# සොබාදහම සහ නිර්මාතෘ හඳුනා ගැනීමට...

## TO RECOGNIZE NATURE AND THE CREATOR...

[මිල කළ නොහැකි පණිවිඩයක් සහිත අත්පොතකි]

**සුදේෂ් ජයන්ත**

**පළමු සංස්කරණය15.3.2026**

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

# විශේෂ ස්තූතිය සහ පිළිගැන්වීම

නව දැනුම සෙවීමට මාර්ගය විවෘත කර දෙමින් සහ අතරමග වැටීමට ඉඩ නොදී සැමවිටම ආදර්ශයක් මෙන්ම ශක්තියක් වෙමින් මා දිරිමත් කළ රනා අද්‍රා මහත්මියට මගේ විශේෂ කෘතඥතාව පුදමි.

මෙවැනි කටයුත්තක් කිරීමට මා තුලින් මාවම පෙළඹවූ සහ දිරිගැන්වීමේ බීජ වූ මගේ ආදරණීය බිරිඳට සහ මගේ පුතාට මෙය සෙනෙහසින් පිළිගන්වමි.

සොබාදහම සහ නිර්මාතෘ හඳුනාගැනීමටත් මෙහි අන්තර්ගත කරුණු ඉගෙන ගැනීමටත් නන් අයුරින් මට ප්‍රයෝජනවත් වූ සහ සහාය දුන් සැමට මෙය උපහාරයක් වේවා!

සිංහල කියවීමට හැකි සෑම දෙනාටම මෙය ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් වේවා!

ٱلْحَمْدُ لِلَّهِ رَبِّ ٱلْعَالَمِينَ

# ප්‍රවේශය

මෙය හුදෙක් රසවින්දනය, ත්‍රාසය හෝ කුතුහලය ඇති කිරීමෙන් පාඨක උනන්දුව දිනා ගැනීම සඳහා ලියන ලද තවත් එක් ග්‍රන්ථයක් නොවේ. මෙහි අන්තර්ගතය ඔබේ කැමැත්තට වඩා ඔබේ අවශ්‍යතාවයට ප්‍රමුඛත්වය දෙන ලෙස ඉදිරිපත් කර ඇත. පාඨකයාගේ පහසුව සඳහා මෙම පොත කෙටි කිරීමට හැකි වුවද, එසේ කිරීමට මම ලෝබ උනෙමි. මෙම පොත තුලින් බොහෝ පාඨකයින්ට නුහුරු නුපුරුදු විෂයයන් සහ මාතෘකා රාශියක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන අතර, ඕනෑම පිටුවක් අහඹු ලෙස කියවීමෙන් වුවද යම් දැනුමක්, ප්‍රයෝජනයක් ලබා ගත හැකිය.

ඔබේ සුපුරුදු සීමාවන් ඉක්මවා යන මාතෘකාද මෙහිදී සාකච්ඡා කෙරේ. ඔබේ උසස් මනස ප්‍රතික්ෂේප කරන කරුණුද ඔබට හමු විය හැකිය. ඔබේම විනිශ්චයට අභියෝග කරන තත්ත්වද මෙතුලින් ඔබ දකීවි. ඇත්ත වශයෙන්ම, මෙහි එවැනි බොහෝ දේ ඇතුළත් ය. නමුත් සාක්ෂි සහිතව කරුනු ඉදිරිපත් කර ඇති බැවින්, ඒවා ප්‍රවේශමෙන් කියවා ඒවායේ සාරය උකහා ගන්න. නිසැකවම ජීවිතයේදී ඔබට මේ දක්වා මග හැරුණු බොහෝ දේ මෙහි තිබෙන අතර ඒවා ඔබේ දැනුමට, මෙලොව ජීවිතයට සහ මරණින් මතු ජීවිතයට ඉතා වැදගත් වනු ඇත.

තවද, මෙය දිව්‍යමය වචන රැසක එකතුවක් සහිත වන අතර ඔබේ දෛනික ජීවිතයේදී නොදැනිවම ඔබව ගසාගෙන යන මායාවේ රළ පහරින් ආරක්ෂා වීමට උපකාරී වන අත්පොතක් ලෙසද මෙය භාවිතා කල හැක.

# හැඳින්වීම

අප විවිධ මට්ටම් වලින් ජීවිතය බුක්ති විඳින්නෙමු. එහෙත් සෑම මිනිසෙකුටම මරණය අත් විඳින්නට සිදුවේ. අපගේ ශරීරය පස් බවට පත්වී නැවත එය සොබාදහමටම එකතු වේ. සමහර විට එතන ගසක් පැලවීමට හෝ දූවිලි වීමටද ඉඩ ඇත. එහෙත් අපේ ආත්මයට කුමක් සිදුවේද? මෙයට නිසි පිළිතුර දැන ගැනීමට නම් අප කුමන මට්ටමක සිටියත්, කුමණ දහමක් ඇදහුවත් සොබාදහම යනු කුමක්දැයි හරියටම දැන ගත යුතුය. එයට හේතුව නම්, ශරීරය පමණක් නොව, අපගේ ආත්මය නැවත පිටවයන්නේද සොබාදහමටම වීමය.

බෞද්ධ පරිසරයක හැදී වැඩුණු මම රැකියාවක් සඳහා විදෙස්ගත වූ පසු එහිදී  මවිසින් සිදුකල විවිධ ආගම් පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයේදී මට ඉතා වටිනා කාරණාවක් ගැන දැනගන්නට ලැබුණි. එනම්, සොබාදහමට නිර්මාතෘවරයෙක් සිටී. එසේනම් ඒ කවුරුන්ද? ඔහු සහ අප අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? ඔහුගෙන් මිදී අපට පැවත්මත් ඇතිකර ගත හැකිද?

මෙය කියවීම ආරම්භ කරන ඔබට සොබාදහම සහ එහි නිර්මාතෘ පිළිබඳව සෑහීමකට පත්විය හැකි තරමේ සහ ඒ ගැන විශ්වාසයෙන් යුතුව තව කෙනෙකුට පහදා දිය හැකි තත්ත්වයක් තිබේද? ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙකුට ඒ ගැන පැහැදිළි අදහසක් සහ හැකියාවක් නැතැයි මා විශ්වාස කරමි.

මේ කාරණය හොඳින් අධ්‍යයනය කිරීමෙන් පසු, මවිසින් මෙම පොත දැඩි විශ්වාසයකින් හා අභියෝගාත්මකව සකස් කර ඇත්තෙමි. මෙහි අඩංගු කරුණු සාක්ෂි සහිතව අසත්‍ය කළ නොහැකි බව මට විශ්වාසයි යන්න මම ඔබට දෙන අභියෝගයයි. එම විශ්වාසය සමගම, මෙම පොතේ විශේෂ පණිවිඩයක් ද අඩංගු වේ. එය තම ආත්මය හා එය තුල පවතින තමාගේ  අනන්තවූ අනාගත ඉරණම කෙරෙහි සෘජුව බලපාන්නකි. එමනිසා, ඔබේ පාට කණ්නාඩි ගලවා මෙම පොත සිහිකල්පනාවෙන් හා මධ්‍යස්ථභාවයෙන් කියවා එහි සත්‍යය තේරුම් ගන්නා ලෙස මම ඔබට ආරාධනා කරමි.

මෙම කාරණයෙහි දී මම මහත් අභියෝගයකට මුහුණ දෙන්නෙමි. එනම්, කෙනෙකුගේ මනසෙහි කලක සිට පැලපදියම්වූ විශ්වාස සහ ඇදහීම් සහිත මහා මන්දිරයේ අගුළු දමා ඇති දොරටුවට තට්ටු කර මෙවැනි මාතෘකා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමේදී මුහුණදීමට සිදුවන අසීරු තත්ත්වයයි. එය කෙටියෙන්ම පවසනවා නම් බොහෝ අය මෙවැනි කාරණා අසන්නටවත් කැමති නැත. බොහෝ අය කැමති වල්-පල් වලට සවන් දීමටය. නමුත් මෙය පැවසිය යුතුම තැනකට පැමිණ ඇත. මගේ යහපතට නොව, අසන්නාගේ යහපත සඳහා වුවද මෙහි ඇති පණිවිඩය ඉදිරිපත් කිරීමට මා මෙතරම් වෙහෙසක් දරන්නේ මන්දැයි මුළින්ම කිව යුතුය. එය නම්, “මා වැනිම තව කෙනෙකු ගේ ඉරණම කෙරෙහි ඇති වන බිය, මානුෂිකත්වය, ආදරය, කරුණාව සහ මේ සම්බන්ධයෙන් දෙවියන් ඉදිරියේ මට ඇති වගකීම් සහිත භාවය යි“.

බොහෝ විට අප සමහරුන්ට අඩු-වැඩි වශයෙන් ආදරය කරන්නන් සහ තම යුතුකම් ඉටුකිරීම වෙනුවෙන් අතිශයෙන් කැප වන්නන් ලෙසද සිටී. මෙහි උච්චතම අවස්ථාව  තම පවුල වටා බැඳී පවතී. ඔවුනොවුන්ගේ කෑම බීම, අධ්‍යාපනය, විවාහය, දුක සතුට ආදී බොහෝ දේ කෙරෙහි එකිනෙකා වද වේ. සොයා බලයි, උදව් කරයි, උපදෙස් දෙයි. එවන් සමීපතයෙක් මිය ගිය පසු පවා ඔහුට පිං පිණිස දාන මාන කරයි. **නමුත් ඇත්තටම නම් ඔවුනොවුන්ගේ මෙලොව ජීවිතයේ සැබෑ අරමුණ වෙනුවෙන් සහ මරණින් මතු ජීවිතය ගැන වැඩි අවධානයක් නොකරයි.** බොහෝ දෙනෙකුට මේ කාරණා දෙක ගැන යම් කිසි අදහසක් පවා ඇත්තේ තම වැඩිහිටියන් සහ තම ආගම දහමින් පෙන්වා දුන් දේ හරහා ය. එහෙත් ඒවා හරිද වැරදි දැයි සොයා බලන්න උත්සහයක් නොගනියි. තමන්ට, තමන්ගේ මවට, පියාට, දරුවන්ට, නෑදැයන්ට, අසල්වාසියන්ට, මිතුරන්ට මරණින් මතු සිදුවන්නේ කුමක්දැයි සොයා බලා කල් තියා කටයුතු කරන අය සිටින්නේ කීයෙන් කීදෙනාද? ලෝක ස්වභාවයට අපිත් අවනත වන්නා ලෙසට පුරුද්දට මෙන් අප අතරින් කෙනෙක් මිය ගිය පසු ඔහුට හෝ ඇයට “සුභ ගමන්!“, “නිවන් සැප ලැබේවා!“ හෝ “Rest In Peace!” යැයි පවසා තම දුක තුනී කරගනු වස් යම් කිසි චාරිත්‍රානුකූල කටයුතු කිහිපයක් ද කර ‘මෙලොව සහ එලෙසින් අප අතහැර යන අයට හීනියට සමුදී නිහඬ වෙයි’. ඔවුන් සහ ඔවුන් සමග මෙලොවදී ගතකළ යම් යම් මතකයන් වලට පමණක් සීමා වේ.

එහෙත්, ජීවත් වන අපට වෙනස් වෙනස් සත්‍යයන් තිබුණත්, මිය යන සියල්ලන්ම ස්වභාවධර්මයෙන් උරුම වූ එකම සත්‍යයකට මුහුණ දෙති. එසේ නම් ඒ එකම සත්‍යය කුමක්ද? අතීතයේදී තමන් පණ සේ ආදරය කළ අය මිය ගොස් මේ වන විට මුහුණ දෙනවා ඇත්තේ ඔවුන් මෙලොව සිටියදී පිළිගත් සත්‍යයටද, නැතිනම් ඔවුන් මෙලොවදී ප්‍රතික්ෂේප කළ සත්‍යයකටද? ඔවුන් මරණින් පසු දුකට උරුමකම් කීවාද සැපතට උරුමකම් කීවාද? ඔවුන්ට පිටුපසින් යන අපේ තත්ත්වයත් එයම නොවේද? ඒ අනුව බලන කළ අප ඉදිරියේ තිබෙන්නේ අවිනිශ්චිත ගමනක්ද නොවෙද?

මගේ ඉදිරිපත් කිරීම ඒ සඳහා ඉලක්ක කර ගෙන ඇත. එය පැහැදිලිව තේරුම් ගැනීමට සහ මෙලෙස තවකෙනෙකුට පැහැදිළිව පහදා දීමට මට මාර්ගය පෑදුනේ විවිධ ආගම් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් කිරීමට අවස්ථාව ලැබීමෙනි. එහිදී, සොබාදහම සහ එහි නිර්මාතෘ පිළිබඳ ප්‍රතික්ෂේප කළ නොහැකි කරුණු මට හමු විය. ආගම යනු කුමක්දැයි පැහැදිලි විය. ලෞකික ජීවිතය සාර්ථක කර ගන්නේ කෙසේදැයි මම තේරුම් ගතිමි. මරණින් මතු ජීවිතයේ ස්වභාවය පිළිබඳව පැහැදිලි විය. මා ආභාෂය ලැබූ පරිසරය හරහා මා කලින් දැන සිටි දේවල් නිවැරදි නොවන බව මට වැටහුණි. එබැවින්, මට හමුවූ **'සාධක සහිතව සත්‍ය ලෙස පිළිගත හැකි තොරතුරු'** ඔබ වෙත ඉදිරිපත් කිරීම අනිවාර්‍යය සහ බැරෑරුම් වගකීමක් බවට පත්ව ඇත. එය ඉදිරිපත් නොකිරීම ඉහත සඳහන් කළ ආදරයේ දුර්වලතාවයක් සහ වගකීම පැහැර හැරීමක් ලෙස මට හැඟේ. එබැවින්, මම මගේ යුතුකම ඉටු කරමි. මෙය මෙතරම්ම පවසා තිබියදී මේ ගැන ඉදිරියටත් කියවීම ඔබේ වගකීමකි. මෙය වැරදි යැයි ඔබට හැඟෙන්නේ නම් නිවැරදි මග මට පෙන්වා දෙන්න. එකම සත්‍යයක් වෙත අප සියල්ල යා යුතුව ඇත.

එකම සත්‍යයක් ගැන විවිධ සාශ්තෘවරුන් විවිධ ආකාරවලින් කරුණු පෙන්වා දී තිබේ. මේ එවන් කරුණු දෙකකි

1). වසර 2550 කට පමණ පෙර, බුදුන් වහන්සේ විසින් මිනිසෙකුට සිදුවිය හැකි ලොකුම වැරැද්ද පිළිබඳ (සත්‍යයක්) මෙලෙස දේශනා කර ඇත:

*“මහණෙනි, මිථ්‍යා දෘෂ්ඨිය යම් ආකාරයක් වෙත් ද එසේ මහා සාවද්‍ය වූ අන් එකදු ධර්මයකුදු මගේ සර්වඥතා ඥාණයෙන් නො දකිමි. මහණෙනි, මිථ්‍යා දෘෂ්ඨිය වරදවල් අතරින් සියල්ලට ම මහත් වරද වේ.”(ත්‍රිපිටකය)*

[එය මෙසේ විග්‍රහ කර ඇත; ආනන්තරීය කර්ම කළවුන් කල්ප අවසානයේ දී නරකයෙන් මිදෙන නමුදු නියත මිත්‍යා දෘෂ්ඨිය ගත්තවුන් ලෝකය විනාශය සිදුවන අවස්ථාවේදී වෙනත් ලෝකයක (නරකයක) ඉපිද දුක් විපාක විදීමට සිදු වේ. එමෙන්ම එසේ සිදුවන විපාකවල අවසානය පිළිබඳ නිශ්චිතව කිව නො හැකි ය]. [පිටුව 725 බලන්න]

2). වසර 2000 කට පමණ පෙර යේසුස් වහන්සේ එවක සිටි ජනතාවට (එක් සත්‍යයක් ගැන) මෙසේ පවසා ඇත.

*“මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත. (බයිබලය-යොහන් 14:6).*

ප්‍රධාන ඉගැන්වීම් දෙකකින් උපුටා ගත් ඉහත කරුණු දෙක අද බෞද්ධයෙකු හෝ කිතුනුවෙකු නොවන මවිසින්ද පිළිගනිමින්, මගේ ඉස්ලාමීය විශ්ලේෂණය පහත පරිදි දිග හරිමි. එය අවසන් වන්නේ කෙසේදැයි බැලීමට ඉවසිලිවන්තව පොත කියවන්න. [පිටුව 550 බලන්න]

**පහත සඳහන් වැකි දෙස ඔබේ අවධානය යොමු කරන්න.**

මෙම වාක්‍යයන් උපුටා ගන්නා ලද්දේ වසර 1400 කට පමණ පෙර පහළ වූ ශුද්ධ වූ කුරානයෙන් ය. පළමුව, කුරානය ගැන යමක් පැවසිය යුතුය. ආරම්භයේ සිට අද දක්වා කිසිදු වෙනසක් සිදු නොවූ සහ වෙනස් කළ නොහැකි, ‘අද ලෝකයේ ඇති එකම ආගමික ග්‍රන්ථය’ එයයි. එහි සර්වබලධාරී දෙවියන්ගේ වචන පමණක් අඩංගු බව නිසැකවම පැවසිය හැකිය. එබැවින්, ඒ මත පදනම්ව තොරතුරු ඉදිරිපත් කිරීමට මම අදහස් කළෙමි. එය නබි මොහම්මද්(ﷺ) තුමන් වෙත අරාබි භාෂාවෙන් හෙළිදරව් කර ඇත. මේ එහි සිංහල පරිවර්තන වාක්‍ය කිහිපයකි.

*(නබියේ!) අහස් හිද භූමියෙහිද, ඔවුන්ට ඉදිරියෙන්ද පසුපසින්ද, ඇති දැය ඔවුන් අවධානය කර බැලුවේ නැද්ද?; (Quran 34:9) ඒවා කිසිවක් නොමැතිව තමන් විසින්ම ඇති කළෙහුද? නැතහොත් මොවුන්, තමන්ට තමන්ම නිර්මාණය කර ගත්තෙහුද? නැතහොත් අහස්ද භූමියද ඔවුන් නිර්මාණය කළෙහුද? නැත. මේ සියල්ල නිර්මාණය කළ අය දෙවියන්ය; (Quran 52:35,36)*

*(නබියේ!) (මීට පෙර අපි දූතයින් බොහෝමයක් දෙනාව යැවූ) මේ අන්දමටම ඔබවද අපි (අපගේ දූතයා වශයෙන්) එක් සමූහයක් වෙත යැව්වෙමු. මොවුන්ගෙන් පෙරද (මොවුන්ගෙන්) විවිධ සමූහයන් ඉකුත්ව ගොස් ඇත්තාහ. (දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන් වෙත දූතයෙකු නොපැමිණියේය). එබැවින් අපි ඔබට වහී මගින් දැනුම් දෙන දැය මොවුන්ට ඔබ සමුදීරණය කර පෙන්වා දෙනු; (Quran 13:30)*

*(නබියේ!) ඔබ (මිනිසුන්ට) ප්‍රඥාවෙන්ද, අලංකාරවත් හොඳ ඔවදන් මගින්ද ඔබගේ දෙවියන්ගේ මාර්ගය දෙසට ආරාධනා කරණු. තවද ඔවුන් සමග (තර්ක කිරීමට සිදු වුවහොත්) ඔබ (ගෞරවණීය හා) අලංකාරවත් අන්දමින් තර්ක කරනු මැනව!; (Quran 16:125)*

*(අපගේ) දූතයාණෙනි! ඔබගේ දෙවියන්ගෙන් ඔබට පහළ කරන ලද දැය (කිසිම අඩුපාඩුවකින් තොරව ඔවුන්ට) දැනුම් දී හරිනු. ඔබ (එසේ) නොකලහොත් ඔවුන්ගේ දූත මෙහෙවර ඔබ ඉටු කල කෙනෙකු බවට පත්වන්නේ නැත. (මෙහිදී ඔබ කිසිවෙකුටවත් බිය නොවනු). මිනිසුන්ගේ (නපුරෙන්) දෙවියන් ඔබව (ආරක්ෂාකර) බේරා ගනු ඇත. (Quran 5:67)*

*(නබියේ!) ඔබ කැමති අයව ඍජු මාර්ගයෙහි ඇතුළු කිරීමට නියත වශයෙන්ම ඔබට නොහැකිය; (Quran 28:56) "(නබියේ!) මෙසේ පවසන්න! මිනිසුනි! නුඹලාගේ පරමාධිපතිගෙන් සත්‍යය නුඹලා හමුවට පැමිණ ඇත. (එමගින්) කවරෙක් යහමග ලබයිද, ඔහු තමාටම යහපතක් කරගනියි. කවරෙක් මංමුලාවෙහි ගමන්කරයිද, ඔහු තමාටම එරෙහිව නොමගෙහි යන්නෙකි. මා නුඹලාට භාරකාරයෙක් නොවෙමි" (Quran 10:108). (නබියේ!)"ඔබගේ යුතුකම පණිවිඩය ගෙන ඒම පමණි; තවද ගණන් බැලීම අප සතුය" (Quran 13:40)*

*විශ්වාසවන්තයිනි! ඔබ, ඔබවද, ඔබගේ පවුලේ උදවියද මිනිසුන්ද, ගල්ද ඉන්ධන බවට පත් කළ හැකි නිරා ගින්නෙන් ආරක්ෂා කර ගනු. එහි දැඩි හැකියාවන්ගෙන් පිරි ශක්ති සම්පන්නයන් වන මලායිකාවරුන්ව පත් කරනු ලැබ ඇත්තේය. ﷲ (දෙවියන්) ඔවුන්ට නියෝග කර ඇති දැයෙන් (පොඩියක් හෝ) වෙනසක් නොකරනු ලබන්නාහ. ඔවුන්ට (දඬුවම් කරන මෙන්) තමන්ට දෙනු ලැබූ නියෝගයන්ම ඉටු කරමින් සිටින්නාහ. (Quran 66:6)*

*මෙම ප්‍රතික්ෂේප කරන්නන් අපව අතහැර දමා අපගේ වහලුන්ව (තමන්ට) ආරක්ෂකයින් වශයෙන් ගත හැකිය යයි අදහස් කරමින් සිටින්නෙහුද? නියත වශයෙන්ම මෙම ප්‍රතික්ෂේප කරන්නන්ට ආගන්තුක සත්කාර කිරීම සඳහා නිරයම පිළියෙල කර ඇත්තෙමු. (Quran 18:102)*

*ඔවුන් (කවුරුන්දයත්) මෙලොව ජීවිතයෙහි වැරදි මාර්ගයෙහිම උත්සහ කරමින් තමන් ඇත්තෙන්ම හොඳ ක්‍රියාවන්ම කරන බවට සිතා ගන්නාහ. (Quran 18:104)*

*මෙවැන්නන්ම තමන්ගේ දෙවියන්ගේ ආයාවන්ද, ඔහුව හමු වන්නෙමු යන්නද ප්‍රතික්ෂේප කළ අයයි. ඔවුන්ගේ හොඳ ක්‍රියාවන් සියල්ල විනාශ වී ගියේය. (පින් පව් කිරා බැලීමට) ඔවුන් වෙනුවෙන් විනිශ්චය දිනදී තරාදිය අපි නොසිටුවන්නෙමු (Quran 18:105) ඔවුන් මගේ ආයාවන්ද, මගේ දූතයන්වද, ප්‍රතික්ෂේප කර, සමච්චලයට ලක් කළ හේතුවෙන් නිරයම ඔවුන්ට එලවිකාක වන්නේය. (Quran 18:106)*

*කාලය මත සත්තකින්ම, මිනිසා තම ආයුෂ කාලය නිකරුනේ වියදම් කර නියත වශයෙන්ම පරාජික මාර්ගයේ සිටින්නේය. එහෙත් කවුරුන්, විශ්වාසය තබා දැහැමි කාරනාවන්ද කර සත්‍යය කෙනෙකුට කෙනෙකු ඔවදන් දී (පාපයන් අතැහැර දැමීමෙහිද, පින් ඇති දැය කිරීමෙහිද, ඇති වන අමාරුකම විද දරා ගන්නා ලෙසටද, කෙනෙකුට කෙනෙක් ඔවදන් දෙමින් සිටින්නෝද) ඔවුන් හැර. (මොවුන් පරාජිත වූවේ නැත) (Quran 103:1-3)*

*(එබැවින් මනුෂ්‍යයිනේ!) ඔබ ඔබගේ දෙවියන්ගෙන් සමාව දෙසටද, ස්වර්ගය දෙසටද ඉක්මන් කර යනු. එහි විස්තීරණය අහස් හා භූමියෙහි විස්තීරණය මෙන්ම*

*ඇත්තේය. එය ﷲ (දෙවියන්)වද, ඔහුගේ දූතයින්වද විශ්වාස තැබූවන් වෙනුවෙන්ම පිළියෙල කරණු ලැබ ඇත්තේය. එය දෙවියන් (ﷲ) ගේ වරප්‍රසාදයකි. එය ඔහු කැමති (හොඳ) අයටම ලබා දී ඇත්තේය. දෙවියන් (ﷲ) ඉමහත් වූ දයාබරවන්තයෙකි. (Quran 57:21).*

දෙවියන්ගේ අවසන් නබිවරයා වන මුහම්මද් (ﷺ) තුමා තම නබිත්වයේ 23 වන (හෙවත් අවසන්) වසරේ තමාගේ අවසාන සමුගැනීමේ දේශනාවේදී, මෙසේ පැවසීය,

*'පැමිණ සිටින අය නොපැමිණෙන අයට ප්‍රකාශ කරත්වා!'. (මගේ ඉගැන්වීම්) තනි වාක්‍යයක් වුවද ජනතාවට ප්‍රකාශ කරන්න'. (Sahih al-Bukhari 3461/ 60, 128)*

මෙවැනි බරපතල සහ නොසැලකිලිමත් විය නොහැකි තත්වයක් හමුවේ විශ්වය/න් සහිත සොබාදහමේ මැවුම්කරු සහ හිමිකරු වන සර්වබල්ධාරී (ﷲ) දෙවියන්වහන්සේ විසින් අවසන් දේවදූත මොහම්මද්(ﷺ) තුමාණන් වෙත ලබා දුන් අවසන් දිව්‍ය එළිදරව්ව සහිත මාර්ගෝපදේශය උපයෝගී කරගනිමින් බුදු වදනක සඳහන් ආකාරයට මිනිසෙකුට විය හැකි ලොකුම වරද වන මිත්‍යා දෘෂ්ඨියෙන් මිදී, යෙසුස් වහන්සේ පැවසූ ආකාරයට සත්‍ය පියානන් වෙත යන මාර්ගයත් නිවැරදිව හඳුනා ගැනීමට කරුණු මෙලෙස ඉදිරිපත් කරන්නෙමි.

මෙහි සඳහන් වන දෙවියන්ගේ පණිවිඩය තුල ඇති එකම වැකියක්වත් සාධක සහිතව කිසිවෙකුටත් බොරු කළ නොහැකිය යන අභියෝගයම මෙය ඉදිරියට කියවීමට ඔබව දිරිමත් කරාවි යැයි මම විශ්වාස කරමි.

මෙය බොරු කළ නොහැකි නම් මෙයට වඩා තවත් සත්‍යයක් තිබිය හැකිද? සොබාදහම, විශ්ව ශක්තිය, පරම සත්‍යය ආදී සියල්ල මෙතුලින් ඔබට හමුවේවි. අප අවට ඇති සියළුම දහම් පිළිබඳවත්, සාශ්තෘවරුන් පිළිබඳවත් පැහැදිළිතාවයක් ඇති වේවි. තමා ඇතුලුව සොබාදහමත්, එහි නිර්මාතෘවත් නිවැරදිව හඳුනා ගත හැකි වනු ඇත. එතුලින් ඔබ යායුතු නිවැරදි ගමන්මග හඳුනා ගනු ඇත. අප සියල්ල ගමන් කරමින් සිටින්නේ එම එකම සත්‍යය වෙතය. මෙය කියවා එය හඳුනා ගන්න. පොතෙහි අන්තර්ගතය හඳුනා ගැනීමට මුලින්ම පහත සඳහන් පටුන මුල සිට අග දක්වා කියවන්න.

# පටුන


**විශේෂ ස්තුතිය සහ පිළිගැන්වීම. 1**

**ප්‍රවේශය. 2**

**හැඳින්වීම. 3-9**

**පටුන. 10-16**

**සොබාදහමේ දහම සහ මිනිසාගේ දහම නිවැරදිව හඳුනා ගනිමු. 17**

**සර්වබලධාරී දෙවිඳුන් (الله) සම්බන්ධව.**

- ❖ සර්වබලධාරී දෙවියන් වහන්සේ සහ ඔහුගේ නිර්මාණ (මූලික හැඳින්වීම). 26
- ❖ දෙවියන් යනු කෙබඳු කෙනෙක්ද? (දෙවියන්ගේ නම් 99 සමග) 27
- ❖ දෙවියන් සිටින බවට සාක්ෂි. 48
- ❖ ඒකදේවත්වය - (තව්හීද්). 60
- ❖ දෙවියන්ගේ රාජධානිය. 63
- ❖ දෙවියන්ට සමානයන් තැබීම. 69
- ❖ දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීම හෙවත් ලොකුම පාපය. 71
- ❖ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ කුරාන් වැකි. 77

**දෙවියන්ගේ නිර්මාණ.**

- ❖ දෙවියන්ගේ දැනුම සහ නිර්මාණශීලීත්වය. 105
- ❖ සියල්ල සිදුවන්නේ දෙවියන්ගේ දැනුම සහ අනුමැතිය මතයි. 113

**දෙවියන්ගේ අවසන් හෙළිදරව්ව වන ශුද්ධ වූ අල් කුර්ආන් සම්බන්ධව. 122**

- ❖ කුරානය යනු කුමක්ද? (මට හමු වුනු අද්විතීයම ග්‍රන්ථය). 123
- ❖ කුරානය ගැන සඳහන් කුරාන් වැකි. 129
- ❖ කුරානයේ විද්‍යාත්මක හෙළිදරව්වන්. 135
- ❖ කුරානයේ ගණිතමය ආශ්චර්යයන්. 141
- ❖ කුරානය විද්‍යාවට අභියෝග කරන්නේ කෙසේද? 144
- ❖ කුරානය පිළිබඳව මුස්ලිම් නොවන විද්වතුන්ගේ ප්‍රකාශනයන්. 148

- ❖ දැනුම නොමැතිව කුරානය විග්‍රහ කළ හැකිද? 151
- ❖ කුරානයෙන් උපදෙස් 100ක්. 154
- ❖ අල් කුරාණය: පරිච්ඡේද වල නම්, අංක, පිටු අංක, වැකි ගනණ, පහළ වූ ස්ථාන. 158


**දෙවියන්ගේ නිර්මාණ:- මිනිසා සම්බන්ධව.**


- ❖ දෙවියන් අපව නිර්මාණය කලේ ඇයි? 166
- ❖ පළමු මිනිසා (ආදම් අ.ස.)ව නිර්මාණය කිරීම. 174
- ❖ ආත්මය, සිත, විඥානය, ශරීරය, හෘද සාක්ෂිය -(රූහ් සහ නෆ්ස්). 181
- ❖ මිනිසා සම්බන්ධව ඇති කුරාන් වැකි. 195
- ❖ විශ්මිත මිනිස් සිරුර. 203
- ❖ මිනිසාව පළමුවෙන්ම මැවීමේ සිට ඔහුගේ අවසානය දක්වා දෙවිඳුන් පවසා ඇති කරුණු. 210
- ❖ මානව කළලයේ විකසනය පිළිබඳව අල් කුර්ආනය පවසන දේ. 226
- ❖ මිනිස් ශුක්‍රාණු සහ කළල අවධිය පිළිබඳව දෙවියන් පවසා ඇති දේ. 228
- ❖ ඉස්ලාමයට අනුව මිනිසාගේ ජීවන ගමනේ ආරම්භය, මැද සහ අවසානය. 231
- ❖ ඔබේ මෙලොව සංචාරය !!! 237
- ❖ මිනිසුන් ආබාධිත හා විකෘති වී උපදින්නේ ඇයි? 257
- ❖ මම කවුද ? WHO AM I ? 265
- ❖ මිනිසා විශ්වාස කළ යුතු කරුණු හයක්. 275
- ❖ කුසල් යාන්ත්‍රණය ගැන දැන ගැනීම සහ පහසුවෙන් කුසල් රැස් කිරීම. 278
- ❖ ඔබගේ ආගම කුමක් විය යුතුද? 287
- ❖ මට වැරදුනාද? 290
- ❖ ජීවිතය විඳින්න දහමට යොමු වන්න. 293
- ❖ කාලය සහ ජීවිතය. 296
- ❖ මිනිසාව මවා ඇත්තේ අරමුණකින් තොරව යැයි ඔබ සිතනවාද? 300
- ❖ දෙවියන් සියල්ල දන්නේ නම්, මිනිසාව පරීක්ෂා කරන්නේ ඇයි? 302
- ❖ දෙවියන්ගේ දඬුවම් ප්‍රමාද වන්නේ ඇයි? 303


**දෙවියන්ගේ නිර්මාණ:- විශ්වය සහ සොබාදහම සම්බන්ධව.**


- ❖ සොබාදහම සහ දෙවියන් මිනිසාට දුන් වරප්‍රසාද. 306

❖ විශ්වයේ මැවීම. 323
❖ විශ්වය සහ ඉන් ඔබ්බට. 325
❖ විශ්මිත විශ්වය. 333
❖ තාරකා භෞතික විද්‍යාව පිලිබඳ අල් කුරානයේ එන සංකල්ප. 335
❖ විශ්මිත සොබාදහම. 337
❖ සොබාදහම සහ දෙවියන්. 338
❖ ඔබ මවිත වන දේවල් කිහිපයක්. (කුඩාම දේ සිට විශාලම දේ දක්වා). 340
❖ ජලය සම්බන්ධව ඇති කුරාන් වැකි. 353
❖ සතුන් ගැන දෙවියන් වහන්සේ පවසා ඇති දේ. 365
❖ විශ්මිත සතුන්. 377
❖ පරිණාමවාදය සහ දෙවියන්ගේ නිර්මාණ. 380
❖ දෙවියන්ගේ දඬුවම් ප්‍රමාද වන්නේ ඇයි? 387
❖ සොභාවික විපත් පිටුපස ඇති රහස. 390

**ලෝක අවසානය සහ විනිශ්වය දිනය.**

1. ලෝක අවසානය සම්බන්ධව. 409
2. ලෝක අවසානයේ පෙරනිමිති. 411
3. විනිශ්වය දිනය ගැන සඳහන් කුරාන් වැකි එකතුවක්. 416

**දෙවියන්ගේ වෙනත් විශේෂ නිර්මාණ:-**

❖ ස්වර්ගය. 437
❖ නිරය. 444
❖ ඉබ්ලීස්, ජින්වරු, ෂෙයිතාන්වරු. 456
  ➢ ඉබ්ලීස් ගේ උපක්‍රම. 465
❖ මලායිකාවරුන් (දේව දූතයන්/ සුරදූතයන්) හැඳින්වීම. 475
  ➢ අප සමග සිටින මලායිකාවරුන් සහ ඔවුන්ගේ කාර්යයන්. 481
  ➢ මලායිකාවරුන් ගැන සඳහන් කුරාන් වැකි එකතුවක්. 484

**පෙර විසූ නබිවරු සහ අවසන් නබි මොහම්මද් (ﷺ) තුමා. 493**

❖ නබිවරුන්ගේ පෙලපත. 494
❖ මොහම්මද් නබිතුමා (ﷺ) යනු කවුරුන්ද? (ලිපි 1). 497

- මුහම්මද් (ﷺ) තුමා කව්ද? (ලිපි 2) 510
- මුහම්මද් (ﷺ) තුමාණන්ගේ මිහ්රාජ් ගමන. 513
- මුහම්මද් (ﷺ) තුමාණන් කල අවසාන දේශනය. 515
- නබිවරුන් සම්බන්ධ ප්‍රාතිහාර්යයන්. 517
- The Most Influential Man in History - Michael Hart. 526
- Views of non-Muslim scholars on Muhammad (PBUH). 534


**අනාගතවක්තෘවරයෙකු ගැන වූ සංසන්දනාත්මක අධ්‍යයනයක්.**


- බෞද්ධ ග්‍රන්ථ වල සඳහන් මෛත්‍රේය නම් වූ ශාස්තෘන්. 537
- හින්දු ග්‍රන්ථවල අවසන් දේවදූත මොහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු. 547
- යුදෙව් ග්‍රන්ථවල අවසන් දේවදූත මුමොහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු. 549
- ක්‍රිස්තියානි ග්‍රන්ථවල අවසන් දේවදූත මොහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු. 550


**නවක මුස්ලිම්වරු. [පළමු කොටස]**


- ඉස්ලාමයට නැවත හැරීම යනු කුමක්ද? 552
- ආගම් ප්‍රචාරණය. 559
- ඉස්ලාමය ගැන පැහැදිලි කරන්න යන ඔබට උපදෙසක්. 562
- මුස්ලිම් නොවන අය අසන පොදු ප්‍රශ්න 100ක්. 571
- දාවා පිළිබඳ හැඳින්වීම සහ එය ඉටු කරන ආකාරය. 576
- ඉස්ලාමය පිළිගන්නේ කෙසේද? 587
- මුස්ලිම් නොවන අයට පණිවිඩයක්. 592
- බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි අයගෙන් කෙරෙන ඉල්ලීමක්! 595
- මොහම්මද් නබි (ﷺ) තුමාගේ මිතුරන් (සහාබිවරුන්). 599


**ඉස්ලාම් දහම සම්බන්ධව විවිධ මාතෘකා කිහිපයක්.**


- ඉස්ලාමය සත්‍යය බව තහවුරු කර ගැනීමට සාධක. 603
- විශ්ව දහම සරළව වටහා ගනිමු. 612
- මුස්ලිම්වරුන්ට විශේෂ වූ ස්ථාන. 625

- අදාන් සහ නැමදුම. 639
- ඉස්ලාමයේ වැදගත් ලක්ෂණ. 646
- මානව දයාවෙන් පරිපූර්ණ වූ ඉස්ලාම්. 648
- ඉස්ලාමයේ අන්තවාදය තිබේද? 652
- ඉස්ලාම් භීතිකාව. 654
- ඉස්ලාමය ව්‍යාප්ත වූයේ කඩුවෙන්ද? 656
- ෂරියා නීතිය යනු කුමක්ද? 658
- සකාත් ගෙවන්නන් සහ සකාත් ලබන්නන්. 662
- සුන්නි සහ ෂියා අතර වෙනස. 664
- රමදාන්. 667
- දුආ ප්‍රාර්ථනා. 668
    - දුආ ප්‍රාර්ථනා යනු කුමක්ද? 668
    - දුආ, දික්ර්, ශුක්ර්, තව්බා. 677
    - දෙවියන් සිහිකිරීම සම්බන්ධව ඇති කුරාන් ආයත්. 684

**ප්‍රධාන ආගම් පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක්. [691-831]**

- ආගම් වර්ගීකරණය. 692
- දෙවියන් පවසන "මිනිසාගේ නොමග යෑම". 693
- යුදෙව්- ක්‍රිස්තියානි- ඉස්ලාම් යනු එකම ආගමේ අදියර තුනකි. 697
- ඉබ්‍රාහිම් නබි තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව. 703
- පිළිම වන්දනාව අනුමතද? 706
- මුස්ලිම්වරුන්ට දෙවියන්ගේ පරීක්ෂණය පහසුද? 716
- මිත්‍යා දෘෂ්ඨිය හඳුනා ගනිමු. 725
- ඉස්ලාමය සහ වෙනත් ආගම්. 735
- මැවුම්වාදය පිලිගනන්වාද? භෞතිකවාදය පිළිගන්නවාද? 737
- මියගිය හදවත් වල අධ්‍යාත්මික බංකොලොත්භාවය. 638
- ආගමක් නිවැරදි වන්නේ කෙසේද? 740

**ආගම්වල බෙදීම්.**

    - ක්‍රිස්තියානි දහමේ බෙදීම්. 742
    - බුදුදහම ගැන කෙටි හැඳින්වීමක් සහ බුදු දහමේ බෙදීම්. 751, 754

- ඉස්ලාම් දහමේ බෙදීම්. 761
- යුදෙව් දහමේ බෙදීම්.763
- හින්දු දහමේ බෙදීම්. 765
    - මහාවීර යනු කවුරුන්ද? 767
    - මහාවීර සහ ගෞතම බුදුන් අතර සමානකම් හා වෙනස්කම්. 769

**විවිධ ආගම් හී ප්‍රධාන ධර්ම මූලාශ්‍ර.**

- හින්දු ග්‍රන්ථ. 772
- බෞද්ධ ග්‍රන්ථ. 775
- යුදෙව් ග්‍රන්ථ. 777
- ක්‍රිස්තියානි ග්‍රන්ථ. 781
- ඉස්ලාමීය ග්‍රන්ථ. 783

**ක්‍රිස්තියානි ආගම සම්බන්ධව. 787**

- යේසුස් වහන්සේ ගැන කුරාන් වැකි කිහිපයක්. 789
- අල් කුරානයට අනුව ජේසුතුමා කව්ද? (ලිපි 2) 793
- අවධානය යොමු කළ යුතු බයිබල් වැකි. 797

**විවිධ ආගම් හී දෙවියන් පිලිබඳ සංකල්ප.**

- හින්දු ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය. 813
- ක්‍රිස්තියානි ආගමේ දෙවියන්ගේ සංකල්පය. 814
- යුදෙව් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය. 816
- Zoroastrianism හි දෙවියන් පිළිබඳ සංකල්පය. 819
- සීක් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය. 821
- බුද්ධාගමෙහි දෙවියන් පිළිබඳව සංකල්පය. 824
- ඉස්ලාම් ආගමේ දෙවියන් පිළිබඳව සංකල්පය. 829

**දැනුම සඳහා වෙනත් ලිපි.**

ඉස්ලාමීය චාරිත්‍ර.

- ඉස්ලාමීය විවාහය. 832
- ඉස්ලාමීය අවමංගල චාරිත්‍ර. 834

❖ නවක මුස්ලිම්වරයෙකුගේ අභාවයකදී ඇතිවන ප්‍රායෝගික ගැටලු. 837
❖ ඉස්ලාමීය ඇඳුම් පැළඳුම් කේතය. 840
❖ චර්මච්ඡේදනය. 844
❖ හලාල් සහ හරාම්. 845

**කාලීන**

❖ අන්තවාදය යනු කුමක්ද? 848
❖ ඉස්ලාම් දහමින් අධ්‍යාපනයට හිමි තැන. 850
❖ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම. 852
❖ මුස්ලිම්වරුන් අතර සියදිවි නසා ගැනීම් අඩු ඇයි? 853
❖ ඉස්ලාම් දහමින් දුම්පානය තහනම් කරන්නේ ඇයි? 857
❖ ඉස්ලාම් දහම තුල දරුවන් වෙනුවෙන් දෙමව්පියන්ගේ වගකීම්. 859
❖ සත්ව කරුණාව සහ ඉස්ලාමය. 861
❖ සත්ව ඝාතනය- විද්‍යාත්මක සහ ආගමික කෝණ වලින්. 863
❖ මිනිස් හදවත දැඩි වීම කෙරෙහි බලපාන සාධක. 873
❖ මුස්ලිම්වරයා සතු සමාජ වගකීම්. 876

**නවක මුස්ලිම්වරු. [දෙවන කොටස]**

❖ උත්සව සමය සහ නවක මුස්ලිම්වරු. 880
❖ SRMI CENTER - ශ්‍රී ලාංකික නැවත හැරුනු මුස්ලිම්වරුන්ගේ ස්වාධීන මධ්‍යස්ථානය. 885 www.srmicenter.com / https://srmi-center.webnode.page/
  ➢ SRMI Center සහ www.srmicenter.com වෙබ් අඩවියෙහි අරමුණ. නවක මුස්ලිම්වරු වෙනුවෙන් SRMI Center වෙතින් ඉටු විය යුතු සේවාවන්. 888
  ➢ නවකමුස්ලිම්වරුන් සම්බන්ධව මා දුටු පාරම්පරික මුස්ලිම්වරුන්ගේ දායකත්වය -889
❖ ශ්‍රී ලංකාවේ ආගමික නිදහස - 891
❖ දෙවිඳුනි ඔබමයි මා ලද සම්පත [ගීතයක්]. 893

❖ පොත ගැන පාඨක සටහන්. 894
❖ පොතෙහි පසු පිට:- කතෘගෙන් පොත ගැන කෙටි සටහනක්.

## <u>සර්වබලධාරී දෙවිඳුන් (ﷻ) සම්බන්ධව.</u>

## සොබාදහමේ දහම සහ මිනිසාගේ දහම නිවැරදිව හඳුනා ගනිමු.

ඈත අතීතයේ එක් කාලයක සොබාදහමක් තිබී නැත. වෙනත් වචන වලින් කිවහොත්, අප ජීවත් වන විශ්වය (සහ වෙනත් කුමණ හෝ විශ්වයන් තිබේ හෝ තිබුනාම්, ඒවාද) ආරම්භ වී නොතිබුණි. එසේ නම් මේවා ආරම්භ වූයේ කෙසේද? අප දන්නා අපගේ විශ්වය ආරම්භ වී එය මනා පිළිවෙලකට සැකසුනේ කෙසේද? මෙය සොබාදහම පිළිබඳ පළමු හා වැදගත්ම ප්‍රශ්නයයි. ඉන් අනතුරුව, එය පාලනයකින් යුතුව පවතින්නේ කෙසේද? එයට බලපාන එකම ධර්මතාවය කුමක්ද? පසුව, එහි සිටින මිනිසුන්ට විවිධ ආගම් ඇති උනේ කෙසේද?

බොහෝ අය නොදන්නමුත් මේ සියල්ලට පිළිතුරු ඇත.

අප සිටින විශ්වය ආරම්භ උනේ මීට වසර බිලියන 13.7කට පමණ පෙර එක්තරා ලක්ෂයක් පුපුරා යාමෙන් බවත් එය මහා පිපිරීම (Big Bang) ලෙස නම් කළ බවත් විද්‍යාඥයින් පවසයි. [එහෙත් එම ලක්ෂය ආරම්භ වීමට හේතුව විද්‍යාඥයින් තවම නොදනී]. මීට අමතරව අප නොදන්නා වෙනත් විශ්වයන් ඇතිවී තිබුනා නම් ඒවාත් කුමණ හෝ ආකාර වලට ආරම්භ වන්න ඇති.

මෙහිදී, “ආරම්භ උනා“ යන වචනයෙන් අපට ඉතා වටිනා සළකුණක් පෙන්වයි. යමක් ආරම්භ වීමට නම්, හේතුවක් තිබිය යුතුය. එය අපි “හේතු සහ ඵල නීතිය“ හෝ හේතු-ඵල දහම ලෙස හඳුන්වමු.

විශ්වය/න් සහ එහි ඇති දේවල් ආරම්භ වීමට හේතුවක් බලපෑ නිසා එයට අපි "හේතු සහිත තත්වය" ලෙස නම් කරමු. මෙම හේතු සහිත තත්වයේ සිටින හෝ තිබෙන සියල්ල යම් අවස්ථාවක ආරම්භ වූ නිසා ඒවා කිසිවක් සදාකල් නොවේ. එසේම ඒවා ස්වයංපෝෂිතද නොවේ. එනිසා ඒවා සර්වසම්පූර්ණද නොවේ. එනිසා ඒවා කිසිවක් සර්වබල්ධාරීද නොවේ. ආරම්භයක් මෙන්ම ඒවාට අවසානයක්ද ඇත. මේවා වෙනත් හේතුවක් මත බිහිවූ නිසා මේවාට තමාට වඩා

බලවත් අළුත් යමක් ඇති කිරීමට (හෝ මැවීමක් සිදු කිරීමටද) නොහැක. මෙය පහදා ගැනීම සඳහා අපි සුදු A4 කොළයක් ගෙන එය දෙකට වෙන් කර එහි දකුණු පසට ඉහත කී තොරතුරු ඇතුලත් කරමු.

| හේතු-ඵල තර්කය | | |
|---|---|---|
| | **හේතු රහිත තත්වය** | **හේතු සහිත තත්වය** |
| | **(දෙවියන් ලෙස නම් කරමු)** | **(විශ්වය/න් සහ එහි අංතර්ගතය)** |
| 1 | සදාකල් පවතින්නකි. (ආරම්භයක් සහ අවසානයක් යන තත්ත්ව වලින් තොරව පවතින්නකි) | සදාකල් නැත. (ආරම්භයක් සහ අවසානයක් ඇත) |
| 2 | සදාකල් (අනන්තයක සිට සිටින) නිසා ආරම්භයක් නැත. (ආරම්භය යන වචනය මෙයට අදාල නැත). | ආරම්භයක් ඇත. (ආරම්භය යන වචනය මෙයට අදාල දෙයකි). |
| 3 | සදාකල් පවතින නිසා ආරම්භයට හේතුවක් අදාල නැත). හේතු රහිත තත්වය) | යම් කලෙක ආරම්භ වූ නිසා ආරම්භයට හේතුවක් අවශ්‍යය වේ. (හේතු සහිත තත්වය). |
| 4 | සර්වසම්පූර්ණය (එසේම ස්වයංපෝෂීය). | සර්වසම්පූර්ණ නොවේ (එසේම ස්වයංපෝෂී නැත/ පරපෝෂීය). |
| 5 | සදකාලික තත්වයක් නිසා (මෙම තත්වය ඇති කිරීමට) නිර්මාණ කරුවෙක් නොමැත. | නිර්මාණකරුවෙකු නැතිව ආරම්භ විය නොහැක. |
| 6 | නිර්මාණකරුවෙකුගෙන් තොරව පවතින නිසා (මෙම තත්වය) නිර්මාණයක් නොවේ. | අලුතින් ආරම්භ වූ මෙය (කාගේ හෝ ) නිර්මාණයකි. |
| 7 | ස්වයංපෝෂී තත්වයක් නිසා (පිටස්තර) සැලසුම්කරුවෙකු උවමනා නැත. | (පිටස්තර) සැලසුම්කරුවෙකු නැතිව ස්වයං සැලසුම්සහගත විය නොහැක. |
| 8 | සදාකල් පවතින නිසා (තම පැවැත්මට අලුතින්) කිසි අවශ්‍යතාවයක් නොමැත. | ආරම්භයට සැලසුමක්, ක්‍රියා පටිපාටියක්, බලයක්, අවකාශයක්, සහ අමුද්‍රව්‍ය අවශ්‍ය වේ. |
| 9 | ආරම්භයක් මෙන්ම අවසානයක්ද නැත (සදාකල් පවතී). | ආරම්භයක් මෙන්ම අවසානයක්ද ඇත, (සදාකල් නැත). |
| 10 | සදාකල් පැවතීමට සර්වබලධාරී විය යුතුය. (විනාශ වීමට බලපාන හේතුවක්ද නැත) | විනාශ වෙන නිසා එහි ඇති කිසිවක් සර්වබලධාරී නොවේ. (විනාශ වීමට පිටස්තර හේතු බලපායි) |
| 11 | එක් සර්වබලධාරී තත්වයක්ම විය යුතුය. (සර්වබලධාරී දෙදෙනෙකුට එකට සිටිය නොහැක). | විශ්වයන් එකකට වඩා තිබිය හැක. |
| 12 | සර්වබලධාරී නිසා මැවීමකින් නිර්මාණ කල හැක. තම බලයෙන් ඒවා විනාශ කිරීමටද, අහෝසි කිරීමටද පුළුවන. | විශ්වයට හෝ එහි සිටින අයට අලුතින් කිසිවක් මැවිය නොහැක. කිසිවක් විනාශ (අහෝසි) කළද නොහැක. |
| ඉහත කරුණු සලකා බැලීමේදී විශ්වයේ ආරම්භයට (සහ අවසානයට) හේතුව යම්කිසි බලයක් (ලෙස හෝ එය දෙවියන්වහන්සේ) විය යුතු යැයි තර්ක කල හැක. | | |

ආරම්භයේදී එම කොළයේ දකුණු පස හිස්ව තිබුණි. (විශ්වය/න් නොතිබුණි. සොබාදහමක් නොතිබුණි, කිසිම ධර්මතාවයක් නොතිබුණි). මෙසේ දකුණු පස හිස් තත්වයක තිබෙන අවස්ථාවේ මෙම කොළයේ වම් පස පහතින් සඳහන් කරන ආකාරයේ ආරම්භයක් සහ අවසානයක් නොමැතිව සදාකල්ම, ස්වයන්පෝෂී සහ සර්වබලධාරී තත්වයෙන් සිටින "හේතු රහිත තත්වය" ක් තිබිය යුතුය. එවන් තත්වයක් නොපවතී නම් දකුණු පස විශ්වය/න් බිහි වීමට බලපාන වෙනත් කිසිම ක්‍රමයක් නොමැත. මෙම වම්පස සඳහන් හේතු රහිත තත්වයට අප දෙවියන්වහන්සේ ලෙස නම් කරමු. ඔහු සර්වබලධාරීය. සර්වබලධාරී නම් එක්කෙනෙක් පමණක් විය යුතුය. ඔහු සදාකල් පවතින්නකි. ඔහු ස්වයන්පෝෂීය. ඔහු සර්වබලධාරී නිසා ඔහුට මැවීම් හරහා නිර්මාණ බිහි කළ හැක.

අතීතයේ දෙවියන්වහන්සේ පමණක් තනිව සිටි අවස්ථාවක ඔහු අදහස් කර ඔහුගේ හැකියාවෙන් (මෙහි දකුණු පස පෙදෙසෙහි) අලුතින් නිර්මාණ බිහිකිරීම ආරම්භ කෙරිණ. "දෙවියන්ගේ එම නිර්මාණ සොබාදහම ලෙස හැඳින්විය හැක". එසේ අලුතින් ඇති කරන නිර්මාණ වල (එනම් ඔහු ඇති කළ සොබාදහමේ) සෑම තත්වයකටම, සෑම දෙයකටම ඔහු ඒවා කෙසේ පැවතිය යුතු යැයි දක්වමින් ආඥා පළ කෙරිණ. මෙම ආඥා හෙවත් නීති පද්ධතිය සොබාදහමට බල පවත්නා නීති පද්ධතියයි. එම නීති පද්ධතිය (අරාබි භාශාවෙන්) හඳුන්වන්නේ ඉස්ලාම් ලෙසයි.

**[සැ: යු] මෙහිදී අරාබි වචන භාවිතා කිරීමට හේතුව නම් දෙවියන්ගේ අවසන් දිව්‍ය එළිදරව්ව අරාබි බසින් පහළ වී ඇති නිසයි.**

මෙම ඉස්ලාම් යන වචනය **අස් + සලාම්** යන වචන වල එකතුවකින් සෑදී ඇත. **අස්සලාම් යනු "සාමය" යන්නයි**. එනම් දෙවියන් තමා නිර්මාණය කළ සොබාදහමට ඉදිරිපත් කල දහම හෙවත් නීතිරීති හෝ ආඥාව ඉස්ලාමයයි. එනම් "සාමයේ දහමයි".

එයට අනුව සූර්යයාට අදාල දහම (හෙවත් දෙවියන් තම නිර්මාණයක් වන සූර්යයාට දුන් ආඥාව) ඉස්ලාම් දහමයි. එනම් සූර්යයාට දෙවියන් නිකුත් කල අණ යි.

සූර්යයා තම නිර්මාතෘගේ අණට යටහත්ව, කීකරුව, අවනතව කටයුතු කරයි. සූර්යයා තම ආලෝකය නිශ්චිත ප්‍රමානයෙන් නිකුත් කරමින්ද, තම නිශ්චිත ගමන්මාර්ගයේ ගමන් කරමින්ද පවතින්නේ එනිසයි. සූර්යයා තම කාර්යය 100% ක්ම නිවැරදිව ඉටු කරමින් සොබාදහමේ සාමය පවත්වා ගැනීමට දායක වෙයි.

පෘතුවියද එසේමය. චන්ද්‍රයාද එසේමය. සෑම ආකාශ වස්තුවක්ම ක්‍රියාත්මකවන්නේ තම නිර්මාතෘවරයාගේ අණට අවනතව, යටහත්ව සහ කීකරුවය. එනිසා මුළු විශ්වය පුරාම ඉස්ලාමය ක්‍රියාත්මකයි. විශ්වය පුරාම සාමය පවතී. මුළු විශ්වයටම බලපවත්නා ධර්මතාවය එහි නිර්මාතෘ ගේ ආඥාවයි. ඔහු සියල්ල නිර්මාණය කර, ඒවා සංවර්ධනය කරමින් පෝෂණය කරමින් සහ පරිපාලනය කරමින් සිටී.

පෘතුවිය තුල ඇති සෑම අංශුවක්ම ක්‍රියාත්මක වන්නේ ඒවායේ නිර්මාතෘගේ දේව නීතියට අවනතව, යටහත්ව සහ කීකරුවයි. සෑම ශාකයක්ම සහ සෑම සත්ව ශරීරයක්ම ක්‍රියාත්මක වන්නේ තමන්ගේ නිර්මාතෘ තමන්ට නියම කර ඇති ආඥාවට අනුවය. එනිසා සෑම ජීවී ශරීරයක්ම තම ආගම (තම මාර්ගෝපදේශය) ලෙස දේව අණ හෙවත් ඉස්ලාමය පවත්වා ගනී.

ලොකු හෝ කුඩා සෑම සතෙක්ම තම ශරීරයෙනුත්, තම සිතිනුත් තම නිර්මාතෘගේ අණට අනුවම ජීවත් වේ. කුරුල්ලන් දේශ දේශාන්තර වලට සංචාරය කරන්නේද, නැවත ඔවුන්ගේ මුල් පදිංචි ස්ථානය කරා පියාඹා එන්නේද තම නිර්මාතෘගේ අණට අනුවය. දෙවියන් ඔවුන්ට එම හැකියාව ලබා දී ඇත.

බොහෝමයක් ශාක සහ සතුන් තම වර්ගයා බෝ කරන්නේ වසරේ නිශ්චිත කාලයකදීය. අනිකුත් කාල වල ඔවුන් ලිංගික කටයුත්තේ නියැලෙන්නේ නැත. එයට හේතුව, දෙවියන් විසින් ඔවුන්ට දී ඇති ආඥාව එයයි. ඔවුන් එයට යටහත්ව, අවනතව සහ කීකරුව කටයුතු කරයි.

බීජයකින් පැළයක් හටගෙන එය විශාලවී එමගින් නැවත බීජ නිකුත් කිරීම දක්වා එය තුල සිදුවෙන සියළුම ක්‍රියාදාමයන් සිදුවන්නේ එහි නිර්මාතෘගේ සැලැස්මට සහ ආඥාවට අනුවමය. සතුන්ද තම ජීවන චක්‍රය තුල විවිධ අවස්ථාවන් පසුකර

යන්නේ ඔවුන්ගේ නිර්මාතෘ වන දෙවියන්වහන්සේගේ සැලැස්මට සහ ආාක්ඥාවට අනුවය. .

ඒ අනුව සෑම ශාකයකම සහ සෑම සතෙකුගේම දහම ඉස්ලාම් දහමයි.

සොබාදහමේ ඇති සෑම (ඝන, ද්‍රව, වායු) වස්තුවක්ම, සෑම ජීවී සෛලයක්ම, සෑම ශරීරයක්ම, සාමය රකින්නන් වේ, සාමයට අනුව කටයුතු කරන්නන් වේ, දෙවියන්ට හෙවත් තම නිර්මාතෘට අවනත වූවන්ය. එනිසා ඒ සියල්ලක්ම මුස්ලිම්ය. ඒ සියල්ලෙහි දහම සොබාදහමේ දහම හෙවත් ඉස්ලාම්ය.

දෙවියන් විසින් නිර්මාණය කළ ලොකු හෝ කුඩා ඕනෑම වස්තුවක්, ඕනෑම ජීවී සෛලයක්, ඕනෑම ජීවී ශරීරයක් තම නිර්මාතෘ තමන් වෙත පළ කළ ආාක්ඥාව හෙවත් අණට අවනතව, යටහත්ව සහ කීකරුව ප්‍රතිචාර දක්වයි නම්, ඒ අණට අනුව ක්‍රියා කරයි නම් ඒවා සොභා දහමේ දහමට අනුකූලව පවතින්නන් වේ. සොබාදහමේ සාමය රකින්නන් වේ. මෙයට ඉස්ලාමය තුල (අරාබි භාශාවෙන්) මුස්ලිම් යනුවෙන් හඳුන්වයි. එම වචනය සෑදී ඇති ආකාරය බලන්න.

අරාබි ව්‍යාකරණ වලට අනුව ක්‍රියාව ඉදිරියට "මු" දැමූ විට එය "ක්‍රියාව කරන්නා" බවට පත් වේ. එයට අනුව, සලාම් යන වචනය ඉදිරියට මු දැමූ පසු මු+සලාම් එකතු වී මුස්ලිම් යන්න සෑදේ. එහි අර්ථය සාමය රකින්නා, සාමය පවත්වාගෙන යන්නා, දේව නීතියට අනුව කටයුතු කරන්නා ලෙස පෙන්වා දිය හැක.

අජීවී වස්තූන්ද, ශාකද, සතුන් සියල්ලක්මද දේව නීතියට අනුවම කටයුතු කරන නිසා ඒ සියල්ලද මුස්ලිම් ලෙස හඳුන්වා දිය හැක.

එසේම, දෙවියන්වහන්සේගේ තවත් ශ්‍රේෂ්ඨ නිර්මාණාත්මක ජීවීන් සමූහයක් වන දේවදූතයන් හෙවත් මලායිකාවරුන්ද මුස්ලිම් වේ. ඔවුනුත් 100%ක්ම තම නිර්මාතෘගේ ආාක්ඥාවට අවනතව යටහත්ව කීකරුව සිටී.

ඉහත සඳහන් සියල්ලගේම දහම සොභාදහමේ දහමයි.

- **දැන් මිනිසාගේ දහම නිවැරදිව හඳුනා ගනිමු.**

සියළුම මිනිසුන්ගේ ශරීරද තම නිර්මාතෘට අවනතය, යටහත්ය, කීකරුය. සෑම අවයවයක්ම, සෑම සෛලයක්ම අදහන ආගම සොභා දහමේ දහම වන ඉස්ලාමයයි. එනම් ඒවායේ නිර්මාතෘ ඒවාට දී ඇති ආඥාවන් ක්‍රියාවට නැගීමයි. එනිසා ඒවාද මුස්ලිම්ය. හදවත මුස්ලිම්ය, දිව මුස්ලිම්ය, වකුගඩුව මුස්ලිම්ය. අපගේ සෑම සෛලයක්ම, සෑම අවයවයක්ම ක්‍රියා කරන්නේ ඒවා වෙත තම නිර්මාතෘ නියම කර ඇති අණට අනුවම නිසා ඒ සියල්ලක්ම මුස්ලිම්ය. එනිසා මිනිසාගේ ශරීරය මුස්ලිම්ය. මියගිය මිනිස් ශරීරයද දිරාපත් වී නැවත පස් බවටම පත්වන්නේද සොභාදහමේ නීතියටම අනුවමය. එයද දෙවියන්ගේ ආඥාවයි.

**නමුත් මිනිසා සොභා දහමේ ඇති අජීවී වස්තූන්ගෙන්ද, සතුන්ගෙන්ද, මලායිකාවරුන්ගෙන්ද වෙනස් වන එක් කාරනාවක් ඇත. එනම් මිනිසාට තම සිතින් මුස්ලිම් හෝ මුස්ලිම් නොවන කෙනෙකු විය හැක.**

දෙවියන් මිනිසාව පෘතුවියෙහි නියෝජිතයා ලෙස එවා ඔහුට නිදහස් සිතුවිලි ගැනීමේ අවස්ථාව ලබා දී ඔහු එය භාවිතා කරමින් තම නියෝජිත භාවය පෘතුවිය තුල කෙසේ ඉටුකරන්නේද යන්න පරීක්ෂාවකට ලක් කර ඇත.

සමහර මිනිසුන් තම සිතුවිල්ලෙන් තම නිර්මාතෘ ගෙන් දුරස්වී තමන්ට නිර්මාතෘ කෙනෙකු නැතැයි අදහස් කරමින්ද, සොභාදහම ඉබේ හටගත් එකක් යැයි අදහස් කරමින්ද ජීවත් වේ. තම සිතුවිල්ලෙන් මවාගත් නව දහම් තුල ජීවත් වෙමින් කාලය ගත කරයි. විශ්වයේ ඇති සියල්ල දෙවියන්ගේ ආඥාවට අවනතව, යටහත්ව සහ කීකරුව (සොබාදහමේ දහමත් එක්ක) එකට සිටින විට ඔහු මනසින් එයට පිටින් ජීවත් වේ. ඔහු තම සිතින් මවාගත් විවිධාකාරයේ වෙනත් දහම් සමග තම ජීවිත ගත කරයි. මොවුන් සාමයේ දහමට පිටින් සිටින අය නිසා ඔවුන්ට මුස්ලිම් නොවන අය ලෙස හඳුන්වනු ලැබේ. ඔවුන්ව බෞද්දයින්, හින්දුවරුන්, ක්‍රිස්තියානුවන්, යහුදීන්, නිරාගමිකයින් යන නම්වලින් සමාජය තුල සිටිනු අපට දැකිය හැක. හින්දූන්, යහුදිවරුන් සහ ක්‍රිස්තියානිවරුන් දෙවියන්ව පිළිගන්නා නමුත් ඔවුන් දෙවියන්ගේ මාර්ගෝපදේශයන් නිවැරදි ආකාරයෙන් අනුගමනය නොකරන නිසා ඔවුනුත් මුස්ලිම් නොවන අය ලෙසම හඳුන්වයි. මොවුන්ගේ ශරීර මුස්ලිම්ය, මනසින් මුස්ලිම් නොවේ.

සමහර මිනිසුන් තම නිර්මාතෘ විසින් තමාට එවා ඇති නබිවරුන්ව සහ මාර්ගෝපදේශ නිසි අයුරින් පිළිගනිමින් සොභාදහමට හිමි දහම හෙවත් ඉස්ලාම් දහම තුලම ජීවත් වීමට උත්සහ ගනී. එම මිනිසුන් මුස්ලිම්වරුන් ලෙස හඳුන්වනු ලබයි. (මොවුන්ගේ ශරීර සහ මනස යන දෙකම මුස්ලිම්ය).

මරණින් පසු අප සියල්ල නැවත තම නිර්මාතෘ හමුවට යා යුතුව ඇති අතර එහිදී තම තමන් මෙලොවදී ඇදහූ ආගම් ගැන ප්‍රශ්න කරන බව දෙවිඳුන් පවසා ඇත. දෙවියන්ගේ ආඥාව හෙවත් සොබදහමේ දහමට පිටින් ජීවත්වී මිය ගිය අයට එදිනදී කණගාටුදායක ඉරණමකට මුහුණ දීමට සිදුවන බව මිනිසුන් සියල්ලගේම නිර්මාතෘ තම අවසන් මාර්ගෝපදේශය වන අල් කුරාණය තුලින් අනතුරු අඟවා ඇත. (මෙලොවදී මුස්ලිම්වරුන් ලෙස පෙනී සිටි අය ගැනද සැබෑ විනිශ්චය දෙන්නේ එදිනය).

සොබාදහම (ඔවුන්ට නියමිත ආකාර වලින්) තම නිර්මාතෘව නමදිමින් සිටින බව දෙවියන්වහන්සේ අපට මෙසේ දැනුවත් කර ඇත.

*අහස් හිද භූමියෙහිද ඇති දෑ සියල්ල (ඒවා) කැමති උවද, අකමැති උවද, අල්ලාහ්ට හිස නවා (අනිවාර්යයෙන්ම අවනතම) වන්නේය; (13:15)*

*අහස් හිද භූමියෙහිද ඇති අනිත් ජීවීන්ද අල්ලාහ්ටම හිස නවා නමදින්නාහ. මලායිකාවරුන්ද එසේමය. ඔවුන් (ඉබ්ලීස් මෙන් ඔහුට සුජූද් නොකර) උඩඟු බස් දොඩන්නේ නැත. ඔවුන් තමන්ට උඩින් ඇති තමන්ගේ දෙවියන්ට යටත් වී තමන්ට දෙන ලද නියෝගයෙන්ම සිටින්නාහ. (16:49,50)*

*(නබියේ!) අහස් හී සිටින්නන්ද, භූමියෙහි සිටින්නන්ද, සූර්යයාද, චන්ද්‍රයාද, තාරුකාද, කඳුද, ගස්ද, සතුන්ද, මිනිසුන්ගෙන් බොහෝමයක් දෙනාද නියත වශයෙන්ම අල්ලාහ්ට සුජූද් කර, නමදින්නහ යන්න ඔබ නොදැක්කෙහිද?;(22:18)*

*අහස් හිද, භූමියෙහිද ඇති දැයද, (මේවා අතර ඇති දැයද, විශේෂයෙන්ම) පක්ෂීන්ද, (තමන්ගේ) අත් තටු විහිදා (පියාඹමින්) නියත වශයෙන්ම අල්ලාහ්ව සුවිශුද්ධ කරමින් සිටින බව (නබියේ!) ඔබ නුදුටුවෙහිද? මේවා සියල්ල තමන් සුවිශුද්ධ කරමින් නැමදිය යුතු ආකාරයට නියත වශයෙන්ම දැනගෙනම සිටින්නාහ. අල්ලාහ්ද ඔවුන් කරමින් සිටින දැය හොඳින් දන්නෙකු වශයෙන් සිටින්නේය. (24:41)*

*[මිනිසුන්ගෙන් සහ ජින්වරුන්ගෙන්], (දෙවියන්ට අවනත වන්නන් හා දෙවියන්ට වෙනස්කම් කරන්නන් ආදී) මේ දෙකොට්ඨාශයම තමන්ගේ දෙවියන් ගැන තර්ක කරමින් සිටින්නාහ; (22:19)*

දෙවියන් වහන්සේ අල් කුර්ආනය තුළින් ස්වභාවධර්මය ගැන පුළුල් ලෙස කථා කර ඇත. එහි වාක්‍ය කිහිපයක් පහත දැක්වේ.

*අහස් හිද භූමියෙහිද, ඔවුන්ට ඉදිරියෙන්ද පසුපසින්ද, ඇති දැය ඔවුන් අවධානය කර බැලුවේ නැද්ද?; (34:9)*

*ඒවා කිසිවක් නොමැතිව තමන් විසින්ම ඇති කළෙහුද? නැතහොත් මොවුන්, තමන්ට තමන්ම නිර්මාණය කර ගත්තෙහුද? නැතහොත් අහස්ද භූමියද ඔවුන් නිර්මාණය කළෙහුද? නැත. මේ සියල්ල නිර්මාණය කළ අය දෙවියන්ය; (52:35,36)*

*නියත වශයෙන්ම ඔබගේ දෙවියන් වන අල්ලාහ් අහස්ද, භූමියද දින හයකින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජධානිය ස්ථාවර කර තැබුවේය. ඔහුම රාත්‍රියෙන් දහවල වසා දමන්නේය. (දහවලෙන් රාත්‍රිය වසා දමන්නේය). එය ඉතාමත් තීව්‍ර වශයෙන්ම එකකට පිටුපසින් එකක් වශයෙන් පිළිවෙලින් සිදුවෙමින් පවතින්නේය. සූර්යයාද, චන්ද්‍රයාද, තාරකාවන්ද ඔහුගේ නියෝගයන්ට ඇතුළත් වන්නේය. උත්පාදනයන්ද, එහි පාලනයද ඔහුටම අයත් දැය නොවේද? සකළ ලෝකයන්ම උත්පාදනය කර, පෝෂනය කර, සංවර්ධනය කරන අල්ලාහ් ඉමහත් භාග්‍යවන්තයෙකි. (7:54) [මෙම දින අල්ලාහ්ගේ සන්නිධානයේ දිනය. පෘතුවි දින නොවේ].*

*අහස් හතක්ද, ඒවා මෙන් භූමියද අල්ලාහ්ම උත්පාදනය කළේය. ඒවා අතර (දිනපතා සිදුවිය හැකි සියළු කාරණාවන් ගැන වූ) නියෝගයන් පහළ කරමින්ම සිටින්නේය; (65:12)*

*වලාකුළු උසුළාගෙන යන සුළඟද අපිම යැව්වෙමු. එම වලාකුළෙන් වැස්සද අපිම වසින්නට සලස්වන්නෙමු. එය අපි ඔබට පොවන්නෙමු. (වැස්සෙහි ජලය වලාකුළෙහි) ඔබ එක්රැස් කර තැබුවේ නැත. (අපිම එක්රැස් කරමු) (15:22)*

*ඔබටද, ඔබ ආහාර දී (හදා වඩා) නොගන්නා වූ (අහස් හීද, භූමියෙහිද වාසය කරන) ජීවීන් සියල්ලටද ජීවත් වීමට අවශ්‍යය වස්තූන්ද අපිම එහි සැලසුම් කළෙමු. (15:20)*

*(ඔබ සංචාරය කරණු පිනිස) නැව ඔබට වසඟ කර දී, තම නියෝගයන්ට අනුව සාගරයෙහි තරනය කරන්නට සලස්වන්නේය. (ඇළ මාර්ගද) ඔබ කැමති ආකාරයට තරනය කිරීමට පහසුකම් ලබා දුන්නේය. (14:32)*

*ඔහුම රාත්‍රියද, දහවලද (ඇති කළේය). සූර්යයාද චන්ද්‍රයාද උත්පාදනය කළේය. (මේවා තමන්ගේ සීමාවන් තුළ) පිහිනා යන්නේය. (21:33)*

*බීජද, ඇටද නියත වශයෙන්ම අල්ලාහ්ම පැලී (පැළවෙන්නට) සලස්වන්නේය. මරණයට පත්වූ දැයෙන් පණ ඇති දැය ඔහු ඉකුත් කරන්නේය. පණ ඇති දැයෙන් මළ දැයද ඔහු නුකුත් කරන්නේය. ඔහුම ඔබගේ දෙවියන්ය. එබැවින් ඔබ (ඔහු හැර දමා) කොහේ නම් දුවන්නෙහුද්? (6:95)*

*නියත වශයෙන්ම අල්ලාහ්ගේ සන්නිධානයෙහි (බාර ගනු ලැබූ) ධර්මය ඉස්ලාමයයි. (3:19)*

*ඔහුම මෙලොවෙහි ඔබව නියෝජිතයින් බවට නිර්මාණය කළේය. එබැවින් (ඔබගෙන්) කවුරුන් ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ගේ ප්‍රතික්ෂේපයේ විනාශය ඔවුන් කෙරෙහි පවරනු ලැබේ; (35:39)*

*(නබියේ!) කවුරුන් මෙලොව ජීවිතයෙන් මත් වී තමන්ගේ ධර්මය පුහු සෙල්ලමක් වශයෙන්ද, (විහිළුවල් වශයෙන්ද) ඇර ගත්තෝද, ඔවුන්ව (ඔවුන්ගේ*

*ගමනෙහි) අත්හැර දමනු. එහෙත් 'සෑම ආත්මයක්ම තම (නපුරු) ක්‍රියාවන්ගේ හේතුවෙන් (විනිශ්චය දිනදී) විපතට ඇතුළු වනු ඇත' යන සත්‍යය ඔබ (ඔවුන්ට) මතක් කර දෙනු; (6:70)*

*(තවද) අල්ලාහ් විශ්වාසවන්තයින්ගේ ආරක්ෂකයාය. ඔවුන්ව අන්ධකාරයෙන් (පිටතට ගෙන) ඉමහත් ආලෝකය දෙසට ඇතුළු කරන්නේය. නමුත් ප්‍රතික්ෂේප කරන්නන්ට නම්, ඔවුන්ගේ ආරක්ෂකයින් ෂෙයිතාන්වරුන්ය. ඒවා ඔවුන්ව ඉමහත් ආලෝකයෙන් (පහ කර) අන්ධකාරය දෙසට ඇතුළු කරන්නේය. (තවද) ඔවුන් නිරාවාසීන්ය. (තවද) ඔවුන් එහි සදහටම රැඳී සිටිනු ඇත. (2:257)*

---

## සර්වබලධාරී දෙවියන් වහන්සේ සහ ඔහුගේ නිර්මාණ (හැඳින්වීම).

සෑම මිනිසෙක්ම දැනුවත්ව හෝ නොදැනුවත්ව මේ ලෝකය තුල සිදු කරනුයේ සර්වබලධාරී දෙවියන් වහන්සේගේ නිර්මාණ ගැන දැන ගැනීමට සහ ඒවා බුක්ති විඳීමට කරන මෙහෙයුමයි.

සමහරු එය අවබෝදයෙන් කරන අතර සමහරු එය අනවබෝදයෙන් කරමින් සිටී. විශ්වය සහ එහි ඇති දේ ගැන මිනිසා පර්යේෂණ පවත්වමින් ඉතා වෙහෙසෙමින් සොයන්නේ දෙවිඳුන් විසින් සිදුකළ නිර්මාණ ගැනමය. එය විශ්වයේ විශාලත්වය ගැන සෙවීමක් ගැන හෝ පළතුරක රස විඳීමක් ගැන හෝ විය හැකිය. මිනිසා සොයන හෝ බුක්ති විඳින සෑම දෙයකින්ම දෙවියන්ගේ ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු වේ.

සැබැවින්ම, මිනිසාගේ මෙලොව ජීවිතයේ අරමුණ විය යුත්තේද විශ්වයේ සහ තමන්ගේ නිර්මාතෘගේ මහිමය ගැන සොයමින්, ඔහුගේ නිර්මාණ බුක්ති විඳිමින්, ඔහුව ඉහලින්ම ප්‍රසංශා කරමින්, ඔහු පෙන්වා දුන් මාර්ගයේ ගමන් කිරීමය.

ඔබ වෛද්‍යවරයෙක් නම්, ඔබ මෙතෙක් කල් වෙහෙස මහන්සි වී ඉගන ගත්තේ මොනවා ගැනද? දෙවියන්ගේ නිර්මාණ ගැන නොවේද? ඔබ ඔහුව හඳුනා

නොගන්න තාක් කල් ඔබට ඔබ ආ ගමන පිළිබඳව සැබෑ සතුටක් අත් විඳිය නොහැක. අධ්‍යාපනය සමබර කරගෙන නැත. වැදගත්ම අංශයක් ඔබට මග හැරී ඇත. දෙවියන්ව හඳුනා නොගෙන ඔබට ඔබ ගැනවත් ඔබ ප්‍රතිකාර කරන රෝගීන් ගැනවත්, ඔබ සිටිනා සොබාදහම ගැනවත් (මේවා මොනවාදැයි) වටහා ගත නොහැක. (හැකිනම් උත්සහ කර බලන්න. ඔබේ උත්සහය ඵල රහිත වනු නියතය).

දෙවියන් නොමැති වූවා නම් සොබාදහමක් බිහිවන්නේ නැත. මේ බව ඉදිරි ලිපිවලින් පැහැදිළි කර දී ඇත.

ඔබ ගෘහණියක් නම් ඔබ ආහාර සඳහා පිළියෙල කිරීමට භාවිතා කරන්නේ මොනවාද? ඒ සියල්ල දෙවියන්ගේ නිර්මාණ නොවේද?

ඔබ කණ්නාඩියක් ඉදිරියෙන් සිටගත් විට ඔබ දකින්නේ කාගේ නිර්මාණයක්ද?

ඔබ (සියල්ලෙහි) නිර්මාතෘව හඳුනා නොගත හොත් ඔබ පරාජිතයෙක් ලෙසින්ම මෙලොව හැර යනු නියතය. මරණින් පසු ඔබ එය වටහා ගනු ඇත. නමුත් එවිට ඔබ ප්‍රමාදය. ඔබට සැබෑ සතුටින් සහ නිදහස් මනසින් යුතුව මෙලොව හැර යන්න ඕනි නම් මෙම සත්‍යය වටහා ගන්න. ඔබ ඔබේ නිර්මාතෘව හඳුනා ගෙන ඔහුව ප්‍රශංසා කරන්න. ඔහු වෙතින් පැමිණි අපි සියල්ල නැවත ඔහු වෙතම යා යුතුව ඇත. එයයි පරම සත්‍යය. එයට සාධක ඔබ මෙහි දකීවි.

---

## දෙවියන් යනු කෙබඳු කෙනෙක්ද?

ඔබ ජීවිත කාලය තුල දෙවියෙකුව රූපයකින්, පිළිමයකින් හෝ මිනිස් වෙසකින් දැක ඇත්නම් ඒ සියල්ල හරහා ඔබ රැවටී ඇත. ඔබ සැබෑවටම දැක ඇත්තේ දෙවි කෙනෙකු දැයි නැවත කල්පනා කර බලන්න. සැබෑ දෙවියන් ඒ සියල්ලට වඩා වෙනස්ය. එනිසයි ඔහුට "දෙවියන්" ලෙස ආමන්ත්‍රණය කරන්නේ.

එම සර්වබලධාරී දෙවියන්වහන්සේ කොතරම් ශ්‍රේෂ්ඨද යත්, අපට උන්වහන්සේව අපගේ පියවි ඇසින් දැකිය නොහැක. මනසින් උන්වහන්සේගේ බලසම්පන්නකම අපට සිතා ගැනීමටවත් නොහැකිය.

දෙවියන් සමීපයට ළඟා විය හැකි කිසිවෙකුත් නැත. එනිසා දෙවියන් විසින්ම තමා ගැන අප වෙත දන්වා ඇති තොරතුරු හරහා මිස දෙවියන් ගැන අපට දැන ගත හැකි වෙන කිසිම ක්‍රමයක්ද නැත. බුදු දහමේ පවසන ආකාරයට බුදුන් වහන්සේ සිත දියුණු කර මණසින් බැලුවත් දෙවියන් ගැන සියළු තොරතුරු දැන ගත නොහැක. සර්වබලධාරී ස්වභාවයෙන් සදාකල් සිටින දෙවියන්වහන්සේගේ පෞද්ගලික තොරතුරු කෙසේ නම් වෙනත් අය දැනගන්නද? දෙවියන් එවැන්නක් සඳහා ඉඩ තබාවී නම් ඔහුගේ සර්වබලධාරීකමට සහ සදාකල් පැවතීමට එයම අභියෝගයක් වනු ඇත. එනිසා කෙතරම් සිත දියුණු කර ගත් කෙනෙක් උනත් ඔහු මුළු විශ්වයම ගැන දැනගත්තත් දෙවියන් ගැන දැන ගැනීමට ඉඩ නැත. එයට අනුව දෙවියන්ට පිටින් සිටින කිසිවෙක් සියල්ල දන්නා කෙනෙක් ලෙස නම් කළ නොහැක.

එනිසා දෙවියන් ගැන අපට දැනගත හැකි එකම මාර්ගය දෙවියන්මයි.

එම මාර්ගය කුමක්දැයි මුලින්ම වටහා ගෙන සිටිමු.

පැරණි ග්‍රංථයකින් උපුටා ගත් පහත වැකි දෙස හොඳින් බලන්න. එම ග්‍රංථය මිනිසාගේත් අප සිටින විශ්වයේත් හිමිකරු වෙතින් පහළ කළ දෙයක් බවත්, එහි කිසිදු වරදක්, අඩුපාඩුවක්, සැකයක් නොමැති බවත් එහි සහතික කර ඇත. එය තුල සම්පූර්ණ සත්‍යය සඳහන්ව ඇති බවත්, එය හරහා දෙවියන් වන තමා ගැන තොරතුරු දැනගන්නට සලස්වා ඇති බවත් සඳහන් ව තිබේ. එනම්, දෙවියන් ගැන තොරතුරු දෙවියන්ම අපට පවසා ඇත. එය ගැඹුරින් අධ්‍යයනය කර තහවුරු කර ගැනීම අපගේ වගකීමක්ය. එම ග්‍රංථය වෙන කිසිවක් නොව, මීට වසර 1440 කට පමණ පෙර දෙවියන් විසින් පහළ කළ, අදටත් කිසිඳු වෙනසකට ලක් නොවී, පහළ වූ ආකාරයටම පවතින ශුද්ධ වූ අල් කුරාණයයි.

දෙවියන් ගැන අල් කුරාණයෙහි මෙසේ සඳහන් වේ

*මිනිසුනේ! ඔබගේ දෙවියන් වෙතින් (ප්‍රමාණවත්) සාධකයන් නියත වශයෙන්ම ඔබ වෙත පැමිණ ඇත. පැහැදිළි ඉමහත් ආලෝකයම (ශුද්ධ වූ කුර්ආනය) අපි ඔබට පහළ කර ඇත්තෙමු. (4:174)*

*ශුද්ධ වූ කුරානය වන මෙය ධර්ම පුස්තකයයි. මෙහි කිසිම සැකයක් නැත. භය භක්තිකයින්ට (මෙය) ඍජු මාර්ගය පෙන්වන්නේය. (2:2)*

*(නබියේ!) නියත වශයෙන්ම අපි මිනිසුන්ගේ යහපත සඳහාම සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් පිරි මෙම ධර්මය ඔබ වෙත පහළ කළෙමු. එබැවින් කවුරුන් (මෙය) අනුගමනය කර කටයුතු කරන්නේද, ඔහුටම එය හොඳකි. කවුරුන් එයින් මාර්ගය වැරද යන්නේද, එය ඔහුටම නපුරක් වශයෙන් අවසන් වනු ඇත; (39:41) මීට පෙරද මිනිසුන්ට ඍජු මාර්ගෝපදේශයන් වශයෙන් තිබුනු (පව්, පින්) වෙන්කර දැණුම් දිය හැකි (අනිත්) දැයද පහළ කර ඇත්තේය. (3:4)*

*අහස් හා භූමියෙහි පාලනය අල්ලාහ්ටම අයත්ය. සියල්ල කෙරෙහි අල්ලාහ් බලසම්පන්නය. (3:189)*

*නියත වශයෙන්ම ඔබගේ දෙවියන් වන අල්ලාහ් අහස්ද, භූමියද (දෙවියන්ගේ සන්නිධානයේ) දින හය*

*කින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජධානිය ස්ථාවර කර තැබුවේය. ඔහුම රාත්‍රියෙන් දහවල වසා දමන්නේය. (දහවලෙන් රාත්‍රිය වසා දමන්නේය). එය ඉතාමත් තීව්‍ර වශයෙන්ම එකකට පිටුපසින් එකක් වශයෙන් පිළිවෙලින් සිදුවෙමින් පවතින්නේය. සූර්යයාද, චන්ද්‍රයාද, තාරකාවන්ද ඔහුගේ නියෝගයන්ට ඇතුළත් වන්නේය. උත්පාදනයන්ද, එහි පාලනයද ඔහුටම අයත් දැය නොවේද? සකළ ලෝකයන්ම උත්පාදනය කර, පෝෂනය කර, සංවර්ධනය කරන අල්ලාහ් ඉමහත් භාග්‍යවන්තයෙකි. (7:54)*

*(නබියේ! මිනිසුන්ට) ඔබ මෙසේ පවසනු: අල්ලාහ් එක් කෙනෙකි. (එම) අල්ලාහ් (කිසිවෙකුගේ) අවශ්‍යතාවයක් නොවන්නෙකි. (සියල්ලන්ම ඔහුගේ වරප්‍රසාදයන්ම බලාපොරොත්තුවෙන් සිටින්නාහ). ඔහු (කිසිවෙකුත්) ප්‍රසූත කළේ*

*නැත. (කිසිවෙකු විසින්) ප්‍රසූත කරනු ලැබුවේද නැත. (එබැවින් ඔහුට පියෙක් ද නැත. දරුවන් ද නැත). තවද ඔහුට සමාන කිසිවෙක්ද නැත. (112:1-4)*

*අල්ලාහ් (කෙතරම් ශ්‍රේෂ්ඨයෙකු වන්නේද යත්) ඔහු හැර, වෙන කිසිම දෙවියෙක් (ඇත්තෙන්න්ම) නැත. (ඔහු) අමරණීයයි. (කවදත්) ස්ථිරත්වන්තයි. ඔහුව තද නින්ද හෝ (සාමාන්‍ය)නින්ද හෝ පීඩාවට පත් කරන්නේ නැත. අහස් හා භූමියෙහි ඇති සියල්ල ඔහුටම අයත්ය. ඔහුගේ අනුමැතියෙන් තොර ඔහු වෙත (කවරෙකුවත්) කවුරුන්ට නම් මැදිහත්වී කතා කල හැකිද? ඔවුන් ඉදිරියේ ඇති දැයද, වෙන්ව ඇතින් තිබෙන දැයද, ඔහු හොඳින් දන්නේය. ඔහුගේ කැමැත්තෙන් තොර, ඔහු දන්නා දැයෙන් කිසිවක් (වෙන කිසිවෙකුටත්, තමන්ගේ දැනුමෙන්) දැනගත නොහැක. ඔහුගේ රාජ්‍යය අහස් හිද, භූමියෙ හිද පැතිරී ඇත. ඒ දෙකම (බේරාගෙන) ආරක්ශා කිරීම ඔහුට ආයාසයක් නැත. තවද, ඔහු ඉතාමත් ශ්‍රේෂ්ඨයෙකු හා ඉමහත් උසස් වන්තයෙකි. (2:255)*

සර්වබලධාරී දෙවියෙකු නම් ඔහු එයට සරිලන ස්වභාවකින් යුතු කෙනෙකු විය යුතුයි. දෙවියන් තමන්ගේ ස්වභාවය පහත ආකාරයට විවිධ නම් වලින් සහ ලක්ෂන වලින් පෙන්නුම් කර ඇත. අපට ඔහු ගැන වටහා ගැනීමට මෙම නම් වල ඇති අර්ථ වටහා ගැනීම සහ ඒවා ඔහුට ඇති බව විශ්වාස කිරීමත් ඔහු නොවන වෙනත් කිසිවෙකුට එවන් ස්වභාවයන් ඇත්දැයි සංසන්දනය කර බැලීමත් කළ හැක.

*එම අල්ලාහ්ම උත්පාදකයාය. (ඔහුම උත්පාදනයන් සැලසුම් කරන්නේය). හැඩරුව නිර්මාණය කරන්නාය. ඔහුට වෙනත් අලංකාරවත් ශුද්ධ වූ නාමයන් බොහෝමයක් ඇත්තේය. (59:24) අල්ලාහ්ට හොඳම නම් අයත් වේ, එබැවින් ඒවායින් ඔහුට ආයාචනා කරන්න; (7: 180) අල්ලාහ් - ඔහු හැර වෙනත් දෙවියෙකු නැත. හොඳම නම් උන් වහන්සේටය. (20: 8) ඔහු අල්ලාහ්, මැවුම්කරු,, නව නිපැයුම්කරු,, විලාසිතාකරුවා ය; හොඳම නම් උන්වහන්සේටය. (59:24)*

අවසන් දිව්‍ය හෙළිදරව්ව වන ශුද්ධ වූ අල් කුරාණය තුල දෙවියන්ගේ නාමයන් සහ ගුණාංගයන් බොහෝමයක් සඳහන්ව ඇත. (ඒවා පහතින් පෙන්වා දී ඇත). ඒ සෑම එකකින්ම දෙවියන්ගේ මහිමය පෙන්නුම් කරයි.

දෙවියන් යනු ඉහතින් විස්තර කළ සහ පහත සඳහන් නම් සහ ගුණාංගයන් ඇති කෙනෙකි. එනිසයි ලිපිය ආරම්භයේදීම සඳහන් කළේ ඔබ රූප වලින් දැක ඇති කිසිවක් දෙවිවරුන් ලෙස සැළකීම වැරදි බව. ඒවා කිසිවක් සත්‍යය දෙවියන් සතු මේ ගුණාංග සම්පූර්ණ කරන අය නොවේ. එනිසා ඒවාට දෙවියන් ලෙස ආමංත්‍රණය කල නොහැක. දෙවියන් යන නමින් සිටින්නේ එකම එක දෙවි කෙනෙක් පමණි. ඔහු සර්වබලධාරීය, ඔහුට සමාන කිසිවෙක් නැත.

සත්‍යය එකම දෙවියන්ව පහත සඳහන් නම් සහ ගුණාංග සහ ලක්ෂණ වලින් හඳුණා ගන්න.

මුලින්ම පහත උදාහරණ කිහිපය දෙස බලන්න. ඔහු, ඔහු ගැන පවසන එම ලක්ෂන ඔහු හැර වෙන කිසිවකට ආදේශ කළ හැකි අය සිටී දැයි බලන්න

"සියල්ල දන්නා, සියල්ල කෙරෙහි බලය ඇත්තා, සියල්ල නිර්මාණය කල තැනැත්තා, සියල්ල දකින්නා, සියල්ල අසන්නා, සදාකාලික තැනැත්තා..."

දැන් ඔබලා අසා ඇති කතරගම දෙවියන්ට හෝ වෙන ඕනෑම කෙනෙකුට ඉහත දෙවියන් සතු ගුණාංග තිබේද? නැත. (එනිසා කතරගම දෙවියන් දෙවිකෙනෙකු නොව). දෙවියෙකු නම් ඔහුට කිසිම දුර්වලතාවයක් තිබිය නොහැක. දුර්වලතා තිබේ නම් ඔවුන් "දෙවියන්" කියන වර්ගයට අයත් නොවේ. මෙලෙසයි දෙවියන් සහ දෙවියන් නොවන දේවල් වෙන් කරන්නෙ.

බෞද්ධ සාහිත්‍යය තුල හෝ හින්දු කෝවිල් වල, වලාකුළුවල, කැලෑ වල, ගස් උඩ හෝ සතුන් පිට ඇති කිසිම දෙවියෙකු (ලෙස නම කර ඇති ඒවා)ට මෙම සර්වබලධාරී දෙවියන්ගේ ලක්ෂන වලට සමාන කම් එකක් හෝ පෙන්විය නොහැක. එනිසා ඒ කිසිවක් දෙවිවරු ලෙස සැලකිය නොහැක. ඒවා ලොකු දෙවිවරු හෝ කුඩා දෙවිවරුද නොවේ. එවැනි ලොකු හෝ කුඩා ලෙස හෝ

දෙවිවරු වර්ග නැත. ඉන්නේ එකම එක සර්වබලධාරී දෙවියෙකු පමණි. ඔහුට පිටින් ඇති සියල්ල ඔහුගේ නිර්මාණය. ඒ නිර්මාණ කිසිවක් ඔහුට සමාන නැත.

සටහන: එකම සර්වබළදාරී දෙවියන් විසින් මලායිකාවරු නමින් හඳුන්වන දේව දූත වරුන්ව නම් විවිධ හැඩයන්, විවිධ හැකියාවන් සහ විවිධ ස්වරූප වලින් නිර්මාණය කර ඔහුගේ නිර්මාණ (විශ්වය/න්) පුරා සිටින සේ ව්‍යාප්ත කර ඇත. ඔවුන් ආලෝකයෙන් උත්පාදනය කල අයයි. එහෙත් ඔවුන් දෙවිවරුන් නොව. ඔවුන් දෙවියන්ගේ ශ්‍රේෂ්ඨ වූ සේවකයන් කණ්ඩායමකි. (සමහර විට වෙනත් ආගමිකයින් ඔවුන්ව දෙවිවරුන් ලෙස සළකමින් සිටිනවා හෝ අදහස් කරමින් සිටිනවා විය හැක. එහෙත් ඔවුන්ට මිනිසුන්ට සමාන රූප නැත)

**එකම දෙවියන්ගේ නම්, ලක්ෂණ සහ ගුණාංග පහත පරිදි වේ.**

අල්ලාහ් හැර මෙසේ තමන් දෙවියන් යැයි කියමින් තමන් ගැන තොරතුරු ඉදිරිපත් කළ කුමන හෝ වෙනත් දෙවියෙකු පිළිබඳ තොරතුරක් ගැන ඔබ අසා තිබේද? බොහෝ විට ඔබ අසා ඇත්තේ මිනිසුන් විසින් සාදන ලද දේව රූපවලට මිනිසුන් විසින්ම දාපු නම් සහ ලක්ෂනය. නමුත් සර්වබලධාරී අල්ලාහ් තමන් ගැන මෙසේ අපට දන්වා ඇත. මෙම නම් සහ ලක්ෂණ දෙවියන්ගේ අවසන් පණිවිඩය වන අල් කුරාණය තුලින් ලබා ගත්දෙවියන් සඳහා අරාබි වචනය.

**"අල්ලාහ්"** යනු දෙවියන් සඳහා සම්මත අරාබි වචනය වන අතර එය ඉංග්‍රීසියෙන් "The God", සිංහලෙන් "දෙවියන්" භාවිතා කරන ආකාරයටම භාවිතා වේ. The God, දෙවියන් යන වචන භාෂා පරිවර්තකයකින් අරාබි භාශාවට පරිවර්ථනය කර බැලූ විය එය "අල්ලාහ්" (ﷲ) ලෙස පරිවර්ථනය වේ. (එයින් වටහා ගත යුත්තේ අල්ලාහ් යනු දෙවියන් මිස අල්ලාහ් නමින් සිටින තවත් එක් දෙවියෙක් නොවන බවයි). දෙවියන්ව හැඳින්වීමට හෝ ඇමතීමට ඇති අද්විතීය නම ද මෙයයි. "අල්ලාහ්" දෙවියන්ගේ පුද්ගලික නාමය ලෙස සලකනු ලබන අතර එය සැමවිටම ඒකීය වන අතර එය තව්හිද් (දෙවියන්ගේ ඒකීයභාවය) පිළිබඳ ඉස්ලාමීය සංකල්පය පිළිබිඹු කරයි. මෙම නම ස්ත්‍රී පුරුෂ භාවයට අයත් නොවේ. කුරානය තුල ඇතැම් විට "ඔහු" වැනි සර්වනාම අල්ලාහ්ට ගරු කිරීම සඳහා

භාවිතා කරන අතර, අල්ලාහ් පිරිමි හෝ ගැහැණු නොවන බව තේරුම් ගැනීම වැදගත්ය. (සාධක ලෙස කුරාන් ආයත් කිහිපයක් ඉදිරිපත් කර ඇත.)

**අල් වාහිද්:-** එක්කෙනා. එකම දෙවි. උන්වහන්සේගේ සාරයෙහි අද්විතීය වන ඔහුට දෙවන, හවුල්කරුවෙකු, සම වයසේ මිතුරෙකු හෝ ප්‍රතිවාදියෙකු නොමැත. මැවිල්ලෙන් ඉස්මතු වන එකම ප්‍රභවය ඔහුය. ඒකදේවත්වය ලෙස හඳුන්වන්නේ එයයි. (Quran 14:48/ 39:4/ 40:16/ 2:163)

**අල් හක්:-** නිරපේක්ෂ සත්‍යයවන්තයා. සැබවින්ම පවතින තැනැත්තා කවුද, ඔහුගේ සාරය එකම යථාර්ථය වන අතර සත්‍යය එයයි. සියලු ධර්මිෂ්ඨකම් සහ යුක්තිය හෙළි කරන්නේ ඔහුය. ඔහුගේ වචනය, ක්‍රියා, විපාක, දඬුවම් සහ පොරොන්දුව සත්‍යයයි. (Quran- 22:62/24:25/31:30/43:29/21:112)

**අල් ජලීල්:-** තේජවන්ත, මහානුභාවසම්පන්න තැනැත්තා. බලයේ ශ්‍රේෂ්ඨත්වය සහ තත්වයේ මහිමය ආරෝපණය කරන තැනැත්තා. (Quran 55:27/20:5/17:110/55:78/7:143)

**අල් බාදි:-** අසමසම/ අද්විතීය ආරම්භකයා. පූර්ව ආකෘතියක් අනුගමනය නොකර හෝ මෙතෙක් පැවති කිසිම දෙයකට සමාන නොවී, අසමසම බලයකින් අද්විතීය නිර්මාණයන් බිහි කර ඇති තැනැත්තා ඔහු ය. (Quran 2:117/6:101)

**අල් හෙයි:-** සදාකාල ජීවනය ඇත්තා. ආරම්භයක් හෝ අවසානයක් නැති අඛණ්ඩ ජීවිතයක් ගත කරන තැනැත්තා. උන්වහන්සේගේ සියලු ගුණාංග සමඟ ඔහුගේ ජීවිතය පරිපූර්ණ අවසානයකි. උන්වහන්සේගේ පැවැත්මට අවසානයක් නැත. උන් වහන්සේ අන් සියල්ලන්ටම පෙර සිටි සේම, ඔහු නිමක් නැති කාලය පුරාම පවතිනු ඇත. (Quran 2:255/ 3:2/20:111/25:58/40:65)

**ඇහැද්:-** අද්විතීය එකම එක තැනැත්තා. උන්වහන්සේගේ සාරය හා ගුණාංග යන දෙකෙහිම අද්විතීය තැනැත්තා. උන් වහන්සේ හා සමාන කිසිවෙකු හෝ කිසිවක් නැත. (Quran 112:1)

**අස් සමද:-** අනන්ත, සදාකාලික තැනැත්තා. අවශ්‍යතාවන්ගෙන් තෘප්තිමත් තැනැත්තා. සදාකාලික ව සිටින. කිසිඳු බලපෑමට ලක් නොවන හා වෙනස් නොවන තැනැත්තා. සෑම අවශ්‍යතාවක්ම තමා විසින්ම සපුරාලිය හැකි තැනැත්තා ඔහුය. සියලු මැවිල්ල රඳා පවතින්නේ ඔහු මත වන අතර ඔහු කිසිවෙකු මත රඳා නොපවතී. (Quran 112:2)

**අල්-කදීර්:-** සියළුම හැකියාව ඇති, බලවත්ම තැනැත්තා. පරිපූර්ණ, සම්පූර්ණ බලය හා හැකියාව ඇති තැනැත්තා. අල්-කදීර්ගේ බලයෙන් මැවීම බිහි වේ, ජීවිතය හා මරණය ලබා දෙන අතර උන්වහන්සේගේ බලයෙන් නැවත නැඟිටීම හා විපාකය ස්ථාපිත වේ.අල් අලීම්:- සියල්ල දන්නා, සර්වඥ. දැනුම (ඉල්ම්) ඉගෙනීමෙන් ලබා නොගන්නා හෝ නොදැනුවත්කමට පෙරාතුව හෝ අමතක වීමේ ක්‍රියාවලිය අනුගමනය නොකරන තැනැත්තා. සෑම දෙයක්ම සිදුවීමට පෙර පවා ඔහු දැන සිටියි! (Quran 34:3/5;109/66:2)

**අල් khහාලික්:-** උත්පාදකයා, නිර්මාතෘ, මවන්නා, මැවුම්කරු. නොපවතින දේවල් පසුව ඇති කරන තැනැත්තා. පූර්ව ආකෘතියක් නොමැතිව නව නිපැයුම් කරන තැනැත්තා. ඉන්පසු ඔවුන්ගේ චලනයේ ලක්ෂණ සහ වෙනත් ගුණාංග ඔවුන්ට ලබා දෙන තැනැත්තා ඔහුය. ඇස්වලට පෙනෙන නොපෙනෙන ඕනෑම දෙයක නිර්මාණය පරිපූර්ණ කරන්නේ ඔහුය.

(Quran 59:24/23:14/23:115/15:86)

**අල්-බාරි:-** ආරම්භකයා. සෑම දෙයකම ආරම්භකයා වන්නේ ඔහුය. ඔහු මැවුම්කරුවා වන අතර ඔහුගේ සියලු මැවිල්ලට සුවිශේෂී ලක්ෂණ ලබා දෙයි. අල්-බාරි හෙවත් 'නිර්මාණයන්ගේ ආරම්භකයා වන ඔහු' ඔහුගේ මැවීම ගැන හොඳින් දනී. (Quran 59:24/82:7/95:4/2:28)

**අල් අව්වල්:-** පළමුවැන්නා. මුල් තැනත්තා. පළමු හා ප්‍රධානතම තැනැත්තා. ඔහු සියලු මැවිල්ලට පෙර සහ පවතින සෑම දෙයකටම හේතුව විය. (Quran 57:3)
**අල් ආක්හිර්:-**අවසානයා. අන්තිමයා සහ අවසාන තැනැත්තා. මැවීම විනාශ වීමෙන් පසු ඉතිරිව සිටින තැනැත්තා ඔහුය. ඔහුගෙන් ඔබ්බට කිසිවක් නැත. (57:3)

**අර්-රහ්මාන්:-** වඩාත්ම දයානුකම්පිතයා. මේ විශ්වයේ සිටින සියලුම ජීවීන්ට ඔහුගේ දයාව (රහ්මා) ලබා දෙයි. (Quran 17:110 & more 56 times)

**අර් රහීම්:-** උපරිම අනුකම්පාසහගත කෙනා. දයාවේ හිමිකරු වන උන් වහන්සේ (ගේ) මැවිල්ල සම්පූර්ණයෙන්ම ආවරණය කරයි. අල්ලාහ්ගේ දයාවේ අතිමහත් බව "අර්-රහ්මාන්" මගින් පෙන්වා දෙන අතර "අර්-රහීම්" මගින් පෙන්වා දෙන්නේ මෙම දයාව ඔහුගේ මැවීම කෙරෙහි ඇති කරන බලපෑමයි. (Quran 33:43/2:143/39:53/19:96 & more)

**අල් මුසව්විර්:-** විලාසිතාකරු, හැඩගන්වන්නා. සෑම මැවිල්ලකම මෝස්තරකරු, විලාසිතාකරු, හැඩගන්වන්නා ඔහුය. මැවීමේදී සෑම දෙයකටම විශේෂ ස්වරූපයක් සහ විශේෂ ආකාරයක් ලබා දී ඇත්තේ ඔහුය. (Quran 59:24)

**අල් මලික්:-** (රාජ්‍යයෙහි) රජු සහ හිමිකරු. අල්ලාහ් රාජධානි ආධිපත්‍යය, බලය, අධිකාරය යන ගුණාංග ඇත්තාය. අල්ලාහ් යනු 'අල් මලිකුල් හක්' ය. සියලු කටයුතු බැහැර කිරීමේ අයිතිය ඔහු සතුය. ඔහු අණ කරයි, සාදයි, ඔහුට අවශ්‍ය ඕනෑම දෙයක් කරයි. අල්ලාහ් තමාට අයිති රාජධානියෙන් තමා කැමති ඕනෑම කෙනෙකුට තමන් කැමති දෙයක් ලබා දෙයි. (Quran 20:114/3:26/23/116/59:23/1:4/85:9/7:158)

**අල් අසීස්:-** සර්වබලධාරියා. සෑම දෙයක්ම අභිබවා යන තැනැත්තා. කිසිවෙකු උන් වහන්සේ හා සමාන නොවේ. තවද ඔහු අතිශයින්ම වටිනා තැනැත්තා ලෙසටද සඳහන් කරයි. ඔහුව පරාජය කළ නොහැකි අතර උන් වහන්සේගේ අභිමතාර්ථ ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහුව කිසිවෙකුට වලකාලීමටද නොහැක. (Quran 38:9/48:7/6:96/35:28)

**අල්-ජබ්බාර්:-** බල කරන්නා. අල්-ජබ්බාර් යනු බලහත්කාරයයි. ඔහු කැමති ඕනෑම දෙයක් සිදුවෙයි. උන්වහන්සේගේ මැවිල්ලට වඩා උසස් තැනැත්තා ඔහුය. ඔහු ප්‍රතිසංස්කරණය කරන්නේය. ඔහුගේ මැවීම සඳහා සියලු තීරන ගන්නේ ඔහුය. (Quran 59:23)

**අල් කුද්දූස්:-** ඉතා පිරිසිදු, නියත වශයෙන්ම පිරිසිදු තැනැත්තා. ඔහු කිසිම අසම්පූර්ණකමක්, දෝෂයක්, වැරැද්දක් සහ අඩුපාඩුවක් සතිත කෙනෙකු නොවේ. ඔහු තමාට නොගැලපෙන දේට වඩා උසස් ය. (Quran 2:253/5:110/16:102/59:23/62:1)

**අල්-'අලී':-** මහෝත්තමයාණන් වහන්සේ. අන් සියල්ලන්ට වඩා ඉහළින් සිටින තැනැත්තා. ඔහුට වඩා වඩා ඉහළින් කිසිවෙක් නැත. ඔහුගේ උසස්කම නියත වශයෙන්ම පරිපූර්ණයි. ඔහු තමයි ඉහළම තැනැත්තා. අල්-'අලී' තත්වය ඉහළින්ම ඇති අතර, එය මෙතෙක් පැවති සියල්ල, දැන් පවතින සියල්ල සහ ඉදිරියට පවතින සියල්ල අභිබවා යයි. (Quran 87:1/2:255/34:23)

**අල් කෙයූම්:-** තිරසාරයා, ස්වයං සහනය ලබන්නා. අනුන්ව පෝෂණය කරන්නා. තමාගේම දෑ මත ස්ථාපිත වූ තැනැත්තා සහ සියල්ල රඳා පවතින්නේ ඔහු විසිනි. ඔහු නඩත්තු කරයි, ආරක්ෂා කරයි, අධීක්ෂණය කරයි. ඔහු පවතින සියල්ල සපයයි, සංරක්ෂණය කරයි, ඔහුට කෑම හෝ බීම අවශ්‍ය නැත. මන්ද ඔහු තම නිර්මාණයන් පෝෂණය කරන නමුත් තමාට පිටස්තර පෝෂණයක් උවමනා නැත. ඔහු සියලු මැවිල්ලෙන්ද කිසිදු අවශ්‍යතාවයකින් තොරය. (3:2/20:111)

**අල් khහාබීර්:-** සියල්ල දන්නා, සර්ව-දැනුවත්. අභ්‍යන්තර හා පිටත සෑම දෙයක්ම දන්නා තැනැත්තා. නිර්මාණය කරන ලද සියල්ලේ සැබෑ තත්වය, අභ්‍යන්තර ගුණාංග සහ අර්ථයන් පිළිබඳව පරිපූර්ණ දැනුමක් හා අවබෝධයක් ඇති තැනැත්තා ඔහුය. (Quran 59:18/6:103/35:14/32:34)

**අර් රස්සාක්:-** සපයන්නා. පෝෂණය හා පෝෂණය සඳහා සියලු මාධ්‍යයන් නිර්මාණය කරන තැනැත්තා. අවශ්‍ය සියල්ල සපයන තැනැත්තා ඔහුයි (රිස්ක්). එයින් අදහස් කරන්නේ ශරීරය, මනස සහ අධ්‍යාත්මික ජීවිතය සඳහා උන්වහන්සේ සියලු සහය සහ වර්ධනය ලබා දෙන බවයි. (Quran 51:56,58)

**අල් මුහී:-** ජීවය දෙන තැනැත්තා. යමක් ජීවයට ගෙන ඒමට හැකි එකම තැනැත්තා අල්-මුහී ය. උන් වහන්සේ ජීවීන්ව යම්කිසි දෙයකින් මැවූ අතර ජීවිතය අවසන් කිරීමට උන් වහන්සේ නියම කරන තෙක් ජීවත් වීමට සුදුසු

කොන්දේසි සහිතව ඒවා සියල්ල වට කර ගනී. විනිශ්චය දවසේදී උන් වහන්සේ ජීවිත නැවත නැඟිටුවයි. මේ සියල්ල උන් වහන්සේට පහසුය. (Quran 15:23)

**අල් මුමීත්**:- මරණය දෙන තැනැත්තා, විනාශ කරන්නා. ජීවමාන අයවලුන් මළවුන් බවට පත් කරන තැනැත්තා. (Quran 3:156/7:158/15:23/57:2)

**අල්-හෆීඩ්**:- සර්වබලධාරී සහ සර්ව ආරක්‍ෂා කරන්නා. අහස, පොළොව ආරක්ෂා කරන්නේ කාගේ බලයද? ඔහු සියලු ලෝක වල ආරක්ෂකයා වේ. ඔහු ගේ දැනුමෙන් අප කරන සියලු ක්‍රියාවන් අල්-හෆීඩ් ට අවනත වන අතර ඔහු සිය වහලුන්ව සියලු ආකාරයේ දුෂ්කරතා හා නපුරෙන් ආරක්ෂා කරයි. (Q-11:57)

**අල් සමී'**:- සර්වබලධාරි, සියල්ල අසන්නා. විවිධ ශබ්ද සහ කටහඬවල්, විවිධ භාෂාවලින් සහ ඔවුන්ගේ විවිධ අවශ්‍යතා අසන තැනැත්තා. ඔහු සර්වබලධාරි, සදහටම සවන් දෙන තැනැත්තා ය. (Quran 34:50/58:1/2:127)

**අල් බසීර්**:- සර්වබලධාරි, සියල්ල දකින්නා. ඔහුගේ බලසම්පන්න කමින් සෑම දෙයක්ම පැහැදිලිව දකින අතර, කුඩාම ක්‍රියාව හා සැඟවුණු දෙය පවා ඔහුට පෙනෙයි. සිදුවී ඇති සියල්ල අවබෝධ වන තැනැත්තා ඔහුය. (Quran 4:58/3:15)

**අල්-කබීර්**:- ශ්‍රේෂ්ඨතමයා, අති ශ්‍රේෂ්ඨ, උසස්වන්තයා. අසමසම ශ්‍රේෂ්ඨවන්තයා . උන්වහන්සේගේ සියලු ගුණාංගවල ශක්තිය, බලය, සහ දයාව යන දෙයින් උන්වහන්සේගේ සාරය සිතාගත නොහැකි තරම් පරිපූර්ණයි. ඔහු මහෝත්තමයාණෝ ය. උන්වහන්සේගේ කිසිම මැවිල්ලකට සමාන කළ නොහැකි තරමය. ඔහුගේ මැවිලි කිසි විටෙකත් උන් වහන්සේ හා සමාන විය නොහැක. (Q 4:34/31:30/34:23/22:62/40:12)

**අස්-සලාම්**:- සාමය පරිපූර්ණ කිරීම සහ දෙන තැනැත්තා. උන්වහන්සේගේ පරිපූර්ණත්වය, ඔහුගේ ගුණාංග, සහ ක්‍රියාවන් ආදියෙහි කිසිඳු අඩුපාඩු කමකින් නිදහස් තැනැත්තා. එනිසා උන්වහන්සේගේ මැවිල්ල සම්බන්ධයෙන් ඔහුගේ පැත්තෙන් සිදුවන ඕනෑම අසාධාරණයකින් එය ආරක්ෂා කරයි. (Quran 59:23/37:18/36:58)

**අල් මු'මින්:-** ඊමාන් සහ ආරක්ෂාව ලබා දෙන තැනැත්තා. ඔහුගේ ඒකීයභාවය තහවුරු කරන සහ විශ්වාස කරන (ඊමාන්ධාරී) තැනැත්තා ට ආරක්ෂාව සහ සාමය ලබා දෙන්නේ ද ඔහු ය. අල්-මුමින් යනු බිය ඉවත් කරන තැනැත්තා සහ විශ්වාසවන්තයාය. ඔහුගේ පොරොන්දු සැමවිටම සත්‍ය වේ. (Quran 59:23)

**අල් මුහයිමින්:-** ආරක්ෂකයා, භාරකරු, රක්ෂකයා, රැකබලාගන්නා. උන් වහන්සේගේ මැවිල්ල වන ඔවුන්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් ඔවුන්ව සෑම විටම නිරීක්ෂණය කරන තැනැත්තා, සාමය හා සුරක්ෂිතභාවය ලබා දෙන තැනැත්තා සහ සත්‍යය ප්‍රකාශ කරන විශ්වාසවන්තයා ද වේ. ඔහු නිතරම අප දෙස බලා අපව රැකබලා ගනී. (Quran 59:23)

**අල්-මුතකබ්බිර්:-** උත්තරීතර, තේජවත්, ගරුගම්භීරවන්තයා. අල්-මුතකබ්බිර් යනු උත්තරීතර ය, ඔහු සෑම මොහොතකම සහ සෑම සිදුවීමකදීම උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හා බලය හෙළි කරයි. අල්-මුතකබ්බිර් සිය අයිතිවාසිකම්, වරප්‍රසාද සහ ගුණාංග අන් සියල්ලන්ගේ අයිතිවාසිකම්වලට වඩා ඉහළින් හා ඉන් ඔබ්බට භාවිතා කරයි. (Quran 59:23)

**අල් ගෆ්ෆාර්:-** සියලු හා බොහෝ විට සමාව දෙන්නා. සමාව දී අපේ වැරදි නැවත නැවත සොයා බලන තැනැත්තා. මේ ජීවිතයේ දී සහ ඊළඟ ජීවිතයේ දී අපගේ වැරදිවල බලපෑම් වලින් ඔහු අපව ආරක්ෂා කරයි. අපගේ වැරදි ක්‍රියාවන් යහපත් ක්‍රියාවන් බවට වෙනස් කළ හැකි තැනැත්තා ඔහුය. (Quran 39:53/71:10/20:82/38:66/39:5/40:42)

**අල් කහ්හාර්:-** යටත් කරන්නා, සදාකාලික ආධිපත්‍යය හිමිකරුවා. තම රාජ්‍යයේ සෑම දෙයක්ම පාලනය කරන තැනැත්තා. මුළු මැවිල්ලටම නිහතමානී වී උතුම්කම, බලය සහ පරිපූර්ණ ශක්තිය ඉදිරිපත් කළ තැනැත්තා ඔහුය. ඔහු කිසි විටෙකත් අසාධාරණ නොවෙයි. (Quran 38:65/12:39/13:16/14:48/39:4/40:16)

**අල් වහ්හාබ්:-** තෑගි දෙන්නා. සෑම මැවිල්ලකටම අඛණ්ඩව තෑගි, අනුග්‍රහයන් සහ ආශීර්වාද ලබා දෙන තැනැත්තා. එයින් අදහස් කරන්නේ උන් වහන්සේ වරක් හෝ දෙවරක් තෑගි දෙනවා පමණක් නොව, ඔහු නිතරම එසේ කරන බවයි. කිසිම

ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවී නිදහසේ හා නිමක් නැතිව දෙන තැනැත්තා ඔහුය. (Quran 38:9/38:35)

**අල් ෆත්ත්තාහ්:-** ආරම්භක, විනිසුරු.  තම දාසයන්ට දයාව, ලාභය සහ පෝෂණය යන සියලු දොරටු විවෘත කරන තැනැත්තා. සෑම දුෂ්කරතාවයකම විසඳුමේ දොරටුව උන් වහන්සේට පහසුවෙන් විවෘත කළ හැකිය. අපැහැදිලි දේ ඔහු පැහැදිලි කරයි. අල් ෆත්ත්තාහ් යනු තම වහලුන් අතර පරිපූර්ණ යුක්තියෙන් විනිශ්චය කරන තැනැත්තාය. (Quran 34:26)

**අල් කාබිඩ්:-** රඳවා තබන්නා. අල්-කාබිඩ්, අල්-බාසිත් යනු රඳවා තබාගෙන දිගු කරන තැනැත්තාය. ඔහු අදහස් කරමින් ලබා දිය යුතු දෙය 'යහපත් වූ විට සංකෝචනය කරන අතර' එසේම එය 'යහපත් වූ විට ඔහු පුළුල් කරයි'. වරින් වර ඔහු රඳවා තබන අතර තවත් විටෙක උන් වහන්සේ ලබා දෙයි. මෙය ජීවිතය සහ මරණය සඳහා ප්‍රතිපාදනය (රිස්ක්) වේ. (Quran 2:245)

**අල්-බාසිත්:-** දීර්ඝ කරන්නා, පතුරුවන්නා, විසුරුවන්නා, විස්තීරණය කරගන්නා. අල්-කාබිඩ්, අල්-බාසිත් යනු රඳවා තබාගෙන දිගු කරන තැනැත්තාය. ඔහු අදහස් කරමින් ලබා දිය යුතු දෙය 'යහපත් වූ විට සංකෝචනය කරන අතර' එසේම එය 'යහපත් වූ විට ඔහු පුළුල් කරයි'. වරින් වර ඔහු රඳවා තබන අතර තවත් විටෙක උන් වහන්සේ ලබා දෙයි. මෙය ජීවිතය සහ මරණය සඳහා ප්‍රතිපාදනය (රිස්ක්) වේ. (Quran 2:245/42:27)

**අල්-ඛාෆිද්:-** අඩු කරන්නා, පහතට දමන්නා, අවමානයට පත් කරන්නා. අල්-ඛාෆිද්, අර්-රාෆි යනු ඔහුගේ විනාශයෙන් තමා කැමති ඕනෑම කෙනෙකුව පහත් කොට ඔහුගේ දායාදයෙන් ඔහු කැමති ඕනෑම කෙනෙකුව නැඟිටුවීමයි.(Quran 56:3)

**අර්-රාෆි:-** ප්‍රශංසා කරන්නා, උතුම් බවට පමුණුවන්නා. අල්-ඛාෆිද්, අර්-රාෆි යනු කෙනෙකුගේ විනාශයෙන් තමා කැමති ඕනෑම කෙනෙකුව පහත් කොට, ඔහුගේ දායාදයෙන් ඔහු කැමති ඕනෑම කෙනෙකුව නැඟිටුවීමයි. (Quran 94:4)

**අල් මුයිස්:-** ගෞරවනීය, හොඳම තැනැත්තා. අල්-මුයිස්, අල්-මුසිල් යනු තමා කැමති ඕනෑම කෙනෙකුට ගෞරවය දෙන තැනැත්තාය, එබැවින් ඔහුව පහත් කිරීමට කිසිවෙකු නැත; ඔහු කැමති ඕනෑම කෙනෙකුව පහත් කරයි, එබැවින් ඔහුට ගෞරවය දීමට කිසිවෙක් නැත. (Quran 3:26)

**අල්-මුසිල්:-** අවමානයට ලක් කරන්නා. අල්-මුයිස්, අල්-මුසිල් යනු තමා කැමති ඕනෑම කෙනෙකුට ගෞරවය දෙන තැනැත්තාය, එබැවින් ඔහුව පහත් කිරීමට කිසිවෙකු නැත; ඔහු කැමති ඕනෑම කෙනෙකුව පහත් කරයි, එබැවින් ඔහුට ගෞරවය දීමට කිසිවෙක් නැත. (Quran 3:26 & 39:26)

**අල් හකම්:-** විනිසුරුවරයා, යුක්තිය දෙන්නා. එකම සහ පරම සැබෑ විනිශ්වයකරු ඔහු වන අතර සෑම අවස්ථාවකම ඔහු යුක්තිය ඉටු කරයි. විනිශ්වයන් හා නියෝග කිසි විටෙකත් හරවා නොගන්නා තැනැත්තා ඔහු වන අතර සියලු කාරණාවල ස්වභාවය පිළිබඳ අවසාන තීරණය ගන්නා තැනැත්තාද ඔහුය. සියලු ආරවුල් බේරුම් කරන්නේ ඔහුය. (Quran 22:69/5:50/10:109/53:39)

**අල් ආදල්:-** සම්පූර්ණයෙන්ම සාධාරණයි. තමා කරන දේ කිරීමට අයිතිය ඇති තැනැත්තා. (Quran 4:40,16:90,6,115,4:135)

**අල් ලතීෆ්:-** සියුම් තැනැත්තා, වඩාත් මෘදු තැනැත්තා. ඉතාම සියුම් තොරතුරු පිළිබඳව වඩාත්ම දැනුමක් ඇති තැනැත්තා. ඔහුගේ ක්‍රියාවන් කෙතරම් සියුම් යත් ඒවා අපට තේරුම්ගත නොහැකිය. උන්වහන්සේගේ මැවීමේ අවශ්‍යතාවන්ට හොඳින් ගැලපෙන තෑගි ඔහු ලබා දෙයි. ඔහු අසාමාන්‍ය කරුණාවන්ත හා අවබෝධය ඇති අයෙකි. ඔහු අපට මඟ පෙන්වන අතර අපට එය නොදැනෙන ලෙසට ඔහු ඉතා කරුණාවෙන් එය සිදුකරයි. (Quran 31:16/22:63/12:100/6:103/33:34/42:19/67:14)

**අල් හලීම්:-** වඩාත්ම ඉවසිලිවන්තයා. උන් වහන්සේට අකීකරු වී බොහෝ වැරදි කළත්, ඔහුගේ මැවිල්ලට දෘශ්‍යමාන හා සැඟවුණු ආශීර්වාද ලබා දෙන තැනැත්තා. එබැවින් උන් වහන්සේ සමාව දී පව්කාරයන්ට ලැබිය යුතු ද ඩුවම් ලබා දෙන්නේ නැත. පසුතැවිලි වීමට ඔහු ඔවුන්ව දිරිමත් කරන අතර උන් වහන්සේ වෙත හැරීමට ඔවුන්ට කාලය ලබා දෙයි. (2:235/2:263/3:155/4:12)

**අල් අතීම්/ අල් අසීම්:-** උත්තරීතර, අති ශ්‍රේෂ්ඨයා. ශ්‍රේෂ්ඨතම තැනැත්තා, බලවත්ම, තැනැත්තා, සියල්ලටම වඩා උන්වහන්සේගේ ගුණාංග සහ ආත්මය යන දෙකෙහිම පරම ශ්‍රේෂ්ඨත්වයක් ඇත. උන්වහන්සේගේ සියලු ක්‍රියා පරිපූර්ණයි. සියලු අසම්පූර්ණකම් වලින් තොර බව, මහිමය සහ පාරිශුද්ධත්වය යන ගුණාංග ලැබීමට සුදුසු තැනැත්තා ඔහුය. උන්වහන්සේගේ බලය හා උදාරත්වය නිසැකවම අපට තේරුම්ගත නොහැකිය. (Quran 56:96/69:52/2:255/42:4)

**අල් ගෆූර්:-** සමාව දීම, අතිශයින්ම සමාව දීම සිදුකරන්නා. අපේක්ෂාවෙන් ඔබ්බට සමාව දෙන, පසුතැවිල්ල පිළිගෙන අපගේ වැරදිවලට සමාව දෙන තැනැත්තා. ඔහු තමයි අපේ පව් වසන් කරන්නේ, ඒවායේ නරක ප්‍රතිපලවලින් අපව ආරක්ෂා කරයි, එබැවින් අපට ලැජ්ජාව හෝ වරදකාරිත්වයක් නොමැතිව ඉදිරියට යා හැකිය. අල්-ගෆූර්ට එය කොපමණ හෝ කොතරම් විශාල පාපයක් වුවද එය වසන් කළ හැකිය. (Quran 15:49/41:32/2:173)

**අල් ශකූර්:-** වඩාත්ම අගය කිරීම සිදුකරන්නා. කුඩා දේට ප්‍රතිඵලයක් ලෙස බහුල ලෙස දෙන තැනැත්තා. ඔහු වඩාත්ම අගය කරන තැනැත්තා වන්නේ ඔහු කුඩාම ක්‍රියාවන් පවා අගය කරන බැවිනි. උන් වහන්සේගේ අගය අසීමිත ය. මක්නිසාද යත් උන් වහන්සෙ ප්‍රධානය කරන පාරාදීසයේ දී ලබන්නට හැකි සන්තෝෂයට අවසානයක් නැත. (Quran 2:158/4:147/35:43/42:23)

**අල්-මුකීත්:-** තිරසාරයා, නොනැසී පවත්වාගෙන යන්නා. අල්-මුකීත් සිය බලයෙන් සෑම දෙයක්ම යටපත් කරන අතර සෑම දෙයකටම වගකිව යුත්තේ උන්වහන්සේගේ පරිපූර්ණ හා සියල්ල ඇතුළත් දැනුමෙනි. ඔහු බලසම්පන්න නඩත්තු කරන්නා වන අතර පවතින සියල්ල අධීක්ෂණය කරයි, උන් වහන්සේගේ මැවිලිවලට ප්‍රතිපාදන යවා ඒවා අතර බෙදාගෙන, සියලු ජීවීන් රැකබලා ගනී.

**අල්-හසීබ්:-** ගණකාධිකාරී, සියල්ලට ප්‍රමානවත් තැනැත්තා. අල්-හසීබ් යනු ඔහුගේ වහලුන් ගැන ගණන් දිය යුතු ය. ඔහු ඔවුන්ගේ ක්‍රියාවන්, ඔවුන්ගේ ආයු කාලය සහ ඔවුන්ගේ සියලු කටයුතු දනී. ඔහු ප්‍රමාණවත් ය; ඔහු සිය සියලු

වහලුන් බලා ගනී. අල්-හසීබ් සියළුම ක්‍රියාවන් පිළිබඳව වාර්තා තබා ඇති අතර, පසුව උන්වහන්සේගේ ප්‍රඥාව අනුව ඒවා ලබා දෙනු ඇත. (4:86/33:39/4:6)

**අල්-කරීම්:-** වඩාත්ම ත්‍යාගශීලී, ගෞරවනීය තැනැත්තා. වඩාත්ම ත්‍යාගශීලී තැනැත්තා. ඔහුගේ මැවිල්ලට දිගින් දිගටම වටිනා ත්‍යාග ලබා දෙයි. උන්වහන්සේගේ සාරය අනුව ඔහු අල්-කරීම් වන අතර, උන්වහන්සේගේ පරිපූර්ණත්වය හා ඒකීයභාවය නිසා ඔහු වඩාත් ගෞරවයට පාත්‍ර වූවකි. උන්වහන්සේගේ මැවීම සමඟ ගනුදෙනු කිරීමේදී ඔහු අල් කරීම් ය. ඔහු සමාව දෙයි. උන් වහන්සේගේ දීම සියලු අපේක්ෂාවන් ඉක්මවා යයි. (82:6/27:40)

**අර්-රාකීබ්:-** සෝදිසියෙන් සිටින්නා, නිරීක්ෂණය කරන්නා. උන් වහන්සේගේ මැවිල්ල, ඇසීම, දැකීම සහ සියල්ල දැන සිටීම. ඔහු නිරීක්ෂකයා සහ සාක්ෂිකරු වන අතර ඔහු කිසි විටෙකත් එම ස්ථානයට නොපැමිණෙයි. අර්-රාකීබ් ඔබ කොතැනක සිටියත්, ඔබ කරන ඕනෑම දෙයක්, ඔබ එය කරන සෑම අවස්ථාවකම ඔබ දෙස බලා සිටින අතර ඔබේ නොකියූ චේතනා පවා ඔහු දනී. (4:1/33:52)

**අල්-මුජීබ්:-** වගකිවයුතු තැනැත්තා. යාච්ඤා වලට පිළිතුරු දෙන තැනැත්තා. ඉල්ලන අයගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වන අතර උන් වහන්සේට යාච්ඤා කරන අයගේ ඇමතුමට ප්‍රතිචාර දක්වන්නේ ඔවුන්ගේ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී උන්වහන්සේගේ ප්‍රඥාවට අනුව ඔවුන්ට උපකාර කිරීමෙනි. අල්-මුජීබ් බොහෝ විට ඔබ ඉල්ලන දේට වඩා වැඩි යමක් ඔබට ලබා දෙනු ඇත, මන්ද ඔහු ඔබට අවශ්‍ය දේ සහ ඔබට වඩාත් සුදුසු දේ හොඳින් දනී.(11:61)

**අල් වාසී:-** සර්වබලධාරී, සීමා මායිම් රහිත, අනන්ත තැනැත්තා. ඔහුගේ පුළුල් සාරය මුළු මැවිල්ලම ආවරණය කරයි. උන්වහන්සේගේ හැකියාවන් ගුණාංගවල අර්ථයන් සීමාවකින් තොරව හා බහුල වේ. අල් වාසී හි බලය, දයාව, ත්‍යාගශීලිත්වය සහ දැනුම අසීමිත ය. ඔහුගේ අධිකාරය කිසි විටෙකත් අවසන් නොවේ. (2:115/2:261/2:261/2:268/3:73/4:130)

**අල් හකීම්:-** සර්ව ඥානාන්විත, සියල්ල දත් තැනැත්තා. කාගේ ප්‍රඥාව පරිපූර්ණද, ඕනෑම වැරැද්දකින් හෝ වරදවා වටහාගැනීමෙන් තොරය. උන්වහන්සේගේ දිව්‍ය කැමැත්ත ක්‍රියාත්මක වන්නේ උන්වහන්සේගේ දිව්‍ය ප්‍රඥාවෙනි, එයින් අදහස්

කරන්නේ උන්වහන්සේ සෑම දෙයක්ම හොඳම ස්ථානයෙහි හා හොඳම වේලාව අනුව කරන බවය. (Quran 6:128/12:100/43:84/5:50/6:114)

**අල්-වදූද්:-** වඩාත්ම ආදරණීය තැනැත්තා. සියලු ප්‍රේමයේ හා සෙනෙහසේ උල්පත ඔහුයි. උන්වහන්සේගේ ප්‍රේමය තීව්‍ර, නිරන්තර හා කල් පවතින ය. සියලු ආදරය හා සෙනෙහස ලැබිය යුත්තේ අල්-වඩූද් ය. අල්-වදූද් ඇදහිලිවන්තයන්ට ආදරය කරන අතර ඇදහිලිවන්තයන්ද සියල්ලටම වඩා ඔහුට ප්‍රේම කරයි. (11:90

**අල්-මජීඩ්:-** තේජාන්විත, ගෞරවනීය තැනැත්තා. මහිමයේ හා මහිමයේ පරිපූර්ණත්වය කාගේ සාරයද, ඔහු ගෞරවනීය, තේජාන්විත මෙන්ම අවසානය අතිශයින් ත්‍යාගශීලීය. උන්වහන්සේගේ පැවැත්ම හා ක්‍රියාව යන දෙකෙහිම විශිෂ්ටත්වය හේතුවෙන් සියලු ප්‍රශංසාව හා ගෞරවය ලැබිය යුතු එකම තැනැත්තා අල්-මජීඩ් පමණි. (Quran 11:73)

**අල් බා'යිත්:-** නැවත නැඟිටවන්නා, මළවුන්ගෙන් නැගිට්ටවන්නා. තම දාසයන් මෙලොව දී කල හොඳ සහ නරක වෙන්කර පෙන්වා දී ඒවාට සරිලන ඵලවිපාක දීම සඳහා මරණයෙන් පසු තම දාසයන්ව නැවත නැඟිටුවන තැනැත්තා. (33:33)

**අල් ශහීද්:-** සර්වබලධාරී සාක්ෂිකරුවානන්. සෑම දෙයක්ම සහ ඔහු මැවූ සෑම දෙයක්ම නිරීක්ෂණය කරන තැනැත්තා. පෙනෙන හා නොපෙනෙන, සියලු ක්‍රියාවන් සහ සිතුවිලි සහ අභිප්‍රායන් පවා දකින තැනැත්තා සහ විනිශ්චය දවසේ අවසාන සාක්ෂිකරු ඔහුය. (4:166/5:117/6:19/22:17/34:47/41:53/85:9)

**අල්-වකීල්:-** භාරකරු, කටයුතු බැහැර කරන්නා. සියලු කටයුතු භාර දිය හැකි තැනැත්තා. ඔහු සියලු දේවල අවසාන භාරකරු සහ පරිපාලකයා වන අතර අල්-වකීල් සෑම කාරණයකටම පරිපූර්ණ විසඳුමක් ලබා දෙනු ඇතැයි අපට විශ්වාස කළ හැකිය. (Quran 3:173/4:171/33:3)

**අල් කවීර්:-** සර්වබලධාරී. සියලු දුර්වලකම්වලින් ඔබ්බට ගිය තැනැත්තා. ඔහුගේ ශක්තිය උත්තරීතර ය. අසීමිත හා විස්තර කළ නොහැකි. උන් වහන්සේ ඉදිරියෙහි ඕනෑම දෙයක හෝ ඕනෑම කෙනෙකුගේ ශක්තිය ඔහුගේ ශක්තිය ඉක්මවා නොයන අතර ඕනෑම කෙනෙකුගේ ශ්‍රේෂ්ඨත්වය ට වඩා ඔහු උතුම් යැයි

සලකයි.(Quran 22:40/22:74/42:19/33:25/57:25/58:21/8:52/40:22/11:66)

**අල් මතීන්**:- ස්ථිරසාරවන්තයා. මහත් ස්ථිරභාවයකින් යුත් තැනැත්තා. ඔහු සියලු ශක්තියේ හිමිකරු වන අතර උන්වහන්සේගේ ස්වභාවය අතිශයින්ම ස්ථිරභාවයයි. උත්තරීතර ස්ථිරභාවයෙන් හා ශක්තියෙන් ඕනෑම දෙයක් පහසුවෙන් ජයගත හැකි තැනැත්තා ඔහුය. (Quran 51:580)

**අල් වලී**:- ආරක්ෂණ සහායකයා. ආරක්ෂා කරන මිතුරා, අනුග්‍රාහකයා සහ සහායකයා. (Quran 2:257/42:28/7:196/33:17/45:19)

**අල් හමීඩ්**:- ප්‍රශංසනීයවන්තයා. උන්වහන්සේගේ ආවේණික ගුණාංගවලට පමණක් නොව, විශේෂ අනුග්‍රහයන් සඳහා පමණක් නොව, සෑම ආකාරයකම ප්‍රශංසාව, ගෞරවය සහ ස්තුතිය ලැබීමට සුදුසු එකම තැනැත්තා ඔහුය.(Q 35:15)

**අල් මුෂී**:- සියල්ල ගණනය කරගන්නා. සියළුම දේවල් ගණන් කරන තැනැත්තාය. උන් වහන්සේ සියල්ල දනී. (Q 72:28/19:94/20:52)

**අල් මුබ්දි**:- ආරම්භකයා. මිනිසාවත් අනෙක් සියල්ලත් ආරම්භ කළ තැනැත්තා. (85:13)

**අල් මු'ඉද්**:- නැවත යථා තත්වයට පත් කරන්නා. මරණයෙන් පසු සත්වයන් නැවත ගෙන එන තැනැත්තා. (30:28/10:4/85:13/27:64/29:19)

**අල් වාජිද්**:- සියල්ල සංජානනය කරගන්නා, ප්‍රතයාක්‍ෂ  කරගන්නා. Q 93:6-8)

**අල් මජීඩ්**:- විශ්මය ජනක, සත් කීර්තිමත් තැනැත්තා. මහිමාන්විත (Q 11:73)

**අල්-මුක්තදීර්**:- සර්වබලධාරී. ඔහු උතුම් සහ ශ්‍රේෂ්ඨ වන අතර ඔහුගේ අතිමහත් බලය තුළින් අල්-මුක්තදීර් තත්වයෙන් සිය සියලු මැවිලි පාලනය කරයි. ඔහු සිය වසමේ සිටින සියල්ලන් සහ සියල්ල යටත් කරයි. ඔහුගේ නියෝගය සෑම තත්වයකදීම පවතී. (Q 54:55/18:45/6:65)

**අල් මුකද්දිම්:-** ඉක්මන් කරවන්නා, ප්‍රවර්ධකයා. අල් මුකද්දිම්, අල්-මුආක්කීර් යනු දේවල් නිසි තැනට දැමීමයි. ඔහු තමා කැමති දේ ඉදිරියට ගෙන යන අතර ඔහු කැමති දේ ප්‍රමාද කරයි. (Q 57:3/75:13/14:42/6:59)

**අල්-මුආක්කීර්:-** ප්‍රමාද කරන්නා. අල් මුකද්දිම්, අල්-මුආක්කීර් යනු දේවල් නිසි තැනට දැමීමයි. ඔහු තමා කැමති දේ ඉදිරියට ගෙන යන අතර ඔහු කැමති දේ ප්‍රමාද කරයි. (Quran 71:14)

**අද් දාක්හිර්:-** ප්‍රතයාක්‍ෂ, උත්කෘෂ්ටයා. කිසිවක් ඔහුට ඉහළින් නැති අතර කිසිවක් ඔහුට යටින් නැත. එබැවින් උන් වහන්සේ තැනක් නොමැතිව සිටියි. ඔහු උත්කෘෂ්ටයාය, ඔහුගේ පැවැත්ම සාක්ෂි මගින් පැහැදිලි වන අතර මැවුම් වල ගතිලක්ෂණ වල මායාවන්ගෙන් ඔහු ගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි ය. (Q 57:3)

**අල් බාතින්:-** සැඟවුණු තැනැත්තා. මැවීම දැකිය හැකි ආකාරයෙන් දැකිය නොහැකි තැනැත්තා. සියල්ල වට කරන තැනැත්තා. ඔහු අභ්‍යන්තර තත්වයන් පවා දනී, නමුත් ඔහු මැවීමේ සංජානනයෙන් වැසී ඇත. (Q 57:3)

**අල් වාලී:-** ආණ්ඩුකාර, අනුශාසක. දේවල් අයිති කර ඒවා කළමනාකරණය කරන තැනැත්තා. Quran (13:11)

**අල් මුතා'අලී:-** ස්ව උත්කෘෂ්ට වන්තයා. මැවීමේ ගති ලක්ෂණ වලින් උත්කෘෂ්ට බව පැහැදිලි වන තැනැත්තා. (Quran 13:9)

**අල් බාර්:-** යහපත්කමේ ප්‍රභවය, කරුණාවන්ත ප්‍රතිලාභියා. මැවිල්ලට කරුණාවන්ත හා යහපත්කම ලබා දී ඇති තැනැත්තා. ඔහු සියලු යහපත් ක්‍රියා කරන අතර සියලු යහපත් ක්‍රියා උන් වහන්සේගෙන් පැමිණේ. (Quran 52:28)

**අත් තව්වාබ්:-** සදාකාලයට සමාව දෙන්නා, දඬුවම් ලිහිල් කරන්නා. තම මැවිලිවලින් තමන් කැමති ඕනෑම කෙනෙකු ගේ පසුතැවිලි පිළිගනී. (Q 9:104)

**අල් මුන්තකීම්:-** දඬුවම් කරන්නා. ජයග්‍රාහකයා තම සතුරන් අභිබවා ගොස් ඔවුන්ගේ පව්වලට ද දඬුවම් කරයි. ඒවා විනාශ කරන තැනැත්තා. (Q 3:4/32:22)

**අල් අෆුවුව්:-** සමාව දෙන තැනැත්තා. පාප හා වැරදි ඉවත් කරන තැනැත්තා. ඔහු පව්වලට සමාව දෙනවා පමණක් නොව, සම්පූර්ණයෙන්ම මකා දමා ඕනෑම වැරැද්දක් හෝ පාපයක් ඔහු කැමති සෑම විටම අතුරුදහන් කළ හැකිය. (4:33)

**අර් රවූෆ්:-** වඩාත්ම කරුණාවන්තයා. මැවිල්ලට අතිශයින්ම දයාව දෙන තැනැත්තා. අනුකම්පාව, සෙනෙහස, කරුණාව සහ මුදු මොළොක් බව තේරුම්ගත නොහැකි තරම් උසස් තැනැත්තා ඔහුය. (Q 2:143/2:207/3:30)

**මාලික් අල් මුල්ක්:-** රාජධානියේ ස්වාමියා. සියලු මැවිල්ල අයිති සහ පාලනය කරන තැනැත්තා. ලෝකයන් සහ ඒවායේ අඩංගු සෑම දෙයක්ම පාලනය කිරීමට, අණ දීමට හා තීරණය කිරීමට බලය හා බලය ඔහු සතුය. (Q 3:26/1:4/67:1)

**දුල්-ජාලාලි වල්-ඉක්රාම්:-** මහිමය හා ගෞරවය හිමි තැනැත්තා, මහිමාන්විත හා ත්‍යාගශීලී අධිපති. මහිමාන්විත හිමිකරු සහ සියලු ත්‍යාගශීලීභාවයේ අධිපතියා. මහිමය, ගෞරවය සහ ත්‍යාගය යන සෑම ගුණාංගයකම හිමිකරු ඔහුය. (55:27)

**අල් මුහීත් :-** එයින් අදහස් කරන්නේ ඔහුගේ දැනුම, බලය සහ ආධිපත්‍යය සියලු මැවිල්ල වටා ඇති බවයි. (Q 3:120/4:108/2:19/41:54/85?20)

**අල් ජාමි:-** එකතු කරන්නා., විනිශ්චය දිනයේ දී විසුරුවා හරින ලද මනුෂ්‍ය වර්ගයා එක්රැස් කරන තැනැත්තා. (Q 3:9/3:103/4:140/8:63)

**අල් ඝනී:-** ස්වයංපෝෂිතයා, ධනවත් තැනැත්තා. කිසිවක් අවශ්‍ය නැති තැනැත්තා. ඔහු සම්පූර්ණයෙන්ම ස්වාධීන වන අතර මුළු මැවිල්ලම ඔහුගේ ධනය මත රඳා පවතී. ඔහුට කිසිම දෙයක හෝ කිසිවෙකුගේ උදව්වක් හෝ උපකාරයක් අවශ්‍ය නැත. එහෙත් සියල්ලන්ටම උන් වහන්සේ අවශ්‍ය වේ. 2:267

**අල් මුග්නි:-** පොහොසත් තැනැත්තා. සත්වයන්ගේ අවශ්‍යතා සපුරාලන්නා 9;28

**අල් මානී:-** රඳවා තබන්නා. ආරක්ෂා කරන්නා. (Q 67:21/2:216)

**අල් ධාර්:** [අන්-නෆි] - ආපදා ඇති කරන්නා. තමා කැමති ඕනෑම කෙනෙකුට හානි වන අතර ඔහු කැමති ඕනෑම කෙනෙකුට ප්‍රතිලාභ ලබා දෙයි. (6:17/2:155)

**අල් නාෆී:-** වාසිදායක දෙය ලබා දෙන්නා, ප්‍රතිලාභ දෙන්නා. අද්-ධාර්, අන්-නෆි යනු තමා කැමති ඕනෑම කෙනෙකුට හානි වන අතර ඔහු කැමති ඕනෑම කෙනෙකුට ප්‍රතිලාභ ලබා දෙයි. (Q 21:69,70)

**අන් නූර්:-** ආලෝකය ඇති තැනැත්තා. ආලෝකය මැවූ තැනැත්තාය. ඒවා සැහැල්ලු කිරීම සඳහා අහස් හා පොළොවෙහි තැබුවේය. දැනුමෙන් හා ඇදහිල්ලෙන් ඇදහිලිවන්තයන්ගේ හදවත් ආලෝකවත් කරන තැනැත්තාද අන්-නූර් ය. (Quran 24:35)

**අල් හාදි:-** මාර්ගෝපදේශයා. මඟ පෙන්වීමේ උල්පත වන තැනැත්තා. මනුෂ්‍ය වර්ගයාට මඟ පෙන්වීම සඳහා අනාගතවක්තෘවරුන් හා පණිවිඩකරුවන් යවා, සිහිකල්පනාව හා හදවත් මෙහෙයවන අතර ඔහුගේ දාසයන් ඍජු මාවතට යොමු කරන්නේ ඔහුය. (Quran 25:31/22:54/28:56/20:50)

**අල් බාකී:-** සදාකාලික ව සිටින්නා. නොපවතින තත්වයකට ඔහුව පත් කළ නොහැකිය. ඔහුද එසේ නොවේ. (Quran 20:73)

**අල් වාරිත්:-** උත්තරීතර උරුමක්කාරයා. සියලු සත්වයන් නැවත පැමිණෙන්නේ ඔහු වෙතය. සියලු දේපළ උන් වහන්සේ වෙත ආපසු යන්නේ එම දේපළ වලට හිමිකම් පෑමට කිසිත් නැති වූ විට ය. මුළු මැවිල්ලම විනාශ වූ පසුත් ඔහු සිටින්නේ ය. (Quran 15:23/19:40/21:89)

**අල් රාශීඩ්:-** මාර්ගෝපදේශක, නොවරදින ගුරුවරයා. නිවැරදි මාවතට මඟ පෙන්වීම, මඟ පෙන්වන තැනැත්තා. (Q 18:10/72:2/2:256/49:7)

**අල් සබූර්:-** ඉවසිලිවන්තයා. පව්කාරයන්ට ඉක්මනින් දඬුවම් නොකරන තැනැත්තා. (Quran 2:153/3:200/8:46/41:35)

ඉහතින් සඳහන් කර ඇති නම්, ලක්ෂන සහ ගුනාංග සියළු ලෝක නිර්මාණය කල සර්වබලධාරී දෙවියන්වහන්සේට වඩා ඔහුගේ නිර්මාණ වෙත ආදේශ කිරීම එය දෙවියන්ට සමාන කිරීමක් හෝ දෙවියන්ව අභිබවා යවන්නකි. එවැන්නක් විය නොහැකි මෙන්ම එසේ කිරීමද සුදුසු නැත.______________________________

# දෙවියන් සිටින බවට සාක්ෂි

1. දිව්‍යමය හෙළිදරව්
2. හේතු-ඵල තර්කය
3. සැලසුම් සහගත බවේ තර්කය
4. ප්‍රාතිහාර්යයන් පිලිබඳ තර්කය
5. ස්වභාවික අත්දැකීම් සහිත තර්කය

දෙවියන් ඇත කියන අය බහුතරයක් ද, දෙවියන් නැත කියන අය සුලුතරයක් ද, මේ ගැන නිශ්චිත අදහසක් නොදෙන සුලු පිරිසක් ද අප අතර සිටී.

දෙවියන් නැත යැයි විශ්වාස කරන මිනිසුන් දෙවියන් නැත යැයි මෙතෙක් සාක්ෂි සහිතව තර්ක කර හෝ ඔප්පු කර නැත. යමක් නැත යැයි ස්ථිර කිරීමට නම් ඒ පිළිබඳව 100% සොයා බලා හමු නොවූ විට එය තහවුරු කල යුතුයි.

'දෙවියන් නැත' කියන අය දෙවියන්ව හෙව්වෙ කොහෙද? ඒ සඳහා භාවිතා කල ඉන්ද්‍රියයන් හෝ උපකරණ මොනවද? පියවි ඇසට නොපෙනීම හෝ වෙනත් සීමා සහිත බලයන් ඇති උපකරන භාවිතා කර සොයා බලා තමාට හමු නොවූ නිසා දෙවියන් නැහැ කියා ස්ථිරව කීම සදාචාරාත්මක නෑ. එවැනි අය, අපි දෙවියන්ව හෙව්වා ඒත් අපිට හම්බ උනේ නෑ කියා කීම යුක්ති සහගතයි.

'දෙවියන් සිටියි' යැයි විශ්වාස කරන බොහෝ පිරිසක් ලොව තුල සිටී. මෙහිදී දෙවියන් ලෙස සලකන්නේ එක් සර්වබලධාරී දෙවියෙකි. ඔහු ඇතැයි විශ්වාස කරන අය විවිධ නම් වලින් ඔහුව හඳුන්වයි. ඉන් නම් කිහිපයක් ලෙස අල්ලාහ්, The God, Elohim, Bhagwaan, බ්‍රහ්ම, ශක්‍ර ආදී ලෙස සඳහන් කල හැක.

දෙවියන්ගේ ස්වරූපය කෙසේ දැයි හොඳම විග්‍රහය ලැබෙන්නේ ඉස්ලාම් දහමේ ඇති (කිසිඳු වෙනසකට ලක් නොවූ දෙවියන්ගේම වදන් ලෙස සලකන) අල් කුරාණය තුලිනි. (පරිච්චේදය 112).

*(නබියේ! මිනිසුන්ට) ඔබ මෙසේ පවසන්න; දෙවියන් (අල්ලාහ්) එක්කෙනෙකි. ඔහුට (කිසිවෙකුගේ) අවශ්‍යතායක්ද නොවන්නෙකි. ඔහු (කිසිවෙකුවත්) ප්‍රසූත*

*කලේ නැත. (කිසිවෙකු විසින්) ඔහුව ප්‍රසූත කරනු ලැබුවේද නැත. තවද, ඔහුට සමාන කිසිවෙක්ද නැත. (112:1-4)*

දෙවියන් සිටින බවට සාක්ෂි

**1) දිව්‍යමය හෙළිදරව්**

දෙවියන් විසින්ම මිනිසාව දැනුවත් කිරීමට පහල කලා යැයි ප්‍රචලිත දිව්‍යයමය හෙළිදරව්වන් මගින් ලැබෙන තොරතුරු පිළිබඳ තර්කය.

දෙවියන් විවිධ අවස්ථාවල මනුෂ්‍යයා වෙත පහළ කල දේව මාර්ගෝපදේශ අතරින් සුබූර්, තව්රාත් (The Old Testament), ඉන්ජීල් (New Testament/ Bible), ශුද්ධවූ කුරාණය ඒවායින් සමහරකි. ඇතැම් ඒවා දැන් සොයාගත නොහැකි අතර සමහර ඒවා මිනිසුන් අතරේ තිබේ. ඒවායිනුත් සමහර ඒවා මිනිසුන්ගේ අදහස්ද කලවම් කර දෙවියන්ගේ වදන් වෙනස්කම් වලටද ලක් කර ඇත. එනමුත්, දෙවියන්ගේ අවසන් පණිවිඩය පහල වූ ස්වරූපයෙන්ම පහල වූ භාශාවෙන්ම කිසිඳු වෙනසකට ලක් නොවී ආරක්ෂා වී සහ භාවිතයේ ඇත. එය අල් කුරානයයි. මෙමගින් දෙවියන් සිටිනවා යැයි තර්ක කල හැක. අල්කුරාණය අධ්‍යයනය කළොත් දෙවියන් සිටින බවට බොහෝ සාධක ලබා ගත හැකිය.

**2) හේතු-ඵල තර්කය**

ආරම්භ වන ඕනෑම දෙයකට හේතුවක් ඇත. විශ්වයට සහ එහි ඇති සෑම දෙයකටම ආරම්භයක් ඇත. එනිසා එයට හේතුවක් තිබිය යුතුය. එම හේතුව දෙවියන් වහන්සේ ලෙස දක්වන තර්කය. දෙවියන් වහන්සේ පළමු හෝ හේතු රහිත හේතුව විය.

හේතු රහිතව පවතින දෙය සහ හේතු සහිතව පවතින දේ අතර වෙනස පහත සටහනින් වටහා ගමු.

මෙම සටහන මෙම පොතෙහි පළමු ලිපියෙහිද ඉදිරිපත් කර තිබුණි.

| හේතු-ඵල තර්කය | | |
|---|---|---|
| | හේතු රහිත තත්වය<br>**(දෙවියන් ලෙස නම් කරමු)** | හේතු සහිත තත්වය<br>**(විශ්වය/න් සහ එහි අංතර්ගතය)** |
| 1 | සදාකල් පවතින්නකි. (ආරම්භයක් සහ අවසානයක් යන තත්ත්ව වලින් තොරව පවතින්නකි) | සදාකල් නැත. (ආරම්භයක් සහ අවසානයක් ඇත) |
| 2 | සදාකල් (අනන්තයක සිට සිටින) නිසා ආරම්භයක් නැත. (ආරම්භය යන වචනය මෙයට අදාල නැත). | ආරම්භයක් ඇත. (ආරම්භය යන වචනය මෙයට අදාල දෙයකි). |
| 3 | සදාකල් පවතින නිසා ආරම්භයට හේතුවක් අදාල නැත). හේතු රහිත තත්වය) | යම් කලෙක ආරම්භ වූ නිසා ආරම්භයට හේතුවක් අවශ්‍යය වේ. (හේතු සහිත තත්වය). |
| 4 | සර්වසම්පූර්ණය (එසේම ස්වයංපෝෂීය). | සර්වසම්පූර්ණ නොවේ (එසේම ස්වයංපෝෂී නැත/ පරපෝෂීය). |
| 5 | සදකාලික තත්වයක් නිසා (මෙම තත්වය ඇති කිරීමට) නිර්මාණ කරුවෙක් නොමැත. | නිර්මාණකරුවෙකු නැතිව ආරම්භ විය නොහැක. |
| 6 | නිර්මාණකරුවෙකුගෙන් තොරව පවතින නිසා (මෙම තත්වය) නිර්මාණයක් නොවේ. | අලුතින් ආරම්භ වූ මෙය (කාගේ හෝ ) නිර්මාණයකි. |
| 7 | ස්වයංපෝෂී තත්වයක් නිසා (පිටස්තර) සැලසුම්කරුවෙකු උවමනා නැත. | (පිටස්තර) සැලසුම්කරුවෙකු නැතිව ස්වයං සැලසුම්සහගත විය නොහැක. |
| 8 | සදාකල් පවතින නිසා (තම පැවැත්මට අලුතින්) කිසි අවශ්‍යතාවයක් නොමැත. | ආරම්භයට සැලසුමක්, ක්‍රියා පටිපාටියක්, බලයක්, අවකාශයක්, සහ අමුද්‍රව්‍ය අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| 9 | ආරම්භයක් මෙන්ම අවසානයක්ද නැත (සදාකල් පවතී). | ආරම්භයක් මෙන්ම අවසානයක්ද ඇත, (සදාකල් නැත). |
| 10 | සදාකල් පැවතීමට සර්වබලධාරී විය යුතුය. (විනාශ වීමට බලපාන හේතුවක්ද නැත) | විනාශ වෙන නිසා එහි ඇති කිසිවක් සර්වබලධාරී නොවේ. (විනාශ වීමට පිටස්තර හේතු බලපායි) |
| 11 | එක් සර්වබලධාරී තත්වයක්ම විය යුතුය. (සර්වබලධාරී දෙදෙනෙකුට එකට සිටිය නොහැක). | විශ්වයන් එකකට වඩා තිබිය හැක. |
| 12 | සර්වබලධාරී නිසා මැවීමකින් නිර්මාණ කල හැක. තම බලයෙන් ඒවා විනාශ කිරීමටද, අහෝසි කිරීමටද පුළුවන. | විශ්වයට හෝ එහි සිටින අයට අලුතින් කිසිවක් මැවිය නොහැක. කිසිවක් විනාශ (අහෝසි) කළද නොහැක. |
| ඉහත කරුණු සලකා බැලීමේදී විශ්වයේ ආරම්භයට හේතුව දෙවියන්වහන්සේ විය යුතු යැයි තර්ක කල හැක] | | |

දෙවියන් සියල්ල මැව්වා නම් දෙවියන්ව මැව්වේ කවුරුන්ද යන (සමහරු අසන) ප්‍රශ්නයට මෙතනින් පිළිතුරු ලැබේ. පහත සඳහන් ක්‍රියාව ඔබත් කර බලන්න.

සුදු A4 කොළයක් ගෙන එය දෙකට මැදින් ඉරක් ගසා සළකුණු කරන්න. එහි වම් පැත්ත දෙවියන් ලෙස සඳහන් කරන්න. දකුනු පැත්ත 'නිර්මාණාත්මක ස්වරූපවලින් පවතින දේවල්' ලෙස ලියන්න. (විශ්වය/ විශ්වයන්/ සහ ඒවා තුල ඇති සියල්ල).

දැන් ඉහත සටහනේ ඇති තොරතුරු වම් පැත්තට සහ දකුනු පැත්තට දාන්න.

වම් පැත්තේ සිටින දෙවියන්ට නිර්මාණ කරුවෙක් නැත. එනම් දෙවියන්ව නිර්මාණය කළ කෙනෙක් නැත. ඔහු සදාකල් පවතින කෙනෙකි. ඔහු විසින්

දකුනු පැත්තේ ඇති දැය නිර්මාණය කළ නිසා ඒවාට ආරම්භයක් සහ අවසානයක් ඇත.

යම් කිසිවෙක් කියනවානම් දෙවියන් ලෙස වම් පස කිසිවෙක් නැත යැයි, එසේ නම් දකුණු පැත්තද කිසිවක් නැති විය යුතුයි. නමුත් දැන් දකුණු පස පවතී. එසේ නම් එයට හේතුව ලෙස වම් පස දෙවියන් ලෙස එම තත්වය තිබිය යුතුමයි.

**3) සැලසුම් සහගත බවේ තර්කය**

විශ්වය පුදුමාකාර වන අතර එහි ඇති දෑ හි පුදුමාකාර නිර්මාණාත්මක බවක් සහ මනා පිළිවෙලක් ප්‍රදර්ශනය කරයි. නිර්මාණ වල ස්වභාවය එසේ සංකීර්ණ සහ පිළිවෙලයි නම්, සර්වබලධාරී අපූරු නිර්මාණකරුවෙක් සිටිය යුතු යැයි තර්ක කල හැක.






V16-TURBO එන්ජිම සංකීර්ණ දෙයකි -එය සැලසුම් කර හදපු කෙනෙකු සිටී. [ඔබ එය දන්නවා]. එසේනම් මෙම වේගවත් [warthog] සත්වයාව සැලසුම් කර නිර්මාණය කළ නිර්මාණ කරුවෙකු නොසිටින්නේද?

දෙවනුවට පෙන්වා ඇති ඇති රූපයේ මිග් යානය සංකීර්ණ දෙයකි - එය සැලසුම් කර හදපු කෙනෙකු සිටී. [ඔබ එය දන්නවා]. එසේනම් ඒ සමීපයෙන්ම පෙන්වා

ඇති එම රාජාලියාව සැලසුම් කර නිර්මාණය කළ නිර්මාණ කරුවෙකු නොසිටින්නේද?






මිනිසාගේ ශරීරය සංකීර්ණ දෙයකි - එය සැලසුම් කර නිර්මාණය කල කෙනෙකු සිටිය යුතුය. [ඔබට එය විශ්වාස කල නොහැකිද?]

විශ්වය සංකීර්ණ දෙයකි - එය සැලසුම් කර නිර්මාණය කල කෙනෙකු සිටිය යුතුය. [ඔබට එය විශ්වාස කල නොහැකිද?]

අප සිටින සෞරග්‍රහ මන්ඩලයම මොන තරම් සැලසුම් සහගත දැයි ඔබ දන්නේය. එය අහඹු පිපිරීමක අහඹු සැකසීමක්ද?

**4) ප්‍රාතිහාර්යයන් පිලිබඳ තර්කය.**

ස්වභාවධර්මයේ නීති උල්ලංඝනය කිරීමේ අර්ථයෙන් ඉඳහිට ප්‍රාතිහාර්යයන් සම්බන්ධයෙන් විශේෂිත ඓතිහාසික සිදුවීම් අපට අසන්නට ලැබේ. එවැනි ප්‍රාතිහාර්යයන් පැවතීමට අද්භූත බලවේගයක් හෝ දෙවි කෙනෙකු සිටීම අවශ්‍ය වේ යන තර්කය.

උදාහරණ කිහිපයක්:

- ඉබ්‍රාහිම් (අ:ස) සම්බන්ධ ප්‍රාතිහාර්යයන්

- සාලිහ් (අ:ස) සම්බන්ධ ප්‍රාතිහාර්යයන්
- ලූත් (අ:ස) සම්බන්ධ ප්‍රාතිහාර්යයන්
- මෝසෙස් (අ:ස) සම්බන්ධ ප්‍රාතිහාර්යයන්
- ජීසස් (ඊසා) (අ:ස) සම්බන්ධ ප්‍රාතිහාර්යයන්
- මොහම්මද් (ﷺ) සම්බන්ධ ප්‍රාතිහාර්යයන් (සහ),
- බෞද්ධ ඉතිහාසයේද ගෞතම බුදුන්වහන්සේ සම්බන්ධ ප්‍රාතිහාර්යයන්

බොහෝ ප්‍රාතිහාර්යන් එම කාලයේ අවස්ථාවට සීමා වූ අතර මොහම්මද් නබි (ﷺ) තුමාට පහල වූ කුරානය නම් ප්‍රාතිහාර්යය අදටත් ජීවමානව ඇත.

**5) ස්වභාවික අත්දැකීම් සහිත තර්කය.**

බොහෝ අයට දෙවියන් වහන්සේ වෙතින් කල ප්‍රාර්ථනා සම්බන්ධයෙන් සහ වෙනත් පුද්ගලික අත්දැකීම් ඇති බව කියා ඇත, එබැවින් දෙවියන් වහන්සේ සිටිය යුතුය යන තර්කය. යමෙකු තම මනසින් ප්‍රාර්ථනා කල විට එය අසා පිලිතුරු දෙන කෙනෙකු සිටින බව මින් පැහැදිලිය.

තවද, යමෙකු ඉතාම කරදරකාරී හෝ දුක්මුසු තත්වයකට පත්වූ විට එහෙමත් නැතිනම්, අවසානයට ඔහුට කර-කියා ගන්න දෙයක් නැති වූ විට නිරායාසයෙන්ම ඔහුට දෙවියන් සිහිවේ. ඔහු තම දුක්ගැනවිල්ල දෙවියන්ට කියමින් ඔහුගෙන් පිහිට අපේක්ශා කරයි. (ඇතැම් සතුන් පවා අහස බලාගෙන තම දුක්ගැනවිලි කියනා ආකාර අපි දැක ඇත්තෙමු). එනම් සහජයෙන්ම මේ ස්වභාවය අපි තුල ඇති දෙයක් බව හැඟෙයි. මෙවන් තත්ව සම්බන්ධ තර්ක මගිනුත් දෙවියන් සිටින බව පෙන්නුම් කරයි.

*(නබියේ!) ඔබ වෙතින් මගේ වහලුන් මා ගැන විමසුවහොත් (එයට ඔබ මෙසේ කියනු): නියත වශයෙන්ම මා සමීපයෙහි සිටින්නෙමි. (කවුරුන් හෝ) මාව ආරධනා කළ හොත් එම ආරාධනා කරන්නාගේ ආරාධනාවට මා පිළිතුරු දෙන්නෙමි". එබැවින් ඔවුන් මා වෙත ප්‍රාර්ථනා කළ යුතුය. (එමගින් ඔවුන් ඍජු මාර්ගය අත් කර ගන්නාහ). (2:186)*

---

විචාර බුද්ධිය අවධිකර ගැනීම සඳහා අමතර කරුණු කිහිපයක්.

## 1). අවසාන බලධාරියා

මෙම උදාහරණය බලන්න. පාසැල් ළමුන්ගේ බලධාරීන් මෙසේය.

පන්ති නායක > පන්තිභාර ගුරුවරයා > ප්‍රදේශ භාර ගුරුවරයා > උප විදුහල්පති > විදුහල්පති > කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ නිලධාරී > අධ්‍යාපන අමාත්‍යාන්ශයේ බලයලත් නිලධාරී > අධ්‍යාපන ඇමති > ජනාධිපති (එතනින් අවසන්).

ජනාධිපති කියන්නෙ බලය අසීමිත ලෙස ඇති අවසන් තීන්දුව ගත හැකි එකම පුද්ගලයා. ඔහුට ජනාධිපති හෝ රජු වීමට හේතු එකක් හෝ කිහිපයක් තිබේ. එනිසයි ඔහුට ඒ බලය හිමිව තිබෙන්නෙ. ඕනෑම රටක ස්වභාවය මෙයයි.

මෙම නායකත්වය හෝ කෙලවරක බලය සහිතව සිටින්නෙක් හැම තැනකටම පොදුයි. පව්ලක් ගත්තත්, රාජ්‍ය ආයතනයක් ගත්තත්, නිරය වැනි තැනක උනත් මේ හැම තැනකම බලය සහිත කෙනෙකු ඇත. එය විශ්වයටත් පොදුයි. බලය සහිත කෙනෙක් විශ්වය කෙලවරෙහිත් සිටිය යුතුයි.

ඉතින් මේ සදාකල් බලයක් සහිතව තනියම සිටින දෙවියන්වහන්සේ ගැන පෙන්වා දුන්නම ඒ ගැන පුදුම වෙන්න දෙයක් නෑ. අප කුමණ මාතෘකාවක් ගැන කතා කලත් එහි අවසානයට සිටින්නේ ඒවායේ නිර්මාතෘ වන, ඒවායේ හිමිකරු වන සර්වබලධාරී දෙවියන්වහන්සේමය. හැම කාරණාවකටම හේතුව එම දෙවියන්වහන්සේමයි.

කෙළවරේ සිටින බලධාරියා සම්බන්ධ තව උදාහරණයක්.

අපි හිතමු ලෝකෙ තියෙන ප්‍රභලම රාජ්‍යයේ යුද හමුදා වෙඩික්කරුවෙක් විශේෂ සතුරෙකුව ඉලක්ක කරගෙන සිටී. නමුත් ඉහලින් අවසර ලැබෙන තෙක් ඔහුට වෙඩි තියන්න බෑ. ඔහු ඔහුගේ ඉහල නිළධාරියාගෙන් අවසර ඉල්ලනවා. එම ඉහල නිළධාරියා ඔහුට ඉහළින් සිටින්නාගෙන් ඒ ගැන අහනවා. එම නිළධාරියාත් තමාට ඉහලින් සිටින උසස් නිළධාරියාගෙන් අහනවා. ඔහු

යුධහමුදාපතිගෙන් අහනවා. ඔහු ජනාධිපතිගෙන් අහනවා. දැන් අර සතුරාට වෙඩි තැබීම ප්‍රායෝගිකව සිදු වීමට නම මෙම ජනාධිපති අවසන් තීන්දුව දිය යුතුයි.

මෙසේම යමක් නිර්මාණයක් ලෙස බිහිවී තිබේ නම්, එහි කෙළවරේ එයට වගකියන අවසන් පෙළේ සිටින බලධාරියෙක් (හෙවත් දෙවියන් වහන්සේ) සිටිය යුතුයි. ඔහුගේ නිර්මාතෘ කව්ද යන ප්‍රශ්නය නැවත ඇසීමට නොහැකි අවස්ථාව එයයි.

**2). එක් එක් අයගේ විවිධ වූ නිර්මාණශීලී හැකියාවන්**

මී මැස්සන් එකතු කරගත් අමුද්‍රව්‍ය වලින් තම කූඩුව සාදන විදිහ සහ කොට්ටෝරුවා අමුද්‍රව්‍ය භාවිත නොකර තම නිවස සාදන විදිය එකෙනෙකට වෙනස්ය. මිනිසුන් දෙදෙනෙක් මැටි වලින් සහ ඇලුමිනියම් වලින් වෙනස් ආකාර වලින් මුට්ටි සාදයි. මකුළුවා තම නිවස හදන්නේ අමුතුම ආකාරයකටය. එයාගෙ අමුද්‍රව්‍ය එයාගෙ ශරීරය ඇතුලෙමයි තියෙන්නෙ. හරි පුදුමයි නේද?

ඉතින් දෙවියන්වහන්සේ අපිට වඩා වෙනස් ආකාරයකට එයාගෙ නිර්මාණ ඇති කරනවා කිව්වම අපි ඇයි එය විතරක් සැකෙන් බලන්නෙ? අපේ හැකියාවෙන් අපි පොඩි පොඩි දේවල් හදනවා. මිනිසුන් තම සීමිත හැකියාව උපයෝගී කරගෙන මැටි වලින්, ප්ලාස්ටික් සහ ලෝහ භාවිතා කර සෙල්ලම් සතුන් හදනවා අපි දැක ඇත්තෙමු. දෙවියන් ඔහුගේ අසීමිත බලය භාවිතා කර පෙර උදාහරණයක් හෝ නැතිවම ඇත්ත සතුන් නිර්මාණය කරනවා. දෙවියො කියලා කියන්නෙ සර්වබලධාරී කෙනෙක්. ඉතින් දෙවියො දෙවියන්ගෙ බලයෙන් විශ්වයන් සහ ඒ අතර ඇති දේවල් නිර්මාණය කරනවා.

එනිසා දෙවියෝ යමක් නිර්මාණය කලා හෝ මැවීමකින් යමක් ඇති කලා කිව්වම අමුතුවෙන් පුදුම වෙන්න දෙයක් නෑ.

**3). සියල්ල නිරීක්ෂණය කරමින් පවතී**

නිරීක්ෂන විශ්වයටම සාපේක්ෂව මිනිසා හරියට කාන්තාරයේ ඇති එක වැලි කැටයක් තරම් කුඩාය. ඒත් මිනිසා තම හැකියාව භාවිතා කර නිරීක්ෂන විශ්වයේ කෙලවරත් නිරීක්ෂනය කරනවා. වාහනයක් වේගෙන් ගියාම ඒකත් අල්ලලා නඩු

දානවා. මිනි-කැමරා දැන් කමිස බොත්තමේ පවා. යන යන තැන් වල CCTV කැමරා නිසා හොරකමක් වත් කරන්න අමාරුයි. ඒ මදිවට චන්ද්‍රිකා මගිනුත් අපි දිහා බලා සිටිනවා. අහසට ගිය චන්ද්‍රිකා ඉතා දුර සිටියත් ඒවායෙන් පණිවිඩ මිනිසාට ලැබෙමින් පවතී. ඉතින් මේ වැලි කැටයක් තරම් කුඩා වූ මිනිසාගේ හැකියාව මෙතරම් සංකීර්ණ නම් විශ්වයම නිර්මාණය කළ සර්වබලධාරී දෙවියනේ හැකියාව කොහොම ඇත්ද? ඉතින් දෙවියන්ම පවසා තිබෙනවා ඔහුගේ බලයෙන් විශ්වයත් මිනිසාවත් නිර්මානය කළ බව. මිනිසාගේ හදවත තුල ඇති රහස පවා ඔහු දන්න බව. මිනිසාගේ අනාගතය ගැනත් දන්න බව පවසනවා. සියල්ල දකින බවත් සියල්ල අසන බවත් පවසනවා. ඉතින් ඒක පුදුම වෙන්න දෙයක් නෙවෙයි කියලා දැන් හිතෙන්නෙ නැද්ද? ඒ තමයි දෙවියන්ගෙ හැකියාව.

**4). මියගොස් සිටින සියළුම මිනිසුන්ව විනිශ්චය දිනයට දෙවියන් වෙත කැඳවනු ලබයි.**

දැන් දියුනු රටවල රියදුරු රහිතව තනියම පිටත් වූ වාහන වැඩ අවසන් වී ආපසු මුල් තැනටම එනවා. ෆෝන් එකෙන් යවන මැසේජ් එකකින් කොහේ හෝ නතර කරල තිබුණු වාහනය තමන්ව හොයාගෙන ළඟටම එනවා. ඉතින් මිනිසා මෙතරම් දියුණුයි නම්, දෙවියන් පවසන විනිශ්චය දිනයට සියල්ල ආපසු කැඳවීම ගැන අපි පුදුම වන්නේ ඇයි?

**5). කැස්බෑවන්ගේ, වවුලන්ගේ සහ සහ සංචාරක කුරුල්ලන්ගේ GPS තාක්ෂණය.**

දැන් නම් කුඩා ළමයෙකුට උනත් GPS තාක්ෂනයේ උපකාරයෙන් තම මාර්ගය සොයාගෙන දීර්ඝ ගමනක් ගොස් නැවත ආපසු ඒම එතරම් ගැටලුවක් නොවේ. මිනිසා තම හැකියාවෙන් GPS තාක්ෂණය සොයා ගත්තායැයි සිතමු. නමුත්, මීට වසර ගනනාවකටම පෙර සිට ඉහත සතුන් මොන තාක්ෂණය හරහාද කිලෝමීටර් දාස් ගනනින් දුර වූ තමන්ගේ ගමන් මාර්ග සොයා ගත්තේ? සත්තු මිනිසාට වඩා තාක්ෂණය අතින් දියුණුයි කියනවද, නැත්නම් එම සතුන්ගේ නිර්මාතෘ ඔවුන්ට එම හැකියාව ලබා දී ඇතැයි විශ්වාස කරනවද? මෙය වටහා ගැනීමට දෙවියන් කුරාන් වැකියක් පහළ කර තියෙනවා "මී මැස්සන්ට දැණුම

දෙන්නේ ඔහුය" කියමින්. එසේනම් අපි භාවිතාකරන හෝ සොයාගන්නා දැණුම පිටුපස සිටින්නේ දෙවියන්ම බව අපට සිතාගත හැකිය. කවුරුන් හෝ දැණුමක් ලබා ගත්තා නම්, සොයා ගත්තා නම් ඒ දැණුමේ මුල් හිමිකරු දෙවියන් වහන්සේය. එනිසා දැණුම අතින් දෙවියන්ට වඩා උසස් කෙනෙකු සිටිය නොහැක.

**6). මිනිසාගේ දෘෂ්ඨි පරාසය සීමා සහිතය.**

අපට වඩා සමහර සතුන්ගේ දෘෂ්ඨි පරාසය වැඩිය. කුඩා දේ අපේ පියවි ඇසින් දැකිය නොහැකි විට අපි අන්වීක්ෂත් ඉතා දුරුන් ඇති වස්තු නිරීක්ෂණයට දුරේක්ෂත් භාවිතා කරයි. සමහර ආලෝක කදම්භ දිහා අපට එක එල්ලේ බලා සිටීම අසීරුය. මේ සියල්ලෙන් පෙන්නුම් කරන්නේ දෘෂ්ඨිය සම්බන්ධව මිනිසාට යම් යම් දුර්වලතා සහ සීමා මායිම් ඇති බවය. ඉතින් දෙවියන්ව අපේ ඇසට නොපෙනුනායි කියා දෙවියො නැතැයි කියා අපට තහවුරු කළ නොහැක. දෙවියො පමණක් නොව බොහෝ දේ අපේ ඇස් වලට නොපෙනේ. නමුත් ඒවා පවතී. අපට දුරේක්ෂ මගින් නිරීක්ෂනය කළ හැක්කේ විශ්වයෙන් 5% ක් තරම් ප්‍රමාණයක් පමණි. ඉතින් පහලම අහසේ පවතින විශ්වයත්, ඊට ඉහලින් ඇති තවස් අහස් හයක් සහ ඊටත් ඉහලින් ඇති දෙවියන්ගේ රාජධානියත් නිර්මානය කළ සර්වබල්ධාරී දෙවියන්ව අපේ පියවි ඇසින් හෝ දුරේක්ෂ මගින් බැලිය නොහැකි බව වටහා ගන්න. (නමුත් ස්වර්ගයට පිවිසෙන අයට දෙවියන්ව දැකීමට අවස්ථාවක් ලබා දෙන බව දහම තුල සඳහන් වේ).

**7). වෙනස් ස්වරූප**

අපේ ඇස් වලට හසුවන බහුතරයක් එකෙනෙකට වෙනස් ස්වරූප වලින් තිබේ. එය අපට සාමාන්‍ය දෙයක් නිසා ඒ ගැන අපි පුදුම වෙන්නෙ නෑ. ඉතින් සියල්ලට වඩා බලසම්පන්න (සර්වබලධාරී) දෙවියන්වහන්සේටත් ඔහුට ගැලපෙන වෙනස් ස්වරූපයක් තියෙනාවා යැයි කීම ගැන අපි පුදුම වන්නේ ඇයි. එය එසේ විය හැකියි.

8). දැනුම ලබාදීමේ ක්‍රමවේද.

කුඩාම කල අම්මා තමයි දරුවාගේ ගුරුවරිය. අම්මා එක එක විදිහට දරුවට පාඩම් කියා දෙනවා. ඉන් පසු වෙන විදිහකට පාසැල් ගුරුවරු ළමයින්ට පාඩම් කියා දෙනවා. මිනිසුන් විවිධ ආකාර වලින් දැනුම ලබා ගන්නවා. ඇමෙරිකාවේ පුද්ගලයෙක් එහෙදි ලබා දුන් පණිවිඩයක් අපි අපේ රටේදි එය ලබා ගන්නවා. සමහර විට එවෙලෙම පරිඝණක තිරය හරහා කියවනවා, නැත්නම් Download කරගෙන පසුව කියවා බලනවා. ඉතින් දෙවියන් වහන්සේ තමන්ගේ නිර්මාණයක් වන මිනිසාට ඔහුට ගැලපෙන ක්‍රම වේදයකින් (මලායිකාවරයෙක් හරහා) පෘතුවියට පණිවිඩයක් එවා එහි සිටින මිනිසෙකු හෙවත් නබි වරයෙකු ලවා අපට එය ලබා දී ඇතැයි කිව්වාම අපි පුදුම වෙන්නේ ඇයි? එය කියාවා බලන්න පුළුවන්. දැන් එය Download කරගන්නත් පුලුවන්. අවසානයට දෙවියන් එවූ පණිවිඩය ශුද්ධ වූ අල් කුරාණයයි. එය ඔබ ළඟ තියෙනවාද? ඔබ එය කියවා බැලුවාද?

### 9). නිර්මාණ වල රහස්

කිසිම මිනිසෙක් මීට පෙර දැක නැත දෙයක එහි අභ්‍යන්තර හෝ භාහිර ස්වභාවය ගැන තොරතුරු මුළින්ම කිව හැක්කේ කාටදැයි යන ප්‍රශ්නයට ඔබ දෙන පිළිතුර කුමක්ද? එයට දිය හැකි එකම පිළිතුර නම්, "එහි නිර්මාණකරු විය යුතුයි" යන්නය. මිනිසුන් නොදන්නා බොහෝ කරුණු දෙවියන්වහන්සේ තම පණිවිඩය තුල ලියා ඇත. එනිසා එම පණිවිඩය එවා ඇත්තේ එම නිර්මාණවල නිර්මාතෘමය යන්න වටහා ගැනීම අපහසු නොවේ. කුරානයේ විද්‍යාත්මක හෙලිදරව්වන් යන සබැඳි ලිපිය කියා බැලීමෙන් එය වඩා හොඳින් තහවුරු කර ගත හැක.

ඉහත සඳහන් කරුණු කෙරෙහි අවධානය කර බැලීමෙන් දෙවියන් සිටින බව අපට ප්‍රත්‍යක්ෂ කර ගත හැකි නොවේද?

# ඒකදේවත්වය - Thawheed

තව්හීද් (ඒකදේවත්වය හෙවත් එකම දෙවියෙක් පමණක් සිටින බව)

ඉස්ලාමයේ ආගමික ව්‍යුහයට මූලික වන්නේ තව්හීද් හෙවත් ඒකදේවවාදය යන සංකල්පයයි. ගසකට බීජය වන්නා සේම ඉස්ලාමයට තව්හීද් ඇත. බීජයෙන් ගස විශ්මයජනක ලෙස වර්ධනය වූ දිගුවක් වන්නා සේම ඉස්ලාමයේ ආගමික ක්‍රමයද තනි මූලික සංකල්පයක බහුවිධ ප්‍රකාශනයකි. මක්නිසාද යත්, ඉස්ලාමයේ ඒකදේවවාදය යන්නෙන් අදහස් කරන්නේ එකම දෙවි කෙනෙකු කෙරෙහි විශ්වාසයක් පමනක් නොව, සැම අතින්ම දෙවියන් වහන්සේගේ ඒකීයභාවයයි. දෙවියන් වහන්සේගේ මේ ඒකීයභාවයට කිසිවෙක් හවුල් නොවේ.

මානව විද්‍යාඥයන් විශ්වාස කරන්නේ ඉස්ලාමීය විශ්වාසයට අනුව තව්හීද් දේව සංකල්පය  මිනිස් ජීවිතයේ ආරම්භයේ සිටම පවතී. පළමු මිනිසා වන ආදම් (අ.ස) දෙවියන් වහන්සේගේ පළමු දූතයා විය. තව්හීද් සංකල්පය මිනිසුන්ට කියා දුන්නේ මෙම පළමු දූතයාය.

ඔහුගෙන් පසු පරම්පරාවල අය තමයි මේ ආගමික ක්‍රමය වෙනස් කරන්න පටන් ගත්තේ. මෙය ප්‍රධාන වශයෙන් සිදු වූයේ දේවත්වය ස්වභාවික සංසිද්ධීන් තුළ ආවේනික යැයි මිනිසුන් උපකල්පනය කිරීමට පටන් ගත් බැවිනි. කඳුකරයේ උස් බව, නොනවතින ගංගා ගලායාම, ඉර හඳ සහ තරු වල අසාමාන්‍ය දීප්තිය ගැන ඔවුන් පුදුම වූ අතර, එවැනි විස්මිත ගුණාංගවලින් යුත් දේවල් දෙවියන් වහන්සේගේ දේවත්වයට අනිවාර්යයෙන්ම හවුල් විය යුතු බව ඔවුහු අදහස් කලහ. විශේෂ කුසලතා ඇති මිනිසුන්ද දිව්‍ය ගණයට ඇතුළත් කලහ. ඔවුන් දෙවියන්ගේම අවතාර විය යුතු යැයි ඔවුන් සිතූහ. බහුදේව සංකල්පය ආගමික ක්‍රමයට රිංගා ගත්තේ මේ ආකාරයටය.

මානව ආගම් ආරම්භ වූයේ තව්හීද් සමඟ ය. බහුදේවවාදය පසුකාලීන වර්ධනයකි. මෙලොව විවිධ කාලවල පෙනී සිටි සියලුම නබිවරුන්ගේ මූලික

මෙහෙවර වූයේ මිනිසුන් ව්‍යාජ දෙවි වරුන්ව නමස්කාර කිරීමෙන් ඈත් කර නැවත සත්‍යය වූ එකම දෙවියන් වෙත යොමු කිරීමයි. එකම දෙවියන්ට නමස්කාර කිරීමට යොමු කිරීමටය.

මැවුම්කරුගේ පැවැත්ම පිළිබඳ සාක්ෂියක් ලෙස, අල් කුරාණය විශ්වයේ ආරම්භය සහ එහි පැවැත්ම පිළිබඳ සත්‍යය ඉදිරිපත් කරයි. විශ්වය පිළිබඳ සියලුම අධ්‍යයනයන් පෙන්නුම් කරන්නේ එය අහඹු උත්පත්තියක් විය නොහැකි බවයි.

විශ්වයේ ආරම්භයට සහ එහි පැවැත්ම සඳහා එයට හිමිකරුවෙකු අත්‍යවශ්‍ය වේ. එවැන්නෙක් (එවැනි දෙවියෙක්) නොමැතිව පවතින විශ්වයක් ගැන සිතාගත නොහැකි බැවින්, එවැනි දෙවියන් වහන්සේ කෙනෙකු සමඟ පවතින විශ්වයක් පිළිගැනීමට අප මනසද අපව බල කර සිටී.

දෙවියන් වහන්සේ මිනිසා මවා ඔහුව පොළොවේ පදිංචි කළේය. ඔහුව මෙහි ස්ථාපනය කිරීමෙන් පසු, ඔහු ඔහු ගැන නොනවතින සෝදිසියක් තබා ඇත. ජීවිතයත් මරණයත් එකසේ ඇත්තේ උන්වහන්සේගේ අතේය. මිනිසාට කුමක් ලැබුණත්, අහිමි වුවත්, ඒ සියල්ල දෙවියන් වහන්සේගේ කැමැත්ත මත සිදු වේ. කුරානය එය ප්‍රකාශ කරන පරිදි:

දෙවියන්වහන්සේ තමන් ගැන අල් කුරාණය තුලින් මෙසේ දන්වා ඇත.

*1. (නබියේ! මිනිසුන්ට) ඔබ මෙසේ පවසන්න, අල්ලාහ් එක් කෙනෙකි. (එම) අල්ලාහ් (කිසිවෙකුගේ) අවශ්‍යයතාවයක් නොවන්නෙකි. (සියල්ලන්ම ඔහුගේ වරප්‍රසාදයන්ම බලාපොරොත්තුවෙන් සිටින්නාහ). 3. ඔහු (කිසිවෙකුත්) ප්‍රසූත කළේ නැත. (කිසිවෙකු විසින්) ප්‍රසූත කරනු ලැබුවේද නැත. (එබැවින් ඔහුට පියෙක් ද නැත. දරුවන් ද නැත). 4. තවද ඔහුට සමාන කිසිවෙක්ද නැත. (ඒල් කුරානය 114)*

*අල්ලාහ්; ඔහු හැර වෙන දෙවි කෙනෙක් නැත - ඔහු ජීවමාන, සදාකාලික තැනැත්තාය. නිදිමත හෝ නින්ද යන දෙකම ඔහුව අබිබවා යන්නේ නැත. අහස් හි සහ පොලොවෙහි ඇති දේ ඔහුගේය. ඔහුගේ අනුමැතියෙන් මිස ඔහු වෙත මැදිහත් විය හැක්කේ කාටද? ඔබවුන් ඉදිරියේ ඇති දැයද, වෙන්ව ඇතින් තිබෙන*

*දැයද ඔහු හොඳින් දන්නේය. ඔහුගේ කැමැත්තෙන් තොර, ඔහු දන්නා දැයෙන් කිසිවක් (වෙන කිසිවෙකුට තමන්ගේ දැනුමෙන්) දැන ගත නොහැක. ඔහුගේ සිංහාසනය අහස් පොළොව මෙන් විශාලය. දෙකම රැකගැනීමෙන් ඔහු වෙහෙසට පත් නොවේ. ඔහු උත්තරීතර, අතිමහත්ය. (2: 255)*

සර්වබල්ධාරී ස්වභාවයෙන් සදාකල් එක්කෙනෙක් වශයෙන්ම සිටින දෙවියන් වහන්සේ අල් කුරනය තුලින් මෙසේද පවසා ඇත.

*(එබැවින් නබියේ!) ඔබ මෙසේ පවසනු: "ඔවුන් කියන අන්දමට අල්ලාහ් සමග වෙනත් දෙවිවරු සිටින්නේ නම්, ඒවා අර්ෂ්හි (අල්ලාහ් වන) ඔහු දෙසට යන මාර්ගය සොයාගෙන (ඔහු වෙතම ගොස්) ඇත. (17:42)*

ඉස්ලාමයේ නිර්වචනය කර ඇති දෙවියන්ගේ ඒකීයභාවය යන්නෙන් අදහස් කරන්නේ දෙවියන් වහන්සේගේ ස්වභාවයෙන් එකම භවයක් ඇති බවයි. විශ්වයේ ඇති අනෙකුත් සියලුම භෞතික හෝ භෞතික නොවන දේවල් මෙම එකම දෙවියන්ගේ මැවීම් වේ. ඒවා කිසිම ආකාරයකින් දිව්‍යමය දේවත්වයේ සංඝටක හෝ හවුල්කරුවන් නොවේ.

**කෙසේ වෙතත්, ඉස්ලාමීය දේවධර්මය තුළ, තව්හීද්ට එහි පැති දෙකක් ඇත:**

1. **පැවැත්මේ ඒකීයභාවය**
2. **ගුණාංගවල ඒකීයභාවය.**

මෙයින් අදහස් කරන්නේ දේවත්වයේ තත්ත්වය භුක්ති විඳින සහ දිව්‍යමය බලයන් ඇති එකම ජීවියෙකු පමණක් සිටීම යන කාරණයට අමතරව, වෙනත් කිසිවෙකුට දෙවියන් වහන්සේගේ ගුණාංගවලට හවුල් වීමට හෝ හිමිකම් පෑමට නොහැකි බවය.

මේවාට ඇතුළත් වන්නේ විශ්වය එහි සියලු අසංඛ්‍යාත ශරීර චලනය වන පරිදි නිර්මාණය කර පවත්වා ගෙන යාම, සියලුම ලෝකයන් පවත්වා ගෙන යාම සහ පෝෂණය කිරීම ඍජුවම දෙවියන් විසින් කළමනාකරණය කරනු ලැබේ. දෙවියන්ගේ කිසිම නියෝජිතයෙකුට හෝ කිසිම නිර්මාණයකට විශ්වයේ සිදුවීම් සම්බන්ධයෙන් ස්වාධීන බලයක් නැත.

*..ඔහුම රාත්‍රිය දහවලෙන් වසා දමන්නේය, එය ඉතාමත්ම තීව්‍ර වශයෙන් එකකට පිටුපසින් එකක් වශයෙන් පිළිවෙලින් සිදුවෙමින් පවතින්නේය, සූර්යයාද චන්ද්‍රයාද තාරකාවන්ද ඔහුගේ නියෝගයන්ට ඇතුලත් වන්නේය. උත්පාදනයන්ද එහි පාලනයද ඔහුටම අයත් දැය නොවේද? සකල ලෝකයන්ම උත්පාදනය කර පෝෂණය කර සංවර්ධනය කරන අල්ලාහ් ඉමහත් භාග්‍යයවන්තයෙකි. (7:54)*

දිව්‍යමය ගුණාංගවල බෙදීම ඉස්ලාම් ආගමට සම්පූර්ණයෙන්ම පිටස්තරයි. දෙවියන් වහන්සේ ඔහුගේ පැවැත්ම තුළ තනිව සිටින්නා සේම, උන්වහන්සේගේ ගුණාංගවලින්ද ඔහු තනිව සිටියි. උන්වහන්සේගේ සුවිශේෂත්වය පිළිගනිමින්, කුර්ආනය පහත සඳහන් ආයාචනය සමඟින් විවෘත වේ.

*අසීමිත දයාව හා අසම සම අනුකම්පාවෙන් යුත් අල්ලාහ් ගේ නාමයෙන්.*

*සියලු ප්‍රසංශා අල්ලාහ් ටය. (ඔහු) සකල ලෝකයම නිර්මාණය කර, සංවර්ධනය කර, සංරක්ෂණය කර, පෝෂණය කරන්නා වූද, අපරිමිත අනුකම්පා වද, අසම සම දයාවද, විනිශ්චය දින අධිපති (ද වන්නේ ය). (අනුකම්පාව හා දයාවද පිරි අප දෙවියනේ), ඔබවම අප නමදින්නෙමු. ඔබගෙන්ම අප පිහිට පතන්නෙමු. ඔබ අපට ඍජු මාර්ගය පෙන්වා දෙනු මැනව. ඔබගේ අනුකම්පාව හා දයාව කාහට පහළ කලේද, ඔවුන්ගේ මාර්ගයේ යාමට සලස්වනු මැනව. එය ඔබගේ කෝපයට පත් වූවන් ගිය මාර්ගයෙහිද නොව, අයහමගෙහි වූවන්ගේ මාර්ගයෙහිද නොව. (1: 1-7)*

---

## දෙවියන්ගේ රාජධානිය

සියළුම මැවීම් වලට ඉහලින් දෙවියන්වහන්සේ සදාකල්, එක්කෙනෙකු ලෙස සහ සර්වබලධාරී තත්වයෙන් එයට ගැලපෙන උත්තරීතර ස්වභාවයෙන් සිටී. දෙවියන්වහන්සේ සම්බන්ධයෙන් කාලය හෝ ස්ථානයක් මෙතරම් යැයි ගනනින් කිව නොහැක. ඔහු ඒ සියල්ල අභිභවා යන්නෙකි. දෙවියන්වහන්සේ සිටින ස්ථානය ගැන පවා අපට අපගේ මනසින් පරිකල්පනය කල නොහැකිය. නමුත් ඔහුගේ අවසන් දිව්‍ය හෙළිදරව්ව වන අල් කුරාණය හරහා එය "අර්ෂ්" ලෙස

හඳුන්වාදී තිබේ. වෙනත් කිසිවක් තිබීමට පෙර එය ජලයේ පාවෙමින් තිබෙන ලෙස දෙවියන්වහන්සේ එය නිර්මාණය කර ඇති බව පවසා ඇත. පසුව දෙවියන්වහන්සේ විසින් පළමු නිර්මාණය ලෙස විශේෂ පෑනක් නිර්මාණය කර ඇත.

හදීසයක මෙසේ සටහන්ව ඇත.

*උබදා බී. අල් සමිත් තම පුතාට මෙසේ කීවේය: පුතා! අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) පවසනු මට ඇසිණි: අල්ලාහ් මුලින්ම මැවූයේ පෑනයි. ඔහු එයට මෙසේ කීවේය: ලියන්න. එවිට එය මෙසේ ඇසුවේය: ස්වාමීනි, මා කුමක් ලිවිය යුතුද? ඔහු කීවේය: අවසාන හෝරාව පැමිණෙන තෙක් සෑම දෙයක් ගැනම නියම කර ඇති දේ ලියන්න. Grade: Sahih (Al-Albani) | Reference: Sunan Abi Dawud 4700 | In-book reference: Book 42, Hadith 105 | English translation: Book 41, Hadith 4683.*

අහස් සහ පොළොව නිර්මාණය කිරීමට වසර 50,000 කට පෙර ඒවායෙහි සිදුවිය යුතු දේවල් සියල්ල ආරක්ෂිත ඵලකයක් ලෙස හඳුන්වන අල්ලාහ්ගේ ඊලග නිර්මාණය ලෙස සලකන ලවුහුල් මහ්ෆූල් හි පෑන විසින් සටහන් කළ බව දෙව්දූත් අපට දැනුම් දී තිබේ. ඉන් පසු අල්ලාහ් අර්ෂ් හි තම සිංහාසනය (අල් කුරුසි) නිර්මාණය කර තම බලයෙන් අර්ෂයට පිටින් ඇති දැය නිර්මාණය කරන්නට විය.

ලවුහුල් මහ්ෆූල් HARD DISK එකක් යැයි අප උපකල්පනය කලොත් අල්ලාහ්ගේ නිර්මාණ සියල්ලෙහි දත්ත එහි ගබඩා කර ඇත. එනම්, වසර 2050 වන විට අප සිටින විශ්වයේ සියළුම ග්‍රහ වස්තූන් ස්ථානගත වන තැන් පිළිබඳව හෝ වේවා, ලබන වසරේ ඉපදෙන්නට සිටිනා කුහුඹුවෙකුගේ සම්පූර්ණ ජීවිත කාලයට අවශ්‍යය වන උගේ ආහාර වට්ටෝරුව හෝ වේවා එහි ලියවී අවසන්ය. අනාගතයේදී කවදා කෙසේ විශ්වය විනාශ වන්නේ දැයි පවා එහි ලියවී අවසන්ය. එසේම ස්වර්ගය අපාය වැනි දැහි සදාකල් පවතින ස්වභාවයන් ගැනද එහි සිටින්නන් ගැනද ලියවී අවසන්ය. (සියල්ලෙහි නිර්මාතෘ වන සර්වබලධාරී

දෙවියන් සිටින බවට සාක්ෂි සහ දෙවියන් යනු කෙබඳු කෙනෙක්ද යන ලිපි කියවීමෙන් දෙවියන් ගැන තව අවබෝධ කර ගත හැක).

සර්වබලධාරී දෙවියන්වහන්සේ (අල්ලාහ්) "සිංහාසනයේ අධිපති"ය. එයින් අදහස් කරන්නේ අල්ලාහ් සියල්ලට වඩා උත්තරීතර යන්නයි. සිංහාසනය, සියළුම නිර්මාණ කෙරෙහි මෙහෙයුම් මධ්‍යස්ථානය ලෙස (අපගේ මට්ටමින්) වටහා ගැනීම ප්‍රමාණවත් යැයි මම අදහස් කරමි. එහි සම්පූර්ණම බලධාරියා ඔහුය. ඔහු කිසිවකුගේ පරිකල්පනයට හා අවබෝධයට වඩා බොහෝ ඉහළින් සිටින අතර, මෙතෙක් ඔහුව දැකපු කෙනෙකුත් නොමැත. ඔහු තම මැවීම තුළින් ඔහුගේ මහිමය සහ ඔහුගේ සදාකාලික අධිකාරිය ප්‍රදර්ශනය කරයි. යුග අවසානයට පසු ස්වර්ගවාසීන්ට ඔහුව දැකීමට අවස්ථාවක් ලබා දෙන බව පවසා ඇත. එතෙක් ඔහුගේ රුව අපට සිතින් හෝ පරිකල්පනය කල නොහැක.

*"බලසම්පන්න බවින් විශ්වය නිර්මාණය කළෝ අප වන අතර තවද අපම එය නිරන්තරයෙන්ම පුළුල් කරන්නෙමු" නියත වශයෙන්ම අපි (එය ඔවුන්ගේ බුද්ධියට හසු නොවන සේ) අති විශාලවත් අන්දමට තබා ඇත්තෙමු. (51:47)*

ඔහු අපට ලබා දී ඇති මාර්ගෝපදේශය වන ශුද්ධ වූ අල් කුරාණය තුල තම රාජධානිය ගැන සහ පසුව ඔහු කළ නිර්මාණ ගැන යම් ප්‍රමාණයකට තොරතුරු කිහිපයක් අපට දන්වා තිබේ. කුරාණයට අමතරව අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) හරහා ද තවත් අමතර කරුණු කිහිපයක් හෙළිදරව් කර ඇත. පහතින් දැක්වෙන්නේ ඉන් කිහිපයකි.

*නියත වශයෙන්ම ඔබගේ දෙවියන් වන අල්ලාහ් අහස්ද, භූමියද දින හයකින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජධානිය ස්ථාවර කර තැබුවේය. ඔහුම රාත්‍රියෙන් දහවල අවසා දමන්නේය, (දහවලෙන් රාත්‍රිය වසා දමන්නේය). එය ඉතාමත් තීව්‍ර වශයෙන්ම එකකට පිටුපසින් එකක් වශයෙන් පිළිවෙලින් සිදු වෙමින් පවතින්නේය. සූර්යයාද, චන්ද්‍රයාද, තාරකාවන්ද ඔහුගේ නියෝගයන්ට ඇතුළත් වන්නේය. උත්පාදනයද, එහි පාලනයද ඔහුටම අයත් දැය නොවේද? සකළ ලෝකයන්ම උත්පාදනය කර, පෝෂණය කර, සංවර්ධණය කරන අල්ලාහ් ඉමහත් භාග්‍යවන්තයෙකි. (7:54)*

*(මිනිසුනේ!) ඔබගේ දෙවියන් වන එම අල්ලාහ්ම අහස්ද භූමියද දින හයකින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජ්‍යය ස්ථාපිත කළේය. (මේවා සම්බන්ධයෙන් වූ) සියළු කාරණාවන්ද ඔහුම සැළසුම් කර (පරිපාලනය කරමින්) සිටින්නේය. ඔහුගේ අනුමැතියෙන් තොරව (ඔබ වෙනුවෙන් ඔහු වෙත) මැදිහත් වී කතා කරන්නන් කිසිවෙකුත් නැත. එම අල්ලාහ්ම ඔබව උත්පාදනය කර පෝෂණය කරන්නාය. එබැවින් ඔහුවම (ඔහු එක්කෙනෙකුවම) ඔබ නමදිනු. (හොඳ හැඟීමක් ලබා ගැනීමට මේවා ගැන) ඔබ සිතා බැලිය යුතු නොවේද? (10:3)*

අල්ලාහ් (ඔහුගේ සන්න්නිධානයට අදාල) දින හයකින් අහස් හත නිර්මාණය කර ඇති අතර ඉන් දින දෙකකදී පහලම අහස වන අප සිටින විශ්වය නිර්මානය කර ඇත. අප සිටින විශ්වයේ නිර්මාණයට විද්‍යාඥයින් Big Bang Theory ලෙස හඳුන්වයි.

*ඔහුම අහස්ද, භූමියද දින හයකිදී උත්පාදනය කළේය. (ඒ අවස්ථාවේදී), ඔහුගේ අර්ෂ් ජලය මත (පාවෙමින්) තිබුණි. ඔබගෙන් දැහැමි ක්‍රියාවන් කරන්නෝ කවරෙක්දැයි ඔබව පිරික්සනු පිණිස, (ඔබවද, මේවාද ඔහු උත්පාදනය කළේය. නබියේ! (ඔබ මිනිසුන්ගෙන්)."ඔබ මිය යාමෙන් පසු නියත වශයෙන්ම (පණ ලබා දී) නැගිට්ටවනු ලබන්නෙහුය" යැයි පැවසුව හොත්, එයට (ඔවුන්ගෙන් වූ) ප්‍රතික්ෂේප කරන්නන් "මෙය ප්‍රකට සූනියමක් මිස, වෙන කිසිවක් නැත" යැයි පවසන්නාහ. (11:7)*

*ආරම්භයේදී එකට එක්කාසුවී තිබුණු අහස්ද, භූමියද අපිම වෙන්කර තැබුවෙමු යන්නද, පණ ඇති සෑම දැයක්ම ජලයෙන් උත්පාදනය කළෙමු යන්නද, මෙම ප්‍රත්ක්ෂේප කරන්නන් අවධානය කළ යුතු නොවේද? (මෙය) ඔවුන් විශ්වාස නොකරන්නෙහුද? (21:30)*

*ඔහුම අහස්ද භූමියද පෙර නිදසුනක් නොමැතිව උත්පාදනය කළ කෙනෙකි. (ඔහු කුමක් හෝ උත්පාදනය කිරීමට අදහස් කර), තීරණය කළහොත් "වනු" යැයි කීම පමණකින්ම එවෙලේම එය සිදුවන්නේය. (2:117)*

*(නබියෙ! මින්) පසුවද, ඔවුන් (ඔබව අනුගමනය නොකර) ඈත් වුවහොත් (ඔවුන්ට) ඔබ මෙසේ පවසනු: "අල්ලාහ් මාහට ප්‍රමානවත්ය. ඔහු හැර වෙන*

*කිසිම දෙවියෙක් නැත. (මගේ කාරණාවන් සියල්ලෙහි) ඔහු කෙරෙහි මා පූර්ණ විශ්වාසය තබා ඇත්තෙමි. ඔහුම අති විශාල වූ අර්ෂ් හි අධිපතිය".(9:129)*

*(නබියේ! එදිනදී) මලායිකාවරුන් තමන්ගේ දෙවියන්ට ප්‍රශංසා කර සුවිශුද්ධ කරමින්, අර්ෂ් වටා වට කරගෙන සිටිනු ඔබ දකින්නෙහිය. ඒ අතර ඔවුන් අතරේ සාධාරණ ලෙසටම විනිශ්චය කරනු ලැබේ. "ලෝකවාසීන් සියල්ලන්වම උත්පාදනය කර, පෝෂනය කර, සංරක්ෂණය කරමින් සිටින අල්ලාහ්ටම සියලු ප්රශංසා අයත් වේ" යයි (සියල්ලන් විසින් සුවිශුද්ධ කර, ප්‍රශංසා කර) පවසනු ලැබේ. (39:75)*

*අර්ෂ් උසුලාගෙන සිටින්නන්ද, එය වටා සිටින්නන්ද, තමන්ගේ දෙවියන්ගේ ප්‍රශංසාව මගින් (ඔහුව) සුවිශුද්ධ කරන්නාහ. ඔහුව විශ්වාස කරන්නාහ. විශ්වාසය තැබූවන්ගේ වැරදි වලට සමාව දෙන මෙන්ද ඉල්ලා සිටින්නාහ: (40:7)*

*එදිනදීම (යුග අවසානයේ) ඉමහත් වූ සිදුවීම සිදුවනු ඇත. එදිනදී අහස පුපුරා විවර වී පඬරැල් මෙන් බවට පත්වනු ඇත. (නබියේ!) මලායිකාවරුන් එහි පැතිවල සිටින්නාහ. තවද එදිනදී ඔබ දෙවියන්ගේ අර්ෂ්, මලායිකාවරුන් අට දෙනෙකු තමන්ට ඉහළින් ඔසවාගෙන සිටිනු ඇත. (මිනිසුනේ!) එදිනදී ඔබ (ඔබගේ දෙවියන් ඉදිරියේ) ගෙන යනු ලබන්නාහ. ගුප්ත වූ ඔබගේ කුමණ කාරණාවක් වුවද ඔහුට සැඟවෙන්නේ නැත.(69:15-19)*

තවත් හදීස් දෙකක මෙසේ සටහන්ව ඇත.

*"අල්ලාහ්ගේ දූතයාණෝ (ﷺ) මෙසේ පැවසූහ: 'අර්-රහ්මාන්ගේ අත පිරී ඇත, ඔහු දිවා රෑ නොබලා වියදම් කරයි, එහෙත් එය ඔහුගේ අතේ ඇති දේ අඩු වී නැත, ඔහුගේ සිංහාසනය ජලයට ඉහළින් ඇත, ඔහුගේ අනෙක් අතේ ඔහු ඔසවන සහ පහත් කරන මිසාන් (පරිමාණය) ඇත. Jami at-Tirmidhi | Grade: Sahih (Darussalam) | English translation: Vol. 5, Book 44, Hadith 3045 | Arabic reference: Book 47, Hadith 3319*

*ඉබ්නු මස්ඌද් පැවසූ බව විස්තර විය: පළමු අහස සහ ඊට ඉහළින් ඇති අහස අතර (දුර) අවුරුදු පන්සියයකි. සෑම අහසක් අතරම අවුරුදු පන්සියයක දුරක් ඇත.*

*හත්වන අහස සහ කුර්සි අතර (දුර) අවුරුදු පන්සියයකි. කුර්සි සහ ජලය අතර (දුර) වසර පන්සියයක් වන අතර, සිංහාසනය ජලයට ඉහළින් ඇත. අල්ලාහ් සිංහාසනයට ඉහළින් සිටින අතර, ඔබගේ ක්‍රියාවන්ගෙන් කිසිවක් ඔහුගෙන් සැඟවී නැත. (At-Tawhid, p. 105 සහ Al-Bayhaqi in Al-Asma' was-Sifat, p. 401 හි Ibn Khuzaymah විසින් විස්තර කරන ලදී. [මෙම අවුරුදු ගණනය කුමණ ඒකක මතදැයි සඳහන වී නැත]*

පලමු අහස (අපගේ විශ්වය) => එහි ඉහලින්ම බයිතුල් ඉස්සා => ඊට ඉහලින් අනිකුත් අහස් හය. හත්වෙනි අහසේ ආරම්භයේ බයිතුල් මා' මූර් => හත්වෙනි අහසේ ඉහලින් සිද්රතුල් මුම්තහා ගස => ඊටත් ඉහලින් අල්ලාහ්ගේ රාජධානිය පිහිටා ඇත.

මේ පිළිබඳව කෙටි සටහනක් ඔබ මවිත වන දේවල් කිහිපයක් නැමති ලිපියෙහි අවසානයට සඳහන් කර ඇත.




---

**කුර්සි.**

එය යම් කිසි භෞතික ස්ථානයක් විය යුතුයි. එහි විශාලත්වය අහස් හතට සාපේක්ෂවද (අපට සිතා ගත නොහැකි තරම්) විශාලය. එම කුර්සි ය අප ඉහත කතා කල අහස් හත ආදියෙහි පරිපාළක මධ්‍යාස්ථාන යැයි අප උපකල්පනය

කරමු. එය ('කුර්සි') කොතරම්ම විශාල වුවත් අර්ෂ් සහ අල්ලාහ්ගේ තත්වය හා සන්සන්දනය කරන විට එයද කාන්තාරයේ වැලි කැටයක් තරම් යැයි අවසන් නබි මොහම්මද් (ﷺ) තුමා පවසා ඇත. ඒ අනුව අල්ලාහ් කෙතරම් බලසම්පන්නයෙක්දැයි අපට යම් අදහසක් ගත හැක.

දෙවියන්ගේ අර්ෂ් මලායිකාවරුන් හතර දෙනෙකු විසින් ඔසවා සිටින බව පවසයි. විනිශ්චය දිනයේ ඔවුන්ගේ ගණන අටක් බව අල්ලාහ් දැනුම් දී ඇත.

*(නබියේ!) මලායිකාවරුන් එහි පැතිවල සිටින්නාහ. තවද එදිනදී ඔබ දෙවියන්ගේ අර්ෂ්, මලායිකාවරුන් අට දෙනෙකු තමන්ට ඉහලින් ඔසවාගෙන සිටිනු ඇත. (69:17)*

---

## දෙවියන්ට සමානයන් තැබීම

අල්ලාහ් (දෙවියන්) එක්කෙනෙකි. ඔහුට කිසිවෙකුගේ සහාය අවශ්‍ය නොවේ. මෙය ඉස්ලාමයේ ප්‍රධාන ඉගැන්වීමකි. එබැවින් අල්ලාහ්ට සමානයන් තැබීම හෝ ඔහු වෙනුවෙන් පමණක් කල යුතු වැඳුම් පිදුම් වලදී තවත් අය එකතුකර ගැනීම බලවත් වරදක් වන්නේය. මේ නිසා ලුක්මාන් අලෛහි සලාම් සිය පුතුන්ට මෙසේ අවවාද කළේය.

*"ලුක්මාන් තම පුතාට අවවාද කරන කල පැවසුවේ, 'මාගේ දයාබර පුතුනි! අල්ලාහ්ට කිසිම දෙයක් සම නොකරන්න! නියතවශයෙන්ම අල්ලාහ්ට වෙනත් දෙයක් සමකිරිම ඉතා දරුණු අපරාධයකි" (කුරානය 31:13).*

අද බොහෝ අය අල්ලාහ්ට නමදින අතරම මළවුන් වෙනුවෙන් උත්සව පවත්වා ඔවුන්ගෙන් ද උදව් පතනු දැකිය හැකිය. මෙය අල්ලාහ් සමා නොකරන වරදක් බව ඔවුන් තේරුම් ගත යුතුව තිබේ. එවැනි දෙයක් සඳහා අල් කුරානයේ හෝ නබිතුමාගේ හදිස් වල මූලාශ්‍ර කිසිවක් නොමැත. එහෙත් බොහෝ නොමග ගිය උදවිය නොයෙකුත් හේතු දක්වමින් එම වරදේ නියලේන්නෝය. මේ නිසා සිදු

වන්නේ තමන් අල්ලාහ් වෙනුවෙන් කරන පින් දහම් වලටත් කුලිය නොලැබී යාම ය. තවද එම ක්‍රියාවන් නිසා ඔවුන් අල්ලාහ්ගේ කෝපයට ඇතුල් වන්නෝය.

*"නියතවශයෙන්ම අල්ලාහ් ඔහුට (වෙන දෙයක්) සම කරනු ලැබීම ක්ෂමා නොකරන්නේය. එය හැර අනෙක්වා ඔහුගේ අභිමතය පරිදි ක්‍ෂමා කරන්නේය. කවරෙක් (නැමදීමේ දී) අල්ලාහ්ට (යමක්) ආදේශ කරයිද ඔහු නියතවශයෙන්ම මහා පාපයක් ගොතන ලද්දෙක් වේ" (කුරානය 4:48).*

සාස්තෘවරුන්ට හෝ ඔවුන් මිය ගිය පසු ඔවුන්ගේ සොහොන්වලට හෝ ගොස් ප්‍රාර්ථනා කිසිම දෙවියන්ට සමානයන් තැබීමකි. මෙය විශාල පවක් වන්නේය. ඇයිද යත් මුස්ලිම්වරුන්ගේ ප්‍රාර්ථනයන් යොමු කල හැක්කේ අල්ලාහ්ට පමණි. මෙවැනි වරදක් දැන දැන සිදු කරන්නේ නම් ඔහුට දෙවියන්ගෙන් සමාවක් ලැබෙන්නේ නැත. එබැවින් ඔවුන් මරණයට පත්වීමට පෙර දෙවියන්ගෙන් සමාව ගෙන නොතිබුනේ නම් සදාකල් නිරයට පාත්‍ර වීමට නියමිතය. අල් කුරානයේ මෙසේ සඳහන් වේ.

*"නුඹගේ 'රබ්' ඔහුට හැර (වෙන කිසිවෙකුටත්) නැමදුම් නොකළ යුතු යැයි නියෝග කරයි" (කුරානය 17:23).*

කුරානයේ තවත් තැනක මෙලෙස සඳහන් වේ.

*"අවංක ලෙස අල්ලාහ්ට පමණක් මිස වෙන කිසිවෙකුට නැමදුම් කරන ලෙස ඔවුන්ට නියෝග කෙරුවේ නැත" (කුරානය 98:5).*

මෙසේ තිබියදී අල්ලාහ්ට පමණක් කල යුතු නැමදීම් සමග තවත් කෙනෙකු එකතු කර ගත නොහැකිය. මේ නිසා නැමදීමේදී තවත් කෙනෙකුගේ සිත දිනා ගැනීමට හෝ වෙනත් කෙනෙකු රැවටීමට එය සිදු කරන්නේ නම් එයද දෙවියන්ට සමානයන් තැබීමක් ලෙස සලකනු ලැබේ. මේ නිසා ඉතා පිරිසිදු චේතනාවෙන් පමණක් අල්ලාහ්ට නමදුම් සිදු කල යුතු ය.

ආදම් තුමාගේ සිට නුහ් නබි තුමා දක්වා සොහොන් වන්දනාව තිබුනේ නැත. එහෙත් නුහ් නබිතුමාගේ කාලයේදී එය ආරම්භ විය. ඒ අනුව එකල ජීවත්වූ සාස්තෘවරුන්ට ගෞරව කිරීමේ පදනමින් ආරම්භ කරන ලද මෙය අවසාන

කෙරුනේ ඔවුන් අල්ලාහ්ගේ අතරමැදියන් ලෙස පත් කර ගැනීමෙනි. එහෙත් අල්ලාහ්ට අතරමැදියන් පත්කර ගැනීම විශාල පාපයක් ලෙස ඉස්ලාම් දහම පෙන්වා දෙන්නේය. මළවුන්ගෙන් ප්‍රර්ථනා කිරීම හෝ ඔවුන්ව අතරමැදියන් ලෙස පත්කරගනිමින් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම කෙනෙකුව දහමින් බැහැර කල හැකි වරදවල් ය. එවැනි වරදක් සිදු කරමින් කරන සලාතයට හෝ උපවාසයට හෝ අනෙක් පින් දහම් වලට කුසල් නොලැබෙන්නේය. ඒ අනුව කෙනෙකුගේ කුසල් අල්ලාහ් වෙත පිලිගැනීම සඳහා තිබිය යුතු මූලික කොන්දේසිය වන්නේ ඔහු අල්ලාහ්ට සමානයන් නොතැබීමය.

*"ඔබ පිළිම වන්දනාවේ යෙදෙනවා නම්, නුඹලාගේ සියලු ක්‍රියා නිෂ්ඵල වන්නේය. තවද ඔබ පරාජිතයින් සමඟ සිටින්නෙහිය" (කුරානය 39:65).*

මුස්ලිම්වරයෙකු යාක්ඤා කල යුත්තේද පඬුරු දැමිය යුත්තේද සලාතය ඉටු කල යුත්තේද අල්ලාහ්ට පමණි. මේ නිසා කිසිම කෙනෙක් මළවුන් වෙනුවෙන් පඬුරු දැමීම හෝ ඔවුන්ගෙන් යාක්ඤා කිරීම නොකල යුතුය. මෙය පැහැදිලිව දැකිය හැක්කේ මුස්ලිම්වරයෙකු සලාතය ඉටු කරන අවස්ථාවේදීය. ඔහු ෆාතිහා සූරාව පරායණය කරන අවස්ථාවේදී,

*"අපි නුඹවම නමදිමු. නුඹගෙන්ම උදව් පතමු" (කුරානය 1:5)* යනුවෙන් පවසන නිසාය. තවද ඔහු අත්තහියාත් පරායණය කිරීමේදී පවසන්නේ සෑම පඬුරක්ම අල්ලාහ්ට බවයි. එසේ තිබියදී මුස්ලිම්වරයෙකුට කිසිම හේතුවක් නිසාවත් මළවුන්ගෙන් හෝ සාස්තෘවරුන්ගෙන් උදව් පැතීමට හෝ ඔවුන් වෙනුවෙන් පඬුරු දැමීමට හෝ ඔවුන් වෙනුවෙන් සතුන් කැප කිරීමට හෝ නොහැකිය.

---

## ප්‍රතික්ෂේප කිරීම හෙවත් ලොකුම පාපය

ප්‍රතික්ෂේප කිරීම ලෙස මෙහිදී සළකනු ලබන්නේ විශ්වයේ නිර්මාතෘව සහ ඔහුගේ මඟ පෙන්වීම ප්‍රතික්ෂේප කිරීමයි.

විශ්වයටත් තමාටත් නිර්මාතෘ කෙනෙක් සිටිනා බව සමහරුන් දන්නේ නැති නිසා නොදැනුවත්වම හෝ මෙම ප්‍රතික්ෂේපය සිදු විය හැක. නමුත් නොදැනුවත්කම අවසානයට නිදහසට කරුනක් නොවෙයි. මෙය නිවැරදිව වටහා නොගෙන නොසලකා හැරියොත් තමන් තමන් විසින්ම හුස්ම හිරකරගෙන සියදිවි නසාගත්තාක් මෙනි. ඇත්තටම නම් එය ඊට වඩා දරුණුය. එනිසා සෑම මිනිසෙකුම තම ජීවිත කාලය තුල දැනගත යුතු මූළික කරුණු කිහිපයක් ඇත. ඒවා නම්, විශ්වය සහ තමාව නිර්මාණය කල දෙවිඳුන් ගැනත්, දෙවියන්වහන්සේ විසින් මිනිසාව නිර්මාණය කලේ ඇයි දැයි යන්නත්, මිනිසා තම ජීවිත කාලය තුල තම නිර්මාතෘ සමග සම්බන්ධතාවය තබා ගත යුත්තේ කෙසේද යන්නත් ගැනය. දැනුවත්ව හෝ නොදැනුවත්ව දෙවියන්ව ප්‍රතික්ෂේප කරමින් ජීවත් උනොත්, තම මරණින් පසු ඔහු ඉමහත් අලාභවන්තයෙක් බවට පත්වනු නියතය.

දෙවියන් තම දහම තුල මිනිසාට බල කිරීමක් කර නැත. තම කැමැත්තට නිදහස දී ඇත. නමුත් ඒ නිදහස මරණය තෙක් පමණි. ඉන් පසු අප (කැමති උනත් නැතත්) නිර්මාතෘගේ ඉදිරි පියවරයන් කරා මුහුණ දිය යුතුය.

*(නබියේ!) ඔබ මෙසේ පවසනු; "(සම්පූර්ණයෙන්ම) සත්‍යය වූ (මෙම ධර්මය) ඔබගේ දෙවියන් විසින් පහළ කරන ලදී" කැමැත්තන්ට මෙය විශ්වාස කළ හැකිය, අකැමැත්තන්ට (මෙය) ප්‍රතික්ෂේප කර දැමිය හැකිය". (නමුත් මෙම ප්‍රතික්ෂේප කරන) අපරාධකාරුවන්ට නියත වශයෙන්ම අපි නිරයම පිළියෙල කර ඇත්තෙමු (18:29)*

**නියත වශයෙන්ම නිරයට යවන තරමට බරපතල වූ මෙම ප්‍රතික්ෂේප කිරීම කුමක්ද?**

තමන්ට පුළුවන්ද තමන්ට උපතක් දුන් තමන්ගෙම අම්මව ප්‍රතික්ෂේප කරන්න. ඇය ලේ කිරිකර තමන්ට පොවා, ලොකු මහත් කර, උගන්වා, ඇයට හැකි උපරිමයෙන් සහයෝගය දී සිටියදී කාටද පුළුවන් ඇය තමන්ගෙ මව නොවෙයි කියන්න හෝ තමන්ට මවෙක් නැතැයි කියන්න?

මීට වඩා බරපතලයි තමන්ට නිර්මාතෘ කෙනෙක් නැහැයි කියලා සිතා සිටිනවා නම්. එහෙම හිතනවා නම් තමන්ට නොදැනුවත්වම මේ ලෝකෙ බොහෝ

දේවල් ප්‍රතික්ෂේප කරන්නෙක් බවට තමන්ව නිරායාසයෙන්ම පත් වෙනු ඇත. අන්තිමට තමන්ට තමන්ගේ මනුෂ්‍යාත්වය පවා නැති වෙනවා. තමන් කිසිම කෘත ගුණයක් නොදන්නා ඉතාම පහත් කෙනෙක් බවට පත්වෙනවා.

මිනිසාගේ නිර්මාතෘ මිනිසාට එවූ අවසන් මාර්ගෝපදේශයේ ප්‍රතික්ෂේප යන වචනය 525 වතාවක් සඳහන්ව ඇත.

මෙය මෙතරම් බහුල වශයෙන් සඳහන් කිරීමට හේතුව නම්, මිනිසාගේ ඉරණම තීන්දු වන්නේ ඔහු රැස් කරන කුසල් අකුසල් වලට වඩා විශ්වාසය සහ ප්‍රතික්ෂේපය නැමති කාරණාව මතය.

ප්‍රතික්ෂේප කිරීම පහදා දීමට මම පහත කුරාන් වැකි තුන උපයෝගී කර ගැනීමට අදහස් කලෙමි. (අල් කුරාණය, පරිච්ඡේදය 95)

*නියත වශයෙන්ම අපි මිනිසාව ඉතාම ලක්ෂණ ස්වරූපයෙන් උත්පාදනය කර ඇත්තෙමු. (95:4)*

*(ඔහුගේ නපුරු ක්‍රියාවන් හේතුවෙන්) පසුව ඔහුව දීන වූවන්ගෙනුත් දීන වූවෙකු (නිරාවාසියෙකු) බවට අපි පත්කර හරින්නෙමු (95:5)*

*එහෙත්, කවුරුන් විශ්වාසය තබා දැහැමි ක්‍රියාවන් කරමින් සිටින්නෝද, ඔවුන් හැර. ඔවුන්ට (සදාකල්ම) නොවැලැක්වෙන හොඳ ඵලවිපාක (ස්වර්ගයන්හී) ඇත. (95:6)*

මම මෙම වැකි නොසලකා හැරියොත් (මම කැමති උනත් නැතත්) මගේ තත්වය එම වැකි තුලම ලියැවී ඇත. එනම් දෙවියන් විසින් මාව දීන වූවන්ගෙනුත් දීන වූවෙක් බවට පත්කර හරිනවා යැයි පවසා ඇත. එයට අනුව එහි ප්‍රතිඵල මටම අත් විඳින්න සිදුවනු ඇත. (එයට විරුද්ධව මට විශ්වයේ අධිපති සමග සටන් කළ නොහැක).

මෙම වැකි ප්‍රතික්ෂේප කලොත් මම නොදැනුවත්වම හෝ මවිසින් ප්‍රතික්ෂේප කරන තව කරුනු කීපයකුත් එයට එකතු වනු ඇත. ඒවා නම්,

1). මෙම වැකි සඳහන් වන්නේ ශුද්ධ වූ අල් කුරාණය තුලයි. එතුල අන්තර්ගතවන සෑම වැකියක්ම විශ්වයේ අධිපති වන දෙවියන්වහන්සේ විසින් පහළ කර ඇති බවට සහතික කර ඇත. මිනිසෙකුගේ වචන එකක්වත් එහි අන්තර්ගත කර නැත. මම මෙම වැකි බොරුවක් යැයි කියනවා නම්, විශ්වයේ අධිපති එවූ පණිවිඩය (එනම් අල් කුරාණයම) බොරුවක් බවට මම තහවුරු කරනවා. (නමුත් කුරානය තුල කිසිඳු බොරුවක් නැති බවට එයම එයට සාක්ෂි දරනවා). එය අධ්‍යනය කිරීම හෝ නොකිරීම මගේ ඉරණමට ඍජු ලෙසම බලපාන කරුණක් වී ඇත. එනිසා කුරාන් වැකි බොරු යැයි කීමට හදිස්සි නොවී ඒ ගැන සොයා බැලිය යුතුය.

2). දෙවියන් විසින් මිනිසාව ඉතාම ලක්ෂන ස්වරූපයෙන් නිර්මාණය කර ඇති බව එහි පවසනවා. අනිකුත් සියළුම සතුන්ට වඩා මිනිසා සුවිශේෂී බව අපට අවිවාදයෙන් පිළිගත හැක. දෙවියන් මිනිසාව නිර්මාණය නොකලා යැයි ඔබ විශ්වාස කරනවා නම්, ඔබ විශ්වාස කරන වෙනත් කරුණක් දෙවියන්ගේ කාරණාවට වඩා හොඳින් ඔබ අවබෝධ කරගෙන සිටිය යුතුයි. නමුත්, මට නම් එයට වඩා පිළිගත හැකි වෙනත් තොරතුරක් මෙතෙක් හමුවී නැත. මම හෝ ඔබ කොතරම් උත්සහ ගත්තත් අපට ඒ සඳහා ප්‍රමාණවත් දත්ත සොයාගත නොහැක. එය ස්ථිරය. මෙහි ඇති පරිණාමවාදය සහ දෙවියන්ගේ නිර්මාණ යන ලිපිය තුල ඒ බව සඳහන් කර ඇත.

3). මිනිසා කරන ක්‍රියාවන් වල කුසල් අකුසල් සඳහා දෙවියන් විසින් ඵලවිපාක ලබා දෙන බව එහි සඳහන්. එය ප්‍රතික්ෂේප කරනවා නම් ඔබට සිදුවෙනවා කුසල් අකුසල් යාන්ත්‍රණය කෙසේ සිදුවන්නේ දැයි පැහැදිළි කිරීමට. දෙවියන් පෙන්වා දෙන ක්‍රමයට වඩා සාර්ථක ක්‍රමයක් මට නම් පෙන්වා දිය නොහැකිය.

4). මෙහි ස්වර්ගය සහ නිරය ගැන සඳහන් වෙනවා. ඔබ ඒවා පිළිගන්නවානම් ඒවා කෙසේ නිර්මාණය උනා දැයි ඔබ දන්නවාද? දන්නෙ නැතිනම්, ඒවා දෙවියන්ගේ නිර්මාණ ලෙස පෙන්වා දෙන කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කළ යුතු වෙනවා. මෙනිසා මෙය අධ්‍යනය කළ යුතු දෙයකි. දැනුම නොමැතිව තීරණ ගන්නවාට වඩා අධ්‍යනය කර දැනගැනීම තමාගේ යුතුකමකි. මිනිසාගේ නිර්මාතෘ පවසන පරිදි මිනිසාගේ ගමනාන්තය මේ දෙකෙන් එකකි.

වෙන මාර්ග නැත. දෙවියන්ට හොරෙන් ඔහුගේ නිර්මාණ වලින් එක අණුවකට (හෝ එක ආත්මයකට හෝ) පිටව යා නොහැකි බව දෙවියන් සහතික කර ඇත.

5. මෙහි විශ්වාසය තබා දැහැමි ක්‍රියාවන් කිරීමක් ගැන සඳහන් වී ඇත.

මොනව ගැනද විශ්වාසය තැබිය යුත්තේ? දෙවියන් විසින් අප වෙත එවා ඇති අල් කුරාණය තුලද, අවසන් නබිවරයාද කරුණු පෙන්වා දෙමින් එම විශ්වාස කළ යුතු කරුණු 6 ක් ඉදිරිපත් කර ඇත. මම "විශ්වාස නොකරන්නෙක්/ ප්‍රතික්ෂේප කරන්නෙක් නම්" එම කරුණු 6 ම ප්‍රතික්ෂේප කරන්නෙක් බවට නිරායාසයෙන්ම මාව පත් වනු ඇත. උදාහරණයකින් කියනවානම් බෞද්ධ අය විසින් මෙම කරුණු 6 ම ප්‍රතික්ෂේප වෙනු ඇත. එය බරපතල කාරණාවකි. ඒ කරුණු 6 පහත පරිදි වේ.

1. දෙවියන්ගේ ඒකීයභාවය පිළිබඳ විශ්වාසය
2. දෙවියන්ගේ දූතයන් කෙරෙහි විශ්වාසය
3. දෙවියන්ගේ පොත් කෙරෙහි විශ්වාසය
4. අනාගතවක්තෘවරුන් කෙරෙහි විශ්වාසය
5. විනිශ්වය දවස කෙරෙහි විශ්වාසය
6. දිව්‍ය ආඥාව කෙරෙහි විශ්වාසය

ඉහත කරුණු 6 ම විශ්වාස කළ හැකි වන තරමට අපට තොරතුරු ලැබී ඇත. (මෙම වෙබ් පිටුවලද ඒවා ඉදිරිපත් කර ඇත). ඒවා ගැන අධ්‍යයන නොකර මම විසින් ඒවා ප්‍රතික්ෂේප කරනවා නම් (මම කැමති උනත් නැතත්) ඉහත වැකි තුලින් (සහ අල් කුරාණය පුරාවටම) දෙවියන් පවසනවා එවැන්නන්ගේ මරණින් මතු තත්වය ගැන. එනම් ඔවුන් නිරාවාසීන් බවට පත් කරනු ඇත.

6). කුමක්ද මෙහි "නීච වූවන්ගෙනුත් නීච වූවන්" බවට පත් වෙනවා කියන දේ? මම මගේ මව ප්‍රතික්ෂේප කරන්නෙක් නම් මම නීචයෙකි. ඉහත කරුණු 6 ද ඇතුළුව මම මගේ නිර්මාතෘව ප්‍රතික්ෂේප කරන්නෙක් නම් මම නීච වූවන්ගෙනුත් නීචයෙකි. එය සිදුවන්නේ පහත ආකාරයටයි.

තිරිසන් ලෝකය පහත් යැයි සමහරු සිතනවා. නමුත් දෙවියන්ගේ මාර්ගෝපදේශයට අනුව තිරිසන් සතුන් මරණින් මතු නිරාවාසීන් වන්නේ නැත. නිරය නිර්මාණය කර ඇත්තේ මිනිසුන් සඳහාය. එනිසා එහි සේන්දුවන අය අවසානයේ තිරිසනුන්ටත් වඩා පහත් තත්වයට වැටෙනවා නොවෙද? මම මම ගැනත් ඔබ ඔබ ගැනත් සිතා බැලිය යුතුයි. කරන දෙයක් මරණය ලගා වන තෙක් පමණි. ඉන් පසු අපගේ පරීක්ෂනය අවසන්. තම නිර්මාතෘව සහ ඔහුගේ මග පෙන්වීම ප්‍රතික්ෂේප කිරීම සෙල්ලමක් හෝ සුළු පටු කාරනාවක් නොවේය!

මෙම සියළුම කරුනු තහවුරු කිරීමට අවශ්‍යය කරන ලිපි මෙම වෙබ් අඩවිය තුලම ඇත.

**දෙවියන්ව ප්‍රතික්ෂේප කරන අයව හඳුනා ගන්නෙ කොහොමද?**

1). දෙවියන් විසින් පහළ කළ (තම සමාජයට අදාල) දිව්‍ය වදන් (සහිත පුස්තකය) අධ්‍යනය නොකරන සහ (තම සමාජයට අදාල) නබිවරයාව අනුගමනය නොකරන අය. දෙවියන් පවසන ආකාරයට ඔවුන් නොමග ගිය ජන කොටසකි. මොවුන් තම නිර්මාතෘව සහ ඔහුගේ මගපෙන්වීම ප්‍රතික්ෂේප කර ඇත. එවැනි අය නම්,

- බෞද්ධ දර්ශනය පමණක් පිලිගන්නා අය.
- හින්දු අය දෙවියන්ව නොමග ගිය ආකාරවලින් අනුගමනය කිරීම.
- වෙනත් දර්ශන අනුගමනය කරන අය.
- භෞතික වස්තූන් නමදින්නන්.
- මිනිසුන්ව නමදින්නන්.
- සත්වයින්ව නමදින්නන්.
- යක්ශයින් නමදින්නන්.
- කිසිම ආගමක් දහමක් අනුගමනය නොකරන අය.

2). දෙවියන් ගේ මාර්ගෝපදේශ පරිහරණය කළත් එහි උපදෙස් නිසි පරිදි භාර නොගැනීම/ ප්‍රතික්ෂේප කිරීම. (විශේෂයෙන්ම දෙවියන් පිළිබඳව සඳහන් කරුණු).

දෙවියන්ගේ උපදේශය වන්නේ තම සමාජය වෙත අවසන් වරට පැමිණ ඇති නබිවරයා සහ ඔහුට දෙවියන් විසින් පහළ කළ මාර්ගෝපදේශය අනුගමනය කරන ලෙසය. එම උපදෙස ප්‍රතික්ෂේප කර හෝ එම ධර්මය විකෘති කරගෙන වැරදි මාර්ගයේ යන අය පහත ආකාරවලින් අපට දැකීමට පුළුවන. දෙවියන් පවසන ආකාරයට ඔවුන් දෙවියන්ගේ කෝපයට පාත්‍ර වූ ජන කොටසකි.

- 1, **යුදෙව්වරුන්:-** ඔවුන් වෙත පැමිණි මූසා (අ.ස) නබි සහ ඔහුට පහළ වූ තව්රාත් නැමති දිව්‍ය හෙළිදරව මත නතර වී (එයද විකෘති කරගෙන) ඉන් පසු පහළ කළ මාර්ගෝපදේශ සහ නබිවරුන්ව අනුගමනය නොකරන ජනතාව.
- 2, **ක්‍රිස්තියානිවරුන්:-** ඔවුන් වෙත පැමිණි (Jesus) ඊසා (අ.ස) නබි සහ ඔහුට පහළ වූ ඉන්ජීල් නැමති දිව්‍ය හෙළිදරව්ව මත නතර වී (එයද විකෘති කරගෙන), නබිවරයාව දෙවියන් වශයෙන් සලකා, ඉන් පසු පහළ කළ මාර්ගෝපදේශ සහ නබිවරයාව අනුගමනය නොකරන ජනතාව.
- **3, මුස්ලිම් සමාජයේ වැරද ගිය අය:-** අවසන් නබි මොහම්මද් (ﷺ) තුමා පවසා තිබෙනවා මුස්ලිම් සමාජයේත් සිටින එහෙත්, දෙවියන්ව නැමදීම නොකරන ජනතාව ඔහුගේ ජනතාවක් නොවන බව. එසේම ධර්මයෙහි කොටසක් පිළි අරන් තව කොටසක් ප්‍රතික්ෂේප කරන්නන්ද, එසේත් නැතිනම් ධර්මයට අලුතින් දේවල් එකතු කරන්නන් සහ ධර්මය තුල ඇති දෙය වෙනස් කරන්නන්ද ප්‍රතික්ෂේප කරන්නන්ම බව.

---

# ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ කුරාන් වැකි

"මෙය ඇත්තෙන්ම බරපතල අනතුරු ඇඟවීමකි".

ශුද්ධ වූ අල් කුරාණය මොහම්මද් ﷺ නබි තුමා වෙත වසර 23 ක් පුරාවට විටින් විට පහළ වූවකි. එහි මිනිසාගේ ප්‍රතික්ෂේප කිරීම සඳහන් කරමින් දෙවියන්වහන්සේ විසින් හෙළි කරන ලද වැකි කිහිපයක් පහත පරිදි ගොනු කර ඇත.

1. විශ්වයේත් තමාගේත් නිර්මාතෘව ප්‍රතික්ෂේප කිරීම.
2. දෙවියන්ගේ පණිවිඩය වන අල් කුරාණය ප්‍රතික්ෂේප කිරීම.
3. අප සමාජයට එවූ නබි මොහම්මද් ﷺ තුමාව ප්‍රතික්ෂේප කිරීම.
4. දෙවියන්ගේ දයාව සහ වරප්‍රසාද ප්‍රතික්ෂේප කිරීම.
5. ප්‍රතික්ෂේප කිරීම ගැන පොදු පණිවිඩ.
6. මිනිසුන්ව, පිළිරූ සහ වෙනත් දෑ නමදින්නන්ට අදාලව.
7. මොහම්මද් ﷺ නබි තුමාට සෘජුවම සතුරුකම් කළ අය සම්බන්ධව.
8. ධර්මය හිමි අය (යුදෙව්වන් සහ ක්‍රිස්තියානිවරුන්)ට අදාලව.
9. පෙර සමාජවල ප්‍රතික්ෂේප කළ ජනතාව සම්බන්ධව.
10. ප්‍රතික්ෂේප කළ ජනතාව සහ විනිශ්වය දිනයේ ඔවුන්ගේ තත්වය.
11. ප්‍රතික්ෂේප කළ ජනතාව සහ නිරයේ සිටින ඔවුන්ගේ තත්වය.
12. ප්‍රතික්ෂේප කළ නබිවරුන්ගේ පවුල් වලම අය කිහිප දෙනෙකු ගැන.

දෙවිඳුන් කුරානය තුලින් බොහෝ තැන්වල යුදෙව්වරුන්ගේ ප්‍රතික්ෂේප කිරීම ගැනත්, ක්‍රිස්තියානුවන්ගේ ප්‍රතික්ෂේප කිරීම ගැනත් වැඩි වශයෙන් කතා කර ඇති අතර වෙනත් ඇදහිලිවන්තයින්ගේ ප්‍රතික්ෂේප කිරීම ගැනත් සුළුවෙන් කතා කර ඇත.

උදාහරණ, උපදෙස්, අණතුරු ඇඟවීම් සහ භිය ගැන්වීම් සහිත මෙම වදන් හරහා මිනිසුන්ට බොහෝ පාඩම් ඉගන ගෙන තමන්ගේ තත්වය නිසි පරිදි පිළිසකර කර ගැනීමට ප්‍රයෝජනවත් දෙයක් ලෙස මෙම පණිවිඩය තිබෙනු ඇත.

### 1. විශ්වයේ සහ තමාගේ නිර්මාතෘ (දෙවියන්)ව ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව

*(සියල්ලටම වඩා) ශ්‍රේෂ්ඨයෙකු හා ඥානවන්තයෙකු වන අල්ලාහ් විසින් මෙම ධර්මය පහළ කරනු ලැබ ඇත්තේය. අහස්ද භූමියද ඒවා අතර ඇති දෑයද නියමිත කාරණාවකට හා (ඒවාට) නියමිත කාල අවකාශයකටද මිස අපි උත්පාදනය කළේ නැත. කවුරුන් (අල්ලාහ්ව) ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන් තමන්ට බියගන්වා අනතුරු අඟවන ලද දෑය ප්‍රතික්ෂේප කර හරින්නාහ. (46:1,2)*

*අහස්ද, භූමියද, මේවා මධ්‍යයෙහි ඇති දෑයද, නිකරුණේ අපි උත්පාදනය කළේ නැත. මෙය (නිකරුණේ යන්න) ප්‍රතික්ෂේප කරන්නන්ගේ සිතුවිල්ලකි.*

*ප්‍රතික්ෂේප කරන මොවුන්ට විනාශයයි. මොවුන්ට (නිරා) ගින්නම ලැබෙනු ඇත. (38:27)*

*ආරම්භයේදී එකට එක්කාසු වී තිබුණු අහස්ද, භූමියද අපිම වෙන්කර තැබුවෙමු යන්නද, පණ ඇති සෑම දැයක්ම ජලයෙන් උත්පාදනය කළෙමු යන්නද, මෙම ප්‍රතික්ෂේප කරන්නන් අවධානය කළ යුතු නොවේද? (මෙය) ඔවුන් විශ්වාස නොකරන්නෙහුද? (21:30)*

*පූර්ණ සඳ මත සත්තකින්ම! (එක තත්වයක සිට තවත් තත්වයකට) නියත වශයෙන්ම ඔබ ක්‍රම ක්‍රමයෙන් පසුකර යා යුතුව ඇත. (84:18,19) එබැවින් (මෙය ප්‍රතික්ෂේප කරමින් සිටින) ඔවුන්ට කුමක් නම් සිදුවී ඇත්ද? ඔවුන් මෙය විශ්වාස කරන්නේ නැත. (84:20) එපමණක්ද? මෙම ප්‍රතික්ෂේප කරන්නන් මෙම කුරාණයම බොරු කරන්නාහ .(84:22)*

*ඔහුම ඔබව උත්පාදනය කළ අයයි (එසේ තිබියදී ඔහුව) ප්‍රතික්ෂේප කරන්නන්ද ඇත, (ඔහුව) විශ්වාස කරන්නන්ද ඔබගෙන් ඇත. ඔබ කරන දැය අල්ලාහ් අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන්ම සිටින්නේය. (64:2)*

*ඔබ අල්ලාහ්ව ප්‍රතික්ෂේප කලහොත් එමගින් ඔහුට කිසිම පාඩුවක් වන්නේ නැත. නියත වශයෙන්ම අහස් හී ඇති දැයද, භූමියෙහි ඇති දැයද අල්ලාහ්ට අයිති දැය වශයෙන්ම ඇත්තේය; (4:131)*

*සියලු ප්‍රශංසා අල්ලාහ්ටම අයිතිය! ඔහුම අහස්ද, භූමියද උත්පාදනය කළේය. අන්ධකාරයන්ද, දීප්තිමත් ආලෝකයන්ද ඇති කළේ ඔහුය. එහෙත් ප්‍රතික්ෂේප කරන්නන් (අල්ලාහ් වන) තමන්ගේ දෙවියන්ට (බොරු දෙවිවරුන්ව) සම කරන්නාහ. (6:1)*

*ඔහු නම් සෑම ආත්මයක්ම කරන සෑම දැයක්ම හොඳින් දන්නෙකි. ඔවුන් නම්, (ව්‍යාජ දෙවිවරුන්ව) අල්ලාහ්ට සමානයන් වශයෙන් තබන්නාහ! මෙවැනි වැරදි කරුවන්ට දඬුවම් නොකර අත්හැර දමනු ඇත්ද?; (13:33)*

*කවුරුන් අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන්නන් වශයෙන් සිටින්නේද, ඔහුගේ ප්‍රතික්ෂේපය ඔහුටම නපුරක් වශයෙන් අවසන් වනු ඇත. කවුරුන් දැහැමි*

*ක්‍රියාවන් කරන්නේද, ඔහු (එය පරලොවදී) තමන්ට හොඳක් වශයෙන්ම සලස්වා ගන්නේය. (30:44)*

*(ඔහුව) ඔබ ප්‍රතික්ෂේප කර දැමුවද, (ඔහුට කිසි පාඩුවක් නැත. මන්දයත්) නියත වශයෙන්ම අල්ලාහ් ඔබගේ අවශ්‍යයතාවයක් නොමැත්තෙකු වශයෙන් සිටින්නේය. එහෙත් තමන්ගේ වහලුන් (තමන්ව) ප්‍රතික්ෂේප කිරීම ඔහු කැමති වන්නේ නැත. ඔබ (ඔහුට) කෘතඥ වන්නේ නම්, ඔබ ගැන ඔහු තෘප්තියට පත් වන්නේය. කෙනෙකුගේ පාපයන්හී බර වෙනත් කෙනෙකු උසුළන්නට නොහැක. මින් පසු ඔබ යා යුත්තේ ඔබගේ දෙවියන් වෙතය. ඒ අවස්ථාවේදී ඔබ කරමින් සිටි දැය ඔහු ඔබට දැනුම් දෙනු ඇත. හෘදන්හී ඇති දැයද නියත වශයෙන්ම ඔහු හොඳින් දන්නේය. (39:7)*

*(නබියේ!) ඔබ මෙසේ පවසනු; "(මෙතරම් විශාල) භූමිය දින දෙකකදීම උත්පාදනය කළ අයව ඔබ ප්‍රතික්ෂේප කර දමා (අන් දැය) ඔහුට සමානයන් වශයෙන් තබන්නෙහුද? ඔහුම (සකල) ලෝකයන්ම උත්පාදනය කර පෝෂනය කරන්නාය". (41:9) [මෙය අල්ලාහ්ගේ සන්නිධානයෙන් දින දෙකකි].*

*(මෙය) ඔවුන් තමන් තුළම අවධානය කළ යුතු නොවෙද? අහස්ද, භූමියද, මේවා අතර ඇති දැයද, සාධාරණ හේතුවක් නොමැතිවද, නියමිත කාල අවකාශයක් නොමැතිවද, අල්ලාහ් උත්පාදනය කළේ නැත. එහෙත් මිනිසුන්ගෙන් වැඩි දෙනෙකු දෙවියන්ගේ හමුවීම ද ප්‍රතික්ෂේප කරන්නාහ. (30:8)*

*ඇත්තෙන්ම අල්ලාහ් ප්‍රතික්ෂේප කරන්නන්ට ශාප කර, දළු ලා දැවෙන ගින්දර ඔවුන්ට පිළියෙල කර තබා ඇත්තේය. ඔවුන් එහි සදාකල් රැඳී සිටිනු ඇත. (ඔවුන්ව) බේරා ගන්නන්ද, (ඔවුන්ට) උදව් කරන්නන්ද (එහි) ඔවුන් දකින්නේ නැත. (33:64,65)*

**2. දෙවියන්ගේ පණිවිඩය වන අල් කුරාණය ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව**

*(නබියේ!) නියත වශයෙන්ම ඉතාමත් පැහැදිලි ආයාවන්ම අපි ඔබ වෙත පහළ කර ඇත්තෙමු. එබැවින් පාපතරයන් මිස, (වෙන කිසිවෙකුත්) ඒවා ප්‍රතික්ෂේප කරන්නේ නැත. (2:99)*

*නියත වශයෙන්ම කවුරුන් තමන් වෙත හොඳ ඔවදන් පැමිණෙන විට, ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන් විනිශ්චය දිනදී තමන්ගේ තත්වය වටහා ගනු ඇත. මන්දයත් නියත වශයෙන්ම මෙය ඉමහත් ගෞරවණීය ධර්මයක් වන්නේය.(41:41) මීට කලින් හෝ මීට පසුව හෝ (පරිශ්ද්ධ වූ කුරානය වන) මෙයට බොරු (කිසි සේත්) ළඟා වීමට නොහැකිය. ඉතාමත් ප්‍රශංසාවට අයත් කෙනා හා ඥානවන්තයා විසින් (මෙය) පහළ කරන ලදී. (41:42)*

*මිනිසුනේ! ඔබගේ දෙවියන්ගේ සන්නිධානයෙන් සත්‍යය සමග (එවන ලද) එක් දූතයෙකු නියත වශයෙන්ම ඔබ වෙත පැමිණ ඇත්තේය. එබැවින් ඔබ (ඔහුව) විශ්වාස කරනු. (එය) ඔබටම ඉතාමත් හොඳය. ඔබ (ඔහුව) ප්‍රතික්ෂේප කර දැමුවහොත් (අල්ලාහ්ට කිසිම අඩුවක් වන්නේ නැත. මන්දයත්) අහස් හිද, භූමියෙහිද ඇති සියල්ල නියත වශයෙන්ම අල්ලාහ්ටම අයිතිය. අල්ලාහ් සියල්ලන්වම හොඳින් දන්නෙකු හා ඥානවන්තයෙකු වශයෙන් සිටින්නේය). (4:170)*

*(නබියේ!) ඔබ මෙසේ විමසනු; "(මෙම ධර්මය) අල්ලාහ්ගේ සන්නිධානයෙන් පැමිණ තිබියදී මෙය ඔබ ප්‍රතික්ෂේප කළ හොත් (මෙසේ) ප්‍රසිද්ධියේම (ඔහුට) විරුද්ධ වන්නාට වඩා දුර්මාර්ගිකයා කවරෙක්ද යන්න ඔබ අවධානය කළෙහුද?" (41:52)*

*(නබියේ!) ඔබ මෙසේ පවසනු; "(සම්පූර්ණයෙන්ම) සත්‍යය වූ (මෙම ධර්මය) ඔබගේ දෙවියන් විසින් පහළ කරන ලදී" කැමැත්තන්ට මෙය විශ්වාස කළ හැකිය, අකැමැත්තන්ට (මෙය) ප්‍රතික්ෂේප කර දැමිය හැකිය". (නමුත් මෙම ප්‍රතික්ෂේප කරන) අපරාධකාරුවන්ට නියත වශයෙන්ම අපි නිරයම පිළියෙල කර ඇත්තෙමු; (18:29)*

*නියත වශයෙන්ම ඔබට සමීප වුණු එක් දඬුවමක් ගැන අපි අනතුරු අඟවන්නෙමු. එදිනදී සෑම මිනිසෙකුම තම දෑතින් (සිදුකර) යැවූ දැය (තම දෑසින්) දැක ගන්නේය. ප්‍රතික්ෂේප කරන්නන් නම්, තමන් පස් බවට පත්වීම සිටියා නම් අගනේය නොවෙදැයි දොඩවන්නාහ! (78:40)*

*ප්‍රතික්ෂේප කරන්නන් මෙසේ පවසන්නාහ; "(ශුද්ධ වූ කුරානය වන) මෙය බොරු ගොතා ඔහු මනඃක්කල්පිත කර ගත් දැය මිස, වෙන කිසිවක් නැත. මෙහි (මනඃක්කල්පිත කිරීමෙහි) වෙනත් ජනතාවක් ඔහුට උදව් කරන්නාහ". (නමුත් සත්‍යය කුමක්ද යත්) ඔවුන්ම අපරාධයද, බොරුවද පවසන්නාහ. (25:4)*

*අල්ලාහ් කෙරෙහි බොරු කියා, තමන් වෙත පැමිණි (ධර්මය වන) සත්‍යය බොරු කරන්නාට වඩා අති විශාල අපරාධකාරයා කවරෙක්ද? (එවැනි) ප්‍රතික්ෂේප කරන්නන් රැඳෙන ස්ථානය නිරයෙහි නොවෙද? (39:32)*

*කවුරුන් (අපගේ ආයාවන්) ප්‍රතික්ෂේප කළෝද, (ඔවුන්ට) "ඔබට මගේ ආයාවන් සමුදීරණය කර පෙන්වනු ලැබුවේ නැද්ද" නමුත් (ඒ අවස්ථාවේදී) ඔබ ආඩම්බරයට පත්ව (එය ප්‍රතික්ෂේප කර) හැරියෙහුය. තවද ඔබ වැරදි කරන ජනතාවක් වශයෙන්ම සිටියෙහුය" (යයිද කියනු ලැබේ). (45:31)*

*(හොඳ ඔවදනින් හා) මතක් කිරීම් වලින් පිරි මෙම කුරානය මත සත්තකින්ම! (මෙය අප විසින් පහළ කරන ලදී). නමුත්, මෙම ප්‍රතික්ෂේප කරන්නන් ඉමහත් වූ ක්‍රෝධයෙහිද, වෛරයෙහිද, (ගැලී) සිටින්නාහ. (38:1.2)*

*(දෙවියන් ඔහුට) "ඇත්තෙන්ම මගේ ආයාවන් ඔබ වෙත පැමිණියේය, ඒවා බොරු කරන්නෙහිය. උඩඟු වූවෙහිය. (ඒවා) ප්‍රතික්ෂේප කරන්නෙකු වශයෙන්ම සිටින්නෙහිය" (යයි නොකියා සිටීම සඳහාද, ඔබගේ දෙවියන් විසින් ඔබට පහළ කරන ලද අලංකාරවත් නියෝගයන් අනුගමනය කරනු). (39:59)*

*මෙම කුරානයෙහි සියලු උපමාවන් මිනිසුන්ට අපි (නැවත නැවතත්) විවරණය කර පවසා ඇත්තෙමු. එහෙත් මිනිසුන්ගෙන් වැඩි දෙනෙකු මෙය ප්‍රතික්ෂේප නොකර සිටියේ නැත. (17:89)*

*විශ්වාසවන්තයිනී! ඔබ අල්ලාහ්වද, ඔහුගේ දූතයාවද, ඔහු තමන්ගේ (මෙම) දූතයා කෙරෙහි පහළ කළ මෙම ධර්මයද, මෙයට පෙර ඔහු පහළ කළ ධර්මයන්ද විශ්වාස කරනු. කවුරුන් අල්ලාහ්වද, ඔහුගේ මලායිකාවරුන්වද, ඔහුගේ ධර්මයන්ද, ඔහුගේ දූතයන්වද, අවසාන දිනයද, ප්‍රතික්ෂේප කරන්නේද, ඔහු නියත වශයෙන්ම ඉතාමත් ඈත් වූ දූර්මාර්ගයෙහිම ගමන් කරන්නේය. (4:136)*

*(මෙම ප්‍රතික්ෂේප කරන්නන් බොරු කරන) මෙම උසස් ශුද්ධ වූ කුරානය - ලව්හුල් මහ්ෆූල්හිද (සටහන් කරනු ලැබ) ඇත්තේය. මෙය මොවුන් ප්‍රතික්ෂේප කිරීමෙන් සිදු විය හැක්කේ කුමක්ද?) (85:21,22)*

*(නබියේ!) කවුරුන් මෙම ධර්මය සිතට විරුද්ධව ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ට ඔබ බිය ගන්වා අනතුරු ඇඟවීමද, ඔවුන්ට ඔබ බිය ගන්වා අනතුරු අඟවා නොසිටීමද, ඔවුන්ට එක සමානය. ඔවුන් විශ්වාස කරන්නේම නැත. (2:6)*

*කවුරුන් අපගේ (මෙම ධර්ම) පුස්තකයන් ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම අපි (පරලොවදී) නිරයෙහි සේන්දු කර හරින්නෙමු. ඔවුන් දඬුවම් සදා විඳීම සඳහා ඔවුන්ගේ හම දැවී අඟුරු වී යන සෑම විටම වෙනත් අලුත් හමක් මාරු කරමින් සිටින්නෙමු. නියත වශයෙන්ම අල්ලාහ් ඉමහත් බලසම්පන්නව හා ඥානවන්තවද සිටින්නේය. (4:56)*

*නියත වශයෙන්ම අල්ලාහ්ගේ සන්නිධානයෙහි (බාර ගනු ලැබූ) ධර්මය ඉස්ලාමයයි. ධර්මය පහළ කරනු ලැබූවන්, (මෙයයි සත්‍යය ධර්මය යන) ඥානය ඔවුන්ට ලැබුනු පසුද, තමන් අතර ඇති ඊර්ෂ්‍යාවේ හේතුවෙම (මෙයට) වෙනස් කම් දැක් වූහ. එබැවින් (මෙසේ) කවුරුන් අල්ලාහ්ගේ ආයාවන් ප්‍රතික්ෂේප කරන්නෝද, (ඔවුන්ට විනාශයයි. ඔවුන්ගේ) ගණනය නිර්ණය කිරීමෙහි අල්ලාහ් ඉතාමත් සීඝ්‍රවන්තයෙකි. (3:19)*

*මීට පෙරද මිනිසුන්ට ඍජු මාර්ගෝපදේශයන් වශයෙන් තිබුනු, (පව්,පින්) වෙන්කර දැනුම් දිය හැකි (අනිත්) දෑයද පහළ කර ඇත්තේය. එබැවින් කවුරුන් අල්ලාහ්ගේ (එම) ආයාවන් ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම දරුණු දඬුවම් ඇත. අල්ලාහ් (සියල්ලටම වඩා) බලසම්පන්නයෙකු හා (නපුරු අයගෙන්) පළි ගන්නෙකු වශයෙන් සිටින්නේය. (3:4)*

*කවුරුන් තම දෙවියන්ගේ (කුරානය නැමැති) පැහැදිළි දැනුම ලබා ඇත්තෙහුද ඔවුන්ද, ඔවුන්ට දෙවියන් විසින් (ඊසාට) පහළ කරනු ලැබූ දෑය (ඉන්ජීල්) සාක්ෂියක් වශයෙන් ඇත්තේද ඔවුන්ද, තවද ඔවුන්ට මෙයට පෙර පහළ කරනු ලැබූ මූසාගේ ධර්මය එක් මර්ගෝපදේශයක් වශයෙන්ද, වරප්‍රසාදයක් වශයෙන්ද, ඇත්තේද ඔවුන්ද, අනිවායීයෙන්ම මෙම ධර්මයද විශ්වාස කරනු ඇත.(ඔවුන්*

*වෙනුවෙන් වූ ඵලවිපාකය නම් ස්වර්ගයයි). මෙම පාර්ශවයන් තුනෙන් කවුරුන් මෙය ප්‍රතික්ෂේප කළා වුවද, ඔවුන්ට පොරොන්දු දෙන ලද ස්ථානය නිරයයි. එබැවින් (නබියේ!) ඔබ මෙහි පොඩියක් හෝ සැකයක් ඇති කර නොගනු. නියත වශයෙන්ම මෙය ඔබගේ දෙවියන් විසින් පහළ කරන ලද සත්‍යය (ධර්මය)යි! එහෙත් මිනිසුන්ගෙන් බොහෝමයක් දෙනා මෙය විශ්වාස කරන්නේ නැත. (11:17)*

*නියත වශයෙන්ම කවුරුන් අල්ලාහ්ගේ ආයාවන් ප්‍රතික්ෂේප කරමින්ද, අසාධාරණයේ නබිවරුන්ව ඝාතනය කරමින්ද සිටින අතර මිනිසුන්ගෙන් සාධාරණය මගින්ම පොළඹවන්නන්වද ඝාතනය කරමින් සිටින්නෝද, ඔවුන්ට වේදනා ගෙන දෙන දඬුවම මගින් (නබියේ!) ඔබ සුභාරංචි පවසනු මැනව! (3:21)*

*"තවද කවුරුන් (ඍජු මාර්ගය) ප්‍රතික්ෂේප කර, අපගේ ආයාවන් බොරු කරන්නෝද, ඔවුන් නිරාවාසීන්ම වන්නාහ! ඔවුන් එහි සදාකල් රැඳී සිටිනු ඇත". (2:39)*

*බිය ගන්වා අනතුරු අඟවන්නෙකු අපි කුමන රටකට යැව්වද, එහි සිටි ධනපතියන් (ඔහුට) "නියත වශයෙන්ම අපි, ඔබ ගෙන ආ දූත මෙහෙවර ප්‍රතික්ෂේප කරන්නෙමු" යයි පවසා නොසිටියේ නැත. (34:34)*

*ඔවුන් භූමියෙහි සංචාරය කර බැලුවේ නැද්ද? එසේ නම්, ඔවුන්ට පෙර (නපුර කරමින්) සිටි අයගේ අවසානය කෙසේ වූයේද යන්න දැන ගනු ඇත. (කලින් නපුර කරමින් සිටි) ඔවුන්ව අල්ලාහ් සහමුලින්ම විනාශ කර දැමුවේය. ප්‍රතික්ෂේප කරන්නන්ටද මේවා වැනි දැයම හමු වනු ඇත. (47:10)*

*නියත වශයෙන්ම මෙය භය භක්තියෙන් යුත්තන්ට හොඳ ඔවදනක් වශයෙන්ම ඇත්තේය. එහෙත් ඔබගෙන් (එය) බොරු කරන්නන්ද ඇත්තේය යන්න නියත වශයෙන්ම අපි හොඳින්දනිමු. නියත වශයෙන්ම මෙය ප්‍රතික්ෂේප කරන්නන්ට දුක ගෙන දෙන්නක් වශයෙන්ම ඇත්තේය. (එහෙත්) නියත වශයෙන්ම මෙය පොඩියක් හෝ සැකයෙන් තොර සත්‍යයක් වන්නේය. (69:49-51)*

*නියත වශයෙන්ම (අල්ලාහ් වන) ඔහු මෙම ධර්මය ඔබට මෙසේ පහළ කර ඇත්තේය. අල්ලාහ්ගේ ආයාවන් (කවුරුන් විසින් හෝ) ප්‍රතික්ෂේප කරනු ලැබීම හෝ නැතහොත් සමච්චල් කරනු ලැබීම හෝ ඔබ සවන් දුන්නහොත් ඔවුන් මෙයින් වැළකී වෙනත් කාරණාවකට ප්‍රවේශ වන තුරු ඔබ ඔවුන් සමග වාඩි නොවිය යුතුය; (4:140)*

**3. අප සමාජයට එවූ නබි මොහම්මද් ﷺ තුමාව ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව**

*ශුභාරංචි දෙන්නෙක් වශයෙන්ද, බිය ගන්වා අනතුරු අඟවන්නෙක් වශයෙන්ද අපි අපගේ දූතයින්ව යැව්වෙමු. එහෙත් ප්‍රතික්ෂේප කරන්නන් නම්, සත්‍යය විනාශ කර දැමීමට අදහස් කර, පුහු තර්කයන් කිරීමට ආරම්භ කර, මගේ ආයාවන් ද, ඔවුන්ට බිය ගන්වා අනතුරු අඟවන ලද (දඬුවම් පැමිණීම) ගැනද සමච්චලයට ලක් කරමින් ගෙන ඇත්තාහ. (18:56)*

*(නබියේ ඔබ බොරුකාරයෙකු නොව). (එබැවින්) කවුරුන් හෝ විශ්වාස කළායින් පසුව ඔහු අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළහොත් ඔහු ගැන අවධානය කරනු ඇත; (16:106)*

*(නබියේ! තවද) ඔබ මෙසේ පවසනු; "අල්ලාහ්ටද, (ඔහුගේ) රසූල්ටද ඔබ අවනත වනු. නමුත් ඔබ ප්‍රතික්ෂේප කළහොත්, නියත වශයෙන්ම අල්ලාහ් ප්‍රතික්ෂේප කරන්නන්ව ප්‍රිය කරන්නේ නැත" (3:32)*

*(නබියේ! මීට මෙර අපි දූතයින් බොහෝමයක් දෙනාව යැවූ) මේ අන්දමටම ඔබවද අපි (අපගේ දූතයා වශයෙන්) එක් සමූහයක් වෙත යැව්වෙමු. මොවුන්ගෙන් පෙරද (මොවුන්ගෙන්) විවිධ සමූහයන් ඉකුත්ව ගොස් ඇත්තාහ. (දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන් වෙත දූතයෙකු නොපැමිණියේය). එබැවින් අපි ඔබට වහී මගින් දැනුම් දෙන දැය මොවුන්ට ඔබ සමුදීරණය කර පෙන්වා දෙනු. එහෙත් මොවුන් නම්, (ඔබව ප්‍රතික්ෂේප කරනවා පමණක් නොව, තමන් කෙරෙහි අනේක වරප්‍රසාදයන් පහළ කරන ලද අසීමිත දයාළු වන) රහ්මාන්වම ප්‍රතික්ෂේප කරන්නාහ!;(13:30)*

*(නබියේ!) ප්‍රතික්ෂේප කරන්නන්ටද, වංචනිකයින්ටද, ඔබ අවනත නොවනු. ඔවුන් විසින් (ඔබට) ඇති වන දුක් ගැහැට ඔබ ප්‍රතික්ෂේප කර දමනු. (ඔබගේ සියලු කාරණාවන්ද) අල්ලාහ්වම විශ්වාස කර බාර දෙනු. (අල්ලාහ්ම (ඔබට) ප්‍රමාණවත් ආරක්ෂකයෙකු වන්නේය. (33:48)*

*සෑම වාර්ගිකයන් වෙතම (අපි යැවූ අපගේ දූතයාව ඔවුන්ට) සාක්ෂි වශයෙන් අපි කැඳවන (දිනය ගැන නබියේ! ඔබ ඔවුන්ට මතක් කර දෙනු). එදිනදී (එම දූතයින්ව) ප්‍රතික්ෂේප කළ අයට (යම් කිසිවක් කතා කිරීමට) අනුමැතිය දෙනු ලබන්නේ නැත. තවද ඔවුන් නිදහසට බොරු කරුණු ඉදිරිපත් කිරීමටද මාර්ගයක් නොතිබෙනු ඇත. (16:84)*

*(නබියේ!) අද දින ප්‍රතික්ෂේප කරන්නන්ට ඔබගේ ධර්මය විනාශ කර දැමිය හැකිය යන්න ගැන තිබූ විශ්වාසය බිඳී ගියහ. ඔවුන්ට ඔබ (පොඩියක් හෝ) බිය නොවනු. මටම බිය වනු. මා ඔබට ඔබගේ ධර්මය අද දින පූර්ණය කර තැබුවෙමි. ඔබ වෙනුවෙන් ඉස්ලාම් ධර්මයද තෝරාගෙන (ඔබට පහළ කර භාර) ගත්තෙමි; (5:3)*

*(නබියේ!) මිනිසුන්ට බිය ගන්වා අනතුරු අඟවන මෙන් (මිනිස් වර්ගයාට අයත්) ඔවුන්ගෙන් කෙනෙකුට වහී මගින් අපි නියෝග කරන්නේ නම්, මෙම මිනිසුන්ට පුදුමයක් වශයෙන් ඇත්තේද?; (10:2)*

*(නබියේ!) ප්‍රතික්ෂේප කරන්නන් හැර, (වෙන කිසිවෙකුත්) අල්ලාහ්ගේ ආයාවන් ගැන (නිකරුණේ) තර්ක කරන්නේ නැත. එබැවින් (නබියේ! නිකරුනේ තර්ක කරන) ඔවුන්, විවිධ නගරයන් හිඳ (ඉතාමත් ආඩම්බරයෙන් යුතුව සැප පහසුවෙන්) ඒ මේ අත සැරිසරනු ඔබව රවටා නොදැමිය යුතුය. (40:4)*

*(නබියේ!) කවුරුන් මෙලොව ජීවිතයෙන් මත් වී තමන්ගේ ධර්මය පුහු සෙල්ලමක් වශයෙන්ද, (විහිළුවල් වශයෙන්ද) ඇර ගත්තෝද, ඔවුන්ව (ඔවුන්ගේ ගමනෙහි) අත්හැර දමනු. එහෙත් 'සෑම ආත්මයක්ම තම (නපුරු) ක්‍රියාවන්ගේ හේතුවෙන් (විනිශ්චය දිනදී) විපතට ඇතුළු වනු ඇත' යන සත්‍යය ඔබ (ඔවුන්ට) මතක් කර දෙනු; (6:70)*

**4. දෙවියන්ගේ දයාව සහ වරප්‍රසාද ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව**

*ඔබගෙන්ම ඔබ වෙනුවෙන් භාර්යාවන් අල්ලාහ් නිර්මාණය කර ඇත්තේය. තවද ඔබගේ භාර්යාවන්ගෙන් දරුවන්වද, මුනුබුරු මිණිපිරියන්වද උත්පාදනය කර, ඔබට හොඳ ආහාරද කවන්නේය. (මෙසේ තිබියදී) ඔවුන් (තමන් වෙනුවෙන් මනක්කල්පිත කරගත්) ව්‍යාජ දැය විශ්වාස කර, අල්ලාහ්ගේ වරප්‍රසාදයන් ඔවුන් ප්‍රතික්ෂේප කරන්නෙහුද? (16:72)*

*(මනුෂ්‍යයිනි!) ප්‍රාණයක් නොමැතිව තිබූ ඔබට පණ දී තිබියදී, ඔබ අල්ලාහ්ව කෙසේ නම් ප්‍රතික්ෂේප කරන්නෙහුද? ඉන් පසුවද ඔහුම ඔබව මරණයට පත් කරන්නේය. පසුවද ඔහුම ඔබව පණ දෙන්නේය. (ඉන්) පසුවද ඔබ (ඔබගේ කළකම් සඳහා ඵල විපාක අත් කර ගැනීම සඳහා) ඔහු වෙතම (විනිශ්චය සඳහා) ගෙන එනු ලබන්නෙහුය. (2:28)*

*ඔහුම මෙලොවෙහි ඔබව නියෝජිතයින් බවට නිර්මාණය කළේය. එබැවින් (ඔබගෙන්) කවුරුන් ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ගේ ප්‍රතික්ෂේපයේ විනාශය ඔවුන් කෙරෙහි පවරනු ලැබේ. ප්‍රතික්ෂේප කරන්නන්ට ඔවුන්ගේ ප්‍රතික්ෂේපය ඔවුන්ගේ දෙවියන්ගේ කෝපය මිස, (වෙන කිසිවක්) වැඩි කරන්නේ නැත. ප්‍රතික්ෂේප කරන්නන්ට ඔවුන්ගේ ප්‍රතික්ෂේප පාඩුවක් මිස, (වෙන කිසිවක්) වැඩි කර හරින්නේද නැත. (35:39)*

*අල්ලාහ්ගේ (මෙවැනි) වරප්‍රසාදයන් ඔවුන් හොඳින් දැන සිටීමෙන් පසුවද, එය ඔවුන් ප්‍රතික්ෂේප කරන්නාහ. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු කෙළෙහි ගුණ නොදත් අය වශයෙන්ම සිටින්නාහ. (16:83)*

*මිනිසාට යම්කිසි විපතක් ඇති වන විට, සම්පූර්ණයෙන්ම තම දෙවියන් දෙසම බලා ප්‍රාර්ථනා කරමින්ම සිටින්නේය. නමුත් දෙවියන් යම් කිසි වරප්‍රසාදයක් පහළ කරන විට, මීට පෙර ඔහු කුමක් ප්‍රාර්ථනා කරමින් සිටියේද, එය අමතක කර දමා, අල්ලාහ්ට (බොරු දෙවිවරුන්ව) සමානයක් කර, (අන් අයවද) ඔහුගේ මාර්ගයෙන් වැරද යාමට සලස්වන්නේය; (39:8)*

*කවුරුන් තමන්ව පෝෂනය කර, පරිපාලන කරන්නාව ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ගේ ක්‍රියාවන්ගේ උපමාව අළු මෙන් ඇත්තේය! සුළි සුළං කාලයට හමන දැඩි සුළඟ එය, ගසාගෙන යන ලදී. තමන් සොයා ගත් දැයෙන් කිසිවක් ඔවුන් අත් කර ගන්නේ නැත. මෙයම ඉතාමත් ඈතින් වූ දුර්මාර්ගය වන්නේය. (14:18)*

*මිනිසුන්ගෙන් බොහෝමයක් ඉතාමත් ගුණමකු අය වශයෙන් සිටින්නාහ.; (25:50)*

*කවුරුන් විශ්වාසය තබා දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ව නියත වශයෙන්ම අල්ලාහ් දිය දහරා සදා ගලමින් ඇති ස්වර්ගයන්හී ඇතුළු කරන්නේය. කවුරුන් ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන් සතුන් කන්නාක් මෙන් කමින්ද, (සතුන් මෙන්) සුවය විඳිමින්ද සිටින්නාහ. (එහෙත්) ඔවුන් (අවසාන වශයෙන්) රැඳෙන ස්ථානය නිරයයි.( 47:12)*

*නියත වශයෙන්ම අල්ලාහ්ගේ සන්නිධානයේ සතුන් සියල්ලගෙන් ඉතාමත් නපුරු (දැය කුමක්ද යත්) ප්‍රතික්ෂේප කරන්නන්ය; (8:55)*

*අහස් හා භූමියෙහි ඇති (නිධානයන් ආදී) දැයේ යතුරු ඔහු වෙතම ඇත්තේය. එබැවින් අල්ලාහ්ගේ ආයාවන් කවුරුන් ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන් සම්පූර්ණයෙන්ම පාඩුව අත් කර ගත අයයි. (39:63)*

*(ඔබ අපරාධ කිරීම අත්හැර දමා පසුව හෝ එයින් ඈත් වුවහොත්) ඔබගේ දෙවියන් ඔබ කෙරෙහි දයාව දැක්විය හැකිය. (නොඑසේ නම්, ඔබගේ කාරණාව දෙසටම) නැවතත් ඔබ හැරුණොත් අපිද (ඔබව පෙර මෙන් දඬුවම් දීමට) ඉදිරිපත් වන්නෙමු. තවද (මෙවැනි) කෙළෙහිගුණ නොදත් අයව නිරය වටකර ගන්නා ලෙසටද සලස්වන්නෙමු. (17:8)*

*නියත වශයෙන්ම (අල්ලාහ් මත විශ්වාසය නැති) ප්‍රතික්ෂේප කරන්නන් මිස, (වෙන කිසිවෙකුත්) අල්ලාහ්ගේ දයාවෙහි විශ්වාසය බිඳ දමන්නේ නැත"; (12:87)*

**5. ප්‍රතික්ෂේප කිරීම ගැන පොදු පණිවිඩ**

*අල්ලාහ් අදහස් කර තිබුනේ නම්, මිනිසුන් සියල්ලන්වම ඍජු මාර්ගයෙහි ඇතුළු කිරීමට ඉඩ තිබුණි යන්න ගැන විශ්වාසවන්තයින් සෑහීමකට පත් උනේ නැද්ද?; (13:31)*

*ප්‍රතික්ෂේප කරන්නන් තමන් තමන්ටම නපුර කර ගන්නාහ; (2:254)*

*(මෙම ධර්මය සිතට විරුද්ධව ප්‍රතික්ෂේප කරන) පාපතරයන් හැර, (අන් කිසිවෙකුත්) මෙමගින් මාර්ගය වැරද යාමට ඔහු සලස්වන්නේ නැත; (2:26)*

*කවුරුන් හෝ පශ්චාත්තාප වී (පාපයන්ගෙන් ඈත් වී) හැඩ ගැසුනොත් (අල්ලාහ් ඔවුන්ට) සමාව දෙනු ඇත. මන්ද යත් නියත වශයෙන්ම අල්ලාහ් ඉතාමත් සමාව දෙන්නෙකු හා දයාබරවන්තයෙකු වශයෙන්ම සිටින්නේය (3:89)*

*(තවද) අල්ලාහ් විශ්වාසවන්තයින්ගේ ආරක්ෂකයාය. ඔවුන්ව අන්ධකාරයෙන් (පිටතට ගෙන) ඉමහත් ආලෝකය දෙසට ඇතුළු කරන්නේය. නමුත් ප්‍රතික්ෂේප කරන්නන්ට නම්, ඔවුන්ගේ ආරක්ෂකයින් ෂෙයිතාන්වරුන්ය. ඒවා ඔවුන්ව ඉමහත් ආලෝකයෙන් (පහ කර) අන්ධකාරය දෙසට ඇතුළු කරන්නේය. (තවද) ඔවුන් නිරාවාසීන්ය. (තවද) ඔවුන් එහි සදහටම රැඳී සිටිනු ඇත. (2:257)*

*අල්ලාහ්ගේ ආලෝකය තම කටින් පිඹ නිවා දැමිය හැකි යැයි මොවුන් අදහස් කරන්නාහ. මෙම ප්‍රතික්ෂේප කරන්නන් පිළිකුල් කළා වුවද, අල්ලාහ් තමන්ගේ ආලෝකය (ලොව පුරා ආලෝකය විහිදුවන මෙන්) පූරණය කර ඇත්තේය. (61:8)*

*කවුරුන් අල්ලාහ්ගේ මාර්ගය වළක්වා එහි වැරද්ද (සැකය)ද ඇති කරන්නට අදහස් කරන්නෝද, ඔවුන් පරලොවද ප්‍රතික්ෂේප කරන්නන්ය. (11:19)*

*ඔබගෙන් කවුරුන් හෝ අල්ලාහ්ටද, ඔහුගේ මලායිකාවරුන්ටද, ඔහුගේ රසූල්වරුන්ටද, ජිබ්රීල්ටද, මීකායීල්ටද, සතුරෙකු වශයෙන් සිටිමින් (ඔවුන්ව ප්‍රතික්ෂේප කර) හැරියොත්, එම ප්‍රතික්ෂේප කරන්නන්ට නියත වශයෙන්ම අල්ලාහ්ද සතුරෙකු වශයෙන්ම සිටිනු ඇත. (2:98)*

*තවද අල්ලාහ් (තමන්ව) ප්‍රතික්ෂේප කරන ජනතාව (ඔවුන්ගේ නපුරු ක්‍රියාවන් හේතුවෙන්) ඍජු මාර්ගයෙහි ඇතුළු කරන්නේ නැත: (2:264)*

*අපි ඔවුන්ට පහළ කළ දැයද, ප්‍රතික්ෂේප කර හරින්නාහ. (එබැවින් ඔවුන්ට "මෙලොවදී) පොඩියක් සුවය විඳ ගනු. පසුව (පරලොවදී) ඔබ (සත්‍යය) දැන ගන්නෙහුය" (යයි නබියේ! ඔබ පවසනු මැනව!) (16:55)*

*(මෙවැන්නන්) මෙලොවෙහි සුළු සැපතක් විඳිය හැක. පසුව (පරලොවදී නම්), අප වෙතම ඔවුන් පැමිණිය යුතුව ඇත්තේය. පසුව (සත්‍යය මෙසේ) ඔවුන් ප්‍රතික්ෂේප කරමින් සිටි හේතුවෙන් ඔවුන් දරුණු දඬුවම් විඳින ලෙසට අපි සලස්වන්නෙමු.(10:70)*

*(මෙලොවදී) ඔවුන් තර්ක කරමින් සිටි දැය ඔවුන්ට අල්ලාහ් පැහැදිලිව දැනුම් දීම පිණිසද, ප්‍රතික්ෂේප කරන්නන් තමන්ම බොරුකාරයින් යන්න දැන ගැනීම සඳහාද, (පරලොවදී ඔවුන්ට පණ දෙනු ලබන්නාහ. එසේ ඔවුන්ව නැගිටවීම අපට එතරම් කාරියක් නොව). (16:39)*

*"(තවද) සකාත් නොගෙවූ අයටද, පරලොව ප්‍රතික්ෂේප කල අයටද විනාශයයි)" (41:7)*

*පාපයන් කරමින් සිටින ඔවුන්ගෙන් කෙනෙකුට මරණය ළඟා වූ විට, "මෙන්න! මා (මගේ පාපයන්ට) පස්චාත්තාප වන්නෙමි" යයි පවසන්නේද ඔහුටද, කවුරුන් (විශ්වාසය නොතබා ප්‍රතික්ෂේප කර) ප්‍රතික්ෂේපය මතම සිටින්නෝද ඔවුන්ටද, පව් ක්ෂමාවක් නැත. මෙවැන්නන්ට වේදනා ගෙන දෙන දඬුවම්ම පිළියෙල කර ඇත්තෙමු. (4:18)*

*විශ්වාසවන්තයිනි! (තමන් මෙන්) විශ්වාසවන්තයින් මිස, ප්‍රතික්ෂේප කරන්නන්ව තමන්ට ආරක්ෂකයින් (අව්ලියා) බවට පත් කර නොගත යුතුය. ඔවුන්ගෙන් (තමන්ව) ආරක්ෂා කර ගන්නට මිස, කවුරුන් හෝ මෙසේ කළහොත් ඔවුන්ට අල්ලාහ්ගේ සන්නිධානයෙන් කිසිම සම්බන්ධයක් නැත. අල්ලාහ් තමන් ගැන ඔබට (බිය ගන්වා) අනතුරු අඟවන්නේය. (ඔබ) අල්ලාහ් වෙතටම (අවසානයේදී) යා යුතුව ඇත්තේය. (3:28)*

*විශ්වාසවන්තයිනි! ඔබගෙන් කවුරුන් හෝ තමන්ගේ ධර්මයෙන් මාරු වුවහොත් (එමගින් අල්ලාහ්ට කිසිම පාඩුවක් නැත, ඔබව යවා වෙනත් ජනතාවක් අල්ලාහ් ගෙන එනු ඇත. ඔහු ඔවුන්ව ප්‍රිය කරනු ඇත. ඔවුන්ද ඔහුව ප්‍රිය කරනු ඇත; (5:54)*

*කවුරුන් ප්‍රතික්ෂේප කරන්නන් බවට පත් වූවෝද, ඔවුන්ගේ ක්‍රියාවන් කාන්තාරයේ ඇති වන මිරිඟුව මෙන් ඇත්තේය. පිපාසයට පත් වූ අය එය, ජලය යයි අදහස් කරමින් ඒ අසළට පැමිණෙන විට, කිසිවක් ඔහු දකින්නේ නැත. එහෙත් අල්ලාහ්වම ඒ ස්ථානයේ දකින්නේය. ඔහු මොහුගේ ගණනය අවසන් කර හරින්නේය. (එනම් ඔහුව මරණයට පත් කර හරින්නේය). අල්ලාහ් ප්‍රශ්ණ කිරීමෙහි ඉතාමත් තීව්‍රවන්තයෙකි. (24:39)*

*එහෙත් කවුරුන් විශ්වාසය තැබීමෙන් පසු ප්‍රතික්ෂේප කර, එම ප්‍රතික්ෂේපයේම අධික වන්නෝද, ඔවුන්ගේ සමාව ඉල්ලීම නියත වශයෙන්ම බාර ගනු නොලැබේ. ඔවුන්ම (සම්පූර්ණයෙන්) මාර්ගය වැරද ගියවුන් වන්නාහ. (3:90)*

*නියත වශයෙන්ම කවුරුන් ප්‍රතික්ෂේප කර, (එම ප්‍රතික්ෂේපයෙන් නොමිදී) ප්‍රතික්ෂේප කරමින්ම මරණයට පත් වන්නෝද, ඔවුන්ගෙන් කෙනෙකුට මෙම භූමියෙහි බොහෝ සේ රත්‍රන් තිබී, එය (තම වරදට සමාව ලබා ගැනීම සඳහා ඒ සියල්ල) තමන්ට වන්දි වශයෙන් දුන්නද, (එය) භාර ගනු ලබන්නේ නැත. මෙවැන්නන්ටම වේදනා ගෙන දෙන දඬුවම් ඇත. මොවුන්ට උදව් කරන්නන්ද (එහිදී) කිසිවෙකුත් නැත. (3;91)*

*(නබියේ!) ප්‍රතික්ෂේප කරන්නන් භූමියෙහි (දිව ගොස් සැඟවී බේරී) අපව පරාජය කර හරින්නෙහු යයි ඔබ නොසිතනු. (ඔවුන් අනිවාර්යයෙන්ම දඬුවමට හසු කරන්නෙමු. පරලොවදී) ඔවුන් යන තැන නිරයයි. එය රැඳෙන ස්ථානයන්ගෙන් ඉතාම නපුරුය. (24:57)*

*ප්‍රතික්ෂේප කරන්නන් තමන් බේරුනාය යයි ඔවුන් නොසිතිය යුතුය. නියත වශයෙන්ම ඔවුන් (අපව) පරාජය කළ නොහැක. (8:59)*

*(තවත් මොවුන්ගේ උපමාව නම්); එක් ෂෙයිතාන් කෙනෙකුගේ උපමාවට සම වන්නේය. ඔහු මිනිසාට "ඔබ අල්ලාහ්වද, ඔහුගේ දූතයාවද) ප්‍රතික්ෂේප කර දමනු" යයි පැවසුවේය. එසේම ඔහුද ප්‍රතික්ෂේප කර දැමූවේය. (පසුව ෂෙයිතාන් ඔහුට) "නියත වශයෙන්ම මා ඔබෙන් ඈත් වූවෙමි. මන්දයත් ලෝකයන්හී දෙවියන් වන අල්ලාහ්ට ඇත්තෙන්ම මා බිය වන්නෙමි' යයි පැවසුවේය. (59:16)*

**6. මිනිසුන්ව, පිළිරූ සහ වෙනත් දෑ නමදින්නන්ට අදාලව**

*(නබියේ!) කවුරුන් අල්ලාහ් සමග වෙනත් හිමියෙකු (දෙවියන් යයි) ආරාධනා කරන්නේද, ඔහු වෙත එයට අයත් කිසිම සාධකයක් නැත. ඔහුගේ (පාපයන්ගේ) ගණනය ඔහුගේ දෙවියන් වෙතම (තීන්දු කරනු ලැබේ); (23::117)*

*මෙම ප්‍රතික්ෂේප කරන්නන් අපව අත්හැර දමා අපගේ වහලූන්ම (තමන්ට) ආරක්ෂකයින් වශයෙන් ගත හැකි යයි අදහස් කරමින් සිටින්නෝද? නියත වශයෙන්ම මෙම ප්‍රතික්ෂේප කරන්නන්ට ආගන්තුක සත්කාර කිරීම සඳහා නිරයම අපි පිළියෙල කර ඇත්තෙමු. (18:102)*

*(නබියේ!) අල්ලාහ්ගේ දයාව ප්‍රතික්ෂේපය මගින් වෙනස් කර, තමන්ගේ ජනතාවද විනාශ පාතාලයෙහි බැසීමට සලස්වන ලද අයව ඔබ නොදැක්කෙහිද? ඔවුන් නිරයටම පැමිණ සේන්දු වනු ඇත. (එය) නැවතී සිටින ස්ථානයන්ගෙන් ඉතාමත් නපුරු ස්ථානයකි. (14:28,29)*

*මෙවැන්නන්ම තමන්ගේ දෙවියන්ගේ ආයාවන්ද, ඔහුව හමුවන්නෙමු යන්නද ප්‍රතික්ෂේප කළ අයයි. ඔවුන්ගේ හොඳ ක්‍රියාවන් සියල්ල විනාශ වී ගියේය. (පින්, පව් කිරා බැලීමට) ඔවුන් වෙනුවෙන් විනිශ්චය දිනදී තරාදිය අපි නොසිටුවන්නෙමු. (18:105)*

*ප්‍රතික්ෂේප කරන්නන් එදිනදී (දෙවියන්ට) "අපගේ දෙවියනේ! අපව මාර්ගය වැරද යාමට සැලැස්වූ මිනිසුන්වද, ජින්වරුන්වද අපට පෙන්වනු. ඔවුන්ව අවමානයට ලක් කිරීම පිණිස, අපි ඔවුන්ව අපගේ කකුල් වලට යටින් තබා පාගා දමන්නෙමු" යයි පවසනු ඇත. (41:29)*

*බාහිරා, සායිබා, වසීලා, හාම් (ආදී) මේ සියල්ල අල්ලාහ් ඇතිකළ දැය නොව. එහෙත් ප්‍රතික්ෂේප කරන්නන්ම (ඒවා අල්ලාහ් විසින් ඇති කළ දැය යයි) අල්ලාහ් මත බොරුවට මනඃක්කල්පිත කරන්නාහ. ඔවුන්ගෙන් බොහෝමයක් නොදැනුවත් අය වශයෙන්ම සිටින්නාහ. (5:103)*

*(ව්‍යාජ දෙවිවරුන් වෙත) ප්‍රතික්ෂේප කරන්නන් කරන ප්‍රාර්ථනාවන් දූර්මාර්ගයක් වශයෙන්ම ඇත්තේය; (13:14)*

*කවුරුන් අල්ලාහ් කෙරෙහි බොරු ගොතා මනඃක්කල්පිත කර පවසන්නෝද, නැතහොත් ඔහුගේ ආයාවන් බොරු කරන්නෝද, ඔහුට වඩා අපරාධකරුවා කවරෙක්ද? (මෙලොව දී ජීවත් වන තුරු) ඔවුන්ට නියම කර ඇති (ආහාර වස්තුව ආදී) දැය ඔවුන්ට ලැබෙමින් පවතී. (ඔවුන්ගේ කාලය අවසන් වී) තමන්ගේ පණ අත්පත් කිරීමට අපගේ මලායිකාවරුන් ඔවුන් වෙත පැමිණි අවස්ථාවේදී, (ඔවුන්ට) "ඔබ ආරාධනා කරමින් තිබූ දැය කොහේද?" යි ඔවුන් විමසනු ඇත. එයට ඔවුන් "(ඒවා සියල්ල) අපව අතහැර දමා (දිව ගොස්) සැඟවී ගියහ" යයි කියා, ඇත්තෙන්ම අපි (සත්‍යය) ප්‍රතික්ෂේප කරන්නන් වශයෙන් සිටි බවද, තමන් තමන්ට විරුද්ධවම සාක්ෂි ශරන්නාහ. (6:37)*

*ඒවාට ඔබ ආරාධනා කළා වුවද, ඔබගේ ආරාධනාව ඒවායේ සවනට වැටෙන්නේ නැත. ඒවා සවන් ඬුන්නා වුවද, ඔබට පිළිතුරු දෙන්නේ නැත. විනිශ්චය දින දී නම් (ඒවා) ප්‍රතික්ෂේප කර දමනු ඇත. සියල්ල දන්න (දෙවියන්) මෙන් (එම දෙවිවරුන්) කිසිවක් ඔබට දැනුම් දෙන්නේ නැත. (35:14)*

*(නබියේ!) ප්‍රතික්ෂේප කරන්නන්ව (පාපතර කාරණාවන් කරන මෙන්) පොළඹවමින් සිටිනු සඳහාම ෂෙයිතාන්වරුන්ව අපි (ඔවුන් වෙත) යවා ඇත්තෙමු යන්න ඔබ අවධානය නොකළෙහිද? (19:83)*

*අපි ඔවුන්ට දුන් වස්තූන්ගෙන් එක් කොටසක් තමන් නොදැනුවත් දැය (වන දෙවිවරුන්ට) යයි සඳහන් කර පවසන්නාහ. අල්ලාහ් මත සත්තකින්ම! ඔබ මනඃක්කල්පිතව පවසන මෙම බොරු (කියමන්) ගැන (පරලොවදී) නියත වශයෙන්ම ඔබව විමසනු ලබන්නෙහුය. (16:56)*

*සමානයන් තබා නමදින්නන් පිළිකුල් කළා වුවද, අන් සියළුම ධර්මයන් ජයග්‍රහණය කරනු පිණිස, ඔහුම තමන්ගේ දූතයාව ඍජු මාර්ගය මගින්ද, සත්‍යය ධර්මය මගින්ද, යැව්වේය. (61:9)*

*නියත වශයෙන්ම කවුරුන් ප්‍රතික්ෂේප කර, අල්ලාහ්ගේ මාර්ගයද වළක්වා දමා ප්‍රතික්ෂේප කරමින්ම සිටින්නෝද, ඔවුන් (ගේ වැරදි වලට) අල්ලාහ් කිසි කලෙක සමාව දෙන්නේම නැත. (47:34)*

*(අන්ධයින් මෙන් තමන්ගේ මුතුන් මිත්තන්ව අනුගමනය කරන) එම කාෆිර්වරුන්ගේ උපමාව නම්, (අර්ථය වටහා නොගෙන) කෑ කෝ ගැසීමද, විලාපයද මිස, වෙන කිසිවක් වටහා නොගත හැකි දැය (ගමේ සතුන්ව) කැඳවීමට ශබ්ද නගන කෙනෙකු (එඬේරෙකු)ගේ උපමාවට සමාන වන්නේය. තවද ඔවුන් (කිසිවක් ඇසීමට නොහැකි) බිහිරන් වශයෙන්ද, (කිසිවක් කීමට නොහැකි) ගොළුවන් වශයෙන්ද, (කිසිවක් දැකීමට නොහැකි) අන්ධයින් වශයෙන්ද සිටින්නාහ. එබැවින් ඔවුන් (කිසිවක්) දැන ගන්නේ නැත. (2:171)*

*(පරලොව) ප්‍රතික්ෂේප කර, අල්ලාහ්ගේ මාර්ගයද වළක්වා (අපරාධ කරමින්) සිටි මොවුන්ට, මොවුන්ගේ අපරාධයන්හි හේතුවෙන් දඬුවම් පිට දඬුවම් වශයෙන් අපි අධික කරමින් සිටින්නෙමු. (16:88)*

*පසුව විනිශ්චය දිනදී නම්, ඔහු ඔවුන්ව අවමන් කර '(ඔබ ඔබගේ දෙවිවරුන්ව) මා හට සමානයන් යැයි (පවසා, විශ්වාසවන්තයින් සමග) ඔබ තර්ක කරමින් සිටියා නොවෙද? ඒවා කොහේද" " යි විමසනු ඇත; (16:27)*

*ඔවුන්ට මෙම කුරානය කියවා පෙන්වනු ලැබුවා වුවද, (දෙවියන්ව) ඔවුන් හිස බිම තබා නමදින්නේ නැත. (84:21)*

**7. මොහම්මද් ﷺ නබි තුමාට ඍජුවම සතුරුකම් කළ අය සම්බන්ධව**

*(නබියේ!) "ඔබ (දෙවියන් විසින්) යවනු ලැබූ දූතයෙකු නොව" යයි මෙම ප්‍රතික්ෂේප කරන්නන් පවසන්නාහ. (එයට ඔවුන්ට " මේ ගැන) මටත් ඔබටත් අතරේ අල්ලාහ්ද, ධර්ම ඥානය හිමි අයද ප්‍රමාණවත් සාක්ෂිකරුවන් වන්නාහ" යයි පවස්නු මැනව! (13:43)*

*ඔවුන්ට අපගේ පැහැදිලි ආයාවන් සමුදීරනය කර පෙන්වනු ලැබුව හොත්, එයට ඔවුන් (අපගේ දූතයා ගැන) "මොහු එක් (සාමාන්‍ය) මිනිසෙකු මිස, වෙන කිසිවෙක් නොව, ඔබගේ මුතුන් මිත්තන් නමදිමින් තිබූ දැයෙන් ඔබව වළක්වා හැරීමට මොහු අදහස් කරන්නේය. (ඔහු පවසන) මෙය නිකම්ම නිකම් ප්‍රබන්ධ කතාවක් මිස වෙන කිසිවක් නොව" යයි පවසන්නාහ. තවද, (ශුද්ධ වූ කුරානය වන) "මෙය ප්‍රකට සූනුයමක් මිස, වෙන කිසිවක් නොව" යයිද මෙම ප්‍රතික්ෂේප කරන්නන් පවසන්නාහ. (34:43)*

*අල්ලාහ්, ප්‍රතික්ෂේප කරමින් සිටින මොවුන්ව (සෑම විටම) වටකරගෙනම සිටින්නේය; (2:19)*

*"නියත වශයෙන්ම අපි මෙම කුරානයද විශ්වාස නොකරමු. මෙයට පෙර ඇති ධර්මයද විශ්වාස නොකරමු" යයිද මෙම ප්‍රතික්ෂේප කරන්නන් පවසන්නාහ. එබැවින් මෙම අපරාධකාරයින් තමන්ගේ දෙවියන් ඉදිරියේ සිටුවා තබා….., [ඔවුන්ගේ දීන වූ ත්ත්වය ඔබ දැක ගන්නෙහුය;] (34:31)*

*මොවුන්ට අපගේ පැහැදිලි ආයාවන් සමුදීරණය කර පෙන්නුවහොත් (ඒවා) ප්‍රතික්ෂේප කරන මොවුන්ගේ මුහුණුවල පිළිකුල ඔබ දකින්නෙහිය; (22:72)*

*ධර්මය හිමි අයගෙන් එක් සමූහයක් (තම වාර්ගිකයින්ට) මෙසේ පවසන්නාහ; "ඔබ විශ්වාසය තැබූවන්ට පහළ කරන ලද (මෙම ධර්මය) උදේ කාලයේ විශ්වාස කර, සවස් කාලයේ (එය) ප්‍රතික්ෂේප කර හරිනි. (මෙමගින් විශ්වාසය තැබූ) ඔවුන්ද, (අවුල් වී තම විශ්වාසයෙන්) හැරී යනු ඇත. (3:72)*

*ප්‍රතික්ෂේප කරන්නන් (අන් අයට) "ඔබ මෙම කුරානය (ඔබගේ කන් වලින්ද) නොඅසනු. (කවුරුන් එය සමුදීරණය කළා වුවද, ඔබ ඒ අවස්ථාවේදී ශබ්ද නගා) එහි ආරවුල් ඇති කරනු. එමගින් ඔබ ජයග්‍රහණය කරන්නෙහුය" යයිද පැවසූහ. (41:26)*

*(නබියේ!) මෙම ප්‍රතික්ෂේප කරන්නන් (අපගේ දූතයා වන ඔබව ගෙන හැර දක්වමින්) "මොහු කෙරෙහි මොහුගේ දෙවියන් වෙතින් (අපි කැමති ආකාරයට) කුමක් හෝ සාධකයක් පහළ කළ යුතු නොවේද? යි පවසන්නාහ. (එයට) ඔබ*

*මෙසේ පවසනු; "නියත වශයෙන්ම අල්ලාහ් (දඬුවම් කිරීමට) අදහස් කරන අයව, වැරදි මාර්ගයෙහි අත්හැර දමන්නේය. සම්පූර්ණයෙන්ම ඔහු දෙසටම සිටින්නන්ව ඍජු මාර්ගයෙහි ඇතුළු කරන්නේය". (13:27)*

*(නබියේ!) ඔබට පෙර (පැමිණි අපගේ) දූතයින් බොහෝමයක් දෙනාද (මේ අන්දමටම) නියත වශයෙන්ම සමච්චලයට ලක් කරනු ලැබූහ. (ඔවුන්ව) ප්‍රතික්ෂේප කළ අයවද (එවෙලේම දඬුවම් නොකර) මා කල් දී අත්හැර දැමුවෙමි. එහෙත් පසුව මා ඔවුන්ව අල්ලා ගත්තෙමි. අපගේ දඬුවම කෙසේ තිබුණේද (යන්න සිතා බලනු මැනව!). (13:32)*

*ප්‍රතික්ෂේප කරන්නන්ට මෙලොව ජීවිතයම අලංකාරවත් ආකාරයට (සිතෙන සේ) පත් කරනු ලැබ ඇත්තේය. එබැවින් ඔවුන් (දුප්පතුන් වශයෙන් සිටින) විශ්වාසවන්තයිව සමච්චල් කරන්නාහ. නමුත් (විශ්වාසවන්තයින් වන) පරිශුද්ධවන්තයින් නම්, විනිශ්වය දිනදී ඔවුන්ට වඩා (අපමණ තරම්) උසස්ව සිටිනු ඇත. තවද අල්ලාහ් කැමැත්තන්ට ගණනය නොකරම ලබා දෙන්නේය .(2:212)*

*එබැවින් (නබියේ!) මෙම ප්‍රතික්ෂේප කරන්නන්ට අවනත නොවනු. තවද, (කුරානය වන මෙය) සාක්ෂි වශයෙන් තබා ඔබ ඔවුන් සමග දෙඩි ලෙස තර්ක කරනු (25:52)*

*(නබියේ!) ප්‍රතික්ෂේප කරන්නන් (ඉමහත් වෙළෙන්දන් වශයෙන්ද, ධනවතුන් වශයෙන්ද ආඩම්බරයෙන් යුතුව) නගරයන්හි සැරිසරමින් සිටිනු ඔබව වශී නොකළ යුතුය. (3:196)*

*(නබියේ!) (ඒ ස්ථානයේදීද) ඔවුන් ඔබට විරුද්ධව යුද්ධ කිරීමට පැමිණියහොත් ඔබත් ඔවුන්ව කපා දමනු. එම ප්‍රතික්ෂේප කරන්නන්ට අයත් ඵලවිපාකය මෙයයි!; (2:191)*

*(අපගේ) දූතයානෙනි! සමහරෙකු ප්‍රතික්ෂේපය දෙසට වේගයෙන් දිවීම ඔබට දුකක් ගෙන දිය යුතු නැත. මන්දයත් "විශ්වාසය තැබුවෙමු"යයි තමන්ගේ මුවින් පමණක් පැවසුවා මිස, ඔවුන්ගේ හෘදයන් (එය) භාර ගත්තේ නැත; (5:41)*

**8.** ධර්මය හිමි අය (යුදෙව්වන් සහ ක්‍රිස්තියානිවරුන්)ට අදාලව

*(නබියේ!) ඔබ මෙසේ කියනු; ධර්මය හිමි අයවළුනි! අල්ලාහ්ගේ ආයාවන් ඔබ කුමක් නිසා ප්‍රතික්ෂේප කරන්නෙහුද? අල්ලාහ් නම් ඔබ කරන දැයට සාක්ෂි වශයෙන් සිටින්නේය. (3:98)*

*තව්රාත් (නැමති ධර්මයද) නියත වශයෙන්ම අපිම පහළ කර ඇත්තේය. එහි සෘජු මාර්ගය ඇත්තේය. දීප්තිමත් ආලෝකයද ඇත්තේය. (අල්ලාහ්ට) සම්පූර්ණයෙන්ම අවනත වී කටයුතු කළ නබිවරුන්, එමගින් යුදෙව්වන්ට (ධර්ම) නියෝගයන් දෙමින් සිටියහ…,*

*තවද ඔවුන් (තමන්ගේ ධර්මයෙහි ඇති සත්‍යය සඟවා) ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව ප්‍රතික්ෂේප කරමින්ම මරණයටද පත් වන්නෝද, ඔවුන් කෙරෙහි අල්ලාහ්, මලායිකාවරුන්, මිනිසුන් ආදී සියල්ලගේ ශාපය නියත වශයෙන්ම අත් වන්නේය.(2:161)*

*විශ්වාසවන්තයිනි! ධර්මය හිමි අයගෙන් (ඇති) එක් සමූහයකට ඔබ අවනත වුවහොත් ඔබ විශ්වාසය තැබුවායින් පසුවද ප්‍රතික්ෂේප කරන්නන් වශයෙන් ඔබව හරවා යවනු ඇත. (3:100)*

*…කවුරුන් අල්ලාහ් පහළ කළ දෙය මගින් විනිශ්චය නොදෙන්නෝද, ඔවුන් නියත වශයෙන්ම ප්‍රතික්ෂේප කරන්නන්ම වන්නාහ!; (5:44)*

*ඉස්රායීල පරම්පරාවේ දරුවන්ගෙන් කවුරුන් ප්‍රතික්ෂේප කළෝද ඔවුන්ව, දාවූද්, මර්යම්ගේ පුත් ඊසා අදී මොවුන්, මුවින්ද ශාප කරනු ලැබ ඇත්තාහ. මන්දයත් (ඒ කාලයේදී) සීමාව ඉක්මවාද, පාපයන් කරමින්ද සිටියහ. (5:78)*

*"නියත වශයෙන්ම අල්ලාහ් (පියා, පුත්‍රයා, පරිශුද්ධ ආත්මය ආදී මෙම) තිදෙනාගෙන් කෙනෙකි" යයි පැවසූ අයද, නියත වශයෙන්ම ප්‍රතික්ෂේප කරන්නන් බවට පත් වූහ; (5:73)*

*"නියත වශයෙන්ම මර්යම්ගේ පුත් මසීහ්, අල්ලාහ් (දෙවියන්)ය" යයි පැවසූ අයද ඇත්තෙන්ම ප්‍රතික්ෂේප කරන්නන් බවට පත් වූහ. එහෙත් එම මසීහ් නම්,*

*"ඉස්රායීල පරම්පරාවේ දරුවනි! මගේ දෙවියන්වද, ඔබගේ දෙවියන්වද වන අල්ලාහ්වම නමදිනු" යයිම පැවසූහ. කවුරුන් අල්ලාහ්ට සමානයන් තබන්නේද, ඔහුට නියත වශයෙන්ම අල්ලාහ් ස්වර්ගය වළක්වා හරින්නේය. ඔහු රැඳෙන ස්ථානය නිරයයි. (මෙවැනි) අපරාධකාරයින්ට (විනිශ්චය දිනදී) උදව් කරන්නන් කිසිවෙකුත් නැත" (5:72)*

*ඔබ, ධර්මයෙහි (ඇති) සමහර නියෝගයන් විශ්වාස කර සමහර නියෝගයන් ප්‍රතික්ෂේප කරන්නෙහුද?;(2:85) [*මෙය පවසන්නේ යුදෙව්වන්ටය]*

*ඔවුන්ගේ ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අල්ලාහ් ඔවුන්ව ශාප කර හැරියේය. එබැවින් ඔවුන් විශ්වාස කිරීම ඉතාමත් අල්පය; (2:88) [*මෙය පවසන්නේ යුදෙව්වන් ගැනය]*

*මා පහළ කළ (මෙම ධර්මය) ඔබ විශ්වාස කරනු. මෙය ඔබ වෙත ඇති දැයද (තව්රාත් නැමති ධර්මයද) සත්‍යය කර තබන්නේය. මෙය ප්‍රතික්ෂේප කරන්නන්ගෙන් ඔබ, පළමුවැන්නන් බවට පත් නොවනු. (මෙම ධර්මය ගැන ඔබ වෙත ඇති තව්රාතයෙහි පවසා ඇති) මගේ වදන් (වෙනස් කර) සුළු මුදලකට විකුණා නොදමනු. ඔබ (වෙනත් අයටද බිය නොවී) මටම බිය වනු. (2:41) [*මෙය පවසන්නේ යුදෙව්වන්ටය]*

*අල්ලාහ් වෙතින් ඔවුන්ට එක් ධර්මයක් පහළ විය. එය ඔවුන් වෙත ඇති ධර්මය සත්‍යය කරද තබන්නේය. මීට පෙර නම්, ඔවුන් ප්‍රතික්ෂේප කරන්නන් මත (තමන්ට) ජයග්‍රහණය ලබා දෙන මෙන් ප්‍රාර්ථනා කරමින් සිටියහ. නමුත් ඔවුන් හොඳින් දැන (පැමිණේවි යැයි බලා) සිටි (මෙම ධර්මය) ඔවුන් වෙත පැමිණි අවස්ථාවේදී, මෙය ඔවුන් ප්‍රතික්ෂේප කරන්නාහ. එබැවින් එම ප්‍රතික්ෂේප කරන්නන් මත අල්ලාහ්ගේ ශාපය වේවා!; (2:89) [*මෙය පවසන්නේ යුදෙව්වන් ගැනය]*

*(මෙම ශුද්ධ වූ කුරානය තමන් වෙත පහළ නොකර) අල්ලාහ් තමන්ගේ වහලුන්ගෙන් තමන් කැමැත්තන් වෙත තමන්ගේ දයාව මගින් පහළ කිරීම ගැන ඊර්ෂ්‍යා කර, අල්ලාහ් පහළ කල මෙයම ප්‍රතික්ෂේප කිරීම මගින් ඔවුන් තමන්ව විකුණා කුමක් මිලදී ගත්තෝද, එය (ඉතාමත්) නපුරුය. (කුරානය තමන් වෙත*

*පහළ කලේ නැතැයි) කෝපයෙන් (මෙම ධර්මය ප්‍රතික්ෂේප කර, අල්ලාහ්ගේ) කෝපයෙහි ඔවුන් සේන්දු වූහ. එබැවින් එම ප්‍රතික්ෂේප කරන්නන්ට අවමන් ගෙන දෙන දඬුවම් ඇත. (2:90) [*මෙය පවසන්නේ යුදෙව්වන් ගැනය]*

*"අල්ලාහ් පහළ කළ මෙය, ඔබ විශ්වාස කරනු" යැයි ඔවුන්ට කියනු ලැබුව හොත් "අපගේ (නබිවරුන්) වෙත පහළ කරනු ලැබූ දැය (පමණක්) විශ්වාස කරමු" යයි පවසා ඒවා මිස, මෙය (මෙම ධර්මය) ප්‍රතික්ෂේප කර හරින්නාහ. නමුත් මෙය නම්, ඔවුන් වෙත ඇති දැය (තව්රාතය) සත්‍යය කර තබන සත්‍ය (ධර්මය) වශයෙන් ඇත්තේය; (2:91) [*මෙය පවසන්නේ යුදෙව්වන් ගැනය]*

*විශ්වාසය තැබූවන්ගෙන්ද, යුදෙව්වන්ගෙන්ද, සාබීර්න්වරුන්ගෙන්ද, ක්‍රිස්තියානුවන්ගෙන්ද, කවුරුන් (ඇත්තෙන්ම) අල්ලාහ්වද, අවසාන දිනයද විශ්වාස කර, දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම බියක් නැත. ඔවුන් දුක් නොවන්නාහ. (5:69)*

*විශ්වාසවන්තයිනී! ඔබට පෙට ධර්මය ලබා දුන් අයගෙන්ද, ප්‍රතික්ෂේප කරන්නන්ගෙන්ද, කවුරුන් ඔබගේ ධර්මය සමච්චලයක් වශයෙන්ද, (පුහු) කෙළියක් වශයෙන්ද ඇර ගන්නෝද, ඔවුන්ව (ඔබට) සහායයන් වශයෙන් (හෝ ආරක්ෂකයින් වශයෙන් හෝ) නොගනු; (5:57)*

**9. පෙර විසූ නබිවරුන් සහ පෙර සමාජවල ප්‍රතික්ෂේප කළ ජනතාව සම්බන්ධව**

*(මිනිසුනේ! ඔබට) පෙර සිටි ප්‍රතික්ෂේප කළ අයගේ පුවත් ඔබට ලැබුනේ නැද්ද? ඔවුන් තමන්ගේ ක්‍රියාවන්හි නපුරු ඵලවිපාක (මෙලොවදී) වින්දාහ. තවද, (පරලොවදීද) ඔවුන්ට වේදනා ගෙන දෙන දඬුවම් ඇත. (64:5)*

*(නබියේ!) ඔබට, පෙරසිටි සෑම දූතයෙකුටම ඇත්තෙන්ම වහී මගින් දෙනුම් දෙනු ලැබූ දැය (කිමෙක්දයත්, දෙවියන්ට) ඔබ සමානයන් තැබුව හොත්, ඔබගේ පින් (සියල්ල) විනාශ වී, නියත වශයෙන්ම පරාජිතයින්ගේන් වූ අය බවට පත්වන්නෙහුය" (යනුවෙන් වේ). එබැවින් ඔබ අල්ලාහ්වම නමදිනු. ඔහුට කෘතඥ වන්නන් කෙනෙකු වශයෙන් ඔබත් සිටිනු (39:65,66)*

*භූමියෙහි (විනාශ වී ගිය) පෙර විසූ අයගෙන් පසු, එය අයිතිකරගත් මොවුන්ද අපි අදහස් කළෙමු නම්, මොවුන්ගේ පාපයන්හී හේතුවෙන් (ඒ ආකාරයෙන්ම විනාශ කර) දඬුවම් කරන්නෙමු යන කාරණාව මොවුන්ට ඍජු මාර්ගය පෙන්වූයේ නැද්ද: (7:100)*

*මා නබිව යැවූ සෑම රටකම මිනිසුන්ව (ඔවුන් ප්‍රතික්ෂේප කර හැරියොත්) ඔවුන් යටහත් පහත්ව පැමිණීම පිණිස දුක් ගැහැට මගින් අපි ඔවුන්ව නොඅල්ලා සිටියේ නැත. (7:94)*

*නූහු (නබි තම දෙවියන්ට) " මගේ දෙවියනේ! භූමියෙහි එම ප්‍රතික්ෂේප කරන්නන්ගෙන් කිසිවෙකුත්වත් වාසය කිරීමට ඔබ අත්හැර නොදමනු! ඔබ ඔවුන්ව අත්හැට දමා තබන්නේ නම්, ඔබගේ (අනිත්) වහලුන්වද නියත වශයෙන්ම ඔවුන් මාර්ගය වැරද යාමට සළස්වන්නාහ. පාපතරයන්වද, ප්‍රතික්ෂේප කරන්නන්වද මිස (වෙන කිසිවෙකුත් දරුවන් වශයෙන්) ඔවුන් ප්‍රසූත කරන්නේද නැත. (71:27)..... මෙම අපරාධකාරයින්ට විනාශයම මිස, ඔබ අධික නොකරනු මැනව! යයි ප්‍රාර්ථනා කළේය). (71:28)*

*(මෙසේම) මද්යන්වාසීන්ද, (තමන්ගේ නබිවරයාව බොරු කළහ. මෙසේම) මූසාවද (තම ජනතාව විසින්) බොරු කාරයා බවට පත් කරනු ලැබුවේය. එබැවින් ප්‍රතික්ෂේප කළ මොවුන් සියල්ලන්ටම මා සුළු කාල අවකාශයක් ලබා දී, පසුව ඔවුන්ව මා අල්ලා ගත්තෙමි. (මගේ) දඬුවමේ (භයානකත්වය) කෙසේ තිබුනේදැයි (යන්න ඔබ අවධානය කර බැලුවෙහිද?) (22:44)*

*ඔවුන්ගෙන් පසුවද මූසාව සාධකයන් සමග පිරවුන් වෙතද යැව්වෙමු. එහෙත් ඔවුන් නම්, එම සාධකයන් අවතක්සේරු කර, (ප්‍රතික්ෂේප) කර දැමූහ. (මෙවැනි) අපරධකරුවන්ගේ අවසානය කෙසේ වූයේදැයි යන්න (නබියේ!) ඔබ අවධානය කර බලනු මැනව! (7:103)*

**10. ප්‍රතික්ෂේප කළ ජනතාව සහ විනිශ්චය දිනයේ ඔවුන්ගේ තත්වය.**

*(යුග අවසානය ගැන වූ සත්‍යය) පොරොන්දුව ළඟාවිය. (එය පැමිණෙන විට, එය දකින) ප්‍රතික්ෂේප කරන්නන්ගේ ඇස් ඇරුණු ඇරුණු ආකාරයටම තිබෙණු ඇත.*

*(තවද ඔවුන්) 'අපට විනාශයයි! අපි මේ ගැන කණගාටු නොවන අය වශයෙන්ම හිඳිමින්, අපට අපිම හානියක් කර ගත්තෙමු" යයි විළාප නගන්නාහ. (21:97)*

*එදිනදී සත්‍යය වූ රාජ්‍යය රහ්මාන් (එක්කෙනෙකු)ටම ඇත්තේය. (එය) ප්‍රතික්ෂේප කරන්නන්ට (ඉතාමත්) දරුණු දිනයක් වශයෙන්ද තිබෙනු ඇත. (25:26)*

*එහෙත් ප්‍රතික්ෂේප කරන්නන් "විනිශ්චය දිනය අපට (කිසිදාක ) පැමිණෙන්නේ නැත" යයි පවසන්නාහ. (නබියේ!) ඔබ මෙසේ පවසනු; "එසේ නොව, මගේ දෙවියන් මත සත්තකින්ම! නියත වශයෙන්ම (එය) ඔබ වෙත අනිවාර්යයෙන්ම පැමිණෙන්නේය. ඔහු ගුප්ත දැය සියල්ල දන්නෙකි. ඔහු නොදැනුවත්ව අහස් හී හෝ භූමියෙහි හෝ ඇති දැයෙන් එක් අනු ප්‍රමාණයක් හෝ බේරී යන්නේ නැත. ඊටත් වඩා කුඩා හෝ ලොකු හෝ (සෑම දෙයක්ම ලවුහුල් මහ්ෆූල් නැමැති) පැහැදිලි (සටහන්) පුස්තකයෙහි සටහන් නොවී නැත. (34:3)*

*නියත වශයෙන්ම ප්‍රතික්ෂේප කරන්නන්ට මෙම භූමියෙහි ඇති සියල්ල තිබී, ඒ සමග ඒවා මෙන් තවත් කොටසක්ද (අයිතිව) තිබී, ඔවුන් මේ සියල්ල (තමන්) විනිශ්චය දිනදී විඳින දඬුවමට වන්දි වශයෙන් ලබා දුන්නා වුවද, ඔවුන් වෙතින් (එය) භාර ගනු නොලැබේ. පසුව ඔවුන්ට වේදනා ගෙන දෙන දඬුවම්ම ලැබෙනු ඇත. (5:36)*

*(එදිනදී ප්‍රතික්ෂේප කරන්නන්ට) "ප්‍රතික්ෂේප කරන්නෙනී! අද දින ඔබ (පුහු) ප්‍රශංසා නොකියනු. ඔබට දෙනු ලබන ඵලවිපාක නම්, ඔබ කරන දැයටයි. (ඔබ නොකළ දැයට නොව" යයි කියනු ලැබේ). (66:7)*

*දෙවියන් "පරලොව මිනිසුන්ටද, ජින්වරුන්ටද) "මිනිසුනී! හා ජින් සමූහයිනී! ඔබගෙන් ඉකුත් වූ (මාගේ) දූතයින් ඔබ වෙත පැමිණ මාගේ ආයාවන් ඔබට සමුදීරණය කර පෙන්වා, ඔබ (මාව) හමුවන මෙම දිනය ගැනද ඔබට බිය ගන්වා අනතුරු ඇඟවූවේ නැද්ද?" යි (විමසනු ඇත). එයට ඔවුන්, "(අපගේ දෙවියනේ! ඇත්තය). මෙලොව ජීවිතය අපව රවටා දැමීය" යයි තමන්ට විරුද්ධවම සාක්ෂි දරණ අතර ඇත්තෙන්ම තමන් ප්‍රතික්ෂේප කරමින් සිටි බවද, තමන්ට තමන්ම විරුද්ධව සාක්ෂි දරනු ඇත. (6:130)*

*තමන්ද මුස්ලිම්වරුන් වශයෙන් සිටිය යුතු නොවේදැයි ප්‍රතික්ෂේප කරන්නන් (පරලොවදී) ඉමහත් සේ කැමති වන්නාහ. (15:2)*

*(මෙසේ අල්ලාහ්ව) ප්‍රතික්ෂේප කර, (අල්ලාහ්ගේ) දූතයාට වෙනස්කම් කළ අය, භූමිය තමන්ව ජීර්ණය කර ගත්තා නම් අගනේය යයි එදින කැමති වන්නාහ. මොවුන්ට අල්ලාහ් වෙත කිසිම කාරණාවක් සඟවා ගත නොහැක. (4:42)*

*එදිනදී ප්‍රතික්ෂේප කළ අය සමූහ සමූහ වශයෙන් නිරය දෙසට දක්කාගෙන එනු ලබන්නාහ; (39:71)*

*කවුරුන් (ඒ දිනය) ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ට (එදින) ඔවුන්ගේ වස්තුවද ඔවුන්ගේ දරුවන්ද අල්ලාහ්ගෙන් (ඔහුගේ දඬුවමෙන්) කිසිවෙක් වළක්වා දමන්නට නොහැක. ඔවුන්ම ඇත්තෙන්ම (නිරා) ගින්නේ දර වශයෙන් ඇත්තාහ. (3:10)*

**11. ප්‍රතික්ෂේප කළ ජනතාව සහ නිරයේ සිටින ඔවුන්ගේ තත්වය.**

*නිරයෙහි ආරක්ෂකයින් වශයෙන් මලායිකාවරුන්ම මිස, (වෙන කිසිවෙකුත්) අපි නියම කළේ නෑ. ප්‍රතික්ෂේප කරන්නන්ව පිරික්සීම සඳහාම (මෙසේ) මොවුන්ගේ ගණනය (දහ නව දෙනෙකු වශයෙන්) අපි ඇති කළෙමු. ධර්මය හිමි අය මෙය ස්ථිර වශයෙන්ම විශ්වාස කළ යුතුය; (74:31)*

*විශ්වාසවන්තයිනි! ඔබ, ඔබවද, ඔබගේ පවුලේ උදවියද, මිනිසුන්ද ගල්ද ඉන්දන බවට පත් කළ හැකි නිරා ගින්නෙන් ආරක්ෂා කර ගනු. එහි දැඩි හැකියාවන්ගෙන් පිරි ශක්තිසම්පන්නයන් වන මලායිකාවරුන්ව පත් කරනු ලැබ ඇත්තේය. අල්ලාහ් ඔවුන්ට නියෝග කර ඇති දැයෙන් (පොඩියක් හෝ) වෙනසක් නොකරනු ලබන්නාහ. ඔවුන්ට (දඬුවම් කරන මෙන්) තමන්ට දෙනු ලැබූ නියෝගයන් ඉටු කරමින් සිටින්නාහ (66:6)*

*"ඔබට මෙම දඬුවම ලැබීමට හේතුව නම්, "අල්ලාහ් එක්කෙනෙකි' යයි කියනු ලැබූ විට, (එය) ඔබ ප්‍රතික්ෂේප කළෙහුය. ඔහුට (යම් කිසිවෙකු) සමානයක් කළ විට, (එය) ඔබ විශ්වාස කළෙහුය! අද දින ඔබට ලැබී ඇති) මෙම තීන්දුව ඉතාමත්*

*විශාලවන්තයා වන අල්ලාහ්ටම අයත්ය" යයි පවසනු ඇත). (40:12)*

*කවුරුන් (අපගේ ආයාවන්) ප්‍රතික්ෂේප කර හැරියෝද, ඔවුන්ට නිරා ගින්නම ලැබෙනු ඇත. ඔවුන් මරණයට පත් වන අන්දමට (එහි) ඔවුන්ගේ කාරනාව අවසන් කර දමනු ලබන්නේ නැත. (දඬුවම විඳිමින් සිටිණු පිණිස, නොමැරී පණ පිටින්ම සිටින්නාහ). තවද, එම දඬුවමෙන් ඔවුන්ට (පොඩියක් හෝ) අඩු කරනු ලබන්නේද නැත. මේ අන්දමටම සියලු ප්‍රතික්ෂේප කරන්නන්ටද අපි එලවිපාක දෙන්නෙමු. (35:36)*

*ඔවුන් අපගේ ආයාවන් ප්‍රතික්ෂේප කර දැමූ අතර "අපි (මරණයට පත් වී) ඇටසැකිලි බවටද, දිරා පත් වී පස් බවටද, පත් වූ පසු ඇත්තෙන්ම අළුත් උත්පාදනයක් වශයෙන් අපි නැගිට්ටවනු ලබන්නෙමුද?" යයිද කියමින් සිටීමම මෙවැනි (දරුණු) දඬුවම ඔවුන්ට අත් වීමට හේතුවයි. (17:98)*

*"ඔබට පොරොන්දු දෙන ලද නිරය මෙයයි" '(මෙය) ඔබ ප්‍රතික්ෂේප කරමින් සිටි හේතුවෙන් අද දින මෙහි ඔබ ඇතුළු වනු" (යයිද පවසන්නෙමු). (36:63,64)*

*මිනිසුන්ද, ගල්ද භාවිතා කර ගන්නා (නිරා) ගින්නට බිය වනු. එය (මෙම ධර්මය) ප්‍රතික්ෂේප කරන්නන් වෙනුවෙන්ම සම්පාදනය කර ඇත; (2:24)*

*(අපගේ කළ ගුණ අමතක කළ) ප්‍රතික්ෂේපයට මෙය අපි ඔවුන්ට එලවිපාක වශයෙන් දුන්නෙමු. ප්‍රතික්ෂේප කරන්නන්ට මිස, (වෙන කිසිවෙකුටත් මෙවැනි) එලවිපාක අපි දෙන්නෙමුද? (34:17)*

## 12. ප්‍රතික්ෂේප කළ නබිවරුන්ගේ පවුල් වලම අය කිහිප දෙනෙකු ගැන

*තම නිර්මාතෘව ප්‍රතික්ෂේප කිරීම හෝ ඔහුව පිළිගැනීම තම පුද්ගලික කාරණාවකි. එය තම හද තුල තිබෙන ආකාරය දෙවියන් ඉතාම හොඳින් දනී. එය අණුවක් තරම් කුඩාවට තිබුනත් දෙවියන් එයද දනී. දෙවියන්ට අවනත වීම තමා විසින්ම කළ යුතු දෙයකි. එය නබිවරුන්ටවත් වෙනස් කළ හැකි දෙයක් නොවේ. පහතින් දැක්වෙන්නේ නබිවරුන්ට තම පවුලේ උදවියගේ හදවත් දෙවියන්ට අවනත වන ලෙස කළ නොහැකි වූ අවස්ථා කිහිපයකට උදාහරණය.*

*ප්‍රතික්ෂේප කරන්නන්ට නූහු (නබි) ගේ භාර්යාවද, ලූත් නබිගේ භාර්යාවද, අල්ලාහ් උදාහරණ වශයෙන් තබා ඇත්තේය. එම ස්ත්‍රීන් දෙදෙනාම අපගේ හොඳ වහලුන්ගේ භාර්යාවන් වශයෙන්ම සිටියහ. එහෙත් එම ස්ත්‍රීන් දෙදෙනාම තම ස්වාමිපුරුෂයින්ට ද්‍රෝහිකම් කළහ. එබැවින් මොවුන් දෙදෙනාම (නබිවරුන්ගේ භාර්යාවන් වශයෙන් සිටියද), අල්ලාහ්ගේ දඬුවමෙන් කිසිවක් වළක්වා ගත නොහැකි විය. (මොවුන් ද්‍රෝහිකම් කල හේතුවෙන් මොවුන්ට) "නිරයෙහි ඇතුළුවනු" යයි කියනු ලැබේ. (66:10)*

*එම නැව කඳු වැනි විශාල රළ අතරේ ඔවුන්ව ඔසවාගෙන ගමන ආරම්භ කළේය. (ඒ අවස්ථාවේදී) නූහ් තමන්ව අත්හැර ඇත්ව සිටි තම පුතාට "මගේ පුතාණෙනි! අප සමග (විශ්වාසය තබා) ඔබත් (මෙහි) නැග ගනු. (අපගෙන් ඈත් වී) ප්‍රතික්ෂේප කරන්නන් සමග ඔබ නොසිටිනු. (එසේ වුවහොත් ඔබත් ජලයෙහි ගිලී යනු ඇත)" යයි (ශබ්ද නගා) ආරාධනා කළේය. එයට ඔහු "(මෙය විශාල) ජල ගැල්මෙන් බේරීමට හැකි උස කන්දක් මතට මා නැග ගන්නෙමි" යයි පැවසුවේය. එයට ඔහු, "අල්ලාහ් දයාව පහළ කළොත් මිස, ඔහුගේ නියෝගයෙන් බේරීමට අද කිසිවෙකුටත් නොහැකිය" යයි පැවසුවේය. (එවිට) ඔවුන් අතරේ එක් (විශාල) රළක් නැග හරස් වුනේය. ඔහුද ගිලී ගිය අය සමග ගිලී ගියේය. (11:42,43)*

*ඉබ්රාහීම් තමන්ගේ පියා වන අසර්ට "පිළිරූ, දෙවිවරුන් වශයෙන් ඇර ගන්නෙහිද? නියත වශයෙන්ම ඔබද, ඔබගේ ජනතාවද ප්‍රකට දුර්මාර්ගයෙහි සිටිනු මා දකින්නෙමි" යයි පැවසුවේය. (6:74)*

ෆිර්අවුන්ගේ බිරිඳ ආසියා සහ ජේසු තුමාගේ මව මර්යම් (අ.ස) නබි වරුන් නොව. නමුත් අල්ලාහ්ම පවසනවා ඔවුන් ශ්‍රේෂ්ඨතම මුස්ලිම් කාන්තාවන් දෙදෙනෙකු බව. ආසියාගේ ස්වාමියා අල්ලාට ප්‍රභල ලෙස සතුරු කම් කළේය. බිරිඳ කොතරම් හොඳ උනත් ස්වාමියා නිරාවාසියෙක් විය. මරියම් තුමියගේ පුත් අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨ නබිවරයෙකි.

*විශ්වාසය තැබූවන්ට (කාන්තාවන් දෙදෙනෙකුව) උදාහරණයන් වශයෙන් දක්වන්නේය. (පළමුව); ෆිරවුන්ගේ බිරිඳ (66:11) (දෙවනුව); ඉම්රාන්ගේ දියණිය වන මර්යම්ය: (66:12)*

අල්ලාහ්ගේ අති ශ්‍රේෂ්ඨතම නබිවරයා වන්නේ මොහම්මද් ﷺ නබි තුමාය. ඔහුව බලා ගත්තේ ඔහුගේ ලොකු තාත්තා වන අබූ තාලිබ්ය. අබූතාලිබ් දැනගෙන හිටියා තම ඥාති පුතා අල්ලාහ්ගේ දූතයා බව. එසේම ඔහු සත්‍යයවන්තයෙක් බවත් දැන සිටියා. නමුත් ඔහු මිය යන තෙක් ඔහු අල්ලාහ්ව පිළිගන්නා බව (ඉස්ලාමීය ක්‍රමවේදයට අනුව) සිදු නොවීය. මේ ඒ ගැන සඳහන් කරමින් පහළ වූ දේව වදනකි.

*(නබියේ!) ඔබ කැමති අයව ඍජු මාර්ගයෙහි ඇතුළු කිරීමට නියත වශයෙන්ම ඔබට නොහැකිය. එහෙත් අල්ලාහ් තමන් කැමති අයවම ඍජු මාර්ගයෙහි ඇතුළු කරන්නේය. ඍජු මාර්ගයේ යා හැකි අය කවුරුන්දැයි ඔහුම හොඳින් දන්නේය. (28:56)*

තමන් හදතුල අණුවක තරම් හෝ වංක භාවයක්, අවිශ්වාසයක්, අහංකාරකමක්, ප්‍රතික්ෂේප කිරීමක් තිබුනොත් අල්ලාහ් ඔහුට ඍජු මාර්ගය දෙන්නේ නැති බව ඔහු පවසා ඇත.

---

## දෙවියන් වහන්සේගේ දැනුම සහ නිර්මාණශීලීත්වය

දෙවියන් මිනිසාගෙන් මෙසේ අසයි,

*අහස් හිද භූමියෙහිද, ඔවුන්ට ඉදිරියෙන්ද පසුපසින්ද, ඇති දැය ඔවුන් අවධානය කර බැලුවේ නැද්ද?; (34:9) ඒවා කිසිවක් නොමැතිව තමන් විසින්ම ඇති කළෙහුද? නැතහොත් මොවුන්, තමන්ට තමන්ම නිර්මාණය කර ගත්තෙහුද? නැතහොත් අහස්ද භූමියද ඔවුන් නිර්මාණය කළෙහුද? නැත. මේ සියල්ල නිර්මාණය කළ අය දෙවියන්ය; (52:35,36)*

දෙවියන් විසින් ශුද්ධ වූ කුරාණයේ ස්ථාන දෙකක පරමාණුවක කුඩාම අංශුව ගැන මෙසේ සඳහන් කර ඇත.

*ඔහු ගුප්ත දැය සියල්ල දන්නෙකි. ඔහු නොදැනුවත්ව අහස් හි හෝ භූමියෙහි හෝ ඇති දැයෙන් එක් අණුවක ප්‍රමාණයක් තරම් හෝ බේරී යන්නේ නැත. ඊටත් වඩා*

*කුඩා හෝ ලොකු හෝ (සෑම දෙයක්ම) ලව්හුල් මහ්ෆූල් නැමැති පැහැදිලි සටහන් පුස්තකයෙහි සටහන් නොවී නැත; (අල් කුරාණය 34:3).*

*භූමියෙහි හෝ අහසෙහි හෝ ඇති දැයෙන් එක් අණු ප්‍රමාණයකින් හෝ (නබියේ!) ඔබගේ දෙවියන් නොදැන වැරද යන්නේ නැත. මේවාටත් වඩා කුඩා හෝ ලොකු හෝ (කුමක් වුවද), ඔහුගේ පැහැදිලි සටහන් පුස්තකයෙහි සටහන් නොකර ඇත්තේ නැත. (අල් කුරාණය 10:61)*

මිනිසාගේ තුන් කාලය ගැනම සහ සිතුවිල්ල ගැන පවා දෙවිඳුන් දන්නා බව

*නියත වශයෙන්ම අපිම මිනිසාව (පළමු වරට) උත්පාදනය කළෙමු. ඔහුගේ මනසෙහි ඇතිවන සිතුවිල්ලද, අපි හොඳින් දනිමු. පිටි බෙල්ලේ ඇති පණ නහරයට වඩා අපි ඔහුට ඉතාමත් සමීපවයෙන්ම සිටින්නෙමු. (50:16) ඔබව පස් වලින් නිර්මාණය කළ අවස්ථාවේදී ඔබගේ (ගති ගුණයන්) ඔහු හොඳින් දන්නේය. ඔබ ඔබගේ මවගේ කුසයෙහි (මාංශ පින්ඩයක් වශයෙන්) සැඟවී තිබූ අවස්ථාවෙහිද, (ඔබව ඔහු හොඳින් දන්නේය); (53:32) හෘදන්හී ඇති දැයද නියත වශයෙන්ම ඔහු හොඳින් දන්නේය. (39:7) ඔහු නම් සෑම ආත්මයක්ම කරන සෑම දැයක්ම හොඳින් දන්නෙකි; (13:33) ඔහු නොදැනුවත්ව කිසියම් හෝ කාන්තාවක් ගැබ් ගන්නේද නැත, ප්‍රසූත කරන්නේද නැත. ඔහුගේ සටහන් පුස්ථකයෙහි නොමැතිව කිසිවකුගේ වයස වැඩි කරනු ලබන්නේද නැත, කිසිවකුගේ වයස අඩු කරනු ලබන්නේද නැත. නියත වශයෙන්ම මේවා සියල්ල දැනගෙන සිටීම අල්ලාහ්ට ඉතාමත් සුළු දැයකි. (35:11)*

සියල්ලෙහි නිර්මාතෘ වන සර්වබලධාරී දෙවියන් වහන්සේ තමාගේ ප්‍රඥාව ගැන මෙසේද පවසයි:

*'නබියේ! ඔබ පවසන්න, අල්ලාහ්ගේ වචන, ප්‍රඥාව සහ සංඥා ලිවීමට මුහුදේ ජලය පෑනකට තීන්තයක් ලෙස භාවිතා කලේ නම්, ඒ සියල්ල ලියා තැබීමට පෙර මුහුද සිඳී යනු ඇත. (අල් කුරාණය 18 :109)*

*පොළොවේ ඇති සියලුම ගස් පෑන් පමණක් වූවා නම්, ඊට පසු තවත් මුහුදු සතකින් ජලය තීන්ත ලෙස සැපයෙන්නේ නම්, (ඒවායින් නොනවත්වා ලීවත්)*

*දෙවියන් වහන්සේගේ වචනය අවසන් නොවනු ඇත. නියත වශයෙන්ම අල්ලාහ් බලවත්ය, සර්ව ප්‍රඥාවන්තය. [අල් කුරාන් 18 :109]*

පහත කරුනු දෙස අවධානය යොමු කරන්න.

1). සදාකල් එක්කෙනෙක් පමණක් ලෙසම සිටින සර්වබලධාරී දෙවියන් වහන්සේ ඔහුගේ බල පරාක්‍රමයෙන් ඔහුට භාහිරින් ඇති දැය නිර්මාණය කරන ලදී. ඔහු (කෙසේ හෝ) ඒවා නිර්මාණය කළේ නැතිනම් ඔහු හැර වෙන කිසිවක් පැවතීමට හේතුවක් වත් අපිට සොයා ගත නොහැකිය. නිර්මාණකරුවෙකු නොමැතිව කිසිඳු නිර්මාණයක් බිහිවීමට ඉඩක් නැත, එසේම, කිසිඳු පදාර්තයකට හෝ ජීවයකට කිසිවක් නොමැති අවස්ථාවේ සිට තමාට තමාව ස්වයංව නිර්මාණය කරගැනීමටද නොහැක. එසේම අහඹු ලෙස සුවිශේෂී නිර්මාණ බිහිවීමටද ඉඩක් නැත. එනම්, සෑම නිර්මාණයක් පසුපසම නිර්මාණකරුවෙකු සිටිය යුතුමය. ඔබ කොතරම් අතීතයක සිදුවීමක් ගැන කතා කලත්, එය නිර්මාණය වීමටද හේතුව මෙම සර්වබලධාරී දෙවියන්මය. (මෙය තහවුරු කර ගැනීමට අවශ්‍ය නම් දෙවියන් සිටින බවට සාක්ෂි ලිපිය බලන්න).

2). ඔහු සදාකල් පැවතීමට නම් ඔහු වෙත දුර්වලතා කිසිවක් තිබිය නොහැක. ඔහුගේ නිර්මාණ වලින් ඔහුට හානියක්, අභියෝගයක්, හෝ එම නිර්මාණ කෙරෙහි ඔහුට සැකයක්, අතපසු වීමක්, බල රහිත බවක් තිබිය නොහැක.

3). මේ අනුව බලන කල ඔහුට ඔහුගේ නිර්මාණ කෙරෙහි සම්පූර්ණ අවබෝදයක් තිබිය යුතුය. එය කෙතරම් සියුම් තත්වයක් ද යත්, එම නිර්මාණය ඇති කිරීමට පෙරම ඔහුට එහි මුල, මැද සහ අග පිළිබඳව සම්පූර්ණ ඇස්තමේන්තුවක්, සම්පූර්ණ සැලැස්මක් තිබිය යුතුය. එම නිර්මාණය විශාල විශ්වයක් හෝ වේවා කුඩා කුහුඹුවෙකුගේ ආහාර ජීර්ණ පද්ධතිය ගැන හෝ වේවා විය හැකියි. එසේම එම කුහුඹුවා තම ජීවිත කාලය තුල කොතරම් ආහර ප්‍රමාණයක් අනුභව කරනවාද ලෙස හෝ විය හැකියි. නැත්නම් පරමානුවේ කුඩාම කොටස වුවද විය හැක. මේ සියල්ල කෙරෙහි ගනනය කිරීමක් පවා ඔහුගේ ඇස්තමේන්තුව තුල තිබිය යුතුය. එසේ නොවුන හොත් ඔහුගේ නිර්මාණ කෙරෙහි කුමණ කෝ දෙයකින් ඔහු

අසමත් උනොත් එය ඔහුගේ සර්වබලධාරී කමට නුසුදුසු කමකි. එය ඔහුගේ සදාකල් පැවැත්මට, ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයට හානියකි. මෙය අප වටහා ගත යුතුයි.

4). අප දන්නා විශ්වයට වයස දැනට වසර බිලියන 13.7 කි. එය අංක වලින් පෙන්නුවොත් වසර 13,700,000,000 කි. දෙවියන් මීට වසර 1400 කට පෙර ශුද්ධ වූ අල් කුරානය පහළ කර එතුලින් ඔහු අපට පවසා තිබෙනවා ඔහු විසින් මෙම විශ්වය නිර්මාණය කල බව.

ඔහුගේ නිර්මාණයේ එක් ග්‍රහලෝකයක් වන පෘතුවියම අරන් බැලුවත්, එය තුල තිබෙන මනා සැලසුම් සහගත බව, එහි සිටින ජීවීන්ගේ ශරීරවල විශ්මිත සැලසුම් සහගත බව, ඒවාට අවශ්‍යය සියළුම දෑ වල මනා පරිපාළන ස්වභාවය, එකිනෙක අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්දතාවය ආදිය අපේ ඇස් වලින්ම අපට බලා ගත හැක. එනම් මේ සියල්ල දෙවියන් විසින් ඉතාම සැලසුම් සහගත ආකාරයකට නිර්මාණය කර ඇති බවට කිසිඳු සැකයක් නැත. (වැඩි විස්තර සඳහා දෙවියන්ගේ නිර්මාණ වෙත යොමුවී බලන්න).

අප සාකච්චාවට බඳුන් කරන සියල්ල නිර්මාණ වන අතර ඒ සියල්ලට වඩා දෙවියන්ට ඇත්තේ වෙනස් ස්වභාවයකි. එනිසා ඔහුව දෙවියන් ලෙස හඳුන්වන අතර නිර්මාණ කිසිවකට "දෙවියන්" යන නම භාවිතා කිරීම් නුසුදුසුය.

*ඔහු අහසත් පොළොවත් නිර්මාණය කළේ නිශ්චිත අරමුණක් සඳහාය. [16:3]*

ඔහු විසින් කල නිර්මාණ කිහිපයක් ගැන සලකා බලා ඔහුගේ දැනුම හා නිර්මාණශීලී හැකියාව ගැන අප යම් අවබෝදයක් ලබා ගනිමු.

**"මිනිසා" නැමැති නිර්මාණය.**

*"සැබැවින්ම අපි මිනිසා මැව්වේ තෙත් පොළොවේ නිෂ්පාදනයකිනි (කිරිමැටි සාරයකිනි). පසුව එය අපි ඉන්ද්‍රීය බිඳක් බවට පත්කර ඉතාමත් ප්‍රවේසම් සහිත ස්ථානයක තැම්පත් කළෙමු. පසුව එම ඉන්ද්‍රීය බිඳ ලේ කැටියක් බවට පත් කළෙමු. පසුව එම ලේ කැටිය මාංශ පිණ්ඩයක් බවට පත් කළෙමු. පසුව එම මාංශ පිණ්ඩයේ ඇට කටු නිර්මාණය කර, එම ඇට සැකිල්ලට මස් මාංශ ඇන්දෙව්වෙමු. පසුව එය (පූර්ණ) මිනිස් ජීවිතයක් බවට පත් කළෙමු; (23:12-14)*

සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ සිරුරේ ඇති සෛල ප්‍රමාණය :-

- පිරිමින් සෛල (වර්ග 200ක් පමණ) ගනනින් ට්‍රිලියන 36කින් (36,000,000,000,000) පමණ සමන්විත වන අතර කාන්තාවන්ට සෛල ට්‍රිලියන 28ක් පමණ ඇති අතර අවුරුදු 10ක දරුවෙකුගේ සෛල ට්‍රිලියන 17ක් පමණ ඇත.
- ඊට අමතරව මිනිස් සිරුරේ සියලුම අවයවවල තවත් බැක්ටීරියා වර්ග දහසක් පමන ගනනින් ට්‍රිලියන 39 ක් පමණ (මිනිස් සිරුර තුළ සහ ඒ මත) ක්‍රියාත්මකව ඇත.
- නව පර්යේෂණ වලට අනුව සාමාන්‍ය පිරිමි මොළයේ සෛල බිලියන 171 (171,000,000,000) ක් පමණ ඇත, නියුරෝන බිලියන 86 ක් පමණ ඇත. නියුරෝන යනු මොළය පුරා සංඥා සම්ප්‍රේෂණය කිරීමට උපකාර වන සෛල වේ.
- සෑම තත්පරයකටම රතු රුධිර සෛල මිලියන 2-3 ක් ඇට මිදුළු තුළ නිපදවා සංසරණයට මුදා හරිනු ලැබේ. එවැනිම සෛල ප්‍රමාණයක් තත්පරයක් තුල මිය යයි.

සෛල වලට වඩා කුඩා DNA ගැන තොරතුරු ටිකක් සොයා බලමු.

- බොහෝ DNA හෝ RNA වල ප්‍රමාණය 50 nm වේ (සෑම මූලික යුගලයක්ම දිග 1/3 nm පමණ වේ).
- DNA එකක ප්‍රමාණය කෙසේද? මිනිස් DNA පොටක විෂ්කම්භය නැනෝමීටර් 2.5 කි. එක අඟලක නැනෝමීටර් 25,400,000ක් තියෙනවා. මිනිස් කෙස් කළඹක් නැනෝමීටර් 80,000-100,000 පමණ පළල වේ. (නැනෝමීටරයක් යනු මීටරයකින් බිලියනයකින් පංගුවකි).
- එක් සෛලයක් තුල ඇති DNA වල දිග මීටර් 2 ක් පමණ වනු ඇත.
- අපගේ ශරීරයේ සෛල ට්‍රිලියන 30ක් පමන ඇත. (2m x ට්‍රිලියන 30= ට්‍රිලියන 60m = බිලියන 60km. එම දුර පෘතුවිය වටේ 1,497,192 වාරයකට සමානය. එම දුර පෘතුවියේ සිට චන්ද්‍රයා වෙත ඇති දුර මෙන් 156,087 වතාවක් දුරය. එම දුර පෘතුවියේ සිට සූර්යයා වෙත ඇති දුර මෙන් 400 වතාවක් දුරය.

- DNA තුල ඇති ප්‍රෝටීන DNA වලට වඩා කුඩා ය. ප්‍රෝටීන වල සාමාන්‍ය ප්‍රමාණය 3~6 nm.
- [අප අසා ඇති පරමානු තුල ඇති ප්‍රෝටෝන සහ නියුට්‍රෝන වලටත් වඩා 10,000 ගුනයකින් කුඩා තවත් දෙයක් ඇත. එය ක්වාක් ලෙස හඳුන්වයි].

(read Quran 34:3/ 10:61/ 99:7,8/ 4:49/ 34:22)

මදක් සිතා බලන්න, කුඩා පරිමාණයේ නිර්මාණ කීයක් මිනිස් නිෂ්පාදනය සඳහා අපූරුවට ඇසුරුම් කර තිබෙනවාද කියා.

මනුෂ්‍යයාගේනිර්මාණය මෙතරම් විශ්මිත නම් මෙයට වඩා විශ්මිත විශ්වයේ නිර්මාණය ගැන කුමක් පවසන්නද? එයයි දෙවියන්ගේ නිර්මාණශීලීත්වය.

දෙවියන් මනුෂ්‍යය සංහතියේ පලමුවන්නා ලෙස ආදම් (අ.ස) නැමති පලමු මිනිසාව පොලොවෙහි ජලය මිශ්‍ර පසෙන් නිර්මානය කර ඔවුට ජීවය ලබා දී පසුව ඔහු වෙතින්ම ඔහුට බිරිඳක් නිර්මානය කර පසුව ඔවුන් දෙදෙනා ගෙ දරුවන් ලෙසින් වසර ගනනාවක් පුරා ජනගහනය වියාප්ත කර බිලියන 8 ක් පමන වත්මන් ජන සනත්වයක් දක්වා පමුණුවා තිබේ.

**මිනිස් මොළයේ මතක ධාරිතාවය**

සයන්ටිෆික් ඇමරිකන් සඟරාවේ ලිපියක සඳහන් කර ඇති පරිදි වැඩිහිටි මිනිස් මොළයට ගිගාබයිට් මිලියන 2.5 කට සමාන මතකයක් රැස් කර ගත හැකිය.(මේ සමග සසදා බලා වෙනස වටහා ගන්න iPhone 15plus storage capacity 512GB)

**"විශ්වය" නැමැති නිර්මාණය.**

මේ අයුරින්ම, කිසිවක් නොතිබුනු අවස්ථාවක එනම් හිස් බවේ සිට වසර බිලියන 13.8 කට පෙර විශ්වය නිර්මාණය (ආරම්භ) වී අද අප එතුල ජීවත් වන්නෙමු. එම විශ්වය ගණනය කල නොහැකි තරම් අති විශාලය. එහි ඇති දැයද අති විශාලය.

සූර්යයාගේ බර පෘථිවිය මෙන් 333,000 ගුණයක් පමණ වේ. මෙය පෘථිවියේ විෂ්කම්භය මෙන් 109 ගුණයක් පමණ වේ. එය කොතරම් විශාලද යත් පෘථිවි ග්‍රහලෝක 1,300,000ක් පමණ එහි අභ්‍යන්තරයට ගැලපේ.

අපගේ (ක්ෂීරපථ) මන්දාකිණිය කොපමණ විශාල වේද?

අපේම මන්දාකිනියේ (ක්ෂීරපථයේ) අවම වශයෙන් තරු බිලියන 100 ත් 400 ත් අතර ගනනක් ඇත. පෘථිවිය සහ අනෙකුත් ග්‍රහලෝක අපගේ සූර්යයා වටා පරිභ්‍රමණය වන ආකාරය වැනි ග්‍රහලෝක පද්ධතියක කේන්ද්‍රස්ථානය වන විට අපි තරු "සූර්යයන්" ලෙස හඳුන්වමු. අපගේ ක්ෂීරපථයේ ග්‍රහලෝක බිලියන 17 (17,000,000,000) ක් පමන ඇතැයි අනුමාන කරයි.

ක්ෂීරපථය ආසන්න වශයෙන් ආලෝක වර්ෂ 100,000 ක් හෝ සැතපුම් ට්‍රිලියන 600,000 ක් (කිලෝමීටර් ට්‍රිලියන 950,000) පමණ වේ. අපි එහි නිශ්චිත වයස නොදනිමු, නමුත් එය වෙනත් බොහෝ මන්දාකිණි සමඟ මහා පිපිරුමෙන් වසර බිලියනයක් ඇතුළත මුල් විශ්වයේ ඇති වූ බව අපි උපකල්පනය කරමු.

විශ්වයේ ඇති විශාලතම මන්දාකිණිය වන්නේ ආලෝක වර්ෂ මිලියන හතරක් පුරා ඇති IC 1101 ය.

මෑත කාලීන ඇස්තමේන්තු අපට පවසන්නේ නිරීක්ෂණය කළ හැකි විශ්වයේ (5% ක ප්‍රමාණය තුල) මන්දාකිණි ට්‍රිලියන දෙකක් පමණ තිබිය හැකි බවයි. [2,000,000,000,000]. අපගේ ක්ෂීරපථය නම් මන්දාකිණියේ පමනක් තරු දළ වශයෙන් බිලියන 300 ක් පමණ ඇත. සියළුම මන්දාකිනි ක්ෂීරපථයට සමාන යැයි උපකල්පනය කළ හොත්, එයට අනුව නිරීක්ෂණය වන විශ්වයේ පමණක් තරු දළ වශයෙන් බිලියන 300 ට්‍රිලියන 2 න් වැඩි කල යුතු වනවා.

[300,000,000,000 x 2,000,000,000,000 = 6 x 10 23].

කෙසේ හෝ දෙවියන්ගේ නිර්මාණයක් වන විශ්වයේ විශාලත්වය ගැන අපට සිතාගන්නවත් නොහැකිය. එසේනම් එම නිර්මාතෘ කෙතරම් බලසම්පන්න විය හැකිද?

මිනිසාට දෙවියන්ගේ ශ්‍රේෂ්ඨත්වය වටහා ගැනීමට විවිධ මාර්ග පෙන්වා ඇත. විශ්වය ගැන දැනගැනීමද ඉන් එකකි. විශ්වය අති විශිෂ්ඨ ලෙස නිර්මාණය කළ බව අල්ලාහ් අපට මෙසේ පවසයි.

*අහස් හතක් ද, ඒවා මෙන් භූමියද අල්ලාහ්ම උත්පාදනය කළේය. ඒවා අතර (දිනපතා සිදුවිය හැකි සියලු කාරණාවන් ගැන වූ) නියෝගයන් පහළකරමින් සිටින්නේය. (එබැවින් විශ්වාසවන්තයිනි) නියත වශයෙන්ම අල්ලාහ් සියල්ල කෙරෙහි බලසම්පන්නයෙකු යනුවෙන්ද, තම ඥානයෙන් සියල්ල වටකරගෙන සිටින්නේය යනුවෙන්ද ඔබ දැනගනු මැනව. " (අල් කුර්ආනය, 65:12).*

මෙම නියෝගයේ විස්තරවල උත්තරීතර භාවයට මුහුණ දෙන මිනිසා, අල්ලාහ්ගේ ප්‍රඥාව, දැනුම සහ බලය අසීමිත බව හඳුනා ගනී. අල්ලාහ්ගේ දැනුම කෙතරම් පුළුල්ද යත්, අපට "අනන්තය" යනු ඔහු ඉදිරියෙහි දැනටමත් අවසන් වී ඇත. කාලය ආරම්භ වූ දා සිට සදාකාලයට ගැඹුරට යන තෙක් සිදු වූ සෑම සිදුවීමක්ම කලින් තීරණය කර අල්ලාහ් ඉදිරියෙහි අවසන් විය. මිනිසා අල්ලාහ්ගේ දැනුමේ ප්‍රමාණය අගය කිරීමට උත්සාහ කළ යුතු අතර, ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය අවබෝධ කර ගැනීමට උත්සහ කළ යුතුය.

*එහෙත් ප්‍රතික්ෂේප කරන්නන් "විනිශ්වය දිනය අප වෙත කිසිදා නොපැමිණෙන්නේය" යනුවෙන් පවසන්නාහ. නබියේ ඔබ මෙසේ පවසනු. "එසේ නොව, මාගේ දෙවියන් මත සත්තකින්ම! එය නියත වශයෙන්ම ඔබ වෙත පැමිණෙනු ඇත!" ඔහු ගුප්ත දැය සියල්ල දන්නෙකි. ඔහු නොදැනුවත්ව අහස් හි හෝ භූමියෙහි හෝ ඇති දැයෙන් එක් අණුවක ප්‍රමාණයක් තරම් හෝ බේරී යන්නේ නැත. ඊටත් වඩා කුඩා හෝ ලොකු හෝ (සෑම දෙයක්ම) ලව්හුල් මහ්ෆූල් නැමැති පැහැදිලි සටහන් පුස්තකයෙහි සටහන් නොවී නැත. [අල් කුරාන් 34:3].*

# සියල්ල සිදුවන්නේ දෙවියන්ගේ දැනුම සහ අනුමැතිය මතයි.

මෙම මාතෘකාව Qadar & Qada [කදර් & කදා] ලෙස ව්‍යාවහාරයේ භාවිතා කරයි.

Qada (කදා) යනු:- අල්ලාහ් සියල්ල පිළිබඳව දැනුවත්ව සිටින බව සහ, සියල්ල අල්ලාහ්ගේ අනුග්‍රහයෙන් සහ අනුමැතියෙන් යුතුව සිදුවන බවය.

කදා සහ කදර් විශ්වාස කිරීම යන්නෙන් අදහස් කරන්නේ මෙම විශ්වයේ සිදුවන සෑම දෙයක්ම අල්ලාහ්ගේ කැමැත්ත සහ නියෝගය අනුව සිදු වන බවට නිශ්චිත විශ්වාසයකි.

මේ වචන දෙකම එකට එකතු කර ගත් විට මිනිසා සම්බන්ධව නම් ඔහු ගැන දිව්‍ය ආඥාව, ඔහුගේ ඉරණම, ඒ සම්බන්ධව පූර්ව නියමය ආදී ලෙස අදහස් වේ.

මේ පිළිබඳව විශ්වාස කිරීම මුස්ලිම්වරුන්ගේ ඊමානයේ හෙවත් විශ්වාසයේ අනිවාර්ය කුළුනකි. එම විශ්වාසය අන්ධ භක්තිය මත පදනම් වූවක් නොව. එය 'එසේ නොවේ යැයි කීමට බැරි තරමට' එය මනාව පැහැදිලි කරගත හැකි සහ පැහැදිලි කර දිය හැකි වෙනත් සාදක මත හිඳිමින් පූර්ණ ආත්ම විශ්වාසයක් මත තබන විශ්වාසයකි.

"කදර් & කදා" එක් ලිපියකින් වටහා දීම අපහසු කාර්යයකි. එම නිසා මෙයට අදාල වීඩියෝකුත්, අමතර තොරතුරු www.srmicenter.com / https://srmi-center.webnode.page/ / (මාගේ වෙබ් අඩවියෙහි) ඇතුලත් කර ඇත. ඊට අමතරව පහත මාතෘකා යටතේ ඇති ලිපි ද කියවා බලන්න

- **දෙවියන් සිටින බවට සාක්ෂි (48)**
- **දෙවියන්ගේ නිර්මාණ: (විශ්මිත සතුන් 377, විශ්මිත මිනිස් සිරුර 203, විශ්මිත සොබා දහම 337, විශ්මිත විශ්වය 333)**

- **දෙවිඳුන්ගේ වෙනත් නිර්මාණ (මලායිකාවරුන්, ජින් වරුන්, ස්වර්ගය, නිරය) (437)**
- **අල්ලාහ්ගේ දැනුම සහ නිර්මාණශීලීත්වය. (105)**
- **ඉස්ලාමය සත්‍යය බව තහවුරු කරගැනීමට සාදක. (603)**

සර්වබලධාරී දෙවියන්වහන්සේ තමාගේ සියළුම නිර්මාණ කෙරෙහි ඉතාමත්ම දැණුවත් භාවයෙන් සිටී. ඒ බව ඉහත සඳහන් දෙවියන්ගේ දැනුම සහ නිර්මාණශීලීත්වය යන ලිපියෙන් උපුටා ගත් වැකි කිහිපයක් මෙහි නැවත සඳහන් කරමි.

පහත කරුනු දෙස අවධානය යොමු කරන්න.

1). සදාකල් එක්කෙනෙක් පමණක් ලෙසම සිටින සර්වබලධාරී දෙවියන් වහන්සේ ඔහුගේ බල පරාක්‍රමයෙන් ඔහුට භාහිරින් ඇති දැය නිර්මාණය කරන ලදී. ඔහු කෙසේ හෝ ඒවා නිර්මාණය කළේ නැතිනම් ඔහු හැර වෙන කිසිවක් පැවතීමට හේතුවක් වත් අපිට සොයා ගත නොහැකිය. ඔබ කොතරම් අතීතයක සිදුවීමක් ගැන කතා කලත්, එය නිර්මාණය වීමට හේතුවද මෙම සර්වබලධාරී දෙවියන්මය. (මෙය තහවුරු කර ගැනීමට අවශ්‍ය නම් දෙවියන් සිටින බවට සාක්ෂි ලිපිය බලන්න).

2). ඔහු සදාකල් පැවතීමට නම් ඔහු වෙත දූර්වලතා කිසිවක් තිබිය නොහැක. ඔහුගේ නිර්මාණ වලින් ඔහුට හානියක්, අභියෝගයක්, හෝ එම නිර්මාණ කෙරෙහි ඔහුට සැකයක්, අතපසු වීමක්, බල රහිත බවක් තිබිය නොහැක.

3). මේ අනුව බලන කල ඔහුට ඔහුගේ නිර්මාණ කෙරෙහි සම්පූර්ණ අවභෝදයක් තිබිය යුතුය. එය කෙතරම් සියුම් තත්වයක් ද යත්, එම නිර්මාණය ඇති කිරීමට පෙරම ඔහුට එහි මුල, මැද සහ අග පිළිබඳව සම්පූර්ණ ඇස්තමේන්තුවක්, සම්පූර්ණ සැලැස්මක් තිබිය යුතුය. එම නිර්මාණය විශාල විශ්වයක් හෝ වේවා කුඩා කුහුඹුවෙකුගේ ආහාර ජීර්ණ පද්ධතිය හෝ වේවා විය හැකියි. එසේම එම කුහුඹුවා තම ජීවිත කාලය තුල කොතරම් ආහර ප්‍රමාණයක් අනුභව කරනවාද යන්න පවා ඔහුගේ ඇස්තමේන්තුවට ඇතුලත් වී තිබිය යුතුය. එම නිර්මාණය පරමානුවේ කුඩාම කොටස හෝ විය හැකිය. එහි සැලැස්ම හා පැවැත්ම ගැන

පවා ඔහුගේ දැනුමෙහි තිබිය යුතුය. මේ සියල්ල කෙරෙහි ගනනය කිරීමක් පවා ඔහුගේ ඇස්තමේන්තුව තුල තිබිය යුතුය. එසේ නොවුන හොත් ඔහුගේ නිර්මාණ කෙරෙහි කුමණ කෝ දෙයකින් ඔහු අසමත් උනොත් එය ඔහුගේ සර්වබලධාරී කමට නුසුදුසු කමකි. එය ඔහුගේ සදාකල් පැවැත්මට, ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයට හානියකි. මෙය අප වටහා ගත යුතුයි.

4). අප දන්නා විශ්වයට වයස දැනට වසර බිලියන 13.7 කි. එය අංක වලින් පෙන්නුවොත් වසර 13,700,000,000 කි. දෙවියන් මීට වසර 1400 කට පෙර ශුද්ධ වූ අල් කුරානය පහළ කර එතුලින් ඔහු අපට පවසා තිබෙනවා ඔහු විසින් මෙම විශ්වයත් නිර්මාණය කල බව.

ඔහුගේ නිර්මාණයේ එක් ග්‍රහලෝකයක් වන පෘතුවියම අරන් බැලුවත්, එය තුල තිබෙන මනා සැලසුම් සහගත බව, එහි සිටින ජීවීන්ගේ ශරීරවල විශ්මිත සැලසුම් සහගත බව, ඒවාට අවශ්‍යය සියළුම දෑ වල මනා පරිපාළන ස්වභාවය, එකිනෙක අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්දතාවය ආදිය අපේ ඇස් වලින්ම අපට බලා ගත හැක. එනම් මේ සියල්ල දෙවියන් විසින් ඉතාම සැලසුම් සහගත ආකාරයකට නිර්මාණය කර ඇති බවට කිසිඳු සැකයක් නැත. (වැඩි විස්තර සදහා දෙවියන්ගේ නිර්මාණ වෙත යොමුවී බලන්න).

ඉහත කරුණුත් සිහි තබා ගෙන දැන් අපි කදර් & කදා (හෙවත් දෙවියන්ගේ ආඥාව) පාඩම වටහා ගැනීමට අදාල කරුනු කිහිපයක් පෙළ ගස්සා බලමු.

1. දෙවියන් තම නිර්මාණ සියල්ල කෙරෙහි පූර්ණ වශයෙන් දැනුවත්ව සිටී.
2. දෙවියන් මේ සියල්ල පූර්ණ වශයෙන් ලව්හුල් මහ්ෆූල් නම් එලකයක ලියා ඇත. ලියා අවසන් කර ඇත. දැන් සිදුවන සෑම දෙයක්ම එහි ලියා ඇති ආකාරයටම සිදුවෙමින් පවතී.
3. අල්ලාහ් සම්පූර්ණ නපුර හෝ සම්පූර්ණ හොඳ මේ ලෝකය තුලට අනුයුක්ත කර නැත. එය විශ්වාස කල යුතුයි.
4. අල්ලාහ් විසින්ම (ඔහු පමණක්ම) සියළුම වස්තූන්, ඒවායේ ලක්ෂන සහ ඒවායේ ක්‍රියාවන් නිර්මාණය කරන බව විශ්වාස කිරීම.
5. අල්ලාහ් තම නිර්මාණ ඔහුට කැමති ආකාරවලට කරන බව විශ්වාස කිරීම

6. යහපත සහ අයහපත යන මාර්ග දෙකම අල්ලාහ් අපට විවෘත කර දී ඇති අතර යහ මාර්ගයේ යාමට අල්ලාහ්ගේ දයාව කෙරෙහිත් විශ්වාසය තැබීම.

මුස්ලිම්වරු මෙම කරුණු විශ්වාස කළ යුතුය. එය තමයි මෙම (කදර් & කදා) පාඩමෙහි මූලිකම හරය.

මිනිසා සම්බන්දව කතා කිරීමේදී, දෙවිඳුන්ගේ අණින් (ඔහුගේ නිර්මාණයක් වන පෑන මගින් ලවුහුල් මහ්ෆූල් නැමති එලකයෙහි) මිනිසාගේ ජීවන සටහන කොටස් දෙකකට ලියා ඇත.

1. පළමු අවස්ථාවේ මලායිකාවරුන්ට ලබා ගත හැකි ජීව දත්ත
2. දුආ ආදිය මත වෙනස් වන ලෙස දැකීමට ඇති ජීව දත්ත

මේ ආකාරයට මිනිසා ගේ සම්පූර්ණ හැසිරීම් රටාව, ඔහුගේ මරණින් මතු තත්වය ආදී සියල්ල එහි සටහන් කර ඇත.

මිනිසා ගේ හැසිරීම අල්ලාහ් කල්තියා දුටු නිසා සහ අල්ලාහ්ගේ අනුමැතිය මත ඔහු දක්වන හැසිරීම ලියා තිබීම අල්ලාහ්ගේ දැනුම සම්බන්ධ කාරණාවකි. නමුත් මිනිසා හැසිරෙනුයේ අල්ලාහ් ඔහුට ලබා දී ඇති නිදහස මත හිඳිමින්ය. එනිසා මිනිසා කරන හොඳ සහ නරක වලට කුසල් අකුසල් ඔහු එකතු කරගන්නේ අල්ලාහ්ගෙ කැමැත්ත මත හෝ ලව්හුල් මහ්ෆූල් හී ලියා ඇති නිසා නොවන බව නිවරැදිව වටහා ගත යුතුය.

**අල්ලාහ් සම්පූර්ණ නපුර හෝ සම්පූර්ණ හොඳ මේ ලෝකය තුලට අනුයුක්ත කර නැත. එය විශ්වාස කල යුතුයි.**

අපි නපුර ලෙස දකින සමහර කාරණ පිටුපස අල්ලාහ්ගේ දැක්මෙන් නපුරට වඩා හොඳ තිබිය හැක. අපි හිතමු සුනාමියකින් යම් විශාල පලාතක් විනාශ උනා කියලා. අපි දකින්නේ එහි විනාශය තමයි. දැන් හිතල බලන්න අතීතයේ සිදු වූ යම් විනාශ හේතු කොට ගෙන මිනිසා ඉන් පාඩම් ඉගන ගෙන අනාගතයේ යහපත වෙනුවෙන් කටයුතු කිරීමට යොමු වූ අවස්ථා. තාක්ෂනය, වෛද්‍ය විද්‍යාව, වාරි මාර්ග, ගමනාගමනය ආදිය පවා දියුනු වීමට සමහර අවාසනාවන්ත

ලෙස අවසන් වූ අතීත සිදුවීම් හේතු විය. එනිසා අපි දකින නපුර පිටිපස යම් හොදක් ගැබ් වී තිබිය හැක. සම්පූර්ණ නපුර හෝ දුක නිරය තුලත් සම්පූර්ණ හොඳ හෝ සතුට ස්වර්ගය තුලත් දැකීමට හැකි වන ලෙස අල්ලාහ් ඒවා නිර්මාණය කර ඇති බව පවසයි. මෙලොව ජීවත් වන මිනිසාට මෙම විශ්වාසයන් තුළින් හොඳ පදණමක් ලබා දෙයි.

ඔබට කුසල් රැස් කර ගැනීමට මාර්ග මේ ලොව තුල තිබිය යුතුය. සියල්ල පොහොසත් නම්, ඔබ දුප්පතෙකුට උදව් කර කුසල් රැස් කර ගන්නේ කෙසේද? සියල්ල හොඳ වැඩ කරන මිනිසුන් විතරක් මේ ලොව තුල ඉන්නවා නම් පව්කාරයෙකුට උදව් කර ඔබ කුසල් රැස් කර ගන්නේ කෙසේද? දෙපා අහිමි අය ඔබ නොදකින්නේ නම් ඔබට තියෙන ඔබේ දෙපා ගැන සතුටු වන්නේ කෙසේද? අල්ලාහ් මේ සියල්ල සැලසුම් සහගතව හේතූන් ඇතිව නිර්මාණය කර ඇති බව විශ්වාස කළ යුතුය.

**අල්ලාහ් විසින් වස්තූන්, ඒවායේ ලක්ෂන, ඒවායේ ක්‍රියාවන් සහ චලනයන් නිර්මාණය කරන බව විශ්වාස කිරීම.**

*අල්ලාහ්ම සියළු වස්තූන් උත්පාදනය කළේය. ඔහුම සියල්ලෙහි ආරක්ෂකයාය. (39:62)*

*එම අල්ලාහ්ම උත්පාදකයාය. (ඔහුම උත්පාදයන්) සැලසුම් කරන්නේය. ඔහුම (උත්පාදනයන්ගේ) හැඩ රුව නිර්මාණය කරන්නාය; (59:24)*

අල්ලාහ් විසින් අපේ ක්‍රියාවන් [Actions] (කථනය ඇතුලුව ශරීර චලනයන්) නිර්මානය කරණ බව මා මීට පෙර ලියා ඇති මම කවුද? WHO AM I ? ලිපියෙහි විස්තර සහිතව සඳහන් වේ. පහතින් දැක්වෙන්නේ ඉන් උපුටා ගත් සටහනකි.

බාබර් කෙනෙක් දැලි පිහියකින් වෙන කෙනෙකුගෙ රැවුල කපන කටයුත්ත ගැන ටිකක් බලමු.

බාබර්ගේ අත (ඇතුළුව භාහිර ශරීරය) ද බාබර්ගෙම ස්ව-නිර්මාණයක් නොවෙයි.

බාබර්ගේ අත සහ භාහිර ශරීරයම මේ ක්‍රියාවට භාවිතා කරන යාන්ත්‍රනයත්, එයට අදාළ වන ප්‍රෝටීන, විටමින් වැනි ශක්තීන්ද ඔහුගේම නිර්මාණ නොවෙයි.

බාබර්ට තනිවම තමන්ගෙ අතක් සොලවගන්නවත් බැහැ. ශරීරය ඇතුළුව මේතන තියෙන සියල්ල අයිති බාබර් නොවන වෙනත් කෙනෙකුටය. අත සෙලවීම පවා වෙනත් කෙනෙකුගේ යාන්ත්‍රණයක ප්‍රතිඵලයකි. බාබර්ගෙ ආත්මයත්, සිත ආදියත් බාබර්ගේ නිර්මාණ නොවේ. එසේනම් මෙතන බාබර්ට අයිති මොනවාද? ඔහුට ඇත්තටම අයිති තමන්ට ලැබී තිබෙන ආත්මය, ශරීරය සහ සිත නම් ව්‍යුහ තුල සිටිමින් සිත තුලින් අත නිශ්චිත ස්ථානය දක්වා සෙලවීමට අදහස ගැනීම සහ එම අදහස ක්‍රියාවට නැංවීමට අවසන් තීන්දුව ගැනීමේ අවස්ථාව පමණි. එවිට දෙවියන්ගේ සැලැස්මට අනුව සහ ඔහුගේ අනුමැතියට අනුව බාබර්ගේ ශරීරය බාබර්ට උදව් කරයි. එනම් අප අදහස් කර අවසන් තීන්දුව ක්‍රියාත්මක කරවීමට අවශ්‍යය ක්‍රියා [Actions] දෙවියන්ගේ නිර්මාණයක්ය යන්න අප විශ්වාස කල යුතුයි. මේ ගැන හොඳ අවබෝදයක් ඇති තැනැත්තා දෙවියන්ගෙන්ම උදව් අරන් නරක සහ නපුරු වැඩ කිරීමට යොමු වීමට භිය සහ ලැජ්ජා වනු ඇත.

තමා නිදා සිටින විට පවා තමාට නොදැනිවම තමාගේ ශරීරය තුල අල්ලාහ් අභ්‍යන්තර සහ භාහිර ක්‍රියා නිමාණය කරයි. ඔබේ හදවත ඔබ නොදැනීම ක්‍රියාත්මක වේ. එසේම ඔබ නින්දේ සිටින විට ඔබ නොදැනීම ඇඳේ එක් එක් පැති වලට හැරෙමින් සිටින්නේ එම ක්‍රියාවන් අල්ලාහ් නිර්මාණය කරන නිසයි. සමහර පුද්ගලයන්ට තම සිතින් ක්‍රියාවට අනුමැතිය දුන්නත් අල්ලාහ් එම ක්‍රියාව ක්‍රියාවට නොනගයි. කෝමා තත්ව, අංශභාගය ආදිය එහි ප්‍රතිඵලයන්ය.

තම නිර්මාතෘ (හෙවත් දෙවියන්), යමක් කිරීමට යන පුද්ගලයාට ආකාර හතරකින් ප්‍රතිචාර දක්වනවා.

1. දෙවියන් කැමති දෙයක් කිරීමට මිනිසා අදහස් කලා නම් එය වෙන්න ඉඩ දෙනවා. සරල උදාහරණයකින් කියනවා නම්, දුප්පතෙකුට ආහාර වේලක් දෙන්න මිනිසා අදහස් කලා නම්, එම මිනිසාගෙ නිර්මාතෘ එයට කැමතියි. ඔහු එයට උදව් කරනවා. එය වෙන්න ඉඩ දෙනවා. පසුව එම සිතුවිල්ල

ගැනීම, නිර්මාතෘගේන් උදව් ගැනීම හා එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කුසල් ලබා දෙනවා.

2. දෙවියන් කැමති දෙයක් කිරීමට මිනිසා අදහස් කලත් දෙවියන් එය වෙන්න ඉඩ දෙන්නෙත් නෑ. දුප්පතෙකුට ආහාර වේලක් දෙන්න මිනිසා අදහස් කලා නම්, එම මිනිසාගෙ නිර්මාතෘ එයට කැමතියි. ඒත් ඔහු එයට උදව් කරන්නෙ නෑ, එය වෙන්න ඉඩ ඉඩ දෙන්නෙ නෑ. සමහර අයට යහපත් දේවල් කරන්න හිතුනට එවැනි දේ කරගන්න බැරි වන අවස්ථා අපි දකිනවා. පසුව එම සිතුවිල්ල ගැනීම, නිර්මාතෘගෙන් උදව් ගැනීමට උත්සහ කිරීම, හා එය ක්‍රියාත්මක කිරීමට උත්සහ කිරීම මත ඔහුට කුසල් ලබා දෙනවා. එම ආහාර වේල එම දුප්පතා දීමට නොහැකි වීමට හේතුව සමහර විට ඔහුට හිතා ගන්න බැරි වෙයි. එවිට ඔහු එක් එක් අණුමාන මත කල්පනා කරයි. නමුත් දෙවියන් දන්නවා එම දුප්පතා හට එම වෙලාවේ එම ආහාර වේල නොදීමට හේතුව. එය දෙවියන්ගේ විශ්මිත දැණුම. එසේම එය ඔහුට නොදෙන බව ඔහු ඉපදෙන්නටත් පෙරම ලවුහුල් මහ්ෆූල් හි ලියා ද අවසන්. එම ආහාර වේල අල්ලාහ්ගේ (මෙම ලෝකය නිර්මාණය කරන) ඇස්තමේන්තුවට අඩංගු කරද නොමැත. (මෙය නොදීමට බලපෑ හේතුව සමහර විට විනිශ්චය දිනදී දෙවියන් ඔවුන් දෙදෙනාටම පෙන්වීමටද ඉඩ ඇත).

3. දෙවියන් අකැමති දෙයක් කිරීමට මිනිසා අදහස් කලා නම්, එහෙත් එය වෙන්න ඉඩ දෙනවා. උදා:- කිසියම් කෙනෙක් අදහස් කලා නම් තම නිර්මාතෘට (දෙවියන්ට) බනින්නට, දෙවියන් එයට අකැමතියි, නමුත් ඔහු එයට එයට ඉඩ දෙනවා, උදව් කරනවා. පසුව ඔහුට අකුසල් ලබා දෙනවා. (මිනිසා දෙවියන්ට බැන්නට දෙවියන්ට කිසිම හානියක් වෙන්නෙ නෑ, නමුත් එයින් මිනිසා මිනිසාටම හානි කරගන්නවා. ඇත්තටම දෙවියන්ට බනින අය කරන්නෙ දෙවියන්ගෙන්ම භාහිර හා අභයන්තර ශරීර ලබාගෙන දෙවියන්ම තමන්ට දුන් සීමිත නිදහසෙන් ප්‍රයෝජන ගෙන දෙවියන්ගේම උදව් අරන් දිව සොලවමින් දෙවියන්ටම බනින එකයි. දෙවියන්මයි ඔහුට මේ වෙනුවෙන් අකුසල් ලබා දෙන්නෙ. මේවා

නොදන්න අය දෙවියන්ට බනිනවා. අවසන් විනිශ්චය දිනදී ඒ අකුසල් වලට දඬුවම් ලබන්න සිදු වෙනවා).

4. දෙවියන් අකමැති දෙයක් කිරීමට මිනිසා අදහස් කලා නම් එය වෙන්න ඉඩ දෙන්නෙ නෑ. සරල උදාහරනයකින් කියනවා නම්, ඔබ සතෙකු මැරීමේ අදහසින් එම සතාට ගලකින් ගසනවා. දෙවියන් එයට කැමැති නෑ. එනිසා ඔබ උත්සහ ගත්තත් එය සිදු වෙන්න ඉඩ දෙන්නෙ නෑ. තව උදාහරනයක්:- යම් කිසි රටක් අදහස් කරනවා තම බලය භාවිතා කරල ලෝකයම විනාශ කරන්නට. ඔවුන්ට එයට හැකියාව තිබෙන්න පුළුවන්. නමුත් අල්ලාහ් එයට ඉඩ දෙන්නේ නෑ. එම රටේ පාලකයන්ට අල්ලාහ්ගේ ඉදිරි සැලසුම් වලට හානියක් වන ලෙස කටයුතු කරන්නට ඉඩ දෙන්න බෑ. මේ උදාහරණය බලන්න:- අල්ලාහ් පවසා තිබෙනවා ලෝක විනාශයට පෙර ජේසු තුමා (ඊසා අලෙහිස්සලාම්) නැවත ලෝකයට එන බව. එසේ නම් ලෝකයේ සිටින කුමන බලවතෙක් ලෝකය විනාශ කරන්න උත්සහ ගත්තත් අල්ලාහ්ගේ පොරොන්දුව මත ඊසා අලෙහිස්සලාම් එනතෙක් ලෝකය විනාශ වෙන්න නොදී අල්ලාහ් එය ආරක්ශා කළ යුතුයි. අල්ලාහ් කල් තියාම දන්නවා එම රටේ උදවිය ලෝක විනාශ කරන්න සැලසුම් කරන බව. එයත් අල්ලාහ් ලව්හුල් මහ්ෆූල් එලකයෙහි සටහන් කරනවා. එසේම එය අල්ලාහ් විසින් වලක්වන බවත් එහිම සටහන් කරනවා. මේ සටහන ලියැවෙන්නේ අල්ලාහ් මිනිසාව නිර්මාණය කරන්නත් කලින්මය. ඒ සියල්ල දැනගෙනයි නිර්මාණය ආරම්භ කරන්නෙ.

**අල්ලාහ් තම නිර්මාණ ඔහුට කැමති ආකාරවලට කරන බව විශ්වාස කිරීම:-**

එම නිර්මාණ ඍජු ආකාර වලින් හෝ වක්‍ර ආකාර වලින්, එසේත් නැතිනම් වෙනම ආකාරවලින් නිර්මාණය කරයි. තම නිර්මාණ කෙසේ කරන්නේද, කුමණ හැඩයෙන් කරන්නේද, කොපමණ ප්‍රමාණයන්ගෙන් සහ කවදා නිර්මාණය කරන්නේද යන සියල්ල අල්ලාහ් ගේ කැමැත්ත මත සිදුවන්නේය. උදාහරණයකට මිනිසාගේ නිර්මාණය ගෙන බලමු.

1. අල්ලාහ් පළමු මිනිසා වන ආදම් (අ.ස) ගේ ශරීරය පෘතිවියෙහි ඇති පස සෘජුව භාවිතා කර එයට ජලය මිශ්‍ර කර එමගින් සැකසූ මැටි වලින් නිර්මාණය කරන ලදී.
2. ඔහුගේ බිරිද වන හව්වා (අ.ස)ව ආදම්ගේ ශරීරයෙන් ගත් එක් ඉල ඇටයකින් මැවීමක් ලෙස නිර්මාණය කරන ලදී.
3. ජේසු තුමා හෙවත් ඊසා (අ.ස), මරියම් (අ.ස) නැමති කාන්තාව පමණක් භාවිතා කරමින් උත්පාදනය කරන ලදී.
4. ඔබ සහ මම ඇතුළු අපිව මවක් සහ පියෙක් යන දෙදෙනෙකුගේ එක් වීමකින් එහි ප්‍රතිඵලයක් ලෙස උත්පාදනය කරන ලදී.

මේ ආකාරයටම අල්ලාහ් අපේ ක්‍රියාවන්ද වක්‍ර ආකාර වලින් නිර්මාණය කරයි. අල්ලාහ් තමයි සියල්ලෙහි නිර්මාතෘ. අපිට කිසිවක් නිර්මාණය කිරීමට නොහැක.

**තම සිතුවිලිවල තම හොඳ තත්වය පදනම්ව අල්ලාහ්ගේ දයාව මත ඔහුට එහි සෘජු මාර්ගයේ යාමට මඟ පෙන්වීම සහ, තම සිතුවිලිවල නරක තත්වය මත අල්ලාහ් විසින් ඔහුට එම මාර්ගයේම යාමට මඟ පෙන්වීම සිදුවන බව විශ්වාස කිරීම:-**

මිනිසා මේ ලෝකය තුල කොතරම් දුරට අල්ලාහ්ව විශ්වාස කරගෙන කොතරම් දුරට කුසල් ලැබෙන කටයුතු වල නියැලුනත් එම කුසල් ප්‍රමාණය අවසානයේ ස්වර්ගයට ඇතුළු කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බව නබි ﷺ තුමානන් පවසා ඇත. කොටින්ම එතුමාට පවා. නමුත් අල්ලාහ්ගේ දයාව මතම යහපත් විශ්වාසවන්තයින්ව තම තරාතිරම් මත ස්වර්ගයට ඇතුළු කරන බවද පවසා ඇත.

සමහරුන්ව වැරදි මාර්ගයේම යාමට ඉඩ හරින්නේ අල්ලාහ් ඔහු පිළිබඳව සියල්ල දන්නා නිසයි. එනම් එම පුද්ගලයා තම කැමැත්තෙන් කිසි විටකත් සත්‍යය වෙත පියවර තැබීමට කැමතිම වන්නේ නැති තරමට හිත ගල් කර ගත් අයයි.

එම නිසා අල්ලාහ්ගේ දයාව අපේක්ෂා කිරීම සියළුම මුස්ලිම් වරුන්ගේ යුතුකමකි. අල්ලාහ්ව ප්‍රතික්ශේප කරමින් සිටින අය හැකි ඉක්මනින් එයින් මිදී අල්ලාහ්ගේ මාර්ගයේ උත්සහ ගැනීමට කටයුතු කල යුතුයි. මිනිසා කොතරම් පාපකර්ම කර තිබුනත් ඔහු ඔහුගේ ජීවිත කාලය තුල පසු තැවී අල්ලාහ් වෙත

හැරෙන්නේ නම් අල්ලාහ් කැමති ආකාරයට ඔහුට උපරිම සමාව දීමට පවා බලා සිටින බව අල්ලාහ්ම පවසා ඇත.

මෙතරම්ම ශ්‍රේෂ්ඨ අල්ලාහ්ව තව දුරටත් ප්‍රතික්ෂේප කරන්නන්ට නිරය සූදානම් කර ඇති බවද පවසා ඇත. තවද, ඔවුන් එහි සදාකල් සිටිනු ඇත.

**කදර් & කදා කෙරෙහි විශ්වාස කිරීමෙන් ඇතිවන ප්‍රතිලාභ කිහිපයක්.**

1. තව්හීද් හෙවත් අල්ලාහ්ගේ ඒකීය භාවය පිළිබඳව මනා අවබෝදයක් ලැබීම.
2. ඊමානය හෙවත් තම ආගමික නැඹුරුතාවයේ ස්වභාවය වර්ධනය වීම.
3. අල්ලාහ් සුභානවතාලා කෙරෙහි ඇති විශ්වාසය තවත් වර්ධනය වීම.
4. අල්ලාහ් කෙරෙහි භිය භක්තිය සහ ඇත්තටම භිය වර්ධනය වී ඔහුට සමීප වීමට තවත් උත්සහ ගැනීමට පෙළඹීම.
5. අල්ල්හ්හ් කෙරෙහි තම හද තුල ආදරය තව තවත් වර්ධනය වීම.
6. තමා තුල ඉවසීම නම් ගුණාංගය ප්‍රගුණ වීම.
7. කුමණ තත්වයකට මුහුණ දුන්නත් තම දැඩි විශ්වාසය, කැපවීම අදිය නිසා අවසානයේ දී වඩාත්ම හොඳම දෙයක් වනු ඇතැයි සිතීමට යොමු වීම.
8. ඊර්ෂ්‍යාව තම හද තුලින් අඩු වී යාම.

---

# දෙවියන්ගේ අවසන් හෙළිදරව්ව වන ශුද්ධ වූ අල් කුර්ආන් සම්බන්ධව

ශුද්ධ වූ අල් කුරාණය සර්වබලධාරී දෙවියන් වහන්සේ විසින් දේව දූත ජිබ්රීල් (අ.ස) ගේ මාර්ගයෙන් අවසන් නබි මොහම්මද් (ﷺ) තුමා වෙත, (ඔහුගෙන් පසු එන සියළුම මිනිසුන්ගේ මාර්ගෝපදේශය ලෙස) පහළ කළ දිව්‍ය හෙළිදරව්වයි.

*(සියල්ලන්ටම වඩා) ශ්‍රේෂ්ඨයෙකු හා ඥානවන්තයෙකු වන අල්ලාහ් (දෙවිඳුන්) විසින් මෙම ධර්මය පහළ කරනු ලැබ ඇත්තේය. (46:2)*

*මිනිසුනේ! ඔබගේ දෙවියන් වෙතින් (ප්‍රමාණවත්) සාධකයන් නියත වශයෙන්ම ඔබ වෙත පැමිණ ඇත. පැහැදිළි ඉමහත් ආලෝකයම (ශුද්ධ වූ කුර්ආනය) අපි ඔබට පහළ කර ඇත්තෙමු. (4:174)*

*එබැවින් මෙහි ඇති කාරණාවන් (ගනන් නොගෙන) සුළු කොට සළකන්නෙහුද? (56:81)*

'කරආ' යන අරාබි වචනයෙහි තේරුම කියවනවා යන්නයි. නිතර නිතර කියවන (නිතර නිතර පාරායනය කරන) යන අර්ථය කුර් ආන් යන වචනයෙන් පිළිබිඹු වේ. නාම පදයක් නිශ්චිතව හඳුන්වා දීමට ඉංග්‍රීසියෙන් 'The' ද භාවිතා කරනවා සේ අරාබි වචන ඉදිරියෙන් 'අල්' භාවිත කරයි. එනිසා **'අල් කුර්ආන්'** ලෙසද සිංහලෙන් කුර්ආනය/ **කුරානය** ලෙසද මෙම ග්‍රන්ථයෙහි නම භාවිතා කරයි. එය ශුද්ධ වූ කුර්ආනය ලෙස හඳුන්වනු ලබන්නේ එහි කිසිදු වෙනසක් නොමැතිව දෙවියන් වහන්සේගේ වචන පමණක් අඩංගු වන බැවිනි. නබි මොහම්මද් තුමාට දෙවියන් පහල කළ පලමු වචනයත් මෙය හා සමීප අර්ථයක් පෙන්වයි. එනම් 'එක්රා' යන්නයි (Q 96:1). එහි තේරුම 'කියවන්න' යන්නයි.

---

## කුරානය යනු කුමක්ද?

මගේ ජීවිතය තුල මට හමු වුනු අද්විතීයම ග්‍රන්ථය මෙයයි. එය කියවා බලන ලෙස මම සෑම කෙනෙකුටම ආරාධනා කරමි. මෙය ජීවමාන මහා ප්‍රාතිහාර්යයක් ලෙස මා දුටුවෙමි. පොතේ කතෘ පොත ආරම්භ කරන්නේ මෙලෙස පවසමිනි.

*"මෙම පොතෙහි කිසිදු සැකයක් නැත."(ශුද්ධ වූ අල්කුරාන් 2:2).*

කුරානයට අමතරව මෙම වැකිය ඉදිරියට හෝ පසුපසට දා මෙතරම් විෂය පරාසයක් තුල ලියවුණු වෙනත් ග්‍රන්ථයක් සොයා ගැනීමට නොහැකි වනු ඇතැයි මා විශ්වාස කරමි. මෙය සුළු පටු වාක්‍යක්ද?

කවුරුන් හෝ පොත කියවා තමන් දන්නා සහ පෘතුවිය තුල තියෙන උපරිම තාක්‍ෂණය භාවිතා කර, මුළු විද්‍යාඥයෝ සමුහයම එකතුවෙලා හෝ අබමල්

රේණුවක තරම් හරි සැකසහිත තැනක්, වරදක්, නොගැලපීමක්, බොරුවක් සොයාගෙන ඔප්පු කර පෙන්නුවොත් ඇතිවන තත්වය කුමක්ද? ඉහත වාක්‍ය පොතෙන් ඉවත් කරන්න වෙනවා නේද? නමුත් පොත ඉදිරිපත් කර වසර 1400ක් තරම් කල් ගියත් අදත් එම වැකිය සාම්හිර ලෙස එම ස්ථානයේම නොසෙල්වී පවතිනවා යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? මෙයන් පිළිබිඹු වන්නේ මෙම පොතේ කතෘට තම පොත ගැන තියෙන විශ්වාසය නොවේද?

මෙම ශුද්ධ වූ ග්‍රන්ථයට "ශුද්ධ" කියන නාම විශේෂණය භාවිතා කිරීම කෙතරම්ම සුදුසුද යන්නටත් ඉහත මා සඳහන් කල කුරාන් වැකියම ප්‍රමාණවත් නොවේද?

කිරි කළය තුල ගොම බිංදුවක් තිබුනොත් එයට ශුද්ධ යන වචනය භාවිතා කල නොහැක. අප එදිනෙදා භාවිතයට ගැනෙන, කතාබහ කරන අනිකුත් ශුද්ධ වූ යැයි හඳුන්වාදෙන ග්‍රන්ථ දෙස හැරී බලමු. ඒවාට ශුද්ධ යන වචනය කෙතරම් සාධාරනියද කියල හොයල බලන්න. වැරදීම්, නොගැලපීම්, මුසාවන්, විද්‍යාවෙන් බොරු කළහැකි කරුණු, සාහිත්‍යයට අනුවද සිදුවූ අඩුපාඩු ආදී කරුණු වලින් දෙකක් හොයන්න උත්සහ ගන්න එපා. එකක් තිබුනොත් එය"ශුද්ධ වූ ග්‍රන්ථයක් " නෙමෙයි. එය ද තවත් "ග්‍රන්ථයකි". අල් කුරාන් හි කතෘ සහතික වෙනවා එහි කිසිදු සැකයක් නැති බවට.

මෙය බොරු කිරීමට උත්සහ ගතවුන් අතර ඇතැම් මහා විද්‍යාඥයෝද, ඉතිහාසක්ඥයෝද, වෛද්‍යවරුද, අගම්ග විද්වතුන්ද, සාහිත්‍ය ධාරින්ද, පූජක වරුන්ද තම ප්‍රයත්නය තුල අසාර්ථක වුවෝ වූ අතර වෙති. ඉන් බොහෝ උදවිය මෙහි සත්‍යතාවය වටහා ගත්තවුන් බවට පත් වූ බවට සාදක ද ඕනෑ තරම් ඇත. ඔබටද මෙම ග්‍රන්ථයේ ඉහත වැකිය බොරු කිරීමට උවමනා නම් අද පවතින ඕනෑම තාක්ෂණික මෙවලමක්, ඕනෑම පුද්ගලයෙකුගේ සහායක්ද ලොව අවසන් වනතුරු ඔබට ඒ සඳහා කාලයද භාවිතා කල හැකිය. මෙය ශුද්ධ වූ අල් කුරාන් හි කතුවරයා මුළු මහත් මානව සංහතියටම දී ඇති අභියෝගයකි.

මම සඳහන් කලේ කුරාන් හි සඳහන් එක වැකියක් ගැන පමනයි. මේ වැකියම ප්‍රමාණවත් මෙමෙ ග්‍රන්ථය මහා ප්‍රාතිහාර්යයක් බවට ඉඟි කිරීමට. ප්රාතිහාර්යය

බැලීමට කැමති අයට කුරානය සියුම්ව අද්‍යනය කරන ලෙසට එහි කතෘ ම මෙසේ ආරාධනා කරයි.

*"මන්ද ඔවුන් අල් කුරානය අධ්‍යනය නොකරන්නේ, ඔවුන්ගේ සිත් තුලට අගුලු දමා තිබේද ?" (47:24).*

ග්‍රන්ථයේ කතෘ මානව සංහතියටම ඉදිරිපත් කරන තවත් එක අභියෝගයකි දැන් මෙහි සඳහන් කරනුයේ;

කුරානය පහලවී වසර 1400 ක් ගත උනත් එම අභියෝගය අදටත් ඔබ ඉදිරියේ පවතී. එය හෙටත් එසේම වනු ඇතැයි සියලු මුස්ලිම්වරුන්ගේ ඒකායන විශ්වාසයයි. කව්රු හරි මෙම කුරානය බොරුවක් යැයි කියන්න උත්සහ ගන්නවානම් ඕනෑම කෙනෙක් ඉදිරියේ මෙම අභියෝගයද පවතී.

ග්‍රන්ථයේ කතෘ එම අභියෝග කුරානය තුලින් අවස්ථා කිහිපයකදී එය පහසු කර දීත් තිබෙනවා. කැමති කෙනෙකුට එය බාරගත හැකිය.

*"නබිතුමනි අවිස්වාස කරන අයට ඔබ කියන්න, "සියලුම මිනිසුන් සහ සියලුම ජින් වරුන්ද එක්වී හෝ මෙවැනි ග්‍රන්ථයකට සමාන ග්‍රන්ථයක් නිර්මාණය කර පෙන්නවන්න' කියල. (15:88).*

එය ටිකක් ලිහිල් කර මෙසේද පවසනවා.

*"නබිතුමා විසින් මෙය ගොතනු ලැබුවක් යැයි සමහරු කියනවනම් ඔවුන්ට කියන්න, පුලුවන්නම් මෙහි සඳහන් ආකාරයේ පරිච්චේද 10 ක් නිර්මාණය කරන්න' කියල. (11:13).*

එයත් ලිහිල් කර මෙසේද පවසයි.

*"නබිතුමා විසින් මෙය ගොතනු ලැබුවක් යැයි සමහරු කියනවනම් ඔවුන්ට කියන්න, පුලුවන්නම් මෙහි සඳහන් ආකාරයේ පරිච්චේද එකක් නිර්මාණය කරන්න' කියල. (2:23-25).*

මෙහිදී අල්කුරාන් හි කතෘ පවසන්නේ ඔහුව හැර ඕනෑම කෙනෙකුගේ උදව් අරගෙන පුලුවන්නම් නිර්මාණය කරලා පෙන්නවන්න කියලයි. මෙයද ලෙහෙසි පහසු අභියෝගයක්ද?

මම තවත් විශ්මිත අභියෝගයක් පෙන්වා දෙන්නම්. ඒ, මෙම ග්‍රන්ථයේ ආරක්ෂාව පිළිබඳව දී තිබෙන සහතිකයයි. අභියෝගය නම් "මෙම ග්‍රන්ථය හිතුන හිතුන කෙනාට වෙනස් කරන්න බෑ." යන්නයි. ලොව පවතින වෙනත් ඕනෑම ග්‍රන්ථයක් අරන් බලන්න. එය බිහිවූ ආකාරයටම පවත්වාගෙන යන්නට පුළුවන් උනාද කියල. බුදු දහමේ හෝ කිතු දහමේ හෝ වෙනත් ඕනෑම දහමක හෝ විෂයක් අරන් බලන්න. කුරානය බිහිවෙලා අවරුදු 1400 ක් ගත උනත් එහි මුල් ග්‍රන්ථය තුල අන්තර්ගත සියල්ල කිසිම වෙනසකට ලක් නොවී අදත් පවතිනවා යන්න සත්‍යකි. අද වෙනකම්ම කිසි කෙනෙකුට එයට හානියක් කිරීමට පුළුවන්කමක් ලැබී නැහැ. අද ලොව තුල තියෙන කුරාන් පොත්, CD, Memory Chips ආදී සියල්ල එකතු කර එකවරම ගිනි තියල අළු කර දැම්මත් හෙට වෙනකොට අකුරකද තිතකද වෙනසක් නැතුව මුල්ම ග්‍රන්ථයට සමාන ග්‍රන්ථ දහස් ගණන් බිහිවීමේ තත්වයක් තියෙනවනම් එහි ආරක්ෂාව ගැන ඇත්තේ කුමන අවදානමක්ද? අද තත්වය එයයි. එය ඒ ආකාරයටම සිදුවන බව ග්‍රන්ථයේ කතුවරයා සක්සුදක් සේ දන්නා නිසයි වසර 1400 කට පෙර පහළකළ තම ග්‍රන්ථයේ මෙවැනි වාක්‍යයක් ඇතුලත් කර ඇත්තේ.

*"අපි තමයි මෙම ග්‍රන්ථය පහල කලේ. අපිම එය ආරක්ෂා කරන්නෙමු"(15:9).*

මෙතරම් බැරෑරුම් අභියෝගයන් සමග ග්‍රන්ථයක් ඉදිරිපත්කල කතුවරයා කව්ද යන්න දැන් සොයා බලමු. ඒ සඳහා පහත සඳහන් කුරාන් වාක්‍යයම ප්‍රමාණවත්.

*"මෙම ග්‍රන්ථය පහල උනා. මෙහි කිසිදු සැකයක් නැත .මෙය අනාවරණය උනේ විශ්වයේ අධිපති වූ අල්ලාහ් ගෙනි." (32:2).*

මෙම වාක්‍ය දෙසද බලන්න. මෙම ග්‍රන්ථයේ කතෘ තමා බවත්, තමා විශ්වයේ අධිපති බවත් සඳහන් කර ඇත. ඔබ ඕනි තරම් පොත් කියවල ඇති. එකම නවකතාව පස් හය වතාව කියවල ඇති. පාසල් පොත්, සගරා, තව බොහෝ පොත් වර්ග. මේ ඔක්කොම මිනිස්සු විසින් ලියපුවා. විශ්වයේ අධිපති විසින් පහල

කල පොතක් නිකමටවත් කියවල බලන්න හිතෙන්නේ නැද්ද? මිනිසුන් විසින් මුහු කල එක අකුරක් වත් ඒ පොතේ නැති බව දෙවියන්ගේම සහතිකය ඔබ දුටුවා. එනම් මේ මුළු පොතම දෙවියන්ගේම වදන්ය.

අපි දැන් බලමු මේ පොතේ තියෙන තවත් සුවිශේෂත්වයන් කිහිපයක්. ඉන් පසුව බලමු පොතහි අන්තර්ගත දේවල් ගැන බලමු.

පසුගිය වසර 1400 කාලයක් තුල වැඩිම භාෂා ප්‍රමාණයකට පරිවර්තනය කල ග්‍රන්ථය මෙයයි.

- ලොව වැඩිම ජනතාවක් කටපාඩම් කල ග්‍රන්ථය මෙයයි.
- ලොව පුරා දිනකට වැඩිම වතාවක් භාවිතයට ගැනෙන ග්‍රන්ථයද මෙයයි.
- වාක්‍යය, අකුරු, තිත්, ඉස්පිලි පාපිලි පවා ගණනයට ලක්කර වඩාත්ම විශ්ලේෂණයට ලක්වුණු පොතද මෙයයි.
- වසර 1400 ක කාලයක සිට අද දක්වාම භාවිතයට ගැනෙන භාෂාවකින් ඇති එකම සම්පූර්ණ ග්‍රන්ථයද මෙයයි .
- අල් කුරාන් හි අන්තර්ගතය (එහි පණිවිඩය).
- ලිපිය දිදීර්ඝ නොවීමට අදාල කාරණාව පමණක් සඳහන් කර ඇත.
- කුරානය ඉතා නිවැරදි, සැක නැති, නොගැලපීම් නැති, අසම්පූර්ණ නොවන ග්‍රන්ථයක් බව,
- මෙය මුළු මහත් මානව සංහතියටම පහළ කළ ග්‍රන්ථයක් බව,
- මැවුම්කරු/ දෙවියන්/ අල්ලාහ් යනු කෙබඳු කෙනෙක්ද යන්න,
- මිනිසාව ඇතුළුව මුළු මහත් විශ්වයම නිර්මාණය කල බව,
- ඉතිහාසය, වර්තමානය, සහ අනාගතය ගැන,
- මිනිසාව මිහිමත උසස් කල බව,
- ජාත්‍යන්තර සහයෝගිතාවය ගැන, සහජීවනය පිලිබඳව,
- නිතිය ඉටු කිරීමට උපදෙස් හා අල්ලාහ් ගේ නීති රීති පිලිබදව,
- දූත සංකල්පය ගැන,
- මරිය තුමිය, ජේසු (ඊසා අලෙය් ) තුමා සහ පෙර විසූ නබි වරු ගැන,
- අවසන් සාස්තෘ (අනාගතවක්තෘවරයා)ගේ පැමිණීම ගැන,
- ජිවත් වීමට යහපත් උපදෙස්

- දෙවියන්ගේ නිර්මාණ ගැන,
- විශ්වයට එපිටින් ඇති දැය ගැන, විශ්වය ගැන සොබාවධර්මය ගැන, පොළොව ගැන, ජලය ගැන.
- දෙවියන් මනුෂ්‍යාට දුන් වරප්‍රසාද ගැන,
- මෙලොව ජීවිතයේ පරමාර්ථය ගැන,
- පරලොව ජීවිතයේ තත්වය ගැන/ මරණින් මතු ජීවිතය,
- සමාව, දඬුවම්, ත්‍යාග පිළිබඳව,
- ස්වර්ගය සහ නිරයේ තත්වයන් ගැන,
- කෘතගුණ දන්නා කෙනෙකුගේ යුතුකම්,
- විශ්වාසවන්තයන් සහ අවිශ්වසවාන්තයන් ගැන,
- විනිශ්වය දිනයක් එන බව සහ එහි තත්වය මතක්කර දීම,
- දේව දූත (සුරංගනාවන්) සහ ශේතාන්වරු (යක්ෂයන්) ගැන,
- නූතන විද්‍යාවට ඔප්පු කළ හැකිද විද්‍යාඥයන් විස්මිතයට පත්කරන විද්‍යාත්මක කරුණු විශාල සංඛ්‍යාවක් - (කළල විද්‍යාව/ සාගර වී/ ජල විද්‍යාව/ ශාක විද්‍යාව/ තාරකා විද්‍යාව/ සත්ව විද්‍යාව/ මානව ජීව විද්‍යාව),...

ලිපිය අවසන් කිරීමට පෙර තව එක ලස්සන දෙයක් සදහන් කරන්නම්. ඒ තමයි කුරාන් හි භාෂාව.

ඔබට භාෂාව නොතේරෙන්න පුළුවන්. එහෙත් කුරානය මනාව පරායනය කරන විටක ඔබ එයට සවන් දුන්නා නම්, ඔබ මවිතයට පත්වනු ඇත. එතරම්ම එය සිත්ගන්නා සුළුය.

ලිපියේ මුලින්ම මම සදහන් කලා මෙය විශිෂ්ඨතම ප්‍රාතිහාර්‍යය බව. බුදු රජුන් ප්‍රාතිහාර දැක් වූ බව පොත පතේ සදහන්. ජේසු තුමාද, මූසා නබි තුමාද තව බොහෝ අය ප්‍රාතිහාර්‍යය දැක් වූ බවට තොරතුරු අපි දන්නවා. එත් අද ඒවා එකක්වත් අපිට බලා ගන්න බැහැ.. ඒවා ඒ ඒ කාල වලට සීමා උනා. නමුත් කුරානයේ ප්‍රාතිහාර්‍යයන් වසර 1400ක පෙර සිට, ලොව අවසන් වන තෙක්ම දැසින්ම බලාගන්න පුළුවන්. මේ ප්‍රාතිහාර්‍යය තමයි අපේ ජීවිතයේ අත් පොත. ඔබත් ඔබේ නිර්මාතෘ ඔබට එවා ඇති අත් පොත කියවා බලන්න.

# කුරානය ගැන සඳහන් කුරාන් වැකි

දෙවියන්වහන්සේ විසින් මොහම්මද් නබි (ﷺ) තුමාගෙන් පසු පැමිණෙන සියළුම ලෝක වාසී මිනිසුන්ට තම මාර්ගෝපදේශය ලෙස ශුද්ධ වූ අල් කුරාණය (මීට වසර 1400 පෙර) පහළ කරණ ලදී. එහි ඇති උපදේශයන්ට අමතරව එම කුරානය ගැනම යම් තොරතුරු ප්‍රමාණයක්ද එහි සඳහන් කර තිබේ.

සාමාන්‍යායෙන් බයිබලය සම්බන්ධ බයිබල් වැකි ලෙස හෝ ත්‍රිපිටකය සම්බන්ධ ත්‍රිපිටක වැකි ලෙස එවන් තත්වයක් එම ග්‍රන්ථ වල නොමැත. නමුත් කුරානය තුල අපට එය දැකිය හැකි වීම විශේෂත්වයකි

මෙම කුරානය ලොව සිටින ඕනෑම මට්ටමේ කෙනෙකුට ගැලපෙන ආකාරයට එවා තිබීම එහි ඇති සුවිශේෂීම ලක්ෂණයකි.

මිනිසාගේ නිර්මාතෘ වන දෙවියන්වහන්සේ, එය කියවා බලන ලෙස ලෝක වාසී සියළුම මිනිසුන්ට ආරාධනා කර සිටී.

**උපමාතෘකා**

1. සත්‍යය වූ මෙම ධර්මය දෙවියන්වහන්සේ විසින්ම පහළ කළ බව
2. කුරානයෙහි මුල් පිටපත පිහිටා ඇති ස්ථානය ගැන
3. කුරානය පළමුවෙන්ම පහළ කළ අවස්ථාව ගැන
4. මොහම්මද් නබි (ﷺ) තුමාට කුරානය උගැන්වීම සම්බන්ධව
5. කුරානය සම්බන්ධව මිනිසුන්ට උපදෙස් කිහිපයක්
6. ධර්මය හිමි (යුදෙව්, ක්‍රිස්තියානි) අය වෙත කළ මතක් කිරීම්
7. කුරානය සත්‍ය නොවන බව පවසන අයට ඉදිරිපත් කර ඇති අභියෝග
8. දහම සම්පූර්ණ කළ බව සහ එය ආරාක්ෂා කරන බව තහවුරු කිරීම

## 1. සත්‍යය වූ මෙම ධර්මය දෙවියන්වහන්සේ විසින්ම පහළ කළ බව

*ශුද්ධ වූ කුරානය වන මෙය ධර්ම පුස්තකයයි. මෙහි කිසිම සැකයක් නැත. භය භක්තිකයින්ට (මෙය) ඍජු මාර්ගය පෙන්වන්නේය. (2:2)*

*(සියල්ලන්ටම වඩා) ශ්‍රේෂ්ඨයෙකු හා ඥානවන්තයෙකු වන අල්ලාහ් (දෙවිඳුන්) විසින් මෙම ධර්මය පහළ කරනු ලැබ ඇත්තේය. (46:2)*

*මෙම කුරානය අල්ලාහ් විසින් (පහළ කළා) මිස, (වෙන කිසිවෙකු විසින්) බොරුවට මනඃක්කල්පිත කර ගත් දැයක් නොව. ; (10:37)*

*(නබියේ!) නියත වශයෙන්ම අපි මිනිසුන්ගේ යහපත සඳහාම සම්පූර්ණයෙන්ම සත්‍යයයෙන් පිරි මෙම ධර්මය ඔබ වෙත පහළ කළෙමු. ; (39:41)*

*මිනිසුනේ! ඔබගේ දෙවියන් වෙතින් (ප්‍රමාණවත්) සාධකයන් නියත වශයෙන්ම ඔබ වෙත පැමිණ ඇත. පැහැදිලි ඉමහත් ආලෝකයම (ශුද්ධ වූ කුර්ආනය) අපි ඔබට පහළ කර ඇත්තෙමු. (4:174)*

*මෙම කුර්ආනය අල්ලාහ් විසින් (පහළ කළා) මිස, (වෙන කිසිවෙකු විසින්) බොරුවට මනඃක්කල්පිත කර ගත් දැයක් නොව. තවද මෙය, මෙයට පෙර ඇති ධර්මයන් සත්‍යය කර තබා ඒවායේ ඇති දැය විවරණය කර පවසන්නක් වශයෙන්ද ඇත්තේය. එබැවින් මෙය (ලෝකවාසී) සියල්ලන්වම උත්පාදනය කර පෝෂණය කරන්නාගෙන් පැමිණියේ යන්නෙහි කිසිම සැකයක් නැත. (10:37)*

*පසුව එය විවරණය කර පැවසීමද අප කෙරෙහි ඇති අනිවාර්‍යය යුතුකමක් වන්නේය. (75:19)*

**2. කුරානයෙහි මුල් පිටපත පිහිටා ඇති ස්ථානය ගැන**

*නියත වශයෙන්ම මෙය ඉතාමත් ගෞරවයෙන් පිරි කුර්ආනය වන්නේය. මෙය (ලව්හුල් මහ්ෆූල් නැමති) ආරක්ෂා කරන ලද ඵලකයෙහි (ලියනු ලැබ ඇත්තේය). පාරිශුද්ධවන්තයින් (මලායිකාවරුන්) මිස, (වෙන කිසිවෙකුත්) මෙය ස්පර්ශ කරන්නේ නැත. සියළු ලෝකයන්හී අධිපති දෙවියන් විසින් මෙය පහළ කරන ලදී. (56:77,78,79,80)*

**3. කුරානය පළමුවෙන්ම පහළ කළ අවස්ථාව ගැන**

*නියත වශයෙන්ම අපි මෙය (ඉතාමත් ගෞරවයෙන් පිරි) එක් රාත්‍රියකදී (පළමුවෙන්ම) පහළ කර තැබුවෙමු. (97:1)*

*පැහැදිලි මෙම ධර්මය මත සත්තකින්ම! නියත වශයෙන්ම අපි මෙම අල් කුර් ආනය ඉතාමත් භාග්‍යයෙන් පිරි එක් රාත්‍රියකදී (පළමු වරට) පහළ කර, නියත වශයෙන්ම අපි (මෙමගින්) බිය ගන්වා අනතුරු අගවන්නෙමු. බුද්ධියෙන් පිරි සියළු (හේතූන්ද), කාරණාවන්ද එහිම අපගේ නියෝගයන්ට අනුව විද්‍යාත්මක අන්දමට) නිර්මාණය කරණු ලැබ ඇත්තේය. (නබියේ!) නියත වශයෙන්ම අපි (ඔබව ඔවුන් වෙත අපගේ දූතයා වශයෙන්) යවන්නෙමු. (44:3-5)*

**4. මොහම්මද් නබි තුමාට කුරානය උගැන්වීම සම්බන්ධව**

*වේගයෙන් දිව ගොස් සැඟවී යා හැකි මාර්ගයේම නැවත නැවතත් ගමන් කරන ග්‍රහයන් මත සත්තකින්ම! ගමන් කරන රාත්‍රිය මත සත්තකින්ම! උදාවන අළුයම මත සත්තකින්ම, නියත වශයෙන්ම (ශුද්ධ වූ කුරානය නැමති) මෙය ඉතාමත් ගෞරවණීය (ජිබ්රීල් නැමති) දේව දූතයෙකු මගින් පවසනු ලැබූවක් වන්නේය. (81:15,16,17,18,19)*

*සියල්ල උත්පාදනය කළ ඔබගේ දෙවියන්ගේ ශුද්ධ වූ නාමයෙන් ඔබ සමුදීරණය කරනු මැනව. ( 96 :1) [මොහම්මද් නබි ﷺ තුමා වෙත පළමුවෙන්ම පහල වූ කුර්ආන් වැකිය මෙයයි.]*

*ජිබ්රීල් මගින් අපි (ඔබට) සමුදීරණය කර පෙන්නුවහොත්, (ඔහු සමුදීරණය කර අවසන් වූ පසු) ඒ ආකාරයටම ඔබ එය අනුගමනය කර සමුදීරණය කරනු. (75:18)*

*(නබියේ! ජිබ්රීල් වහී මගින් ඔබට සමුදීරණය කර පෙන්වනු ලබන ආයාවන් වැරදී යාවිදෝ යයි බිය වී ඔහු සමුදීරණය කර අවසන් වීමට පෙර) ඔබ ඉක්මන් වී එය සමුදීරණය කිරීමට ඔබගේ දිව නොසොළවනු. මන්දයත් එය එක්කාසු කර, (ඔබ) සමුදීරණය කරන ලෙසට සැලැස්වීම නියත වශයෙන්ම අප කෙරෙහි ඇති අනිවාර්‍යය යුතුකමක් වන්නේය. (75:16,17)*

*(නබියේ!) නියත වශයෙන්ම අපි මිනිසුන්ගේ යහපත සඳහාම සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් පිරි මෙම ධර්මය ඔබ වෙත පහළ කළෙමු. එබැවින් කවුරුන් (මෙය) අනුගමනය කර කටයුතු කරන්නේද, ඔහුටම එය හොඳකි. කවුරුන් එයින්*

*මාර්ගය වැරද යන්නේද, එය ඔහුටම නපුරක් වශයෙන් අවසන් වනු ඇත. (නබියේ!) ඔබ ඔවුන්ව (ඍජු මාර්ගයෙහි යන ලෙස මෙන් බල කර), බේරා ගන්නෙකු නොව. (39:41)*

*(නබියේ! ඔබ ගැන) ඔවුන් පවසන දැය අපි හොඳින් දනිමු. ඔබ ඔවුන්ව බල කළ හැකි කෙනෙකු නොව, (අපගේ) දඬුවමට බිය වන්නන්ට මෙම කුර් ආනය මගින් ඔබ හොඳ ඔවදන් දෙනු. (50:45)*

*තවද, සත්‍යය පැමිණ ඇත, අසත්‍යය සැඟවී ගියේය. නියත වශයෙන්ම අසත්‍යය අනිවාර්‍යයෙන්ම විනාශ වී යනු ඇතැයි ද (නබියේ ඔබ) පවසනු. (17:81)*

*(නබියේ!) සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් පිරි මෙම ධර්මය ඔබ කෙරෙහි ඔහුම පහළ කරනු ලැබුවේය. (මෙය) මෙයට පෙර තිබූ ධර්මයන් සියල්ල ස්ථිර කරන්නේය. තව්රාතයද, ඉන්ජීලයද ඔහුම පහළ කළේය. (3:3) [එනම්, දෙවියන් යුදෙව්වන්ට පහළ කළ ධර්මය (පොත් 5), සහ ක්‍රිස්තියානි ජනතාවට පහළ කල ධර්මය (බයිබලය). නමුත් ඒවා දැන් මුල් පිටපත් ලෙස පහළ වූ ආකාරයටම නොමැත]*

**5. කුරානය සම්බන්ධව මිනිසුන්ට උපදෙස් කිහිපයක්**

*මොවුන් හොඳ වැටහීමක් ලබා ගනු පිනිස, මෙම කුරානයෙහි නියත අවශයෙන්ම අපි විවිධාකාර අන්දමින් (හොඳ ඔවදන්) පවසා ඇත්තෙමු: (17:41)*

*මිනිසුන්ට හොඳ වැටහීමක් ලබා ගැනීම පිනිසම මෙම කුරානය නියත වශයෙන්ම අපි ඉතාමත් පහසු කර ඇත්තෙමු. එබැවින් (මෙමඟින්) හොඳ වැටහීමක් ලබන්නන් කවුරුන් හෝ ඇත් ද? (54:17)*

*මිනිසුන්ව තෘප්තියට පත් කිරීමට අවශ්‍යය උදාහරණයන් සියල්ල මෙම කුර්ආනයෙහි නියත වශයෙන්ම අපි පවසා ඇත්තෙමු. (30:58)*

*ඔබ දුක් විඳීම සඳහා මෙම කුරානය අපි පහල කළේ නැත. (නබියේ! දෙවියන්ට) භය භක්තිය ඇති අයට හොඳ ඔවදනක් වශයෙන්ම (මෙය පහළ කර ඇත්තේය).*

*උසස් අහස්ද, භූමියද නිර්මාණය කළ අය විසින්ම (මෙය) පහළ කර ඇත්තේය. (20:2-4)*

*"මන්ද ඔවුන් අල් කුරානය අධ්‍යනය නොකරන්නේ, ඔවුන්ගේ සිත් තුලට අගුලු දමා තිබේද?" (47:24).*

*අල්ලාහ් පහළ කල (මෙම ධර්මය) අනුගමනය කරනු" යැයි ඔවුන්ට කියනු ලැබුවහොත් එයට ඔවුන් 'නොඑසේය! අපගේ මුතුන් මිත්තන් කුමක් කෙරෙහි සිටියෝ දැයි අපි දුටුවෙමුද, එයම අනුගමනය කරන්නෙමු" යැයි (මෙය ප්‍රතික්ෂේප කරන්නන්) පවසන්නාහ; (31:21)*

*(මෙය) 'ඔබ හොඳින් (අපට) කියවා පෙන්වා දැනුම් දුන්නෙහිය' යයි ඔවුන් පැවසීම සඳහාද, දැනගත හැකි ජනතාවට අපි මෙය පැහදිළි කර දීමටද, (අපගේ) ආයාවන් මෙසේ බොහෝ වාර ගණනින් (විටින් විට) විස්තර කරන්නෙමු. (6:105)*

*(මිනිසුනේ!) මෙම කුරානය ඔවුන් ගැඹුරින් අවධානය කළ යුතු නොවේද? මෙය අල්ලාහ් නොවන කෙනෙකුගෙන් පැමිණ තිබුනේ නම්, මෙහි අනන්තවත් වැරදිද, භේදයන්ද ඔවුන් දකිනු ඇත. (4:82) [මෙය ලොව සිටින 'ප්‍රතික්ෂේප කරන ඉහලම විද්වතුන්ට' යොමු කරන අභියෝගයකි]*

*එබැවින් මෙහි ඇති කාරණාවන් (ගනන් නොගෙන) සුළු කොට සළකන්නෙහුද? (56:81)*

*(මිනිසුනේ!) ශුද්ධ වූ කුර්ආනය සමුදීරණය කරනු ලැබුවහොත් කට පියාගෙන, එය හොඳින් සවන් දෙනු. (එමගින්) ඔබ (දෙවියන්ගේ) දයාව අත් කර ගත හැකිය. (7:204)*

### 6. ධර්මය හිමි (යුදෙව්, ක්‍රිස්තියන්) අය වෙත කළ මතක් කිරීම්

*මීට පෙරද මිනිසුන්ට සෘජු මාර්ගෝපදේශයන් වශයෙන් තිබුනු (පව්, පින්) වෙන්කර දැණුම් දිය හැකි (අනිත්) දැයද පහළ කර ඇත්තේය. (3:4)*

*ධර්මය හිමි අයවළුනි! ඔබ වෙත ඇත්තෙන්ම අපගේ එක් දූතයෙකු පැමිණ ඇත්තේය. ධර්මයෙහි ඔබ සඟවා ගත් බොහෝමයක් කාරණා ඔහු ඔබට පැහැදිලිව ගෙන හැර දක්වන්නේය. තවත් (ධර්මයන් ගැන ඔබ ගෙන ඇති වැරදි අදහස්) බොහෝමයක් පහ කර හරින්නේය. නියත වශයෙන්ම අල්ලාහ් ගේ සන්නිධානයෙන් ඉමහත් වූ ආලෝකයද පැහැදිලිතාවයද ඇති එක් ධර්මයක් දැන් ඔබ වෙත පැමිණ ඇත්තේය. (5:15)*

**7. කුරානය සත්‍ය නොවන බව පවසන අයට ඉදිරිපත් කර ඇති අභියෝග**

*"නබිතුමනි! අවිස්වාස කරන අයට ඔබ කියන්න, සියලුම මිනිසුන් සහ සියලුම ජින් වරුන්ද එක්වී හෝ මෙවැනි ග්‍රන්ථයකට සමාන ග්‍රන්ථයක් නිර්මාණය කර පෙන්නවන්න" කියල. (15:88).*

*"නබිතුමා විසින් මෙය ගොතනු ලැබුවක් යැයි සමහරු කියනවනම් ඔවුන්ට කියන්න, පුලුවන්නම් මෙහි සදහන් ආකාරයේ පරිච්චේද 10 ක් නිර්මාණය කරන්න" කියල. (11:13).*

*"නබිවරයා විසින් මෙය ගොතනු ලැබුවක් යැයි සමහරු කියනවනම් ඔවුන්ට කියන්න, පුලුවන්නම් මෙහි සදහන් ආකාරයේ පරිච්චේද එකක් නිර්මාණය කරන්න" කියල. (2:23-25).*

**8. දහම සම්පූර්ණ කළ බව සහ එය ආරාක්ෂා කරන බව තහවුරු කිරීම**

*නියත වශයෙන්ම අපිම මෙම ධර්මය (ඔබ කෙරෙහි) පහළ කළෙමු. එබැවින් (එහි කිසිම වෙනස්වීමක් හෝ විනාශයක් හෝ ඇති නොවන සේ) අපිම එය ආරක්ෂා කර ගන්නෙමු. (15:9)*

*(නබියේ!) ඔබ දෙවියන්ගේ පොරොන්දුව සත්‍යයයෙන්ද, සාධාරනත්වයෙන්ද පූර්ණ විය. ඔහුගේ පොරොන්දු වෙනස් කරන්නන් කිසිවෙකුත් නැත (6:115) [මෙයින් පවසන්නේ කුරානය සහ අල්ලාහ්ගේ දහම සම්පූර්ණ කල බව]*

*කවුරුන් (අල්ලාහ්ව) විශ්වාස කර දැහැමි ක්‍රියාවන්ද කර, මොහම්මද් (නබි) නමින් පහළ කරනු ලැබූ එය තමන්ගේ දෙවියන්ගේ සන්නිධානයේ සිට පැමිණි*

*සත්‍යය (ධර්මය) යයි විශ්වාස කරමින්සිටියෝද. (ඔවුන් නොදැනුවත්ව කළ) නපුරු ක්‍රියාවන් ඔවුන්ගෙන් පහ කර, (ඔවුන්ගේ තත්වයද දෙවියන් හොඳ අතට හරවා) පිළිසකර කළේය (47:2)*

*ඔවුන්ව සෘජු මාර්ගයෙහි ඇතුළු කර ඔවුන්ගේ තත්වයද පිළිසකර කර හරිනු ඇත. තවද ඔවුන්ට දැනුම් දෙනු ලැබූ ස්වර්ගයන්හීද ඔවුන්ව ඇතුළු කරන්නේය. (47:5,6)*

*කවුරුන් (මෙම ධර්මය) ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ට විනාශයයි. ඔවුන්ගේ කකුල් අස්ථාවර කර) ඔවුන්ගේ ක්‍රියාවන් සියල්ල ප්‍රයෝජනවත් නොවන දැය බවට පත් කරනු ඇත (47:9)*

---

## කුරානයේ විද්‍යාත්මක හෙළිදරව්වන්.

අද වන විට විද්‍යා තාක්ෂණය මිනිසුන්ව පුදුම කරන තැනට දියුණු වී ඇත. එබැවින් මෙය ඉතා රසවත් මාතෘකාවක් බවට පත්ව ඇත. විද්‍යාව එතරම් දියුණු නොවූ පුරාණ ඉතිහාසයේ පැවති කාලයට වඩා අද මෙම මාතෘකාව වඩාත් කාලෝචිත ය.

මුලින්ම විද්‍යාවේ ආරම්භය සහ කුරානයේ ඉතිහාසය දෙස අවධානය යොමු කරමු.

විද්‍යාව සොබාදහමේ සෑම දෙයක් තුලම එය පටන් ගත්ත දවසේ සිටම තිබුන දෙයක් බවට කිසිම සැකයක් නැත. නමුත් යම් දෙයක් විද්‍යාත්මක ලෙස මිනිසාට වැටහෙන්නේ මිනිසා විසින් එය විද්‍යාත්මකව තහවුරු කරගන්න උත්සහ ගන්න විට හෝ තහවුරු කරගත්තට පසුවය. එතෙක් එය විද්‍යාත්මක දෙයක් ලෙස සාමාන්‍ය ව්‍යවහාරයෙදී කිසිවෙකුත් නොකියයි.

**මේ පුංචි උදාහරණය බලන්න.**

වසර 1400 කට පෙර පහළ වූ ශුද්ධ වූ කුරානයෙහි මෙවැනි වාක්‍යක් අන්තර්ගතය.

*'ඔබගේ හිමි මී මැස්සන්ට වැටහීම දෙන්නේය. කඳු, ගස් හා උස වූ ගොඩනැගිලිවල නුඹලා මී වද බඳිනු, තවද නුඹලා සෑම පලතුරු (වර්ගවල ඇති මල්) වලින් රොන් උරා බී ඔබ හිමිගේ පහසු මාර්ගයෙහි (නුඹලා ගේ නිවෙස් තුලට) ඇතුළු වනු. මෙයින් උගේ උදරයන්හි වර්ණ කිහිපයකින් යුත් පැණියක් (මී පැණි) වෑහෙන්නේය. එයින් මිනිසුන්ට සුවය ඇත. ඇත්තෙන්ම මෙහිද සිතා වටහා ගන්නා ජනතාවට සාක්ෂියක් ඇත'.(අල් කුර්ආන් 16:68/69).*

මෙතන සඳහන් වන්නේ මී මැස්සන් රොන් ගෙන විත් මී පැණි සෑදීම ගැනය. බැලූ බැල්මට එහි විද්‍යාත්මක දෙයක් නැත. .

මෙය කුරානය තුලින් ඉදිරිපත් කරන්න හෙතුව කුමක්ද?

'වටහා ගන්න ජනතාවට සාක්ෂියක් ඇත'. ඒ කුමක්ද?

අපි දන්නවා භාෂාවක ව්‍යාකරණ රීති තියෙනවා කියලා. ඒ අනුව අපි කියන්නේ අම්මා බත් කෑවාය කියලයි, අම්මා බත් කෑවේය කියලා නෙවෙයි.

කුරාන්හි ඇති වාක්‍යය ගෙන බැලුවම,

- අරාබි භාශා සාහිත්‍ය නීතීන්ට අනුව, මෙය ස්ත්‍රී ලිංග වාක්‍යායකි. එම වැකි වලින් කියැවෙන්නේ, රොන් සොයා ගොස් ඇත්තේ මී මැස්සා නොව මී-මැස්සියි.
- මී මැස්සි තුඩින් රොන් අරන් එනවා නොව, දෙවියන්ගේ අණ, රොන් බිමටය.
- මී පැණි හදනවා නොව, එය මී මැස්සියන්ගේ උදරය තුලින් හැදෙන බවත් මෙහි සඳහන්. එනම් දෙවියන්ගේ අණ මී පැනි හදන්න නොව, රොන් බීමටය.
- මී පැණි වල විශාල ඖෂධිය ගුණයක් ඇත.

දැන් මෙහි විද්‍යාත්මක කරුණු හතරක් ඇත.

මුලින් විද්‍යාත්මකව නොදුටු එම වාක්‍යන්ම පසුව විද්‍යාත්මකයි කියල දැනුනේ කොහොමද? මී මැස්සා කව්ද මී මැස්සි කව්ද කියලත්, රොන් ගේනවද බොනවද කියලත්, මී පැණි හදනවද උදරයෙන් වැහෙනවද යන්නත් නූතන විද්‍යාත්මක මෙවලම් භාවිතා නොකර මිනිසාට දැනගන්න විදිහක් නැහැ.

1973 දී මේ කාරණාව හොයාගත්ත විද්‍යාඥයන් දෙපලකට නොබෙල් ත්‍යාගය හම්බ වූ බවත් දැනගන්නට තිබේ.

නමුත් අවුරුදු 1400 කට කලින් මේ කතාව කුරානය තුලට ඇතුලත් වී තිබේ.

නොබෙල් ත්‍යාගය හිමිකරගත්ත විද්‍යාඥයන් විසින් සාක්ෂි සහිතව ඔප්පු කරලා පෙන්නුවානම් මී පැණි ගෙන්න යන්නේ මී මැස්සි නොව මී මැස්ස ය කියල (සත්‍ය එය නොවෙයි), එහෙනම් කුරානයෙ ව්‍යාකරණ දෝෂයක්ද අහු වෙනවා නේද? එහෙනම් කුරානය 'ශුද්ධ වූ කුරානයක්' වෙන්නේ නැහැ. කුරානයෙත් අඩුපාඩු තියෙන බව එයින්ම ඔප්පු වෙනවා.

නමුත් කුරානය පටන්ගෙනම තියෙන්නේ "මෙහි කිසිඳු සැකයක් නෑ" කියලයි. (2;2)

නමුත් සත්‍ය නම් මෙවැනි ඉතාම නොගැනිය හැකි සියුම් තැනකදී පවා කුරානය නිවැරදි බවට දෙවියන් සහතික වී තිබෙනවා.

'ඔවුන් මෙම කුරානය ගැඹුරින් අවධානය කල යුතු නොවේද? මෙය දෙවියන්ගෙන් හැර වෙනත් කෙනෙකුගෙන් පහල වූ පුස්තකයක් නම් මෙහි අනන්තවත් -වැරදි හා භේදයන් ද ඔවුන් විසින් දකින්නට තිබුණි' (4:82).

මම සදහන් කලේ මී මැස්සාගේ ලිංගය නිර්ණය වැනි විද්‍යාත්මක වූ ඉතා සියුම් කාරණයකි.

**දැන් බලමු විශ්වය තරම් විශාල විද්‍යාත්මක වූ ලොකු කාරණයක් ගැන.**

*"බලසම්පන්න බවින් විශ්වය නිර්මාණය කලෝ අප වන අතර තවද අපම එය නිරන්තරයෙන්ම පුළුල් කරන්නෙමු".(51:47)*

දැන් අපි මනුෂ්‍යයා දන්නා විද්‍යාව දෙසට හැරෙමු.

20 වන සියවසේ ආරම්භයේදී රුසියානු විද්‍යාඥ අලක්සන්ඩර් ෆරධිමන් හා බෙල්ජියානු විශ්ව වෙදී ලිමයත්රෝ යන දෙදෙනා 'මුළු විශ්වයම අඛණ්ඩවම ගමන් කරන බවද විශ්වය ක්‍රමයෙන් ප්‍රසාරණය වන බවද' සිද්ධාන්ත වශයෙන් ගණනය කර අදහසක් ඉදිරිපත් කලා.

1929 දී එඩ්වින් හර්බල් නම් තාරකා විද්‍යාඥයා තම දුරදක්නයෙන් අහස සිසාරද්දී තාරකා හා මන්දාකිනි එකිනෙකාගෙන් ඈත් වනබව පළමුවරට දුටුවා. විශ්වය ප්‍රසාරණය වනබව සනාථ උනා. (ඒ අවරුදු 70 කට පෙර). නමුත් අවරුදු 1400 කට පෙර මෙය කුරාන් හි සදහන් වෙලා තියෙනවනම් ඒ ගැන ඔබට මොනවද හිතෙන්නේ.

විද්‍යාවත් කුරානයත් අවේ එකම තැනකින් යන්න මේ පුංචි කාරණා දෙකෙන්ම ඔප්පු වෙනවා නොවේද?

මෙවැනි කරුණු 1000 ක් විතර කුරානය තුල ඇතයි විද්වතුන් පවසයි.

ඉහත සදහන් කරුණු සරළව පෙනුනට නුතණ විද්‍යාඥයන් එම කරුණු පිළිබඳව විශ්මයෙනුත් විශ්මයට පත්වී ඇත. වසර 1400 කට පෙර සදහන් මෙවැනි කරුණු, නුතන විද්‍යාවෙන් තහවුරු කරගත්තේ (සියල්ලටම පොදුවේ ගත් කල) අදින් වසර 200ක් ඇතුලත්ය.

ඔබට සාමාන්‍ය අදහසක් ලබා දීම සඳහා, විද්‍යාවේ විවිධ ක්ෂේත්‍රවලට අදාළ කුරාන් හි අන්තර්ගත වාක්‍ය කිහිපයක් මම පෙන්වා දෙන්නම්.

**තාරකා විද්‍යාව /ආකාශ විද්‍යාව/අභ්‍යාවකාශ විද්‍යාව :-** *හිස් බවේ සිට අපි විශ්වය මැවූ අතර අපිම එය නිරන්තරයෙන් පුළුල් කරන්නෙමු [51:47]. අහස්හි ග්‍රහලෝකයන් නිර්මාණය කර එහි සූර්යයා ආලෝකයක් වශයෙන්ද, චන්ද්‍රයා දීප්තිය ගෙන දෙන්නක් වශයෙන්ද නිර්මාණය කළ ඔහු භාග්‍යවන්තය [25:61]. ඔහු රාත්‍රියද දාවලද ඇති කළේය. සූර්යයාද චන්ද්‍රයාද නිර්මාණය කළේය. මේවා අහසෙහි තමන්ගේ කක්ෂවල ගමන් කරන්නේය [21:33]. ඔහු අහස මැවූ අතර එය ආරක්ෂාකාරී වහලක් බවට පත්කර ඇත [21:32].*

**රසායන විද්‍යාව :-** *ඔබේ දෙවියන්ට පරමාණුවේ ඉතා කුඩා අංශුව ගැනද දැනුම ඇත [10:61].*

**ජල විද්‍යා ක්ෂේත්‍රය :-** *ඔහු අහසින් ජලය පහල කරන අතර එය පොළොවේ පැලුණු තැන් අතරින් යවා වගා බිම් සරුසාරව වැඩෙන්නට හරින්නේය [39:21]. ජලය ඉහලට ගමන් කර වලාකුළු හටගෙන ඒවා එක්රැස් වන කළ කැබලි බවට පත්වී ජලය පොළොවට පතිත වේ [38:48].*

**කළල විද්‍යාව :-** *මිනිසා තමාව කුමකින් මවා ඇත්තේ දැයි නොදනිත්ද? ඔහුව මවනු ලැබුවේ බින්දුවකිනි. කොඳු ඇට පෙළ හා ඉල ඇට පෙළ අතාරින් නිකුත්වන.[86:5.6.7]. අපි මිනිසාව නුත්නාවකින් මැව්වෙමු {නුත්නාවක් යනු ඉතා කුඩා ද්‍රව බින්දුවක්} [23:13]. අපි මිනිසාව ඉතාම කුඩා පරිමාණයේ මිශ්‍ර තරලයකින් මැව්වෙමු[76:2]. අපි මිනිසාව සුලාලාවකින් මැව්වෙමු {සුලාලාවක් යනු එහි හොඳම කොටස/ශුක්‍රානු තරලයෙහි හොඳම කොටස} [32:8]. ඔහු මිනිසා අළක් නමැති කුඩල්ලෙක් වැනි රුධිර කැටියකින් මැව්වේය [96:1.2].*

**සාගර විද්‍යාව :-** *ඔහු ගලායන ජල කඳන් දෙකක් එක ළඟ තැබූ අතර ඒවා හමුවුවත් මිශ්‍රවන්නේ නැත. ඒවා අතර තරණය කළ නොහැකි වනසේ නොපෙනෙන භාදකයක් ඇත.[55:19.20].*

**ජීව විද්‍යාව :-** *අපි සෑම සජීවී දෙයක්ම ජලයෙන් නිර්මාණය කළෙමු [21:30].*

**උද්භිද විද්‍යාව :-** *ඔහු අහසින් ජලය පහල කර එයින් විවිධ වර්ගයේ පැල (ස්ත්‍රී පුරුෂ) යුගල් වශයෙන් නිර්මාණය කරන්නේය [20:53].*

**සත්ව විද්‍යාව/ කායික විද්‍යා ක්ෂේත්‍රය :-** *එළු ගව බැටළු හා ඔටුවන් ආදී සතුන්ගෙන්ද ඔබට පාඩමක් ඇත. ලේ වලටද මලවලටද මුත්‍රා වලටද අතරින් ඒවායෙන් උදරයෙන් කලවම් නොවුණු කිරි උත්පාදනය කර ඔබට පොවන්නෙමු, එය පානය කිරීමට ඉතා රසවත්ය [16:66]. තවද ඔබ එම සතුන්ගෙන් සමහරක් අනුභව කරන්නේය [23:21].*

**භූගෝල විද්‍යාව :-** *අපි පොලොව විහිදුනු දෙයක් ලෙස මවා කඳු එහි ඇබ ලෙස මැව්වෙමු [78:6.7]. අපි පොලොව මත කඳු ඉතා ස්ථාවර දෙයක් ලෙස තබා ඇත්තෙමු. ඒ එය නොසෙල්වී තිබීම පිණිසය [21:31/ 16:15].*

**ජාන තාක්ෂණ විද්‍යාව :-** *පුරුෂයාගෙන් නිකුත්වන ද්‍රව්‍යය එහි කලලයේ ලිංගය {ගැහැනුද පිරිමිද බව} නිර්ණය කරයි [45:46]. අපි මිනිසාව ඉතා කුඩා පරිමාණ මිශ්‍ර තරලයකින් මවා ඉන් පසුව එය අලකාවලින් මුඩ්ගාවට පත්කර එයට ගැහැණු හෝ පිරිමි යන ලිංගය නිර්ණය කළෙමු {එනම්, ලිංග භේධයට බලපාන්නේ පුරුෂයාගේ ශුක්‍රානු මිස ස්ත්‍රියගේ ඩිම්බ නොවන බව} [76:37-39]. අපි මිනිසාව ඔහුගේ මවගේ ගර්භාශයේ එකකට පසු එකක් වශයෙන් අඳුරු පටල 3 ක් හරහා මැව්වෙමු [39:6]. අපි මිනිසාව ඉතා කුඩා ප්‍රමාණයේ ද්‍රව්‍යකින් මවා එය ඉතා ආරක්ෂිත තැනක තබා එය අලකා නමැති කුඩල්ලෙක් වැනි ලේ කැටියක් බවට පත් කර එය මුඩ්ගා නම් විකන ලද ගුලියක් බවට ද එය අසාම් නම් ඇටකටු බවට පත් කර එය ලැහැම් නම් මාංශ වලින් වැසුවෙමු. සියලු පැසසුම් අල්ලාහ් ට හිමිය [23:12-14].*

**වෛද්‍ය විද්‍යා :-** *අවිස්වාසවන්තයන් ප්‍රශ්නයක් ඇසූ කළ; එනම් 'මිනිසා මිය ගොස් ඔහුගේ ශරීරය වල දැමුවාට පසුව එම ශරීරයේ ඇටකටු වලින් යලිත් ඔහුව දෙවියන් විසින් උපදවන්නේ කෙසේදැයි' ඔවුන් ඇසුවොත්, නබි තුමනි ඔබ ඔවුන්ට මෙසේ පිළිතුරු දෙන්න."අපට මියගොස් පස් බවට පත් වුන මිනිසාව යලි මැවීමට පමණක් නොව පෙර තිබූ සේම සෑම ඇඟිලි තුඩක්මද යලි තැබීමටද අපට හැකියාව ඇති බව"[75:3-4]. අපේ සලකුණු ප්‍රතික්ෂේප කරන්නන්ව නිරයට තල්ලු කරනු ලැබේ. ඔවුන්ගේ සම පිළිස්සුනු වහාම යලි නව සම ලබාදී නැවත නැවත වේදනාව අත් විදින්නට සලස්වන්නෙමු [4:56].*

ඔබ ස්වභාවධර්මයට ආදරය කරන කෙනෙක් නම් සත්‍ය වශයෙන්ම ස්වභාවධර්මය කොහෙන් ආපු එකක්ද, එයට හිමිකරුවෙක් ඉන්නවද, එය පාලනය කරන්නේ කව්රුන්ද, ස්වභාව ධර්මයක් ඇතිවී තිබෙන්නට හේතුව කුමක්ද, මිනිසා සහ ස්වභාවධර්මය අතර තියෙන මනා සම්බන්දතාව කුමක්ද යන්න පැහැදිලිව වටහා ගන්න කැමති නම් ඉතාම කුඩා පොතක් වශයෙන් තියෙන ශුද්ධ වූ කුරානය කිහිප වතාවක් කියවලා බලන්න. එවිට ඔබ සබැ

ලෙසම ඔබ හඳුන්වන ස්වභාවධර්මයට ආදරය දක්වන්නට පෙළඹේවි. එවිට ඔබ මෙලොවෙහි ජීවත්වන්නේ කුමන හේතුවක් සඳහා යැයිද ඔබට ඉතා ඉක්මනින් වැටහේවි.

---

## කුරානයේ ගණිතමය ආශ්චර්යයන්

අල්-කුර්ආනය යනු අවසන් දේව පණිවිඩය වන අතර, එය වසර 23ක් පුරාවට මුහම්මද් නබි (ﷺ) තුමාණන්ට අදියර වශයෙන් හෙළිදරව් කරන ලදී. අල්-කුර්ආනයේ හෙළිදරව් කිරීම් මුස්ලිම්වරුන් විසින් දෙවියන්ගේ (දිව්‍යාමය) වචනය ලෙස සලකයි. අල්-කුර්ආනය කියවා තේරුම් ගත් ඕනෑම කෙනෙකුට එහි විශිෂ්ටත්වය ගැන සාක්ෂි දිය හැකිය.

*අහෝ මනුෂ්‍ය වර්ගයා! දැන් ඔබගේ දෙවියන්ගෙන් ඔබට සාක්ෂියක් පැමිණ ඇත, අපි ඔබට පැහැදිලි ආලෝකයක් පහළ කළෙමු. (ඔබගේ මාර්ගය ආලෝකමත් කිරීමට සහ ඔබට සියල්ල පැහැදිලිව පෙන්වා දීමට). [4:174]*

කුරාන්හි ඇතැම් වචන විශ්මිත ආකාරයට සංඛ්‍යාත්මකව සම වන සහ එක් එක් ආකාරයට ගැලපෙන අවස්ථාවන් කිහිපයක්..

- "Salawat" (යාච්ඤා) යන වචනය අල් කුර්ආනයේ 5 වරක් සඳහන් කර ඇති අතර, සෑම මුස්ලිම්වරයෙකුටම අනිවාර්ය දෛනික යාච්ඤා ගණන 5 ක් වේ.
- කුරානයේ "සහර්" (මාසය) යන වචනය වසරක ඇති මාස ගණන මෙන් 12 වතාවක් සඳහන් වේ.
- "Yawn" (day) යන වචනය, ඒකවචනයෙන්, කුර්ආනයේ 365 වතාවක් සඳහන් කර ඇත, වසරක දින ගණන මෙන්.
- "අයියම්" (දින) යන වචනය බහු වචන වලින්, කුරානයේ 30 වතාවක් සඳහන් වේ, මාසයක දින ගණන 30 මෙන්.
- "අල් හයාත්" (ජීවිතය), 145 වතාවක් "අල් Mawt" (මරණය), 145 වතාවක්.

- "අල්-දුන්යා" (ලෞකික ජීවිතය), 115 වතාවක් - "අල් අකිරා" (පසු ජීවිතය), 115 වතාවක්.
- "මලායිකා" (දේවදූතයන්), 88 වතාවක් - "Shayatin" (යක්ෂයන්), 88 වතාවක්.
- "ar Rajul (මිනිසා), 24 වතාවක් - "අල් මාරා (කාන්තාව), 24 වතාවක්.
- "ar Raghba (කැමති), 8 වතාවක් - "අල් ජවුෆ් (බිය), 8 වතාවක්.
- "සාලිහාත් (යහපත් ක්‍රියා) ලෙස 167 වතාවක් - "සයියාත් ලෙස" (වැරදි කිරීම්), 167 වතාවක්.
- "an Nafaa" (ප්‍රතිලාභය), 50 වතාවක් - "අල් ෆසාඩ් (දූෂණ), 50 වතාවක්.
- "Al-Hayat" (ජීවිතය) 145 වතාවක් සහ "අල්-මොවුත්" (මරණය) 145 වතාවක් සඳහන් වේ
- මනස 49 වතාවක් - 49 වතාවක් ආලෝකය.
- "දිව" 25 වතාවක් සහ "දේශනය" යන වචනය 25 වතාවක් පුනරාවර්තනය වේ.
- "ප්‍රතිලාභ" යන වචනය 50 වතාවක් සහ "දූෂිත" යන වචනය 50 වතාවක් දිස්වේ.
- "ත්‍යාග" (ajr) 107 වතාවක් - "ක්‍රියාව" (fa`il) 107 වතාවක්.
- "ආදරය" (අල්-මහබ්බා) 83 වතාවක් සහ "කීකරුකම" (අල්-තාආහ්) ද 83 වතාවක්.
- "සරණාගත" (මසීර්) 28 වතාවක් සහ "සදහටම" (අබදාන්) 83 වතාවක්.
- "ආපදා" (අල්-මුසීබා) 75 වතාවක් සහ "ස්තුතියි" (අල්-ෂුක්ර්) 28 වතාවක්.
- "හිරු" (ෂම්ස්) 75 වතාවක් සහ "ආලෝකය" (නූර්) 75 වතාවක්.
- "නිවැරදි මග පෙන්වීම" (අල්-හුදා) 79 වතාවක් සහ "දයාව" (අල්-රහ්මා) පෙනී සිටීම් 79 වතාවක්.
- "කරදර" 13 වතාවක් සහ "සාමය" 13 වතාවක්.
- "ද්‍රෝහිකම" (ඛියානා) 16 වතාවක් සහ "ඵුල්" (ඛබීත්) 16 වතාවක්.
- "මිනිසා" 65 වතාවක් භාවිතා වේ: මිනිසාගේ මැවීමේ අවධීන් වෙත යොමු කිරීම් ගණනේ එකතුව සමාන වේ: i.e.

- SOIL turaab 17 times
- DROP OF SPERM nutfah 12 times
- EMBRYO `alaq 6 times
- A HALF FORMEND LUMP OF FLESH meda'a 3 times
- BONE `idham 15 times
- FLESH lahm 12 times
  - **TOTAL 65 times**
  - කුරානයේ "ඉඩම්" යන වචනය 13 වතාවක් ද "මුහුද" යන වචනය 32 වතාවක් ද සඳහන් වන අතර, මුළු යොමු කිරීම් 45 ක් ලබා දෙයි. (අපි එම සංඛ්‍යාව ඉඩම පිළිබඳ යොමු සංඛ්‍යාවෙන් බෙදුවහොත් අපට ලැබෙන්නේ 28.888888888889% අගයයි).

    ගොඩබිම සහ මුහුද පිළිබඳ සම්පූර්ණ යොමු සංඛ්‍යාව, 45, කුරානයේ මුහුද පිළිබඳ යොමු සංඛ්‍යාවෙන් බෙදීම, 32, 71.111111111111% කි.

    අසාමාන්‍ය ලෙස, මෙම සංඛ්‍යා අද පෘථිවියේ ගොඩබිම සහ මුහුදේ නියම අනුපාතය නියෝජනය කරයි.

මේ කුරානයේ ඇති ඇදහිය නොහැකි සංඛ්‍යා තුලනය පිලිබඳ උදාහරණ කිහිපයක් පමණි.

තවත් හඳුනාගත් බොහෝ විද්‍යාත්මක හා ගණිතමය විශ්මයන් අල් කුර්ආනය තුළ ඇතැයිද, සහ මෙතෙක් හඳුනාගත් නොගත් ඒවා අනාගතයේදී හෙළිදරව් වනු ඇතැයි විශ්වාස කළ හැකිය.

මෙම පොත ආශ්චර්යයන්ගෙන් පිරී ඇති අතර මඟ පෙන්වීම සඳහා වන කැඳවීමකි, ඔබ එයින් වැඩි වැඩියෙන් ඉගෙන ගන්නා තරමට එය ඔබට උගන්වයි.

# අල් කුර්ආනය විද්‍යාවට අභියෝග කරන්නේ කෙසේද?

විශ්වය ගැන හොඳින් දැන ගැනීමට විද්‍යාව උපකාරී වන්නේය. කෙසේ වෙතත් මිනිසාගේ දැනුම සිමා සහිත බැවින් එය කල හැක්කේ යම් සීමාවකට පමණි. එසේ තිබියදී විශ්වයේ මැවුම්කරු දෙවියන් වන බැවින් විද්‍යාවෙන් සොයා ගත නොහැකි බොහෝ දේවල් කුරානයෙන් විස්තර කරන්නේය. මේ සඳහා අල් කුරානයේ වැකි දහසක් පමණ වෙන් කොට ඇත. ඒවායින් බොහොමයක් විද්‍යාඥයින් සොයාගනු ලැබුවේ කුරානය පහළ වී සියවස් 14 ක් පමණ ගෙවී ගිය පසුවය. උදාහරණයන් වශයෙන් විශ්වයේ ප්‍රසාරණය, අහස සහ පොලව එකම ප්‍රබවයකින් හට ගන්නා බව, සූර්යයා සහ අනෙක් ග්‍රහ වස්තූන් ඊට නියමිත මාර්ගවල ගමන් කරන බව, කාලයේ විස්තාරණය, කලලයේ විකසනය, පොලවේ ස්ථායිතාවයට කඳුවලින් සිදු වන මෙහෙය යනාදිය පෙන්වා දිය හැකිය. මෙවැනි දේවල් කුරානය මගින් ඍජුවම ඉදිරිපත් කරද්දී විද්‍යාඥයින් ඒවා සොයාගනු ලැබ ඇත්තේ බොහෝ කාලයක් තිස්සේ කරන ලද පර්යේෂණ වලින් පසුවය. මේ අනුව පෙනී යන්නේ අල් කුරාණය විද්‍යාවට වඩා බොහෝ ඉදිරියෙන් සිටින බවයි. එසේ තිබියදී විද්‍යාඥයින්ට මේ දක්වා විශ්වයේ බිහිවීම ගැන හෝ එහි අවසානය ගැන නිවැරදිව යමක් ප්‍රකාශ කිරීමට හැකිවී නොමැත. ඒවා විස්තර කොට ඇත්තේ දහම හරහාය.

අල් කුරානයට අනුව මිනිසාව මවා ඇත්තේ අල්ලාහ්ගේ මිහිපිට නියෝජිතයා ලෙසය. මිහිපිට ඇති ජීවින් සමග සැසඳීමේදී එය ඉතා හොඳින් පැහැදිලි වන්නේය. විශේෂයෙන්ම මිනිසාට ලැබී ඇති බුද්ධිය සහ ශරීර ලක්ෂණයන් මීට හේතුවක් ලෙස සැලකිය හැකිය. මින් පෙනී යන්නේ මිහිපිට සිටින ජීවින් අතරින් මිනිසාව විශේෂ හේතුවක් නිසා මවා ඇති බවයි. මෙම කරුණ මිනිසාට ආගමක් ඇදහීමටත් දෙවියන්ව විශ්වාස කිරීමටත් ප්‍රමාණවත් ය. එසේ තිබියදී මිනිසා අනෙක් ජීවින් මෙන් කෑමටත් වර්ගයා බෝ කිරීමටත් පමණක් ජීවත් වන්නේ නම් එය මිනිස් කමට කරන බලවත් නිගාවකි.

මිනිස් ජීවිතයේ අරමුණ දෙවියන් පහළ කල සෑම ආගම් පුස්තකයකින්ම පැහැදිලි කොට ඇත. ඒ හැර වෙනත් කිසිම ක්‍රමයකින් මිනිස් ජීවිතයේ අරමුණ දැනගත

හැකි වන්නේ නැත. එසේ තිබියදී විද්‍යාවේ දියුණුවත් සමග මිනිසාට ආගමත් සමග ඇති විශ්වාසය අඩු වෙමින් පවතී. ඊට එක් හේතුවක් වශයෙන් පෙන්වා දිය හැක්කේ ඇතැම් විද්‍යාඥයින් දෙවියන්ව විශ්වාස නොකිරීමයි. කෙසේ වෙතත් සෑම විද්‍යාඥයෙකුම අදේවවාදීන් නොවේ. උදාහරණයක් වශයෙන් අයිසැක් නිව්ටන් වැනි විද්‍යාඥයින් දෙවියන්ව විශ්වාස කොට ඇත. එපමණක් නොව අදටත් විද්‍යාඥයින්ගෙන් සැලකිය යුතු පිරිසක් ආගමක් අදහති. තවත් පිරිසකට ඒ පිළිබඳව පැහැදිලි දැක්මක් නොමැතිව ජීවත් වෙති. කෙසේ වෙතත් විද්‍යාඥයින්ට දහම ගැන විශ්වාසයක් නොමැති වීම තවත් කෙනෙකුට දහමින් ඈත්වීමට හේතුවක් නොවේ.

මිනිසාගේ දැනුම සීමා සහිතය. එබැවින් ඔහුට ගවේශනය කල හැක්කේ එම සීමාව තුල පමණි. ඒ අනුව විද්‍යාඥයින්ට ආත්මය ගැන හෝ මරණයෙන් පසු සිදුවන දේවල් ගැන හැදෑරීමට නොහැකිය. එම නොහැකියාව දහමින් බැහැර වීමට හේතුවක් කරගත යුතු නැත. කෙසේ වෙතත් මිනිසා දහමින් ඉවත්වීම ඔහු ලබන විශාල පාඩුවක් වනවාට කිසිම සැකයක් නැත. එය දැනගත හැක්කේ මෙලොව ජීවිතය අවසාන වීමෙන් පසුව නම් එය තවත් පාඩුවකි. එවිට මිනිසාට කල හැකි දෙයක් ඉතිරි වන්නේ නැත.

විද්‍යාව මෑත ඉතිහාසය තුල සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇතත් විශ්වය හා ජීවය සම්බන්ද බොහෝ දේවල් ඉන් සොයාගෙන නැත. ඇත්ත වශයෙන්ම ඒවා නිවැරදිව විස්තර කොට ඇත්තේ දෙවියන් පහළ කරන ලද දහම තුලය. කෙසේ වෙතත් අවශ්‍යතාවය තිබෙන කෙනෙකුට දෙවියන්ව විශ්වාස කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි විශ්වය පුරාම ඇත. එහෙත් ඇතැමුන් ඒවා දැකිය යුතු අන්දමින් දකින්නේ නැත. තවත් සමහරු ඒවා දැක්කත් පිළිගැනීමට සූදානම් නැත. එය මෙලෙස තේරුම් කල හැකිය. දෑස පියාගෙන සිටින කෙනෙකුට සූර්යයා කොතරම් දීප්තිමත් උනත් එය දැකිය නොහැකිවා සේම දෙවියන්ව තේරුම් ගැනීමට උවමනාවක් නොමැති කෙනෙකුට ටොන් ගණනින් හේතු දැක්වුවත් ඉන් ප්‍රයෝජනයක් අත් වන්නේ නැත. එසේ තිබියදී නොදකින දෙවියන්ව විශ්වාස කල නොහැකි යැයි කෙනෙක් පවසන්නේ නම් එය ඔහුගේ මුග්ධ කමකි. ඇත්තෙන්ම තිරිසන් සතුන්ට එවැනි නිගමනයකට පැමිණිය හැකිය. එහෙත්

මිනිසාට ලැබී ඇති දැනුම නිසා එසේ කල නොහැකිය. ඒ අනුව මිනිසා එවැනි නිගමනයකට පැමිණීමෙන් සිදු වන්නේ මිනිසා ඔහුව තිරිසනාගේ තත්වයට පත්කර ගැනීමකි.

මිනිසාට ජීවිතයේ අරමුණ නිවැරදිව දැනගැනීමට නම් දෙවියන් පහළ කරන ලද දහමක් හැදෑරිය යුතුය. ඒ තුලින් දෙවියන් පිලිබඳ නිවැරදි විශ්වාසය ගොඩ නගා ගත හැකි වනු ඇත. කෙසේ වෙතත් දෙවියන් පිලිබඳ විශ්වාසය නිරායාසයෙන් ලැබෙන්නේ නැත. ඒ සඳහා කටුක අත්දැකීම් වලට මුහුණ පෑමට සිදු වන්නේය. ඒ අනුව දහම දෙසීමට පැමිණි නබිවරුන් පවා බොහෝ පරීක්ෂාවන්ට මුහුණ දී තිබේ. එසේ නොමැතිව ආචාර්ය, මහාචාර්ය පදවි තිබීමෙන් පමණක් දෙවියන් පිලිබඳ ස්ථිර විශ්වාසය ගොඩ නගා ගැනීමට හැකි වන්නේ නැත.

දෙවියන් පිලිබඳ විශ්වාසය උත්සාහයෙන් අත්කර ගත යුතු දෙයක් වුවත් ලෞකික දේවල් ඕනෑම කෙනෙකුට දෙවියන් විසින් ප්‍රධානය කරන්නේය. මේ නිසා දෙවියන්ව විශ්වාස නොකරන බොහෝ අයට ලෞකික දේවල් අසීමිත ලෙස ලැබුණු අවස්ථා දැක ගත හැකිය. මෙවැනි බොහෝ අය ගැන කුරානයේ සඳහන් වන්නේය. මේ නිසා දෙවියන්ව විශ්වාස නොකරන කෙනෙකුට වස්තුව ලැබීමෙන් ඔහු නිවැරදි මාර්ගයේ සිටින බව කිව නොහැකිය.

පෘථිවිය මත ඇති සෑම දෙයකින්ම දෙවියන්ගේ බල මහිමය කියා පාන්නේය. උදාහරණයක් වශයෙන් පසේ දමන බීජයක් දිරා නොගොස් ඉන් පැලයක් හටගෙන පසුව එය ගසක් බවට වැඩී නැවත පල දරන්නේ දෙවියන්ගේ සැලසුම නිසාය. තවද එම පල නොයෙකුත් රසයෙන් සුවඳින් වර්ණයෙන් සහ ගුණයෙන් යුක්ත වන්නේ දෙවියන්ගේ මැවීමක් නිසාය. නැතහොත් මෙවැනි දෙයක් සිදු විය නොහැකිය. මීට අමතරව දෙවියන් පිලිබඳ විශ්වාසය ඇති කිරීම සඳහා විද්‍යාව නොදියුණු කාලවල නබිවරුන් විසින් ප්‍රාතිහාරයන් පා ඇත. මේ අනුව ජේසු තුමාගේ කාලයේ ජීවත්වූ අයට අභියෝග කරමින් එතුමා මළවුන් නැගිටුවා ඇත. එසේම ලාදුරු රෝගීන් සුවපත් කොට ඇත. මේ සෑම එකකටම වඩා එතුමා පියෙකු නොමැතිව පිළිසිඳ ගෙන තිබේ. අනෙක් නබිවරුන්ද ප්‍රාතිහාරයන් පෙන්වා ඇත. එසේ තිබියදී නබිවරුන්ගේ අවසාන පුරුක ලෙස මෙලොවට පැමිණි මුහම්මද් නබිතුමාට පහළ වූ අල් කුරානය එදාට පමණක් නොව අදටත්

ප්‍රතිහාරයක් මෙන්ම ලිඛිත ශාක්ෂියකි. එවැනි ග්‍රන්ථයක් මෙතෙක් කිසිවෙකුට නිර්මාණය කිරීමට හැකිවී නැත.

ඇතැම් විද්‍යාඥයින් දෙවියන්ව විශ්වාස නොකරත් ඔවුන්ට පිළිතුරු දීමට නොහැකි ප්‍රශ්න රාශියක්ම ඇත. ඒ අනුව විශ්වය මහා පිපිරුමකින් ඇතිවූ බව ඔවුන් සඳහන් කලත් ඒ සඳහා සැලසුම් සකස් කලේ කව්රුන්දැයි පවසා නැත. තවද, ඕනෑම පිපිරුමකින් පසු ව්‍යාකූලතාවය වැඩි වුවත් මහා පිපුරුමෙන් පසු ඉතා හොඳින් සංවිදානය වූ විශ්වයක් බිහිවී ඇත. මෙය ඇතිවුයේ කෙසේදැයි ඔවුන් පවසන්නේ නැත. මෙවැනි තවත් බොහෝ කරුණු පහත දැක්වේ.

පෘථිවියේ සැකසුම සහ එහි ඇති දේවල් ඉතා සංකීර්ණ ය. එහෙත් එය සිදු වුයේ කෙසේදැයි විද්‍යාඥයින්ට පැහැදිලිව යමක් කිව නොහැකිය. එහෙත් අල් කුරානයේ එය සඳහන් වන්නේය.

පෘථිවියේ පිහිටීම සහ එහි නිවැරදි ප්‍රමාණය නිසා එයට වායුගෝලයක් පවත්වාගැනීමට හැකිවී තිබේ. තවද එම වායුගෝලය ජීවින්ට හිතරක අන්දමින් පවත්වාගෙන යාමට යාන්ත්‍රණයක් ඇත. මෙය සිදු වුයේ කෙසේදැයි විද්‍යාඥයින්ට විස්තර කල නොහැකිය.

පෘථිවිය දෙසට සූර්යායගෙන් පැමිණෙන අහිතකර කිරණ පෙරා වෙන් කොට ජීවීන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා විදිමත් සැලැස්මක් ඇත. එය සිදුවූයේ කෙසේදැයි විද්‍යාඥයින් විසින් නිවැරදිව විස්තර කොට නැත.

විශ්වය පුරාම එකම ස්වභාවික නීති පද්දතියක් ක්‍රියාත්මක වන්නේය. එසේම විශ්වයේ බොහෝ විශ්ව නියතයන් දැකිය හැකිය. මෙවැනි දෙයක් සිදුවන්නේ කෙසේදැයි විද්‍යාඥයින් විස්තර කොට නැත. එහෙත් එමගින් විශ්වය එක් දෙවි කෙනෙකුගේ නිර්මාණයක් බව නිගමනය කල හැකිය.

පෘථිවියේ වෙසෙන සෑම ජීවියෙකුගේම අංග සම්පූර්ණ විස්තරයක් කියැවිය හැකි ආකාරයට ඥානාන්විත අයුරින් DNA අනුවල ගබඩා කොට ඇත. එය පරිගනකයක දත්ත ගබඩා කිරීමට වඩා සංකීර්ණ වේ. මෙය විස්තර කිරීම විද්‍යාඥයින්ට අභියෝගයකි.

විශ්වයේ සිටින ජීවින් අතරින් මිනිසා අද්විතීය ස්ථානයක් හොබවන්නේය. මිනිසා ගැන අධ්‍යයනය කරන ඕනෑම කෙනෙකුට එය පහසුවෙන්ම තේරුම් ගත හැකිය. එසේ වීමට හේතුව විද්‍යාඥයින් විසින් මෙතෙක් නිවැරදිව විස්තර කොට නැත. එහෙත් දෙවියන් විසින් එය පැහැදිලිව පවසා ඇත.

මෙහි සඳහන් කලේ ඉතාමත්ම සීමිත කරුණු කිහිපයක් පමණි. ඒවා තේරුම් ගත හැකිවන පරිදි මිනිසාව මවා තිබේ. මේවාට පිළිතුරු සෙවීමේදී විශ්වයට මැවුම්කරු එක් දෙවි කෙනෙක් පමණක් සිටින බව නිගමනය කල හැකිය. ඒ අනුව මිනිසාට අවංක උවමනාවක් තිබේ නම් විශ්වයට නිර්මාණ කරුවෙක් සිටිය යුතු බව තේරුම් ගැනීමට හැකි විය යුතුය. ඒ අනුව මිනිසාට ආගමක අවශ්‍යතාවය ගැන වටහා ගැනීමට හැකි වන්නේය. එහෙත් නිවැරදි දහම කුමක්දැයි සොයා දැනගැනීම මිනිසා හමුවේ ඇති ප්‍රධාන අභියෝගයකි. කෙසේ වෙතත් ලොවට පහළ වූ අවසාන නබිවරයා මුහම්මද් තුමා බවත් ලොව පහළ වූ අවසාන දේව ග්‍රන්ථය අල් කුරානය බවත් ප්‍රත්‍යක්ෂ කරුණකි. එබැවින් අල් කුරානය සහ ඉස්ලාම් දහම නිවැරදිව හැදෑරීම මිනිසාට පැවරෙන භාර දූර කර්තව්‍යයකි. (By Fasy Ajward-FA)

---

# අල්-කුරානය පිළිබඳව මුස්ලිම් නොවන විද්වතුන්ගේ ප්‍රකාශනයන්

අල් කුරානය අල්ලාහ් දෙවිඳුන්ගෙන් පහළ වූ අද්විතීය ග්‍රන්ථයකි. හත්වන සියවසේදී පහළ වූ එම ග්‍රන්ථයේ ව්‍යාකරණ වැරැද්දක් හෝ විෂය කරුණු වල වැරැද්දක් හෝ මේ දක්වා සොයාගෙන නොමැත. එහි වාක්‍යයන් හයදහසකට වඩා ඇති අතර ඉන් දහසක් පමණ විද්‍යාත්මක කරුණු වන්නේය. එසේ තිබියදීත් එහි ඇති කිසිම කරුණක් නවීන විද්‍යාව හමුවේ අභියෝගයට ලක් නොවීම සුවිශේෂී කරුණකි. ඉන් පෙනී යන්නේ එය මිනිස් නිර්මාණයක් නොවන බවයි.

අල් කුරානය ගැන මුස්ලිම් විද්වතුන් මෙන්ම මුස්ලිම් නොවන විද්වතුන් විසින් අදහස් දක්වා ඇත. මෙහි පහත දැක්වෙන්නේ මුස්ලිම් නොවන විද්වතුන් විසින් දක්වන ලද අදහස් කිහිපයකි.

**(1) ඇල්බට් අයින්ස්ටයින් (1879-1955)**: කුරානය යනු වීජගණිතය හෝ ජ්‍යාමිතිය සම්භන්ද ග්‍රන්ථයක් නොවුනත් මිනිසාට නිවැරදි මාර්ගය පෙන්වීම සඳහා ඇති නීති රීති මාලාවක් අඩංගු ගොනුවකි. එම මාර්ගය ශ්‍රේෂ්ඨ දාර්ශනිකයන්ට පවා ප්‍රතික්ෂේප කල නොහැකිය.

**(2) විල් දොරන්ට් (උපත 1855):** අල්ලාහ් දෙවියන් විසින් යවා ඇති අල්-කුරානයේ ආගමික සංග්‍රහය පමණක් නොව ලෞකික සංග්‍රහයත් පෙන්වා දී ඇත. අල්-කුරානයේ යහපත් ආචාරවිධි, සෞඛ්‍යසම්පන්න විධි, විවාහය, දික්කසාදය, ළමයින්ගේ සහ අනෙක් සතුන්ගේ යුතුකම්, වහලුන්, ව්‍යාපාර, දේශපාලනය, අසාධාරණ ලෙස ලාභ ලැබීම, ණය ගනුදෙනු, ගිවිසුම්, රෙකමදාරුව, ධනය, දඬුවම් කිරීම, යුද්ධය සහ සාමය පිළිබඳව නීති රීති අඩංගු වේ. කුරානයෙන් සාමාන්‍ය ජනතාවට සරල වශයෙන් විශ්වාසය පිළිබඳව කියා දී ඇත. ඒවා සියල්ලම පිළිම වන්දනයෙන් නිදහස්ය. කුරානයෙන් සමුහ වශයෙන් වූද තනි වශයෙන් වූද විනය පිළිබඳ නීති රීති සංස්ථාපිත කොට ඇත.

**(3) චාර්ල්ස් ෆ්‍රැන්සිස් (ඇමරිකානු මහාචාර්යවරයෙකි)**: බයිබලය නමැති පොත ඇමරිකානුවන් කිසිවෙකු දන්නේ නැත එහෙත් කුරානය නමැති පොත සෑම මුස්ලිම්වරයෙකුම දනී. එය බොරුවක් නොවේ. එයත් සමගම සඳහන් කල යුතු කරුණක් වන්නේ බයිබලය ගැන නොදැනුවත්ව සිටීම දහමට වාසනාවක් බවයි.

**(4) කිත් එල් මුවර් (කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ ව්‍යුහ විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි)**: කයිරෝ නුවර පැවති සම්මන්ත්‍රණයකදී පර්යේෂණ කෘතියක් ඉදිරිපත් කරමින් ඔහු පවසා සිට ඇත්තේ: "මම අල්-කුරානයේ ඇති මිනිසාගේ විකසනය පිළිබඳව ඇති ප්‍රකාශනයන් පිළිබඳව පැවසීමට ලැබීම ගැන අතිශයින්ම සතුටට පත් වෙමි. මට පැහැදිලි වන එක් කරුණක් නම් මෙම වගන්ති පහළ විය යුත්තේ දෙවියන්ගෙන් බවයි. ඇයිද යත් එම කරුණු වලින් බොහොමයක්ම දැනට සතවර්ෂ ගනනාවක් යන තුරුම සොයාගෙන නොතිබුණු

නිසාය. එබැවින් මට සනාථ කළ හැකි කරුණක් වන්නේ මුහම්මද් තුමා දෙවියන්ගේ දූතයෙකු විය යුතු බවයි".

ඔහු තව දුරටත් පවසා සිට ඇත්තේ, "...මිනිසාගේ කළලය වර්ධනය වීමේදී සිදුවන නිරන්තර විපර්යාස හේතුකොට ගෙන, එහි සංකීර්ණ අවස්ථාවන් සම්බන්දයෙන් කුරානයේ සහ හදිස් වල ඇති කරුණු අලලා අළුත් වර්ගීකරණයක් කල යුතුව ඇත. එම යෝජිත ක්‍රමවේදය ඉතා සරලවුද පුළුල්වුද නවීන කළල විද්‍යාව පිලිබඳ දැනුම සමග එකඟ වන්නා වූද එකකි".

**(5) සර් බර්නාඩ් ෂෝ**: "මා සැමවිටම මුහම්මද් ගේ ආගමට ඉහල වටිනාකමක් දෙමින් ඇළුම්කලේ එහි ඇති ජීවාත්ම බලය නිසයි. මට පෙනෙන පරිදි වෙනස්වන ලෝකයේ සෑම අවශ්‍යතාවන්ට ම උර දිය හැකි එකම දහම එයයි. මම ඔහු ගැන හදෑරුවෙමි- ආශ්වර්යමත් මිනිසෙකි, මගේ මතය අනුව ඔහු ක්‍රිස්තු විරෝධියෙකු යැයි ඇමතීමට වඩා මිනිසාගේ ගැලවුම් කරු යැයි ආමන්ත්‍රණය කිරීම නිවැරදිය. මා විශ්වාස කරන පරිදි ඔහු වැනි කෙනෙකුට නවීන ලෝකයේ පාලනය භාර කලේ නම් එහි ඇති සියළු ප්‍රශ්න වලට විසඳුම් සොයා සාමය සහ සතුට ගෙන එනු ඇත. මට කිව හැකි අනාවැකියක් වන්නේ එම දහම අද පවතින යුරෝපය පිළිගන්නා සේම අනාගත යුරෝපයත් පිළිගනු ඇත"

**(6) මහත්මා ගාන්දි**: "මට අවශ්‍ය කලේ මිලියන ගණන් මිනිසුන්ගේ හදවත් වසඟකරගෙන පාලනය කරන මිනිසා ගැන දැනගැනීමටයි....මම කිසිදිනක නොසිතු අන්දමින් ඉස්ලාම් දහම කඩුවෙන් මිනිසුන් අතර ව්‍යාප්ත වුවා යැයි කීමට වඩා එහි ඇති පැහැදිලිව පෙනෙන සරල බව, නිහන්කාරකම, අකුරටම පොරොන්දු ඉටුකිරීම, යහළුවන් සහ අනුගාමිකයින් කෙරෙහි දැක්වූ ආදරය, නිර්භීතකම, ඔහු දෙවියන් කෙරෙහි සහ ඔහුගේ ධර්ම ප්‍රචාරය ගැන දැක්වූ දැඩි විශ්වාසය එයට හේතුවයි...."

**(7) මයිකල් H හාට්**: "ලොව විසු වැදගත් පුද්ගලයින්ගේ නාම ලැයිස්තුවේ මුලටම මුහම්මද් ගේ නම් යෙදීමට සිදුවීම ගැන ඇතැම් පාඨකයින් මවිතයට පත් වනු ඇත. තවත් සමහරු එය ප්‍රශ්න කරනු ඇත. එහෙත් ඉතිහාසයේ සිටම ආගම අතිනුත් ලෞකික අතිනුත් අතිශයින්ම සාර්ථක වූ එකම මිනිසා ඔහුය....ඔහු විසින්

ඉස්ලාම් දහම කෙරෙහි ඇතිකළ බලපෑම ජේසු තුමා සහ සාන්ත පොල් යන දෙදෙනා එකතුව කල බලපෑමට වඩා අතිශයින්ම ඉහල වටිනාකමක් ඇත...

මුහම්මද නබි තුමා කියවීමට හෝ ලිවීමට දැන සිටියේ නැත. එවන් කෙනෙක් කිසිම වැරැද්දක් නොමැතිව ඉතා විශිෂ්ට අරාබි බසින් කුරානය බඳු කෘතියක් ලිවිම කිසිසේත්ම විය හැකි දෙයක් නොවේ. තවද අල් කුරානයේ බොහෝ විෂයන්ට අයත් කරුණු අඩංගු වන්නේය. ඒවා ලිවීමට නම් ඒ ඒ විෂයන් පිලිබඳ විශාරද දැනුම තිබිය යුතුය. ඒ අනුව කිසිසේත්ම තනි මිනිසෙකුට කුරානය බඳු කෘතියක් ලිවීමට හැකි වන්නේ නැත. එබැවින් එය දෙවියන්ගෙන් පහළ වූ පණිවිඩයක් විය යුතු වන්නේය. (FA)

---

## දැනුම නොමැතිව අල් කුර්ආනය විග්‍රහ කළ හැකිද?

සත්‍යය සොයා යන ඇතැම් මුස්ලිම් නොවන අය අල්-කුර්ආනයයේ දිව්‍යමය ප්‍රභවය හඳුනාගෙන නැතත් එය අද්විතීය හා විස්තර කළ නොහැකි තරම් බලවත් ග්‍රන්ථයක් බව තේරුම්ගෙන තිබේ. පහත දැක්වෙන්නේ එවැනි ප්‍රකාශනයකි.

"අල් කුර්ආනය ලෝකයේ ඇති ශ්‍රේෂ්ඨ ආගමික ග්‍රන්ථ අතර වැදගත් ස්ථානයක් හිමි කරගෙන ඇති බව පිළිගත යුතුය. එය සාහිත්‍ය පන්තියට අයත් යුගයක් නිර්මාණය කිරීමේ ලාබාලතම කෘතිය වුවද, එමගින් බහුතර මිනිසුන් කෙරෙහි ඇති කර තිබෙන පුදුමාකාර බලපෑමෙන් කිසිසේත්ම ගැලවිය නොහැකිය. එය මිනිස් චින්තනයේ නව අවධියක් සහ නැවුම් චරිතයක් නිර්මාණය කර තිබේ. කුරානය මගින් මුලින්ම අරාබි අර්ධද්වීපයේ විෂමජාතීය කාන්තාර ගෝත්‍ර වැසියන් ගණනාවක්ම වීර චරිතයන් බවට පරිවර්තනය කර තිබේ. පසුව යුරෝපයේ සහ නැගෙනහිර රටවල්වල දේශපාලන-ආගමික බලවේගයක් බිහි කිරීමට සමත් වී ඇත" (G. Margoliouth, Introduction to J.M. Rodwell's, "The Koran," New York: Everyman's Library, 1977, p. vii.).

කුරානය සම්බන්දයෙන් මුස්ලිම් නොවන අයගේ මෙවැනි තවත් බොහෝ ප්‍රකාශනයන් තිබේ. එසේ තිබියදී ඇතැම් අය "කුර්ආන්" යන වචනය පවා

නිවැරදිව උච්චාරණය කිරීමට නොහැකිව තිබියදී එහි ඇති ඇතැම් කරුණු විවේචය කිරීම කනගාටුවට කරුණකි.

අල් කුරානය මුහම්මද් නබිතුමාට පහළ වුවත් එය සමස්ත මිනිස්වර්ගයාටම නිවැරදි මාර්නය පෙන්වා දීම සඳහා අල්ලාහ්ගෙන් පහළ වූ මාර්ගෝපදේශයකි. එහි විවරණය ලෙස සලකනු ලබන්නේ මුහම්මද් නබිතුමාගේ මඟ පෙන්වීමයි. තවද එය ලෝකය පවතින තාක් කල් ආරක්ෂා කිරීමේ වගකීම අල්ලාහ් ඔහුවෙත පවරාගෙන තිබේ. එම නිසා කිසිවෙකුට කුරානය වෙනස් කිරීමට ලැබෙන්නේ නැත.

අල් කුරානය පහළ වුයේ ඒ ඒ අවස්ථාවන්ට අවශ්‍යා පරිදි කරුණු පැහැදිලි කරමින් කොටස් වශයෙනි. ඒ අනුව එහි ඇති ඇතැම් වැකි පහළ වී තිබෙන්නේ යුද්ධයක් සිදුවන අවස්ථාවේදී ක්‍රියා කල යුතු අකාරය විස්තර කිරීමට ය. සමහර වැකි පහළ වී තිබෙන්නේ ආර්ථික කටයුතු සම්බන්දයෙනි. සමහර වැකි පහළ වී තිබෙන්නේ විවාහය සහ දික්කසාදය සම්බන්ද කරුණු පැහැදිලි කිරීමට ය. සමහර වැකි පහළ වී තිබෙන්නේ දෙමව්පියන් සහ දරුවන් සම්බන්ද කරුණු විස්තර කිරීමට ය. මේ නිසා කුරානය නිවැරදිව තේරුම් ගැනීම සඳහා එහි ඇති වැකි පහළ වීමට බලපාන ලද හේතු දැනගෙන සිටිය යුතුය.

කරුණු එසේ තිබියදී මුස්ලිම් නොවන ඇතැම් අය උවමනාවෙන්ම කුරානයේ ඇති වැකිවලින් කොටස් සන්දර්බයෙන් තොරව උපුටා දක්වමින් ඒවා විවේචය කරති. ඉන් සිදු වන්නේ ඔවුනුත් නොමග යන අතරම අනෙක් අයත් නොමග යැවීම යි. මේ සඳහා ඔවුන් උපුටාගනු ලබන කුර්ආන් වැකිය මෙසේය,

*"නුඹලා ඔවුන්ව කොතැනක දුටුවත් ඝාතනය කරනු" (කුරානය 2:191)*

ඉතත සඳහන් කුරආන් වැකිය ද්වේශසහගත ලෙස සන්දර්බයෙන් බැහැරව ඉදිරිපත් කල විට පෙනී යන්නේ කුරානය ඉතා භයානක ග්‍රන්ථයක් ලෙසය. එහෙත් එම වැකියට ඉහලින් සහ ඊට පහලින් ඇති වැකි කෙරෙහි අවදානය යොමු කිරීමේදී පෙනී යන්නේ කුරානය මානව හිතවාදී ග්‍රන්ථයක් බවයි. අදාළ වැකියට ඉහලින් ඇත්තේ මෙලෙසය.

*"කවරහු නුඹලා සමග සටන් කරයිද ඔවුන් සමග නුඹලාද අල්ලාහ්ගේ මගෙහි සටන් කරන්න. සීමාව නොඉක්මවන්න. නියතව අල්ලාහ් සීමාව ඉක්මවන්නන්ව ප්‍රිය නොකරන්නේය"*

ඒ අනුව (2:191) වැනි වැකියේ ඇති නියෝගය ආදාල වන්නේ මුස්ලිම්වරුන්ට විරුද්ධව යුධ වැදුණු අයට පමණක් බව ඉතා පැහැදිලිය. අදාළ වැකියට පහලින් ඇති (2:192) වන වැකිය මෙසේය.

*"නමුත් ඔවුන් (සටන් නොකර) ඉවත් වුයේ නම් නියතව අල්ලාහ් අධිකව ක්‍ෂමාකාරන්නාය; අසම දයාවන්තයය"*

ඒ අනුව පැහැදිලි වන්නේ (2:191) හි විස්තර කොට ඇත්තේ යුද්ධයේදී සතුරා සමග සටන් කිරීම සම්බන්දයෙන් බවයි. එහෙත් ඔවුන් යුද කිරීමෙන් ඉවත් වන්නේ නම් වහාම ඔවුන් සමග යුද වැදීම නතර කල යුතු බව පවසා තිබේ. මේ නිසා (2:191) වැනි වැකිය පරිවර්තයන විය යුත්තේ මුස්ලිම්වරුන්ගේ කුර්ආන් පරිවර්තන වල දැකිය හැකි පරිදි මෙලෙසය.

"නුඹලා ඔවුන්ව (සටනේදී) කොතැනක දුටුවත් ඝාතනය කරනු" යනුවෙනි.

මෙය ඕනෑම යුද්ධයකදී අනුගමනය කරනු ලබන සාමාන්‍ය ක්‍රියා පටිපාටිය වේ. මේ අනුව ඉස්ලාම් විරෝධීන් කියන අකාරයේ වැරැද්දක් කුර්ආන් වැකි තුල ඇතුලත් වන්නේ නැත.

අල් කුරානයේ මුස්ලිම් නොවන අය සමග සහයෝගයෙන් ජීවත් වීම ගැන මෙසේ සඳහන් කර ඇත. *"කවරහු ආගම නිසා නුඹලා සමග සටන් නොකළෝද ඔවුන්ටද, තවද, නුඹලාව නුඹලාගේ නිවෙස්වලින් පිට නොකළෝද ඔවුන්වද, නුඹලා යහපත් දේ කිරීමද, ඔවුන් සමග යුක්තිසහගතව ක්‍රියා කිරීම කෙරෙහිද අල්ලාහ් නුඹලාව වැලක්වුයේ නැත. නියත වශයෙන්ම අල්ලාහ් යුක්තිගරුකව ක්‍රියා කරන්නන්ව ප්‍රිය කරන්නේය"* මින් පැහැදිලි වන්නේ සහජීවනයට කුරානයේ ඉඩක් දී ඇති බවයි.

*මුස්ලිම් නොවන්නන් සමග යුක්ති ගරුකව ක්‍රියා කිරීම සම්බන්දයෙන් නබිතුමා මෙසේ ප්‍රකාශ කොට ඇත. "ප්‍රවේසම් වනු! කවුරුන් හෝ මුස්ලිම් නොවන*

*සුළුතරයක් කෙරෙහි කුරිරු හා දැඩි ලෙස කටයුතු කරන්නේ නම් ද ඔවුන්ගේ අයිතිවාසිකම් කප්පාදු කරන්නේ නම් ද ඔවුන්ට දරාගත හැකි ප්‍රමාණයට වඩා බරක් පටවන්නේ නම් හෝ ඔවුන්ගේ නිදහස් කැමැත්තට එරෙහිව ඔවුන්ගෙන් යමක් ලබා ගන්නේ නම් ද මම (මුහම්මද් නබි) එම පුද්ගලයාට එරෙහිව විනිශ්චය දිනයේදී පැමිණිලි කරන්නෙමි" (අබූ දාවූද්).* මේ නිසා මුස්ලිම් රාජ්‍යයක වෙසෙන මුස්ලිම් නොවන්නන්ගේ අයිතිවාසිකම් නබිතුමා විසින් තහවුරු කොට තිබේ.

අල් කුරානයේ සත්‍යය පැහැදිලි කොට තිබියදීත් යම් කෙනෙක් තම පෞද්ගලික උවමනාවන් සඳහා කුරානය උපයෝගී කර ගන්නේ නම් එය ඔහුගේ වරදකි. ඒ සඳහා ඔහුට දිය හැකි උපරිම දඬුවම ලබා දිය යුතුය. එසේ නොකර එම වරද සමස්ත මුස්ලිම් ජනයා වෙත පැටවීම කිසිසේත්ම අනුමත කල නොහැකිය. (FA)

---

## අල් කුරාණයෙන් උපදෙස් 100ක්

1. කතාවේදී රළු නොවන්න (3:159)
2. කෝපය පාලනය කරගන්න (3:134)
3. අන් අයට යහපත් වන්න (4:36)
4. අහංකාර නොවන්න (7:13)
5. අන් අයගේ වැරදි වලට සමාව දෙන්න (7:199)
6. මිනිසුන්ට මෘදු ලෙස කතා කරන්න (20:44)
7. ඔබේ හඬ පහත් කරන්න (31:19)
8. අන් අයට සමච්චල් නොකරන්න (49:11)
9. දෙමාපියන්ට කීකරු වන්න (17:23)
10. දෙමාපියන්ට අගෞරව කරන වචනයක්වත් නොකියන්න (17:23)
11. අවසරයකින් තොරව දෙමාපියන්ගේ පෞද්ගලික කාමරයට ඇතුළු නොවන්න (24:58)
12. ණය ලියා තබන්න (2:282)
13. අන්ධ ලෙස කිසිවෙකු අනුගමනය නොකරන්න (2:170)

14. ණයගැතියා දුෂ්කර කාලයක සිටී නම් ආපසු ගෙවීමට වැඩි කාලයක් ලබා දෙන්න (2:280)
15. පොලිය පරිභෝජනය නොකරන්න (2:275)
16. අල්ලස් නොගන්න (2:188)
17. පොරොන්දුව කඩ නොකරන්න (2:177)
18. විශ්වාසය තබා ගන්න (2:283)
19. සත්‍යය අසත්‍යය සමඟ මිශ්‍ර නොකරන්න (2:42)
20. මිනිසුන් අතර යුක්තියෙන් විනිශ්චය කරන්න (4:58)
21. යුක්තිය වෙනුවෙන් ස්ථිරව පෙනී සිටින්න (4:135)
22. මියගිය අයගේ ධනය ඔහුගේ පවුලේ සාමාජිකයන් අතර බෙදා හැරිය යුතුය (4:7)
23. කාන්තාවන්ටද උරුමයේ අයිතිය ඇත (4:7)
24. අනාථ දරුවන්ගේ දේපළ ගිල නොදමන්න (4:10)
25. අනාථ දරුවන් ආරක්ෂා කරන්න (2:220)
26. එකිනෙකාගේ ධනය අසාධාරණ ලෙස පරිභෝජනය නොකරන්න (4:29)
27. මිනිසුන් අතර සමථයකට පත් වීමට උත්සාහ කරන්න (49:9)
28. සැකයෙන් වළකින්න (49:12)
29. අවශ්‍ය විටකදී සාක්ෂිය නොසැඟවිය යුතුයි (2:283)
30. ඕපාදූප කතා නොකරන්න (49:12)
31. ධනය දානයට වියදම් කරන්න (57:7)
32. දුප්පතුන්ට ආහාර දීම දිරිමත් කරන්න (107:3)
33. අවශ්‍යතා ඇති අයට (ඔවුන් සොයා ගෙන ගොස්) උදව් කරන්න (2:273)
34. අධික ලෙස මුදල් වියදම් නොකරන්න (17:29)
35. දන් දීපු දෙය නැවත නැවත කීම මගින් එහි ඵලවිපාක අවලංගු කර නොගන්න (2:264)
36. අමුත්තන්ට ගෞරව කරන්න (51:26)
37. ඔබ එය කිරීමෙන් පසුව පමණක් මිනිසුන්ට දැහැමිකම නියම කරන්න (2:44)
38. පොළොවේ අපයෝජන නොකරන්න (2:60)

39. පල්ලිවලින් මිනිසුන් වළක්වන්න එපා (2:114)
40. ඔබ සමඟ සටන් කරන අය සමඟ පමණක් සටන් කරන්න (2:190)
41. යුද්ධයේ ආචාර ධර්ම පිළිපදින්න (2:191)
42. සටනේදී ආපසු නොයන්න (8:15)
43. ආගමේ බල කිරීමක් නැත (2:256)
44. සියලුම අනාගතවක්තෘවරුන් විශ්වාස කරන්න (2:285)
45. ඔසප් කාලය තුළ ලිංගික සංසර්ගයේ යෙදෙන්න එපා (2:222)
46. ඔබේ දරුවන්ට සම්පූර්ණ අවුරුදු දෙකක් මව්කිරි දෙන්න (2:233)
47. නීති විරෝධී ලිංගික සංසර්ගයට පවා ළං නොවන්න (17:32)
48. ඔවුන්ගේ කුසලතාවයෙන් පාලකයන් තෝරන්න (2:247)
49. පුද්ගලයෙකුට ඔහුගේ සීමාවට වඩා බරක් පටවන්න එපා (2:286)
50. බෙදී නොයන්න (3:103)
51. මේ විශ්වයේ අරුමපුදුම දේ සහ නිර්මාණය ගැන ගැඹුරින් සිතන්න (3:191)
52. පිරිමින්ට සහ කාන්තාවන්ට ඔවුන්ගේ ක්‍රියාවන්ට සමාන විපාක ලැබේ (3:195)
53. ඔබේ ලේ නෑයන් සමඟ විවාහ නොවන්න (4:23)
54. පවුල මෙහෙයවිය යුත්තේ පිරිමින් විසිනි (4:34)
55. මසුරු නොවන්න (4:37)
56. ඊර්ෂ්‍යාව තබා නොගන්න (4:54)
57. එකිනෙකා මරා නොගන්න (4:92)
58. වංචාවට පක්ෂපාතී නොවන්න (4:105)
59. පාපයට සහ ආක්‍රමණයට සහයෝගය නොදක්වන්න (5:2)
60. ධර්මිෂ්ඨකමට සහයෝගය දක්වන්න (5:2)
61. බහුතරය තිබීම' සත්‍යයේ නිර්ණායකයක් නොවේ (6:116)
62. සාධාරණ වන්න (5:8)
63. අපරාධ සඳහා ආදර්ශමත් ආකාරයකින් දඬුවම් කරන්න (5:38)
64. පාපකාරී සහ නීති විරෝධී ක්‍රියාවන්ට එරෙහිව සටන් කරන්න (5:63)
65. මළ සතුන්, රුධිරය, ඌරු මස් තහනම්ය (5:3)

66. මත් ද්‍රව්‍ය සහ මත්පැන් වලින් වළකින්න (5:90)
67. සූදුව නොකරන්න (5:90)
68. අන් අයගේ දෙවිවරුන්ට අපහාස නොකරන්න (6:108)
69. මිනිසුන් වංචා කිරීම සඳහා බර හෝ මිනුම අඩු නොකරන්න (6:152)
70. කන්න බොන්න, නමුත් අධික ලෙස නොසිටින්න (7:31)
71. යාඥා වේලාවන්හිදී හොඳ වස්ත්‍ර පළඳින්න (7:31)
72. ආරක්ෂාව පතන අයව ආරක්ෂා කර උදව් කරන්න (9:6)
73. පාරිශුද්ධත්වය තබා ගන්න (9:108)
74. අල්ලාහ්ගේ දයාව කෙරෙහි කිසි විටෙකත් බලාපොරොත්තු අත් නොහරින්න (12:87)
75. නොදැනුවත්කම නිසා වැරදි කළ අයට අල්ලාහ් සමාව දෙනු ඇත (16:119)
76. දෙවියන් වහන්සේ වෙත ආරාධනා කිරීම ප්‍රඥාවෙන් හා යහපත් උපදෙස් සහිතව විය යුතුය (16:125)
77. කිසිවෙකු අන් අයගේ පාපයන් දරා නොගනු ඇත (17:15)
78. දුප්පත්කමට බියෙන් ඔබේ දරුවන් මරා නොදැමිය යුතුය (17:31)
79. ඔබට දැනුමක් නොමැති දේ අනුගමනය නොකරන්න (17:36)
80. නිෂ්ඵල දේවලින් ඈත් වන්න (23:3)
81. අවසර නොලබා අන් අයගේ නිවෙස්වලට ඇතුළු නොවන්න (24:27)
82. අල්ලාහ් කෙරෙහි පමණක් විශ්වාස කරන අයට අල්ලාහ් ආරක්ෂාව සපයනු ඇත (24:55)
83. නිහතමානීව පොළොවෙහි ගමන් කරන්න (25:63)
84. මෙලොව ඔබේ කොටස නොසලකා හරින්න එපා (28:77)
85. අල්ලාහ් සමඟ වෙනත් කිසිදු දෙවියෙකුට ආයාචනා නොකරන්න (28:88)
86. සමලිංගික සේවනයේ නොයෙදෙන්න (29:29)
87. යහපත අණ කරන්න, අයහපත තහනම් කරන්න (31:17)
88. පොළොව පුරා අහංකාර ලෙස ගමන් නොකරන්න (31:18)
89. කාන්තාවන් තම අලංකාරය ප්‍රදර්ශනය නොකළ යුතුය (33:33)

90. අල්ලාහ් විශ්වාසවන්තයින්ගේ සියළු පාප වලට වුව සමාව දීමට තරම් කාරුණික කෙනෙකි, අල්ලාහ්ගේ කරුණාව ගැන බලාපොරොත්තු සුන් නොකරන්න (39:53)
91. යහපතෙන් නපුර පලවා හරින්න (41:34)
92. සාකච්ඡා කිරීමෙන් කටයුතු තීරණය කරන්න (42:38)
93. ඔබ අතරින් උතුම්ම තැනැත්තා ඉතාමත් දැහැමියාය (49:13)
94. ආගමේ පැවිද්දක් නැත (57:27)
95. දැනුම ඇති අයට අල්ලාහ් උසස් තනතුරක් ලබා දෙනු ඇත (58:11)
96. මුස්ලිම් නොවන අයට කරුණාවන්තව හා සාධාරණව සලකන්න (60:8)
97. තණ්හාවෙන් ඔබව ගලවා ගන්න (64:16)
98. අල්ලාහ්ගෙන් සමාව අයදින්න. ඔහු සමාව දෙන හා කරුණාවන්ත කෙනෙකි (73:20)
99. ඉල්ලන්නෙකුට පිටුපාන්න එපා (93:10)
100. ජාතිවාදී භාවයකින් තොරවම නීතිය අකුරටම පිළිපදින්න (5:8)

---

# අල් කුරාණය: පරිච්ඡේද වල නම්, අංක, පිටු අංක, වැකි ගනණ, පහළ වූ ස්ථාන.

පටුන: කෙටි යෙදුම්

- පහළ වීම
- මක්කා (Makki surath) [mk]
- මදීනා (Madani surath) [md]
- ස්ථානය සැක සහිත (Disputed surath) [D]
- ජුස් ආරම්භය {Juz}
- වැකි ගනණ : [v_ ]

පරිච්ඡේද අංක නම පිටු අංක වැකි ගනණ පහළ වූ ස්ථාන ජුස් ආරම්භය

1. - අල් ෆාතිහා 1-1 [v7] [D]{1Juz1;1}
2. - අල් බකරා (එළදෙන) 2-49 [v286] [md]{2Juz141&3Juz253}
3. - ආල ඉම්රාන් 50-76 [v200] [md]{4Juz93}
4. - අන්නිසා (කාන්තාවන්) 77-106 [v176] [md]{5Juz24&6Juz148}
5. - අල් මායිදා (ආහාර බන්දේසිය) 106-127 [v120] [md]{7Juz82}
6. -අල් අන්ආම් (එළු,ගව,ඔටුවන් වැනි සතුන්) 128-150 [v165] [mk]{8Juz111}
7. - අල් අරාෆ් (සීකරය) 151-176 [v206] [mk]{9Juz88}
8. - අල් අන්ෆාල් (යුද්ධාජීද වස්තූන්) 177-186 [v177] [md]{10Juz41}
9. - අත්තව්බා (පසුතැවිල්ල) 187-207 [v129] [md]{11Juz93}
10. - යූනුස් 208-221 [v109] [mk]
11. - හූද් 221-235 [v123] [mk]{12Juz6}
12. - යූසුෆ් 235-248 [v111] [mk]{13Juz53}
13. - අර් රඅද් 249-255 [v43] [D]
14. - ඉබ්‍රාහීම් 255-261 [v52] [mk]
15. - අල් හිජ්ර් (ගල් තලාව) 261-266 [v99] [mk]{14Juz1}
16. - අන්නහ්ල් (මී මැස්සා) 266-281 [v128] [mk]
17. -අල් ඉස්රා (ඉස්රායීල පරම්පරාවේ දරුවන්) 282-293 [v111] [mk]{15Juz1}.
18. - අල් කහ්ෆ් (ගුහාව) 293-304 [v110] [mk]{16Juz75}
19. - මරියම් 305-312 [v98] [mk]
20. - තා හා 312-321 [v135] [mk]
21. - අල් අන්බියා (නබිවරුන්) 322-331 [v112] [mk]{17Juz1}.
22. - අල් හජ් (වන්දනාව) 332-341 [v78] [mk]
23. - අල් මුඋ මිනූන් (විශ්වාසවන්තයින්) 432-349 [v118] [mk]{18Juz1}
24. - අල් නූර් (ආලෝකය) 350-359 [v64] [md]
25. -අල් ෆුර්කාන් (පින් පව් වෙන් කර දැනුම් දෙන) 359-366 [v77] [mk]{19Juz21}

26.- අල් ෂුඅරාඋ (කිවිදියන්) 376-376 [v227] [mk]
27.- අල් නම්ල් (කුහුඹුවා) 377-385 [v93] [mk]{20Juz56}
28.- අල් කසස් (ඉතිහාසය) 385-396 [v88] [mk]
29.- අල් අන්කබූත් (මකුළුවා) 396-404 [v69] [mk]{21Juz46}
30.- අර් රූම් (රෝමවරුන්) 404-410 [v60] [mk]
31.- ලුක්මාන් 411-414 [v34] [mk]
32.- අස් සජදා (නළල බිම තබා නැමදීම) 415-417 [v30] [mk]
33.- අල් අහ්සාබ් (සහායයන්) 418-427 [v73] [md]{22Juz32}
34.- සබා (නගරය) 428-434 [v54] [mk]
35.- ෆාතිර් (උත්පාදකයා) 434-440 [v45] [mk]
36.- යාසීන් 440-445 [v83] [mk]{23Juz28}
37.- අස්සාෆ්ෆාත් (පෙළ ගැසී ඇති කණ්ඩායම්) 446-452 [v182] [mk]
38.- සාද් 453-458 [v88] [mk]
39.- අල් සුමර් (සමූහයන්) 458-467 [v75] [mk]{24Juz32}
40.- සාෆිර් (විශ්වාස කරන්නා) 467-476 [v85] [mk]
41.- හා. මීම්. අල් සජ්දා (ෆුසිලත්) 477-482 [v54] [mk]{25Juz47}.
42.- අෂ්ෂූරා (සාකච්ඡාව) 483-489 [v53] [mk]
43.- අස්සුරූෆ් (රණ් ආභරණ) 489-495 [v89] [mk]
44.- අද්දුකාන් (දුමාරය) 496-498 [v59] [mk]
45.- අල් ජාසියා (දණින් වැටීම) 499-502 [v37] [mk]
46.- අල් අහ්කාෆ් (වැලි කඳු) 502-506 [v35] [mk]{26Juz1}
47.- මුහම්මද් 507-510 [v38] [md]
48.- අල් ෆත්හ් (ජයග්‍රහණයන්) 511-515 [v29] [md]
49.- අල් හුජුරාත් (කාමර) 515-517 [v18] [md]
50.- කාෆ් 518-520 [v45] [mk]
51.- අද්දාරියාත් (සුළි සුළං) 520-523 [v60] [mk]{27Juz31}
52.- අත්තූර් (කන්ද) 523-525 [v49] [mk]
53.- අන්නජ්මු (තාරකාවන්) 526-528 [v62] [mk]
54.- අල් කමර් (චන්ද්‍රයා) 528-531 [v55] [mk]

55.- අර්රහ්මාන් (අප්‍රමාණ දයාවන්තයා) 531-534 [v78] [D]
56.- අල් වාකිආ (අති විශාල සිද්ධිය) 534-537 [v96] [mk]
57.- අල් හදීත් (යකඩ) 537-541 [v29] [md]
58.- අල් මුජාදලා (තර්කය) 542-545 [v22] [md]{28Juz1}
59.- අල් හෂ්ර් (ඒකරාශී කිරීම) 545-548 [v24] [md]
60.- අල් මුම්තහනා (පරීක්ෂා කිරීම) 549-551 [v13] [md]
61.- අස් සාෆ් (බළ ඇණි) 551-552 [v14] [D]
62.- අල් ජුම්ආ (සිකුරාදා) 553-554 [v11] [md]
63.- අල් මුනාෆිකූන් (වංචනිකයින්) 554-555 [v11] [md]
64.- අත්තකාබූන් (අඩුලුහුඩුකම්) 556-557 [v18] [md]
65.- අත් තලාක් (දික්කසාදය) 558 [v12] [md]
66.- අත් තහ්රීම් (තහනම් කිරීම) 559-561 [v12] [md]
67.- අල් මුල්ක් (රාජ්‍ය පාලනය) 562-564 [v30] [mk]{29Juz1}
68.- අල් කලම් (පෑන) 564-566 [v52] [mk]
69.- අල් හාක්කා (සත්‍ය සිද්ධිය) 566-568 [v52] [mk]
70.- අල් මආරීජ් (උසස් මාර්ගය) 568-570 [v44] [mk]
71.- නූහ් 570-571 [v28] [mk]
72.- අල් ජින් (ජින්වරුන්) 572-573 [v28] [mk]
73.- අල් මුසම්මිල් (පොරවාගත් තැනැත්තා) 574-575 [v20] [mk]
74.- අල් මුද්දසීර් (පොරවාගෙන සිටින්නා) 575-577 [v56] [mk]
75.- අල් කියාමා (විනිශ්චය දිනය) 577-578 [v40] [mk]
76.- අල් ඉන්සාන් (කාලය) 578-580 [v31] [md]
77.- අල් මුර්සලාත් (යවනු ලබන දෑය) 580-581 [v50] [mk]
78.- අන්නබා (අති ශ්‍රේෂ්ඨ පුවත) 582-583 [v40] [mk]{30Juz1}
79.- අන්නාසිආත් (තදින් උදුරා ගන්නෝ) 583-584 [v46] [mk]
80.- අබස (කෝපයෙන් වෙව්ලන්නට වූවේය) 585 [v42] [mk]
81.- අත්තක්වීර් (මැකී යාම/ හැකිළී යාම) 586 [v29] [mk]
82.- අල් ඉන්ෆිතාර් (පිපිරී යාම) 587 [v19] [mk]
83.- අල් මුතෆ්ෆිෆීන් (මිනුමෙහි වංචා කිරීම) 587-589 [v36] [mk]

84.- අල් ඉන්ෂිකාක් (පැළී දෙකඩ වීම) 589 [v25] [mk]
85.- අල් බුරූජ් (ග්‍රහ මණ්ඩල) 590 [v22] [mk]
86.- අත් තාරික් (අළුයම තාරකාව) 591 [v17] [mk]
87.- අල් ආලා (අති ශ්‍රේෂ්ඨයෙකි) 591-592 [v19] [mk]
88.- අල් ඝාෂියා (වටකර ගැනීම) 592 [v26] [mk]
89.- අල් ෆජ්ර් (අළුයම කාලය) 593-594 [v30] [mk]
90.- අල් බලද් (නගරය) 594 [v20] [mk]
91.- අෂ් ෂම්ස් (සූර්යයා) 595 [v15] [mk]
92.- අල් ලයිල් (රාත්‍රිය) 596-597 [v21] [mk]
93.- අල් ලුහා (පෙරවරුව) 597 [v11] [mk]
94.- අලම් නෂ්රහ් (අපි විස්තීරණය කළේ නැද්ද?) 597 [v8] [mk]
95.- අත්තීන් (අත්තික්කා) 597 [v8] [mk]
96.- අල් අලක් (ලේ කැටිය) 597 [v19] [mk]
97.- අල් කද්ර් (ඉමහත් ගෞරවයෙන් යුත් රාත්‍රිය) 598 [v5] [mk]
98.- අල් බයියිනා (පැහැදිළි සාධකය) 598-599 [v8] [md]
99.- අල් සිල්සාලහා (භූමි කම්පාව) 599 [v8] [md]
100. අල් ආදියාත් (වේගයෙන් දුවන්නවුන්) 599-600 [v11] [mk]
101. - අල් කාරිආ (තිගැස්සෙන සුළු සිද්ධිය) 600 [v11] [mk]
102. - අත්තකාසුර් (තන්හාව) 600 [v8] [mk]
103. - අල් අස්ර් (කාලය) 601 [v3] [mk]
104. - අල් හුමසා (ඕපාදූප කීම) 601 [v9] [mk]
105. - අල් ෆීල් (ඇතා) 601 [v5] [mk]
106. - කුරයිෂ් (කුරයිෂිවරුන්) 602 [v4] [mk]
107. - අල් මාඋන් (අල්ප වස්තුව) 602 [v7] [mk]
108. - අල් කව්සර් (අප්‍රමාණ සැප සම්පත්) 602 [v3] [mk]
109. - අල් කාෆිරූන් (ප්‍රතික්ෂේප කරන්නන්) 603 [v6] [mk]
110. - අන්නස්ර් (අති මහත් උදව්ව) 603 [v3] [md]
111. - අල් ලහබ් 603 [v5] [mk]
112. - ඉඛ්ලාස් (ඒකීයත්වය) 604 [v4] [mk]

113. - අල් ෆලක් (අළුයම) 604 [v5] [mk]

114. - අන්නාස් (මිනිසුන්) 604 [v6] [mk]

**මක්කි සහ මදනී සූරා පිළිබඳව සටහනක්**

මොහම්මද් නබි (ﷺ) තුමානන් වෙත අල් කුරාණය පහළ වූයේ එකවර නොව. එය විටින් විට වසර 23ක කාලයක් තුල පහළ විය. එම වසර 23 හෙවත් එතුමා නබි කෙනෙකු ලෙස සිටින විට දී පළමු වසර 13 මක්කාවේද ඉතිරි වසර 10 මදීනාවේද ජීවත් විය. මක්කාවේ සහ මදීනාවේ සිටි කාලයන් වලදී එතුමා කෙටි කාලීන ගමන් ලෙස තම පදිංචි ප්‍රදේශයෙන් බැහැරව ගිය අවස්ථාද ඇත. මක්කාවේ සිටි කාලයේ ඉස්රාජ් ව මිහ්රාජ් නැමැති සුවිශේෂී ගමනද සිදු විය. අවසන් වසර 10 මදීනාවේ සිටියදීද මක්කාව ජයග්‍රහනය කිරීම සහ හජ් කටයුත්ත සඳහා කෙටි කාල වලට මක්කාවට පැමිනි අවස්ථාද ඇත. දිව්‍ය හෙළිදරව්වන් එම කාල වලදීද පහළ වී ඇත. එම නිසා වැකියෙන් වැකිය පහළ වූ ආකාරය ලෙස නොව, මෙය පරිච්ඡේද වශයෙන් පෙන්වන නිසා මෙම කුරාන් පරිච්ඡේද පහළ වීම බෙදා වෙන් කිරීමේදී සමහර වැකි සම්බන්ධවද සුළු සුළු වෙනස්කම් තිබිය හැක. මේ ගැන ඉස්ලාමීය විද්වතුන් ද විවිද මත පළ කර ඇත. අපගේ මට්ටමින් වටහා ගැනීමේ සහ අධ්‍යයනයේ පහසුවට ඉහතින් දක්වා ඇති සටහන මගින් අපට යම් අදහසක් ලබා ගැනීමට හැක.

මේවා මක්කි සූරා (82) සහ මදනි සූරා (20) ලෙස දෙකට වෙන්කර ඇත. නිශ්චිත නොවූ මත සහිත වෙන්ව දක්වන සූරා (12) ද ඇත.

විද්වතුන් මක්කී සහ මදනි සූරත් අර්ථ දැක්වීම් පහත ආකාර තුනෙන් එකකින් අර්ථ දක්වයි:

මක්කී යනු මක්කමේදී හෙළිදරව් කරන ලද දෙය වන අතර මදනි යනු මදීනාහිදී හෙළිදරව් කරන ලද දෙයයි;

මක්කී යනු මක්කමේ ජනතාව සම්බන්ද කරගෙන කතා කරන දෙය වන අතර මදනි යනු මදීනා ජනතාව සම්බන්ධ කර ගෙන කතා කරන දෙයයි;

මක්කී යනු හිජ්රාවට පෙර (මක්කම තුලදී හෝ මක්කමෙන් පිටත වුවද) හෙළිදරව් කරන ලද දෙය වන අතර මදනි යනු හිජ්රාවෙන් පසු (මදීනාවේදී හෝ ඉන් පිටත වුවද) හෙළිදරව් කරන ලද දෙයයි .

මක්කි පරිච්ඡේද අධ්‍යයනය කරන විට, ඒවා ප්‍රධාන වශයෙන් දෙවියන් වහන්සේගේ ඒකීයභාවය හෙවත් තව්හීද් පිළිබඳ විශ්වාසය ස්ථාපිත කර ශක්තිමත් කරන බව පෙනී යයි. කුර්ආනයේ මෙම මුල් පරිච්ඡේද මගින් මක්කා සමාජයෙන් රූප වන්දනාව දුරු කිරීමට සහ මුල් මුස්ලිම්වරුන්ගේ ඇදහිල්ල ශක්තිමත් කිරීම අදහස් කර ඇත. මෙම පරිච්ඡේද විනිශ්චය දිනය සහ නැවත නැඟිටීම පිළිබඳ සංකල්පය හඳුන්වා දෙයි. විනිශ්චය දිනයේදී සිදුවන භයානක සිදුවීම් පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදවලින් අපට හමු වේ. මෙම පද ඇදහිලිවන්තයන් සඳහා සදාකාලික වාසස්ථානය ලෙස ස්වර්ගය පොරොන්දු වන අතර, අවිශ්වාස කරන්නන් සඳහා සදාකාලික වාසස්ථානය ලෙස නිරය ගැන අනතුරු අඟවයි.

තවද, මක්කී පරිච්ඡේදවල අල්ලාහ් විසින් ඔවුන්ගේ ජනයා වෙත එවන ලද අනාගතවක්තෘවරුන්ගේ කථා කියයි, උදාහරණයක් ලෙස යූසුෆ්, ඉබ්‍රාහිම්, හූද්, යූනුස් යන පරිච්ඡේද. අනාගතවක්තෘවරුන් සහ ඔවුන්ව අවිශ්වාස කළ සහ ඔවුන්ට සමච්චල් කළ අය අතර සිදු වූ සංවාද පවා මෙම පදවල දැක්වේ.

සමස්තයක් වශයෙන්, මක්කී පරිච්ඡේදවල මදනී පරිච්ඡේදවල පදවලට වඩා කෙටි හා සංක්ෂිප්ත පද ඇති බව දැකිය හැක. තවද බොහෝ විට (නමුත් සියල්ලම නොවේ) පදවල කථාව {මිනිස් වර්ගයා} වෙත යොමු කරන විට, එම පරිච්ඡේදය මක්කී වේ. තවද {විශ්වාස කළ ඔබලා} වෙත යොමු කරන ලද කථාවේ පුනරාවර්තනයක් ඇති විට, එම පරිච්ඡේදය මදනී වේ.

මක්කි පරිච්ඡේද හඳුනා ගැනීමට උපකාරී වන තවත් ප්‍රධාන වචනයක් වන්නේ {No/ එසේ නොව හෝ නැත} යන වචනයයි, (අරාබි භාෂාවෙන් {kalla}), එය සාමාන්‍යයෙන් පදයේ ආරම්භයේ ඇත. එසේම, වැකි කියවීමේ අතර තුර සුජූද්, හෝ සජ්දා වෙත යන අවස්ථාව මක්කි පරිච්ඡේදවල පමණක් දක්නට ලැබේ. එය කුර්ආනයේ විවිධ පරිච්ඡේද වල 14 වතාවක් දක්නට ලැබේ.

මදනී පරිච්ඡේද සම්බන්ධයෙන් ගත් කල, මෙම පද මගින් මදීනාවේ මුස්ලිම්වරුන්ට නීත්‍යානුකූල දේ සහ තහනම් දේ උගන්වයි. නිදසුනක් වශයෙන්, මත්පැන් සහ පොලිය තහනම් කිරීම මදීනාවේ දී හෙළිදරව් කරන ලදී. රාමසාන් උපවාසය, වන්දනා ගමන් කිරීම, හිජාබ් පැළඳීම වැනි ඉස්ලාමයේ බැදීම් මදනී පරිච්ඡේදවල නියම කර ඇත.

මදනි පරිච්ඡේදවල ඇති පද මගින් සාධාරණ මුස්ලිම් සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය නීති ස්ථාපිත කරන අතර, සමාජයේ දුප්පතුන්, වැන්දඹුවන් සහ අනාථ දරුවන් වැනි දුර්වලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා බොහෝ පද හෙළිදරව් කරන ලදී. මදනි පරිච්ඡේදවල විවාහ සහ දික්කසාද නීති, උරුමය සහ ව්‍යාපාරික නීති අඩංගු වේ. මංකොල්ලකෑම් සහ මිනීමැරුම් වැනි වැරදි සඳහා දඬුවම් මදනි පරිච්ඡේදවල නියම කර ඇත.

මක්කී පරිච්ඡේද මගින් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් සහ පිළිම වන්දනාකරුවන් අතර සංවාදය ගෙනහැර දක්වන අතර, මදනි පරිච්ඡේද මගින් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් සහ දෙවිඳුන් මීට පෙර පහළ කළ ධර්මය හිමි ජනයා හෙවත් ග්‍රන්ථය හිමි ජනයා, (එනම් යුදෙව්වන් සහ ක්‍රිස්තියානීන්) අතර සංවාදය ගෙනහැර දක්වයි. කුහකයින් අමතන ඕනෑම පරිච්ඡේදයක් මදනි පරිච්ඡේදයක් වන අතර මුස්ලිම්වරුන් සහ අවිශ්වාස කරන්නන් අතර සටනක් අමතන ඕනෑම පරිච්ඡේදයක්ද මදනි පරිච්ඡේදයකි.

කුර්ආනය වෙළුම් තිහකට බෙදා ඇත. මෙම කොටස් තිහ පරා තිහ හෙවත් ජේද තිහ ලෙස හැඳින්වේ. අරාබි භාෂාවෙන් එය ජුස් ලෙස හැඳින්වේ. දකුණු ආසියාවේ මුස්ලිම්වරුන් අතර පැරා යන වචනය බහුලව දක්නට ලැබේ.

ජුස්' (අරාබි: جُزْء ජුස්, බහු වචන: أَجْزَاء ඇජැසා', වචනාර්ථයෙන් "කොටස" යන්නයි)

---

<u>මිනිසා සම්බන්ධව</u>

## දෙවියන් අපව නිර්මාණය කලේ ඇයි?

සර්වබලධාරී දෙවියන් කිසිවක් නිකරුනේ හේතුවක් නොමැතිව නිර්මාණ නොකල බව අල් කුරානය තුලින් අපට දන්වා ඇත. අල්ලාහ්ගේ එක් නමකි අල් හකීම්. එනම් ප්‍රඥාවන්තයා. එනිසා ඔහු යමක් නිර්මාණය කරන්නේ නම් ඒ පිටුපස සුවිශේෂී හේතුවක් තිබිය යුතුය. එසේම එම නිර්මානණයත් සුවිශේෂී නිර්මාණයක්ම විය යුතුය.

ඔබ නිවසින් පිටතට ගොස් ඔබට පුලුවන් නම් සුවිසේශී නොවන සහ මේ ලෝකයට උවමනා නැති දෙයක් හෝ සතෙක් හොයන්න බලන්න. ඔබට පුදුම හිතෙයි. එනම්, ඔබට එවැන්නක් හමු නොවේවි.

කූඹියෙක්, සමනලයෙක්, කුරුලු පිහාටුවක්, ජල බිංදුවක්, වල් පැලයක්, වැලි කැටයක්..., ඔබ අහුලන හෝ සොයා ගන්නා සෑම දෙයකම පුදුමාකාර නිර්මාණාත්මක සහ සැලසුම් සහගත බවක් ඔබ දකී. ඒ එකක්වත් ඉබේ නිර්මාණය විය හැකි දේවල් නොවේ. එතරම්ම ඒවායේ ව්‍යුහය සංකීර්ණයි. ඔබේ ශරීරයත් එසේමය. එක් මිනිසෙකුකේ මුළු සිරුරේම DNA වල සම්පූර්ණ දිග කිලෝමීටර බිලියන 575කට ආසන්න වේ. හිතා ගන්නත් බෑ නේද?

මිනිසෙක් වන ඔබවත් ඉබේ නිර්මාණය විය නොහැකියි. මිනිසාගේ ශරීරය පසින්ම නිර්මානය කර නැවත පසටම දිරාපත් වන සොබා දහමේ තවත් එක් දෙයක් පමනි. දෙවියන් මිනිසාගේ ආත්මය නිර්මාණය කලේ සුවිසේශී අරමුණක් සඳහාය. එය මිනිසා දැන ගත යුතුය. එය දැනගත හැකි එකම ක්‍රමය වන්නේ නිර්මාණ කරුගෙන්ම දැනගැනීමය. වෙන විකල්ප ක්‍රමයක් නැත.

දෙවියන් කුරානය තුලින් මිනිසාට දැනුවත් කර ඇති පහත වාක්‍යය කිහිපය දෙස හොඳින් බලන්න.

*අහස්ද, භූමියද, ඒවා අතර ඇති දෑයද (පුහු) සෙල්ලමක් සඳහා අපි නිර්මාණය කලේ නැත (කුරානය 44:38,21:16).*

*නියත වශයෙන්ම නිශ්චිත හේතුවක් සඳහාම මිස අපි මේවා උත්පාදනය කළේ නැත. (කුරානය44:39).*

*මනුෂ්‍යයිනි! ඔබ, ඔබවද ඔබට පෙර විසූ අයවද උත්පාදනය කළ ඔබගේ දෙවියන්වම නමදිනු. (එමඟින්) ඔබ පරිශුද්ධවන්තයින් විය හැක. (2:21)*

*"තවද, මම (අල්ලාහ්) ජින්වරුන් සහ මනුෂ්‍ය වර්ගයා මැව්වේ ඔවුන් මට (තනිවම) නමස්කාර කිරීමට මිස නොවේ".(කුරානය 51:56).*

මෙමගින් දෙවියන්වහන්සේ අපට පැහැදිළි ලෙසම කියා සිටින්නේ පිළිම, රූප, පුද්ගලයන්, ගින්දර, සූර්යයා වැනි දෑ නැමදීම් නොකල යුතු බවය. එසේම දෙවියන් වෙත ආහාර ලබාදීම, ඇඳුම්, මුදල් ආදිය පූජා කිරීම වැනි දෑ නොකළ යුතු බවය. දෙවියන් අපව උසස් කර ඇති ආකාරය පෙන්වා දෙයි.

*"අපි නුඹලාව නිකමට මැව්වෙමු යැයිද, නියතව නුඹලා අප හමුවට හරවනු නොලබන්නෝහු යැයිද සිතාගෙන සිටියෙහුද?" (කුරානය 23:115).*

*ඔබගෙන් කවුරුන් ක්‍රියාවන්ගෙන් ඉතාමත් අලංකාරවත් කෙනෙකුද යන්නෙහි ඔබව පිරික්සනු පිනිසම ඔහු ජීවිතයද මරණයද උත්පාදනය කර ඇත්තේය. (කුරානය 67:2)*

*(ඔහුම) තම නියෝජිතයින් වශයෙන් භූමියෙහි ඔබව පත්කර ඇත්තේය. තවද ඔබගෙන් සමහරෙකුව අනික් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමඟින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේ දැයි) ඔබව පිරීක්ෂා කරන්නේය. (6:165*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම අත් විඳින්නාහ. පින් පව් කරන තත්වයෙන් අපි ඔබව (තබා) පිරික්සන්නෙමු. පසුව ඔබ අප වෙතම ගෙන එනු ලබන්නෙහුය. (21:35)*

*කාන්තාවන්, දරුවන්, රණ් රිදී විශල පොදි, උසස් අශ්වයින් (එළු, බැටළු, ගව, ඔටුවන් වැනි) ගමේ සතුන්, ගොවිතැන් ආදිය මත ඉමහත් ආශාවක් ඇති කර ගැනීම මිනිසුන්ට අලංකාරවත් කර ඇත්තේය. එහෙත් මේවා (සියල්ල අස්ථාවර)*

*මෙලොව ජීවිතයෙහි (අල්ප) සැප සම්පත්ය! අල්ලාහ්ගේ සන්නිධානයෙහි නම්, (ස්ථිර වූ) අලංකාරවත් වාසස්ථානයක් ඇත. (3:14)*

*(මනුෂ්‍යයිනි!) ප්‍රාණයක් නොමැතිව තිබූ ඔබට ඔහුම පණ දී තිබියදී, ඔබ අල්ලාහ්ව කෙසේ නම් ප්‍රතික්ෂේප කරන්නෙහුද? ඉන් පසුවද ඔහුම ඔබව මරණයට පත් කරන්නේය, පසුවද ඔහුම ඔබට පණ දෙන්නේය. (ඉන්) පසුවද ඔබ (ඔබගේ කළකම් සඳහා ඵලවිපාක අත්කර ගැනීම සඳහා) ඔහු වෙතම (විනිශ්චය සඳහා) ගෙන එනු ලබන්නෙහුය. (2:28)*

*(එබැවින් මනුෂ්‍යයිනේ!) ඔබ ඔබගේ දෙවියන්ගෙන් සමාව දෙසටද, ස්වර්ගය දෙසටද ඉක්මන් කර යනු. එහි විස්තීරණය අහස් හා භූමියෙහි විස්තීරණය මෙන්ම ඇත්තේය. එය අල්ලාහ්වද, ඔහුගේ දූතයින්වද විශ්වාස තැබූවන් වෙනුවෙන්ම පිළියෙල කරණු ලැබ ඇත්තේය. එය අල්ලාහ්ගේ වරප්‍රසාදයකි. එය ඔහු කැමති (හොඳ) අයටම ලබා දී ඇත්තේය. අල්ලාහ් ඉමහත් වූ දයාබරවන්තයෙකි. (කුරානය 57:21).*

*නියත වශයෙන්ම ප්‍රතික්ෂේප කරන්නන්ට නිරයම අප පිළියෙල කර ඇත්තෙමු. (කුරානය 18:102)*

ඉහත කුරාන් වැකි කිහිපයට අනුව අපට පහත ආකාරයේ සරල අදහසක් ගත හැක.

අල්ලාහ් අදහස් කර අපිව නිර්මාණය කර මේ ලෝකය තුල අපට ජීවිත කාලයක් ලබා දී, එම කාලය තුල අපි ඔහුව විශ්වාස කල අය ලෙස සිටිනවාද, නැත්නම් ඔහුව ප්‍රතික්ෂේප කල අය ලෙස සිටිනවාද, කවුරුන් යහපත් ලෙසට සහ කවුරුන් අයහපත් ලෙසට ඉන්නවාද යන්න පරීක්ෂාවකට ලක් කර ඇති බවත්, ඉන් ජයග්‍රහනය කරන්නන්ට අනර්ඝ වූ ස්වර්ගයත්, පරාජිතයන්ට වේදනාකාරී නිරයත් සදාකලයටම උරුම කර දෙන ලෙසත් දන්වා ඇත.

දැන් අල්ලාහ් ගැන, ඔහුගේ දේව දූතයන් ගැන, ඔහුගේ පණිවිඩ ගැන නොදන්නා කෙනෙකුට මෙහෙම සාධාරණ ප්‍රශ්නයක් පැන නගින්න පුලුවන්. ඔහු එය

මෙලෙස ප්‍රශ්නයක් විදිහට ඉදිරිපත් කරන්න පුලුවනි. (එම ප්‍රශ්නයට ලැබෙන පිළිතුරෙන් ඔබ පුදුම වනු ඇතැයි මම විශ්වාස කරමි. ඉදිරියට කියවන්න).

ප්‍රශ්නය:- "මට මෙහෙම ජීවිතයක් ඕනිත් නෑ, ස්වර්ගයක් ඕනිත් නෑ, අපායක් ඕනිත් නෑ. දෙවියන් කුමටද මාව මේ තත්වෙට පත් කලේ? එහෙම නොකර ඉන්න තිබුනානෙ? එහෙම නම් මේ කිසිම ප්‍රශ්නයක් නැහැනෙ"? [*ප්‍රශ්නය නම් සාධාරණයි].

ඇත්තටම මේක Game එකක් වගේ. ජීවිතය දිනුවොත් අනන්ත සැප සහිත ස්වර්ගය තම වාසස්ථානය බවට පත් වෙනවා. පරාජ උනොත් අන්ත දුක්ඛිත නිරය තම වාසස්ථානය වෙනවා.

අපි දැන් බලමු මේ සම්බන්ධයෙන් දෙවියන් මොනවද කියලා තියෙන්නේ කියලා.

*නියත වශයෙන්ම "(අපගේ) වගකීම උසුලාගන්නෙහුද? යි අපි අහස්, භූමිය හා කඳු ආදියෙන් විමසුවෙමු. එයට ඒවා, ඒ ගැන බිය වී එය උසුලා නොගෙන ඇත් වූවේය. එවැන්නක්ම මිනිසා උසුලා ගත්තේය. (එබැවින්) නියත වශයෙන්ම ඔහු නොදැනුවත්කම නිසා තමන්ට තමන්ම හානියක් කරගත්තේය. (කුරානය 33:72)*

*(එවැනි වගකීමක් භාරගෙන එයට වෙනස් ආකාරයකින් කටයුතු කරන) වංචනික පිරිමින්ටද, ගැගැනුන්ටද නියත වශයෙන්ම අල්ලාහ් දඬුවම් කරනු ඇත. (එම වගකීම සැලකිල්ලට ගෙන කටයුතු කරන) විශ්වාසවන්තයින් වන පිරිමින්ටද, ගැහැනුන්ටද ඔවුන්ගේ වැරදි වලට සමාව දී) ඔවුන් දෙස දයාවෙන් යුතුව බලන්නේය. අල්ලාහ් ඉතාමත් ක්ෂමා කරන්නෙකු හා කරුණාවන්තයෙකු වශයෙන් සිටින්නේය. (කුරානය 33:73).*

අල්ලාහ් ඉහත සඳහන් කරනුයේ පෘතිවියේ නියෝජිතයෙකු ලෙස අල්ලාහ්ගේ වගකීම භාරගන්න කැමතිදැයි මිනිසුන්, අහස, භූමිය හා කඳු ආදියෙන් (අපි මෙම ජීවමාන ස්වභාවයට පත්වීමට පෙර -වෙනස් ස්වරූපයකින් සිටි අවස්ථාවකදී) ඇසූ බවය. (ඉහත අවස්ථාවේ සිටි වෙනස් ස්වරූපය සමහර විට විනිශ්චය දිනදී

දෙවියන් අපට පෙන්වීමට ඉඩ ඇත). අල්ලාහ් සර්වබලධාරීය. ඔහුට ඕනම දෙයක් කල හැක.

දැන් පැහදිලියි අල්ලාහ් අපව මිනිසුන් ලෙස නිර්මානය කලේ ඇයි කියලා.

එනම් "අප යනු - අපි විසින්ම බාරගත් අභියෝගයක ප්‍රතිඵලයකි."

අප අල්ලාහ්ගේ වගකීම භාරගත් අවස්ථාවේ අල්ලාහ් අපගේ දෙවියන් බවට අප සාක්ශි දරා ඇත. (සමහර විට මේවා අපට විනිශ්චය දිනදී දැක බලා ගත හැක. අප දැන් පරීක්ෂණයට මුහුන දෙමින් සිටින නිසා සමහර කරුනු අපෙන් වසන් කර ඇත).

එම සාක්ෂි දැරීම අපගේ "හෘද සාක්ෂිය" ලෙස අප තුල ස්ථාපනය කර ඇත. එනම් අප සියලු දෙනාගෙම හදවත් තුල දෙවියන් පිලිබඳ අදහස ඇත. ඕනෑම පුද්ගලයෙක් ඉතාම අසරන වූ විටෙක ඔහු හෝ ඇය රහසින් හෝ දෙවියන්ගෙන් පිහිට ඉල්ලනුයේ මෙනිසාය. අපේ නිර්මාතෘ හා අප අතර සුවිශේෂී සන්නිවේදන සම්බන්ධතාවයක් ඇත. අපට ඍජුවම ඔහු හා සම්බන්ධ විය හැක. කිසිම අතරමැදියෙකුගෙන් තොරවම අපේ දුක ඔහුට පැවසිය හැක. මේ ස්වභායවට ඉස්ලාමය තුල කියන්නේ "දීන් අල්-ෆිත්රා" කියලයි. එනම් සහජ ස්වභාවය. සෑම දරුවෙකුම උපදින්නේ මේ "දීන් අල්-ෆිත්රා" ස්වභාය සමගිනි. සමහරු පසුකාලීනව ඉන් වෙනස් වෙනවා. නමුත් හදවතට තට්ටු කලොත් නැවත එය මතුකර ගත හැක.

මෙම කුරාන් වැකිය තුලින් අල්ලාහ් ඒ බව අපට මතක් කර සිටී;

අල්ලාහ් ඉහත සඳහන් කරනුයේ පෘතිවියේ නියෝජිතයෙකු ලෙස අල්ලාහ්ගේ වගකීම භාරගන්න කැමතිදැයි මිනිසුන්, අහස, භූමිය හා කඳු ආදියෙන් (අපි මෙම ජීවමාන ස්වභාවයට පත්වීමට පෙර -වෙනස් ස්වරූපයකින් අපව මවා සිටි අවස්ථාවකදී) ඇසූ බවය. ඉහත අවස්ථාවේ සිටි වෙනස් ස්වරූපය සමහර විට විනිශ්චය දිනදී දෙවියන් අපට පෙන්වීමට ඉඩ ඇත. අල්ලාහ් සර්ව බලධාරීය. ඔහුට ඕනම දෙයක් කල හැක.

*නබියේ, ඔබගේ දෙවියන් ආදම්ගේ පරම්පරාවේ දරුවන් වන ඔවුන්ගේ පිටකොන්දෙන් ඔවුන්ගේ පරම්පරා දරුවන්ව ඉකුත් කර, ඔවුන් තමන්වම ඔවුන්ට සාක්ශියක් වශයෙන්ද තබා (ඔවුන්ට) "මා ඔබගේ දෙවියන් නොවේද"? යි විමසූ විට, "ඇත්තෙන්ම (ඒ ආකාරයටම) අපි සාක්ශි දරන්නෙමු" යැයි ඔවුන්ගේ පැවසීම (ඔබ ඔවුන්ට) මතක් කර දෙනු. (මන්දයත් මෙය කිසිවෙකුත් මතක් කර නොදුන් බැවින්) නියත වශයෙන්ම අපි මෙය අමතක කර දමා නොසැලිකිලිමත්ව සිටියෙමු" යැයි පරලොව දිනදී ඔවුන් නොකියා සිටීම සදහාද..,(7:172)*

අල්ලාහ් අපව නිර්මාණය කර අපට නබිවරු හරහා ජීවන මාර්ගෝපදේශයන්ද එවා ඇත.

එනිසා මිනිසුන් වන අප භාරගෙන තියෙන මෙම "අභියෝගාත්මක පරීක්ෂණයක් සහිත මිනිස් ජීවිතය" තුලින් කෙසේ හෝ ජයග්‍රහනය කර අනර්ඝ වූ ස්වර්ගය හිමිකර ගන්න උත්සහ කල යුතුයි. එය නම් උතුම් වූ නිර්වාණ සම්පත්තියකි.

*(නබියේ!) "කවුරුන් (මෙම ධර්මය) විශ්වාස කර, (මෙහි සඳහන්ව ඇති අන්දමට) දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම (ස්වර්ගයන්හී) දිය දහරා සදාකල් ගලමින් ඇති උයන් වතු ඇත" යැයි ඔබ සුභාරංචි දෙනු මැනව (2:25)*

මතක තබා ගන්න; පැරදුනොත් සදාකල් නිරාවාසියෙකු වන තරමේ අති භයානක් තත්වයකයි අපි මේ ඉන්නෙ. සෙල්ලමක් නොවෙයි මේ ජීවිතය.

පැහැදිලි කිරීමක්...

මේ වගකීම මෙතරම්ම බරපතල උනේ ඇයි ?

"ජයග්‍රහනය කලොත් සදාකල් ස්වර්ගය, පරාජය උනොත් සදාකල් නිරය".

ඔබ දන්නවා මිනිසුන් සතුන්ට වඩා සුවිශේෂී බවක් පෙන්නුම් කරන බව. ඔබ අලුත්ම වනාන්තරයකට සතුන් සියයක් අතහැර වසර කිහිපයකට පසු ගොස් නැවත එම වනාන්තරය දෙස බලන්න. එහි ලොකු වෙනසක්, පරිසර දූෂණයක් ඔබ නොදකීවි.

සතුන් සියය වෙනුවට මිනිසුන් සියයක් එම කැලයටම අතහැර වසර කිහිපයකට පසු බැලුවොත් එම කැලය ඔවුන් විසින් වෙනස් කර ඇති බවක් ඔබ දකීවි. මේ තමයි මිනිසුන් සහ සතුන් අතර වෙනස.

*ඔහුම (තම) නියෝජිතයින් වශයෙන් භූමියෙහි ඔබව පත් කර ඇත්තේය. තවද ඔබගෙන් සමහරෙකුව අනිත් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමගින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේදැයි) ඔබව පරීක්ෂා කරන්නේය; (6:165)*

අල්ලාහ් කුරානයෙන් මේ කාරනාව මෙසේත් සඳහන් කර තිබෙනවා.

*නියත වශයෙන්ම අපි මිනිසාව ඉතාම ලක්ෂණ ස්වරූපයෙන් උත්පාදනය කර ඇත්තෙමු. (ඔහුගේ නපුරු ක්‍රියාවන් හේතුවෙන්) පසුව ඔහුව දීන වූවන්ගෙනුත් දීන වූවෙකු (නිරාවාසියෙකු) බවට අපි පත්කර හරින්නෙමු, එහෙත්, කවුරුන් විශ්වාසය තබා දැහැමි ක්‍රියාවන් කරමින් සිටින්නෝද, ඔවුන් හැර. ඔවුන්ට (සදාකල්ම) නොවැලැක්වෙන හොඳ ඵලවිපාක (ස්වර්ගයන්හී) ඇත. (95:4,5,6)*

දැන් අපි බලමු ඉහත සඳහන් මිනිසාගෙ "ඉතාමත් ලක්ෂන ස්වරූපය" යනු කුමක්ද කියා.

මිනිසාට (සහ ජින් වරුන්ට) තරම් ස්වයං තීරන ගැනීමේ හැකියාව අල්ලාහ් මේ ලෝකයේ වෙන කිසිවෙකුට ලබා දී නැත. දේව දූත මලායිකා වරුන්ටද එම හැකියාව දී නැත.

මේ ලෝකයේ නියෝජිත භාවය ලබා දී ඇත්තේ මිනිසාටය.

ශාක සහ සතුන් අදිය යම් සීමා රාමු මත කොටු කර ඇති නමුත් මිනිසාට බොහෝ අවස්ථා විවරකර දී ඇත. අහස, පොලොව, මුහුද, ගංගා, සතුන්, ශාක ආදී සියල්ල මිනිසාගේ භාවිතයට නතුකර දී ඇත.

මිනිසාට තරම් බුද්දිමත් භාවයත්, මොලයේ ධාරිතාවයත්, සිතීමේ ශක්තියත්, විතක්ෂනශීලී හැකියාවත්, විචාර බුද්ධියත් වෙන කිසිවෙකුට අල්ලාහ් ලබා දී නැත.

මිනිසාට තරම් බොහෝමයක් කටයුතු කිරීමට හැකි අත් පා සහිත ශරීරයක් වෙන කිසිම සත්වයෙකුට ලබා දී නැත. බලන්න, ඔලිම්පික් ක්‍රීඩා වලදී මිනිසා දක්වන දස්කම් පරාස කෙතරම් ද කියා.

මිනිසාට තරම් භාන්ඩ නිර්මාණය කරගැනීමේ හැකියවද අන් ජීවීන්ට ලබා දී නැත. මිනිසාට තරම් භාශාමය සන්නිවේදන හැකියාවකුත් අන් ජීවීන්ට ලබා දී නැත.

මිනිසාට මෙන් ඇඳුම් සහ ආභාරණ භාවිතයෙන් රුව අලංකාරවත් කරගැනීමේ අවස්ථාවද අන් ජීවීන්ට උරුම කර දී නැත.

මිනිසාට තරම් දැකීමෙන්, රසයෙන්, ආග්‍රාහනයෙන්, ස්පර්ශයෙන් හැඟීම් දැනීම් ලබා ගැනීමේ හැකියාවත්, ආදරය, කරුණාව, මෛත්‍රිය, ප්‍රාර්ථනා වැනි යහ ගුණාංග මතද වෛරය ක්‍රෝධය ඊර්ශියාව, කුහකකම වංචනිකකම ආදී අයහපත් ගුණාංග මත හැසිරීමේ නිදහස සහ පරාසයද මිනිසාට (සහ ජින් වරුන්ට) තරම් අන් ජීවීන්ට ලබා දී නැත.

මේ ආකාරයට මිනිසාව ඉතා ලක්ෂන ස්වරූපයෙන් නිර්මාණය කර ඔහුව මෙලොව නියෝජිතයා කර තව වරප්‍රසාදයන්ද බොහෝමයක් ලබා දී තම ජීවිත කාලය තුල යහපත් ලෙස ජීවත් වෙන්න කියා මාර්ගෝපදේශද, මග පෙන්වන්නන්ද එවා සියල්ල සම්පූර්ණ කර දෙවියන් මිනිසාව නිකම්ම අතහැර දාවි කියා ඔබ හිතනවාද?

මෙලොව මේ සියල්ල ලබා දී මරනින් මතු වෙන කිසිවෙකුට හිමි නොවන සදාකල් සැනසීම ඇති ස්වර්ගයන්ද ලබා දී දෙවියන්ගේ සිත දිනාගත්තවුන් ලෙස සදාකල්ම සිටීමේ අවස්ථාවත් දීමට තමයි මේ Game එක මේ තරම් බැරෑරුම් කර ඇත්තේ.

ඉතින් ඔබ දෙවියන්වත් ඔහුගේ මාර්ගෝපදේශයත් ඔහු විසින් එවන ලද නබිවරයාවත් ප්‍රතික්ෂේප කරමින්, ඔබ දෙවියන්ට දුන් පොරොන්දුවත්, විශ්වාසයත් කඩ කරමින් අභාග්‍යයවන්තයෙක් වෙනවාද? නැත්නම් ස්වර්ගවාසියෙක් වීමට උත්සහ ගන්නවාද? තීරණය ඔබ සතුයි.

මම ඔබට එක ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා...,

ඔබ විසින් ලොකු මහත් කල ඔබේ දරුවා ඉතාමත් ලස්සන, ඉතාමත් උගත්, ඉතාමත් පරිත්‍යාගශීලී, ඉතාමත් පොහොසත්, ඉතාමත් ජනප්‍රිය කෙනෙකු යැයි සිතන්න. ඔහු ඔබට අම්මා හෝ තාත්තා නොකියා පිටස්තරයෙකුට අම්මා හෝ තාත්තා කියනවා නම් ඔහු පව්කාරයෙක් මෙන් නොවෙයිද හැසිරෙන්නෙ?

එය එසේ නම්, ඔබ ඔබේ නිර්මාතෘවත් හඳුනාගෙන ඔහුට නිසි ගරුත්වය දෙන්න. ඔහු ඔබ වෙනුවෙන් ලබා දී ඇති වරප්‍රසාද වෙනුවෙන් නිසි පරිදි ස්තුති කරන්න. එය හොඳ මිනිසෙකුගේ යහපත් ගතිගුණයකි.

---

# පළමු මිනිසා ‘ආදම්’(අ.ස)ව නිර්මාණය කිරීම.

**ආදම් (عليه السلام [අ.ස] - එතුමාට සාමය හා සමාදානය හිමි වේවා!)**

ආදම් (අලෙයිහිස්සලාම්) ව්‍යුත්පන්න වූයේ වානරයන්ගෙන් හෝ වානරයින් හා සමාන සතුන්ගෙන් නොවේ. ආදම් (අ.ස) මැවීමට පෙර අනෙකුත් සත්ව වර්ග මෙන්ම විවිධ වර්ග වල වානරයෝද සිටියහ.

මිනිසා එම සතුන්ට වඩා විශේෂත්වයක් ඇතිව නිර්මාණය කළ ජීවියෙකි. එම නිසා පළමු මිනිසා ගැනත් ඉන්පසු ඔහුගෙන් පැවත එන්නන් ගැනත් දෙවියන් මිනිසා වෙත දැණුම් දී තිබෙනවා.

මිනිසාගේ ආරම්භය ගැන සහ ඔහුගේ ජීවිතයේ අරමුණ කුමක්දැයි යන්න පවා දැන ගත හැකි හොඳම මාර්ගය තමයි මිනිසාගේ නිර්මාතෘගෙන්ම එය දැනගැනීම. (යම්කිසි නව භාණ්ඩයක් ගැන උනත් හරියටම විස්තර දන්නේ එය හදපු කෙනාය). දෙවියන් අපට මිනිසාගේ ආරම්භය ගැන තොරතුරු දන්වා තිබෙන්නේ (දිව්‍ය හෙළිදරව් ලෙස) පණිවිඩ නබිවරුන්ට පහළ කර ඔවුන් හරහාය.

දෙවියන් මිනිසුන්ව නිර්මාණය කිරීමට පෙර තිබූ තත්වයක් ගැන කෙටි සටහනක් ලිවීම වඩා උචිත යැයි මා අදහස් කරමි.

දෙවියන් ආලෝකය මගින් මලායිකා නමින් හඳුන්වන (100% ක්ම දෙවියන්ට අවනතව කටයුතු කරන) දේව දූතයින්ව නිර්මාණය කර තිබිණ. විශ්වය/න් (ඇතුළුව අප අදහස් කරන සොබාදහම) හැසිරවීම සඳහාත් තවත් විශේෂිත වූ කාරණා සඳහාත් ඔවුන්ව නිර්මාණය කර ඇත. ඔවුන් සෑම විටම දෙවියන්ව ප්‍රසංශා කරමින්ම සිටී.

මලායිකාවරුන්ට අමතරව විශ්වය/න් සහිත සොභාදහමද එහි සිටිනා සත්වයින් ආදියද දෙවියන්ට අවනතව කීකරුව සිටී. (සෑම පරමානුවක්ම දෙවියන්ට අවනතව සිටී). ඒවා ඒවාට නියමිත වූ ආකාර වලින් දෙවියන්ව නමදිමින් සිටින බව දෙවියන් පවසා තිබෙනවා. එනම් ඉහත සඳහන් දෙවියන්ගේ සෑම නිර්මාණයක්ම දෙවියන්ට අවනතය. උදාහරන ලෙස මන්දාකිණි, ඒවායෙහි ඇති තරු, ග්‍රහලෝක, මහපොළොවෙහි ඇති කඳු, ජලය, ගස් කොලන්, භූමිය, සතුන්, සහ මලායිකා ආදී සියල්ල ඒවාට නියමිත වූ ආකාර වලින් දෙවියන්ව නමදිමින් සිටී.

දුමාරයක් රහිත ගිනිදළු වලින් ජින් වරුන් ලෙස හඳුන්වන ජීවී සමූහයක්ද දෙවියන් මිනිසාට පෙර උත්පාදනය කර තිබේ. ඔවුන්ගේ ප්‍රධානියා (ඉබ්ලීස්) මුලින්ම සිටියේද ස්වර්ගයෙහිය උයනකය. එම ජින්වරුන්ට අනිකුත් ජීවීන්ට හා මලායිකාවරුන්ට නැති ස්වයං තීරණ ගෙන කීකරු හෝ අකීකරු වීමේ නිදහස දී තිබේ. මෙවැනි අවස්ථාවක තමයි පළමු මිනිසාව නිර්මාණය කිරීම සිදුවන්නෙ.

දෙවියන් අදහස් කරනවා, කීකරු හෝ අකීකරු වීමේ නිදහස දී (සීමිත බලතල සහිතව, නියෝජිතයින් ලෙස) දෙවියන්ව පවා විශ්වාස කර හෝ අවිශ්වාස කර ස්වයං තීරණ ගෙන කටයුතු කළ හැකි තවත් නව ජීවී විශේෂයක් ලෙස මිනිසුන්ව පෘථිවියට එවන්න. ඔවුන්ව පෘථිවියේ පස් වලින්ම නිර්මාණය කිරීමටද අදහස් කරනවා. (පෘතුවියෙහි ඇති ශාක, සතුන් සහ මිනිසුන් ආදී සියල්ල පස් වලින්ම නිර්මාණය කර ඇතත් මෙහිදී මිනිසා නම් විශේෂ නිර්මාණය ගැන පමනයි මෙහිදී සලකා බැලෙන්නෙ). අල්ලාහ් වෙනස් ආකර වලින් ජීවීන් නිර්මාණය කර ඇති අයුරු පහත දැක්වේ.

- මලායිකාවරුන් - ආලෝකය මගින්

- ඉබ්ලීස් ඇතුළුව ජින් වරුන් ගිනි දැල් වලින්
- මිනිසා, සතුන් සහ ශාක පෘතුවියෙහි පස් වලින්

විශේෂයෙන්ම මතක් කල යුතු දෙයක් ඇත. එනම්, අල්ලාහ් සර්වබලධාරීය. ඔහු යමක් නිර්මාණය කිරීමට පෙර එය නිර්මාණය කිරීමට අදහස් කරන විටම එම නිර්මාණය කිරීමට යන දැය ගැන සියල්ල දැනුවත්ව සිටී. එනම් එහි ආරම්භය, එහි පැවැත්ම සහ එහි අවසානය කෙසේ සිදුවන්නේද යන්න ඔහු මැනවින් දනී.

*ඔබව පස් වලින් නිර්මාණය කළ අවස්ථාවේදී ඔබගේ (ගති ගුණයන්) ඔහු හොඳින් දන්නේය. ඔබ ඔබගේ මවගේ කුසයෙහි (මාංශ පින්ඩයක් වශයෙන්) සැඟවී තිබූ අවස්ථාවෙහිද, (ඔබව ඔහු හොඳින් දන්නේය); (53:32)*

අල්ලාහ් එක් දේවදූතයෙකුට පෘතුවියේ විවිධ ස්ථාන වලින් විවිධ වර්ගවල පස් සුළු ප්‍රමාණයක් රැගෙන එන ලෙස නියෝග කළේය. කළු පස, දුඹුරු පස, සුදු පස, රතු පස ලෙස විවිධ වර්ණයන්ගෙන්ද, ඒවා, මෘදු පස සහ රළු(තද) පස ආදී ලෙසද විය. එම දේවදූතවරයා මේ විවිධ පස්වලින් අතලොස්සක් ස්වර්ගය වෙත ගෙන යන ලදී. ඉන් පසු මෙම පස ස්වර්ගයෙහි ජලය සමඟත් මිශ්‍ර වූ අතර එමඟින් ඇතිවූ (මැටි) මිශ්‍රණයෙන් ආදම්ගේ හැඩය නිර්මාණය කර ඇත. (සුදු, කළු, රතු, කහ, සුමට, රළු, සහ ඒ අතර සිටින විවිධ වෙනස්කම් සහිත මිනිසුන් ඇතුළත් වන ආදම්ගේ දරු පරම්පරාවේ විවිධත්වයක් අප දකින්නේ මෙහි ප්‍රතිඵලයක් ලෙසිනි).

කාලයක් මේ හැඩය මැටි පිළිමයක් ලෙස පැවතුණි. අල්ලාහ් මෙම මැටි පිළිමය මැටි බඳුන් වැනි වියළි හා එයට ගැලපෙන අයුරින් තද දෙයක් බවට පත් කළේය.

*(වියළී ගියහොත් ටං ටං යන) ශබ්දය ගෙන දෙන ඇලෙන සුළු කිරිමැටියෙන් නියත වශයෙන්ම අපිම (ඔබගේ මුල් පියා වන පළමු) මිනිසාව උත්පාදනය කළෙමු. (15:26)*

අල්ලාහ් මෙම මැටි පිළිමය, සත්‍ය ලේ, මස්, සහ ඇටකටු බවට පත් කිරීමට සහ, අල්ලාහ් ආදම්ගේ ආත්මය ඔහුගේ ශරීරයට දැමීමට පෙර, ඉබ්ලිස් පැමිණ (නිකමට) මෙම නිර්මාණය පරීක්ෂා කළේය. පරීක්ෂා කිරීමේදී, මෙම නිර්මාණයේ අභ්‍යන්තර කුහර ඇති බව ඔහු සොයා ගත් අතර, එබැවින් මෙම

නිර්මාණයට (එහි ශරීරය තුළට) දේවල් ගත යුතු බව ඔහු වටහා ගත්තේය. කෑම බීම, විවේකය යනාදී සමහර දේවල් අවශ්‍ය නොවී විවිධ දේවල් කරමින් දීර්ඝ කාලයක් යාමට මෙම නිර්මාණයට හැකියාවක් නොමැති බව ඉබ්ලීස් වටහා ගත්තේය. මෙම නිර්මාණය දේවදූතයන් (මලායිකාවරුන්) මෙන් නොවන බව ඉබ්ලීස් ට අවබෝධ විය. මන්ද දේවදූතයන්ට ශරීරයේ අභ්‍යන්තර කුහර නොමැති අතර ඔවුනට ආහාර හෝ බීම හෝ විවේකයක් අවශ්‍ය නොවේ. ඒවා නොමැතිව ඔවුනට දීර්ඝ කාලයක් සිටිය හැක. අල්ලාහ් ඔවුන්ට ඉටු කිරීමට අණ කළ සියල්ල ඉටු කිරීමට අල්ලාහ් ඔවුන්ට ශක්තිය ලබා දුන්නේය. කෑම බීම හෝ හෝ විවේක ගැනීමට අවශ්‍ය නොවේ. මිනිසුන්ට දරාගත නොහැකි දේවල් මලායිකාවරුන්ට දරාගත හැකිය. මේ සියල්ල ඉබ්ලිස් දැන සිටියේය.

(දුමාරයක් නිපදවන්නේ නැති) නිර්මළ ගිනි දැල්ලකින් නිර්මාණය කරන ලද ඉබ්ලිස්, මෙම කාල පරිච්ඡේදය තුළ ඇදහිළිවන්ත වූ සහ අල්ලාහ්ට නමස්කාර කරන දේවදූතයන් සමඟ පාරාදීසයේ ජීවත් වූ වෙකි. ජින් වාර්ගික ප්‍රධානියා (ඉබ්ලිස්) වන මොහු සහ ඔහු සමග සිටි අනිකුත් සියලුම ජින්වරුන්ද ආදම්ගේ එම හැඩය ගැන කතා කළේය. ඔවුන්ට මෙය කුතුහලයක් විය. ඉබ්ලීස් ආදම් ගේ රුව ළඟට විත් පැවසුවේ "අල්ලාහ් ඔබව මැව්වේ මට නොතේරෙන කාරණයක් සඳහාය." ලෙසිනි.

ආදම්ගේ ආත්මය ඔහුගේ ශරීරයට සම්බන්ධ වූ පසු, අල්ලාහ් ආදම්ට සෑම දෙයකම නම් පිළිබඳ දැනුම ලබා දුන්නේය. අල්ලාහ් ආදම්ට එම දැනුම ලබා දුන්නේ ගුරුවරයෙකු නොමැතිව, එනම් ආදම්ට එම දැනුම ලබා ගැනීමට යමෙකුගෙන් ඉගෙන ගැනීමට අවශ්‍ය නොවීය. එවිට අල්ලාහ් මෙම විශේෂ නව මැවිල්ලට (නමස්කාරයෙන් නොව) ගෞරවයක් වශයෙන් ආදම්ට සුජූද් කරන ලෙස දේවදූතයන්ට නියෝග කළේය. ඉබ්ලිස් දේවදූතයන් සමඟ ජීවත් වූ අතර, ඔහුටද ආදම්ට සුජූද් කිරීමට නියෝග කරන ලදී. සියලුම දේවදූතයන් කීකරු බැවින් දේවදූතයන් ආදම්ට හිස නවා නළල බිම තබා ගෞරව කළේය. ඔවුන් අල්ලාහ්ට අකීකරු වන්නේ නැත.

කෙසේ වෙතත් ඉබ්ලිස් අහංකාර විය. (සියල්ල දන්නා අල්ලාහ් ඔහුට අල්ලාහ්ට අකීකරු වීමට නිදහස කලින්ම දී තිබීය).

පහත සඳහන් කර ඇත්තේ ඒ සම්බන්ධව ඇති කුරාන් වැකි කිහිපයකි.

*(නබියේ!) ඔබගේ දෙවියන් මලායිකාවරුන්ට "මා භූමියෙහි (මගේ) නියෝජිතයා (ආදම්)ව නිර්මාණය කිරීමට යන්නෙමි" යැයි පැවසූ අවස්ථාවේදී, (එයට) ඔවුන් "(භූමියෙහි) නපුරුකම් කරමින් ලේ වගුරුවන්නට (පරම්පරාවක් බිහි කිරීමට) යන ඔහුව, එහි (ඔබගේ නියෝජිතයා වශයෙන්) පත් කරන්නෙහිද" අපි නම්, ඔබගේ පාරිශුද්ධභාවය පවසමින්, ඔබගේ ප්‍රශන්සාව මගින් ඔබව සුවිශුද්ධ කරමින්ම සිටින්නෙමු" යයි පැවසූහ. (එයට දෙවියන් වහන්සේ) "ඔබ නොදැනුවත් දැය සියල්ල නියත වශයෙන්ම මා හොඳින් දැන සිටින්නෙමි" යයි පැවසුවේය. (2:30)*

*පසුව (ආදම්ව උත්පාදනය කර). ආදම්ට (භූමියෙහි ඇති) සියළුම (වස්තූන්ගේ) නම්ද (ඒවායේ ගුණාංගයන්ද) උගන්වා දී පසුව ඒවා (එම) මලායිකාවරුන්ගේ ඉදිරියේ තබා, ඔබ සත්‍යයවන්තයින් නම්, මේවායේ නාමයන් ඔබ මා හට දැනුම් දෙනු යැයි පැවසුවේය. (2:31)*

*(එසේ දැනුම් දීමට නොහැකිව) ඔවුන් (දෙවියන් වහන්සේට) "ඔබ ඉතාමත් පරිශුද්ධවන්තයෙකි. ඔබ අපට දැනුම් දුන් දැය හැරෙන්නට (වෙන කිසිවක්) අපි දන්නේ නැත. නියත වශයෙන්ම ඔබම හොඳින් දන්නෙකුද ඥානවන්තයෙකුද වශයෙන් සිටින්නෙහිය" යයි පැවසීය. (2:32)*

*(පසුව දෙවියන් වහන්සේ) ඕ ආදම්! ඔබ මේවායේ නාමයන් ඔවුන්ට දැනුම් දෙනු" යැයි පැවසුවේය. ඔහු ඔවුන්ට ඒවායේ නම් දැනුම් දුන් අවස්ථාවේදී, ඔහු (මලායිකාවරුන්ට), භූමියෙහිද, අහස් හිද (ඔබට සඟවා ඇති දැය නියත වශයෙන්ම මා හොඳින් දැන සිටින්නෙකු යැයි මා ඔබට පැවසුවේ නැදද? එබැවින් ඔබ ආදම් ගැන හෙළිදරව් කළ දැයද, සඟවා ගත් දැයද නියත වශයෙන්ම මා හොඳින් දන්නෙමියි" කීවේය. (2:33)*

*පසුව අපි මලායිකාවරුන්ට "ආදම්ට ඔබ හිස බිම තබා නැවී සුජූද් (ගෞරව) කරනු" යැයි පැවසූ විට, ඔවුන් (සියල්ල) සුජූද් කලහ. ඉබිලීස් හැර. ඔහු නම්, උඩුගු කමින් ඇත් වී (අපගේ අණ නොතකා) ප්‍රතික්ෂේප කර හැරියේය. (2:34)*

මලායිකාවරුන් දෙවියන්ගේ ශ්‍රේෂ්ඨ දේවදූතයින් වෙලත් අල්ලාහ් ඇයි ඔවුන්ට ආදම්ට එලෙස ගෞරව දැක්වීමට අණ කළේ යන්න ගැන පොඩි පැහැදිළි කිරීමක් කළොත් එය වටහා ගැනීමට තවත් පහසු වේවි යැයි මම සිතමි.

ආදම් සහ ඔහුගේ දරු පරම්පරාව පෘතුවියෙහි නියෝජිතයන් ලෙස කටයුතු කිරීමට නියමිතයි. එමගින් ඔවුන්ව පරීක්ෂණයකට භාජනය කෙරෙණු ඇත. මලායිකාවරුන් මිනිසාගේ ආත්මය රැගෙන විත් මවගේ ගර්භාශයේ තැම්පත් කර, එය දරුවෙකු ලෙස කුසෙන් එන තෙක් ඔවුන් එහි වර්ධන කටයුතු වලට සහය වී පසුව එලියට ආ පසු ඔහුව මරණය තෙක් ආරක්ෂා කරමින් ඔවුන්ට අවශ්‍යය සොභාවධර්මයේ කටයුතුද හසුරුවමින් සිටී. අවසානයේ නියමිත වෙලාව පැමිණි පසු ඔහුගේ ආත්මය නැවත රැගෙන නිසි වෙලාව පැමිණි විට නැවත එය දෙවියන් කරා රැගෙන යාම ඔවුන් කළ යුතුයි.

මිනිසා අල්ලාහ් විසින් තමාට දී ඇති ජීවන ප්‍රශ්න පත්‍රයට හරි දේ ලිව්වත්, වැරදි දේ ලිව්වත් මලායිකාවරුන් ඒ ගැන තැකීමක් නොකර මිනිසාට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් සිටිය යුතුය. මිනිසා අල්ලාහ්ට බැන්නත්, වැරදි විදිහට නීච විදිහට තම ජීවිතය ගෙව්වත්, මලායිකාවරුන් මිනිසාට අහිතක් කරන්නෙ නෑ. ඔහුගේ කාළය අවසන් වන තෙක් ඔහුව ඉදිරියෙන් සහ පිටපසින් සිට ආරක්ශා කරමින්, අනිකුත් පහසුකම් සලසමින් සිටිය යුතුයි.

මලායිකාවරුන් කෙතරම් ශ්‍රේෂ්ඨ උනත් සෑම තත්පරයක්ම ඔවුන් අල්ලාහ්ව ප්‍රසංශාකරමින් මෙන්ම අල්ලාහ්ට බියෙන්ද සිටී. ඔවුන් අල්ලාහ්ගේ දයාව ගැනද දඬුවම් ගැන හොඳින් දනී.

නමුත් මිනිසාට පෘතුවිය තුල සිටින කාලය තුල කැමති නම් අල්ලාහ්ට බැනීමටද, මහත් නපුරු ක්‍රියාවන් කිරීමටද අල්ලාහ් නිදහස දී තිබේ. එනම්, එතරම් නිදහසක් ලැබුණු මිනිසුන්, එසේම, පරීක්ෂණයෙන් ජයග්‍රහනය කලහොත්, කිසිඳු බියක්, වෙහෙසක්, දුකක් නොමැතිව සම්පූර්ණයෙන්ම සැනසිල්ලේ අල්ලාහ් තෘප්තියට පත් වූවන් ලෙසින් ස්වර්ගයෙහි සදාකල් සිටීමට අවස්ථාව ලැබෙන නිර්මාණයකි මේ මිනිසා. එනිසා ඇත්ත වශයෙන්ම ගෞරවයට පත් විය යුතුය යන අවබෝදය ඔවුන්ට ඇත.

එනිසා ඔවුන් එම කාර්යය ඉතාම ඉහලින් පිළිගෙන ආදම්ට නිසි ගෞරවය පළකර ඊට ඉදිරිපත් විය. හැබැයි අපි මතක තබා ගත යුතු දෙයක් තිබෙනවා. අපි කරන කියන (හොඳ නරක) හැම දෙයක්ම ඔවුන් (දවසේ පැය 24 ම, දිනපතාම) සටහන් කරගන්නවා. ඔවුන්ට හොරෙන් අපිට කිසි දෙයක් කළ නොහැකියි. පසුව එය ඔවුන් දෙවියන්ට ඉදිරිපත් කරනවා. විනිශ්චය දිනයේ දෙවියන් එයත් සාක්ශි ලෙස අරගන්නවා.

මේ අපට ලැබී ඇති නිදහස් කාලය අපි කෙසේ ගත කළත්, මරණින් පසු අපට ස්වාධීන විය නොහැක. අපගේ මරනින් පසු කාලයද, අපායේ පාලන කටයුතු කරන්නේද ස්වර්ගයන්හී දොරටුවල සිටින්නේද මලායිකාවරුන්මය. මිනිසුන් ඔවුන්ට අල්ලාහ් දුන් ගෞරවය රැකගෙන සිටියොත් මරනින් මතු හොඳය. නැත්නම් අල්ලාහ් මලායිකාවරුන් වෙතින්ම අපට දඬුවම් කරවනු ඇත. (අප සමාජයේ සමහරු 'යම රජු' සහ 'යම පල්ලන්' කියන්නේ දෙවියන්ගේ මෙම ශ්‍රේෂ්ඨ මලායිකාවරුන් කොටසකටය). හොඳ අයව නැවත ගෞරවයෙන් යුතුව ස්වර්ගයට ඇතුලත් කරන්නේද ඔවුන්මය.

කෙසේ නමුත්, ඉබ්ලීස් (ශේතාන්) මෙලෙස ආදම්ව උසස් කෙනෙක් ලෙස පිළිගැනීමට කැමති උනේ නැහැ. ඔහු එම ගෞරව දැක්වීම ප්‍රතික්ශේප කළා. අල්ලාහ්ට සහ ඔහුගේ නියෝගයට විරුද්ධ වීමෙන් ඉබ්ලිස් අල්ලාහ්ට අපහාස කළේය. ඔහු දෙවියන්ට විරුද්ධව ගිය පළමු කටයුත්ත මෙයයි. අල්ලාහ් සමාව දෙන්නෙකි, ඉවසිලිවන්තයෙකි, මහා කරුණාවන්තයෙකි. නමුත් ඉබ්ලීස් තම වරද වෙනුවෙන් අල්ලාහ්ගෙන් සමාව නොගෙන අහංකාර වූවෙකු මෙන් සිටියේය.

ආදම් (අ.ස)ද දෙවියන් එපා කියූ ගසෙන් පළතුරු කා දෙවියන්ගේ අණට පිටින් ගියේය. නමුත් ඔහු (සහ ඔහුගේ බිරිඳ) වහාම ඒ ගැන පසු තැවී දෙවියන්ගෙන් සමාව ගෙන පිළිසකර විය. අල්ලාහ් ඔවුන්ගේ සමාව භාරගත්තේය. නමුත් ඉන්පසු ඉබ්ලීස්, ඔහුගේ අනිකුත් ශේතාන්වරුන්ද, ආදම්, ඔහුගේ බිරිඳ හව්වා යන සියල්ල ස්වර්ගයේ සිට පෘතුවිය වෙත එවීය.

ආදම් (අ.ස) සහ ඔහුගේ බිරිඳ හව්වා (අ.ස) ගැන වැඩි විස්තර පහත www.srmicenter.com / https://srmi-center.webnode.page/ වෙබ් අඩවියෙහි Prophet Adam නැමති ලිපිය බලන්න. ඔවුන් දෙදෙනා ස්වර්ගයේ සිටි කාලය, ඉන් පිට වීම, පෘතුවියට පහළ වීම, එම ස්ථාන, ඉන් පසු ඔවුන් දෙදෙනා ගේ දරුවන්, ඔවුන්ගේ පරම්පරාව ආදී විස්තර එමඟින් දැනගත හැක.

---

# ආත්මය, සිත, විඥානය, ශරීරය, හෘද සාක්ෂිය -

# [රූහ් සහ නෆ්ස්]

මිනිසා සම්බන්ධව ඉහත සියළු කාරණා ඉස්ලාමය තුලින් කතා කරනුයේ පහත සඳහන් මාතෘකා 4 යටතේය.

1. ශරීරය
2. රූහ් (ආත්මය)
3. නෆ්ස් (ස්වයං විඥානය සහ උප විඥානය)
4. හදවත (එනම් හෘද සාක්ෂිය)

දෙවියන්වහන්සේ ආකාර 4 කින් මිනිසුන්ගේ ශරීර නිර්මාණය කර ඇති බව අවසන් දිව්‍ය වදන් සහිත අල් කුරාණය තුලින් අපට දකින්නට පුළුවන.

1. කිසිම පුරුෂයෙකුගේ හෝ කිසිම ස්ත්‍රියකගේ සම්බන්ධයක් නොමැතිව නිර්මාණය කිරීම. උදා:- ආදම් (අ.ස)
2. පුරුෂයෙකු පමණක් සම්බන්ධ කරගෙන නිර්මාණය කිරීම. උදා:- හව්වා (අ.ස)/ ආදම්ගේ බිරිඳ
3. කාන්තාවක් පමණක් සම්බන්ධ කරගෙන නිර්මාණය කිරීම. උදා:- යේසුස් වහන්සේ (ඊසා අ.ස)
4. පුරුෂයෙකු සහ ස්ත්‍රියකු යන දෙදෙනෙකු සම්බන්ධ කරගෙන නිර්මාණය කිරීම. උදා:- ඔබ, මම වැනි අය.

අප මෙහිදී සකච්චා කරන්නේ ඔබ මම වැනි සාමාන්‍ය අය ගැනය.

❖ **1). ශරීරය (මෙය අවස්ථා 3කට විග්‍රහ කරයි)**

1. (ජීවත්වන) ජීවිතය රහිත සිරුර (ගර්භාෂය තුල දින 120 ක් දක්වා කාලය) [al jazat]. 120 වන දින මලක්වරයෙක් ඔහුගේ ආත්මය මව් කුසෙහි ඇති කළලය වෙත ගෙනවිත් එහි කාරණා 4 ක් ලියයි.

1) ඔහු ජීවිතය ගෙවන ආකාරය.
2) ඔහුගේ ජීවනෝපාය, වත්කම් ආදිය
3) ඔහු මිය යන දිනය සහ වෙලාව.
4) ඔහුගේ ජීවන ගමනාන්තයේ තත්වය. එනම් ස්වර්ගය හෝ නිරය යන වග. [එය සටහන් කර ආත්මය ඇතුළු කරයි].

2. ජීවිතය සහිත සිරුර (දින 120 සිට මරණය දක්වා) [al jisum]. පහත සඳහන් කුරාන් වැකිය දෙස අවධානය කර බලන්න.

*නියත වශයෙන්ම (ආරම්භයේදී පළමු) මිනිසාව කිරිමැටි සාරයෙන් උත්පාදනය කළෙමු. පසුව එය අපි ඉන්ද්‍රීය බිඳක් බවට පත්කර ඉතාමත් ප්‍රවේසම් සහිත ස්ථානයක තැම්පත් කළෙමු. පසුව එම ඉන්ද්‍රීය බිඳ ලේ කැටියක් බවට පත් කළෙමු. පසුව එම ලේ කැටිය මාංශ පිණ්ඩයක් බවට පත් කළෙමු. පසුව එම මාංශ පිණ්ඩයේ ඇට කටු නිර්මාණය කර, එම ඇට සැකිල්ලට මස් මාංශ ඇන්දෙව්වෙමු. පසුව එය (පූර්ණ) මිනිස් ජීවිතයක් බවට පත් කළෙමු. මෙසේ උත්පාදනය කළ අල්ලාහ් ඉමහත් භාගයවන්තයෙකි. ඔහු උත්පාදකයින්ගෙන් ඉතාමත් අලංකාරවන්තයෙකි (Al Quran 23:12,13,14).* (මෙම වැකිය ගැන Dr. Keith Moor ගේ අදහස- Google search කර බලන්න).

3. මළ සිරුර [al badan] පළමු මිනිසාගේ ශරීරය ජලය මිශ්‍ර පසෙන් (කිරි මැටි සාරයෙන්) කිර්මාණය කර එයට ආත්මය (රූහ්), නෆ්ස් සහ හෘද සාක්ෂිය ආදිය එකතුකල බව දෙවිදුන් අපට දන්වා ඇත. ඉන් පසු ඔහුගෙන් බිරිඳව උත්පාදනය කර ඔවුන් දෙදෙනා හරහා දරු පරම්පරාව ලෙස මිනිස් සංහතිය

ව්‍යාප්ත කළ බවත් දෙවිඳුන් පවසා ඇත. අප මිය ගිය පසු නැවත ඉතුරුවන්නේ පස් බවටම පත්වන සිරුරය. විනිශ්චය දිනයේ නැවත මෙම පස් බවට පත් වූ සිරුරම යලි ඇති කර මිනිසාගේ ආත්මය එය තුලට සම්බන්ධකරන බව දෙවිඳුන් පවසා ඇත.

(දෙවියන්ගේ නිර්මාණ: පළමු මිනිසා (ආදම්)ව නිර්මාණය කිරීම ගැන සඳහන්වූ තොරතුරු සිහිකර බලන්න)

**ශරීරය ගැන සටහනක්:-** එය අදියර කීපයක් පසු කරයි. එහි ප්‍රමානය වෙනස් වෙනවා, හැඩය වෙනස් වෙනවා, ශක්ති සම්පන්න බව වෙනස් වෙනවා, රෝගී වෙනවා, රෝග සුව වෙනවා, ක්ෂය වන සමහර කොටස් නැවත වර්ධනය වෙනවා. අපට අදහා ගත නොහැකි සිදුවීම් බිලියන ගනනක් එය අභ්‍යාන්තරයේ සිදුවෙමින් පවතිනවා.

ඇත්තටම අපි මේ දරා සිටිමින් සිටින්නෙ අල්ලාහ් (දෙවිඳුන්)ට අයිති අපට අදහා ගත නොහැකි විශ්මිත දෙයකි. මෙම ශරීරය අපේ පරීක්ෂනයේ තවත් අංගයකි. එනිසා අපට තේරෙන වයසට පැමිනි අවස්ථාවේ සිට අප අපගේ ශරීරය පරිස්සමින් පාවිච්චි කල යුතුයි. එය ආරක්ෂා කර ගත යුතුයි. එය පිරිසිදුව තබා ගත යුතුයි. එයට ගෞරව කල යුතුයි. ලැජ්ජා සහගත තත්වයට එය පත් නොකල යුතුයි. අපචාරයේ සහ දුරාචාරයේ නොයෙදිවිය යුතුයි. අප මෙලොවින් සමුගන්නා විට අප එය නැවත දෙවිඳුන්ගේ සොඟා දහමට භාර දී යා යුතුයි. අවශ්‍යයතාවය මත විනිශ්චය දිනදී එය තමාට පක්ෂව හෝ තමාට විරුද්ධව සාක්ෂි දරන සාක්ෂිකරුවෙකු ලෙස ඉදිරිපත් විය හැක. එදින අත්, පා, ඇස්, කන්, නාසය ආදිය කතා කරනු ඇත. (විශ්මිත මිනිස් සිරුර සම්බන්ධ ලිපිය කියවන්න).

### ❖ 2). රූහ් (ආත්මය)

ආත්මය දෙවියන් වහන්සේගේ ආඥාවෙන් (අණින්) ඇති වන්නක් වන අතර අපි ඒ ගැන දන්නේ අල්ප වශයෙනි. එම අණ මත එය ඇතිවී ඒ අනුව ක්‍රියාත්මක වේ.

*(නබියේ!) "රූහ්" ගැන (යුදෙව්වන් වන) ඔවුන් ඔබගෙන් විමසන්නාහ. එයට ඔබ "එය අපගේ දෙවියන්ගේ නියෝගයෙන් ඇති වන්නකි. (ඒ ගැන) ඉතාමත් අල්ප*

*ඥානයක් මිස, ඔබට දෙනු ලැබුවේ නැත. (එබැවින් එහි ගැඹුරු අදහස ඔබට දැන ගැනීමට නොහැකිය)" යැයි පවසනු මැනව! (17:85)*

රූහ් (ආත්මය), අපගේ මනස-ශරීරය-විඥානය සහ සවිඥ්ඥාණික ආත්මය (nufs) සමඟ පරිපූර්ණව සම්බන්ධය. ආත්මය හරහා ජීවය ලබා දෙන අතර යාන්ත්‍රික ශරීරයේ චලනයට එය අවශ්‍ය වේ.

එය සත්‍යය දන්නා ආත්මයකි, එබැවින් පුද්ගලයෙකු මිය ගිය විට ඔහු මිය ගිය බව දනී. එය මෙලොව ඉපදීමට පෙර ජීවිතය ගැන සහ මරණින් මතු ජීවිතය ගැන (තමාට වඩා) තොරතුරු දන්නේය. අල්ලාහ් අපට සඟවා ඇති අදෘශ්‍යමාන දේ එය දකිති. මෙම ආත්මය අපිට වඩා ඇත්ත දනී. (අප දැන් ඉන්නේ පරීක්ෂණයට මුහුණ දෙමින් නිසා සමහර කරුණු අපට මතක නැත. ඒවා දැන ගත හැක්කේ පරීක්ෂණයේ කොටසක් වන නබි වරු සහ අල්ලාහ්ගේ පුස්තක හරහාය).

ආත්මය සෑම මිනිසෙකු තුළම එකම විදිහට පවතී. එය පිරිසිදුය. නරක පුද්ගලයා තුළ පවා එය පිරිසිදු තත්වයෙන් පවතී. ඔබ නින්දට යන විට එය ඔබේ ශරීරයෙන් අර්ධ වශයෙන් ඉවත් වන අතර ඔබ මිය යන විට සම්පූර්ණයෙන්ම ඔබේ ශරීරයෙන් පිටවේ.

අල්ලාහ් හැර එය පාලනය කළ හැකි කිසිවෙක් නැත. එහි පැමිනීමද ආපසු යාමද එහි නිර්මාතෘ වෙතමය. අල්ලාහ්ට හැර වෙන කිසිම කෙනෙකුට, කිසිම දෙයකට හෝ කිසිම ක්‍රමයකට මෙම ආත්මය විනාශ කල නොහැක. එය වෙනස් කළ නොහැකිය. එය සර්වබලධාරී අල්ලාහ් කැමති තාක් කල් මිය යන්නේ හෝ අහෝසි වන්නේ නැත. (මෙයට අනුව "සිත දියුණු කර නිර්වාණය ලබා [පහණ නිවිනා සේ] චුත වීම" යන සංකල්පයට ඉඩක් නැත. යමෙක් එය ස්ථිර කරන්නේ නම් එය සර්වබලධාරී දෙවිඳුන්ට කරන අභියෝගයකි).

දෙවිඳුන් "රූහ්" යන වචනය භාවිත කරමින් ඉදිරිපත් කර ඇති කුරාන් වැකි කිහිපයක් පහතින් දක්වා ඇත.

**1). අල්ලාහ් විසින් දේව දූත ජිබ්රීල් (අලෛහිස්සලාම්)ට රූහ් යන වචනය භාවිතා කර ඇත**

රූහ් අල් කුදුස්/ රූහුල් අමීන්:- ජිබ්රීල් නමැති පරිශුද්ධ ආත්මය.

(ජිබ්රීල් නමැති පරිශුද්ධ) ආත්මය නබිතුමාගේ හදවතට දිව්‍ය එළිදරව්ව ගෙන එයි.

*(නබියේ! ශුද්ධ වූ කුරානය වන) මෙය නියත වශයෙන්ම ලෝකයන්ගේ දෙවියන් විසින්ම පහළ කරන ලදී. (දෙවියන්ගේ නියෝගයට අනුව) රූහුල් අමීන් (නැමති ජිබ්රීල්) මෙය ඔබගේ මනසෙහි පහළ කර තැබුවේය.(26:192,193)*

**2). අල්ලාහ් විසින් අල් කුරානය ට රූහ් යන වචනය භාවිතා කර ඇත**

**3). ආත්මය දෙවියන් වහන්සේට අයත් වන අතර ඔහු එය "මගේ ආත්මය" ලෙස හඳුන්වයි.**

*"මා (පලමු) මිනිසාව නිර්මාණය කර එහි (ජීවයට අවශ්‍ය) මාගේ ආත්මය ඇතුළු කළහොත් -ඔහුට (ගෞරව කිරීමට) - ඔබ නලල බිම තබා) සුජූද් කරනු" (යැයි අණ කළේය). ඒ ආකාරයටම මලායිකාවරුන් සියල්ලම (ඔහුට ගුරව කිරීම සඳහා) සුජූද් කළහ.(15:29,30)*

අල්ලාහ් එය ඔහුගේම ආත්මය ලෙස හැඳින්වූයේ එය ගෞරවයට පාත්‍ර වූ දෙයක් ලෙස හැඟවීමට වන අතර එය ඔහුගෙන් අපට ලැබුණු තෑග්ගක් සහ විශේෂත්වයක් ලෙස දැන්වීමටය.

**4). දෙවියන් වහන්සේ මරියම් තුළට (යේසුස් වහන්සේගේ ආත්මය) රූහ් ඇතුළු කල බව සඳහන් කරයි**

*ඉම්රාන්ගේ දියණිය වන මරියම්ය. ඇය තමන්ගේ පතිවත ආරක්ෂා කර ගත්තාය. එබැවින් එහි (ඇයගේ ගර්භයෙහි) අපගේ ආත්මයන්ගෙන් (එක් ප්‍රාණයක්) පිම්බෙමු: (66:12)*

*පසුව (ඉබේම) මරියම් ගැබ් ගෙන, ඒ සමග (ඇය උන් හිටි ස්ථානයෙන් පිටත්ව), දුරින් පිහිටි ස්ථානයකට ගොස් සේන්දු වූවාය, (19:22)*

**5. අල්ලාහ් විසින් ඊසා අලෙහිස්සලාම් (යේසුස් වහන්සේ) ට රූහ් යන වචනය භාවිතා කර ඇත.**

*නියත වශයෙන්ම මරියම්ගේ පුත් ඊසා මසීහ් ආල්ලාහ්ගේ (එක්) දූතයෙකි. (ඔහුගේ පුතෙකු නොව). හැරත් ඔහු ("කුන්" නමැති) වදනකින් (ඉපදුනු කෙනෙකු වශයෙන්ද) සිටින්නේය. අල්ලාහ් එම පොරොන්දුව මරියම්ට ලබා දුන්නේය. (අනිත් අයගේ ආත්මයන් මෙන් ඔහුද) ඔහුගේ සන්නිධානයෙන් පැමිණි එක් ආත්මයකි;(4:171)*

මෙනිසා ඔහුට රූහුල්ලාහ් ලෙසද හඳුන්වනු ලබයි.(Rūḥ minhu (Arabic: رُوحٌ مِّنْهُ) a Spirit from him/ Kalimat Allah/ Word of God)

යේසුස් වහන්සේගේ ආත්මය පවා අල්ලාහ්ගේ සන්නිධානයෙන් පැමිණි බව.

*නියත වශයෙන්ම මරියම්ගේ පුත් ඊසා මසීහ් ආල්ලාහ්ගේ (එක්) දූතයෙකි. (ඔහුගේ පුතෙකු නොව). හැරත් ඔහු "කුන්" (නමැති) වදනකින් (ඉපදුනු කෙනෙකු වශයෙන්ද) සිටින්නේය. අල්ලාහ් එම පොරොන්දුව මරියම්ට ලබා දුන්නේය. (අනිත් අයගේ ආත්මයන් මෙන් ඔහුද) ඔහුගේ සන්නිධානයෙන් පැමිණි එක් ආත්මයකි;(4:171)*

**6). දේවදූතයන් සියල්ලම ආත්මයට සම්බන්ධයි. ආත්මය සියලු මලායිකාවරුන් (දේවදූතයන්) ගේ කේන්ද්‍රය වේ.**

*(ජිබ්රීල් නමැති පරිශුද්ධ) ආත්මයද, මලායිකාවරුන්ද, කණ්ඩායම් කණ්ඩායම් වශයෙන් සිටින (විනිශ්චය) දිනදී කිසිවෙකුත් ඔහු (එනම් දෙවියන්) ඉදිරියේ කතාද නොකරන්නාහ. එහෙත් කවුරුන් රහ්මාන් (එනම් දෙවියන්) ගේ අනුමැතිය ලබා ගත් අතර සත්‍යය (පමණක්) කියන්නේද, ඔහු හැර.(78:38)*

**7). දෙවියන් වහන්සේ යේසුස් වැනි අනාගතවක්තෘවරුන්ට ආත්මයෙන් උපකාර කරයි.**

*තවද, මරියම්ගේ පුත් ඊසාට අපි පැහැදිළි සාධකයන් ලබා දී, (ජිබ්රීල් නැමැති) පරිශුද්ධ ආත්මය මගින් ඔහුට උදව් කළෙමු; (2:253)*

*පසුව අල්ලාහ් (ඊසාට -විනිශ්චය දිනදී) මෙසේ පවසන්නේය: "ඕ මරියම්ගේ පුත් ඊසා! ඔබ කෙරෙහිද ඔබගේ මව කෙරෙහිද (මා ලබා දී ඇති) මගේ වරප්‍රසාදයන් ඔබ මතක් කර බලනු; (5:110)*

**7). අල්ලාහ් විසින් දක්වන යම් සහයෝගයන් කෙරෙහිද රූහ් යන වචනය භාවිතා කර ඇත.**

නබි තුමා තම සගයන් සමග එක්වී යුධ කරන අවස්ථාවේ එම සහාබාවරුන්ගේ විශ්වාසය ඉහල නැන්වීමට (ඊමානය වර්ධනය කිරීමට) අල්ලාහ්ගේ සන්නිධානයෙන් සහාය පල කිරීම ද රූහ් ලෙස සඳහන් කර ඇත.

**8). අපගේ ශරීරය තුල තිබෙන අප ආත්මය ලෙස හඳුන්වන දෙයටද රූහ් යන වචනය භාවිත කරයි.**

මේ අනුව රූහ් (ආත්මය) යන වචනය තුල "ජීවිතය" යන්න ගැබ්වී ඇත. එහෙත් එය අපට වැටහෙනවාට වඩා විශාල අරුතක් සහ සංකීර්ණ බවක් ඇති දෙයක් බව තේරුම් ගත හැකියි.

රූහ් යන වචනයට සමානුපාතිකව භාවිතාවන අනිත් වචනය නම් "නෆ්ස්" යන්නයි. මෙයද අපගේ රූහ් සමග සම්බධතාවයක් ඇති එහෙත් දෙවිඳුන්ගේ වෙනත් ආකාරයක විශ්මිත නිර්මාණයක තවත් සංකීර්ණ අවස්ථාවකි.

මනස, ස්වයං විඥානය සහ උප විඥානය ආදී ලෙස අප අදහස් කරන කාරණා මේ හා සමග බැදී පවතී. එය අපහා ක්‍රියාත්මක වන ආකාරය ගැන යම් තොරතුරු ප්‍රමාණයක් දෙවියන්වහන්සේ විසින් අපට හෙළිදරව් කර ඇත.

නබි (ﷺ) තුමාගේ වදනකට අනුව අප මිය යන විට එය අපෙන් වෙන්ව යන බව අපට පෙනෙනු ඇත. අවදියෙන් සිට හෙමින් හුස්ම පිටකරමින් අවසන් ගමන් යන අයගේ ඇස් ඒ වෙත ට යොමු වී තිබීම සමහර විට අපට දකින්නට ලැබී ඇත. එතනදී තම ආත්මය මලකුල් මවුත් නැමති මලායිකා වරයා විසින් අත්පත්කර ගන්නා ආකාරය ඔහු දකිනු ඇත. මෙය තත්පරයෙන් දාහෙන් එකක් තරම් ක්ෂනයකින් සිදුවුවත් එය දැකීමට කාලයේ වේගය ඔහුට භාධාවක් නොවනු ඇත.

අපි මරණයට ආසන්න වූ විට, අපගේ ඇසට නොපෙනෙන සමහර දේවල් අපට පෙනෙන පරිදි අපගේ ඇස් ඉදිරිපිට තිබූ තිරයක් ඉවත් කරන බව දෙවියන් වහන්සේ පවසා ඇත.

**කුමක්ද මේ "නෆ්ස්?".**

**වටහා ගැනීමේ පහසු වචන වලින් කියනවා නම්, නෆ්ස් තමයි "මම".**

- **3). "නෆ්ස්?" (මෙයද රූහ් මෙන්ම තවත් ආකාරයක නිර්මාණයකි)**

මේ යටතේ තමයි ඔබ ඔබෙන්ම මේ ප්‍රශ්නය අසාගත යුත්තේ,

එනම්, **WHO AM I ? මම කවුද ? (ලිපිය කියවන්න -Page 265 )**

ශුද්ධ වූ කුර්ආනය තුළින් දෙවියන් වහන්සේ අපගේ අධ්‍යාත්මික ජීවිතය ගැන කථා කරයි, එනම් අපගේ සවිඥානක භාවිතය, හරි වැරැද්ද පිළිබඳ අවබෝධය, අපගේ අධ්‍යාත්මික ආශාවන්, පෞරුෂය, ආදරය, කෝපය පාලනය කිරීමෙන් සාමය සහ ආත්ම තෘප්තිය ළඟා කර ගැනීමේ හැකියාව, දුක සහ සතුට ඉවසීම, හෘදය සාක්ෂිය, ඊර්ෂ්‍යාව, ක්‍රෝදය, වෛරය, තන්හාව, ආශාව, ගිජු කම, තරහව, වංචනිකබව යනාදිය ගැන කතා කරන විට "නෆ්ස්" යන වචනය භාවිතා වේ.

රූහ් සෑම කෙනෙකුගේම එකම ආකාරයේ උනාට නෆ්ස් පුද්ගලයාගෙන් පුද්ගලයාට ඔහුගේ ක්‍රියා මත එකිනෙකාට වෙනස් වේ.

**නෆ්ස් වර්ග තුනක් තිබේ:**

1. අල්-නෆ්ස් අල්-අම්මාරා, (මනුශ්‍යත්වයේ පහත් මට්ටම)
2. අල්-නෆ්ස් අල්-ලව්වාමා, (මනුශ්‍යත්වය ගැන වැටහෙන මට්ටම)
3. අල්-නෆ්ස් අල්-මුතම'ඉන්නා. (මනුශ්‍යත්වයේ ඉහලම මට්ටම)

1). "නෆ්ස් අල්-අම්මාරා මගින් පිළිබිඹු කෙරෙන්නේ පුද්ගලයාගේ අභ්‍යන්තර ආශාවන්, ස්වයං තෘප්තිය, ක්ෂණික තෘප්තිය ආදියයි.

*"මිනිසුන්ගේ සිත් පාපයන් කරන මෙන් පොළඹවන්නට හැක්කක් වශයෙන්ම ඇත්තේය"; (12:53)*

එනම්, හරි වැරද්ද, යුක්ති අයුක්තිය නොසලකා ගිජුකම, බලය, ආධිපත්‍යය අසමානතාවය ආදියට කැමැත්ත ඇති වේ. එහෙයින් මෙලොව සැපම සොයන අතර ආත්ම ප්‍රශංසාව, උඩඟුකම, බොරු කීම, කේලාම් කීම, බැන වැදීම, ඊර්ෂ්‍යාව, විවේචනය, අතෘප්තිය, ආත්මාර්ථකාමිත්වය, තණ්හාව සහ තමාට අධිකව ආදරය කිරීම වැනි ලක්ෂණ වැළඳ ගනී.

(අන් අයට නිහතමානීව, ගෞරවයෙන්, හා සමාන ගුණාංගවලින් සැලකීමෙන් එවැනි ආශාවන් පාලනය කළ හැක).

'නෆ්ස් අල්-අම්මාරා හරියට ඔබ නැඟ සිටින වල් අශ්වයෙකු වැනිය. ඔබ එක තත්පරයකට ඔබේ අවධානය වෙනතක යොමු කළහොත්, ඌ ඔබව ඉවතට විසි කරයි'. ඔබ තුල මේ ස්වභාවය ඇති නිසා නරක අතට යොමුවීමෙන් ඔබව වලක්වා ගැනීමට ඔබට වෙහෙසක් දැරීමට සිදු වෙයි. මනා පුහුණුවක් තුලින් එය පාලනය කල හැක.

2). නෆ්ස් අල්-ලව්වමා තමාගේ අභ්‍යාන්තරය අසම්පූර්ණ ආශාවන් අනුගමනය කිරීම සහ ක්ෂණික තෘප්තිය ඉල්ලා සිටීම ගැන තමන්ටම දොස් පවරමින් තමාගේ අසම්පූර්ණකම හෙවත් දුර්වලකම ගැන දැනුවත් වීමට ඉඩ සලසයි. එය යහපත් දෙයට ආරාධනා කරයි. යහපත් ක්‍රියාවන්හි විශිෂ්ටත්වය දැනගෙන, වැරදි ක්‍රියාවලින් සහ අයහපත් ක්‍රියාවලින් තමාව ඈත් කරයි. මෙම ස්වභාවය ගැන කුරානයේ මෙසේ සදහන් වේ.

*"වරද කළ අයට නින්දා කරනු ලබන (ඔහුගේ) හෘද සාක්ෂිය මතද මා දිව්රමි. ("මම ස්වයං නින්දා කරන ආත්මය මත දිවුරමි") (75:2).*

වැරදි ක්‍රියාවන්හි නියැලීම වරදකාරී හැඟීම ඇති කරයි, එහෙත් මෙම ස්වභාවය මගින් පුද්ගලයා තමාව නිවැරදි කිරීමට හෝ වරදින් වැළකී සිටීමට පටන් ගන්නා අතර එමගින් ඔහුට ලැජ්ජාව සහ පසුතැවිල්ල ඇතිවීමේ හේතුව නතර වේ.

මෙම අදියරේදී පුද්ගලයාගේ හෘදය සාක්ෂිය අවදි වේ. එහි අණට අකීකරු වීම ගැන ඔහු ඔහුටම චෝදනා කිරීමට පටන් ගනී සහ ඔහු විඥානය, තාර්කිකත්වය සහ අභිලාෂයන් නෆ්ස් අල්-ලව්වාමාව පරිපූර්ණ වීමට පොළඹවයි. යහපත උල්ලංඝණය කිරීම ගැන සහ එම වරදේ යථාර්තය වටහා ගනී".

*"නබිතුමාණන් මෙසේ පැවසූහ, 'ආදම්ගේ [සහ ඒවගේ] සියලුම දරුවන් පව්කාරයන් වන අතර හොඳ පව්කාරයන් පසුතැවිලි වන අයයි" ("සුනන් අල්-තිර්මිදි," හදීස් අංක 2499).*

3). නෆ්ස් අල්-මුතම'ඉන්න යනු සන්සුන් භාවයේ, සන්සුන් භාවයේ සහ සාමයේ තත්වයකි, මන්ද යමෙකු ඔහු/ඇය තවදුරටත් වැරදි ක්‍රියාවන් සහ නරක ක්‍රියාවන් නොකරන අවස්ථාවට පැමිණ ඇත. විනයගරුක ජීවිතයක් ගත කළ එබඳු අය අවසානයේ ව්‍යාජ උඩඟුකම, තණ්හාව සහ ආධිපත්‍යය අතහැර පරාර්ථකාමී හා නිහතමානී බවට පත්ව ඇත. මනුෂ්‍යත්වයට සේවය කිරීම තම පරම අරමුණ කර ගනී.

මෙවන්නන් සම්බන්ධව අල්ලාහ් මෙසේ පවසයි.

*(එහෙත් එදිනදී හොඳ වහලුන්ට) "ඕ තෘප්තියට පත් ආත්මය. ඔබ ඔබගේ දෙවියන් දෙසට යනු. ඔහු මගින් ඔබ තෘප්තියට පත්වනු. ඔහු ඔබ ගැන තෘප්තියට පත්වී ඇත්තේය. ඔබ මගේ හොඳ වහලුන් සමග එකතුවී, මගේ ස්වර්ගයෙහි ඔබ ඇතුළුවනු! (යැයිද පවසනු ඇත).(89:27-30)*

දෙවිඳුන් "නෆ්ස්" යන වචනය භාවිත කරමින් ඉදිරිපත් කර ඇති කුරාන් වැකි කිහිපයක් පහතින් දක්වා ඇත.

ආත්මය දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කර සමානුපාතික කර ඇත. දෙවියන් වහන්සේ ආත්මයට හරි වැරැද්ද පිළිබඳ දැනුම ලබා දී ඇත

*මිනිසුනේ! ඔබ ඔබගේ දෙවියන්ට බිය වී කටයුතු කරනු. ඔහු ඔබ සියල්ලන්වම එකම ආත්මයකින් උත්පාදනය කළේය. (ආරම්භයේදී එම එක්කෙනාව උත්පාදනය කර) ඔහුගෙන් බිරිඳ උත්පාදනය කළේය. පසුව ඒ දෙදෙනාගෙන් බොහෝ පිරිමි ගැහැනු (ඉකුත් කර) විසිර යාමට සැලැස්සුවේය; (4:1)*

*ආත්මය මතද, එය (මිනිසා වශයෙන්) නිර්මාණය කළ අය මතද, එහි හොඳ නරක එයට දැනුම් දුන් අය මතද සත්තකින්ම. කවුරුන් (පාපයන්ගෙන් ඈත්වී) තමන්ව පරිශුද්ද කර ගත්තේද, ඔහු නියත වශයෙන්ම ජයග්‍රහනය කළේය. කවුරුන් එය (පාපයෙහි) වළලා දැම්මේද, ඔහු නියත වශයෙන්ම පරාජය අත් කර ගත්තේය. (91:7-10).*

ආත්මය පරලොවදී විනිශ්චය කරනු ලබන අතර එය උපයාගත් දේ ලැබෙනු ඇත.

*තවද එක් දිනක් ගැන බිය වනු. එදින (ණය ලබාගත් අයද, දුන් අයද ආදී) ඔබ (සියල්ලන්වම) අල්ලාහ් වෙත ගෙන එනු ලබන්නෙහුය. සෑම ආත්මයක්ම, එය කළකම් වලට පූර්ණ වශයෙන් (ඵලවිපාක) දෙනු ලබනු ඇත. තවද ඒවාට අපරාධ කරනු නොලැබේ. (2:181)*

*ඔබ එක් දිනක් ගැන බියවනු. (එදින) කුමන ආත්මයක් හෝ අනිත් ආත්මයකට කිසිම ප්‍රයෝජනයක් අත් කර දීමට නොහැක. ඒ වෙනුවෙන් (ඔහු) මැදිහත් වී කතා කිරීමද භාර ගනු නොලැබේ. තවද ඔවුන් කිසිවෙකුගෙන් කිසිම උදව්වක් කරනු නොලබන්නාහ. (2:48)*

*කවුරුන් තම දෙවියන්ගේ සන්නිධානයෙන් (ප්‍රශ්න කිරීම සඳහා නැගී සිටීම) ගැන බිය වී (පහත් වර්ගයේ ශරීර) ආශාවන්ගෙන් ඈත් වී තමන්ව වලක්වා ගත්තේද, නියත වශයෙන්ම ඔහු රැදෙන ස්ථානය ස්වර්ගයයි.(79:40,41)*

ආත්මයට නපුර කිරීමට අණ කිරීමට හැකියාව ඇත

*මිනිසුන්ගේ සිත් පාපයන් කරන මෙන් පොළඹවන්නට හැක්කක් වශයෙන්ම ඇත්තේය; (12:53)*

*නියත වශයෙන්ම අපිම මිනිසාව පළමු වරටද උත්පාදනය කළෙමු. ඔහුගේ මනසෙහි ඇතිවන සිතුවිල්ලද, අපි හොඳින් දනිමු. පිටි බෙල්ලේ ඇති පන නහරයට වඩා අපි ඔහුට ඉතාමත් සමීපව සිටින්නෙමු.( 50:16)*

ආත්මයට තමාවම වාරණය කිරීමට හැකියාව ඇත

*වරද කළ අයට නින්දා කරනු ලබන (ඔහුගේ) හෘද සාක්ෂිය මතද මා දිවුරමි. (75:2)*

සමාදානයෙන් සිටින ආත්මය පාරාදීසයට ඇතුල් කරනු ලැබේ

*(එහෙත් එදිනදී හොඳ වහලුන්ට) "ඕ තෘප්තියට පත් ආත්මය. ඔබ ඔබගේ දෙවියන් දෙසට යනු. ඔහු මගින් ඔබ තෘප්තියට පත්වනු. ඔහු ඔබ ගැන තෘප්තියට පත්වී ඇත්තේය. ඔබ මගේ හොඳ වහලුන් සමග එකතුවී, මගේ ස්වර්ගයෙහි ඔබ ඇතුළුවනු! (යැයිද පවසනු ඇත).(89:27-30)*

දෙවියන් වහන්සේගේ මාර්ගයෙහි වියදම් කිරීමෙන් ආත්මය ශක්තිමත් කළ හැකිය

*කවුරුන් තමන්ගේ වස්තුව අල්ලාහ්ගේ ශුද්ධ වූ සොම්නස බලාපොරොත්තුවෙන් තමන්ගේ සිත් ස්ථිරභාවයෙන් වියදම් කරන්නෝද, ඔවුන්ගේ (දානමානයට) තිබෙන උපමාව, උසස් භූමිය (වන කන්දක්) මත තිබෙන එක් වත්තකට සමවන්නේය; (2:265)*

ආත්මය මරණය විඳියි

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යෙන්ම විඳින්නාහ. එහෙත් ඔබගේ (ක්‍රියාවන්ට සරිලන) ඵලවිපාක ඔබ පූර්ණ වශයෙන් අත් කර ගන්නේ විනිශ්චය දිනදීය;(3:185)*

ආත්මයට වැරදි කිරීමට හෝ විනාශ කිරීමට හෝ පව් කර පසුව සමාව පැතීමට හැකිය

*කවුරුන් හෝ පාපයක් කිරීමෙන් අනතුරුව, නැතහොත් තමන් තමන්ටම නපුරක් කරගෙන පසුව (එයින් ඇත් වී ඇත්තෙන්ම පශ්චාත්තාප වී)අල්ලාහ්ගෙන් පව් ක්ෂමාව ඉල්ලා සිටියහොත් (ඔහුගේ පාපයන්ට) ඉතාමත් සමාව දෙන ආදරයෙන් බර කෙනෙකු වශයෙන්ම අල්ලාහ්ව ඔහු දකිනු ඇත. (4:110)*

*නියත වශයෙන්ම තමන් තමන්ටම හානියක් කර ගත්හ; (7:53)*

*-(මෙසේ බොරු දිවුරුම් කරන) ඔවුන් තමන්වම විනාශ කර ගන්නාහ. නියත වශයෙන්ම ඔවුන් බොරුකාරයින් යන්න අල්ලාහ් හොඳින් දන්නේය;(9:42)*

අල්ලාහ් ඔවුන් මිය ගිය විට රූහ් සහ නෆ්ස් අත්පත් කරගනී ගනී.

*මිනිසුන් මරණයට පත්වන විටද, මරණයට පත් නොවී නින්දෙහි සිටින විටද, අල්ලාහ් ඔවුන්ගේ පණ අත්පත් කර ගන්නේය. පසුව කවුරුන් කෙරෙහි මරණය නියම වූවේද, ඔවුන්ගේ පණ (තමන් වෙතම) නවතා තබා ගන්නේය. අන් අයගේ (පණ) නියමිත කාලය දක්වා (ජීවත් වීමට) ඔවුන් වෙතම ඔහු යවන්නේය. අවධානය කර දැනගත හැකි ජනතාවට මෙහි පාඩම් (බොහෝමයක්) ඇත්තේය. (39:42)*

**ආත්මය (රූහ්) සහ නෆ්ස් අවස්ථා කිහිපයක සම්බන්ධතාවයක් පෙන්වයි.**

1). ඔබ ඉපදීමට පෙර ඔබගේ ආත්මය සූදානම්ව තිබින.

2). ඔබගේ මව ගැබ් ගත් පසු කුස තුලට ඔබේ ආත්මය සම්බන්ධ වීම

3). ඔබ නිදන විට ඔබේ ආත්මය (සහ විඥානය) සුළු වෙලාවකට ඔබේ ශරීරයෙන් පිටත් වේ.

4). ඔබ මරණයට පත් වන විට ඔබේ ආත්මය (රූහ්) නෆ්ස් සමග ඔබේ ශරීරයෙන් පූර්ණව ඉවත් වේ. පුද්ගලික විඥානය සහ උප විඥානය (සිත ලෙසද මෙය අපට හඳුන්වන්න පුළුවනි) එය ශරීරය සමගම අක්‍රිය වේ. ආත්මය (රූහ්) සහ නෆ්ස් පිටත් වූ පසු ඒවා තවදුරටත් ක්‍රියාත්මක නොවේ.

පිටත් වූ රූහ් සහ නෆ්ස් දීර්ග ගමනක යෙදේ. ඒ ගැනද නබි තුමන් විස්තර කර ඇත.

5). විනිශ්චය දින නැවත නැගිටුවීමේදී ඔබ මෙලොව අතහැර දමූ සිරුර නැවත නිර්මාණය කර එය තුලට ශරීරයෙන් ඉවත්ව ගමනක යෙදුනු රූ සහ නෆ්ස් නැවත ශරීරය තුල ස්ථාපනය කරනු ලබයි. ඉන් පසු දෙවියන් ඉදිරියේ මෙලොව ජීවිතය සම්බන්ධව අවසන් විනිශ්චයට මුහුණ දෙනු ඇත.

6). විනිශ්චයට පසු රූහ් සහ නෆ්ස් දෙවියන් ආරම්භයේදී පොරොන්දු වූ අවසන් ගමනාන්ත වෙත යොමු කරනු ඇත. එනම් නිරයෙන් හෝ ස්වර්ගයෙන් අවසන් වේ. ඒවාහී අනන්තකාලයක් සිටිනු ඇත. ඒවාට ගැලපෙන අයුරින් නැවත ශරීර ලබා දෙනු ඇත.

- **4). හදවත (එනම් අවයවය නොව, ඔබ තුල ඇති සත්‍යභාවය/ හෘද සාක්ෂිය)**

මෙය අප කාටත් හුරු පුරුදු දෙයකි. ඔබ යම් කෙනෙකුට හදවතින් මොන තරම් සමීපද? ඔබ හදවතින්ම නපුරුකම් කරන කෙනෙක්ද? ඔබට හදවතට එකඟව අසාධාරනය කළ හැකිද?

ඔබ කියන දෙය, ඔබ කරන දෙය, ඔබ හිතන දෙය ඔබේ හදවතත් සමග උරගා බලන්න. එය තුල සත්‍ය ඇත, දෙවියන් එය තුල යහපත ස්ථාපනය කර ඇත. එය තුල අවංකභාවය ඇත. එය තුල සැබෑ ආදරය ඇත. එය තුල විශ්වාසනීය බව ඇත. ඔබ බලන සමහර ටෙලි නාට්‍යය බැලීමට තරම් වටිනව දැයි ඔබ ඔබේ හදවතින් විමසා බලන්න. ඔබ ඇතැම්විට අනවශ්‍යය ලෙස විනෝද වෙමින් කාලය කමින් සිටීම යුක්ති සහගත දැයි ඔබ ඔබේ හදවතින් අසා බලන්න. ඔබ ඔබ ගැන සොයා බැලුවාද? ඔබේ නිර්මාණය කෙසේ වූවා දැයි ඔබ සිතා බැලුවාද? ඔබේ නිර්මාතෘ දෙවියන් ගැන ඔබ මෙනෙහි කර බැලුවාද? මේවා ඔබේ හදවත තුලින් විමසා බලන්න. මේ සියල්ල සමගයි දෙවියන් ඔබව නිර්මාණය කර ඇත්තේ. ඔබ දෙවියන්ට ස්තුති වන්ත වෙන්න මෙතරම් වටිනා ජීවිතයක් සහ ස්වර්ගය වැනි අනර්ඝ අනාගත අවස්ථාවක් ඔබ ඉදිරියේ තබා තිබීම ගැන.

**අල්ලාහ් කුරානයෙන් මේ හදවත ගැන කතා කරයි.**

*ආත්මය මතද, එය (මිනිසා වශයෙන්) නිර්මාණය කළ අය මතද- එහි හොඳ නරක එයට දැනුම් දුන් අය මතද සත්තකින්ම, කවුරුන් (පාපයන්ගෙන් ඈත් වී) තමන්ව පාරිශුද්ධ කර ගත්තේද, ඔහු නියත වශයෙන්ම ජයග්‍රහණය කළේය. (91:7-9)*

අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ පවසා ඇත.

*අබු තාලබා වාර්තා කරයි: "අල්ලාහ්ගේ දූතයාණනි, නීත්‍යානුකූල සහ නීති විරෝධී කුමක්දැයි මට පවසන්න" යැයි මම කීවෙමි. නබි (සල්) තුමාණෝ පැවසූහ, "ධර්මිෂ්ඨකම යනු ආත්මයේ සන්සුන් භාවය සහ හදවත නම් මනසේ සාමයයි. විනිශ්චයකරුවෙකු එය අනුමත කළත් පාපය ආත්මය තුළ සන්සුන් නොවේ, හදවතට තෘප්තිමත් නොවේ." Source: Musnad Aḥmad 17742 Grade: Sahih (authentic)*

*වබීසා ඉබින් මා'බද් වාර්තා කරයි: අල්ලාහ්ගේ දූතයාණෝ, (ඔහුට සාමය හා ආශීර්වාදය ලැබේවා!), "ඔබ ධර්මිෂ්ඨකම සහ පාපය ගැන විමසීමට පැමිණියාද?" යනුවෙන් මාගෙන් ඇසීය. මම ඔව් කිව්වා. නබිතුමා තම හස්තය අල්ලා ඔහුගේ පපුවට පහර දෙමින්, "ඔබේ ආත්මය ගැන විමසන්න, ඔබේ හදවත විමසන්න, ඕ වබීසා. ධර්මිෂ්ඨකම යනු ඔබේ ආත්මයට සහ ඔබේ හදවතට සහනයක් ලබා දෙනනක් වන අතර, මිනිසුන් නැවත නැවතත් ඔවුන්ගේ විනිශ්චයන් අනුමත කළත්, පාපය ඔබේ ආත්මය තුළ සැලෙන අතර ඔබේ පපුවට ආතතියක් ඇති කරයි. Source: Sunan al-Dārimī 2533*

---

## මිනිසා සම්බන්ධව ඇති කුරාන් වැකි

දෙවියන් අපව නිර්මාණය කළ ආකාරය ඉතා සරළව එහෙත් විද්‍යාත්මකව කුරානය තුලින් පෙන්වා දී ඇත. ඔහු මෙය අපට පෙන්වා දී අපෙන් අසනු ලබන්නේ ඔහු අපව නිර්මාණය කර තිබියදීත් මිනිසා ඔහුව ප්‍රතික්ෂේප කරමින් සිටින්නේ ඇයි දැයි යන ප්‍රශ්නයයි.. දෙවියන් මිනිසාව නිර්මාණය කළ නියම කාරණාව මතුකරගෙන ඔහුගෙන් මහත් වූ වරප්‍රසාදයන් ලබා ගැනීමට යුහුසුළු වන ලෙසද අපට දන්වා සිටී.

මෙම කුරාන් වැකි සරළ ආකාරයට අපට පෙනුනත් මෙහි සඳහන් ඇතැම් වැකි දැකීමෙන් පසු කළල විද්‍යාව සම්බන්දයෙන් ලොව සිටින අග්‍රගන්‍යම මහාචාර්යවරයා වන Dr. කීත් එල්. මුවර් මහතා විශ්මයට පත් වූ බව ඔහු ප්‍රකාශ කර තිබෙනවා. නවීණ තාක්ෂණික උපකරණ නොමැතිව මෙම කුරාන්

වැකිවලින් පෙන්වා දී ඇති එම ගර්භාශයේ අවස්ථාවන් ගැන මෙතරම් නිවැරදිව කිසිම මනුෂ්‍යයයෙකුට කිව නොහැකි බව ඔහු අවධාරණයෙන් කියා සිටියි.

*නියත වශයෙන්ම අපි ඔබලාව උත්පාදනය කිරීමට අදහස් කර ඔබව (ඔබගේ මුල්ම පියා වන ආදම්ව) නිර්මාණය කළෙමු. (7:11)*

*(වියළී ගියහොත් ටං ටං යන) ශබ්දය ගෙන දෙන ඇලෙන සුළු කිරිමැටියෙන් නියත වශයෙන්ම අපිම (ඔබගේ මුල් පියා වන පළමු) මිනිසාව උත්පාදනය කළෙමු. (15:26)*

*"මා මිනිසාව නිර්මාණය කර එහි (ජීවයට අවශ්‍යය) මගේ ආත්මය ඇතුළු කළහොත් (ඔහුට ගෞරව කිරීමට) ඔබ නලල බිම තබා සුජූද් කරණු (යයි අණ කළේය). ඒ ආකාරයටම මලායිකාවරුන් සියල්ලන්ම (ඔහුට ගෞරව කිරීම සඳහා) සුජූද් කළහ. ඉබ්ලීස් හැර, ඔහු සුජූද් කරන්නන් සමග එක්කාසු වී සුජූද් නොකර ඇත් වූවේය". (15:29,30,31).*

*ඔහුම ඉන්ද්‍රීය බිඳකින් මිනිසාව උත්පාදනය කළේය. එසේ තිබියදී ඔහු (දෙවියන් සමග ප්‍රකට සතුරෙකු වශයෙන් සිටින්නේය. (16:4)*

*(මිනිසුනේ!) ඔබ සියල්ල එකම ආත්මයකින් උත්පාදනය කර, පසුව (ඔබගේ) පියා වෙත) රැඳී සිටීමට සලස්වා (ඔබගේ මවගේ ගර්භයෙහි) බාරදෙන්නේද ඔහුය. (6:98)*

*කිසිවක් ඔබ නොදන්නා අය වශයෙන් සිටියදී, ඔබගේ මව්වරුන්ගේ කුසෙන් අල්ලාහ්ම ඔබව ඉකුත් කළේය. තවද, ඔබට කණ්ද, ඇස්ද, හෘදයද, ලබා දුන් අය ඔහුය. (මෙයට) ඔබ (ඔහුට) කෘතඥ වනු මැනව.(16:78)*

*මිනිසුනේ! විනිශ්චය දිනදී ඔබට පණ දී නැගිට්ටවීම ගැන ඔබ සැක සිතුවහොත් (ඔබව පළමුවෙන්ම) කෙසේ උත්පාදනය කළෙමු දැයි යන්න අවධානය කර බලනු). නියත වශයෙන්ම අපි ඔබව (ඔබගේ මුල් පියා වන ආදම්ව) කිරි මැටියෙන් උත්පාදනය කළෙමු. පසුව (ඔබව) ඉන්ද්‍රීය බිඳකින් උත්පාදනය කර පසුව එය එක් ලේ කැටියක් වශයෙන්ද, පසුව (එය) අඩු රුවකින් යුත් නැතහොත් පූර්ණ රුවකින් යුත් මාංශ පිණ්ඩයක් වශයෙන්ද අපි උත්පාදනය කරන්නෙමු.*

*අපගේ බලසම්පන්නකම ඔබට පැහැදිලි කරණු පිනිස (මෙසේ කර), අපි අදහස් කල අයව ගර්භයන්හී නියමිත කාලයක් දක්වා රැඳී සිටින සේ සලස්වන්නෙමු. පසුව ඔබව ළදරුවන් වශයෙන් ඉකුත් කර ඔබ, ඔබගේ තරුණ විය අත් කර ගැනීමට සලස්වන්නෙමු. (මේ අතර) මරණයට පත්වන්නන්ද ඔබ අතරෙන් සමහරෙක් ඇත්තාහ. (නැතහොත් ජීවත්ව සිටිමින්) සියල්ල දැනගත්තායින් පසු කිසිවක් නොදන්නා කෙනෙකු බවට පත් වන මහළු වයස දක්වා (ජීවත් වීමට) අත්හැර දමන්නන්ද ඔබගෙන් සිටින්නාහ. මිනිසුනේ! භූමිය (කිසිම භෝගයක් නොමැති) පාළු කර්කශක (භූමියක්) වශයෙන් තිබෙනු ඔබ දුටුවේ නැද්ද? ඒ මත අපි වර්ෂාව වසින්නට සැලැස්සුවහොත් එය සශ්‍රීක වි, වැඩී අලංකාරවත් විවිධ වර්ගයේ (ජෝඩු ජෝඩු වශයෙන්) වැඩෙන්නට සලස්වනු ලැබේ. (22:5)*

*නියත වශයෙන්ම (ආරම්භයේදී පළමු) මිනිසාව කිරිමැටි සාරයෙන් උත්පාදනය කළෙමු. පසුව එය අපි ඉන්ද්‍රීය බිඳක් බවට පත්කර ඉතාමත් ප්‍රවේසම් සහිත ස්ථානයක තැම්පත් කළෙමු. පසුව එම ඉන්ද්‍රීය බිඳ ලේ කැටියක් බවට පත් කළෙමු. පසුව එම ලේ කැටිය මාංශ පිණ්ඩයක් බවට පත් කළැමු. පසුව එම මාංශ පිණ්ඩයේ ඇට කටු නිර්මාණය කර, එම ඇට සැකිල්ලට මස් මාංශ ඇන්දෙව්වෙමු. පසුව එය (පූර්ණ) මිනිස් ජීවිතයක් බවට පත් කළෙමු. මෙසේ උත්පාදනය කළ අල්ලාහ් ඉමහත් භාගයාවන්තයෙකි. ඔහු උත්පාදකයින්ගෙන් ඉතාමත් අලංකාරවන්තයෙකි (23:12,13,14)*

*ඔහු ඔබව පස් වලින් උත්පාදනය කළේය. පසුව ඔබ මිනිසුන් බවට පත් වී (භූමියෙහි විවිධ ප්‍රදේශයන්හී) විසිරී යාමට හැරීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දෙයකි. (30:20)*

*ඔබ එක්කාසු වී ජීවත්විය හැකි ඔබගේ භාර්යාවන්ව (ඔබ ඔවුන් වෙත හිත සුව ලැබීම පිණිස) ඔබගෙන්ම (ඔහු) නිර්මාණය කර, ඔබ අතරේ ආදරයද, කරුණාවද ඇති කර තැබීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. (එකක් නොව, බොහෝමයක්) සාධක ඇත්තේය. (30:21)*

*ඔබගෙන්ම ඔබ වෙනුවෙන් භාර්යාවන් අල්ලාහ් නිර්මාණය කර ඇත්තේය. තවද, ඔබගේ භාර්යාවන්ගෙන් දරුවන්ද, මුනුබුරු මිණිබිරියන්ද උත්පාදනය කර, ඔබට හොඳ ආහාරයන්ද කවන්නේය; (16:72)*

*ඔහු උත්පාදනය කළ සෑම වස්තුවක්ම (එහි හැඩයද) ඉතාමත් අලංකාරවත් ලෙස නිර්මානය කළේය. ඔහුම ආරම්භයේදී මිනිසාව කිරිමැටියෙන්ම උත්පාදනය කළේය.(32:7)*

*පසුව එක් අල්ප බිඳක් වන (ඉන්ද්‍රිය) සාරයෙන් ඔහුගේ පරම්පරාවේ දරුවන්ව (නිර්මාණය කර) ඇති කළේය.(32:8) පසුව එය රූපයක් වශයෙන් අඹා තමන්ගේ රූහ් වෙතින් එහි පිඹ (මිනිසාව ඇති) කළේය. හෘදයන් ආදී දැයද ඔහුම නිර්මාණය කළේය. (මෙසේ තිබියදී ඔබ කෘතඥ වීම ඉතාමත් අල්පයකි. (32:9)*

*අල්ලාහ් ඔබව ආරම්භයේදී පස් වලින් උත්පාදනය කළේය. පසුව එක් ඉන්ද්‍රිය බිඳකින්ද, පසුව (පිරිමි - ගැහැණු) ජෝඩු බවට ඔබව පත් කළේය. ඔහු නොදැනුවත්ව කිසියම් හෝ කාන්තාවක් ගැබ් ගන්නේද නැත, ප්‍රසූත කරන්නේද නැත. ඔහුගේ සටහන් පුස්තකයෙහි නොමැතිව කිසිවකුගේ වයස වැඩි කරනු ලබන්නේද නැත, කිසිවකුගේ වයස අඩු කරනු ලබන්නේද නැත. නියත වශයෙන්ම මේවා සියල්ල දැනගෙන සිටීම අල්ලාහ්ට ඉතාමත් සුළු දැයකි. (35:11)*

*ඔහු ඔබව (ආරම්භයේදී) එකම මිනිසෙකුගෙන් නිර්මාණය කර තිබුණි. පසුව ඔහුගෙන් ඔහුගේ බිරිඳව නිර්මාණය කළේය. (ඒ දෙදෙනාගෙන්, ඔබව පිරිමි, ගැහැණු වශයෙන් උත්පාදනය කරන්නේය). තවද, (ඔබගේ යහපතටම) සතුන් අට වර්ගයක් ජෝඩු ජෝඩු වශයෙන් පහළ කර ඇත්තේය. ඔබගේ මව්වරුන්ගේ කුසයෙහි එකකට පසු එකක් වශයෙන් අඳුරු වහන්තරාවන් තුනක් තුළ තබා ඔබව උත්පාදනය කරන්නේය. මෙම අල්ලාහ්ම ඔබගේ දෙවියන්ය. සියලු රාජ්‍යයන් ඔහුටම අයත් දැයයි. ඔහු හැර, වෙන දෙවියෙකු නැත. එබැවින් (ඔහුව අතහැර දමා) ඔබ කොහේ නම් (යන්නට) හැරෙන්නෙහුද? (39:6)*

*පසුව පිරිමි ගැහැණු මිශ්‍ර වූ එක් ඉන්ද්‍රීය බිඳක් මගින් නියත වශයෙන්ම අපිම මිනිසාව උත්පාදනය කළෙමු. ඔහුව අපි පිරික්සීම පිණිසම සවණ ඇති අය වශයෙන්ද, බැල්ම ඇති අය වශයෙන්ද, ඔහුව පත් කළෙමු. (76:2)*

*ඈතට පනිමින් ඉකුත් වන එක් ජල බිඳක් මගින්ම (මිනිසාව) උත්පාදනය කරණු ලැබුවේය. එය කොඳු ඇටවලටද, ඉල ඇට වලටද මධ්‍යයෙන් ඉකුත් වන්නේය. (86:6,7)*




*නියත වශයෙන්ම අපි මිනිසාව එක් ඉන්ද්‍රීය බිඳකින් උත්පාදනය කළෙමු යන්න ඔවුන් අවධානය කළේ නැද්ද? එසේ තිබියදී ඔහු ප්‍රකට සතුරෙකු බවට පත්වී අපට වෙනස්කම් කිරීමට ඉදිරිපත් වන්නේය. (36:77)*

*සෑම මිනිසෙකුටම (ඔහු පිටතට පැමිණීමට) පෙර කාලයක් ගත වූයේ නැද්ද? (එහි) ඔහු අසවල් වස්තුව යැයි කීමට නොමැති තත්වයක සිටියේය (76:1)*

*ඔහු තමන්ගේ උත්පාදනය (තමන්ව කෙසේ නිර්මාණය කරනු ලැබුවේද) යන්න අමතක කර දමා, එක් උදාහරණයක් අප වෙත ගෙනහැර දක්වන්නේය. "දිරා පත්ව පස් බවට පත්වූ (මෙම) ඇටසැකිල්ලට පණ දෙන්නේ කවරෙක්දැයි?" ඔහු විමසන්නෙහුය. (36:78)*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම අත් විඳින්නාහ. පින් පව් කරන තත්වයෙන් අපි ඔබව (තබා) පිරික්සන්නෙමු. පසුව ඔබ අප වෙතම ගෙන එනු ලබන්නෙහුය. (21:35)*

*කාන්තාවන්, දරුවන්, රණ් රිදී විශල පොදි, උසස් අශ්වයින් (එළු, බැටළු, ගව, ඔටුවන් වැනි) ගමේ සතුන්, ගොවිතැන් ආදිය මත ඉමහත් ආශාවක් ඇති කර ගැනීම මිනිසුන්ට අලංකාරවත් කර ඇත්තේය. (එහෙත් මේවා (සියල්ල අස්ථාවර) මෙලොව ජීවිතයෙහි (අල්ප) සැප සම්පත්ය! අල්ලාහ්ගේ සන්නිධානයෙහි නම්, (ස්ථිර වූ) අලංකාරවත් වාසස්ථානයක් ඇත. (3:14)*

*අල්ලාහ් තමන් කැමති අයට අප්‍රමාණව ලබා දෙන්නේය. (තමන් කැමති අයට) සීමා සහිතවද ලබා දෙන්නේය. එහෙත්, (ප්‍රතික්ෂේප කරන්නන්) මෙලොව ජීවිතය මගින් සතුටට පත්වන්නාහ. මෙලොව ජීවිතය නම්, පරලොව සමග (සසඳා බලන විට) ඉතාමත් අල්ප දැයක් මිස වෙන කිසිවක් නැත. (13:26)/[34:39]*

*(මරණයට පත්ව දිරාපත් වී පස් වූ) ඔහුගේ ඇටකටු අපි එක්කාසු නොකරන්නෙමු යයි මිනිසා අදහස් කරමින් සිටින්නෙහිද? නොඑසේය, ඔහුගේ ඇඟිලි තුඩු පවා (පෙර තිබූ ආකාරයටම) සකස් කිරීමට අපි බලසම්පන්න වන්නෙමු. (75:3,4)*

*මිනිසාණෙනි! ඔබගේ ගෞරවණීය දෙවියන් ගැන ඔබව රවටා දැමුවේ කිමෙක්ද? ඔහුම ඔබව උත්පාදනය කර, උසස් අන්දමට හැඩරුව නිර්මාණය කර, ඉතාමත් නියමිත ආකාරයට සකස් කළේය. ඔහුම තමන් කැමති (ඉතාමත් අලංකාරවත්) හැඩයකින් ඔබව (ඔබේ අවයවයන්) සවි කළේය. (82:6,7,8)*

*සෑම මිනිසෙකු වෙතම (අප විසින් ඇති කරන ලද) අවධානය කළ හැකි කෙනෙකු (මලායිකාවරයෙකු) නැත්තේ නොවේ. එබැවින් මිනිසා (තමන්) කුමක් නිසා උත්පාදනය කරණු ලැබ ඇත්තේ දැයි පොඩියක් අවධානය කර බැලිය යුතුය. (ඇතට) පනිමින් ඉකුත් වන එක් ජල බිඳක් මඟින්ම (ඔබව) උත්පාදනය කරණු ලැබුවේය. (36:4,5,6)*

*නියත වශයෙන්ම අපි මිනිසාව ඉතාමත් අලංකාරවත් හැඩයකට උත්පාදනය කර ඇත්තෙමු. (ඔහුගේ නපුරු ක්‍රියාවන් හේතුවෙන්) පසුව ඔහුව දීන වූවන්ගෙනුත් දීන වූවෙකු බවට අපි පත් කර හරින්නෙමු. (95:4,5)*

*මිනිසුන් මරණයට පත්වන විටද, මරණයට පත් නොවී නින්දෙහි සිටින විටද, අල්ලාහ්ම ඔවුන්ගේ පණ අත්පත් කර ගන්නේය. පසුව කවුරුන් කෙරෙහි මරණය නියම වූවේද, ඔවුන්ගේ පණ (තමන් වෙතම) නවතා තබා ගන්නේය. අන් අයගේ (පණ) නියමිත කාලය දක්වා (ජීවත් වීමට) ඔවුන් වෙතම ඔහු යවන්නේය. අවධානය කර දැනගත හැකි ජනතාවට නියත වශයෙන්ම මෙහි පාඩම් (බොහෝමයක්) ඇත්තේය. (39:42)*

*භූමියෙහි ඇතුළු වී යාමද, එයින් පිටවී යාමද, අහසින් බැසීමද, ඒ දෙසට (භූමියේ සිට) නැගීමද, ඔහු හොඳින් දන්නේය. ඔබ කොහේ සිටියා වුවද, ඔහු ඔබ සමග සිටින්නේය. අල්ලාහ් අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන්ම සිටින්නේය. (57:4)*

*ඔබව පස් වලින් නිර්මාණය කළ අවස්ථාවේදී ඔබගේ (ගති ගුණයන්) ඔහු හොඳින් දන්නේය. ඔබ ඔබගේ මවගේ කුසයෙහි (මාංශ පින්ඩයක් වශයෙන්) සැඟවී තිබූ අවස්ථාවෙහිද, (ඔබව ඔහු හොඳින් දන්නේය); (53:32)*

*(විශ්වාසවන්තයිනි!) අද පටන් (අනුභව කිරීමට) පරිශුද්ධ වූ දෑයම ඔබට අනුමත කර ඇත්තේය. ධර්මය හිමි අයගේ ආහාරයද ඔබට අනුමතය. ඔබගේ ආහාරයද ඔවුන්ට අනුමත දැයයි! විශ්වාසය තැබූ කුල කාන්තාවන්ද, ඔබට පෙර ධර්මය ලබා දෙන කුළ කාන්තාවන්ද, වෂ්‍යාවන් වශයෙන් හෝ අනියම් බිරියන් වශයෙන් හෝ අත් කර නොගෙන, ඔවුන්ට දිය යුතු මහර් ලබා දී (විවාහ කර) ගැනීම ඔබට අනුමතයි; (5:5)*

*සාමාන්‍යයෙන් භූමියෙහි හෝ නැතහොත් (පෞද්ගලිකව) ඔබට හෝ ඇතිවිය කුමණ අමාරුකමක් හෝ (පාඩුවක් හෝ) ඒවා අපි උත්පාදනය කිරීමට පෙරම (ලව්හුල් මහ්ෆූල් නැමති) පොතෙහි (සටහන් කරනු ලැබ) නැත්තේ නොවේ. නියත වශයෙන්ම මෙය අල්ලාහ්ට ඉතා ලෙහෙසි දැයකි. (57:22)*

*නියත වශයෙන්ම ඔහුම ඔබව සිනාසෙන්නට සලස්වන්නේය, හඬන්නටද සලස්වන්නේය. නියත වශයෙන්ම ඔහුම (ඔබව) මරණයට පත්වන්නටද සලස්වන්නේය. (නැවතත්) පණ දෙන්නේය. (53:43,44)*

*(කිසිම) ප්‍රශ්නයක් නොඅසා අත්හැර දමන්නෙමු යැයි මිනිසා අදහස් කළෙහිද? (75:36)*

*නියත වශයෙන්ම අපිම මිනිසාව (පළමු වරට) උත්පාදනය කළෙමු. ඔහුගේ මනසෙහි ඇතිවන සිතුවිල්ලද, අපි හොඳින් දනිමි. පිටි බෙල්ලේ ඇති පන නහරයට වඩා අපි ඔහුට ඉතාමත් සමීපවයෙන්ම සිටින්නෙමු. (50:16)*

*දකුණු පැත්තේ කෙනෙකුද, වම් පැත්තේ කෙනෙකුද වශයෙන් දෙදෙනෙකු සිටිමින් (ඔහුගේ වැඩ කටයුතු) සටහන් කරමින් සිටින්නාහ. (50:17)*

*(මිනිසා) කුමක් පැවසුවා වුවද, (එය ලිවීමට) බලාපොරොත්තුවෙන් සිටින කෙනෙකු, ඔහු වෙත නැත්තේ නොවේ. (ඔහුගේ මුවින් පිටවෙන සෑම වචනයක්ම එවෙලෙ එවෙලේම සටහන් කරනු ලබන්නාහ), (50:18)*

*කවුරුන් (මෙම ධර්මය) ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ට විනාශයයි. ඔවුන්ගේ කකුල් අස්ථාවර කර) ඔවුන්ගේ ක්‍රියාවන් සියල්ල ප්‍රයෝජනවත් නොවන දැය බවට පත් කරනු ඇත. (47:9)*

*නමුත්, කවුරුන් තමන්ගේ දෙවියන්ට අවනත වී කටයුතු කරන්නෝද, ඔවුන්ට (ස්වර්ගයන්හී) තට්ටු පිට තට්ටු වශයෙන් ඇති මාලිගාවන් ඇත. ඒවායේ දිය දහරා සදා ගලමින් ඇත. (මෙයම) අල්ලාහ්ගේ පොරොන්දුවකි. අල්ලාහ් (තමන්ගේ) පොරොන්දුවෙන් වෙනස් වන්නේ නැත. (39:20)*

*මිනිසුනේ! ඔහු කැමති වුවහොත් ඔබව විනාශ කර දමා (ඔබ වෙනුවට) අන් අයව ගෙනවිත් (ඔබගේ ස්ථානයෙහි තබා) හරින්නේය. අල්ලාහ් මෙසේ කිරීමට බලසම්පන්නයෙකු වශයෙන් සිටින්නේය. (4:133)*

**කුරාන් හි සඳහන් කළල විද්‍යාව සම්බන්ධ වැකි ගැන මහාචාර්ය කීත් මෝර් මහතාගේ අදහස් බලන්න.*

---

# විශ්මිත මිනිස් සිරුර.

මිනිස් සිරුර නිර්මාණය වී ඇත්තේ විවිධ ඒකක ට්‍රිලියන ගනනින් ඉතා සූක්ෂමව හා ක්‍රමානුකූලව ඒවා එකිනෙක අතර සම්බන්ධ වීමෙනි.

ඔබේ ශරීරය අවයව 80කින් පමණ සමන්විත විශ්මිත (ඇදහිය නොහැකි තරම් සංකීර්ණ) නිර්මාණයකි.

ඔබට එම අවයවයන් පිළිබඳව විමසිලිමත්ව බලන්න වෙලාවක් තිබුනාද? ඔබ ගතකරන සෑම මොහොතකම මේවා ඔබ වෙනුවෙන් මොන තරම් අගනා ක්‍රියාවලියක නිරත වෙනින් සිටිනවාද? බුදු දහමෙ නම් මේවා ගැන සිහිකරමින් කරන පිලිකුල් භාවනාව නම් භාවනාවන්ද ඇත. මගෙ අදහස අනුව එය පිළිකුල් භාවනාව ලෙස නොව විශ්මිත භාවනාව ලෙසින් හැදින් වූවානම් අගනේය.

මදක් නතර වී මෙය කියවා බලන්න.

**මේ ඔබ සතු විශ්මිත අවයවයන් කිහිපයකි.**

ඇස්, කන්, නාසය, දිව, සම, මුඛය, දත්, මොළය, තයිරොයිඩ්, ස්නායු, හදවත, ධමනි, කේශනාලිකා, ශිරා, පෙනහළු, මාංශ, පේශී, චර්මාභ්‍යන්තර පටක, අක්මාව, ප්‍රාචීරය, ඇටසැකිලි, කොඳු ඇට පෙළ, ඇටමිදුළු, අග්න්‍යාශය, නියපොතු, ස්වරාලය, ලවණ ග්‍රන්ථි, අන්තරාලය, රෝම කූප, වසා ගැටිති, අග්න්‍යාශය, පිටියුටරි ග්‍රන්ථිය, පුරස්ථි ග්‍රන්ථි, පියයුර, ආමාශය, කුඩා අන්ත්‍ර, විශාල අන්ත්‍ර, වකුගඩු, මුත්‍රාශය, මුත්‍ර මාර්ගය, ගුද මාර්ගය, ගුදය, වෘෂණ කෝෂ

ශිෂ්ණය නාභිය, ගර්භාෂය, වැදෑමහ, ඩිම්බ කෝෂ, පැලෝපීය නාල, ගැබ්ගෙල, යෝනි මාර්ගය, භගමණිය...,

මෙය කියවන ඔබ මිනිස් සිරුර සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙක් වීමටද පුළුවන. ඔබ තව දුරටත් විශ්වාස කරනවා නම් ආදී සූපයයෙන් සහ ඩාවින්ගේ පරිණාමවාදයට අනුව මේ තරම් සංකීර්ණ තත්වයක් කරා මිනිස් සිරුර ඉබේ සැකසුනා කියා, එසේ නම ඔබට කොතැනක හෝ වැරදිලා ඇත. එය තහවුරුකරගෙනම මෙහි විශ්මිත බව අත් විදීමට මුලින්ම පරිණාමවාදය සහ දෙවියන්ගේ නිර්මාණ යන ලිපිය කියවා බලන ලෙසට මම ඔබට ආරාධනා කරමි.

දෙවියන් විසින් විශ්මිත අයුරින් මිනිසාව නිර්මාණය කළ බව දිව්‍ය හෙලිදරව්වක් වන ශුද්ධ වූ කුරාණය තුලින් අවස්ථා කිහිපයකදීම පෙන්වා දී ඇත. ඉන් කිහිපයක් මෙහි සඳහන් කර ඇති අතර වැඩි විස්තර මෙහි අවසානයට ඇති සබැදි වලින් ලබා ගත හැක.

*සියල්ලන්ටම වඩා) ශ්‍රේෂ්ඨයෙකු හා ඥානවන්තයෙකු වන අල්ලාහ් (දෙවිඳුන්) විසින් මෙම ධර්මය පහළ කරනු ලැබ ඇත්තේය. (46:2)*

*(මිනිසුනේ!) මෙම කුරානය ඔවුන් ගැඹුරින් අවධානය කළ යුතු නොවේද? මෙය අල්ලාහ් නොවන කෙනෙකුගෙන් පැමිණ තිබුනේ නම්, මෙහි අනන්තවත් වැරදිද, භේදයන්ද ඔවුන් දකිනු ඇත. (4:82)*

*මිනිසුන්ව තෘප්තියට පත් කිරීමට අවශ්‍යය උදාහරණයන් සියල්ල මෙම කුර්ආනයෙහි නියත වශයෙන්ම අපි පවසා ඇත්තෙමු. (30:58)*

*"මන්ද ඔවුන් අල් කුරානය අධ්‍යනය නොකරන්නේ, ඔවුන්ගේ සිත් තුලට අගුලු දමා තිබේද?" (47:24).*

*නියත වශයෙන්ම (ආරම්භයේදී පළමු) මිනිසාව කිරිමැටි සාරයෙන් උත්පාදනය කළෙමු. පසුව එය අපි ඉන්ද්‍රිය බිඳක් බවට පත්කර ඉතාමත් ප්‍රවේසම් සහිත ස්ථානයක තැම්පත් කළෙමු. පසුව එම ඉන්ද්‍රිය බිඳ ලේ කැටියක් බවට පත් කළෙමු. පසුව එම ලේ කැටිය මාංශ පිණ්ඩයක් බවට පත් කළැමු. පසුව එම මාංශ පිණ්ඩයේ ඇට කටු නිර්මාණය කර, එම ඇට සැකිල්ලට මස් මාංශ*

*ඇන්දෙව්වෙමු. පසුව එය (පූර්ණ) මිනිස් ජීවිතයක් බවට පත් කළෙමු. මෙසේ උත්පාදනය කළ අල්ලාහ් ඉමහත් භාගයයවන්තයෙකි. ඔහු උත්පාදකයින්ගෙන් ඉතාමත් අලංකාරවන්තයෙකි (23:12,13,14)*

*නියත වශයෙන්ම අපි සෑම වස්තුවක්ම (නියමිත්) ප්‍රමාණයට අනුවම නිර්මාණය කර ඇත්තෙමු. (54:49)*

*ඔහුම ඔබව උත්පාදනය කළ අයයි. (එසේ තිබියදී) ඔහුව ප්‍රතික්ෂේප කරන අයද ඔබගෙන් ඇත. (ඔහුව) විශ්වාස කරන අයද ඔබගෙන් ඇත. ඔබ කරන දෑය අල්ලාහ් අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන් සිටින්නේය. (64:2)*

*බැලිය හැකි ඇස් දෙකක්ම අපි ඔහුට ලබා දුන්නේ නැද්ද? එසේ තිබියදී සත්‍යය ඔහු දුටුවේ නැත. දිවක්ද, තොල් දෙකක්ද (අපි ඔහුට ලබා දුන්නේ නැද්ද?). ඒවා ඉබේම ඔහු අත් කර ගත්තේද? නැත. (90:8,9)*

*කිසිවක් ඔබ නොදන්නා අය වශයෙන් සිටියදී, ඔබගේ මව්වරුන්ගේ කුසෙන් අල්ලාහ්ම ඔබව ඉකුත් කළේය. තවද, ඔබට කණ්ද, ඇස්ද, හෘදයද, ලබා දුන් අය ඔහුය. (මෙයට) ඔබ (ඔහුට) කෘතඥ වනු මැනව.(16:78)*

- ඔබේ ශරීරය සෛල ට්‍රිලියන 36 කින් පමණ සමන්විත වන අතර එය විවිධ වර්ග 200 කට පමණ බෙදා ඇත.
- සෛල බිලියන 100ක් පමණ සහිතව ඔබේ ශරීරයේ විශාලතම ඉන්ද්‍රිය වන සම සෑදී ඇත.
- ඔබට මාංශ පේශී 640ක්, සන්ධි 360ක්, අස්ථි 206ක් සහ රෝම කූප 100,000ක් පමණ ඇත.
- සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ සිරුරේ සෛල වර්ග 200ක් පමන ඇත.
- වැඩුනු පිරිමියෙකුගේ සිරුරේ සෛල ට්‍රිලියන 36 (36,000,000,000,000) පමණද, කාන්තාවකගේ සිරුරේ සෛල ට්‍රිලියන 28ක් පමණද, අවුරුදු 10ක දරුවෙකුගේ සිරුරේ සෛල ට්‍රිලියන 17ක් පමණද ඇත.

❖ ඊට අමතරව මිනිස් සිරුර තුළ සහ ඒ මත තවත් බැක්ටීරියා (වර්ග දහසක් පමන) ගනනින් ට්‍රිලියන 39 ක් පමණ ක්‍රියාත්මකව ඇත.

හෘදය

❖ ඔබේ හදවත දිනකට 100,000 වාරයක් ස්පන්දනය වේ - එය දළ වශයෙන් වසරකට ස්පන්දන මිලියන 35 ක් සහ ජීවිත කාලය තුළ ස්පන්දන බිලියන 2.5 කි.
❖ සෑම ස්පන්දනයකින්ම, හෘදය ශිරා සහ ධමනි විශාල ජාලයක් හරහා රුධිරය පොම්ප කරයි, සෑම සෛලයකටම ඔක්සිජන් සහ අත්‍යවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ ලබා දෙන අතරම කාබන් ඩයොක්සයිඩ් සහ අපද්‍රව්‍ය එකවර ඉවත් කරයි.
❖ ඇත්ත වශයෙන්ම, ඔබේ හදවත කොපමණ රුධිර ප්‍රමාණයක් පොම්ප කරයිද යත් එය එක් දිනක් තුළ ඔබේ ශරීරය හරහා සැතපුම් 12,000 (කිලෝමීටර් 19,000) පමණ ගමන් කරයි, එය පෘථිවියේ විෂ්කම්භය මෙන් දෙගුණයක් වේ.
❖ තවද මෙම විශිෂ්ට ඉන්ද්‍රිය හෙවත් එන්ජිම වෙහෙස නොබලා ක්‍රියා කරයි. ජීවිත කාලය පුරාවටම නොනවත්වා ඇති වූ හෘද ස්පන්දන ගණන සලකා බැලීමේදී මෙම කුඩා නමුත් බලවත් ඉන්ද්‍රියයට ඇදහිය නොහැකි කල්පැවැත්ම සහ ඔරොත්තු දීමේ හැකියාවක් ඇති බවට සාක්ෂි දරයි.

මිනිස් මොළයේ මතක ධාරිතාවය

❖ Scientific American සඟරාවේ ලිපියක සඳහන් කර ඇති පරිදි වැඩිහිටි මිනිස් මොළයට ගිගාබයිට් මිලියන 2.5 (2,500,000GB)කට සමාන මතකයක් රැස් කර ගත හැකිය. iPhone 8plus දුරකථනයක ගබඩා ධාරිතාව 256GB කි. එනම් මිනිස් මොළයේ ධාරිතාවය දළ වශයෙන් iPhone 8plus දුරකථන 9,765 කට සමානය. එය තව විදිහකින් කියනවා නම්, 1GB ප්‍රමාණයේ පැය දෙකේ චිත්‍රපට මිලියන 2.5 ක් ගබඩා කල හැක. ඒවා එක දිගටම බලන්න ගත්තොත් ඔබට පැය මිලියන 5ක් ගත වෙයි, එනම් වසර 570ක් ගත වෙයි.

මොළයේ සෛල

- ❖ නව පර්යේෂණ වලට අනුව සාමාන්‍ය පිරිමි මොළයේ සෛල බිලියන 171 (171,000,000,000) ක් පමණ ඇත. එයින් බිලියන 86 ක් පමණ නියුරෝන සෛලය. (නියුරෝන යනු මොළය පුරා සංඥා සම්ප්‍රේෂණය කිරීමට උපකාර වන සෛල වේ). සාමාන්‍යයෙන්, මොළයේ සම්බන්ධතා ට්‍රිලියන 100කට වඩා සමන්විත වේ. සෑම නියුරෝනයකටම සම්බන්ධතා 1,000 ක් පමණ සෑදීමට හැකියාව ඇත. එය විභව උපාගම (potential synapses) 1,000කට පමණ පරිවර්තනය වේ. මොළයේ උපාගම ට්‍රිලියන 125ක් පමණ ඇත. සෑම උපාගමයකටම තොරතුරු 4.7bits දක්වා ගබඩා කළ හැක.

මිනිස් DNA

- ❖ DNA යනු ජීවියෙකුගේ වර්ධනය සහ ක්‍රියාකාරිත්වය සඳහා ජානමය තොරතුරු රැගෙන යන අණුවයි.
- ❖ එක මිනිසෙකුගේ DNA සියල්ල දිග නූලක් ලෙස සැකසුවොත් එය සම්පූර්ණ දිග කිලෝමීටර බිලියන 575කට පමණ ආසන්න වේ. (575,000,000,000 km).
- ❖ අපේ පෘථිවිය වටේ වට ලක්ශ 143 ක් පමණ එතිය හැකි තරම් දිගය. පෘතුවියේ සිට සූර්යයා වෙත 300 වතාවක් යන එන ගමනක් මෙනි. අපගේ සෞරග්‍රහ මණ්ඩලයේ විෂ්කම්භය මෙන් දෙගුණයක් පමණ දිග තරම්ය.

රතු රුධිර සෛල

- ❖ ඔබේ ශරීරයේ රතු රුධිර සෛල ට්‍රිලියන 30ක්, රුධිර නාල බිලියන 42ක් සහ ලේ ලීටර් 6ක් (ගැලුම් 1.6ක්) පමණ ඇත.
- ❖ ඔබේ රුධිරය ඔබේ සිරුරේ බරෙන් 10%ක් පමණ වේ.
- ❖ සෑම තත්පරයකටම රතු රුධිර සෛල මිලියන 2ත් 3ත් අතර ප්‍රමාණයක් ඇට මිදුළු තුළ නිපදවා සංසරණයට මුදා හරිනු ලැබේ. තත්පරයක් තුල එවැනිම රතු රුධිර සෛල ප්‍රමාණයක් මිය යයි.

වරකට පිරිමි ශුක්‍රාණු කීයක් මුදා හරිනවාද?

- සාමාන්‍යයෙන් පිරිමින් ශුක්‍රාණු පිට කරන සෑම අවස්ථාවකම ශුක්‍රාණු මිලියන 100කට ආසන්න ප්‍රමාණයක් මුදාහරිනවා. (100,000,000)
- කාන්තාවකගේ ඩිම්බය සංසේචනය කිරීමට අවශ්‍ය වන්නේ එක් ශුක්‍රාණුවක් පමණි.

සාමාන්‍ය මිනිස් හිසක කෙස් වල දිග.

- විද්‍යාඥයින් විශ්වාස කරන්නේ හිසකෙස් වසරකට අඟල් 6ක් පමණ වර්ධනය වන අතර සාමාන්‍ය හිසක කෙස් 100,000ක් පමන ඇති බවයි.
- ඉතින්, අවුරුදු 67.2 ක සාමාන්‍ය ආයු කාලයක් ගන්න. 6 x 100,000 x 67.2 අඟල් 40,320,000 ට සමාන වන අතර එය 1,000 km ක් පමණ වේ.
- ශ්‍රී ලංකාව වටා ඇති දුර මීට ටිකක් විතර වැඩිය. එනම් එය 1,340 km කි.

ඇස

- ඔබ සතුව දෘෂ්ටි විතානයේ සෛල මිලියන 127 ක් පමණ ප්‍රමාණය ඇති අතර එමඟින් ඔබට විවිධ වර්ණ මිලියන 10 ක් වැනි පරාසයක් තුල විවිධ වර්ණවලින් ලෝකය දැකීමට ඉඩ සලසයි.

කෙල

- ඔබ ඔබේ ජීවිත කාලය තුළ කෙල ලීටර් 23,000 (ගැලුම් 6,075) පමණ නිෂ්පාදනය කරයි, එය පිහිනුම් තටාක දෙකක් පිරවීමට ප්‍රමාණවත් වේ.

නාසය

- ඔබේ නාසයේ විවිධ ගන්ධයන් 50,000ක් පමණ වෙන්කර හඳුනා ගැනීමට ඉඩ සලසන ආඝ්‍රාණ ප්‍රතිග්‍රාහක 1000ක් පමණ ඇත.

පෙනහළු

- ❖ ඔබේ පෙනහළු ඔබට දිනකට හුස්ම 23,000 ක් පමණ හුස්ම ගැනීමට ඉඩ සලසයි,

ඇඟිලි සලකුණු

- ➢ ඇඟිලි සලකුණු දෙකක් සමාන නොවේ.
- ➢ ඔබගේ සියලුම ඇඟිලි සලකුණු වෙනස් වේ.
- ➢ එකම DNA බෙදාගන්නා සමාන නිවුන් දරුවන් පවා විවිධ ඇඟිලි සලකුණු ඇත.
- ➢ අත්ල, ඇඟිලි තුඩු, යටිපතුල් සහ ඇඟිලි මතුපිටින් ඇඟිලි සලකුණු සෑදිය හැක.
- ➢ ඇඟිලි සලකුණු දහඩිය නිසා ඇති වන අතර ඩයි වර්ග, රසායන ද්‍රව්‍ය හෝ ලේසර් භාවිතයෙන් අධිකරණ වෛද්‍ය විද්‍යාඥයා විසින් අනාවරණය කරනු ලැබේ.
- ➢ ඇඟිලි සලකුණු කිරීම අද බහුලව භාවිතා වන අධිකරණ වෛද්‍ය ක්‍රමයයි.
- ➢ ගොඩනැගිලි, පරිගණක යනාදිය වෙත ප්‍රවේශය සීමා කිරීම සඳහා මුරපද, හැඳුනුම්පත් සහ වෙනත් ක්‍රම වෙනුවට ඇඟිලි සලකුණු භාවිතා කළ හැක.

ඇඟිලි සලකුණු හඳුනා ගත් ඉතිහාසය

- ○ අපරාධකරුවන් හඳුනා ගැනීම සඳහා රෝමානුවන් වෙළඳ නාමකරණය සහ කපා ඉවත් කිරීම භාවිතා කළහ.
- ○ 19 වැනි සියවසේ අගභාගයේදී බර්ටිලෝන් නම් ප්‍රංශ ජාතිකයා මිනිසුන් හඳුනාගැනීම සඳහා සිරුරේ කොටස් මැනීමේ ක්‍රමයක් භාවිත කළේය.
- ○ 1900 දී මිනිසුන් හඳුනා ගැනීම සඳහා ඇඟිලි සලකුණු භාවිතා කිරීමට පටන් ගත්තේය.
- ○ ශුද්ධ වූ අල් කුරාණය තුල (අදින් වසර 1400ට පමණ පෙරම ඇඟිලි සලකුණු ගැන සඳහන් කර ඇත).

---

## මිනිසාව පළමුවෙන්ම මැවීමේ සිට ඔහුගේ අවසානය දක්වා දෙවිඳුන් පවසා ඇති කරුණු.

මිනිසා පිළිබඳ විෂය ඉතා සංකීර්ණයි. එය මිනිස් ශරීරය, බුද්ධිය, ආත්මය සහ මනස, මිනිසාගේ ආරම්භය සහ අවසානය, මේ ජීවිතයේ අරමුණ සහ පරලොව ස්වභාවය වැනි බොහෝ අංශ ආවරණය කරයි. බුදු දහමට අනුව මේ ගැන හොඳම විග්‍රහයක් ලබා දීමට බෝසතානන් වහන්සේ ඉතා විශාල ආත්ම ගනණක් සහ කාලයක් ගෙවමින් පැමිණි බවත් අවසානයේ බුද්ධත්වයට පත්වන තෙක්ද තවස්දම් පුරමින් ඉතා වෙහෙසක් ගත් බවත් සඳහන් වේ. එම අපිරිමිත උත්සහායේ අරමුණ වූයේ මිනිසා ගැන සත්‍ය අවබෝධ කර ගැනීමට බව සඳහන් වේ. එතුමන්ට අමතරව ලොව පුරා බොහෝ සුවිශේෂී පුද්ගලයන් විසින්ද මිනිසා ගේ සැඟවුනු තොරතුරු පිළිබඳව එක් එක් අදහස් ඉදිරිපත් කර ඇත.

ඔය අතර, සමහරුන් විශ්වාස නොකලත්, පහතින් දැක්වෙන්නේ මහ පුදුම කාරණාවකි. එය නම්, විශ්වයේ සහ මිනිසාගේ නිර්මාතෘ තමා යැයි ඉදිරිපත් වෙමින්, තමන් සර්වබලධාරී දෙවියන්වහන්සේ යැයි හඳුන්වා දෙමින්, මිනිසාට නිකුත් කළ අවසන් දිව්‍ය හෙළිදරව්ව ලෙස ශුද්ධ වූ අල් කුරානය ඉදිරිපත් කරමින් එතුළින් මිනිසා ගැන සඳහන් කල (මිනිසාගේ නිර්මාතෘගේ) වැකි කිහිපයක් අපට හමුවීමය.

එම නිසා කුමණ දහමක් අනුගමනය කරන්නෙක් උනත්, කුමණ තරාතිරමකම කෙනෙක් උනත් මේ ගැන නෙත් යොමුකර බැලීම වඩා හොඳය.

දෙවියන් මෙසේ පවසයි.

*අහස් හිද භූමියෙහිද, ඔවුන්ට ඉදිරියෙන්ද පසුපසින්ද, ඇති දැය ඔවුන් අවධානය කර බැලුවේ නැද්ද?; (34:9) ඒවා කිසිවක් නොමැතිව තමන් විසින්ම ඇති කළෙහුද? නැතහොත් මොවුන්, තමන්ට තමන්ම නිර්මාණය කර ගත්තෙහුද? නැතහොත් අහස්ද භූමියද ඔවුන් නිර්මාණය කළෙහුද? නැත. මේ සියල්ල නිර්මාණය කළ අය දෙවියන්ය; (52:35,36)*

*ශුද්ධ වූ කුරානය වන මෙය ධර්ම පුස්තකයයි. මෙහි කිසිම සැකයක් නැත. භය භක්තිකයින්ට (මෙය) ඍජු මාර්ගය පෙන්වන්නේය. (2:2) මිනිසුන්ට හොඳ වැටහීමක් ලබා ගැනීම පිනිසම මෙම කුරානය නියත වශයෙන්ම අපි ඉතාමත් පහසු කර ඇත්තෙමු. එබැවින් (මෙමඟින්) හොඳ වැටහීමක් ලබන්නන් කවුරුන් හෝ ඇත් ද? (54:17)*

පහත අනු මාතෘකා යටතේ මිනිසා ගැන දිව්‍ය වදන් ඇත.

1. මිනිසාව නිර්මාණය කිරීමට හේතුව පහදා දීම
2. මිනිසාගේ තුන් කාලය ගැනම සහ සිතුවිල්ල ගැන පවා දෙවිඳුන් දන්නා බව
3. සියළු ආත්ම නිර්මාණය කළ මුල්ම අවස්ථාව
4. පළමු මිනිසාව නිර්මාණය කිරීම
5. පළමු මිනිසාගේ පරම්පරාව ඇති කළ ආකාරය
6. ආත්මයට සම්බන්ධ, සිත, හෘද සාක්ෂිය (රූහ් සහ නෆ්ස්)
7. දෙවිඳුන් මිනිසාට දුන් පෞරුෂත්වය හා පරීක්ෂනයේ ප්‍රධාන කාරණාව
8. දෙවිඳුන් විසින් මිනිසාට දුන් විශේෂ වරප්‍රසාද කිහිපයක්
9. පෘතුවිය තුල මිනිසාගේ වගකීම කුමක්දැයි පෙන්වා දීම
10. මිනිසාගේ මෙළොව ජීවිතයේ අරමුණ කුමක්දැයි පෙන්වා දීම
11. සෑම මිනිසෙකු සම්බන්ධවම මලායිකාවරු (දේව දූතවරු) පත් කර ඇති බව
12. දෙවියන්ගේ මාර්ගෝපදේශය මිනිසාට ලබා දීම ගැන
13. නින්දේදී සහ මිනිසා මරණයට පත්වන අවස්ථාවේ ආත්මය අත්පත් කර ගැනීම
14. මරණින් මතු (මිනීවල තුල) ජීවිතය ගැන
15. මරණින් පසු නැවත නැගිටුවීම සම්බන්ධව
16. දෙවියන්ගේ අනුදැනුමට එපිටින් කිසිම ආත්මයට කිසිවක් කළ නොහැකි බව
17. ලෝක විනාශය ගැන
18. දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීම නිරාවාසියෙකු වන තරමේ පාපයක් බව

19. විනිශ්චය දිනය ගැන
20. නිරයට සේන්දු වන්නන් ගැන
21. ස්වර්ගය වෙත ඇතුළු කරන්නන් ගැන

**1. මිනිසාව නිර්මාණය කිරීමට හේතුව පහදා දීම**

*අහස්ද, භූමියද, ඒවා අතර ඇති දැයද (පුහු) සෙල්ලමක් සඳහා අපි නිර්මාණය කලේ නැත (කුරානය 44:38,21:16).*

*"අපි නුඹලාව නිකමට මැව්වෙමු යැයිද, නියතව නුඹලා අප හමුවට හරවනු නොලබන්නෙහු යැයිද සිතාගෙන සිටියෙහුද?" (කුරානය 23:115).*

*ඔබගෙන් කවුරුන් ක්‍රියාවන්ගෙන් ඉතාමත් අලංකාරවත් කෙනෙකුද යන්නෙහි ඔබව පිරික්සනු පිණිසම ඔහු ජීවිතයද මරණයද උත්පාදනය කර ඇත්තේය. (කුරානය 67:2)*

*ඔහුව අපි පිරික්සීම පිණිසම සවණ ඇති අය වශයෙන්ද, බැල්ම ඇති අය වශයෙන්ද, ඔහුව පත් කළෙමු; (76:2)*

*(කිසිම) ප්‍රශ්නයක් නොඅසා අත්හැර දමන්නෙමු යැයි මිනිසා අදහස් කළෙහිද? (75:36)*

**2. මිනිසාගේ තුන් කාලය ගැනම සහ සිතුවිල්ල ගැන පවා දෙවිඳුන් දන්නා බව**

*ඔබව පස් වලින් නිර්මාණය කළ අවස්ථාවේදී ඔබගේ (ගති ගුණයන්) ඔහු හොඳින් දන්නේය. ඔබ ඔබගේ මවගේ කුසයෙහි (මාංශ පින්ඩයක් වශයෙන්) සැඟවී තිබූ අවස්ථාවෙහිද, (ඔබව ඔහු හොඳින් දන්නේය); (53:32)*

*නියත වශයෙන්ම අපිම මිනිසාව (පළමු වරට) උත්පාදනය කළෙමු. ඔහුගේ මනසෙහි ඇතිවන සිතුවිල්ලද, අපි හොඳින් දනිමු. පිටි බෙල්ලේ ඇති පණ නහරයට වඩා අපි ඔහුට ඉතාමත් සමීපවයෙන්ම සිටින්නෙමු. (50:16) හෘදන්හී ඇති දැයද නියත වශයෙන්ම ඔහු හොඳින් දන්නේය. (39:7) ඔහු නම් සෑම ආත්මයක්ම කරන සෑම දැයක්ම හොඳින් දන්නෙකි; (13:33)*

*ඔහුම ඉන්ද්‍රිය බිඳකින් මිනිසාව උත්පාදනය කළේය. එසේ තිබියදී ඔහු (දෙවියන් සමග ප්‍රකට සතුරෙකු වශයෙන් සිටින්නේය. (16:4) මිනිසුන්ගෙන් බොහෝමයක් ඉතාමත් ගුණමකු අය වශයෙන් සිටින්නාහ.; (25:50)*

*ඔහු නොදැනුවත්ව කිසියම් හෝ කාන්තාවක් ගැබ් ගන්නේද නැත, ප්‍රසූත කරන්නේද නැත. ඔහුගේ සටහන් පුස්තකයෙහි නොමැතිව කිසිවකුගේ වයස වැඩි කරනු ලබන්නේද නැත, කිසිවකුගේ වයස අඩු කරනු ලබන්නේද නැත. නියත වශයෙන්ම මේවා සියල්ල දැනගෙන සිටීම අල්ලාහ්ට ඉතාමත් සුළු දැයකි. (35:11)*

*සාමාන්‍යයෙන් භූමියෙහි හෝ නැතහොත් (පෞද්ගලිකව) ඔබට හෝ ඇතිවිය කුමණ අමාරුකමක් හෝ (පාඩුවක් හෝ) ඒවා අපි උත්පාදනය කිරීමට පෙරම (ලව්හුල් මහ්ෆූල් නැමති) පොතෙහි (සටහන් කරනු ලැබ) නැත්තේ නොවේ. නියත වශයෙන්ම මෙය අල්ලාහ්ට ඉතා ලෙහෙසි දැයකි. (57:22)*

*සියල්ලන්ම උත්පාදනය කළ අය, (හෘදයන් හී ඇති දැය) දැන නොගන්නෙහිද?;(67:14)*

*(නබියේ!) අහස් හිද, භූමියෙහිද ඇති සියල්ල නියත වශයෙන්ම අල්ලාහ් හොඳින් දන්නේය යන්න ඔබ අවධානය කළේ නැද්ද? ඔවුන්ගෙන් තුන් දෙනෙකු (එක්කාසු වී කතා කරන) රහසෙහි ඔහු ඔවුන්ගේ හතරවැන්නා වශයෙන් නැත්තේ නොවේ., පසුව ඔවුන් කළ දැය ගැන ඔවුන්ට විනිශ්චය දිනදී දැනුම් දී (එයට සරිලන ඵලවිපාකද ලබා දී) හරින්නේය. ;(58:7)*

### 3. සියළු ආත්ම නිර්මාණය කළ මුල්ම අවස්ථාව

*නියත වශයෙන්ම "(අපගේ) වගකීම උසුලාගන්නෙහුද? යි අපි අහස්, භූමිය හා කඳු ආදියෙන් විමසුවෙමු. එයට ඒවා, ඒ ගැන බිය වී එය උසුලා නොගෙන ඇත් වූවේය. එවැන්නක්ම මිනිසා උසුලා ගත්තේය. (එබැවින්) නියත වශයෙන්ම ඔහු නොදැනුවත්කම නිසා තමන්ට තමන්ම හානියක් කරගත්තේය. (කුරානය 33:72)*

*(එවැනි වගකීමක් භාරගෙන එයට වෙනස් ආකාරයකින් කටයුතු කරන) වංචනික පිරිමින්ටද, ගැගැනුන්ටද නියත වශයෙන්ම අල්ලාහ් දඬුවම් කරනු ඇත. (එම වගකීම සැලකිල්ලට ගෙන කටයුතු කරන) විශ්වාසවන්තයින් වන පිරිමින්ටද, ගැහැනුන්ටද ඔවුන්ගේ වැරදි වලට සමාව දී) ඔවුන් දෙස දයාවෙන් යුතුව බලන්නේය. අල්ලාහ් ඉතාමත් ක්ෂමා කරන්නෙකු හා කරුණාවන්තයෙකු වශයෙන් සිටින්නේය. (කුරානය 33:73).*

*නබියේ, ඔබගේ දෙවියන් ආදම්ගේ පරම්පරාවේ දරුවන් වන ඔවුන්ගේ පිටකොන්දෙන් ඔවුන්ගේ පරම්පරා දරුවන්ව ඉකුත් කර, ඔවුන් තමන්වම ඔවුන්ට සාක්ශියක් වශයෙන්ද තබා (ඔවුන්ට) "මා ඔබගේ දෙවියන් නොවේද"? යි විමසූ විට, "ඇත්තෙන්ම (ඒ ආකාරයටම) අපි සාක්ෂි දරන්නෙමු" යැයි ඔවුන්ගේ පැවසීම (ඔබ ඔවුන්ට) මතක් කර දෙනු. (මන්දයත් මෙය කිසිවෙකුත් මතක් කර නොදුන් බැවින්) නියත වශයෙන්ම අපි මෙය අමතක කර දමා නොසැලිකිලිමත්ව සිටියෙමු" යැයි පරලොව දිනදී ඔවුන් නොකියා සිටීම සඳහාද,..(7:172)* [මෙය ආත්ම නිර්මාණය කළ මුල්ම අවස්ථාවේ සෑම ආත්මයක්ම දෙවියන්ට දුන් පොරොන්දුවකි].

**4. පළමු මිනිසාව නිර්මාණය කිරීම**

*නියත වශයෙන්ම අපි ඔබලාව උත්පාදනය කිරීමට අදහස් කර ඔබව (ඔබගේ මුල්ම පියා වන ආදම්ව (වියළී ගියහොත් ටං ටං යන ශබ්දය ගෙන ඇලෙන සුළු කිරිමැටියෙන්) නිර්මාණය කළෙමු. (7:11) (15:26)*

*ඔහු ඔබව (ආරම්භයේදී) එකම මිනිසෙකුගෙන් නිර්මාණය කර තිබුණි. පසුව ඔහුගෙන් ඔහුගේ බිරිඳව නිර්මාණය කළේය. (ඒ දෙදෙනාගෙන්, ඔබව පිරිමි, ගැහැණු වශයෙන් උත්පාදනය කරන්නේය); (39:6) පසුව පිරිමි ගැහැණු මිශ්‍ර වූ එක් ඉන්ද්‍රීය බිඳක් මගින් නියත වශයෙන්ම අපිම මිනිසාව උත්පාදනය කළෙමු; (76:2)*

*ඔහු උත්පාදනය කළ සෑම වස්තුවක්ම (එහි හැඩයද) ඉතාමත් අලංකාරවත් ලෙස නිර්මාණය කළේය: (32:7) නියත වශයෙන්ම අපි මිනිසාව ඉතාම ලක්ෂණ*

*ස්වරූපයෙන් උත්පාදනය කර ඇත්තෙමු. (95:4)* පළමු මිනිසා- ආදම්(අ.ස)ව නිර්මාණය කිරීම යන ලිපියෙහි වැඩි විස්තර ඇත.

**5. පළමු මිනිසාගේ පරම්පරාව ඇති කළ ආකාරය**

*පසුව එක් අල්ප බිඳක් වන (ඉන්ද්‍රීය) සාරයෙන් ඔහුගේ පරම්පරාවේ දරුවන්ව (නිර්මාණය කර) ඇති කළේය.(32:8)*

*(මිනිසුනේ!) ඔබ සියල්ල එකම ආත්මයකින් උත්පාදනය කර, පසුව (ඔබගේ) පියා වෙත) රැඳී සිටීමට සලස්වා (ඔබගේ මවගේ ගර්භයෙහි) බාරදෙන්නේද ඔහුය.(6:98).*

*ඇතට පනිමින් ඉකුත් වන එක් ජල බිඳක් මගින්ම (මිනිසාව) උත්පාදනය කරණු ලැබුවේය. එය කොඳු ඇටවලටද, ඉල ඇට වලටද මධ්‍යයෙන් ඉකුත් වන්නේය. (86:6,7)*

*පසුව එය අපි ඉන්ද්‍රීය බිඳක් බවට පත්කර ඉතාමත් ප්‍රවේසම් සහිත ස්ථානයක තැම්පත් කළෙමු. පසුව එම ඉන්ද්‍රීය බිඳ ලේ කැටියක් බවට පත් කළෙමු. පසුව එම ලේ කැටිය මාංශ පිණ්ඩයක් බවට පත් කළෙමු. පසුව එම මාංශ පිණ්ඩයේ ඇට කටු නිර්මාණය කර, එම ඇට සැකිල්ලට මස් මාංශ ඇන්දෙව්වෙමු. පසුව එය (පූර්ණ) මිනිස් ජීවිතයක් බවට පත් කළෙමු; (23:12-14)*

*අපි අදහස් කල අයව ගර්භයන්හී නියමිත කාලයක් දක්වා රැඳී සිටින සේ සලස්වන්නෙමු. (22:5) ඔබගේ මව්වරුන්ගේ කුසයෙහි එකකට පසු එකක් වශයෙන් අඳුරු වහන්තරාවන් තුනක් තුළ තබා ඔබව උත්පාදනය කරන්නේය; (39:6)*

*පසුව ඔබව ළදරුවන් වශයෙන් ඉකුත් කර ඔබ, ඔබගේ තරුණ විය අත් කර ගැනීමට සලස්වන්නෙමු. (මේ අතර) මරණයට පත්වන්නන්ද ඔබ අතරෙන් සමහරෙක් ඇත්තාහ. (නැතහොත් ජීවත්ව සිටිමින්) සියල්ල දැනගත්තායින් පසු කිසිවක් නොදන්නා කෙනෙකු බවට පත් වන මහළු වයස දක්වා (ජීවත් වීමට) අත්හැර දමන්නන්ද ඔබගෙන් සිටින්නාහ; (22:5)*

*කිසිවක් ඔබ නොදන්නා අය වශයෙන් සිටියදී, ඔබගේ මව්වරුන්ගේ කුසෙන් අල්ලාහ්ම ඔබව ඉකුත් කළේය. තවද, ඔබට කණ්ද, ඇස්ද, හෘදයද, ලබා දුන් අය ඔහුය. (මෙයට) ඔබ (ඔහුට) කෘතඥ වනු මැනව.(16:78) සෑම මිනිසෙකුටම (ඔහු පිටතට පැමිණීමට) පෙර කාලයක් ගත වූයේ නැද්ද? (එහි) ඔහු අසවල් වස්තුව යැයි කීමට නොමැති තත්වයක සිටියේය (76:1)*

*මිනිසාණෙනි! ඔබගේ ගෞරවණීය දෙවියන් ගැන ඔබව රවටා දැමුවේ කිමෙක්ද? ඔහුම ඔබව උත්පාදනය කර, උසස් අන්දමට හැඩරුව නිර්මාණය කර, ඉතාමත් නියමිත ආකාරයට සකස් කළේය. ඔහුම තමන් කැමති (ඉතාමත් අලංකාරවත්) හැඩයකින් ඔබව (ඔබේ අවයවයන්) සවි කළේය. (82:6,7,8)*

*ඔහු ඔබව පස් වලින් උත්පාදනය කළේය. පසුව ඔබ මිනිසුන් බවට පත් වී (භූමියෙහි විවිධ ප්‍රදේශයන්හී) විසිරී යාමට හැරීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දෙයකි. (30:20) ඔහුම එක් ජල බිඳකින් මිනිසාව නිර්මාණය කරන්නේය. පසුව එයට ලේ සම්බන්ධ ඥාතීන්ද, විවාහය සම්බන්ධයෙන් වූ ඥාතීන්ද ඇති කරන්නේය. (නබියේ!) ඔබගේ දෙවියන් (තමන් කැමති ආකාරයන් සියල්ල කිරීමට) බලසම්පන්නයෙකු වශයෙන් සිටින්නේය. (25:54)*

*ඔබ එක්කාසු වී ජීවත්විය හැකි ඔබගේ භාර්යාවන්ව (ඔබ ඔවුන් වෙත හිත සුව ලැබීම පිණිස) ඔබගෙන්ම (ඔහු) නිර්මාණය කර, ඔබ අතරේ ආදරයද, කරුණාවද ඇති කර තැබීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. (එකක් නොව, බොහෝමයක්) සාධක ඇත්තේය. (30:21)*

**6. ආත්මයට සම්බන්ධ, සිත, හෘද සාක්ෂිය (රූහ් සහ නෆ්ස්) ගැන**

*(නබියේ!) "රූහ් (ආත්මය)" ගැන (යුදෙව්වන් වන) ඔවුන් ඔබගෙන් විමසන්නාහ. එයට ඔබ "එය අපගේ දෙවියන්ගේ නියෝගයෙන් ඇති වන්නකි. (ඒ ගැන) ඉතාමත් අල්ප ඥානයක් මිස, ඔබට දෙනු ලැබුවේ නැත. (එබැවින් එහි ගැඹුරු අදහස ඔබට දැන ගැනීමට නොහැකිය)" යැයි පවසනු මැනව! (17:85)*

*"මා (පලමු) මිනිසාව නිර්මාණය කර එහි (ජීවයට අවශ්‍ය) මාගේ ආත්මය ඇතුළු කළහොත් -ඔහුට (ගෞරව කිරීමට) - ඔබ නලල බිම තබා) සුජූද් කරනු" (යැයි*

*අණ කළේය). ඒ ආකාරයටම මලායිකාවරුන් සියල්ලම (ඔහුට ගුරව කිරීම සඳහා) සුජූද් කළහ.(15:29,30)*

*ආත්මය මතද, එය (මිනිසා වශයෙන්) නිර්මාණය කළ අය මතද, එහි හොඳ නරක එයට දැනුම් දුන් අය මතද සත්තකින්ම. කවුරුන් (පාපයන්ගෙන් ඈත්වී) තමන්ව පරිශුද්ද කර ගත්තේද, ඔහු නියත වශයෙන්ම ජයග්‍රහනය කළේය. කවුරුන් එය (පාපයෙහි) වළලා දැම්මේද, ඔහු නියත වශයෙන්ම පරාජය අත් කර ගත්තේය. (91:7-10). මිනිසුන්ගේ සිත් පාපයන් කරන මෙන් පොළඹවන්නට හැක්කක් වශයෙන්ම ඇත්තේය; (12:53) වරද කළ අයට නින්දා කරනු ලබන (ඔහුගේ) හෘද සාක්ෂිය මතද මා දිව්රමි. (75:2) (එහෙත් එදිනදී හොඳ වහලුන්ට) "ඕ තෘප්තියට පත් ආත්මය. ඔබ ඔබගේ දෙවියන් දෙසට යනු. ඔහු මගින් ඔබ තෘප්තියට පත්වනු. ඔහු ඔබ ගැන තෘප්තියට පත්වී ඇත්තේය. ඔබ මගේ හොඳ වහලුන් සමග එකතුවී, මගේ ස්වර්ගයෙහි ඔබ ඇතුළුවනු! (යැයිද පවසනු ඇත).(89:27-30) සෑම ආත්මයක්ම මරණය අනිවාර්යෙන්ම විඳින්නාහ. එහෙත් ඔබගේ (ක්‍රියාවන්ට සරිලන) ඵලවිපාක ඔබ පූර්ණ වශයෙන් අත් කර ගන්නේ විනිශ්චය දිනදීය;(3:185)*

*ඉම්රාන්ගේ දියණිය වන මරියම්ය. ඇය තමන්ගේ පතිවත ආරක්ෂා කර ගත්තාය. එබැවින් එහි (ඇයගේ ගර්භයෙහි) අපගේ ආත්මයන්ගෙන් (එක් ප්‍රාණයක්) පිම්බෙමු: (66:12) පසුව (ඉබේම) මරියම් ගැබ් ගෙන, ඒ සමග (ඇය උන් හිටි ස්ථානයෙන් පිටත්ව), දුරින් පිහිටි ස්ථානයකට ගොස් සේන්දු වූවාය, (19:22)*

ආත්මය, සිත, විඥානය, ශරීරය, හෘද සාක්ෂිය -රූහ් සහ නෆ්ස් යන ලිපියෙහි වැඩි විස්තර ඇත.

## 7. දෙවිඳුන් මිනිසාට (සහ ජින් වරුන්ට) දුන් පෞරුෂත්වය හා පරීක්ෂනයේ ප්‍රධාන කාරණාව

*"තවද, මම (අල්ලාහ්) ජින්වරුන් සහ මනුෂ්‍ය වර්ගයා මැව්වේ ඔවුන් මට (තනිවම) නමස්කාර කිරීමට මිස නොවේ".(කුරානය 51:56).* [එනම් වෙන කිසිවෙකුට නමස්කාර කිරීමක් අවශ්‍ය නොවේ].

## 8. දෙවිඳුන් විසින් මිනිසාට දුන් විශේෂ වරප්‍රසාද කිහිපයක්

*අල්ලාහ්ගේ වරප්‍රසාදයන් ඔබ ගණනය කළහොත්, ඒවා ඔබ විසින් ගණන් කළ නොහැක. නියත වශයෙන්ම අල්ලාහ් ඉතාමත් ක්ෂමා කරන්නෙකු හා ඉමහත් දයාබරවන්තයෙකුද වශයෙන් සිටින්නාහ. (16:18)*

*(මිනිසුණේ!) "අහස්හිද, භූමියෙහිද, ඇති දැය නියත වශයෙන්ම දෙවියන් ඔබට වසඟ කර දී ඇත්තේය" යන්නද, ඔහු තම වරප්‍රසාදයන් ගුප්තවද, ප්‍රසිද්ධියේද, ඔබ කෙරෙහි පහළ කර ඇත්තේය යන්නද, ඔබ දුටුවේ නැද්ද? මේ සියල්ල මෙසේ තිබියදී මිනිසුන්ගෙන් සමහරෙක් අධ්‍යාපන දැනුම හෝ තර්කානුකූල ඍජු මාර්ගය හෝ ආලෝකමත් ධර්ම ග්‍රන්ථයෙහි (කුරාන්හී) සාධකයන් හෝ නොමැතිව අල්ලාහ් (දෙවියන්) ගැන (නිකරුණේ) තර්ක කරන්නාහ. (31:20)*

*අල්ලාහ්ම ඔබට භූමිය වාසස්ථානයක් බවටද, අහස වියනක් බවටද පත් කර, ඔබව නිර්මාණය කර, අලංකාරවත් හැඩරුව ඇතිවද ඔබව පත් කලේය. තවද ඔහුම ඔබට උසස් ආහාරයන්ද ලබා දෙන්නේය. මෙම අල්ලාහ්ම ඔබගේ දෙවියන්ය. (සකල) ලෝකයන්හී දෙවියන් වන අල්ලාහ් භාග්‍යය වන්තයෙකි. (40:64)*

*ආදම්ගේ පරම්පරාවේ දරුවන්ව නියත වශයෙන්ම අපි ගෞරව කළෙමු. වෙරළෙහි වාහන මතද මුහුදෙහි නැව් මතද අපිම ඔහුව උසුළාගෙන යාමට සලස්වන්නෙමු. හොඳ ආහාරද අපිම ඔවුන්ට ලබා දෙන්නෙමු. අපි උත්පාදනය කළ (වෙනත් ජීවීන්ගෙන්) අපි ඔවුන්ව උසස් කර ඇත්තෙමු. (17:70)*

*බැලිය හැකි ඇස් දෙකක්ම අපි ඔහුට ලබා දුන්නේ නැද්ද? එසේ තිබියදී සත්‍යය ඔහු දුටුවේ නැත. දිවක්ද, තොල් දෙකක්ද (අපි ඔහුට ලබා දුන්නේ නැද්ද?). ඒවා ඉබේම ඔහු අත් කර ගත්තේද? නැත. (90:8,9) ඔහුම මිනිසාට (පැහැදිලිව) කථා කිරීමට ඉගැන්වූයේය. (55:4) ඔහුම පෑනක් මගින් (ලිවීමට) ඉගැන්වූවේය. තවද, මිනිසා නොදන්නා සියල්ල ඔහුට උගන්වා දෙන්නේය. (96:4,5) (මිනිසුනේ!) නියත වශයෙන්ම අපි ඔබට භූමියෙහි සියළුම සැප පහසුකම් ලබා දී එහි ඔබට ජීවනෝපායද ඇති කළෙමු. (මෙසේ තිබියදී) ඔබ ස්තූති කිරීමද ඉතා අල්පය. (7:10)*

*දෙවියන්ගේ නිර්මාණ: සොබාදහම සහ මිනිසාට දුන් වරප්‍රසාද යන ලිපියෙහි වැඩි විස්තර ඇත.*

**9. පෘතුවිය තුල මිනිසාගේ වගකීම කුමක්දැයි පෙන්වා දීම**

*(ඔහුම) තම නියෝජිතයින් වශයෙන් භූමියෙහි ඔබව පත්කර ඇත්තේය. තවද ඔබගෙන් සමහරෙකුව අනික් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමඟින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේ දැයි) ඔබව පිරික්ෂා කරන්නේය. (6:165)*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම අත් විඳින්නාහ. පින් පව් කරන තත්වයෙන් අපි ඔබව (තබා) පිරික්සන්නෙමු. පසුව ඔබ අප වෙතම ගෙන එනු ලබන්නෙහුය. (21:35)*

*(මනුෂ්‍යයිනි!) ප්‍රාණයක් නොමැතිව තිබූ ඔබට ඔහුම පණ දී තිබියදී, ඔබ අල්ලාහ්ව කෙසේ නම් ප්‍රතික්ෂේප කරන්නෙහුද? ඉන් පසුවද ඔහුම ඔබව මරණයට පත් කරන්නේය, පසුවද ඔහුම ඔබට පණ දෙන්නේය. (ඉන්) පසුවද ඔබ (ඔබගේ කළකම් සඳහා ඵලවිපාක අත්කර ගැනීම සඳහා) ඔහු වෙතම (විනිශ්චය සඳහා) ගෙන එනු ලබන්නෙහුය. (2:28)*

**10. මිනිසාගේ මෙළොව ජීවිතයේ අරමුණ කුමක්දැයි පෙන්වා දීම**

*"තවද, මම (අල්ලාහ්) ජින්වරුන් සහ මනුෂ්‍ය වර්ගයා මැව්වේ ඔවුන් මට (තනිවම) නමස්කාර කිරීමට මිස නොවේ".(කුරානය 51:56). [එනම් වෙන කිසිවෙකුට නමස්කාර කිරීමක් අවශ්‍ය නොවේ].*

*මිනිසාණෙනි! ඔබ ඔබගේ දෙවියන් වෙත යන තුරු (හොඳ හෝ නරක හෝ විවිධ වැඩ කටයුතුවල නිරත වී) අමාරුවෙන් උත්සාහ කරමින් සිටින්නෙහිය. පසුව (විනිශ්චය දිනදී) ඔබ ඔහුව හමුවන්නෙහිය. (84:6)*

*විශ්වාසවන්තයිනි! ඔබ අල්ලාහ්වද, ඔහුගේ දූතයාවද, ඔහු තමන්ගේ මෙම දූතයා වෙත පහළ කළ ධර්මයද, මෙයට පෙර තිබූ ධර්මයන්ද විශ්වාස කරනු. කවුරුන් අල්ලාහ්වද, ඔහුගේ මලායිකාවරුන්වද, ඔහුගේ ධර්මයන්ද, ඔහුගේ දූතයන්වද,*

*අවසාන දිනයද ප්‍රතික්ෂේප කරන්නේද, ඔහු නියත වශයෙන්ම ඉතාමත් ඈත් වූ දුර්මාර්ගයෙහිම ගමන් කරන්නේය (4:136)*

පහතින් දැක්වෙන සූරාව ඉස්ලාමයේ සාරාංශය සහ මිනිසාගේ මෙලොව ජීවිතයේ අරමුණය.

*කාලය මත සත්තකින්ම, මිනිසා තම ආයුෂ කාලය නිකරුනේ වියදම් කර නියත වශයෙන්ම පරාජික මාර්ගයේ සිටින්නේය. එහෙත් කවුරුන්, විශ්වාසය තබා දැහැමි කාරනාවන්ද කර සත්‍යය කෙනෙකුට කෙනෙකු ඔවදන් දී (පාපයන් අතැහැර දැමීමෙහිද පින් ඇති දැය කිරීමෙහිද ඇති වන අමාරුකම විද දරා ගන්නා ලෙසටද, කෙනෙකුට කෙනෙක් ඔවදන් දෙමින් සිටින්නෝද) ඔවුන් හැර. (මොවුන් පරාජිත වූවේ නැත). (103:1-3)*

[සැබැවින්ම, මිනිසාගේ මෙලොව ජීවිතයේ අරමුණ විය යුත්තේද විශ්වයේ සහ තමන්ගේ නිර්මාතෘගේ මහිමය ගැන සොයමින්, ඔහුගේ නිර්මාණ බුක්ති විඳිමින්, ඔහුව ඉහලින්ම ප්‍රසංශා කරමින්, ඔහු පෙන්වා දුන් මාර්ගයේ ගමන් කිරීමය].

මිනිසාව මවා ඇත්තේ අරමුණකින් තොරව යැයි ඔබ සිතනවාද? යන ලිපියෙහි වැඩි විස්තර ඇත.

## 11. සෑම මිනිසෙකු සම්බන්ධවම මලායිකාවරු (දේව දූතවරු) පත් කර ඇති බව

*සෑම මිනිසෙකු වෙතම (අප විසින් ඇති කරන ලද) අවධානය කළ හැකි කෙනෙකු (මලායිකාවරු) නැත්තේ නොවේ; (36:4,5,6)*

*දකුණු පැත්තේ කෙනෙකුද, වම් පැත්තේ කෙනෙකුද වශයෙන් දෙදෙනෙකු සිටිමින් (ඔහුගේ වැඩ කටයුතු) සටහන් කරමින් සිටින්නාහ. (50:17)*

*(මිනිසා) කුමක් පැවසුවා වුවද, (එය ලිවීමට) බලාපොරොත්තුවෙන් සිටින කෙනෙකු, ඔහු වෙත නැත්තේ නොවේ. (ඔහුගේ මුවින් පිටවෙන සෑම වචනයක්ම එවෙලෙ එවෙලේම සටහන් කරනු ලබන්නාහ), (50:18)*

අප සමග සිටින මලායිකාවරුන් සහ ඔවුන්ගේ කාර්යයන් යන ලිපියෙහි වැඩි විස්තර ඇත.

**12.** **දෙවියන්ගේ මාර්ගෝපදේශය මිනිසාට ලබා දීම ගැන**

*මිනිසුන්ට හොඳ වැටහීමක් ලබා ගැනීම පිනිසම මෙම කුරානය නියත වශයෙන්ම අපි ඉතාමත් පහසු කර ඇත්තෙමු. එබැවින් (මෙමඟින්) හොඳ වැටහීමක් ලබන්නන් කවුරුන් හෝ ඇත් ද? (54:17)*

*(පින් පව්) මාර්ගයන් දෙකම අපි ඔහුට වෙන්කර දැණුම් දුන්නෙමු (90:10) නියත වශයෙන්ම ඍජු මාර්ගය පෙන්වීම අපගේ යුතුකම වන්නේය, (නියත වශයෙන්ම මෙලොවද පරලොවද අපගේමය. (92:12.13)*

*නබියේ!) නියත වශයෙන්ම අපි මිනිසුන්ගේ යහපත සඳහාම සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් පිරි මෙම ධර්මය ඔබ වෙත පහළ කළෙමු. එබැවින් කවුරුන් (මෙය) අනුගමනය කර කටයුතු කරන්නේද, ඔහුටම එය හොඳකි. කවුරුන් එයින් මාර්ගය වැරද යන්නේද, එය ඔහුටම නපුරක් වශයෙන් අවසන් වනු ඇත. (නබියේ!) ඔබ ඔවුන්ව (ඍජු මාර්ගයෙහි යන ලෙස මෙන් බල කර), බේරා ගන්නෙකු නොව. (39:41)*

*(නබියේ!) ඔබ මෙසේ පවසනු; "(සම්පූර්ණයෙන්ම) සත්‍යය වූ (මෙම ධර්මය) ඔබගේ දෙවියන් විසින් පහළ කරන ලදී" කැමැත්තන්ට මෙය විශ්වාස කළ හැකිය, අකැමැත්තන්ට (මෙය) ප්‍රතික්ෂේප කර දැමිය හැකිය". (නමුත් මෙම ප්‍රතික්ෂේප කරන) අපරාධකාරුවන්ට නියත වශයෙන්ම අපි නිරයම පිළියෙල කර ඇත්තෙමු; (18:29)*

*(නබියේ!) "කවුරුන් (මෙම ධර්මය) විශ්වාස කර, (මෙහි සඳහන්ව ඇති අන්දමට) දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම (ස්වර්ගයන්හී) දිය දහරා සදාකල් ගලමින් ඇති උයන් වතු ඇත" යැයි ඔබ සුභාරංචි දෙනු මැනව (2:25)*

**13.** **නින්දේදී සහ මිනිසා මරණයට පත්වන අවස්ථාවේ ආත්මය අත්පත් කර ගැනීම**

*මිනිසුන් මරණයට පත්වන විටද, මරණයට පත් නොවී නින්දෙහි සිටින විටද, අල්ලාහ් ඔවුන්ගේ පණ අත්පත් කර ගන්නේය. පසුව කවුරුන් කෙරෙහි මරණය නියම වූවේද, ඔවුන්ගේ පණ (තමන් වෙතම) නවතා තබා ගන්නේය. අන් අයගේ*

*(පණ) නියමිත කාලය දක්වා (ජීවත් වීමට) ඔවුන් වෙතම ඔහු යවන්නේය. අවධානය කර දැනගත හැකි ජනතාවට මෙහි පාඩම් (බොහෝමයක්) ඇත්තේය. (39:42)*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම අත් විඳින්නාහ. පින් පව් කරන තත්වයෙන් අපි ඔබව (තබා) පිරික්සන්නෙමු. පසුව ඔබ අප වෙතම ගෙන එනු ලබන්නෙහුය. (21:35)*

**14. මරණින් මතු (මිනීවල තුල) ජීවිතය ගැන**

*නියත වශයෙන්ම විනිශ්චය කාලය අනිවාර්යයෙන්ම පැමිණෙන්නේය. එහි කිසිම සැකයක් නැත. (එදිනදී) සොහොන්වල (වැළලී) ඇති අයව නියත වශයෙන්ම අල්ලාහ් (පණ දී) නැගිට්ටවන්නේය. (22:7)*

*(අනිත් වතාවේදී කවදා) සූර් (නැමති හොරණෑව) පිඹිනු ලබන්නේද, එවෙලේම ඔවුන් සොහොන් වලින් ඉකුත් වී තමන්ගේ දෙවියන් වෙත (ඉතාමත්) වේගයෙන් දිව එන්නාහ. (36:51)*

*ඔවුන් පහත හෙලූ බැල්මෙන් යුතුව සොහොන්වලින් ඉකුත් වී විසිරී සිටින පළඟැටියන් මෙන් කැඳවන්නා වෙත වේගයෙන් දිව එන්නාහ. (54:7) සොහොන් වලින් පිටවී (මහ්ෂර් නැමති පිටියට) ඉතාමත් තීව්‍රව යන්නාහ; (70:43)*

*සොහොණ්හී ඇති දැය ගැන ප්‍රතික්ෂේප කරන්නන් විශ්වාසය බිඳී ගිය අන්දමටම පරලොව ගැන නියත වශයෙන්ම මොවුන් විශ්වාසය බිඳ දැමූහ. (60:13)*

*සොහොන් (කබ්රු) වල ඇති දෙය පිටතට විසි කරනු ලැබ (100:9)*

**15. මරණින් පසු නැවත නැගිටුවීම සම්බන්ධව**

*ඔහු තමන්ගේ උත්පාදනය (තමන්ව කෙසේ නිර්මාණය කරනු ලැබුවේද) යන්න අමතක කර දමා, එක් උදාහරණයක් අප වෙත ගෙනහැර දක්වන්නේය. "දිරා පත්ව පස් බවට පත්වූ (මෙම) ඇටසැකිල්ලට පණ දෙන්නේ කවරෙක්දැයි?" ඔහු විමසන්නෙහුය. (36:78)*

*(මරණයට පත්ව දිරාපත් වී පස් වූ) ඔහුගේ ඇටකටු අපි එක්කාසු නොකරන්නෙමු යයි මිනිසා අදහස් කරමින් සිටින්නෙහිද? නොඑසේය, ඔහුගේ ඇඟිලි තුඩු පවා (පෙර තිබූ ආකාරයටම) සකස් කිරීමට අපි බලසම්පන්න වන්නෙමු. (75:3,4)*

*එක් ඉන්ද්‍රීය බිඳක් මගින්ම ඔහුව උත්පාදනය කර, (ඔහු සිටින මේ ආකාරයටම, ඔහුව මිනිසා වශයෙන් නිර්මාණය කර), ඔහුව සැළසුම් කළේය, පසුව ඔහු කරනු ලබන පව් පින්වලට අයත්) මාර්ගය ඔහුට පහසු කර තැබුවේය. පසුව ඔහුව මරණයට පත් වීමට සලස්වා, සොහොන්හී ඔහුව ඇතුළු කරන්නේය. පසුව ඔහු කැමති අවස්ථාවක (පණ දී) ඔහුව නැගිට්ටුවන්නේය. (80:20-23)*

## 16. දෙවියන්ගේ අනුදැනුමට එපිටින් කිසිම ආත්මයට කිසිවක් කළ නොහැකි බව

*ඔහු ගුප්ත දැය සියල්ල දන්නෙකි. ඔහු නොදැනුවත්ව අහස් හි හෝ භූමියෙහි හෝ ඇති දැයෙන් එක් අණුවක ප්‍රමාණයක් තරම් හෝ බේරී යන්නේ නැත. ඊටත් වඩා කුඩා හෝ ලොකු හෝ (සෑම දෙයක්ම) ලව්හුල් මහ්ෆූල් නැමැති පැහැදිලි සටහන් පුස්තකයෙහි සටහන් නොවී නැත; (අල් කුරාණය 34:3).*

*භූමියෙහි ඇතුළු වී යාමද, එයින් පිටවී යාමද, අහසින් බැසීමද, ඒ දෙසට (භූමියේ සිට) නැගීමද, ඔහු හොඳින් දන්නේය. ඔබ කොහේ සිටියා වුවද, ඔහු ඔබ සමග සිටින්නේය. අල්ලාහ් අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන්ම සිටින්නේය. (57:4)*

*(අනිත් වතාවේදී කවදා) සූර් (නැමති හොරණෑව) පිඹිනු ලබන්නේද, එවෙලේම ඔවුන් සොහොන් වලින් ඉකුත් වී තමන්ගේ දෙවියන් වෙත (ඉතාමත්) වේගයෙන් දිව එන්නාහ. (36:51)*

## 17. ලෝක විනාශය ගැන

*පැමිණිය යුතු (යුග අවසාන කාලය) ළඟා විය. අල්ලාහ් හැර, වෙන කිසිවෙකු විසින් හෝ එය වැළැක්විය නොහැක. මෙම පුවත ගැන ඔබ පුදුම වන්නෙහුද? ඔබ සිනාසෙන්නෙහුද? හැඬිය යුතු නොවෙද? (53:57-60)*

*සූර් පිඹිනු ලැබුවහොත් අහස් හී සිටින්නන්ද, භූමියෙහි සිටින්නන්ද, (අල්ලාහ් අදහස් කරන්නන් හැර) හුස්ම සිර වී (සිහිසුන් වී මැරී වැටී) යන්නෙහුය. අනිත් වර සූර් පිඹිනු ලැබුවහොත් එවෙලේම ඔවුන් සියල්ලන්ම (පණ ලැබ) නැගිට ඉදිරිය බලා සිටිනු ඇත (39:68)*

*(යුග අවසානය සඳහා) අහස පැළී යන අවස්ථාවේදී, එය (සෙයිතුන්) තෙල් මෙන් රෝස වර්ණයක් බවට පත්වනු ඇත. (55:37)*

*විනිශ්චය දිනය ළඟා විය. (එයට සළකුණක් වශයෙන්) චන්ද්‍රයාද පැළී ගියේය. එහෙත් ඔවුන් එම සාධකය දුටුවා වුවද, (එය) ප්‍රතික්ෂේප කර "මෙය දිගටම පැවත එන සූනියමකි" යයි පවසන්නාහ. (54:1,2)*

ලෝක අවසානය සම්බන්ධව යන ලිපියෙහි වැඩි විස්තර ඇත. (P: 409)

**18. දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීම නිරාවාසියෙකු වන තරමේ පාපයක් බව**

*මිනිසුන්ගෙන් සමහරෙක් අධ්‍යාපන දැනුම හෝ, (තර්කානුකූල) ඍජු මාර්ගය හෝ පැහැදිලි ධර්ම (සාධකයන්) හෝ නොමැතිවම අල්ලහ් ගැන තර්ක කරන්නාහ. අල්ලාහ්ගේ මාර්ගයෙන් (ජනතාව) හරවා දමනු පිණිස, උඩඟුකමින් යුතුව (මෙසේ තර්ක කරන්නාහ). මෙලොවදී ඔවුන්ට අවමානයයි. විනිශ්චය දිනදී නම්, දැවෙන ගින්නෙහි දඬුවමම ඔවුන්ට විඳින්නට සලස්වන්නෙමු. (22:8,9)*

ප්‍රතික්ෂේප කිරීම හෙවත් ලොකුම පාපය සහ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ කුරාන් වැකි යන ලිපි වල වැඩි විස්තර ඇත.

**19. විනිශ්චය දිනය ගැන**

*මිනිසුන්ට ඔවුන්ගේ ප්‍රශ්න ගණනය කිරීමේ (දිනය) ළඟා වෙමින් ඇත්තේය. එහෙත් ඔවුන් නම්. එය ප්‍රතික්ෂේප කර, කිසි දූකක් නැති අය වශයෙන්ම සිටින්නාහ. (21:1)*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම විඳින්නාහ. එහෙත් ඔබගේ (ක්‍රියාවන්ට සරිලන) ඵලවිපාක ඔබ පූර්ණ වශයෙන් අත් කර ගන්නේ විනිශ්චය දින දීය; (3:185)*

*(නබියේ!) නියතවශයෙන්ම ඔබගේ දෙවියන් මොවුන් සියල්ලන්වම (ප්‍රශ්න කිරීම සඳහා විනිශ්චය දිනදී තමන් ඉදිරියේ) ඒකරාශී කරනු ඇත; (15:25)*

*(නබියේ! විනිශ්චය කාලය ගැන එය කවදා එන්නේදැයි ඔවුන් ඔබගෙන් විමසන්නාහ. (එයට) ඔබ මෙසේ පවසනු. "එහි දැණුම මගේ දෙවියන්ගේ සන්නිධානයෙහිම ඇත්තේය. එය පැමිණෙන වේලාව ඔහු මිස, වෙන කිසිවෙකුටත් පැහැදිලි කිරීමක්ද කළ නොහැක. (ඒ අතරම) අහස් හිද, භූමියෙහිද ඉමහත් වූ සිදුවීම් සිදුවනු ඇත. හදිසියේම මිස, (එය) ඔබ වෙත පැමිණෙන්නේ නැත"; (7:187)*

*(විනිශ්වය දිනදී) ඔබ කොටස් තුනකට බෙදී යන්නේහුය. (පළමුව) දකුණු පාර්ශවයේ ඇති අයයි. දකුණු පාර්ශවයේ සිටින ඔවුන් කවුරුන්ද (යන්න ඔබ දන්නෙහිද) ඔවුන් ඉතාමත් භාග්‍යයවන්තයින්ය. (56:7,8) (දෙවනුව) වම් පාර්ශවයේ ඇති අයයි. වම් පාර්ශවයේ සිටින ඔවුන් කවුරුන්ද (යන්න ඔබ දන්නෙහිද) ඔවුන් ඉතාමත් අභාග්‍යයවන්තයින්ය. (56:9) (තුන්වෙනුව) පෙර ඉකුත්ව ගිය අයයි. (මොවුන් දැහැමි කාරණාවන්හි අන් සියල්ලටම වඩා) පෙර ඉකුත්ව ගිය අයයි.මොවුන් (තමන්ගේ දෙවියන්ට) ඉතාම සමීප වූ අයයි. (56:10,11)*

විනිශ්චය දිනය ගැන සඳහන් කුරාන් වැකි එකතුවක් යන ලිපියත් බලන්න. (P416)

### 20. නිරය ගැන

*කවුරුන් අල්ලාහ්ට සමානයන් තබන්නේද, ඔහුට නියත වශයෙන්ම අල්ලාහ් ස්වර්ගය වළක්වා හරින්නේය. ඔහු රැඳෙන ස්ථානය නිරයයි. මෙවැනි අපරාධකාරයින්ට (විනිශ්වය දිනදී) උදව් කරන්නන් කිසිවෙකුත් නැත; (5:72)*

*නියත වශයෙන්ම කවුරුන් අපගේ ආයාවන් බොරු කර ඒවා ප්‍රතික්ෂේප කිරීම ආඩම්බරයක් වශයෙන් ගත්තෝද, ඔවුන්ට (දෙවියන්ගේ වරප්‍රසාදයන්ට හිමි) අහස් හී දොරටු විවෘත කරනු නොලැබේ. ඉඳිකටුවේ සිදුර තුලින් ඔටුවෙකු රිංගන*

*තුරු ඔවුන් ස්වර්ගය අත් කර ගන්නේ නැත. වැරදි කරුවන්ට මේ අයුරින්ම අපි ඵලවිපාක දෙන්නෙමු. (7:4)*

*නියත වශයෙන්ම අපි මිනිසාව ඉතාම ලක්ෂණ ස්වරූපයෙන් උත්පාදනය කර ඇත්තෙමු. (ඔහුගේ නපුරු ක්‍රියාවන් හේතුවෙන්) පසුව ඔහුව දීන වූවන්ගෙනුත් දීන වූවෙකු (නිරාවාසියෙකු) බවට අපි පත්කර හරින්නෙමු, එහෙත්, කවුරුන් විශ්වාසය තබා දැහැමි ක්‍රියාවන් කරමින් සිටින්නෝද, ඔවුන් හැර. ඔවුන්ට (සදාකල්ම) නොවැලැක්වෙන හොඳ ඵලවිපාක (ස්වර්ගයන්හී) ඇත. (95:4,5,6)*

දෙවියන්ගේ නිර්මාණ: නිරය (අපාය) යන ලිපියත් බලන්න. (P 444)

**21. ස්වර්ගය ගැන**

*(නබියේ!)"කවුරුන් (මෙම ධර්මය) විශ්වාස කර, (මෙහි සඳහන් ව ඇති අන්දමට) දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම (ස්වර්ගයෙහි) දිය දහරා සදාකල් ගලමින් ඇති උයන් වතු ඇත" යයි ඔබ සුභාරංචි දෙනු මැනව! .. තවද ඔවුන් එහි සදාකල් රැඳී සිටින්නාහ; (2:25)*

*එබැවින් පිරිමි වුවද, ගැහැනු වුවද, ඔවුන් ඇත්තෙන්ම විශ්වාසය තබා දැහැමි ක්‍රියාවන් කරන්නොද, ඔවුන්ම ස්වර්ගයට යන්නාහ. ඔවුන්ට පොඩියක් හෝ අසාධාරණයක් කරණු නොලබන්නාහ. (4:124)*

දෙවියන්ගේ නිර්මාණ: ස්වර්ගය යන ලිපියත් බලන්න. (P 437)

---

# මානව කළලයේ විකසනය පිළිබඳව අල් කුර්ආනය

කුරානයේ විශේෂත්වය වන්නේ එහි ඉතාමත් දියුණු විද්‍යාත්මක සංකල්පයන් දැකිය හැකි වීමයි. ඒ අනුව එහි මිනිස් කළලයේ විකසනය, භූගර්බ විද්‍යාව, අභ්‍යාවකාශ විද්‍යාව, සාගර විද්‍යාව ඇතුළු තවත් බොහෝ විෂයයන්ට අයත් කරුණු 100% නිවැරදිව සඳහන්ව තිබීම දැකගත හැකිය. එහෙත් මෙහිදී සලකා

බලනු ලබන්නේ මිනිස් කළලය පිළිබඳව කුරානයේ සඳහන් කොට ඇති කරුණු පමණි.

මිනිස් කළලයේ විකසනය පිළිබඳ පියවරවල් අඩංගු එක් කුර්ආන් වැකියක් පහත සඳහන් කොට ඇත.

*"ඉන් පසු ඔහුව (ආදම්ගේ ප්‍රජාව) 'නුත්ෆා' (ශුක්‍රානු-ඩිම්බ එකතුව) ආරක්ෂිත තැනක තැන්පත් කෙළෙමු. පසුව එම 'නුත්ෆා' අවස්ථාව කැටියක් (අලකා) බවට පත් කෙළෙමු, එම කැටියෙන් අස්ථින් ඇති කළෙමු, ඉන් පසුව එම අස්ථින් මස්වලින් අවරනය කෙළෙමු; ඉන්පසු ඔහුව වෙනත් මැවීමක් බවට පත් කෙළෙමු" (කුරානය 23: 13-14).*

මෙම කුර්ආන් වැකිය ගැන අදහස් දැක්වීමට ටොරොන්ටෝ විශ්වවිද්‍යාලයේ ව්‍යුහ විද්‍යාව පිළිබඳ මහාචාර්ය කිත් එල් මුවර් (Keith L Moore) මහතා වෙත යොමු කර ඇත. ඒ අනුව ඒ මහතා මෙම කුර්ආන් වැකිය දීර්ඝ ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු එහි සඳහන් අනු පිළිවෙල පිළිබඳව අතිශයින්ම පුදුමයට පත් වී තිබේ. ඉන් පසුව වර්ෂ 1981දී සවුදි අරාබියාවේ දමාම් නගරයේ පැවති විද්‍යා

සම්මන්ත්‍රණයේදී ඔහු පහත සඳහන් ප්‍රකාශය සිදු කොට තිබේ.

"මනුෂ්‍යයාගේ වර්ධනය පිළිබඳව අල්-කුරානයේ ඇති ප්‍රකාශනයන් ගැන විස්තර කිරීමට ලැබීම ගැන මා අතිශයෙන්ම සතුටට පත් වෙමි. ඇයිද යත් ඒවා අධ්‍යයනය කිරීමේදී මට පැහැදිලි වන එක් කරුණක් වන්නේ එම වදන් මුහම්මද් තුමාට දෙවියන්ගෙන් ලැබී තිබිය යුතු බවයි. මා එසේ පැවසීමට හේතුව එහි සඳහන් වන කරුණු මිට ශතවර්ෂ කීපයක් යන තුරුම සොයාගෙන නොතිබීමයි. මේ අනුව මට තහවුරු කළහැකි වැදගත් කරුණක් වන්නේ මුහම්මද් තුමාට එම වදන් දෙවියන්ගෙන් ලැබිය යුතු බවයි".

මෙම කුර්ආන් වැකියට අමතරව නබිතුමාගේ හදීස්වල කළලයේ නොයෙකුත් අවස්ථාවන් ගැන තවත් බොහෝ විස්තර දැකිය හැකි වන්නේය. කිසිඳු අධ්‍යාපනයක් නොලද මුහම්මද් නබි තුමාට එවැනි දෙයක් සිදු කිරීමට නම් අනිවාර්යයෙන්ම දෙවියන්ගෙන් පණිවිඩයක් ලැබී තිබිය යුතුය.

අල් කුරානය මිනිස් නිර්මාණයක් නොවන බව සනාථ කිරීමට අවශ්‍ය කරුණු කුරානය තුලම අඩංගු වෙතත් ඊට අමතරව මෙම 21 වන සියවසේදී මිනිසා ලබා ඇති විද්‍යා හා තාක්ෂණ දැනුමද එම කරන තවදුරටත් ස්ථිර කරන්නේය.

අල් කුරානයේ ඇති මෙවැනි ප්‍රකාශන දැකීමෙන් මිනිසාගේ සිත අවදි විය යුතුය. එහෙත් පුදුමයට කරුණ නම් සුළු පිරිසකට හැර බොහෝ අයට ඒවා තේරුම් ගැනීමට නොහැකි වීමයි. (FA)

---

## මිනිස් ශුක්‍රාණු සහ කළල අවධිය පිළිබඳව දෙවියන් වහන්සේ පවසා ඇති දේ

දෙවියන් වහන්සේගේ අවසාන දිව්‍ය මාර්ගෝපදේශය වන ශුද්ධ වූ කුරානය මීට වසර 1400 කට පමණ පෙර, වසර 23 ක කාලයක් තුළ කොටස් වශයෙන් නබි මොහම්මද් (ﷺ) තුමාට හෙළිදරව් කරන ලදී. එම අවස්ථාවේ මිනිසාගේ කළල අවධිය පිළිබඳවද වැකි පහළ විය. කුරානයෙන් උපුටා ගත් එම වැකි කිහිපයක් පහත දැක්වේ. මෙහි ඇති සමහර වැකි ඉතා සියුම් බැවින් වසර 1400 කට පෙර කිසිදු මිනිසෙකු ඒවා දැන සිටියේ නැත, නැතහොත් කිසිවෙකුට ඒවා පැවසිය නොහැක. අද වන විට නව තාක්ෂණය හරහා ඒවා ඉතා නිවැරදි බව තහවුරු වී ඇත. ඒ අනුව, අපට එම වැකි දෙවියන් වහන්සේගෙන්ම ලැබුණු වැකි ලෙස සැලකිය හැකිය.

*(මිනිසුනේ!) ඔබ සියල්ල එකම ආත්මයකින් උත්පාදනය කර, පසුව (ඔබගේ පියා වෙත) රැඳී සිටීමට සලස්වා (ඔබගේ මවගේ ගර්භයෙහි) බාරදෙන්නේද ඔහුය. (6:98)*

*මිනිසා තමාව කුමකින් මවා ඇත්තේ දැයි නොදනිත්ද? ඇතට පනිමින් ඉකුත් වන එක් ජල බිඳක් මගින්ම (මිනිසාව) උත්පාදනය කරණු ලැබුවේය. එය කොඳු ඇටවලටද, ඉල ඇට වලටද මධ්‍යයෙන් ඉකුත් වන්නේය. (86:6,7).*

*අපි මිනිසාව ඉතාම කුඩා පරිමාණයේ මිශ්‍ර තරලයකින් මැව්වෙමු. (76:2). අපි මිනිසාව සුලාලාවකින් මැව්වෙමු. (32:8) [සුලාලාවක් යනු ශුක්‍රානු තරලයෙහි හොඳම කොටස]*

*නියත වශයෙන්ම අපි මිනිසාව එක් ඉන්ද්‍රිය බිඳකින් උත්පාදනය කළෙමු යන්න ඔවුන් අවධානය කළේ නැද්ද? එසේ තිබියදී ඔහු ප්‍රකට සතුරෙකු බවට පත්වී අපට වෙනස්කම් කිරීමට ඉදිරිපත් වන්නේය. (36:77)*

*නියත වශයෙන්ම (ආරම්භයේදී පළමු) මිනිසාව කිරිමැටි සාරයෙන් උත්පාදනය කළෙමු. පසුව එය අපි ඉන්ද්‍රීය බිඳක් බවට පත්කර ඉතාමත් ප්‍රවේසම් සහිත ස්ථානයක තැම්පත් කළෙමු. පසුව එම ඉන්ද්‍රීය බිඳ ලේ කැටියක් බවට පත් කළෙමු. පසුව එම ලේ කැටිය මාංශ පිණ්ඩයක් බවට පත් කළැමු. පසුව එම මාංශ පිණ්ඩයේ ඇට කටු නිර්මාණය කර, එම ඇට සැකිල්ලට මස් මාංශ ඇන්දෙව්වෙමු. පසුව එය (පූර්ණ) මිනිස් ජීවිතයක් බවට පත් කළෙමු. මෙසේ උත්පාදනය කළ අල්ලාහ් ඉමහත් භාගයාවන්තයෙකි. ඔහු උත්පාදකයින්ගෙන් ඉතාමත් අලංකාරවන්තයෙකි (23:12,13,14)*

*පසුව පිරිමි ගැහැණු මිශ්‍ර වූ එක් ඉන්ද්‍රීය බිඳක් මගින් නියත වශයෙන්ම අපිම මිනිසාව උත්පාදනය කළෙමු. ඔහුව අපි පිරික්සීම පිණිසම සවණ ඇති අය වශයෙන්ද, බැල්ම ඇති අය වශයෙන්ද, ඔහුව පත් කළෙමු. (76:2)*

*කිසිවක් ඔබ නොදන්නා අය වශයෙන් සිටියදී, ඔබගේ මව්වරුන්ගේ කුසෙන් අල්ලාහ්ම ඔබව ඉකුත් කළේය. තවද, ඔබට කණ්ද, ඇස්ද, හෘදයද, ලබා දුන් අය ඔහුය. (මෙයට) ඔබ (ඔහුට) කෘතඥ වනු මැනව.(16:78)*

*මිනිසුනේ! විනිශ්චය දිනදී ඔබට පණ දී නැගිට්ටවීම ගැන ඔබ සැක සිතුවහොත් (ඔබව පළමුවෙන්ම) කෙසේ උත්පාදනය කළෙමු දැයි යන්න අවධානය කර බලනු). නියත වශයෙන්ම අපි ඔබව (ඔබගේ මුල් පියා වන ආදම්ව) කිරි මැටියෙන් උත්පාදනය කළෙමු. පසුව (ඔබව) ඉන්ද්‍රීය බිඳකින් උත්පාදනය කර පසුව එය එක් ලේ කැටියක් වශයෙන්ද, පසුව (එය) අඩු රුවකින් යුත් නැතහොත් පූර්ණ රුවකින් යුත් මාංශ පිණ්ඩයක් වශයෙන්ද අපි උත්පාදනය කරන්නෙමු. අපගේ බලසම්පන්නකම ඔබට පැහැදිළි කරණු පිනිස (මෙසේ කර), අපි අදහස්*

කල අයව ගර්භයන්හී නියමිත කාලයක් දක්වා රැඳී සිටින සේ සලස්වන්නෙමු. පසුව ඔබව ළදරුවන් වශයෙන් ඉකුත් කර ඔබ, ඔබගේ තරුණ විය අත් කර ගැනීමට සලස්වන්නෙමු. (මේ අතර) මරණයට පත්වන්නන්ද ඔබ අතරෙන් සමහරෙක් ඇත්තාහ. (නැතහොත් ජීවත්ව සිටිමින්) සියල්ල දැනගත්තායින් පසු කිසිවක් නොදන්නා කෙනෙකු බවට පත් වන මහළු වයස දක්වා (ජීවත් වීමට) අත්හැර දමන්නන්ද ඔබගෙන් සිටින්නාහ; (22:5)

පසුව එය රූපයක් වශයෙන් අඹා තමන්ගේ රූහ් වෙතින් එහි පිඹ (මිනිසාව ඇති) කළේය. හෘදයන් ආදී දෑයද ඔහුම නිර්මාණය කළේය. (මෙසේ තිබියදී) ඔබ කෘතඥ වීම ඉතාමත් අල්පයකි. (32:9)

අල්ලාහ් ඔබව ආරම්භයේදී පස් වලින් උත්පාදනය කළේය. පසුව එක් ඉන්ද්‍රීය බිඳකින්ද, පසුව (පිරිමි - ගැහැණු) ජෝඩු බවට ඔබව පත් කළේය. ඔහු නොදැනුවත්ව කිසියම් හෝ කාන්තාවක් ගැබ් ගන්නේද නැත, ප්‍රසූත කරන්නේද නැත. ඔහුගේ සටහන් පුස්ථකයෙහි නොමැතිව කිසිවකුගේ වයස වැඩි කරනු ලබන්නේද නැත, කිසිවකුගේ වයස අඩු කරනු ලබන්නේද නැත. නියත වශයෙන්ම මේවා සියල්ල දැනගෙන සිටිම අල්ලාහ්ට ඉතාමත් සුළු දැයකි. (35:11)

ඔහු ඔබව (ආරම්භයේදී) එකම මිනිසෙකුගෙන් නිර්මාණය කර තිබුණි. පසුව ඔහුගෙන් ඔහුගේ බිරිඳව නිර්මාණය කළේය. (ඒ දෙදෙනාගෙන්, ඔබව පිරිමි, ගැහැණු වශයෙන් උත්පාදනය කරන්නේය); ඔබගේ මව්වරුන්ගේ කුසයෙහි එකකට පසු එකක් වශයෙන් අඳුරු වහන්තරාවන් තුනක් තුළ තබා ඔබව උත්පාදනය කරන්නේය: (39:6)

ඔහු මිනිසා අළක් නමැති කුඩල්ලෙක් වැනි රුධිර කැටියකින් නිර්මාණය කළේය. (96:1.2).

සෑම මිනිසෙකුටම (ඔහු පිටතට පැමිණීමට) පෙර කාලයක් ගත වූයේ නැද්ද? (එහි) ඔහු අසවල් වස්තුව යැයි කීමට නොමැති තත්වයක සිටියේය (76:1)

*මිනිසාණෙනි! ඔබගේ ගෞරවණීය දෙවියන් ගැන ඔබව රවටා දැමුවේ කිමෙක්ද? ඔහුම ඔබව උත්පාදනය කර, උසස් අන්දමට හැඩරුව නිර්මාණය කර, ඉතාමත් නියමිත ආකාරයට සකස් කළේය. ඔහුම තමන් කැමති (ඉතාමත් අලංකාරවත්) හැඩයකින් ඔබව (ඔබේ අවයවයන්) සවි කළේය. (82:6,7,8)*

*නියත වශයෙන්ම අපි මිනිසාව ඉතාමත් අලංකාරවත් හැඩයකට උත්පාදනය කර ඇත්තෙමු; (95:4,5)*

---

# ඉස්ලාමයට අනුව මිනිසාගේ ජීවන ගමනේ ආරම්භය, මැද සහ අවසානය

අපගේ ලෞකික ජීවිතයට පෙර සහ පසු අනුක්‍රමික පියවර මාලාවක් ලෙස තවත් ජීවන අවස්ථා කිහිපයක් තිබේ. ඒවා පිළිවෙලින් මෙසේය.

1. මුලින්ම දෙවියන්වහන්සේ විසින් සියළුම මිනිසුන්ගේ ආත්ම එක්තරා ස්ථානයක දී නිර්මාණය කළ පසු පෘතුවියට පැමිණීමට තම වාරය එන තෙක් රැඳී සිටින කාලය.
2. *[පළමු පිරිමි මිනිසා සහ පසුව පළමු කාන්තාව නිර්මාණය]
3. *[පළමු මිනිස් යුවල පෘතුවියට පැමිණීම]
4. නව දරුවන්ගේ ගර්භාෂ අවධිය (පළමු දින 120)
5. එය වෙත ආත්ම ඇතුළු වීම සහ ඉතිරි ගර්භාශ අවධිය
6. මිනිසෙකු ලෙස පරිසරයෙහි ගතකරන (තම ඉරණමේ පරීක්ෂන) අවධිය
7. මරණින් පසු (බර්සාඛ් නම් මිණී වල තුල) ගතකරන ජීවිත කාලය
8. විනිශ්චය දිනය ගතකරන කාලය
9. විනිශ්චයට පසු ස්වර්ගයට හෝ නිරයට යාමට ගතවන කාලය
10. සමහරු නිරයෙහි ගත කරන සදාකල් ජීවිතය
11. සමහරු ස්වර්ගයෙහි ගත කරන සදාකල් ජීවිතය

[1]. පළමු පියවර ලෙස විශ්වයේ නිර්මාතෘ සර්වබලධාරී දෙවියන් තම අණ පරිදි අහසේ එක්තරා ස්ථානයක මිනිසුන්ට ආත්මීය තත්වයක් නිර්මාණය කළේය.

වැඩි විස්තර සඳහා දෙවියන් අපව නිර්මාණය කළේ ඇයි යන ලිපිය කියවන්න.

[2]. මිනිස් සංහතිය ඇති කිරීමෙහි දෙවනි අදියරය ලෙස අහසෙහි යම් ස්ථානයක (ස්වර්ග උයනක) පළමු මිනිසා ලෙස ආදම් (අලෛහිස්සලාම්)ව නිර්මාණය කර ඔහුගේ ශරීරය තුලට ඔහුට නියම කළ ආත්මය (රූහ් සහ නෆ්ස් යන තත්වය) ලබා දී ඔහු ජීවමාන බවට පත් කිරීම.

වැඩි විස්තර සඳහා පළමු මිනිසා-(ආදම්)ව නිර්මාණය කිරීම යන ලිපිය කියවන්න.

එහිදී අනාගතයේ ඉපදීමට නියමිත අප ඇතුළු සියළුම මිනිස් සංහතියට අදාල ජාන ආදිය ආදම් (අලෛහිස්සලාම්) තුලම තැන්පත් කර ඇත.

ආත්මය, සිත, විඥානය, ශරීරය, හෘද සාක්ෂිය -රූහ් සහ නෆ්ස් අදියට අදාලව වැඩි විස්තර සඳහා සබැඳි ලිපිය කියවන්න. (P 181)

ඉන් පසු ඔහු වෙතින්ම (එනම් ඔහුගේ ශරීරයෙන්ම ගත් ඉල ඇටයකින්) ඔහු වෙනුවෙන් බිරිඳක් ලෙස (මැවීමකින්) පළමු කාන්තාව (හව්වා අලෛහිස්සලාම්ව) නිර්මාණය කිරීම.

[3]. ඉන් පසු ඔවුන් දෙදෙනා ස්වර්ගයේ සිට පෘතුවිය වෙත පහළ කිරීම.

පසුව ඔවුන් දෙදෙනා අඹු සැමියන් ලෙස එක්වීම හේතුවෙන් දරු පරම්පරාවක් ව්‍යාප්ත විය.

ඔවුන්ගේ දරුවන්ගේ දරුවන්ගේ දරුවන් ලෙස කාලයකට පසු වත්මන් තම පියා ගේ (ශුක්‍රාණු) බීජ හරහා පැමිණ, තමන්ගේ මවගේ ඩිම්භ සෛලයක් සමග සම්බන්ධ වී තමන්ට හිමි ජීවයක් රහිත ශරීරය සැකසුනි.

[4]. එය දින 120 ක් වර්ධනය වූ පසු ඉහත සඳහන් කළ අහසෙහි යම් ස්ථානයක දී දෙවිඳුන් විසින් නිර්මාණය කළ ආත්මය නැමති දෙය එම ස්ථානයේ සිට මවගේ

කුස තුල වර්ධනය වී ඇති කළලය වෙත දේවදූත (මලායිකා)වරයෙකු විසින් ගෙන විත් ඇතුළු කරන ලදී.

[5]. ඉන්පසු ජීවය සහිතව මවගේ ගර්භාශය තුල එක්තරා ජීවිතයක් ගත කිරීම. (ගර්භාෂය තුල ජීවිතය මෙලොවට වඩා හාත්පසින්ම වෙනස් ලෝකයක් වැනි තැනකි, අපට මෙලොවට වඩා හාත්පසින්ම වෙනස් ලෝක ඇති බව වටහා ගැනීමට ගර්භාෂ අවධියම හොඳ උදාහරණයකි). එයට අනුව අප පසු කළ දෙවැනි ලෝකය ගර්භාෂ අවධියයි.

[6]. ගර්භාෂයෙන් ඉකුත්ව මිනිසා මෙලොව පරිසරයට ඇතුළු වන්නේ සතුන්ට වඩා සාපේක්ෂව දුර්වල බාහිර හා අභ්‍යන්තර ශරීරයක් සහිතවය. උදාහරණයක් ලෙස අලුත උපන් මුව පැටියෙකු දෙස බලන්න. ඌ උපන් සැණින් නැගිට මවගේ පියයුර සොයාගෙන කිරි බී සෙල්ලම් කිරීමටද පටන් ගන්න නමුත් මනුෂ්‍යය දරුවාට මාස තුනක් පමණ වනතුරු හිස කෙලින් කර ගැනීමටවත් නොහැකිය. මුල් දවස්වල අම්මා තමයි හැමදේම කළේ. අම්ම තමයි හැම දේම ඉගැන්නුවේ.

මිනිසාට සිතීමට මෙහි යම් සංඥාවක් තිබේ. අපි නොදන්න ගොඩක් දේවල් අපිට පිටින් ඉගෙන ගන්න වෙනවා. ලෝකයට සවන් දිය යුතුය. නොදන්නා දේ සොයා බලන්න වෙනවා. එය මිනිස් ස්වභාවයයි.

භාහිර පරිසරයට හුරු උන දරුවා මවගේ කුස තුල දුටුවාට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයක සොභාදහමක් දකිනවා. ඔහු ඒ ගැන දන්නෙ අල්පයකි. එනිසා ඔහුගේ සිතේ නැගෙන සමහර ප්‍රශ්න මාපියන්ගෙන් අසන විට ඒවාට පිළිතුරු ඔවුන් දන්නේද නැත.

අම්මේ.., මේ අහසේ තරු කොහොමද ඇති උනේ? අප බොන කිරි නිර්මාණය වූයේ කොහොමද? සතුන් මේ ලෝකයට පැමිණියේ කොහෙන්ද? මේ මැරුණු සමනලයාට මොකද වෙන්නේ?

මේ වගේ ළමා සිත්වල නැගෙන ප්‍රශ්න ඉවරයක් නැහැ. බොහෝ දේවල් නොදන්න වැඩිහිටියන් මෙවැනි ප්‍රශ්ණ වලදී ළමයින්ට බොරු උත්තර දෙන්නත් හොඳ නැහැ. මෙවැනි තත්ව යටතේදී විශ්වයේ සහ මිනිසාගේ නිර්මාතෘ මිනිසාව

අසරණ කළේ නැත. දෙවිඳුන් විසින් මිනිසා නොදන්නා බොහෝ දේ අනාගතවක්තෘවරුන් මාර්ගයෙන් අපට දැනගැනීමට සලස්වා ඇත. මානව වර්ගයාගේ සෑම සමාජයකටම නබිවරුන් 100,000 කට වඩා යවා ඇත. මිනිසාගේ බුද්ධියට ග්‍රහණය නොවන බොහෝ තොරතුරු ඔවුන් හරහා අප වෙත ලැබී ඇත. ඒවාට ඇහුන්කන් දීම මනුෂ්‍යයාගේ වගකීමකි. ඒ අනුව යමින් බාල පරම්පරාවට නිවැරදි පිළිතුරු ලබා දී ඔවුන්වත් යහමග යැවීමට වගබලා ගත යුතුයි.

මිනිසුන්ට දෙවියන් පහළ කළ මාර්ගෝපදේශ සමග පැමිණි නබිවරුන්ගේ පෙලපතක් ගැනද බලන්න. (Page 494)

අපගේ සමාජයට මඟ පෙන්වීම සඳහා දෙවියන් වහන්සේ අවසාන දේවදූතයා ලෙස මොහම්මද් නබි ﷺ තුමා එවා ඇත. ඔහු ගැන දැනගැනීම සෑම මිනිසෙකුගේම වගකීමකි. මොහම්මද් නබි ﷺ තුමා කියන්නේ කවුරුන්ද? ලිපියෙන් ඔබට ඔහු ගැන බොහෝ තොරතුරු ලබා දැනගත හැක. ඔහු ඔබගේත් නබිවරයාය.

ශුද්ධ වූ කුර්ආනය අද මුළු ලොවටම දෙවියන්ගෙන් මඟ පෙන්වීමක් ලෙස පහළ වී ඇති අතර එය අධ්‍යයනය කර ඒ අනුව තම ජීවිතය සකස් කර ගැනීමෙන් මෙලොව ජීවිතයේ අරමුණ සාක්ෂාත් කරගත හැකිය. කුරානය යනු කුමක්ද යන පාඨය සහිත මෙම සබැඳියෙන් ඔබට ඒ ගැන හොඳ අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත. කුරාණය ඔබගේ ජීවන අත්පොතයි. එය කියවා බැලුවොත් ඔබ පුදුමයට පත්වනු නොඅනුමානය.

ශුද්ධ වූ අල් කුරානය තුලින් දෙවිඳුන් බොහෝමයක් තොරතුරු අප වෙත ලබා දී ඇත. ඊට අමතරව දෙවිඳුන් නබි ﷺ තුමා මාර්ගයෙන් තවත් තොරතුරු සහ උපදෙස් බොහොමයක් ලබා දී ඇත. ඒවා හදීස් ලෙස හඳුන්වයි. හදීස් වලින් ජීවිතයට වටිනා කරුණු රාශියක් එකතුකර සැකසූ රියාලුස් සාලිහීන් නම් මහඟු වටිනාකමක් ඇති පොත බලන්න.

ඔබේ මෙලොව සංචාරය !!! (Page 237) ලිපිය හරහා ඔබ ජීවත්ව සිටියදී දැනගත යුතුම තවත් කරුණු කිහිපයක් අන්තර්ගත කර ඇත. ඔබ ඔබේ මෙලොව

ජීවිතයේ අරමුණ වටහා ගෙන අනවශ්‍ය දෙවලින් ඉවත්ව අවශ්‍යය දේ කෙරෙහි නැඹුරුවන්න.

අපගේ මෙලොව ජීවිතය සඳහා දෙවියන්වහන්සේ විසින් අපට මොනතරම් වරප්‍රසාදයන් ලබා දී ඇත්දැයි ඔබ මදකට හෝ කල්පනා කර බැලුවාද? ඇත්තවශයෙන්ම ඒවා ගණනය කලොත් ගණනය කර අවසන් කල නොහැකිය. සමහර විට ඔබ සොබාදහම කියන්නෙ මොකක්ද කියලවත් තාම හරියට වටහා ගෙන නැතිව ඇති. දෙවියන්ගේ නිර්මාණ: ස්වභාවධර්මය සහ මිනිසාට දුන් වරප්‍රසාද සබැඳිය සහිත ලිපිය තුලින් මේ ගැන ඔබට හොද වැටහීමක් ලබා ගත හැක. ඒවා වෙනුවෙන් ඔබ කී සැරයක් නම් දෙවිදුන්ට ඔබ ස්තුති කර ඇත්ත? ඔබ මෙය වටහා ගත්තොත් ඔබ ඔබ ගැනම පසු තැවෙනු ඇත.

මේ ලොව තුල අප මොන තරම් ජයග්‍රහනය ලැබුවත් අප සිටින්නේ දෙවියන් පවසන මිනිසාගේ නොමග යෑම තුල නම් අප ලැබූ ජයග්‍රහනය සියල්ල මේ ලෝකයට පමනක් සීමා වනු ඇත. එම නිසා අපගේ නිර්මාතෘ අපට පෙන්වා දුන් ඍජු මාර්ගය තෝරාගෙන එහි යුහුසුළුව කටයුතු කිරීමට අප සැම වගබලා ගත යුතුය.

[7]. මරණයෙන් පසු ආත්මයට බාහිර ශරීරයෙන් ඉවත් වී "බර්සා" නම් ස්ථානයක සිටීමට සිදු වේ. එය අප ඇතුළු වන සිව්වන ලෝකයයි. එහි තත්ත්වය පිළිබඳව දෙවියන් වහන්සේ අපට යම් තොරතුරු ලබා දී ඇත. එහි කාලය මේ ලෝකයේ අපගේ කෙටි කාලය මෙන් නොවේ. ඉතා දිගු කාලයකි. එයද එක්තරා ජීවිතයකි. මෙලොව ජීවත් වූ ආකාරය මත එහි තත්වය දුක්බර හෝ සැපවත් වනු ඇත.

[8]. ඉන් පසු අපගේ ඊලග පියවර ලගා වනුයේ යම් දිනක දෙවියන්වහන්සේගේ නියෝගයට අනුව අපව විනිශ්වය සඳහා කැඳවීමය. මෙලොව ජීවත් වී මියගිය සියළුම ආත්ම වෙත එදිනදී නැවත ශරීර ලබා දී විනිශ්වය සඳහා සිටුවා තබනු ලබයි. එයද එක් දිනක් ලෙස සඳහන් වුවත් එය අපගේ ලොවට අදාල කාලයට අනුව එක් දිනක් නොව. දෙවියන්ගේ සන්නිධානයේ එක් දිනකි. එයද ඉතා දීර්ග කාලයකි. එදින තත්වයද සුව හෝ කටුක වන්නේ අප මෙලොව ජීවත්වන

ආකාරය අනුවය. එයද අප අත්විඳින තවත් ලෝකයකි. එදින දෙවියන් වහන්සේ විසින් සෑම කෙනාවම තනි තනිව ගෙන ප්‍රශ්න කරන බව සඳහන්.

අප ගමන ආරම්භයේදී භාරගත් වගකීම මත පදනම්ව මෙලොවදී අප විසින් එය ඉටු කල ආකාරය සහ එහිදී අප එකතුකරගත් කුසල් සහ අකුසල් ප්‍රමාණයන්ද මැන බලා එදින කිසිවෙකුට අසාධාරනයක් නොවන ලෙස සර්වසාධාරණ විනිශ්චයක් මත පහත සඳහන් වන පරිදි අපව අපගේ ඊලග සහ අවසාන ගමනාන්තය ලෙස තවත් වෙනස්ම ආකාරයේ ලෝකයකට අපව සේන්දුකරනු ඇත.

[9]. මෙහිදී මුලින්ම, මෙලොව දී නිර්මාතෘව ප්‍රතික්ශෙප කල අයව ඔවුන්ගේ මෙලොව අනිකුත් යහකම් කිසිවක් නොසලකාම නිරයට සේන්දු කරන බව දෙවියන්වහන්සේ පවසා ඇත. තමන්ගේ නිර්මාතෘව ප්‍රතික්ශේප කිරීම, ඔහුගේ උපදෙස් නොසලකා හැරීම, තම සමාජයට පැමිණි නබිවරයාව ප්‍රතික්ශේප කිරීම ආදිය ගමන ආරම්භයේදී තමා දෙවිඳුන්ට දුන් පොරොන්දු කඩකිරීමකි. එම පොරොන්දුව ගැන පවා මෙලොවදී මතක් කර දී තිබේ. තම හෘද සාක්ශිය තුලම දෙවියන් සිටියේය. එය පවා නොසලකා සිටීම මෙම අභාග්‍යය ඉරණම අත්කර ගැනීමට හේතු විය.

තමා කල වරද මැනවින් වටහා ගත් එම අභාග්‍යවන්තයින් තමාටම දොස් පවරමින් නිරයට පිවිසෙන බව දෙවිඳුන් කල් තියාම අපට සිහිපත් කර දී ඇත.

ඔවුන් හැරුනුකොට, මෙලොවදී නිර්මාතෘව පිළිගෙන යහපත් ලෙස සිටි අයව ස්වර්ගයට සේන්දු කඅරනු ඇත.

මෙලොව දී නිර්මාතෘව පිළිගෙන මුස්ලිමෙකු ලෙස හැසිරෙමින්, එහෙත්, අයහපත් දේ කර තිබුනා නම් ඒවාට වන්දි ලෙස සමාව හෝ දඩුවම් දී, (සමහර විට යම් කාලයක් දක්වා නිරය තුල දඩුවමට ලක් කර කර) පසුව අවසානයේ ඉන් පිටකර ස්වර්ගයට සේන්දු කිරීමක් ද සිදුකරනු ඇත. ස්වර්ගයට ඇතුළු වීමට පෙර සිරාත් නම් පාලමක් තරණය කල යුතුව ඇත. සමහරුන්ට එය ඉතා දීර්ඝ කාලයකි. මෙලොව අහංකාර කමින් සිටි මිනිසුන්ට එය දීර්ඝ කාලයකි.

සමහරුන්ට ඉතා කෙටි කලකින් එය තරණය කල හැක. සමහරුන්ට එය තරණය කළ නොහැකිව නිරය දෙසටම ඇද වැටෙනු ඇත.

[10][11]. ඉන් පසු අපායට නියම වුවන් සහ ස්වර්ගයට නියම වූවන් දෙවියන් කැමති තාක් එහිම සිටීමට ඉඩ හැරීම. ඒවා ඔවුන්ගේ සදාකල් වාසස්ථාන වනු ඇත. (ස්වර්ගය සහ නිරය ගැන දෙවිඳුන් විසින් පවසා ඇති තොරතුරු කියවා බලන්න).

මෙයයි අපේ ගමන..

---

## ඔබේ මෙලොව සංචාරය!!!

ඔබේ මෙලොව සංචාරයේ අරමුණ සහ පරලොවෙහි ස්වභාවය කුමක්ද යන්න පිළිබඳව ඔබට නියම වැටහීමක් නොමැතිව ඔබ දවසින් දවස ගෙවා දමන්නේ නම්, ඔබ ඔබ පිළිබඳවම පසුවට පසු තැවෙනු ඇත.

අපි මෙලොව ජීවිතයේ අරමුණු කොට සළකා සීමා මායම් දමාගෙන සිටින පහත කරුණු දෙස බලන්න.

නිවසක්, වාහනයක්, රැකියාවක්, හොඳ ආදායමක්, හොඳ දරු පවුලක්, හොඳ මානසික සැනසිල්ලක්, හොඳ ජීවිතයක්, ජනප්‍රියත්වයක් ආදිය සළකා බලමු.

අපි හිතමු මේ සියල්ලම හොඳටම තිබුනා කියල. රටේ ජනාධිපතිකමත් ලැබුණා කියල හිතමු. එහෙමත් නැත්නම් TATA සමාගමේ හිමිකරු මෙන් පොහොසත් ව්‍යාපාරිකයෙක් උනා කියලා හිතමු.

එවිට අපි අපේ ජීවිතය ජය ගත්තා කියලා හිතන්න පුලුවන්ද? මේ සඳහා ද අපි මෙලොවට අපි පැමිණියේ ?

මෙයට වඩා ගැඹුරු අර්ථයක් තිබිය නොහැකිද?

පිළිතුර සෙවිය හැක්කේ විද්‍යාවෙන් හෝ තාක්ෂණයෙන් නොව. ආගම ධර්මය තුළිනුයි. නමුත් ආගම ධර්මය හරහා අපිට කියනදේ අන්ධ භක්තියෙන් පිළි නොගෙන ඒවා පිළිබඳව යම් නිගමන වලට පැමිණීමට විද්‍යාව හා තාක්ෂනය උපයෝගී කරගත්තට වරදක් නැත යනුයි මගේ අදහස. එනිසා නව දැනුමත් විචාර බුද්ධියත් යොදවමින් අප අවට තියෙන ප්‍රධාන ආගම් වලින් මේ පිළිබඳව අපට කියන දේ විමසා බලමු.

ඉතාම සරලවම කියනවා නම් ඒ ඒ දහම් තුලින් අපට මෙවැනි අදහස් දී ඇත.

(මෙහි ආගම් පිළිබඳව යම් ආකාරයකට සංසන්දනාත්මක ස්වභාවයකින් කරුණු ඉදිරිපත් කිරීමක් තිබිය හැකි නිසා ලිපිය අවසන් වන තුරු නොකියවා අතරමගදී යෝජනා චෝදනා විවේචන ඉදිරිපත් නොකරන්න කියා මුලින්ම මතක් කරමි).

**බුදු දහමට අනුව.**

භව චක්‍රය තුල සංසාරේ යන දීර්ග ගමනේ මේ එක ජීවිතයක් පමණි. කරන හොඳ නරක අනුව සංසාරය කෙටි හෝ දීර්ඝ විය හැක. කැමති අයට උත්සහ ගත්තොත් දුක් සහිත මේ සසර ගමන ඉක්මනින්ම නිවනින් අවසන් කරගත හැක.

**කිතු දහමට අනුව.**

මේ ජීවිතය දෙවියන් අපට දුන් වරප්‍රසාදයකි. ජේසු තුමා මිනිසාගේ පව් වෙනුවෙන් ජීවිතයෙන් වන්දි ගෙවන ලදී. එතුමාව පිළිගෙන මෙලොව ජීවත්වී මියගිය පසු ස්වර්ගයේ සිටින එතුමා වෙත යාමට අවස්ථාව ලැබෙනු ඇත. (ජේසු තුමා එසේ කිව්වා යැයි මා නොකියමි, නමුත් කිතුණුවන් එසේ කියයි)

**ඉස්ලාම් දහමට අනුව.**

දෙවියන් මිනිසාව නිර්මාණය කර පරීක්ෂණයක් සඳහා මෙලොවෙහි ජීවත්වීමට අවස්ථාවක් දී ඇත. මරණින් පසු සියල්ලගේම ක්‍රියා කලාප සැලකිල්ලට ගෙන ඔවුන්ව ස්වර්ගය හෝ අපාය වෙත යොමු කෙරෙනු ඇත. ඔවුන් ඒවා තුල දෙවියන් කැමති තාක් කල් සිටී.

මේ කුමන කාරණයක් බැලුවත් පැහැදිලි වන්නේ මෙලොවට වඩා පරලොව තත්වය වැදගත් තැනක් ගන්න බවයි. කොටින්ම කියනවනම් මෙලොව ජීවිතයට තිබිය යුතු අරමුණ විය යුත්තේ පරලොව තමාට ලැබෙන තත්වය කුමක්ද යන්න පිලිබඳව දැනගෙන ඒ අනුව ජීවත්වීම බව පැහැදිලියි.

**බුදුන් වහන්සේගේද ජේසු [ඊසා අලෙයි] තුමාගේද මොහම්මද් නබි [ﷺ] තුමාගේද ඒකායන අරමුණ උනෙත් පරලොව තමාගේ තත්වය කුමක්ද යන්න මිස මෙලොව තත්වය නොව.** ඉතින් එතුමන්ලාට ආදරය කරන, එතුමන්ලව විශ්වාස කරන, එතුමන්ලාගේ දහම් අනුගමනය කරන අපගේ මෙලොව ජීවිතයේ අරමුණ විය යුත්තේද එයම නොවේද? එනම් පරලොව තමාට ලැබෙන තත්වය කුමක්ද යන්න පිළිබඳව දැනගෙන ඒ අනුව ජීවත් වීමට වෙර දැරීම නොවේද ?

**නමුත් ඉහත පරලොව ස්වභාවයන් තුනම හරියන්න විධියකුත් නැහැ .**

(වෙනත් විශ්වාස අපි මදකට පසෙකින් තබා අපිට පුරුදු ප්‍රධාන ආගම් තුන ගැන විතරක් මෙහිදී සළකා බලමු).

මෙයින් අපට පහත නිගමනවලට පැමිණිය හැක.

- එකිනෙකට විරුද්ධ මත තුනක් නිසා ඒවා තුනම එකවර හරි යන්නට බැහැ.
- දෙකක් හරි යන්නත් බැහැ
- එක කොටසක් නිවැරදි නම් අනිකුත් කොටස් දෙක නොමග ගොස්ය.
- එසේ නැත්නම් මේ කොටස් තුනම නොමගෙහිය

මෙය බැරෑරුම් තත්වයකි. එනිසා මෙලොව සංචාරයේ අරමුණ ගැන සොයා බැලීම ඉතාම වැදගත් බව පෙනෙයි.

කිසිවෙක් කියූ නිසා, අපේ වැඩිහිටියෝ හරිය කියල කිව්ව නීසා, පාසල් පොත් පත්වල සදහන් වෙලා තියෙන නිසා සොයන්නේ බලන්නේ නැතුව සිටීම අනුවන කමකි.

ගෙවල් දොරවල් යාන වාහන දරු මල්ලෝ සියල්ල දාල යන දේවල්. එනිසා ඒවා ගැන දක්වන උනන්දුවට වඩා අපි මරණින් පසු යාමට නියමිත තැන ගැන හරියට කරුණු සොයා බලා එයට කල්තියා සූදානම් වීම තමයි ඥාවනට හුරු වන්නේ.

ඔබට විශ්වාස ඔබේ ආගමේ සදහන් දෙයයි. එය සාධාරනයි. නමුත් එය 100% නිවැරදියි කියා කීමට තරම් සාධක ඔබලග නැත්නම්, ඔබ වැරදියි කියල හිතන මාර්ගයක් හරි යාමේ අවස්ථාවක්ද තිබෙනවා නේද?

පහත කරුණු දෙස විමසිල්ලෙන් බලන්න.

1) බුදු දහමට අනුව සංසාරේ සැරිසරන කතාව නිවැරදි නම් අනිකුත් මාර්ගවල සිටින අයද සංසාරයේ ගමන් කරාවි, සමහර විට ඊළඟ ආත්මයකදී ඔවුන් බුදු දහම පිළිගැනීමට ඉඩක් තිබිමටද පුළුවනි යැයි උපකල්පනය කල හැක. එනිසා තත්වය එතරම්ම ගැටළු සහගත නැහැ. පහු වෙලා හරි අවස්ථාව උදාවෙන්නට ඉඩ තියෙනවා. සංසාරේ ඉතාම දිගයි. අනික තව බුදුවරයෙකු පහල වෙන්නටත් කල් තියෙනවා.

2) කිතු දහමේ කතාව නිවැරදි නම් ජේසු (ඊසා අ.ස) තුමාව විස්වාස කල හොද නරක සියල්ලම මරණින් මතු එතුමා වෙත අනිවාර්යයෙන්ම යන අතර අනිකුත් සියල්ල ස්වර්ගස්ථාන නොවනු ඇත.

3) ඉස්ලාම් දහමේ කතාව සත්‍ය උනොත් දෙවියන්ව සහ ඔහුගේ දූතයන්වද පුස්තකද විශ්වාස කර හොද හෝ නරක කල සියල්ලට එම ක්‍රියාවන්ට සරිලන ප්‍රතිපල (වරප්‍රසාද  හෝ දඩුවම්) ලබාදී පසුව ස්වර්ග වලද තරාතිරම් වලට අනුව දෙවියන් කැමති තාක් කල් සිටීමට අවස්ථාව ලබා දෙනු ඇත. අන් සියල්ල තම නිර්මාතෘව ප්‍රතික්ෂේප කල නිසා අපාගත වෙනු ඇත. මෙම මෙම තත්වය ඉතාම බරපතලය. මෙය සත්‍ය උනොත් ඔබ යන්නේ කොහෙටද කියා බලන්න. ඔබ ඔබේ නිර්මාතෘව ප්‍රතික්ෂේප කරමින් සිටින කෙනෙකි. දෙවැනි අවස්ථාවක් නෑ. නැවත සත්‍ය හොයන්න හෝ කල වරද නිවැරදි කරගන්නට අවස්ථාවක් හෙවත් ආත්මයක් ද නැහැ. (ඉස්ලාම් දහමින් කියන කතාව හරි ගියොත්) තත්වය ඉතාම බරපතලය.

ඉස්ලාම් නොවන ඔබේ දහම කෙතරම්ම නිවැරදියි කියා හිතාගෙන හිටියත් ඉස්ලාම් දහමින් සැමවිටම කතාකරන "පැහැදිලි සාක්ෂි සහිතව" කියන කතාව ඔබට සුළුවෙන් තකන්නට බැහැ. ඉස්ලාම් දහමින් එසේ පැහැදිලි සාක්ෂි සහිතව කිය කියා කරුණු ඉදිරිපත් කරන විටත් සොයන්නේ බලන්නේ නැතුව ඔබ එය ප්‍රතික්ෂේප කිරීම පසෙකින් තිබ්බත් ඔබේ යුතුකමක් තමයි තමා හරිය කියන, මුල මැද අග සම්පූර්ණයි කියන දහමේ මොනවද තියෙන්නේ "පැහැදිලි සාක්ෂි සහිතව" කියන්න පුළුවන් දේවල් කියල ටිකක් හොයල බලන එක.

මගේ මතය නම්, කුමක් උනත් අප අනුගමනය කල යුතු වන්නේ අපේ බුද්ධියට, විචාර බුද්ධියට, නූතන විද්‍යාව ආදියට ගැලපෙන අයුරින් කරුණු පහදා දෙන සොබාදහමට එකඟ වන ප්‍රායෝගික දහම බවයි.

අපි දැන් එක එක ආගම් මෙලොව ජීවිතයේ අරමුණ ගැන කියන කතා එකින් එක ගෙන, ගැඹුරට නොගිහින් සරලව විමර්ශනය කර බලමු.

**බුදු දහමට අනුව "සංසාරේ යන දීර්ග ගමන" පිළිබඳව මට හමුවුණු තොරතුරු සහ මතුවූ ප්‍රශ්න කිහිපයක් මෙහි සදහන් කරමි.**

- ආබස්සර බ්‍රහ්ම ලෝක වලින් මෙලොවට පැමිණි ශරීර රහිත ජීවීන් කොටසක් මෙම පෘථිවියට පැමිණ රස පොලොව උරා කෑ පසු ඔවුන්ට ආපසු යා නොහැකි වූ අතර ඇතිවූ නන්භාව වැනි දෑ නිසා අවසානයේ ක්‍රම ක්‍රමයෙන් සිරුරු හටගත් බවක් බුදු දහමේ සඳහන් බව පවසනවා.
- ඒ සමගම පහත සදහන් ප්‍රශ්න වලටද පිළිතුරු සොයා බලන්නත් උවමනාය. එනම්,
- ආබස්සර බ්‍රහ්ම ලෝක සහ ඒවාට මුල්ම ජීවින් ආරම්භ වෙන්න ඇත්තේ කොහොමද? එනම් පළමුම අවස්ථාව කුමක් විය හැකිද? කුමන සංඛයාවක් සහිත භව චක්‍ර හෝ වෙනත් වෙනත් විශ්වයන් හෝ ගැන සඳහන් කලත් යමක් ආරම්භ උනා යැයි කියනවා නම් එම ආරම්භයට හේතුවක් තිබිය යුතුයි. එම හේතුව ගැන බුදුදහමෙහි සඳහනක් මට හමුවී නැත.

- පෘථිවිය තුලට ඔවුන් ගේ පැමිණීමට පසු ආත්මාවන් සහිත ජීවීන් යලිත් අලුතින් බිහි උනා ද? බිහි උනා නම් බිහි උනේ කොහොමද?
- කුමණ ආකාරයකට ජීවින්, ශාක ආදියෙහි විවිද ප්‍රබේධ බිහි වෙලාද? [පරිණාමවාදය පිළිගත නොහැක. ඒ බව මෙහි ලිපියකින් පෙන්වා දී ඇත].
- ඒවාට විවිධ හැඩ රුව, අංග ලක්ෂණ ලැබෙන්නේ මොන පදනම යටතේද?
- මිහි මත සිටින සෑම ජීවියෙකුටම සරිලන විධියට පරිසර තත්ත්ව ද සමාන්තර ආකාරයට ගැලපෙන්නේ කුමන කාරණය මතද?
- මේ කුසල්ය මේ අකුසල් ය වශයෙන් බෙදා වෙන් කලේ කව්ද?
- කුසලක් හෝ අකුසලයක් (හෝ පිං පව්) කරන විට එය සටහන් කරගන්නේ කව්ද?
- එක ආත්මයකදී සහ පෙර ආත්මවල කල කුසල් අකුසල් නිවැරදි ලෙස වෙන්කරන්නේ කව්ද, මොන පදනම යටතේ මොන නිතිය යටතේ එය සිදුවන්නේද? ඒවා ගබඩා කර සුරක්ෂිත කර ඊළඟ ආත්මය හෝ ආත්ම වෙත මනා සැලසුම් සහගත ලෙස ගෙන ගොස් බෙදා හරින්නේ කව්ද?
- විශ්වයක් හෝ භවචක්‍රයක් අවසන් වූ පසු නැවත විශ්වයක් හෝ භව චක්‍රයක් වෙත සංක්‍රමණය වන තෙක් ජීවීන්ගේ ආත්මාවන් රැඳී සිටින්නේ කොහේද?
- බිලියන, ට්‍රිලියන ගණනින් සහිත ජීවිත (ශරීර) තිබෙන වටපිටාවක් තුල තමාට සුදුසු තමාටම නිශ්චිත වූ ජීවිතය(ශරීරය) බිහිවීමට අදාල වන මව සහ පියා සොයා දෙන්නේ කව්ද?
- මරනින් මතු තමන්ගේ සන්දබ්බ අවධිය ගත කරන්නේ තනියමද?
- කුසල් අකුසල් (හෝ පිං පව්) වල තත්වය සලකා ආත්මාව යොමු කර ශරීරය උපද්දවන්නේ සතෙකු ලෙසද මනුශ්‍යයෙකු ලෙසද, ප්‍රේතයෙකු ලෙසද කියා තීරණය ගන්නේ කව්ද?
- සතුන්ගේ සහ ශාකවලද බැක්ටීරියා වෛරස් වලද ඇති විශ්මිත ශරීර නිර්මාණය කලේ කව්ද? මේවා සිත මගින් නිර්මාණය වුනු දේවල්ද?
- ඕපපාතික ජීවීන් යනු කවුරුන්ද? ඔවුන් ඉබේ හටගන්නා ජීවීන්ද?

- ඇත භවයකදී කල ක්‍රියාවකට වර්තමාන ජීවිතයේදී ප්‍රතිපල දෙන තෙක් කුසල් අකුසල් යන එම දත්ත සුරක්ෂිත කලේ කොහෙද? එය මොනතරම් සංකීර්ණ දත්ත ගබඩාවක් විය යුතු නොවේද? එය පාලනය කරන්නේ කව්ද? එම සැකසුම නිර්මාණය කලේ කව්ද?
- මෙම ක්‍රියාවන් නිසි අයුරින් ක්‍රියාවට නගන්නට අණ සහ උපදෙස් දෙන්නෙක් සිටිනවද? මේ සඳහා වෙනම කණ්ඩායමක් සිටිනවද? නැත්නම් අපෙන් පිටව යන සිත් හෝ ආත්ම මගින්ම මේවා සිදුකර ගන්නවාද?
- මේ සැම ආත්මයකටම (ජීවිතයකටම) අවශ්‍ය ආහාර නවාතැන් ලබා දෙන්නේ කව්ද? කල්ප ලක්ෂ ගණන් (පෘතුවිය බිහිවෙන්නත් කලින් සිට වූ) ඇත ඉතිහාසයක සිට එන ආත්මවන් සියල්ල නිවන් යන්නට පෙර සූර්යයා මිය ගොස් එහි ක්‍රියාව අවසන් උනොත් ඇතිවන තත්වය කුමක්ද ? එම ආත්මාවන් වෙනත් ස්ථානයකට සංක්‍රමණය වෙනවාද? සමහට විට විශ්වයෙනුත් එහාට, එනම් වෙනත් නව විශ්වයකට යාමට තරම් තනි තනි ආත්ම වලට හැකියාවක් තියෙනවද? ඒ ගැන සඳහන් දහම් කරුණු තියෙනවද?
- සංසාර ගමනේ අතර මගදී මුළු ලෝක සියල්ල අළු දූවිලි වෙලා නැතිවී ගියොත් ඒ හේතුවෙන් මිය ගිය ජීවිත වල එම ආත්මවන් යන්නේ කොහාටද? විශ්වයන්ගේ විනාශයත් සමග කුසල් සහ අකුසල් (හෝ පිං පව්) සහිත ආත්මත් විනාශවී නැති වෙලාම යනවාද? ඉපදෙන්නට තැනකුත් නැතිනම්, නිවන් යන්නට කුසලුත් නැතිනම් අතරමන් වෙන මෙම කොටි ප්‍රකෝටි ආත්මවන් වලට වග කියන්නේ කව්ද? එවිට එම ආත්මවන් රැක බලාගන්නේ කව්ද? එවිට ඇතිවන තත්වය මෙහෙය වන්නේ කව්ද?
- ආනන්තරීය පාපකර්මය කල අයට කෙදිනක හෝ අවසානයක් තිබේද?
- අපාය ගැන විශ්වාස කරනවා නම්, අපායේ යම රජු සහ යමපල්ලන් යනු කවුරුන්ද? ඒ ගැන අදහසක් හෝ බුදුදහමින් පෙන්වා දෙන්නේද?

මේ ප්‍රශ්න බහුබූත ප්‍රශ්න නොවෙයි. බුදු දහම ප්‍රශ්න කිරිමකට ඉදිරිපත් කළා නොව, බුදු දහමට අනුව සංසාරේ ගමනක් යන ඔබට වර්තමානේ වෙලා ඉන්න

ගමන් පිළිතුරු සොයන්න තියෙන ප්‍රශ්න කොපමණද කියල සිහි ගැන්වීම කලා පමණි. මෙය ඔබේ ගමනය. එය දැනගෙන යාම ඥාවනට හුරු නොවේද? (මෙම සියළුම ප්‍රශ්න වලට ඉස්ලාම් දහමින් පිළිතුරු ඇත).

සොභාධර්මය දෙස මදක් විමසිල්ලෙන බලන්න.

- පසේ ක්ෂාරය උරාගෙන බීජයක් ලොකු වෙයි. එහි එල අපි ආහාරයට ගන්නෙමු, පසුව කෙදිනක හෝ අපි මියැදෙන්නෙමු, අපේ ශරීරද පස් බවට පත්වෙයි. පසේ සංයුතියත්, එලවල සංයුතියත්, අපේ සිරුරේ සංයුතියත් අතර තියෙන්නේ මනා ගැලපිමකි.
- සූර්යා ලෝකය පතිත වූ විට ශාක තම ආහාර නිපදවා ගනී. ජලය වාෂ්පීකරණය වී ජල චක්‍රය ක්‍රියාත්මක වෙයි,
- පෘතුවිය බ්‍රමණය වෙන නිසා දිවා රාත්‍රී ඇති වෙයි. එනිසා සතුනට විවේකයක් සහිත රාත්‍රිය උදා වේ.
- ගුරුත්වාකර්ෂණය නිසා අපි පොළොවෙහි සිටගෙන සිටින්නෙමු.
- හමා එන සිසිල් සුළඟ, මනරම් වටපිටාව, සතුන්ගේ මිහිරි නාද, කඳු, ගංගා, දියඇලි. මොන තරම් සැලසුම් සහගත වටපිටාවක්ද අප අවට තිබෙන්නේ?

එකිනෙකා අතර තියෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාවයේ විශ්මිත බව මෙපමණයි කිව හැකිද? මේවා නැරඹීමට, ඇසීමට, විඳීමට අපට විශ්මිත අවයව ලැවී ඇත. ආදරය, කරුණාව, මව්පිය සෙනෙහස ආදී මේවා කොහෙන් පහළ වූ ඒවාද? මේවා අතර තියෙන සම්බන්දතාව කොහොම ඇති උනාද? මේවා අතර මනා පාලනය කෙසේ සිදුවන්නේද? මේ මොකුත් කතා නොකර “මේ ජීවිතය කුණු ගොඩකි, දුකකි, ජරාවකි, මෙම ජීවිතය අපවෙත ලැබී තියෙන්නේ අපම කරගත් මහා පව්කාර කමකටය, මෙය අවසන් කර දැමිය යුතු එකකි, ඒ සදහා පහත ක්‍රමය අනුගමනය කරමු කියල අපට කුඩා කල සිට වැඩිහිටියන්ගෙන් උපදෙස් ලැබුනත් අපේ විචාර බුද්ධිය වර්ධනය වනවිට අපි එම කියමන් පිළිබඳව නැවත සොයා බැලිය යුතු නොවෙද? ඉතා සංකීර්ණ නවීනපන්නයේ මෝටර් රථයක් ඔබ ඉදිරියේ තිබෙන විට එය යකඩ ගොඩකි එය විනාශ කල යුතු යැයි ඔබ සිතන්නේද? නැතිනම් මෙය

නිර්මාණය කර ඇත්තේ කුමණ අරමුනක් සඳහා දැයි සොයා බලා එය භාවිත නොකරන්නේද? මෙම සංසාරේ යන ජීවිතය හෝ ආත්මය අවසන් කලයුතු යැයි තර්ක කරන අය දැනන් සිටියාද මෙය ආරම්භ උනේ කුමන හේතුවක් මතද යන්න? මේවා සොයා බැලිය යුතු කරුණුය.

මේ තරම් සංකීර්ණද, විශ්මිතද, වටිනාකමින් උපරිමද වන ජීවිතයක් ලැබී ඇති වෙලාවේ, අපි එය කුණු කන්දක්, ජරා ගොඩක් කියල අදහස් කරමින් ජීවිතෙන් පැන යන්නේ නැතුව එහි යථාර්ථය හොයාගෙන එම වටිනා ජීවිතයෙන් උපරිම ඵල නෙලා ගැනීමට යුහුසුළු වීම නොවේද බුද්ධිමත් කම. තමාව හඳුනා ගන්නවා කියන්නේ එය නොවේද?

**අපි දැන් කිතු දහමට අනුව මෙලොවේ සංචාරය කෙසේ දැයි දැනගන්න බලමු.**

කිතු දහම කොටස් රාශියකට බෙදී ඇති නිසා කුමන කොටස ගැන කතා කරනවද යන්න ගැටලුවකි. සමහරු ජේසු තුමාව අනුගමනය කරන බව පවසයි. තවත් සමහරු මරිය තුමිය හරහා දෙවියන්ගෙන් පිහිට පතයි. තවත් සමහරු ත්‍රිත්වයක් ගැන පවසයි. දෙවියන් නමදිනවා කියල පිළිම වන්දනාවේ යෙදෙයි. මෙය අවුල් සහගත තත්වයක් ලෙස මටද පෙනෙන නිසා, පොදුවේ කතාකිරීම පහසුයි.

කිතු දහමේ ප්‍රධාන භූමිකා ලෙස දෙවියන් වහන්සේවද, ජේසු තුමාවද, මරිය තුමියද, මෝසෙස් තුමා සහ ඉබ්‍රාහිම් තුමාවද, සාන්ත පාවුලුතුමා ද, පාප් වහන්සේලා ඇතුළුව පල්ලියේ අනපනත්ද, විවිධ වෙනස්කම් වලට ඔවුන් විසින්ම ලක් කල ශුද්ධ වූ පැරණි හා අලුත් තෙස්තමෙන්තුද සැලකිල්ලට ගත හැක.

කිතු දහම තුලම තියෙන ග්‍රන්ථවල සත්‍ය ඉතිහාසයද, සත්‍ය තොරතුරුද, සත්‍ය දේව දූතවරයන් ගැනද, සත්‍ය දෙවියන් පිළිඹදවද විමර්ශනාත්මකව කරුණු සොයා බලන්න. පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න .

ජේසු තුමා, මෝසෙස් තුමා, ඉබ්‍රාහිම් තුමා, මරිය තුමිය යන චරිත පිළිඹදව සත්‍ය කරුණු සොයා බලන්න. එනම් මේ අය දෙවි වරුද, දෙවියන්ගේ ආත්මද, දෙවියන්ට සමීප කරවන අතර මැදියන්ද, නැත්නම් විශේෂත්වයක් තියෙන මිනිසුන්මද කියල හොයල බලන්න.

ශුද්ධ වූ බයිබලයේ "ශුද්ධ" භාවය ගැන කරුණු සොයා බලන්න. (එනම් දෙවියන් ගේ වචන පමණද එහි අන්තර්ගත වන්නේ. නුසුදුසු, නොවටින, නොගැලපෙන, වැරදි සහිත කරුණු එතුල ඇත්නම් එම වචන කෙසේ එයට ඇතුලත් වෙලාද කියල හොයන්න. (Page 797)

ත්‍රිත්වය යන්න කුමක්ද කියල පවසන කෙනාටත් අහගෙන ඉන්න කෙනාටත් යන දෙදෙනාටම එය පැහැදිලිව තේරෙන දෙයක්ද යන්නත් සොයා බලන්න.

ඉහත කරුණු වලට පිළිතුරු සොයා යාමේදී කිතු දහමේ නිවැරදි මග ඉස්ලාම් දහමේ ගමන් මග බව අවබෝධ කර ගැනීම අපහසු නොවෙනු ඇත. එනම් ඔවුන් ඉස්ලාමේ දහම් මගෙහිම පැමිණ වෙන වෙන අසම්පූර්ණ අපැහැදිලි මාර්ග වලට හැරී ගිය කොටස් බව පැහැදිලිය.

එනිසා කිතු දහම හඳුන්වා දෙන මෙලොව සංචාරයේ අරමුණ ගැන සොයා බැලීම තේරුමක් නැති දෙයක් යයි මම අදහස් කරමි.

කිතුනු සහෝදරයන් මා සමග අමනාප වෙන්න එපා, දහම යනු ඉරණමයි. මම යෝජනා කරන්නේ සොයා බලන ලෙසයි. ඔබේ ඉරණම ගැන සොයා බැලීම ඔබේ යුතුකමයි. හැඟීම් වලට වහල් වෙන්න එපා. අවේගශීලි වෙන්නත් එපා. නිවැරදිව හෙව්වොත් ඔබට නිවැරදි මග හමුවේවි. අවධානය යොමු කළ යුතු බයිබල් වැකි කිහිපයක් මෙහි සඳහන් කර ඇත. එය කියවා බලා නිවැරදි මාර්ගය වෙත පිය නගන්න.

ඉස්ලාම් දහම පැහැදිලි ලෙස සාක්ෂි ඉදිරිපත් කරමින් ස්ථාවරව කියා සිටින්නේ ආදම් (අ.ස), ඉබ්‍රහිම් (අ.ස), මෝසෙස් -මුසා (අ.ස), ජේසු (ඊසා අ.ස), සහ තවත් එවැනි නබිවරුද, එම නබිවරුන්ගේ පෙළෙහි අවසන් නබි මොහම්මද් (සල්) තුමාද දෙවියන් වහන්සේ විසින් මෙලොවට පහල කල දේව දූතවරයන් බවය.

ඔවුන්ව හෝ වෙන කිසිම මැවීමක් නැමදීම්වලට ලක් නොකරන ලෙසත් අල්ලාහ්ට පමණක් අවනතවන ලෙසත් දෙවියන් දැනුම් දී ඇත. පැරණි සහ අලුත් තෙස්තමේන්තු ලෙස හඳුන්වන්නේ එම අල්ලාහ් විසින්ම පහල කල තව්රාත්, ඉන්ජීල් නම් දේව ග්‍රන්ථය. ඒවා මිනිසුන් විසින් වෙනස් කරනයන්ට ලක් කර

තිබෙන නිසා ශුද්ධ තත්වයෙන් පවතිනවද යන්න පැහැදිලි ලෙස සැක සහිතය. අවසන් නබි හෙවත් මොහම්මද් (සල්) තුමාට පහල කල දේව ග්‍රන්ථය හෙවත් ශුද්ධ වූ අල් කුරානය කිසිඳු වෙනසකට හෝ හානියකට ලක් නොවී සැමදා ශුද්ධ තත්වයෙන්ම පවතින බව ඉස්ලාමය තුලින් පැහැදිලි කරයි.

එනිසා ඉස්ලාම් දහමට අනුව මෙලොව සංචාරයේ අරමුණ ගැන දැනගැනීමට කාලය මිඩංගු කිරීම වඩා උචිත බව පැහැදිලිය. එසේම, මෙය කියවා අවසන් වන විටත් මා ඉහත බුදු දහමට අනුව මතුකළ ප්‍රශ්න වලටද පිළිතුරු ඔබට ලැබේ යයි මම විස්වාස කරමි.

මුලින්ම ඔබ හීනෙකින්වත් නොහිතන දෙයක් මම මෙහි සඳහන් කරන්නම්. එනම්, මේ පොලොව මත සිටින සියලුම ජීවින් ගෙන් මිනිසා ඉතාම ශ්‍රේෂ්ඨත්වයෙහි ලා සැලකීම අපි කව්රුත් කරන දෙයක්. තිරිසනුන් ඇතුළු අනිකුත් ජීවින් අපට වඩා පහත් කොට සලකයි. මොකද, ඔවුන්ට අපට මෙන් හොඳ නරක තෝරා ගැනීමේ නිදහස මෙන්ම තීක්ෂණ බුද්ධිය, මිනිසාට මෙන් අධික මතක ශක්තියද, විචාර බුද්ධියද, සුවිශේෂී නිර්මාණ ශීලි හැකියාවද, සිතු සිතු ආකාරයට සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවද, තව නොයෙකුත් පහසුකම් ද නැත. නමුත් අප මෙන්ම ඔවුනුත් මෙම පොලොව මත යම්කිසි ආයුෂ ප්‍රමාණයක් හිඳ අප මෙන්ම ඔවුනුත් මේ පොළොවටම පස් වෙනවා. ඔවුනුත් අපිත් දෙගොල්ලොම මේ එකම පොළොවටම යනවා. නමුත් එසේ මියගියාට පසු මේ දෙගොල්ලන්ගේ තත්වය ගැන ඔබ දන්නේ මොනවද? කවුද ශ්‍රේෂ්ඨ, කවුද පහත්? බලන්න ඉස්ලාම් දහමින් පෙන්වා දෙන දේ අනුව ඔවුන්ට කුමක් වෙනවද කියලා.

ඉස්ලාම් දහමට අනුව, විශ්වයේ මහා මැවුම්කාර දෙවියන් හෙවත් අල්ලාහ් මෙම විශ්වයද එහි අපට අදාල පෘථිවියද ඉර හඳද ගහ කොලද සතා සිව්පාවද අනිකුත් සියලුම දේ (හෙවත් ස්වභාව ධර්මය) ද කිසියම් පැහැදිලි හේතුවකට නිර්මාණය කර පිලිවලකට විසිරුවා හැර සියල්ල තම පාලනයට නතුකර ගෙන සිටී. පෘථිවිය වෙත මිනිසාව පරීක්ෂණයක් සඳහා නියෝජිතයෙකු ලෙස ඒවා ඇත. ජනගහනය ලෙස බෝ කර විවිධ ප්‍රදේශයන් තුල ව්‍යාප්ත කර ඇත. පළමු මිනිසාගේ සිට අවසන් මිනිසා දක්වා වූ සෑම මිනිසෙක්ම (කුමන තරාතිරමක වුවද, සමේ පැහැය

කුමක් වුවද, කුමන පරිසරයක, කුමන කාලයක ජිවත් උවද, ඔහු හෝ ඇය) මෙම පෘථිවියෙහි නියෝජිතයෙක් ලෙසින් තම පරීක්ශනයට මුහුන දෙයි. ඔහුට හෝ ඇයට නියෝජිත භාවය දැරීමට නියමිත ආයුෂ කාලයක්, නියමිත භව භෝග සම්පත්, දරු මල්ලන් ආදිය නියම කර ඇත. නියෝජිත භාවය කෙසේ දරනවද යන්න තම තමන්ගේ ආත්මයට භාර දී ඇති අතර ඒ සඳහා ක්‍රියාත්මක වීමට පසෙන් නිර්මාණය කල ශරීරයක් හෙවත් යන්ත්‍රයක් ද දී ඇත. එම යන්තරයට අනිකුත් සතුනට මෙන් පොදු අවයවම සවිකර තිබුනත් හදවතට සහ මොලයට සුවිශේෂත්වක් ඇති කර චිත්ත පරිශුධ්ධත්වයද, හොද නරක පිළිබඳව දැනුමද, ආදරය කරුණාව මෛත්‍රිය ඉවසීම අනුකම්පාව ආදී යහ ගුනධර්මද වෛරය ක්රෝධය ඉර්ෂියාව ආදී දෙයද සතුනට වඩා වැඩිවශයෙන් එක්කොට බුද්ධි මට්ටමද ඉහල අගයක් කොට ඇත. මේ සියල්ල හැසිරවීමේ නිදහසද දී, එම ශරීරයට අවශ්‍ය ආහාරද පසින්ම නිර්මාණයකර විවිධ ස්වරූප වලින් ලබා දී ඇත. අනිකුත් පහසුකම් ද සියල්ල ලබා දී ඇත. මිනිසාට නියෝජිත භාවය හරි විධියට දරන්නේ කෙසේද යන්න පිළිඹදව තම හර්ද ශාක්ෂියට අමතරව භාහිර වශයෙන් දේව දූත වරයන් සහ දේව ග්‍රන්ථ මගින් දැනුම්ද දී ඇත. මිනිසාගේ දැණුම, ශ්‍රවන පරාසය, දෘෂ්ටි පරාසය හා ඉසිලීමේ ද ක්‍රියාකිරීමේ හැකියාවද සිමා සහිත කර, නොමග යාමේ මාර්ගද ඇතිකර නොමග කුමක් දැයි පහදා දී, යහපත් ආකාරයද පෙන්වා දී, තම නියෝජිත භාවය කෙසේ පවත්වාගෙන යන්නේ දැයි දැඩි පරීක්ෂණයකට ලක් කර ඇත .මිනිසාට හොද හෝ නරක කැමති දෙයක් කල හැක. නමුත් මිනිසා එළිපිට හෝ රහසින් කරන සියල්ල කෙරෙහි දෙවියන් අවධානයෙන් සිටින බවද දනුම් දී ඇත. නියෝජිත භාවය අවසන් වූ පසු හෙවත් ආයුෂ අවසන් වූ පසු යන්ත්‍රය හෙවත් ශරීරය නැවත පස වෙතම යවා, ආත්මය හෙවත් "තමන්" පෘථිවිය තුල තම නියෝජිත භාවය කෙසේ ඉටුකලේ දැයි ගණන්හිලව් බේරන තෙක් "බර්සාඛ් " නම් මිනිවල තුල යම් කිසි ජිවිත කාලයක් ගතකල යුතුයි.

ඉන් පසු යම් දිනක, දෙවියන් සියලුම ජීවින් හෙවත් "ආත්ම" කැඳවා නැවත පසින්ම තමතමන්ගේ ශරීර තම තමන්ගේ ආත්ම වලට ලබාදී, ගණන් හිලව් බේරීමේ දිනය හෙවත් විනිශ්චය දිනය පවත්වනු ලබයි.

මෙදින ඔබ පොලොව මත එදා හිටපු තිරිසනුන්ට සතා සිව්පාවට වඩා අසරණ තත්වයකට සහ තැති ගැන්මකට ලක් වීමට ඉඩ ඇත. මොකද, ඔබය් පෘතුවිය මත හිටපු බුද්ධිමතා. ඔබටයි සියල්ල නතුකර දීල තිබුනේ. එනිසා සතා සිව්පාවට වඩා ඔබයි දැඩි ප්‍රශ්න කිරීමකට ලක් වනුයේ. මදකට සිතන්න, අපි පහත් යැයි සලකන පුසෙකුට වඩා උසස් අපි මේ පොලොව මත වැරදි කරන්නේ නැතිද? අපි බොරුම කීයක් නම් කියල ඇතිද? අපි හිතෙන් කොතරම් වැරදි කරලා ඇතිද? මේ සියල්ල දෙවියන් නොදන්නවා නොවේ. මේ සියල්ල ඉතිහාසයට එකතුවෙලා අහෝසි උනා නොවේ. ඔබ හෝ මම තනියම අන්දකාරය තුල කල පාපකර්මයක් හෝ කුසලක් අන්දකාරය තුලම යට ගියා යැයි සිතනවද, එසේ නොව, එය දෙවියන්ගේ සටහන්පොතට ඇතුල් වී හමාරයි. අද නූතන මිනිසාගේ තොරතුරු පටිගත කිරීමේ සහ දත්ත ගබඩා කර තැබීමේ හැකියාව කෙතරම් තික්ෂනද. තත්වය එසේනම් මුළු විශ්වයම නිර්මාණය කල දෙවියන්ගේ එම හැකියාව කෙසේ විය හැකිද? දෙවියන් සියල්ල කෙරෙහි බලසම්පන්නය. ඔහු සියල්ල ශ්‍රවනය කරන්නාය, ඔහු සියල්ල දකින්නාය.

පහත කුරාන් වැකියන් දෙස බලන්න.

*"බෙල්ල පිටුපසින් ඇති පන නාලයට වඩා අපි ඔබට ඉතාමත් සමීපව සිටින්නෙමු, දකුණු පැත්තේ කෙනෙකුද වම පැත්තේ කෙනෙකුද වශයෙන් දෙදෙනෙකු ඔහුගේ ක්‍රියාවන් සටහන් කරමින් සිටින්නෝය. මිනිසා කුමක් කීවද එය ලිවීමට බලාපොරොත්තුවෙන් සිටින කෙනෙකු ඔහුගේ සන්නිධානයෙන් නැත්තේ නොවේ -(අල් කුරාන් 50:15-18)*

**මෙලොව සංචාරයේ අරමුණ කුමක්ද යන්න වටහා ගැනීමට නියමිත වෙලාව දැනුයි.** එනම් මරණින් මතු අපව නැවත නැගිටුවා දෙවියන් හමුවේ ඔහු විසින් අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට සූදානම් වීම සහ එහිදී ඔහුගේ තෘප්තිය දිනාගෙන ඔහු විසින් දෙන්නට පොරොන්දු වී ඇති ත්‍යාග (හෙවත් සදාකල් ජීවිත්විය හැකි ස්වර්ගය) ලබාගැනීමේ අරමුණ විය යුතුයි. දෙවියන්ගේ කෝපයට ලක්ව අපාගත වීමෙන් වැලකි සිටීමට ක්‍රියා කල යුතුයි. දෙවියන් විසින් මෙවැනි ප්‍රශ්න අපෙන් අසනු ඇතැයි අපට අල් කුරාන් මගින් සහ පිළිගත් හදිස් හෙවත්

නබි (සල්) තුමා ගේ වදන් වලින් දැනගන්නට ලැබී ඇත. මෙහිදී මම සරල අදහසක් පමණක් ඉදිරිපත් කරන්නම් .

දෙවියන් විසින් විනිශ්චය දිනයේදී මෙවැනි ප්‍රශ්න ඇසුවොත් ඔබ ඒවාට පිළිතුරු දීමට සුදානම් ද?

- ✓ පෘතුවිය තුල ජීවත් වූ කාලය තුල ඔබ ඔබේ දෙවියන්ව නිවැරදිව හදුනා ගැනීමට ක්‍රියාත්මක උනාද?
- ✓ දෙවියන් ව හදුනා ගැනීමට තිබුණු පැහැදිලි සාදක ඔබ දුටුවාද?
- ✓ දෙවියන්ගේ වදන් හෙවත් පුස්තකද, දෙවියන් විසින් එවූ පැහැදිලි සාක්ෂි සහිත නබිවරු/ වක්තෘවරු/ දේව දූතයන් කෙරෙහි ඔබ විශ්වාස කර ඔවුන්ව අනුගමනය කලාද?
- ✓ ඔබ ඔබේ දෙවියන්ව හදුනා ගත්තාද?
- ✓ ඔබ ඔබේ දෙවියන්ට කලයුතු යුතුකම් ඉටු කලාද?
- ✓ ඔබ කල වැරදි වලට දෙවියන්ගෙන් සමව අයැද සිටියාද?
- ✓ දෙවියන්ගේ ඒකීය භාවය ඔබ පිළිගත්තද?
- ✓ ඔබ දෙවියන්ට සමානයන් තැබීමෙහි නිරතව සිටියාද?
- ✓ ඔබ දෙවියන් ප්‍රතික්ෂේප කළෙහිද (තමන්ගේම නිර්මාතෘට හැර වෙන අයට හෝ දේ වලට නමැදුම් කලාද)?
- ✓ ජීවිතය ගතකල ආකාරය ගැන
- ✓ ඔබ ඔබේ තරුණ කාලය කෙසේ ගත කලාද?
- ✓ ඔබ ඔබේ වටිනා විවේක කාලය කෙසේ ගත කලාද?
- ✓ ඔබ ඔබේ දැනුම බුද්ධිය කෙසේ භාවිතා කලාද?
- ✓ ඔබට ලැබුණු සම්පත්, ධනය, තනතුරු, බලය කෙසේ පරිහරණය කලාද?
- ✓ යුතුකම් ඉටුකිරීම ගැන
- ✓ ඔබ ඔබ කෙරෙහි යුතුකම් නිසිපරිදි ඉටු කලාද?
- ✓ ඔබ ඔබේ පවුල කෙරෙහි, දරුවන් කෙරෙහි යුතුකම් නිසිපරිදි ඉටු කලාද?
- ✓ ඔබ ඔබේ දෙමාපියන්, ලේ නෑයන් කෙරෙහි යුතුකම් නිසිපරිදි ඉටු කලාද?
- ✓ ඔබ ඔබේ අසල්වාසීන් කෙරෙහි යුතුකම් නිසිපරිදි ඉටු කලාද?

- ✓ ඔබ ඔබේ සේවකයන් කෙරෙහි, සේවා හිමියන් කෙරෙහි යුතුකම් නිසිපරිදි ඉටු කලාද?
- ✓ ඔබ දුගී දුප්පතුන්, අසරණයන් කෙරෙහි යුතුකම් නිසිපරිදි ඉටුකලද?
- ✓ ඔබ සතුන් කෙරෙහි, ගස් කොලන් කෙරෙහි නිසිපරිදි යුතුකම් ඉටු කලාද?
- ✓ ඔබ ඔබේ පරිසරය කෙරෙහි නිසිපරිදි යුතුකම් ඉටු කලාද?
- ✓ ඔබ ඔබේ ආගම වෙනුවෙන් නිසි පරිදි යුතුකම් ඉටු කලාද?
- ✓ ඔබේ සාශ්තෘවරයා කව්ද? ඔහු වෙනුවෙන් ඔබ යුතුකම් ඉටු කලාද? (එතුමා අපට ඉගැන් වූ ආකාරයට අපේ ජීවිත සකසා ගැනීම, එතුමාගේ ආදර්ශය අප තුලින් ද ලොවට ඉදිරිපත් කිරීම, එතුමන්ට ආදරය කිරීම, එතුමාට දෙවියන්ගෙන් ආශීර්වාද පැතීම වැනි දෑ කිරීම)

මීට අමතරව ඔබ කල සියල්ල ගැන ප්‍රශ්න කෙරෙනු ඇත.

තාක්ෂනය අතින් උපරිම ජපනාට තවමත් එක පණුවෙක් තරම් ජීවියෙක්ව හදාගන්න බැහැ. මොකද දෙවියන්ගේ නිමවුමක් වූ පණුවා ගේ සිරුරේ තියෙන තාක්ෂනය නූතන ජපාන ගේ තාක්ෂනය අභිබවන්නකි. එහෙයින් බුද්ධියෙන්ද දනුමෙන්ද උසස් ඔබ පෘතුවිය මත නියෝජෝතයෙකු වශයෙන් සිටින අවස්ථාවේ දෙවියන් ඔබට දී තිබෙන නිදහස අයුතු ලෙස භාවිත කරමින් අහිංසක සමනලයෙකු නිකරුනේ මරා දැම්මා නම් ඔබත් සමනලයත් අතර එම ගනුදෙනුව දෙවියන් විසින් විසදා යුක්තිය ඉටු කරනු ඇත. දෙවියන් සර්වසාධාරණ බවත් කිසිඳු ජීවියෙකුට අසාධාරණයක් නොකරන බවත් කුරානය තුලින් පවසා ඇත.

මිනිසුන් ලක්ෂ ගණන් මැරූ හිට්ලර්ට සෑම මිනිසෙකු වෙනුවෙන්ම පිළිතුරු දිය යුතු වෙයි. ප්‍රභාකරන්ටද එසේ මය. ඔහුගේ පිළිතුරින් ඔහු වැරදිකරු උනොත් එම මැරූ සෑම මිනිසෙකු වෙනුවෙන්ම සහ ඔවුන් මත යැපුන, ඔවුන්ගේ සෙනෙහස පවා අහිමිව අසාධාරණයට ලක්වුනු මැරුණු අයගේ සහ සමාජයේ (අසාධාරණයට ලක්වූ) සියල්ලටද වෙන් වෙන් වශයෙන් වන්දි ගෙවීමට සිදුවෙනු නොඅනුමානය. දැන් ඔබට හිට්ලර්ගේ ප්‍රභාකරන් ගේ මරණින් මතු ජීවිත ගැන සුළු වැටහීමක් ලැබෙන්නට ඇති සිතමි. ඔවුන් අල්ලාහ්ව ප්‍රතික්ෂේප කල එම පාපය නිසා සදාකල් අපාගත වනවා පමණක් නොව අන් වැරදි නිසා අපායේ දරුනු වද හිංසා වලින්ද අඩුවක් නොවනු ඇත. සෑම මනුශ්‍යයෙකුගේම කුසල්

අකුසල් වෙනුවෙන් ප්‍රතිඵල ලැබෙනු ඇත. අල්ලාහ් දයාබරය, සර්වසාධාරණය, එසේම දඬුවම් දීමෙහි ඉතා දැඩිය,

බුදු දහමේ සඳහන් අපායේ හැඩරුව ඔබේ සිහියට එනු ඇතැයි සිතමි. ඉස්ලාම් දහමින් කියන්නෙත් අපාය එවැනි ම එකක් ලෙසය. එය මහත් භයානක වේදනාකාරී තැනකි. වැරදි කරන අය දෙවියන්ට භිය විය යුතු නොවේද?

ඇතැම් මිනිසුන් එළිපිට බෝධිසත්ව ලක්ෂණ පෙන්නමින් යටින් මොනතරම් දරුණු අපරාද දූෂණ වංචා කරනවාදැයි අපි දකින්නෙමු. මහජනතාවගේත් රජයේත් නීතියේත් ඇස්වලට වැලි ගසා වංචා දූශන කලත් අන්තිමට රාජ්‍ය ගෞරව මැදින්ම අවසන් ගමනුත් යනවා. පසුව පිලිමෙකුත් හැදෙනවා. මල් මාලත් වැටෙනවා. සමහරුන්ට ගෞරව නාමත් පුදනවා. සමහරු නමස්කාරත් කරනවා. නමුත් එය අවසන් ගමන නොව. නියම ගමනේ ආරම්භය තමයි මෙලොව ජීවිතයේ අපි ලබන මරණය. මරනින් මතු දඬුවම් පටන් ගන්නේ මිනි වල තුල ට ගිය දින සිටමයි. ඉන් පසු විනිශ්චය සඳහා දෙවියන් ඉදිරියට පැමිණි පසු මෙලොව දී කල කී සියල්ල දිගහැර එලියට දැමූ පසුවයි තමාගේ මෙලොව ජීවිත කථාවේ නියම බරපතලකම වැටහෙනුයේ.

අපට මෙම ජීවිතය සඳහා පෘතුවිය තුල ලබා දී තිබෙන සම්පත් සහ අවස්ථාවන් ගැන සලකා, අප කල කුඩා පාපය උවත් දෙවියන් කුඩා කොට නොසලකන බවත්, එසේම කුඩා කුසලයද ගුණාත්මකව වැඩිකර සලකන බවත් පවසා ඇත. එබැවින්, ඔබ ඉතා අමාරුකම් තියෙද්දිත් දුප්පතෙකුට ආහාර වේලක් ලබා දුන්නා නම් ඒ වෙනුවෙන් ඔබට ප්‍රසංසා නොකලත් කමක් නෑ, කිසිවෙක් දැක්කේ නැතත් කමක් නෑ. නමුත් දෙවියන් එය ගනනය කරණු ඇත. දෙවියන් හමුවේ එය ඉතා හොඳ ක්‍රියාවකි. එහි ප්‍රතිපල ඔබ විනිශ්චය දිනයේදී ලබනු නොඅනුමානයි. මෙවැනි යහගුණද දෙවියන් නැමදීමේ ලක්ෂණයක් කොට ඉස්ලාම් දහමෙහි සලකනු ලබයි. එනම් දෙවියන්ගේ තෘප්තිය ලබන්නට කල හැකි සෑම ක්‍රියාවක්ම දෙවියන් නැමදීමකි. එසේම දෙවියන් මිනිසාව උසස් කර ඇත. ඔහු දෙවියන්ට නැමදීමට හැර වෙන කිසිවකට නැමදීමටද නිර්මාණය කර නැත. එනිසයි අල්ලාහ් කුරානය තුලින් පවසා ඇත්තේ,

*"මට නැමදීමට හැර මා මිනිස් සහ ජින් වර්ගයාව මැව්වේ නැත" (අල් කුරාන් 51:56 )*

බලන්න දෙවියන්ගේ සැලැස්ම කොතරම් ලස්සනද, කොතරම් සාධාරණද, කියල.

මෙම විශ්වය තුල අපට අදාල සියල්ල (සොභාව ධර්මය) විශ්මිත අයුරින් සකසා එය අපට කැමති විධියකට පරිහරණය කරන්නට නතුකර දී විවිධ අවස්ථාවන් විවිධ ස්වරුපයන්ගෙන් ඇතිකර එම අවස්ථා වලදී දෙවියන් සතුටු වෙන ආකාරයට ජීවත් වන්නේ කවුරුන්දැයි තේරීමට පරීක්ෂණයක් ආකාරයට අප ලෙසින් මෙම ආත්ම මවා අපට ඉතා අගනා අවස්ථාවක් උදාකර දී, ජයග්‍රහණය හෝ පරාජයද අපටම භාරකාර ඇත. මෙය දෙවියන්ගේ කැමත්තයි. දෙවියන් ඔහුට සිතු සිතු දේ කල හැකි තරම් බලසම්පන්න බව පවසයි.

දෙවියන් විශ්වාස කර යහපත් ක්‍රියාවල යෙදුනු පුද්ගලයන් ස්වර්ග වැසියන් ලෙසින්ද, දෙවියන්ව නිසි අයුරින්ම විශ්වාස කර දෙවියන්ගේ දහම තුලම සිටිමින් යම් යම් වැරදි කළවුන්ට එම වැරදි වලට දෙවියන්ගේ කැමැත්ත පරිදි සමාව හෝ දඩුවම් ලබාදී අවසානයේදී හෝ ස්වර්ගයට යොමු කරන බවත්, දෙවියන් ප්‍රතික්ෂේප කර වැරදි කළවුන් පරාජිතයන් (නපුරු මැවීම්) ලෙසින් සලකා නිරයට විසි කරනු ඇත. එසේම හොද වැඩ කෙතරම්ම කලත් දෙවියන්ව ප්‍රතික්ෂේප කල අයට (එම පාපය බරපතලම පාපයක්, වරදක් ලෙසින් සලකන හෙයන් ඔවුනට) ද සමාවක් නැත. ඒ බව අල්ලාහ් කුරානය තුලින්ම පවසා ඇත. මෙයද දෙවියන්ගේ කැමත්තයි.

නමුත් මෙලොව සියල්ලටම (එනම් අල්ලාහ්ව පිළිගත් සහ අල්ලාහ්ව ප්‍රතික්ෂේප කල සියල්ලට) අල්ලාහ් එක හා සමානව ආදරය දක්වන බවත් පරලොවදී අල්ලාහ් ආදරය දක්වන්නේ මෙලොව අල්ලාහ්ට ආදරය කල අයට පමණක් බවද පවසයි.

බුදු දහමට අනුව ඉහත මා සදහන් කල සියලුම ප්‍රශ්න වලට පිළිතුරු දැන් ඔබට හමුවන්න ඇතයි හිතමි. (නැවත වරක් සංසාර ගමන ගැන කියවන්න).

මේ සොභාව ධර්මය කියන්නේ දෙවියන්ගේ සැලස්මයි. වෙන කිසිවක් නොවෙයි. මේ ජීවින් වෙන කොහෙන්වත් අවේ නැහැ. දෙවියන් වෙතිනුයි ආවේ.

මේ ජීවින් සියල්ලගේම තියෙන සුවිශේෂත්වය නිකම්ම ඇති උනේ නැහැ. එය අල්ලාහ්ගේ හෙවත් දෙවියන්ගේ මැවීමය.

මොවුන්ට අවශ්‍ය ආහාර ඇතුළු පහසුකම් නිකම්ම ලැබෙන්නේ නැහැ, අල්ලහ්ගෙන්ම මිස. මොවුන් මැරුණම වෙන කොහෙවත් යන්නේ නැහැ, අල්ලාහ් වෙතටම මිස.

මේ ඉර හඳ ඇතුළු මුළු විශ්වයේම පාලනය නිකම්ම වෙන්නේ නැහැ, මේ සියල්ල මෙතරම් ලස්සනට ක්‍රියා කරවීමට දෙවිගොල්ලෝ ගොඩක් නැහැ, කොටින්ම පාලකයෝ (දෙවිවරු) දෙන්නෙක් හෝ හිටියනම් කොතනකින් හරි අවුලක් හටගන්න ඉඩ තියෙනවා. මේ විශ්වයටම සිටින්නේ එකම දෙවියෙක් පමනයි. ඔහු අල්ලාහ් මිස වෙන කව්ද ?

අල්ලාහ් හැර වෙන කිසිම දෙවියෙක් කුමන ආකාරයකින් හෝ අපව පැහැදිළි සාක්ෂි සහිතව අමතා තිබෙනවද.

අපි ගල් වැලි යොදල රූප හදාගෙන අපිම වැඳුම් පිදුම් කරන දේවල් දෙවිගොල්ලොද? පලතුරු වට්ටියක් එනකන් බලන් ඉන්න අය දෙවි ගොල්ලොද?

කපු මහත්තය ගේ භාෂාව විතරද දෙවියන්ට තේරෙන්නේ?

සල්ලි වැඩිපුර දෙන අයට දෙවියෝ ගොඩක් උදව් කරනවානම් ඒ දෙවියෙක්ද?

මේ සියල්ල ව්‍යාපාර මිස වෙන කිසිවක් නැත යන්නයි අද මගේ ස්ථාවරය.

අල්ලාහ් මේ සියල්ලගෙන්ම සුවිශුද්ධය. ඔහුට සමාන කිසිවක් හෝ කිසිවෙක් නැත. වැඳුම් පිදුම් කිරීමටද වැඳුම් පිදුම් ලැබීමටද වෙන කිසිවෙක් නැත. (ලා ඉලාහ ඉල්ලල්ලාහ්).

එවන් අල්ලාහ්ව ප්‍රතික්ෂේප කර අපි කොහේ නම් දුවන්නද. ඔහුගේ දහම ඉස්ලාම් නම්, ඉස්ලාම් දහමෙන් තොර කාගේ දහම කෙරෙහි අපිට විශ්වාසයක් තැබිය හැකිද. එනිසයි මම කියන්නේ දහම කියන්නේ තමාගේ ඉරණම බව.

බලන්න, මෙලොව සංචාරයේදී අපි විසින් සොයා දැනගත යුතු කරුණු. නමුත් අපි අන්දයන් වගේ හති දාගෙන දුවන්නේ වෙන වෙන දේවල් වලට පිළිතුරු හොයාගෙන නොවේද?

ඉහත කරුණු කෙරෙහි ඔබ නොසැලකිලිමත් නම් ඔබ අද ජනාධිපති උනත් පරලොවදී ඔබට එය ප්‍රයෝජනවත් වෙන්නේ නැහැ. මෙලොව මී හරක් බලාගන්න කෙනෙක් උනත් ඔබ දෙවියන්ගේ මාර්ගයේ ස්ථිර ප්‍රතිපත්තිය පිහිටුවමින් ඉන්නවනම්  ඔබ මෙලොවදීත් කිසිවෙකුට හිස නැමිය යුතු නැත. දෙවියන්ගේ මාර්ගයෙන් පිට සිටින රාජ්‍ය නායකයෙකුට වඩා ඔබ මෙම පොලොව මත සිටින උසස් කෙනෙකි.

ඔබේ ආර්ථික හිඟකම, දුෂ්කර ජීවන රටාව, හෝ කරගැට සහිත දැත යන කිසිවක් ඔබේ කර්මය නිසා හෝ පෙර කල පව් නිසා නොව, එයයි දෙවියන් ඔබට දුන් පරීක්ෂණය. ඔබේ දැසද නොපෙනේ නම් මෙලොව වශයෙන් ඔබ කම්පා විය යුතු නැහැ, එයයි දෙවියන්ගේ පරීක්ෂණ ස්වභාවය. ඔබේ දරුවා අකාලයේ මිය ගියානම් හෝ නිවස ගංවතුරට ගහගෙන ගියානම්, එයද දෙවියන් ඔබව පරික්ෂා කරන ආකාරයකි, දෙවියන්ගේ පරීක්ෂණය ඉතාම ශුක්ෂම බව වටහාගන්න.

කිසිඳු දෙයක් නැතුව ඉපදුනු ඔබ නැවත කිසිඳු දෙයක්ද නැතුවම යලි මිය යනු ඇත. ඒ ඔබගේ පරීක්ෂණ කාලයයි. පරීක්ෂණයෙන් පලා යාමටද බැරිය. නැවත පරික්ෂණයන් ලැබෙන්නේද නැත. ඉන් පසු ලැබෙන්නේ ප්‍රථිපලයි. මරණින් මතු විනිශ්චය දිනයේදී දෙවියන් අසන ඉහත ආකාරයේ ප්‍රශ්න වලට දෙවියන් ගේ තෘප්තිය දිනාගත හැකි ආකාරයට පිළිතුරු දීමට හැකි උනොත් ඔහු ඔබව ස්වර්ග වැසියෙක් ලෙසින් තෝරා පත්කරනු ඇත. එනිසා අද ඔබ සිටින තත්වය හෝ, සමේ පැහැය හෝ ජීවත්වන නිවසේ ප්‍රමාණය හෝ ඔබට භාධාවක් හෝ වරප්‍රසාදයක් වන්නේ නැහැ. දෙවියන් ඔබව මෙලොවට එව්වේ ඔබට කියල මේ පොලොව මත ලොකු ගෙයක් හදව ගන්න නොවෙයි. නමුත් බොහෝ අය

කරන්නේ එයම නොවේද? ජනාධිපති උනත් බලන්නේ ජනතාවගේ මුදල් හොරකම් කරලා හරි අමෙරිකාවෙනුත් ඉඩම් කෑල්ලක් අරන්දාලාම මෙලොව සංචාරයට සමුදෙන්න. කොතරම් මෝඩ ක්‍රියාවක්ද?

බුද්ධිමත් ලෙස බලන්න ඔබ මෙලොව සංචාරය කරන වාහනයේ සුක්කානමවත් හරියට නිසිපරිදි සවි කරලද කියල. ඉහත පින්තූරය කොතරම් ලස්සනද? සිත් ඇදගන්න සුළු නොවේද? මා අද ඉස්ලාම් හැර අනිකුත් ආගම් දකින්නේද එලෙසිනි. කිසිම දහමක් පහත් කිරීම හෝ සිත් රිදවීමක් කිරීම නොවේ මගේ අරමුණ. සිත් රිදුනනම් සමාවන්න. හරියට වාහනය එලව ගන්න බැරි උනොත් නතරවන්නේ බොහොම නරක තැනකම තමයි. නැවත ගොඩ ඒමක් නැත. නිරය හෙවත් අපාය නම් එහිදී මිය යෑමක්ද නැත. තත්වය බරපතලයි, සුළුවෙන් තකන්න එපා මෙය. මේ ඉස්ලාම් දහම ගැන ගැඹුරින් ඕනි නම් ගැඹුරින්ම සොයා බලන්න. මෙය දෙවියන්ගේ දහමයි. දෙවියන් මිනිසාට අනුමත කලද, ඔහු පිලිගන්නාද එකම දහමයි.

පහත සදහන් කුරාන් වැකි දෙස නැවත නැවත සිත යොමන්න.

*(කිසිදු ප්‍රශ්න කිරීමක් නතුවමද කළකම් වලට වකීමක් ද නැතිවම) මිනිසාව නිකම්ම අත්හැර දමනු ඇත යැයි මිනිසා සිතන්නේද? (අල් කුරාන් 75:36)*

*ඔවුන් කරන සෑම ක්‍රියාවක්ම (ඔවුන්ගේ) සටහන් පිටුවෙහි ලියා ඇත. (54:52)*

*කුඩා හෝ විශාල සියල්ල එහි ලියා තබා ඇත (54:53).*

*හොඳ දැයට හොඳ දැයම මිස වෙන පලවිපාක ඇත්තේද? (55:60).*

දෙවියන් අපට අපායට නොවැටී ස්වර්ගයට එන ලෙස ආරාධනා කර ඇත. මෙලොව ජීවිතයේ සංචාරයේ අරමුණ විය යුත්තේ ස්වර්ගයම නොවේද? ස්වර්ගයට යන මාවත පැහැදිලි ලෙස පෙන්වා ඇත. එනම් "අෂ්හදුඅල්ලාහ් ඉලාහ ඉල්ලල්ලාහ්, ව අෂ්හදු අන්න මෝහම්මදර් රසූලුල්ලාහ්". මෙලොවින් සමුගන්නට පෙර මෙය ඉතාම හොදින් වටහා ගන්න. ඉන්පසු එහිම ස්ථිර වන්න. (එහි සිංහල පරිවර්තනය නම්; අල්ලාහ් හැර නැමදීමට වෙන කිසිඳු දෙවියෙකු නොමැති බවටත්, මොහම්මද් (සල්)තුමා අල්ලාහ්ගේ දාසයා මෙන්ම අවසන් ශාස්තෘවරයා

බවටත් මම සාක්ෂි දරමි). මෙයයි ඉස්ලාම් හි මූලික ප්‍රතිපත්තිය. මෙයයි ස්වර්ගයේ යතුර. (ආලාහ්ගේ කැමැත්ත පරිදි අප සියල්ලට එහි ඇතුළුවීමට වරප්‍රසාද ලබේවායි අල්ලාහ්ගෙන් ප්‍රර්ථනා කරමු, ආමීන්.

---

# මිනිසුන් ආබාධිත හා විකෘති වී උපදින්නේ ඇයි?

කෙටි විභාගයකින් හෝ සම්මුඛ පරීක්ෂණයකින් ජය ගැනීමට නම් මෙහි පළමු පිළිතුර ප්‍රමාණවත් වේ. නමුත් ජීවිත පරීක්ෂණය තුළ නම් එයට වෙනස් ආකාරයක පිළිතුරක් ඇති බව දැන සිටිය යුතුය.

පළමු පිළිතුර:- මිනිසුන් ආබාධිත සහ විකෘතිතා සහිතව උපත ලැබීමට හේතු ලෙස ජානමය සාධක, ගර්භණී සමයේදී සහ වර්ධනයේදී පාරිසරික විෂ ද්‍රව්‍යවලට නිරාවරණය වීම, මවට හෝ දරුවාට ජීවිතයේ මුල් අවධියේදී ඇතිවිය හැකි ආසාදන, ගර්භණී සමයේදී දෙමාපියන්ගේ සෞඛ්‍යය හා දුර්වල හැසිරීම, මවගේ මානසික තත්ත්වය, දරු ප්‍රසූතියේදී ඇතිවන සංකූලතා සහ වෙනත් සාධකවල එකතුවක් ලෙස පෙන්වා දිය හැක.

ආධ්‍යාත්මික වටිනාකමක් ඇති දෙවැනි පිළිතුර සඳහා පසුබිම සැකසීම;

- මෙය යම් කිසි පෙර සැළසුමක ප්‍රතිඵලයක්ද?
- මෙය පෙර ආත්මවල කළ අකුසල් නිසා කර්මය එල දීමක්ද?
- ඉහත කී විද්‍යාත්මක සාධක මත පමණක් බලපාන දෙයක්ද?
- සොබාදහමේ නියමයක්ද? මෙය ඉබේ (අහඹු ලෙස) සිදුවන්නක්ද?
- දෙවියන්ගේ කැමැත්තද?
- ඉහත කරුණු කිහිපයක එකතුවක්ද?

ප්‍රශ්න කිහිපයක් ඇති බැවින්, ඒවා තර්කානුකූලව විසඳා ගත හැකි වන පරිදි එක් පිළිතුරක් සැපයීමේ අරමුණින් කරුණු සංවිධානය කිරීමට මම සිතුවෙමි.

පහත අදහස් වලට අපි සැමටම එකඟ විය හැක.

- ❖ ස්වර්ගයෙහි නම් කිසිඳු දුකක් නැත.
- ❖ අපායේ නම් කිසිඳු සැපක් නැත.
- ❖ පෘතුවියෙහි නම් දුකත් ඇත, මධ්‍යස්ථ භාවයත් ඇත, සැපත් ඇත. එහෙත් ස්වර්ගයේ තරම් සැප නැත, අපායේ තරම් දුක නැත.

ඉහත කාරනාවෙන් පැහදිලි වෙනවා ස්වර්ගයෙහි නම් ආබාධිත සහ විකෘතිතා සහිත අය නැති බව. එය අපිට වටිනා තොරතුරකි.

පහත දැක්වෙන්නේ අප පිළිගත් තවත් ලෞකික සත්‍යයන් කිහිපයකි.

- ❖ රෝස මල් හරිම ලස්සනයි. නමුත් මුළු ලෝකයටම රෝස මල් පමණක් තිබුණා නම්? (නැහැ, විවිධත්වය ඊට වඩා හොඳයි).
- ▪ වෛද්‍යවරයෙකුගේ රැකියාව නම් හොඳයි. (නමුත් හැමෝම වෛද්‍යවරුන් නොවීමත් හොඳයි).
- ➢ මේ ලෝකයේ හැමෝම පොහොසත් නම්? (ඒකත් ගැලපෙන්නේ නැහැ. දුප්පත් මිනිස්සුත් ඉන්න වෙනවා. නැත්නම්, කර්මාන්තයක් පවත්වාගෙන යන්න කම්කරුවන් පවා නැති වෙයි).
- ✓ සියළුම මිනිසුන් එක වගේ උනා නම්? (නැහැ. එහෙම උනොත් ආදරය කුමක්ද කියාවත් හඳුනා ගන්න බැරි වෙයි).
- ○ මේ ලෝකේ මිනිස්සු විතරක් හිටියනම්? (ඒක හරියන්නෙත් නැහැ. සතුන් නැතිව අපිට පැවැත්මක් නැහැ. ඔවුන් සොබාදහමේ සමතුලනයට විශාල මෙහෙයක් කරනවා).

**අපි මේ විදියට දිගටම ලියාගෙන ගියා නම් නම්, මේ ලෝකය විවිධත්වයෙන් යුක්ත විය යුතු බව අපි තහවුරු කරනවා. මෙයයි මේ ලෝකයේ ස්වභාවය. අපි කැමති උනත්, නැතත් මේ ලෝකය පැවතීමට නම්, එහි ස්වභාවය පවත්වා ගත යුතුයි.**

සරළ උදාහරනයකින් පහදනවා නම්, මේ ලෝකය පෙට්‍රල් වාහනයක් නම්, පෙට්‍රල් වාහනයක ස්වභාවය එහි නඩත්තු විය යුතුයි. නැත්නම් එයට පැවැත්මක් නෑ. ස්වර්ගය විදුලි වාහනයක් නම් එයට එම ස්වභාවය තිබුනම ඇති. එනිසා පෘතුවිය නම් පෙට්‍රල් වාහනයේ තිබෙන සමහර උපාංග ස්වර්ගය නම් විදුලි වාහනයට

අදාල නෑ. මේ දෙක දෙවිදිහක්. ස්වර්ගයේ ස්වභාවය අනුව එහි දුප්පතුන් සිටීමේ අවශ්‍යයතාවයක් නැහැ. නමුත් පෘතුවියට දුප්පතුන් නැතුව බැහැ. පෘතුවියේ ස්වභාවය අනුව මිනිසාට නින්ද අවශ්‍යයයි. නමුත් ස්වර්ගයේ ස්වභාවය අනුව මිනිසාට නින්දක අවශ්‍යතාවයක් නෑ. ස්වර්ගයේ ස්වභාවය අනුව එහි අලුතින් කුසල් එක් රැස් කිරීමේ අවශ්‍යතාවයක් නෑ. එනිසා ඒ වෙනුවෙන් සැකසුනු වටපිටාවක්ද එහි නෑ. නමුත් පෘතුවියෙහි ඉන්න මිනිසුන්ට නම් කුසල් රැස් කර ගැනීමට අවශ්‍යයයි. එනිසා එයට සරිළන වටපිටාවකුත් තිබිය යුතුයි.

මේ තමයි ස්වභාවය අනුව අප භාර ගත යුතු විශ්ව සත්‍යය.

දැන් අපි අපේ මාතෘකාවට එමු. මේ තරම් විවිධත්වයෙන් හා මනාව සංවිධානය වී ඇති මේ පෘථිවියේ ස්වභාවය කුමක්ද?

අපි හිතමු මිනිසා කරන අකුසල් වල ස්වභාවය නිසා මිය ගිය කිසිවෙක් මරණින් මතු නැවත වවුලන් සහ මී මැස්සන් බවට පත් නොවුනා කියලා. එසේ නම් වවුලන් සහ මී මැස්සන් (මී මැස්සියන්) විසින් පරාගනය සම්බන්ධව කරන කාර්‍යය ඇණ හිටිනවා. එය සිදුවුවහොත් අපගේ ශාක ලෝකයට කොපමණ හානියක් සිදුවනු ඇත්දැයි අපි දනිමු. එය මිනිසුන්ගේ හොඳ හෝ නරක ක්‍රියාවන් මත රඳා පවතී නම්, ස්වභාවධර්මයේ සමතුලිතතාවයට එයම භයානක තත්ත්වයකි. එනම් එවන් අහඹු ස්වභාවයකට වඩා මනා සංවිධානාත්මක සැලසුම් සහ කලමන්නාකාරීත්වයක් පෘතුවියෙහි පැවැත්ම සඳහා අවශ්‍යය වේ.

විශ්වයේ නිර්මාතෘ හෙවත් දෙවියන් වහන්සේ අපට (සාක්ෂි සහිතව) පවසන්නේ මෙම විශ්වයේ ඇති සෑම දෙයක්ම ඉතා සූක්ෂමව සහ නිශ්චිතව ඔහු විසින් සැලසුම් කළ බවයි. ඔහුට අනුව සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, පෝෂණය කිරීම, නඩත්තු කිරීම සහ පරිපාලනයද ඔහු වෙතින්ම සිදු වේ.

*ඔහුම අහස් හතම එක පිට එකක් වශයෙන් නිර්මානය කර ඇත්තේය. (මිනිසාණෙනි!) රහ්මාන්ගේ උත්පාදනයන්හී ඔබ කිසිම අඩුපාඩුකමක් නොදකින්නෙහිය. නැවත්ත් (එය අවධානය කර) බලනු. (එහි) කිසිම භේදයක් ඔබ දකින්නෙහිද? (නැවත) නැවතත් දෙවරක් බලනු. මෙසේ ඔබ කොතරම් වාර*

*ගනනක් හාර හාරා බැලුවද, බැල්මම දුබලව ව්‍යාකූල වී (ඔබ වෙත) ආපසු හැරෙනු ඇත. (76:4)*

දෙවියන් අපට පවසන්නේ මුළු විශ්වයම නිරවද්‍ය ලෙස ඔහු නිර්මාණය කර ඇති බවයි. එතරම් දැයක් කළ ඔහුට නොදැනිව මෙම ආබාධිත සහ විකෘතිතා සහිත අය බිහි වෙනවා යැයි විශ්වාස කිරීම හෝ තවත් පාර්ශවයක් පවසන ආකාරයට මිනිසා පෙර කළ අකුසල් නිසා සතුන් බවට හෝ ආබාධිත සහ විකෘතිතා ඇති මිනිසුන් ලෙස නැවත නැවත ඉපදෙනු ඇතැයි පවසන තර්ක විශ්වාස කිරීම අසීරුය. විවිධත්වයෙන් යුතු වනාන්තරයක් නිර්මානය කිරීම දෙවියන්ගේ සැලසුමක් නම් විවිධත්වයෙන් යුතු මිනිසුන්ව නිර්මාණය කිරීමත් ඔහුගේම සැලසුමෙහි කොටසක් විය යුතුය.

දැන් අපට ඊළඟට මතුවන ප්‍රශ්නය නම්, දෙවියන් එසේ ආබාධිත සහ විකෘතිතා සහිත අයව නිර්මාණය කර ඔහු එයින් කුමක් බලාපොරොත්තු වන්නේද යන්නයි.

බැලූ බැල්මට එය අසාධාරණ තත්වයක් ලෙස අපට හැඟේ. දෙවියන් වහන්සේ කාට හෝ කිසිම හෝ අසාධාරාණයක් කරාවිද? එසේ විය නොහැකිය. දෙවියන් යනු සර්ව සාධාරණ පාරිශුද්ධ කෙනෙකි. එසේ නම්, අපි දෙවියන් පවසා ඇති සමහර වදන් කිහිපයක් දෙස බලමු.

විශ්වය සහ මිනිසාව නිර්මාණය කළ කාරනාව පැහැදිළි කිරීම

*අහස්ද, භූමියද, ඒවා අතර ඇති දැයද (පුහු) සෙල්ලමක් සඳහා අපි නිර්මාණය කලේ නැත. (කුරානය 44:38,21:16). "අපි නුඹලාව නිකමට මැව්වෙමු යැයිද, නියතව නුඹලා අප හමුවට හරවනු නොලබන්නෙහු යැයිද සිතාගෙන සිටියෙහුද?" (23:115). මිනිසාණෙනි! ඔබ ඔබගේ දෙවියන් වෙත යන තුරු (හොඳ හෝ නරක හෝ විවිධ වැඩ කටයුතුවල නිරත වී) අමාරුවෙන් උත්සාහ කරමින් සිටින්නෙහිය. පසුව (විනිශ්චය දිනදී) ඔබ ඔහුව හමුවන්නෙහිය. (84:6)*

ඉහත වැකි වලට අනුව පැහැදිලියි මෙම ජීවිත අවස්ථාව අපට පරික්ෂණයකට මුහුණදෙන අවස්ථාවක් ලෙසට ලබා දී ඇති බව. හැමෝටම ස්වායීන සුවිශේෂී පරීක්ෂන අවස්ථාවන්ය. එහි එක් අවස්ථාවක් ලෙස අප අතරට පැමිණෙන

ආබාධිත හෝ විකෘතිතා ඇති අයව සැළකිය හැක. මෙම ජීවිත කාලය ඔවුන්ට ලැබුණු ස්වරූපට අනුව එය ඔවුන්ටම පරීක්ෂනයක් වනවා සේම ඔවුන්ගේ ආබාධිත හෝ විකෘති තත්වය එසේ නොවන අයගේද පරීක්ෂන අවස්ථාවකි.

*(ඔහුම) තම නියෝජිතයින් වශයෙන් භූමියෙහි ඔබව පත්කර ඇත්තේය. තවද ඔබගෙන් සමහරෙකුව අනික් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමගින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේ දැයි) ඔබව පිරික්ෂා කරන්නේය. (6:165)*

එසේ නම් ආබාධිත නොවන අය ආබාධිත අය වෙනුවෙන් කටයුතු කළ යුතු නැද්ද? සතුන්ට නැති භාන්ඩ නිර්මාණ හැකියාව දෙවියන් මිනිසාට දුන්නේ ඇයි? කකුල් නැති අය වෙනුවෙන් ඔහු රෝද පුටුවක් හෝ සාදා දිය යුතු නොවේද?

*ඔබගෙන් කවුරුන් ක්‍රියාවන්ගෙන් ඉතාමත් අලංකාරවත් කෙනෙකුද යන්නෙහි ඔබව පිරික්සනු පිණිසම ඔහු ජීවිතයද මරණයද උත්පාදනය කර ඇත්තේය. (67:2) පින් පව් කරන තත්වයෙන් අපි ඔබව (තබා) පිරික්සන්නෙමු; (21:35)*

පොහොසතෙකු ලෙස මෙලොවට උපත ලැබූ අය එය මත පරීක්ෂාවට ලක්වේ. යමෙකු මෙලොව ඉපදීමට පෙරම ඔහු වෙනුවෙන් වෙන් කල ආයුෂ කාළය, වස්තු ප්‍රමාණය, ආහාර ප්‍රමාණය, හැඩරුව, දරුවන් ප්‍රමාණය ආදී සියල්ල වෙන් කර හමාරය. ඔහු එය භාවිතා කරන ආකාරය පරීක්ෂණයට ලක් කෙරේ. (උදාහරනයක්:-යමෙකු වෙනුවෙන් දෙවියන් වයස අවුරුදු 80ක් ද ආහාර ටොන් 40ක් ද නියම කර තිබුනා යැයි සිතමු. එයට අනුව ඔහු අවුරුදු 80 අනිවාර්යයෙන්ම ජීවත් වෙනවා. ඔහු ආහර ටොන් 40ම ආහාරයට ගන්නවා. එහිදී ඔහු සාධාරනව ජීවත් වෙන්න උත්සහ ගත්තත්, ඔහු අසාධාරන ලෙස උපයා ජීවත් උනත් ඔහු ගන්නෙ එම ආහාර ප්‍රමාණයම පමණයි. අල්ලාහ් මිනිසාට අවස්ථාව දුන්නා. මිනිසාට පුළුවන් එය යහපත් හෝ අයහපත් ලෙස උපයාගෙන ආහාර ලෙස ගන්න).

ලස්සන රුවක් ලැබුණු කාන්තාවක් නම්, ඇය එය මත පරීක්ෂනයට ලක් කෙරේ. කෙනෙකුට අවලස්සන රූපයක් දී ඇයට ලස්සන රූපයක් ලබා දුන්නේ නිකමට නොවේ. එය පරීක්ෂණයේ අවස්ථාවකි.

ලස්සන රූපය නිසා ඇයට ලැබුනු වරප්‍රසාදයන් ගැනත්, ආබාධිත හෝ විකෘතිතා සහිතව උපත ලැබූ අය සම්බන්ධව ඔවුන්ට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා ගැනත් විනිශ්චය දිනදී විනිශ්චයට ලක් කෙරේ. මේවා පුද්ගලික මෙන්ම සමාජීය මට්ටමින් එකිනෙකා අතර සිදුවූ සම්බන්ධතා ආදිය ගැනද විනිශ්චයට ලක් කෙරේ. ඇස් අන්ධ මිනිසෙක් පාරක් මාරුවන්න උත්සහ ගන්නා විට ඇස් ඇති අය ඔහුට උදව් කළාද නැද්ද යන්න එදිනදී විනිශ්චයට ලක් කෙරේ. ආබාධිත දරුවන් ඇති දෙමාපියන්වත්, ඔහුගේ නෑදැයිනුත්, අසල්වාසීනුත් ඒ හරහා පරීක්ෂණයට ලක් කෙරේ. ධානපතියෙකුගේ දරුවන් ඔවුන්ට පියා හරහා ලැබුණු වස්තුව හරහා පරීක්ෂණයට ලක් කෙරේ. දෙවියන්ගේ පරීක්ෂණය අති ශුක්ෂමය. සර්ව සාධාරණය.

*ඔබගෙන් සමහරෙකුව අනික් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමඟින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේ දැයි) ඔබව පිරීක්ෂා කරන්නේය. (21:35)*

දෙවියන්ට කැමති නම් මේ ලොවත් ස්වර්ගය මෙන් කිසිඳු අඩුපාඩුවක් නැතිව නිර්මාණය කිරීමට හැකිය. එසේ කලා නම් කව්ද ජයග්‍රහනය කරන්නෙ? විභාගයකින් තොරව සම්මාන, සහතික, ගෞරවනාම ලබා දීම අසාධාරනය.

ඉහත සඳහන් ආකාරයේ පරීක්ෂණයක් සඳහා අප ජීවත්වන පරිසරයේ දුප්පත්-පොහොසත්, පරිපූර්ණ-ආබාධිත, ලස්සන-අවලස්සන, බලය සහිත-බලය රහිත, උගත්-නූගත්, දක්ෂ-අදක්ෂ, හිමි-අහිමි, රෝගී- නිරෝගී ආදී විෂමතාවයන් තිබිය යුතුය.

*ඔබගේ මව්වරුන්ගේ කුසයෙහි එකකට පසු එකක් වශයෙන් අඳුරු වහන්තරාවන් තුනක් තුළ තබා ඔබව උත්පාදනය කරන්නේය: (39:6)*

*ඔහුම තමන් කැමති හැඩයකින් ඔබව (ඔබේ අවයවයන්) සවි කළේය; (82:8)*

පාද අහිමිව සිටි අයගෙන් විනිශ්චය දිනදී ඔහුගෙන් පාද සම්බන්ධව (පාද අහිමි වීම නිසා) ඔහු නොකල දේවල් ගැන ප්‍රශ්න නොකරාවි. එනිසා එදින ඔහුට දෙවියන් ඉදිරියේ පහසුවක් දැනේවි. නමුත් පාද සහිතව ජීවත් වූ අයට තමන් පාද

භාවිතා කරමින් ගිය තැන්, කල දේ සියල්ල කෙරෙහි පිළිතුරු දීමට සිදු වේවි. එනිසා එදින ඔහුට එය අමාරු අවස්ථාවක් වේවි. එදින තමන්ගේම අත පය ඇස් පවා තමන්ටම විරුද්ධව සාක්ෂි දරන බව පවසා ඇත.

අද ඇස් තිබෙන ඔබ සමහර විට ඇස් වලින් වැරදි කර තිබුනා නම් හෝ ඇස් නිසි පරිදි භාවිතා නොකර තිබුනා නම් ඇස් දෙක නිසාම ඔබ විනාශ වූ බව එදින වටහා ගැනීමටද ඉඩ ඇත. එනිසා අද ඇස් ඇති ඔබ ඒ ගැන බිය විය යුතුය. නමුත් ඇස් නැති කෙනාට ඒ ගැන බියක් ඇතිකර ගත යුතු නැත.

කෙසේ නමුත් ආබාධිත සහ විකෘතිතා හෝ අධික දිළිඳු කම, සමහර අහිමි වීම්, වේදනා ආදිය සහිතව මිනිසුන් අප අතර සිටිනු දකින විට අපට ඒ ගැන සංවේගයක් ද ඇතිවේ.

**නමුත් අල්ලාහ් සර්වසාධාරණය.**

මේ පරීක්ෂණ කාලය දීර්ඝ කාලීන එකක් ද කෙටි කාළීන එකක්ද?

ඇත්තටම මෙය ඉතාම කෙටි කාලීන පරීක්ෂණයකි. වසර 75ක් ජීවත් වන පුද්ගලයාට දුන් පැයක පරීක්ෂනයක් වැනිය. එම කෙටි කාලය තුල තමයි අපි පාසැල් ගියේ, රැකියා කලේ, විවාහවී දරුවන් හැදුවේ සහ අනිකුත් සියළුම කටයුතු කරන්නෙ. මිනිසාට මෙය දීර්ඝ ලෙස දැනුනාට ඔහුගේ සැබෑ ජීවන ගමනේ එක් කුඩා කාල පරිච්චේදයකි. එම කෙටි කාලය තුල තමයි ඔහු ආබාධිත-විකෘතිතා ඇත්තෙකු ලෙස හෝ පෝසත්- සර්වසම්පූර්ණ හෝ දුප්පත්-දිලින්දෙකුව සිටින්නේ.

*(තවද) "ඔබ භූමියෙහි කොපමණ වසර ගණනක් සිටියෙහුද"යි ඔහු විමසනු ඇත. එයට ඔවුන් "එක් දිනක් නැතහොත් සුළු කොටසක් රැඳී සිටින්නට ඇත්තෙමු" (මේ ගැන) ගණනය කර ඇත්තවුන්ගෙන් ඔබ විමසනු මැනව!" යයි පවසන්නාහ. (23:112,113)*

මිනිසාගේ ජීවන ගමනේ අනිකුත් අවස්ථාවන්හී සහ අල්ලාහ්ගේ සන්නිධානයේ දින ගනනයේ කාලයන් දෙස බලන්න.

*නියත වශයෙන්ම ඔබගේ දෙවියන් වන අල්ලාහ් අහස්ද, භූමියද දින හයකින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජධානිය ස්ථාවර කර තැබුවේය.; (7:54)*

*පසුව ඔහු ඒවා දින දෙකකදී අහස් හතක් වශයෙන් සැලසුම් කර, සෑම අහසකටම නියමිත විවිධ යුතුකම් දැනුම් දුන්නේය; (41:12),*

*(නබියේ! එක් දිනක් ගැන ඔබ ඔවුන්ට මතක් කර දෙනු). එදිනදී මෙම භූමිය වෙනස් කර වෙනත් ආකාරයක භූමියක් බවට පත් කර හරිනු ඇත. අහස්ද ඒ ආකාරයටමයි. ඔවුන් (තම තමන්ගේ ස්ථානයන්හී සිට) ඉකුත් වී (සියල්ලන්වම) යටහත් පහත් කර එකම දෙවියන් වන එම අල්ලාහ්ගේ සන්නිධානයෙහි එක්රැස්වනු ඇත. (14:48)*

*අහසේ සිට භූමිය දක්වා ඇති සෑම කාරණාවක්ම ඔහුම පිළිවෙලකට කරන්නේය. (සෑම දැයකම) අවසානයද (ඔබගේ) ගනනයට අනුව වසර දහසකට සම වන එක් දිනකදී ඔහු වෙතම යනු ඇත. (32:5)*

*(නබියේ!)"කවුරුන් (මෙම ධර්මය) විශ්වාස කර, (මෙහි සඳහන් ව ඇති අන්දමට) දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම (ස්වර්ගයෙහි) දිය දහරා සදාකල් ගලමින් ඇති උයන් වතු ඇත" යයි ඔබ සුභාරංචි දෙනු මැනව! .. තවද ඔවුන් එහි සදාකල් රැඳී සිටින්නාහ;(2:25)*

*ඇත්තෙන්ම කවුරුන් ප්‍රතික්ෂේප කරන්නෙකු වශයෙන්ම තම දෙවියන් වෙත පැමිණෙන්නේද, ඔහුට නියත වශයෙන්ම නිරයම (ඵලවිපාක වනු ඇත). එහි ඔහු මැරෙන්නේද නැත. (සුවයෙන් යුතුව) ජීවත් වන්නේද නැත. (දඬුවම හා දහ දුක විඳිමින්ම සිටිනු ඇත). (20:74) ඔවුන් සියල්ලන්ම (නිරයට තල්ලු කරනු ලැබ) සදාකල් එහි රැඳී සිටිනු ඇත; (21:98,99)*

මීට අමතරව මිනිසාගේ ආත්ම නිර්මාණය කළ අවස්ථාවේ සිට ඔහු තම මවගේ ගර්භාෂය වෙත පැමිණෙන තෙක් ගත කළ කාලයද ඉතා දීර්ඝය.

එසේම මරනින් පසු නැවත විනිශ්චය දිනට කැඳවන තෙක් මිනී වල තුල ගතකළ යුතු ජීවිතයද ඉතා දීර්ඝ කාලීන එකකි.

විනිශ්චයට පසු ස්වර්ගය වෙත හෝ නිරය වෙත ඇතුළු වීමට පෙර සිරාත් නම් පාලම අසලදී ගත වන කාලයද (සමහරුන්ට) ඉතාමත් දීර්සය.

මේ සියළුම කාල සමග සසඳා බලද්දී මෙලොව ජීවිත කාලය ඉතාම කෙටිය. ඒ කෙටි කාලය තුල අපට අපගේ පරීක්ෂනය සඳහා දෙවියන්වහන්සේ විසින් නියම කල තත්වය අපි සතුටින් පිළිගෙන පරලොව ජයග්‍රහනය කිරීම වෙනුවෙන් යුහුසුළුව කටයුතු කළ යුතුය.

බුදු දහමෙත් පවසන්නේ සංසාරය ඉතා දිගු එකකි, එයට සාපේක්ෂව මෙලොව ජීවිතය අල්පයකි. එනිසා ලැබුණු මෙලොව කෙටි ජීවිත කාළය තුල පරලොව වෙනුවෙන් උපරිමව යහකම් කර කුසල් රැස් කරගන්නා ලෙසය.

ඉස්ලාමය තුල පෙන්වා දෙන මෙම ජීවිත අවස්ථාව එය ලැබුන පුද්ගලයා තමා ආබාධිත හෝ විකෘතිතා ඇත්තෙකු උනත්, දුප්පතෙකු උනත් ඔහුට දුකක් නැත. ඔහු පව්කාරයෙක් නොව. මෙය ඔහුගේ පෙර පව් වල ප්‍රතිඵලයක් නොවේ. එනිසා ඔහු ලද දෙයින් සතුටු වී එය ලබා දීම ගැන දෙවියන්ට ප්‍රශංසා කරමින් සිටී. ඔහු දන්නවා තමන් පැමිනියෙත් දෙවියන්ගෙන් වන අතර ආපසු යන්නෙත් දෙවියන් වෙතම බව. දෙවියන් පොරොන්දු ඉෂ්ඨ කරන්නෙක් බව ඔහු විශ්වාස කරයි. එනිසා ඔහු තම පරීක්ෂණයට හැකි අයුරින් මුහුණ දී කෙසේ හෝ තම ජීවිත සටන ජය ගැනීමට උත්සාහ කරයි. කිසි විටකත් සිය දිවි නසා ගැනීම් වැනි දේ වෙත යොමු නොවේ. ඔහු මොන තත්වයෙන් හිටියත් ඔහු පවසන්නේ අල්හම්දුලිල්ලාහ් යනුවෙනි. එනම් සියළු ප්‍රශංසා දෙවියන්ටමය.

---

# මම කවුද ? WHO AM I ?

'මම'- ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය.

1) භාහිර ශරීරය
2) අභ්‍යාන්තර ශරීරය (ආත්මය සහ සිත වැනි දෑ)

**1. භාහිර ශරීරය**

ශරීරය යනු මවගේ ඩිම්බ සෛලයක් හා පියාගේ ශුක්‍රාණු සෛලයක් එක්වී ආරම්භයේදී ඇසටවත් නොපෙනෙන මට්ටමින් පටන්ගෙන එය බිලියන ට්‍රිලියන වාරයක් විභේදනය වීම්, වෙනස් වීම් සහ විශාල වීම් වලට ලක්වී විශ්මිත ලෙස සැලසුම්සහගතව නිර්මාණය වන දෙයකි. පසුව එය යම් අවස්ථාවක (මරණයට පත් වූ පසු) පොලොවට පස් වී නැවත ඇසට නොපෙනෙන කුඩා අන්ශු බවට පත්වේ. ඒ අනුව බලන කළ ශරීරය ශාක මෙන්ම පස් වලින් නිර්මාණය වී ඇති තවත් එක් ස්වරූපයකි. භාහිර ශරීරය ද්‍රව්‍යමය වශයෙන් ගත්තොත් මළකඳ කට සමාන කල හැකිය. මළකඳ පස් ගොඩකට සමාන කල හැකියි.

භාහිර ශරීරය අවස්ථා 3කට විග්‍රහ කරයි.

1) ජීවත්වන එහෙත්, ජීවිතය රහිත සිරුර (ගර්භාෂය තුල දින 120 ක් දක්වා කාලය)
2) ජීවිතය සහිත සිරුර (දින 120 සිට මරණය දක්වා)
3) මළ සිරුර

පැහැදිලිවම මේ භාහිර ශරීරය ගැන "මම" කියන අපි කිසිවෙකුත් හරියටම දන්නෙත් නැහැ. එහි ට්‍රිලියන ගනන් ඇති සෛල වලින් එකක ක්‍රියාකාරීත්වය ගැනවත් "මම" කියා ගන්නා අපි හරියටම දන්නෙත් නෑ, එවැන්නක් නිර්මාණය කරන්නත් බෑ. වෛද්‍යවරු පවා ශරීරය ගැන දිනපතා අධ්‍යයනය කරමින් තමයි ඉන්නෙ. තත්වය එසේනම්, මෙම මෙම භාහිර ශරීරයට මම හෝ මගේ කිව නොහැකිය.

## 2. අභ්‍යන්තර ශරීරය. (Page 181 හි ලිපියත් බලන්න)

මෙය ගැන කතා කිරීමේදී පහත සඳහන් නම් අප භාවිතා කරයි

ආත්මය (soul, රූහ්) , ප්‍රාණය, සිත ක්‍රියාත්මක වන ව්‍යුහය (නෆ්ස්), ස්වයං විඥානය සහ උප විඥානය (Self-consciousness and subconsciousness/ (නෆ්ස් ක්‍රියාත්මක වන සිතෙහි ස්වභාවය), හදවත සහ හෘද සාක්ෂිය (conscience.

අපි එදිනෙදා භාවිතා කරන ආත්මය, ජීවිතය, සිතුවිලි, විඥානය, බුද්ධිය, මතකය, පින් පව්, ආදරය, කරුණාව, මෛත්‍රිය, තරහා, වෛරය, නපුරුකම, ආශාව වැනි දේ දේ ක්‍රියාත්මක වෙන්නෙ ඔය අභ්‍යන්තර ශරීරය සමගයි. ඉහත සඳහන් කිසිවක් මලකදත් සමග සම්බන්ධ නැත. එය පස් ගොඩක් ලෙස සැලකිය හැක්කේ එනිසයි.

ඉහත සඳහන් කිසිවක් ගැනවත් මිනිසාට "හරියටම එය මෙයයි" කියා කියන්න තරම් අවබෝධයක් හෝ දැණුමක්ද නැත. ඒවා කිසිවක් මිනිසාගේ නිර්මාණවල ප්‍රතිඵලත් නොවෙයි. මේවා සියල්ල මිනිසාගේ නොවන දේවල්ය.

තත්වය එසේ නම් මම කියන්නෙ කවද?

අප සිටින විශ්වය හෝ වෙනත් විශ්වයන් ඇත්නම් ඒවා කිසිවක් නොතිබුන (හෙවත් ආරම්භ වීමට පෙර) තත්වයක් ගැන සිතා බලන්න.

එවැනි අවස්ථාවක මම සහ මට අදාලව ඉහතින් කථා කල කිසිවක් තිබී නැත. එනිසා, විශ්වයන් කිසිවක් නොතිබුන තත්වයක මේවා ආරම්භ වීමට හේතුව මම විය නොහැක. බුදු දහමේ සඳහන් වෙනවා සිත විසින් නිර්මාණය කරගත් තත්වයක් ගැන. නමුත් සිත පවා ආරම්භ වීමට හේතුවක් තිබිය යුතුයි. එනිසා සිතටත් එහා තත්වය ගැන නොසිතා මේවාට පිලිතුරක් සොයා ගත නොහැක.

විද්‍යාගාරවලම පිහිට පතන අයට නම් ඒ හරහා මෙය කිසිසේත්ම සොයා ගත නොහැක. විද්‍යාව පදනම් වන්නේ පරීක්ෂන නිරීක්ෂණ සහ නිගමන මතය. විශ්වයන්ට එහා ගිය යමක් විද්‍යාව හරහා කිසිසේත්ම සෙවිය නොහැක. එනිසා විද්‍යාව මතම සිටියොත් නම් මේ ගැන නොදැනගෙනම මෙලොවින් සමුගන්නයි වෙන්නෙ. නමුත් එහෙම කිසිවක් නොදැන මේ ලෝකෙන් සමු ගන්නෙ නැතිව මෙය යම් මට්ටමකින් හරි වටහා ගන්න උත්සහ ගමු.

**මම පොඩි ක්‍රියාකාරකමක් ගෙන එය පහදන්න උත්සහ ගන්නම්.**

**බාබර් කෙනෙක් දැලි පිහියකින් වෙන කෙනෙකුගෙ රැවුල කපන කටයුත්ත ගැන ටිකක් හාරවුස්සල බලමු.**

- බාබර් ජීවත් වෙන ලෝකය බාබර්ගෙද? නැත, එය එයාගෙ දෙයක් නෙවෙයි, ලෝකය එයාගෙ නිර්මාණයක් නෙවෙයි. බාබර් ඉපදෙන්න පෙරම ලෝකය තිබුනා.
- සැලුන් එක තියෙන පොළොවත් බාබර්ගේ නෙවෙයි.
- බාබර් භාවිතා කරන සියළුම ද්‍රව්‍ය වල මුලික අංශුත් බාබර්ගේ නෙවෙයි.
- බාබර්ගේ අත (ඇතුළුව භාහිර ශරීරය)ද බාබර්ගෙම ස්ව නිර්මාණයක් නොවෙයි. (මෙය ඉහත පෙන්වා දුන්නා).
- බාබර්ගේ අත සහ භාහිර ශරීරයම මේ ක්‍රියාවට භාවිතා කරන යාන්ත්‍රනයත්, එයට අදාළ වන ප්‍රෝටීන, විටමින් වැනි ශක්තීන්ද ඔහුගේම නිර්මාණ නෙවෙයි.
- බාබර් මේ සඳහා භාවිතා කරන කාලයත් බාබර්ගෙ නෙවෙයි.
- රැවුල කපා ගන්න ආ පුද්ගලයත් බාබර්ගේ නෙවෙයි.
- ඒ අනුව පැහැදිළිවම මෙතන බාබර්ට අයි කිසිම දෙයක් නෑ.
- බාබර් විසින් "මම තමයි බාබර්, මේ මගේ සැලුන් එක, මට රැවුල කපන්න පුලුවන්". කියල කිව්වට මෙතන බාබර්ට අයිති දෙකුත් නෑ. එයාට කරන්න පුලුවන් දේකුත් නෑ. කොටින්ම බාබර්ට තනිවම තමන්ගෙ අතක් සොලවගන්නවත් බැහැ. (මම එය පැහැදිළි කරන්නම්).
- ශරීරය ඇතුළුව මේතන තියෙන සියල්ල අයිති බාබර් නොවන වෙනත් කෙනෙකුටය.
- දැන් බාබර්ගෙ ආත්මය, සිත, ආදී ලෙස අප ඉහත කතා කල දේවල් අරන් බලමු. බාබර් සතුව ඇති ආත්මයත් (අරාබි භාශාවට අනුව-රූහ්), සිත ක්‍රියාත්මක වන ව්‍යුහය (නෆ්ස්) ආදියත් බාබර්ගේ නිර්මාණ නොවෙයි. (සිතුවිල්ලක් ක්‍රියාත්මක වීමට යම් ව්‍යුහයක් අවශ්‍යයි. එම ව්‍යුහය (අරාබි භාශාවට අනුව -නෆ්ස්) බාබර්ගෙ නිර්මාණයක් නොවෙයි යන්නයි මෙහි අදහස). නමුත් බාබර්ලා එක එක විලාසිතා අනුව රැවුල් කපනවා අපි දැකල තියෙනවා. කොහොමද එය සිදුවන්නෙ?

  - එහෙනම් මේ බාබර් කියන්නෙ කව්ද?
  - මෙයා මේ ලෝකෙට ආවෙ කොහේ ඉදලද?
  - මෙයාට ශරීරයක් ලැබුනෙ කොහොමද?

- එයට ආත්මයක්, සිතක්, විඥාණයක්, හෘද සාක්ෂියක් ආදිය ලැබුනෙ කොහොමද?
- ඒවා භාවිතා කරල මෙයා කොහොමද මේ වැඩේ කරන්නෙ?
- මෙම ක්‍රියාදාමය කාගෙ සැලසුමක්ද? මෙය මෙහෙයවන්නෙ කවුද?
- කුමණ හේතුවක් නිසා මෙයා මෙහෙම දෙයක් කරමින් ඉන්නවද?
- ඉන් පසු ඔහු මැරුණම කොහෙටද යන්නෙ?
- මෙහි අවසානනය කුමක්ද?

බාබර් මේවා මොකුත් හිතන්නෙ නැතිව නිකම්ම ජීවත් වෙලා ඉඳලා මැරිලා යන එක අනුමත කරන්න පුලුවන්ද? ඔබටත් මටත් තත්ත්වය එසේමය.

දැන් අපි මේ ගැන ටිකක් බලමු.

බාබර්ට අයිති නැති මම ඉහත කී සියල්ල කෙසේ හෝ බාබර්ට ලැබිල තියෙනවා. ඉස්ලාම් දහමට අනුව මෙවා සර්වබලධාරී දෙවියන්ගේ නිර්මාණ ලෙස හඳුන්වයි.

දෙවියන් මිනිසාව නිර්මාණය කිරීම ගැන වැඩි විස්තර සඳහා මෙහි ඇති පහත සඳහන් ලිපි කියවා බලන්න.

- පළමු මිනිසා (ආදම්)ව නිර්මාණය කිරීම
- දෙවියන් අපව නිර්මාණය කලේ ඇයි?

මේ බාබර් ඔහුට ලැබුණු අභ්‍යන්තර හා භාහිර ශරීර භාවිතා කරමින් රැවුල කපන කටයුත්ත කරනවා.

**දැන් තමයි අපිට "නියම බාබර් ව හඳුන ගන්න" පුලුවන්.**

බාබර්ට ලැබුණු ආත්මය තුල ඇති 'සිත නම් ව්‍යුහය (නෆ්ස් තුලින්)' බාබර්ට යම් කිසි "නිදහස් සිතුවිල්ලක් ගැනීමේ අවස්තාවක්" ඇති බව බාබර්ට වැටහෙනවා.

බාබර්ගේ භාහිර ශරීරය වෙත ලැබුණු ආත්මය (රූහ්) තුල ඇති නෆ්ස් තුලින් තමන්ට නිදහස් සිතුවිලි ගැනීමේ අවස්ථාවක් හිමිවෙනවා. මිනිසාගේ සිතුවිලි ක්‍රියාත්මක වන්නේ මෙම නෆ්ස් තුලය.

මෙම රූහ් සහ නෆ්ස් පවා දෙවියන් විසින් නිර්මාණය කර මිනිසාට තම සිතුවිලි ගැනීමට අවශ්‍ය වටපිටාව සකසා දී ඇත. නෆ්ස් තුල මිනිසා ආකාර තුනකින් නිදහස් සිතුවිලි ගනී. එ අනුව නෆ්ස් කොටස් තුනකි

1. පාපයට බර සිතුවිලි ගැනීම
2. එය පාපයක් ලෙස වටහාගෙන ඒ ගැන පසුතැවෙන හා නිවැරදි වීමට උත්සහ ගන්න සිතුවිලි ගැනීම
3. හොඳ සිතුවිලි පමනක් ගැනීම

රූහ් සහ නෆ්ස් පිලිබදව පැහැදිළි කිරීමක් පහත සඳහන් ලිපියෙහි ඇත.

ආත්මය, සිත, විඥානය, ශරීරය, හෘද සාක්ෂිය -රූහ් සහ නෆ්ස්

**මෙන්න මේ "නිදහස් සිතුවිල්ලක් ගැනීමේ අවස්තාව" පමනයි බාබර්ටම අයිති. ඔහුට නෆ්ස් ක්‍රියාකරන ඉහත ආකාර තුනෙන් කැමති සිතුවිල්ලක් ගත හැක.**

භාහිර සහ අභ්‍යන්තර ශරීර යන දෙකම හරියට කෙනෙක්ට ඔප්පුවක් හරහා ඉඩමක් අයිතිකර දුන්නා වගෙයි. එලෙස එය ඔහුට අයිති උනාට ඔහු එම ඉඩමේ නිර්මාතෘ වෙන්නෙත් නෑ. නමුත් ඔහු ඒ ඉඩම සම්බන්දයෙන් වගකීම් දරන්නා වෙනවා. නිර්මාතෘ තමාට අයිති කර දුන් නිදහස් සිතුවිලි ගැනීමේ අවස්තාවට හිමිකම් කියන්නෙත් අර ඉඩමට හිමිකම් කියනවා වගේ තමයි. එයයි ඔහුට අයිති. වෙන කිසිවක් ඔහුගේ නොවේය. (මෙයට අනුව තමාට පවරා දුන් නිදහස් සිතුවිලි ගැනීමේ සීමිත අවස්ථාව හැර වෙන කිසිවක් බාබර්ගෙ නෙවෙයි). බාබර් ලෙස පුද්ගලිකව හදුන්වා දෙන්න වෙන්නේ මෙම "නිදහස් සිතුවිල්ලක් ගැනීමේ අවස්ථාව හා එය කිරීමට තමන් අදහස් කිරීම" නම් අපට නොපෙනෙන මේ තත්වයටයි. ඔහු වගකියන්නේ එයටයි.

ඔහුගේ වන්නෙ එය පමණයි. (එනම් 'මම' කියන්නෙ ඔය අවස්ථාවටයි).

ඔහුව අපිට බාබර් කෙනෙක් ලෙස පෙනුනට, ඔහුට ඔහු බාබර් කෙනෙක් ලෙස හිතුනට ඇත්තටම නම් ඔහු ඔහුගේ සිතුවිලි වලින් තම නිර්මාතෘගේ මහත් පරීක්ශනයකට ලක් වෙමින් ඉන්න අවස්ථාවක් පමණයි මෙය.

දැන් ඔහු ඒ නිදහස් සිතුවිලි ගැනීමේ අවස්තාව ප්‍රයෝජනයට ගනිමින් අනිකුත් සියල්ල (උපකාර ලෙස), ඒවායේ නිර්මාතෘගෙන් ලබාගෙන තමා අදහස් කරන රැවුල කැපීමට ඉදිරිපත් වෙනවා. ඔහුට ඔහුගේම භාහිර ශරීරයේ ඇති අත සොලවන්න වත් බැරි අසරණයෙක් බව ඔහුට වැටහෙනවා, මොකද, ඒ අත පවා ඔහුගේ නොවෙයි. ඔහු ඒ සඳහා එහි නිර්මාතෘගෙන් උදව් අරගෙනයි අත සොලවන්නෙ. මෙය අපට පිටතින් නොපෙනුනාට, පිටතින් නොහැඟුනාට ඇත්තටම සිදුවන්නේ එයයි.

දැන් ඔහු අදහස් කරන ආකාරයට (භාහිර ශරීරයේ නිර්මාතෘගේ උදව්වෙන්) දැලිපිහිය එහෙට මෙහෙට යවන්න තමගේ සිත ක්‍රියාත්මක කරනවා. ඔහුට පුලුවන් දැලිපිහිය අහවල් ස්ථානයට ගෙනියනවා කියන අදහස ගැනීම පමණයි. එය ක්‍රියත්මක කිරීමට (ඔහුගේ නොවන) භාහිර ශරීරයෙන් උදව් අවශ්‍ය වෙනවා. මේ උදව් දෙන්නෙ භාහිර ශරීරයේ අයිතිකරුයි. ඔහුට පුලුවන් 'ඔහුගේ වන එකම දෙය වන නිදහස් සිතුවිලි ගැනීමේ අවස්තාව' උපයෝගී කරගෙන රැවුල කපනවාද බෙල්ල කපනවාද කියා තීරණය කරන්න. එම තීරණය පමනයි ඔහුට අයිති වෙන්නෙ. (බොහෝ මුස්ලිම්වරු ඕනෑම වැඩක් ආරම්භ කිරීමෙදී බිස්මිල්ලාහ් හෙවත් දෙවියන්ගේ නාමයෙන් ආරම්භ කරමි කියා පටන් ගන්නේ මේ නිසයි). ඔහුගේ සෑම ක්‍රියාවකටම තම නිර්මාතෘගේ උදව් අවශ්‍යයයි. ඔහු රැවුල කපන අදහස ගෙන එය ඉතාමත් අවන්කව තම නිර්මාතෘ පවා සතුටු වන ලෙස කලා නම් ඔහු එයට නිර්මාතෘගෙන් පින් ලබා ගන්නවා. ඔහුට එම නිර්මාතෘ දෙනු ලබන කුසල් මෙලොවදී පෙනෙන්නෙ නෑ. ඔහුට පෙනෙන්නෙ තමන් කරන වැඩෙයි අර පාරිභෝගිකයා දෙන මුදල පමනයි. නමුත් නිර්මාතෘ ඔහුව මෙලොවට එව්වේ මුදල් හම්බ කරන්න නොවෙයි. ඒ එක් එක් මාර්ග වලින් තම නිර්මාතෘගෙන් කොපමන කුසල් ලබා ගන්නවාද බලන්නයි. එය ඔහු වටහා ගෙන හිටියොත් ඔහු ඉතාමත් හොඳ දේ පමනක් කරාවි. එය හරියට වටහා නොගෙන හිටියොත් නරක දේවලුත් කරයි.

ඔහු රැවුල වෙනුවට වෙනත් කාරනාවක් නිසා ඔහුගේ පාරිභෝගිකයාව මරන චේතනාවෙන් ඔහුගේ බෙල්ල කපුවා නම් බෙල්ල කැපුවේ නිර්මාතෘ නොව, ඔහුයි. ඔහු එයට උදව් පවා ගත්තේ නිර්මාතෘගෙනුයි. නිර්මාතෘ එයට උදව් කලේ

එහි පසුබිම ගැන ඔහු සියල්ල් දන්නා නිසයි. (මෙය වෙනම කතා කලයුතු දෙයක්). නමුත් නිර්මාතෘ හමුවෙ බෙල්ල කැපූ "පව" උරුම වන්නෙ ඔහුටයි. (ඔහු එයට අවසන් විනිශ්චය දිනදී හේතු ඉදිරිපත් කල යුතුයි). තමන්ගේම නිර්මාතෘගෙන් උදව් අරන් නිර්මාතෘගේ තවත් නිර්මානයක් ඔහුගේ චේතනාව මත විනාශ කලා. මෙය බරපතල වරදකි. නිකරුනේ ගහක කොලයක්වත් කඩා විනාශ නොකල යුත්තේ මේ නිසයි. එනම්, තමන්ගේ නිර්මාතෘගෙන් උදව් අරගෙන නිර්මාතෘගේ තවත් නිර්මානයක් වන ගහේ කොලය නිරපරාදෙ කඩා දැමීමට තමා හේතු වෙනවා. මෙය නිර්මාතෘගේ අමනාපයට හේතුවකි. එනිසා ඔහුට ඒ සම්බන්දයෙන් අකුසල් ලබා දෙනවා.

ඕනම සිතුවිල්ලක් ක්‍රියාත්මක කරන්න නම්. භාහිර වටපිටාවත්, භාහිර ශරීරයත් ආත්මය හා සිත නම් අභන්තර ශරීරයත් තමාට ලබා දුන් අයිතකරුගෙන් උදව් ලබා ගන්න වෙනවා.

ඔහුගේ අවසන් තීරනය මත ඔහු බෙල්ල කපන්න තීරනය කලා නම් එයට ඔහුගෙ නිර්මාතෘ (කැමැත්තෙන් හෝ අකමැත්තෙන්) ඍජුව හෝ වක්‍රව උදව් කර, ඔහු කල ක්‍රියාව පිනක් හෝ පවක් ලෙස ඔහුට භාර කරනවා. (මිනිසුන් හිතන හැම දේම ක්‍රියාත්මක කරන්න බැරි ඔහුට තම නිර්මාතෘගෙන් ඒ සඳහා උදව් නොලබිමයි).

පහත සඳහන් කුරාන් වැකි දෙක දෙස බලන්න. ඔබට කිරි බීමට සිතක් පහළ උනත් කිරි සහිත වීදුරුව ඔසවා බීමට නම් ඔබට ඔබේ නිර්මාතෘගෙන් සහය ලැබිය යුතුය. එසේ නොවුන හොත් ඔබට එය බීමට නොහැක.

කුරුල්ලන්ටද එසේමය. ඔවුන්ට පියාඹෑමට සියලු පහසුකම් සපයනුයේ දෙවියන් විසින්මය.

දෙවියන් පුදුමාකාර ලෙස මේ සියල්ල හසුරුවමින් සිටී.

*(එළු, ගව, ඔටුවන් වැනි) සතුන්ගෙන්ද ඔබට පාඩමක් ඇත. ලේ වලටද, ගොම වලටද අතරේ උන්ගේ කුසෙන් කළවම් නොවුන කිරි (උත්පාදනය කර) අපි ඔබට පොවන්නෙමු. එය පානය කිරීමට ඉතා රසවත්ය. (16:66)*

*අහස් ගැබෙහි (දෙවියන්ගේ නියෝගයන්ට) අනුව යටත් වී පියාඹන පක්ශීන්ව ඔවුන් දුටුවේ නැද්ද? ඒවා (අහස් හී) උසුළාගෙන සිටින්නා අල්ලාහ් හැර වෙන කිසිවෙකුත් නැත. විශ්වාසය තැබූ ජනතාවට මෙහිද විවිධ සාධකයන් ඇත්තේය. (16:79)*

මිනිසා තම සිතින් අදහස් කරන සියල්ල මිනිසාට ඉටු කර ගැනීමට නොහැක. එයට හේතුව නම්, දෙවියන්ගේ නිර්මාණ සියල්ලට දෙවියන් තමන්ගේ සැලසුම කල්තියාම නියම කර තිබෙන නිසා මිනිසාට එම මූළික සැලසුම අභිභවා යා නොහැක.

**තම නිර්මාතෘ (හෙවත් දෙවියන්), යමක් කිරීමට යන පුද්ගලයාට ආකාර හතරකින් ප්‍රතිචාර දක්වනවා.**

1. ඔහු (දෙවියන්) කැමති දෙයක් කිරීමට මිනිසා අදහස් කලා නම් එය වෙන්න ඉඩ දෙනවා. සරල උදාහරණයකින් කියනවා නම්, දුප්පතෙකුට ආහාර වේලක් දෙන්න මිනිසා අදහස් කලා නම්, එම මිනිසාගෙ නිර්මාතෘ එයට කැමතියි. ඔහු එයට උදව් කරනවා. එය වෙන්න ඉඩ දෙනවා. පසුව එම සිතුවිල්ල ගැනීම, නිර්මාතෘගේන් උදව් ගැනීම හා එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කුසල් ලබා දෙනවා.
2. දෙවියන් කැමති දෙයක් කිරීමට මිනිසා අදහස් කලත් දෙවියන් එය වෙන්න ඉඩ දෙන්නෙත් නෑ. දුප්පතෙකුට ආහාර වේලක් දෙන්න මිනිසා අදහස් කලා නම්, එම මිනිසාගෙ නිර්මාතෘ එයට කැමතියි. ඒත් ඔහු එයට උදව් කරන්නෙ නෑ, එය වෙන්න ඉඩ ඉඩ දෙන්නෙ නෑ. සමහර අයට යහපත් දේවල් කරන්න හිතුනට එවැනි දේ කරගන්න බැරි වන අවස්ථා අපි දකිනවා.පසුව එම සිතුවිල්ල ගැනීම, නිර්මාතෘගේන් උදව් ගැනීමට උත්සහ කිරීම, හා එය ක්‍රියාත්මක කිරීමට උත්සහ කිරීම මත ඔහුට කුසල් ලබා දෙනවා.
3. දෙවියන් අකැමති දෙයක් කිරීමට මිනිසා අදහස් කලා නම් එහෙත් එය වෙන්න ඉඩ දෙනවා.

(උදා:- කිසියම් කෙනෙක් අදහස් කලා නම් තම නිර්මාතෘට (දෙවියන්ට) බනින්නට, දෙවියන් එයට අකැමතියි. නමුත් ඔහු එයට ඉඩ දෙනවා. උදව් කරනවා. පසුව ඔහුට අකුසල් ලබා දෙනවා. මිනිසා දෙවියන්ට බැන්නට දෙවියන්ට කිසිම හානියක් වෙන්නෙ නෑ, නමුත් එයින් මිනිසා මිනිසාටම හානි කරගන්නවා. ඇත්තටම දෙවියන්ට බනින අය කරන්නෙ දෙවියන්ගෙන්ම භාහිර හා අභයන්තර ශරීර ලබාගෙන දෙවියන්ම තමන්ට දුන් සීමිත නිදහසෙන් ප්‍රයෝජන ගෙන දෙවියන්ගේම උදව් අරන් දිව සොලවමින් දෙවියන්ටම බනින එකයි. දෙවියන්මයි ඔබට මේ වෙනුවෙන් අකුසල් ලබා දෙන්නෙ. මේවා නොදන්න අය දෙවියන්ට බනිනවා. අවසන් විනිශ්චය දිනදී ඒ අකුසල් වලට දඬුවම් ලබන්න සිදු වෙනවා.

4. දෙවියන් අකමැති දෙයක් කිරීමට මිනිසා අදහස් කලා නම් එය වෙන්න ඉඩ දෙන්නෙ නෑ. (සරල උදාහරනයකින් කියනවා නම්, ලෝක බලවත් රාජ්‍ය නායකයෙක් තම යුධ අවි භාවිතා කර ලෝකයම විනාශ කරන්න අදහස් කරනවා යැයි සිතමු. දෙවියන්ගේ සැලැස්මට කලින් ලෝකය විනාශ වීමට දෙවියන් ඉඩ දෙන්නේ නෑ. එනිසා එවැනි දේ සිදුවීම දෙවියන් විසින් වලක්වනු ලබනවා.

මෙසේ මිනිසා තම භාහිර ශරීරය අතහැර මෙලොවින් පිටත් වෙනකම්ම ඔහුගේ නිදහස් සිතුවිලි ක්‍රියාත්මක කිරීමට ඔහ්ට සීමිත අවස්ථා ලබා දෙමින් සහ ඒ සඳහා උදව් දෙමින්, ඒවා සිදු කළ පසු ඒ වෙනුවෙන් ඔහු මත කුසල් හෝ අකුසල් ගොඩ ගසා අවසානයේ මොලෙව හැර ගිය පසු ඒවා ඔහුට ප්‍රතිවිපාක ගෙන දෙන දේ බවට පත් වෙනවා. මෙයයි අපේ ගමන...

"මම කියන්නෙ කව්ද? " යන්න නැවත කෙටි සටහනකින්.

"මම කියල කියන්නෙ නිර්මාණ කරුවෙකු (ඉස්ලාම් දහමට අනුව Allah) විසින් ඔහු අදහස් කල ආකාරයට හා ස්වරූපයකට කල එක් නිර්මාණයක්ය.

එය අපට නොපෙනෙන චින්තන ස්වභාවයක් වැනිය. අප සතු වන්නේ ඒ චින්තන ස්වභාවයෙන් ස්වයංතීරණ ගැනීමේ එක් සීමිත අවස්ථාවක් පමනි. (මම වන්නෙ එයයි).

එය සහිත ආත්මය (ඉස්ලාම් දහමට අනුව) දෙවියන් නිර්මාණය කල ස්ථානයේ සිට දේව දූතයන් විසින් රැගෙන විත් එය යම් ක්‍රමයක් හරහා (එනම් කළලයක් ලෙස) පටන් ගෙන භාහිර ශරීරයක් හා භාහිර වටපිටාවක්, එනම් ජීවත් වෙන්න පරිසරයක් ලබා දුන් පසු ඒ මත ක්‍රියාත්මක වී කුසල් හෝ අකුසල් රැස්කර ගෙන වෙනත් අවස්ථාවක් දක්වා යන ගමනක යෙදෙන කෙනෙකි.

ගමන කොහෙන් පටන් ගෙන කොහෙන් අවසන් වෙනවාද නම්, නිර්මාතෘ වෙතින් ආ අපි (දැන් ගමනක් යෙදී ඉන්න අතර නැවත අපි) නිර්මාතෘ වෙතම යන ගමනයි මේ සිදුවන්නෙ. "ඔබ ගමනක් යන්න බසයට ගොඩ උනා නම් ඒ බසය, පාර අදිය ඔබේ නොවෙයි වගේ මේ ගමනෙදිත් ඔබේ නොවන දේ බොහෝය. ඔබේ නොවන දෙය වටහා දීමයි මෙම ලිපියෙහි අරමුණ.

මිනිසා ගේ හොඳ සහ නරක පමනක් ඔහු සමග ගමන් කර අවසානයේ තමන් මෙලොවදී උපයා ගත් දෙය මතම තමාගේ ඉදිරි සදාකල් ජීවිතය ගොඩ නැගෙයි.

එහිදීත් තමාට නැවත භාහිර ශරීරයක් ලබා දී මේ දෙක එක්ව සදාකල් ඉදීමට බාහිර පරිසරයක් හා අවස්ථාවක් ලැබෙනවා. අපි කැමති උනත් නැතත් මෙයයි අපේ ඉරණම. වැඩි විස්තර සඳහා දෙවියන් අපව නිර්මාණය කලේ ඇයි යන ලිපිය කියවන්න.

තමාවත්, තමා සිටින වටපිටාවත් නිර්මාණය කල ආකාරයත් නිර්මාණය කල අරමුණත්, එම අරමුණ සාක්ශාත් කරගැනීමට තමා කෙසේ හැසිරිය යුතුද යන්නත් ගැන නිර්මාතෘ පනිවිඩ එවා ඇත. එයයි ඉස්ලාමීය පණිවිඩය. එය භාවිතා කිරීම හෝ නොකිරීමත් තමාගේ නිදහස් සිතුවිලි භාවිතා කිරීමේ අවස්ථාවට යටත් දෙයකි.

---

## මිනිසා විශ්වාස කළ යුතු කරුණු හයක්!

පහත දැක්වෙන්නේ මුස්ලිම්වරුන් විශ්වාස කරන කාරණා හයකි. නමුත් එය මුස්ලිම්වරුන්ට සීමාවූවක් නොව, මුලු මහත් මනුෂ්‍ය සංහතිය තුලම තිබිය යුතු

ගුණාංගයක් විය යුතුයි. එයට හේතුව නම් මෙම කරුණු හය කෙරෙහි විශ්වාසය තබා කටයුතු කළ යුතු බව අපට දන්වා තිබෙන්නේ මිනිසුන් සියල්ලගේම නිර්මාතෘ වන දෙවියන් විසිනි.

1. දෙවියන්ගේ ඒකීයභාවය පිළිබඳ විශ්වාසය
2. දෙවියන්ගේ දූතයන් කෙරෙහි විශ්වාසය
3. දෙවියන්ගේ පොත් කෙරෙහි විශ්වාසය
4. අනාගතවක්තෘවරුන් (දෙවියන්ගේ දූතයන්) කෙරෙහි විශ්වාසය
5. විනිශ්චය දවස විශ්වාස කිරීම
6. දිව්‍ය ආඥාව කෙරෙහි විශ්වාසය (Qadr & Qadr)

**1). දෙවියන්ගේ ඒකීයභාවය පිළිබඳ විශ්වාසය:**

දෙවියන් වහන්සේ සදාකල් පවතින සර්වබලධාරියෙකි. ඔහුට සුවිශේෂී ගුණාංග රාශියක් ඇති අතර ඔහුට සමාන කිසිවෙකුත් නැත. මිනිසුන් ඇතුළු සියල්ලෙහිම නිර්මාතෘ ඔහුය.

**2). දෙවියන්ගේ දූතයන් කෙරෙහි විශ්වාසය:**

දෙවියන් වහන්සේට නමස්කාර කරන සහ විශ්වය පුරා දෙවියන්ගේ නියෝග ක්‍රියාත්මක කරන අදෘශ්‍යමාන ජීවීන් ක්ණඩායමක් දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කර ඇත. ඔවුන්ව මලායිකාවරුන් ලෙස හඳුන්වයි.

**3). දෙවියන්ගේ පොත් කෙරෙහි විශ්වාසය:**

දෙවියන් වහන්සේ මනුෂ්‍යයන් නිර්මාණය කර ඔවුන්ට ජීවත් වීමට පෘතුවිය තුප පහසුකම් සලසා ජීවත් විය යුත්තේ කෙසේද යන්න දිව්‍යය හෙළිදරව් මගින් දන්වා තිබේ. ඒවා මිනිසුන් අතරින් ටිගෝරාගත් නබි වරුන්ට විවිධ අවස්ථාවල පහළ කර තිබේ. ඉන් කිහිපයක් මෙසේය. අල් කුර්ආනය (මුහම්මද් තුමාට දෙන ලඩ්ග්හී), තව්රාත් (මෝසෙස්ට දෙන ලදී), ශුභාරංචිය (ජේසුස් වහන්සේට දෙන ලදී), ගීතාවලිය (දාවිත්ට දෙන ලදී) සහ ලියවිලි (ආබ්‍රහම්ට දෙන ලදි) මෙම දිව්‍ය වදන් හෙවත් ධර්ම පුස්තක වලින් අවසානයල පහල කළ කුරානය පහළ වූ ආකාරයටම ආරක්ෂා වී ඇත.

**4). අනාගතවක්තෘවරුන් (දෙවියන්ගේ දූතයන්) කෙරෙහි විශ්වාසය:**

පළමු අනාගතවක්තෘවරයා ලෙස සැලකෙන (පළමු මිනිසා වන) ආදම්ගෙන් ආරම්භ වී ඉතිහාසය පුරාවටම, අනාගතවක්තෘවරුන් හරහා දෙවියන් වහන්සේගේ මඟ පෙන්වීම මානව වර්ගයාට හෙළිදරව් කර ඇත. නූහු, ඉබ්රාහීම්, මූසා, ඊසා (හෙවත් ජේසුස්) ඇතුළු මෙම අනාගතවක්තෘවරුන් 25 දෙනෙකු ගැන කුරානය තුල නම්වලින් සඳහන් කර ඇත. මුහම්මද් තුමා මෙම අනාගතවක්තෘවරුන් අතරින් අවසාන වක්තෘවරයාය.)

**5). විනිශ්චය දවස විශ්වාස කිරීම:**

දෙවියන් අපට දැනුම් දී ඇති ආකාරයට සියළුම මිනිසුන් මරණින් පසු නැවත පණ ලබා දී එක්තරා දිනකදී එක් ස්ථානයකට කැඳවා ඔවුන් මෙලොව තුල ජීවත්ව සිටි කාළය තුල කළ හොඳ නරක ගණනයකට ලක් කර දෙවියන් විසින් විනිශ්චයක් කරන බවය. එයට පසු අපේ ඉරණමේ ඉදිරිය තීන්දු වන බව විශ්වාස කළ යුතුව ඇත.

**6). දිව්‍ය ආඥාව කෙරෙහි විශ්වාසය:**

සෑම දෙයක්ම දිව්‍යමය නියෝගයෙන් පාලනය වන බවට විශ්වාසය. එනම් කෙනෙකුගේ ජීවිතයේ සිදුවන ඕනෑම දෙයක් දෙවියන් විසින් එය කලින්ම දැන ගෙන එය එසේ වීමට ඉඩ සලසා දෙමින් එය කලින්ම නියම කර ඇති බවත්, ඇදහිලිවන්තයන් තමන්ට සිදුවන හොඳ හෝ නරකට ස්තුතිවන්ත භාවයෙන් හෝ ඉවසීමෙන් ප්‍රතිචාර දැක්විය යුතු බවය. මෙය "නිදහස් කැමැත්ත" යන සංකල්පය ප්‍රතික්ෂේප නොකරයි. මිනිසුන්ට දෙවියන්ගේ ආඥාව ගැන කලින් දැනුමක් නැති නිසා, ඔවුන්ට තේරීමේ නිදහස තිබෙනවා.

පහත සඳහන් ලිපි හරහා ඉහත මාතෘකා පිළිබඳව වැඩිදුර අධ්‍යනය කල හැක.

- ඒකදේවත්වය - Thawheed / ඒකදේව ඇදහීම යනු කුමක්ද? (P 60)
- දෙවියන්ගේ නිර්මාණ: මලායිකාවරුන් (සුරදූතයන්) (P 457)
- කුරානය සම්බන්ධව (P 122)
- නබිවරුන්ගේ පෙළපත (P 493)

- විනිශ්චය දිනය ගැන සඳහන් කුරාන් වැකි එකතුවක්. (Page 416)
- සියල්ල සිදුවන්නේ අල්ලාහ්ගේ දැනුම සහ අනුමැතිය මතයි! (P 113)

---

# කුසල් යාන්ත්‍රණය ගැන දැනගැනීම සහ පහසුවෙන් කුසල් රැස් කිරීම

ඔබේ බැංකු ගිණුමෙහි කොතරම් මුදල් තිබුනත්, ඔබ කොතරම් විශාල නිවසක ජීවත් උනත්, ඔබ සමාජය තුල කොතරම් ජනප්‍රිය උනත් ඒ කිසිවක් ඔබ මියගිය පසු ඔබ සමග පැමිණෙන්නේ නැත. ඔබ සමග පැමිණ ඔබේ ඉරණම සඳහා ඔබට සහය වන්නේ ඔබ රැස් කළ කුසල් හෝ අකුසල්ය.

ඔබ ජීවත්ව සිටින කාළය තුල ඔබේ කැපවීමෙන් පොදු ස්ථානයක හෝ දුප්පතෙකුගේ ළිඳක බාල්දිය එල්ලන ලණුවක් සවිකර දුන්නා නම් ඔබ මිය ගියත් එම ලණුව පවතින තාක් කල් පවා ඔබට ඉන් කුසල් එකතුවන බව ඔබ දනී. සමහර විට ඒ ලණුවෙ ආධාරයෙන් වතුර රැගෙන ජලය පානය කල අය යහපත් වැඩදායි පුද්ගලයන් ලෙස ඔවුන් සමාජයට සේවය කළා නම් එතෙක් ඔබ සවිකළ ලණුව නැතත් තව දුරටත් ඔබට කුසල් පැමිනෙමින්ම තිබීමට ඉඩ ඇත. කුසල් කියන්නේ මේ ජාතියේ පුදුමාකාර දෙයක්. ඔබ කළ යහකම්හී කුසල් ඔබ අනිවාර්යයෙන්ම දවසක ඔබ ඉදිරියේ සිටී. ඒ අවස්ථාවේ එය කන්දක් තරම් විශාලව වර්ධනය වී තියෙන්නටද ඉඩ ඇත.

කුසල් රැස් කිරීමට ආර්ථිකය ශක්තිමත් වෙන්නම ඕනි නෑ. වත්කමේ හැටියට පින්කම් කළ හැකියි. කිසිම වියදමක් නොකරම උනත්  අනන්තවත් කුසල් රැස්කරගත හැකි.

කුසල් රැස් කරන්න පටන් ගන්න කලින් ඒවායේ පසුබිම ගැන සොයා බැලීම ඉතාම වටිනනව. නැත්නම් අපි කරන කුසල් "ගඟට කැපූ ඉනි" මෙන් විය හැක. "ගඟට කැපූ ඉනි මෙන්" කියන්නෙ අපි මහන්සි වෙලා කරපු යම් ක්‍රියාවක සියළුම ප්‍රතිඵල සම්පූර්ණයෙන්ම අපතේ යවා ගැනීමකටය. (මහන්සියෙන් කැපූ

ඉනි ගඟේ ගසාගෙන ගියා මෙන්). එනිසා අප කරන කුසල් වල පසුබිම සහ යාන්ත්‍රණය දැනගැනීම ඉතාමත් වැදගත්ය.

අපගේ යම් කිසි සිතුවිල්ලක හෝ ක්‍රියාවක කුසල් හෝ අකුසල් තත්වය දකින්නේ කව්ද? එය අපෙන් ග්‍රහණය කරගන්නේ කව්ද? එය මිනුම්ගත කරන්නේ කව්ද? එය තැන්පත් කරන්නේ කොහෙද? ඉන් පසු එය නැවත අපට (ඵලවිපාකයක් ලෙස) ගෙන එන්නේ කව්ද? එම කාලය සහ ප්‍රමාණය තීරණය කරන්නේ කවුද? එවැන්නක් කිරීමට ඇති ක්‍රියාකාරී පසුබිම කුමක්ද? සහ එවැන්නක් කිරීමේ ඇති අවශ්‍යතාවය කුමක්ද?

ඉහත ආකාරයේ පසුබිමක් නැත්නම් අප සිතන හෝ කරන දේවල් කුසල් හෝ අකුසල් ලෙස බලපවත්වන්න විදිහක් නැත. මෙය ඉබේ සිදුවිය නොහැක. එම ක්‍රියාදාමය අප විසින් කරන දෙයකුත් නොවේ නම් වෙන කෙනෙකුගේ සම්බන්ධයක් එයට තිබිය යුතුය. පිං පව් ස්වර්ගය අපාය හෝ කර්මය ගැන අදහස් ඇති අපි සියළු දෙනාම මුලින්ම මේ කාරණාව ගැන දැනගෙන සිටිය යුතුය.

තම සිතීමේ නිදහස භාවිතා කරමින් මිනිසා තම ජීවිත කාලය තුල කුසල් හෝ අකුසල් රැස්කර ගන්නවාට අමතරව මිනිසා විසින් මේ ලෝකය තුල ස්ථිරසාර වෙන කිසිවක් කරන්නේ නැත.

කල් ඉකුත් වීම, දිරාපත් වීම, ලෝක විනාශය ආදිය අපට හුරු වචනය. අපි මේ ලෝකය තුල මොන සෙල්ලම දැම්මත් අන්තිමට අපට ඉතුරුවන්නේ තම අභ්‍යන්තර ශරීරය (ආත්මය) සහ ඒ වෙනුවෙන් තමා එකතු කර ගත් කුසල් අකුසල් පමණක් බව අපි විශ්වාස කරන්නෙමු.

එනම්, භෞතික වශයෙන් කිසිවක් නොමැතිව පැමිණි අප මරණින් පසු මෙලොවින් යන්නේද භෞතික වශයෙන් කිසිවක් නැතිවමය. නමුත් අපගේ ජීවත් වූ කාලයට අරමුණක් තිබිය යුතුය. එම අරමුණ නම්, එම කාලය තුල අප කොතරම් කුසල් - අකුසල් රැස්කර ගත්තාද යන්නය.

මිනිසා කරන හෝ සිතන දෙය මිනිසාට භාහිරින් ඇති "කණ්ඩායමක් මගින්" එය කුසල් හෝ අකුසල් ලෙස ග්‍රහණය කරගැනීමකි සිදුවන්නේ. මේ කණ්ඩායම ගැන ඔබ මොනවද දන්නෙ?

මේ විශ්වය තුල අපට නොපෙනෙන, අපට නොඇසෙන, අපට ළඟා වීමට නොහැකි බොහෝ දේවල් ඇත. කෙතරම් හිත දියුණු කලත් අපට නොපෙනෙන සමහර දේවල් අපේ බුද්ධියට ගෝචර නොවෙන්නත් පුළුවන්. එනිසා මෙවැනි දෑ කෙසේ සිදුවෙනවාද යන්න දැනගත හැකි පැහැදිලිම මාර්ගය වන්නේ එය සිදුකරන පාර්ශවයෙන්ම දැන ගැනීමෙනි. එහෙම නැතිව අප විසින් එක් එක හිතලු මත හිදිමින් තීරණය කරන්න ගියොත් අපි මුලාවේ වැටීමට ඉඩ ඇත.

කරුණු සොයා යාමේදී විශ්වයේ ආරම්භයේ සිටම, මිනිසාගේ ආරම්භය සහ ඒවා ඇතිවීමේ ක්‍රම වේදයන් මෙන්ම ඇතිවීමට බලපෑ හේතූන් හී මුල, මැද, අග ලෙස විස්තරාත්මක පැහැදිලි කිරීමක් ඉස්ලාම් දහම තුලින් දැකිය හැක. අවාසනාවකට සිංහල භාෂාව තම මූලික භාෂාව කරගත් බහුතරයකට මෙම තොරතුරු නිසි පරිදි ලැබී නැත. එම නිසා එම කාරණාවන් ඔවුන්ට අළුත් දේවල් ලෙසද හැඟෙන්නට ඉඩ ඇත.

ඉස්ලාම් දහමෙන් (පිළිගත හැකි ආකාරයට) පෙන්වා දෙන කුසල් අකුසල් යාන්ත්‍රණය සරළවම පවසනවා නම් එය සිදුවන්නේ මෙසේය.

සදාකල් පවතින සර්වබලධාරී දෙවියන්වහන්සේ විසින් ඔහුට සිතූ දෙය ඔහු විසින් නිර්මාණය කරමින් සිටී. එම නිර්මාණ වලට අවශ්‍යය සියලුම වටපිටාවන්ද ආවරණය කරමින් තම බලය පතුරුවමින් සිටී.

පැහැදිලි කාරණාවක්ම සඳහා ඔහු මිනිසාවත් නිර්මාණය කර ඇත. එහිදී මිනිසාට යම් සුවිශේෂත්වයක් දක්වමින් ඔහුව යම් කිසි පරීක්ෂන මට්ටමකට පත් කරද ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසා විසින් සිදුකරන සෑම ක්‍රියාවක්ම (සහ සිතුවිල්ලක්ම) එම පරීක්ෂනයේ අවස්ථාවන් බවට පත් කර ඇත. ඒ සියල්ල නිරීක්ෂනය කරමින්ද, සටහන් කරමින්ද, ඒවා සුරක්ෂිත කර තබා ගනිමින්ද, අවසානයේ විනිශ්චය දිනදී සියල්ල රැස්කර ඔවුනොවුන් කළ කී දේ සහ සිතූ දේවලට පවා ඵලවිපාක ලබා දෙනු ඇත.

මිනිසාව නිර්මාණය කළ කාරණාව දෙවියන් විසින් මිනිසා වෙත නබිවරුන් හරහා දැනුම් දී තිබේ. ඒ අතර හොඳ සහ නරක කුමක්ද යන්නත් පෙන්වා දී තිබේ. මිනිසා කරන කියන හැමදේම දෙවියන් දකින බවත් ඒවා මලායිකාවරුන් හරහා සටහන් කරන බවත් අවසානයේ විනිශ්චය දින දී කල කී දේ සියල්ලට ඵලවිපාක දෙන බවත් දැනුවත් කර තිබේ.

ඒ අනුව සියල්ල දකින අල්ලාහ්ම පළමු සාක්ෂි කරු වේ. මිනිසා සිතන දේ පවා තමා විසින් දැනගන්නා බව අල්ලාහ්ම අපට පවසා ඇත.

මලායිකාවරුන් විසින් තමන් සටහන් කරගත් මිනිසාගේ දෛනික හොඳ නරක කටයුතු සහිත ලේඛණය ඔවුන්ට නියම කර ඇති ස්ථානයේ ආරක්ෂිතව තබන බවද දහම තුලින් පෙන්වා දී තිබේ.

කුසල් අකුසල් යාන්ත්‍රණයේ තවත් වැදගත් කාරණාවකි අපගේ ශරීරයම අපට පක්ෂපාතීව හෝ අපට විරුද්ධව විනිශ්චය දිනදී දෙවියන් ඉදිරියේ සාක්ෂි දීම. අප කළ වැරදි ගැන එදින අපගේ අත් දෙවියන් ඉදිරියේ කතා කරාවි. අපේ කකුල්, අපේ ඇස් එදින කතා කරාවි. ඒ බව අල් කුරානයෙහිත් සඳහන්ව ඇත.

අප ජීවත්වන සොබාවික පරිසරය පවා අප සම්බන්ධව සාක්ෂිකරුවන් වනු ඇත. මේවා සියල්ල අල්ලාහ්ගේ නිර්මාණ වන අතර අල්ලාහ්ට කැමති ආකාරයකට ඒවා ක්‍රියාවට නැංවිය හැක. ඒ නිසා එම කරුණු කෙරෙහි අප සැක උපදවා ගත යුතු නැත.

ඒ අනුව බලන විට කුසල් අකුසල් වල සම්පූර්ණ කතාවම හරිම පැහැදිළියි.

කුසල් අකුසල් යාන්ත්‍රණය ගැන දැන් හොඳ වැටහීමක් ඇති නිසා එය සිහි කල්පනාවේ තබා ගනිමින් අකුසල් සිදුවීම අවම කර වැඩිවශයෙන් කුසල් රැස් කිරීමට කිරීමට යොමු විය හැක.

- හුකූක් අල්ලාහ්
- හුකූක් අල් ඉන්සාන්

1). අල්ලාහ් සම්බන්ද කාරණා. **හුකූක් අල්ලාහ්.** (මෙය තමා සහ අල්ලා අතර ඇති පුද්ගලික කාරණා වේ. ඔබ ඔබ සම්බන්දයෙන් සහ සොහාදහම සම්බන්දයෙන් ඔබ කරන කාරණාය. එනිසා විනිශ්චය දිනදී මේවායේ ගනුදෙනු තමන්ට අල්ලාහ් සමග පුද්ගලිකව බේරා ගත හැක. ඒවාට අරාබි භාශාවෙන් හුකූක් අල්ලාහ් ලෙස කියයි.

2). අනිත් කාරණා නම් **හුකූක් අල් ඉන්සාන්.** එනම් වෙනත් මිනිසුන් සම්බන්ධව තමන් කරන කාරනා. උදාහරනයකින් පවසනවා නම් යමෙකුට අසාධාරනයක් කලා නම්, එය ගැන අල්ලාහ් විනිශ්චය දීමට පෙර ඔබ සහ එම අසාධාරණයට ලක් වූ පුද්ගලයා අතර ගනුදෙනුව අවසන් වී තිබිය යුතුය. මෙය කලින් කාරණාවට වඩා බරපතලය. එනිසා තමන් අතින් යම් වරදක් උනා නම් තමන් සහ ඔහු මිය යාමට පෙරම හැකි විදිහකින් ඒ වරද වෙනුවෙන් යහපත් ලෙස පියවර ගෙන සිටීම වඩා හොඳය. සමාව ගැනීමක් හෝ වන්දියක් ගෙවීමක් ලෙස එය කළ හැක. එවිට එම කාරණාව අල්ලාහ් ඉදිරියේ විසඳන විට පහසු වේවි.

කිසිම වියදමක් නැතිව සහ වියදම් ඉතාම සුළුවෙන් කර හෝ කුසල් බොහෝමයක් රැස් කළ හැකි ක්‍රම කිහිපයක් පහතින් සඳහන් කර ඇත. මේවාද දෙවියන්ගේ මාර්ගයෙන්ම ආ දැනමුතුකම් නිසා ඒවා කිසිවිටකත් "ගඟට කැපූ ඉනි මෙන්" නොවනු ඇත. ඔබත් උත්සහ කර බලන්න.

මුළින්ම අප නිර්මාතෘ වන දෙවියන් වහන්සේ විසින් අප වෙත දැණුම් දී ඇති පහත සඳහන් උපදෙස් දෙස අවධානයෙන් බලන්න.

*(ඔහුම) තම නියෝජිතයින් වශයෙන් භූමියෙහි ඔබව පත්කර ඇත්තේය. තවද ඔබගෙන් සමහරෙකුව අනික් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමඟින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේ දැයි) ඔබව පිරීක්ෂා කරන්නේය. (6:165)*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම අත් විඳින්නාහ. පින් පව් කරන තත්වයෙන් අපි ඔබව (තබා) පිරික්සන්නෙමු. පසුව ඔබ අප වෙතම ගෙන එනු ලබන්නෙහුය. (21:35)*

*(කිසිම) ප්‍රශ්නයක් නොඅසා අත්හැර දමන්නෙමු යැයි මිනිසා අදහස් කළෙහිද? (75:36)*

*ඔහුම ඔබව උත්පාදනය කළ අයයි. (එසේ තිබියදී) ඔහුව ප්‍රතික්ෂේප කරන අයද ඔබගෙන් ඇත. (ඔහුව) විශ්වාස කරන අයද ඔබගෙන් ඇත. ඔබ කරන දෑය අල්ලාහ් අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන් සිටින්නේය. (64:2)*

*(පින් පව්) මාර්ගයන් දෙකම අපි ඔහුට වෙන්කර දැණුම් දුන්නෙමු (90:10) නියත වශයෙන්ම ඍජු මාර්ගය පෙන්වීම අපගේ යුතුකම වන්නේය, (නියත වශයෙන්ම මෙලොවද පරලොවද අපගේමය. (92:12.13)*

*සියල්ලන්ම උත්පාදනය කළ අය, (හෘදයන් හී ඇති දෑය) දැන නොදන්නෙහිද?;(67:14)*

*නියත වශයෙන්ම අපිම මිනිසාව (පළමු වරට) උත්පාදනය කළෙමු. ඔහුගේ මනසෙහි ඇතිවන සිතුවිල්ලද, අපි හොඳින් දනිමු. පිටි බෙල්ලේ ඇති පන නහරයට වඩා අපි ඔහුට ඉතාමත් සමීපයෙන්ම සිටින්නෙමු. (50:16)*

*දකුණු පැත්තේ කෙනෙකුද, වම් පැත්තේ කෙනෙකුද වශයෙන් (මලායිකාවරුන්) දෙදෙනෙකු සිටිමින් (ඔහුගේ වැඩ කටයුතු) සටහන් කරමින් සිටින්නාහ. (50:17)*

*(මිනිසා) කුමක් පැවසුවා වුවද, (එය ලිවීමට) බලාපොරොත්තුවෙන් සිටින (මලායිකා) කෙනෙකු, ඔහු වෙත නැත්තේ නොවේ. (ඔහුගේ මුවින් පිටවෙන සෑම වචනයක්ම එවෙලෙ එවෙලේම සටහන් කරනු ලබන්නාහ), (50:18)*

*සෑම මිනිසෙකුගේම ක්‍රියාවන් ගැන (විස්තරාත්මක දෛනික) සටහන් ඔහුගේ බෙල්ලෙහි එල්ලා ඇත්තෙමු. විනිශ්චය දිනදී එය ඔහුට එක් පුස්තකයක් මෙන් ගෙන දෙන්නෙමු. ඔහු එය දිගහැර බලනු ඇත. (ඒ අතර ඔහුට) "අද දින ඔබගේ ගණනය බැලීමට ඔබම ප්‍රමාණවත්ය. එබැවින් ඔබගේ (සටහන්) පුස්තකය ඔබම කියවා බලනු" (යයි කියන්නෙමු). (17:13,14)*

*මෙම ප්‍රතික්ෂේප කරන්නන් අපව අතහැර දමා අපගේ වහලුන්ව (තමන්ට) ආරක්ෂකයින් වශයෙන් ගත හැකිය යයි අදහස් කරමින් සිටින්නෙහුද? නියත*

*වශයෙන්ම මෙම ප්‍රතික්ෂේප කරන්නන්ට ආගන්තුක සත්කාර කිරීම සඳහා නිරයම පිළියෙල කර ඇත්තෙමු. (18:102) ඔවුන් (කවුරුන්දයත්) මෙලොව ජීවිතයෙහි වැරදි මාර්ගයෙහිම උත්සහ කරමින් තමන් ඇත්තෙන්ම හොඳ ක්‍රියාවන්ම කරන බවට සිතා ගන්නාහ. (18:104) මෙවැන්නන්ම තමන්ගේ දෙවියන්ගේ ආයාවන්ද, ඔහුව හමු වන්නෙමු යන්නද ප්‍රතික්ෂේප කළ අයයි. ඔවුන්ගේ හොඳ ක්‍රියාවන් සියල්ල විනාශ වී ගියේය. (පින් පව් කිරා බැලීමට) ඔවුන් වෙනුවෙන් විනිශ්චය දිනදී තරාදිය අපි නොසිටුවන්නෙමු (18:105)*

*එදිනදී (විනිශ්චය දිනදී) මිනිසුන් (හොඳ හෝ නරක හෝ) තමන්ගේ විපත් දකිනි පිණිස (විවිධ කොටස් වශයෙන් බෙදී) සමූහ සමූහ වශයෙන් (විනිශ්චය සඳහා) පැමිණෙනු ඇත, එබැවින් කවුරුන් එක් අනු ප්‍රමාණයක් හෝ පින්කර තිබුණේ නම්, ඔහු (එදිනදී) එය දැක ගන්නේය. (එසේම) කවුරුන් එක් අනු ප්‍රමාණයක් හෝ පාපයන් කර තිබුණේද, එයද ඔහු (එදිනදී) දැක ගන්නේය. (99:6-8)*

ඉහත දිව්‍යමය වදන් වලින් පැහැදිළි වන්නේ දෙවියන් අපව පැහැදිළි කාරණාවකට නිර්මාණය කර ඇති බවත්, ඔහුම අපට පින් සහ පව් වෙන්කර පෙන්වා දී ඇති බවත්, මිනිසා සිතන සහ කරන සෑම දෙයක්ම දෙවියන්ට දැනගත හැකි බවත්, ඒවා සටහන් කර ගන්නා බවත්, විනිශ්චය දිනදී ඒවාට ඵලවිපාක දෙන බවත් ය. දෙවියන්ව සහ ඔහු පෙන්වා දී ඇති ක්‍රමවේදයන්ට පිටින් කොතරම් කුසල් කලත් ඒවා නිශ්ඵල වන බවත් දන්වා තිබේ.

කුසල් අකුසල් හී යාන්ත්‍රණය හරිහැටි අවබෝද වූවාට පසු අපටම පහසුයි ඵලදායි විදිහට පහසුවෙන් කුසල් රැස් කර ගැනීමට. ඒවා මේ ආකාරයට වර්ග වශයෙන් වෙන් කරගෙන වටහා ගත් විට තමන්ට එයට ගැලපෙන ආකාර වලට කුසල් කටයුතු එකතුකර ගත හැකිය.

- **දෙවියන් සම්බන්ධව කුසල් කරගත හැකි ක්‍රම.**

දෙවියන්ව (තමන්ගේ නිර්මාතෘව) සිහිපත් කරන්න, ඔහුව ප්‍රසංශා කරන්න, ඔහුට ස්තුති කරන්න, ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය අගයන්න, ඔබ අතින් වූ වැරදි වලට ඔහුගෙන් සමාව ඉල්ලා සිටින්න. (සුභානල්ලාහ්, අල්හම්දුලිල්ලාහ්,

අල්ලාහුඅක්බර් ආදී ලෙස). මේ සෑම වචනයකටම දෙවියන් කුසල් දෙන බවට පොරොන්දු වී ඇත. [දුආ ප්‍රාර්ථනා]

සුන්නත් සලාතයන් කිරීමද ඔබට ඉමහත් සේ කුසල් වැඩිකර ගත මාර්ගයකි.

❖ **ධර්මය සම්බන්ධව කුසල් කරගත හැකි ක්‍රම.**

කුරාණය පාරායනය කිරීම, එය අධ්‍යයනය කිරීම, එය අන් අයට කියා දීම. නබිවරුන් පිළිබඳව අධ්‍යයනය කිරීම, ඒ ගැන සමාජය දැනුවත් කිරීම, නබිවරුන්ට දෙවියන්ගේ ආශිර්වාදය ප්‍රාර්ථනා කිරීම.

අවසන් දේවදූතවරයා (ﷺ) ද පැමිණ දැන් ඔහුද මරණයට පත් වී ඇති නිසා දෙවියන්ගේ දේව පණිවිඩය ඉදිරි සමාජය වෙත ගෙනයාමේ වගකීම ඇත්තේද අපටමය. එනිසා හැකි අයුරින් එයට දායක වීමද ඉමහත් කුසල් ලැබෙන මාර්ගයකි.

❖ **තමන් සම්බන්ධව කුසල් කරගත හැකි ක්‍රම.**

අපි කළුවර කාමරයක තනිව සිටියත් අප හිතන දේ පවා අල්ලාහ් දන්නේය. අප අවදි වී නින්දට යනතෙක් කරමින් සිටින සෑම ක්‍රියාවක්ම කුසලක් බවට පත් කර ගැනීමට අල්ලාහ් අපට අවස්ථාව දී ඇත. සමහර අවස්ථා වල අල්ලාහ් අපට බෝනස් සහිත කාල ලබා දී ඇත. උදාහරණයකට, ශව්වාල් මස දින 6ක් උපවාසය කලොත් එය එම අවුරුද්ද පුරාම උපවාස කල කුසලට සම කර ඇත. නින්දට යන විට පවා දහම තුලින් පෙන්වා දී ඇති ආකාරයට එය සිදු කළොත් නින්දෙන් ඇහැරෙන තෙක්ම එය කුසල් එකතු වන්නක් බවට පත් කර ඇත. තමන් අඳින විදිහ, කන බොන විදිහ, කොටින්ම වැසිකිළි යන විදිහ සහ සහකාරු හෝ සහකාරිය සමග ලිංගිකව හැසිරෙන කාරණාවෙදී පවා ඒවා නිසි පරිදි කළ හොත් ඒවටද කුසල් එකතු වේ.

❖ **ඥාතීන් සම්බන්ධව කුසල් කරගත හැකි ක්‍රම.**

ඥාතීන්ගේ වැදගත්කම ඉස්ලාමය තුලින් මැනවින් පෙන්වා දී තිබේ. එනිසා ඔවුන්ගේ කටයුතු වලදී තමන්ගෙන් විය යුතු යුතුකම් ඇත්නම් ඒ කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීමට කම්මැලි නොවිය යුතුයි.

❖ **මිනිසුන් සම්බන්ධව කුසල් කරගත හැකි ක්‍රම.**

ඉස්ලාම් දහමට අනුව සියළුම මිනිසුන් ආදම් (අ.ස) සහ හව්වා (අ,ස) ගේ දරු පරම්පරාවය. එනිසා සියල්ල තම සහෝදරයින් ලෙස සලකා කටයුතු කළ හැක. සියල්ලෝම දෙවියන්ගේ පරීක්ෂණයට මුහුණ දෙමින් සිටී. සමහරුන් උදව් අවශ්‍ය මට්ටම් වලට පත් වී සිටිය හැක. හැකි හැම විටකම ඔවුන්ට වචනෙකින් හරි උදව් කල හැකි නම් එය විශාල කුසලක් ලෙස අපට විනිශ්චය දිනයේ දැකිය හැකි වනු ඇත. අල්ලාහ් අප කරන දෙය දෙස බලා සිටී, මලායිකාවරුන් ඒවා සටහන් කරමින් සිටී. ගෙවෙන හැම මොහොතක්ම අපට කුසල් රැස් කිරීමට හැකි අවස්ථාවක් බව අමතක නොකළ යුතුයි

❖ **සතුන් සම්බන්ධව කුසල් කරගත හැකි ක්‍රම.**

අල්ලාහ් සතුන්ව මිනිසාට වසඟ කර දී ඇත. ඔවුන් අපට යටහත් පහත් ලෙස සිටින ලෙස නිර්මාණය කර ඇත. ඔවුන්ගෙන් අපට බොහෝ ප්‍රයෝජනද ඇත. එසේම සමහර සතුන් ඉතා අහිංසකය. සමහර සතුන් ඉතාම ආදරබරින් යුක්තය. අප මේ සියල්ල කෙරෙහි අවධානයෙන් යුතුව කටයුතු කළ යුතුය. අපි සතුන් කෙරෙහි වැරදි ලෙස හැසිරුනහොත් ඔවුන් විනිශ්චය දිනයේදී අපට විරුද්ධව අල්ලාහ්ට පැමිණිලි කරනු ඇත. නිකරුනේ කුහුඹුවෙක් පවා මැරීමට අපට අයිතියක් නැත. කුසගින්නේ සිටි බල්ලෙකුට වතුර පොදක් දුන් අභිසාර කාන්තාවකට අල්ලාහ් ස්වර්ගය නියම කල බවත්, පූසෙක්ට ආහාර නොදී සිර කර සිටි කාන්තාවකට අල්ලාහ් අපාය නියම කල බවත් ඉස්ලාමය තුල පෙන්වා දී තිබේ.

“සතුන් ගැන දෙවියන් වහන්සේ අපට පවසා ඇති දේ” නැමති ලිපිය මගින් ඒ ගැන වැඩිවිස්තර දැනගත හැක.

❖ **පොදු සමාජය සම්බන්ධව කුසල් කරගත හැකි ක්‍රම.**

බුලත් කාලා පාරට, බිත්තිවලට කෙල ගසමින් යන මිනිසුන් පොදු සමාජය ගැන සැලකිල්ලක් නොදක්වන අයයි. සමහරු විශාල ලෙස මුදල් වියදම් කර තම මෝටර් රථවල සයිලන්සර් ශබ්දය උවමනාවෙන්ම වැඩිකර ගනී. සමහර බස් වල අධික ශබ්දයෙන් සංගීතය දමා ගමන් යයි. සමහරු මිනිසුන් නොමග යවන, කාලය කා දමන හෝ කිසි වැඩකට නැති වීඩියෝ සමාජගත කරයි. මෙවැනි බොහෝ ක්‍රියා තුලින් මිනිසුන් බොහෝ අකුසල් රැස්කර ගනී.

පොදු සමාජය ගැන අප හැම විටම සැළකිලිමත් විය යුතුයි. එහි අපට කුසල් රැස්කර ගත හැකි බොහෝ තැන් ද ඇත.

❖ **පරිසරය සම්බන්ධව කුසල් කරගත හැකි ක්‍රම.**

අල්ලාහ් මිනිසාව පෘතුවියෙහි නියෝජිතයින් වශයෙන් එවා ඇත. සෑම මිනිසෙකුම තමන් ගේ පරිසරය ආරක්ශා කිරීමට බැඳී සිටී. අල්ලාහ් සියල්ල බලා සිටී. පරිසරය අපට විරුද්ධව හෝ අපට පක්ෂපාතීව අල්ලාහ් ඉදිරියේ කරුණු ඉදිරිපත් නොකරාවි යැයි ඔබ සිතන්නේද? අපි පොලොවේ පස් වලින් සෑදුනු අය වන්නෙමු. එනිසා පොලොවට කෙල ගැසීමේදී හෝ හයියෙන් අඩිය තබා ඇවිදීමේදී පවා පරිස්සම් වන්න. අපි ආපසු යන්නෙත් ඒ පොළොවටමමයි.

තම එදිනෙදා ජීවිතයේදි කුසල් රැස්කරගත හැකි ක්‍රම රාශියක් අපට අවසන් දේවදූත මොහම්මද් (ﷺ) තුමා හරහාද දැනගන්නට ලැබී ඇත. මෙහි පහතින් සඳහන් ව ඇති රියාලුස් සාලිහීන් ග්‍රංතය තුලින් ඒවා පහසුවෙන් සොයාගත හැක.

**කුසල්-අකුසල්/ කර්ම-ඵල ආදියෙහි යාන්ත්‍රණය ගැන වෙනත් ක්‍රමවේදයක් ඇත්නම් අපට දන්වන්න.**

---

# ඔබගේ ආගම කුමක් විය යුතුද?

සෑම මිනිසෙකුටම සහජයෙන්ම ආගම ගැන හැඟීමක් ලැබී තිබේ. එබැවින් ආගම ගැන අමුතුවෙන් අර්ථ දැක්වීමක් අවශ්‍ය වන්නේ නැත. කෙසේ වෙතත් ජීවින්

අතුරින් මිනිසාට සුවිශේෂී තැනක් හිමිවන්නේ, මිනිසාට අනෙක් ජීවින්ට නොමැති සිතීමේ හැකියාවක් සහ ශරීරයක් ලැබී ඇති නිසාය. එබැවින් සත්ව ලෝකයේ ආගමක් අදහන එකම ජීවියා මිනිසා වන්නේය.

ආගම හරහා මිනිසාට තම මැවුම්කරු ගැන නිවැරදිව දැනගැනීමට ලැබෙන අතර මරණයෙන් පසු කුමක් සිදු වන්නේදැයි දැනගිමට ද හැකියාව ලබේ. එසේ තිබියදී ඇතැම් අය ආගමක් අදහන්නෙවත් දෙවියන් ගැන විශ්වාස කරන්නේවත් නැත. එවැනි අය මරණයෙන් පසු ජීවිතයක් ඇතොත් ඊට මුහුණ දෙන්නේ කෙසේදැයි තම මරණයට පෙර සිතා බැලිය යුතුව තිබේ.

මිනිසාට ආගමක් අවශ්‍යවන්නේ ඔහුගේ මැවුම්කරු ගැන දැන ගැනීම සඳහාය. එමගින් තම ජීවිතයේ අරමුණ ලඟා කර ගැනීමට හැකි වනු ඇත. විශ්වයට ආරම්භයක් තිබෙන බව පරම සත්‍යයකි. එය විද්‍යාඥයින් පවා පිළිගෙන ඇත. තවද විශ්වය ගැන ගැඹුරින් හැදෑරීමේදී පෙනී යන්නේ එය එක් දෙවිකෙනෙකුගේ මැවීමක් බවයි. එක් දෙවිකෙනෙකුට වඩා සිටින්නේ නම් අපට මෙවැනි ඒකාකාරී විශ්වයක් දැක ගැනීමට ලැබෙන්නේ නැත. එම නිසා බහු දේව වාදී ආගම් වලින් නිවැරදි මාර්ගය ලඟා කර ගත හැකි දැයි ප්‍රශ්නයක් පැන නගින්නේය.

දෙවියන් පහළ කළ සෑම ආගමකින්ම දෙවියන් ගැන දැනගත හැකිය. කෙසේ වෙතත් ඇතැම අය අසන ප්‍රශනයක් වන්නේ දෙවියන් ඇතිවුයේ කෙසේද යන්නයි. ඇත්තෙන්ම ඔහු මවන ලද මේ විශ්වය තුල ඔහු අන්තර්ගත නොවන නිසා අපට ඔහු ගැන දැනගත හැකි වන්නේ ඔහු විසින් එවන ලද දහම තුලින් පමණි.

මුල්ම මිනිසා වන ආදම් තුමාගේ සිට මුහම්මද් නබිතුමා දක්වා දෙවියන්ගේ නියෝජිතයින් වන නබිවරු විශාල සංඛ්‍යාවක් මෙලොවට පැමිණ තිබේ. ඔවුන් සියළුදෙනාම සත්‍යය දහම් පණිවිඩය මිනිසාට ලබා දී ඇත. එම නිසා ඒ ඒ නබිවරුන්ගේ කාලවලදී ඔවුන් දේශනා කරන ලද දහම නිවැරදිව අනුගමනය කල සියළුම දෙනා විමුක්තිය ලබා ගනු ඇත. එසේ තිබියදී නබිවරුන්ගේ අභාවයෙන් පසු බොහෝ ආගම් වෙනස්කම් වලට භාජනය වී තිබේ. එම නිසා අද

ජීවත්වන මිනිසාට නිවැරදි ආගමක් සොයා ගැනීම අසීරු කරුණක් බවට පත්ව ඇත.

**නිවැරදි දහමකින් පහත දැක්වෙන කරුණු ඉදිරිපත් විය යුතුය.**

- ❖ දෙවියන් ගැන නිවැරදි සහ සත්‍ය වූ කරුණු
- ❖ දෙවියන්ගෙන් පහළ වූ දහමක් බව තහවුරු කල හැකි සාක්ෂි
- ❖ දහම පහලවූ මුල් භාෂාවෙන්ම එය තිබීම
- ❖ කිසිම වෙනසකට ලක් නොවී පහල වූ ආකාරයටම ආරක්ෂා වී තිබෙන බව සනාථ කල හැකි සාක්ෂි තිබීම
- ❖ මිනිසුන්ගේ උවමනාවන්ට සරිලන පරිදි වෙනස් නොවී තිබීම
- ❖ එම දහම තුල කිසිම පරස්පරතාවයක් නොතිබීම
- ❖ ලොව ඕනෑම තැනකදී පිළිපැදීමට හැකි වීම
- ❖ මිනිසාට පිළිපැදිය හැකි නිවැරදි මාර්ගය සරලව පෙන්වා දී තිබීම
- ❖ ඕනෑම කෙනෙකුට පහසුවෙන්ම එම දහමේ පෙන්වා දෙන ඇදහිලි ඉටු කිරීමට හැකි වීම
- ❖ මිනිසාගේ උපතේ සිට විපත දක්වා වූ සියළු කරුණු කාරනා එහි අඩංගු වී තිබීම
- ❖ දහමේ ඇති නීති රීති යල්පැන ගිය ඒවා නොවීම
- ❖ දහම පහළ කල යුගයේ පැවති අවිද්‍යාත්මක සංකල්පයන් සත්‍ය කරුණු ලෙස දහමින් ඉදිරිපත් නොවීම
- ❖ මරණයෙන් පසු ජීවිතය ගැන නිවැරදිව කරුණු ඉදිරිපත් කොට තිබීම
- ❖ එම ආගම තුලින් දෙවියන්ගේ නියෝගයන් නිවැරදිව ඉදිරිපත් කොට තිබීම

අපි අදහන ආගම කුමක් වුවත් එහි ඉහත සඳහන් කරුණු ගැබ් වී තිබේ නම් එමගින් විමුක්තිය අත්කර ගැනීමට හැකි වනු ඇත. කෙසේ වෙතත් අද ලෝකයේ ඇති බොහෝ ආගම් මිනිසා විසින් වෙනස් කරගෙන තිබේ. එසේ වෙනස් කරන ලද ආගමකින් සත්‍යය දැනගැනීමට හැකි වන්නේ නැත. මේ නිසා තමන් ආගමක් තෝරාගැනීමට පෙර ඒ ගැන ගවේශයන කිරීම වැදගත් වේ. එහෙත් බොහෝ අය කරන්නේ දෙමව්පියන්ගෙන් උරුම වන ආගමක් පිළිපැදීමය. එසේ කිරීමෙන්

සත්‍යය වෙත ලඟා වීමට හැකි වේදැයි ස්ථිරවම කිව නොහැකිය. තවද පරම්පරාවෙන් උරුමවන දහමක් නාම මාත්‍රික ලෙස ඇදහීමෙන් සැම විටම සත්‍ය ලඟා කර ගත හැකිවන්නේ නැත. එම නිසා නාම මාත්‍රිකව ආගමක් ඇදහීමට වඩා අවබෝදයෙන් යුතුව එය සිදු කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. (FA)

---

## මට වැරදුනාද ? .....

ජීවිතයට අරුතක් සොයා යන ගමනේදී මිනිසා විවිධ වූ මාර්ග ඔස්සේ ගමන් කරනු ලබයි. ජීවිතය අර්ථාන්විතව ගොඩනගන්න, මනසෙහි සන්තුෂ්ටිය පවත්වා ගැනීමට, සරල සුගම ජීවිතයක පහස වින්දනය කරන්නට මිනිසා උත්සාහ දරන්නේය. ඒ උදෙසා ජීවිතය යම් යම් ක්‍රියාමාර්ග ඔස්සේ විවිධාකාර ලෙස ගොඩ නඟන ආකාරය දකින්නේය.

මිනිස් ජීවිත පිළිබඳව අධ්‍යයනය කරන විට ඉතා පැහැදලිව පෙනෙන්නේ එකිනෙකාගේ වින්දනීය ස්වභාවය එකිනෙකට පරස්පරව පවතින බවයි.

නවීන ලෝකයෙහි ජීවත්වන මිනිසා අන්ත අසරණ ස්වභාවයකට පත්ව ඇති බව ඉතා පැහැදිලිව දැකගත හැකිය. යාන වාහන, ඉඩකඩම්, මිල මුදල්, ගේ දොර මේ සියල්ල තුළ මිනිසා සතුට සොයමින් සැරිසරන්නේය. මේ වෙනුවෙන්ම මිනිස් ජීවිත විශාල සංඛ්‍යාවක් වහල් ස්වභාවයට පත්වී ඇත.

මේ අදහස තවත් ආකාරයකින් කෙටියෙන්ම කියනවානම් මිනිසා ඉතා පුදුම සහගත ලෙස සැපට දුක් විඳින්නේය.අද මිනිසුන් අතර ගොඩනැගී තිබෙන විෂමතාවය හොඳින් අධ්‍යයනය කර බලන විට ඉතා පැහැදිලිව පෙනෙන්නේ භෞතික කාරණා මත මිනිසා ගැටෙන බවයි. මිනිසාගේ ආශාවන්ට සීමාවක් නොමැත. මුළු ලෝකයම තමා ගේ පාමුල උරුමයක් ලෙස පැවතියත් එයින් තෘප්තිමත් වීමට කිසිම මිනිසෙකුට හැකියාවක් නොමැත. හැම කෙනෙක්ම එකිනෙකා පරයා නැගී සිටින්නට දරන උත්සාහය අදහාගැනීමට අපහසුය.

ලෝකයේ බලවත් රටවල් සංවර්ධනය වෙමින් පවතින දිළිඳු රටවල් ක්‍රමණය කර හමාරය. සමහර රටවල් සදාකාලිකවම බලවතුන්ගේ සපත්තුවට පෑගෙමින් වහල් භාවයෙන් යුක්තව පවතින්නේය. කුමන පැත්තකින් හෝ හිස ඔසවන්නට වෙර දරන රාජ්‍යයන් කඩා බිඳ දමන්නට බලවත් රාජ්‍යයන් යම් යම් ක්‍රියාමාර්ග ඉතා රහසිගතව හා සූක්ෂමව ක්‍රියා කරගෙන යයි. මෙයද එකිනෙකා පරයා නැඟී සිටින්නට දරන ප්‍රයත්නයේ එක් පැතිකඩකි.

මිනිසුන්ගේ සදාචාරාත්මක වර්ධනය පිණිස මග පෙන්වන්නා වූ ආගම් තුළ දක්නට ලැබෙන්නේ මෙවැනි ප්‍රතිරූපයකි. බොහෝ විට ලෝකයෙ ගැටුම් නිර්මාණය වී ඇත්තේ ආගම් හරහාය. ඉතිහාසය පුරාවටම යම් ගැටුමක් නිර්මාණය වී ඇත්නම් ඒ පිටුපස බලය ස්ථිර කිරීම මෙන්ම ආගමික පසුබිමද ඒකත්වයක්ව පවතින බව ඉතා පැහැදිලිව පෙනෙන්නට තිබේ. ඇත්ත වශයෙන්ම ආගමක් නිර්මාණය වන්නේ මිනිසුන් භෞතික වශයෙන් නොව ආධ්‍යාත්මික වශයෙන් ගොඩනැගීමටය. එහෙත් වර්තමානයෙහි ආගම් වූ කලී බොහෝවිට සමාජය අතර බෙදීම් ඇති කරමින් ගැටුම් නිර්මාණය වෙමින්ම තමන්ගේ ආගමික අයිතීන් ලෝකයට ප්‍රකාශ කරමින් තමන්ගේ ආගම් උද්දීපනය කිරීමට සටන් වදිති.ශ්‍රී ලංකාව වැනි කුඩා රාජ්‍යයක විටින් විට ආගමික ගැටුම් විවිධාකාර ලෙස නිර්මාණය වන ආකාරය දැකගත හැකිය.

ආගම් පහළ වී තිබෙන්නේ මිනිසා උදෙසා වුවත් බොහෝවිට ආගම් තුළින් මිනිසාට සැනසීමක් නිදහසක් ලැබී නැත. ඇත්ත වශයෙන්ම අද වන විට මිනිසුන්ට එක පැත්කින් ආගම මහත් කරදරයකි, හිසරදයකි. මිනිසුන් තම තමන්ගේ ආගම් රැකගැනීමට සටන් කරති. තම තමන්ගේ සත්‍යතාවයන් අන් අයට පැහැදිලි කරන්නට උත්සාහ කරති. නමුත් තම තමන්ගේ ආගමික සමාජයන් තුළ වුවද එක්සත්කමක් දක්නට නොමැත. මනුෂ්‍යත්වයට වඩා ඉහළින් වූ ආගමක් මා දකින්නේ නැත. ආගම් සුරක්ෂිත කිරීමට පළමුව මිනිසා විසින් මිනිස් හැඟීම් වලට ගරු කළ යුතුය. මිනිස් ජීවිත ජීවත් කිරීමේ අභිප්‍රායන් ක්‍රියාත්මක විය යුතුය. එවැනි දර්ශනයක් නොවන ආගම් මිනිසාට අවශ්‍ය නැත.

අද අපට දක්නට ලැබෙන්නේ ඇත්ත වශයෙන්ම මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන ආගමික මුහුණුවරක්ය.

එවැනි පසුබිමක ජීවත් වෙමින් අපි ආගමික සදාචාරය පිළිබඳව දේශනා කරන්නෙමු. ඕනෑම ප්‍රශ්නයකට විසඳුම් සොයා යාමට ආගම පිළිසරණක් වුවත් අද ඒ ආගම ම මිනිසාට මහත් හිසරදයකි. ආගම් පහළ වී තිබෙන්නේ මිනිස් ජීවිත සරල සුගම ආකාරයෙන් ගොඩ නගා ගනිමින් ජීවිතයේ සැනසීම සාක්ෂාත් කරගැනීම සඳහාය. එහෙත් අද එය කල්පනාකර බැලිය යුතු තත්ත්වයකට පත්ව තිබේ. මෙයට හේතුව බුද්ධියෙන් තොර ශක්තියක් මිනිසා අතර ක්‍රියාත්මක වීමය. බොහෝ විට තම තමන්ගේ ආගම පිළිබඳව වුවද විශ්ලේෂණය කර බුද්ධියට ඉඩ දෙන්න මිනිසාට හැකියාවක් නැත. බුද්ධියෙන් තොර භක්තිය අන්ධය. අද අන්ධ භාවයෙන් සිටින බොහෝ දෙනෙක් මඟ පෙන්වන්නන් ලෙස ක්‍රියාත්මක වීම නිසා බොහෝ දෙනකුට මග වැරදී තිබේ. අප විසින් මතක තබා ගත යුතු කරුණක් වන්නේ බුද්ධිය ආගමක් තුළ උගන්වන මූලිකම රීතිය බවයි. සත්‍ය වශයෙන්ම බුද්ධියෙන් තොර ආගමක් නැත. එමනිසා බුද්ධිය වර්ධනය කරගැනීම පවත්නා විෂය ක්ෂේත්‍රය අතර සංසරණය කිරීමට මිනිසාට ලැබෙන දායාදයකි. මක්නිසාද පවත්නා භෞතික ස්වභාවයන් තුළ ජීවත්වෙමින් ආධ්‍යාත්මික ස්වභාවය වර්ධනය කරගැනීම, ආගමික මඟ පෙන්වීම වන නිසායබොහෝවිට අද ආගමික වශයෙන් නායකත්වයක් දරන බහුතරයක් බුද්ධි හීන, මනුෂ්‍යාත්වය පිළිබඳ ව නිසියාකාර දැක්මක් නොමැති ආත්මාර්ථකාමී ස්වභාවයෙන් සමාජයට අදහස් ඉදිරිපත් කරන නිසා ආගම පිළිබඳව මතවාද ගැටුම් නිර්මාණය වෙමින් පවතී. මෙම සත්‍යතාවය වටහා ගැනීමට නම් පෞද්ගලිකව ආගම යන්න කුමක්ද පිළිබඳව අවබෝධ කරගෙන තම තමන්ගේ ජීවිත තුළ ම සත්‍යතාවයන් ගොඩනැගිය යුතුය. අද ආගම් දේශපාලනය හා ආර්ථිකය සමාජ දර්ශනය ලෞකික ජීවිත වල කුඩාමහත් කාර්යයන් මෙකී නොකී සියල්ලම ආක්‍රමණය කොට තිබේ. සමහරවිට ආගමකින් තොරව හුස්ම ගැනීමට වත් මිනිසාට ඉඩක් නැත. මනුෂ්‍යාත්වය ඉක්මවා ක්‍රියාත්මක වන වැරදි සහගත ආගමික දර්ශනයන් පැහැදිලිව අවබෝධ කරගැනීමට දියුණු කරගත යුත්තේ බුද්ධියයි. බුද්ධියෙන් තොරව සුගතියක් ලබන්නට මෙලොවදී මිනිසාට හැකියාවක් නැත. එසේ නම් පරලොව පිළිබඳව කෙසේ නම් ජයග්‍රහණයක් බලාපොරොත්තු වෙන්නද. කල්පනා කර බැලීම ඔබ සතුය. [මා මිත්‍ර Ibrahim Sebastian (IBS) ගේ ලිපියකි].

## ජීවිතය විදින්න දහමට යොමු වන්න..

මෙලොව ජීවත්වන සෑම මිනිසෙකුගේම බලාපොරොත්තුව වන්නේ සතුටින් යුක්තව ජීවිතය පවත්වාගෙන යාමයි. නමුත් අප අතර ජීවත් වන බොහෝ දෙනෙක් අතරින් අතලොස්සක් හැර අන් සියල්ලෝම ජීවිතය පිළිබඳව වින්දනීය ආකල්පයක් දරන්නේ නැත. ඇත්ත වශයෙන්ම කියනවානම් බොහෝ දෙනෙක් "ඇයි මම ජීවත් වෙන්නේ ?" කියන ප්‍රශ්නයට වත් පිළිතුරු සොයාගෙන නැත. එමනිසා බොහෝ දෙනෙකුට ජීවිතය පිළිබඳව බලාපොරොත්තුවක්ද නොමැත.

බලාපොරොත්තුවක් නැති ජීවිතවලින් සතුට සහ සමාදානය ගොඩනැගෙන්නේ යයි සිතිය නොහැක.

ඇත්ත වශයෙන්ම මිනිසාට ජීවිතය ලැබී තිබෙන්නේ මෙලොව තුළ එම ජීවිතය විදින්නයි. මෙලොව උපදින අපි හඬ හඬා පැමිණියෙමු. එතැන් පටන් සෑම මොහොතකම කෙඳිරි ගගා ජීවත් වුණෙමු. නැතිවී විනාශ වී ගිය බොහෝ දේ අතර ජීවිතය කටුක අමිහිරි අත්දැකීම් අතර ගෙවා දැම්මෙමු. අවසානයේදී බලාපොරොත්තු ජීවත් කළ අපි සියලු දේ අහිමි කොට ගෙන මෙලොවින් නික්ම යන්නෙමු.

ඇත්ත වශයෙන්ම ජීවිතය යනු කුමක්ද, ඇයි ජීවත් වෙන්නේ, ජීවිතේ අරමුණ කුමක්ද, යනාදී ලෙස තම තමන්ගෙන් ප්‍රශ්න කළ හොත් දීමට පිළිතුරක් ඔබට තිබෙනවාද? සැබවින්ම නැහැ නේද?

එයට හේතුව බොහෝවිට බුද්ධිය මුහුකුරා ගිය සමාජය හා ගැටෙන අපි සෑම අවස්ථාවකම සිතුවිළි මෙහෙයවන්නෙ තමාගෙන් බාහිරව වූ සමාජය කෙරෙහි නිසාය. ජීවත් වීම අප අත්දකින්නේ අන්‍යයන් හා සංසන්දනය කර ගැනීමෙන් වින්දනාත්මක ස්වභාවයට පත්කර ගැනීමටය. මෙය කිසි විටෙක ඉටුනොවන සිහිනයකි.

ඇත්ත වශයෙන්ම මෙලොව පවතින සියල්ල විනාශ වී යන්නේ නම් විනාශ වී යන දෙයක් කෙරෙහි බලාපොරොත්තු තබා ගන්නේ කෙලෙසද? මේ ගැන සිතන

විට ජීවිතයට ජීවිතයට සැබෑ අර්ථකථනයන් සපයන්නේ ආගමානුකූලව කරනු ලබන මඟ පෙන්වීම් තුළ පමණි.

තවත් ආකාරයකින් ප්‍රකාශ කරන්නේ නම් ජීවිතය විඳින්නට උගන්වන්නේ ආගම් තුළින් බව අවධාරණයෙන් ම ප්‍රකාශ කළ හැකිය.

අප ජීවත්වන ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන වශයෙන්ම බෞද්ධ හින්දු ක්‍රිස්තියානි සහ ඉස්ලාම් යනාදී ආගම් අදහන හා විශ්වාස කරන ජනතාවක් ජීවත් වන්නේය.

ඔබ බෞද්ධයෙක් නම් ජීවිතය පිළිබඳව සැබැවින්ම වින්දනීය මාර්ගයක් ඔබ සතුය. ලොව්තුරා තථාගත බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන්නට යෙදුන ධර්මය ලෝකෝත්තර දහමකි. තථාගත දේශනාවට අනුව මෙලොව පවත්නා සියල්ල අනිත්‍ය වශයෙන් කල්පනා කරන විට ඔබ විසින් කළ යුතු වන්නේ නිත්‍ය දේ කුමක්දැයි ධර්මය තුළින් සොයා දැන ගැනීමයි. ශ්‍රී ලංකාව තුල ජීවත් වන්නේ බහුතරයක් බුදුදහම විශ්වාස කොට ගත් පිරිසක් ලෙසය. බොහෝවිට වර්තමාන බෞද්ධ සමාජය ධර්මයෙහි පැතිකඩ අල්ලාගෙන සිටින්නේ වැරදි සහගත ස්වභාවයෙන් යුක්තවය. බුදුරජාණන් වහන්සේ සැබැවින්ම ඔබට උගන්වා ඇත්තේ නිත්‍ය නොවන ලෝකයක් තුළ ස්ථිර වූ ජීවිතයක් ගොඩනඟා ගැනීමටය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පස්වනක් ප්‍රීතියෙන් ජීවිතය වින්දේය. එම ධර්මය තුළින් බෞද්ධ ජනතාවට ජීවිතය විඳින්නට මග පෙන්වන ලදී.

බුදුදහම බෞද්ධයාට පමණක් උරුම දහමක් නොව එය සමස්ත මානව වර්ගයාටමත් අයිති දහමකි. පසුගිය කාලය පුරාවට අන්තර්ජාලය ඔස්සේ සිදුවූ සිදුවීම් දෙස බුද්ධිමත්ව බලන ඔබ සැබෑ බෞද්ධයෙක් නම් ඇත්ත වශයෙන්ම ඔබ නිත්‍ය වූ පැවැත්ම ස්ථිර කරගැනීමට මෙලොව බදාගෙන සටන් වදින බව නොවැටහෙන්නේද?

සමස්ත මානව වර්ගයා වෙනුවෙන්ම පහළ වූ උතුම් ධර්මානුකූල මාර්ගය ඔබට පමණක් සීමා කොට ගෙන ඔබ වැටක් ගසා කොටු කර ගත්තේ නම් එයින් එහාට ඔබට දැක්මක් ඇතිකර ගැනීමට හැකියාවක් ලැබේවිද?

මතක තබාගන්න බුදුරජාණන් වහන්සේ දෙශනා කර තිබෙන්නේ "යදනිච්චං තන් දුක්ඛං", යමක් නිත්‍ය වශයෙන් ඔබ අල්ලා ගත්තද එය දුකක් බව වටහා ගන්න.

ඇත්තවශයෙන්ම අපගේ සහෘද බෞද්ධ සහෝදර සහෝදරියන් වෙත ලැබී තිබෙන්නා වූ උත්තරීතර ධර්මය තුළින් ජීවිතය දකින්නට මාර්ගය විවර විය යුතුය. පළමුවෙන් ධර්මානුකූලව ජීවිතයට අවශ්‍ය මග පෙන්වීම ලැබිය යුතුය. සිංහල සාහිත්‍ය අධ්‍යයනය කර බලන විට ඇත්ත වශයෙන්ම එය ගොඩනැගී තිබෙන්නේ බෞද්ධ දර්ශනය හා සමගාමීවය. ජනකවි, ජනකතා, පන්සිය පනස් ජාතක පොත හා සන්දේශ කාව්‍ය, යනාදී සම්‍යක් හෙළ සාහිත්‍ය නියෝජනය කරන ගද්‍ය සහ පද්‍ය අධ්‍යයනය කර බලන විට අතීතයේ හෙළ ජන ජීවිතය වින්දනය කර ඇති ආකාරය ඉතා පැහැදිලිව දක්නට ලැබේ. ඒ තුළ ආදරය, කරුණාව, කැපවීම, ඉවසීම, කෝපය, දයාව, මිනිස් ස්වභාවයක් ලෙස පැවතියද ඒවා සමාජගත කිරීමේ දී සංයමයෙන් යුක්තව සමාජගත කළ ආකාරය සාහිත්‍යය අවධාරණය කරයි.

ඇත්ත වශයෙන්ම අද වන විට බුදුදහම පන්සලට සීමා වූ ධර්මය පමණක් වී ද? සමස්ත සත්ත්ව සමුදාය වෙනුවෙන්ම පතල මහා කරුණාවෙන් සොයා දැන ගත්තා වූ උත්තරීතර තථාගත ධර්මය මිනිසා මිනිසා අතරම භේදයක් ඇති කළේද? නැත අප තේරුම් ගත් ස්වභාවය වැරදිය. ජීවිතය විඳින්න බුදුදහම ගෙනහැර දක්වන පිටුබලය ධර්මය සොයා දැන ගැනීම ඉතා වැදගත්ය.

ලොව්තුරා තථාගත දේශනාවේ කිසිදු ආගමකට පරිභව කරන ද්වේශසහගත ලෙස ක්‍රියාකරන ස්වභාවයෙන් යුක්ත වූ ධර්මයක් නොවේ. එය යම් රටකට, පුද්ගල කණ්ඩායමකට, යම් භාෂාවක ට, පමණක් අයිති වූ ධර්මයක් නොවේ. සමස්ත මානව වර්ගයාටම අවබෝධ කරගෙන තම තමන් පිළිපැදිය යුතු දහමකි. එය භක්තියෙන් අන්ධ වූ අති පාරිශුද්ධ වූ පිරිසකට අයිති වූවක් නොවේ. අංගුලිමාල වැනි මිනීමරුවන්, සුනීත සෝපාක වැනි සමාජයේ පීඩිත වූවන්, පටාචාරා කිසාගෝතමී වැනි ජීවිතයේ බලාපොරොත්තු කඩවූවන්, අම්බපාලි වැනි සලෙළුන් සතුටු කල ගණිකාවන්, මං පහරන සොරුන්, සුන්දරී, දේවදත්ත වැනි එදිරිවාදීන් වශයෙන් මෙකී නොකී සියල්ලන්ට විමුක්තිය සැදූ උත්තරීතර ධර්මයකි.

එහෙත් වර්තමානයෙහි බුදුදහම පිළිබඳව බොහෝ දේ දේශනා වුවද. සමාජය තුළ විවිධ මාතෘකා සංවාදයට භාජනය වුවද එම ධර්මය ඉදිරියේ මිනීමරුවන්, සොරුන්, ගණිකාවන්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්, සමාජයේ අන්ත අසරණ පීඩාවට පත් වූවන් පිළිසරණක් ලබන්නේ ද?

මේ ගැන ධර්මයට අනුව කල්පනා කර බලන්න. ඔබ සැබෑ බෞද්ධයෙක් නම් ඔවුන් වෙනුවෙන් ඔබගේ පියාපත් දිගු කරන්න. බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව ඇත්තටම මේ ලෝකය ජීවත් වීමට හා ඔබගේ වින්දනීය ස්වභාවය සම්පූර්ණ කිරීමට ඉතා වටිනා තැනක් ලෙස මිහි මඬල ඔබ දකීවි.

දෙනෙත් හැර, කට අයා, හැඩිදැඩි සිරුරකින් ලෝකය දකින්නට කිසිවිටෙක නොහැක. ඔබ දැකිය යුත්තේ ප්‍රඥාව නැමැති දෙනෙත විවෘත කොට, ධර්මානුකූලව ගොඩනහාගත් වචනයෙන් කට අයා, ධර්මයට අනුකූල වූ පංචෙන්ද්‍රිය සහිත ඔබගේ ශරීරය මෙහෙයවා ලෝකය දැකීමටය.

ධර්මය ඔබට ය. විමුක්තිය අවශ්‍ය ඔබටය. සැනසීම ඔබටය. අන් අය වෙනුවෙන් කිසිවක් කිරීමට හෝ එවැනි කිසිවක් ලබා දීමට ඔබට නොහැක. කරුණාකර මේ සියල්ල ධර්මානුකූලව ඔබම විඳින්න. (IBS)

---

## කාලය සහ ජීවිතය...

*බිස්මිල්ලාහිර්රහ්මානිර්රහීම්........*

*කාලය මත සත්තකින්ම. මිනිසා තම ආයුෂ කාලය නිකරුනේ වියදම් කර නියත වශයෙන්ම පරාජිත මාර්ගයේ සිටින්නේය. එහෙත් කවුරුන්, විශ්වාසය තබා දැහැමි කාරනාවන්ද කර සත්‍යය කෙනෙකුට කෙනෙකු ඔවදන් දී (පාපයන් අතැහැර දැමීමෙහිද පින් ඇති දෑය කිරීමෙහිද, ඇති වන අමාරුකම විද දරා ගන්නා ලෙසටද, කෙනෙකුට කෙනෙක් ඔවදන් දෙමින් සිටින්නෝද) ඔවුන් හැර. (මොවුන් පරාජිත වූවේ නැත) [Quran; 103]*

ඉහතින් දක්වා ඇත්තේ ශුද්ධ වූ අල්කුර්ආන් හි වාක්‍ය තුනකින් සමන්විත කෙටි සූරාව කි. මෙය ඉතා කෙටි සූරාවක් වුවද මිනිස් ජීවිතයට අවශ්‍ය කරන ඉතා වැදගත් කරුණක් අවධාරණය කරයි. මෙහි මූලික වශයෙන්ම කාලය මත දිවුරා තිබීමෙන් පැහැදිලි වන්නේ කාලයෙහි ඇත්තා වූ වැදගත්කමය. කාලය මත ජීවිතය සකස් කර ගැනීමෙන් ජීවිතයේ අරමුණු සියල්ල ආයාසයකින් තොරව ජයග්‍රාහීව ගමන් කිරීමට හැකියාව ලැබේ. මෙය ශුද්ධ වූ අල් කුරාන් හි මිනිසා වෙනුවෙන් කරනු ලබන්නාවූ ඉතා වැදගත් මග පෙන්වීමකි.

අප ජීවත්වන මෙම කාලවකවානුව තුළ ජීවත් වන මිනිසුන් කාලය මත ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා උනන්දුවක් දක්වන්නේ දැයි සැක සහිතය. ජීවිතයේ සාර්ථකත්වය කුමක්ද යන්න නොසලකා දුවන්නන් වාලේ දුවමින් එකිනෙකා අතර තරගකාරී ස්වභාවයක් දක්වයි.

මිනිසුන් ලෙස ජීවත් වන්නා වූ අප දෛනික ජීවිතයේදී විවිධ ආකාර වූ දුක් වේදනා ප්‍රශ්න ගැටලු සමුදායකට මුහුණ දෙන්නේ මය. මෙම ප්‍රශ්න හමුවේ නොසැලී ජීවිතයට මුහුණදෙන්නේ කීයෙන් කී දෙනෙක් ද යන්න සිතා ගැනීමට අපහසු ය. මිනිසා ස්වභාවයෙන්ම වේදනාත්මක තත්ත්වයන් හට මුහුණ දෙන්නට කැමති නැත. හැමවිටම ප්‍රාර්ථනා කරන්නේ යහපත් ජීවිතයකි. ඉස්ලාම් ධර්මය ලොවට කියා දුන් අද්විතීය නායකයාණන් වන මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ජීවිතයෙහි පැවැත්ම පිළිබඳව උපදෙස් දෙනු ලබන්නේ මිනිස් ජීවිතයේ ඉවසීම තිබිය යුත්තේ කෙනෙකු විපතට පත් වන පළමු අවස්ථාවේම බවයි.

මුස්ලිම්වරයෙකුගේ විශ්වාසය ගොඩ නැඟෙන්නේ ඉවසීම නමැති මූලධර්මය පදනම් කොටගෙනය. මක්නිසාද ඉස්ලාමීය ඉගෙන්වීමට අනුව මිනිස් ජීවිතයේ හොඳ හා නරක සියල්ල සිදු වන්නේ මිනිසාගේ මැවුම්කාර වූ දෙවියන්ගේ කැමැත්ත මතය. මේ පිළිබඳව කිසිදු ප්‍රශ්න කිරීමක් මිනිසාට කළ නොහැකි නමුදු සර්වබලධාරී දෙවිඳාණන් කිසිවිටක කිසිම මිනිසෙකුට අසාධාරණයක් කරන්නේ නැත. මුස්ලිම්වරයකු ලෙස ජීවත් වන්නා වූ අයෙකු සිය ජීවිතයට පැමිණෙන සියලු බාධක හා අභියෝගයන්ට ඉවසීමෙන් යුක්තව මුහුණ දිය යුතුය.

අපගේ මුස්ලිම් සමාජය දෙස බලන විට වර්තමානයේ දී ඔවුන් කැමැති වන්නේ සුඛෝපභෝගී ජීවිත හා ප්‍රශ්න ගැටලුවලින් තොර ජීවිතයක ගමනාන්තයකි. යම් අවස්ථාවලදී උදාවන්නා වූ අවාසනාවන්ත සිදුවීම් දෙස ඔවුන් බලන්නේ එය වැරදි සහගත සිදුවීමක් ලෙසය. එයට සාධාරණීකරණය කිරීම සඳහා නොයෙකුත් උදාහරණ සපයමින් සිදුවීම් ඔස්සේ ප්‍රශ්න කරමින් ගමන් කරයි. ප්‍රශ්නය සංකීර්ණ වෙයි. බොහෝ විට දෙවියන් වහන්සෙගේ නියමය අමතක කරමින් ක්‍රියා කිරීම නිසා ජීවිතයෙහි දොරටුව සාතන්ට විවෘත කර ඇත. ඉස්ලාමීය ඉගෙන්වීමට අනුව කෙනෙකුට විපතක් පැමිණි විට "ඉන්නා ලිල්ලාහි ව ඉන්නා ඉලෛහි රාජිඋන්" යනුවෙන් පවසන ලෙස අල්-කුර්ආනය නියෝග කොට ඇතත් මෙය බොහෝ විට ප්‍රකාශ කරන්නේ කෙනෙක් මියගිය පසු වය. ඒත් විපතක් පැමිණි අවස්ථාවේදී මෙම දුආව කරමින් හා ඉවසීමෙන් යුතුව සලාතය ඉටු කරමින් අල්ලාහ්ගේ පිහිට පැතීම සිදු කළ යුතුය.

ඉස්ලාමීය ඉතිහාසයේ එන චරිත දෙස බලනවිට බොහෝ පරීක්ෂාවන්ට මුහුණදුන් නබිවරුන් අපට හමුවේ.

- ඉබ්‍රාහිම් නබිතුමා ගින්නෙන් පරීක්ෂාවට ලක්විය,
- යූසුෆ් නබිතුමා සහෝදරයන්ගෙ ද්වේෂයට ලක් වී පාළු ළිඳකට දමා පරික්ෂා කරන ලදී.
- අයූබ්(යොබ්) නබි තුමා දරුණු කුෂ්ඨ රෝගයකින් ගඩු හටගෙන තුවාලවල වේදනාවෙන් හා සියලු සම්පත් විනාශ වීමෙන් පරීක්ෂාවට ලක් කරන ලදී.
- යූනුස් නබි තුමා මාළුවෙකුගේ බඩ ඇතුළෙහි අන්ධකාරයෙහි පරීක්ෂණයට ලක් කරන ලදී.
- මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් කුසගින්නෙන්, යුද්ධමය ප්‍රශ්නවලින්, රෝග පීඩාවලින් පරීක්ෂාවට ලක්විය.

මේ සියල්ලෙහි දී ඔවුහු ඉවසීමෙන් යුක්තව ක්‍රියා කිරීම නිසා දෙවිදාණන් ගේ අරමුණ වූ ඍජු මග අවසන් කිරීමට හැකියාව ලැබිණි.

වර්තමාන සමාජයෙහි කිසිදු මුස්ලිම්වරයෙකු පරීක්ෂාවට මුහුණ දීමට කැමති නැත. නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් සහ සිය අනුගාමිකයන්

විසින් ඉස්ලාමීය ධර්මයේ උන්නතිය සඳහා අනුගමනය කළා වූ ක්‍රියා කලාපය හා කැපවීම මත ගොඩනැගුණු විවිධාකාර පරීක්ෂාවන් ඉවසීමෙන් යුතුව දරාගත් නිසා ඉස්ලාමය ලොව පුරා ව්‍යාප්ත විය. අද එය දේශනාවක් පමණි. වර්තමානයෙහි මුස්ලිම්වරුන් පුද්ගලික ලෙස හා සමාජයක් ලෙස අතීතයෙහි මුහුණ දුන්නා වූ පරීක්ෂණ වලට වඩා වෙනස් ආකාර පරීක්ෂාවලට මුහුණ දෙනු ඇත. මුස්ලිම්වරුන්ගේ අධික ධනවත් භාවය හා සමාජය වර්ධනය වීමේ ප්‍රවණතාවයන් මත අන්‍ය සමාජයන් තුළින් මුස්ලිම් සමාජයට පැන නැගෙන ප්‍රශ්න ගණනාවක් ම දක්නට ලැබේ.

ඉස්ලාම් ධර්මය පිළිබඳව අවබෝධයක් නොමැති පිරිස් මුස්ලිම් සමාජයට නායකත්වය දෙමින් ශුද්ධවූ අල්කුර්ආනයට පවා වැරදි අර්ථ කථනයන් ගොනුකරමින් කරනු ලබන ඉගැන්වීම් නිසා අද මුස්ලිම් සමාජය පරීක්ෂාවට ලක් වේ. එමෙන්ම ඉස්ලාමීය ආගමික ඉගැන්වීම පරස්පර ලෙස හුවා දක්වමින් මුස්ලිම් සමාජය කණ්ඩායම් වශයෙන් බෙදී යාම ද එක්තරා පරීක්ෂාවකි.

තවත් ආකාරයකින් කිවහොත් ධර්මයෙහි මුවාවෙන් යම් යම් කණ්ඩායම් ත්‍රස්තවාදී ක්‍රියාවන් සිදු කරනු ලබයි. මෙයද මුස්ලිම් සමාජය මුහුණ දෙන්නා වූ ගැටලුවකි. එමෙන්ම වර්තමානයෙහි මුස්ලිම් සමාජය තුළ නොයෙකුත් ගැටළු සහගත තත්වයන් විවිධාකාර ලෙස දැකිය හැකිය.

ඉහතින් දක්වන කරුණු දෙස මනාව බලා අධ්‍යයනය කොට මේ සියල්ල සමාජය තුළ සිදුවන විට අප ශක්තිමත් කරගත යුතු වන්නේ අල්ලාහ් කෙරෙහි තැබූ විශ්වාසයයි. විශ්වාසය ශක්තිමත් කර ගැනීමෙන් සියලු ප්‍රශ්නවලට මුහුණදීමට ධෛර්යය ගොඩනැගෙනු ඇත. පරීක්ෂාවන් සිදු වන විට මුස්ලිම්වරුන් ලෙස අප කළ යුතු වන්නේ සර්වබලධාරී දෙවිදානන්ගේ කරුණාව සහ දයාව බලාපොරොත්තු වෙමින් දුෂ්කර වූ පරීක්ෂාවන්ට මුහුණ දීම තුළින් ලැබෙන්නා වූ ආනිශංස අති මහත් බව විශ්වාස කිරීමයි. එමෙන්ම ශුද්ධ වූ අල් කුර්ආන්හි උගන්වන අල්ලාහ්ගේ වචනයට හා මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ ක්‍රියාකලාපයට අනුව ජීවිතය සකස් කොටගෙන සැබෑ ඉස්ලාමීය ඉගෙන්වීමට අනුගත වීමයි.

මේ සියල්ලට අවශ්‍ය ඉවසීම හා සැබෑ ඉස්ලාමීය ඉගෙන්වීම තේරුම් ගැනීම තුළින් කාලය මත දිවුරා ප්‍රකාශ කර තිබෙන "අලාභය", ජීවිතයෙන් ජය ගැනීමට හැකිවේ. (IBS)

---

## මිනිසාව මවා ඇත්තේ අරමුණකින් තොරව යැයි ඔබ සිතනවාද?

ඕනෑම නිර්මාණයක් පිටුපස යම් අරමුණක් තිබේ. උදාහරණයක් වශයෙන් පරිගණකයක්, බැකෝ යන්ත්‍රයක්, ඉදිකට්ටක්, නූලක් වැනි ඕනෑම දෙයක් සාදන්නේ යම් කිසි අරමුණක් ඉටු කිරීම සඳහාය. ඒවායින් එම අරමුණ ඉටු නොවේ නම් විනාශ කර දමනු ඇත. දෙවියන්ද අරමුණක් නොමැතිව කිසිම දෙයක් මවන්නේ නැත. දෙවියන් මිනිසාව සහ ජින් වර්ගයාව මවා ඇත්තේ දෙවියන්ව නැමදීම සඳහාය. (වෙනත් දේවල් වලට නැමදීම සඳහා නොවන බව මින් අදහස් කෙරේ). ඒ බව ඔහු විසින් පහළ කරනු ලැබූ දේව පණිවිඩයේ සඳහන් කොට ඇත. එම වැකිය පහත දැක්වේ.

*"මා ජින්වරුන්ව සහ මිනිසුන්ව මාව නැමදීමට මිස මැව්වේ නැත" (කුරානය 51:56).*

මෙම සමූහයන් දෙකින් ඒවා මවන ලද අරමුණු ඉටු නොවේ නම් ඒවා නිරයට දමන බව සඳහන් කොට ඇත. මිනිසා මැවූ මුල් අවස්ථාවේ දෙවියන් විසින් ලබා දෙන වගකීමක් භාර ගැනීමට මිනිසා එකග වූ බවත් එම අවස්ථාව ගැන අවසන් දිව්‍ය හෙළිදරව්වෙන් මතක් කර දීත් තිබේ. එම නිසා හරි වැරදි තේරුම් ගැනීමට හැකි මිනිසා කල යුත්තේ තම මැවුම්කරුව නිවැරදිව තේරුම් ගෙන ඔහුගේ අණට කීකරුව තමාගේ මෙලොව ජීවිතයේ අරමුණ සහ වගකීම තේරුම් අරගෙන ජීවත් වීම යි. එසේ නැතහොත් මිනිසාගේ උඩඟු කමට සිදු වන්නේ මරණයෙන් පසු නිරය තෝරාගැනීමට ය. එය මිනිසාගේම වරදින් සිදු කර ගන්නා දෙයකි.

මිහිපිට බොහෝ ජීවීන් ඇතත් මිනිසා එහි අද්විතීය ස්ථානයක් උසුලන්නේය. එම නිසා මිනිසාට සෙසු ජීවීන්ට මෙන් අරමුණක් නොමැතිව ජිවත් විය නොහැකිය. මිනිසාට පමණක් දහම විශේෂ කර පහළ කොට ඇත. එබැවින් මිනිසා එම දහම අනුව ජිවත් විය යුතුය. මිනිසා කෙසේ ජිවත් වුවත් අවසානයේදී දෙවියන් හමුවට යා යුතුව තිබේ. ඒ බව පහත දැක්වෙන කුර්ආන් වැකියේ සඳහන් කොට ඇත.

*"අපි නුඹලාව නිකමට මැව්වෙමු යැයිද, නියතව නුඹලා අප හමුවට හරවනු නොලබන්නේහු යැයිද සිතාගෙන සිටියෙහුද?" (කුරානය 23:115).*

ඉහත දැක්වෙන කුර්ආන් වැකිය අනුව මෙලොව ජිවත් වන සෑම ජීවියෙකුම නැවතත් තම මැවුම්කරු වෙත යා යුතුව තිබේ. එවිට ඔහු සෑම කෙනෙකුගෙන්ම ප්‍රශ්න කිරීමට නියමිතය. එම ප්‍රශ්න කිරීම්වලට නිසි පරිදි පිළිතුරු දීමෙන් පමණක් මරණයෙන් පසු ජිවිතය ජය ගැනීමට හැකි වනු ඇත. දෙවියන්ව ප්‍රතික්ෂේප කල අය එම දිනයේදී කාගේ පිහිට පතන්නේද? විශ්වය මැවූ තවත් දෙවි කෙනෙක් සිටිය හැකිද? මිනිසාට ලැබී ඇති දැනුම අනුව විශ්වයට එක් දෙවි කෙනෙකුට වඩා සිටිය නොහැකිය. එය විද්‍යාත්මක සත්‍යයකි. එසේ තිබියදී බොහෝ අය මරණයෙන් පසු ජීවිතයට සූදානම් වන්නේ නැත. ඔවුන්ගේ එකම අරමුණ මෙම ජීවිතයේදී උපරිම සතුටින් ගත කිරීම වේ. මේ නිසා ඔවුන් දෙවියන්ගේ නියෝග තුට්ටුවකටවත් ගණන් ගන්නේ නැත.

එසේත් නැත්නම් මේ භවයෙදි හෝ වෙන භවයකදී තම ආත්මය අහෝසි කර ගැනීමට උත්සහ ගැනීමටය. නමුත් දෙවියන් පවසන්නේ කිසිම ආත්මයක් තමන්ට උවමනා පරිදි අහෝසි හෝ විනාශ කර ගත නොහැකි බවය. මරණයෙන් පසු ජීවිතය සමග සැසඳීමේදී මෙලොව ජීවිතය අල්ප එකක් බව ඔවුන් තේරුම් ගන්නේ නම් එසේ නොකරනු ඇත. අවාසනාවකට මෙන් දෙවියන්ව විශ්වාස කරන අය පවා දහමින් දුරස්වී සිටිනු දැකිය හැකිය. එහි බැරෑරුම් කම ඔවුන් තේරුම් ගන්නා විට ප්‍රමාද වැඩිය. (FA)

# දෙවියන් සියල්ල දන්නේ නම් මිනිසාව පරීක්ෂා කරන්නේ ඇයි?

අල්ලාහ් (හෙවත් දෙවියන්) සියල්ල දන්නේ නම්, මිනිසාව පරික්ෂා නොකරම ස්වර්ගයට හෝ නිරයට දැමිය නොහැක්කේ ඇයිදැයි ඇතැම් අය ප්‍රශ්න කරන්නේය. ඇත්ත වශයෙන්ම කාලය මැවූ අල්ලාහ් කාලයෙන් සීමා නොවන අතර ඔහුට එවැනි දෙයක් කිරීම අසීරු කරුණක් ද නොවේ. අල්ලාහ්ගේ දැනුම කොතරම්ද කිවහොත් මිනිසා යමක් කිරීමට ප්‍රථමයෙන්ම මිනිසා කරන්ට යන දේවල් ගැන ඉතා නිවැරදිව දන්නේය. එම නිසා මිනිසාගේ දෛවය ගැන ඔහු කලින්ම ලියා හමාරය. එසේ කිරීමෙන් මිනිසාට කිසිම අසාධාරණයක් නොවන අතර එය අල්ලාහ්ගේ දැනුම හා සම්බන්ද කාරනාවකි. උදාහරණයක් වශයෙන් දක්ෂ ගුරුවරයෙකුට පන්තියේ සමත්වන සිසුන් කව්ද අසමත්වන සිසුන් කව්දැයි කලින්ම කිව හැකිය. ඒ බව ඔහු කලින්ම ලියා තැබීමෙන් එම සිසු සිසුවියන්ගේ විභාග ප්‍රතිපලවල කිසිම වෙනසක් සිදු වන්නේ නැත. එසේම ඇතැම් දරුවන් සමත් විමටත් ඇතැම් දරුවන් අසමත් වීමටත් එම ගුරුවරයාගේ සටහන හේතුවක් වන්නේද නැත. ඒ අකාරයටම දෙවියන් මිනිසාගේ දෛවය ලියා තැබීමෙන් මිනිසාට කිසිම අසාධාරණයක් සිදු කරන්නේ නැත.

මෙලොව ජීවිතයේදී මිනිසා මුහුණ දෙන පරීක්ෂාවකින් පසු ලැබෙන ස්වර්ගය හෝ නිරය ගැන මිනිසා අනිවාර්යයෙන්ම සෑහීමට පත්විය යුතුය. ඇයිද යත් එය ඔහු විසින්ම ලබා ගත් ප්‍රතිපල අනුව තීරණය කරනු ලබුවක් නිසාය. එසේම එම ප්‍රතිපල දෙස බලා දෙවියන්ට දොස් කීමටද නොහැකිය. ඇයිද යත් මිනිසා කරන දේවල් ගැන දෙවියන් කලින්ම දැනගෙන සිටියත් ඒවා මිනිසාගේම ක්‍රියාවන්ගෙන් ඔප්පු කොට පෙන්වා ඇති නිසාය.

ස්වර්ගයට හෝ නිරයට දැමීමට පෙර පරික්ෂා කිරීමේ තවත් වැදගත්කමක් තිබේ. එනම් මිනිසාව පරික්ෂා නොකර දෙවියන්ගේ දැනුම පදනම් කරගෙන එක් කොටසක් ස්වර්ගයටත් තවත් කොටසක් නිරයටත් දැමුවේ නම් ස්වර්ගය ලැබුණු අය සතුටට පත්වනු ඇති අතර නිරයට දැමු අය ඊට එරෙහි වනු ඇත. නිරයට දැමු අය පවසනු ඇත්තේ අවස්ථාවක් ලබා දුන්නේ නම් ඔවුන් පින් දහම් කොට

ස්වර්ගයට යන බවයි. ඒ අනුව බලන කල සෑම කෙනෙක්ම පරික්ෂා කොට බලා එහි ප්‍රතිපල අනුව ස්වර්ගයට හෝ නිරය ලබා දීම සාධාරණය.

මිනිසාට මෙලොවදී ලැබී ඇති පරීක්ෂාවන් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්ය. එම නිසා කිසිවෙකුට කොපි කිරීමෙන් සමත් වීමට නොහැකිය. ඒ අනුව සෑම කෙනෙක්ම දෙවියන්ගේ පරීක්ෂාවන්ට වෙන වෙනම මුහුණ දීමට නියමිතව තිබේ. නබිවරුන් පවා දෙවියන්ගේ පරීක්ෂාවන්ට මුහුණ දී ඇත.

මිනිසාට මරණය දක්වාම පරීක්ෂාවන් එක පිට එකක් පැමිණීමට නියමිතය. ඒවාට මුහුණ දිය යුතු අකාරයද දෙවියන් පහළ කල දහමින් පෙන්වා දී තිබේ. ඒ අනුව ප්‍රශ්න පත්‍රය සහ ඊට අවශ්‍ය පිළිතුරු මිනිසාට දැනටමත් ලබා දී අවසානය. මිනිසා කල යුතුව තිබෙන්නේ ඒවාට සරිලන පරිදි තමන්ව සූදානම් කර ගැනීම පමණි. එහෙත් බොහෝ අය එම පරීක්ෂාවන්ගෙන් අසමත් වන්නේ ඔවුන්ගේ උඩඟු කම නිසාය. එහි ඇති මූලිකම ප්‍රශ්නය දෙවියන්ව විශ්වාස කිරීම වේ. එහෙත් බොහෝ අය එම සරල ප්‍රශ්නයට පවා පිළිතුරු සැපයීමට අසමත්ව සිටිති. (FA)

---

## දෙවියන්ගේ දඬුවම් ප්‍රමාද වන්නේ ඇයි?

බොහෝ වැරදිකරුවන් යහතින් ජීවත්වීම දකින විට දහම ගැන නිසි අවබෝදයක් නොමැති කෙනෙකුට දෙවිකෙනෙක් සිටිනවාදැයි සැකයක් පහළ විය හැකිය. උදාහරනයක් වශයෙන් ඇතැම් පාලකයින් ජනතාව තලා පෙලා අල්ලස් සහ දූෂණයෙන් රට පාලනය කලත් ඔවුන්ට කිසිම දඬුවමක් ලැබෙන්නේ නැත. මේවා දකින විට දුර්වල මනසක් ඇති කෙනෙකුට දෙවියන් ගැන සැක පහළ විය හැකිය. මෙවැනි සිදුවීම ඇත ඉතිහාසයේ සිටම සිදුවී තිබේ. පාරාවෝ මීට හොඳම උදාහරණය වේ. ඔහු දෙවියන්ට අභියෝග කළේය. එහෙත් දෙවියන් ඔහු කෙරෙහි කරුණාව දැක්විය. ඔහුව නිවැරදි මාර්ගයට ගැනීම සඳහා නබිවරුන් දෙදෙනෙකුම යැව්වේය. එහෙත් පාරාවෝ ඉන් ප්‍රයෝජනයක් නොගත් බැවින් ඔහුව සහ ඔහුගේ සේනාව ජලයේ ගිලවා විනාශ කර දැම්මේය. නූහ් නබිතුමාගේ කාලයේදීද එසේම විය. ඔවුන් වැරදි කිරීමෙහි ස්ථීරවම සිටින විට ඔවුන් සියළුම

දෙනා විශාල ජන ගැල්මකින් විනාශ කළේය. කෙසේ වෙතත් දෙවියන්ගේ අරමුණ මිනිසා විනාශ කොට දඬුවම ලබා දීම නොවේ. ඔහු ඉතා කාරුණිකය. මේ නිසා මිනිසා කොපමණ වැරදි කලත් මරණයට පෙර යම් දවසක තමන්ව නිවැරදි කර ගැනීම සඳහා සෑම අවස්ථාවකම ලබා දී තිබේ.

මිනිසා සහ ජින්වරුන් දෙවියන්ගේ විශේෂ මැවීම් දෙකකි. ඔවුන්ට ස්වයං තීරණ ගැනීමට හැකිය. එම හැකියාව දේවදූතයින්ට පවා ලබා දී නොමැත. එම හේතුවෙන් මිනිසාට දෙවියන්ගේ අණ පිලිපැදීමෙන් දේවදූතයින්ට වඩා ශ්‍රේෂ්ඨ විය හැකිය. කෙසේ වෙතත් මිනිසාට එය කල හැක්කේ ඔහුට මෙලොවදී ලැබී ඇති පරීක්ෂාවන්ට සාර්ථකව මුහුණ දීමෙන් පමණි. එම නිසා මිනිසාගෙන් කුමන අකාරයේ වැරදි සිදු වුවත් ඒවා හදා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ. මිනිසා සහජයෙන්ම වැරදි කරන්නේය. ඒවාට එවෙලේම දඬුවම් කලේ නම් ඔහුගෙන් සිදු වන වැරදි හදා ගැනීමට අවස්තව නොලැබී යනු ඇත. එම නිසා මිනිසා කොපමණ වැරදි කලත් ඒවා නිවැරදි කර ගැනීම සඳහා අවස්ථාවක් ලෙස ඔහුගේ දඬුවම් එවෙලේම ලබා දෙන්නේ නැත.

*"අල්ලාහ් මිනිසුන්ගේ අපරාධ හේතුවෙන් (එම මොහොතේදීම) දඬුවම් කළහොත් (පොළව මත) එහා මෙහා වන කිසිම ප්‍රානියෙකුව ඉතිරි කරන්නේ නැත, එහෙත් ඔවුන්ට නියමිත කාල සීමාවක් දක්වා කල් දී තිබේ, නියමිත කාලය පැමිණි කල ඔවුන්ට එක් හෝරාවක් ඉදිරියට හෝ ආපස්සට යෑමට ලැබෙන්නේ නැත" (කුරානය 16:61).*

දෙවියන් සෑම දෙයක් ගැනම ඉතා හොඳින් නිරීක්ෂණය කරන්නේය. එය ඔහුගේ ගුණාංගයක් ද වේ. එහෙත් මහා කාරුණික දෙවියන් මිනිසාට මැරෙන මොහොත දක්වා ම ඔහු කරන වැරදි වලට සමාව ගැනීමට අවස්තාව ලබා දී තිබේ. එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම මිනිසා ලබා ඇති විශාලා වරමකි. එම වරමෙන් ප්‍රයෝජන නොගන්නේ නම් මොනතරම් අවාසනාවක්ද?

*"වැරදි කරුවන් කරන දේවල් ගැන අල්ලාහ් නොදැන සිටිනවා යැයි නොසිතන්න, එහෙත් ඔහු භීතියෙන් තිගැස්සී ඇස් උඩ යන එම දිනය දක්වා ඔවුන්ට අවකාශ ලබා දී තිබේ" (කුරානය 14:42).*

මෙම අවවාද වලින් ප්‍රයෝජන ලබන්නා මරණයෙන් පසු නිමක් නොමැති ජීවිතය ජය ගනු ඇත. තවද, ඊට පිටු පාන අය දෙවියන්ගේ දඬුවමට ලක් වනු ඇත. කෙසේ වෙතත් කෙනෙක් දෙවියන්ව විශ්වාස කල යුතු අන්දමට විශ්වාස නොකර තමන් නිවැරදි මාර්ගයේ සිටින්නේ යැයි උපකල්පනය කරන්නේ නම් ඔහු කරන ලොකුම වැරැද්ද එයයි. උදාහරණයක් වශයෙන් දෙවියන් වෙනුවට සාන්තු වරයෙකුව හෝ ඔහුගේ ප්‍රතිමාවක් හෝ දෙවියන් ලෙස සලකා ඔහුට වැඳුම් පිදුම් කිරීම පෙන්වා දිය හැකිය. එවැනි කෙනෙක් නැවත හරි මාර්ගයට පැමිණීම ඉතා විරලය. එහෙත් බේබද්දෙක් හෝ වෙනත් වැරදි කල කෙනෙක් යම් දවසක තමන් කරන වැරදි වලින් මිදී නිවැරදි මඟ තෝරාගැනීම ගැන සිතා බැලිය හැකිය. තවද දෙවියන්ව විශ්වාස කරන කෙනෙක් දෙවියන්ට සමානයන් තබන්නේ නම් එයද ඔහු කරන විශාල වරදකි. ඇයිද යත් එවැනි අයට මරණයෙන් පසු සමාවක් නොලැබෙන බව කුරානයේ ඉතා පැහැදිලිව සඳහන් කොට ඇති නිසාය. එම අවස්ථාවට මුහුණ දුන් පසු නැවත හැරීමක් නොමැත. මෙවැනි අයද නැවත නිවැරදි මාර්ගය අත්කර ගැනීම ඉතා විරලය. මේ නිසා මිනිසා සත්‍යය දහම සොයා දැනගෙන එය පිළිපැදිය යුතුව තිබේ.

*"නුඹගේ අධිපති දෙවියන් අධික ලෙස ක්ෂමාකරන්නාය; කරුනාවන්තයාය. ඔහු, ඔවුන් උපයාගත් දේවල් සඳහා දඬුවම් කරන්නේ නම් නියත වශයෙන්ම ඔවුනට වේදනාව ඉක්මන් කරත හැකිය. එහෙත් ඒ සඳහා ඔවුන්ට යැයි ප්‍රතිඥා දෙනු ලැබූ වෙලාවක් නියම කොට ඇත. ඉන් ඔබ්බට ඔවුන් සඳහා ගැලවුමක් නැත" (කුරානය 18:58).*

මිනිසාට මෙලොවදී ලැබී ඇත්තේ එක් අවස්ථාවක් පමණි. එය හරියාකාරව තේරුම් ගැනීම මිනිසාට පැවරී ඇති විශාල වගකීමකි. එහෙත් බොහෝ අය ඒ ගැන සිතීමට වඩා ලෞකික ජීවිතයේ සැපත වෙනුවෙන් කාලය ගත කිරීම කොතරම් මුග්ධ කමක් විය හැකිද? තවද බොහෝ අය පින් දහම් කරති. එහෙත් ඔවුන් කරන පින් දහම් දෙවියන් විසින් පෙන්වා දෙන ලද ඒවා දැයි සොයා බැලීමක් නැත. බොහෝ විට ඒවා මිනිසාගේ සිතුම් පැතුම් අනුව නිර්මාණය කල ඒවාය. ඒවා තේරුම් ගෙන නිවැරදි මාර්ගයට ප්‍රවේශ වීම සඳහා දෙවියන් මිනිසාට දෙන දඬුවම් ප්‍රමාද කිරීම ප්‍රයෝජනයට ගත යුතුව ඇත. නැතහොත් මිනිසාට ලැබී

ඇති අනගි අවස්ථාව ඔවුන්ගෙන් ගිලිහී යනු ඇත. එහි ප්‍රතිපලය වන්නේ දෙවියන් ප්‍රතිඥා දී ඇති ස්වර්ගය නොලැබී යාමයි.

---

## විශ්වය සහ සොබාදහම සම්බන්ධව

## සොබාදහම සහ දෙවියන් මිනිසාට දුන් වරප්‍රසාද.

ස්වභාවධර්මය යනු කුමක්දැයි බොහෝ දෙනෙකුට නිසි අවබෝධයක් නොමැත. මෙම ලිපිය ඔබට එය වඩා හොඳින් තේරුම් ගැනීමට අවස්ථාව ලබා දෙනු ඇත.

පෙළ ගැස්ම

1. විශ්වය (සොබාදහම) ආරම්භයට බලපෑ හේතුව පැහැදිළි කිරීම
2. විශ්වය නිර්මාණය කළ ආකාරය පැහැදිළි කිරීම
3. මිනිසාව නිර්මාණය කළ ආකාරය පැහැදිළි කිරීම
4. දෙවිඳුන් මිනිසාට සූර්යයා, චන්ද්‍රයා සහ තාරකා මගින් ලබා දුන් වරප්‍රසාද
5. අපට ඉහලින් සමීපව ඇති අහසින් දුන් වරප්‍රසාද
6. වලාකුළු, වැස්ස සහ ජලය මගින් දුන් වරප්‍රසාද
7. සුලඟ මගින් ලබා දුන් වරප්‍රසාද
8. පොලොවෙන් ලබා දුන් වරප්‍රසාද
9. ශාක සහ භෝග වෙතින් ලබා දුන් වරප්‍රසාද
10. ආහාර ලෙස මිනිසාට දුන් වරප්‍රසාද
11. සතුන් හරහා ලබා දුන් වරප්‍රසාද
12. මුහුදින් ලබා දුන් වරප්‍රසාද
13. ගිංදර මගින් ලබා දුන් වරප්‍රසාද කිහිපයක්
14. ඇඳුම්, වාසස්ථාන, භාණ්ඩ නිපදවීම වැනි වරප්‍රසාද

**1. විශ්වය (සොබාදහම) ආරම්භයට බලපෑ හේතුව පැහැදිළි කිරීම**

අප සිටින ලෝකයද ඇතුළුව විශ්වයන් සහ ජීවයන්ට ස්වභාවධර්මය හෝ සොබාදහම යන වචනය භාවිතා කරන අපි හැමෝටම ඒ සම්බන්ධයෙන් පහත ආකාරයේ සාධාරණ ප්‍රශ්න කිහිපයක් මතු වෙයි.

1) කාලයත් අවකාශයත් ඒ අතර කිසිවකුත් නැති අවස්ථාවේ (එනම්, විශ්වයන් සහ ජීවයන් ආදී මේවා කිසිවක් නොතිබුනු තත්වයක සිට) ඒවා "අහඹු ලෙස, (ඉබේ) ආරම්භ වෙන්න පටන් ගත්තාද?"
2) සැලසුම්කරුවෙක්, සැපයුම්කරුවෙක් නොමැතිව ස්වභාවධර්මය ඉබේ ස්වයං පෝෂිතවී, ස්වයං සැලසුම්සහගතවී, ස්වයං නිර්මාණයවී, ස්වයං පාලනයවී, පසුව එය ස්වයංවම විනාශ වෙනවාද? එනම්, සොබාදහම "(ආරම්භයක් - අවසානයක් සහිත) අත්භූත බලවේගයක්ද?"
3) (නැත්නම්), සොබාදහමත් එහි ඇති ජීවීනුත් "කිසියම් හෝ නිර්මාණකරුවකුගේ කුමණ හෝ ආකාරයක නිර්මාණයක්ද?"

ඉහත (1) සහ (2) සමග මෙය ලියන මට එකඟ වීමට නොහැක. මම බෞද්ධ දේශනා වලින් අසා ඇති ආකාරයට අනුව අවිද්‍යාව හා, පසුව තෘෂ්ණාව ආදිය මගින් සිත ඇති වීමත්, සිත මගින් ලෝක ඇතිවීමත් ආදීය සළකා බැලුවත් අවම තරමින් අවිද්‍යාව ආරම්භ වීමටත් කාලයත් හා අවකාශයත් ඊටත් අමතරව හේතුවකුත් තිබිය යුතුයි.

**කෙසේ නමුත්, "ඇත්තක් ලෙස හෝ මායාවක් ලෙස හෝ පවතින කුමණ හෝ දෙයක ආරම්භයක් සිදුවී ඇත්නම් එම ආරම්භයට හේතුවක් තිබිය යුතුයි."**

අප කොපමන දුරකට ආපස්සට ගිහින් සළකා බැලුවත් අපට අවසානයේ නතර විය යුතු තැනක් හමුවෙනවා. එය තමයි ආරම්භ වූ දැයෙහි හේතුව. "එම හේතුව-ආරම්භයක් (එනම් උපතක්/ඇතිවීමක්) නැති සදාකල් පවතින්නක් විය යුතුයි".

මෙම තර්කය සමග අවසානයේ පහත සදහන් කුරාන් වැකි සමග අපට එකඟ විය හැක. එනම්, ඇත්තක් ලෙස හෝ මායාවක් ලෙස හෝ පවතින සොබාදහම කුමණ හෝ ආකාරයක සැලසුම්සහගත නිර්මාණයක් බවය.

සොබාදහමට අයිතිවාසිකම් කියමින් ඉදිරිපත්කර ඇති පහත වැකි වලින් එය මනාව තහවුරු කර ගත හැකි යැයි මම විශ්වාස කරමි.

එම වැකි සරළව පෙනුනත් ඒවා තුල බොහෝමයක් විද්‍යාත්මක හෙළිදරව්වන්ද අන්තර්ගතය. ඒවා ගැඹුරින් අධ්‍යයනය කරන තරමටම එම වැකි වල වටිනාකම තව තවත් වැඩි වෙනු දැකිය හැක.

ඔබද මෙම වැකි සියල්ල කෙරෙහි අවධානය යොමුකර සත්‍යය වටහා ගන්න. එවිට ඔබ සැබෑ ලෙසටම සොභාදහම හදුනාගෙන, සැබෑ ලෙසටම එහි ආශ්වාදය ලබමින්, සැබෑ ලෙසටම සොබාදහමට ආදරය කරාවි. සොබාදහමේ හිමිකරු විසින් අපට ලබා දී ඇති වරප්‍රසාදයන් ගැන හොඳ පැහැදීමක් ඇති වේවි. ඔබ සොබාදහමේ හිමිකරුට හදවතින්ම ස්තූති කරාවි.

මෙය සමග "සොබාදහමේ දහම සහ මිනිසාගේ දහම නිවැරදිව හඳුනා ගනිමු" යන ලිපියත් කියවන්න.

පහතින් දැක්වෙන්නේ ශුද්ධ වූ අල් කුර්ආන් හි සඳහන් වැකි එකතුවකි.

**විශ්වයේ සහ මිනිසාගේ නිර්මාණය ගැන හැඳින්වීමක්**

*ශුද්ධ වූ කුරානය වන මෙය ධර්ම පුස්තකයයි. මෙහි කිසිම සැකයක් නැත. භය භක්තිකයින්ට (මෙය) ඍජු මාර්ගය පෙන්වන්නේය. (2:2)*

*මිනිසුන්ට හොඳ වැටහීමක් ලබා ගැනීම පිනිසම මෙම කුරානය නියත වශයෙන්ම අපි ඉතාමත් පහසු කර ඇත්තෙමු. එබැවින් (මෙමඟින්) හොඳ වැටහීමක් ලබන්නන් කවුරුන් හෝ ඇත් ද? (54:17)*

*අහස් හිද භූමියෙහිද, ඔවුන්ට ඉදිරියෙන්ද පසුපසින්ද, ඇති දැය ඔවුන් අවධානය කර බැලුවේ නැද්ද?; (34:9)*

*ඒවා කිසිවක් නොමැතිව තමන් විසින්ම ඇති කළෙහුද? නැතහොත් මොවුන්, තමන්ට තමන්ම නිර්මාණය කර ගත්තෙහුද? නැතහොත් අහස්ද භූමියද ඔවුන් නිර්මාණය කළෙහුද? නැත. මේ සියල්ල නිර්මාණය කළ අය දෙවියන්ය; (52:35,36)*

*(කිසිවෙකුගේ උදව්වක් නොමැතිව) අපගේ ශක්තිය මගින් අහස (විශ්වය) නිර්මාණය කළෙමු. නියත වශයෙන්ම අපි (එය ඔවුන්ගේ බුද්ධියට හසු නොවන සේ) අති විශාලවත් අන්දමට තබා ඇත්තෙමු. (ඇත්ත වශයෙන්ම, අපි එය පුළුල් කරන්නෙමු." (51:47)*

*අහස් හා භූමියෙහි පාලනය අල්ලාහ්ටම අයත්ය. සියල්ල කෙරෙහි අල්ලාහ් බලසම්පන්නය. (3:189)*

*නියත වශයෙන්ම අපි සෑම වස්තුවක්ම (නියමිත්) ප්‍රමාණයට අනුවම නිර්මාණය කර ඇත්තෙමු. (54:49)*

*අහසේ සිට භූමිය දක්වා ඇති සෑම කාරණාවක්ම ඔහුම පිළිවෙලකට කරන්නේය. (සෑම දැයකම) අවසානයද (ඔබගේ) ගනනයට අනුව වසර දහසකට සම වන එක් දිනකදී ඔහු වෙතම යනු ඇත. (32:5)*

*ආරම්භයේදී එකට එක්කාසු වී තිබුණු අහස්ද භූමියද අපිම වෙන්කර තැබුවෙමු යන්නද, පණ ඇති සෑම දැයක්ම ජලයෙන් උත්පාදනය කළෙමු යන්නද, මෙම ප්‍රතික්ෂේප කරන්නන් අවධානය කළ යුතු නොවේද? (මෙය ඔවුන් විශ්වාස නොකරන්නෙහුද?) (21:30)*

*පසුව දුමාරයක් වශයෙන් තිබූ අහස දෙසට හැරී (එය උත්පාදනය කර) එයද භූමියද දෙස බලා "ඔබ කැමති වුවද, අකැමැති වුවද (අවනත වී මා වෙත) පැමිනෙණු" යයි පැවසෙඖවේය. එයට ඒවා "(මෙන්න! අපි කැමැත්තෙන්ම පැමිණියෙමු" යයි පැවසුවේය. (41:11)*

*පසුව ඔහු ඒවා දින දෙකකදී අහස් හතක් වශයෙන් සැලසුම් කර, සෑම අහසකටම නියමිත විවිධ යුතුකම් දැනුම් දුන්නේය. පසුව (මෙතරම්ම් දැයක් කළ) අපිම (භූමියට සමීපයෙන්) පහතින්ම ඇති අහසෙහි (තාරකා නම් වූ) පහන් මගින් අලංකාරවත් කර. (එය) ආරක්ෂා සහිතවද පත් කළෙමු. මේ සියල්ල. (සියල්ලන්ටම) බලසම්පන්නයෙකු හා (සියල්ල) හොඳින් දන්නෙකු (වන අප)ගේම සැලසුමකි. (41:12)*

*ඔහුම (තම) නියෝජිතයින් වශයෙන් භූමියෙහි ඔබව පත් කර ඇත්තේය. තවද ඔබගෙන් සමහරෙකුව අනිත් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමගින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේදැයි) ඔබව පරීක්ෂා කරන්නේය; (6:165)*

*(මිනිසුණේ!) "අහස්හිද, භූමියෙහිද, ඇති දැය නියත වශයෙන්ම දෙවියන් ඔබට වසඟ කර දී ඇත්තේය" යන්නද, ඔහු තම වරප්‍රසාදයන් ගුප්තවද, ප්‍රසිද්ධියේද, ඔබ කෙරෙහි පහළ කර ඇත්තේය යන්නද, ඔබ දුටුවේ නැද්ද? මේ සියල්ල මෙසේ තිබියදී මිනිසුන්ගෙන් සමහරෙක් අධ්‍යාපන දැනුම හෝ තර්කානුකූල සෘජු මාර්ගය හෝ ආලෝකමත් ධර්ම ග්‍රන්ථයෙහි (කුරාන්හී) සාධකයන් හෝ නොමැතිව අල්ලාහ් (දෙවියන්) ගැන (නිකරුණේ) තර්ක කරන්නාහ. (31:20)*

*එම අල්ලාහ්ම උත්පාදකයාය. (ඔහුම උත්පාදනයන් සැලසුම් කරන්නේය). හැඩරුව නිර්මාණය කරන්නාය. ඔහුට වෙනත් අලංකාරවත් ශුද්ධ වූ නාමයන් බොහෝමයක් ඇත්තේය. (59:24)*

*(එබැවින් නබියේ!) මෙතරම් දුරට දැනුම් දුන්) පසුවත් ඔවුන් (විශ්වාස නොකර) ප්‍රතික්ෂේප කළහොත් ඔබ මෙසේ පවසනු: "ආද්, සමූද් (නැමැති ජනතාවන්ට) ඇති වූ හෙණ හඬ වැනි හෙණ හඬ ක්ම, මා ඔබට බිය ගන්වා අනතුරු අඟවන්නෙමි". (41:13)*

*අල්ලාහ්ම ඔබට භූමිය වාසස්ථානයක් බවටද, අහස වියනක් බවටද පත් කර, ඔබව නිර්මාණය කර, අලංකාරවත් හැඩරුව ඇතිවද ඔබව පත් කලේය. තවද ඔහුම ඔබට උසස් ආහාරයන්ද ලබා දෙන්නේය. මෙම අල්ලාහ්ම ඔබගේ දෙවියන්ය. (සකල) ලෝකයන්හී දෙවියන් වන අල්ලාහ් භාග්‍යය වන්තයෙකි. (40:64)*

**2. විශ්වය සහ අප සිටින භූමිය නිර්මාණය කිරීම සම්බන්ධව**

*නියත වශයෙන්ම ඔබගේ දෙවියන් වන අල්ලාහ් අහස්ද, භූමියද දින හයකින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජධානිය ස්ථාවර කර තැබුවේය. ඔහුම රාත්‍රියෙන් දහවල වසා දමන්නේය. (දහවලෙන් රාත්‍රිය වසා දමන්නේය). එය*

*ඉතාමත් තීව්‍ර වශයෙන්ම එකකට පිටුපසින් එකක් වශයෙන් පිළිවෙලින් සිදුවෙමින් පවතින්නේය. සූර්යයාද, චන්ද්‍රයාද, තාරකාවන්ද ඔහුගේ නියෝගයන්ට ඇතුළත් වන්නේය. උත්පාදනයන්ද, එහි පාලනයද ඔහුටම අයත් දැය නොවේද? සකළ ලෝකයන්ම උත්පාදනය කර, පෝෂනය කර, සංවර්ධනය කරන අල්ලාහ් ඉමහත් භාග්‍යවන්තයෙකි. (7:54)*

*අහස් හා භූමිය උත්පාදනයෙහිද, රාත්‍රිය හා දහවලේ වෙනස් වීමෙහිද බුද්ධිමතුන්ට නියත වශයෙන්ම බොහෝ සාදකයන් ඇත. (3:190)*

*ඔහුම අහස්ද භූමියද පෙර නිදසුනක් නොමැතිව උත්පාදනය කළ කෙනෙකි. (ඔහු කුමක් හෝ උත්පාදනය කිරීමට අදහස් කර), තීරණය කළහොත් "වනු" යැයි කීම පමණකින්ම එවෙලේම එය සිදුවන්නේය. (2:117)*

*අහස් හතක්ද, ඒවා මෙන් භූමියද අල්ලාහ්ම උත්පාදනය කළේය. ඒවා අතර (දිනපතා සිදුවිය හැකි සියළු කාරණාවන් ගැන වූ) නියෝගයන් පහළ කරමින්ම සිටින්නේය; (65:12)*

*ඔහුම අහස් හතම එක පිට එකක් වශයෙන් නිර්මානය කර ඇත්තේය. (මිනිසාණෙනි!) රහ්මාන්ගේ උත්පාදනයන්හී ඔබ කිසිම අඩුපාඩුකමක් නොදකින්නෙහිය. නැවත්ත් (එය අවධානය කර) බලනු. (එහි) කිසිම භේදයක් ඔබ දකින්නෙහිද? (නැවත) නැවතත් දෙවරක් බලනු. මෙසේ ඔබ කොතරම් වාර ගනනක් හාර හාරා බැලුවද, බැල්මම දුබලව ව්‍යාකූල වී (ඔබ වෙත) ආපසු හැරෙනු ඇත. (76:4)*

*(මිනිසුනේ!) අපි මෙසේ ඔබව පමණක්ද උත්පාදනය කර ඇත්තේ? නියත වශයෙන්ම ඔබට ඉහලින් ඇති අහස් හතද අපිම උත්පාදනය කළෙමු. ඒවා සෑම එකකම ඔබ වැනි උත්පාදනයන් ඇත්තේය. (මේවා උත්පාදනය කර ඇති අතර) මෙම උත්පාදනයන්ට (අවශ්‍යය දැය) ගැන අපි නොසැලකිළිමත් නොවූයෙමු. (23:17)*

*ඔහුම භූමියෙහි ඇති සියල්ල ඔබ වෙනුවෙන් උත්පාදනය කළේය. තවද ඔහු අහස උත්පාදනය කිරීමට අදහස් කළ (අවස්ථාවේ) ඒවා අහස් හතක් වශයෙන්ද නිර්මාණය කළේය. (2:29)*

*වැඩි විස්තර සඳහා "දෙවියන්ගේ නිර්මාණ: විශ්වය සහ ඉන් ඔබ්බට" ලිපිය බලන්න.*

***3. මිනිසාව නිර්මාණය කළ ආකාරය පැහැදිලි කිරීම***

*ඔහුම ඔබව උත්පාදනය කළ අයයි. (එසේ තිබියදී) ඔහුව ප්‍රතික්ෂේප කරන අයද ඔබගෙන් ඇත. (ඔහුව) විශ්වාස කරන අයද ඔබගෙන් ඇත. ඔබ කරන දෑය අල්ලාහ් අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන් සිටින්නේය. (64:2)*

*ඇතට පනිමින් ඉකුත් වන එක් ජල බිඳක් මගින්ම (මිනිසාව) උත්පාදනය කරණු ලැබුවේය. එය කොඳු ඇටවලටද, ඉල ඇට වලටද මධ්‍යයෙන් ඉකුත් වන්නේය. (86:6,7)*

*ජීවීන් සෑම එකක්ම අල්ලාහ් ජලය මගින්ම උත්පාදාය කර ඇත්තේය. ඒවායින් සමහරක් තම උදරයෙන් (නයින් මෙන්) බඩ ගාමින් යන්නේය. ඒවායෙන් (වෙනත්) සමහරක් කකුල් දෙකෙන් ගමන් කරන්නාහ. ඒවායෙන් (තවත්) සමහරක් කකුල් හතරෙන් ගමන් කරන්නාහ. (මෙසේ) අල්ලාහ් තමන් අදහස් කරන දෑය (කැමති ආකාරයට) උත්පාදනය කරන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් සියල්ල කෙරෙහි බලසම්පන්නය. (24:45) ආදම්ගේ පරම්පරාවේ දරුවන්ව නියත වශයෙන්ම අපි ගෞරව කළෙමු. වෙරළෙහි වාහන මතද මුහුදෙහි නැව් මතද අපිම ඔහුව උසුළාගෙන යාමට සලස්වන්නෙමු. හොඳ ආහාරද අපිම ඔවුන්ට ලබා දෙන්නෙමු. අපි උත්පාදනය කළ (වෙනත් ජීවීන්ගෙන්) අපි ඔවුන්ව උසස් කර ඇත්තෙමු. (17:70)*

*ඔහුම මිනිසාට (පැහැදිලිව) කථා කිරීමට ඉගැන්වූයේය. (55:4) ඔහුම පෑනක් මගින් (ලිවීමට) ඉගැන්වූවේය. තවද, මිනිසා නොදන්නා සියල්ල ඔහුට උගන්වා දෙන්නේය. (96:4,5) බැලිය හැකි ඇස් දෙකක්ම අපි ඔහුට ලබා දුන්නේ නැද්ද?*

*එසේ තිබියදී සත්‍යය ඔහු දුටුවේ නැත. දිවක්ද, තොල් දෙකක්ද (අපි ඔහුට ලබා දුන්නේ නැද්ද?). ඒවා ඉබේම ඔහු අත් කර ගත්තේද? නැත. (90:8,9)*

පහත සඳහන් ලිපි කියවන්න

- පළමු මිනිසා- ආදම්(අ.ස)ව නිර්මාණය කිරීම
- මිනිසාව පළමුවෙන්ම මැවීමේ සිට ඔහුගේ අවසානය දක්වා දෙවිඳුන් පවසා ඇති කරුණු

*අල්ලාහ්ගේ වරප්‍රසාදයන් ඔබ ගණනය කළහොත්, ඒවා ඔබ විසින් ගණන් කළ නොහැක. නියත වශයෙන්ම අල්ලාහ් ඉතාමත් ක්ෂමා කරන්නෙකු හා ඉමහත් දයාබරවන්තයෙකුද වශයෙන් සිටින්නාහ. (16:18)*

[මෙය වටහා ගැනීමට අපගේ පෘතුවිය සහ අඟහරු වැනි වෙනත් ග්‍රහ ලෝකයක් සංසන්දනය කර බලන්න. ඉන් පසු අපගේ ලෝකය සහ දෙවිඳුන් අපට දීමට පොරොන්දු වී ඇති ස්වර්ගය සමග සසඳා බලන්න]

**4. සූර්යයා, චන්ද්‍රයා සහ තාරකා මගින් ලබා දුන් වරප්‍රසාද කිහිපයක්**

*නියත වශයෙන්ම අපි පහතින්ම ඇති අහස පහන් (තාරකා) මගින් (භූමියෙහි සිටින්නන්ට) අලංකාරවත් කර තැබුවෙමු; (67:5)*

*ඔහුම (සූර්යයා) පායන්නට සලස්වන්නෙකි. ඔහුම (ඔබව නිදන්ට සලස්වා ඔබ) සුවය ලබා ගැනීම සඳහා රාත්‍රිය ඇති කරන්නේය. ඔබ (කාලයේ) ගණනය දැන ගැනීම සඳහා සූර්යයා වද චන්ද්‍රයාවද ඇති කළේය. (6:96)*

*ඔහුම සූර්යයා දීප්තිම ආලෝකයක් වශයෙන්ද්, චන්ද්‍රයා (අලංකාරවත්) ආලෝකය ලබා දෙන්නක් බවටද පත්කර අවුරුදු සංඛ්‍යාවද, මාසයන්හී ගණනයද ඔබ දැන ගැනීම පිණිස, (චන්ද්‍රයා වන) එයට (මාරුවෙන් මාරුවට පැමිණිය හැකි) අවස්ථාවන්ද මනක්කල්පිත කළේය. සත්‍යය වූ නියමිත කාරණාවක් නොමැතිව මේවා අල්ලාහ් උත්පාදනය කළේ නැත. දැනගත හැකි ජනතාව වෙනුවෙන් (තම බලසම්පන්නකමට අයත්) සාධකයන් (මෙසේ) විවරණය කරන්නේය. (10:5)*

*තවද, (දිශාවන් දැනුම් දිය හැකි) සළකුණු මගින්ද, තාරකාවන් (නිර්මාණය කර තැබීම) මගින්ද (සංචාරකයින් වන) ඔවුන් මාර්ගය දැන ගන්නාහ. (16:16)*

*ඔබ වෙනුවෙන් තාරකාවන් උත්පාදනය කළේද ඔහුමය. ගොඩබිම්බෙහිද, මුහුදෙහිද ඇති අන්ධකාරයන්හී ඒවා මගින් ඔබ මාර්ගය දැන යන්නෙහුය. (6.97)*

*ඔහුම රාත්‍රියද, දහවලද (ඇති කළේය). සූර්යයාද චන්ද්‍රයාද උත්පාදනය කළේය. (මේවා තමන්ගේ සීමාවන් තුළ) පිහිනා යන්නේය. (21:33)*

*සූර්යයා චන්ද්‍රයාට ලඟා විය නොහැක. රත්‍රිය දහවල පසු කරන්නට නොහැක. (මෙසේම ග්‍රහයන්ද, තාරකාවන්ද) සෑම එකක්ම (තමන්ගේ) සීමා වටයන් තුල පිහිනා යන්නේය. (36:40)*

*(වියළි නැවී) ගිය පරණ ඉඳි අත්තක් මෙන් (තිබී පූර්ණ සඳක් වශයෙන්) පත්වන තුරු චන්ද්‍රයාට අපි හැඩ රූ ගනනාවක් ඇති කර ඇත්තෙමු; (36:39)*

*(නබියේ!) ඔබගේ දෙවියන් සෙවණැල්ල කෙසේ අඩු කරන්නේද, කෙසේ වැඩි කරන්නේද යන්න ඔබ අවධානය කළේ නැද්ද? ඔහු අදහස්කර තිබුණේ නම්, එය ස්ථිරව තිබීමට සැළැස්විය හැක. සූර්යයාව චන්ද්‍රයා ඉදිරියෙන් අපිම පත් කළෙමු. (25:45)*

*(නබියේ! ඔබ ඔවුන්ට) අහස්ද, භූමියද උත්පාදනය කර සූර්යයාද, චන්ද්‍රයාද (තමන්ගේ සැලැස්මට අනුව ගමන් කරන මෙන් යටහත් කර) තැබුවේ කව්ද'?යි ඔබ ඔවුන්ගෙන් විමසන්නේ නම්, දෙවියන් (අල්ලාහ්) යැයි ඔවුන් නියත වශයෙන්ම පවසනු ඇත. එසේ නම් ඔවුන් (අපගෙන් ඈත් වී) කොහේ නම් දුවන්නෙහුද? (29:61)*

**5. අපට ඉහලින් සමීපව ඇති අහසින් මිනිසාට දෙන වරප්‍රසාද කිහිපයක්**

*ඔහුම ඔබ වෙනුවෙන් භූමිය වාසස්ථානයක් බවටද, අහස වියණක් බවටද නිර්මාණය කර, වලාකුළෙන් වර්ෂාව වසින්නට සලස්වා, එමගින් ඔබට ආහාර වශයෙන් ගත හැකි පළතුරු වර්ගද ඔබට ඉකුත් කරන්නේය. එබැවින් (මේ සියල්ල) දැනගෙන අල්ලාහ්ට (කිසිම) සමානයක් ඇති නොකරනු. (2.22)*

*අහස් කුළුනු නොමැතිව ඔසවන ලද්දේ අල්ලාහ්ය. එය ඔබ (ඔබගේ දෑස් වලින්) දකින්නෙහුය; ඔහුම සූර්යයාද චන්ද්‍රයාද තම පාලනය යටතේ තබා ඇත්තේය, (මේවා) සෑම දැයක්ම (ඒවාට) නියමිත කාල පරාසයට අනුව ගමන් කරමින් සිටින්නේය, ඒවායේ සියලු කාරණාවන්ද ඔහුම සැලසුම් කරන්නේය; (13:2)*

*ඔබට බියද, ලාබයද ලබා දිය හැකි විදුලිය ඔහුම ඔබ ඉදිරියේ බැබලීමට සලස්වන්නේය. (වැස්ස, සුළඟ) ඝන වලාකුළුද ඔහුම ඉකුත් කරන්නේය. (12:12)*

*හෙණ හඬද ඔහුගේ ප්‍රශංසාව ගායනා කරන්නේය; ඔහුම හෙණ වැදීමට සලස්වා එමඟින් ඔහු අදහස් කරන අයට පහර දෙන්නේය; (13:13)*

**6. වලාකුළු, වැස්ස සහ ජලය මගින් මිනිසාට දෙන වරප්‍රසාද කිහිපයක්**

*ඔබ බොන වතුර අවධානය කළෙහුද? වලාකුළෙන් ඔබ එය වසින්නට සලස්වන්නෙහුද? නැතහොත් අපි වසින්නට සලස්සන්නෙමුද? (56:68,69)*

*මැරී ගිය භූමියට එමගින් අපි ජීවය ලබා දී අපගේ උත්පාදකයන්ගෙන් වූ එළු, ගව, ඔටුවන් වැනි සතුන්ටද, බොහෝ මිනිසුන්ටද එය පානය කිරීමට සලස්වන්නෙමු. (25:49)*

*අහස ආරක්ෂා සහිත උඩුවියනක් මෙන්ද අපි නිර්මාණය කළෙමු. (මෙසේ තිබියදී) ඒවායේ ඇති සාදකයන් ඔවුන් ප්‍රතික්ශේප කරන්නාහ. (21:32)*

දෙවියන්ගේ නිර්මාණ: ජලය සම්බන්ධව ඇති කුරාන් වැකි යන ලිපිය බලන්න.

**7. සුළඟ මගින් ලබා දුන් වරප්‍රසාද කිහිපයක්**

*ඔහුම තම වරප්‍රසාදයන් පහළ කිරීමට පෙර (සිසිල්) සුළඟ ශුභාරංචියක් වශයෙන් යවන්නේය. (මිනිසුනේ!) අපිම වලාකුළෙන් පරිශුද්ධ වූ ජලය වසින්නට සලස්වන්නෙමු. (25:48).*

*ඔහුම ඔහුගේ වරප්‍රසාදයන්ට පෙර ශුභාරංචිය වශයෙන් සිසිල් සුළඟ යවන්නේය. එය (කළුවර වී ඇති වන) ඝන වලාකුළු ඔසවාගත් පසු එය, අපි (වියළී) මැරී ගිය*

*භූමිය දෙසට පදවාගෙන ගොස් එයින් වැස්ස වැසීමට සලස්වන්නෙමු. පසුව එමඟින් සියළු වර්ගයේ පළතුරුද ඉකුත් කරන්නෙමු.(7:57)*

*වලාකුළු උසුළාගෙන යන සුළඟද අපිම යැව්වෙමු. එම වලාකුළෙන් වැස්සද අපිම වසින්නට සලස්වන්නෙමු. එය අපි ඔබට පොවන්නෙමු. (වැස්සෙහි ජලය වලාකුළෙහි) ඔබ එක්රැස් කර තැබුවේ නැත. (අපිම එක්රැස් කරමු) (15:22)*

**8. පොලොවෙන් ලබා දුන් වරප්‍රසාද කිහිපයක්**

*භූමිය ජීවීන් වාසය කිරීමට පහසුවන අන්දමට එය නිර්මාණය කළේය. (තවද) එහි (විවිධ වර්ගයේ) පළතුරු වර්ගද, (වළු වලින් පිරි) අතු වලින් යුත් ඉඳි ගස්ද වැඩෙන්නේය. දහයියා වලින් වසන ලද ධාන්‍යද, සුවඳ පැළෑටි ගස් වැද පැළවන්නේය. (55:10,11,12)*

*ඔහුම වළාකුලෙන් වැස්ස පහළ කර තබන්නේය. එමඟින් සියළුම වර්ගයේ පැළෑටි අපි පැළවීමට සලස්වා, එයින් සාරවත් පැළයන්ද අපි ඉකුත් කළෙමු. එයින් ඝනට වැඩුණු ධාන්‍යයෙන් (පිරි කරල්ද) අපි ඉකුත් කරන්නෙමු. ඉඳි ගසේ අතුවලින් නැමී එල්ලෙන පළතුරු වලුද ඇත්තේය. මිදි වතුද, බැලූ බැල්මට එකම ආකාරයටද එහෙත් රසයෙන් විවිධවද ඇති දෙළුම්, ඔලිව් ආදියද (අපිම ඉකුත් කළෙමු). ඒවා (මල් පිපී) ගෙඩි හට ගැනීමද, පසුව ඉදී, ඉදුනු පළතුරු බවට පෙරළෙන අන්දමද (අවධානයෙන් යුතුව බලනු මැනවි). විශ්වාසය තබන ජනතාවට නියත වශයෙන්ම මෙහි සාධකයන් බොහෝමයක් ඇත්තේය. (6:99)*

*ඔබ භූමියෙහි ගොවිතැන් කරන දැය ගැන අවධානය කළෙහුද? එය ඔබ පැල කර අස්වැන්න බවට පත් කරන්නෙහුද? නැතහොත් අපි අස්වැන්න බවට පත් කරන්නෙමුද. (56:63,64)*

*ඔහුම භූමිය දිගහැර එහි ස්ථිර වූ (අති විශාල) කඳුද, (දීර්ඝ) ගංගාවන්ද නිර්මාණය කලේය; (13:3)*

*භූමිය මිනිසුන් සමග ඇල නොවී සිටිනු පිණිස, එහි කඳු අපිම සිටෙව්වෙමු. ඔවුන් (කැමති ස්ථානයකට) යනු පිණිස, එහි විශාල පාරවල් ද අපි ඇති කළෙමු. (21:31)*

*යකඩද අපිම පහළ කළෙමු. එයින් බිහිසුනු යුධ තර්ජන ඇත්තේය. මිනිසුන්ට ප්‍රයෝජනවත් බොහෝමයක්ද ඇත්තේය. (57:25)*

*මෙතරම් විශාල භූමිය අපි ඔබට තොටිල්ලක් වශයෙන්ද, කඳු සවිකරන ලද ඇණ වශයෙන්ද නිර්මාණය කළේ නැද්ද? ජෝඩු ජෝඩු වශයෙන් අපිම ඔබ නිර්මාණය කර ඇත්තෙමු. (78:6,7,8)*

*අපව ඔසවාගෙන සිටින භූමිය නොසෙල්වී තිබෙනු පිණිස අති විශාල කඳු ඒ මත තැබුවේය. (ඔබගේ යාම් ඊම් සඳහා) ඍජු මාර්ගයන් ඔබ දැනගැනීම සඳහා (විවිධ) මාර්ගයන්ද, ගන්ගාවන්ද නිර්මාණය කළේය. (16:15)*

*(මිනිසුනේ!) නියත වශයෙන්ම අපි ඔබට භූමියෙහි සියළුම සැප පහසුකම් ලබා දී එහි ඔබට ජීවනෝපායද ඇති කළෙමු. (මෙසේ තිබියදී) ඔබ ස්තුති කිරීමද ඉතා අල්පය. (7:10)*

**9. ශාක සහ භෝග වෙතින් ලබා දුන් වරප්‍රසාද කිහිපයක්**

*විහිදී තිබෙන වැල්ද, විහිදී නොයන පැළෑටීන්ද ඇති උයන් වතුද, ඉඳි ගස්ද, ආහාරයට ගත හැකි විවිධ ගස් වැල් පලා වර්ගද, ධාන්‍යය වර්ගද, (බැලූ බැල්මට) එක සමානවද, (රසයෙන්) විවිධ වූ ඔලිව් ද, දෙළුම් හා තව විවිධ වර්ගයේ පළතුරු ආදියද, ඔහුම උත්පාදනය කර ඇත්තේය, එබැවින් ඒවා ප්‍රයෝජනවත් වන්නේ නම් (ඕනෑ තරම්) ආහාරයට ගනු. ඒවා අස්වැන්න නෙලා ගන්නා කාලයෙහි (දෙවියන්ට ස්තුති කිරීම පිණිස) එහි ඔහුගේ කොටසද දුප්පතුන්ට දෙනු; (6:141)*

*(එකම අන්දමේ වර්ෂාව ලැබුනද) සාරවත් භූමිය දෙවියන්ගේ නියෝගයන්ට අනුවම තම පැළෑටි, ගස් වැල් ආදිය ඉකුත් කරන්නේය. එහෙත්, කර්කෂක භූමියෙහි ඉතා ස්වල්පයක් මිස, පැළ වැවෙන්නේ නැත. ස්තුතිය දක්වන ජනතාවට මෙසේ විවිධ අන්දමට (අපගේ) ආයාවන් විවරණය කරන්නෙමු. (7:58)*

*භූමියෙහි විවිධ ප්‍රදේශයන් එකට එක්කාසු කළාක් මෙන් නිර්මාණය කර (එහි) මිදි වතුද, ධාන්‍යය ගොවි බිම්ද, ඉඳි ගස්ද නිර්මාණය කළේය. අතු ඇති ගස්ද, අතු නොමැති ගස්ද උත්පාදනය කරන්නේය. (මේවා සියල්ලට) එකම විදිහේ ජලය*

*පොවනු ලැබුවා වුවද, සමහර දැයට වඩා සමහරක් දැය අපි රසයෙන් උසස් කර තැබුවෙමු. මෙහි බුද්ධිය ඇති ජනතාවට නියත වශයෙන්ම සාධකයන් බොහෝමයක් ඇත්තේය. (13:4)*

*බීජද, ඇටද නියත වශයෙන්ම අල්ලාහ්ම පැලී (පැළවෙන්නට) සලස්වන්නේය. මරණයට පත්වූ දැයෙන් පණ ඇති දැය ඔහු ඉකුත් කරන්නේය. පණ ඇති දැයෙන් මළ දැයද ඔහු නුකුත් කරන්නේය. ඔහුම ඔබගේ දෙවියන්ය. එබැවින් ඔබ (ඔහු හැර දමා) කොහේ නම් දුවන්නෙහුද්? (6:95)*

**10. ආහාර ලෙස මිනිසාට දුන් වරප්‍රසාද**

*මිනිසුනේ! ඔබ දරිද්‍රතාවයට බියවී ඔබගේ දරුවන්ව ඝාතනය කර නොදමනු. අපි ඔවුන්ටද ආහාර ලබා දෙන්නෙමු. ඔබටත් (ලබා දෙන්නෙමු). ඔවුන්ව මරා දැමීම විශාල පාපයකි. (17:31)*

*අල්ලාහ් ආහාර සැපයීම භාර නොගත් කිසිම ජීවියෙක් භූමියෙහි නැත. (ඒවා) ජීවත් වී සිටින ස්ථානයද, ඒවා (මරණයට පත් වී) භූමදානය වන ස්ථානයද ඔහු දැනගෙනම සිටින්නේය. මේවා සියල්ල් පැහැදිලි පුස්ථකයෙහි සටහන් වී ඇත්තේය. (11:6)*

*තමන්ගේ ආහාරය උසුලාගෙන නොයන කොපමණදෝ සතුන් සිටින්නේය. ඒවාටත් ඔබටත් අල්ලාහ්ම ආහාර සපයන්නේය. (මෙසේ තිබියදී ඒ වෙනුවෙන් කුමක් නිසා ඔබ අධික වශයෙන් දුක් විය යුතුද?). ඔහු නම් සියල්ල සවන්දෙන්නෙකු වශයෙන්ද හොඳින් දන්නෙකු වශයෙන්ද සිටින්නේය. (29:60)*

*නියත වශයෙන්ම අල්ලාහ් තමන් අදහස් කරන අයට ආහාර විස්තීරණය කර ලබා දෙන්නේය. තමන් අදහස් කරන අයට සීමා සහිතව ලබා දෙන්නේය යන්න ඔවුන් අවධානය කර බැලුවේ නැද්ද? විශ්වාස කරන ජනතාවට නියත වශයෙන්ම මෙහි (බොහෝමයක්) සාධකයන් ඇත්තේය. (30:37)*

*ඔබටද, ඔබ ආහාර දී (හදා වඩා) නොගන්නා වූ (අහස් හීද, භූමියෙහිද වාසය කරන) ජීවීන් සියල්ලටද ජීවත් වීමට අවශ්‍යය වස්තූන්ද අපිම එහි සැලසුම් කළෙමු. (15:20) සෑම වස්තුවකම භාන්ඩාගාරයක් අප වෙතම ඇත්තේය. එහෙත්*

*ඒවා (ඒ ඒ කාලයන්ට ඒ ඒ දැයට) නියමිත ප්‍රමාණයෙන්ම අපි පහළ කර තබන්නෙමු, (15:21)*

*ඉඳි, මිදි ආදී පළතුරුවලින් මත්පැන්ද, හොඳ ආහාරයන්ද ඔබ නිපදවන්නෙහිය. නියත වශයෙන්ම මෙහිද බුද්ධිමත් ජනතාවට එක් සාධකයක් ඇත (16:67)*

*(එළු, ගව, ඔටුවන් වැනි) සතුන්ගෙන්ද ඔබට පාඩමක් ඇත. ලේ වලටද, ගොම වලටද අතරේ උන්ගේ කුසෙන් කළවම් නොවුන කිරි (උත්පාදනය කර) අපි ඔබට පොවන්නෙමු. එය පානය කිරීමට ඉතා රසවත්ය. (16:66)*

*ඒ අන්දමටම අහස් හිද, භූමියෙහිද ඇති සියල්ලම ඔහු තමන්ගේ දයාවෙන් ඔබට (ඔබගේ යහපත සඳහා හරිහම්බ කරන මෙන්) පාලනය කර තබා ඇත්තේය. සිතා පරිශීලනය කරණ ජනතාවට මෙහි (බොහෝ) පාඩම් ඇත්තේය. (45:13)*

## 11. සතුන් හරහා ලබා දුන් වරප්‍රසාද කිහිපයක්

*අපගේ අතින්ම නිර්මාණය කළ දැයෙන් ඔවුන් අයිතිවාසිකම් දැරිය හැකි (එළු, ගව, ඔටුවන් වැනි) සතුන්ද ඔවුන් වෙනුවෙන් අපිම උත්පාදනය කළෙමු යන්න දුටුවේ නැද්ද? (36:71) ඒවා ඔවුන්ට යටහත් පහත් වන සේ අපි පත් කළෙමු. ඒවායෙන් ඔවුන් (වාහන මෙන්) නැග ගත හැකි දැයද ඇත්තේය. ඔවුන් ආහාරයට ගත හැකි දැයද ඇත්තේය. (36:72)*

*අශ්වයින්, හා බූරුවන් ආදී සතුන් මත නැග ගමන් යාම සඳහාද, (ඔබට) අලංකාරවත් වශයෙන්ද (ඔහු) ඒවා උත්පාදනය කර ඇත්තේය. තවද, ඔබ නොදන්නා දැයද උත්පාදනය කර ඇත්තේය. (6:8)*

*අහස් ගැබෙහි (දෙවියන්ගේ නියෝගයන්ට) අනුව යටත් වී පියාඹන පක්ශීන්ව ඔවුන් දුටුවේ නැද්ද? ඒවා (අහස් හී) උසුළාගෙන සිටින්නා අල්ලාහ් හැර වෙන කිසිවෙකුත් නැත. විශ්වාසය තැබූ ජනතාවට මෙහිද විවිධ සාධකයන් ඇත්තේය. (16:79)*

*ඔවුන්ට පානය කළ හැකි (කිරි වැනි) දැයද තවත් බොහෝ ප්‍රයෝජනද ඒවායෙන් ඇත්තේය. (මේවා සියල්ලට) ඔවුන් කෘතඥ විය යුතු නොවේද? (36:73)*

*(මිනිසුනේ!) ගමේ සතුන්වද ඔහුම උත්පාදනය කර ඇත්තේය. ඒවායින් ඔබ වෙනුවෙන් (ශීතය වැලැක්වීමට) භාණ්ඩද, විවිධ ප්‍රයෝජනවත් දැයද ඇත්තේය. ඒවායෙන් සමහරක් අනුභව කරන්නෙහුය. (16:5)*

*ඔබගේ නිවෙස් අල්ලාහ් ඔබට නිදහස ලබා දෙන ස්ථානයක් වශයෙන් සැලැස්සුවේය. ගමේ සතුන්ගේ හම් වලින් ඔබ නිවෙස් වශයෙන් තනා ගැනීමට (පහසු ආකාරයට) ඔබ වෙනුවෙන් ඔහු උත්පාශනය කර ඇත්තේය. එය ඔබ සංචාරය කරන අවස්ථාවන්හිදීද, ස්ථානයකදී කඳවුරු බඳගන්නා අවස්ථාවන්හිදීද, ඉතා පහසුවෙන් උසුළාගෙන යා හැකිව ඇත්තේය, ඒවායෙන් ලොම, රෝම, කෙස්, ආදී දැයද ඔහු ඔබ වෙනුවෙන් ණිර්මාණය කර ඇත්තේය. ඒවායෙන් නිශ්පාදිත භාන්ඩ කාලයක් දක්වා නිවෙස් වලට අලංකාරවත් ආකාරයටද, (ජීවිතයට) ප්‍රයෝජනවත් දැය වශයෙන්ද ඇත්තේය. (16:80)*

*ඉතාමත් අමාරුකමෙන් මිස, ඔබට යා නොහැකි රටවලට ඒවා (ඔබවද) ඔබගේ ඉමහත් බරද ඔසවාගෙන යන්නේය. නියත වශයෙන්ම ඔබගේ දෙවියන් (ඔබ කෙරෙහි) ඉතාමත් දයාබරව හා කරුණාවන්තව සිටින්නේය. (16:8)*

*'ඔබගේ හිමි මී මැස්සන්ට වැටහීම දෙන්නේය. කඳු, ගස් හා උස වූ ගොඩනැගිලිවල නුඹලා මී වද බඳිනූ, තවද නුඹලා සෑම පලතුරු (වර්ගවල ඇති මල්) වලින් රොන් උරා බී ඔබ හිමිගේ පහසු මාර්ගයෙහි (නුඹලා ගේ නිවෙස් තුලට) ඇතුළු වනු. මෙයින් උගේ උදරයන්හි වර්ණ කිහිපයකින් යුත් පැණියක් (මී පැණි) වැහෙන්නේය. එයින් මිනිසුන්ට සුවය ඇත. අත්තෙන්න්ම මෙහිද සිතා වටහා ගන්න ජනතාවට සාක්ෂියක් ඇත'.(අල් කුර්ආන් 16:68/69).*

*භූමියෙහි බඩගා ඇවිදිය හැකි දැයද, තමන්ගේ තටු මගින් (අහසෙහි) පියාඹිය හැකි දැයද, ඔබ මෙන් (ජීවය ඇති) ඔබ වැනි උත්පාදනයන්ම මිස වෙන කිසිවක් නැත. මෙවායින් කිසිවක් අපගේ පුස්ථකයෙහි සඳහන් නොකර මා අතහැර දැමුවේ නැත. පසුව (දිනකදී) මේවාද තම දෙවියන් වෙත ගෙන එනු ලැබේ. (6:38)*

**12.** මුහුදින් ලබා දුන් වරප්‍රසාද

*(ඔබ සංචාරය කරණු පිනිස) නැව ඔබට වසඟ කර දී, තම නියෝගයන්ට අනුව සාගරයෙහි තරනය කරන්නට සලස්වන්නේය. (ඇළ මාර්ගද) ඔබ කැමති ආකාරයට තරනය කිරීමට පහසුකම් ලබා දුන්නේය. (14:32)*

*ඔහුම ඔබ මාළු (අල්ලා පිළියෙල කර) අනුභව කිරීමටද, ඔබ ආභරන වශයෙන් පැළඳිය හැකි වස්තූන් ලබා ගැනීමටද, මුහුද (ඔබට) පහසුකම් ඇති කර දුන්නේය. (විවිධ ස්ථානයන්ට ගොස් වෙළඳාම මගින්) දෙවියන්ගේ වරප්‍රසාදයන් ඔබ සොයා ගැනීම පිණිස, (මුහුදෙහි යාත්‍රාකරන අවස්ථාවේදී) නැව් මුහුද දෙබෑ කරමින් යනු ඔබ දකින්නෙහිය. (මේ වෙනුවෙන් ඔබ දෙවියන්ට කෘතඥ වෙමින් සිටිනු මැනවි. (16:14)*

*ඔහුගේ නියෝගයන් මගින් (විවිධ රටවල්වලට) නැව් වලින් ගමන් කිරීමට අල්ලාහ් මුහුද ඔබට වසඟ කර දී ඇත්තේය. (එමගින් ඔහුගේ) වරප්‍රසාදයන් ඔබ සොයා ගන්නෙහුය. (ඒ වෙනුවෙන් ඔහුට) ඔබ කෘතඥ වනු මැනව! (45:12)*

*ජලයේද, ගොඩබිමෙහිද ඔහුම ඔබව කැඳවාගෙන යන්නේය; (10:22) නැව බොහෝමයක් මිනිස් සංහතියන් ඔසවාගෙන යාමට අපි සැලැස්වීමද නියත වශයෙන්ම ඔවුන්ට එක් සාධකයකි. (36:41) ඔවුන් නැග යාමට එවැනි (රුවල් නැව් ආදී) දෑයද අපි ඔවුන් වෙනුවෙන් උත්පාදනය කර ඇත්තෙමු. (36:42)*

**13. ගිංදර මගින් ලබා දුන් වරප්‍රසාද කිහිපයක්**

*ඔබ ලිපෙහි මොළවන ගින්නද අවධානය කළෙහුද? එහි දර ලී ඔබ උත්පාදනය කළෙහුද? නැතහොත් අපි උත්පාදනය කරන්නෙමුද? (56:71,72)*

*"අමු ගසකින් ඔබට ගින්දර නිපදවන්නාද ඔහුය. පසුව එමගින් ඔබ (ඔබට අවශ්‍යය ගින්දර) මොළව ගන්නෙහුය" (36:80)*

**14. ඇඳුම්, වාසස්ථාන, භාණ්ඩ නිපදවීම වැනි වරප්‍රසාද**

*ආදම්ගේ දරුවනී! ඔබගේ රහස් ස්ථානයන් වසා ගත හැකි ඇඳුම්ද, අලංකාරයද, නියත වශයෙන්ම අපි ඔබට දයාව පහළ කර ඇත්තෙමු. එහෙත් (පාපයන් වසා ගත හැකි පාරිශුද්ධ භාවයේ ඇඳුමම ඉතාම උසස්ය. (7:26)*

අල්ලාහ් ඔබ වෙනුවෙන් උත්පාදනය කර ඇති දැයෙන් සෙවණ දිය හැකි දැයද ඇත්තේය. කඳුවල (ගුහා වල) ඔබට වාසස්ථාන නිර්මාණය කලේය. උෂ්නයද, සීතයද ඔබට වැලැක්විය හැකි ඇඳුම් ද, (පිහි හෙල්ල වැනි) ආයුධ වලින් වැලැක්විය හැකි පළිහ (ආදිය සෑදිය හැකි) වස්තූන්ද ඔහුම ඔබ වෙනුවෙන් නිර්මාණය කලේය. ඔහු තමන්ගේ වරප්‍රසාදයන් මෙසේ පූර්ණ කර ඇත්තේය. මේ වෙනුවෙන් ඔබ ඔහුට සම්පූර්ණයෙන්ම අවනත වී කටයුතු කරනු මැනව! (16:81)

අහස්ද භූමියද උත්පාදනය කර තිබීමද, ඔබගේ භාෂාවන්ද, වර්ණයන්ද වෙනස්වී තිබීමද, ඔහුගේ සාදකයන්ගෙන් ඇති දැයයි. මෙහිද බුද්ධිමත් අයට නියත වශයෙන්ම (බොහෝමයක්) සාධකයන් ඇත්තේය. (30.22)

රාත්‍රීයේද, දහවලේද නිදාගෙන විඩාව නිවා ගැනීමද, භූමියෙහි විවිධ ප්‍රදේශයන්ට ගොස් ඔහුගේ වරප්‍රසාදයන් සොයා ගැනීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. සවන් දෙන ජනතාවට මෙහිද (බොහෝමයක්) සාධකයන් ඇත්තේය. (30:23)

විශ්වයේ නිර්මාණය ගැනත් සොබා දහම ගැනත්, මිනිසා ගැනත්, ස්වර්ගය සහ අපාය ගැනත් දෙවිඳුන් අපව දැනුවත් කර ඇත. දෙවියන් විශාල වරප්‍රසාද ප්‍රමාණයක් අපට ලබා දී ඇති බව ඉහතින් පෙන්වා දුනි.

දෙවිඳුන් මෙසේද පවසයි.

අහස්ද, භූමියද, ඒවා අතර ඇති දැයද (පුහු) සෙල්ලමක් සඳහා අපි නිර්මාණය කලේ නැත (කුරානය 44:38,21:16).

"අපි නුඹලාව නිකමට මැව්වෙමු යැයිද, නියතව නුඹලා අප හමුවට හරවනු නොලබන්නෙහු යැයිද සිතාගෙන සිටියෙහුද?" (කුරානය 23:115). (කිසිම) ප්‍රශ්නයක් නොඅසා අත්හැර දමන්නෙමු යැයි මිනිසා අදහස් කළෙහිද? (75:36)

ඔබගෙන් කවුරුන් ක්‍රියාවන්ගෙන් ඉතාමත් අලංකාරවත් කෙනෙකුද යන්නෙහි ඔබව පිරික්සනු පිණිසම ඔහු ජීවිතයද මරණයද උත්පාදනය කර ඇත්තේය. (කුරානය 67:2)

*ඔහුව අපි පිරික්සීම පිණිසම සවණ ඇති අය වශයෙන්ද, බැල්ම ඇති අය වශයෙන්ද, ඔහුව පත් කළෙමු; (76:2)*

*(නබියේ!) නියත වශයෙන්ම අපි මිනිසුන්ගේ යහපත සඳහාම සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් පිරි මෙම ධර්මය ඔබ වෙත පහළ කළෙමු. එබැවින් කවුරුන් (මෙය) අනුගමනය කර කටයුතු කරන්නේද, ඔහුටම එය හොඳකි. කවුරුන් එයින් මාර්ගය වැරද යන්නේද, එය ඔහුටම නපුරක් වශයෙන් අවසන් වනු ඇත. (නබියේ!) ඔබ ඔවුන්ව (ඍජු මාර්ගයෙහි යන ලෙස මෙන් බල කර), බේරා ගන්නෙකු නොව. (39:41)*

---

## විශ්වයේ මැවීම

විද්‍යාව සහ තාක්ෂණයේ දියුණුවත් සමගම විශ්වයට ආරම්භයක් තිබිය යුතු බව නිගමනය කොට ඇත. එහෙත් ඈත අතීතයේදී විශ්වය නිරන්තරයෙන්ම තිබුණු එකක් බව විශ්වාස කොට තිබේ. කෙසේ වෙතත් විශ්වය බිහිවූ අන්දම ගැන විද්‍යාඥයින්ට තවමත් ප්‍රහේලිකාවකි.

බොහෝ විට විශ්වයේ ආරම්භය පිළිබඳව අසනු ලබන ප්‍රශ්නයන් වන්නේ, විශ්වයට ආරම්භයක් තිබේ නම් එය කෙසේ ඇතිවූයේද, ඒ සඳහා නිර්මාණ කරුවෙක් සිටිය යුතුද, නැතහොත් එය ඉබේ ඇතිවූනාද, නිර්මාණ කරුවෙක් සිටිනවා නම් ඔහු කව්ද, විශ්වයට නිර්මාණ කරුවෙක් නොසිටින්නේ නම් විශ්වය ඇති වීමට බලපාන ලද සාදක මොනවාද, විශ්වය දෙවියන් මැවුවා යැයි පිළිගත හැකිද, දෙවියන් විශ්වය මැව්වේ යැයි පිළිගන්නේ නම් ඔහු කව්ද, ඔහු සිටින්නේ කොතනද, ඔහුගේ ලක්ෂණ මොනවාද යනාදිය වේ.

අපගේ විශ්වය බිලියන 14 ක් පමණ පැරණි බව ගණන් බලා තිබේ. එහි ආරම්භය සෙවීම සඳහා විද්‍යාඥයින් විශාල වෙහෙසක් ගනිමින් සිටිති. කෙසේ වෙතත් මේ දක්වා එම උත්සාහයන් සාර්ථක ප්‍රතිපල පෙන්වා නොමැත. ඊට හේතුව විද්‍යාඥයින් ඉදිරිපත් කරන සෑම වාදයකම අඩුපාඩු දැකිය හැකි වීමය. විද්‍යාඥයින් විශ්වයේ බිහිවීම සම්බන්දයෙන් ඇතැම් මත ඉදිරිපත් කොට ඇත.

මහා පිපිරුම් වාදය ඉන් එක් මතයකි. එම මතය පිළිනොගන්නා විද්‍යාඥයින් ද ඇත. තවත් සමහර විද්‍යාඥයින් පවසන්නේ විශ්වය ඉබේ ඇතිවිය යුතු බවයි. එහෙත් එම මතය පිළි නොගන්නා විද්‍යාඥයින් ද සිටිති. ඒ අනුව විශ්වයේ බිහිවීම විද්‍යාඥයින්ට තවමත් අභිරහසකි. එසේ තිබියදී අල් කුරානයේ සඳහන් වන්නේ විශ්වය දෙවියන් මැවූ බවයි.

*"නියත වශයෙන්ම නුඹගේ අධිපතියා අල්ලාහ්ය, ඔහු අහස් සහ පොළව දවස් හයකදී මැව්වේය, පසුව ඔහු (සිය තත්වයට ගැලපෙන පරිදි) අර්ෂ් මත නැඟුණේය. ඔහු දවහල ආවරණය කරමින් රාත්‍රිය ඇති කරන්නේය, ඒවා (රාත්‍රිය සහ දහවල) එකිනෙක එහු බඳින්නේය, තවද සූර්යාවද චන්ද්‍රයාවද තරකාවන්ද සිය අණට වසඟ වන දේවල් ලෙස (මවා ඇත්තේය). නියත වශයෙන්ම මැවීමද, අණ කිරීමද, ඔහුටම අයත් ඒවා වේ. සකල ලොවැසියන්ගේ අධිපති වූ අල්ලාහ් භාග්‍යවන්තයා ය" (කුරානය 7:54).*

මෙම කුර්ආන් වැකිය අනුව අල්ලාහ් විශ්වය නිශ්චිත කාල වකවානු හයකදී මවා තිබේ. (දින හය යන්න අප සලකන පැය 24 දින හයක් නොව, එය දෙවියන්ගේ කාල මිනුම් මත ඇති දෙයකි). එහෙත් විද්‍යාඥයින්ට මේ දක්වා මහා පිපුරුමට අවශ්‍ය සැලසුම ඇති කලේ කව්රුන්දැයි කීමට හෝ පිපිරීමෙන් පසු බිලියනයකට වඩා ක්ෂීරපත බිහිවුයේ කෙසේදැයි පැවසීමට හැකිවී නැත.

පෘථිවිය මත සිටින ජීවීන් අතරින් මිනිසා ඉතා වැදගත් මැවීමක් වන්නේ ඔහුට ලැබී ඇති බුද්ධිය නිසාය. එපමණක් නොව මිනිසාට දෙවියන් විසින් දහමක් ලබා දී තිබේ. මේ නිසා මිනිසාට විශාල කාර්ය භාරයක් පැවරෙන්නේය. එනම් විශ්වයේ මැවුම්කරු ගැන විශ්වාස කොට ඔහුගේ මගපෙන්වීම අනුව ජීවත් වීමය. එහෙත් මිනිසා මෙලොවට පැමිණ ඇති අරමුණ ගැන නොසිතා වෙනත් කාර්යයන්හි නිරත වෙමින් සිටින්නේය.

බොහෝ අයට තිබෙන ප්‍රශ්නයක් වන්නේ විශ්වය දෙවියන්ගේ මැවීමක් නම් දෙවියන්ව මැව්වේ කව්රුන්ද යන්නය. එහෙත් දෙවියන් පිලිබඳ අල් කුරානයේ දී ඇති අර්ථ දැක්වීම අනුව ඔහු කිසිවෙකුට දාව ඉපදී නොමැත. කෙසේ වෙතත් දෙවියන් විශ්වය මවා ඇත්තේ ඔහු සිටින අවකාශයේ නොවන්නේය. එබැවින්

මෙම විශ්වය තුල දෙවියන් සිටින්නේ නැත. එම නිසා දෙවියන් ගැන දැනගත හැක්කේ ඔහු විසින් දෙන ලද දේව පණිවිඩයකින් පමණි.

දෙවියන් විසින් පහළ කරන ලද සෑම ප්‍රධාන දහමකින්ම ඔහු ගැන සඳහන් කොට ඇත. අල් කුරානය අවසාන වරට පහළ කරන ලද දහම් පණිවිඩය වේ. එය හොඳින් හැදෑරීමෙන් විශ්වයේ මැවුම්කරු ගැන නිවැරදි අවබෝදයක් ලබා ගත හැකි වන්නේය. කුරානය දෙවියන්ගෙන් ලැබුණු පණිවිඩයක් බව සනාථ කිරීම සඳහා අවශ්‍යකරන කරුණු එය තුලම අන්තර්ගත කොට තිබේ. එම නිසා ඒවා හැදෑරීමෙන් කුරානයේ සත්‍යතාව තහවුරු කර ගත හැකිය. (FA)

---

## දෙවියන්ගේ නිර්මාණ:

## විශ්වය සහ ඉන් ඔබ්බට

## (The universe and beyond)

මීට වසර 1400 කට පමණ පෙර පහළ කළ අවසන් දිව්‍ය හෙළිදරව්ව වන ශුද්ධ වූ අල් කුරානය තුලින් දෙවියන්වහන්සේ මෙසේ පවසා ඇත.

*(මිනිසුනේ!) අපි මෙසේ ඔබව පමණක්ද උත්පාදනය කර ඇත්තේ? නියත වශයෙන්ම ඔබට ඉහලින් ඇති අහස් හතද අපිම උත්පාදනය කළෙමු. ඒවා සෑම එකකම ඔබ වැනි උත්පාදනයන් ඇත්තේය. (මේවා උත්පාදනය කර ඇති අතර) මෙම උත්පාදනයන්ට (අවශ්‍යය දෑය) ගැන අපි නොසැලකිළිමත් නොවූයෙමු. (23:17)*

*අහස් හා භූමියෙහි පාලනය අල්ලාහ්ටම අයත්ය. සියල්ල කෙරෙහි අල්ලාහ් බලසම්පන්නය. (3:189)*

*නියත වශයෙන්ම අපි සෑම වස්තුවක්ම (නියමිත) ප්‍රමාණයට අනුවම නිර්මාණය කර ඇත්තෙමු. (54:49) අහසේ සිට භූමිය දක්වා ඇති සෑම කාරණාවක්ම ඔහුම*

*පිළිවෙලකට කරන්නේය. (සෑම දැයකම) අවසානයද (ඔබගේ) ගනනයට අනුව වසර දහසකට සම වන එක් දිනකදී ඔහු වෙතම යනු ඇත. (32:5)*

නූතන දුරේක්ෂ මගින් නිරීක්ෂණය කර තහවුරු කරන ලද බොහෝ කරුණු බොහෝ කලකට පෙර අල් කුරාණය තුල අඩංගු වී තිබීම පිළිබඳව මිනිසුන් විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

දෙවියන්වහන්සේ මිනිසුන්ගෙන් මෙසේ ප්‍රශ්ණ කරයි. ඔහු එම ප්‍රශ්නය තුලින් අසන්නේ හේතුඵල වාදය ගැනය.

*අහස් හිද භූමියෙහිද, ඔවුන්ට ඉදිරියෙන්ද පසුපසින්ද, ඇති දැය ඔවුන් අවධානය කර බැලුවේ නැද්ද?; (34:9)*

*ඒවා කිසිවක් නොමැතිව තමන් විසින්ම ඇති කළෙහුද? නැතහොත් මොවුන්, තමන්ට තමන්ම නිර්මාණය කර ගත්තෙහුද? නැතහොත් අහස්ද භූමියද ඔවුන් නිර්මාණය කළෙහුද? නැත. මේ සියල්ල නිර්මාණය කළ අය දෙවියන්ය; (52:35,36)*

හේතුඵල දහමට අනුව ඕනෑම දෙයක් ආරම්භ වීමට හෙවත් ඵලයක් හට ගැනීමට හේතුවක් තිබිය යුතුයි. එයට අනුව සියල්ල ඇතිවීමට මූලික වූ හේතුව දෙවියන්වහන්සේ වන අතර ඔහුට පිටින් නිර්මාණය වී ඇති සියළු දේ එම හේතුව නිසා ඇති වූ ඵලයන්ය.

ලිපියෙහි අණු මාතෘකා

1) සියල්ලට ඉහලින් ඇති දෙවියන්ගේ රාජධානිය
2) අප සිටින විශ්වයට ඔබ්බෙන් ඇති දැය
3) පහලම අහස හෙවත් අප සිටින විශ්වය
4) සෞරග්‍රහ මණ්ඩලය
5) පෘතුවිය

**1. සියල්ලට ඉහලින් ඇති දෙවියන්ගේ රාජධානිය**

*නියත වශයෙන්ම ඔබගේ දෙවියන් වන අල්ලාහ් අහස්ද, භූමියද දින හයකින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජධානිය ස්ථාවර කර තැබුවේය; (7:54)*

*ඔහුම අහස්ද, භූමියද දින හයකිදී උත්පාදනය කළේය. (ඒ අවස්ථාවේදී), ඔහුගේ අර්ෂ් ජලය මත (පාවෙමින්) තිබුණි. ; (11:7) මෙම දින ගනණය අල්ලාහ්ගේ සන්නිධානයට අදාලවය. (පෘතුවි දින නොවේ)*

*පසුව දුමාරයක් වශයෙන් තිබූ අහස දෙසට හැරී (එය උත්පාදනය කර) එයද භූමියද දෙස බලා "ඔබ කැමති වුවද, අකැමැති වුවද (අවනත වී මා වෙත) පැමිනෙණු" යයි පැවසුවේය. එයට ඒවා "(මෙන්න! අපි කැමැත්තෙන්ම පැමිණියෙමු" යයි පැවසුවේය. (41:11)*

[මෙම ඉහත වැකියෙන් අදහස් කරණුයේ අනාගතය ගැන සියල්ල දකින ආල්ලාහ් අනාගතයේදී එනම් ඊලග මොහොතෙදී නිර්මාණය වීමට යන තම නිර්මාණය වන අහස් හත වෙත නිකුත් කළ අණකි].

*උත්පාදනයද, එහි පාලනයද ඔහුටම අයත් දැය නොවෙද? සකළ ලෝකයන්ම උත්පාදනය කර, පෝෂණය කර, සංවර්ධණය කරන අල්ලාහ් ඉමහත් භාග්‍යවන්තයෙකි. (7:54)*

සකළ ලෝකයම යන්නෙන් අදහස් කරනුයේ අල්ලාහ් ට එපිටින් ඇති ඔහුගේ සියළුම නිර්මාණ හෙවත් ඔහුට එපිටින් පවතින සියල්ල වේ. එහි දළ සටහනක් පහතින් දැක්වේ.




*ඔහුම අහස්ද භූමියද පෙර නිදසුනක් නොමැතිව උත්පාදනය කළ කෙනෙකි. (ඔහු කුමක් හෝ උත්පාදනය කිරීමට අදහස් කර), තීරණය කළහොත් "වනු" යැයි කීම පමණකින්ම එවෙලේම එය සිදුවන්නේය. (2:117)*

**2. අප සිටින විශ්වය (පළමු අහස) සහ ඊට ඔබ්බෙන් ඇති අනිකුත් අහස් හය සම්බන්ධව**

*(කිසිවෙකුගේ උදව්වක් නොමැතිව) අපගේ ශක්තිය මගින් අහස (විශ්වය) නිර්මාණය කළෙමු. නියත වශයෙන්ම අපි (එය ඔවුන්ගේ බුද්ධියට හසු නොවන සේ) අති විශාලවත් අන්දමට තබා ඇත්තෙමු. (ඇත්ත වශයෙන්ම, අපි එය පුළුල් කරන්නෙමු." (51:47)*

*අහස් හතක්ද, ඒවා මෙන් භූමියද අල්ලාහ්ම උත්පාදනය කළේය. ඒවා අතර (දිනපතා සිදුවිය හැකි සියළු කාරණාවන් ගැන වූ) නියෝගයන් පහළ කරමින්ම සිටින්නේය; (65:12)*

*නියත වශයෙන්ම ඔබගේ දෙවියන් වන අල්ලාහ් අහස්ද, භූමියද දින හයකින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජධානිය ස්ථාවර කර තැබුවේය. ඔහුම රාත්‍රියෙන් දහවල වසා දමන්නේය, (දහවලෙන් රාත්‍රිය වසා දමන්නේය). එය ඉතාමත් තීව්‍ර වශයෙන්ම එකකට පිටුපසින් එකක් වශයෙන් පිළිවෙලින් සිදු*

*වෙමින් පවතින්නේය. සූර්යයාද, චන්ද්‍රයාද, තාරකාවන්ද ඔහුගේ නියෝගයන්ට ඇතුළත් වන්නේය. උත්පාදනයද, එහි පාලනයද ඔහුටම අයත් දැය නොවේද? සකළ ලෝකයන්ම උත්පාදනය කර, පෝෂණය කර, සංවර්ධණය කරන අල්ලාහ් ඉමහත් භාග්‍යවන්තයෙකි. (7:54)*

*පසුව ඔහු ඒවා දින දෙකකදී අහස් හතක් වශයෙන් සැලසුම් කර, සෑම අහසකටම නියමිත විවිධ යුතුකම් දැනුම් දුන්නේය; (41:12)*

*තට්ටු වශයෙන් විශ්ව හතක් නිර්මාණය කළේ ඔහුය. සර්වබලධාරිගේ මැවීමේදී ඔබට කිසිදු නොගැලපීමක් නොපෙනේ. ඔබේ බැල්ම ඒ වෙත නැවත යොමු කරන්න, ඔබට කිසියම් අඩුපාඩුවක් පෙනෙනවාද? 67:3*

*ඔහුම අහස් හතම එක පිට එකක් වශයෙන් නිර්මාණය කර ඇත්තේය. (මිනිසාණෙනි!) රහ්මාන්ගේ උත්පාදනයන්හී ඔබ කිසිම අඩුපාඩුකමක් නොදකින්නෙහිය. නැවත්ත් (එය අවධානය කර) බලනු. (එහි) කිසිම භේදයක් ඔබ දකින්නෙහිද? (නැවත) නැවතත් දෙවරක් බලනු. මෙසේ ඔබ කොතරම් වාර ගනනක් හාර හාරා බැලුවද, බැල්මම දුබලව ව්‍යාකූල වී (ඔබ වෙත) ආපසු හැරෙනු ඇත. (76:4)*

*ආරම්භයේදී එකට එක්කාසු වී තිබුණු අහස්ද භූමියද අපිම වෙන්කර තැබුවෙමු යන්නද, පණ ඇති සෑම දැයක්ම ජලයෙන් උත්පාදනය කළෙමු යන්නද, මෙම ප්‍රතික්ෂේප කරන්නන් අවධානය කළ යුතු නොවේද? (මෙය ඔවුන් විශ්වාස නොකරන්නෙහුද?) (21:30)*

**3. සෞරග්‍රහ මණ්ඩලය සම්බන්ධව**

*අහස් හා භූමිය උත්පාදනයෙහිද, රාත්‍රිය හා දහවලේ වෙනස් වීමෙහිද බුද්ධිමතුන්ට නියත වශයෙන්ම බොහෝ සාදකයන් ඇත. (3:190)*

*ඔහුම රාත්‍රියෙන් දහවල වසා දමන්නේය. (දහවලෙන් රාත්‍රිය වසා දමන්නේය). එය ඉතාමත් තීව්‍ර වශයෙන්ම එකකට පිටුපසින් එකක් වශයෙන් පිළිවෙලින් සිදුවෙමින් පවතින්නේය. සූර්යයාද, චන්ද්‍රයාද, තාරකාවන්ද ඔහුගේ නියෝගයන්ට ඇතුළත් වන්නේය; (7:54)*

*ඔහුම රාත්‍රියද, දහවලද (ඇති කළේය). සූර්යයාද චන්ද්‍රයාද උත්පාදනය කළේය. (මේවා තමන්ගේ සීමාවන් තුළ) පිහිනා යන්නේය. (21:33)*

*(නබියේ! ඔබ ඔවුන්ට) අහස්ද, භූමියද උත්පාදනය කර සූර්යයාද, චන්ද්‍රයාද (තමන්ගේ සැලැස්මට අනුව ගමන් කරන මෙන් යටහත් කර) තැබුවේ කව්ද'?යි ඔබ ඔවුන්ගෙන් විමසන්නේ නම්, දෙවියන් (අල්ලාහ්) යැයි ඔවුන් නියත වශයෙන්ම පවසනු ඇත. එසේ නම් ඔවුන් (අපගෙන් ඈත් වී) කොහේ නම් දුවන්නෙහුද? (29:61)*

*සූර්යයා චන්ද්‍රයාට ලඟා විය නොහැක. රාත්‍රිය දහවල පසු කරන්නට නොහැක. (මෙසේම ග්‍රහයන්ද, තාරකාවන්ද) සෑම එකක්ම (තමන්ගේ) සීමා වටයන් තුල පිහිනා යන්නේය. (36:40)*

*(වියළි නැවී) ගිය පරණ ඉඳි අත්තක් මෙන් (තිබී පූර්ණ සඳක් වශයෙන්) පත්වන තුරු චන්ද්‍රයාට අපි හැඩ රූ ගනනාවක් ඇති කර ඇත්තෙමු; (36:39)*

*අහස් කුළුනු නොමැතිව ඔසවන ලද්දේ අල්ලාහ්ය. එය ඔබ (ඔබගේ දෑස් වලින්) දකින්නෙහුය; ඔහුම සූර්යයාද චන්ද්‍රයාද තම පාලනය යටතේ තබා ඇත්තේය, (මේවා) සෑම දැයක්ම (ඒවාට) නියමිත කාල පරාසයට අනුව ගමන් කරමින් සිටින්නේය, ඒවායේ සියලු කාරණාවන්ද ඔහුම සැලසුම් කරන්නේය; (13:2)*

*ඔහුම (සූර්යයා) පායන්නට සලස්වන්නෙකි. ඔහුම (ඔබව නිදන්ට සලස්වා ඔබ) සුවය ලබා ගැනීම සඳහා රාත්‍රිය ඇති කරන්නේය. ඔබ (කාලයේ) ගණනය දැන ගැනීම සඳහා සූර්යයා වද චන්ද්‍රයාවද ඇති කළේය. (6:96)*

**4. විශ්වය සම්බන්ධව**

*(පසුව) ඔහු ඒවා දින දෙකකදී අහස් හතක් වශයෙන් සැලසුම් කර, සෑම අහසකටම නියමිත විවිධ යුතුකම් දැනුම් දුන්නේය. පසුව (මෙතරම්ම් දැයක් කළ) අපිම (භූමියට සමීපයෙන්) පහතින්ම ඇති අහසෙහි (තාරකා නම් වූ) පහන් මගින් අලංකාරවත් කර. (එය) ආරක්ෂා සහිතවද පත් කළෙමු. මේ සියල්ල. (සියල්ලන්ටම) බලසම්පන්නයෙකු හා (සියල්ල) හොඳින් දන්නෙකු (වන අප)ගේම සැලසුමකි. (41:12)*

*ඉහත වැකියෙහි සඳහන් තාරකා (නම් වූ පහන්) සහිත පහතින්ම ඇති අහස යනු අප සිටින විශ්වයයි. අපට එහි 5%ක් පමණ නිරීක්ෂණය කළ හැක. අපගේ මන්දාකිණියේ තරු හෙවත් සූර්යයාවන් බිලියන 400ක් පමණ ඇත. අපගේ නිරීක්ෂන අහසේ මන්දාකිණි ට්‍රිලියන දෙකක් පමන ඇත. ඇත්තවශයෙන්ම අහස නිරීක්ශණයට ඉතාම සිත්ගන්නා සුළු තැනකි.*

**5. පෘතුවිය සම්බන්ධව**

*අහස ආරක්ෂා සහිත උඩුවියනක් මෙන්ද අපි නිර්මාණය කළෙමු. (මෙසේ තිබියදී) ඒවායේ ඇති සාධකයන් ඔවුන් ප්‍රතික්ෂේප කරන්නාහ. (21:32)*

*යකඩද අපිම පහළ කළෙමු. එයින් බිහිසුනු යුධ තර්ජන ඇත්තේය. මිනිසුන්ට ප්‍රයෝජනවත් බොහෝමයක්ද ඇත්තේය. (57:25) පෘතුවිය තුල යකඩ ඇතිවී තිබෙන්නේ පසු කාලීනව බව විද්‍යාඥයින් සොයාගෙන ඇත*

*ඔබ වෙනුවෙන් තාරකාවන් උත්පාදනය කළේද ඔහුමය. ගොඩබිමෙහිද, මුහුදෙහිද ඇති අන්ධකාරයන්හී ඒවා මගින් ඔබ මාර්ගය දැන යන්නෙහුය. (6.97)*

*අපව ඔසවාගෙන සිටින භූමිය නොසෙල්වී තිබෙණු පිණිස අති විශාල කඳු ඒ මත තැබුවේය. (ඔබගේ යාම් ඊම් සඳහා) සෘජු මාර්ගයන් ඔබ දැනගැනීම සඳහා (විවිධ) මාර්ගයන්ද, ගංගාවන්ද නිර්මාණය කළේය. (16:15)*

*පොළොව නොසෙල්වී තිබීමට කඳු වල මුල් කූඤ්ඤ ලෙස ක්‍රියා කරන බව විද්‍යාඥයින් සොයාගෙන ඇත.

*මෙතරම් විශාල භූමිය අපි ඔබට තොටිල්ලක් වශයෙන්ද, කඳු සවිකරන ලද ඇණ වශයෙන්ද නිර්මාණය කළේ නැද්ද? ජෝඩු ජෝඩු වශයෙන් අපිම ඔබ නිර්මාණය කර ඇත්තෙමු. (78:6,7,8)*

*තවද, (දිශාවන් දැනුම් දිය හැකි) සළකුණු මගින්ද, තාරකාවන් (නිර්මාණය කර තැබීම) මගින්ද (සංචාරකයින් වන) ඔවුන් මාර්ගය දැන ගන්නාහ. (16:16)*

*ඔබට බියද, ලාබයද ලබා දිය හැකි විදුලිය ඔහුම ඔබ ඉදිරියේ බැබලීමට සලස්වන්නේය. (වැස්ස, සුළඟ) ඝන වලාකුළුද ඔහුම ඉකුත් කරන්නේය. (12:12)*

*හෙණ හඬද ඔහුගේ ප්‍රශංසාව ගායනා කරන්නේය; ඔහුම හෙණ වැදීමට සලස්වා එමඟින් ඔහු අදහස් කරන අයට පහර දෙන්නේය; (13:13)*

*රාත්‍රීයේද, දහවලේද නිදාගෙන විඩාව නිවා ගැනීමද, භූමියෙහි විවිධ ප්‍රදේශයන්ට ගොස් ඔහුගේ වරප්‍රසාදයන් සොයා ගැනීමද, ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැයයි. සවන් දෙන ජනතාවට මෙහිද (බොහෝමයක්) සාධකයන් ඇත්තේය. (30:23)*

*(නබියේ!) ඔබගේ දෙවියන් සෙවණැල්ල කෙසේ අඩු කරන්නේද, කෙසේ වැඩි කරන්නේද යන්න ඔබ අවධානය කළේ නැද්ද? ඔහු අදහස්කර තිබුණේ නම්, එය ස්ථිරව තිබීමට සැළැස්විය හැක. සූර්යයාව චන්ද්‍රයා ඉදිරියෙන් අපිම පත් කළෙමු. (25:45)*

*ඔහුම සූර්යයා දීප්තිම ආලෝකයක් වශයෙන්ද්, චන්ද්‍රයා (අලංකාරවත්) ආලෝකය ලබා දෙන්නක් බවටද පත්කර අවුරුදු සංඛ්‍යාවද, මාසයන්හී ගණනයද ඔබ දැන ගැනීම පිණිස, (චන්ද්‍රයා වන) එයට (මාරුවෙන් මාරුවට පැමිණිය හැකි) අවස්ථාවන්ද මනක්කල්පිත කළේය. සත්‍යය වූ නියමිත කාරණාවක් නොමැතිව මේවා අල්ලාහ් උත්පාදනය කළේ නැත. දැනගත හැකි ජනතාව වෙනුවෙන් (තම බලසම්පන්නකමට අයත්) සාධකයන් (මෙසේ) විවරණය කරන්නේය. (10:5)*

*අහස්ද භූමියද උත්පාදනය කර තිබීමද, ඔබගේ භාෂාවන්ද, වර්ණයන්ද වෙනස්වී තිබීමද, ඔහුගේ සාදකයන්ගෙන් ඇති දැයයි. මෙහිද බුද්ධිමත් අයට නියත වශයෙන්ම (බොහෝමයක්) සාධකයන් ඇත්තේය. (30.22)*

*නියත වශයෙන්ම ඔබගේ දෙවියන් වන අල්ලාහ් අහස්ද, භූමියද දින හයකින් උත්පාදනය කර, අර්ෂ් මත තම රාජධානිය ස්ථාවර කර තැබුවේය. ඔහුම රාත්‍රියෙන් දහවල වසා දමන්නේය. (දහවලෙන් රාත්‍රිය වසා දමන්නේය). එය ඉතාමත් තීව්‍ර වශයෙන්ම එකකට පිටුපසින් එකක් වශයෙන් පිළිවෙලින් සිදුවෙමින් පවතින්නේය. සූර්යයාද, චන්ද්‍රයාද, තාරකාවන්ද ඔහුගේ නියෝගයන්ට ඇතුළත් වන්නේය. උත්පාදනයන්ද, එහි පාලනයද ඔහුටම අයත් දැය නොවේද? සකළ ලෝකයන්ම උත්පාදනය කර, පෝෂනය කර, සංවර්ධනය කරන අල්ලාහ් ඉමහත් භාග්‍යවන්තයෙකි. (7:54)* ______________

# විශ්මිත විශ්වය

විශ්වය නිර්මාණය වූයේ කෙසේ දැයි විද්‍යාව මගින් තවම සම්පූර්ණ තොරතුරු සොයා ගෙන නැත. විද්‍යාවේ දැනුමෙහි සීමාව Big Bang හී ආරම්භක ලක්ෂය දක්වා පමණක් විය. නමුත් එම ආරම්භක ලක්ෂය පැමිණියේ කොහෙන්ද සහ මනා ක්‍රමවේදයකට එය පුපුරා ගියේ කෙසේ දැයි විද්‍යාඥයන්ට තවම සොයා ගත නොහැකි විය.

අද වන විට විශ්වය පිළිබඳ බොහෝ තොරතුරු ජේම්ස් වෙබ් දුරේක්ෂය ඇතුළු විවිධ පරිමාණ දුරේක්ෂවලින් ලබා ගනී.

අපගේ ක්ෂීරපථයේ (අපගේ මන්දාකිණියේ) පමණක් තරු බිලියන 100 ක් පමණ ඇත. සියළුම මන්දාකිණි ක්ෂීරපථයට සමාන යැයි උපකල්පනය කළ හොත්, එයට අනුව නිරීක්ෂණය වන විශ්වයේ පමණක් තරු දළ වශයෙන් බිලියන 100x මන්දාකිණි ට්‍රිලියන 2 න් වැඩි කල යුතු වනවා. එය 2 x10 23 බලයකි. අපගේ ක්ෂීරපථයේ (මන්දාකිණියේ) පමනක් තරු බිලියන 100 ක් පමණ ඇත. නිරීක්ෂණය කළ හැකි විශ්වයේ මන්දාකිණි ට්‍රිලියන 2 පමණ ඇත. (200,000,000,000,000,000,000,000). මෙයින් සූර්යයා යනු එක තරුවකි.

මන්දාකිනියේ ඇති සියලුම වස්තූන් එහි කේන්ද්‍රය වටා භ්‍රමණය වේ. ක්ෂීරපථයේ කේන්ද්‍රය වටා එක් වටයක් යැමට අපගේ සූර්යයාට (සහ පෘථිවියට) වසර මිලියන 230 ක් ගතවේ. අපි පැයට කිලෝමීටර 828,000 ක සාමාන්‍ය වේගයකින් ගමන් කරමින් සිටිමු. නමුත් එම ඉහළ වේගයකින් වුවද, ක්ෂීරපථය වටා එක් සම්පූර්ණ කක්ෂයක් සෑදීමට අපට වසර මිලියන 230 ක් පමණ ගත වේ! (පෘථිවි කක්ෂයේ වේගය සාමාන්‍යයෙන් 29.78 km/s - 107,208 km/h)

Oort Cloud හි ඇත කෙළවර අපගේ සෞරග්‍රහ මණ්ඩලයේ මායිම ලෙස සලකනු ලබන අතර, සෞරග්‍රහ මණ්ඩලයේ විෂ්කම්භය කිලෝමීටර ට්‍රිලියන 30 ක දළ ඇස්තමේන්තුවක් ලබා දෙයි. එය ආලෝක වර්ෂ 3 කට වඩා වැඩිය.

නිරීක්ෂණය කළ හැකි විශ්වයේ මන්දාකිණි බිලියන 125 (1.25×1011) පමණ ඇත.

අපට සමීපතම මන්දාකිණිය සූර්යයාගේ සිට ආලෝක වර්ෂ 25,000 දුරින් පිහිටා ඇත. මීළඟට ආසන්නතම මන්දාකිණිය සූර්යයාගේ සිට ආලෝක වර්ෂ 70,000 දුරින් පිහිටා ඇත.

ආසන්නතම තාරකාව වන Proxima Centauri ආලෝක වර්ෂ 4.24 ක් ඈතින් පිහිටා ඇත

Nebula -(නිහාරිකා) වක් යනු අභ්‍යවකාශයේ ඇති දූවිලි හා වායු වලින් සමන්විත යෝධ වලාකුළකි. සමහර නිහාරිකා (එකකට වඩා වැඩි නිහාරිකා) සුපර්නෝවා වැනි මිය යන තාරකාවක පිපිරීමෙන් පිටතට විසි කරන වායු හා දූවිලි වලින් පැමිණේ.

අනෙකුත් නිහාරිකා යනු නව තාරකා සෑදීමට පටන් ගන්නා කලාප වේ.

ක්ෂීරපථ මන්දාකිණිය තුළ ග්‍රහලෝක නිහාරිකා ලෙස හඳුන්වන වස්තූන් 20,000ක් පමණ ඇත. ඉන් 3,500ක් පමණ ලැයිස්තුගත කර ඇත.

පෘථිවිය හා සසඳන විට සූර්යයා අති විශාලයි! පෘථිවිය සාමාන්‍ය සූර්ය ලපයක් තරම් විශාලයි! සූර්යයා සමස්ත සෞරග්‍රහ මණ්ඩලයේ ස්කන්ධයෙන් 99.86% ක් අඩංගු වේ. පෘථිවියේ සිට සූර්යයා දක්වා දුර කිලෝමීටර් මිලියන 149. සූර්යයාගේ විෂ්කම්භය කිලෝමීටර් මිලියන 1.39 පමණ වේ. මෙය පෘථිවියේ විෂ්කම්භය මෙන් 109 ගුණයක් පමණ වේ.

සූර්යයාගේ බර පෘථිවිය මෙන් 333,000 ගුණයක් පමණ වේ. එය කොතරම් විශාලද යත් පෘථිවි ග්‍රහලෝක 1,300,000ක් පමණ එහි අභ්‍යන්තරයට ගැලපේ.

පෘථිවිය සහ චන්ද්‍රයා අතර සාමාන්‍ය දුර කිලෝමීටර් 384 400 කි. පෘථිවිය සඳට වඩා දළ වශයෙන් විෂ්කම්භය 4 ගුණයක්, පෘෂ්ඨීය වපසරියෙන් 13 ගුණයක්, ස්කන්ධයෙන් 81 ගුණයක්.

කළු කුහර යනු අඳුරු, පදාර්ථ ගිල දමන ගුරුත්වාකර්ෂණ බෝල කුහර වේ.

phoenix A black hole විශාලතම දන්නා කළු කුහරය වන අතර එය සූර්යයා මෙන් බිලියන 100 ක ස්කන්ධයක් ඇත. අපට ආසන්නම විශාලතම කළු කුහරය

TON 618 වේ. එය සූර්යයා මෙන් බිලියන 66කි. එහි විෂ්කම්භය කි.මී. බිලියන 130 ක් පමන වේ. එය සූර්යයා මෙන් 140 ට්‍රිලියන තරමක් ආලෝකමත්ය. එය ආලෝක වර්ෂ බිලියන 10ක් දුරින් පිහිටා ඇත.

---

## තාරකා භෞතික විද්‍යාව පිලිබඳ අල් කුර්ආනයේ එන සංකල්ප

විශ්වය සහ එහි ඇති සියළුම දේවල්වල මැවුම්කරු අල්ලාහ් යැයි කුරානය මගින් අවධාරණය කර සිටියි. මේ නිසා විශ්වය ගැන නිවැරදි තොරතුරු ලබා දිය හැක්කේ අල්ලාහ්ට පමණි. එසේ ලබා දෙන තොරතුරුවල වැරදි ඇතොත් කුරානය අභියෝගයට ලක් කල හැකි වන්නේය. අනෙක් අතට විද්‍යාව නොදියුණු යුගයක කුරණයෙන් ඉදිරිපත් කොට ඇති ගැඹුරු විද්‍යා සංකල්පයන් 100% ක් නිවැරදි වීමෙන් පෙන්නුම් කරන්නේ අල් කුරානය සර්වඥානි දෙවිකෙනෙකුගේ පණිවිඩයක් විය යුතු බවයි. මේ අනුව අල් කුරානයේ විද්‍යාවට සම්බන්ද වැකි සියල්ල ඉතා වැදගත් පණිවිඩයක් ලබා දෙන්නේය. කෙසේ වෙතත් මෙහිදී සලකා බලනු ලබන්නේ තරකා භෞතික විද්‍යාවට අයත් වැකි දෙක තුනක් පමණි.

අල් කුරානය තුල විශ්වයේ ප්‍රසාරණය, ග්‍රහවස්තුවල ගමන් පිළිබඳව මෙන්ම තවත් ඉතා වැදගත් කරුණු අන්තර්ගත වන්නේය. එහෙත් මේවා ගැන 7 වන සියවසේදී කිසිවෙකු දැනගෙන සිටියේ නැත. එබැවින් එවැනි දෙයක් ඉතා නිවැරදිව ප්‍රකාශ කිරීමට නම් දේව පණිවිඩයක්ම ලැබිය යුතුය. ඇයිද යත් එම කරුණු විද්‍යාඥයින් විසින් සොයාගෙන ඇත්තේ ඉතා නවීන උපකරණ යොදාගනිමින් 20 වන සියවසේ දීය. පහත දක්වා ඇත්තේ තාරකා භෞතික විද්‍යාව පිලිබඳ ඉතා වැදගත් සංකල්පයකි.

*"අපි අහස ශක්තියෙන් අධිකවූවක් ලෙස ගොඩනැගුවෙමු, තවද නියතවශයෙන්ම අපි එය ක්‍රමයෙන් ව්‍යාප්ත කරන්නෙමු" (කුරානය 51:47).*

මෙය මුලින්ම සොයා ගනු ලැබුවේ එඩ්වඩ් හබල් විසිනි. ඉන්පසු වර්ෂ 1998 දී ස්වාධීන ව්‍යාපෘති දෙකක් මගින් නැවත තහවුරු කොට ඇත. එම ව්‍යාපෘති දෙක වන්නේ සුපර්නෝවා කොස්මොලොජි ප්‍රොජෙක්ට් සහ හයි-Z සුපර්නෝවා යන කණ්ඩායම දෙකයි. ඔවුන් විසින් විශ්වය ප්‍රසාරණය වන බව නැවත තහවුරු කොට ඇත (The Supernova Cosmology Project and the High-Z Supernova Search Team).

විශ්වය ප්‍රසාරණය වන බව සොයාගැනීමෙන් පසු මහා පිපිරුම් වාදය ඉදිරිපත් කළේය. එහෙත් අල් කුරානය මගින් එවැනි සංකල්පයක් ද ඉදිරිපත් කොට තිබේ.

*"නියතව අහස් හා පොළොව සම්බන්ධ වී තිබුණි, අපිම එම දෙකම වෙන් කළෙමු;" (කුරානය 21:30).*

*"Have those who disbelieved not considered that the heavens and the earth were a joined entity, then We separated them, and made from water every living thing? Then will they not believe?" (Quran 21:30)*

මෙය මහා පිපිරුම් වදයට සම්බන්ද ඉතා වැදගත් ප්‍රකාශනයකි. මෙවැනි වදනක් සඳහන් කල හැක්කේ අල් කුරානය අල්ලාහ් විසින් පහළ කල බැවිනි.

මිට අමතරව තාරකා භෞතික විද්‍යාව සම්බන්ද තවත් ඉතා වැදගත් කරුණු කුරානය තුල දැකිය හැකිය. එනම් සූර්යා ඊට නියමිත ගමන් මාර්ගයක යමින් සිටින බවයි. එහෙත් මෙම කරුණ විද්‍යාඥයින් සොයා ගනු ලැබුවේ විද්‍යාවේ දියුණුවත් සමගය.

*"සූර්යයා තමාට නියමිත ස්ථානය බලා දිවමින් සිටියි" (කුරානය 36:38).*

මෙතරම් නිවැරදි ප්‍රකාශන අල් කුරණයන් හෙළි කල හැක්කේ එය විශ්වයේ මැවුම්කරු වන අල්ලාහ්ගෙන් පහළ වූ නිසාය. විද්‍යාඥයින් සොයා ගෙන ඇති පරිදි සූර්යයා අපගේ ක්ෂීරපථය වටා චක්‍රාකාර කක්ෂයක තත්පයකට කිලෝමීටර 220 ක වේගයෙන් ගමන් කරන්නේය. මෙම ගමන සම්පූර්ණ කිරීම සඳහා සූර්යයාට වසර මිලියන 230 ක් ගත වන බව ගණන් බලා තිබේ. එසේ

තිබියදී සූර්යාගේ ගමන ගැන කුරානයේ මිට සියවස් 14 කට පමණ පෙර පවසා තිබේ.

ඇතැම් විද්‍යාඥයින් පවසන්නේ ඉහත සඳහන් කොට ඇති සංකල්පයන් දෙවියන්ගේ පණිවිඩයකින් මිස නබිතුමාට ප්‍රකාශ කළ නොහැකි බවයි. ඒ අනුව අල් කුරානය මිනිසාට නිවැරදි දහම් මාර්ගය පෙන්වා දීම සඳහා අල්ලාහ්ගෙන් පහළ වූ පණිවිඩයක් බව පිළිගත යුතු වන්නේය. (FA)

---

## විශ්මිත සොබාදහම.

සොබාදහම යටතේ විවිධත්වයෙන් යුත් බොහෝ මාතෘකා ගැන කතා කල හැක. පොළවේ පිහිටීම, ගස් කොළන්, මල් වර්ග, පැලෑටි, පළතුරු,, වෙනත් ආහර වර්ග, විවිධ පාෂාණ වර්ග, රසායනික ද්‍රව්‍ය, වායු වර්ග, වලාකුළුවල ස්වභාවය, ගංගා ඇල දොල, සාගරයේ මතුපිට සහ එහි අභ්‍යන්තරය, වර්ෂාපතනය, ජල චක්‍රය, කුඩා සතුන්, විශාල සතුන්, ඔවුන්ගේ ජීවන රටා, ජීවීන්ගේ ආහාර දාම, ආලෝකය, විද්‍යුතය, චුම්භකත්වය, ගුරුත්වාකර්ෂනය, ආදිය ඉන් සමහරකි. මේවා සෑම එකක්ම ඉතා පරිපූර්ණ සහ සැලසුම්සහගත ලෙස පිහිටන බවක් අපට දකින්නට පුළුවන. ඒ වගේම ඒවා එකෙනෙක අතරත් මනා සම්බන්ධතා පවතිමින් අපගේ සොබා දහම විශ්මිත නිමැවුමක් ලෙස අපිට දකින්නට පුළුවන. මිනිසා තම ජීවිත කාලය තුල මේව ගැන බොහෝ දේ ඉගනගනිමින් සිටී. නමුත් මේවායේ ආරම්භය ගැන වැඩිය සිතන්නෙ නෑ. සිතන්නෙ නැතිව ඒවා පාවිච්චි කරනව, ඒවා භුක්ති විදිනවා. වෙන ආකරයට කියනවා නම් තමන්ගෙ නොවන දේවල් තමන්ගෙ වගේ භුක්ති විදිනවා.

යමෙක් සොබාදහමේ ඇති නියමයක් සොයාගෙන එය ඉදිරිපත් කළ විට (සමහර විට) ඒ සඳහා ඔහුට නොබෙල් තෑගි පවා දේ. සමහර විට ඔහුට එම කාරණාවේ “පියා“ යන විරුදාවලියද ලබා දේ. එහෙත් එම නියමය එහි ස්ථාපනය කළ දෙවියන්ව ඔවුන්ට මග හැරේ.

බුදුන්වහන්සේ පවා සුවිශේෂී දැනුමක් සොයාගත් කෙනෙකු ලෙස මිස දැනුමක් හෝ ඊට අදාල වටපිටාවක් නිර්මාණය කළ අයෙක් ලෙස හඳුන්වන්නේ නෑ. සොයා ගැනීමටත් කොහේ හෝ එය තිබිය යුතුයි යන්න බොහෝ අයට අමතකයි.

---

## සොබාදහම සහ දෙවියන්.

ඉර පායා බැස යන්නේය, දේශගුණික විපර්යාසයන් සිදුවන්නේය, බීජයකින් පැල හටගන්නේය. මෙවැනි අසීමිත සිදුවීම් විශ්වය පුරා දැකිය හැකිය. බොහෝ අය මේවා හඳුන්වන්නේ සොබාදහමේ ක්‍රියාවලියන් ලෙසය. එහෙත් මේවා පිටුපස ඇති බලය කුමක්දැයි බොහෝ අය සිතා බලන්නේ නැත. එබැවින් එය අර්ථදැක්වීමකට පමණක් සීමා වී තිබේ. කෙසේ වෙතත් කුරානයේ ඇති ඇතැම් කරුණු දෙස බැලීමේදී එම සිදුවීම් දෙවියන්ගේ නියෝගයක් බව පැහැදිලි වන්නේය.

එක් අවස්ථාවකදී ඉබ්‍රාහිම් නබිතුමාව විශාල ගින්නක් තුලට විසි කරන ලද අවස්ථාවේදී දෙවියන් ගින්නට සෘජුවම නියෝග කරමින් ඉබ්‍රාහිම් නබිතුමා කෙරෙහි ශාන්තිය දක්වන ලෙස නියෝග කළේය. ගින්නද එය ඉටු කල අතර ඉබ්‍රාහිම් නබිතුමා කිසිම පිලිස්සීමකින් තොරව ගින්නෙන් පිටතතට පැමිණියේය. සොබාදහම යනු දෙවියන්ගේ නියෝගයන් බව ගෙන හැර දැක්වීමට මෙය එක් උදාහරණයක් පමණි. තවත් අවස්ථාවකදී එක් නබිවරයෙක් විනාශයට පත්වූ නගරයක් හරහා යන අවස්ථාවේදී එම නගරය නැවත ගොඩ නගන්නේ කෙසේදැයි දෙවියන්ගෙන් විමසූ විට ඔහුව වසර ගණනාවක නින්දකට පත් කළේය. ඔහු නැවත අවදි වී බලන විට දක්නට ලැබුනේ ඔහු ගමන් කල බූරුවාගේ දිරා ගිය ඇටසැකිලි පමණි. එහෙත් ඔහු ගෙන ගිය ආහාර වලට කිසිම දෙයක් සිදු වී තිබුනේ නැත. තවද ඔහු නිදා සිටි කාලය ගැන ඔහුගෙන් විමසනු ලැබූ විට ඔහු පවසා ඇත්තේ දවසක් හෝ ඉන් කොටසක් ලෙසය. මින් පැහැදිලි වන්නේ කාලය දෙවියන්ගේ නියෝගය අනුව තුන් ආකාරයකට ක්‍රියා කොට ඇති බවයි. මින් පැහැදිලිවන්නේ සොබාව දහම යනු දෙවියන්ගේ නියෝගයන් බවයි.

වාහනයක්, ගුවන් යානයක්, පරිගණකයක් වැනි දේවල් ඉබේ ඇතිවන්නේ නැත. ඒවා සෑදීම සඳහා දැනුම ඇති උදවිය සිටිය යුතුය. එසේ නම් ඊට වඩා ඉතා සංකීර්ණ ගස් කොලන්, සතා සිව්පාවන්, ගංගා ඇල දොළ ඉබේ ඇති විය හැකිද? මිනිසා විසින් සාදන ලද ඉතා උසස් නිර්මාණයක් වන පරිගණකය පවා තවත් කෙනෙකුට සෑදීමට හැකිය. එහෙත් දෙවියන් මවන ලද ලේ බිඳක් හෝ වෙන යමක් කිසිවෙකුට නිර්මාණය කළ නොහැකිය. එසේ තිබියදී ඒවා කිසිවෙකුගේ නිර්මාණයක් නොවේ යැයි කියන්නේ කෙසේද? ඇත්ත වශයෙන්ම ඒවා සර්වබලධාරී දෙවියන්ගේ මැවීම් වන්නේය.

බීජයක් පසෙහි දැමූ විට එය දිරා නොගොස් පැලයක් හට ගන්නේ ඒ සඳහා යම් සැලසුමක් තිබෙන නිසාය. එවැනි දෙයක් ලොව වෙසෙන සියළුම විද්‍යාඥයින් එකතුවී උත්සාහ කලත් සිදු කල නොහැකිය. එසේ නම් එවැනි සංකීර්ණ නිර්මාණයක් දෙවියන්ගේ ක්‍රියාවක් නොවේ යැයි කිව හැකිද? ඇත්ත වශයෙන්ම විශ්වය සහ එහි ඇති සියළුම දේවල් සර්වඥානී දෙවිකෙනෙකුගේ ක්‍රියාවක් විය යුතුය. එහෙත් අපට දෙවියන්ව දැකීමට නොහැකි වීම වෙනම කරුණකි. දෙවියන්ව මෙලොවදී නොදුටු පමණින් දෙවි කෙනෙක් නැතැයි නිගමනයට පැමිණිය නොහැකිය.

සුන්බුන් ගොඩක් කොපමණ කාලයක් තිබුනත් ඉන් පරිගණක යාන වාහන ගෙවල් දොරවල් නිර්මාණය වන්නේ නැත. ඒ සඳහා යම් බලයක් ක්‍රියාත්මක විය යුතුය. එසේ නම් පරමාණුවේ සිට දැවැන්ත ක්ෂීරපත දක්වා වූ සෑම දෙයක්ම කව්රුන් විසින් හෝ නිර්මාණය කොට තිබිය යුතු නොවේද?

මෙම විශ්වය නිකම්ම මැවීමක් නොවේ. එහි බොහෝ භෞතික නීති ක්‍රියාත්මක වන්නේය. උදාහරණක් වශයෙන් මුහුදේ ගමන් කරන විශාල නැවක් නොගිලී ගමන් කරන්නේ ඒ මත උඩුකුරු තෙරපුම් බලයක් ක්‍රියාත්මක වන නිසාය. එම බලය ඉබේ ඇති විය හැකිද? නැතහොත් කව්රුන් හෝ විසින් එය ඇති කොට තිබිය යුතුද? ඔහු කව්ද? විශ්වය පුරා මෙවැනි තවත් බොහෝ භෞතික නීති ක්‍රියාත්මක වන්නේය. ඒවායේ ප්‍රතිපලයක් වශයෙන් අපට බොහෝ දේවල් කල හැකිව තිබේ. භෞතික නීති වලට අමතරව විශ්වය පුරා අතිශයින්ම සංකීර්ණ රසායනික සංයෝග දැකිය හැකිය. විශ්වයේ ඇති සෑම දෙයක්ම ගොඩ නැගී

ඇත්තේ ඒවායේ ප්‍රතිපලයක් ලෙසය. මෙය මිනිසා විසින් තේරුම් ගත යුතුව තිබේ.

ලෝකයේ තිබෙන ජෛව විවිදත්වය දෙස බලන කල ඒවා පිටුපස ඉතා ඥානාන්විත මැවුම් කරුවෙක් සිටිය යුතු බව පැහැදිලිය. ඇයිද යත් සෑම ජීවියෙකුට මවා ඒවාට අවශ්‍යා අහාර සහ ඒවායේ පැවැත්ම සඳහා වැඩ පිළිවෙලක් සකසා තිබෙන නිසාය. එවැනි දේවල් කිසිසේත්ම ඉබේ සිදු විය නොහැකිය. එය දෙවියන්ගේ ක්‍රියාවක්ම විය යුතුය.

විශ්වයේ මැවුම්කරු වන දෙවියන් ගැන දැනගැනීම මිනිසාගේ වගකීමකි. සෑම ප්‍රධාන ආගමකින්ම ඔහු ගැන සඳහන් කොට ඇත. ඔහු මිනිසාව මවා ඇත්තේ සුවිශේෂී කරුණක් සඳහා ය. ඒ බව දෙවියන් පහළ කල සෑම දහමකින්ම උගන්වා තිබේ. ඒවා හැදෑරීමෙන් මිනිස් ජීවිතයේ නිවැරදි අරමුණ තේරුම් ගැනීමට හැකි වනු ඇත. එය මිනිසා හමුවේ ඇති ප්‍රධාන වගකීමක්ද වේ.

---

## ඔබ මවිත වන දේවල් කිහිපයක්.

## (කුඩාම දේ සිට විශාලම දේ දක්වා).

මෙම ලිපිය ලිවීමේ මගේ අරමුණ වන්නේ පරමාණුවක කුඩාම අංශුවෙන් ආරම්භ වී ක්‍රමයෙන් විශාල වී අවසානයේ විශ්වයටත් වඩා විශාල වන දේවල් කිහිපයක් ඔබට පෙන්වීමයි. අවසාන ප්‍රතිඵලය දැනගත් විට ඔබ පුදුම වනු ඇත. හොඳයි, අපි කුඩාම දෙයින් පටන් ගනිමු.

වැලි කැටයක් කොටස් මිලියනයකට කැඩුවම පරමාණුවක් ප්‍රමානය අපට ලැබේ.

වැලි කැටයක් බිලියන 2000 කට කැඩූ විට ඉන් එක කොටසක් පරමානුව ඇතුලෙ තියෙන ඉලෙක්ට්‍රෝනයක ප්‍රමාණය අපට ලැබේ. (මෙය 1897 දී සොයා ගන්නා ලදී.

එයටත් වඩා කුඩා, එනම් එම එලෙක්ට්‍රෝනයෙන් තුනෙන් එකක තරම් ප්‍රමාණයෙන් යුත් නියුට්‍රෝන ගැන 1911 දී සොයා ගනු ලැබුවා.

භෞතික විද්‍යාඥයන් ප්‍රථම වරට ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන සමඟ ගැටුණු විට, ප්‍රෝටෝනය තුළ ඇති කුඩා දෘඩ න්‍යෂ්ටි තුනකින් ඉලෙක්ට්‍රෝන පැන යන බව ඔවුන් නිරීක්ෂණය කළහ. එවිට ලැබෙන හරය ක්වාක් (QUARK) ලෙස හැඳින්විණි. Quarks යනු විද්‍යාත්මක ප්‍රයත්නයේදී මෙතෙක් මිනිසාට හමු වූ කුඩාම අංශු වේ.

Quark එකක ප්‍රමාණය දළ වශයෙන් දැනගැනීමට විද්‍යාඥයන් දක්ෂ අධ්‍යයනයන් කිහිපයක් කිරීමට සමත් වී ඇත. අවසාන වශයෙන්, එය සෙන්ටිමීටරයකින් බිලියනයෙන් බිලියනයෙන් පංගුවක් පමණ වන බව සොයා ගැනීමට මට හැකි විය.

1 Quark = 0.00000000000000001 cm

මේවා කොතරම් කුඩා වුවත් ඒවාට නිශ්චිත ව්‍යුහාත්මක ස්වභාවයන් ඇති බව පැහැදිලි වේ. දැන් අපිට මතුවන ගැටළුවක් තමයි, මෙවා කොතරම් කුඩා වුවත්, මෙවා මෙලෙස ඉබේ සැලසුම් සහගත වෙන්න පුළුවනිද? සාමාන්‍ය මනුස්ස බුද්ධියට අනුව උනත් හේතුවකින් තොරව කිසිවක් මෙලෙස ඉබේ සිදු විය නොහැකිය.

**දෙවියන් වහන්සේ විසින් ශුද්ධ වූ කුර්ආනයේ ස්ථාන දෙකක පරමාණුවක කුඩාම අංශුව ගැන මෙසේ සඳහන් කර ඇත.**

*ඔහු ගුප්ත දැය සියල්ල දන්නෙකි. ඔහු නොදැනුවත්ව අහස් හි හෝ භූමියෙහි හෝ ඇති දැයෙන් එක් අණුවක ප්‍රමාණයක් තරම් හෝ බේරී යන්නේ නැත. ඊටත් වඩා කුඩා හෝ ලොකු හෝ (සෑම දෙයක්ම) ලව්හුල් මහ්ෆූල් නැමැති පැහැදිලි සටහන් පුස්තකයෙහි සටහන් නොවී නැත; (34:3).*

*භූමියෙහි හෝ අහසෙහි හෝ ඇති දැයෙන් එක් අණු ප්‍රමාණයකින් හෝ (නබියේ!) ඔබගේ දෙවියන් නොදැන වැරද යන්නේ නැත. මේවාටත් වඩා කුඩා හෝ ලොකු*

*හෝ (කුමක් වුවද), ඔහුගේ පැහැදිලි සටහන් පුස්තකයෙහි සටහන් නොකර ඇත්තේ නැත. (10:61)*

*එම අල්ලාහ්ම උත්පාදකයාය. (ඔහුම උත්පාදනයන් සැලසුම් කරන්නේය). හැඩරුව නිර්මාණය කරන්නාය.; (59:24)*

පහතින් සඳහන් කර ඇත්තේ අප මවිතයට පත් කරන අපට පිළිගත හැකි කුඩා සහ විශාල නිර්මාණ කිහිපයකි. ඇත්තෙන්ම පුදුමයි. අදහාගත නොහැකියි. නමුත් ඒවා ඇත්ත බව අද තාක්ෂණය මගින් යම් යම් ප්‍රමාණ වලින් හෝ තහවුරු කර ඇත. මේ සෑම එකක්ම ඉබේ සෑකසිය හැකි දැයි සිතමින්ම කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න. මේවාට අදාල රූප කිහිපයක් "දෙවියන්ගේ නිර්මාණ: විශ්මිත රූප එකතුවක්" වෙත පිවිස බලන්න

**මිනිසා සම්බන්ධව**

- මිනිස් සිරුර තුළ සහ ඒ මත බැක්ටීරියා (වර්ග දහසක් පමන) ගනනින් ට්‍රිලියන 39 ක් පමණ ක්‍රියාත්මකව ඇත
- සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ සිරුරේ සෛල වර්ග 200ක් පමණ ඇත.
- වැඩුනු පිරිමියෙකුගේ සිරුරේ සෛල ට්‍රිලියන 36 පමණ ඇත.
- මිනිස් ඇස ඩිජිටල් කැමරාවක් නම් එහි මෙගාපික්සල් 576ක් තිබෙනු ඇත. දෘෂ්ටි විතානයේ සෛල මිලියන 127 ක් පමණ ඇත. ඔබේ ශරීරයේ වඩාත් ක්‍රියාකාරී මාංශ පේශී ඇත්තේ ඔබේ ඇස්වලය.
- ඇසෙහි චලනය වන කොටස් මිලියන 2 කට වඩා ඇත.
- ඔබේ හදවත දිනකට 100,000 වාරයක් පමණ ස්පන්දනය වේ. ඔබ මැරෙනකම්ම එයට විවේකයක් නැත.
- ඔබේ ශරීරය හරහා රුධිරය කිලෝමීටර් 19,000 පමණ ගමන් කරයි, එය පෘථිවියේ විෂ්කම්භය මෙන් දෙගුණයක් වේ.
- වැඩිහිටි මිනිස් මොළයට ගිගාබයිට් මිලියන 2.5 (2,500,000GB)කට සමාන මතකයක් රැස් කර ගත හැකිය.
- සාමාන්‍ය පිරිමි මොළයේ සෛල බිලියන 171 ක් පමණ ඇත. එයින් බිලියන 86 ක් පමණ නියුරෝන සෛලය. සාමාන්‍යයෙන්, මොළයේ

සම්බන්ධතා ට්‍රිලියන 100කට වඩා සමන්විත වේ. සෑම නියුරෝනයකටම සම්බන්ධතා 1,000 ක් පමණ සෑදීමට හැකියාව ඇත.

- එක මිනිසෙකුගේ DNA සියල්ල දිග නූලක් ලෙස සැකසුවොත් එය සම්පූර්ණ දිග කිලෝමීටර බිලියන 575කට පමණ ආසන්න වේ. (575,000,000,000 km). අපේ පෘථිවිය වටේ වට ලක්ශ 143 ක් පමණ එතිය හැකි තරම් දිගය.
- සෑම තත්පරයකටම රතු රුධිර සෛල මිලියන 2ත් 3ත් අතර ප්‍රමාණයක් ඇට මිදුළු තුළ නිපදවා සංසරණයට මුදා හරිනු ලැබේ. තත්පරයක් තුල එවැනිම රතු රුධිර සෛල ප්‍රමාණයක් මිය යයි.
- සාමාන්‍යයෙන් පිරිමින් ශුක්‍රාණු පිට කරන සෑම අවස්ථාවකම ශුක්‍රාණු. මිලියන 100කට ආසන්න ප්‍රමාණයක් මුදාහරිනවා. කාන්තාවකගේ ඩිම්බය සංසේචනය කිරීමට අවශ්‍ය වන්නේ එක් ශුක්‍රාණුවක් පමණි.
- සාමාන්‍ය මිනිසෙකුගෙ වසර 67ක පමණ කාලයක් තුල හිසකෙස්/ රෝම 1000km පමණ වර්ධනය වේ.
- සාමාන්‍ය මිනිසෙකුගෙ (10cm පමණ දිග) වකුගඩු දෙක මගින් දිනකට රුධිර ලීටර් 180 ක් පමණ පෙරීම, රතු රුධිර සෛල නිෂ්පාදනය පාලනය කිරීම, ඔබේ රුධිර පීඩනය නියාමනය කරන හෝමෝන නිකුත් කිරීම සහ ශරීරයෙන් අපද්‍රව්‍ය මුත්‍රා ලෙස ඉවත් කිරීම සිදු කරයි.

**සතුන් සම්බන්ධව**

- සත්ව ලොක්කය තුල එකිනෙකාට වෙනස් සුවිශේෂතා දහස් ගනනින් දැකිය හැක. කිහිපයක් මෙහි පමණක් පෙන්වා ඇත. මේ සියල්ලක් තුලම නිර්මාණකරුවෙකුගේ මහිමය විදහා පෙන්වයි.
- ලෝකයේ සිහින්ම සත්වයා හග්ෆිෂ් ය. ඔවුන්ට තත්පර 0.1 කට අඩු කාලයකදී සෙවල ලීටරයක් නිපදවිය හැකිය.
- ලෝකයේ වැඩිපුරම හිසකෙස් ප්‍රතිශතයක් ඇති සත්වයා මුහුදු ඔටර් වන අතර, උගේ ශරීරයේ සෙන්ටිමීටරයකට හිසකෙස් 100-160,000 කින් සමන්විත වේ (වැඩිහිටියෙකු මුළු හිසකෙස් බිලියනයකට වඩා ඇත).

- අලියෙකුගේ හොඬවැල ලෝකයේ විශාලතම නාසයයි. උගේ නහයෙන් ගස් ඇදගෙන යාම සහ කිලෝග්‍රෑම් 350 දක්වා බර ඔසවන්නට හැකිය.
- ඩොල්ෆින්ට එක ඇසක් විවෘතව තබාගෙන නිදා ගත හැකිය. එක වරකට නිදා ගන්නේ ඔවුන්ගේ මොළයෙන් අඩක් පමණි. මෙය ඔවුන්ගේ පැවැත්මට අත්‍යවශ්‍ය වන අතර හුස්ම ගැනීමට මතුපිටට පැමිණීමට සහ සුපරීක්ෂාකාරීව සිටීමට අවදියෙන් සිටීම උපකාරී වේ.
- වැඩිපුරම නිදා ගන්නා සත්වයා කෝලා ය. සෑම දිනකම පැය 20-22 ක් නිදා ගනී.
- ලොව බරම පියාඹන කුරුල්ලා වන කෝරි බස්ටාඩ්ගේ බර කිලෝග්‍රෑම් 11-19 කි.
- මෙතෙක් බරින් වැඩිම සත්වයා ලෙස හඳුනාගෙන ඇත්තේ වන්නේ පෙරුසෙටුස් සොලොස්සුස් නම් තල්මසාය. උගේ අස්ථිවල ඝනත්වය අනුව ගනන් බලද්දි ශරීරය උපරිමව ටොන් 340 කට ආසන්න ශරීර ස්කන්ධයක් තියෙන්නට ඇත.
- බූවල්ලාට හදවත් තුනක් ඇත, ඒවාට එකිනෙකට තරමක් වෙනස් භූමිකාවන් ඇත.
- පිරිමි මුහුදු අශ්වයන් පැටවුන් බිහි කරයි. මුහුදු අශ්වයන් යම් ආකාරයක ප්‍රතිලෝම ගැබ් ගැනීමක් පෙන්වයි - සංසේචනය කිරීමෙන් පසු බිත්තර වර්ධනය වීමට පිරිමින්ගේ මල්ලකට මාරු කරනු ලැබේ. එහිදී බිත්තරවලට ඔක්සිජන් සහ ආරක්ෂාව ලැබෙන අතර, ගැබ් ගැනීම දින 14 සිට 28 දක්වා පවතින අතර, පසුව පිරිමි සතා පැටවුන් ලෙස හැඳින්වෙන සජීවී පැටවුන් වරකට 2000 පමණ බිහි කරයි.
- චීටා යනු ලොව වේගවත්ම සතුන් වන අතර පැයට කිලෝමීටර 120 ක වේගයක් කරා ළඟා වේ. එක් පියවරකින් ඔවුන්ට වේගය පැයට කිලෝමීටර 10 කින් වැඩි කළ හැකියි.
- විදුලි ඊලෙකුට වෝල්ට් 600 (V) ක ධාරාවකින් ඉහළ මට්ටමේ කම්පනයක් ඇති කළ හැකිය.

**විශ්වය සම්බන්ධව**

- ආලෝකයේ වේගය :- චලනය වන ප්‍රභවයකින් ලැබෙන ආලෝකය තත්පරයට කිලෝමීටර් 300,000 ක වේගයෙන් ගමන් කරයි. (සූර්යයාගෙන් නිකුත්වන ආලෝක කදම්භයක් තත්පරයට කිලෝමීටර ලක්ශ තුනක වේගයෙන් කිලෝමීටර මිලියන 150 ක දුරක් තත්පර 500 කදී ගමන් කර පෘතිවියට ලඟා වේ). ආලෝක වර්ෂය යනු ආලෝකය වසරක් තුළ ගමන් කරන දුරයි. එනම්, කිලෝමීටර් ට්‍රිලියන 9 කි.
- Oort Cloud හි ඇත කෙළවර අපගේ සෞරග්‍රහ මණ්ඩලයේ මායිම ලෙස සලකනු ලබන අතර, සෞරග්‍රහ මණ්ඩලයේ විෂ්කම්භය කිලෝමීටර ට්‍රිලියන 30 ක දළ ඇස්තමේන්තුවක් ලබා දෙයි. එය ආලෝක වර්ෂ 3 කට වඩා වැඩිය.
- අපගේ සෞරග්‍රහ මණ්ඩලය පිහිටා ඇත්තේ මන්දාකිණියේ මධ්‍යයේ සිට ආලෝක වර්ෂ 26,000ක් ඈතිනි. ක්ෂීරපථය ආසන්න වශයෙන් ආලෝක වර්ෂ 100,000 ක විෂ්කම්භයකින් යුක්ත වේ.
- අපගේ ක්ෂීරපථයේ (අපගේ මන්දාකිණියේ) පමණක් තරු බිලියන 100 ක් පමණ ඇත. සියළුම මන්දාකිණි ක්ෂීරපථයට සමාන යැයි උපකල්පනය කළ හොත්, එයට අනුව නිරීක්ෂණය වන විශ්වයේ පමණක් තරු දළ වශයෙන් (තරු බිලියන 100 මන්දාකිණි ට්‍රිලියන 2 න් වැඩි කල යුතු වනවා) එය 2 x10 23 බලයකි. (200,000,000,000,000,000,000,000). මෙයින් සූර්යයා යනු එක තරුවකි.
- සූර්යයාට ආසන්නතම අනිත් තාරකාව වන Proxima Centauri ආලෝක වර්ෂ 4.24 ක් ඈතින් පිහිටා ඇත.
- පෘථිවිය සහ චන්ද්‍රයා අතර සාමාන්‍ය දුර කිලෝමීටර් 384 400 කි. පෘථිවිය සඳට වඩා දළ වශයෙන් විෂ්කම්භය 4 ගුණයක්, පෘෂ්ඨීය වපසරියෙන් 13 ගුණයක්, ස්කන්ධයෙන් 81 ගුණයක්.
- පෘථිවිය හා සසඳන විට සූර්යයා අති විශාලයි! පෘථිවිය සාමාන්‍ය සූර්ය ලපයක් තරම් විශාලයි! සූර්යයා සමස්ත සෞරග්‍රහ මණ්ඩලයේ ස්කන්ධයෙන් 99.86% ක් අඩංගු වේ. පෘථිවියේ සිට සූර්යයා දක්වා දුර කිලෝමීටර් මිලියන 149. සූර්යයාගේ විෂ්කම්භය කිලෝමීටර් මිලියන

1.39 පමණ වේ. මෙය පෘථිවියේ විෂ්කම්භය මෙන් 109 ගුණයක් පමණ වේ.

- සූර්යයාගේ බර පෘථිවිය මෙන් 333,000 ගුණයක් පමණ වේ. එය කොතරම් විශාලද යත් පෘථිවි ග්‍රහලෝක 1,300,000ක් පමණ එහි අභ්‍යන්තරයට ගැලපේ.
- අපට සමීපතම මන්දාකිණිය සූර්යයාගේ සිට ආලෝක වර්ෂ 25,000 දුරින් පිහිටා ඇත. මීළඟට ආසන්නතම මන්දාකිණිය සූර්යයාගේ සිට ආලෝක වර්ෂ 70,000 දුරින් පිහිටා ඇත.
- මන්දාකිනියේ ඇති සියලුම වස්තූන් එහි කේන්ද්‍රය වටා භ්‍රමණය වේ. ක්ෂීරපථයේ කේන්ද්‍රය වටා එක් වටයක් යෑමට අපගේ සූර්යයාට (සහ පෘථිවියට) වසර මිලියන 230 ක් ගතවේ. අපි පැයට කිලෝමීටර 828,000 ක සාමාන්‍ය වේගයකින් ගමන් කරමින් සිටිමු. නමුත් එම ඉහළ වේගයකින් වුවද, ක්ෂීරපථය වටා එක් සම්පූර්ණ කක්ෂයක් සෑදීමට අපට වසර මිලියන 230 ක් පමණ ගත වේ! (පෘථිවි කක්ෂයේ වේගය සාමාන්‍යයෙන් 29.78 km/s - 107,208 km/h).
- ආලෝකයේ වේගයට වඩා වේගයෙන් විශ්වය ප්‍රසාරණය වෙමින් පවතී.
- phoenix A black hole විශාලතම දන්නා කළු කුහරය වන අතර එය සූර්යයා මෙන් බිලියන 100 ක ස්කන්ධයක් ඇත. අපට ආසන්නම විශාලතම කළු කුහරය TON 618 වේ. එය සූර්යයා මෙන් බිලියන 66කි. එහි විශ්කම්භය කි.මී. බිලියන 130 ක් පමන වේ. එය සූර්යයා මෙන් 140 ට්‍රිලියන තරමක් ආලෝකමත්ය. එය ආලෝක වර්ෂ බිලියන 10ක් දුරින් පිහිටා ඇත.
- අප විශ්වය ලෙස කතා කරනුයේ අප සිටින පලමු අහස සම්බන්ධයෙනි. (දැනට අපට එහි නිරීක්ෂණය වන්නේ 5% පමන ප්‍රමාණයක් පමණි).

අල්ලාහ් (ඔහුගේ සන්න්නිධානයට අදාල) දින 6 කින් අප සිටින විශ්වය නිර්මාණය කළේය. පෘතුවියෙහි ස්වභාවය ඉන් දින දෙකක කාලයකදී සිදුවූ බවද සඳහන්.

(විද්‍යාඥයින් මෙය Big Bang Theory ලෙස හඳුන්වයි)

ඉහතින් සඳහන් කලේ අප මවිතයට පත් කරන අපට පිලිගත හැකි කුඩා සහ විශාල නිර්මාණ කිහිපයකි. ඇත්තෙන්ම පුදුමයි. අදහාගත නොහැකියි. නමුත් ඒවා ඇත්ත බව අද තාක්ෂණය මගින් තහවුරු කර ඇත.

පහතින් සඳහන්ව ඇත්තේ අප මවිතයට පත් කරන අපගේ තාක්ෂණයට ග්‍රහණය නොවන අදහා ගත නොහැකි තවත් නිර්මාණ කිහිපයකි.

ඉහතින් සඳහන් කර ඇති කාරනා පුදුම උනත් තාක්ෂණයේ දියුණුවත් සමග මිනිසාට එම කරුණුවල සත්‍යයතාවයන් තහවුරු කරගන්නට හැකිව තිබෙනවා.

ඒ වගේම අප විසින් වර්තමානයේදී තහවුරු කරගන්නා වූ ඇතැම් සුවිශේෂී කාරනා ගැන තාක්ෂණය අඩු ඉතිහාසයේ සිටි ඇතැම් සුවිශේෂී පුද්ගලයන්ගේ දේශනා වල සඳහන්ව තිබෙනු දැකිය හැක. ඒවා ඔවුන්ට විශේෂ ආකාරවලට ලැබුනු දැනුම් ලෙස අප විශ්වාස කරන්නෙමු.

එවැනි සුවිශේෂී දැනුම් සහිතව සිටි පුද්ගලයන් ලෙස බුදුන්වහන්සේ, මොහම්මද් (සල්) නබි තුමා, ඊට අමතරව ඇල්බර්ට් අයින්ස්ටයින් වැනි විද්‍යාඥයින් සහ තවත් එවැනි අය කිහිපදෙනෙක්ව සඳහන් කල හැකිය.

සමහර තොරතුරු අල් කුරාන් සහ හදීස්, ත්‍රිපිටකය, බයිබලය, වේදාස් උපනිශද් වැනි හින්දු ග්‍රන්ථ, තව්රාත් වැනි යුදෙව් ග්‍රන්ථ වැනි ආගමික ග්‍රන්ථ වල විශේෂයෙන්ම සඳහන්ව තිබෙනු දැකිය හැක. එනම් ඒවා පිටුපස යම් සැඟවුනු කාරනාවක් ගැබ්ව ඇතැයි සාධාරනව සිතන්නෙකුට වටහා ගත හැක.

විවිධ ආගමික මූලික ග්‍රන්ථ සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කර බැලුවහොත් සාමාන්‍ය මනුෂ්‍යයන්ට ග්‍රහණය කරගත නොහැකි එවැනි කරුණු විශ්වය සහ ඉන් එහා ඇති දේ ගැන දන්නා තැනකින් ලැබුණු තොරතුරු බව ප්‍රත්‍යක්‍ෂ වෙයි. විවිධ ආගමික ග්‍රන්ථ තුලින් එහි මුල් ස්වභාවයෙන්ම පවතින එකම ග්‍රන්ථය ලෙස අල් කුරාණය සඳහන් කල හැකිය. අනිකුත් ග්‍රන්ථ ධර්මය පහල වූ හෝ දේශනා කල ස්වභාවයෙන්ම ලිඛිත වූ බවක් දකින්නට නොමැතිකම එක්තරා කණගාටුවට කරුණකි. නමුත් යම් යම් කරුණු සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමට ඒවාද යම් අයුරකින් ප්‍රයෝජනවත් වන අවස්ථා ඇත.

විශ්වය (හෙවත් පලමු අහස)ට එහායින් මිනිසාට ග්‍රහණය කර ගත නොහැකි බොහෝ දේ ඇත. සියල්ලෙහි නිර්මාතෘ වන සර්වබලධාරී දෙවියන්වහන්සේ මිසාට පහළ කළ අවසන් දිව්‍ය හෙළිදරව්ව වල අල් කුරාණය තුලින් අහස් හතක් ගැන පවසා ඇත. පළමු අහසට ඉහලින් ඇති අහස් ගැන කරුණු නිරීක්ෂණය කිරීමට මිනිසා සතු තාක්ෂනය ප්‍රමාණවත් නැත.

දෙවිඳුන්ගේ නිර්මාණයෙහි සාරාංශයක් පහත සටහනින් පෙන්නුම් කරයි.

අල්ලාහ් විසින් අහස්ද භූමියද දින හයකින් උත්පාදනය කල අතර දින දෙකකදී එය අහස් හතක් ලෙස සැලසුම් කළ බව පවසා ඇත (Quran 7:54/41:12). ඒවායේ සිටින මලායිකාවරුන් ආදිය කවදා කෙසේ නිර්මාණය කළේ දැයි අපව දැණුවත් කර නැත.




මිනිසාට ගෝචර නොවන සමහර නිර්මාණ කිහිපයක් ගැන පහතින් සඳහන් කර ඇත.

1. මලායිකාවරුන්
2. බයිතුල් ඉස්සා
3. බයිත්-උල්-මාමූර්
4. සිද්රතුල් මුන්තහා ගස
5. සිරාත් පාලම

6. අල් කුර්සි
7. පෑන සහ ලවුහ් අල් මහ්ෆූද්
8. අර්ෂ්

**1. මලායිකාවරුන්**

දෙවියන්ගේ සමහර දේවදූත මලායිකාවරුන්ට ආලෝකයේ වේගයටත් වඩා, (කොටින්ම) "නිමේශයකින්" ගමන් කල හැකිය.

උදාහරනයක් ලෙසට ජිබ්රීල් (අ.ස.) කිහිප වතාවක්ම අහස් හතටත් ඉහල සිට මොහම්මද් නබි (ස.ල්) තුමා හමුවට පැමිනීම සඳහන් කළ හැකිය.

**2. බයිතුල් ඉස්සා**

(Baytul Izzah) යන යෙදුම ඉංග්‍රීසියෙන් පරිවර්තනය කර ඇත්තේ 'The House of Honour' යන්නයි. එය මක්කාවේ කබාව හා සමපාත වන පළමු අහසේ (අපට ආසන්නතම ස්වර්ගය) පිහිටා ඇති නිවසක් ගැන සඳහන් කරයි.

අල්ලාහ් ලයිලතුල් කද්ර් නැමති රාත්‍රියේදී, ලව්හුල් මහෆූස් සිට පහළම අහසෙහි බයිත් අල් ඉස්සා නැමති ස්ථානය වෙත අල් කුරාණය එකවරම පහළ කළ අතර, පසුව ජිබ්‍රීල් (අ.ස) වෙතින් එය නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාට කොටස් වශයෙන් වසර 23ක කාලයක් පුරාවට ලබා දුනි. මෙය ඉබ්නු අබ්බාස් විසින් ප්‍රකාශ කරන ලදී." (තෆ්සීර් අත්-තබාරි 20/129)

*නියත වශයෙන්ම අපි මෙය (මෙම කුරානය ගෞරවයෙන් පිරි) ලෙෙලතුල් කද්ර් නැමති එක් රාත්‍රියකදී (පළමුවෙන්ම) පහළ කර තැබුවෙමු. (97:1) "මිනිස් සංහතියට මඟ පෙන්වීමක් ලෙස අල් කුරානය රමදාන් මස පහළ කරණු ලැබීය...." (2:185)*

**3. බයිත්-උල්-මාමූර්**

*"බයිත්-උල්-මාමූර් මත සත්තකින්ම* (52:4)

එය නම් දේවදූතයන් විසින් නොකඩවා පැමිණෙන මක්කාවේ පිහිටි කබා හි ආකෘතියට සමාන ලෙස සහ ඊට ඉහලින් හත්වන ස්වර්ගයෙ නිර්මාණය කර ඇති නිවසය. මෙය වෙත සෑම දිනකම මලායිකාවරුන් 70,000 ක් පැමිණ එය පැදකුණු කරයි. ඔවුන්ට නැවත කිසි දිනකට එතනට පැමිණිය නොහැක. (සහීහ් බුහාරි 3207; සහීහ් මුස්ලිම් 164)

**4. සිද්රතුල් මුන්තහා ගස**

මුහම්මද් (ﷺ) තුමාණන් ඉස්රා ව අල් මිරාජ් ගමනෙදී දුටු ආශ්චර්යමත් ගසකි. නබි (ﷺ) තුමානන් විස්තර කළ ආකාරයට එය 7 වන අහසට ඉහළින් ඉතා දුරින් පිහිටා ඇත. එහි පත්‍ර "අලියෙකුගේ කන්" වැනිය. එහි වර්ණ ඉහළට හා පහළට යන බවත් එම වර්ණ මේ ලෝකයේ ඇති සාමාන්‍ය වර්ණ නොවන බවත් එනිසා එය විස්තර කළ නොහැකි බවත්, එම වර්ණ සදා වෙනස් වෙමින් පවතින්නක් ලෙසත් පවසා ඇත.

බොහෝ දේ ගසෙන් බැස යන බවත් සියලුම දුආ ප්‍රාර්ථනා, යහපත් ක්‍රියාවන්, යාඥාවන් සහ ආත්මයන් පවා පෘථිවියෙන් පිට වූ පසු ඒවා සිද්‍රත් අල්-මුන්තහා හි නතර වේ. මෙම ගසෙන් ඔබ්බට පැන ඇත සහ සිංහාසනය ඇත. සිංහාසනයට ඉහළින් සිටින්නේ අල්ලාහ්සුභානවතාලාය. ජිබ්‍රීල් අ.ස ඇතුළුව දේවදූතයන්ට සහ ඔවුන්ගේ දැනුම පවා මෙතැනින් එහාට යා නොහැක. ජිබ්රීල් අ.ස ප්‍රකාශ කරන්නේ ඔහුට ගසෙන් ඔබ්බට යාමට අවසර නැති බව සහ යා නොහැකි බවයි. එම ගසෙහි කොළ තරමටම මාලායිකා වරුන් සිටිනු තමා දුටු බවත් නබි තුමා පවසා ඇත.

එබැවින් මූලික වශයෙන්, ගස අත්‍යවශ්‍යයෙන්ම මැවිල්ලේ ඉහළ සීමාවේ ඇති ව්‍යුහයක් වන අතර එය වෙනත් මිනිස් මනසට තේරුම් ගත නොහැකි ලෞකික ලක්ෂණ පෙන්නුම් කරන බව පෙනේ.

ජිබ්රීල් (අ.ස) ට සහ ඔහු නබි (ﷺ) තුමාව එහි රැගෙන ගිය බුරාක් නම් සත්වයාට නිමේශයකින් විශාල දුරක් ගමන් කළ හැකි උනත්, මෙම ගසෙන් ඔබ්බට යන ඕනෑම දෙයක් කාලය හා අවකාශය පිළිබඳ සංකල්ප අභිබවා යා යුතු යැයි අපට අදහසක් ගත හැක.

තත්වය එසේ උවත් විවිධ ආශිර්වාද ලබා දීම සඳහා අල්ලාහ්ගෙන් තෑග්ගක් ලෙස කාලය හා අවකාශය අභිබවා ගසෙන් ඔබ්බට යාමට මුහම්මද් (ﷺ) තුමාණන්ට ආශිර්වාද කර ඇති බව පැහැදිලිය. මිනිසාට නියම කළ සලාතය සහ එය දිනකට 5 වතාවක් අඩු කිරීම, සහ අල්ලාහ්ව විශ්වාස කර (කිසි විටෙකත් ෂිර්ක් නොකළ) අය සදාකල් ජන්නාවේ සිටින්නන් බවට අල්ලාහ්ගේ පොරොන්දුව ආදිය එහිදී නබි තුමා අත් විඳීය.

ගසෙන් ඔබ්බට ගිය මුහම්මද් (ﷺ) තුමාණන්ට එම අවස්ථාව අල්ලාහ් විසින් ලබා දීම, අල් කුරාණය මෙන්ම තවත් ශ්‍රේෂ්ඨතම ප්‍රාතිහාර්යකි. එනම් එම ස්ථානයේ ස්වභාවය සම්පූර්ණයෙන්ම එයට භාහිරින් ඇති සියළුම නිර්මාණ වලට වඩා වෙනස් තත්ව වලින් යුක්ත තැනකි.

එහිදී දෙවියන්වහන්සේගේ හඬට නබි (ﷺ) තුමා සවන් දුන් අතර නබි (ﷺ) තුමා ඔහුගේ වදන් සෘජුවම අල්ලාහ්ට ප්‍රකාශ කර ඇත. නබිතුමාට දෙවියන්වහන්සේව දැකීමට අවස්ථාවක් ලැබී නැත.

නබි (ﷺ) තුමාගේ මෙම ගමන එක් දිනක ගමනකි. ඒ පිලිබඳ තවත් තොරතුරු පහත සඳහන් ලිපියෙහි ඇත.

"මුහම්මද් (ﷺ) තුමාණන්ගේ මිහ්රාජ් ගමන"

සිද්රතුල් මුම්තහා නැමති ගසේ සීමාවෙහි-(54:14) එහි සමීපයෙහිම (හොඳ වහළුන්) රැඳෙන ස්වර්ගය ඇත්තේය. (53:15), එම ගස වටකර ගත යුතු දැය එය (සම්පූර්ණ්යෙන්ම) වටකර ගත්තේය (53:16), එයින් ඔහුගේ) බැල්ම ඇත් වූයේද නැත. පසු කළේද නැත (53:17). ඔහු (නබි මොහම්මද් ) තම දෙවියන්ගේ ප්‍රාතිහාර්යයන් (සියල්ල) ඇත්තෙන්ම දුටුවේය. (53:18)

**5. සිරාත් පාලම**

මෙය විනිශ්චය දිනයෙන් පසු විශ්වාසවන්තයින්ට සහ ධර්මය ළද මිනිසුන්ට තරණය කළ යුතු පාලමකි. (අවිශ්වාසවන්තයින්ව මෙම පාලම සූදානම් කිරීමට පෙරම නිරයට දමන නිසා ඔවුන්ට මෙම පාලමේ තරණය කිරීමක් නැත). එය

ස්වර්ගයට දෙසට යොමුව ඇත. ඔවුන් මෙලොව ජීවත් වන විට ඇදහිලිවන්තයන් හෝ නොමග ගියවුන් යන්න සහ ඔවුන් කොපමණ හොඳ හෝ නරක කළාද යන්න අනුව අල්ලාහ් ඔවුන්ට එම පාලමේ ස්වභාවය වෙනස් කරනු ඇත. එක් එක් පුද්ගලයා එය තරණය කරන්නේ, ඔවුන්ට ලැබෙන ආලෝකය, පාලමේ දිග පළල සහ ඔවුන්ට යා හැකි වේගය අනුව ය. සමහරු එය ඉක්මනින් තරණය කරති, සමහරු සෙමින්, සමහරු අමාරුවෙන් තරණය කරති. බොහෝ දෙනෙකුට එය තරණය කළ නොහැකි අතර නිරයට වැටේ.

## 6. අල් කුර්සි

අල්ලාහ්ගේ රාජධානියේ පිහිටුවා ඇති 'අල් කුර්සි'

එය යම් කිසි භෞතික ස්ථානයක් විය යුතුයි. එහි විශාලත්වය අහස් හතට සාපේක්ෂවද (අපට සිතා ගත නොහැකි තරම්) විශාලය. එම කුරුසිය අප ඉහත කතා කල අහස් හත ආදියෙහි පරිපාළක මධ්‍යස්ථාන යැයි අප උපකල්පනය කරමු. එය ('කුරුසි') කොතරම්ම විශාල වුවත් අල්ලාහ්ගේ තත්වය හා සන්සන්දනය කරන විට එයද කාන්තාරයේ වැලි කැටයක් තරම් යැයි අවසන් නබි මොහම්මද් තුමා පවසා ඇත. ඒ අනුව අල්ලාහ් කෙතරම් බලසම්පන්නයෙක්දැයි අපට යම් අදහසක් ගත හැක.

## 7. පෑන සහ ලවුහ් අල් මහ්ෆූද්

අල්ලාහ් අර්ෂ් නිර්මාණය කළ පසු පෑනක් සහ ලවුහ් අල් මහ්ෆූද් නම් ඵලකයක් නිර්මාණය කර, අල්ලාහ් පෑනට ඉදිරියේදී සිදුවීමට නියමිත සියල්ල ලවුහ් අල් මහ්ෆූද් හි ලියන ලෙස අණ කළේය. ඒ සියල්ල එහි ලියැවිනි.

## 8. අල් අර්ෂ්

අල්ලාහ් ගේ පළමු නිර්මාණය මෙයයි. එය ජලයේ පාවෙන ලෙස නිර්මාණය කර ඇත. එහි විශාලත්වය සහ ස්වභාවය ගැන දන්නේ අල්ලාහ් පමණි. අහස් හතට සහ අර්ෂ් හි අධිපති ලෙස අල්ලාහ් අර්ෂ් හි තම ස්වභාවයට ගැලපෙන අයුරින් සිටී.

දෙවියන්ගේ අර්ෂ් මලායිකාවරුන් හතර දෙනෙකු විසින් ඔසවා සිටින බව පවසයි. විනිශ්චය දිනයේ ඔවුන්ගේ ගණන අටක් බවට අල්ලාහ් දැනුම් දී ඇත.

*(නබියේ!) මලායිකාවරුන් එහි පැතිවල සිටින්නාහ. තවද එදිනදී ඔබ දෙවියන්ගේ අර්ෂ්, මලායිකාවරුන් අට දෙනෙකු තමන්ට ඉහලින් ඔසවාගෙන සිටිනු ඇත. (69:17)*

*අල්ලාහ් (කෙතරම් ශ්‍රේෂ්ඨයෙකු වන්නේද යත්) ඔහු හැර, වෙන කිසිම දෙවියෙක් (ඇත්තෙන්න්ම) නැත. (ඔහු)අමරණීයයි. (කවදත්)ස්ථීරත්වන්තයි. ඔහුව තද නින්ද හෝ (සාමාන්‍ය)නින්ද හෝ පීඩාවට පත් කරන්නේ නැත. අහස් හා භූමියෙහි ඇති සියල්ල ඔහුටම අයත්ය. ඔහුගේ අනුමැතියෙන් තොර ඔහු වෙත (කවරෙකුවත්) කවුරුන්ට නම් මැදිහත්වී කතා කල හැකිද? ඔවුන් ඉදිරියේ ඇති දැයද, වෙන්ව ඇතින් තිබෙන දැයද, ඔහු හොඳින් දන්නේය. ඔහුගේ කැමැත්තෙන් තොර, ඔහු දන්නා දැයෙන් කිසිවක් (වෙන කිසිවෙකුටත්, තමන්ගේ දැනුමෙන්) දැනගත නොහැක. ඔහුගේ රාජ්‍යය අහස් හිද, භූමියෙ හිද පැතිරී ඇත. ඒ දෙකම (බේරාගෙන) ආරක්ෂා කිරීම ඔහුට ආයාසයක් නැත. තවද, ඔහු ඉතාමත් ශ්‍රේෂ්ඨයෙකු හා ඉමහත්ය. (2:255)*

---

## දෙවියන්ගේ නිර්මාණ:

## ජලය සම්බන්ධව ඇති කුරාන් වැකි

ජලය යනු දෙවියන්වහන්සේගේ නිර්මාණ වලින් අති විශිෂ්ඨතම නිර්මාණයකි. ජලය නොමැතිනම් ජීවයක්ද නොපවතී. දෙවියන්ගේ අවසන් දිව්‍ය හෙළිදරව්ව වන ශුද්ධ වූ අල් කුරාණය තුල බොහෝ අවස්ථාවල මෙම ජලය ගැන කතා කර ඇත. විවිධ උදාහරණ දක්වමින්, විවිධ ඉඟි ඉදිරිපත් කරමින් එහි ඇති වැදගත්කම ඉස්මතුකර පෙන්වා දී ඇත. බුද්ධිමත් ජනතාවට එම වැකි දෙස අවධාරයෙන් යුතුව බලන ලෙස දෙවිඳුන් ආරාධනා කරයි. ජලය සම්බන්ධ කරගෙන

දෙවියන්වහන්සේ මිනිසාට දක්වා ඇති දයාව සහ අනුග්‍රහය ගැන මෙම ලිපිය තුලින් හොඳින් වටහා ගත හැක.

දෙවියන් අපෙන් මෙසේ අසයි;

*ඔබ බොන වතුර අවධානය කළෙහුද? වලාකුළෙන් ඔබ එය වසින්නට සලස්වන්නෙහුද? නැතහොත් අපි වසින්නට සලස්වන්නෙමුද? අපි කැමති වුවහොත් එය (ඔබට බොන්නට නොහැකි) ලුණු ජලය බවට පත් කර හැර ඇත්තෙමු. (මෙයට) ඔබ කෘතඥ විය යුතු නොවේද? (56:68-70)*

ලිපියෙහි අනු මාතෘකා

1. දෙවියන්ගේ රාජධානිය (අර්ෂ්) ජලයේ පාවෙමින් තිබෙන බව
2. වලාකුළු, වර්ෂාව, භෝග වගාව සහ පානය සම්බන්ධව
3. මිනිසාව ජලයෙන් උත්පාදනය කළ බව
4. පණ ඇති සෑම දැයක්ම ජලයෙන් උත්පාදනය කළ බව
5. ජලය සම්බන්ද වෙනත් විද්‍යාත්මක තොරතුරු
6. ජලය මිනිසාට වරප්‍රසාදයක් ලෙස ලබා දෙන ආකාරය ගැන
7. මුහුද සහ නැව් සම්බන්ධව
8. ජලය උපමාවක් ලෙස ගෙන දෙවිඳුන් දී ඇති උපදෙස්
9. මූසා නබි (අ.ස) තුමාගේ කාලයේ වූ මුහුද දෙබෑ කිරීමේ ප්‍රාතිහාර්යය ගැන
10. නූහ් නබි (අ.ස) තුමාගේ කාලයේ වූ විශාල ජල ගැල්ම සම්බන්ධව
11. ස්වර්ගයේ ඇති ජලය සම්බන්ධව
12. නිරයෙහි ඇති උණු ජලය සම්බන්ධව
13. සලාත් (නැමදීම්) කිරීමට පෙර දෝවනයට ජලය භාවිතා කිරීම සම්බන්ධව
14. මක්කාවේ ඇති සම් සම් ළිඳ සහ එම වතුරෙහි ඇති විශේෂත්වය

**1. දෙවියන්ගේ රාජධානිය (අර්ෂ්) ජලයේ පාවෙමින් තිබෙන බව**

*ඔහුම අහස්ද, භූමියද දින හයකිදී උත්පාදනය කළේය. (ඒ අවස්ථාවේදී), ඔහුගේ අර්ෂ් ජලය මත (පාවෙමින්) තිබුණි; (11:7)*

## 2. වලාකුළු, වර්ෂාව, භෝග වගාව සහ පානය සම්බන්ධව

*වලාකුළෙන් (අපගේ) සැලසුමට අනුව වර්ෂාව වසින්නට සලස්වන්නෙමු. එය භූමියෙහි රැදෙන සේ සලස්වන්නෙමු. එය (භූමියෙන්) පහ කිරීමටද අපි බලසම්පන්න වෙමු. (23:18)*

*ඔහුම ඔබ වෙනුවෙන් භූමිය වාසස්ථානයක් බවටද, අහස වියණක් බවටද නිර්මාණය කර, වලාකුළෙන් වර්ෂාව වසින්නට සලස්වා, එමගින් ඔබට ආහාර වශයෙන් ගත හැකි පළතුරු වර්ගද ඔබට ඉකුත් කරන්නේය. එබැවින් (මේ සියල්ල) දැනගෙන අල්ලාහ්ට (කිසිම) සමානයක් ඇති නොකරනු. (2.22)*

*ඔහුම වළාකුලෙන් වැස්ස පහළ කර තබන්නේය. එමගින් සියළුම වර්ගයේ පැළෑටි අපි පැළවීමට සලස්වා, එයින් සාරවත් පැළයන්ද අපි ඉකුත් කළෙමු. එයින් ඝනට වැඩුණු ධාන්‍යයෙන් (පිරි කරල්ද) අපි ඉකුත් කරන්නෙමු. ඉඳි ගසේ අතුවලින් නැමී එල්ලෙන පළතුරු වලුද ඇත්තේය. මිදි වතුද, බැලූ බැල්මට එකම ආකාරයටද එහෙත් රසයෙන් විවිධවද ඇති දෙළුම්, ඔලිව් ආදියද (අපිම ඉකුත් කළෙමු). ඒවා (මල් පිපී) ගෙඩි හට ගැනීමද, පසුව ඉදී, ඉදුනු පළතුරු බවට පෙරළෙන අන්දමද (අවධානයෙන් යුතුව බලනු මැනවි). විශ්වාසය තබන ජනතාවට නියත වශයෙන්ම මෙහි සාධකයන් බොහෝමයක් ඇත්තේය. (6:99)*

*(නබියේ!) ඔබ බැලුවේ නැද්ද? නියත වශයෙන්ම අල්ලාහ්ම වලාකුළෙන් වර්ෂාව වසින්නට සලස්වන්නේය. (එමගින්) භූමිය සශ්‍රීක වන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් ඉතාමත් කරුණාවන්තයෙකු හා (සියල්ල) දන්නෙකු වශයෙන් සිටින්නේය (22:63)*

*(තවද) අහස්ද, භූමියද උත්පාදනය කර, වලාකුළෙන් ඔබ වෙනුවෙන් වැස්ස වසින්නට සලස්වන්නා කවරෙක්ද? අපිම එමගින් (ඇස් පිනා යාම පිණිස) අලංකාරවත් වතුද වැවෙන්නට සලස්වන්නෙමු. අපගේ (උදව්වෙන් තොර) එහි තිබෙන ගස් වැවෙන්නට සැලැස්වීමට ඔබට නොහැකිය. එබැවින් අල්ලාහ් සමග නැමදුමට යුතු (වෙන කෙනෙකු) සිටින්නෙහිද? නැත. (මෙසේ තිබියදී) මොවුන් (තමන්ගේ මනඃක්කල්පිත දෙවිවරුන්ව දෙවියන්ට) සම කරන ජනතාවක් වශයෙන් සිටින්නාහ. (27:60)*

*වලාකුළු උසුළාගෙන යන සුළඟද අපිම යැව්වෙමු. එම වලාකුළෙන් වැස්සද අපිම වසින්නට සලස්වන්නෙමු. එය අපි ඔබට පොවන්නෙමු. (වැස්සෙහි ජලය වලාකුළෙහි) ඔබ එක්රැස් කර තැබුවේ නැත. (අපිම එක්රැස් කරමු) (15:22)*

*ඔහුම ඔහුගේ වරප්‍රසාදයන්ට පෙර ශුභාරංචිය වශයෙන් සිසිල් සුලඟ යවන්නේය. එය (කළුවර වී ඇති වන) ඝන වලාකුළු ඔසවාගත් පසු එය, අපි (වියළී) මැරී ගිය භූමිය දෙසට පදවාගෙන ගොස් එයින් වැස්ස වැසීමට සලස්වන්නෙමු. පසුව එමඟින් සියළු වර්ගයේ පළතුරුද ඉකුත් කරන්නෙමු.(7:57)*

*ඔහුම තම වරප්‍රසාදයන් පහළ කිරීමට පෙර (සිසිල්) සුළඟ ශුභාරංචියක් වශයෙන් යවන්නේය. (මිනිසුනේ!) අපිම වලාකුළෙන් පරිශුද්ධ වූ ජලය වසින්නට සලස්වන්නෙමු. (25:48).*

*මැරී ගිය භූමියට එමගින් අපි ජීවය ලබා දී අපගේ උත්පාදකයන්ගෙන් වූ එළු, ගව, ඔටුවන් වැනි සතුන්ටද, බොහෝ මිනිසුන්ටද එය පානය කිරීමට සලස්වන්නෙමු. (25:49)*

*එහි උස් කඳුද අපි නිර්මාණය කර මිහිරි ජලයද (ඒවායෙන්) ඔබට බීමට සලස්වන්නෙමු.(77:27)*

*ඔහු වලාකුළෙන් ඔබට වැස්ස වැසීමට සලස්වන්නේය. එහිම ඔබ පානය කළ හැකි ජලයද ඇත. එමගින්ම (ඔබගේ ගමේ සතුන්ට) උලා කෑම සඳහා තණකොළ පැළෑටි (ආදියද) පැල වෙන්නේය.(16:10) එමගින්ම ගොවිතැන් භෝගද, සෙය්තුන්, ඉඳි, මිදි ආදී සියළුම පලතුරු වර්ගද ඔහු ඔබට උත්පාදනය කරන්නේය. නියත වශයෙන්ම මෙහි සිතා දැන ගත හැකි ජනතාවට එක් සාධකයක් ඇත්තේය. (16:10,11)*

*(එකම අන්දමේ වර්ෂාව ලැබුනද) සාරවත් භූමිය දෙවියන්ගේ නියෝගයන්ට අනුවම තම පැළෑටි, ගස් වැල් ආදිය ඉකුත් කරන්නේය. එහෙත්, කර්කෂක භූමියෙහි ඉතා ස්වල්පයක් මිස, පැළ වැවෙන්නේ නැත. ස්තුතිය දක්වන ජනතාවට මෙසේ විවිධ අන්දමට (අපගේ) ආයාවන් විවරණය කරන්නෙමු. (7:58)*

*ඔහුම අහස්, කුළුණු නොමැතිවම නිර්මානය කර ඇත්තේය. එය ඔබත් බලන්නෙහුය. භූමිය ඔබව නොසැලී සිටීම පිණිස (ස්ථිර වූ) කඳු (එහි සිටුවා) තබා විවිධ වර්ගයේ ජීවීන්වද විසුරුවා හැරියේය. (මිනිසුනේ! අල්ලාහ් වන) අපිම වලාකුළෙන් වර්ෂාව වැසීමට සලස්වා එමගින්ම උසස් වූ විවිධ වර්ගයේ ගස් වැල් පැලෑටි ජෝඩු ජෝඩු වශයෙන් වැඩෙන්නට සලස්වන්නෙමු. (31:10)*

*(නබියේ!) නියත වශයෙන්ම අල්ලාහ්ම අහසින් වැස්ස පහළ කර තබන්නේය යන්න ඔබ අවධානය කර බැලුවේ නැද්ද? (අල්ලාහ් වන) අපිම එමගින් විවිධ (රසයන්ගෙන් හා) වර්ණයන්ගෙන් යුත් ගෙඩි, පලතුරු, ආදිය ඉකුත් කරන්නෙමු; (35:27)*

*භූමියෙහි විවිධ ප්‍රදේශයන් එකට එක්කාසු කළාක් මෙන් නිර්මාණය කර (එහි) මිදි වතුද, ධාන්‍යය ගොවි බිම්ද, ඉඳි ගස්ද නිර්මාණය කළේය. අතු ඇති ගස්ද, අතු නොමැති ගස්ද උත්පාදනය කරන්නේය. (මේවා සියල්ලට) එකම විදිහේ ජලය පොවනු ලැබුවා වුවද, සමහර දැයට වඩා සමහරක් දැය අපි රසයෙන් උසස් කර තැබුවෙමු. මෙහි බුද්ධිය ඇති ජනතාවට නියත වශයෙන්ම සාධකයන් බොහෝමයක් ඇත්තේය. (13:4)*

*(නබියේ!) ඔබ බැලුවේ නැද්ද? නියත වශයෙන්ම අල්ලාහ්ම (විවිධ ප්‍රදේශයන්හී සී සීකඩ වී ඇති) වලාකුළු එකට අලවා ඒවා ඒකරාශී කර, එකක් මත එකක් වශයෙන් අසුරන්නේය. පසුව එම වලාකුළෙහි මධ්‍යයෙන් වර්ෂාව වසින්නට සලස්වනු ඔබ දකින්නෙහිය. ඔහුම අහසෙහි ඇති වලාකුළු කඳු වලින්, කැට වශයෙන් වූ (ගල් වැසි) වසින්නටද සලස්වන්නේය. එය ඔහු අදහස් කරන අය මත වැටෙන්නට සලස්වන්නේය. ඔහු අදහස් කරන අයගෙන් එය වලක්වා ගන්නේය. එහි විදුලියේ ආලෝකයෙන් ඇස් පෙණුම උදුරා ගන්නට තැත් කරන්නේය. (24:43)*

### 3. මිනිසාව ජලයෙන් උත්පාදනය කළ බව

*පසුව එක් අල්ප බිඳක් වන (ඉන්ද්‍රිය) සාරයෙන් ඔහුගේ පරම්පරාවේ දරුවන්ව (නිර්මාණය කර) ඇති කළේය. (32:8)*

*එක් ඉතාමත් ආල්ප බිඳක් මගින් අපි ඔබව උත්පාදනය කළේ නැද්ද? එය (ප්‍රවේසම් සහිත ගර්භාශයන්හි) නියමිත කාලයක් දක්වා රැඳී සිටින සේ අපි සලස්වා, පසුව අපිම එය (දරුවෙකු වශයෙන්ද) මනඃක්කල්පිත කරන්නෙමු. මනඃක්කල්පිත කරන්නන් සියල්ලන්ගෙන් අපි අපමණ උසස්වන්තයෙකි. (77:21-24)*

*ඔහුම එක් ජල බිඳකින් මිනිසාව නිර්මාණය කරන්නේය. පසුව එයට ලේ සම්බන්ධ ඥාතීන්ද, විවාහය සම්බන්ධයෙන් වූ ඥාතීන්ද ඇති කරන්නේය.(නබියේ!) ඔබගේ දෙවියන් (තමන් කැමති ආකාරයන් සියල්ල කිරීමට) බලසම්පන්නයෙකු වශයෙන් සිටින්නේය. (25:54)*

*එබැවින් මිනිසා (තමන්) කුමක් නිසා උත්පාදනය කරනු ලැබ ඇත්තේදැයි පොඩියක් අවධානය කර බැලිය යුතුය. (ඇතට) පනිමින් ඉකුත් වන එක් ජල බිඳක් මගින්ම උත්පාදනය කරනු ලැබුවේය. එය කොඳු ඇට වලටද, ඉළ ඇටවලටද මධ්‍යයෙන් ඉකුත් වන්නේය. (මෙසේ උත්පාදනය කරනු ලබන) ඔහු,(මොහු මරණයට පත් වූ පසු මොහුට පණ දී) නැවත පණ ගැන්වීමටද, නියත වශයෙන්ම ඔහු බලසම්පන්නයෙකි! (86:5-8)*

*මිනිසුනේ! (විනිශ්චය දිනදී ඔබට පණ දී) නැගිට්ටවීම ගැන ඔබ සැක සිතුවහොත් (ඔබව පළමුවෙන්ම කෙසේ උත්පාදනය කළෙමුදැයි යන්න අවධානය කර බලනු). නියත වශයෙන්ම අපි ඔබව (ඔබගේ මුල්ම පියා වන ආදම්ව) කිරි මැටියෙන් උත්පාදනය කළෙමු. පසුව (ඔබව) ඉන්ද්‍රීය බිඳකින් (උත්පාදනය කර), පසුව එය එක් ලේ කැටියක් වශයෙන්ද, පසුව (එය) අඩු රුවකින් යුත් නැතහොත් පූර්ණ රුවකින් යුත් මාන්ශ පිණ්ඩයක් වශයෙන්ද, (අපි උත්පාදනය කරන්නෙමු. අපගේ බලසම්පන්නකම) ඔබට පැහැදිළි කරනු පිණිස (මෙසේ කර), අපි අදහස් කළ අයට ගර්භයන්හී නියමිත කාලයක් දක්වා රැඳී සිටින සේ සලස්වන්නෙමු. පසුව ඔබව ළදරුවන් වශයෙන් ඉකුත් කර ඔබ, ඔබගේ තරුණ විය අත් කර ගැනීමට සලස්වන්නෙමු. (මේ අතර) මරණයට පත්වන්නන්ද ඔබගෙන් සමහරෙක් ඇත්තාහ. (නැතහොත් ජීවත්ව සිටිමින්) සියල්ල දැනගත්තායින් පසු, කිසිවක් නොදන්නා කෙනෙකු බවට පත් වන මහළු වයස දක්වා (ජීවත් වීමට) අත්හැර දමන්නන්ද ඔබගෙන් සිටින්නාහ. (මිනිසුනේ!) භූමිය (කිසිම භෝගයක්*

*නොමැති) පාළු කර්කශක (භූමියක්) වශයෙන් තිබෙණු ඔබ දුටුවේ නැද්ද? ඒ මත අපි වර්ෂාව වසින්නට සැලැස්සුවහොත් එය සශ්‍රීක වී, වැඩී අලංකාරවත් විවිධ වර්ගයේ (ජෝඩු ජෝඩු වශයෙන්) උසට වැඩුණු ගස්වැල් වැඩෙන්නට සලස්වනු ලැබේ. (22:5) මෙසේ (කරන්නා) නියත වශයෙන්ම අල්ලාහ්ය. ඔහුම සත්‍යවන්තයෙකි. නියත වශයෙන්ම ඔහු මරණයට පත් වූවන්ට පණ දී නැගිට්ටවන අයයි. නියත වශයෙන්ම ඔහු සියල්ල කෙරෙහි බලසම්පන්නයෙකු යන්න මෙයම ප්‍රමාණවත් (සාධකයක් වශයෙන් ඇත්තාහ). (22:6)*

**4. පණ ඇති සෑම දැයක්ම ජලයෙන් උත්පාදනය කළ බව**

*ජීවීන් සෑම එකක්ම අල්ලාහ් ජලය මගින්ම උත්පාදාය කර ඇත්තේය. ඒවායින් සමහරක් තම උදරයෙන් (නයින් මෙන්) බඩ ගාමින් යන්නේය. ඒවායෙන් (වෙනත්) සමහරක් කකුල් දෙකෙන් ගමන් කරන්නාහ. ඒවායෙන් (තවත්) සමහරක් කකුල් හතරෙන් ගමන් කරන්නාහ. (මෙසේ) අල්ලාහ් තමන් අදහස් කරන දැය (කැමති ආකාරයට) උත්පාදනය කරන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් සියල්ල කෙරෙහි බලසම්පන්නය. (24:45)*

*ආරම්භයේදී එකට එක්කාසු වී තිබුණු අහස්ද භූමියද අපිම වෙන්කර තැබුවෙමු යන්නද, පණ ඇති සෑම දැයක්ම ජලයෙන් උත්පාදනය කළෙමු යන්නද, මෙම ප්‍රතික්ෂේප කරන්නන් අවධානය කළ යුතු නොවේද? (මෙය ඔවුන් විශ්වාස නොකරන්නෙහුද?) (21:30)*

**5. ජලය සම්බන්ධ වෙනත් විද්‍යාත්මක තොරතුරු**

*එකට එකතුවන සමුද්‍රයන් දෙකම ඔහුම හමු වීමට සැලැස්සුවේය. එහෙත් ඒවා අතර බාධකයක් ඇත. (එම බාධකය) ඒ දෙක කඩ කරන්නේ නැත. (55:19,20)*

*ඔහුම මුහුදු දෙකක ජලයන්ද එක්කාසු කර ඇත්තේය. එකක් ඉතා රසවත් හා මනරම් ජලයයි. අනිත් එක ලුණු හා තිත්ත රසයෙන් යුත් ජලයයි. මේ දෙක අතරේ බිඳ දැමිය නොහැකි බාධකයක් ඇති කර ඇත්තේය. (25:53)*

*භූමිය ස්ථිර වාසස්ථානයක් වශයෙන් නිර්මාණය කර එහි මධ්‍යයෙහි ගංගාවන්ද, ඒ සඳහා ස්ථිර කඳුද නිර්මාණය කළේ කවරෙක්ද? මුහුදු දෙකක් අතරේ බාදකයක්*

*ඇති කළේ කවරෙක්ද? (මේවා කළ) අල්ලාහ් සමග නැමදුමට යුත්තෙකු (වෙන කෙනෙකු) සිටින්නෙහිද? (ඇත්තෙන්ම) නැත. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු (මෙයද) නොදැනුවත් අය වශයෙන්ම සිටින්නාහ. (27:61)*

*අල්ලාහ්ම වලාකුළෙන් වැස්ස වැසීමට සලස්වා ජීවය නැතිවී ගිය භූමියට එමගින් ජීවය ලබා දෙන්නේය. (හොඳ ඔවදනට) සවන් දෙන ජනතාවට නියත වශයෙන්ම මෙහි එක් සාධකයක් ඇත්තේය. (16:65)*

*(නබියේ!) ඔබ බැලුවේ නැද්ද? නියත වශයෙන්ම අල්ලාහ්ම වලාකුළෙන් වර්ෂාව වැසීමට සලස්වා, එය භූමියෙහි උල්පත් බවට පත් කර, ගලන්නට සලස්වන්නේය. පසුව එමඟින් විවිධ වර්ණයන්ගෙන් යුත් (විවිධ වර්ගයේ) භෝග ඔහු ඉකුත් කරන්නේය. පසුව (කරස්) පැසී, ඒවා කහ පැහැ වී තිබෙණු දකින්නෙහිය. පසුව එය (වියළී) පිදුරු බවට පත් වන්නේය. නියත වශයෙන්ම මෙහි බුද්ධිමතුන්ට හොඳ පාඩමක් ඇත්තේය. (39:21)*

**6. ජලය මිනිසාට වරප්‍රසාදයක් ලෙස ලබා දෙන ආකාරය ගැන**

*ඔහු අහස්ද, භූමියද, උත්පාදනය කර තිබීමෙහිද, රාත්‍රිය හා දහවල මාරුවෙන් මාරුවට පැමිණීමෙහිද, මිනිසුන්ට ප්‍රයෝජනයක් අත් කර දීම මගින් සාගරයන්හී යාත්‍රා කරන නැව්හිද, (කර්කෂ වී) මැරී ගිය භූමියට පණ දීමට (සශ්‍රීක කිරීමට) අල්ලාහ් අහසින් වැසීමට සලස්වන වර්ෂාවද, සියළුම වර්ගයේ සතුන්ද භූමියෙහි විසිරී සිටීමද, සුළඟ විවිධ දිශාවන්ට (හරව) හරවා යැවීමෙහිද, අහසට හා භූමිය අතර පාලනය කරණු ලැබ ඇති ඝන වලාකුළෙහිද, (මිනිසුන්ට ඇති එල ප්‍රයෝජන ගැන පර්යේෂණය කර) සිතන ජනතාවට (ඔහුගේ දයාවද, ආදරයද, දැනුම දෙනු ලබන අනේක) සාධකයන් නියත වශයෙන්ම ඇත්තේය. (2:164)*

*(ගංගා හා මුහුදු ආදී) ජලාශයන් දෙකම එක සමාන වන්නේ නැත. එකක් බීමට මිහිරි හා රසවත් ජලයයි. අනික ලුණු හා තිත්ත රසයෙන් පිරි ජලයයි. මෙසේ මේ දෙකේ ඇති වෙනසක් තිබිණද මේ දෙකෙන්ම රසවත් මාළු අනුභව කරන්නෙහුය; (35:12)*

*ආදම්ගේ පරම්පරාවේ දරුවන්ව නියත වශයෙන්ම අපි ගෞරව කළෙමු. වෙරළෙහි වාහන මතද මුහුදෙහි නැව් මතද අපිම ඔහුව උසුළාගෙන යාමට සලස්වන්නෙමු. හොඳ ආහාරද අපිම ඔවුන්ට ලබා දෙන්නෙමු. අපි උත්පාදනය කළ (වෙනත් ජීවීන්ගෙන්) අපි ඔවුන්ව උසස් කර ඇත්තෙමු. (17:70)*

*භූමියෙහි විවිධ ප්‍රදේශයන් එකට එක්කාසු කළාක් මෙන් නිර්මාණය කර (එහි) මිදි වතුද, ධාන්‍යය ගොවි බිම්ද, ඉඳි ගස්ද නිර්මාණය කළේය. අතු ඇති ගස්ද, අතු නොමැති ගස්ද උත්පාදනය කරන්නේය. (මේවා සියල්ලට) එකම විදිහේ ජලය පොවනු ලැබුවා වුවද, සමහර දැයට වඩා සමහරක් දැය අපි රසයෙන් උසස් කර තැබුවෙමු. මෙහි බුද්ධිය ඇති ජනතාවට නියත වශයෙන්ම සාධකයන් බොහෝමයක් ඇත්තේය. (13:4)*

*(නැවතත් නබියේ!) ඔබ මෙසේ පවසනු: "ඔබගේ ජලය (හදිසියේ එක් දවසකදී) උදෙන්ම භූමියෙහි සිදී ගියහොත්, පසුව ජලයෙහි (වෙනත්) උල්පතක් ඔබට ගෙන එන්නා කවුරුන්දැයි අවධානය කළෙහුද? (67:30)*

*(නබියේ!) මෙලොව ජීවිතයට එක් උපමාවක් ඔවුන්ට පවසනු: එය වලාකුළෙන් අපි පහළ කරනු ලබන (වර්ෂා) ජලයට සම වන්නේය. භූමියෙහි ඇති ගස්, වැල්, තණ, බීජයන් වැනි (ඒවා උරාගෙන) ඒවා සමග මිශ්‍ර වී (හොඳට පැළ වී වැඩී, එහි අස්වැන්න ලබා දීම වෙනුවට), සුළං හමා ගසාගෙන යා හැකි බිල් බවට පත් විය. (මෙයම මෙලොව ජීවිතයට උපමාව වන්නේය). සියළු දැය කෙරෙහි අල්ලාහ් බලසම්පන්නයෙකු වශයෙන් සිටින්නේය. (18:45)*

*කවුරුන් ප්‍රතික්ෂේප කරන්නන් බවට පත් වූවෝද, ඔවුන්ගේ ක්‍රියාවන් කාන්තාරයේ ඇති වන මිරිඟුව මෙන් ඇත්තේය. පිපාසයට පත් වූ අය එය, ජලය යයි අදහස් කරමින් ඒ අසළට පැමිණෙන විට, කිසිවක් ඔහු දකින්නේ නැත. එහෙත් අල්ලාහ්වම ඒ ස්ථානයේ දකින්නේය. ඔහු මොහුගේ ගණනය අවසන් කර හරින්නේය. (එනම් ඔහුව මරණයට පත් කර හරින්නේය). අල්ලාහ් ප්‍රශ්ණ කිරීමෙහි ඉතාමත් තීව්‍රවන්තයෙකි. (24:39)*

### 7. මුහුද සහ නැව් සම්බන්ධව

*ඔබ ආභරණ වශයෙන් පැළඳිය හැකි (මුතු පබළු ආදී) දැයද (ඒවායෙන්) ගන්නෙහුය. (බොහෝමයක් රටවල් වල ඇති) දෙවියන්ගේ වරප්‍රසාදයන් ඔබ සොයා ගැනීම සඳහා (යාත්‍රා කරන විට, ඔබගේ) නැව ජලය දෙබෑ කරගෙන යනු ඔබ දකින්නෙහිය. (මෙයට)ඔබ කෘතඥ වනු මැනව! (35:12)*

*ඔහුගේ නියෝගයන් මගින් (විවිධ රටවල්වලට) නැව් වලින් ගමන් කිරීමට අල්ලාහ් මුහුද ඔබට වසඟ කර දී ඇත්තේය. (එමගින් ඔහුගේ) වරප්‍රසාදයන් ඔබ සොයා ගන්නෙහුය. (ඒ වෙනුවෙන් ඔහුට) ඔබ කෘතඥ වනු මැනව! (45:12)*

*ජලයේද, ගොඩබිමෙහිද ඔහුම ඔබව කැඳවාගෙන යන්නේය; (10:22) නැව බොහෝමයක් මිනිස් සංහතියන් ඔසවාගෙන යාමට අපි සැලැස්වීමද නියත වශයෙන්ම ඔවුන්ට එක් සාධකයකි. (36:41) ඔවුන් නැග යාමට එවැනි (රුවල් නැව් ආදී) දැයද අපි ඔවුන් වෙනුවෙන් උත්පාදනය කර ඇත්තෙමු. (36:42)*

*(ඔබ සංචාරය කරණු පිනිස) නැව ඔබට වසඟ කර දී, තම නියෝගයන්ට අනුව සාගරයෙහි තරනය කරන්නට සලස්වන්නේය. (ඇළ මාර්ගද) ඔබ කැමති ආකාරයට තරනය කිරීමට පහසුකම් ලබා දුන්නේය. (14:32)*

**8. ජලය උපමාවක් ලෙස ගෙන දෙවිඳුන් දී ඇති උපදෙස්**

*[මෙය යුදෙව්වන් සම්බන්ධව පහළ වූ වැකියකි] මින් පසුවද ඔබගේ සිත් දැඩි වී ගියේය. ඒවා ගල් පරයන් මෙන් නැතහොත් ඒවාටත් වඩා දැඩි ඒවා වශයෙන් ඇත්තේය. (මන්දයත්) ගල් පරයන්ගෙන්ද සදාකල් (ස්වයංව) උල්පත් ඇති වී ජලය වෑහෙමින් තිබෙණු නියත වශයෙන්ම ඇත. පැලී (ගියහොත්) ඒවායෙන් ජලය ඉකුත් වී වෑහෙන ඒවාද ඒවායේ ඇත. අල්ලාග් ගැන බියෙන් (කඳු මත තිබී) වැටී පෙරළී යන දැයද ඒවායේ ඇත. (නමුත් යුදෙව්වනි! ඔබ තමන් විසින්ම නිවැරදි වූයේ නැත. නබිවරුන්ගේ දේශනාවන්ට සවන් දුන්නේද නැත. අල්ලාහ්ට බිය වූයේද නැත). ඔබගේ වැඩ කටයුතු ගැන අල්ලාහ් නොසැළකිලිමත්ව සිටින්නේ නැත. (2:74)*

*(නබියේ!) අස්වනු දැවී වියළී) භූමිය පාළු වී තිබෙණු ඔබ දැකීමද, ඇත්තෙන්ම ඔහුගේ සාධකයන්ගෙන් ඇති දැය වන්නේය. ඒ මත අපි වර්ෂාව වැසීමට*

*සැලැස්සුවහොත් එහි (මොටැයි මතුවී) සශ්‍රීකව වැඩෙන්නේය. (මෙසේ මැරී ගිය) භූමියට කවුරුන් පණ දෙන්නේද, ඔහු මරනයට පත් වූවන්ටද, ඇත්තෙන්ම පණ දෙන්නේය. නියත වශයෙන්ම ඔහු සියල්ල කෙරෙහි බලසම්පන්නයෙකි. (41:39)*

*ඔහුම වර්ෂාව සීමා සහිත ප්‍රමාණයෙන් පහළ කරන්නේය. (මෙසේ කරන අල්ලාහ් වන) අපිම පසුව එමගින් මැරී වියළී ගිය භූමියට පණ දෙන්නෙමු. මෙසේම ඔබත් (මරණයට පත් වූ පසු සොහොන්වලින් පණ දී) ඉකුත් කරණු ලබන්නෙහුය. (34:11)*

**9.** මූසා නබි (අ.ස) තුමාගේ කාලයේ වූ මුහුද දෙබෑ කිරීමේ ප්‍රාතිහාර්යය ගැන

*සූර්යයා උදා වන විට මොවුන් (ෆිරවුන් සහ ඔහුගේ සේනාව) ඔවුන් (මූසා සහ ඔහුගේ ජනතාව) පිටුපස ලුහු බැන්දාහ. මෙම සමූහයන් දෙක කෙනෙකුට කෙනෙකු දුටු අවස්ථාවේදී "නියත වශයෙන්ම අපි කොටු උනෙමු" යයි මූසාගේ සහායයන් පැවසූහ. එයට (මූසා) "එසේ නොව, නියත වශයෙන්ම මගේ දෙවියන් මා සමග සිටින්නේය. (අපි බේරෙන) මාර්ගය නියත වශයෙන්ම අපට දැනුම් දෙනු ඇත" යයි පැවසුවේය. එබැවින් අපි මූසාට "ඔබ, ඔබගේ සැරයැටියෙන් මෙම මුහුදට ගසනු" යයි වහී (මාර්ගයෙන්) දැනුම් දුන්නෙමු. (ඔහු එසේ ගැසූ වහාම) එය (මුහුද) (විවිධ මාර්ගයන් බවට පැලී දෙකඩ විය. සෑම පැල්ලමක්ම විශාල කඳු මෙන් දිස් විය. (පසු පසින් ගිය) අනිත් අයවද එයට ළඟා වීමට සැලැස්සුවෙමු. මූසාවද, ඔහු සමග සිටි සියල්ලන්වම අපි බේරා ගත්තෙමු. පසුව (ඔවුන් පසු පස ගිය) අනිත් සියල්ලන්වම ගිල්වා දැමුවෙමු. (26:60-66) (10:90-92)*

**10.** නූහ් නබි (අ.ස) තුමාගේ කාලයේ වූ විශාල ජල ගැල්ම සම්බන්ධව

*එම නැව කඳු වැනි විශාල රළ අතරේ ඔවුන්ව ඔසවාගෙන ගමන ආරම්භ කළේය. (ඒ අවස්ථාවේදී) නූහ් තමන්ව අත්හැර ඈත්ව සිටි තම පුතාට "මගේ පුතාණෙනි! අප සමග (විශ්වාසය තබා) ඔබත් (මෙහි) නැග ගනු. (අපගෙන් ඈත් වී) ප්‍රතික්ෂේප කරන්නන් සමග ඔබ නොසිටිනු. (එසේ වුවහොත් ඔබත් ජලයෙහි ගිලී යනු ඇත)" යයි (ශබ්ද නගා) ආරධනා කළේය. එයට ඔහු "(මෙය විශාල) ජල ගැල්මෙන් බේරීමට හැකි උස කන්දක් මතට මා නැග ගන්නෙමි" යයි පැවසුවේය.*

*එයට ඔහු, "අල්ලාහ් දයාව පහළ කළොත් මිස, ඔහුගේ නියෝගයෙන් බේරීමට අද කිසිවෙකුටත් නොහැකිය" යයි පැවසුවේය. (එවිට) ඔවුන් අතරේ එක් (විශාල) රළක් නැග හරස් වුනේය. ඔහුද ගිලී ගිය අය සමග ගිලී ගියේය. (11:42,43)*

**11.** ස්වර්ගයේ ඇති ජලය සම්බන්ධව

*කව්රුන් තම දෙවියන්ගේ සන්නිධානයට බිය වන්නේද, ඔහුට (ස්වර්ගයෙහි) උයන් වතු දෙකක් ඇත. (55:45) ඒ දෙකේම උල්පත් මතුවී (සදාකල්) ගලා බසිමින් ඇත්තේය. (55:50)*

**12.** නිරයෙහි ඇති උණු ජලය සම්බන්ධව

*ඔවුන්ගේ ප්‍රතික්ෂේපය හේතුවෙන් ඉතාමත් වේදනා ගෙන දෙන දඬුවමත් සමග (බීමට) උතුරණ පානයක්ද ලබන්නාහ (6:70)*

*(නබියේ!) ඔබ මෙසේ පවසනු: "(සම්පූර්ණයෙන්ම) සත්‍යය වූ (මෙම ධර්මය) ඔබගේ දෙවියන් විසින් පහළ කරන ලදී". කැමැත්තන්ට මෙය විශ්වාස කල හැකිය. අකැමැත්තන්ට (මෙය) ප්‍රතික්ෂේප කර දැමිය හැකිය. (නමුත් මෙම ප්‍රතික්ෂේප කරන) අපරාදකරුවන්ට නියත වශයෙන්ම අපි නිරයම පිළියෙල කර ඇත්තෙමු. එම නිරයෙහි ගිනි ජාලාවන් ඔවුන්ව වටකර ගනු ඇත. ඔවුන් (ජලය ඉල්ලා) විලාප නැගුවහොත්, රත් පැහැ වී උණු වී යන තඹ මෙන් වූ ජලයම (ලෝදියම) ඔවුන්ට දෙනු ලැබේ. (ඔවුන් එය බීමට කළින්ම) එය ඔවුන්ගේ මුහුණ පුළුස්සා අඟුරු කර දමනු ඇත. (තවද) එය ඉතා පිළිකුල් සහගත බීමක්ද වන්නේය. ඔවුන් ගිමන් නිවන ස්ථානය ඉතාම නපුරුය. (1:29)*

*(දෙවියන්ට අවනත වන්නන් හා දෙවියන්ට වෙනස්කම් කරන්නන් ආදී) මේ දෙකොට්ඨාසයම තමන්ගේ දෙවියන් ගැන තර්ක කරමින් සිටින්නාහ. එබැවින් (ඔවුන්ගෙන්) කවුරුන් (තමන්ගේ දෙවියන්ව) ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ට ගින්නෙන් නිම වූ ඇඳුම් සැලසුම් කර ඇත්තේය. උණු වී නටමින් තිබෙන ජලය (ලෝදිය) ඔවුන්ගේ හිස්ස් මත වත් කරනු ලැබේ. (22:19)*

*පසුව, නියත වශයෙන්ම උතුරණ සැරව මිශ්‍ර (ලෝදිය) එහිදී ඔවුන්ට (පානයක් වශයෙන්) දෙනු ලැබේ. (37:67)*

*(විනිශ්චය දිනදී)- වම් පාර්ශවයේ සිටින්නන් නම්- වම් පාර්ශවයේ සිටින්නන්ගේ (අභාග්‍යසම්පන්න තත්වය) දන්නෙහුද? ඔවුන් ධරුණු උනුසුම් සුළඟෙහිද, උතුරන ලෝදියෙහිද, සන අඳුරු දුමාරයෙහිද සිටිනු ඇත. (එහි) ශීතයක්ද නොතිබෙනු ඇත. සැනසුමක්ද නොලබන්නාහ. (56:31-44)*

**13.** **සලාත් (නැමදීම්) කිරීමට පෙර දෝවනයට ජලය භාවිතා කිරීම සම්බන්ධව**

*(4:43) (5:6)*

**14.** **මක්කාවේ ඇති සම් සම් (Zam zam) ළිඳ සහ එම වතුරෙහි ඇති විශේෂත්වය**

*මීට වසර 4000 කට වඩා ඉපැරණි ඉතිහාසයක් ඇති ළිඳකි මක්කාවේ කාබතුල්ලාව අසල ඇති මෙම සම් සම් ළිඳ. ඇත්තටම එහි ආරම්භය සහ එහි පැවැත්මද ප්‍රාතිහාර්යයක් වැන්නකි. එහි ජලයද අප භාවිතා කරන ජලයට වඩා ගුණාත්මක බවින් ඉහලය. ඉබ්රාහීම් නබි (අ.ස) පුතා සහ ඔහුගේ මව වන හාජර් (අ.ස) යන දෙදෙනා මක්කාවෙහි එම කාන්තාර භූමියේ තනිව සිටි වෙලාවේ ප්‍රාතිහාර්යයක් ලෙසින් ආරම්භ වූ මෙම ළිඳ යම් යම් අවස්ථාවල වැසී, මතුවී කෙසේ හෝ අද දක්වාම ඇත. අදත් එයින් දිනකට විශාල ප්‍රමාණයක් ජලය නිකුත් කරයි. එම ජලය ගැන පැවැත්වූ පරීක්ෂණ වලින් එහි ඇති විශේෂතා හඳුනා ගෙන ඇත. එම ජලය නැනෝ තාක්ෂනයෙන් පෙරණ ලද ජලයට සමාන බව ඉන් එක් අදහසකි.*

---

# සතුන් ගැන දෙවියන් වහන්සේ අපට පවසා ඇති දේ.

අපගේ පෘතුවියෙහි සොබාදහම නම් සැබවින්ම විශ්මයජනකයි, සතුන් එහි කැපී පෙනෙන කොටසකි. පෘථිවියේ සත්ව විශේෂ මිලියන 8.7ක් පමණ සිටින බව විද්‍යාඥයින් ගණන් බලා ඇතත්, ඉන් මිලියන 7.5කට වඩා සොයා නොගෙන පවතින බව ඇතැම් පර්යේෂකයින් පවසයි. විශේෂ මිලියන 1.2කට වඩා විධිමත් ලෙස විස්තර කර ඇතත්, සත්‍ය සංඛ්‍යාව ඊට වඩා බෙහෙවින් වැඩි බව විශ්වාස

කෙරේ. සමුද්‍ර ජීවීන්ගෙන් සැලකිය යුතු කොටසක් තවමත් ගවේෂණය කර නොමැත. මූලික වශයෙන්, අපට ප්‍රධාන සත්ව කාණ්ඩ කිහිපයක් හමු වේ. ඒවා නම්:

**අපෘෂ්ඨවංශීන්:-** (කොඳු ඇට පෙළක් නොමැති සතුන් - කෘමීන්, මකුළුවන්, ගොළුබෙල්ලන්, බූවල්ලන් සහ පෙලිහිශ් වැනි විවිධ කණ්ඩායම්)

**පෘෂ්ඨවංශීන්:-** (කොඳු ඇට පෙළක් ඇති සතුන්)

- මාළු
- උභයජීවීන්
- උරගයින්
- පක්ෂීන්
- ක්ෂීරපායින්

මීට අමතරව අපගේ පියවි ඇසින් බැලිය නොහැකි තරම් කුඩා ජීවීන්ද ඇත.

මේ විශ්මිත සත්ව ලෝකය දෙස විමසිල්ලෙන් බැලුවහොත් එය නම් සර්වබලධාරී දෙවියන්ගෙම නිර්මාණ බවට එහි කිසිඳු සැකයක් නැත. එක් එක් ජීවී කාණ්ඩ සුවිශේෂී ලක්ෂන පෙන්නුම් කරයි. ඔවුන් සියල්ල සර්වසම්පූර්ණ නිමැවුම්ය.

දෙවියන්වහන්සේ මෙලොවට පහළ කළ අවසන් එළිදරව්ව වන ශුද්ධ වූ අල් කුරානය තුල සතුන් ගැන බොහෝ සෙයින් කතා කර ඇත. ඒවායින් උපුටා ගත් වැකි කිහිපයක් පහතින් දැක්වේ.

උපමාතෘකා

1. සතුන් දෙවියන්ගේ නිර්මාණ බව හඟවන වැකි කිහිපයක්
2. දෙවිඳුන් විසින් තම නිර්මාණ වලට අවශ්‍ය දැණුම ලබා දෙන බව
3. අහස් හී සහ භූමියෙහි සිටින සතුන් දෙවියන්ව නමදිමින් සිටින බව
4. දෙවිඳුන් විසින් සතුන් හරහා මිනිසුන්ට ලබා දී ඇති විශේෂ වරප්‍රසාද
5. අනුභවය සඳහා වළක්වන ලද සත්ව ආහාර සම්බන්ධව

6. ආහාර සඳහා හෝ වෙනත් කාරණාවන් සඳහා සතුන් ඝාතනය (කුර්බානි)
7. සතුන් උපමා ලෙස හෝ උදාහරණ ලෙස ගෙන කරුණු පැහැදිළි කළ අවස්ථා කිහිපයක්
8. සතුන් සම්බන්ධව මූසා නබි (අ.ස) ගේ කාලයේ සිදුවූ සිදුවීම් කිහිපයක්
9. ඉබ්රාහීම් නබි (අ.ස) සහ සත්ව ආහාර සම්බන්ධ කාරණාවක්
10. තවත් නබිවරු කිහිපදෙනෙකු සහ සතුන් සම්බන්ධ ඉතිහාස කතා කිහිපයක්
11. සතුන් සම්බන්ධ වෙනත් ඉතිහාස කතා කිහිපයක්
12. මරණින් පසු සතුන්ට කුමක් සිදුවේද?

**1). සතුන් දෙවියන්ගේ නිර්මාණ බව හඟවන වැකි කිහිපයක්**

*අපගේ අතින්ම නිර්මාණය කළ දැයෙන් ඔවුන් අයිතිවාසිකම් දැරිය හැකි (එළු, ගව, ඔටුවන් වැනි) සතුන්ද ඔවුන් වෙනුවෙන් අපිම උත්පාදනය කළෙමු යන්න දුටුවේ නැද්ද? (36:71)*

*ජීවීන් සෑම එකක්ම අල්ලාහ් ජලය මගින්ම උත්පාදනය කර ඇත්තේය. ඒවායින් සමහරක් තම උදරයෙන් (නයින් මෙන්) බඩ ගාමින් යන්නේය. ඒවායෙන් (වෙනත්) සමහරක් කකුල් දෙකෙන් ගමන් කරන්නාහ. ඒවායෙන් (තවත්) සමහරක් කකුල් හතරෙන් ගමන් කරන්නාහ. (මෙසේ) අල්ලාහ් තමන් අදහස් කරන දැය (කැමති ආකාරයට) උත්පාදනය කරන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් සියල්ල කෙරෙහි බලසම්පන්නය. (24:45)*

*(මිනිසුනේ!) ගමේ සතුන්වද ඔහුම උත්පාදනය කර ඇත්තේය. ඒවායින් ඔබ වෙනුවෙන් (ශීතය වැලැක්වීමට) භාණ්ඩද, විවිධ ප්‍රයෝජනවත් දැයද ඇත්තේය. ඒවායෙන් සමහරක් අනුභව කරන්නෙහුය. (16:5)*

*අහස් ගැබෙහි (දෙවියන්ගේ නියෝගයන්ට) අනුව යටත් වී පියාඹන පක්ෂීන්ව ඔවුන් දුටුවේ නැද්ද? ඒවා (අහස් හී) උසුළාගෙන සිටින්නා අල්ලාහ් හැර වෙන කිසිවෙකුත් නැත. විශ්වාසය තැබූ ජනතාවට මෙහිද විවිධ සාධකයන් ඇත්තේය. (16:79)*

*භූමියෙහි බඩගා ඇවිදිය හැකි දැයද, තමන්ගේ තටු මගින් (අහසෙහි) පියාඹිය හැකි දැයද, ඔබ මෙන් (ජීවය ඇති) ඔබ වැනි උත්පාදනයන්ම මිස වෙන කිසිවක් නැත. මේවායින් කිසිවක් අපගේ පුස්ථකයෙහි සඳහන් නොකර මා අතහැර දැමුවේ නැත. පසුව (දිනකදී) මේවාද තම දෙවියන් වෙත ගෙන එනු ලැබේ. (6:38)*

*සියළුම වර්ගයේ සතුන් භූමියේ විසිර සිටීමද,- අල්ලාහ්ගේ සාධකයන් අතරින්ය; (2:164)*

*කාන්තාවන්, දරුවන්, රණ් රිදී විශල පොදි, උසස් අශ්වයින් (එළු, බැටළු, ගව, ඔටුවන් වැනි) ගමේ සතුන්, ගොවිතැන් ආදිය මත ඉමහත් ආශාවක් ඇති කර ගැනීම මිනිසුන්ට අලංකාරවත් කර ඇත්තේය. (එහෙත් මේවා (සියල්ල අස්ථාවර) මෙලොව ජීවිතයෙහි (අල්ප) සැප සම්පත්ය! අල්ලාහ්ගේ සන්නිධානයෙහි නම්, (ස්ථිර වූ) අලංකාරවත් වාසස්ථානයක් ඇත. (3:14)*

*ඒ අන්දමටම අහස් හිද, භූමියෙහිද ඇති සියල්ලම ඔහු තමන්ගේ දයාවෙන් ඔබට (ඔබගේ යහපත සඳහා හරිහම්බ කරන මෙන්) පාලනය කර තබා ඇත්තේය. සිතා පරිශීලනය කරණ ජනතාවට මෙහි (බොහෝ) පාඩම් ඇත්තේය. (45:13)*

*"දරුවන්ද, එළු, ගව, ඔටුවන්ද, ඔබට (ලබා දී) උදව් උපකාර කර ඇත්තේය. (26:133)*

*(මිනිසුනේ!) අපිම වලාකුළෙන් පරිශුද්ධ වූ ජලය වසින්නට සලස්වන්නේය. මැරී ගිය භූමියට එමගින අපි ජීවය ලබා දී අපගේ උත්පාදනයන්ගෙන් වූ එළු, ගව, ඔටුවන් වැනි සතුන්ටද, බොහෝ මිනිසුන්ටද එය පානය කිරීමට සලස්වන්නෙමු ;(25:48,49)*

*අහස්ද, භූමියද උත්පාදනය කර තිබීමද, ඒවායෙහි සතුන් (ආදී බොහෝමයක් ජීවින්)ද (ඒ මේ අත) විසිරුවා හැර තැබීමද, ඔහුගේ ප්‍රාතිහාර්යයන්ගෙන් වූ දැයයි. එබැවින් ඔහු කැමති අවස්ථාවන්හිදී (ඒවා මරණයට පත් වූ පසුද) ඒවා ඒකරාශී කිරීමට බලසම්පන්නයෙකු වශයෙන් සිටින්නේය. (42:29)*

*(මිනිසුනේ! හැඩරුව) නිර්මාණයෙහි ඔබ බලවන්තයින්ද? නැතහොත් උත්පාදනය කළ අහසද? ඔහුම එහි මුදුන ඔසවා සැළසුම් කළේය. එබැවින් එහි රාත්‍රිය අන්ධකාර කර, (සූර්යා මගින්) දහවල එළියට ගෙන, (ආලෝකමත්) කළේය. මින් පසුව ඔහුම භූමිය දිග හැරියේය. ඔහුම එයින් ජලයද, තණ (බිම්)ද ඉකුත් කරන්නේය. කඳුද ඔහුම එහි ස්ථිරවත් කළේය. ඔබටද, ඔබගේ සතුන්ටද ප්‍රයෝජනවත් විය හැකි දැයද (එහි නිර්මාණය කළේය). (79:27-33)*

**2). දෙවිඳුන් විසින් තම නිර්මාණ වලට අවශ්‍ය දැණුම ලබා දෙන බව**

*'ඔබගේ හිමි මී මැස්සන්ට වැටහීම දෙන්නේය. කඳු, ගස් හා උස වූ ගොඩනැගිලිවල නුඹලා මී වද බඳිනු, තවද නුඹලා සෑම පලතුරු (වර්ගවල ඇති මල්) වලින් රොන් උරා බී ඔබ හිමිගේ පහසු මාර්ගයෙහි (නුඹලා ගේ නිවෙස් තුලට) ඇතුළු වනු. මෙයින් උගේ උදරයන්හි වර්ණ කිහිපයකින් යුත් පැණියක් (මී පැණි) වැහෙන්නේය. එයින් මිනිසුන්ට සුවය ඇත. ඇත්තෙන්ම මෙහිද සිතා වටහා ගන්නා ජනතාවට සාක්ෂියක් ඇත'.(අල් කුර්ආන් 16:68/69).*

**3). අහස් හී සහ භූමියෙහි සිටින සතුන් දෙවියන්ව නමදිමින් සිටින බව**

*අහස්හිද භූමියෙහිද ඇති දෑ සියල්ල (ඒවා) කැමති උවද, අකමැති උවද, අල්ලාහ්ට හිස නවා (අනිවාර්යයෙන්ම අවනතම) වන්නේය; (13:15)*

*අහස්හිද භූමියෙහිද ඇති අනිත් ජීවීන්ද අල්ලාහ්ටම හිස නවා නමදින්නාහ. මලායිකාවරුන්ද එසේමය. ඔවුන් (ඉබ්ලීස් මෙන් ඔහුට සුජූද් නොකර) උඩඟු බස් දොඩන්නේ නැත. ඔවුන් තමන්ට උඩින් ඇති තමන්ගේ දෙවියන්ට යටත් වී තමන්ට දෙන ලද නියෝගයෙන්ම සිටින්නාහ. (16:49,50)*

*(නබියේ!) අහස් හී සිටින්නන්ද, භූමියෙහි සිටින්නන්ද, සූර්යයාද, චන්ද්‍රයාද, තාරුකාද, කඳුද, ගස්ද, සතුන්ද, මිනිසුන්ගෙන් බොහෝමයක් දෙනාද නියත වශයෙන්ම අල්ලාහ්ට සුජූද් කර, නමදින්නාහ යන්න ඔබ නොදැක්කෙහිද?;(22:18)*

*අහස් හිද, භූමියෙහිද ඇති දැයද, (මේවා අතර ඇති දැයද, විශේෂයෙන්ම) පක්ෂීන්ද, (තමන්ගේ) අත් තටු විහිදා (පියාඹමින්) නියත වශයෙන්ම අල්ලාහ්ව*

*සුවිශුද්ධ කරමින් සිටින බව (නබියේ!) ඔබ නුදුටුවෙහිද? මේවා සියල්ල තමන් සුවිශුද්ධ කරමින් නැමදිය යුතු ආකාරය නියත වශයෙන්ම දැනගෙනම සිටින්නාහ. අල්ලාහ්ද ඔවුන් කරමින් සිටින දැය හොඳින් දන්නෙකු වශයෙන් සිටින්නේය. (24:41)*

*[මිනිසුන්ගෙන් සහ ජින්වරුන්ගෙන්] දෙවියන්ට අවනත වන්නන් හා දෙවියන්ට වෙනස්කම් කරන්නන් ආදී) මේ දෙකොට්ඨාශයම තමන්ගේ දෙවියන් ගැන තර්ක කරමින් සිටින්නාහ; (22:19)*

**4). දෙවිඳුන් විසින් සතුන් හරහා මිනිසුන්ට ලබා දී ඇති විශේෂ වරප්‍රසාද.**

*අපගේ අතින්ම නිර්මාණය කළ දැයෙන් ඔවුන් අයිතිවාසිකම් දැරිය හැකි (එළු, ගව, ඔටුවන් වැනි) සතුන්ද ඔවුන් වෙනුවෙන් අපිම උත්පාදනය කළෙමු යන්න දුටුවේ නැද්ද? (36:71)*

*ඒවා ඔවුන්ට යටහත් පහත් වන සේ අපි පත් කළෙමු. ඒවායෙන් ඔවුන් (වාහන මෙන්) නැග ගත හැකි දැයද ඇත්තේය. ඔවුන් ආහාරයට ගත හැකි දැයද ඇත්තේය. (36:72) අල්ලාහ් ඔබට දී ඇති මේවායෙන් (ආහාරයට ගත හැකි දැය) ඔබ අනුභව කරනු. මෙහිදී ශේතාන්ගේ පා සටහන් අනුගමනය නොකරනු; (6:142)*

*(එළු, ගව, ඔටුවන් වැනි) සතුන්ගෙන්ද ඔබට පාඩමක් ඇත. ලේ වලටද, ගොම වලටද අතරේ උන්ගේ කුසෙන් කළවම් නොවුන කිරි (උත්පාදනය කර) අපි ඔබට පොවන්නෙමු. එය පානය කිරීමට ඉතා රසවත්ය. (16:66)*

*ඔවුන්ට පානය කළ හැකි (කිරි වැනි) දැයද තවත් බොහෝ ප්‍රයෝජනද ඒවායෙන් ඇත්තේය. (මේවා සියල්ලට) ඔවුන් කෘතඥ විය යුතු නොවේද? (36:73) නියත වශයෙන්ම එළු, ගව, ඔටුවන් ආදී දැයෙන් ඔබට පාඩමක් ඇත්තේය. මේවායේ තනබුරුල් වලින් (කිරි) අපි ඔබට පොවන්නෙමු. තවද ඔබට බොහෝමයක් ප්‍රයෝජනද ඇත්තේය. ඒවායෙන් සමහරෙක් ඔබ අනුභව කරන්නෙහිය. (23:21) ඒවා මතද නැව් මතද ඔබව ගෙන යනු ලබන්නේය. (23:21,22)*

*අශ්වයින්, හා බූරුවන් ආදී සතුන් මත නැග ගමන් යාම සඳහාද, (ඔබට) අලංකාරවත් වශයෙන්ද (ඔහු) ඒවා උත්පාදනය කර ඇත්තේය. තවද, ඔබ නොදන්නා දෑයද උත්පාදනය කර ඇත්තේය. (6:8)*

*ගමේ සතුන්ගේ හම් වලින් ඔබ නිවෙස් වශයෙන් තනා ගැනීමට (පහසු ආකාරයට) ඔබ වෙනුවෙන් ඔහු උත්පාදනය කර ඇත්තේය. එය ඔබ සංචාරය කරන අවස්ථාවන්හිදීද, ස්ථානයකදී කඳවුරු බඳගන්නා අවස්ථාවන්හිදීද, ඉතා පහසුවෙන් උසුළාගෙන යා හැකිව ඇත්තේය, ඒවායෙන් ලොම, රෝම, කෙස්, ආදී දෑයද ඔහු ඔබ වෙනුවෙන් ණිර්මාණය කර ඇත්තේය. ඒවායෙන් නිශ්පාදිත භාන්ඩ කාලයක් දක්වා නිවෙස් වලට අලංකාරවත් ආකාරයටද, (ජීවිතයට) ප්‍රයෝජනවත් දෑය වශයෙන්ද ඇත්තේය; (16:80)*

*ඉතාමත් අමාරුකමෙන් මිස, ඔබට යා නොහැකි රටවලට ඒවා (ඔබවද) ඔබගේ ඉමහත් බරද ඔසවාගෙන යන්නේය. නියත වශයෙන්ම ඔබගේ දෙවියන් (ඔබ කෙරෙහි) ඉතාමත් දයාබරව හා කරුණාවන්තව සිටින්නේය. (16:8)*

*ඔහුම ඔබ මාළු (අල්ලා පිළියෙල කර) අනුභව කිරීමටද, ඔබ ආභරන වශයෙන් පැළඳිය හැකි වස්තූන් ලබා ගැනීමටද, මුහුද (ඔබට) පහසුකම් ඇති කර දුන්නේය. (විවිධ ස්ථානයන්ට ගොස් වෙළඳාම මගින්) දෙවියන්ගේ වරප්‍රසාදයන් ඔබ සොයා ගැනීම පිණිස, (මුහුදෙහි යාත්‍රාකරන අවස්ථාවේදී) නැව් මුහුද දෙබෑ කරමින් යනු ඔබ දකින්නෙහිය. (මේ වෙනුවෙන් ඔබ දෙවියන්ට කෘතඥ වෙමින් සිටිනු මැනවි). (16:14)*

*අල්ලාහ් ආහාර සැපයීම භාර නොගත් කිසිම ජීවියෙක් භූමියෙහි නැත. (ඒවා) ජීවත් වී සිටින ස්ථානයද, ඒවා (මරණයට පත් වී) භූමදානය වන ස්ථානයද ඔහු දැනගෙනම සිටින්නේය. මේවා සියල්ල් පැහැදිලි පුස්ථකයෙහි සටහන් වී ඇත්තේය. (11:6)*

*ඔබටද, ඔබ ආහාර දී (හදා වඩා) නොගන්නා වූ (අහස් හීද, භූමියෙහිද වාසය කරන) ජීවීන් සියල්ලටද ජීවත් වීමට අවශ්‍යය වස්තූන්ද අපිම එහි සැලසුම් කළෙමු. (15:20) සෑම වස්තුවකම භාන්ඩාගාරයක් අප වෙතම ඇත්තේය. එහෙත්*

*ඒවා (ඒ ඒ කාලයන්ට ඒ ඒ දැයට) නියමිත ප්‍රමාණයෙන්ම අපි පහළ කර තබන්නෙමු, (15:21)*

*අල්ලාහ්ම (එළු, ගව, ඔටුවන් වැනි) සතුන්- ඒවායෙහි සමහරක් මත ඔබ ගමන් කිරීමටද, ඒවායෙන් සමහරක් ඔබ අනුභව කිරීමටද- ඔබ වෙනුවෙන් ඇති කර ඇත්තෙමු. ඒවායෙහි ඔබට වෙනත් (බොහෝ) ප්‍රයෝජනයන්ද ඇත්තේය. ඔබගේ සිත් හී ඇති ඉල්ලීම් ඒවා මගින් ඔබ අත් කර ගැනීම පිණිස, ඒවා මතද, නැව් මතද, (බොහෝමයක් තැන් වලටද) ඔබව උසුලාගෙන යනු ලබන්නෙහුය. (40:79,80)*

*ඒවායේ පිට කොන්ද මත ඔබ (නැග) වාඩි වීම සඳහා, ඒ මත ඔබ (තෘප්තිමත් වන අන්දමට) වාඩි වුව හොත් ඔබගේ දෙවියන් පහළ කළ මෙම වරප්‍රසාදය මතක් කර, (මේ වෙනුවෙන් ඔබ ඔහුව නැමද) "මේ මත (නැගීමට) ශක්තිය නොමැත්තන් වශයෙන් සිටි අපට මෙය වසඟ කර දුන් අය ඉතාම පාරිශුද්ධයෙකි" යයිද, නියත අවශයෙන්ම අපි අපගේ දෙවියන් වෙතම ආපසු යන්නෙමු" යයිද පවසනු මැනව! (43:13,14)*

**5). අනුභවය සඳහා වළක්වන ලද සත්ව ආහාර සම්බන්ධව**

*(විශ්වාසවන්තයිනි! ඉබේ) මැරුණු, ලේ, ඌරු මස්, අල්ලාහ් නොවන දැයෙහි නම් පවසනු ලැබූ දැය ආදියද, බෙල්ල මිරිකා මැරුණු දැයද, පහර වැදී මැරුණු, (ඉහල සිට) වැටී මිය ගිය දැයද, අං වලින් අනිනු ලැබ මැරුණු දැයද, (සිංහ දත්, වීර නියපොතු වලින් යුත් මස් බුදින සතුන් වන සිංහයන්, කොටියන්, දිවියන් වැනි) දඩයම් සතුන් විසින් සපා (මැරුණු) දැයද, ඔබට තහනම් කරනු ලැබ ඇත්තේය. (එහෙත් මෙම සතුන් දඩයම් කරන ලද) ඒවායෙන් (පන පිටින් සිටින විටදී) නියම අන්දමින් (බිස්මිල්ලාහ් කියා) ඔබ බෙල්ල කැපූ (කුර්බාන් කළ) දැය හැර. (එසේ බෙල්ල කැපූ දැය ආහාරයට ගත හැකිය. තවද පූජා කිරීම සඳහා) සිටුවන ලද (කුළුණු, කොඩි, පිළිරූ වැනි) දැය සඳහා කැපූ දැයද, දුන්නෙන් විද (නිවිති බලා) පංගු බෙදා ගැනීමද (ඔබට තහනම් කරනු ලැබ ඇත්තේය). මේ සියල්ල පාපයන් වන්නේය.- කව්රුන් හෝ පාපයක් කිරීමේ අදහසක් නොමැතිව බඩ ගින්නේ දරුණු කම නිසා, බල කරනු ලැබ,(ඉහත සඳහන් තහනම් කරනු*

*ලැබූ දැය අනුභව කර) හැරියොත් (එය වරදක් නැත).මන්දයත් නියත වශයෙන්ම අල්ලාහ් (බල කරනු ලැබ ඔහුගේ වැරදි වලට) සමාව ලබා දී අනුකම්පා කරන්නෙකු වශයෙන් සිටින්නේය; (5:3) [2:173][6:145,146]*

**6). ආහාර සඳහා හෝ වෙනත් කාරණාවන් සඳහා සතුන් ඝාතනය (කුර්බාන්) කිරීම ගැන**

*කුර්බානි සම්බන්ධව [2:196][5:27][5;94-97][22:28,30,33,34,36,37][6:162][108:2]*

**7). සතුන් උපමා ලෙස හෝ උදාහරණ ලෙස ගෙන කරුණු පැහැදිලි කළ අවස්ථා කිහිපයක්**

- *නයා හැව ඇරීම සම්බන්ද උපමාවක් [7:175]*
- *මැස්සෙකු නැතහොත් ඊටත් වඩා (අල්පයෙහි) උසස් යම් කිසිවක් උපමාවක් වශයෙන් ගැනීමට අල්ලාහ් නියත වශයෙන්ම ලැජ්ජා වන්නේ නැත; (2:26)*
- *මකුළුවා සහ මකුළු දැළ උපමාවට ගැනීම [29:41]*
- *බූරුවාගේ කට හඬ උපමාවට ගැනීම [31:19]*
- *සතුන් මෙන් සිටිනා මිනිසුන් ගැන උදාහරණ [7:179][8:55][25:44][47:12]*
- *බූරුවාට උපමා කල මිනිසුන් ගැන [62:5][74:48-51]*
- *සිංහයන්ව දැක දුවන වල් බූරුවන්ට උපමා කල ප්‍රතික්ෂේප කරන මිනිසුන් ගැන [62:5]*
- *ඉඳිකටුවේ සිදුරෙන් ඔටුවෙකු රිංගන තුරු ප්‍රතික්ෂේප කරන්නන් ස්වර්ගයට ඇතුළු නොවේ;[7:40]*
- *මිනිසුන්ට හා ඔවුන් ගේ ව්‍යාජ දෙවිවරුන්ට එක් මැස්සෙකුවත් නිර්මාණය කළ නොහැකි බව උපමාවකින් පැවසීම [22:73]*
- *බල්ලෙකුගේ උදාහරණයක් [7:176]*

- *පෘතුවියෙහි පළමුවෙන්ම මිය ගිය මිනිසාගේ මෘත දේහය කෙසේ භූමදනය කළ යුතු දැයි කපුටෙකු මගින් පොළොව හාරා උදාහරන පෙන්වීම [5;31]*
- *මිනිසුන්ගේද, අනෙකුත් ජීවීන්ගේද, පළතුරු ආදියෙහිද විවිධ වර්ණයන් (හා රසයන්) ඇති කළ බව [35:27,28]*
- *යුග අවසානයට පසු විනිශ්චය වෙත ඒමට යොමුවන මිනිසුන් විසිරුණු මෙරුවන්ට උදාහරන ලෙස දැක්වීම [101:4]*

**8. සතුන් සම්බන්ධව මූසා නබි (අ.ස) ගේ කාලයේ සිදුවූ සිදුවීම් කිහිපයක්**

*මූසා නබි (අ.ස) කුර්බාන් සම්බන්ධව තම ජනතාවට ප්‍රකාශ කිරීම [2:67-73] [5:1]*

*තවද (තව්රාත් ධර්මය ලබා දීමට) මූසාට අපි රාත්‍රීන් හතළිහක් පොරොන්දු වී තිබුනෙමු. (ඒ සඳහා ඔහු ගිය) පසු (ඔහු ආපසු හැරී ඒමට පෙරම) ඔබ සීමාව ඉක්මවා වසු පැටවෙකු (දෙවියන් වශයෙන්) ගෙන තිබුනෙහුය. (2:51)*

*තවද අපි ඔබට (ඔබගේ මුතුන් මිත්තන්ට) ස්වේත වර්න වළාකුළු වලින් සෙවන ලබා දීමට සලස්වා, ඔබ වෙනුවෙන් 'මන්නු', 'සල්වා' ද පහළ කර, (ඔවුන්ට) "අපි ඔබට ලබා දෙමින් තිබෙන පාරිශුද්ධ වූ මේවා අනුභව කරමින් සිටිනු" (යයි නියෝග කර සිටියෙමු); (2:57) [මන්නු සහ සල්වා යනු කුරුල්ලන් විශේෂ දෙකකි].*

*තවද (විවේක දිනය වන) සෙනසුරාදා දිනයන්හී (මාළු ඇල්ලීම තහනම් යයි තිබුණු සීමාව) ඔබගෙන් කවුරුන් කඩ කළෙහුද යන්නද, ඒ වෙනුවෙන් අපි ඔවුන්ට "ඔබ දීන වූ වඳුරන් බවට පත්වනු" යයි පැවසීම යන්නද, ඔබ පැහැදිලිවම දැනගෙනම සිටින්නෙහුය. (2:65), [5:60] [7:160]*

*එබැවින් ඔවුන් කෙරෙහි (වැස්ස සමග එන) සිළි සුළඟ, පළගැටියන්, උකුනන්, ගෙම්බන්, ලේ ආදී පැහැදිලි මෙම ප්‍රාතිහාර්යයන් (එකක් පසු පස එකක් වශයෙන්) අපි යැව්වෙමු. (මින්) පසුවද ඔවුන් උඩඟු වී වැරදි කරන ජනතාවක් වශයෙන්ම සිටියහ. (7:133)*

**9.** **ඉබ්රාහීම් නබි (අ.ස) සහ සත්ව ආහාර සම්බන්ධ කාරණාවක්**

*ඉබ්රාහීම් නබි (අ.ස) තුමා බදින ලද මස් ගෙනවිත් අමුත්තන්ට දීම. ඔහු නොදැන සිටි ඒ අමුත්තන් මලායිකාවරුන්ය. ඔවුන් ඒවා ප්රතික්ෂේප කළේය. [11:69]*

**10.** **තවත් නබිවරු කිහිපදෙනෙකු සහ සතුන් සම්බන්ධ ඉතිහාස කතා කිහිපයක්**

*යූසුෆ් (අ.ස) ගේ සොයුරන් තම සොයුරා වෘකයා විසින් කා දැමූ බවට බොරු කීම ගැන. [12:17,18]*

*සමූද් ජනතාව වෙත ප්රාතිහාර්යයක් ලෙස එවූ ඔටු දෙන සම්බන්ධව [17:59][54:27-30][91:13]*

*යූනුස් නබි (අ.ස) මාළුවෙකු ගිලගත් සිදුවීම ගැන [37:139-148][68:48]*

*මූසා නබි (අ.ස) ගේ සැරයැටිය නාගයෙක් බවට පත් කිරීම ගැන [20:17-2][26:32][28:31]*

*(අනුන්ගේ) එළුවන් විසින් බෝග උලා කෑම ගැන නබි දාවූද් (අ.ස) විනිශ්චය කිරීම ගැන [21:78][38:24]*

*නබි දාවූද් (අ.ස) ට සහ නබි සුලෙයිමාන් (අ.ස) ට පක්ෂීන් අවනත කර දීම සහ පක්ෂීන් සමග කථා කිරීම ගැන.[21:78,79][27:16,17,20-24][34:10][18:19,20]*

*දාවූද් නබි (අ.ස) ගේ යුධ අශ්වයින් ගැන.[38:31,33]*

*සුලෙයිමාන් (අ.ස) කුහුඹුවන් ගේ භාෂාව වටහා ගැනීම ගැන [27:18]*

*සුලෙයිමාන් නබි (අ.ස) හේත්තු වී සිටි සරයැටිය වේයන් විසින් කා දැමීම ගැන [34:14]*

**11.** **සතුන් සම්බන්ධ වෙනත් ඉතිහාස කතා කිහිපයක්**

*එක් මිනිසෙකුව වසර 100ක් නිදි කරවා නැගිටවීමත්, ඔහුගේ මැරී ගිය බූරුවා දිරාපත් වූ පසු නැවත ශරීරය සහ පණ දී නැගිටුවීම සම්බන්ධ දීර්ඝ කුරාන් වැකිය [2:259]*

*ගුහා වාසීන් සමග වසර 300කට ආසන්න කාලයක් නිදාගෙන සිටි බල්ලා ගැන .[18:18,22]*

*ඇබා බීල් නැමති කුඩා කුරුල්ලන් විසින් විසින් පුළුස්සන ලද ගල් කැට වීසි කර ඇත් සේනාව විනාශ කිරීම ගැන. [ 105:3-5*

*යුධ අශ්වයින් ගැන [8:60] වේගයෙන් දුවන අශ්වයින් [100:1-5]*

*බුරාක් නැමැති ස්වර්ගයේ සිට එවන ලද විශේෂ සත්වයෙකු ගැන සඳහන් කර ඇත. මොහම්මද් නබි (සල්) තුමාව මක්කා සිට ජෙරුසෙලම් හි පිහිටි බය්යතුල් මුකද්දිස් දක්වාත්, ඉන් පසු හත්වෙනි අහසේ ඉහලටත් එම සතා හරහා රැගෙන ගිය ප්‍රාතිහාර්යයම ගමන [17:1]*

*අනාගතයේදී- යුග අවසානය වන විට කැලේ සතුන් ගම්වලට ඒකරාශී කරන බව [81:5]*

**12. මරණින් පසු සතුන්ට කුමක් සිදුවේද?**

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් විසින් - බොහෝ සනාථ කරන හදීසයක - මෙසේ පැවසූ බව වාර්තා කර ඇත:

*"අල්ලාහ් ඔහුගේ මැවීම, ජින්වරුන්, මිනිසුන් සහ සතුන් අතර විනිශ්චය කරනු ඇත. එදින, අල්ලාහ් අං නැති සත්වයාට අං ඇති සතුන් සමඟ තම ලකුණු තීරණය කිරීමට ඉඩ දෙනු ඇත, එවිට විසඳා ගැනීමට කිසිවක් ඉතිරි නොවන විට, අල්ලාහ් ඔවුන්ට "දූවිලි වන්න" යැයි කියනු ඇත. එම අවස්ථාවේදී කාෆිර් මෙසේ කියනු ඇත, "මම දූවිලි වී සිටියා නම්".* (අල්-සිල්සිලත් අල්-සහීහා, අංක 1966 හි අල්-අල්බානි විසින් සහීහ් ලෙස වර්ගීකරණය කර ඇත)

**එවිට අවිශ්වාස කරන්නා මෙසේ කියනු ඇත:**

*'එදිනදී සෑම මිනිසෙකුම තම දෑතින් (සිදුකර) යැවූ දෙය තම දෑසින් දැක ගන්නේය. එදිනදී සෑම මිනිසෙකුම තම දෑතින් (සිදුකර) යැවූ දෙය තම දෑසින් දැක ගන්නේය. ප්‍රතික්ෂේප කරන්නන් නම්, තමන් පස් බවට පත්වී ම සිටියා නම් අගනේය නොවන්නේදැයි දොඩවන්නාහ!; [අන්-නබා' 78:40].*

එම හදීසයෙන් සහ කුරාන් වැකියෙන් අදහස් වන්නේ, සතුන් සියල්ලමත් විනිශ්චය දිනදී දෙවියන් වෙත කැඳවන බවත්, සතුන්-සතුන් හා සතුන්-මිනිසුන් අතර වූ ගනුදෙනු සම්බන්ධතා විනිශ්චයට ලක්කර, ඔවුන්ට මෙලොවදී සිදු උන සාධාරන-අසාධාරන වලට දෙවියන් විසින් අවසන් සාධාරනය ඉටු කොට ඉන් පසු සියළුම සතුන්ව දූහුවිලි බවටම පත් කර ඔවුන්ගේ කාරණාව එතැනින් සම්පූර්ණයෙන්ම අවසන් කරන බවය. ඉන් පසු ඔවුන්ට ආත්මයක් ද නැත.

නමුත් මිනිසුන්ගේ (සහ ජින් වරුන්ගේ) ආත්ම එසේ අවසන් කරන්නේ නැත. ඔවුන්ගේ අවසානය (සදාකල්) නිරය හෝ (සදාකල්) ස්වර්ගය වේ. එය දන්නා මිනිසුන්ගෙන් ප්‍රතික්ශේප කරමින් සිටි මිනිසුන් ද තමන් දූහුවිලි බවටම පත්ව සිටියා නම් හොඳ යැයි පවසන බව දෙවිදුන් පවසයි.

---

# විශ්මිත සතුන්.

අපි අපේ පාසල් කාලයේ සිට කාර්‍යය බහුල විය. රැකියාව සහ ආර්ථික රටාව, පවුල් සම්බන්ධතා, ගමන් බිමන්, විනෝදාංශ සහ අළුතින් නම් සමාජ මාධ්‍යය නිසා අපි යම් යම් සීමාවන් තුල සිරවෙලා. අපිට සොහා දහම දෙස බලන්න, ඒ ගැන සිතන්න පවා වෙලාවක් නැති තරම්.

අපිට පිටින් ඉන්න සත්ව ලෝකය දෙස අපි මොන තරම් සුළු සැලකිල්ලකින්ද බලන්නෙ. ඔවුන් විවිධත්වයෙන් ඉතා විශාලය. මිනිසුන් එක් සත්ව විශේෂයකි. පෘථිවියේ සත්ව විශේෂ මිලියන 8.7ක් පමණ සිටින බව විද්‍යාඥයින් ගණන් බලා ඇතත්, ඉන් මිලියන 7.5කට වඩා සොයා නොගෙන පවතින බව ඇතැම් පර්යේෂකයින් පවසයි. විශේෂ මිලියන 1.2කට වඩා විධිමත් ලෙස විස්තර කර ඇතත්, සත්‍ය සංඛ්‍යාව ඊට වඩා බෙහෙවින් වැඩි බව විශ්වාස කෙරේ, සමුද්‍ර

ජීවීන්ගෙන් සැලකිය යුතු කොටසක් තවමත් ගවේෂණය කර නොමැත. ඒ ඒ සත්ව විශේෂ වලට බොහෝ විට අනන්‍යය වූ සුවිශේෂී ලක්ෂණද පෙන්වයි. මේවා අදහා ගත නොහැකි තරම් විශ්මය ජනකයි. එහි අපට ප්‍රධාන සත්ව කාණ්ඩ කිහිපයක් හමුවේ. ඒවා නම්,

**1). අපෘෂ්ඨවංශීන්:-** (කොඳු ඇට පෙළක් නොමැති සතුන් - කෘමීන්, මකුළුවන්, ගොළුබෙල්ලන්, බූවල්ලන් සහ පෙලිහිශ් වැනි විවිධ කණ්ඩායම්)

**2). පෘෂ්ඨවංශීන් :-** (කොඳු ඇට පෙළක් ඇති සතුන්)

- මාළු
- උභයජීවීන්
- උරගයින්
- පක්ෂීන්
- ක්ෂීරපායින්

**3). මීට අමතරව අපගේ පියවි ඇසින් බැලිය නොහැකි තරම් කුඩා ජීවීන්ද ඇත.**

මේ පිළිබඳව සෝදිසි කිරීම මගින් මේවායේ නිර්මාතෘ ගේ ශ්‍රේෂ්ඨත්වය මනාව පිළිබිඹු වෙයි.

දෙවියන් සතුන් ගැන කුරානය තුලින් යම් යම් තොරතුරු අප වෙත දන්වා ඇත. ඒවායින් කිහිපයක් පහතින් දැක්වේ.

*භූමියෙහි බඩගා ඇවිදිය හැකි දැයද, තමන්ගේ තටු මගින් (අහසෙහි) පියාඹිය හැකි දැයද, ඔබ මෙන් (ජීවය ඇති) ඔබ වැනි උත්පාදනයන්ම මිස වෙන කිසිවක් නැත. මේවායින් කිසිවක් අපගේ පුස්ථකයෙහි සඳහන් නොකර මා අතහැර දැමුවේ නැත. පසුව (දිනකදී) මේවාද තම දෙවියන් වෙත ගෙන එනු ලැබේ. (6:38)*

*(එළු, ගව, ඔටුවන් වැනි) සතුන්ගෙන්ද ඔබට පාඩමක් ඇත. ලේ වලටද, ගොම වලටද අතරේ උන්ගේ කුසෙන් කළවම් නොවුන කිරි (උත්පාදනය කර) අපි ඔබට පොවන්නෙමු. එය පානය කිරීමට ඉතා රසවත්ය. (16:66)*

*අශ්වයින්, හා බූරුවන් ආදී සතුන් මත නැග ගමන් යාම සඳහාද, (ඔබට) අලංකාරවත් වශයෙන්ද (ඔහු) ඒවා උත්පාදනය කර ඇත්තේය. තවද, ඔබ නොදන්නා දෑයද උත්පාදනය කර ඇත්තේය. (6:8)*

*අහස් ගැබෙහි (දෙවියන්ගේ නියෝගයන්ට) අනුව යටත් වී පියාඹන පක්ෂීන්ව ඔවුන් දුටුවේ නැද්ද? ඒවා (අහස් හී) උසුළාගෙන සිටින්නා අල්ලාහ් හැර වෙන කිසිවෙකුත් නැත. විශ්වාසය තැබූ ජනතාවට මෙහිද විවිධ සාධකයන් ඇත්තේය. (16:79)*

*ඔබටද, ඔබ ආහාර දී (හදා වඩා) නොගන්නා වූ (අහස් හීද, භූමියෙහිද වාසය කරන) ජීවීන් සියල්ලටද ජීවත් වීමට අවශ්‍යය වස්තූන්ද අපිම එහි සැලසුම් කළෙමු. (15:20)*

*'ඔබගේ හිමි මී මැස්සන්ට වැටහීම දෙන්නේය. කඳු, ගස් හා උස වූ ගොඩනැගිලිවල නුඹලා මී වද බඳිනු, තවද නුඹලා සෑම පලතුරු (වර්ගවල ඇති මල්) වලින් රොන් උරා බී ඔබ හිමිගේ පහසු මාර්ගයෙහි (නුඹලා ගේ නිවෙස් තුලට) ඇතුළු වනු. මෙයින් උගේ උදරයන්හි වර්ණ කිහිපයකින් යුත් පැණියක් (මී පැණි) වැහෙන්නේය. එයින් මිනිසුන්ට සුවය ඇත. අත්තෙන්ත්ම මෙහිද සිතා වටහා ගන්න ජනතාවට සාක්ෂියක් ඇත'.(අල් කුර්ආන් 16:68/69).*

විශ්මිත සතුන් කිහිපදෙනෙකු ගැන තොරතුරු ස්වල්පයක් පහතින් දැක්වේ.

- පිරිමි සහ ගැහැණු මුහුදු අශ්වයන් ආලය කිරීමට කාලය ගත කළ පසු, ගැහැණු සතා තම බිත්තර පිරිමි සතාගේ බැගය තුළ තැන්පත් කරයි. එවිට පිරිමි සතා බැගය තුළ බිත්තර සංසේචනය කරයි. මෙය සත්ව රාජධානියේ අද්විතීය අනුවර්තනයකි. වරකට මුහුදු අශ්වයෙක් දින 14-25ක ගැබ් කාලයකට පසු පැටවුන් 2000 ක් පමන ප්‍රසූත කරයි.
- ලෝකයේ වැඩිපුරම හිසකෙස් ප්‍රතිශතයක් ඇති සත්වයා මුහුදු ඔටර් වන අතර, උගේ ශරීරයේ සෙන්ටිමීටරයකට හිසකෙස් 100-160,000 කින් සමන්විත වේ (වැඩිහිටියෙකු මුළු හිසකෙස් බිලියනයකට වඩා ඇත).
- අලියෙකුගේ හොඬවැල ලෝකයේ විශාලතම නාසයයි. උගේ නහයෙන් ගස් ඇදගෙන යාම සහ කිලෝග්‍රෑම් 350 දක්වා බර ඔසවන්නට හැකිය.

- ඩොල්ෆින්ට එක ඇසක් විවෘතව තබාගෙන නිදා ගත හැකිය. එක වරකට නිදා ගන්නේ ඔවුන්ගේ මොළයෙන් අඩක් පමණි. මෙය ඔවුන්ගේ පැවැත්මට අත්‍යවශ්‍ය වන අතර හුස්ම ගැනීමට මතුපිටට පැමිණීමට සහ සුපරීක්ෂාකාරීව සිටීමට අවදියෙන් සිටීම උපකාරී වේ.
- වැඩිපුරම නිදා ගන්නා සත්වයා කෝලා ය. සෑම දිනකම පැය 20-22 ක් නිදා ගනී.
- ලොව බරම පියාඹන කුරුල්ලා වන කෝරි බස්ටාඩ්ගේ බර කිලෝග්‍රෑම් 11-19 කි.
- මෙතෙක් බරින් වැඩිම සත්වයා ලෙස හඳුනාගෙන ඇත්තේ වන්නේ පෙරුසෙටුස් සොලොස්සුස් නම් තල්මසාය. උගේ අස්ථිවල ඝනත්වය අනුව ගනන් බලද්දි ශරීරය උපරිමව ටොන් 340 කට ආසන්න ශරීර ස්කන්ධයක් තියෙන්නට ඇත.
- බූවල්ලාට හදවත් තුනක් ඇත, ඒවාට එකිනෙකට තරමක් වෙනස් භූමිකාවන් ඇත.
- චීටා යනු ලොව වේගවත්ම සතුන් වන අතර පැයට කිලෝමීටර 120 ක වේගයක් කරා ළඟා වේ. එක් පියවරකින් ඔවුන්ට වේගය පැයට කිලෝමීටර 10 කින් වැඩි කළ හැකියි.
- විදුලි ඊලෙකුට වෝල්ට් 600 (V) ක ධාරාවකින් ඉහළ මට්ටමේ කම්පනයක් ඇති කළ හැකිය.

---

## පරිණාමවාදය සහ දෙවියන්ගේ නිර්මාණ.

පරිණාමවාදය යනු න්‍යායකි. එය සත්‍යය දැයි තහවුරු කරගැනීමට විද්‍යාඥයෝ උත්සාහ කරති. එම කාර්‍යය විද්‍යාඥයන්ටම භාර දී එහි අවසාන නිගමනය එන තුරු එය සත්‍යය යැයි කියන්නට අප ඉක්මන් නොවිය යුතුය

විශ්වය නිර්මාණය වූයේ කෙසේ දැයි විද්‍යාව මගින් තවම සම්පූර්ණ තොරතුරු සොයා ගෙන නැත. විද්‍යාවේ දැනුමෙහි සීමාව Big Bang හී ආරම්භක ලක්ෂය

දක්වා පමණක් විය. නමුත් එම ආරම්භක ලක්ෂය පැමිණියේ කොහෙන්ද සහ මනා ක්‍රමවේදයකට එය පුපුරා ගියේ කෙසේ දැයි විද්‍යාඥයන්ට තවම සොයා ගත නොහැකි විය.

විශ්වය මැව්වේ සර්වබලධාරී දෙවි කෙනෙක් බව ලෝකයේ බොහෝ දෙනා විශ්වාස කළත් එය විද්‍යාඥයන්ට ළඟා විය නොහැකි විෂය පරාසයකි. (විද්‍යාව යනු පරීක්ෂන නිරීක්ෂන මත හිදිමින් නිගමන වලට පැමිණෙන සීමා සහිත විෂයකි. එනිසා එයින් සියළුම ප්‍රශ්න වලට පිළිතුරු අපේක්ෂා කළ නොහැක).

ආගමක් යනු විශ්වාසය මත පදනවූ වූ දෙයකි. එය දෙවියන්වහන්සේ වැනි මහා බලයක් කෙරෙහි හෝ බුදුන්වහන්සේ වැනි කෙනෙකුගේ බුද්ධියක් කෙරෙහි හෝ විය හැක. නමුත් මේ විශ්වාස මගින් පවා සියළුම ප්‍රශ්න වලට පිළිතුරු නොලැබේ.

එනිසා ඔබ හෝ මම කැමති උනත් නැතත්, විශ්වය, ශාක සහ සතුන් ආදියෙහි ආරම්භය, එහි පැවැත්ම සහ අවසානය ගැන කතා කිරීමට අපට ආගමික මූලාශ්‍රත්, විද්‍යාවේ සහයත්, අපගේ විචාර බුද්ධියත්, ආධ්‍යාත්මික දැණුමත් යන සියල්ල කෙරෙහි සැලකිලිමත් වෙන්න වෙනවා.

ඔබ ආගම ගැන පමණක්ම කතා කරනවා නම් හෝ, ඔබ විද්‍යාව ගැන පමණක්ම කතා කරනවා නම් මෙය අනවබෝදයෙන් අවසන් වන හිස් තර්කයක් පමණක් වනු ඇත. එනිසා අපි එවැනි අන්තගාමීන් නොවී අපගේ පැණයන්ට පිළිතුරු සොයන්නන් බවට පත්වෙමු.

පරිණාමය යනු පරම්පරාවෙන් පරම්පරාවට ජීව විශේෂ ගහණයක ප්‍රවේණික ද්‍රව්‍යයේ ජාන ලක්ෂණවල වෙනස්කම් ඇතිවීමේ ක්‍රියාවලියයි. ජීවියෙකුගෙන් ඔහුගේ දුහිතෘ ජීවියාට යැවෙන ජාන මගින් මෙම ප්‍රවේණික ලක්ෂණ ඇති කරයි. ජානවල විකෘතිතාව හෝ වෙනස් ලක්ෂණ ජීවීන්ට ඇති කිරීම මගින් ජීවීන් අතර පරම්පරාවෙන් පරම්පරාවට උරුමවන ලක්ෂණ ඇති වේ.

පරිණාමවාදයේ පියා ලෙස හඳුන්වන්නේ චාල්ස් ඩාවින්ය. "ස්වභාවික වරණාත්මක ක්‍රියාවලිය" නම්වූ සිය න්‍යාය ඔහු (1859දී) ලොවට පෙන්වා දුන්

අතර එය කෙතරම් ව්‍යාප්ත වූවාද යත් 1993 උසස් පෙළ ජීව විද්‍යාවට මම ඉගන ගත්තේද එය සත්‍යයට සමීප අදහසක් ලෙසය. එය අදටත් පෞද්ගලික න්‍යායක් ලෙස පවතින අතර විද්‍යාවෙන් සත්‍යය බවට තහවුරු වී නොමැත.

ඉතිහාසය සහ විද්‍යාව හදාරන අයට පෘතුවිය සහ එහි ජීවය හටගැනීම සම්බන්ධව පහත ආකාරයේ තොරතුරු අසන්නට ලැබේ. විශ්වය ආරම්භ වූයේ මීට වසර බිලියන 13.7 කට පමණ පෙරය. එසේනම්, පෘථිවියේ ජීවය ආරම්භ වූයේ කවදාද? පෘථිවිය වසර බිලියන 4.5 ක් පමණ පැරණිය. විද්‍යාඥයන් සිතන්නේ මීට වසර බිලියන 4.3කට පෙර (විශ්වයේ තම සීමාව තුල) පෘථිවිය ජීවයට අවශ්‍ය තත්ත්වයන් වර්ධනය කර ගැනීමට ඉඩ ඇති බවයි. කෙසේ වෙතත් පැරණිතම ෆොසිල වල වයස අවුරුදු බිලියන 3.7 ක් පමණි. එම කාළ දෙක අතර වසර මිලියන 600ක කාළය තුළ, ග්‍රහලෝක, ඇස්ටරොයිඩ සහ වල්ගාතරු ආදිය සමඟ ඇති වුන ව්‍යසනකාරී සට්ටනවල බලපෑමෙන් පෘතුවිය තුල ඇතිවූ ජීවය නැවත නැවත ඇති වී නැතිවී නැවත ඇතිවීම වගේ තත්ව තිබෙන්නට ඇති කියා සමහරු මද ඉදිරිපත් කරයි.

කෙසේ හෝ කල් යද්දි (ඇතැම් විද්‍යාඥයින් පවසන ආකාරයට) ස්වභාවයෙන්ම ආදී සූපය ලෙස හඳුන්වන තත්වයකට පොළොව සැකසී ඇත. එයින් ස්වභාවිකවම ආරම්භක ප්‍රෝටීන අණුද, ඒවා තව කල් යද්දි ඒක සෛලික තත්වද, පසුව බහු සෛලික තත්වද ඇතිවී ඒවා ස්වභාවයෙන්ම වෙනස්වීම් වලට ලක්වී ඉතාම සංකීර්ණ සහ විශ්මිත ව්‍යුහ සහිත ශාක, සත්ව ආදිය අද අප සිටින වර්තමානය දක්වා පරිණාමය වූ බව පවසයි.

දැන් ඔබට සිතීමේ ශක්තිය ඇත්නම් කල්පනාකර බලන්න මේ තරම් මනා පිළිවෙලක් ඇති සොබා දහමකුත්, එතුල විශ්මිත භාවයෙන් යුත් සහ එකිනෙකට වෙනස්කම් දරන විශාල ශාක සහ සත්ව ගහණයකුත් එකම ඉර යට, එකම පොලොවෙ මනා සම්බන්ධතාවයකින් පවතින්නේ ඉබේම ද එසේත් නැතිනම් මෙය යම් කිසි සැලසුමක ප්‍රතිඵලයක් ද කියලා. නැවත නැවත හිතලා බලන්න.

මේ තියෙන්නෙ කුරුමිණියෙකුගෙ පෙර පාදයක යටි පතුලක්





මෙය ස්වභාවික සංසිද්ධියක (අහඹු) ප්‍රතිඵලයක්ද, මෙය ස්වභාවික (ජාන) විකෘතියක ප්‍රතිඵලයක්ද? නැත්නම් මෙය කාගෙ හරි සැළසුමක ප්‍රතිඵලයක්ද? ඔබට මොනවද හිතෙන්නෙ?

මේ කුරුමිනියාගේ යටිපතුල සම්බන්ධ ඉතාම කුඩා එහෙත් සංවිධානත්මකව සැකසී ඇති ශරීර කොටස් සහ එහි ඇති DNA ආදිය ස්වභාවික සංසිද්ධියක් කියලද හිතන්නෙ?

මිනිසෙක් තට්ටු 10ක පමණ උඩක සිට බිමට වැටුනොත් ඔහුගේ මුහුණ විකෘති වෙන විදිහ අපට සිතා ගත හැකි. එය කලින් හිටියට වඩා ලස්සනට විකෘති වෙන තත්වයක් ගැන අපි විශ්වාස කරන්නේ කොහොමද? බිග් බැන්ග් පිපිරීමෙන් පසු ඉතාම සැලසුම්සහගත ආකාරයකට විශ්වය දිග හැරුනේ ඉබේම කියා සිතිය හැකිද? මිනිසෙකුගේ එක් එක් සෛල, ඒවායේ විශ්මිත බව, ඒවායේ එකිනෙක අතර සම්බන්ධය, ඒවායේ DNA වල දිග පළල. ඒවා ඉතා කුඩාවට සැකසී සහ ඇහිරී ඇති ආකාරය නිකම්ම ඉබේ සිදු උනා කියලා කොහොමද හිතන්නෙ?

එහෙම ඉබේ සංවිධානාත්මකව, සංකීර්ණව සහ විශ්මිතව ශුභවාදී වෙනසක් ඇති කරවන "ලෝක නීතිය"ට කියන නම කුමක්ද? ඩාවින් සොභාවික වරණය ලෙස කියූ කතාව පිළිගත හැකිද? ආදී සූපයට පසු ඉබේම හටගත් ඒක සෛලයට

ආත්මය ඇතිවූ ආකාරයක් ගැන මිනිසුන්ගෙන් කවුරුන් හෝ නිවැරදි තොරතුරක් දී තිබේද? වෙන විශ්වයකින් ආත්ම ආවා නම් ඒ ලෝකවලට ඒ ආත්ම ආවේ කොහෙන්ද? ඒ ලෝක හටගත්තේ කොහොමද?

උඩ තට්ටුවේ සිට බිමට වැටීමේ කාලය සහ පරිණාමයේ කාලය වෙනස් උනත් සංසිද්ධිය එකමය. අහඹු සිදුවීමකින් යහපත් තත්වයක් කලාතුරකින් ඇති විය හැකි උනත් අපි දකින විශ්වය සහ සොභා දහමේ ඇති "සියල්ල විශ්මිත සහ සියල්ල අංග සම්පූර්ණය". ඉහල අහසේ සහ පෘතුවියෙහි ඇති බොහෝ දේවල් හී මනා සැලසුම්සහගත සහ නිර්මාණාත්මක ස්වභාවයක් අපි අපේ ඇස් වලින්ම දකින්නෙමු. එය කුඩා කුහුඹුවෙකුගේ ඇසක් හෝ මහ විශාල රුස්ස ගසක් හෝ සූර්යයා හෝ විය හැක. ඒවා සැලසුම්සහගතව සකස් වී ඇති බව ප්‍රතික්ෂේප කළ නොහැක. එවැන්නක් ඉබේ සිදුවන්නේ කෙසේද? පිළිතුර නම් "එවැන්නක් එසේ ඉබේ සිදු විය නොහැකිය" යන්නය. නමුත් එය එසේ වී ඇත. එනිසා, පරිණාමවාදය, ආදි සූපය සහ වෙන විශ්වයකින් මෙහි පැමිණුනා යන අසම්පූර්ණ පිළිතුරු පසුපස හඹා යනවා වෙනුවට විද්‍යා දැනුමත් උපයෝගී කරගෙන පහත සඳහන් කාරණාව කෙරෙහි සිත යොමුකර බැලීම වඩා හොඳය.

අපි උපකල්පණයක් ලෙස මොහොතකට හිතමු, ඉහල අහස තුලින් මහා අමුතුම ස්වරූපයකින් සහ මහා විශාලත්වයකින් යුතුව යම් කිසි කෙනෙක් මතුවී, අපිට දර්ශනය වී, ඔහු කිව්වොත්,"මම තමයි ඔබලා සිටින පෘතුවිය නිර්මාණය කළේ, එයට සාක්ෂියක් ලෙස මම අර ඇත තියෙන විශාල කන්ද ක්‍ෂණයකින් සුණු විසුණු කර පෙන්වන්නෙමි, ඔබලා මා කියූ දෙය පිළි නොගත්තොත් මම දැන්මම ඔබලා සියල්ලවම විනාශ කර දමන්නෙමි". එසේ කියා කන්ද සුණු විසුණු කර පෙන්නුවොත් ඔබලා-ඔබලා අතර හෝ ඔහු සමග තව දුරටත් තර්ක කරනවාද? මම නම් හිතන්නෙ අපි සියළු දෙනාම බයටම එය ඇත්ත කියලා පිළිගනී කියලයි. ඔහු මහා විශාල සාක්ෂියකුත් ගෙන හැර පෙන්වා හමාරය.

අප සිටින සමාජයේ බොහෝ මිනිසුන්, විශ්වය බිහි උනේ මෙහෙමයි, මිනිසා ඇතුලු ජීවය හටගත්තේ මෙහෙමයි, කියල ඒ ගැන හරි විස්තරයක් සොයා ගැනීමටද නොහැකිව, හරියට නොදැන, තර්ක කර කර ඉන්න විට, ඉහත කී ආකාරයේ බලසම්පන්න දෙයක් දැනටමත් පෘතුවියට පැමිණිලයි තියෙන්නෙ.

වෙනසකට තියෙන්නෙ ඒ මහා බලසම්පන්නයා 'තමන් එය කෙසේ නිර්මාණය කළේදැයි මිනිසාට වටහා ගැනීමට සටහන් කර නබිවරයෙකු හරහා එවා ඇති පොත' කියවලා තේරුම් ගන්න තෙක් මිනිසාට පොඩි කාලයක් දී තිබේ. ඒ පොතම ඉහත කන්ද සුණු විසුණු කලා මෙන් මහා ප්‍රාතිහාර්යයක් ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

ඒ පොතෙහි ඇති කරුණු කිහිපයක් පහතින් සඳහන් කර ඇත. එය කියවා බලා පරිණාමවාදය ගැන හෝ ආදී සූපය ගැන හෝ වෙනත් ලොවකින් ජීවීන් පැමිණීම ගැන ඔබ අවසන් නිගමණය ගන්න.

*මිනිසුනේ! ඔබගේ දෙවියන් වෙතින් (ප්‍රමාණවත්) සාධකයන් නියත වශයෙන්ම ඔබ වෙත පැමිණ ඇත. පැහැදිළි ඉමහත් ආලෝකයම (ශුද්ධ වූ කුර්ආනය) අපි ඔබට පහළ කර ඇත්තෙමු. (4:174)*

*(කිවෙකුගේ උදව්වක් නොමැතිව) අපගේ ශක්තිය මගින් අහස (විශ්වය) නිර්මාණය කළෙමු. නියත වශයෙන්ම අපි (එය ඔවුන්ගේ බුද්ධියට හසු නොවන සේ) අති විශාලවත් අන්දමට තබා ඇත්තෙමු. (ඇත්ත වශයෙන්ම, අපි එය පුළුල් කරන්නෙමු)." (51:47)*

*නියත වශයෙන්ම අපි සෑම වස්තුවක්ම (නියමිත්) ප්‍රමාණයට අනුවම නිර්මාණය කර ඇත්තෙමු. (54:49)*

*මොවුන් හොඳ වැටහීමක් ලබා ගනු පිනිස, මෙම කුරානයෙහි නියත අවශයෙන්ම අපි විවිධාකාර අන්දමින් (හොඳ ඔවදන්) පවසා ඇත්තෙමු: (17:41)*

*මිනිසුන්ව තෘප්තියට පත් කිරීමට අවශ්‍යය උදාහරණයන් සියල්ල මෙම කුර්ආනයෙහි නියත වශයෙන්ම අපි පවසා ඇත්තෙමු. (30:58)*

*තවද, සත්‍යය පැමිණ ඇත, අසත්‍යය සැඟවී ගියේය. නියත වශයෙන්ම අසත්‍යය අනිවාර්යයෙන්ම විනාශ වී යනු ඇතැයි ද (නබියේ ඔබ) පවසනු. (17:81)*

*ශුද්ධ වූ කුරානය වන මෙය ධර්ම පුස්තකයයි. මෙහි කිසිම සැකයක් නැත. භය භක්තිකයින්ට (මෙය) සෘජු මාර්ගය පෙන්වන්නේය. (2:2)*

*එබැවින් මෙහි ඇති කාරණාවන් (ගනන් නොගෙන) සුළු කොට සළකන්නෙහුද? (56:81)*

*"මන්ද ඔවුන් අල් කුරානය අධ්‍යනය නොකරන්නේ, ඔවුන්ගේ සිත් තුලට අගුලු දමා තිබේද?" (47:24).*

*(මිනිසුනේ!) මෙම කුරානය ඔවුන් ගැඹුරින් අවධානය කළ යුතු නොවේද? මෙය අල්ලාහ් නොවන කෙනෙකුගෙන් පැමිණ තිබුනේ නම්, මෙහි අනන්තවත් වැරදිද, භේදයන්ද ඔවුන් දකිනු ඇත. (4:82)*

[මෙය ලොව සිටින 'ප්‍රතික්ෂේප කරන ඉහලම විද්වතුන්ට' යොමු කරන අභියෝගයකි]

මිනිසා වඳුරෙකුගෙන් ඇති වූවක් නොව, මිනිසාව මිනිසෙකු වශයෙන්ම නිර්මාණය කළ බව දෙවිඳුන් පවසා ඇත.

*නියත වශයෙන්ම අපිම මිනිසාව (පළමු වරට) උත්පාදනය කළෙමු. ඔහුගේ මනසෙහි ඇතිවන සිතුවිල්ලද, අපි හොඳින් දනිමු. පිටි බෙල්ලේ ඇති පන නහරයට වඩා අපි ඔහුට ඉතාමත් සමීපයෙන්ම සිටින්නෙමු. (50:16)*

*මිනිසාණෙනී! ඔබගේ ගෞරවණීය දෙවියන් ගැන ඔබව රවටා දැමුවේ කිමෙක්ද? ඔහුම ඔබව උත්පාදනය කර, උසස් අන්දමට හැඩරුව නිර්මාණය කර, ඉතාමත් නියමිත ආකාරයට සකස් කළේය. ඔහුම තමන් කැමති (ඉතාමත් අලංකාරවත්) හැඩයකින් ඔබව (ඔබේ අවයවයන්) සවි කළේය. (82:6,7,8)*

*නබියේ, ඔබගේ දෙවියන් ආදම්ගේ පරම්පරාවේ දරුවන් වන ඔවුන්ගේ පිටකොන්දෙන් ඔවුන්ගේ පරම්පරා දරුවන්ව ඉකුත් කර, ඔවුන් තමන්වම ඔවුන්ට සාක්ශියක් වශයෙන්ද තබා (ඔවුන්ට) "මා ඔබගේ දෙවියන් නොවේද"? යි විමසූ විට, "ඇත්තෙන්ම (ඒ ආකාරයටම) අපි සාක්ශි දරන්නෙමු" යැයි ඔවුන්ගේ පැවසීම (ඔබ ඔවුන්ට) මතක් කර දෙනු. (මන්දයත් මෙය කිසිවෙකුත් මතක් කර නොදුන් බැවින්) නියත වශයෙන්ම අපි මෙය අමතක කර දමා නොසැලිකිලිමත්ව සිටියෙමු" යැයි පරලොව දිනදී ඔවුන් නොකියා සිටීම සඳහාද..,(7:172)*

*දෙවිඳුන් විසින් මිනිසාවත් ඔහු ජීවත්වන මහපොළොවත් නිර්මාණය කර මිනිසාට අවශ්‍යය සියළුම පහසුකමුත් සපයා, ජීවත් වීමට මාර්ගෝපදෙශයනුත් එවා, නොදන්නා බොහෝ කාරණා සම්බන්ධ තොරතුරුත් එවා, ජීවත් වීමෙහි අරමුණත් පැහැදිළි කර, මරණින් මතු තත්වයත් පහදා දී අවසානයට මෙසේත් පවසා තිබෙනවා.*

*"අපි නුඹලාව නිකමට මැව්වෙමු යැයිද, නියතව නුඹලා අප හමුවට හරවනු නොලබන්නේහු යැයිද සිතාගෙන සිටියෙහුද?" (කුරානය 23:115).*

*(කිසිම) ප්‍රශ්නයක් නොඅසා අත්හැර දමන්නෙමු යැයි මිනිසා අදහස් කළෙහිද? (75:36)*

*නියත වශයෙන්ම ප්‍රතික්ෂේප කරන්නන්ට නිරයම අප පිළියෙල කර ඇත්තෙමු. (කුරානය 18:102)*

---

## දෙවියන්ගේ දඬුවම් ප්‍රමාද වන්නේ ඇයි?

බොහෝ වැරදිකරුවන් යහතින් ජීවත්වීම දකින විට දහම ගැන නිසි අවබෝදයක් නොමැති කෙනෙකුට දෙවිකෙනෙක් සිටිනවාදැයි සැකයක් පහළ විය හැකිය. උදාහරනයක් වශයෙන් ඇතැම් පාලකයින් ජනතාව තලා පෙලා අල්ලස් සහ දූෂණයෙන් රට පාලනය කලත් ඔවුන්ට කිසිම දඬුවමක් ලැබෙන්නේ නැත. මේවා දකින විට දුර්වල මනසක් ඇති කෙනෙකුට දෙවියන් ගැන සැක පහළ විය හැකිය. මෙවැනි සිදුවීම ඇත ඉතිහාසයේ සිටම සිදුවී තිබේ. පාරාවෝ මීට හොඳම උදාහරණය වේ. ඔහු දෙවියන්ට අභියෝග කළේය. එහෙත් දෙවියන් ඔහු කෙරෙහි කරුණාව දැක්විය. ඔහුව නිවැරදි මාර්ගයට ගැනීම සඳහා නබිවරුන් දෙදෙනෙකුම යැව්වේය. එහෙත් පාරාවෝ ඉන් ප්‍රයෝජනයක් නොගත් බැවින් ඔහුව සහ ඔහුගේ සේනාව ජලයේ ගිලවා විනාශ කර දැම්මේය. නූහ් නබිතුමාගේ කාලයේදීද එසේම විය. ඔවුන් වැරදි කිරීමෙහි ස්ථිරවම සිටින විට ඔවුන් සියළුම දෙනා විශාල ජන ගැල්මකින් විනාශ කළේය. කෙසේ වෙතත් දෙවියන්ගේ අරමුණ මිනිසා විනාශ කොට දඬුවම ලබා දීම නොවේ. ඔහු ඉතා කාරුණිකය. මේ

නිසා මිනිසා කොපමණ වැරදි කලත් මරණයට පෙර යම් දවසක තමන්ව නිවැරදි කර ගැනීම සඳහා සෑම අවස්ථාවකම ලබා දී තිබේ.

මිනිසා සහ ජින්වරුන් දෙවියන්ගේ විශේෂ මැවීම් දෙකකි. ඔවුන්ට ස්වයං තීරණ ගැනීමට හැකිය. එම හැකියාව දේවදූතයින්ට පවා ලබා දී නොමැත. එම හේතුවෙන් මිනිසාට දෙවියන්ගේ අණ පිලිපැදීමෙන් දේවදූතයින්ට වඩා ශ්‍රේෂ්ඨ විය හැකිය. කෙසේ වෙතත් මිනිසාට එය කල හැක්කේ ඔහුට මෙලොවදී ලැබී ඇති පරීක්ෂාවන්ට සාර්ථකව මුහුණ දීමෙන් පමණි. එම නිසා මිනිසාගෙන් කුමන අකාරයේ වැරදි සිදු වුවත් ඒවා හදා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ. මිනිසා සහජයෙන්ම වැරදි කරන්නේය. ඒවාට එවෙලේම දඬුවම් කලේ නම් ඔහුගෙන් සිදු වන වැරදි හදා ගැනීමට අවස්තව නොලැබී යනු ඇත. එම නිසා මිනිසා කොපමණ වැරදි කලත් ඒවා නිවැරදි කර ගැනීම සඳහා අවස්ථාවක් ලෙස ඔහුගේ දඬුවම් එවෙලේම ලබා දෙන්නේ නැත.

*"අල්ලාහ් මිනිසුන්ගේ අපරාධ හේතුවෙන් (එම මොහොතේදීම) දඬුවම් කළහොත් (පොළව මත) එහා මෙහා වන කිසිම ප්‍රානියෙකුව ඉතිරි කරන්නේ නැත, එහෙත් ඔවුන්ට නියමිත කාල සීමාවක් දක්වා කල් දී තිබේ, නියමිත කාලය පැමිණි කල ඔවුන්ට එක් හෝරාවක් ඉදිරියට හෝ ආපස්සට යෑමට ලැබෙන්නේ නැත" (කුරානය 16:61).*

දෙවියන් සෑම දෙයක් ගැනම ඉතා හොඳින් නිරීක්ෂණය කරන්නේය. එය ඔහුගේ ගුණාංගයක් ද වේ. එහෙත් මහා කාරුණික දෙවියන් මිනිසාට මැරෙන මොහොත දක්වා ම ඔහු කරන වැරදි වලට සමාව ගැනීමට අවස්තාව ලබා දී තිබේ. එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම මිනිසා ලබා ඇති විශාලා වරමකි. එම වරමෙන් ප්‍රයෝජන නොගන්නේ නම් මොනතරම් අවාසනාවක්ද?

*"වැරදි කරුවන් කරන දේවල් ගැන අල්ලාහ් නොදැන සිටිනවා යැයි නොසිතන්න, එහෙත් ඔහු භීතියෙන් තිගැස්සී ඇස් උඩ යන එම දිනය දක්වා ඔවුන්ට අවකාශ ලබා දී තිබේ" (කුරානය 14:42).*

මෙම අවවාද වලින් ප්‍රයෝජන ලබන්නා මරණයෙන් පසු නිමක් නොමැති ජීවිතය ජය ගනු ඇත. තවද, ඊට පිටු පාන අය දෙවියන්ගේ දඬුවමට ලක් වනු ඇත.

කෙසේ වෙතත් කෙනෙක් දෙවියන්ව විශ්වාස කල යුතු අන්දමට විශ්වාස නොකර තමන් නිවැරදි මාර්ගයේ සිටින්නේ යැයි උපකල්පනය කරන්නේ නම් ඔහු කරන ලොකුම වැරැද්ද එයයි. උදාහරණයක් වශයෙන් දෙවියන් වෙනුවට සාන්තු වරයෙකුව හෝ ඔහුගේ ප්‍රතිමාවක් හෝ දෙවියන් ලෙස සලකා ඔහුට වැඳුම් පිදුම් කිරීම පෙන්වා දිය හැකිය. එවැනි කෙනෙක් නැවත හරි මාර්ගයට පැමිණීම ඉතා විරලය. එහෙත් බෞද්දෙක් හෝ වෙනත් වැරදි කල කෙනෙක් යම් දවසක තමන් කරන වැරදි වලින් මිදී නිවැරදි මඟ තෝරාගැනීම ගැන සිතා බැලිය හැකිය. තවද දෙවියන්ව විශ්වාස කරන කෙනෙක් දෙවියන්ට සමානයන් තබන්නේ නම් එයද ඔහු කරන විශාල වරදකි. ඇයිද යත් එවැනි අයට මරණයෙන් පසු සමාවක් නොලැබෙන බව කුරානයේ ඉතා පැහැදිලිව සඳහන් කොට ඇති නිසාය. එම අවස්ථාවට මුහුණ දුන් පසු නැවත හැරීමක් නොමැත. මෙවැනි අයද නැවත නිවැරදි මාර්ගය අත්කර ගැනීම ඉතා විරලය. මේ නිසා මිනිසා සත්‍යය දහම සොයා දැනගෙන එය පිළිපැදිය යුතුව තිබේ.

*"නුඹගේ අධිපති දෙවියන් අධික ලෙස ක්‍ෂමාකරන්නාය; කරුනාවන්තයාය. ඔහු, ඔවුන් උපයාගත් දේවල් සඳහා දඬුවම් කරන්නේ නම් නියත වශයෙන්ම ඔවුනට වේදනාව ඉක්මන් කරත හැකිය. එහෙත් ඒ සඳහා ඔවුන්ට යැයි ප්‍රතිඥා දෙනු ලැබූ වෙලාවක් නියම කොට ඇත. ඉන් ඔබ්බට ඔවුන් සඳහා ගැලවුමක් නැත"*
*(කුරානය 18:58).*

මිනිසාට මෙලොවදී ලැබී ඇත්තේ එක් අවස්ථාවක් පමණි. එය හරියාකාරව තේරුම් ගැනීම මිනිසාට පැවරී ඇති විශාල වගකීමකි. එහෙත් බොහෝ අය ඒ ගැන සිතීමට වඩා ලෞකික ජීවිතයේ සැපත වෙනුවෙන් කාලය ගත කිරීම කොතරම් මුග්ධ කමක් විය හැකිද? තවද බොහෝ අය පින් දහම් කරති. එහෙත් ඔවුන් කරන පින් දහම් දෙවියන් විසින් පෙන්වා දෙන ලද ඒවා දැයි සොයා බැලීමක් නැත. බොහෝ විට ඒවා මිනිසාගේ සිතුම් පැතුම් අනුව නිර්මාණය කල ඒවාය. ඒවා තේරුම් ගෙන නිවැරදි මාර්ගයට ප්‍රවේශ වීම සඳහා දෙවියන් මිනිසාට දෙන දඬුවම් ප්‍රමාද කිරීම ප්‍රයෝජනයට ගත යුතුව ඇත. නැතහොත් මිනිසාට ලැබී ඇති අනගි අවස්ථාව ඔවුන්ගෙන් ගිලිහී යනු ඇත. එහි ප්‍රතිපලය වන්නේ දෙවියන් ප්‍රතිඥා දී ඇති ස්වර්ගය නොලැබී යාමයි. [Fazy Ajwad (FA) ගේ ලිපියකි].

# ස්වභාවික විපත් පිටුපස ඇති රහස.

ගංවතුර, සුනාමි, භූමි කම්පා, සුළි සුළං, ආදී වශයෙන් ස්වභාවික විපත් යනුවෙන් අප අදහස් කරමින් සිටින්නේ කුමක්ද?

මෙම ලිපිය තුලින් ඔබට එය නිවැරදිව වටහා ගනු ඇතැයි මා අදහස් කරමි.

ඉතිහාසයේ සිදුවූ සමහර විපත් කිහිපයක් සහ මෑත කාලයේ සිදුවූ විපත් අති විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කරමින් ඔබේ මනස අවදි කිරීමට මෙම ලිපිය සකස් කර ඇත.

මිනිසා නිර්මාණය කර ඔහුව අධ්‍යාත්මිකව හා භෞතිකව හැඩගස්වා ඔහුව ජීවත් කරවන්නේ සර්වබලධාරි දෙවියන් අල්ලාහ් ය. (මෙය සනාථ කිරීමට බොහෝමයක් සාධක කුර්ආනය තුලින් දැක ගත හැක. මෙම ලිපියෙහි අවසාන කොටස බලන්න).

විශ්වයම නිර්මාණය එය පෝෂණය කරමින්, පාලනය කරමින් තම අණට යටත් කර සිටින සර්වබලධාරි දෙවියන් ගැන දැන ගැනීම, ඔහුගේ උපදෙස් පිළිපැදීම, ඔහුට මනසින් ළංවීම සහ ඔහුව ප්‍රසංශා කිරීම සෑම මිනිසෙකුගේම යුතුකමකි.

දෙවියන්වහන්සේ තම නිර්මාණයක් වන මිනිසා වෙත අනාගතවක්තෘවරයන් හරහා එවන ලද පණිවිඩ තමාගේ නිර්මාතෘ වෙතින් තමා වෙත ආ මාර්ගෝපදේශය ලෙස ඒ ඒ යුග වල සිටින මිනිසුන් පිළිගත යුතු යැයි අවධාරනය කර ඇත.

නිමක් නැති දැනුම, ප්‍රඥාව ගෙන දෙන අල්ලාහ්ගේ අවසන් පණිවිඩය වන කුර්ආනය, තම මනස හා හදවත ආලෝකමත් කරගත හැකි, ආත්මය සුව කර කරගත හැකි, මිනිසාට ශක්තිමත් හෘද සාක්ෂියක් හා විශ්වාසයක් ඇති කරගත හැකි උත්තරීතර ග්‍රන්ථයකි.

අපගේ නිර්මාතෘ අපට පවසන දේ හොඳින් අධ්‍යයනය කර ඒවා මෙනෙහි කළ යුතුය. ඇත්ත වශයෙන්ම, දෙවියන්වහන්සේ පවසන්නේ කුරානය මිනිසාට සිතීමට මග පාදන බවත් එතුලින් තම ජයග්‍රහනය සොයා ගත හැකි බවත් ය. එය

නොසලකා හැරියොත් පරීක්ෂණයට හෝ දඬුවමට ලක්විය හැකි බවත් අවසානයේ පරාජිත වන බවත් කල් තියා දැනුම් දී තිබේ.

*මිනිසුන්ගේ අත් සොයා ගත් (නපුරු) ක්‍රියාවන් හේතුවෙන් මුහුදෙහිද, ගොඩබිමෙහිද අපරාධයන් ඇති විය. (ඒවායෙන්) ඔවුන් ඇත්වනු පිණිස, ඔවුන්ගේ නපුරු ක්‍රියාවන්ගෙන් සමහරක් ඔවුන් (මෙලොවදීම) විඳින සේ ඔහු සලසන්නේය. (Al Quran 30:41)*

අල් කුර්ආනයේ වැදගත් අංගයකි පෙර ජාතීන් පිළිබඳ පුවත් හෙළිදරව් කිරීම. එම ජාතීන්ගෙන් බොහොමයක් ඔවුන් වෙත එවන ලද අනාගතවක්තෘවරුන් ප්‍රතික්ෂේප කළ අතර ඔවුන්ව සතුරන් ලෙස සැලකූහ. ඔවුන්ගේ ප්‍රතික්ෂේපය නිසා සිදුවුන විනාශයන් ඉන් පසු ලොවට එන අයට පාඩම් ලෙස දක්වා ඇති බව දෙවියන්වහන්සේ කුරානයේ සඳහන් කරයි.

අල් කුර්ආනය තුලින් උදාහරන සහ සාධක සහිතව පෙන්වා දෙන අධික වර්ෂාපතන, මහා ජල ගැලීම්, ගංවතුර, භූමි කම්පා, අධික හෙන හඬ, ශබ්ද තරංග, සුළිසුළං, සාගත ආදී තත්ව නිකන් අහඹු ලෙස සිදුවන්නක් නොව, ඒවා මිනිසාගේ නරක ක්‍රියා නිසා දෙවියන්වහන්සේ විසින් ඔවුන්ට දඬුවම් ලෙස සහ අනිකුත් සමාජ වලට එයින් උගත යුතු පාඩම් ලෙස මනා සැලසුමකින් ඇති කල ඒවා බව පැහැදිලි කරයි. එම සිදුවීම් බොහොමයක් පුරාවිද්‍යා කැණීම්වලට ස්තූතිවන්ත වන්නට අපටද දැන ගැනීමට සහ දැක ගැනීමට ඇත.

බහුදේවවාදීන්, අදේවවාදීන්, ප්‍රතික්ෂේප කරන්නන්, නොහික්මුණු මිනිසුන්, පීඩාකරන්නන්, කැරලිකරුවන්. දූෂකයන් සහ ලොව පුරා සිටින දුරාචාරිකයන්, ආදී සියල්ලන්ටම හදිසියේම හා එකවර දඬුවම් නොලැබේ. අල්ලාහ්වත් ඔහුගේ අවසන් නබිවරයාවත් පිලිගන්නා මුස්ලිම් සමාජයන්ටද වරින් වර විවිධාකාරයේ දඬුවම් පහල කර ඇත. ඔවුන්ගේ හැසිරීමත් අල්ලාහ් ඉතා අවධානයෙන් යුතුව බලන අතර ඔවුන්ව දඬුවම් වලට ලක් කිරීමත් විවිධ හේතූන් නිසා සිදුවන්නකි.

සෑම මනුශ්‍යයෙකුටම හෝ ජාතියකටම කාල සීමාවක් ඇත. යම් කාල පරිච්ඡේදයකදී ජාතියක් විනාශ වීමට හේතු වන අකුසලයක් තවත් ජාතියකට අඩු හෝ වැඩි කාලයක් ලෙස ගත විය හැකිය. කෙසේ වෙතත්, ඔවුන්ගේ නියමිත

කාලය ළඟා වූ විට, එය ප්‍රමාද කිරීමට හෝ ඉදිරියට ගෙන යාමට නොහැකිය. ඒවා එවෙලෙහිම විනාශ වෙනු ඇත.

සෑම ජනතාවකටම ඔවුන්ගේ විනාශය ගැන සංරක්ෂණය කරන ලද අල්ලාහ්ගේ සන්නිධානයේ ඇති 'ලහු අල් මහ්ෆූස්' නම් ඵලකයයෙහි සටහන් කර ඇත. එහි ලියා ඇති හේතු සහ කොන්දේසි වලට ළඟා වූ විට ඒවා විනාශ වේ. මෙම කාල සීමාව මිනිසුන්ට දැනගත නොහැක. එය දන්නේ අල්ලාහ් පමණි.

ජාතීන් විනාශ වන්නේ ඔවුන් කරන පීඩාකාරී සහ නරක ක්‍රියා නිසාය. ජාතියක යහපත් ලක්ෂණ ඔවුන් විසින්ම වෙනස් කරගන්නේ නම් මිස අල්ලාහ් වෙනස් නොකරයි. මිනිසුන් යහපත් ක්‍රියා කරන තාක් සුඛිත මුදිතව ජීවත් වෙති. ප්‍රජාවන්ගේ විනාශය සිදුවන්නේ ඔවුන්ගේම අකටයුතුකම්, දූෂණය, අරාජිකත්වය සහ භීෂණය වැනි නරක ක්‍රියා නිසාය.

සමහර සමාජයන්ගේ දඬුවම් සමග එහි සිටි යහපත් මිනිසුන් ද ඒවාට හසුවී මිය යන්නේ ඔවුන්ගේ මෙලොව කාලය අවසන් වූ බැවිනි. මරනින් මතු ඔවුන් ජයග්‍රාහකයින් වනු ඇත. කුඩා ළමුන්, මන්දබුද්ධික මිනිසුන් ආදිය වැරදිකරුවන් ලෙස නොවෙයි මිය යන්නේ. ඔවුන්ගේ මරනින් මතු තත්වය වැරදි කරුවන්ට වඩා වෙනස් ය.

යම් සමාජයක දුරාචාරය, අයුක්තිය, පීඩාව, අයහපත් ක්‍රියා වැඩි වුණොත් ඒවා වළක්වන්න කවුරුවත් උත්සාහ කරන්නේ නැත්නම් ඒ සමාජයට දඬුවම් කර විනාශ කරයි. අල්ලාහ් ඔවුන් වෙනුවට වෙනත් සමාජයක් පත් කරයි. මෙම කාරණය අල් කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

*අපරාධකාරයින් වාසයකල කොපමනදෝ රටවල් අපි විනාශකර, සුණුවිසුණු කර දැමුවෙමු. ඔවුන්ගෙන් පසු (ඒ ස්ථානයන්හී ) වෙනත් ජනතාවන් උත්පාදනය කළෙමු. (අල් කුර්ආන් 21;11).*

බොහෝ ජාතීන් ජීවත් වූ අතර මිය ගියේය. ඒ ජාතීන් නොනැසී සිටියේ ඇයි? ඒවා විනාශ කළේ ඇයි? අල් කුර්ආනයට අනුව, සමහර ජාතීන් දරිද්‍රතාවයෙන් හා

දුෂ්කරතාවලින් පෙළෙන විට විනාශ වූ අතර තවත් සමහරක් සුඛසාධනයෙන් සහ ධනවත්ව සිටියදී සිටියදී විනාශ විය.

අල් කුර්ආනය අපට පවසන පරිදි, මිනිසුන්ට මග පෙන්වීම සඳහා අල්ලාහ් සියලු ජාතීන්ට අනාගතවක්තෘවරුන් එවා ඇත. අනාගතවක්තෘවරු ඔවුන්ව අල්ලාහ්ව විශ්වාස කිරීමට සහ කීකරුකමට කැඳවූ අතර දුෂ්ටකම, පීඩාවන් සහ කැරැල්ල අත්හරින්නැයි ඉල්ලා සිටියහ. කෙසේ වෙතත්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අනාගතවක්තෘවරුන්ගේ කැඳවීම පිළි නොගත් අතර ඒවා ප්‍රතික්ෂේප කළහ. ඔවුන්ගෙන් සමහරෙක් ඔවුන්ගේ අනාගතවක්තෘවරුන්ට වධ දී මරා දැමූහ. අල්ලාහ් එම ජාතීන්ට කිහිප වතාවක්ම අවවාද කළ නමුත් ඔවුන් තමන්ව පිළිසකර කර නොගත් නිසා ඔහු ඔවුන්ව විනාශ කළේය. මෙම කාරණය අල් කුර්ආනයේ (අල් අන්ආම්,6/6, 6/44) සඳහන් වේ.

ඉහත වාක්‍යවල සඳහන් වන්නේ දෙවියන්වහන්සේ පෙර ජාතීන් ඔවුන්ගේ පව් නිසා විනාශ කළ බවත් ඔවුන් ආර්ථික හා තාක්ෂණික වශයෙන් දියුණු වුවද විනාශයෙන් ගැලවීමට නොහැකි වූ බවත්ය. එම විනාශ වූ ජාතීන් වෙනුවට අල්ලාහ් නව ජාතීන් නිර්මාණය කළේය.

විනාශ වූ ජාතීන්ගේ ප්‍රධාන පාප වන්නේ ඔවුන්ව විශ්වාස කිරීමට, කීකරු වීමට සහ අවංක වීමට කැඳවූ අනාගතවක්තෘවරුන්ට එරෙහිව කැරලි ගැසීම සහ ඔවුන්ගේ දෙවියන්ව සහ අනාගතවක්තෘවරුන්ව ප්‍රතික්ෂේප කිරීමයි.

අල් කුර්ආනයේ වැදගත් කොටසක් ලෙස පෙර ජාතීන්ගේ සහ අනාගතවක්තෘවරුන්ගේ කථා සහ ජීවිත වලින් උදාහරණ ලබා දෙයි. මේ කථා ඉදිරිපත් කරන්නේ කියවන්නට පමණක් නොව, මිනිසුන්ට ඒවායින් පාඩම් ඉගෙන ගැනීමටය. මෙම කථා වැදගත් පාඩම් උපදෙස් වලින් පිරී ඇත. ඒ නිසා අපි ඒ පද හොඳින් කියවා ඒවායින් හොඳ පාඩම් ඉගෙන ගත යුතුයි. ඉතිහාසයේ සිදුව ඇති මෙම සත්‍ය උදාහරණ ලෙසටම නොවෙද අදත් අපට සොභාවික විපත් සිදුවන්නේ යැයි ඔබට හොඳින් වැටහෙයි.

**දැන් අපි බලමු පෙර ඉකුත් වූ සමහර ජාතීන් විනාශ වීමට බලපෑ හේතු.**

- **නූහ් නබිවරයාගේ ජන සමාජය**

(අධික වර්ශාවෙන්, මහා ජල ගැලීමෙන් ඔවුන්ව විනාශ කර දැමීය)

පෘථිවිය මත වූ පලමු මිනිසා වන ආදම් (عَلَيْهِ السَّلَامُ) ගෙන් මනුෂ්‍ය සංඛ්‍යාව වැඩි විය. කල් යන විට ඔවුන් පෘථිවියේ නගර කිහිපයක් ගොඩනඟා ගත් නමුත් ඔවුන් සැබෑ ආගමෙන් බැහැර වී පිළිම වන්දනා කිරීමට පටන් ගත්හ. අල්ලාහ් මිනිසුන්ට අනාගතවක්තෘවරයෙකු ලෙස නූහ් නබිවරයාව එවන ලදී. නමුත් ඔවුන් ඔහුගේ උපදෙස් පිළිගත්තේ නැත. ඔවිහු ඔහුට සමච්චල් කළහ. ඔහු වසර 950 ක ආසන්න කාලයක් ඔවුන්ට සත්‍ය පහදා දෙන්න උත්සහ දැරීය. එලක් නොවීය. නූහ් නබිවරයා තම ජාතියේ විශ්වාසය අත්හැර දැමූ අතර අවසානයේ ඔවුන්ව විනාශ කරන ලෙස අල්ලාහ්ගෙන් ඉල්ලා සිටියේය. දෙවියන්වහන්සේ ඔහුට නැවක් තැනීමටත් ඇදහිලිවන්තයන් හා එක් එක් සත්ත්ව විශේෂයේ යුගලයන් නැව්ගත කිරීමටත් නියෝග කළේය. ඉන් පසු අහසින් අධික වර්ශාව සහ භූමියෙහි උල්පත් විවරකරමින් මහා ගංවතුරක් එවා මහ පොළොව යට කර දැමීය. විශ්වාස නොකළ අය දියේ ගිලී විනාශ විය.

නූහ් නබිවරයා ගේ ජාතිය විනාශ වූයේ ඔවුන් අල්ලාහ්ට සහ ඔහුගේ අනාගතවක්තෘවරයාට විරුද්ධව කැරලි ගැසූ නිසාත්, ඔවුන් අවිශ්වාසයට සහ පාපවලට යොමු වූ නිසාත් ය.

- **ආද් ජනයා - හූද් නබිවරයාගේ ජනතාව**

(අධික සුලි සුළඟින් ඔවුන්ව විනාශ කර දැමීය)

දෙවියන්වහන්සේ විසින් යේමනයේ විසූ ආද් ජනයාට අනාගතවක්තෘවරයෙකු ලෙස හූද් (عَلَيْهِ السَّلَامُ) නබිවරයාව එවන ලදී. ආද් ජාතියට බොහෝ වරප්‍රසාද තිබුණි. ඔවුන් විචිත්‍රවත් ගොඩනැගිලි ඉදි කළහ. හූද් නබිවරයා බහුදේවවාදය අනුගමනය කල සහ අල්ලාහ්ව අවිශ්වාස කළ ආද් ජාතියට අල්ලාහ්ව විශ්වාස කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, ඔවුන් තමා වෙත ආ අල්ලාහ්ගේ පණිවුඩකරුවා ව නොසලකා හැර පාපයන්ගේ ගැලී සිටි නිසා දැඩි සුළඟකින් විනාශ වී ගියේය.

දෙවියන්වහන්සේ ඔවුන්ට දුන් වරප්‍රසාද නොතකා ඔවුන් කෘතවේදීත්වය නොදැක්වීම නිසාත්, ඔවුන් ප්‍රතික්ෂේප කිරීම සහ කැරලි ගැසීම නිසාත් එම ආද් ජාතිය විනාශ විය.

- **සමූද් ජාතිය - සාලිහ් නබිවරයාගේ ජනතාව**

(අධික ශබ්ද තරංග මගින් ඔවුන්ව විනාශ කර දැමීය)

ආද් ජාතියේ විනාශයෙන් පසු, සමූද් ජාතිය හිජ්ර් කලාපයේ ජීවත් විය. සමූද් ජාතියටද බොහෝ වරප්‍රසාද තිබුණි. ඔවුන් කඳු සහ ගල් කැටයම් කිරීමෙන්ද, ගිම්හාන සහ ශීත කාල වලට සරිලන ආකාරයට ශක්තිමත් නිවාසද ඉදි කළහ. ඔවුන් බහුල ලෙස හා සුහසාධනයෙන් දිගු කලක් ජීවත් වූහ. කාලයාගේ ඇවෑමෙන් ඔවුන් යහමග හැර ගොස් හිත් උදුම්මාගත් ජාතියක් බවට පත් විය. අල්ලාහ්ට සමානයන් තැබීය.

දෙවියන්වහන්සේ විසින් ඔවුන් වෙත සාලිහ් (عَلَيْهِ ٱلسَّلَامُ) නබිවරයාව අනාගතවක්තෘවරයෙකු ලෙස යවා අල්ලාහ්ව විශ්වාස කිරීමට, නමස්කාර කිරීමට සහ කීකරු වීමට උපදෙස් ලබා දුන්නාහ. අල්ලාහ් ඔවුන්ට හාස්කම් පෙන්වීය. කෙසේ වෙතත්, සමූද් ජාතිය අල්ලාහ් ට හෝ නබිවරයාට කීකරු නොවීය. ඔව්හු ප්‍රතික්ෂේප කරන්නන් ලෙසම සිටියේය. ඔවුන්ට ප්‍රාතිහාර්යයක් ලෙස ලබා දුන් ගැහැණු ඔටුවාව මරා දැමීය. එවිට, සාලිහ් නබිවරයාව සහ ඔහුව විශ්වාස කළ අය හැර, සමූද් ජාතියේ සියලු දෙනා අධික ශබ්ද තරංග මගින් විනාශ විය.

- **ලූත් (عَلَيْهِ ٱلسَّلَامُ) නබිවරයාගේ සමාජය**

(අධික භූමිකම්පාවෙන් ඔවුන්ව විනාශ කර දැමීය)

දෙවියන්වහන්සේ සහ ඔහුගේ දූතවරයාව ප්‍රතික්ෂේප කල මෙම ජනතාව තවත් නොහොබිනා වැඩක් කලේය. එනම් තම ලිංගික ආශාවන් සඳහා පිරිමි- පිරිමි වෙත ගියේය. මෙයත් නතර කරන ලෙස ඔවුන්ට අවවාද කලේය. ඔවුන් පිළිසකර උනේ නැත. එනිසා ඔවුන් සිටි නගරය පොලොව උස්සා ආපහු පොලොවෙ ගැසුවාක් මෙන් සිදු කෙරිනි. එසේ ඔවුන් විනාශ විය.

- පාරාවෝ (ෆිර්අවුන්) සහ ඔහුව අනුගමනය කළ අය

(මුහුදු රළට යට වීමට සලස්වා ඔවුන්ව විනාශ කර දැමීය)

විනාශ වූ බවට සඳහන් වන තවත් ජාතියක් වන්නේ පාරාවෝ සහ ඔවුන් අනුගමනය කළ අයයි. පාරාවෝ යනු පුරාණ ඊජිප්තුවේ රජවරුන්ට දුන් නමකි. පාරාවෝවරු ඊශ්‍රායෙල් දරුවන්ට වහලුන් මෙන් දුෂ්කර රැකියා කිරීමට බල කළහ. ඊජිප්තුවේ ස්වදේශිකයන් වන පාරාවෝවරුන් සහ බහුදේවවාදීන් විසින් ඔවුන්ට කිරීමට බල කරන ලද දුෂ්කර රැකියාවලින් වෙහෙසට පත් වූ ඊශ්‍රායෙල් දරුවන්ට තම මුතුන් මිත්තන්ගේ දේශය වන කානාන් (පලස්තීනය) වෙත ආපසු යාමට අවශ්‍ය විය. කෙසේ වෙතත්, පාරාවෝගෙන් මිදීමට නොහැකි වූ නිසා ඔවුන්ට එය කළ නොහැකි විය. වරක්, අනාවැකි කියන්නෙකු පාරාවෝට (ෆිර්අවුන්ට) පැවසුවේ ඊශ්‍රායෙල් දරුවන්ගෙන් දරුවෙකු ඉපදීමට යන බවත්, දරුවා ෆිර්අවුන්ව නෙරපා හරින බවත්ය. ඉන්පසුව, ෆිර්අවුන් ඊශ්‍රායෙල් දරුවන්ගේ උපත ලැබූ සියලුම පිරිමි දරුවන් මරා දැමීමට පටන් ගත්තේය. මූසා (මෝසෙස්) උපත ලැබුවේ එම අවස්ථාවේදීය.

කුරානයට අනුව මූසා (عَلَيْهِ السَّلَامُ) පාරාවෝ (ෆිර්අවුන්) ගෙන් මිදුණු අතර ඔහුගේම මව විසින් ෆිර්අවුන්ගේ මාලිගාවේ හැදී වැඩුණි. මූසා ෆිර්අවුන් සහ ඔහුගේ අනුගාමිකයන්ව ඒකීයභාවය පිළිබඳ විශ්වාසයට කැඳවූ නමුත් ෆිර්අවුන් විශ්වාස කළේ නැත. ඔහු දෙවියෙකු බව පවා කියා සිටියේය. අවසානයේදී නබි මූසා(عَلَيْهِ السَّلَامُ)ව සහ ඔහුගේ විශ්වාසවන්තයන්ව මැරීමට පැමිණි ඔහු, ඔහුගේ සොල්දාදුවන් සමඟ මුහුදේ ගිලී මිය ගියේය.

- විනාශ කල නගරක් ලෙස ඉරම් නැමති නගරයක් ගැනද කුරානයෙහි සඳහන් වේ.
- කුරුළු සමූහයක් යවා ඇත් සේනාවක් විනාශ කල ඉතිහාසයක් ගැනද එහි සඳහන් වේ,
- මහා වැස්සක පෙර නිමිති පහල කර එය වැස්සක් බවට පත් නොකර අවසන් මොහොතේ යූනුස් නබිවරයාගේ සමාජය විනාශ නොකර අත් හැර දැමූ කතාවක් ද එහි සඳහන්,

- මූසා නබිවරයාගේ කාලයේ සමහර සමාජ වලට සාගත ඇති කර, පළඟැටියන් ගෙන් කරදර ඇතිකර, උකුණන් ගෙන් පීඩා කර ආදී ලෙස පීඩාවන් දී දඬුවම් කල බව ද එහි සඳහන් ය.

ඔවුන් පීඩාවට, විනාශයට ලක්වූ ප්‍රදේශ වෙත ගොස් එහි සත්‍යතාවය දැසින්ම බලා ගන්නා ලෙසටද තව දුරටත් සඳහන් කර ඇත.

ඉහත කුරානය තුලින් ගෙන දුන් උදාහරණ වලට අමතරව තව බොහෝ ජාතීන් විනාශ වූ බව එහි සඳහන්. ඔවුන් විනාශ වීමට ප්‍රධාන හේතුව වූයේ ඔවුන්ගේ ප්‍රතික්ෂේපය සහ නපුරු ක්‍රියාවන්ය.

මෑත කාලයේ ස්වභාවය කෙසේද? මිනිසුන් තම නිර්මාතෘ වන දෙවියන් විසින් එවන ලද පණිවිඩය නිසි පරිදි ග්‍රහණය කරගෙන නිසි පරිදි ජීවත් වෙනවද?

ඇත්ත වශයෙන්ම මිනිසුන්ගෙන් ඉතාම සුලු පිරිසක් හැර බහුතරයක් තනිකරම ඉන්නේ දෙවියන්වත් ඔහුගේ නබිවරයාවත් ප්‍රතික්ෂේප කරමින් සහ දෙවියන් විසින් මිනිසාට නොකල යුතු යැයි අවධාරණයෙන් අවධානය කල කටයුතු වල නියැලෙමිනි.

පහත කරුණු දෙස මදක් සිත යොමන්න.

තම තමන් ගේ විශ්වාසයන්ට අනුව තමන් අදහන දේ නිවැරදි යැයි සිතමින් මිනිසුන් ඉන්නවා. එහෙත් තමන්ගේ නිර්මාතෘ දෙවියන් නම්, මිනිසුන් තමන්ගෙ නිර්මාතෘ ගේ උපදෙස් පිළිපදිනවාද ?

දෙවියන්ගේ පණිවිඩ වලට අනුව ඔහු විසින් අනාගතවක්තෘවරුන් බොහෝමයක් එවා ඇත. ඒ ඒ සමාජ තමාගේ කාලයේ පහල වූ වක්තෘවරයා ව අනුගමනය කල යුතුය.

යුදෙව්වරුන්, ක්‍රිස්තියානිවරුන්, හින්දූන්, බෞද්ධයන්, ආගමක් අදහන්නේ නැති මිනිසුන් ආදී කිසිවෙක් දෙවියන් විසින් අවසන්වරට එවූ තමාගේ කාලයට වලංගු නබිවරයාවත් ඔහු ලොවට කියවා හෙලි කල අවසන් පණිවිඩය වන කුරානයත් අනුගමනය කරන්නේ නැත.

අවසන් පණිවිඩය නිසි ලෙස ලැබුනු මුස්ලිම් ජනයාත් තම යුතුකම් හරියට ඉටු කරනවාද? නැහැ, අද මුස්ලිම් සමාජයත් එකිනෙකා අතර බෙදීම් ඇතිකරගෙන, සමහරු ලෝකෙ උසම බිල්ඩිම හදන්න පොරකනවා දෙවියන්ගෙ පනිවිඩය නිසි ලෙස ලොවට බෙදා දීමේ තම පරම යුතුකමත්-වගකීමත් ටික ටික අමතක කරනව. බොහෝ මුස්ලිම් වරුන් ඌරුමස් නොකා ඉන්න දක්වන උනන්දුව-ප්‍රමුකතාවය තම අනිත් වගකීම් සහ යුතුකම් වලට ලබා දෙන්නෙ නෑ. සමහරු අල්ලාහ් පෙන්වා දුන් පරලොවට වඩා මෙලොව ස්වර්ගය කරගෙන ඉන්නවා, නිසි පරිදි සකාත් ගෙවන්නෙත් නෑ, නිසි පරිදි සලාත් කරන්නෙත් නෑ.

වංචා දූශන වලින් සමාජය පිරිලා. මිනිසුන් ට නියම දහම මොකක්ද කියලවත් හොයන්න බලන්න වෙලාවක් නෑ. මංමුලාවෙලා. විවිධ ආගම් අලංකාරවත් කරගෙන අදහනව. විවිධ දෙවිවරු ලෙස මනඃකල්පිත කරගත් දෑ නමදිනව. එක පැත්තකින් අභයාවකාශයට රොකට් යවන කෙනාම අනිත් පැත්ත හැරිල හරකට නමදිනව, පුරුශලින්ගයට නමදිනවා. සමහරු ජේසු තුමාව විශ්වයේ මැවුම්කරු කරගෙන ඔහුව දෙවියන් ලෙස නමදිනවා. සමහරු නිර්මාණ සංකල්පය ගැන දැනගැනීම පවා ප්‍රයෝජනවත් නැහැ කියමින් එය අතහැර එක එක ආකාරයේ සාස්තෘන් වහන්සේලාව අනුගමනය කරනවා.

ඉතිං, සොභාවික විපත්, යුද්ධ, කරදර ඉවරයක් නැහැ කියමින් පසු තැවෙනවා, අල්ලාහ් ඔවුන්ව විවිධ ආකාර වලින් දඬුවම්වලට යට කරනවා. සොභාවික විපත් ලෙසින් හෝ මිනිසුන් මිනිසුන්වම මරා ගනිමින් ඔවුන් ඔවුන්ටම අවාසනාව ලගා කර ගන්නවා.

දෙවියන්ගේ උපදෙස් පිලි නොපදිනා නිසා, බලන්න මෑත කාලයේ සිදුවී ඇති විනාශවල තරම. මිලියන ගනන් වලින් මිනිසුන් මිය යන්නෙ. වෙන මොකුත් නිසා නොවෙයි, මිනිසුන් සත්යට දුරයි. දෙවියන් ඉතිහාසයේ කල දේම වර්තමානයටත් වෙන්න ඉඩ හැර ඇති බවයි පෙනෙන්න තියෙන්නෙ.

**මෑත කාලයේ සිදුවූ මිනිස් සංහාරයන්ගේ ලැයිස්තු 2 ක් අමුණා ඇත. බලන්න එම මිය ගිය සමාජ තම නිර්මාතෘගේ උපදෙස්වලට කොතරම් දුරින් සිටි අයද බව.**

## මෑත කාලයේ සොභාවික විපත් හේතුවෙන් සිදුවූ මිනිස් මරණ

| YEAR | TIME /PERIOD | DISASTER NAME | DEATH QTY (maxixmum) | LOCATION |
|---|---|---|---|---|
| භූමිකම්පාව | | | | |
| 1976 | 28-Jul | Tangshan earthquake | 655000 | Tangshan/ China |
| 1139 | September 30, | Ganja earthquake | 300000 | Azerbaijan |
| 526 | May 526 | Antioch earthquake | 300000 | ByzantineEmpire(now Turkey) |
| 2010 | 12-Jan | Haiti earthquake | 300000 | Haiti |
| 1920 | | Haiyuan earthquake | 273407 | Ningxia, Republic of China |
| 1303 | September 17, | Hongdong earthq; | 270000 | Mongol-Empire.(China) |
| 115 | December 13 | Antioch earthquake | 260000 | Roman Empire (now Turkey) |
| 1138 | Oct 11, 1138 | Aleppo earthquake | 230000 | Zengid dynasty (now Syria) |
| 2004 | 26-Dec | Indian Ocean earthq; | 227898 | Indonesia |
| 856 | Dec22, 0856 | Damghan earthquake | 200000 | Abbasid.-Caliphate(Iran) |
| 1138 | Octr 11, 1138 | Aleppo earthquake | 230,000 | Zengid dynasty (now Syria) |
| 1923 | 1-Sep-25 | Great Kantō earthq; | 140000 | Japan |
| 1948 | 6-Oct | Ashgabat earthquake | 110000 | Soviet Union, Iran |
| 2023 | 6-Feb | Turkey–Syria earthq; | 62000 | Turkey, Syriya |
| 1939 | 27-Dec | Erzincan earthquake | 33000 | Turkey |
| 1907 | 21-Oct | Qaratog earthquake | 15000 | Uzbekistan |
| 1934 | 15-Jan | Nepal–India earthq; | 12000 | India, Nepal |
| 2015 | 25-Apr | Nepal earthquake | 8964 | India |
| 1949 | 10-Jul | Khait earthquake | 7200 | Tajikistan |
| 1995 | 17-Jan | Great Hanshin earthq | 6434 | Japan |
| 1943 | 27-Nov | Tosya–Ladik earthq; | 5000 | Turkey |
| 1945 | November 28/ | Balochistan earthq; | 4000 | Pakistan |
| 1903 | 45775 | Manzikert earthq; | 3500 | Turkey |
| 1982 | 13-Dec-25 | North Yemen earthq; | 2800 | Yemen |
| 1914 | 4-Oct-25 | Burdur earthquake | 2344 | Turkey |
| 1952 | 4-Nov-25 | Kurilsk earthquake | 2336 | Russia |
| 1983 | 45960 | Erzurum earthquake | 1342 | Turkey |
| 1941 | 11-Jan-25 | Jabal Razih earthq; | 1200 | Yemen |
| 1940 | November 10- | Vrancea earthquake | 1000 | Romania |

| | | | | |
|---|---|---|---|---|
| භූමිකම්පාව සහ සුනාමිය | | | | |
| 2004 | 26-Dec | Indian Ocean earthquake and tsunami | 227,000 | Indonesia, Sri Lanka, India, Thailand, Maldives, Somalia |
| 2011 | 11-Mar | Tōhoku earthquake and tsunami | 19,749 | Japan |
| 2018 | 28-Sep | Sulawesi earthquake and tsunami | 4,340 | Indonesia |
| 1992 | 12-Dec | Flores earthquake and tsunami | 2,500 | Indonesia |
| සුනාමිය | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 2004 | December 26, | Indian Ocean earthquake and Tsu; | 227,898 | Indian Ocean |
| 4000BC | 2nd Millennium BC | 400BC Minoan eruption | 100000 | Greece |
| 1908 | December 28, | Messina earthquake | 80000 | Italy |
| 365 | July 21, 0365 | Crete earthquake | 50,000 | Greece |
| 1775 | November 1, | Lisbon earthquake | 50,000 | Protugal |
| 1883 | August 27, | Eruption of Krakatoa | 36417 | Indonesia |
| 1498 | September 20, | Meiō earthquake | 31,000 | Japan |
| 1707 | October 28, | Hōei earthquake | 30000 | X |
| 1896 | June 15, | Sanriku earthquake | 27,122 | X |
| 1868 | Augt 13, 1868 | Arica earthquake | 25,674 | Chili |
| 1792 | May 21, | Unzen earthquake and tsunami | 15,000 | Japan |
| සාගතය/ ආහාර හිඟ | | | | |
| 1961 | 1959–1961 | Great Chinese Famine | 40,000,000 | China |
| 1907 | 1906–1907 | Chinese famine | 25,000,000 | Qing China |
| 1879 | 1876–1879 | Northern Chinese Famine | 13000000 | China |
| 1793 | 1783–1793 | Chalisa famine & Doji bara famine | 11,000,000 | North India / India |
| 1773 | 1769–1773 | Great Bengal famine | 10,000,000 | British company India |
| 1933 | 1932–1933 | Soviet famine | 8,000,000 | Soviet Union |
| 1317 | 1315–1317 | Great European Famine | 7,500,000 | Europe |
| 1632 | 1630–1632 | Deccan famine | 7400000 | India |
| 1876 | 1876–1878 | Indian Great Famine | 5500000 | British India |
| ගංවතුර | | | | |
| 1931 | July – Nov | China floods | 4000000 | China |
| 1887 | September | Yellow River flood | 2,000,000 | North sea |
| 1975 | 1975 | Banqiao Dam failure | 230,000 | X |
| 1935 | 45844 | Yangtze flood | 145,000 | China |
| 1935 | 1935 | Yangtze flood | 145000 | X |
| 1911 | 25-Mar | Yangtze River flood | 100,000 | China |
| 1530 | 9-Mar | St. Felix's flood, storm surge | 100,000 | Holy Roman Empire |
| 1099 | 1099 | The flood | 100,000 | Netherlands & England |
| 1971 | 1-Aug | Hanoi and Red River Delta flood | 100,000 | North Vietnam |
| 1287 | 1287 | St. Lucia's flood, storm surge | 80000 | Holy Roman Empire |
| 1212 | 1212 | North Sea flood, storm surge | 60000 | North sea |
| 1954 | June – Sep | Yangtze floods | 33,000 | China |
| 1999 | Dec 14 – 16 | Vargas tragedy | 30000 | Venezuela |

| | | | | |
|---|---|---|---|---|
| 2020 | May – October | South Asian floods | 6511 | Afghan;,B;desh,India, Nepal, Pakistan, Sri Lanka |
| 1951 | 45918 | Manchuria flood | 4,800 | China |
| 1989 | 45865 | Sichuan flood | 3,814.00 | China |
| 1953 | January 31–February 1 | North Sea flood | 2,551 | Netherlands, Belgium, England, Scotland |
| 2024 | 6 Mar - 4 Sep | Flood | 1084 | Afghanistan, Pakistan |
| 1924 | July | Great flood of 99 | 1,000 | India |
| 2000 | Feb – March | Mozambique flood | 800 | Mozambique |
| 1938 | July | Hanshin flood | 715 | Japan |
| 1921 | Sep 7 –11 | San Antonio floods | 215 | United States |
| නාය යෑම | | | | |
| 1786 | 20-Nov | Dadu River landslide dam Luding earthquake | 100,000 | China |
| 1718 | | Landslides triggered - Tongwei–Gansu earthquake. | 70,001 | China |
| 1999 | 1999 | Vargas tragedy. | 30,000 | Veneuzuela |
| 1949 | 1949 | Khait landslide-] Tajikistan | 28000 | Khait Island |
| 1970 | | Huascarán avalanche | 22,000 | Peru |
| 1916 | 1916 | White Friday avalanches | 10,000 | Italy |
| 1941 | | Huaraz avalanche | 6,000 | Peru |
| 1962 | 1962 | Huascarán avalanche | 4000 | |
| 1310 | 1310 | Western Hubei landslide | 3466 | China |
| 1933 | | Diexi landslides | 3429 | Diexi Island |
| 2014 | | Badakhshan mudslides | 2,700 | Afghanistan |
| වැව් ජලය පුපුරා යාම | | | | |
| 1986 | August 21, | Lake Nyos disaster / Limnic eruption | 1,744 | Cameroon |
| උණුසුම් සුලඟ | | | | |
| 2003 | July – August | European heat wave | 72,000 | Europe |
| 2022 | June 12 – September 12 | European heat waves | 61,600 | Europe |
| 2010 | 2010 | Russian heat wave | 56000 | Russia |
| 1911 | June–August | France heat wave | 41,072 | France |
| 1988 | 1988-1990 | North American drought | 10,000 | United States |
| 1901 | June–July | Eastern United States heat wave | 9,500 | United States |
| 1936 | June – September | North American heat wave | 5,000 | United States, Canada |
| 2019 | June – July | European heat waves | 3,951 | Europe |
| 2006 | | European heat wave | 3418 | Europe |

| | | | | |
|---|---|---|---|---|
| 1998 | 1998 | Indian heat wave | 2541 | India |
| 2015 | 2015 | Indian heat wave | 2,500 | India |
| 2016 | April – May | Indian heat wave | 1,111 | India |
| ටොනේඩෝ | | | | |
| 1989 | 1989 | The Daulatpur–Saturia tornado | 1300 | Manikganj, Bangladesh |
| 1925 | 1925 | The Tri-State tornado outbreak | 751 | United States (Missouri–Illinois–Indiana) |
| 1973 | 1973 | Dhaka tornado | 681 | Bangladesh |
| 1969 | 1969 | East Pakistan tornado | 660.00 | East Pakistan (now Bangladesh) |
| 1556 | 1551 or 1556 | The Valletta, Malta tornado | 600 | Malta |
| 1851 | 1851 | Sicily tornadoes | 500 | Sicily, Two Sicilies (now Italy) |
| 1984 | 1984 | Soviet Union tornado outbreak | 400 | Soviet Union |
| 1840 | 1840 | The Great Natchez Tornado | 317 | United.States-(Mississippi–Louisiana) |
| සුළි කුණාටුව | | | | |
| 1970 | November 13, | Bhola cyclone | 500,000 | East Pakistan (now Bangladesh) |
| 1970 | | Bhola cyclone | 500,000 | India, East Pakistan (now Bangladesh) |
| 1970 | November 13, | Bhola cyclone | 500000 | East Pakistan (now Bangladesh) |
| 1839 | 25-Nov | Coringa cyclone | 300000 | Andhra Pradesh, India |
| 1737 | Octobar | Calcutta cyclone | 300,000 | Bengal, India |
| 1839 | November 25, | Coringa cyclone[9] | 300,000 | British India (now India) |
| 1737 | October 11, 1737 | Calcutta cyclone | 300000 | |
| 1975 | | Banqiao Dam Failure | 240,000 | China |
| 1975 | | Super Typhoon Nina—Dam failure | 229000 | China |
| 1912 | | China typhoon | 220000 | China |
| 1912 | August 29, | China typhoon | 220000 | China |
| 1876 | October 31, | Great Backerganj Cyclone | 200000 | British Raj (now Bangladesh) |
| 1991 | April 24 – 30 | Bangladesh cyclone | 138866 | Bangladesh |
| 1991 | | Bangladesh cyclone | 138866 | Bangladesh |
| 2008 | April 27 – May 3 | Cyclone Nargis | 138,373 | Myanmar |
| 2008 | | Cyclone Nargis | 138,373 | Myanmar |
| 1922 | July 27 –August 3 | Shantou typhoon | 100,000 | Philippines, China |
| 1780 | | July typhoon | 100,000 | Philippines |
| 1942 | October 14 – 18 | West Bengal cyclone | 61,000 | India |
| 1864 | October 5, 1864 | Calcutta cyclone | 60,000 | India |
| 1962 | October 19 – 31 | Tropical Storm Harriet | 50,935 | Thailand, East Pakistan (now Bangladesh) |

| | | | | |
|---|---|---|---|---|
| 1977 | | Andhra Pradesh Cyc | 50000 | India |
| 1965 | May 11 & June 2 | Bengal cyclones | 47,000 | East Pakistan (now Bangladesh) |
| 1963 | | Extremely Severe Cyclonic Storm | 22000 | East Pakistan (now Bangladesh) |
| 2007 | Nov 11 – 16 | Cyclone Sidr | 15,000 | Bangladesh, India |
| 1906 | | Hong Kong typhoon | 15,000 | Hong Kong,China |
| 1960 | | Cyclonic Storm Ten | 14,174 | East Pakistan (now Bangladesh) |
| 1900 | | Galveston hurricane | 12000 | United States |
| 1961 | May 6 – 9 | Cyclone Winnie | 11,468 | East Pakistan (now Bangladesh) |
| 1998 | Oct 22 – Nov9 | Hurricane Mitch | 11,374 | Honduras, Nicaragua, El Salvador, Guatemal |
| 1937 | | Great Hong Kong typ | 11,021 | China |
| 1967 | | Paradip cyclone | 10000 | India |
| 1974 | September 18 – 20 | Hurricane Fifi–Orlene | 8,210 | Honduras, Nicaragua, , Guatemala, Belize, Mexico |
| 1930 | | San Zenón hurricane | 8,000 | Dominican Republic |
| 1964 | November 4 – 11 | Tropical Storm Joan | 7,000 | Vietnam |
| 2013 | November 8 – 10 | Typhoon Haiyan | 6340 | Philippines, Vietnam, China |
| 2013 | November 8 – 10 | Typhoon Haiyan | 6340 | Philippines, Vietnam, China |
| 1959 | | Typhoon Vera | 5,098 | Japan |
| 1956 | | Typhoon Wanda | 4,935 | China |
| 1928 | Sep 12 –21 | Okeechobee hurricane | 4112 | United States, Puerto Rico, Guadeloupe, Bahamas, Dominica, |
| 1997 | November 1 – 9 | Tropical Storm Linda | 3,123 | Vietnam, Thailand |
| 1932 | | Cuba hurricane | 3103 | Cayman Islands, Cuba |
| 1994 | | Typhoon Fred | 3,063 | China, Taiwan |
| 2017 | September 19 – 21 | Hurricane Maria | 3,059 | Puerto Rico, Dominica |
| 1979 | August 15 – Sep | Hurricane David | 2078 | Dominican Republic, Dominica |
| 2012 | December 4 – 5 | Typhoon Bopha | 1,901 | Philippines |
| 1984 | August 26 – Sept 6 | Typhoon Ike | 1474 | Philippines |
| 1958 | | Typhoon Ida | 1269 | Japan |
| 1996 | November 4 – 7 | Andhra Pradesh cyclone | 1,077 | India |
| 1947 | | Typhoon Kathleen | 1,077 | Japan |
| 1955 | September 22 – 30 | Hurricane Janet | 1,023 | Lesser Antilles, Mexico |
| 1926 | October 14 –28 | Havana–Bermuda hurricane | 709 | Cuba, United States, Bahamas, Bermuda |
| අහිතකර වෛයිරස | | | | |
| 1353 | 1353 | Yersinia pestis – (Plague)/ Black Death | 75–200 million | Mexico |
| 1920 | 1918–1920 | Spanish flu | 100 million | Worldwide |

| | | | | |
|---|---|---|---|---|
| 2023 | 2019–2023 | COVID-19 pandemic | 80 million | Worldwide |
| 1520 | 1519–1520 | 1520 Mexico smallpox epidemic | 5–8 million | Mexico |
| 1548 | 1545–1548 | Cocoliztli Epidemic of | 5–15 million | Roman Empire |
| 190 | 165–190) | Antonine Plague | 5–10 million | Russia |
| 1981 | 1981–present | HIV/AIDS pandemic | 43 million | -(as of 2024) Worldwide |
| 542 | 541–542 | Plague of Justinian | 30–50 million | Europe and West Asia |
| 1922 | 1918–1922 | Russia typhus epidemic | 2.5 million | Russia |
| 1960 | 1855–1960 | Third plague pandemic | 12–15 million | Worldwide |
| ගිනිකඳු පිපිරීමක් | | | | |
| 1815 | April 10, | Eruption of Mount Tambora (see also Year Without a Sum) | 71,000 | Indonesia |
| 1883 | August 27, | Eruption of Krakatoa | 36,000 | |
| 1902 | | Eruption of Mount Pelée | 30,000 | Martinique |
| 1902 | April–August | Eruption of Mount Pelée | 29,000 | Martinique |
| 1985 | | Armero tragedy / Volcanic eruption | 23,000 | Colombia |
| 1985 | November 13, | Armero tragedy | 23000 | Colombia |
| 79AD | | Eruption of Mount Vesuvius in 79 AD | 13000 | Italy |
| 1586 | | Kelud eruption | 10,000 | Indonesia |
| 1902 | October 24, | Santa Maria eruption | 6,000 | Guatemala |
| 1919 | | Kelud mudflow | 5,000 | Indonesia |
| 1919 | May 19, | Kelud mudflow | 5,000 | Indonesia |
| 1822 | | Galunggung eruption | 4011 | |
| ලැව් ගිනි | | | | |
| 1871 | October 8, | Peshtigo fire | 2500 | Wisconsin, United States |
| 1936 | August 3, | Kursha-2 fire | 1000 | Soviet Union |
| 1894 | September | Great Hinckley Fire | 476 | |
| 1918 | October 12, | Cloquet fire | 453 | Minnesota,USA |
| 1825 | October 7, | Miramichi fire | 300 | Canada |
| 1881 | September 5, | Thumb Fire | 282 | Michigan,United States |
| 1997 | September | Indonesian forest fires | 240 | Sumatra and Kalimantan, Indonesia |
| 1916 | July 29, | Matheson Fire | 223 | Ontario, Canada |
| 1987 | | Black Dragon fire | 211 | China & Soviet Union |
| 2009 | February 7, | Black Saturday bushfires/Wildfi | 173 | Australia |
| ශීත කුණාටු | | | | |
| 1916 | | White Friday avalanches | 10000 | Italy |
| 1972 | | Iran blizzard Winter storms | 4,000 | Iran |
| 1719 | | Carolean Death March Winter storms | 3,000 | Norway |
| 2021 | | North American winter storm | 978 | United States and Mexico |
| 2008 | | Afghanistan blizzard / Winter storms | 926 | Afghanistan |

| | | | | |
|---|---|---|---|---|
| 1888 | | Great Blizzard Winter storms | 400 | United States |
| 1950 | | Great Appalachian Storm | 353 | |
| 1993 | | Storm of the Century | 318 | |
| 1960 | | December nor'easter | 286 | United States |
| 1913 | | Great Lakes Storm | 250 | United States and Canada 2021 |
| 1888 | | Schoolhouse Blizzard | 235 | United States |

---

## මෑත කාලයේ මිනිස් යුද්ධ නිසා සිදුවූ මිනිස් මරණ

| TIME PERIOD | Minimum (Millions) | Maximum (Millions) | NAME | DESCRIPTION |
|---|---|---|---|---|
| 1939–1945 | 70.00 | 85.00 | World War II | Allied Powers vs. Axis Powers. Global |
| 1207–1405 | 40.00 | 60.00 | Mongol invasions and conquests | Mongol Empire vs. various states in Eurasia. French Republic, later French Empire, vs. Coalition forces |
| 754–763 | 13.00 | 36.00 | An Lushan rebellion | Tang Dynasty and Uyghur Khaganate vs. Yan Dynasty |
| 220–280 | 36.00 | 40.00 | Three Kingdoms War | Spanish Empire vs. Inca Empire |
| 1850–1864 | 20.00 | 30.00 | Taiping Rebellion | Qing Dynasty vs. Taiping Heavenly Kingdom |
| 1914–1918 | 15.00 | 20.00 | World War I | Allied Powers vs. Central Powers |
| 1618–1683 | | 25.00 | Manchu Conquest of China | |
| 1369–1405 | 7.00 | 20.00 | Conquests of Timur | Global |
| 1917–1922 | 7.00 | 12.00 | Russian Civil War | |
| 1618–1648 | 4.00 | 12.00 | Thirty Years' War | Multiple sides; Bolsheviks, Anti-Bolshevik left, White Movement, Allied and Central Intervention, as well as various separatists |
| 1519–1530 | | 10.50 | | Spanish conquest of Mexico |
| 1533–1572 | | 10.00 | Spanish conquest of the Inca Empire | Indian subcontinent |
| 1927–1949 | 4.00 | 9.00 | Chinese Civil War | Timurid Empire vs. various states in Asia |
| 1095–1291 | 1.00 | 9.00 | Crusades | Originally Byzantine Empire vs. Seljuk Empire, but evolved into Christians vs. Muslims |
| 718–1492 | | 7.00 | Reconquista | |
| 1792–1815 | 5.00 | 7.00 | French Revolutionary and Napoleonic Wars | China |
| 1878–1904 | | 6.00 | Conquests of Menelik II | Multiple sides |
| 1998–2003 | 3.00 | 5.40 | Second Congo War | Multiple sides |
| 1525–1540 | | 5.25 | | Spanish conquest of New Granada |
| 1680–1707 | 4.60 | 5.00 | Deccan wars | Mughal Empire vs. Maratha Confederacy |
| 1967–1970 | 3.04 | 4.10 | Nigerian Civil War | Nigeria vs. Biafra |

| | | | | |
|---|---|---|---|---|
| 1562–1598 | 2.00 | 4.00 | French Wars of Religion | Spanish and Portuguese Christians vs. Spanish and Portuguese Muslims |
| 1950–1953 | 2.50 | 3.50 | Korean War | North Korea and allies vs. South Korea and allies |
| 1955–1975 | 1.10 | 3.40 | Vietnam War | North Vietnam and allies vs. South Vietnam and allies |
| 1337–1453 | 2.30 | 3.30 | Hundred Years' War | House of Valois vs. House of Plantagenet |
| 1978–present | 1.17 | 3.00 | Multiple sides; Afghan mujahideen, later Islamic Emirate of Afghanistan, United Tajik Opposition vs. Soviet Union, | Democratic Republic of Afghanistan, Northern Alliance, Tajikistan, and the United States-led coalition |
| 1300–1310 | 0.50 | 3.00 | Delhi Conquest of North India | Delhi Sultanate vs. North Indian States |
| 1971 | 0.30 | 3.00 | Bangladesh Liberation War | India and Provisional Government of Bangladesh vs. Pakistan |
| 1910–1920 | 1.70 | 2.70 | Mexican Revolution | Anti-government vs. Pro-government |
| 1556–1605 | 1.00 | 2.00 | Akbar's Conquest of North India | Korean Peninsula |
| 1983–2005 | 1.00 | 2.00 | Second Sudanese Civil War | Indochina |
| 1771-1802 | 1.00 | 2.00 | Tây Sơn wars | Western Europe |
| 1961–1991 | 1.75 | 2.00 | Ethiopian Civil War and Eritrean War of Independence | EPRDF, later EPLF vs. Derg and People's Democratic Republic of Ethiopia |
| 1763–1864 | 1.50 | 2.00 | Russo-Circassian War and Caucasian War | Circassian Confederation, Principality of Abkhazia, and Caucasian Imamate vs. Russian Empire |
| 1857–1858 | 0.80 | 2.00 | Indian Rebellion of 1857 | United Kingdom and allies vs. Indian rebels and allies |
| 264 BCE–146 BCE | 1.25 | 1.85 | Punic Wars/ Roman Republic vs. Ancient Carthage | Southern Europe, the Mediterranean Sea, and North Africa |
| 1912–1913 | 0.75 | 1.77 | Balkan Wars | Ottoman Empire vs. Bulgaria, Serbia, Greece, and Montenegro; later Bulgaria vs. Serbia, Greece, Montenegro, and Romania |
| 1954–1962 | 0.40 | 1.60 | Algerian War | France vs. Separatists National Liberation Front, Algerian National Movement, and Algerian Communist Party |
| 1830–1903 | 0.98 | 1.48 | French conquest of Algeria | France vs. Regency of Algiers, Emirate of Abdelkader, Kingdom of Beni Abbas, and allies |
| 58 -50 BCE | | 1.47 | Gallic Wars | Roman Empire vs. Gauls |
| 66–135 | 0.35 | 1.40 | Jewish-Roman wars | Roman Empire vs. Judean provisional government |
| 1701–1714 | 0.40 | 1.25 | War of the Spanish Succession | Habsburg Spain, Great Britain, Holy Roman Empire, and allies vs. Bourboun Spain, Kingdom of France, and allies |

| | | | | |
|---|---|---|---|---|
| 1870–1871 | | 1.15 | Franco-Prussian War | Tây Sơn dynasty vs. Nguyễn lords, Kingdom of Cambodia, Rattanakosin Kingdom, and Kingdom of France |
| 1592–1598 | | 1.00 | | Japanese invasions of Korea |
| 1856–1873 | | 1.00 | Panthay Rebellion | Balkans |
| 1756–1763 | | 1.00 | Seven Years' War | North Africa |
| 1861–1865 | 0.60 | 1.00 | American Civil War | United States vs. Confederate States |
| 1955–1972 | 0.50 | 1.00 | First Sudanese Civil War | Democratic Republic of the Sudan vs. Sudan Defence Force |
| 1946–1954 | 0.40 | 0.84 | First Indochina War | Viet Minh, Pathet Lao, and Khmer Issarak vs. French Union |
| 1993–2005 | 0.55 | 0.80 | Burundian Civil War | Burundi vs. Ethnic Hutu vs. Tutsi Militants |
| 1740–1748 | | 0.75 | War of Austrian Succession | Global |
| 1688–1697 | | 0.68 | Nine Years' War | Second French Empire, later Third French Republic vs. North German Confederation |
| 1853–1856 | 0.61 | 0.67 | Crimean War | Russian Empire vs. Ottoman Empire, France and United Kingdom |
| 475 BCE–221 BCE | | 0.65 | Warring States period and Qin's wars of unification | Multiple sides |
| 2011,22 Pre | 0.58 | 0.61 | | Levant. Syrian civil war- Multiple sides |
| 1362–1443 | | 0.60 | North America. | Bahmani–Vijayanagar Wars |
| 1810–1821 | | 0.60 | | Mexican War of Independence |
| 1919–1923 | 0.40 | 0.60 | Turkish War of Independence | Turkey vs. Greece, France, United Kingdom, and Armenia |
| 2020–2022 | 0.16 | 0.60 | Tigray War | Ethiopia and Eritrea vs. Tigray People's Liberation Front and allies |
| 1554–1721 | | 0.57 | Northern Wars | Rwanda and Burundi |
| 113 BCE–774 | | 0.54 | Roman-Germanic wars | Roman Republic, later Roman Empire and Byzantine Empire vs. Germanic tribes |
| 1980–1988 | 0.45 | 0.50 | Iran-Iraq War | Islamic Republic of Iran vs. Iraqi Republic |
| 1864–1870 | 0.15 | 0.50 | Paraguayan War | Empire of Brazil, Argentina, and Uruguay vs. Paraguay |
| 1566–1648 | 0.10 | 0.50 | Eighty Years' War | Spanish Empire vs. SeparatistDutchRepublic |
| 1962- Press | 0.10 | 0.50 | New Guinea. | Indonesia vs. Free Papua Movement |
| 1978-1986 | 0.10 | 0.50 | Uganda-Tanzania War and Ugandan Bush War | Uganda vs. Tanzania, National Liberation Front, and National Resistance Movement |
| 1936–1939 | 0.35 | 0.47 | Spanish Civil War | Nationalists vs. Republicans |
| 1964–present | | 0.45 | Colombian conflict | Colombia vs. Colombian and Mexican drug cartels and paramilitaries vs. FARC |
| 1485–1699 | | 0.43 | Polish–Ottoman Wars | Mexican patriots vs. Spanish Empire |
| 280 BCE–30 BCE | | 0.42 | Roman–Greek wars | Roman Republic vs. Greek states, later Greek rebels and Ptolemaic Kingdom |
| 1810–1825 | | 0.40 | South America- | Colombian War of Independence |
| 1741–1751 | | 0.40 | | Low Countries. Maratha invasions of Bengal |
| 1975–1991 | | 0.40 | Third Indochina War | |
| 2003–2020 | | 0.40 | War in Darfur | Uganda and Tanzania |
| 1075–1077 | 0.25 | 0.40 | Song Dynasty vs. Đại Việt | Indochina |

| | | | | |
|---|---|---|---|---|
| 1868–1898 | | 0.39 | Cuban Wars of Independence and Spanish–American War | Iberian Peninsula |
| 2013–2020 | | 0.38 | South Sudanese Civil War | Colombia |
| 2014–present | 0.15 | 0.37 | Yemeni civil war- Multiple sides | Indian subcontinent |
| 2009–present | 0.03 | 0.35 | Multinational Joint Task Force vs. Boko Haram | Nigeria |
| 1672–1678 | | 0.34 | Franco-Dutch War | Maratha Confederacy vs. Bengal Nawab |
| 1415–1718 | | 0.34 | Ottoman–Venetian wars | Democratic Kampuchea, China, and Thailand vs. Vietnam, Laos, and People's Republic of Kampuchea vs. Communist Party of Thailand |
| 1989–2003 | 0.30 | 0.32 | Liberian Civil Wars and Sierra Leone Civil War | Liberian government, Revolutionary United Front vs. National Patriotic Front of Liberia, Liberians United for Reconciliation and Democracy, Movement for Democracy in Liberia, Sierra Leone |
| 1833–1876 | | 0.30 | | Carlist Wars |
| 598–614 | | 0.30 | Goguryeo–Sui War | United States, Cuban Revolutionaries, and Philippine Revolutionaries vs. Spanish Emp |
| 2003–Pres | 0.27 | 0.30 | | Iraqi conflict- Multiple sides |
| 1990–1991 | 0.17 | 0.30 | Gulf War | Kuwait and the United States-led coalition vs. Iraq |
| 43–84 | 0.13 | 0.29 | Roman conquest of Britain | Roman Empire vs. Celtic Britons |
| 2014–present | 0.12 | 0.28 | Russia vs. Ukraine | Eastern Europe and the Black Sea |
| 1899–1913 | 0.21 | 0.27 | Philippine–American War | United States vs. Philippine Republic, later Tagalog Republic, Sultanate of Sulu and Sultanate of Maguindanao |
| 1547–1855 | | 0.26 | Burmese–Siamese wars | Yemen |
| 1926–1929 | | 0.25 | Cristero War | Kingdom of France vs. Dutch Republic |
| 1996–1997 | | 0.25 | First Congo War | Ottoman Empire vs. Holy League |
| 262-261 BCE | | 0.25 | Kalinga War | Maurya Empire vs. Kalinga |
| 1821–1829 | | 0.24 | Greek War of Independence | Carlists vs. Liberals and Republicans |
| 1948–present | | 0.23 | Myanmar vs. State Administration Council | National Unity Government of Myanmar |
| 1775–1783 | 0.18 | 0.23 | American Revolution | American Patriots vs. Great Britain |
| 1994–2009 | 0.08 | 0.23 | Chechen conflict | Russia vs. Separatist Chechen Re,of Ichkeria |
| 499 -49 BCE | | 0.20 | Greco-Persian Wars | Greek city-states vs. Achaemenid Empire |
| 1948 | | 0.20 | | Great Britain- Indian Invasion of Hyderabad |
| 1948–1958 | | 0.20 | La Violencia | |
| 1960–1996 | 0.14 | 0.20 | Guatemalan Civil War | Government of Guatemala vs. Guatemalan National Revolutionary Unity |
| 1962–1970 | 0.10 | 0.20 | North Yemen civil war | Kingdom of Yemen vs. Yemen ArabRepublic |

| | | | | |
|---|---|---|---|---|
| 1911–1934 | 0.07 | 0.20 | Italo-Senussi Wars | Kingdom of Italy vs. Senusiyya, Ottoman Empire |
| 1961–1974 | 0.14 | 0.18 | Portuguese Colonial War | Estado Novo vs. MPLA, PAIGC, FNLA, among others |
| 1899–1902 | 0.10 | 0.18 | Thousand Days' War | Colombian Conservative Party vs. Colombian Liberal Party |
| 1983[f]–2009 | 0.08 | 0.17 | Sri Lankan gov; vs. Separatist Liberation Tigers of Tamil | (Sri Lankan Civil War) |
| 1904–1905 | 0.12 | 0.16 | Empire of Japan vs. Russian Empire | East Asia. (Russo-Japanese War) |
| 1992–2002 | | 0.15 | Algerian Civil War | Ottoman Empire vs. Separatist First Hellenic Republic |
| 1948-present | | 0.15 | Arab-Israeli conflict | Israel vs. Arab League, Iran, Hezbollah, Hamas, and the Houthi movement |
| 2023–present | | 0.15 | Sudan and allies vs. Rapid Support Forces and allies | (Sudanese civil war (2023–present) |
| 1975–1990 | 0.12 | 0.15 | Lebanese Civil War | Multiple sides |
| 1946–1949 | 0.08 | 0.15 | Greek Civil War | Kingdom of Greece vs. Provisional Democratic Government |
| 1991–2001 | 0.13 | 0.14 | Separatist forces & NATO vs. | -Socialist Federal Republic of Yugoslavia, |
| 1593–1603 | | 0.13 | Irish Nine Year's War | Central America |
| 1932–1935 | 0.08 | 0.13 | Chaco War | Paraguay vs. Bolivia |
| 336 BCE–323 BCE | | 0.10 | Wars of Alexander the Great | Macedonian Empire vs. Achaemenid Empire among others |
| 1960–1965 | | 0.10 | Congo Crisis | |
| 1859–1863 | | 0.10 | Federal War | Balkans and Peloponnese Peninsula |
| 1794–1804 | | 0.10 | White Lotus Rebellion | Balkans |
| | **TOTAL (Max)** | **501.81** | **500,000,000** | |

---

# <u>ලෝක අවසානය සහ විනිශ්චය දිනය.</u>

## ලෝක අවසානය සම්බන්ධව

පෘථිවියට ආරම්භයක් මෙන්ම අවසානයක් තිබෙන බව විද්‍යාඥයින් පවා පිළිගනිති. එහෙත් එවැනි දෙයක් සිදු වන්නේ කෙසේද යන්න කිසිවෙකුට නිවැරදිව යමක් ප්‍රකාශ කල නොහැකිය. එම නිසා විද්‍යාඥයින් ඒ සඳහා නොයෙකුත් මත ප්‍රකාශ කර තිබේ. එහෙත් දෙවියන් පහල කල සෑම ප්‍රධාන

ආගමකම ලෝක විනාශයක් ගැන සඳහන් කොට ඇත. ඉස්ලාම් දහමේ අනෙක් ආගම්වල මෙන්ම ලෝක විනාශයට පෙර සිදුවන ඇතැම් කරුණු ගැන පූර්ව දැනුම් දීමක් සිදු කොට ඇත. ඒවායින් බොහොමයක් දැනටමත් සිදු වී හමාරය. මෙම සිදුවීම් වලට පසු විශාල සිදුවීම් දහයක් ඇතිවීමට නියමිතය. ඉන් පසු ලෝකය විනාශ වීමට නියමිතය.

ලෝක අවසානයට පෙර සිදුවීමට නියමිත ඇතැම් සුළු සිදුවීම් සහ මහා පරිමාන සිදුවීම් ගැන මොහම්මද් නබි (සල්ලල්ලාහු අලෙහිවසල්ලම්) තුමා පෙර නිමිති සඳහන් කොට ඇත.

සුළු සිදුවීම් අවසාන වන විට නබිතුමාගේ පරම්පරාවට හිමිකම් කියන මහදි තුමා පැමිණීමට නියමිතය. එතුමා ජීවතුන් අතර සිටින අතර වාරයේදී ජේසු තුමා ද නැවත පැමිණීමට නියමිතය. ඒ වන විටත් දජ්ජාල් (Anti Christ) මෙලොවට පැමිණ සිටිනු ඇත. ඔහු භූමියේ විශාල විනාශයන් සිදු කරන බව සඳහන් වේ.

දජ්ජාල් (Anti Christ) ගැන දෙවියන් පහළ කල සෑම ආගමකම අනතුරු හඟවා තිබේ. ඔහු සිරියාව සහ ඉරාකය අතර පිහිටි කලාල යන ස්ථානයෙන් මතුවීමට නියමිතය.ඔහුගේ හිසකෙස් රැලිවැටී ඇති අතර ඇස් ඉදිරියට නෙරා තිබෙනු ඇත. තවද ඔහුගේ එක් ඇසක් අන්ද වේ. ඔහු දින හතලික් පමණ ජීවතුන් අතර සිටිමින් විශාල විනාශයක් කරන බව නබිතුමා පවසා ඇත. ඔහුගේ නළලේ 'කාෆිර්' යැයි සඳහන් කොට ඇති බව හදිස් වල සඳහන් වේ. දජ්ජාල්ට ඇතැම් හාස්කම් කිරීමට දෙවියන් හැකියාව ලබා දී තිබේ. එම හේතුවෙන් ඔහු නියගයෙන් පිඩා විඳිමින් සිටින ජනතාව සඳහා අහසට නියෝග කිරීමෙන් වරුසාව ලබා දෙන්නේය. පොලවට අණ කිරීමෙන් බෝග වගා කර දෙන්නේය. මේවා දැකීමෙන් ඇතැම් අය ඔහුව දෙවියන් යැයි විශ්වාස කරනු ඇත. ඉන් අනතුරුව ඔහු අලංකාර තරුණයෙකුව කැඳවා ඔහුව දෙවියන් යැයි විශ්වාස කරන ලෙස නියෝග කරන්නේය. එහෙත් එම තරුණයා ඔහුගේ නියෝගය ප්‍රතික්ෂේප කරනු ඇත. එවිට දජ්ජාල් සිය කඩුවෙන් එම තරුණයාව කපා වෙන් කරන්නේය. ඉන් පසු එම තරුණයාව ඔහුගේ හාස්කමින් නැවත නැගිට සිටීමට අණ දෙන අතර ඔහු සිනාසෙමින් නැගිටින බව හදිසයේ සඳහන් වේ. අනතුරුව දජ්ජාල්ගේ දේවත්වය පිළිගන්නා මෙන් ඔහුට නියෝග කරත් එම තරුණයා ඔහුගේ ඉල්ලීම දෙවන

වරටත් ප්‍රත්ක්ෂේප කරන්නේය. එවිට දජ්ජාල් ඔහුගේ කඩුවෙන් එම තරුණයාව නැවතත් කපා වෙන් කිරීමට උත්සාහ කලත් ඔහුට එය කල හැකි වන්නේ නැත. මින් පසු දජ්ජාල් වෙනත් නගරයකට පලායනු ඇත. කෙසේ වෙතත් දුර්වල විශ්වාසයන් ඇති අය දජ්ජාල්ගේ ක්‍රියාවන් දැකීමෙන් ඔහුව දෙවියන් බවට විශ්වාසකරන බව සඳහන් වේ. මේ වන විට ජේසු තුමා දෙවදූතයින් දෙදෙනෙකුගේ අත්තටු මත දමස්කස් නගරයට නැගෙනහිරින් පිහිටි මිනාරාව දෙසට පැමිණෙනු ඇත. එහිදී ඔහු මිනිසුන්ට සලාතය මෙහෙයවනු ඇත. පසුව ඔහු දජ්ජාල්ව සොයා ගොස් 'බාබු ලුද්' යන ස්ථානයේදී ඝාතනය කිරීමට නියමිතය. මෙම සිදුවීම වලින් පසු යාජුජ් සහ මාජුජ් (Gog and Magog) යන කණ්ඩායම් දෙක පැමිණීමට නියමිතය. මොවුන් නිසා මිනිසුන් මහත්සේ පිඩාවට පත් වනු ඇත.

මෙම සිදුවීම්වලින් පසු නැවතත් හොඳ කාලයක් එළමෙන බව නබිතුමා පවසා ඇත. එම කාලය අවසාන වීමත් සමග ලෝකය අවසාන වීමට පෙර සිදුවීමට නියමිත විශාල සිදුවීම් සියල්ලම ඉතා වේගයෙන් එක පිට එකක් පැමිණීමට නියමිතය. එහෙත් එම කාලයේදී විශ්වාසවන්තයින් කිසිවෙකු ජීවතුන් අතර නොසිටිනු ඇත. ලෝකය අවසාන වන්නේ ඉන් පසුවය.

මෙම සිදුවීම් වලින් පසුව අල්ලාහ් නියම කල අන්දමට විනිශ්චය දිනය ආරම්භ වනු ඇත. එම දිනයේදී මෙලොව ජීවත්වූ සියලුම ජීවින් එක තැනකට එක්කාසු කරනු ඇත. එම විනිශ්චයෙන් පසු මිනිසාට ස්වර්ගය හෝ නිරය ලැබීමට නියමිතය. සෙසු ජීවින් දූවිලි බවට පත්කරනු ඇත.

---

# ලෝක අවසානයේ පෙරනිමිති

ලෝක අවසානයට පෙර සිදුවන සුළු හා ප්‍රධාන සිදුවීම් කිහිපයක් පිළිබඳව මොහම්මද් නබි (ﷺ) තුමාණන් පුරෝකථනය කළහ.

පහත දැක්වෙන්නේ ඉන් කිහිපයකි.

ලෝක අවසානයට පෙර දැකිය හැකි සුළු සිදුවීම්. [ඒවායින් බොහොමයක් දැනටමත් සිදුවී හමාරය].

1. භූමිකම්පා නිතර සිදුවීම.
2. ලෝකය පුරා යුධ ඇවිලීම්.
3. අයුක්තිය සහ අසාධාරණය ලොව රජ කරනු ඇත.
4. ප්‍රයෝජනවත් දැනුම ලෝකයෙන් තුරන් වන අතර නුගත්කම පැතිරෙනු ඇත. (මෙහි ප්‍රයෝජනවත් දැනුම ලෙස හැඳින්වෙන්නේ ආගමික දැනුම වේ)
5. පොත්පත් සහ ලිඛිත දැනුම බහුලව දැකිය හැකි නමුත් (ආගමික) විද්වතුන්ගේ අඩුවක් සිදුවනු ඇත (අහමද්).
6. පරදාර සේවනය සහ මෛතුනයෙහි යෙදීම සාමාන්‍ය සිද්ධීන් බවට පත්වනු ඇත. (නබිතුමාගේ හදිස් වලින් දැක්වෙන පරිදි මේ වැනි දේ සිදුවන විට මිනිසා මීට පෙර කිසිදාක නො ඇසූ නො දුටු ලෙඩ රෝග අළුතින් ව්‍යාප්ත වනු ඇත) බුහාරි, මුස්ලිම්, ඉබ්නු මාජාහ්.
7. පාලකයින් අතර අපචාරය බහුලව සිදු වනු ඇත. (හදිස් වලින් කියවෙන්නේ මිනිසා අයහපත් දේ වැළැක්වීමට ක්‍රියා නොකිරීමෙන් මෙය සිදුවන බවය-ඉබ්නු මාජාහ්).
8. පරදාර සේවනය සහ මෛතුනයෙහි යෙදීම ප්‍රසිද්ධියේ සිදුවනු ඇත.
9. මත්පැන් පානය බහුලව සිදු වනු ඇත (බුහාරි, මුස්ලිම්).
10. පිරිමින්ට වඩා ගැහැණුන් වැඩිවනු ඇත. මෙය එකට පනහ අනුපාතය දක්වා වැඩිවනු ඇත. (බුහාරි, මුස්ලිම්).
11. මනුෂ්‍ය ඝාතන බහුලව සිදුවනු ඇත. ඝාතන වැඩි වන තරමට කුමන හේතුවක් නිසා එම ඝාතනය සිදුකලේදැයි ඝාතකයා පවා දැනගන්නේ නැත.
12. කෑදරකමින් කෑම මේසයක් වටා සිටගන්නවා සේම මුස්ලිම්වරුන්ට එරෙහිව ලෝකයේ විවිද ජාතීන් සිටගනු ඇත. මෙසේ සිදුවන විට ලෝකයේ මුස්ලිම්වරු බහුලව සිටියත් ඔවුන් මුහුදේ ඇති පෙන මෙන් වටිනාකමක් නැති ජාතියක් බවට පත්වනු ඇත.
13. අම්ල වරුසා, වසිනු ඇත (අත් තබරානි, අල් හාකිම්)

14. අවජාතක දරුවන් සුලබ වනු ඇත (අත් තබරානි, අල් හාකිම්)
15. පොදු අරමුදල් (trust) ලාභ උපයන දෙයක් ලෙස සලකනු ඇත (අත් තිර්මිසි, අල් හයිතමි).
16. ලාභාංශ ධනවතුන් අතර පමකන් බෙදා ගනු ඇත, ඒවා දුප්පතාට නොලැබෙනු ඇත (අත් තිර්මිසි).
17. zසකාත් ගෙවීම බරක් ලෙස සලකනු ඇත. මසුරුකම රජකරනු ඇත. අකමැත්තෙන් සදකා හෙවත් තුටුපඬුරු දෙනු ඇත (අත් තිර්මිසි, අල් හයිතමි).
18. මිනිස් සිත්වල මසුරුකම මුල්බැසගනු ඇත (බුහාරි).
19. හදිසි මරණ ගැන නිතර ඇසීමට ලැබෙනු ඇත (අහමද්).
20. මිනිසුන් ප්‍රසිද්දියේ කුලුපහු මිතුරන් ලෙස රහ පැවත් රහසිගතව සතුරන් ලෙස ක්‍රියාකරනු ඇත (අත් තිර්මිසි).
21. මිනිසුන් තමන්ගේ භාර්යාවට කීකරු වන අතර තමන්ගේ මවට අකීකරු වනු ඇත, තම යහළුවන් සමග කුලුපහවන අතර තම පියාගෙන් දුරස් වනු ඇත (අත් තිර්මිසි).
22. දේවස්ථානවල උස්හඬින් කතා කරනු ඇත (අත් තිර්මිසි).
23. මිනිසුන් ජනතාව ගැවසෙන ස්ථානවල තම කලව ප්‍රදර්ශනය කරනු ඇත.
24. දිගු ගමන් කෙටි කාලයකදී සිදු කරගනු ඇත.
25. මිනිසුන් අතරින් නරකම ජන කොට්ටාසය පාලකයින් බවට පත්වනු ඇත (අත් තිර්මිසි).
26. පාලකයන් ජනතාව තලා පෙලා රට පාලනය කරනු ඇත (අල් හයිතමි).
27. මිනිසුන්ගේ දුෂ්ටකම් වලට බියෙන් මිනිසා මිනිසාට ගව්රව කරනු ඇත (අත් තිර්මිසි).
28. ගායිකාවන් සහ සංගීත භාණ්ඩ ජනප්‍රිය වනු ඇත (අත් තිර්මිසි)
29. මිනිසුන් කුරානය පිළිපදින බව කියමින් හදිස් සහ සුන්නාවලින් ඈත් වනු ඇත (අබු දාවුඩ්).
30. කාලය වේගවත් වනු ඇත (බුහාරි, මුස්ලිම්).
31. සත්ක්‍රියා දුලභ වනු ඇත (බුහාරි).
32. නිතර නිතර භූමිකම්පාවන් සිදුවනු ඇත. (බුහාරි, මුස්ලිම්).

33. සිව්පාවන් මිනිසුන් සමග කතා කරනු ඇත (අහමඩ්).
34. කාන්තාවන් වස්ත්‍ර ඇන්දත් නිරුවතින් මෙන් දිස්වනු වනු ඇත. මොවුන් නොමග යන ගමන් අනෙක් අයවත් නොමග යවනු ඇත (මුස්ලිම්).
35. මිනිසුන් ඉතා උස ගොඩනැගිලි සෑදීමේ තරගයක නිරත වනු ඇත (බුහාරි).
36. පවුල් අතර ඇති බැඳීම් සිඳී යනු ඇත.
37. අහාර පාන බහුලව තිබුනත් ඒවායේ ආශීර්වාදයක් (blessings) නොතිබෙනු ඇත.
38. යුප්‍රටීස් නදියෙන් නිදානයක් මතු වනු ඇත (එම අවස්ථාවේ ජීවත්වන කිසිවෙකුට එය නොගන්නා මෙන් නබිතුමා පවසා ඇත) (බුහාරි, මුස්ලිම්).

**ඉහත සඳහන් කළ සුළු සිදුවීම් වලින් පසු පහත දැක්වෙන මහා පරිමාන සිදුවීම් එකින් ඒක පැමිණීමට නියමිතය.**

1. මසිහ් අද්-දජ්ජාල් ගේ පැමිණීම (The Antichrist). මොහුගේ පැමිණීමෙන් පසු ලෝකයේ කවදාවත් නුදුටු විනාශයන් සිදු කරනු ඇත.
2. මහ්දි (අලෙය්හි සලාම්) ගේ පැමිණීම. මෙතුමා පැමිණ ලෝකයේ ස්ථිර සාමය නැවත ස්ථපනය කරනු ඇත.
3. එම වකවානුව වන විට මරියා තුමියගේ පුත් ඊසා නබි තුමා (Jesus Christ) ගේ දෙවන සම්ප්‍රාප්තිය සිදු වීමට නියමිතය. ඔහු සිරියාවේ දමස්කස් යන ස්ථානයේ පිහිටි දේවස්ථානයට දේවදූතයින් සමහ පැමිණීමට නියමිතය. ජේසු තුමා නැවත පැමිණි පසු කුරානයේ නීති ප්‍රකාරව පාලනය සිදු කරනු ඇත.
4. යඃජුජ් සහ මඃජුජ් (Gog and Magog) ගේ පැමිණීම. මොවුන් ලොව පුරා අසීමිත විනාශයන් කරනු ඇත.
5. කඃබාව විනාශ කිරීම සහ එහි වස්තුව පැහැරගැනීම.
6. දාබ්බතුල් අර්ල් නමැති සත්වයාගේ පැමිණීම.
7. ලෝකය දුමාරයකින් වැසියාම.
8. දරුණු බුමිකම්පා තුනක් ඇති වීම.
9. මනහර සුළගක් හමා මුමින්වරුන් මරණයට පත් වීම.

10. ඉර බටහිරින් නැගෙනහිරට උදාවීම. (මෙම සිදුවීමෙන් පසු සමාවෙ දොරටු වැසි යන්නේය).

**ලෝක විනාශ වන මොහොත සහ මිය ගිය අය නැවත නැගිටුවීම**

- ගින්නක් මගින් මිනිසුන් අවසාන වශයෙන් එක්කාසු වන ස්ථානයට කැදවාගෙන යාම.
- ඉස්රාෆීල් (අ.ස) නැමති මලායිකවරයා විසින් සූර් නම් නලාව නාද කිරීම. මුල්වරට සූර් නම් නලාව නාද කිරීමෙන් පසු ලෝක විනාශය සිදු වනු ඇත. එම අවස්ථාවේ භිය, ත්‍රාසය සහ මරණය සිදුවනු ඇත

එම නලාව දෙවන වරට පිඹීමෙන් පසු මියගිය සියළුම දෙනා නැවතත් මළවුන්ගේ නැගිටිනු ඇත. ඉන් පසු ඔවුන් විනිශ්චය සිදුකරනු ලබන ස්ථනය වෙත එක්රැස් කරනු ලබන්නේය.

දෙවියන් වහන්සේ ලෝක අවසානය සහ විනිශ්චය දිනය ගැන අල් කුරාණය තුලින් බොහෝ වාරයක් කතා කර ඇත. වැඩි විස්තර සඳහා පහත සඳහන් පද සහ අදාළ ලිපි බලන්න.

*(කුරානය 56:1-4)"එම සිද්ධිය ඇතිවන විට එය බොරු කළ හැකි කිසිවක් නොමැත. එමගින් (නිරයට යන අයව) පහත් කරන අතර (ස්වර්ගයට යන අයව) උසස්කරනු ඇත. තවද පොළව ඉතා සැරෙන් සොලවනු ලබන කල, කඳු දූවිලි බවට හැරෙනු ඇත. ඒවා පාවෙන දූවිලි බවට පත්වනු ඇත"*

*(කුරානය 56:61) "නුඹලා නොදන්නා පෙනුමෙන් නුඹලාව නැවත මවන්නෙමු".*

*(කුරානය 56:50) "නියතව සියල්ලෝම නියමිත දවසක නියමිත වේලාවක එක්රැස් කරවනු ලබන්නෝය'යි (නබි!) නුඹ පවසන්න".*

*එම දිනයේදී සැම කෙනෙකුටම ඔවුන් කළ දේවල් ලියා තබන ලද ලියවිල්ලක් ලබා දෙන්නේය. ඉන් පසු ප්‍රශ්න කිරීම ආරම්භ කරනු ලැබේ. මෙම ප්‍රශ්න කිරීමෙන් පසු ස්වර්ගය හෝ නිරය තීරණය කරනු ඇත. (19.9.2017)*

# විනිශ්චය දිනය ගැන සඳහන් කුරාන් වැකි එකතුවක්

## THE DAY OF JUDGMENT - (Yawm al-qiyamah)

විනිශ්චය දිනය අපගේ ජීවිත ගමනේ තවත් එක් අවස්ථාවකි. අපට මවගේ කුස තුල හැමදාම සිටීමට නොහැකි උනා සේම අපට මේ ජීවිතය තුලද හැමදාම මෙලෙස සිටිය නොහැකිය. අපි අනිවාර්යෙන්ම මරණයට පත් වී අපගේ ඉදිරි පියවර කරා යා යුතුව ඇත. මරණින් පසු අපට ජීවිතයක් ඇත, එයටද අවසානයක් ඇත. ඉන් පසු එළැඹෙන්නේ විනිශ්චය දිනයයි. එම දිනය ඉතා දීර්ඝ දිනයකි. අප මෙලොවදී කළ හොඳ සහ නරක ආදිය ගනන් බැලෙන්නේ එදිනය. අපගේ නිර්මාතෘ කිසිදු කෙනෙකුට අසාධාරනයක් නොවන ලෙස එය ඉටු කරන බවත් ඉන් පසු එයට සරිලන ප්‍රතිඵල දෙන බවටත් පොරොන්දු වී ඇත. මේ සම්බන්ධයෙන් දෙවියන් අප වෙත දැනුම් දී ඇති කරුණු කිහිපයක් පහතින් සඳහන් කර ඇත. සෑම මනුශ්‍යයෙකුම තම ජීවිත කාළය තුල කියවා අවබෝධ කරගෙන එයට පෙර සූදානම් වීම ඉතාම වටින්නේය.*අසීමිත දයාව හා අසම සම අනුකම්පාවෙන් යුත් අල්ලාහ් ගේ නාමයෙන්.*

*අසීමිත දයාව හා අසම සම අනුකම්පාවෙන් යුත් අල්ලාහ් ගේ නාමයෙන්.*

*සියලු ප්‍රසංශා අල්ලාහ්ටය. (ඔහු) සකල ලෝකයම නිර්මාණය කර, සංවර්ධනය කර, සංරක්ෂණය කර, පෝෂණය කරන්නා වූද, අපරිමිත අනුකම්පා වද, අසම සම දයාවද, විනිශ්චය දින අධිපති (ද වන්නේ ය). (1:1-4)*

*අල්ලාහ් -ඔහු මිස, වෙන කිසිම දෙවියෙකු නැත- ඔහු නියත වශයෙන්ම සියල්ලන්වම විනිශ්චය දිනදී ඒකරාශී කරන්නේය. මෙහි කිසිම සැකයක් නැත, පුවත් දැනුම් දීමෙහි අල්ලාහ්ට වඩා සත්‍යයවන්තයා කවරෙක්ද? (4:87)*

*(ඔහු) ඉතාමත් උසස් පදවින්ගෙන් යුක්ත කෙනෙකි. අර්ෂ් වලටද අයිතිකරුය. (තමන්ව) හමුවන දිනය ගැන (ඔහු මිනිසාට) බිය ගන්වා අනතුරු අඟවනු පිණිස, තම වහලුන්ගෙන් තමන් කැමති අය කෙරෙහි තම නියෝගයන් වහී මගින් පහළ කර තබන්නේය. (40:15)*

*විශ්වාසවන්තයිනි! ඔබ අල්ලාහ්වද, ඔහුගේ දූතයාවද, ඔහු තමන්ගේ මෙම දූතයා වෙත පහළ කළ ධර්මයද, මෙයට පෙර තිබූ ධර්මයන්ද විශ්වාස කරනු. කවුරුන් අල්ලාහ්වද, ඔහුගේ මලායිකාවරුන්වද, ඔහුගේ ධර්මයන්ද, ඔහුගේ දූතයන්වද, අවසාන දිනයද ප්‍රතික්ශේප කරන්නේද, ඔහු නියත වශයෙන්ම ඉතාමත් ඈත් වූ දූර්මාර්ගයෙහිම ගමන් කරන්නේය (4:136)*

*විනිශ්වය දින මත සත්තකින්ම, (වැරදි කළ අයට) නින්දා කරනු ලබන (ඔහුගේ) හෘද සාක්ෂිය මතද මා දිව්රන්නෙමි. (මරණයට පත්ව දිරා පත් වී පස් බවට පත් වූ) ඔහුගේ ඇටකටු අපි එක්කාසු නොකරන්නෙමු යයි මිනිසා අදහස් කරමින් සිටින්නේද? නොඑසේය. ඔහුගේ ඇඟිලි තුඩු පවා (පෙර තිබූ ආකාරයටම) සකස් කිරීමට අපි බලසම්පන්න වන්නෙමු. (75:1-4)*

*එහෙත් මිනිසා දෙවියන් ඉදිරියේම වැරදි කිරීමට අදහස් කර, (සමච්චලයෙන් මෙන්) විනිශ්වය දිනය කවදා එන්නේද?යි විමසන්නේය. එය (පැමිණෙන) අවස්ථාවේදී බැල්ම නිලංකාර වී, චන්ද්‍රයාගේ ආලෝකය මැකී, (වෙන් වී තිබෙණ) සූර්යයාද, චන්ද්‍රයාද එක්කාසු වනු ඇත. එදිනදී (බේරීමට) කොහේ දුවන්නද?යි මිනිසා විමසනු ඇත. "කිසිසේත් කළ නොහැක. බේරීමට තැනක් නැත" (යයි කියනු ලැබේ). (නබියේ!) එදිනදී ඔබගේ දෙවියන් වෙතම (සියල්ලන්ම) නැගී සිටිය යුතු වන්නේය. මිනිසා කළින් (ඉටුකර) යැවූ දැයද, (ලොවෙහි) අත්හැර දමා පැමිණි දැයද, ගැන එදිනදී දැනුම් දෙනු ලැබේ. (75:5-13)*

*ඔහුම (තම) නියෝජිතයින් වශයෙන් භූමියෙහි ඔබව පත් කර ඇත්තේය. තවද ඔබගෙන් සමහරෙකුව අනිත් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමගින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේදැයි) ඔබව පරීක්ෂා කරන්නේය; (6:165)*

*(කිසිම) ප්‍රශ්නයක් නොඅසා අත්හැර දමන්නෙමු යයි මිනිසා අදහස් කලෙහිද? (75:36)*

*ඔබ එක් දිනක් ගැනද බිය වනු. (එදින) කුමන ආත්මයක් හෝ අනිත් ආත්මයකට කිසිම ප්‍රයෝජනයක් අත් කර දීමට නොහැක. ඒ වෙනුවෙන් (ඔහු) මැදිහත් වී*

*කතා කිරීමද බාර ගනු නොලැබේ. තවද ඔවුන් (කිසිවෙකුගෙන් කිසිම) උදව්වක් කරනු නොලබන්නාහ.(2:48)*

*මිනිසුන්ට ඔවුන්ගේ ප්‍රශ්න ගණනය කිරීමේ (දිනය) ළඟා වෙමින් ඇත්තේය. එහෙත් ඔවුන් නම්. එය ප්‍රතික්ෂේප කර, කිසි දූකක් නැති අය වශයෙන්ම සිටින්නාහ. (21:1)*

*(නබියේ!) නියතවශයෙන්ම ඔබගේ දෙවියන් මොවුන් සියල්ලන්වම (ප්‍රශ්න කිරීම සඳහා විනිශ්චය දිනදී තමන් ඉදිරියේ) ඒකරාශී කරනු ඇත; (15:25)*

*නියත වශයෙන්ම විනිශ්චය දින අනිවාර්යයෙන්ම පැමිණෙන්නේය. සෑම ආත්මයක්ම තම ක්‍රියාවන්ට සරිලන ඵලවිපාක අත් කර ගැනීම පිණිස එය, මා (මිනිසුන්ට) සඟවා තැබීමට අදහස් කරමි. එහෙත් ප්‍රතික්ෂේප කරන්නන් "විනිශ්චය දිනය අපට (කිසිදාක) පැමිණෙන්නේ නැත" යයි පවසන්නාහ. (නබියේ!) ඔබ මෙසේ පවසනු; "එසේ නොව, නියත වශයෙන්ම (විනිශ්චය දිනය) ඔබ වෙත අනිවාර්යයෙන්ම පැමිනෙන්නේය. ඔහු ගුප්ත දෑය සියල්ල දන්නෙකි. ඔහු නොදැනුවත්ව අහස් හී හෝ භූමියෙහි හෝ ඇති දැයෙන් එක් අනු ප්‍රමාණයක් හෝ බේරී යන්නේ නැත. ඊටත් වඩා කුඩා හෝ ලොකු හෝ (සෑම දැයක්ම ලවුහුල් මහ්ෆූල් නැමති) පැහැදිලි (සටහන්) පුස්තකයෙහි සටහන් නොවී නැත".(34:3)*

*එබැවින් එය විශ්වාස නොකර තම (ශරීර) සුවය අනුගමනය කරන්නා, (ඒ දිනය ගැන ඔබ දූක් නොවීමට) ඔබව වලක්වා නොගත යුතුය. එසේ වුවහොත් ඔබ විනාශ වන්නෙහිය! (20:15,16)*

*සෑම මිනිසෙකුගේම ක්‍රියාවන් ගැන (විස්තරාත්මක දෛනික) සටහන් ඔහුගේ බෙල්ලෙහි එල්ලා ඇත්තෙමු. විනිශ්චය දිනදී එය ඔහුට එක් පුස්තකයක් මෙන් ගෙන දෙන්නෙමු. ඔහු එය දිගහැර බලනු ඇත. (ඒ අතර ඔහුට) "අද දින ඔබගේ ගණනය බැලීමට ඔබම ප්‍රමාණවත්ය. එබැවින් ඔබගේ(සටහන්) පුස්තකය ඔබම කියවා බලනු" (යයි කියන්නෙමු). (17:13,14)*

විනිශ්චය දිනදී නිවැරදි තරාදියක්ම අපි සිටුවන්නෙමු. කිසිම ආත්මයකට (යම් කිසිවක් අඩු කර හෝ වැඩි කර හෝ) අපරාධයක් කරනු නොලැබේ. (පින්, පව්) එක් අබ ඇටයක ප්‍රමාණයක් තිබුණා වුවද, එයද (කිරා බැලීමට) ගෙන එන්නෙමු. ගණනය කිරීමට අපිම ප්‍රමාණවත්ය. (වෙන කිසිවෙකුගේ උදවුවක් අපට අවශ්‍යය නැත). (21:47)

(නබියේ! විනිශ්චය කාලය ගැන එය කවදා එන්නේදැයි ඔවුන් ඔබගෙන් විමසන්නාහ. (එයට) ඔබ මෙසේ පවසනු. "එහි දැණුම මගේ දෙවියන්ගේ සන්නිධානයෙහිම ඇත්තේය. එය පැමිණෙන වේලාව ඔහු මිස, වෙන කිසිවෙකුටත් පැහැදිලි කිරීමක්ද කළ නොහැක. (ඒ අතරම) අහස් හිද, භූමියෙහිද ඉමහත් වූ සිදුවීම් සිදුවනු ඇත. හදිසියේම මිස, (එය) ඔබ වෙත පැමිණෙන්නේ නැත"; (7:187)

මිනිසුනේ! (විනිශ්චය දිනදී ඔබට පණ දී) නැගිට්ටවීම ගැන ඔබ සැක සිතුවහොත් (ඔබව පළමුවෙන්ම කෙසේ උත්පාදනය කළෙමුදැයි යන්න අවධානය කර බලනු). නියත වශයෙන්ම අපි ඔබව (ඔබගේ මුල්ම පියා වන ආදම්ව) කිරි මැටියෙන් උත්පාදනය කළෙමු. පසුව (ඔබව) ඉන්ද්‍රීය බිඳකින් (උත්පාදනය කර), පසුව එය එක් ලේ කැටියක් වශයෙන්ද, පසුව (එය) අඩු රුවකින් යුත් නැතහොත් පූර්ණ රුවකින් යුත් මාන්ශ පිණ්ඩයක් වශයෙන්ද, (අපි උත්පාදනය කරන්නෙමු. අපගේ බලසම්පන්නකම) ඔබට පැහැදිලි කරනු පිණිස (මෙසේ කර), අපි අදහස් කළ අයට ගර්භයන්හී නියමිත කාලයක් දක්වා රැඳී සිටින සේ සලස්වන්නෙමු. පසුව ඔබව ළදරුවන් වශයෙන් ඉකුත් කර ඔබ, ඔබගේ තරුණ විය අත් කර ගැනීමට සලස්වන්නෙමු. (මේ අතර) මරණයට පත්වන්නනන්ද ඔබගෙන් සමහරෙක් ඇත්තාහ. (නැතහොත් ජීවත්ව සිටිමින්) සියල්ල දැනගත්තායින් පසු, කිසිවක් නොදන්නා කෙනෙකු බවට පත් වන මහළු වයස දක්වා (ජීවත් වීමට) අත්හැර දමන්නනන්ද ඔබගෙන් සිටින්නාහ. (මිනිසුනේ!) භූමිය (කිසිම භෝගයක් නොමැති) පාළු කර්කශක (භූමියක්) වශයෙන් තිබෙණු ඔබ දුටුවේ නැද්ද? ඒ මත අපි වර්ෂාව වසින්නට සැලැස්සුවහොත් එය සශ්‍රීක වී, වැඩී අලංකාරවත් විවිධ වර්ගයේ (ජෝඩු ජෝඩු වශයෙන්) උසට වැඩුණු ගස්වැල් වැඩෙන්නට සලස්වනු ලැබේ. (22:5) මෙසේ (කරන්නා) නියත වශයෙන්ම අල්ලාහ්ය. ඔහුම

සත්‍යවන්තයෙකි. නියත වශයෙන්ම ඔහු මරණයට පත් වූවන්ට පණ දී නැගිට්ටවන අයයි. නියත වශයෙන්ම ඔහු සියල්ල කෙරෙහි බලසම්පන්නයෙකු යන්න මෙයම ප්‍රමාණවත් (සාධකයක් වශයෙන් ඇත්තාහ). (22:6)

මිනිසුනේ! (විනිශ්චය දිනදී ඔබට පණ දී) නැගිට්ටවීම ගැන ඔබ සැක සිතුවහොත් (ඔබව පළමුවෙන්ම කෙසේ උත්පාදනය කළෙමුදැයි යන්න අවධානය කර බලනු). නියත වශයෙන්ම අපි ඔබව (ඔබගේ මුල්ම පියා වන ආදම්ව) කිරි මැටියෙන් උත්පාදනය කළෙමු. පසුව (ඔබව) ඉන්ද්‍රීය බිඳකින් (උත්පාදනය කර), පසුව එය එක් ලේ කැටියක් වශයෙන්ද, පසුව (එය) අඩු රුවකින් යුත් නැතහොත් පූර්ණ රුවකින් යුත් මාන්ශ පිණ්ඩයක් වශයෙන්ද, (අපි උත්පාදනය කරන්නෙමු. අපගේ බලසම්පන්නකම) ඔබට පැහැදිළි කරනු පිණිස (මෙසේ කර), අපි අදහස් කළ අයට ගර්භයන්හී නියමිත කාලයක් දක්වා රැඳී සිටින සේ සලස්වන්නෙමු. පසුව ඔබව ළදරුවන් වශයෙන් ඉකුත් කර ඔබ, ඔබගේ තරුණ විය අත් කර ගැනීමට සලස්වන්නෙමු. (මේ අතර) මරණයට පත්වන්නන්ද ඔබගෙන් සමහරෙක් ඇත්තාහ. (නැතහොත් ජීවත්ව සිටිමින්) සියල්ල දැනගත්තායින් පසු, කිසිවක් නොදන්නා කෙනෙකු බවට පත් වන මහළු වයස දක්වා (ජීවත් වීමට) අත්හැර දමන්නන්ද ඔබගෙන් සිටින්නාහ. (මිනිසුනේ!) භූමිය (කිසිම භෝගයක් නොමැති) පාළු කර්කශක (භූමියක්) වශයෙන් තිබෙණු ඔබ දුටුවේ නැද්ද? ඒ මත අපි වර්ෂාව වසින්නට සැලැස්සුවහොත් එය සශ්‍රීක වී, වැඩී අලංකාරවත් විවිධ වර්ගයේ (ජෝඩු ජෝඩු වශයෙන්) උසට වැඩුණු ගස්වැල් වැඩෙන්නට සලස්වනු ලැබේ. (22:5) මෙසේ (කරන්නා) නියත වශයෙන්ම අල්ලාහ්ය. ඔහුම සත්‍යවන්තයෙකි. නියත වශයෙන්ම ඔහු මරණයට පත් වූවන්ට පණ දී නැගිට්ටවන අයයි. නියත වශයෙන්ම ඔහු සියල්ල කෙරෙහි බලසම්පන්නයෙකු යන්න මෙයම ප්‍රමාණවත් (සාධකයක් වශයෙන් ඇත්තාහ). (22:6)

විශ්වාසවන්තයිනි! කේවලයද, මිත්‍රකමද, මැදිහත් වීමක්ද නොමැති (සාධාරණ විනිශ්චයේ) එක් දිනයක් පැමිණීමට පෙර, ඔබට අපි ලබා දුන් දැයෙන් (දැහැමි මාර්ගයෙහි) වියදම් කරනු. (මෙය) ප්‍රතික්ෂේප කරන්නන් තමන්ට තමන්ම නපුර කර ගන්නාහ. (2:254)

*(නබියේ!) සැකයෙන් තොර එක් (විනිශ්චය) දිනදී අපි ඔවුන්ව ඒකරාශී කර, (ඔවුන්ගේ) සෑම ආත්මයකටම ඒවායේ ක්‍රියාවට සරිලන ඵලවිපාක පූර්ණ වශයෙන් දෙනු ලැබුවහොත් (ඔවුන්ගේ තත්වය) කෙසේ නම් ඇත්ද? ඔවුන් (තමන්ගේ ඵලවිපාක අත් කර ගැනීමෙහි පොඩියක් හෝ) අසාධාරණය කරනු නොලබන්නාහ.(3:25)*

*(එම) දිනදී සමහර මුහුණු (සතුටින් පිරී දීප්තිමත්) ස්වේත වර්ණයෙන්ද, සමහර මුහුණු (දුකෙන්) කළු වී (මැළ වී) තිබෙණු ඇත. කවුරුන්ගේ මුහුණු කළුවී (මැළ වී) ඇත්තේද, (ඔවුන්ට) "ඔබ විශ්වාසය තැබුවායින් පසු (එය) ප්‍රතික්ෂේප කර හැරියෙහුද? එබැවින් ඔබ ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙන් (නිරා) දඬුවම විඳ බලනු" (යයි පවසනු ලබන්නාහ). (3:106)*

*ඔහු (දෙවියන්) කරුණාව තමන් කෙරෙහි අනිවාර්යය කරගෙන සිටින්නේය. (එබැවින් ඔබගේ වැරද්දට මෙතෙක් ඔබට දඬුවම් නොදී සිටින්නේය. එහෙත්) නියත වශයෙන්ම ඔබ සියල්ල විනිශ්චය දිනදී ඒකරාශී කරනු ඇත. එහි කිසිම සැකයක් නැත. ඔවුන් (සත්‍යය ප්‍රතික්ෂේප කර) තමන්ට තමන්ම පාඩුව ඇති කර ගන්නෝද, ඔවුන් (මෙය) විශ්වාස කරන්නේ නැත. (6:12)*

*(එබැවින්) කවුරුන් (විනිශ්චය කාලයෙහි) අල්ලාහ්ගේ හමුවීම බොරු කරන්නෝද, ඔවුන් නියත වශයෙන්ම පරාජිතයින් බවට පත්ව ගියහ. (බලාපොරොත්තු නොවූ අන්දමට) හදිසියේ ඔවුන්ට විනිශ්චය කාලය පැමිණියහොත්, ඔවුන් තමන්ගේ පාපයන්හී බර තමන්ගේ පිට කොන්ද මත ඔසවා ගත් අය වශයෙන් " මෙය(මෙම දිනය) අපි විශ්වාස නොකළ (වැරද්දෙන්) අපට ඇතිවූ ශෝකය!" යයි දොඩවන්නාහ. ඔවුන් ඔසවාගෙන ඇති දැය ඉතාමත් නපුරු ඒවා නොවේද?*

*ක්‍රිස්තියානිවරුන් (කිසිම ධර්මයක) නැතැයි යුදෙව්වන් පවසන්නාහ. යුදෙව්වන් (කිසිම ධර්මයක) නැතැයි ක්‍රිස්තියානිවරුන් පවසන්නාහ; මොවුන් තර්ක කරමින් සිටින මේ (කාරණාවන්) ගැන විනිශ්චය දිනදී අල්ලාහ් මොවුන් අතරේ තීන්දුවක් දෙනු ඇත; (2:113)*

*කවුරුන් ධර්මයෙහි අල්ලාහ් පහළ කළ දැය සඟවාගෙන ඒ වෙනුවෙන් සුළු මුදලක් ලබා ගන්නෝද, ඔවුන් නියත වශයෙන්ම තම කුසෙහි ගින්දර මිස, වෙන කිසිවක් පුරවා ගන්නේ නැත. තවද විනිශ්චය දිනදී අල්ලාහ් ඔවුන් සමග කතා කරන්නේද නැත. ඔවුන්ට (සමාව දී) පරිශුද්ධ කර හරින්නේද නැත. ඔවුන්ට (ඉතාමත්) වේදනා ගෙන දෙන දඬුවම්ද ඇත. (2:174)*

*තවද කවුරුන් "ඇත්තෙන්ම අපි ක්‍රිස්තියානුවන්" යයි පවසන්නෝද, ඔවුන් වෙතද (මෙසේම) අපි පොරොන්දු ලබා ඇත්තෙමු. එහෙත් ඔවුන්ද (මෙම නබිවරයා ගැන තමන්ගේ ධර්මයෙහි) තමන්ට කියනු ලැබූ කොටස අමතක කර දැමූහ. එබැවින් ඔවුන් තුල වෛරයද, ක්‍රෝධයද විනිශ්චය දින දක්වා (පහ නොවී සිටින සේ) පටලවා හැරියෙමු. (මෙලොවදී) ඔවුන් කුමක් කරමින් සිටියෝදැයි යන්න (පරලොවදී) අල්ලාහ් ඔවුන්ට ගෙනහැර දක්වනු ඇත (5:14)*

*අහස්ද, භූමියද හා මේවා අතර ඇති දැයද නියමිත කාරණාවකට මිස, අපි උත්පාදනය කළේ නැත. (නබියේ! මොවුන්ගේ දඬුවමට අයත්) කාලය නියත වශයෙන්ම පැමිණෙන්නේය! (ඒ වන තුරු මෙම අපරාධකාරයන්) ඔබ ගෞරවාන්විත අන්දමට ප්‍රතික්ෂේප කරමින් සිටිනු. (15:85)*

*ප්‍රතික්ෂේප කරන්නන්ට මෙලොව ජීවිතයම අලංකාරවත් ආකාරයට (සිතෙන සේ) පත් කරනු ලැබ ඇත්තේය. එබැවින් ඔවුන් (දුප්පතුන් වශයෙන් සිටින) විශ්වාසවන්තයින්ට සමච්චල් කරන්නාහ. නමුත් (විශ්වාසවන්තයින් වන) පාරිශුද්ධවන්තයින් නම්, විනිශ්චය දිනදී ඔවුන්ට වඩා (අපමණ තරම්) උසස්ව සිටිනු ඇත. තවද අල්ලාහ් තමන්ට කැමැත්තන්ට ගනණය නොකරම ලබා දෙන්නේය. (2:212)*

*(නබියේ! එක් දිනක් ගැන ඔබ ඔවුන්ට මතක් කර දෙනු). එදිනදී මෙම භූමිය වෙනස් කර වෙනත් ආකාරයක භූමියක් බවට පත් කර හරිනු ඇත. අහස්ද ඒ ආකාරයටමයි. ඔවුන් (තම තමන්ගේ ස්ථානයන්හී සිට) ඉකුත් වී (සියල්ලන්වම) යටහත් පහත් කර එකම දෙවියන් වන එම අල්ලාහ්ගේ සන්නිධානයෙහි එක්රැස්වනු ඇත. (14:48)*

*එදිනදී ඔබ දෙවියන්ගේ අර්ෂ් මලායිකාවරුන් අට දෙනෙකු තමන්ට ඉහලින් එය ඔසවාගෙන සිටිනු ඇත; (69:17)*

*අල්ලාහ් තම දයාව මගින් ඔවුන්ට ලබා දුන් වස්තූන්ගෙන් කවුරුන් මසුරුකම් දක්වන්නෝද ඔවුන් එය ඔවුන්ට හොඳක් යැයි නොසිතිය යුතුය. එය ඔවුන්ට නපුරක් බවටම අවසන් වනු ඇත. ඔවුන් මසුරුකම මගින් එක්කාසු (කර තැබූ) වස්තූන් විනිශ්චය දිනදී ඔවුන්ගේ බෙල්ලෙහි මාලයක් වශයෙන් පටලවා හරුනු ලැබේ; (3:180)*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම විඳින්නාහ. එහෙත් ඔබගේ (ක්‍රියාවන්ට සරිලන) ඵලවිපාක ඔබ පූර්ණ වශයෙන් අත් කර ගන්නේ විනිශ්චය දින දීය. එබැවින් (එදින) කවුරුන් (නිරා) ගින්නෙන් ඈත් කර, ස්වර්ගයන් හී ඇතුළු කරනු ලබන්නේද, ඔහු නියත වශයෙන්ම (ඉමහත්) භාග්‍යය අත් කර ගත්තේය. මෙලොව ජීවිතය වශී කල හැකි (අල්ප) සුවයම මිස වෙන කිසිවක් නැත. (3:185)*

*පැමිණිය යුතු (යුග අවසාන කාලය) ළඟා විය. අල්ලාහ් හැර, වෙන කිසිවෙකු විසින් හෝ එය වැළැක්විය නොහැක. මෙම පුවත ගැන ඔබ පුදුම වන්නෙහුද? ඔබ සිනාසෙන්නෙහුද? හැඬිය යුතු නොවෙද? (53:57-60)*

*විනිශ්චය දිනය ළඟා විය. (එයට සළකුණක් වශයෙන්) චන්ද්‍රයාද පැළී ගියේය. එහෙත් ඔවුන් එම සාධකය දුටුවා වුවද, (එය) ප්‍රතික්ෂේප කර "මෙය දිගටම පැවත එන සූනියමකි" යයි පවසන්නාහ. (54:1,2)*

*(නබියේ!) මෙසේ පවසනු; "ඔබට අල්ලාහ්ගේ දඬුවම පැමිණියහොත්, නැතහොත් ඔබට විනිශ්චය කාලය පැමිණියහොත්, අල්ලාහ් නොවන (ඔබ නමදින මේ පිළිරූ) දැයද ඔබ (ඔබගේ උදව්වට) ආරාධනා කරන්නේ යන්න ඔබ සිතා බැලුවෙහුද? (මෙම පිළිරූ ඔබගේ දෙවිවරුන් යැයි පවසන) ඔබ ඇත්ත කියන්නන් වශයෙන් සිටින්නෙහු නම් (ඒවාම ඔබගේ උදව්වට ආරාධනා කරනු)". (6:40)*

*(නබියේ!) ඔබගේ දෙවියන් ඉතාමත් ක්ෂමා කරන්නෙකු හා දයාබරවන්තයෙකු වශයෙන්ද සිටින්නෙය. ඔවුන් කරන (නපුරු) විපත් හී හේතුවෙන් ඔහු (එවෙලෙ*

*එවෙලේම) ඔවුන්ව අල්ලා ගතහොත්, මෙතෙක් ඔවුන්ව අනිවාර්යයෙන්ම දඬුවම් කර ඇත. එහෙත් (ඔවුන්ට දඬුවම් කිරීමට) ඔවුන්ට එක් නියමිත කාලයක් ඇත. ඉන් පසුව ඔවුන්ට බේරීමට මාර්ගයක් දකින්නේ නැත. (18:58)*

*(අද දින ඔවුන් ප්‍රතික්ෂේප කරමින් සිටියා වුවද), අප වෙත ඔවුන් පැමිණෙන දින (අපගේ නියෝගයන්ට) ඉතාමත් හොඳින් සවන් දෙනු ඇත. (අපගේ දඬුවම්) ඉතාමත් හොඳින් (තමන්ගේ ඇස් වලින්ද) දකිනු ඇත. එහෙත් එම අපරාධකරුවන් මෙදින ප්‍රකට දුර්මාර්ගයෙහිම සිටින්නාහ. නමුත් (නබියේ!) සාධාරණව විනිශ්චය දෙනු ලබන ඉතාමත් දුක්මුසු (එම) දින ගැන ඔබ ඔවුන්ට බිය ගන්වා අනතුරු අඟවනු. එහෙත් (අද දින) ඔවුන් දුකෙන් තොරව සිටින්නාහ. එබැවින් ඔවුන් විශ්වාස කරන්නේම නැත. (19:38,39)*

*ලියන ලද ලිපිය හකුළන්නාක් මෙන් අහස හකුළන දිනදී පළමුවැනි වරට අපි ඔවුන්ව උත්පාදනය කළ ආකාරයටම (එදිනදී) අපි (ඔවුන්ට පණ දී) ඔවුන්ව පුනරුත්තාපනය කරන්නෙමු. එය අප කෙරෙහි අනිවාර්යයෙන් කළ යුතු පොරොන්දුවක් වන්නේය. නියත වශයෙන්ම අපි (එය) අනිවාර්යයෙන්ම කරන්නෙමු. (21:104)*

*(යුග අවසානය සඳහා) අහස පැළී යන අවස්ථාවේදී, එය (සෙයිතුන්) තෙල් මෙන් රෝස වර්ණයක් බවට පත්වනු ඇත. (55:37)*

*මෙම ප්‍රතික්ෂේප කරන්නන් අපව අතහැර දමා අපගේ වහලුන්ව (තමන්ට) ආරක්ෂකයින් වශයෙන් ගත හැකිය යයි අදහස් කරමින් සිටින්නෙහුද? නියත වශයෙන්ම මෙම ප්‍රතික්ෂේප කරන්නන්ට ආගන්තුක සත්කාර කිරීම සඳහා නිරයම පිළියෙල කර ඇත්තෙමු. (18:102) ඔවුන් (කවුරුන්දයත්) මෙලොව ජීවිතයෙහි වැරදි මාර්ගයෙහිම උත්සහ කරමින් තමන් ඇත්තෙන්ම හොඳ ක්‍රියාවන්ම කරන බවට සිතා ගන්නාහ. (18:104) මෙවැන්නන්ම තමන්ගේ දෙවියන්ගේ ආයාවන්ද, ඔහුව හමු වන්නෙමු යන්නද ප්‍රතික්ෂේප කළ අයයි. ඔවුන්ගේ හොඳ ක්‍රියාවන් සියල්ල විනාශ වී ගියේය. (පින් පව් කිරා බැලීමට) ඔවුන් වෙනුවෙන් විනිශ්චය දිනදී තරාදිය අපි නොසිටුවන්නෙමු (18:105)*

*(ප්‍රතික්ෂේප කරමින් සිටින) ඔවුන්ගෙන් කවුරුන්ට හෝ මරණය ළඟා වුවහොත් (ඔහු තම දෙවියන්ට) "මගේ දෙවියනේ! මාව (ලොවට) අපසු හරවා යවනු මැන. "මා අත්හැර දමා පැමිණි (ලොවෙහි) එහි (මින් පසු) හොඳ කාරණාවන්ම මා කරමින් සිටින්නෙමි" යයි පවසනු ඇත. (එහෙත් එය සිදුවිය හැකි කාරණාවක්) නොව. (මෙවැනි අවස්ථාවේදී) ඔහු කියන පුහු වදනක් (මිස, වෙන කිසිවක් නැත). ඔවුන්ට පෙර එහි (පණදී) නැගිට්ටවන දින දක්වා එක් ආවරණයක් ඇති වනු ඇත. (23:99,100)*

*සූර් (නැමති හොරණෑව) පිඹිනු ලබන දිනදී බලය ඔහුටම අයත් වනු ඇත; (6:73)*

*සූර් පිඹිනු ලැබුවහොත් අහස් හී සිටින්නන්ද, භූමියෙහි සිටින්නන්ද, (අල්ලාහ් අදහස් කරන්නන් හැර) හුස්ම සිර වී (සිහිසුන් වී මැරී වැටී) යන්නෙහුය. අනිත් වර සූර් පිඹිනු ලැබුවහොත් එවෙලේම ඔවුන් සියල්ලන්ම (පණ ලැබ) නැගිට ඉදිරිය බලා සිටිනු ඇත (39:68)*

*සූර් (නැමති හොරණෑව කවදා හෝ) පිඹිනු ලැබුවහොත් එදිනදී ඔවුන් අතරේ බන්ධනයක් නොතිබෙනු ඇත. කෙනෙකුගේ (සුවදුක්) වෙනත් කෙනෙකු නොවිමසනු ඇත. (තම තමන්ගේ දුක් විශාලව පෙනෙනු ඇත). (23:101)*

*එකම එක තිගැස්සෙන සුළු ශබ්දයක් පමණක් (ඇතිවනු ඇත). එවෙලේම ඔවුන් (නැගිට අන්දමන්ද වී) ඇහැරෙන්නේය. (37:19)*

*(අනිත් වතාවේදී කවදා) සූර් (නැමති හොරණෑව) පිඹිනු ලබන්නේද, එවෙලේම ඔවුන් සොහොන් වලින් ඉකුත් වී*

*තමන්ගේ දෙවියන් වෙත (ඉතාමත්) වේගයෙන් දිව එන්නාහ. (36:51)*

*කුමන කාලයකදී (සූර් නැමති නලාව) පිඹිණු ලැබ, වැරදිකරුවන්ව අපි ඒකරාශී කරන දිනදී (බියෙන්) ඔවුන්ගේ ඇස් නිල් වී යනු ඇත. ඔවුන් තමන් තුළ ඉතාමත් පහත් හඬින් (කතා කරමින්) "ඔබ එක් (දින) දහයකට අධික වශයෙන් (ලොවෙහි) රැඳී සිටියේ නැත" (යයි පවසනු ඇත). ඔවුන් කුමක් කතා කරන්නෝද යන්න අපි හොඳින් දන්නෙමු. ඔවුන්ගෙන් ඉතාමත් විනීත ප්‍රධානියා (ඔවුන්ට) "එකම දවසක් මිස, ඔබ රැඳී සිටියේ නැත" යයි පවසනු ඇත. (20:103,104)*

අහස්හිද, භූමියෙහිද ඇති සෑම දැයක්ම රහ්මාන් වෙත වහලුන් වශයෙන් පැමිණෙන්නේය. ඒ සියල්ල ඔහු පූරණ වශයෙන් ගණනය කර දැනගෙන සිටින්නේය. ඒවා සෑම එකක්ම විනිශ්චය දිනදී ඔහු වෙත තනි තනියෙන්ම පැමිණෙනු ඇත. (19:93-95)

(නබියේ!) අපි ජනතාවගේ (ගස්, වැල් ආදී භූමියෙහි ඇති) සියල්ල පහ කරන දින, ඔබ භූමිය සමතලා කර්කශක දැයක් බවට දකින්නෙහිය. (එදිනදී) මිනිසුන්ගෙන් කිසිවෙකුත් අත්හැර නොදමා සියල්ලන්වම ඒකරාශී කරන්නෙමු. (18:47)

එදිනදී යම්කිසි මිනිස් හා ජින් කෙනෙකු වෙතින් හෝ පාපයන් ගැන විමසනු ලබන්නේ නැත. (ඔවුන්ගේ සළකුණු මගින්ම දැන ගනු ලැබේ). (55:39)

මෙම ප්‍රතික්ෂේප කරන්නන් අපව අතහැර දමා අපගේ වහලුන්ව (තමන්ට) ආරක්ෂකයින් වශයෙන් ගත හැකිය යයි අදහස් කරමින් සිටින්නෙහුද? නියත වශයෙන්ම මෙම ප්‍රතික්ෂේප කරන්නන්ට ආගන්තුක සත්කාර කිරීම සඳහා නිරයම පිළියෙල කර ඇත්තෙමු. (18:102). ඔවුන් (කවුරුන්දයත්) මෙලොව ජීවිතයෙහි වැරදි මාර්ගයෙහිම උත්සහ කරමින් තමන් ඇත්තෙන්ම හොඳ ක්‍රියාවන්ම කරන බවට සිතා ගන්නාහ. (18:104). මෙවැන්නන්ම තමන්ගේ දෙවියන්ගේ ආයාවන්ද, ඔහුව හමු වන්නෙමු යන්නද ප්‍රතික්ෂේප කළ අයයි. ඔවුන්ගේ හොඳ ක්‍රියාවන් සියල්ල විනාශ වී ගියේය. (පින් පව් කිරා බැලීමට) ඔවුන් වෙනුවෙන් විනිශ්චය දිනදී තරාදිය අපි නොසිටුවන්නෙමු. (18:105)

(ප්‍රතික්ෂේප කරමින් සිටින) ඔවුන්ගෙන් කවුරුන්ට හෝ මරණය ළඟා වුවහොත් (ඔහු තම දෙවියන්ට) "මගේ දෙවියනේ! මාව (ලොවට) අපසු හරවා යවනු මැන. "මා අත්හැර දමා පැමිණි (ලොවෙහි) එහි (මින් පසු) හොඳ කාරණාවන්ම මා කරමින් සිටින්නෙමි" යයි පවසනු ඇත. (එහෙත් එය සිදුවිය හැකි කාරණාවක්) නොව. (මෙවැනි අවස්ථාවේදී) ඔහු කියන පුහු වදනක් (මිස, වෙන කිසිවක් නැත). ඔවුන්ට පෙර එහි (පණදී) නැගිට්ටවන දින දක්වා එක් ආවරණයක් ඇති වනු ඇත. (23:99,100)

(දෙවියන් පරලොවදී මිනිසුන්ටද, ජින්වරුන්ටද) "මිනිසුනි! හා ජින් සමූහයිනි! ඔබගෙන් ඉකුත් වූ (මාගේ) දූතයින් ඔබ වෙත පැමිණ මාගේ ආයාවන් ඔබට

*සමුදීරණය කර පෙන්වා, ඔබ (මාව) හමුවන මෙම දිනය ගැනද ඔබට බිය ගන්වා අනතුරු ඇඟවූයෙ නැද්ද? යි (විමසනු ඇත). එයට ඔවුන් '(අපගේ දෙවියනේ! ඇත්තය). මෙලොව ජීවිතය අපව රවටා දැම්මේය" යයි තමන්ට විරුද්ධවම සාක්ෂි දරණ අතර ඇත්තෙන්ම තමන් ප්‍රතික්ෂේප කරමින් සිටි බවද, තමන්ට තමන්ම විරුද්ධව ඔවුන් සාක්ෂි දරණු ඇත. (6:130)*

*ඔබ දෙවියන්ගේ සාධකයන් පැමිණෙන (අවසාන) දිනදී, පෙර විශ්වාස නොකර සිට, නැතහොත් විශ්වාස කර සිටීමෙන් අනතුරුව (එම විනිශ්ච දින) ඔවුන් තබන විශ්වාසය කිසිම ප්‍රයෝජනයක් අත් කර දෙන්නේ නැත; (6:158)*

*"මා මිනිසාව නිර්මාණය කර එහි (ජීවයට අවශ්‍යය) මගේ ආත්මය ඇතුළු කළහොත් (ඔහුට ගෞරව කිරීමට) ඔබ නලල බිම තබා සුජූද් කරණු (යයි අණ කළේය). ඒ ආකාරයටම මලායිකාවරුන් සියල්ලන්ම (ඔහුට ගෞරව කිරීම සඳහා) සුජූද් කළහ. ඉබ්ලීස් හැර, ඔහු සුජූද් කරන්නන් සමග එක්කාසු වී සුජූද් නොකර ඇත් වූවේය". (15:29,30,31).*

*(එයට දෙවියන්) "ඕ ඉබ්ලීස්! මම ම මගේ අත්වලින් කළ දැයට ඔබ සුජූද් නොකර සිටීමට ඔබව වළක්වා හැරියේ කුමක්ද? උඩඟු වී ගියෙහිද? නැතහොත් ඔබ උසස් පදවීන්ගෙන් යුත් අයගෙන් (කෙනෙකු) බවට පත් වූවෙහිද? යි කීවේය. (38:75)*

*එයට ඔහු "ඔහුට වඩා මම ම උසස් කෙනෙකි. මාව ඔබම ගින්දරෙන් උත්පාදනය කළෙහිය. ඔහුව(ලැජ්ජාවකි), කිරි මැටියෙන් උත්පාදනය කළෙහිය" යි කීවේය. (38:76)*

*(එවිට දෙවියන්, එසේනම්) "ඔබ මෙතැනින් පිටමං වනු. ඔබ එළවනු ලැබූවෙහිය" යි කීවේය. විනිශ්චය දින දක්වා මගේ ශාපය ඔබ කෙරෙහි නියත වශයෙන්ම තිබෙනු ඇත. (38:77,78)*

*(එවිට ඔහු "මගේ දෙවියනේ! (මරණයට පත් වූවන්) නැගිට්ටවනු ලබන දින දක්වා මට කාල අවකාශය දෙනු මැනව" යි කීවේය. (38:79)*

*එයට දෙවියන්, "නියත වශයෙන්ම ඔබට අවකාශය දෙනු ලැබීය. නියමිත කාලයේ දින දක්වා (ඔබගේ වාරයයි) යයි පැවසුවේය. (38:79,80)*

*දෙවියන් ඔවුන් සියල්ල ඒකරාශී කරන (විනිශ්චය) දිනදී (ජින්වරුන්ට) "ඕ ජින් වාර්ගිකයිනී! ඔබ මිනිසුන්ගෙන් බොහෝමයක් දෙනාව (වැරදි යාමට සලස්වා) ඔබ සමග එක්කාසු කරගත්තා (නොවෙද?" යි විමසනු ඇත. එයට) මිනිසුන්ගෙන් වූ ඔවුන්ගේ මිතුරන් "අපගේ දෙවියනේ! අපගෙන් සමහරෙක් (වෙනස්කම් කළ) සමහරෙකු මගින් ප්‍රයෝජන අත්කරගෙන ඇත්තාහ. අපට ඔබ ඇති කළ කාලය අපි අත් පත් කර ගත්තෙමු. (අපට කුමණ නියෝගයක්ද?)යි විමසන්නාහ. (එයට දෙවියන්) "ඔබට නිරයම වාසස්ථානය වේ. (ඔබගෙන්) අල්ලාහ් (සමාව දීමට) අදහස් කරන්නන් හැර, (අන් සියල්ලම සදහටම) එහි රැඳී සිටිනු ඇත" යයි පවසන්නේය. නියත වශයෙන්ම (නබියේ!) ඔබගේ දෙවියන් ඉතාමත් ඥානවන්තයෙකු හා හොඳින් දන්නෙකු වශයෙන් සිටින්නේය. (6:128)*

*නබියේ, ඔබගේ දෙවියන් ආදම්ගේ පරම්පරාවේ දරුවන් වන ඔවුන්ගේ පිටකොන්දෙන් ඔවුන්ගේ පරම්පරා දරුවන්ව ඉකුත් කර, ඔවුන් තමන්වම ඔවුන්ට සාක්ශියක් වශයෙන්ද තබා (ඔවුන්ට) "මා ඔබගේ දෙවියන් නොවේද"? යි විමසූ විට, "ඇත්තෙන්ම (ඒ ආකාරයටම) අපි සාක්ෂි දරන්නෙමු" යැයි ඔවුන්ගේ පැවසීම (ඔබ ඔවුන්ට) මතක් කර දෙනු. (මන්දයත් මෙය කිසිවෙකුත් මතක් කර නොදුන් බැවින්) නියත වශයෙන්ම අපි මෙය අමතක කර දමා නොසැලිකිලිමත්ව සිටියෙමු" යැයි පරලොව දිනදී ඔවුන් නොකියා සිටීම සඳහාද..,(7:172)*

*තවද අපගේ ආයාවන් සමගද, පැහැදිලි සාධකයන් සමගද මූසාව (අපගේදූතයා වශයෙන් ෆිරවුන් වෙතද, ඔහුගේ ජනතාව වෙතද) නියත වශයෙන්ම අපි යැව්වෙමු. (එබැවින්) ෆිරවුන් වෙතද, ඔහුගේ ප්‍රධානීන් වෙතද (ඔහු ගියේය). ෆිරවුන්ගේ නියෝගය (ඔහුගේ සමූහය) අනුගමනය කරමින් සිටියහ. ෆිරවුන් ගේ නියෝගයන් නම්, ඍජු මාර්ගයෙහි තිබුනේ නැත. විනිශ්චය දිනදී ඔහු තම ජනතාව ඉදිරියේ (මාර්ගෝපදේශකයෙකු වශයෙන්) ගොස් ඔවුන්ව නිරයෙහි සේන්දු කරනු ඇත. ඔවුන් යන තැන ඉතාමත් නපුරුය. (11:96-89)*

*ෆිර්අවුන්ගේ ජනතාව නපුරු දඬුවමෙන් වටකර ගත්තේය; උදේ සවස (මිනී වල තුළ සිටියදී) ඔවුන් නිරා ගින්න බලා යනු ලබන්නාහ. (විනිශ්චය) කාලය සිදුවන දිනදී නම් "ෆිර්අවුන් ගේ ජනතාව දරුණු දඬුවමෙහි ඇතුළු කරනු' (යයි කියනු ලැබේ). (40:45,46)*

*(නබියේ!) අල්ලාහ් හැර, කුමක් ඔවුන් (දෙවියන් යයි) ආරාධනා කරන්නෝද, ඒවා විසින් කිසිවක් උත්පාදනය කළ නොහැක. ඒවාද (ඔහු විසින්) උත්පාදනය කළ දැය වන්නේය. (තවද ඒවා) පණ ඇති දැයද නොව, පණ නැති දැයයි. (මරණයට පත් වූවන්) කවදා (පණ ලබාදී) නැගිටවනු ලබන්නේදැයි යන්නද ඒවා දන්නේ නැත. (එබැවින් ඒවා කුමණ ප්‍රයෝජනයක් නම් ලබා දේවිද?). (16:20,21)*

*මිනිසුනේ! ඔබ, ඔබගේ දෙවියන්ට බිය වනු. නියත වශයෙන්ම විනිශ්චය දින කම්පනයෙන් යුතු ඉමහත් වැඩ සටහනක් වන්නේය. (නබියේ!) එදිනදී, කිරි පොවමින් සිටින සෑම මවක්ම තමන් කිරි පොවන ළදරුවා අමතක කර දමන්නීය. සෑම ගැබිණියකගේම ගැබ්බර සිදී විසිරී යනු ඔබ දකින්නෙහිය. මිනිසුන් සිහි බුද්ධිය සිදී ගියවුන් වශයෙන් සිටිනු ඔබ දකින්නෙහිය; (22:1,2)*

*මිනිසුනේ! ඔබගේ දෙවියන්ට බිය වනු. එක් දිනක් ගැන බිය වනු. (එදිනදී) පියා දරුවාට උදව් කරන්නේ නැත. දරුවා පියාට උදව් කරන්නේ නැත. (සෑම දෙනෙකුම තමන්ව බේරා ගැනීමට ප්‍රයත්න දරමින් සිටින දිනයකි); (31:33)*

*(අපරාධකාරයින් වාසය කරන) කුමන රටක් හෝ විනිශ්චය දිනට පෙර අපි විනාශ කර නොදමා හෝ නැතහොත් දරුණු දඬුවම් නොකර හෝ අතහැර දමන්නේ නැත. මෙසේම (අප වෙත ඇති සිදුවීම් සටහන වන) ලව්හුල් මහ්ෆූල්හී සැලසුම් කර ඇත්තේය. (17:58)*

*("අද දින ඔබ දෙවියන්ව පිළිකුල් කළා වුවද, ඔහු) ඔබව (ප්‍රශ්න කිරීම සඳහා) කැඳවන දින ඔබ ඔහුව නමස්කාර කරමින්ම ඔහු වෙත පැමිණෙනු ඇත:(17:52)*

*"තවද ඔබ ප්‍රතික්ෂේප කළා වුවද, මා (මගේ දූත මෙහෙවර) ඔබ සියල්ලටම සමාන වන සේ ගෙනහැර දැක්වූයෙමි. ඔබට බිය ගන්වනු ලබන දඬුවම*

*(අනිවාර්යයෙන්ම පැමිණෙන්නේය. එහෙත් එය) සමීපයෙහි ඇත්තේද, දුරින් ඇත්තේද යන්න මා නොදන්නෙමි" යයි (නබියේ ඔබ) පවසනු මැනව! (21:109)*

*ප්‍රතික්ෂේප කරන්නන්ට (විනිශ්චය දිනදී), ඔවුන් නොසිතූ සියල්ල අල්ලාහ් වෙතින් ඔවුන්ට එළිදරව් වනු ඇත; (39:47)*

*විනිශ්චය දිනය පැමිණෙන තුරු, නැතහොත් (දරුණු) දඬුවමට අයත් අභාග්‍යය සම්පන්න දිනය ඔවුන් වෙත පැමිණෙන තුරු, මේ ගැන සැකයෙන්ම ගැලී සිටිනු ඇත. (22:55)*

*කවුරුන් අල්ලාහ් වැරදි මාර්ගයේ අත් හැර දමන්නෝද. එවැන්නන්ට උදව් කරන්නන් කිසිවෙකු ඔබ නොදකින්නෙහිය. තවද විනිශ්චය දිනදී ඔවුන්ව අන්ධයින් වශයෙන්ද, ගොළුවන් වශයෙන් ද, බිහිරන් වශයෙන්ද, (පත් කර) ඔවුන් තමන්ගේ මූණින් වැටී බඩගාමින් එන්නට (සලස්වා), ඔවුන්ව ඒකරාශී කරන්නෙමු. ඔවුන් රැඳෙන ස්ථානය නිරයයි; (17:97)*

*විනිශ්චය දිනදී තමන්ගේ පව් බර, මොවුන් පූර්ණ වශයෙන් උසුළන අතර බුද්ධියක් නොමැතිව මොවුන් මාර්ගය වැරද යැවූ අන් අයගේ පව් බරද මොවුන්ම උසුළන්නාහ. (මෙසේ දෙදෙනාගේම පව් බර) මොවුන්ම ඉසිලීම ඉතාමත් නපුරත් නොවේද? (16:25)*

*(නබියේ!) මරණයට පත් වූවන්ට අල්ලාහ් පණ ලබා දී නැගිට්ටවනු ලබන්නේ නැත යයි මෙම ප්‍රතික්ෂේප කරන්නන් අල්ලාහ් මත ඉතාමත් ස්ථිර වූ දිව්රුම් කරන්නාහ. එසේ නොව, "(ඔබට පණ දී නැගිට්ටවන්නෙමි" යයි) ඔහු දුන් පොරොන්දුව සම්පූර්ණයෙන්ම සත්‍යයකි! එහෙත් මිනිසුන්ගෙන් වැඩි දෙනෙක් මෙය දැන ගන්නේ නැත. (16:38)*

*(මෙලොවදී) ඔවුන් තර්ක කරමින් සිටි දැය ඔවුන්ට අල්ලාහ් පැහැදිලිව දැනුම් දීම සඳහාද, ප්‍රතික්ෂේප කරන්නන් තමන්ම බොරුකාරයින් යන්න දැන ගැනීම සඳහාද, (පරලොවදී ඔවුන්ට පණ දෙනු ලබන්නාහ. එසේ ඔවුන්ව නැගිට්ටුවීම අපට එතරම් කාරියක් නොව). (16:39)*

*මෙම අපරාධකාරයින් (පරලොවදී) දඬුවම (ඇස්වලින්) දුටු පසු, (ඔවුන් කුමණ ප්‍රශංසාවක් කළා වුවද), ඔවුන්ට (දඬුවම) අඩු කරනු ලබන්නේ නැත. තවද ඔවුන්ට අවකාශයක් දෙනු නොලැබේ. (16:85)*

*(නබියේ!) මෙසේම (ඔබට) පෙර ඉකුත් වී ගිය අයගෙන් වූ ඉතිහාසයන් (නැවතත්) අපි ඔබට පවසන්නෙමු. අප වෙතින් හොඳ ඔවදන් (වලින් යුත් මෙම ධර්මය) නියත වශයෙන්ම අපි ඔබට ලබා දුන්නෙමු. කවුරුන් එය ප්‍රතික්ෂේප කරන්නේද, ඔහු විනිශ්චය දිනදී නියත වශයෙන්ම (විශාල වූ) පාපයක්ම උසුලණු ඇත. එහි ඔහු සැමදා (එය උසුලාගෙනම) සිටිනු ඇත. විනිශ්චය දිනදී ඔවුන් උසුළන මෙම බර, ඉතාමත් නපුරුය. (20:99-101)*

*විනිශ්චය කාලය සිදුවන දින, (එදිනදී) ඔවුන් (හොඳ අය, නපුරු අය යනුවෙන්) බෙදා වෙන් කර හරිනු ලබන්නාහ. (30:14)*

*භූමිය තම දෙවියන්ගේ ආලෝකය මගින් ආලෝකමත්ව බැබලෙන්නේය, (ඔවුනොවුන්ගේ) සටහන් පිටුව (ඔවුන් ඉදිරියේ) තබනු ලැබේ. නබිවරුන්වද, (ඔවුන්ගේ අනිත්) සාක්ෂීන්ද ගෙන එනු ලැබ, ඔවුන් අතරේ සාධාරණ ලෙස තීන්දු දෙනු ලැබේ. (ඔවුන්ගේ පින් වලින් එක් අනු ප්‍රමාණයක් හෝ අඩුකර හෝ, පපයන්ගෙන් එක් අනු ප්‍රමාණයක් හෝ වැඩි කර හෝ) ඔවුන්ට අපරාධයක් කරනු ලබන්නේ නැත. (39:69)*

*(නබියේ!) ඔබ වෙතින් ඔවුන් කඳු ගැන (ලෝක විනාශයේදී එහි ඉරණම කුමක් සිදු වන්නේදැයි) විමසන්නාහ. (එයට) ඔබ මෙසේ පවසනු. "මගේ දෙවියන් ඒවා සුණු විසුණු කර (සී සීකඩ විසුරුවා) හරිනු ඇත". "ඒවා සමතලා කර හරිනු ඇත". "ඒවායේ පොඩියක් හෝ කඳු පල්ලම් ඔබ නොදකින්නෙහුය". "එදිනදී (සියල්ලන්ම, සැමදා) කැඳවන්නාගේ ශබ්දයම අනුගමනය කර යන්නාහ. එහි කිසිම වරදක් ඇති වන්නේ නැත. රහ්මාන්ට බියවී සියළු ශබ්දයන් අඩු වී යනු ඇත. (පහත් හඬින් වූ) අඩි ශබ්දය මිස, (වෙන කිසිවක්) ඔබ නොඅසන්නෙහිය". එදිනදී රහ්මාන් කවුරුන් හට අනුමැතිය දී ඔවුන්ගේ වදන අසන්නට අදහස් කරන්නේද, ඔවුන්ව හැර වෙන කිසිවෙකුගේ මැදිහත් වීම ප්‍රයෝජනයක් අත් කර දෙන්නේ නැත. ඔවුන්ට ඉදිරියෙන් ඇති ඩහෙයද, පසුපසින් ඇති දැයද, ඔහු*

*හොඳින් දන්නේය. එහෙත් ඔවුන්ට ඔහුව (තමන්ගේ) අධ්‍යාපන දැනුම මගින් දැනගත නොහැකිය. (එදිනදී) සදා අමරණීය ස්ථිර වන්නා (වූ දෙවියන්) ඉදිරියේ සියල්ලන්ගේ මුහුණුද බිමට පහත් වනු ඇත. කවුරුන් අපරාධය උසුළා ගත්තේද, ඔහු පරාජිත වන්නේය. කවුරුන් විශ්වාසය තැබූවන් වශයෙන් සිටිමින් දැහැමි ක්‍රියාවන් කරන්නේද, ඔහු (තමන්ගේ හොඳ ඵලවිපාක පොඩියක් හෝ) විනාශ වී යනු ඇතැයි හෝ අඩු වී යනු ඇතැයි හෝ බිය වන්නේ නැත.(20:99-112)*

*(නබියේ! එම පාපතරයන්) තමන් වෙත හදිසියේ පැමිණිය හැකි විනිශ්චය (දින දඬුවම) මිස, වෙන කිසිවක් ඔවුන් බලාපොරොත්තු වන්නෙහුද? මන්ද යත් එහි සළකුණු නියත වශයෙන්ම පැමිණ ඇත. එය ඔවුන් වෙත පැමිණි පසු (එ ගැන) ඔවුන්ට අවවාද කිරීමෙන් කුමණ ප්‍රයෝජනයක්ද? (47:18)*

*(මරණයට පත් වූවන් වසාගෙන සිටින) භූමිය ඉතාමත් තීව්‍ර වශයෙන් (පුපුරා) ඔවුන්ගෙන් ඈත් වන දිනයද (අවධානයෙන් යුතුව තබා ගනු). එය (විනිශ්චය සඳහා සියල්ලන්වම) ඒකරාශී කරන දිනයයි. (මෙසේ ඒකරාශී කිරීම) අපට ඉතාමත් පහසු දැයකි. (50:44)*

*(නබියේ! ඔවුන්ට ඔබ එක් දිනක් ගැන මතක් කර දෙනු. පිළිරූ වන්දනා කරන්නන් තමන්ගේ උත්සව දිනයන්හී පූජාව සඳහා සිටුවන ලද) කොඩි දෙසට වේගයෙන් දිව යන්නාක් මෙන් සොහොන් වලින් පිටවී (මහෂර් නැමති පිටියට) ඉතා තීව්‍රව යන්නාහ. (70;43)*

*සූර් පිඹිනු ලබන දිනදී, අල්ලාහ් (බේරා ගැනීමට) අදහස් කරන අය හැර, අහස් හිද, භූමියෙහිද, සිටින සියල්ලන්ම තිගැස්සී වෙව්ලමින් හිස නවාගත් අය වශයෙන් ඔහු වෙත පැමිණ සේන්දු වනු ඇත. ඔබ දකින කඳු, ඒවා ඉතාමත් ස්ථිරව සිටින බවට අදහස් කරමින් සිටින්නෙහුය. (එහෙත් එදිනදී) ඒවා වලාකුළු මෙන් (අහසෙහි) විසිරී පියාඹා යනු ඇත. සෑම වස්තුවක්ම (උත්පාදනය කර), ස්ථිර වශයෙන් පිළිවෙලකට තැබූ අල්ලාහ්ගේ කලාවට අනුව (එසේ සිදුවනු ඇත); (27:87,88)*

*අහස් වලාකුළෙන් වෙන් වෙන දිනදී මලායිකාවරුන් සමූහ සමූහ වශයෙන් බසිනු ඇත. එදිනදී සත්‍යය වූ රාජ්‍යය රහ්මාන් (එක්කෙනෙකු)ටම ඇත්තේය. (එය)*

*ප්‍රතික්ෂේප කරන්නන්ට (ඉතාමත්) දරුණු දිනයක් වශයෙන්ද තිබෙණු ඇත. (25:25,26)*

*එදිනදී අහස අධික ලෙස රත් වූ තඹ මෙන් (රතු පැහැය) බවට පත් වන්නේය. කඳු පුළුන් මෙන් පාවී යනු ඇත. (එසේම) එක් මිතුරෙකු තවත් මිතුරෙකුගෙන් සුවදුක් විමසන්නේ නැත. (ඔවුන්) කෙනෙකු තවත් කෙනෙකුව මුණ ගැහෙන්නට සිදු වුනා වුවද (කම් නැත!). වැරදිකරුවන් එදිනදී දඬුවමට වන්දි වශයෙන් තමන්ගේ දරුවන්වද, තමන්ගේ භාර්යාවන්වද,තමන්ගේ සහෝදරයන්වද, තමන් ආධාර උපකාර කරමින් සිටි තමන්ගේ ඥාතීන්වද, තවද භූමියෙහි ඇති සියල්ලම දී හෝ බේරෙන්නට කැමති වනු ඇත. (එහෙත් එය) සිදුවන්නට හැකි දැයක් නොව; (70:8-15)*

*මෙදිනදී අපරාධකරයා තමන්ගේ දෑත් සපා ගනිමින් (අපගේ) "දූතයා සමග මමත් (ඍජු) මාර්ගය අනුගමනය කර ගියා නම් හොඳයි නොවේද?" යි පවසනු ඇත. (තවද) "මගේ ශෝකයයි! (පාපයන් කරන මෙන් මාව පෙළඹවූ) අසවලා, මා මගේ මිතුරෙකු වශයෙන් නොගෙන සිටියා නම් හොඳයි නොවේද? මා වෙත හොඳ ඔවදන් පැමිණි පසුවද, එයින් ඔහුම මාව මාර්ගය වැරද යැව්වේය! එම ෂෙයිතාන්, මිනිසාට ඉමහත් කුමන්ත්‍රණ කාරයෙකු වශයෙන් සිටියේය!" (යයිද විලාප නගනු ඇත). (25:28,29)*

*"කවුරුන් මගේ ඔවදන් ප්‍රතික්ෂේප කරන්නේද, ඔහුගේ ජීවිතය නියත වශයෙන්ම ඉතාමත් දුක් ගැහැට වලින් පිරි එකක් වශයෙන්ම තිබෙණු ඇත. විනිශ්චය දිනදී නම්, අපි ඔහුව අන්ධයෙකු වශයෙන්ම නැගිටවන්නෙමු" යි පැවසුවේය. (20:124)*

*මිනිසුන්ගෙන් සමහරෙක් අධ්‍යාපන දැනුම හෝ, (තර්කානුකූල) ඍජු මාර්ගය හෝ පැහැදිලි ධර්ම (සාධකයන්) හෝ නොමැතිවම අල්ලාහ් ගැන තර්ක කරන්නාහ. අල්ලාහ්ගේ මාර්ගයෙන් (ජනතාව) හරවා දමනු පිණිස, උඩඟුකමින් යුතුව (මෙසේ තර්ක කරන්නාහ). මෙලොවදී ඔවුන්ට අවමානයයි. විනිශ්චය දිනදී නම්, දැවෙන ගින්නෙහි දඬුවමම ඔවුන්ට විඳින්නට සලස්වන්නෙමු. (22:8,9)*

*භය භක්තිකයන් මිස, (ප්‍රතික්ෂේප කරන්නන්ගේ) මිතුරන්ම එදිනදී කෙනෙකුට කෙනෙකු සතුරන් බවට පත් වනු ඇත. (43:67)*

*විශ්වාසවන්තයින්ද, යුදෙව්වන්ද, (පිළිම නමදින) සාබීයින්වරුන්ද, ක්‍රිස්තියානුවන්ද, (ගින්දර නමදින) මජූසි වරුන්ද, සමානයන්තබා නමදින්නන්ද, (ආදී සෑම දෙනාම, තමන්ම) ඍජු මාර්ගයෙහි සිටින්නන් යයි පවසන්නාහ. එහෙත් කවුරුන් ඍජු මාර්ගයෙහි ඇත්තේය යන්න මොවුන් අතරේ නියත වශයෙන්ම අල්ලාහ් විනිශ්වය දිනදී තීන්දුවක් දෙනු ඇත. (මොවුන්ගේ ක්‍රියාවන්) සියල්ල අල්ලාහ් නියත වශයෙන්ම අවධානය කරමින්ම සිටින්නේය. (22:17)*

*(අවසාන දිනය ගැන වූ) පොරොන්දුව ඔවුන්ට ලඟා වූ අවස්ථාවේදී ඔවුන් වෙනුවෙන් භූමියෙන් එක් සතෙකු අපි ඉකුත් කරන්නෙමු. එය නියත වශයෙන්ම (කුමන) මිනිසුන් අපගේ ආයාවන් විශ්වාස නොකළෝද, යන්න ඔවුන්ට කියා පානු ඇත. (27:82)*

*නියත වශයෙන්ම ඔහු (ඊසා අ.ස) පැමිණීම විනිශ්වය කාලයට අයත් සාධකයක් වන්නේය. එබැවින් නියත වශයෙන්ම ඔබ මෙහි සැක නොසිතනු. මාවම අනුගමනය කර කටයුතු කරනු. මෙයම ඍජු මාර්ගය වන්නේය. (43:61)*

*(යුග අවසානය නැමති) අති විශාල සිද්ධිය සිදු වුවහොත්, එම සිද්ධිය බොරු කරන කිසිවෙකුත් නැත. එය බොහෝමයකගේ තත්වය පහත හෙලා දමනු ඇත. බොහෝමයකගේ තත්වය උසස් කර හරිනු ඇත, ඒ අවස්ථාවේදී ඉතාමත් බලසම්පන්න භූමිකම්පාවක් ඇති වී, කඳු (විනාශ වී එකකට එකක් ගැටී) සුණු විසුණු වී දූවිලි අනු බවට පත් වී, ඒවා (අහසෙහි) දූවිලි වශයෙන් පාවී යනු ඇත. (56:1-6)*

*එදිනදී ඔබ කොටස් තුනකට බෙදී යන්නෙහුය. (පළමුව) දකුණු පාර්ශවයේ ඇති අයයි. දකුණු පාර්ශවයේ ඇති අය කවුරුන්ද (යන්න ඔබ දන්නෙහුද? ඔවුන් ඉතාමත් භාග්‍යයවන්තයින්ය). (දෙවනුව) වම් පාර්ශවයේ ඇති අයයි. වම් පාර්ශවයේ ඇති අය කවුරුන්ද (යන්න ඔබ දන්නෙහුද? ඔවුන් ඉතාමත් අභාග්‍යයවන්තයින්ය). (තුන්වෙනුව) පෙර ඉකුත්ව ගිය අයයි. (මොවුන් දැහැමි කාරණාවන්ගෙන් අන් සියල්ලටම වඩා) පෙර ඉකුත්ව ගිය අයයි. (56:7-10)*

(ඔවුන් සමග සිටින) ඔබගේ පරම්පරාවේ දරුවන්ද, ඔබගේ ඥාති සම්බන්ධකම්ද, විනිශ්චය දිනදී ඔබට කිසිම ප්‍රයෝජනයක් අත් කර දෙන්නේ නැත. එදිනදී අල්ලාහ් ඔබ අතරේ තීන්දු දෙනු ඇත); (60:3)

(එකකට පසු එකක් වශයෙන්) ක්ෂනිකව යවන ලද සුළං මතද, වේගයෙන් හමන සුළි සුළං මතද, විසුරුවා හැරිය වැහි වළාකුළු මතද, (ඇත්ත බොරුව අතරේ) පැහැදිලිව වෙන් කර ඇති දැය (වන ධර්මය) මතද, මතක් කර දෙන අය (දූතයන්) මතද, සමාව හෝ නැතහොත් අනතුරු ඇඟවීම මතද සත්තකින්ම! නියත වශයෙන්ම ඔබට පොරොන්දු දෙන ලද දැය අනිවාර්යයෙන්ම පැමිණෙන්නේය. (77:1-7)

ඒ අවස්ථාවේදී තාරකාවන්ගේ තම ආලෝකය සිඳී යනු ඇත. අහස පැළී යනු ඇත. කඳු (දූවිලි මෙන්) පාවී යනු ඇත. නියමිත කාලයෙහි (සාක්ෂි කීමට) දූතයින්ව ඒකරාශී කරනු ලබන්නාහ. (මේ සියල්ල) කුමන දවසක් දක්වා කල් දමා ඇත්තේද, (යන්න නබියේ! ඔබ දන්නෙහිද?). විනිශ්චය දෙනු ලබන එදින දක්වායි. (77:8-13)

(නබියේ!) තීන්දු දෙනු ලබන දවසේ ගුණාංගයන් ඔබ දන්නෙහිද? අපගේ ආයාවන් බොරු කළ අයට එදිනදී විනාශයයි! (එය බොරු කරමින් සිටි) පෙර සිටියවුන්වද අපි විනාශ කර දැමුවේ නැද්ද? ඊට පසු සිටි අයවද (විනාශ වී ගිය ඔවුන්ව), අනුගමනය කරන මෙන් සලස්වා, (ඔවුන්වද විනාශ කර දැමුවෙමු). එබැවින් අපගේ ආයාවන් බොරු කරන්නන්ට එදිනදී විනාශයයි. (77:14-19)

(යුග අවසානය සඳහා) සූර්යයාගේ ආලෝකය මැකී යන විට, තාරකාවන්ගේ දීප්තිමත් ආලෝකය සිඳී කඩා වැටෙන විට, කඳු තල්ලුකර, පාවෙන්නට සලස්වන විට, (දස මස්) ගැබ්බර ඔටු දෙනුන් සලකන්නට කෙනෙකු නොමැතිව ඒ මේ අත විසිරී යන්නට අත්හැර දමන විට, කැලේ සතුන් (ගම්වල) ඒකරාශී කරනු ලබන විට, මුහුදු උතුරා (ගොද ගොද ගා) නටන්නට සලස්වන විට, පණපිටින් වළලනු ලැබූ ගැහැණු දරුවන්ට "කුමණ වරදක් සඳහා (පනපිටින් වළලනු ලැබ) ඝාතනය කරනු ලැබුවෙහුද?" යි විමසනු ලබන්නාහ. විනිශ්චය සඳහා මිනිසුන්ගේ) ක්‍රියාකාරකම් ලේඛන දිගහරිනු ලබන විට, අහස් (පැලී) ඇත් කරනු ලබන විට,

*නිරය දවනු ලබන විට, ස්වර්ගය (අලංකාරවත් කරනු ලැබ,) සමීපයට ගෙන එනු ලබන විට, සෑම ආත්මයක්ම (පින් හෝ පව් හෝ) තම ඉදිරියේ තිබීම හොඳින් දැන ගනු ඇත. (81:1-14)*

*එදිනදී මිනිසුන් සියල්ලන්ම ලෝකයන්හී අධිපති දෙවියන් ඉදිරියේ (විනිශ්චය සඳහා) සිටගෙන සිටිනු ඇත. එහෙත් පාපතරයින්ගේ ලැයිස්තුව සිජ්ජීන්හී ඇත්තේය. (නබියේ!) සිජ්ජීන් යනු කිමෙක්දැයි ඔබ දන්නෙහිද? (එය එක්තරා සටහන්) පොතකි. (දඬුවම් කරනු ලැබිය යුතු අයගේ නම් සියල්ල එහි) සටහන් කරනු ලැබ ඇත්තේය. මෙය බොරු කරන්නන්ට එදිනදී විනාශයයි. ඔවුන් (මෙය පමණක්ද බොරු කරන්නේ?) ඵලවිපාක දෙන දිනයද බොරු කරන්නාහ. සීමාව ඉක්මවූ පාපතරයින් සියල්ලන්ම හැර (වෙන කිසිවෙකුත්) එය බොරු කරන්නේ නැත. (83:6-12)*

*මිනිසාණෙනී! ඔබ ඔබගේ දෙවියන් වෙත යන තුරු (හොඳ හෝ නරක හෝ විවිධ වැඩ කටයුතුවල නිරත වී) අමාරුවෙන් උත්සාහ කරමින් සිටින්නෙහිය. පසුව (විනිශ්චය දිනදී) ඔබ ඔහුව හමුවන්නෙහිය.*

*එබැවින් (එදිනදී) කවුරුන්ගේ දකුණු අතෙහි ඔහුගේ ක්‍රියාකාරකම් සටහන ලබා දෙනු ලැබ ඇත්තේද, ඔහුගෙන් ඉතාමත් පහසුවෙන් ගණනය විමසණු ලබන්නේය. ඔහු සතුටට පත් වූවෙකු වශයෙන් (ස්වර්ගයෙහි සිටින) තමන්ගේ පව්ලේ උදවිය වෙත ආපසු හැරෙන්නේය. කවුරුන්ගේ ක්‍රියාකාරකම් සටහන ඔහුගේ පිට කොන්ද පැත්තෙන් දෙනු ලබන්නේද, ඔහු තමන්ටම විනාශයයි කෑ ගසමින්, දැවෙන ගින්න සහිත නිරයට ඇතුළු වන්නේය. (84:6-12)*

---

## දෙවියන්ගේ වෙනත් විශේෂ නිර්මාණ

- ඉබ්ලීස්, ජින්වරු, ෂෙයිතාන්වරු
- මලායිකාවරුන්
- ස්වර්ගය
- නිරය (අපාය)

- ➢ දෙවියන් ගේ අවසන් හෙළිදරව්ව (අල් කුරාණය)
- ➢ බයිතුල් ඉස්සා, බයිත්-උල්-මාමූර්, සිද්රතුල් මුන්තහා ගස, සිරාත් පාලම, අල් කුර්සි, පෑන, ලවුහ් අල් මහ්ෆූද්, අර්ෂ්

## ස්වර්ගය

අපි මෙලොවෙහිම ඉතා ලස්සන තැන් දකින්නෙමු. ගොඩක්ම ලස්සන තැන් වලට අපි කියන්නෙ හරියට ස්වර්ගය වගේ කියලයි. එනම්, අපේ යටි හිත හඳුනා ගෙන ඇති දෙයක් තමයි ස්වර්ගය කියන්නෙ ඉතාම ලස්සන තැනක් බව.

අපේ මුල්ම පියා සහ මව (ආදම් සහ හව්වා අ.ස) ස්වර්ගයේ ජීවත් වූ අයයි. අපේ ආත්මයන් පවා ස්වර්ගයෙහිදී ආරම්භ වූ ඒවාය. එනිසා අපිටත් ස්වර්ගයෙහි යම් උරුමයක් තියෙනවා. නමුත් එය (නැවත) ලබා ගන්න නම් අපිට ලොකු වෙහෙසක් දරන්න වෙනවා. ස්වර්ගය ගැන සඳහන් තොරතුරු ස්වල්පයකුත් එය ලබා ගත හැකි මාර්ගෝපදේශයකුත් අප වෙත ලැබිලා තියෙනවා.

පහතින් සඳහන් කර ඇත්තේ අපවත්, ස්වර්ගත් නිර්මාණය කල දෙවියන්ම මිනිසුන් වෙනුවෙන් නිමවා ඇති ස්වර්ගය ගැන සහ නැවත එය වෙත යා හැකි මාර්ගය ගැන හෙළි කල තොරතුරු ස්වල්පයකි.

*කවුරුන් (දෙවියන්ට) බිය වී කටයුතු කරන්නෝද, ඔවුන්ට දෙවියන්ගේ සන්නිධානයෙන් ස්වර්ගයන් ඇත; (3:15)*

*අල්ලාහ් නම්, තම දයාව මගින් ස්වර්ගයටද (තමන්ගේ) ක්ෂමාවටද (ඔබව) ආරාධනා කරන්නේය. මිනිසුන්ට සිතට (ගෙන) කටයුතු කරණු පිනිස තමන්ගේ ආයාවන් (වැඩිදුරටත්) විවරණය කරන්නේය; (2:221)*

*(නබියේ!)"කවුරුන් (මෙම ධර්මය) විශ්වාස කර, (මෙහි සඳහන් ව ඇති අන්දමට) දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම (ස්වර්ගයෙහි) දිය දහරා සදාකල් ගලමින් ඇති උයන් වතු ඇත" යයි ඔබ සුභාරංචි දෙනු මැනව! ඒවායේ (ඔවුන්ට) පලතුරක් කෑමට ලබා දෙන සෑම විටම "කලින් අපට ලබා දෙනු ලැබුවේද මේවා නොවේද?"යි (විමතියට පත්වෙමින්) පවසන්නාහ. (මන්දයත්,*

*බැලූ බැල්මට) එකම විදිහේ පෙණුමක් ඇති දැයම දෙනු ලබන්නාහ. (එහෙත් ඒවා රසයෙන් විවිධව ඇත). ශුද්ධ වූ වල්ලභයන්ද එහි ඔවුන්ට ඇත. තවද ඔවුන් එහි සදාකල් රැඳී සිටින්නාහ. (2:25)*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම විඳින්නාහ. එහෙත් ඔබගේ (ක්‍රියාවන්ට සරිලන) ඵලවිපාක ඔබ පූර්ණ වශයෙන් අත් කර ගන්නේ විනිශ්චය දින දීය. එබැවින් (එදින) කවුරුන් (නිරා) ගින්නෙන් ඈත් කර, ස්වර්ගයන් හී ඇතුළු කරනු ලබන්නේද, ඔහු නියත වශයෙන්ම (ඉමහත්) භාග්‍යය අත් කර ගත්තේය. මෙලොව ජීවිතය වශී කල හැකි (අල්ප) සුවයම මිස වෙන කිසිවක් නැත. (3:185)*

*කවුරුන් (ෂෙයිතාන්වරුන්ව) ප්‍රතික්ෂේප කර දමා අල්ලාහ් මත විශ්වාසය තබා දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ව (පරලොවදී) අපි ස්වර්ගයන්හී ඇතුළු කරන්නෙමු. ඒවායෙහි දිය දහරා සදාකල් ගලමින් ඇත්තේය. ඔවුන් ඒවායෙහි සදාකල් රැඳී සිටිනු ඇත. අල්ලාහ්ගේ (මෙම) පොරුන්දුව (සම්පූර්ණයෙන්ම) සත්‍යයකි. අල්ලාහ්ට වඩා ඇත්ත කියන්නේ කවරෙක්ද? (4:122)*

*එබැවින් පිරිමි වුවද, ගැහැනු වුවද, ඔවුන් ඇත්තෙන්ම විශ්වාසය තබා දැහැමි ක්‍රියාවන් කරන්නොද, ඔවුන්ම ස්වර්ගයට යන්නාහ. ඔවුන්ට පොඩියක් හෝ අසාධාරණයක් කරණු නොලබන්නාහ. (4:124)*

*කවුරුන් අල්ලාහ්ට සමානයන් තබන්නේද, ඔහුට නියත වශයෙන්ම අල්ලාහ් ස්වර්ගය වළක්වා හරින්නේය. ඔහු රැදෙන ස්ථානය නිරයයි. මෙවැනි අපරාධකාරයින්ට (විනිශ්චය දිනදී) උදව් කරන්නන් කිසිවෙකුත් නැත; (5:72)*

*(නබියේ!) ක්‍රිස්තියානුවෙකු වශයෙන් හෝ යුදෙව්වෙකු වශයෙන් සිටින්නන් හැර,(වෙන කිසිවෙකුත්) ස්වර්ගයට ඇතුළු වන්නේ නැත යයි ඔවුන් (ඔවුනොවුන්ට) පවසන්නාහ. මෙය ඔවුන්ගේ පුහු විශ්වාසයක් මිස, (ඇත්තක් නොව, එබැවින් ඔවුන්ට නබියේ!) ඔබ මෙසේ කියනු. "ඔබ ඇත්ත පවසන්නන් බවට සිටින්නෙහු නම් ඔබ ඔබගේ (මෙම වදනට) සාධකයන් ගෙන එනු".(2.111)*

*(විශ්වාසවන්තයිනි!) ඔබට පෙර ඉකුත්ව ගිය අයට සිදු වූවාක් මෙන් (ඉතාමත් අමාරුකම් වූ) තත්වයක් ඔබට නොපැමිණීම ඔබ ස්වර්ගයට ඇතුළු විය හැකි යැයි සිතා ගත්තෙහුද?;(2:214)*

*(විශ්වාසවන්තයිනි!) ඔබගෙන් (අල්ලාහ් වෙනුවෙන්) යුද්ධ කරන්නේ කවරෙක්ද? (අමාරුකම් ඉවසිලිවන්තව) විඳ දරාගන්නේ කවරෙක්ද යන්න අල්ලාහ් නොදැන, ස්වර්ගයට යා හැකි යයි ඔබ අදහස් කරමින් සිටින්නෙහුද? (3:142)*

*ආදම්ගේ දරුවනි! ෂෙයිතාන් ඔබගේ දෙමව්පියන්ව (ඔවුන් ඉතාමත් සැප පහසුවෙන් වාසය කල) උයනෙන් පිටමං කර (දුක් කරදර වලට ඇතුළු කළ) ආකාරයටම, ඔබවත් දුක් ගැහැට වලට ඇතුළු නොකරත්වා! ඔවුන්ගේ රහස් ස්ථානයන් ඔවුන්ට පෙන්වීම පිණිස ඔහු ඔවුන්ගේ ඇඳුම් ගලවා දැමුවේය. නියත වශයෙන්ම ඔහුද, ඔහුගේ වාර්ගිකයින්ද, ඔබ ඔවුන්ව දැක ගැනීමට නොහැකි වනසේ (සැඟ වී සිටිමින්) ඔබව (මාර්ගය වැරද යාමට සැලැස්වීමට අවස්ථාවක්) බලමින් සිටින්නාහ. නියත වශයෙන්ම විශ්වාසය නොතැබුවන්ටම එම ෂෙයිතාන්වරුන්ව අපි මිතුරන් බවට පත් කර ඇත්තෙමු. (7:27)*

*නියත වශයෙන්ම කවුරුන් අපගේ ආයාවන් බොරු කර ඒවා ප්‍රතික්ෂේප කිරීම ආඩම්බරයක් වශයෙන් ගත්තෝද, ඔවුන්ට (දෙවියන්ගේ වරප්‍රසාදයන්ට හිමි) අහස් හී දොරටු විවෘත කරනු නොලැබේ. ඉඳිකටුවේ සිදුර තුලින් ඔටුවෙකු රිංගන තුරු ඔවුන් ස්වර්ගය අත් කර ගන්නේ නැත. වැරදි කරුවන්ට මේ අයුරින්ම අපි ඵලවිපාක දෙන්නෙමු. (7:4)*

*කවුරුන් විශ්වාසය තබා (තමන් විසින් හැකි පමණින්) දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ගෙන් කිසිවෙකුත් ඔවුන්ගේ ශක්ති ප්‍රමාණයට වැඩියෙන් අපි බල කරන්නේ නැත. මෙවැන්නන්ම ස්වර්ගවාසීන්ය. එහි ඔවුන් සදාකල් රැඳී සිටින්නාහ. (7:42)*

*මෙලොවෙහි (කෙනෙකුට කෙනෙකු ගැන තිබූ) වෛරයද ඔවුන්ගේ සිත් වලින් පහ කර හරින්නෙමු. (එබැවින් කෙනෙකුට කෙනෙකු ඉතාමත් සමීප මිතුරන් බවට පත්වනු ඇත); (7:43)*

*කවුරුන් ඇත්තෙන්ම විශ්වාසය තබා, දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන් පිර්දවුස් නැමති ස්වර්ගයන්හී (අමුත්තන් වශයෙන්) ආගන්තුක සත්කාර කරනු ලබන්නාහ. ඔවුන් එහි සදාකල් ස්ථිර වනු ඇත. එයින් පිටමං වීමට කැමතිම නොවන්නාහ. (18:107,108)*

*(ඒවායෙහි) සලාම් (සාමය හා සමාදානය) යන්න මිස, පුහු වදන් සවන් දෙනු නොලබන්නාහ. එහි ඔවුන්ට උදේ හවස (ඉතාමත් උසස්) ආහාරද ලබා දෙනු ලැබේ. මෙවැනි ස්වර්ග අපගේ වහලුන්ගෙන් භය භක්තිකයන් හට උරුම කර දෙන්නෙමු. (19:62,63)*

*(එබැවින් පරලොවදී මොවුන්ට) "ඔබද ඔබගේ භාර්යාවන්ද ඉතාමත් සතුටින් ස්වර්ගය තුලට ඇතුළු වනු" (යයි කියනු ලැබේ). විවිධ වර්ගයේ ආහාරයන් හා පානයන්ගෙන්ද පිරි) රණ් බන්දේසිද, කුසලානද, ඔවුන් වටා කැරකෙමින් තිබෙණු ඇත. එහිදී ඔවුන් සිත් ඇළුම් කරන දැයද, ඔවුන්ගේ ඇස් පිනා යන දැයද ඔවුන්ට ලැබෙනු ඇත. (ඔවුන්ට) "මෙහි සදාකල් ඔබ වාසය කරමින් සිටිනු" (යයිද කියනු ළැබේ). (43:70-73)*

*පරිශුද්ධවන්තයන්ට පොරොන්දු දෙන ලද ස්වර්ගයෙහි උදාහරණය නම්, එහි හානියකින් තොර (පරිශුද්ධ වූ) දිය දහරා ඇත්තේය. (පරිශුද්ධ වූ) රසය වෙනස් නොවන කිරි වලින් යුත් ගංගාවන්ද ඇත්තේය. පානය කරන්නන්ට ඉමිහිරි රසයක් ගෙන දිය හැකි මිදි රසයෙන් පිරි ගංගාවන්ද ඇත. තවද පැහැදිලි මී පැණි ගංගාවන්ද ඇත්තේය. තවද, එහි ඔවුන්ට සියළු අන්දමේ පලතුරු වර්ගද, තමන්ගේ දෙවියන්ගේ සමාවද (ඔවුන්ට) ඇත; (47:15)*

*කවුරුන් තම දෙවියන්ගේ සන්නිධානයට බිය වන්නේද, ඔහුට (ස්වර්ගයෙහි) උයන් දෙකක් ඇත. මේ දෙකම අතුවලින් ගහනව (පිරී) පවතී, ඒ දෙකේම උල්පත් දෙකක් (සදාකල්) මතුවී ගලා බසිමින්ම ඇත්තේය. ඒ දෙකේම සෑම පලතුරු වර්ගයක්ම (ඉදුණු හා අමු වශයෙන්) දෙවර්ගයක් ඇත. ඉස්තබරක් නැමති සේද මෙට්ටයන් (යහනාවන්) මත හන්සි වී සිටින්නන් වශයෙන් සිටිනු ඇත. එම උයන් දෙකේ පලතුරු වර්ග (කඩා ගැනීමට) ළං වී තිබෙනු ඇත.ඒවායෙහි පහත බැල්මෙන් යුත් (අලංකාරවත්) කන්‍යාවන්ද සිටිනු ඇත. මොවුන්ට පෙර*

කිසි මිනිසෙකු හෝ ජින්වරයෙකු හෝ ස්පර්ශ කර නැත. ඔවුන් රතු මිණි කැට මෙන්ද, පබළු මෙන්ද සිටිනු ඇත. මේ දෙක හැර (ස්වර්ගයෙහි ඔවුන්ට තවත්) උයන් දෙකක් ඇත. ඒ දෙකම තද කොළ වර්ණයෙන් යුක්තය. ඒ දෙකේම උල්පත් දෙකක් (සදාකල්) උතුරා ඉකුත් වෙමින්ම සිටිනු ඇත. ඒ දෙකේම (විවිධ වර්ගයේ) පලතුරුද, ඉඳිද, දෙළුම් ද ඇත. ඒවායේ අලංකාරවත්, හොඳ ගුණවත් හා හොඳ හැඩරුවින් යුත් කන්‍යාවන්ද ඇත්තේය. (ඔවුන්ම) හූර් (නැමති අලංකාරවත් කන්‍යාවන්)ය. ඔවුන් (මුතු, පබලු වලින් නිමා කරන ලද) කූඩාරම්හී වාසය කරන්නාහ. මොවුන්ට පෙර ඔවුන්ව කිසිම මිනිසෙකු හෝ ජින්වරයෙකු ස්පර්ශ කර නැත. (ස්වර්ගවාසීන්) උසස් කොළ වර්ණයෙන් යුත් මැණික් ඔබ්බන ලද ලෝම ඇතිරිල්ලෙහි (ආහාර) අනුභව කර, කොට්ට මත හාන්සි වී සිටින්නන් වශයෙන් සිටින්නාහ. එබැවින් ඔබ සමූහයන් දෙකම දෙවියන්ගේ වරප්‍රසාදයන්ගෙන් කුමක් නම් බොරු කරන්නෙහුද?;/// (55:46-77)

(විනිශ්චය සඳහා මිනිසුන්ගේ) ක්‍රියාකාරකම් ලේඛන දිගහරිනු ලබන විට, අහස (පැළී) ඇත් කරනු ලබන විට, නිරය දවනු ලබන විට, ස්වර්ගය (අලංකාරවත්) කරනු ලැබ), සමීපයට ගෙන එනු ලබන විට, සෑම ආත්මයක්ම (පින් හෝ පව්) තම ඉදිරියේ හොඳින් දැන ගනු ඇත. (81:10-14)

(විනිශ්චය දිනදී) ඔබ කොටස් තුනකට බෙදී යන්නේහුය. (පළමුව) දකුණු පාර්ශවයේ ඇති අයයි. දකුණු පාර්ශවයේ සිටින ඔවුන් කවුරුන්ද (යන්න ඔබ දන්නෙහිද) ඔවුන් ඉතාමත් භාග්‍යයවන්තයින්ය. (56:7,8)

(දෙවනුව) වම් පාර්ශවයේ ඇති අයයි. වම් පාර්ශවයේ සිටින ඔවුන් කවුරුන්ද (යන්න ඔබ දන්නෙහිද) ඔවුන් ඉතාමත් අභාග්‍යයවන්තයින්ය. (56:9)

(තුන්වෙනුව) පෙර ඉකුත්ව ගිය අයයි. (මොවුන් දැහැමි කාරණාවන්හි අන් සියල්ලටම වඩා) පෙර ඉකුත්ව ගිය අයයි.මොවුන් (තමන්ගේ දෙවියන්ට) ඉතාම සමීප වූ අයයි. (56:10,11)

(ස්වර්ගයන්හී) පළමු කොටසේ අයගෙන් විශාල සමූහයක්ද, (පෙර ඉකුත්ව ගිය) පසුව සිටින්නන්ගෙන් සුළු ගනනක්ද සිටින්නාහ. (රණ්, දියමන්ති වලින්) නිමවූ සිංහාසනයන් මත- කෙනෙකුට කෙනෙක් මුහුණ ලා ඒ මත හාන්සි වී සිටින්නන්

*වශයෙන් සිටිනු ඇත. මේ වෙනුවට ලාබාල තරුණයෙන් (සේවය කිරීමට සෑම විටම) මොවුන් වටා කැරකෙමින් සිටින්නාහ. මිහිරි පානයන්ගෙන්ද, කෙණ්ඩිද, බඳුන්ද ඔසවාගෙන (ඔවුන් වටා කැරකෙමින් සිටිනු ඇත) එමගින් (එම පානයන් පානය කිරීම මගින්) මොවුන්ට හිසරදය ඇති නොවේ. මොවුන්ගේ සිහි බුද්ධියද වෙනස් නොවේ. මොවුන් (කැමති වී) තෝරාගන්නා පලතුරු (වර්ග)ද, කැමති පක්ෂීන්ගේ මස් ද, (එම තරුණයින් උසුලාගෙන ඒ මේ අත සැරිසරනු ඇත). (එහි මොවුන්ට) හූරුල් ඊන් (නැමති අලංකාරවත් කන්‍යාවන් වන භාර්යාවන්)ද, සිටිනු ඇත. ඔවුන් ආරක්ෂා කරන ලද මිණි මුතු මෙන් (සිටිනු ඇත). මේ සියල්ල මොවුන් කළ (පින් ඇති) ක්‍රියාවන්ට ඵලවිපාක වශයෙන් ලැබෙනු ඇත; (56:13-24)*

*(එදිනදී හොඳ වහලුන්ට) "ඕ තෘප්තියට පත් ආත්මය! ඔබ ඔබගේ දෙවියන් දෙසට යනු! ඔහු මගින් ඔබ තෘප්තියට පත් වනු! ඔබ ගැන ඔහු තෘප්තියට පත් වී ඇත්තේය. ඔබ මගේ හොඳ වහලුන් සමග එකතු වී- මගේ ස්වර්ගයෙහිද ඔබ ඇතුළු වනු! (යයිද පවසනු ඇත). (89:27-30)*

අල්ලාහ් කෙරෙහි විශ්වාසය තැබූ පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුගේ ආත්මය ගමන් කරන දිශාවන්.

අල්ලාහ්ව විශ්වාස කරමින් සිටි අයෙකු මිය ගිය පසු ඔහුගේ ආත්මය මලායිකාවරයෙකු විසින් පලමු අහසේ ඉහලට එය ගෙන යයි. ඉන් පසු එතැන් සිට හත් වන අහස දක්වාත් ගෙන ගොස් ඔහුගේ සටහන හත්වන අහසේ ඉල්ලීයීන් නැමති ස්ථානයේ සටහන් කර නැවත ආත්මය ඔහුගේ මළ සිරුර වෙත ගෙන එයි. ඉන්පසු මලායිකාවරුන් ඔහුට බර්සාඛ් නම් මිනීවල තුල ජීවිතය ගත කිරීමට අවශ්‍ය වටපිටාව සකසා දෙයි. විනිශ්චය සඳහා අල්ලාහ් කැඳවන තෙක් ඔහු එහි සිටී. විනිශ්චය මහ්ෂර් පිටියේදී පවත්වන බව සඳහන් වේ. විනිශ්චයට පසු සිරාත් නම් පාලම තරණය කල යුතුව ඇත. එය හත්වන අහසේ පිහිටා ඇති ස්වර්ගය දක්වා විහිදී ඇති එකකි. සමහරු වේගයෙන් එය තරණය කරයි. සමහරු හෙමින්, තවත් සමහරුන්ට තරණය කල නොහැකිව සිජ්ජීන් හී පිහිටා ඇති නිරයට වැටේ. අල්ලාහ් කැමති නම් පසුව ඔහු නැවත එයින් එලියට ගෙන

ස්වර්ගය වෙත යොමු කරයි. සිජ්ජීන් පෘතුවියෙහි පහලම ඇති බවට තොරතුරු ඇත. ඒවා පහත දැක්වේ.

ස්වර්ගයේ පිහිටීම

විද්වතුන් විසින් ප්‍රකාශ කර ඇත්තේ ස්වර්ගය හත්වන ස්වර්ගයේ බවත් නිරය පෘථිවියේ පහළම මට්ටමේ බවත්ය.

*අල්-බුහාරි (7432) අබූ හුරෙයිරාගෙන් වාර්තා කරයි, නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූහ: "ඔබ අල්ලාහ්ගෙන් ඉල්ලන්නේ නම්, ඔහුගෙන් අල්-ෆිර්දව්ස් ඉල්ලන්න, මන්ද එය ස්වර්ගයේ මැද සහ ස්වර්ගයේ ඉහළම කොටස වන අතර ඊට ඉහළින් පරම කරුණාවන්තයාගේ සිංහාසනය ඇත."*

*'අතියා ඉබ්න් අබ්බාස්ගෙන් විස්තර කළේය, ඔහු මෙසේ පැවසීය: ස්වර්ගය හත්වන ස්වර්ගයේ ඇති අතර නිරය හත්වන පොළොවේ ඇත. මෙය අබූ නුඅයිම් විසින් විස්තර කරන ලදී.*

*ඉබ්න් මන්දා මුජාහිඩ් හි අබූ යාහියා අල්-කටාත්ගේ හදීසයෙන් විස්තර කළේය, ඔහු මෙසේ පැවසීය: මම ඉබ්න් අබ්බාස්ට මෙසේ කීවෙමි: පාරාදීසය කොහේද? ඔහු මෙසේ පැවසීය: අහස හතකට ඉහළින්. මම මෙසේ කීවෙමි: නිරය කොහෙද? ඔහු මෙසේ පැවසීය: මුහුදු හතක් යට, එකක් අනෙකට ඉහළින්.*

*කටාදාහි ඉබ්නු අබ්ද්-දුන්යා ඔහුගේ ඉස්නාද් සමඟ මෙසේ පැවසීය: පාරාදීසය හත්වන ස්වර්ගයේ ඇති බවත් නිරය හත්වන පොළොවේ ඇති බවත් ඔවුන් පැවසූහ.*

*ඉබ්නු උතයිමීන් (අල්ලාහ් ඔහුට අනුකම්පා කරත්වා) ගෙන් විමසන ලදී: පාරාදීසය සහ නිරය කොහේද?*

*ඔහු පිළිතුරු දුන්නේ:"ස්වර්ගය ඉල්ලීයීන් හී ඉහළම ස්ථානයේ ඇති අතර නිරය අස්-සිජ්ජින්හි ඇති අතර අස්-සිජ්ජීන් පහත්ම පෘථිවියේ ඇති බව හදීසයේ සඳහන් වේ:*

*"පුද්ගලයා මිය යන විට අල්ලාහ්, 'සිජ්ජීන්හි මගේ වහලාගේ පොත පහළම පෘථිවියේ සටහන් කරන්න'". පාරාදීසය සම්බන්ධයෙන් ගත් කල, එය ඉල්ලීයීන් හී ඉහළම ස්ථානයේ ඇත.*

ස්වර්ගය සහ නිරය පිහිටා ඇති ස්ථාන පහත සටහනින් පෙන්නුම් කෙරේ.




---

# නිරය

නිරය ගැන ලෝක වාසී සියල්ලටම යම් අදහසක් ඇත. එය ඇසීමට තරම් භිය උපදවන තැනකි. නිරයක් නොමැති නම් මිහිපිට සමහර මිනිසුන් කරන සමහර වැරදි වලට සාධාරනයක් ඉෂ්ඨ කළ හැකි වෙන තැනක් නොමැත. එනිසා නිරයක් තිබිය යුතුයි යන මතයට බහුතරයක් එකඟ වනු ඇත.

නමුත් ඇත්තටම නිරය දුෂ්ටයන්ට පමණක්ද? මේ ප්‍රශ්නය අහලා ඔබ පුදුම වෙන්න පුළුවන්. ඒ කියන්නේ හොඳ මිනිස්සුත් නිරයට යනවද? ඇත්තටම මෙතන ඔබ දැනගත යුතු දෙයක් තියෙනවා.

**අනු මාතෘකා**

1. අල් කුරානයේ නිරය පිළිබඳ සඳහන් දෙවියන් වහන්සේගේ වචන.
2. නිරයට යාමට බලපාන ප්‍රධානම කාරණාව.
3. නිරය පිහිටා ඇති ස්ථානය.
4. තම නිර්මාතෘ කෙරෙහි විශ්වාසය තැබූ පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුගේ ආත්මය ගමන් කරන දිශාවන්.
5. තම නිර්මාතෘ කෙරෙහි විශ්වාසය නොතැබූ පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුගේ ආත්මය ගමන් කරන දිශාවන්.
6. නිරය සම්බන්ධ කුරාන් හී ඇති විවිධ වචන

අපාය හා සම්බන්ධ වන්නේ නරක නිසා ඇති වන අකුසල්ය. අකුසල් වලට එහායින් ගිය තවත් විශේෂ කාරණාවක් ගැන ඉස්ලාමය තුලින් පෙන්වා දෙයි. එම කාරණාව දෙස හොඳින් අවධානය කර බැලුවොත් අකුසල් වලට වඩා නිරයට යාමට හේතුව ලෙස එය ඉස්මතු වෙනු දැකිය හැක. ඒ තමයි ප්‍රතික්ෂේප කිරීම. අකුසල් ඇති වීමට හේතුව ලෙස මෙම ප්‍රතික්ෂේප කිරීමම අඩු වැඩි වශයෙන් බලපානු ඇත. එනම් සියලුම අකුසල වලට හේතුව මෙම ප්‍රතික්ෂේප කිරීමමයි. එහි උච්චතම අවස්ථාව නම් තමාව නිර්මාණය කල දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීමයි. ඔහුව ප්‍රතික්ෂේප කිරීම හරහා තව ප්‍රධාන කාරණා කිහිපයක්ම එක දිගටම ප්‍රතික්ෂේප වී යනු ඇත. එම නිසා මිනිසුන් අකුසල් කිරීමට බිය නොවනු ඇත. අකුසල් කිරීමට බිය නොවන සමාජය තුලින් යහපත් වටපිටාවක් බලාපොරොත්තු විය නොහැකිය. එනිසා එහි ප්‍රතිඵලයක් ලෙස වැරදිකරුවන්ට දඬුවම් දීමක් කල යුතුවනු ඇත.

දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීම නිසා පහත කාරණාවන්ද නිරායාසයෙන්ම ප්‍රතික්ෂේප වෙනු ඇත. ඒවා නම් දේව දූතයන් හෙවත් මලායිකාවරුන්,

නබිවරුන්, දෙවියන් පහළ කල ධර්මයන්, විනිශ්චය දිනය. සහ මේ විශ්ව නීතිය හෙවත් සියල්ල නිර්මාතෘ ගේ සැලස්මට අනුව සිදුවෙනවා යන නියමය.

මෙවා සියල්ල අපේ පියවි ඇසට හසු නොවන දේවල්ය, එනිසා ඒවා විශ්වාසයේ කුළුණු ලෙස මුස්ලිම් භක්තිකයන් පිළිගනු ලබයි. මේවා අන්ධ භක්තියෙන් විශ්වාස කරන කරුණු නොව. මෙම සියළුම කාරනා තර්කානුකූල සාධක සහිතව පිළි ගත හැකි ඒවාය.

තම නිර්මාතෘව ප්‍රතික්ෂේප කිරීමේ පාපයේ බරපතලකම ගැන මෙම ලිපියෙහි සඳහන් කර ඇත. "ප්‍රතික්ෂේප කිරීම හෙවත් ලොකුම පාපය".

## 1). අල් කුරානයේ නිරය පිළිබඳ සඳහන් දෙවියන් වහන්සේගේ වචන.

*නිරයෙහි ආරක්ෂකයින් වශයෙන් මලායිකාවරුන්ම මිස, (වෙන කිසිවෙකුත්) අපි නියම කළේ නැත. ප්‍රතික්ෂේප කරන්නන්ව පිරික්සීම සඳහාම (මෙසේ) මොවුන්ගේ ගණනය (දහ නව දෙනෙකු වශයෙන්) අපි ඇති කළෙමු. ධර්මය හිමි අය මෙය ස්ථිර වශයෙන්ම විශ්වාස කළ යුතුය; (74:31)*

*විශ්වාසවන්තයිනි! ඔබ, ඔබවද, ඔබගේ පවුලේ උදවියද, මිනිසුන්ද ගල්ද ඉන්දන බවට පත් කළ හැකි නිරා ගින්නෙන් ආරක්ෂා කර ගනු. එහි දැඩි හැකියාවන්ගෙන් පිරි ශක්තිසම්පන්නයන් වන මලායිකාවරුන්ව පත් කරනු ලැබ ඇත්තේය. අල්ලාහ් ඔවුන්ට නියෝග කර ඇති දැයෙන් (පොඩියක් හෝ) වෙනසක් නොකරනු ලබන්නාහ. ඔවුන්ට (දඬුවම් කරන මෙන්) තමන්ට දෙනු ලැබූ නියෝගයන් ඉටු කරමින් සිටින්නාහ (66:6)*

*ධර්මය හිමි අයගෙන්ද, සමානයන් තබා නමදින්නන්ගෙන්ද, (මෙම නබිවරයාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටි අයගෙන්ද) කවුරුන් (ඔහුව) ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන් නියත වශයෙන්ම නිරා ගින්නෙහිම සිටින්නාහ. එහි ඔවුන් සදාකල්ම රැඳී සිටින්නාහ. මෙවැන්නන්ම උත්පාදනයන් සියල්ලගෙන් ඉමහත් නපුරන්ය. (98:6)*

*කවුරුන් ධර්මයෙහි අල්ලාහ් පහළ කළ දැය සඟවාගෙන ඒ වෙනුවෙන් සුළු මුදලක් ලබා ගන්නෝද, ඔවුන් නියත වශයෙන්ම තම කුසෙහි ගින්දර මිස, වෙන*

*කිසිවක් පුරවා ගන්නේ නැත; (2:174) තවද (ධර්මය) වෙනස් කරන්නන් නියත වශයෙන්ම (ඍජු මාර්ගයෙන්) ඉතාමත් ඈතින් සිටින්නාහ. (2:176)*

*මිනිසුන්ද, ගල්ද භාවිතා කර ගන්නා (නිරා) ගින්නට බිය වනු. එය (මෙම ධර්මය) ප්‍රතික්ෂේප කරන්නන් වෙනුවෙන්ම සම්පාදනය කර ඇත; (2:24)*

*මෙම ප්‍රතික්ෂේප කරන්නන් අපව අතහැර දමා අපගේ වහලුන්ව (තමන්ට) ආරක්ෂකයින් වශයෙන් ගත හැකිය යයි අදහස් කරමින් සිටින්නෙහුද? නියත වශයෙන්ම මෙම ප්‍රතික්ෂේප කරන්නන්ට ආගන්තුක සත්කාර කිරීම සඳහා නිරයම පිළියෙල කර ඇත්තෙමු. (18:102)*

*ඔවුන් (කවුරුන්දයත්) මෙලොව ජීවිතයෙහි වැරදි මාර්ගයෙහිම උත්සහ කරමින් තමන් ඇත්තෙන්ම හොඳ ක්‍රියාවන්ම කරන බවට සිතා ගන්නාහ. (18:104)*

*මෙවැන්නන්ම තමන්ගේ දෙවියන්ගේ ආයාවන්ද, ඔහුව හමු වන්නෙමු යන්නද ප්‍රතික්ෂේප කළ අයයි. ඔවුන්ගේ හොඳ ක්‍රියාවන් සියල්ල විනාශ වී ගියේය. (පින් පව් කිරා බැලීමට) ඔවුන් වෙනුවෙන් විනිශ්චය දිනදී තරාදිය අපි නොසිටුවන්නෙමු (18:105)*

*ඔවුන් මගේ ආයාවන්ද, මගේ දූතයන්වද, ප්‍රතික්ෂේප කර, සමච්චලයට ලක් කළ හේතුවෙන් නිරයම ඔවුන්ට ඵලවිකාක වන්නේය. (18:106)*

*වැරදිකරුවන්ව පිපාසයෙන් යුතුව නිරය දෙසට දක්කාගෙන යන්නෙමු. (19:86)*

*(නබියේ! ඔබව) බොරුකාරයා කරන මොවුන්ට එදිනදී විනාශයයි! ඔවුන්ම (පුහු තර්ක විතර්කයන්හී) ගිලී සෙල්ලම් කරමින් සිටින්නාහ. ඔවුන් නිරය දෙසට (පහර දී) එළවාගෙන යන දිනදී, (ඔවුන්ට) ඔබ බොරු කරමින් සිටි (නිරා) ගින්න මෙයයි (කියනු ලැබේ). "මෙය (පුහු) සූනියමක්ද? නැතහොත් (මෙය) ඔබ, (ඔබගේ දෑසින්) බැලුවේ නැද්ද:" මෙහි (ඇතුළු වී) මුහු වී (ගින්ණෙන් දැවී) යනු. (මෙහි දඬුවමෙහි එක් අනු ප්‍රමාණයක් හෝ අඩු කළ නොහැක), ඔබ කළ දැයට අයත් ඵලවිපාකම ඔබට් දෙනු ලබන්නේය" යයි කියනු ලැබේ. (52:11-17)*

*(විනිශ්චය දිනදී) (පාපතරයින් වෙනුවෙන්) නිරය ගෙන එනු ලබන එදිනදී මිනිසාට හොඳ බුද්ධිය උදා වනු ඇත. එහෙත් ඒ අවස්ථාවේදී (උදාවන) බුද්ධියෙන් ඔහුට කුමණ ප්‍රයෝජනයක්ද? මගේ පරලොව ජීවිතය වෙනුවෙන් මා පින් ඇති දැය කර යවා තිබිය යුතු නොවේද!" යයි ප්‍රලාප දොඩවනු ඇත. (89:23,24)*

*මෙයයි වැරදිකරුවන් බොරු කරමින් සිටි නිරය. මෙයටද, උතුරණ ලෝදියටද අතරේ (දෙපැත්ත ගිනි ගත් දර කැබැල්ලක හසුවුනු කූඹීන් මෙන්) ඔවුන් ඒ මේ අත දුවන්නාහ. (55:43,44,45)*

*(නබියේ!) ප්‍රතික්ෂේප කරන්නන් (ඉමහත් වෙළෙන්දන් වශයෙන්ද, ධනවතුන් වශයෙන්ද ආඩම්බරයෙන් යුතුව) නගරයන්හි සැරිසරමින් සිටිනු ඔබව වශී නොකළ යුතුය. (මෙය) අල්ප සුවයක් පමණි. මින් පසුව ඔවුන් ඇතුළුවන ස්ථානය නිරයයි. එය වාසස්ථානයන්ගෙන් ඉතාමත් නපුරුය. (3:196,197)*

*(තවද) ඔවුන් (මෙම) ධර්මය ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව ප්‍රතික්ෂේප කරමින්ම මරණයට ද පත් වන්නෝද, ඔවුන් කෙරෙහි අල්ලාහ්, මලායිකාවරුන්, මිනිසුන් ආදී සියල්ලගේ ශාපය නියත වශයෙන්ම අත් වන්නේය. (2:161)*

*(තවද ඔවුන්) එ(ම ශාපයෙ)හි සැමදා රැඳී සිටින්නාහ. (පරලොවදී) ඔවුන් වෙනුවෙන් දඬුවම් ලිහිල් කරනු ලබන්නේද නැත. ඔවුන්ට විවේකයක් දෙනු ලබන්නේද නැත. (2:162)*

*ඇත්තෙන්ම කවුරුන් ප්‍රතික්ෂේප කරන්නෙකු වශයෙන්ම තම දෙවියන් වෙත පැමිණෙන්නේද, ඔහුට නියත වශයෙන්ම නිරයම (ඵලවිපාක වනු ඇත). එහි ඔහු මැරෙන්නේද නැත. (සුවයෙන් යුතුව) ජීවත් වන්නේද නැත. (දඬුවම හා දහ දුක විඳිමින්ම සිටිනු ඇත). (20:74)*

*ඔබගේ දෙවියන් මෙසේ පවසන්නේය. ඔබ (ඔබට අවශ්‍යය දැය සියල්ල ඉල්ලා සිටීමට) මාවම ආරාධනා කරනු. මා ඔබට (ඔබගේ ප්‍රාර්ථනාවන්ට) පිළිතුරු දෙන්නෙමි. කවුරුන් මාව නොනැමද ආඩම්බර බස් දොඩන්නෝද, ඔවුන් නියත වශයෙන්ම දීන වූ අය වශයෙන් නිරයට ඇතුළු වනු ඇත, (40:60)*

*කවුරුන් (අපගේ) මෙම ධර්මයද, අපගේ (අනිත්) දූතයින් ගෙන ආ ධර්මයන්ද බොරු කරන්නෝද, ඔවුන් පසුව (එහි සත්‍යය නියත වශයෙන්ම) දැන ගන්නෙහුය, ඔවුන්ගේ බෙල්ලෙහි දමන ලද දම්වැල් සමගද, විළංගු සමගද, ඔවුන්ට (දඬුවම් කිරීමට) ඇද්ගෙන එනු ලැබ, (පළමුවෙන්ම) උතුරන ලෝදියෙහිද, පසුව නිරයෙහිද ඇතුළු කරනු ලබන්නෙහුය. පසුව ඔවුන්ට "අල්ලාහ් හැර, ඔබ සමානයන් වශයෙන් කරගෙන සිටි දැය කොහ්රේද? යයි විමසනු ලැබේ. (40:70-73)*

*විශ්වාසවන්තයිනි! නියත වශයෙන්ම (ඔවුන්ගේ) පූජකවරුන්ද, පඬිවරුන්ද, බොහෝමයක් දෙනා ජනතාවගේ වස්තූන් වැරදි ආකාරයෙන් ගිල දමන අතර (ජනතාව) අල්ලාහ්ගේ මාර්ගයෙහි යාමද වළක්වන්නාහ. එබැවින් (මොවුන්ටද, තවද කවුරුන්) රත්‍රන්ද, රිදීද එක්කාසු කර තබා, එය අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් නොකර සිටින්නෝද, ඔවුන්ටද (නබියේ!) ඔබ වේදනා ගෙන දෙන දඬුවම මගින් ශුභාරංචි දෙනු මැනව! (රත්‍රන් රිදී ආදී) දැය නිරා ගින්නෙන් රත් පැහැ ගැන්වෙන තුරු රත් කර, එමගින් ඔවුන්ගේ නළන් වලද, ඉළ ඇට පෙදෙස්වලද, ඔවුන්ගේ පිටකොන්දෙහිද පුළුස්සා "ඔබ වෙනුවෙන් ඔබ එක්කාසු කර තැබූ දැය මෙයයි. එබැවින් ඔබ එක්කාසු කර තිබූ මේවා (පොඩියක්) විඳ බලනු" යයි කියනු ලැබන දින (නබියේ! ඔබ ඔවුන්ට මතක් කර දෙනු).(9:34,35)*

*ඔවුන්ගෙන් කිසිවෙකුත් "අල්ලාහ් හැර මමත් දෙවියෙකි" යයි පැවසුවහොත් ඔහුට නිරයම අපි ඵලවිපාක බවට දෙන්නෙමු. අපරාධකරුවන්ට (ඔවුන් කවුරුන් වුවද) මේ අන්දමටම අපි ඵලවිපාක දෙන්නෙමු. (21:29)*

*නියත වශයෙන්ම ඔබත් අල්ලාහ් හැර. (ඔබ) නමදිමින් සිටි දැයද නිරයෙහි දර කොටන් වශයෙන් සිටින්නෙහුය. ඔබ සියල්ලන්ම එහි යා යුතුව ඇත්තේය" යි කියනු ලැබේ. (ඔවුන් නමදිමින් සිටි) මේවා (සත්‍යය) දෙවිවරුන් වශයෙන් තිබුනේ නම්, නිරයට පැමිණෙන්නේම නැත. එහෙත් ඔවුන් සියල්ලන්ම (නිරයට තල්ලු කරනු ලැබ) සදාකල් එහි රැඳී සිටිනු ඇත. (21:98,99)*

*(දෙවියන්ට අවනත වන්නන් හා දෙවියන්ට වෙනස්කම් කරන්නන් ආදී) මේ දෙකොට්ටාශයම තමන්ගේ දෙවියන් ගැන තර්ක කරමින් සිටින්නාහ. එබැවින්*

(ඔවුන්ගෙන්) කවුරුන් (තමන්ගේ දෙවියන්ව) ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන්ට ගින්නෙන් නිමවූ ඇඳුම් පැළසුම් කර ඇත්තේය. උණු වී නටමින් තිබෙණ ජලය (ලෝදිය) ඔවුන්ගේ හිස් මත වත් කරනු ලැබේ. (22:19) එමගින් ඔවුන්ගේ කුසෙහි ඇති දැයද, (ශරීරය මත ඇති) හමද දැවී අඟුරු වී යනු ඇත. (22:20)

ඔවුන් වෙනුවෙන් යකඩ කදාවන් ඇත. (එමගින් ඔවුන්ට පහර දෙනු ලැබේ). මෙම ශෝක (ජනක නිරයෙන්) ඔවුන් පිටමං වීමට අදහස් කරමින් උත්සහ කරන සෑම විටම, එහි තල්ලු කරනු ලැබ "දවාලනු ලබන දඬුවම විඳිමින් සිටිනු" (යයි කියනු ලැබේ). (22:21,22)

කවුරුන්ගේ (පිනෙහි) බර අඩුවන්නේද, ඔවුන් තමන්ට තමන් පාඩුව ඇති කරගෙන සැමදා නිරයෙහි රැඳී සිටින්නාහ. ඔවුන්ගේ මුහුණු (නිරා) ගින්න දවා (තොල් පෙති දැවී හැකිළී), එහි ඔවුන් මුහුණු විකෘති වූවන් වශයෙන් සිටින්නාහ. (23:103,104)

වැරදි කරුවන්ගෙන් මෙසේ විමසනු ඇත. ඔබව නිරයේ ඇතුළු කලේ කුමක්ද? එයට ඔවුන් "අපි සලාත් කරන්නන්ගෙන් වූයේ නැත", "අපි දුප්පතුන්ට ආහාර සැපයුවේද නැත". "පුහු කාරණාවන්හි ගැලී සිටිය අය සමග අපිත් ගැලී සිටියෙමු". "පලවිපාක ලබා දෙන මේ දිනයද අපි බොරු කළෙමු". "(අපි මරණයට පත්වී) මෙය ස්ථිරව දකින තුරු (මේ අන්දමට සිටියෙමු) යයිද පවසනු ඇත. (74:40-47)

(ඔවුන්ට) "ඔබ කෙරෙහි මගේ ආයාවන් සමුදීරණය කර පෙන්වනු ලැබුවේ නැද්ද? ඒවා ඔබ බොරු කරමින් සිටියෙහුය" (යැයි කියනු ලැබේ). එයට ඔවුන් "අපගේ දෙවියනේ! අපගේ අවාසනාව අපව යටපත් කළේය. එබැවින් අපි දුර්මාර්ගයෙහි ගියෙමු" යයි පවසනු ඇත. (තවද) "අපගේ දෙවියනේ! මෙයින් (නිරයෙන්) අපව පිටමං කර හරිනු මැනව. (පාපයන් කිරීමට) නැවතත් ඉදිරිපත් වුවහොත් අපි ඉමහතපරාධකරුවන් බවට පත් වන්නෙමු" යයි පවසනු ඇත)/ එයට ඔහු "එහිම අවමානයට ලක්වී සිටිනු. ඔබ මා සමග කතා නොකරනු" යයි පවසනු ඇත. (23:107,108)

එහි ඔවුන්ව (ඔසවා) වීසි කරනු ලබන විට, (බූරුවන්ගේ විශාල ශබ්දයක් මෙන්) එහි උතුරණ ශබ්දය ඇසෙනු ඇති අතර එය ගොරවමින් සිටිනු ඇත. කෝපයෙන්

*පුපුරා යන්නාක් මෙන් එහි එක් සමූහයක්ව පිළිස්සනු ලබන සෑම විටම, එහි මුරකරුවා ඔවුන්ට "(මෙම දඬුවම ගැන) බියගන්වා අනතුරු අඟවන්නා ඔබ වෙත පැමිණියේ නැද්ද? යි විමසනු ඇත. එයට ඔවුන් "ඇත්තය, බියගන්වා අනතුරු අඟවන්නා නියත වශයෙන්ම අප වෙත පැමිණියේය. එහෙත් අපි (ඔහුව) බොරුකාරයා බවට පත් කර, අල්ලාහ් (ඔබ වෙත) කිසිම දැයක් පහළ කර තැබුවේම නැත. ඔබ ඉමහත් දුර්මාර්ගයෙහි මිස, සිටියේ නැත" යයි අපි කීවෙමු" යයි පවසනු ඇත. තවද "(ඔහුගේ වදනට) අපි සවන් දී (ඒවා) අපි සිතා (ඒ අනුව කටයුතු කර) තිබුනේ නම්, අපි නිරාවාසීන්ගෙන් වූ අය බවට පත් වී නැත්තෙමු" යයි පවසා, ඔවුන් තමන්ගේ පාපය භාර ගනු ඇත. එබැවින් නිරාවාසීන්ට විනාශයයි. (67:7-11)*

*(නිරයෙහි ඇති) සක්කූම් නැමති (තිත්ත දුගඳ වෑහෙන ගස); (37:62) ඇත්තෙන්ම එය නිරයෙහි යට මට්ටමේ සිට ඉකුත් වන ගසකි. එහි අතු නයින්ගේ පෙනය මෙන් ඇත්තේය. නියත වශයෙන්ම ඔවුන් (තමන්ගේ කුසගින්න දරුණුභාවය නිසා) එයද අනුභව කරන්නාහ. (නමුත් ඔවුන්ගේ කුසගින්න නිවෙන්නේ නැත). පසුව, නියත වශයෙන්ම උතුරණ සැරව මිශ්‍ර (ලෝදිය) එහිදී ඔවුන්ට (පානයක් වශයෙන්) දෙනු ලැබේ. (37:64-67)*

*පසුව නිරයේ සිටින අය, නිරයේ ආරක්ශකයින්ට "දඬුවම දවසකට හෝ අපට ලෙහෙසි කර දෙන මෙන් ඔබගේ දෙවියන්ගෙන් ඉල්ලා සිටිනු" යයි පවසනු ඇත. (එයට ඔවුන් (මොවුන්ට) "ඔබ වෙත පැමිණි (දෙවියන්ගේ) දූතයින් පැහැදිළි (සාධකයන් බොහෝමයක්) සමග ඔබ වෙත පැමිණියේ නැද්ද? යයි විමසණු ඇත. එයට ඔවුන් "ඇත්තය, පැමිණියාහ" යයි පවසනු ඇත. එයට ඔවුන්, එසේ නම් ඔබම ඉල්ලා ගනු" යයි පවසා හරින්නාහ; (40:49,50)*

**2). නිරයට යාමට බලපාන ප්‍රධානම කාරණාව.**

ඉහත දෙවියන්ගේ වදන් දෙස බැලූ විට "මිනිසුන් දෙවියන් හෙවත් තමාගේ නිර්මාතෘව ප්‍රතික්ෂේප කරමින් මෙලොව ජීවත් වීම" තමයි නිරයට යාමට බලපාන ප්‍රධානම කාරණාව.

දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීම නිසා ඔහුට තමන් කවුද, සොභාදහම යනු කුමක්ද, තමන්ගේ මෙලොව ජීවිතයේ අරමුණ සහ පරලොව ස්වභාවය ආදිය ගැන පැහැදිලිතාවයක් ඇති නොවේ. එහෙම මිනිසෙකු ගේ ඇති වටිනාකම කුමක්ද?

ප්‍රතික්ෂේප කරන්නන් සහ වැරදි කරන්නන් දෙවියන්ගේ මෙම වදන් නුදුටුවෙහිද?

*අහස්ද, භූමියද, ඒවා අතර ඇති දෑයද (පුහු) සෙල්ලමක් සඳහා අපි නිර්මාණය කලේ නැත (කුරානය 44:38,21:16).*

*"අපි නුඹලාව නිකමට මැව්වෙමු යැයිද, නියතව නුඹලා අප හමුවට හරවනු නොලබන්නෙහු යැයිද සිතාගෙන සිටියෙහුද?" (කුරානය 23:115).*

*ඔබගෙන් කවුරුන් ක්‍රියාවන්ගෙන් ඉතාමත් අලංකාරවත් කෙනෙකුද යන්නෙහි ඔබව පිරික්සනු පිණිසම ඔහු ජීවිතයද මරණයද උත්පාදනය කර ඇත්තේය. (කුරානය 67:2)*

*(කිසිම) ප්‍රශ්නයක් නොඅසා අත්හැර දමන්නෙමු යැයි මිනිසා අදහස් කළෙහිද? (75:36)*

**3). අල්ලාහ් කෙරෙහි විශ්වාසය තැබූ පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුගේ ආත්මය ගමන් කරන දිශාවන්.**

අල්ලාහ්ව විශ්වාස කරමින් සිටි අයෙකු මිය ගිය පසු ඔහුගේ ආත්මය මලායිකාවරයෙකු විසින් පලමු අහසේ ඉහලට එය ගෙන යයි. ඉන් පසු එතැන් සිට හත් වන අහස දක්වාත් ගෙන ගොස් ඔහුගේ සටහන හත්වන අහසේ ඉල්ලීයීන් නැමති ස්ථානයේ සටහන් කර නැවත ආත්මය ඔහුගේ මළ සිරුර වෙත ගෙන එයි. ඉන්පසු මලායිකාවරුන් ඔහුට බර්සාහ් නම් මිනීවල තුල ජීවිතය ගත කිරීමට අවශ්‍ය වටපිටාව සකසා දෙයි. විනිශ්චය සඳහා අල්ලාහ් කැඳවන තෙක් ඔහු එහි සිටී. විනිශ්චය මහ්ෂර් පිටියේදී පවත්වන බව සඳහන් වේ. විනිශ්චයට පසු සිරාත් නම් පාලම තරණය කල යුතුව ඇත. එය හත්වන අහසේ පිහිටා ඇති ස්වර්ගය දක්වා විහිදී ඇති එකකි. සමහරු වේගයෙන් එය තරණය කරයි. සමහරු හෙමින්, තවත් සමහරුන්ට තරණය කල නොහැකිව සිජ්ජීන් හී පිහිටා ඇති

නිරයට වැටේ. අල්ලාහ් කැමති නම් පසුව ඔහු නැවත එයින් එලියට ගෙන ස්වර්ගය වෙත යොමු කරයි. සිජ්ජීන් පෘතුවියෙහි පහලම ඇති බවට තොරතුරු ඇත. ඒවා පහත දැක්වේ.

**4). අල්ලාහ් කෙරෙහි විශ්වාසය නොතැබූ පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුගේ ආත්මය ගමන් කරන දිශාවන්.**

අල්ලාහ්ව සහ ඔහුගේ මාර්ගෝපදේශ අවිශ්වාස කරමින් සිටි අයෙකු මිය ගිය පසු ඔහුගේ ආත්මය මලායිකාවරයෙකු විසින් පලමු අහසේ ඉහලට එය ගෙන යයි.

නමුත් ඉන් ඉහලට එය රැගෙන නොයයි. ඔහුගේ සටහන පහලම අහසේ පහලම ඇති සිජ්ජීන් නම් ස්ථානයේ සටහන් තබා නැවත ඔහුගේ ආත්මය මල සිරුර වෙත ගෙන එයි. ඉන්පසු මලායිකාවරුන් ඔහුගෙන් මෙලොව ජීවිතය තුලදී අල්ලාහ්ගේ මාර්ගෝපදේශය අනුගමණය නොකිරීම ගැන ප්‍රශ්න කරයි. ඉන්පසු ඔහුට අල්ලාහ් නැවත විනිශ්චයට කැදවන තෙක් බර්සාඛ් නම් මිනීවල තුල ජීවිතය ගත කිරීමට අවශ්‍ය වටපිටාව සකසා දෙයි. අල්ලහ්ව සහ ඔහුගේ මාර්ගෝපදේශය අනුගමණය නොකල නිසා ඔවුන්ට සිරාත් පාළම තරණය කළ නොහැකිය. විනිශ්චයට පසු ඔවුන් සිජ්ජීන් නම් නිරයට ඇද වැටී එහි අල්ලාහ් කැමති තාක් කල් සිටීමට අතහැර දමයි. සිජ්ජීන් නම් අපාය පෘතුවියෙහි පහලම ගැඹුරෙහි හෝ මුහුද යට (ගැඹුරෙහි) ඇතැයි අදහස් පලවී තිබේ. හරිම ස්ථානය ගැන නිශ්චිතවම කිව නොහැක.

*දයිෆ් (හෙවත් දුර්වල) හදීසයක මෙසේ ඇත. (කුරාන් ආයතයේ අර්ථ නිරූපණය): "නියත වශයෙන්ම, අපගේ ආයත් (සාක්ෂි, වැකි, පාඩම්, සංඥා, හෙළිදරව් කිරීම් ආදිය) ප්‍රතික්ෂේප කර ඒවාට උඩඟු ලෙස සලකන අයට, ඔවුන්ට ස්වර්ගයේ දොරටු විවෘත නොකෙරේ, ඔටුවා ඉඳිකටුවේ ඇස හරහා යන තුරු ඔවුන් ස්වර්ගයට ඇතුළු නොවනු ඇත (එය කළ නොහැකි ය)" [අල්-අ'රාෆ් 7:40ප. අල්ලාහ්ගේ සංඥා විශ්වාස නොකරන සහ ඒවා විශ්වාස කිරීමට තරම් අහංකාර වන අය නිසැකවම නිරයේ සිටිනු ඇත." (අෂ්-ෂාර් අල්-මුම්ති', 3/174-175)*

**නිරයේ පිහිටීම ගැන කුරාන් සහ විශ්වාසණීය සහ දුර්වල හදීස් හරහා ලැබී ඇති තොරතුරු මෙසේය.**

**5). නිරය පිහිටා ඇති ස්ථානය:-** "පහලම අහසේ සිජ්ජීන් හි පහලම ස්ථානයේ".

නිරයේ පිහිටීම පෘථිවියේ ඇත, නමුත් සමහර විද්වතුන් එය සාගර බව පැවසූ අතර තවත් සමහරු එය පෘථිවියේ මැද ඇති බව පැවසූහ. පෙනෙන ආකාරයට එය පෘථිවියේ ඇති බව පෙනේ, නමුත් එය පෘථිවියේ හරියටම කොහේදැයි අපි නොදනිමු.

*නිරය පෘථිවියේ ඇති බවට සාක්ෂිය: (අර්ථයේ අර්ථ නිරූපණය): "සැබවින්ම, ෆුජ්ජාර්වරුන්ගේ (විශ්වාස නොකරන්නන්, පව්කාරයන්, නපුරු ක්‍රියා කරන්නන් සහ දුෂ්ටයන්)ගේ වාර්තාව (ක්‍රියාවන් ලිවීම) සිජ්ජීන්හි (සංරක්ෂණය කර ඇත)" [අල්-මුතෆිෆින් 83:7]. සිජ්ජීන් යනු පහළම පොළොව වන පෘථිවියෙහි නිරය ඇත.*

අල්-හකීම් (8698) අබ්දුල්ලා ඉබ්න් සලාම්ගෙන් විස්තර කළේ ස්වර්ගය ස්වර්ගයේ බවත් නිරය පොළොවේ බවත්ය. (අල්-හකීම් විසින් සහීහ් ලෙස වර්ගීකරණය කර ඇති අතර අද්-දහබි ඔහු සමඟ එකඟ විය.)

අල්-හෆීස් ඉබ්න් රජබ් (රළියල්ලාහු අන්හු) මෙසේ පැවසීය: 'අතියා ඉබ්න් අබ්බාස්ගෙන් විස්තර කළේය, ඔහු මෙසේ පැවසීය: ස්වර්ගය හත්වන ස්වර්ගයේ ඇති අතර නිරය හත්වන පොළොවේ ඇත. මෙය අබූ නුඅයිම් විසින් විස්තර කරන ලදී.

*ඉබ්න් මන්දා මුජාහිඩ් හි අබූ යාහියා අල්-කටාත්ගේ හදීසයෙන් විස්තර කළේය, ඔහු මෙසේ පැවසීය: මම ඉබ්න් අබ්බාස්ට මෙසේ කීවෙමි: පාරාදීසය කොහේද? ඔහු මෙසේ පැවසීය: අහස හතකට ඉහළින්. මම මෙසේ කීවෙමි: නිරය කොහෙද? ඔහු මෙසේ පැවසීය: මුහුදු හතක් යට, එකක් අනෙකට ඉහළින්.*

*කටාදාහි ඉබ්නු අබිද්-දුන්යා ඔහුගේ ඉස්නාද් සමඟ මෙසේ පැවසීය: පාරාදීසය හත්වන ස්වර්ගයේ ඇති බවත් නිරය හත්වන පොළොවේ ඇති බවත් ඔවුන් පැවසූහ.*

*ඔවුන්ගෙන් සමහරක් (ඒ සඳහා සාක්ෂි ලෙස අල්ලාහ්),:- කාෆිර්වරුන්ට උදේ සහ සවස ගින්න පෙන්වනු ලබන බව අපට පැවසූ බව, එනම් බර්සාක් කාලය තුළ*

*[මරණය සහ නැවත නැඟිටීම අතර] ස්වර්ගයේ කිසිදු දොරටු ඔවුන්ට විවෘත නොකරන බව පැවසූ බව උපුටා දැක්වූ අතර, මෙයින් ඇඟවෙන්නේ නිරය පොළොවේ ඇති බවයි. " (අත්-තක්වීෆ් මින් අන්-නාර්, පිටු 62-63)*

*ඉබ්නු උතයිමීන් (අල්ලාහ් ඔහුට අනුකම්පා කරත්වා) ගෙන් විමසන ලදී: පාරාදීසය සහ නිරය කොහේද? ඔහු පිළිතුරු දුන්නේ:"ස්වර්ගය ඉලියියින්හි ඉහළම ස්ථානයේ ඇති අතර නිරය අස්-සිජ්ජීන්හි ඇති අතර අස්-සිජ්ජීන් පහත්ම පෘථිවියේ පහළම ඇති බව හදීසයේ සඳහන් වේ: "පුද්ගලයා මිය යන විට, අල්ලාහ්, 'සිජ්ජීන්හි මගේ වහලාගේ පොත පෘථිවියේ පහළම සටහන් කරන්න'".*

*දයිෆ් (හෙවත් දුර්වල) හදීසයක මෙසේ ඇත. (කුරාන් ආයතයේ අර්ථ නිරූපණය): "නියත වශයෙන්ම, අපගේ ආයත් (සාක්ෂි, වැකි, පාඩම්, සංඥා, හෙළිදරව් කිරීම් ආදිය) ප්‍රතික්ෂේප කර ඒවාට උඩඟු ලෙස සලකන අයට, ඔවුන්ට ස්වර්ගයේ දොරටු විවෘත නොකෙරේ, ඔටුවා ඉඳිකටුවේ ඇස හරහා යන තුරු ඔවුන් ස්වර්ගයට ඇතුළු නොවනු ඇත (එය කළ නොහැකි ය)" [අල්-අ'රාෆ් 7:40ප. අල්ලාහ්ගේ සංඥා විශ්වාස නොකරන සහ ඒවා විශ්වාස කිරීමට තරම් අහංකාර වන අය නිසැකවම නිරයේ සිටිනු ඇත." (අෂ්-ෂාර් අල්-මුම්ති', 3/174-175)*

**6). නිරය සම්බන්ධ කුරාන් හී ඇති විවිධ වචන**

- ජහන්නම්: නිරය සඳහා වඩාත් පොදු නම, ගැඹුරු වළක් මින් අදහස් කරයි.
- ජහීම්: නිරයේ දැවෙන ගින්නට මෙය භාවිත වේ.
- සායිර්: දැල්වූ හෝ ඇවිළෙන ගින්නක් ගැන මින් අදහස් කරයි.
- සකාර්: නිරයේ ගින්නෙහි දැඩි තාපය සහ වේදනාව විස්තර කිරීමට භාවිතා කරයි.
- හුතාමා: නිරයේ විනාශකාරී ස්වභාවය පෙන්නුම් කරන "කැඩෙන්නා" හෝ "තලා දමන්නා" යන්නෙහි තේරුමයි.
- ලායි: නිරයේ දැවෙන ගිනිදැල් ගැන සඳහන් වේ.
- හාවියා: ගැඹුරු වළක් හෝ අගාධයක්, ඉහළ සිට පහළට බිංදුවක් යෝජනා කරයි.

- නාර් :- නාර් යනු ගින්දරය. නමුත් එම නමද අපායට භවිතා කල අවස්තා කුරානය තුල ඇත.

---

# ඉබ්ලීස්, ජින්වරු, ෂෙයිතාන්වරු

හැඳින්වීම

ඉබ්ලීස් :- ජින්වරුන්ගේ [ෂෙයිතාන්වරුන්ගේ] ප්‍රධානියා

**ජින්වරුන් :-** දෙවියන්වහන්සේගේ තවත් නිර්මාණයකි. මිනිසුන් නිර්මාණය කිරීමට පෙරම දෙවියන්වහන්සේ ඔවුන්ව නිර්මාණය කර තිබේ. ඔවුන්ව දුම රහිත පැහැදිලි අධික උෂ්ණත්වයෙන් යුත් ගින්දරෙන් නිර්මාණය කර ඇත.

ජින්වරුන්ටද දෙවියන්වහන්සේ අපට මෙන් ජීවන පරීක්ෂණයක් ඉදිරිපත් කර ඇත. ඔවුන්ට දී ඇති සිහිකල්පනාව භාවිතා කර ගෙන ඍජු මාර්ගයේ ගියොත් ඔවුන්ටම හොඳය. ඔවුන්ට අපව පෙනෙයි. එහෙත් අපගේ පියවි ඇසට ඔවුන්ව නොපෙනේ. (සමහර සතුන්ට ඔවුන්ව පෙනෙයි). ඔවුන් තම ප්‍රජාව බෝ කිරීම සිදු කරයි. ඔවුන් ආහාර ගැනීම සිදු කරයි. (උදාහරනයකට මස් කටු ආදිය). නමුත් ඔවුන් එය අනුභව කල බවක් අපගේ පියවි ඇසට නොපෙනේ. මිනිසුන්ට මෙන්ම සමහර ජින්වරුන්ටද අහසේ යම් සීමාවක් දක්වා තරණය කල හැක. මුහුදු පතුලේ කිමිදිය හැක. සමහර අංශ වලින් ඔවුන් මිනිසුන්ට වඩා දක්ශය. සමස්තයක් ලෙස ගතහොත් ඔවුන් මිනිසුන්ට වඩා දුර්වල ජීවී සමූහයකි. නමුත් මිනිසුන් ඔවුන්ට බිය බව ඇඟවුව හොත් හෝ ඔවුන්ගෙන් පිහිට ඉල්ලමින් සිටියොත් ඔවුන්ගෙන් මිනිසුන්ට වන හානිය වැඩි විය හැක. ඔවුන්ගෙන් බහුතරයක් ඇත්තෙන්ම මිනිසාගේ සතුරෙකු ලෙස සිටිමින් මිනිසාව ඍජු මාර්ගයෙන් පිටමං කරවීමට සෑම විටම උත්සාහ ගනිමින් සිටී. ඒ වෙනුවෙන් ඔවුන් කරනුයේ අප ළඟම ගැවසෙමින් අපට නරක කිරීමට මිමිණීමය. එනම් අපට රහසින් පවසයි.

ජින්වරුන්ගෙන සමහරක් මුස්ලිමුන් ලෙස ඍජු මාර්ගයේ සිටිති. දෙවියන්වහන්සේව විශ්වාස කරන (මුස්ලිමුන් ලෙස සිටින) ජින්වරුන් ගැන තොරතුරු රාශියක් අල් කුර්ආන් හී සූරත් අල් ජින්- 72 පරිච්ඡේදයේ සඳහන් වේ

නමුත් ජින්වරු බහුතරයක් දෙවියන්වහන්සේට විරුද්ධව යමින් දුර්මාර්ගයේ සිටිති. එනිසා ජින් සංහතියේ බහුතරයකගේ අවසාන ඉරණම නිරය බව දෙවිඳුන් කලින්ම පවසා තිබේ.

දුර්මාර්ගයේ සිටින ජින්වරුන් අපගේ ඉරණම කෙරෙහි ප්‍රභල බලපෑමක් කරන අය වේ. එම නිසා ඔවුන් පිළිබඳව අප දැනගෙන සිටීම අනිවාර්‍යය වේ.

ජින්වරුන්ට අල්ලාහ් (දෙවියන්වහන්සේ) මිනිසුන්ට නොමැති සුවිශේෂී හැකියාවන්ද දී තිබේ. ඈත අතීතයේ ජින්වරු විශාල බරපතල වැඩ කර ඇත. සුලෙයිමාන් නබිගේ කාලයෙන් පසු මිනිසුන්ට ජින්වරුන්ගෙන් වැඩ ගැනීම තහනම් කර ඇත. නමුත් සමහර මිනිසුන් අදටත් ඔවුන්ගෙන් එක් එක් වැඩ ගනිමින් සිටිනු අපට දකින්නට ඇත.

**ෂෙයිතාන්වරු :-** මොවුන් විශ්වාසවන්ත යහපත් ජින්වරුන්ව සහ විශ්වාසවන්ත යහපත් මිනිසුන්ව දෙවියන්ගේ ඍජු මාර්ගයෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නන්ය.

ෂෙයිතාන්වරු සියල්ලගේම ඉරණම අවසන් වන්නේ නිරයෙනි.

ඔවුන් ජින්වරු අතරත් සිටී, මිනිසුන් අතරත් සිටී. (එනම්, ඉබ්ලීස්ගේ කැමැත්ත ඉටු කරන අය ජින්වරුන්ගේ සැබෑ ස්වභායෙන් ඉන්නත් පුලුවනි, එසේත් නැත්නම් එම කැමත්ත මිනිසා තුලින් ක්‍රියාත්මක වීමට සැලැස්වීමද කළ හැකි බවය). මේ අනුව විශ්වාසවන්තයෙකු ලෙස සිටීමට නම අපට ආකාර දෙකක අවධානම් වලින් ආරක්ෂා වීමට සිදුවෙනවා. (කුරානයේ පරිච්ඡේද 114 න් මේ බව පවසා ඇත).

ෂෙයිතාන්වරුන්, ඔවුන් විසින්ම අපව නොමගට යැවීමට ගන්න උත්සහයන්ගෙන්.

ෂෙයිතාන්වරුන් විසින් දැනටමත් නොමග යවා ඇති මිනිසුන්ව අප වෙත එවා, ඔවුන් හරහා අපවත් නොමගට යැවීමට අටවා ඇති උගුල්වලින්.

ජින්වරුන්ගෙන් සමහරුන්ට එක් එක් ස්වරූප ගැනීමට හැකියාව ඇත. ඔවුන්ට සතෙකු මෙන් පෙනී සිටිය හැක. මිනිසෙකු ලෙසද පෙනී සිටිය හැක.

*නියත වශයෙන්ම ෂෙයිතාන් ඔබට සතුරෙකු වශයෙන් සිටින්නේය. එබැවින් ඔහුව ඔබත් සතුරෙකු බවටම ඇර ගනු. ඔහු (තමන්ට අවනත වූ) තම සමූහය ආරාධනා කරන්නේ ඔවුන් නිරාවාසීන් බවට පත් කිරීමටය. (35:6)*

*(සැඟවෙන අපරාධකාරයින්ගේ විපත් වලින් ආරක්ෂා කර ගන්නා මෙන් ඉල්ලා සිටිමි, (යයි ප්‍රාර්ථනා කරයි). ඔවුන් මිනිසුන්ගේ හෘදයන්හී (පුහු) සැකය උපදවයි. (එවැනි අපරාධකාරයින්) ජින්වරුන්ගෙන්ද, මිනිසුන්ගෙන්ද සිටින්නාහ. (114:4,5,6)*

*(වියළී ගියහොත් ටං ටං යන) ශබ්දය ගෙන දෙන ඇලෙන සුළු කිරිමැටියෙන් නියත වශයෙන්ම අපිම (ඔබගේ මුල් පියා වන පළමු) මිනිසාව උත්පාදනය කළෙමු. (15:26)*

*(එයට/ මිනිසාට) පෙර ජින්වරුන්ව දරුණු උෂ්නත්වයෙන් යුත් ගින්දරෙන් උත්පාදනය කළෙමු. (25:27)*

*(මට අවනත වී මාව) නැමදීමට මිස ජින්වරුන්වද, මිනිසුන්වද මා උත්පාදනය කළේ නැත. (51:56)*

*නියත වශයෙන්ම මිනිසුන්ගෙන්ද, ජින්වරුන්ගෙන්ද, බොහෝමයක් දෙනාව නිරය සඳහාම අප උත්පාදනය කර ඇත්තෙමු. (ඔවුන් කෙබන්දයත් නම්), ඔවුන්ට හෘදයන් ඇත. එහෙත් එමඟින් හොඳ ඔවදන්) ඔවුන් වටහා නොගන්නාහ. ඔවුන්ට ඇස්ද ඇත. එහෙත් එමඟින් (මෙලොවෙහි ඇති සාධකයන්) ඔවුන් නොබලන්නාහ. ඔවුන්ට කන් ඇත. එහෙත් එමගින් ඔවුන් (හොඳ ඔවදන්වලට) සවන් නොදෙන්නාහ. මොවුන් සතුන් මෙන් සිටින්නාහ. තවද ඒවාටත් වඩා මාර්ගය වැරද ගියවුන් වශයෙන්ම සිටින්නාහ. මෙවැන්නන්ම (අපගේ ආයාවන්) නොසළකා හැරිය වුන් වන්නාහ. (7:179)*

*මලායිකාවරුන්ට "ආදම්ට සුජූද් කරනු" යයි අපි පැවසීම ගැන සිතා බලනු. ඉබ්ලීස් හැර, ඔවුන් සියල්ලන්ම සුජූද් කළහ. ඔහු නම්, ජින් වරුන්ගේ වර්ගයට අයත් කෙනෙකි. ඔහු තම දෙවියන්ගේ අණට වෙනස්කම් කර හැරියේය. එබැවින් (මිනිසුනේ!) ඔබ මා හැර, ඔහුවද, ඔහුගේ පරම්පරාවේ දරුවන්වද, හිමි වශයෙන් ගන්නෙහුද? ඔවුන් නම් ඔබට දරුණු සතුරන් වශයෙන්ම සිටින්නාහ. අපරාධකරුවන් (මාව හැර දමා, ඔවුන්ව තමන්ට ආරක්ෂකයින් වශයෙන්) වෙනස් කර ගැනීම ඉතාම නපුරුය. (18:50)*

**පළමු මිනිසා (ආදම්)ව නිර්මාණය සම්බන්ධව**

*"මා මිනිසාව නිර්මාණය කර එහි (ජීවයට අවශ්‍යය) මගේ ආත්මය ඇතුළු කළහොත් (ඔහුට ගෞරව කිරීමට) ඔබ නලල බිම තබා සුජූද් කරණු (යයි අණ කළේය). ඒ ආකාරයටම මලායිකාවරුන් සියල්ලන්ම (ඔහුට ගෞරව කිරීම සඳහා) සුජූද් කළහ. ඉබ්ලීස් හැර, ඔහු සුජූද් කරන්නන් සමග එක්කාසු වී සුජූද් නොකර ඇත් වූවේය". (15:29,30,31).*

*(එයට දෙවියන්) "ඕ ඉබ්ලීස්! මම ම මගේ අත්වලින් කළ දැයට ඔබ සුජූද් නොකර සිටීමට ඔබව වළක්වා හැරියේ කුමක්ද? උඩඟු වී ගියෙහිද? නැතහොත් ඔබ උසස් පදවීන්ගෙන් යුත් අයගෙන් (කෙනෙකු) බවට පත් වූවෙහිද? යි කීවේය. (38:75)*

*එයට ඔහු "ඔහුට වඩා මම ම උසස් කෙනෙකි. මාව ඔබම ගින්දරෙන් උත්පාදනය කළෙහිය. ඔහුව(ලැජ්ජාවකි), කිරි මැටියෙන් උත්පාදනය කළෙහිය" යි කීවේය. (38:76)*

*(එවිට දෙවියන්, එසේනම්) "ඔබ මෙතැනින් පිටමං වනු. ඔබ එළවනු ලැබූවෙහිය" යි කීවේය. විනිශ්චය දින දක්වා මගේ ශාපය ඔබ කෙරෙහි නියත වශයෙන්ම තිබෙනු ඇත. (38:77,78)*

*(එවිට ඔහු "මගේ දෙවියනේ! (මරණයට පත් වූවන්) නැගිට්ටවනු ලබන දින දක්වා මට කාල අවකාශය දෙනු මැනව" යි කීවේය. (38:79)*

*එයට දෙවියන්, "නියත වශයෙන්ම ඔබට ලාක අවකාශය දෙනු ලැබීය. නියමිත කාලයේ දින දක්වා (ඔබගේ වාරයයි) යයි පැවසුවේය. (38:79,80)*

*එයට ඔහු "ඔබගේ ශ්‍රේෂ්ඨත්වය මත සත්තකින්ම! මා මිනිසුන් වන) ඔවුන් සියල්ලන්වම මාර්ගය වැරද යාමට සලස්වන්නෙමි. එහෙත්) ඔවුන්ගෙන් පරිශුද්ධ මනසින් යුත් ඔබගේ වහලුන් හැර" යයි කීවේය. එයට දෙවියන් "එය සත්‍යයයි! මා පවසන සත්‍යය කුමක්ද යත්, නියත වශයෙන්ම ඔබවත්, ඔවුන්ගෙන් ඔබව අනුගමනය කරන සියල්ලන් මගින් නිරය පුරවන්නෙමි" යයි කීවේය. (38:82-85)*

*"ඕ:ආදම්! 'නියතවශයෙන්ම මොහු නුඹටද, නුඹගේ බිරියටද සතුරෙක් වන්නේය. එබැවින්, ඔහු නුඹලා දෙදෙනාව මෙම ස්වර්ගයෙන් පිටමං කිරීමට ඉඩ නොතබනු. එසේ වුයේ නම් නුඹ අභාග්‍යයවන්තයෙකු වනු ඇතැ'යි අපි පැවසුවෙමු". (20:117)*

ඉහත සිදුවීමෙන් පසු ඉබ්ලීස් තම (ෂෙයිතාන්වරුන්ගෙන් යුත්) සේනාවද භාවිතයට ගනිමින් ආදම්ගේ දරු පරම්පරාව වන මිනිස් සංහතිය දෙවියන්ට නැමදීමේ මාර්ගයෙන් ඉවත් කොට දුර්මාර්ග වල යැවීම සඳහා උපරිමව උත්සහ ගනිමින් සිටී. මිනිස් සංහතිය ෂෙයිතාන්වරුන්ගේ උපක්‍රම වලට අසු නොවී දෙවියන් විසින් දෙන ලද මාර්ගෝපදේශය අනුගමණය කලහොත් ජීවන සටනින් ජයග්‍රහනය කල හැක. නැතහොත් පරාජිතයන් බවට පත්වනු ඇත. (මේ ක්‍රමවේදය අල්ලාහ්ගේ නිර්මාණයකි. අල්ලාහ් ජින්න්වරුන්ව සහ මිනිසුන්ව පරීක්ෂා කිරීමට ගත් පියවරකි. මෙතනදී හොඳ හෝ නරක විදිහට හැසිරෙන්නේ අල්ලාහ් නොව, මිනිසුන් සහ ජින්වරුන් ය. ඔවුන්ගේ අනාගතය ගැන ඔවුන් දන්නේ නැත. නමුත් අල්ලාහ් එයද දැනුවත්ව හිඳී).

පළමු මිනිසා (ආදම්)ව නිර්මාණය කළ අවස්ථාවේ සහ ඔහු සහ ඔහුගේ බිරිඳ ස්වර්ගයෙන් පිටමං වී පෘථිවිය වෙත පැමිණෙන තෙක් ෂේතාන්වරුන්ගේ ප්‍රධානියා වන ඉබ්ලීස් හැසිරුණු ආකාරය ගැන වැඩි විස්තර පහත සඳහන් ලිපි තුලින් විස්තර කර ඇත.

- ❖ ***Prophet Adam*** *ආදම් (අ.ස) ගැන ලියවුනු සියළුම කුරාන් ආයත් සහ ස්වර්ගයේ සිටි ආදම් හව්වා දෙපලගේ දරු පරම්පරාව ෂෙයිතාන්වරු නිසා*

*සෘජු මාර්ගයේ සිට දුර් මාර්ගයට ඇවිදින් නෝහා නබිතුමාගේ නූහ් (අ.ස) කාලයේදී මහා විනාශයකට ලක්වුනු ඉතිහාස විස්තර මෙහි ඇත.*

- ❖ ***දෙවියන්ගේ නිර්මාණ:*** *පළමු මිනිසා (ආදම්)ව නිර්මාණය කිරීම (සහ ඉබ්ලීස් ගේ ප්‍රතිචාරය ගැන වැඩි විස්තර මෙහි ඇත).*
- ❖ **ඉබ්ලීස් ගේ උපක්‍රම** යන මැයෙන් ලියා ඇති ලිපිය හරහා අපට නොදැනී ෂේතාන්වරු අපව නොමග යවමින් සිටින ආකාරය ඉතා හොඳින් වටහා ගත හැකිවෙයි.
- ❖ ***සොභාවික විපත් පිටුපස ඇති රහස*** *ලිපිය කියාවා බලන්න. මෙයට හේතුව ශේතාන්වරුන් මිනිසුන්ව දූර්මාර්ගයේ යැවීමය. විපත් භූමිකම්පාවක් ලෙස හෝ මිනිසුන්-මිනිසුන් අතර ඇතිවන යුද්ධයක් ලෙස හෝ භයානක වෛයිරසයක පැතිරීමක් උවත් ඒවායේ රහස එකමය.*

*[6:95-99/අල්ලාහ්ගේ නිර්මාණ හා දයාව විශාල වශයෙන් මතක් කර දී] (මේ සියල්ල මෙසේ තිබියදී) ඔවුන් ජින්වරුන්ගෙන් බොහෝමයක් අල්ලාහ්ට සමානයන් බවට පත් කරන්නාහ. එහෙත් එම ජින්වරුන්වද, ඔහුම උත්පාදනය කරන්නේය; (6:100)*

**නබිවරයන් හා සම්බන්ධව**

*මෙසේම සැම නබිවරයාටම මිනිසුන්ගෙන්ද, ජින්වරුන්ගෙන්ද ඇති ෂෛයිතාන්වරුන්ව අපි සතුරන් බවට පත්කර තිබුණෙමු. ඔවුන්ගෙන් සමහරෙක් සමහරෙකුව රවටණු පිණිස අලංකාරවත් (බොරු) වදන් (කණ්හි) රහසින් පවසා (විසුරුවා හරිමින්) සිටියහ. ඔබගේ දෙවියන් අදහස්කර තිබුනේ නම්, මෙසේ ඔවුන් කර තිබෙන්නට ඉඩ නැත. එබැවින් (නබියේ!) ඔබ ඔවුන්වද, ඔවුන්ගේ බොරු කියමන්ද හැර දමනු. (6:112)*

*(නබියේ!) ඔබ මෙසේ පවසනු; "මිනිසුන්ද, ජින්වරුන්ද එක්කාසු වී මෙවැනි කුර්ආනයක් ගෙන ඒමට උත්සාහ කර, ඔවුන්ගෙන් සමහරෙක් සමහරෙකුට උදව්වට සිටියා වුවද, මෙවැන්නක් ඔවුන් විසින් (කළ) නොහැකිය. (17:88)*

**සුලෙයිමාන් නබි (අ.ස) ගේ කාලයේ සිදුවූ සිද්ධි සම්බන්ධව**

*ජින්වරුන්, මිනිසුන්, පක්ෂීන් ආදීන්ගෙන් යුත් සුලෙයිමාන්ගේ යුධ සේනාව ඔහු ඉදිරියේ ඒකරාශී කර, විවිධ ජාතීන්ට අනුව පෙළගස්වන ලදී. (27:17)*

*එයට ජින්වරුන්ගෙන් වූ ඉෆ්රීත් (නැමැති වීරයෙකු) "ඔබ ඔබගේ ස්ථානයෙන් නැගී සිටීමට පෙරාතුවම එය මා ගෙන එන්නෙමි. නියත වශයෙන්ම මා මෙයට ශක්තිවන්තයෙකි. (ඉතාමත්) විශ්වාසයෙන් යුක්තෙකුද වන්නෙමි" යි පැවසුවේය. (27:39)*

*තවද සුලෙයිමාන්ට සුළඟ (වසඟ කර දුන්නෙමු). එහි උදේ ගමන මාසයක දුරක්ද, එහි සවස් ගමන මාසයක දුරක්ද වශයෙන් තිබුණි. තවද උණු වූ තඹෙහි උල්පතක් (වතුර මෙන්) අපි ඔහු වෙනුවෙන් ගලා බසින්නට සැලැස්සුවෙමු. තම දෙවියන්ගේ අනුමැතියට අනුව ඔහුට වැඩ කර දිය හැකි ජින්වරුන්වද, (අපි ඔහුට වසඟ කර දී, ඔහුට අවනත වී කටයුතු කිරීමෙහි) ඔවුන්න්ගෙන් කවුරුන් අපගේ නොයෝගයන් ප්‍රතික්ෂේප කරන්නේද, ඔහුව දළුලා දැවෙන (නිරා) දඬුවම විඳින ලෙසට අපි සලස්වන්නෙමු"යි කීවෙමු). (34:12)*

*(සුලෙයිමාන් වන) ඔහු කෙරෙහි මරණය නියම කළ විට, ඔහු මරණයට පත් වූවේය යන්න ඔහු හාන්සි වී සිටි සැරයටිය විනාශකර දැමූ වේයන් මිස (වෙන කිසිවෙකුත්) එම ජින්වරුන්ට දැනුම් දුන්නේ නැත, (ඔහු හාන්සි වී සිටි සැරයැටිය වේයන් කා දැමූහ. එබැවින් ඒ මත හාන්සි වී සිටි සුලෙයිමාන් බිමට ඇද වැටුනේය). ඔහු බිම ඇද වැටුනු වහාම (වැඩ කරමින් සිටි) ඔවුන් ගුප්ත කාරණාවන් දැන ගත හැකි අය වශයෙන් සිටියේ නම්, (රෑ දවල් තිස්සේ වැඩ කර) අවමන් ගෙන දෙන මෙම දඬුවමෙහි ස්ථිරව සිටිය යුතු නැතැයි ජින්වරුන් ඉතාමත් පැහැදිලිව දැන ගත්හ. (34:14)*

**විනිශ්චය දින සම්බන්ධව**

*දෙවියන් ඔවුන් සියල්ල ඒකරාශී කරන (විනිශ්චය) දිනදී (ජින්වරුන්ට) "ඕ ජින් වාර්ගිකයිනි! ඔබ මිනිසුන්ගෙන් බොහෝමයක් දෙනාව (වැරදි යාමට සලස්වා) ඔබ සමග එක්කාසු කරගත්තා (නොවෙද?" යි විමසනු ඇත. එයට) මිනිසුන්ගෙන් වූ ඔවුන්ගේ මිතුරන් "අපගේ දෙවියනේ! අපගෙන් සමහරෙක් (වෙනස්කම් කළ) සමහරෙකු මගින් ප්‍රයෝජන අත්කරගෙන ඇත්තාහ. අපට ඔබ ඇති කළ කාලය*

අපි අත් පත් කර ගත්තෙමු. (අපට කුමණ නියෝගයක් ද?) යි විමසන්නාහ. (එයට දෙවියන්) "ඔබට නිරයම වාසස්ථානය වේ. (ඔබගෙන්) අල්ලාහ් (සමාව දීමට) අදහස් කරන්නන් හැර, (අන් සියල්ලම සදහටම) එහි රැඳී සිටිනු ඇත" යයි පවසන්නේය. නියත වශයෙන්ම (නබියේ!) ඔබගේ දෙවියන් ඉතාමත් ඥානවන්තයෙකු හා හොඳින් දන්නෙකු වශයෙන් සිටින්නේය. (6:128)

එදිනදී යම්කිසි මිනිස් හා ජින් කෙනෙකු වෙතින් හෝ පාපයන් ගැන විමසනු ලබන්නේ නැත. (ඔවුන්ගේ සළකුණු මගින්ම දැන ගනු ලැබේ). (55:39)

(දෙවියන් පරලොවදී මිනිසුන්ටද, ජින්වරුන්ටද) "මිනිසුනි! හා ජින් සමූහයිනී! ඔබගෙන් ඉකුත් වූ (මාගේ) දූතයින් ඔබ වෙත පැමිණ මාගේ ආයාවන් ඔබට සමුදීරණය කර පෙන්වා, ඔබ (මාව) හමුවන මෙම දිනය ගැනද ඔබට බිය ගන්වා අනතුරු ඇඟවූයෙ නැද්ද? යි (විමසනු ඇත). එයට ඔවුන් '(අපගේ දෙවියනේ! ඇත්තය). මෙලොව ජීවිතය අපව රවටා දැම්මේය" යයි තමන්ට විරුද්ධවම සාක්ෂි දරණ අතර ඇත්තෙන්ම තමන් ප්‍රතික්ෂේප කරමින් සිටි බවද, තමන්ට තමන්ම විරුද්ධව ඔවුන් සාක්ෂි දරණු ඇත. (6:130)

"ඔබට පෙර ඉකුත් වූ (ඔබ මෙන් පාපතරයන් වන) සමූහය සමග ඔබත් එකතු වී නිරයට යනු' යයි පවසන්නේය. ඔවුන්ගේ සෑම සමූහයක්ම (නිරයට) ගිය විට, (පෙර එහි පැමිණ සිටි) තමන්ගේ වාර්ගිකයින්ව මුමුනා ශාප කරන්නාහ. (මෙසේ) මොවුන් සියල්ලන්ම නිරය අත් කර ගත් පසු (ඔවුන්ගෙන්) පසු පැමිණෙන්නන් (තමන්ට)පෙර පැමිණියන්ව ගෙන හැර දක්වා "අපගේ දෙවියනේ! මොවුන් අපිව මාර්ගය වැරද යාමට සැලැස්වූහ. එබැවින් ඔවුන්ට (අපට වඩා) දෙගුණයකින් නිරා දඬුවම දෙනු මැනව! යයි පවසන්නාහ. එයට ඔහු, "ඔබගෙන් සියල්ලන්ටම දෙගුණයක් (දඬුවම්) ඇත. එහෙත් (මීට හේතුව) ඔබ දැනගන්නේ නැත" යයි පවසන්නේය. (7:38)

"විනිශ්චය දෙනු ලැබූ කල, (සාතන් මෙසේ පවසනු ඇත) 'නියත වශයෙන්ම අල්ලාහ් නුඹලාට සත්‍ය පොරොන්දුවක් දුන්නේය. මමද නුඹලාට (බොරුවට) පොරොන්දු දුන්නෙමි; එහෙත් මම නුඹලාට ද්‍රෝහී වූයෙමි. මට හැකි වූයේ ඔබලාව ඇරයුම් කිරීමට මිස වෙනත් කිසිවක් සඳහා බලයක් තිබුනේ නැත,

*එහෙත් නුඹලා මට ප්‍රතිචාර දැක්වූයේය. එම නිසා මට දොස් නොකියනු, ඒ වෙනුවට ඔබලා නුඹලාට ම දොස් පවරාගනු. මට දැන් නුඹලා වෙනුවෙන් උදව් කල නොහැකිය. ඔබලාටද මා වෙනුවෙන් උදව් කල නොහැකිය. නුඹලා මීට ඉහතදී මාව අල්ලාහ් සමග සම කිරීම මා ප්‍රතික්ෂේප කරමි. ඇත්ත වශයෙන්ම (ඔබ වැනි) වැරදිකරුවන්ට හිංසාකාරී වේදනාවක්ම ඇත." යයි පවසනු ඇත. (14:22)*

**නිරය හා සම්බන්ධව**

*"ඔබට පෙර ඉකුත් වූ (ඔබ මෙන් පාපතරයන් වන) සමූහය සමග ඔබත් එකතු වී නිරයට යනු' යයි පවසන්නේය. ඔවුන්ගේ සෑම සමූහයක්ම (නිරයට) ගිය විට, (පෙර එහි පැමිණ සිටි) තමන්ගේ වාර්ගිකයින්ව මුමුනා ශාප කරන්නාහ. (මෙසේ) මොවුන් සියල්ලන්ම නිරය අත් කර ගත් පසු (ඔවුන්ගෙන්) පසු පැමිණෙන්නන් (තමන්ට)පෙර පැමිණියන්ව ගෙන හැර දක්වා "අපගේ දෙවියනේ! මොවුන් අපිව මාර්ගය වැරද යාමට සැලැස්වූහ. එබැවින් ඔවුන්ට (අපට වඩා) දෙගුණයකින් නිරා දඬුවම දෙනු මැනව! යයි පවසන්නාහ. එයට ඔහු, "ඔබගෙන් සියල්ලන්ටම දෙගුණයක් (දඬුවම්) ඇත. එහෙත් (මීට හේතුව) ඔබ දැනගන්නේ නැත" යයි පවසන්නේය. (7:38)*

*(ඔවුන්ගෙන්) ඔබගේ දෙවියන් දයාව පහළ කළ අය හැර, මේ සඳහාම (වෙනස් වන සුළු) ඔවුන්ව උත්පාදනය කර ඇත්තේය. "(පාපයන් කළ) ජින්වරුන්, මිනිසුන් ආදී සියල්ලන් මගින් නියත වශයෙන්ම මා නිරය පුරවන්නෙමි" යයි ඔබගේ දෙවියන්ගේ පොරොන්දුව අනිවාර්යයෙන්ම පූර්ණය කරනු ඇත. (11:119)*

*අපි කැමති වී තිබුණේ නම්, (මොවුන්ගෙන් වූ) සෑම මිනිසෙකුටම ඔහු ඍජු මාර්ගයෙහි යා හැකි බුද්ධිය දී ඇත්තෙමු. එහෙත්, "ජින්වරුන්ගෙන්ද, මිනිසුන්ගෙන්ද (වූ පාපතරයින්) සියල්ලන් මගින් නියත වශයෙන්ම මා නිරය පුරවන්නෙමි" යි යන මාගේ පොරොන්දුව (මීට පෙරම) ඇති වන්නට ඉඩ තිබුනි. (32:13)*

# ඉබ්ලීස් ගේ උපක්‍රම

දෙවියන්වහන්සේ තම දේව පණිවිඩය තුල මෙසේ සඳහන් කර ඇත.

*وَمَا خَلَقْتُ ٱلْجِنَّ وَٱلْإِنسَ إِلَّا لِيَعْبُدُونِ / මම ජින්වරුන් සහ මිනිසුන්ව මට නමස්කාර කිරීමට මිස මැව්වේ නැත. (50-56)*

මෙම සමූහ දෙක දෙවියන්ට හැර වෙන කිසිවකට නැමදිය යුතු නැත. එයයි දෙවියන් ඔවුන්ට දුන් උසස් භාවය.

ඉබ්ලීස් යනු අල්ලාහ් ගින්නෙන් නිර්මාණය කර ඇති ජින් සමූහයේ (ෂේතාන්වරුන්ගේ) ප්‍රධානියාය. ඔහු ඇතුළු සියළුම ජින්වරුන්ට මිනිසුන්ට මෙන් ස්වයං තීරන ගැනීමේ නිදහස ලබා දී ඇත. පළමු මිනිසා වන ආදම් (අ.ස) නිර්මාණය කිරීමට පෙර අල්ලාහ් විසින් ජින්වරුන්ව නිර්මාණය කර තිබේ.

පහතින් සඳහන් වනුයේ ස්වර්ගයෙහිදී ආදම් (අ.ස) ව නිර්මාණය කරන අවස්ථාවේ සිදුවූ සිදුවීමක් සම්බන්ධව අල් කුරාන් හි සඳහන් වැකි කිහිපයක පරිවර්තනයකි.

*(7:11) නියත වශයෙන්ම අපි ඔබව උත්පාදනය කිරීමට (අදහස් කර) ඔබව (ඔබගේ මුල්ම පියා වන ආදම් ව) නිර්මාණය කළෙමු. පසුව අපි මලායිකාවරුන්ට "ආදම් ට සුජූදි කරනු" යැයි කීවෙමු. ඉබ්ලීස් හැර (අනිත් මලායිකාවරුන් සියල්ල ඔහුට) හිස නවා සුජූද් කළහ. ඔහු සුජූද් කරන්නන්ගෙන් කෙනෙකු වූයේ නැත.*

*(7:12) (එබැවින් දෙවියන් ඉබ්ලීස්ට) "මා ඔබට නියෝග කල අවස්ථාවේදී ඔබ හිස නවා සුජූත් නොකර සිටීමට ඔබව වළක්වා හැරියේ කුමක්දැයි?" විමසුවේය. එයට (ඉබ්ලීස්) "මා ඔහුට වඩා ශ්‍රේෂ්ඨයෙකි. (මන්දයත්), ඔබ මාව ගින්නෙන් උත්පාදනය කර ඇත්තෙහිය. (කිරිමැටි වලට වඩා ගින්දර උසස්ය" යයි (ආඩම්බරයෙන් යුතුව) පැවසුවේය.*

*(7:13) (එයට දෙවියන්) "ඔබ මෙයින් බැස යනු. ඔබ ආඩම්බර වීමට මෙහි ඉඩක් නැත. එබැවින් ඔබ පිටමං වනු. (ඔබගේ උඩඟුකම හේතුවෙන්) නියත වශයෙන්ම ඔබ අවමන් වූවන්ගෙන් කෙනෙකු බවට පත්වූයෙහිය" යයි පැවසුවේය.*

*(7:14). (එයට ඉබ්ලීස් වන) ඔහු "(මරණයට පත් වූවන්ව) නැගිටුවන දින දක්වා ඔබ මා හට කාල අවකාශයක් ලබා දෙන්න" යයි ඉල්ලා සිටියේය.*

*(7:15). (එයට) දෙවියන් "නියත වශයෙන්ම ඔබ (ඒ අන්දමට) කාල අවකාශයක් ලබා දුන් කෙනෙකු බවට සිටින්නෙහිය" යයි කීවේය.*

*(7:16). (එයට ඉබ්ලීස්) ඔබ මා අවමන් කල බැවින් (ආදම්ගේ පරම්පරාවේ දරුවන් වන) ඔවුන් ඔබගේ ඍජු මාර්ගයෙහි නොයා (වළක්වා හැරීමට මාර්ගය අවහිර කර එහි) වාඩි වී සිටින්නෙමි",*

*(7:17). "නියත වශයෙන්ම ඔවුන්ට ඉදිරියෙන් හා පසුපසින්ද, දකුණු පසින් හා වම් පසින්ද ඔවුන් වෙත පැමිණ (ඔවුන්ට මාර්ගය වැරද) යවමින් සිටින්නෙමි. එබැවින් ඔවුන්ගෙන් වැඩි දෙනෙකුව (ඔබට) කෘතඥ වන්නන් බවට ඔබ නොදකින්නෙහිය" යයිද කීවේය.*

*(7:18). (එයට දෙවියන්) නින්දාවට ලක් වූවෙකු වශයෙන්ද, එලවා දමනු ලැබූවෙකු වශයෙන්ද ඔබ මෙතැනින් පිටමං වනු> නියත වශයෙන්ම (ඔබවද) ඔවුන්ගෙන් ඔබව අනුගමනය කරන්නන්වද ආදී ඔබ සියල්ලන් මගින් නිරය පුරවන්නෙමි" යයි පැවසුවේය.*

ඉබ්ලීස්ට සේවය කරන තවත් ජින්වරු බොහෝමයක් ඇත. ඔවුන්ට ශේතාන්වරුන්/ යක්ශයන් ලෙසද හඳුන්වයි. ඉබ්ලීස් අවසන් මිනිසාගේ මරණය දක්වාත් නොමැරේ. නමුත් අනිකුත් ජින්වරුන්ට යම්කිසි ආයුෂ කාලයක් ඇත. ජින්වරුන්ගෙන් වූ ශේතාන්වරුන් සෑම මනුශ්‍යයෙකුගේම ජීවිත කාලය පුරා ඔවුන් සමග ඔවුන්ව නොමග යැවීමට වැරදි දේ කිරීමට පොලඹවමින් සිටී. ඔවුන් කරන කටයුතු ඉබ්ලීස් වෙත දැනුවත් කිරීමට සහ ඔහු වෙත රපෝර්තු කිරීමටද බැඳී සිටී. ජින් වරුන්ගෙන් සමහරු ශේතාන්වරු නොවේ. එනම් ඔවුන් ශේතාන්වරුන් මෙන් මිනිසුන්ට අල්ලාහ්ගේ මාර්ගයෙන් ඉවත් කිරීමට කටයුතු නොකරයි. ඔවුන්ගෙන් සමහරු මුස්ලිම් ජින් වරු ලෙසත් තවත් කොටසක් මුස්ලිම් නොවන (කාෆිර්) ජින් වරු ලෙසටත් සිටී. ශේතාන්වරු කිසිවෙක් මුස්ලිම් ලෙස නොසිටී.

ජින්වරුන් සාමාන්‍යයයෙන් මිනිස් ඇසට හසුනොවන තත්ව යටතේ සිටින තවත් ජීවී ආකාරයකි. ඉස්ලාමයේ මූලික ග්‍රන්ථ ලෙස සලකන අල් කුරාන් සහ පිලිගත් හදීස් වලින් ඉබ්ලීස් සහ අනිකුත් ජින්වරුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් තොරතුරු රාශියක් අප වෙත ලැබී ඇත. එම තොරතුරු වලින් ඔවුන්ගේ හැසිරීම අතීත වර්ථමාන අනාගත යන තුන් කාලයටම ගලපා අධ්‍යයනය කර වටහා ගැනීමට යම් තරමකින් අපට හැකියාව ලැබී ඇත.

පහතින් සඳහන් තොරතුරු කිහිපයෙන් ඉබ්ලීස් ගැනත්, ඔහුගේ උපක්‍රම හරහා මනුෂ්‍ය සමූහය දෙවියන්ව නැමදීම් කරමින් ඔහට කීකරුව සිටීමෙන් වලක්වාලීමට කටයුතු කරන ආකාරය ගැන යම් අවභෝදයක් ලබා ගත හැක.

නැමදීම, පිහිට පැතීම, ප්‍රාර්ථනා කිරීම, පුදුම වීම, ආදරය කරුණාව, බිය බැතිකම, කෘතඥතාවය දැක්වීම ආදී ලක්ෂණ සෑම මනුෂ්‍යයෙකු තුලම සහජයෙන්ම පිහිටා ඇත. මිනිසාගේ නිර්මාතෘ වන දෙවියන් විසින් එය මනුෂයයා තුලම ස්ථාපනය කර ඇත. කිසිඳු බලපෑමකට ග්‍රහණය නොවුනොත් සෑම මිනිසෙකුම ඉහත ගුණාංග සියල්ල තම නිර්මාතෘ සම්බන්ධවම ක්‍රියාත්මක කරනු නොඅනුමානය.

නමුත් ස්වයං තීරන ගැනීමේ නිදහස ඇති මිනිසා තම නොසැලකිල්ල නිසා බොහෝ අවස්ථාවල ඉබ්ලීස් ගේ සහ ඔහුගේ සේනාව වන ෂේතාන්වරුන්ගේ උගුල් වලට හසුවී තම නිර්මාතෘගෙන් ඈතට ගොස් වෙනත් වැරදි මාර්ගවල තම ජීවිතය ගෙවා දමන ආකාරය දෙස බලන්න.

*(24:21) විශ්වාසවන්තයිනි! සාතන්ගේ අඩිපාරේ නොයන්න. යමෙක් සාතන්ගේ අඩිපාරේ ගමන් කරයිද, ඔහු නියත වශයෙන්ම සියලු දුරාචාරයට සහ දුෂ්ටකම්වලට පොළඹවන බව ඔවුන්ට දන්වන්න. ඔබ කෙරෙහි අල්ලාහ්ගේ කරුණාව සහ දයාව නොතිබුනේ නම්, ඔබගෙන් කිසිවෙක් කිසිදා පවිත්‍ර නොවනු ඇත. නමුත් අල්ලාහ් තමන් කැමති අයව පිරිසිදු කරයි. තවද අල්ලාහ් සියල්ල ශ්‍රවණය කරන්නාය, සර්වඥය.*

**සූර්යයා (හිරු)ට  නැමදීම (භෞතික වස්තූන් ට නැමදීම)**

සූර්යයා දෙවියන් විසින් නිර්මාණය කල අජීවී වස්තුවකි. සූර්යයා ක්‍රියාත්මක වන්නේද තම නිර්මාතෘ විසින් තමන්ට ඉදිරිපත් කර ඇති (පනවා ඇති) අණපණත් වලට යටත්වය. ඒ අනුව සූර්යයා යම් රාජකාරියක නිරත වෙමින් සිටිනා දෙයකි. දෙවියන්ගේ අසීමිත නිර්මාණ වලින් එකක් පමනක් වන සූර්යයා සියල්ලෙහි නිර්මාතෘ වන දෙවියන්ට වඩා උසස් කොට සලකමින් වැඳුම් පිදුම් කරන තරමට මිනිසා ගේ මනස දූර්වල කිරීමට ඉබ්ලීස් ගේ උපක්‍රම සාර්ථක වී ඇත. (Quran 37:125), (53:19,23,23) බලන්න.

මෙලෙස ගස්, ගල්, ගින්දර වැනි විවිධ ආකාරවල ස්වභාවික වස්තූන් ඉදිරියට ගොස් තම නමස්කාරයන් කරමින් මිනිසුන් තම උසස් මිනිසත් බව අවමානයට ලක්කරගනී.

**ගවයාට නැමදීම (පන ඇති හෝ අනුරූ ලෙස සැකසූ සතුන් නැමදීම)**

ඈත ඉතිහාසයේ සිටම අද දක්වාත් පිළිම ලෙස සාදාගත් හෝ පන ඇති ගවයන්ට නමස්කාර කරන තරමටම මිනිසාගේ මනස විකෘති කිරීමට තරම් ශේතාන්වරුන්ගේ උපක්‍රම සාර්ථක වී ඇත. ඉන්දියාව වැනි හඳට රොකට් යවන්න තරම් තාක්ශනය දියුණු රටවල පාර්ලිමේන්තුව නියෝජනය කරන උසස් සමාජමට්ටමක් හෝ අධ්‍යාපනක් ලබා ඇති උගත් රාජ්‍ය නායකයින් පවා මේ තත්වෙට ගෙනෙන්නට නම් ශේතාන් ගේ උපක්‍රම කොතරම් ප්‍රභල ද යන්න වටහා ගැනීම අපහසු නොවේ. (20:28)

හරකට පමනක් නොව මිනිසුන්ගෙන් සමහරු අත පය නැති කොටින්ම තමන්ට නිවසක් වත් හදාගන්න බැරි නයාටත් නමස්කාර කර නයාගෙන් පිහිට ප්‍රාර්ථනා කරයි. සමහරු මීයන්ට නමස්කාර කරයි. මෙලෙස විවිධාකාරයේ සතුන් වන්දනා කර සතුන්ගෙන් පිහිට පතන තරමට මිනිසාව නොමග යවා ඇත. සමහරු තම මනසින් අදහස් කර නිර්මාණයකරගත් අබූත සතුන්ටද නමස්කාර කරයි.

**දෙව්වරු ලෙස මනඃකල්පිතව සාදාගත් පිළිම වන්දනාව**

කිසිඳු සාක්ෂියක් නැති තත්ව යටතේ මනඃකල්පිතව විවිධ විකෘතිතා සහිත පිළිම නිර්මාණය කරගෙන ඒවාට එක් එක් නම් යොදාගෙන ඒවා විවිධ වූ කාරනා

වෙනුවෙන් විශේෂඥයින් ලෙස සලකා ඒවාට පුද සත්කාර කර නමස්කාර කරමින් පිහිට ඉල්ලන තරමට ඉබ්ලීස් ගේ උපක්‍රම සාර්ථක වී ඇත.

මෙය ඉතිහාසයේ සිටම ලොව පුරා විවිධ රටවල විවිධ ස්වරූප වලින් නිර්මාණය කරගත් බොරු දෙවිවරුන් නැමදීම, ඒවායෙන් පිහිට පැතීම ජන ජීවිත වල සාමාන්‍ය කාරනාවක් බවට පත්කර ඇත.

අප බොහෝ විට හින්දු කෝවිල් වල දකින්නේ ඉන්දියානු ජනසමාජ හරහා නිර්මාණය වූ ව්‍යාජ දේව රූපය. මීට වඩා වෙනස් වෙනස් රූප වලින් ලොව වෙනත් රටවල විවිධ ආකාරයේ බොරු දෙවිවරු නිර්මාණය කරගෙන ඒවාට නැමදීමට ඔවුන් යොමුවී ඇත.

මීට අමතරව මිනිසුන් පහත දේ වලට වන්දනා කර ඔවුන්ගෙන් හෝ ඔවුන් හරහා වෙනත් බලවේගයකින් පිහිට අපේක්ශා කරයි.

**ජීවත්ව සිටිනා සමාජයේ පිලිගත් අයට නැමදීම.**

**ජීවත්ව සිටිනා ආගමික ශාස්තෘන්වරුන්ට නැමදීම.**

**නිරුවත් පූජකයන්ටත්, පුරුශ ලිංගයටත් නැමදීම.**

**මිය පරලොව ගිය ආගමික ශාස්තෘන්වරුන්ට නැමදීම.**

**මිය පරලොව ගිය සමාජයේ පිලිගත් අයට නැමදීම.**

**(සොහොන් වල සිටින අයට නැමදීම).**

**මීට අමතරව යක්ෂයාට නමදින අයත් සිටී (ඔවුන්ගෙන් මේ ලොවට සිදුවන හානිය ඉතා විශාලය. එනිසා ඒ ගැන වැඩි වශයෙන් ඉදිරියේදි කරුණු ඉදිරිපත් කර ඇත).**

<u>යක්ෂයා නැමදීම</u>

යක්ෂ (Satan) වන්දනාව පුරානයේ සිටම පැවත එන මිනිසා නොමග ගිය තවත් මාර්ගයකි.

මිනිසා විසින් තම නිර්මාතෘ වන දෙවියන්ව පමණක් නැමදීම සිදුකරනු වෙනුවට ඉබ්ලීස් විසින් විවිධ උපක්‍රම හරහා ඔවුන්ව වෙනස් මාර්ග වල නැමදීම් වලට පොලඹනවාට අමතරව විවිධ ස්වරූප වලින් තමාවත් ඔවුන් ලවා වන්දනා කරවීමටද පොළඹවයි.

මෙය ඔබ සිතනවාට වඩා බරපතල කාරනාවකි. ඉබ්ලීස් යනු සුළුපටු කෙනෙකු නොවන බව මේ ගැන හොඳින් අධ්‍යයනය කර බැලුවොත් වැටහේවි, ඔබට ඔබට පුදුම හිතේවි.

**ඉලුමිනාටිවරු ගැන ඔබ දන්නවාද?**

ඉබ්ලීස් ගේ (වර්ථමාන) ලොකුම උගුල මෙයයි.

මිනිසුන්ව පරීක්ෂණයක් සඳහා යොමු කිරීමට මෙලොව ජීවිතය ලබා දුන් බව දෙවියන් පවසා ඇත. දෙවියන් විසින් ලෝක අවසානයට පෙර ඒ ආසන්නයේ සිටින ජනතාවට ඊට පෙර විසූ ජනතාවට වඩා සුවිශේෂී පහසුකම් රාශියක් ලබා දී ඇත. අද එය අපි අත් විඳින්නෙමු. ඒ සැප පහසුකම් සමග දජ්ජාල් නම් සුවිශේෂී පුද්ගලයෙකු හරහාද අපව සුවිශේෂී පරීක්ෂණයකට ලක්කරන බව පවසා ඇත. දජ්ජාල්ගේ රැවටීම් වලින් ආරක්ශාව පතන ලෙසද අපට දැනුවත් කර ඇත.

ඉබ්ලීස් මෙමගින් උපරිම ප්‍රයෝජන ගැනීමට දැනටමත් කටයුතු කර ඇත. දැනටමත් ඔහුගේ උගුල් වලට මුළු ලෝකයම අසුවී ඇත. නමුත් මිනිසුන්ට එය වැටහී නැත. මේ ඒ පිළිබඳව දැනුවත් කිරීමකි....

## Al-Masih ad-Dajjal

නබි තුමාගේ හදීසයක මෙසේ සඳහන් වේ

*විනිශ්චය දිනය ආසන්නයේ දිස්වන විශාල සංඥා දහයෙන් එකක් වන්නේ 'දජ්ජාල්ගේ මතුවීම' ය. මිනිස් ඉතිහාසය පුරාවටම, දජ්ජාල්ගේ අනර්ථය නරකම හා භයානක එකකි. සෑම නබිවරයෙකුම ඒ පිළිබඳව තම උම්මතය හෙවත් තම සාමජය වෙත අවවාද කිරීම තුළින් ඔහුගේ අකටයුතුකම්වල දැවැන්තභාවය සහ*

*බරපතලකම අවබෝධ කරගත හැකිය. (Tirmizi, vol. 4, pp. 101, Hadees 2241)*

දජ්ජාල් යනු ආදම්ගේ පරම්පරාවෙන් එන අප වැනි මිනිසෙකි. (ඔහුගේ එක ඇසක් අන්ධය).

අප වැනි මිනිසුන් අතර සුවිශේෂී මිනිසුන්ද සිටී. ජේසු (ඊසා අ.ස) තුමා එවන් කෙනෙකි. ඔහුට සුවිශේෂී උපතක්, සුවිශේෂී දීර්ඝ ජීවිත කාලයක් හා මරණයක් ඇත. දජ්ජාල් ද එවැනි සුවිශේෂී කෙනෙකි. ජේසු තුමා සමාජයට යහපතක් කිරීමට පැමිනුනත් දජ්ජාල් පැමිනෙන්නේ සමාජයට අයහපතක් කිරීමටය. ඔහු මතුවී "තමන් දෙවියන්" ලෙස පවසමින් ජනතාව මුලා කර ඔවුන්ව නොමග යවයි. මිනිසුන් බොහෝමයක් ඔහුට රැවටෙනු ඇත.

ඔහුව විශ්වාස කරන නූතන මනුෂ්‍යය සමූහයකුත් අප අතර ඇත. "ඔහු පැමින තමන්ව අපායෙන් සදාකාලයටම ගලවා ගනු ඇතැ" යි කියා විශ්වාස කරන ප්‍රභල ධනවත් පවුලක් සහ ඔවුන් ගොඩනගා ගත් සමාජයක් අප අතරත් ඇත. ඔවුන්ව ඉලුමිනාටිවරු ලෙස හඳුන්වනු ලැබේ. ඔවුන් දජ්ජාල්ගේ පැමිනීම අපේක්ෂාවෙන් සිටී. ඔහු පැමිනි පසු ඔහුට මේ ලොව තුල ක්‍රියාත්මක වීමට අවශ්‍යය වටපිටාව සකසමින් සිටී. එය මෙම ලොවට ඉතාම නරක ලෙස බලපා ඇත. ඒ පිලිබඳව පහතින් විස්තර ඉදිරිපත් කර ඇත.

ලොව තුල ප්‍රභල රාජ්‍යයන් තියෙන බව අපි දනිමු. ඇමෙරිකාව, රුසියාව, එංගලන්තය වගේ නම් කියාගෙන ගියත් ඒ සියල්ලට ඉහලින් ඔවුන් සියල්ල යට කරමින්, ඔවුන්ව රූකඩ මෙන් නටවමින් ඉලුමිනාටිවරුන් තම රාජ්‍ය බලය පවත්වාගෙන යයි. එය **Secret Kingdom** ලෙස හඳුන්වයි.

අද ලොව පාලනය කරනු ලබන්නේ මෙම පවුල් 13 විසිනි. ඉබ්ලීස් ඔවුන් හරහා ඔහුට අවශ්‍යය බොහෝ දේ සිදුකර ගනී.

මේ ඔවුන්ගේ රාජයය පාලනයයි. ඔවුන්ගේ ප්‍රධානියා දජ්ජාල් ය. ඔවුන්ගේ ගැලවුම් කරු ලෙස ඔවුන් සළකන්නේ දජ්ජාල්ය. එනිසා ඔවුන් යක්ෂයා අදහන්නන් ලෙස අපට නම් කල හැකිය.

කෙසේ හෝ ඔවුන් මේ වනවිට ලොව සියලුම පාලන බලය ඔවුන් අතට ගෙන හමාරය. ඔවුන්ගේ සුළු කන්ඩායමට පහලින් සිටින අප සියළුම දෙනා බඳු ගෙවන ඔවුන්ගේ වහලුන් මෙනි. ඔවුන්ට අනුව බැටළුවන්ය. එසේත් නැතිනම් ඔවුන්ට අපව කැරපොත්තන් තරම් වත් වටින්නේ නැත.

ප්‍රභලම කොමිටි සාමාජිකයන් 300ක් එක්ව ඔවුන් ඔවුන්ට අවශ්‍ය කාරනා සඳහා එක්ව කටයුතු කරයි. එය **The New World Order Game Plan** ලෙස හඳුන්වයි.

ඔබ සුපිරි වෙළඳසැලකින් මිලදී ගන්නා බොහෝමයක් භාන්ඩ වර්ග ඔවුන්ගේ පාලනය යටතේ පවතින ඉතාම සුළු මව්සමාගම් කිහිපයක භාණ්ඩය. ලොව ඇති සුපිරි සමාගම් බහුතරයක් ඔවුන්ගේ අයිතිය සහ පාලනය යටතේ පවතී

පහතින් දැක්වෙන්නේ ඔවුන් ලොවට බලපෑම් කිරීමට භාවිතා කරන ක්ෂේත්‍රයන් කිහිපයකි. මිනිසුන්ට නොදැනෙන ලෙස මෙම ක්ෂේත්‍ර ඔවුන් විසින් හසුරුවයි.

ඔවුන් විසින් විවිධ ආකාරවලට මිනිසුන්ව කාර්යබහුල කර තියෙන නිසා ඔවුන්ට තිරය පිටුපස වෙන දේ ගැන හොයන්න වෙලාවක් නෑ.

මේ ඔවුන් ලොවට බලපෑම් කිරීමට භාවිතා කරන ක්ෂේත්‍රයන් කිහිපයකි. මිනිසුන්ට නොදැනෙන ලෙස මෙම ක්ෂේත්‍ර ඔවුන් විසින් ඔවුන්ට උවමනා අන්දමින් (ඔවුන්ගේ ඉලක්ක සපිරෙන ආකාරයට) හසුරුවයි.

- රජයට සහ දේශපාලනය සම්බන්ධව
- මාධ්‍ය සම්බන්ධව
- ලෝක ආර්ථිකය සම්බන්ධව
- අධ්‍යාපනය සම්බන්ධව
- පරිසරය සම්බන්ධව
- ඖෂධ සම්බන්ධව
- ආගම් සම්බන්ධව
- සුහසාධන සම්බන්ධව
- තාක්ෂණ ක්ෂේත්‍රය තුල

මේ පිළිබඳව  වැඩි විස්තර අපගේ වෙබ් අඩවියෙන් හෝ Google Search හරහා ලබා ගත හැක.

ඉලුමිනාටිවරුන්ගේ සංකේතය: පිරමීඩයක්/ත්‍රිකෝණයක් තුළ හෝ ඊට ඉහළින් ඇති ‘‘සියල්ල දකින තනි ඇස‘‘ය. දජ්ජාල් සතු වන්නේද තනි ඇසකි. එය ආභාශයෙන් මොවුන් මෙය භාවිතා කරනවා විය හැක. ඔවුන්ගේ තනි ඇස සහිත පිරමිඩය පෙන්වන බලවත් සහ රහස් රූපය තුලින් ඔවුන්ගේ ඉලුමිනාටි සමාජය සහ ෆ්‍රීමසොනරි පිළිබඳ කුමන්ත්‍රණ (Secret Kingdom, The New World Order Game Plan) න්‍යායයන් පිළිබිඹු වේ.















මෙයට සහ මොවුන්ට අනුව ඔබ අප ඇතුළු ලෝකයේ සිටින බහුතරයක් වන සාමාන්‍ය ජනතාව සිටින්නේ ඔබ මෙහි දකින පහළම තීරුවෙහිය. ඔවුන් ගැන සිතීමට හෝ සොයා බැලීමටවත් අවකාශයක් නොදෙන අයුරින් ඔවුන් අපව කායීබහුල කර ඇත. විවිධ  වූ ලෞකික කාරනා ඇතිකර ඔවුන් අපව ඒවා තුලට සීමාකර ඇත. මිනිසාට මිනිසාගේ ජීවිතයේ අරමුණ පවා අමතක වන අයුරින් ඔවුන් අපව මුලා කරමින් සිටී. එයයි ඔවුන්ට ඔවුන්ගේ අරමුණු කරා යාමට පහසුම මග.

# මලායිකාවරුන් (දේවදූතයන්/ සුරදූතයන්)

**මලායිකාවරුන් යනු කවුරුන්දැයි හැඳින්වීම.**

දෙවියන් වහන්සේ සදාකාලිකව ස්වාධීනව සිටින කෙනෙකි. ඔහු ස්වයංපෝෂීය. ඔහුට කිසිවෙකුගේ අවශ්‍යතාවයක් නොමැත. මෙවන් ස්වභාවයක් ඇති දෙවියන්වහන්සේට තනිව සදාකල් සිටිය හැක. එවිට ඔහුට භාහිරින් වෙන කිසිවක් පවතින්නේද නැත.

සර්වබලධාරී දෙවියන්වහන්සේ ඉතා බලසම්පන්නයෙකි. ඔහුට සිතෙන, ඔහුට කැමති ඕනෑම දෙයක් කිරීමට හැක. ඔහුට ඔහුගේ බලයෙන් මැවීම් සිදුකල හැක. එනිසා ඔහුගේ කැමැත්ත පරිදි ඔහු මහා පුදුමාකාර මැවීම් (නිර්මාණ) සිදු කරමින් සිටී. විශ්වය ඉන් එක් මැවීමකි. අපද එම මැවීමේ කොටසකි.

මෙවන් ස්වභාවයක් ඇති දෙවියන් වහන්සේ ඉතා ශ්‍රේෂ්ඨ කෙනෙකි. ඔහු මැවීම් කරන විට එය ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයට ගැලපෙන අයුරින්ම ඒවා සිදුකරයි. එහි ප්‍රතිඵලයකි මලායිකාවරුන් හෙවත් සුරදූතයින්.

මලායිකාවරුන් යනු දෙවිඳුන් ආලෝකය මගින් නිර්මාණය කළ සුවිශේෂී ජීවීන් සමූහයකි. ඔවුන් විවිධ ප්‍රමාණ සිරුරු සහිත අය වශයෙන්ද, විවිධ හැඩ රුව සහ විවිධ හැකියාවන්ගෙන්ද යුක්තව දෙවිඳුන්ට 100%ම අවනතව යටහත්ව සහ කීකරුව දෙවිඳුන්ගේ උපදෙස් වලට අනුව කටයුතු කරමින් දෙවිඳුන් ගේ නිර්මාන සියල්ල පුරාවට පැතිරී පවතී.

**දෙවිඳුන් මලායිකාවරුන්ව නිර්මාණය කළේ ඇයි?**

සරළ උදාහරණයක් මගින් මෙය හොඳින් වටහා දිය හැක.

ඉතා ධනවත්ව සුවසේ සිටින පුද්ගලයෙක් ඔහුගේ හැකියාව යොදා යම් කිසි යන්ත්‍රයක් ගොඩ නගනවා. ඉන් පසු එය ක්‍රියාත්මක කරවීම ආකාර දෙකකට කළ හැක.

ඔහුම එහි වැඩ වලට සම්බන්ධවී ඔහු විසින්ම එය ක්‍රියාවට නැගීම. (නමුත් ඔහු ඉතා ධනවත්ව හා සුවසේ සිටින නිසා ඔහු එයට කැමති නැහැ. එය ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයට ගැලපෙන්නෙත් නැහැ. එනිසා ඔහු පහත ආකාරයේ දෙවැනි සැලසුම වෙත යොමු වෙනවා).

(හොඳින් වැඩකළ හැකි, කාර්යක්ෂම, අවංක සේවකයින් කණ්ඩායමක් ඒ සඳහා භාවිතා කරනවා. (අප කතා කරන මලායිකාවරුනුත් මෙම සේවක පිරිස හා සමානය. නමුත් ඔවුන් ශ්‍රේෂ්ඨ ජීවී සමූහයකි).

එයට අනුව දෙවියන්වහන්සේ තම මැවීම් නිසි ලෙස පවත්වාගෙන යාමට ඒවාට ඉතාම හොඳින් ගැලපෙන අයුරින් මලායිකාවරුන් කණ්ඩායම නිර්මාණය කර ඇත.

(වෙනත් සමහර ආගම් වල තිස්තුන් කෝටියකට අධික දෙවිවරු සිටිතියි විශ්වාස කරයි. බොහෝ විට ඔවුන් මෙම මලායිකාවරුන්ව වැරදි අර්ථකතන වලින් වටහාගෙන එසේ සිතනවා විය හැක. දෙවිවරු නම් ගොඩක් නැත. ඇත්තේ එකම එක දෙවියෙකු පමණි. මලායිකාවරුන් නම් තිස්තුන් කෝටියටත් වඩා ඇත).

**මලායිකාවරුන් ගැන විශ්වාස කිරීම යනු ඉස්ලාම් ඇදහිල්ලෙහි දෙවන මූලිකාංගයයි**. අල්ලාහ් මෙසේ පවසයි,

*"රසූල්වරයා තම ස්වාමියාගෙන් ඔහුට පහළ වූ දේ විශ්වාස කරයි, විශ්වාස කරන්නන් ද එසේමය. සියල්ලෝම අල්ලාහ්, ඔහුගේ දූතයන් සහ ඔහුගේ මලායිකාවරුන් ගැන විශ්වාස කරති".(2:285)*

*"...ඔවුන් අල්ලාහ් අණ කරන දෙයට අකීකරු වන්නේ නැත. ඔහු ඔවුන්ට අණ කරන ලද දේ හරියටම කරති". (66:6)*

ඔවුන් විශ්වය පුරා සෑම තැනකම විසිරී සිටිමින් තමන් වෙත පැවරී ඇති කාර්යයන් 100% ක් නිවැරදිව අකුරටම කරමින් සහ සෑම විටම දෙවියන්ව ප්‍රසංශා කරමින් සිටී. ඔවුන් සැමවිටම දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය ශ්‍රේෂ්ඨත්වය ද පිළිබිඹු කරයි. එනම්, අසංඛ්‍යාත දේවදූතයන් සංඛ්‍යාවක් සෑම මොහොතකම අල්ලාහ්ව මහිමයට පත් කරති.

ඔවුන්ගේ නිර්මාණාත්මක ස්වභාවය අනුව ඔවුන්ට අපට මෙන් ආහාර ගැනීම, මහන්සිය දැනීම, විවේකය ගැනීම, වයසට යෑම, දරුවන් බිහි කිරීම වැනි තත්වයන් නොමැත. ඔවුන්ට ලිංග භේදයක්ද නැත. ඔවුන්ට අපට මෙන් ඊරිසියාව, ක්‍රෝධය, තරහ, ආදරය, කරුණාව වැනි තත්වයන්ද නැත. මිනිසුන් මෙන් එක ස්වරූපයක් ගන්නේද නැත. ඔවුන්ට විවිධ ස්වරූප ඇත. සමහරුන්ට වෙනත් රූපයකට මාරුවෙන්න පුළුවන් (මිනිස් රුවකට පවා), සමහරුන්ගේ වේගය දුර කොපමනදැයි අදාල නොවී නිමේශයකින් අවශ්‍යය තැනට යා හැක. ඔවුන්ට මිනිසුන්ට මෙන් සිවයං තීරණ ගෙන හොඳ හෝ නරක ආදී ලෙස කටයුතු කළ නොහැක. ඔවුන් සැමවිටම දෙවියන්ගේ අණ පමණක් ක්‍රියාවට නගයි. ඔවුන් දෙවියන්ට 100% ම කීකරුව හා යටහත්ව සිටී. ඔවුන් දෙවියන්ගේ ගෞරවණීය නිර්මාණයකි. ඔවුන්ට දෙවියන් කෙරෙහි ගෞරවයද බිය බැති භාවයද උපරිමව ඇත.

එම ගෞරවණීය මලායිකාවරුන්ට අප හැකි හැම විටකදීම "දෙවියන්ගේ ආශිර්වාදය ඔවුන් වෙත ලැබේවා!"යැයි පැතීමද විශ්වාසවන්තයෙකුගේ හොඳ ලක්ෂනයකි.

ඔවුන් අප හා සම්බන්ධවද විශාල කටයුතු ප්‍රමාණයක් කරමින් සිටී. ඔවුන්ව අපගේ පියවි ඇසට නොපෙනේ. නමුත් අවසන් දේවදූත නබි මොහම්මද් (ﷺ) තුමාට ඔවුන්ගෙන් සමහරෙක්ව දැකීමට හැකියාව දෙවියන් ලබා දී තිබුණි.

මලායිකාවරුන් මිනිසුන් සම්බන්ධයෙන් කෙසේ කටයුතු කරන්නේ දැයි පහත සටහනින් පෙන්වා දී ඇත.

දෙවියන් මිනිසාව නිර්මාණ්ය කිළ මුල් අවධියේදී ඔහුට තිබුනේ දෙවියන් ඔහුට දුන් ආත්මය පමණි. මෙලොව ඉපදීමට නියම වූ සියළුම මිනිසුන්ගේ ආත්ම දෙවියන් (අහස් හී) එක් ස්ථානයක රඳවා තැබීය. මෙම රඳවා තබා ඇති ස්ථානයේ සිට එම ආත්මය දෙවියන් නියම කළ වෙළාවට එම ආත්මය හිමි අය ඉපදීමට නියමිත ලෙස දෙවියන් විසින් තීරණයකර තිබූ මවගේ කුස වෙතට (කළලයට දින 120 දී) රැගෙන එන්නේ මෙම මලායිකාවරයන්ගෙන් එයට නියම කර ඇති

අයෙකු විසිනි. ඉන්පසු එම දරුවාගේ අනාගතය කෙසේ ගෙවෙන්නේදැයි අල්ලාහ් ඔහුට දැනුම් දුන් දේ ලියනු ලබයි.

දරුවාගේ ලක්ෂන යම් ප්‍රමාණයක් (සහිත ජාන) ඔහුගේ පියාගේ ශුක්‍රාණු වලින්ද, තවත් ප්‍රමාණයක් මවගේ සෛල වලින්ද දරුවාට ලැබුණත්, දරුවා ඒක සෛලිකව සිට මෙලොව එළිය දකින තුරු එය විභාජනය වී, විවිධ අවයව සහ සහ හැඩතල සැකසීමේ ක්‍රියාවලියටද මෙම මලායිකාවරුන්ගෙන් විශාල මෙහෙයක් සිදු වෙනු ඇත.

ඉන් පසු ඉපදුනු දරුවා පෘතුවිය තුල තම මරණය තෙක් (ජීවත්වන කාලය පුරාවටම) දෙවියන්ගේ උපදෙස් මත ඔවුන්ව ඉදිරියෙන් සහ පසුපසින් ආරක්ශා කරමින් සිටී. මිනිසාගේ ජීවිත කාළය තුල විවිධකාරයට මිනිසුන්ට සහය දක්වමින් සිටින සේ පත් කල විවිධ මලායිකාවරුන් අප සමග සිටී.

මිනිසාට ජීවත්වීමට අවශ්‍යය මාර්ගෝපදේශ හෙවත් දිව්‍ය හෙළිදරව්වන් දෙවියන්ගේ සන්නිධානයේ ඇති ලව්හුල් මහ්ෆූල් නම් ඵලකයෙන් රැගෙන, නබිවරුන් වෙත ගෙන එන්නේද මෙම මලායිකාවරුන්ගෙන්ම එයට නියම වූ අය විසිනි.

මලායිකාවරුන් අපට නොපෙනී අපට බොහෝ උදව් කරමින් සිටී. සමහර අනතුරුවලින් ඔවුන් මහ පුදුමාකාර ලෙස අපව බේරා ගනු ඇත. දෙවියන් ඔවුන්ට ඉවත්වන ලෙස අණ දුන් අවස්ථාවල ඔවුන් තම උදව් දීම අතහැර දමණු ලැබේ.

මොහම්මද් නබි (ﷺ) තුමා කළ ඇතැම් යුද්ධ වලදී ඔහුට සහායක හමුදා වශයෙන් මලායිකාවරුන්ගේ සේනාවන් පැමිණි බවද කුරානයෙහි සඳහන් වේ.

සුළඟ ඒ මේ අත යැවීම, වලාකුළු මත ජලය එක් රැස් කිරීම, ඒවා විවිධ ස්ථාන වෙත තල්ලු කිරීම, ඒවායින් ප්‍රමාණවත් අයුරින් වැස්ස ලෙස ජලය පහලට එවීම ආදී සොභාවධර්මය ලෙස අපි හඳුන්වන පාරිසරික ක්‍රියාවන්ද ඉටුකරයි. ඒවා ඔවුන්ගේ කැමත්තට කරන කටයුතු නොව. දෙවියන් ඔවුන්ට අණ කර ඇති ආකාරයට ඔවුන් ඒවා සිදු කරයි.

ගැහැණු හෝ පිරිමි දරුවෙකු තමන්ට හොඳ නරක තේරෙන වයසට හෙවත් වැඩිවියට පැමිණි පසු ඔහු හෝ ඇය දවසේ පැය 24 පුරාම කරන කියන හොඳ සහ නරක දේවල් සටහන් කර ගැනීමද ඔවුන් විසින් සිදුකරයි. ඔවුන් ඇතිකර ගන්නා හොඳ හෝ නරක සිතුවිලි මලායිකාවරුන්ට නොපෙනේ. නමුත් ඒවා අල්ලාහ්ට පෙනෙණු ඇත. එහෙයින් (අල්ලාහ්ගේ කැමැත්ත මත) ඒවා අල්ලාහ් විසින් මලායිකවරුන්ට දැණුම් දෙනු ඇත. එවිට එය ඔවුන්ගේ සටහන් වල සටහන් කරගනු ඇත. ("රහසින් වත් පව් නොකළ යුතුයි" කියන්නේ මේ නිසයි. එය අකුසලයක් බවට සටහන් වී පසුව එයට අල්ලාහ් වෙතින් විපාක ලැබිය හැක. හොඳ සිතුවිළි ඇතිකරගත් විට ඒවාද සටහන් වන්නේද එලෙසමය). මෙම ලියාගත් සටහන මරණින් මතු (නියමිත විනිශ්වය දවසට) සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට ඒවා ඔවුන් නිසි පරිදි සුරක්ශිත කර තබනු ඇත.

පුද්ගලයෙකුට මරණය නියමු වූ වෙලාවට ඔහුගේ ආත්මය ශරීරයෙන් පිටතට ගනු ලබන්නේද මලායිකාවරුන්ගෙන් එයට නියම වූ අය විසිනි. ඉන්පසු එම ආත්මය ඔවුන්ට උපදෙස් දී ඇති ආකාරයට විනිශ්වය දින නැවත අලාලාහ් විසින් කැඳවනු ලබනතෙක් බර්සාඛ් නම් අවස්තාවේ (එයට නියමිත පරිසරය තුල) තබාගනු ඇත. එම කාලය තුලද මලායිකාවරුන් අපගේ ආත්මය සමග විවිධ ආකාරයට සම්බන්ධව කටයුතු කරණු ඇත. තමා ජීවිත කාළය තුල යහපත් හෝ අයහපත් ලෙස හැසිරුණු විදිහ අනුව මරණින් පසු ආරම්භ වන අලුත් ජීවිතයද පහසු හෝ වේදනාකාරී විය හැක. මලායිකාවරු ඒ සඳහා ගැලපෙන වටපිටාව සකසා දෙනු ඇත.

ඉන් පසු හදිසියේම විනිශ්වය සඳහා එක් මලායිකවරයෙක් විසින් මිය ගිය සියලු ආත්මයන්ට ඇසෙන ලෙස එක් නළා හඬක් නිකුත් කරනු ඇත. එවිට සියළුම ආත්මයන් සහ ඔවුන්ගේ දිරාපත් වී පස් බවට, දූවිලි බවට හෝ පරමාණු බවට පත් වූ තම ශරීර වලට අදාල සියල්ලද එක් ස්ථානයක් වෙත යොමුවෙනු ඇත. ඉන් පසු ඒවා එක්කොට නැවත ශරීයය ඇතිකොට එක් එක් පුද්ගලයන්ගේ ආත්මාවන් නැවත එම ශරීර වලට ඇතුල් කරනු ඇත. ඉන් පසු ඔවුන් දීර්ඝ කාලයක් එහි සිටගෙන සිටිනු ඇත. මේ අවස්ථාවේද මලායිකාවරු එම වටපිටාව හසුරුවමින් සිටිනු ඇත.

දෙවියන් විනිශ්චය සිදු කරන විට අපගේ සටහන් ලියාගත් අයද ඇතුළුව සියළුම මලායිකාවරු එතනට එනු ඇත.

විනිශ්චය දවසට පසු ස්වර්ගයන්ට පිවිසෙන්නන්ව පිළිගෙන ස්වර්ගයන්හි දොරටු විවෘත කරන්නේද ඒ සඳහා නියම වූ මලායිකාවරුන්ය.

අපායට නියම වූවන් එහි ඇතුළු කරන්නේද, ඔවුන්ට නිසි දඬුවම් ලබාදෙන්නේද එයට පත්කර ඇති මලායිකාවරුන් විසිනි. අපායේ සිටින මලායිකාවරුන්ට එහි පරිසරයේ කටුක ස්වභාවය අදාල වන්නේ නැත. එය ඔවුන්ට දුක්බර තැනක් නොව. ඔවුන්ව නිර්මාණය කර ඇත්තේ ඔවුන්ට එය පහසු වන ලෙසටය. නමුත් එහි ඇතුළුවූ මිනිසුන්ට එහි සිටීම ඉතාම දුෂ්කර වනු ඇත.

අර්ෂ් වටා සහ ඉන් පිටතින් ඇති අල්ලාහ්ගේ නිර්මාණය තුල අපට සිතා ගැනීමට නොහැකි තරමටම විශාලය. එය තුල කොතරම් නම් මලායිකාවරුන් සිටීදැයි අපට සිතා ගත නොහැකිය. ගනන් කල නොහැකි තරමින් එම ගනනය අධිකය. විශ්වයට එහා ඇති අර්ෂ් නම් අල්ලාහ්ගේ රාජධානිය ද ඉතාම විශාලය. එය පවා ඔසවා සිටින ආකාරයට මලායිකවරුන්ව අල්ලාහ් නිර්මාණය කර ඇත. විවිධත්වයෙන් සහ ගනණින් ඒවා අති විශාලය.

මේවා සියල්ලෙන් සර්වබලධාරී අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය මැනවින් විදහා දක්වයි.

කුරානය සහ හදීස් තුල නම් වශයෙන් සඳහන් මලායිකාවරු (දේවදූතයින්) කිහිපදෙනෙකුගේ නම් සහ ඔවුන්ට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහතින් දැක්වේ.

- ජිබ්රීල් (අලෙහිස්සලාම්) :- අල්ලාහ් හෙළිදරව් කළ දිව්‍ය පණිවිඩ පෘතුවිය වෙත රැගන ඒම.
- මීකායිල් (අලෙහිස්සලාම්) :- වර්ෂාව යැවීම, ජීවීන්ට පෝෂණය බෙදා හැරීම නියාමනය කිරීම
- ඉස්රාෆීල් (අලෙහිස්සලාම්) :- ලෝක විනාශයට සහ විනිශ්චය පැමිණෙන දවසේදී එය දැණුම් දීම සඳහා හොරණෑව පිඹීමට

- ඉස්රායිල් (අලෛහිස්සලාම්) :- මිනිසාගේ මරණය නියම ව ඇති වෙලාවට ඔහුගේ ආත්මය අත්පත්කරගැනීම.
- මුන්කර් (අලෛහිස්සලාම්) :- මුන්කර් සහ නාකිර් යන දේවදූතයන් දෙදෙනාම මිනිසා භූමදානය කල පසු ආත්මයෙන් මූලිකම ප්‍රශ්න කිරීමක් කරයි.
- නාකිර් (අලෛහිස්සලාම්) :- මුන්කර් සහ නාකිර් යන දේවදූතයන් දෙදෙනාම මිනිසා භූමදානය කල පසු ආත්මයෙන් මූලිකම ප්‍රශ්න කිරීමක් කරයි.
- රාකිබ් (අලෛහිස්සලාම්) :- මිනිසා ජීවත් ව සිටින කාලය තුල කරන හොඳ නරක සටහන් කිරීම
- ආතිද් (අලෛහිස්සලාම්) :- මිනිසා ජීවත් ව සිටින කාලය තුල කරන හොඳ නරක සටහන් කිරීම
- මාලික් (අලෛහිස්සලාම්) :- නිරයේ පාළන කටයුතු
- රිද්වාන් (අලෛහිස්සලාම්) :- විශ්වාසවන්තයින්ව ස්වර්ගයෙහිදී පිළිගැනීම

---

## අප සමග සිටින මලායිකාවරුන් සහ ඔවුන්ගේ කාර්යයන්

ගෞරවනීය මලායිකාවරුන් ආදම්(අ.ස) ගේ සියළුම දරුවන් සමඟ ඔවුන්ගේ මව්වරුන්ගේ කුස තුළ පිළිසිඳ ගත් දින සිට මරණයේදී ඔවුන්ගේ ආත්මයන් ශරීරයෙන් පිටතට ගෙන එන දිනය දක්වාත් ඔවුන් සමඟ පැමිණේ. ඔවුන් ඔවුන්ගේ සොහොන්වල සහ පරලොවදී ද ඔවුන් සමඟ යති.

ඔවුන් මෙලොවදී ඔවුන් සමඟ යන ආකාරය පහත පරිදි වේ:

**ආත්මය මෙලොවට රැගෙන ඒම.**

කළලය වයස දින 120ක් වන විට ජීවයට අදාල ආත්මය රැගෙන විත් කළලය තුලට ඇතුළු කිරීම ඊට අදාල මලායිකවරයා විසින් සිදු කරයි.

**ඔහුව නිර්මාණය කරන විට ඔවුන් ඔහුව රැකබලා ගනී**

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූ බව අනස් (රළියල්ලාහු) තුමාණන්ගෙන් වාර්තා විය: "අල්ලාහ් මවගේ ගර්භාෂය තුළ මලායිකාවරයෙකු පත් කරයි. 'ස්වාමීනි, නුත්ෆා (මිශ්‍ර බිංදුවක්), ස්වාමීනි, පිරිමි සහ ගැහැණු ලිංගික විසර්ජනයක්, ස්වාමීනි, 'අලකා (කැටියක්), ස්වාමීනි, මුඩ්ගා (හපන ලද මස් කැබැල්ලක්), ලෙස ඔහු පවසයි".

*එය නිර්මාණය කලයුතු බව අල්ලාහ් නියම කළ විට, (මලායිකාවරයා), 'ස්වාමීනි, මෙය පිරිමි හෝ ගැහැණුද? අවසානයේ විනාශය හෝ ආශීර්වාදයද ? ඔහුගේ විධිවිධානය කුමක්ද? ඔහුගේ ආයු කාලය කුමක්ද?...ලෙස අසා දැනගෙන එය ඔහුගේ මවගේ කුසෙහි ලියයි. [අල්-බුහාරි, මුස්ලිම්].*

**ඔව්හු ආදම්ගේ පුත්‍රයන් ආරක්ෂා කරති**

*ඔහුට (එක් එක් පුද්ගලයාට), ඔහුට පෙර සහ පසුපස අනුප්‍රාප්තිකව දේවදූතයන් ඇත. අල්ලාහ්ගේ අණ පරිදි ඔවුහු ඔහුව ආරක්ෂා කරති. [13:10-11]*

අල් කුර්ආනය පිළිබඳ හොඳම අවබෝධය ඇති විවරණකරු ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) පැහැදිලි කළේ මුවාකිබාත් මෙහි "අනුප්‍රාප්තික දේවදූතයන්" ලෙස පරිවර්තනය කර ඇත. මිනිසා ඉදිරියෙන් සහ පිටුපසින් ආරක්ෂා කිරීමට අල්ලාහ් පත් කර ඇති දේවදූතයන්, අල්ලාහ්ගේ නියෝගය පැමිණි විට (යම් අනතුරක් හෝ විපතක් යනාදිය ඔහුට සිදු විය යුතු බව ඔහු නියෝග කළ විට) දේවදූතයන් ඔහුගෙන් ඉවත් වේ.

එසේම, සෑම මනුෂ්‍යයයෙකුම නිදා සිටින විට සහ අවදියෙන් සිටින විට ජින්වරුන්ගෙන්, මිනිසුන්ගෙන් සහ වන මෘගයන්ගෙන් ආරක්ෂා කිරීමටද දේව දූතයෙකු පත් කර ඇති බවද සඳහන් වේ. එහෙත් අල්ලාහ් යමක් වීමට අවසර දුන්නොත් මලායිකාවරයා ඉන් ඉවත් වේ.

මිනිසෙක් අලි ඉබ්න් අබි තාලිබ් (රළි) ට මෙසේ කීවේය:

*"මුරාද් ගෝත්‍රයේ කණ්ඩායමකට ඔබව මරා දැමීමට අවශ්‍ය විය." 'අලි (රළියල්ලාහු අන්හු) තුමාණෝ, "සෑම මිනිසෙකු සමඟම අණ නොකළ සෑම දෙයකින්ම ඔහුව ආරක්ෂා කරන දේවදූතයන් දෙදෙනෙක් සිටිති; නියෝගය පැමිණි විට, ඔව්හු ඉවත් වන අතර, ඔහු සහ එය අතර නොසිටිති. මිනිසෙකුගේ නියම ආයු කාලය ඔහුගේ ආරක්ෂාවයි."*

*"ඔහු තම වහලුන්ව යටහත් පහත් කර පාලනය කරන්නේය. තවද ඔබට ආරක්ශකයින්වද ඇති කරන්නේය. ඔවුන් ඔබගෙන් සෑම කෙනෙකුවම මරණයට පත් කිරීමේ කාලය ළඟා වනතුරු ආරක්ශා කර, පසුව ඔහුව අපගේ දේවදූතයින් මරණයට පත් කරන්නාහ. ඔවුන් (නියමිත කාලයට පෙර හෝ පසුව හෝ පන අත්පත් කර) කිසිම වැරැද්දක් කරන්නේ නැත. [6:61]*

අල්ලාහ් එවන භාරකරුවන් පුද්ගලයෙකු වෙනුවෙන් නියම කර ඇති නියමිත කාලය (මරණය) පැමිණෙන තෙක් ආරක්ෂා කරයි.

**ඔවුන් මිනිසුන්ගේ හොඳ නරක ලියා තබයි**

*පුද්ගලයන්ගේ හොඳ සහ නරක ක්‍රියා ලියා තබන දේවදූතයන් [3:3]*

සෑම පුද්ගලයෙකුටම ඔහුගේ සුළු හා විශාල හොඳ - නරක දෙකම ලියා තබන දේවදූතයන් දෙදෙනෙක් සිටී. අල්ලාහ් පවසයි (අර්ථයේ අර්ථකථනය):

*"නියත වශයෙන්ම ඔබ කෙරෙහි දේවදූතයන් පත් කර ඇත. ඔවුන් ගෞරවනීය මලායිකාවරුන් දෙදෙනෙකි.(කිරාමන් කාතිබීන්). ඔබ කරන සෑම දෙයක්ම ඔවුන් නිවැරදිව දැන (ලියා) ගන්නාහ". [82:10-12]*

*"සැබවින්ම අපි මිනිසා මැව්වෙමු, ඔහුගේම ආත්මය ඔහුට පවසන දේ අපි දනිමු. තවද (අපගේ දැනුමෙන්) ඔහුගේ බෙල්ල නහරයට වඩා අපි ඔහුට සමීප වෙමු. ඔහු (හෝ ඇය) වචනයක්වත් නොකියයි, නමුත් ඔහු අසල මුරකරුවෙක් (එය පටිගත කිරීමට) සූදානම්ව සිටී. [50:16-18]*

දකුණු පස ඇති දේවදූතයා හසනාත් (යහපත් ක්‍රියා) සහ වම් පස ඇති දේවදූතයා සයියාත් (නරක ක්‍රියා) සටහන් කරයි.

අල්ලාහ්ගේ දූතයා (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූ බව අබූ උමාමාගෙන් වාර්තා විය: "මුස්ලිම්වරයෙකු නරක ක්‍රියාවක් කර පැය හයක් ගත වන තුරු වම් පස ඇති දේවදූතයා කිසිවක් ලියන්නේ නැත. ඔහු ඒ ගැන පසුතැවිලි වී අල්ලාහ්ගෙන් සමාව ඉල්ලන්නේ නම්, ඔහු එය පසෙකට දමන්නේය [එය ලියන්නේ නැත], එසේ නොමැතිනම් ඔහු එකක් (සයියා/නරක ක්‍රියාව) ලියා ගනී. [අල් තබරානි]

**මිය යන විට ආත්මය අත්පත් කර ගැනීම.**

මිනිසාගේ ආයුකාලය අවසන් වූ විට ආත්මය ශරීරයෙන් පිටතට අත්පත් කර ගැනීම. මරනින් පසු ඉදිරි කාලවලදීද මලායිකාවරුන් අප හා සම්බන්ධව විවිධ කටයුතු කරයි. ඒවා අතරින් කිහිපයක් නම්,

- අප මිය ගිය පසු නැවත දෙවියන් හමුවට යන තෙක් මිනීවල තුල අප ගත කරන බර්සාඛ් නම් ජීවිත කාලය පුරාම ඔවුන් අප සමග සිටී.
- විනිශ්චය දින ඔවුන් අපව හසුරුවමින් විනිශ්චය සඳහා දෙවියන් වෙත යොමු කරයි.
- නිරයට සේන් දූ වූවන්ට දඬුවම් ලබා දෙන්නේද ඔවුන්ය.
- ස්වර්ගයේ දොරටුවල සිටින්නේද ඔවුන්ය.

---

# මලායිකාවරුන් ගැන සඳහන් කුරාන් වැකි එකතුවක්

අපට හිතාගැනීමට බැරි තරම් විශාල කටයුතු ප්‍රමාණයකට දායකත්වය දක්වමින් මලායිකාවරුන් හෙවත් දේව දූතවරුන් අප සම්බන්ධවත්, විශ්වය හා ඊට ඉහලින් දෙවියන්ගේ රාජධානිය දක්වාත් ඇති පරාසය තුල විවිධත්වයෙන් සහ ගණනින් අති විශාලව හිඳිමින් තම දෙවියන් වෙනුවෙන් කටයුතු වල නියැලෙමින් සිටී.

ඔවුන් අපගේ පියවි ඇසට නොපෙනුනත් දෙවියන් ඔවුන් පිළිබඳව යම් තොරතුරු ප්‍රමාණයක් අපට දැනුවත් කර තිබේ. පහතින් දැක්වෙන්නේ එවන් තොරතුරු වල එකතුවකි.

1. පළමු මිනිසා (ආදම්)ව නිර්මාණය සම්බන්ධව

2. මිනිසාගේ ආරක්ෂාව සම්බන්ධව
3. සටහන් තබා ගැනීම සම්බන්ධව
4. මිනිසාගේ මරණය සම්බන්ධව
5. විනිශ්චය දින සම්බන්ධව
6. නිරය සම්බන්ධව
7. ස්වර්ගය සම්බන්ධව
8. ධර්මය සහ නබිවරයන් සම්බන්ධව
9. ජිබ්රීල් දේවදූතවරයා සහ අවසන් නබිතුමා සම්බන්ධව

*අහස් හිද, භූමියෙහිද ඇති අනිත් ජීවීන්ද අල්ලාහ්ට හිස නවා නමදින්නාහ. මලායිකාවරුන්ද එසේමය; (16:49)*

*අහස්ද, භූමියද, උත්පාදනය කර, දෙකක්, තුනක්, හතරක් අත් තටු වලින් යුත් මලායිකාවරුන්ව (තමන්ගේ) දූත මෙහෙවර ගෙන යන්නන් වශයෙන්ද පත් කල අල්ලාහ්ටම සියලු ප්‍රසන්සා. ඔහු කැමති දැය (තම) නිර්මාණයෙන් (පසුද) වැඩි කරන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් සියල්ල කෙරෙහි ඉතාමත් බලසම්පන්යෙකි. (35:1)*

*"නියත වශයෙන්ම අල්ලාහ් හැර වෙන දෙවියෙක් නැතැ"යි මලායිකාවරු සාක්ෂි දරන්නේය; (3:118)*

*මලායිකාවරුන්ගෙන්ද, මිනිසුන්ගෙන්ද අල්ලාහ් (තමන්ගේ) දූතයන්ව තෝරා ගන්නේය; (22:75)*

*විශ්වාසවන්තයිනි! ඔබ අල්ලාහ්වද, ඔහුගේ දූතයාවද, ඔහු තමන්ගේ මෙම දූතයා වෙත පහළ කළ ධර්මයද, මෙයට පෙර තිබූ ධර්මයන්ද විශ්වාස කරනු. කවුරුන් අල්ලාහ්වද, ඔහුගේ මලායිකාවරුන්වද, ඔහුගේ ධර්මයන්ද, ඔහුගේ දූතයන්වද, අවසාන දිනයද ප්‍රතික්ශේප කරන්නේද, ඔහු නියත වශයෙන්ම ඉතාමත් ඈත් වූ දුර්මාර්ගයෙහිම ගමන් කරන්නේය (4:136)*

*තවද මලායිකාවරුන්වද, නබිවරුන්වද දෙවිවරු වශයෙන් ඇරගනු" යයිද ඔහු ඔබට අණ කරන්නේ නැත; (3:80)*

*(මලායිකාවරුන්ව නමදිමින් සිටි) ඔවුන් සියල්ලන්වම ඒකරාශී කරන දිනදී, මලායිකාවරුන්ට "මොවුන් ඔබව නමදිමින් සිටි අය" යයි විමසනු ලැබේ. (34:40) එයට ඔවුන් "(අපගේ දෙවියනේ!) ඔබ ඉතාමත් පාරිශුද්ධවන්තයෙකි. ඔබමය අපගේ දෙවියන්. ඔවුන් නොව. (මොවුන් අපව) නොව, ජින්වරුන්වම නමදිමින් සිටියහ. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු ඔවුන්ව (එම ජින්වරුන්වම) විශ්වාස කරමින්ද සිටියහ" යයි පවසන්නාහ. (34:41)*

*(ඔබගෙන්) කවුරුන් අල්ලාහ්ටද, ඔහුගේ රසූල්වරුන්ටද, ඔහුගේ මලායිකාවරුන්ටද, ජිබ්රීල්ටද, මීකායිල්ටද සතුරෙකු වශයෙන් සිටිමින් (ඔවුන්ව ප්‍රතික්ෂේප කර) හැරියොත්, එම ප්‍රතික්ෂේප කරන්නන්ට නියත වශයෙන්ම අල්ලාහ්ද සතුරෙකු වශයෙන්ම සිටිනු ඇත. (2:98)*

*"(ඔබගෙන්) කවුරුන් ජිබ්රීල්ට සතුරෙකුද?"යි (නබියේ! ඔබ යුදෙව්වන්ගෙන්) විමසනු. නියත වශයෙන්ම ඔහු අල්ලාහ්ගේ නියෝගයන් අනුවම ඔබගේ සිත්හි මෙය දැඩි ලෙස තැබුවේය. (මෙය) තමන්ට පෙර ඇති ධර්මයන් සත්‍යය කරන්නක් වශයෙන්ද, ඍජු මාර්ගය දැණුම් දෙන්නක් වශයෙන්ද, විශ්වාසවන්තයින්ට ශුභාරංචියක් වශයෙන්ද ඇත්තේය. (2:97)*

**1). පළමු මිනිසා (ආදම්)ව නිර්මාණය සම්බන්ධව**

*(නබියේ!) ඔබගේ දෙවියන් මලායිකාවරුන්ට "මා භූමියෙහි (මගේ) නියෝජිතයා (ආදම්)ව නිර්මාණය කිරීමට යන්නෙමි" යැයි පැවසූ අවස්ථාවේදී, (එයට) ඔවුන් "(භූමියෙහි) නපුරුකම් කරමින් ලේ වගුරුවන්නට (පරම්පරාවක් බිහි කිරීමට) යන ඔහුව, එහි (ඔබගේ නියෝජිතයා වශයෙන්) පත් කරන්නෙහිද" අපි නම්, ඔබගේ පාරිශුද්ධභාවය පවසමින්, ඔබගේ ප්‍රශංසාව මගින් ඔබව සුවිශුද්ධ කරමින්ම සිටින්නෙමු" යයි පැවසූහ. (එයට දෙවියන් වහන්සේ) "ඔබ නොදැනුවත් දැය සියල්ල නියත වශයෙන්ම මා හොඳින් දැන සිටින්නෙමි" යයි පැවසුවේය. (2:30)*

*පසුව (ආදම්ව උත්පාදනය කර). ආදම්ට (භූමියෙහි ඇති) සියළුම (වස්තූන්ගේ) නම්ද (ඒවායේ ගුණාංගයන්ද) උගන්වා දී පසුව ඒවා (එම) මලායිකාවරුන්ගේ ඉදිරියේ තබා, ඔබ සත්‍යයවන්තයින් නම්, මේවායේ නාමයන් ඔබ මා හට දැනුම් දෙනු යැයි පැවසුවේය. (2:31)*

*(එසේ දැනුම් දීමට නොහැකිව) ඔවුන් (දෙවියන් වහන්සේට) "ඔබ ඉතාමත් පරිශුද්ධවන්තයෙකි. ඔබ අපට දැනුම් දුන් දැය හැරෙන්නට (වෙන කිසිවක්) අපි දන්නේ නැත. නියත වශයෙන්ම ඔබම හොඳින් දන්නෙකුද ඥානවන්තයෙකුද වශයෙන් සිටින්නෙහිය යයි පැවසීය. (2:32)*

*පසුව අපි මලායිකාවරුන්ට "ආදම්ට ඔබ හිස බිම තබා නැවී සුජූද් (ගෞරව) කරනු" යැයි පැවසූ විට, ඔවුන් (සියල්ල) සුජූද් කලහ. ඉබ්ලීස් හැර. ඔහු නම්, උඩඟු කමින් ඈත් වී (අපගේ අණ නොතකා) ප්‍රතික්ෂේප කර හැරියේය. (2:34)*

*ඔබගේ දෙවියන් මලායිකාවරුන්ට "මා මිනිසාව කිරිමැටියෙන් නිර්මාණය කරන්නට යන්නෙමි" යයි පැවසූ අවස්ථාවේදී. මා ඔහුව නිර්මාණය කර, ඔහු තුලට (මා උත්පාදනය කළ) මාගේ පණද ඇතුළු කළ හොත්, ඔබ ඔහුට සුජූද් (හිස*

*බිම තබා ගෞරව) කරනු" යයිද පැවසුවේය. ඒ අවස්ථාවේදී මලායිකාවරුන් සියල්ල සුජූද් කළහ. ඉබ්ලීස් හැර. ඔහු උඩුගු වී (අපගේ නියෝගය) ප්‍රතික්ශේප කරන්නන්ගෙන් කෙනෙකු බවට පත් විය. 38:71-74)*

*(එහි පළතුරු ආහාරයට ගතහොත්) ඔබ දෙදෙනා මලායිකාවරුන් වශයෙන් හෝ නැතහොත් මරණයක් නොමැත්තන් වශයෙන් හෝ බවට පත්වන්නෙහුය යන්න මිස, (වෙන කිසිවක් සඳහා හෝ) ඔබගේ දෙවියන් මෙම ගස ඔබට වැළැක්වූයේ නැත" (යැයි ඉබ්ලීස් ආදම් [අ.ස]ට සහ හව්වා [අ.ස]ට පැවසූහ); (7:20)*

**2). මිනිසාගේ ආරක්ෂාව සම්බන්ධව**

*ඔහුට (එක් එක් පුද්ගලයාට), ඔහුට පෙර සහ පසුපස අනුප්‍රාප්තිකව දේවදූතයන් ඇත. අල්ලාහ්ගේ අණ පරිදි ඔවුහු ඔහුව ආරක්ෂා කරති. (13:10-11)*

*"ඔහු තම වහලුන්ව යටහත් පහත් කර පාලනය කරන්නේය. තවද ඔබට ආරක්ෂකයින්වද ඇති කරන්නේය. ඔවුන් ඔබගෙන් සෑම කෙනෙකුවම මරණයට පත් කිරීමේ කාලය ළඟා වනතුරු ආරක්ශා කර, පසුව ඔහුව අපගේ දේවදූතයින් මරණයට පත් කරන්නාහ. ඔවුන් (නියමිත කාලයට පෙර හෝ පසුව හෝ පන අත්පත් කර) කිසිම වැරැද්දක් කරන්නේ නැත. (6:61)*

**3). සටහන් තබා ගැනීම සම්බන්ධව**

*පුද්ගලයන්ගේ හොඳ සහ නරක ක්‍රියා ලියා තබන දේවදූතයන් (3:30)*

*ඔවුන් ගෞරවනීය මලායිකාවරුන් දෙදෙනෙකි.(කිරාමන් කාතිබීන්). ඔබ කරන සෑම දෙයක්ම ඔවුන් නිවැරදිව දැන (ලියා) ගන්නාහ". (82:10-12)*

*"සැබවින්ම අපි මිනිසා මැව්වෙමු, ඔහුගේම ආත්මය ඔහුට පවසන දේ අපි දනිමු. තවද (අපගේ දැනුමෙන්) ඔහුගේ බෙල්ල නහරයට වඩා අපි ඔහුට සමීප වෙමු. ඔහු (හෝ ඇය) වචනයක්වත් නොකියයි, නමුත් ඔහු අසල මුරකරුවෙක් (එය පටිගත කිරීමට) සූදානම්ව සිටී. (50:16-18)*

**4). මිනිසාගේ මරණය සම්බන්ධව**

*(තවද) ඔවුන් (තමන්ගේ ධර්මයෙහි ඇති සත්‍යය සඟවා) ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව ප්‍රතික්ෂේප කරමින්ම මරණයටද පත් වන්නෝද, ඔවුන් කෙරෙහි අල්ලාහ්, මලායිකාවරුන්, මිනිසුන් ආදී සියල්ලගේ ශාපය නියත වශයෙන්ම අත් වන්නේය. (2:161)*

*එබැවින් (නබියේ!) ඔබ මෙසේ පවසනු; "ඔබ කෙරෙහි ඔබගේ දෙවියන් පවරනු ලැබ ඇති මලක්කල් මව්ත් (නැමති මලායිකාවරයා) ඔබගේ පණ අත්පත් කරගන්නෙහිය. පසුව (නැවතත් පණ දෙනු ලැබ), ඔබගේ දෙවියන් වෙතම ඔබව ගෙන එනු ලබන්නෙහුය." (32:11)*

*-මෙම අපරාධකාරයින් මරණ මංචකයේ සිටින අවස්ථාවේදී ඔබ ඔවුන්ව දකින්නේ නම්, මලායිකාවරුන් තමන්ගේ අත් දිගු කර (ඔවුන්ට) "ඔබගේ පණ ලබා දෙනු, අද දින අවමන් ගෙන දෙන දඬුවමම ඔබට ඵලවිපාක වශයෙන් දෙනු ලබනු ඇත. ඔබ සත්‍යය නොවන දැය අල්ලාහ් කෙරෙහි (බොරු ගොතා) කියා ඔහුගේ ආයාවන්ද උඩඟුකම මගින් ඔබ ප්‍රතික්ෂේප කිරීමම මෙයට හේතු වේ" (යයි පවසනු ඔබ දකින්නේය); (6:93)*

*තමන්ට තමන්ම අපරාධ කරගෙන සිටින මොවුන්ගේ පණ මලායිකාවරුන් අත් පත් කර ගන්නා විට, ඔවුන් "අපි කිසිම වැරැද්දක් කලේ නැත" යයි (කියමින් තමන්ව වේදනා ගෙන නොදෙනු යයි මලායිකාවරුන් වෙත) සමාදානය ඉල්ලා සිටින්නාහ. (එයට මලායිකාවරුන්) "නොඑසේය! නියත වශයෙන්ම අල්ලාහ් ඔබ කරමින් සිටි දැය හොඳින් දැනගෙනම සිටියේය" යයි පිළිතුරු දෙන්නේය). (16:28)*

*යහපත් අයගේ පණ, මලායිකාවරුන් ඔවුන් පාරිශුද්ධවන්තයින් වශයෙන් සිටියදී අත්පත් කර ගන්නාහ. (ඒ අවස්ථාවේ ඔවුන්ට) "සලාමුන් අලෙයිකුම්" (ඔබට සාමය හා සමාදානය අත්වේවා!). ඔබ කරමින් සිටි (දැහැමි ක්‍රියාවන්ගේ) හේතුවෙන් ස්වර්ගයට යනු" යයි පවසන්නාහ. (16:32)*

**5). විනිශ්චය දින සම්බන්ධව**

*(නබියේ! එදිනදී) මලායිකාවරුන් තමන්ගේ දෙවියන්ට ප්‍රශංසා කර සිව්ශුද්ධ කරමින්, අර්ෂ් වටා වට කරගෙන සිටිනු ඔබ දකින්නෙහිය; (39:75)*

*(ඒ වෙනුවෙන්) සූර් (නැමති හොරණෑව කවදා හෝ) පිඹිනු ලබන දිනදී ඔබ සමූහ සමූහ වශයෙන් පැමිණෙණු ඇත. (78:18)*

*අහස් වලාකුළෙන් වෙන්වන දිනදී මලායිකාවරුන් සමූහ සමූහ වශයෙන් බසිනු ඇත. (25:25)*

*(පරලොවදී ඇති වන) ඉමහත් තිගැස්සීමද ඔවුන්ව දුකට පත් කරන්නේ නැත. (ඒ අතර) මලායිකාවරුන් ඔවුන්ව සාදරයෙන් පිළිගෙන "ඔබට පොරොන්දු දෙන ලද (හොඳ) දියන මෙයයි" යයි ශුභාරංචි පවසන්නාහ. (21:103)*

*ප්‍රතික්ශේප කරන්නන් (එදිනදී දෙවියන්ට) "අපගේ දෙවියනේ! අපව මාර්ගය වැරද යාමට සැලැස්වූ මිනිසුන්වද, ජින්වරුන්වද අපට ඔබ පෙන්වනු. ඔවුන්ව අවමානයට ලක් කිරීම පිණිස, අපි ඔවුන්ව අපගේ කකුල් වලට යටින් තබා පාගා දමන්නෙමු" යයි පවසනු ඇත. (42:29) (එහෙත්) නියත වශයෙන්ම කවුරුන් "අපගේ දෙවියන් අල්ලාහ්ය" යයි පවසා (ඒ මත) ස්ථිරව සිටියෙහුද, ඔවුන් වෙත මලායිකාවරුන් පැමිණ (ඔවුන්ට) "ඔබ (කිසි දැයකට) බිය නොවනු. ඔබට පොරොන්දු දෙන ලද ස්වර්ගය මගින් ස තුටු වනු". (41:30)*

*(නබියේ!) මලායිකාවරුන් එහි පැති වල සිටින්නාහ. තවද එදිනදී ඔබගේ දෙවියන්ගේ අර්ෂ්, මලායිකාවරුන් අට දෙනෙකු තමන්ට ඉහලින් ඔසවාගෙන සිටිනු ඇත. (69:17)*

*(එය හමුවන) වසර පණස් දහසකට සමාන එක් දිනකදී මලායිකාවර්න්ද, (ජිබ්රීල් වන පාරිශුද්ධ වූ) ආත්මයද ඔහු වෙත නැග ගන්නාහ. (70:4)*

*(ජිබ්රීල් නැමැති පාරිශුද්ධ) ආත්මයද, මලායිකාවරුන්ද, කණ්ඩායම් කන්ඩායම් වශයෙන් සිටින එදිනදී කිසිවෙකුත් ඔහු ඉදිරියේ කතාද නොකරන්නාහ. එහෙත් කවුරුන් රහ්මාන්ගේ අනුමැතිය ලබා ගත් අතර සත්‍යය (පමණක්) කියන්නේද, ඔහු හැර. (78:38) ඔබගේ දෙවියන්ද පැමිණෙනු ඇත; (89:22)*

*මලායිකාවරුන්ද සාක්ෂි දරන්නේය. තවද, සාක්ෂි දැරීමට අල්ලාහ්ම ප්‍රමාණවත් වන්නේය. (4:166)*

### 6). නිරය සම්බන්ධව

*විශ්වාසවන්තයිනි! ඔබ, ඔබවද, ඔබගේ පවුලේ උදවියද, මිනිසුන්ද, ගල්ද ඉන්ධන බවට පත් කළ හැකි නිරා ගින්නෙන් ආරක්ෂා කර ගනු. එහි දැඩි හැකියාවන්ගෙන් පිරි ශක්ති සම්පන්නයන් වන මලායිකාවරුන්ව පත් කරනු ලැබ ඇත්තේය. අල්ලාහ් ඔවුන්ට නියෝග කර ඇති දැයෙන් (පොඩියක් හෝ) වෙනසක් නොකරනු ලබන්නාහ. ඔවුන්ට (දඬුවම් කරන මෙන්) තමන්ට දෙනු ලැබූ නියෝගයන්ම ඉටු කරමින් සිටින්නාහ. (66:6)*

*කවුරුන් (තමන්ගේ ධර්ම නියමයන් නිසියාකාරව ඉටු කළ නොහැකි සේ ප්‍රතික්ෂේප කරන්නන්ගේ රටෙහි සිටිමින්) තමන්ට තමන්ම අපරාධ කරගන්නෝද, ඔවුන්ගේ පණ මලායිකාවරුන් අත් පත් කරගන්නා අවස්ථාවේදී, (ඔවුන්ගෙන්) "ධර්ම නියමයන් ඉටු කළ නොහැකි රටෙහි ඔබ කෙසේ නම් ජීවත් වුවෙහුද?" යි විමසන්නාහ. (එයට) ඔවුන්, "එම භූමියෙහි අපි බෙලහීනයන් වශයෙන්ම සිටියෙමු" යයි පිළිතුරු දෙන්නාහ. (එයට මලායිකාවරුන්) "අල්ලාහ්ගේ භූමිය ඉතාමත් විශාලත්ව ඇත්තේ නොවෙද? ඔබ (සිටි) එය (එම*

*ස්ථානය) අත්හැර දමා පිටමං වී යායුතු නොවේද? යි විමසන්නාහ. මෙවැන්නන් රැඳෙන ස්ථානය නිරයයි. යන ස්ථානයන්ගෙන් එය ඉතාමත් නරකය. (4:97)*

*(නිරයෙහි ආරක්ෂකයින් වශයෙන් මලායිකාවරුන්වම මිස, (වෙන කිසිවෙකුත්) අපි නියම කළේ නැත. ප්‍රතික්ෂේප කරන්නන්ව පිරික්සීම සඳහාම (මෙසේ) මොවුන්ගේ ගණනය (දහ නව දෙනෙකු) වශයෙන් අපි ඇති කළෙමු. ධර්මය හිමි අය, (මෙය) ස්ථිර වශයෙන් විශ්වාස කළ යුතුය. මෙය විශ්වාසය තැබුවන්ගේ විශ්වාසය වැඩි කරනු ඇත; (74:31)*

*මලායිකාවරුන් ප්‍රතික්ෂේප කරන්නන්ව අත්පත් කරගන්නා අවස්ථාවේදී ඔවුන්ගේ මුහුණුවලටද, පිට කොඳු වලටද, පහර දී (නිරයට දක්කාගෙන ගොස්) "දවාලන (නිරා) දඬුවම (පොඩියක්) විඳ බලනු" යැයි පැවසීම ඔබ බැලිය යුතු නොවේද? (8:50)*

*එහි ඔවුන් ඉමහත් ශබ්ද නගා "අපගේ දෙවියනේ! (මෙයින්) අපව පිටමං කරනු මැන. අපි කරමින් තිබූ (නපුරු) දෙය නොවන දැහැමි දැයම (මින් පසු) කරන්නෙමු" යයි පවසන්නාහ. (එයට දෙවියන් ඔවුන්ට) 'හොඳ වැටහීමක් ලබා ගත හැකි අය, හොඳ වැටහීමක් ලබා ගන්නට ප්‍රමාණවත් දීර්ඝ කාලයක් දක්වා අපි ඔබව එහි (පණ පිටින්) අත්හැර දමා තිබුනේ නැද්ද? තවද, (මෙම ධර්මය ගැන) ඔබට බිය ගන්වා අනතුරු අඟවන්නෙකු නිතැතින්ම ඔබ වෙත පැමිණියේය. (ඔහුව ඔබම ප්‍රතික්ෂේප කර හැරියෙහුය). එබැවින් (නිරයේ දඬුවම) විඳිමින් සිටිනු. (ඔබ වැනි) අපරාධකරුවන්ට උදව් කරන්නන් කිසිවෙකුත් නැත" (යයි පවසනු ඇත). (35:37)*

*(මෙසේ තිබියදී ඔවුන් නිරයේ අධිපතිට) "ඕ මාලික්! ඔබගේ දෙවියන් අපගේ කාරණාව අවසන් කර දමත්වා! (මරණය මගින් හෝ අපට නිදහස ලැබුනාදෙන්!) යයි ශබ්ද නගන්නාහ. එයට ඔහු "(නොහැක)", නියත වශයෙන්ම ඔබ (මේ තත්වයටම දඬුවම් විඳිමින්ම නොමැරී) ස්ථිරව සිටිය යුතුය" යයි පවසනු ඇත. (43:77)*

### 7). ස්වර්ගය සම්බන්ධව

*අපි මෙලොව ජීවිතයේදී ඔබට උදව්කරුවන් වශයෙන් සිටියෙමු. පරලොවදීද (ඔබට උදව්කරුවන්ය). ස්වර්ගයෙහි ඔබගේ මනස කැමති වන ඕනෑම දෙයක් ඔබට ලැබෙණු ඇත". '(පාපයන්ට) සමාව දී කරුණාව දක්වන්නා වෙතින් සංග්‍රහයක් වශයෙන් ලැබෙණු ඇත" යයි (මලායිකාවරුන්) පවසනු ඇත. (41:32)*

*ස්ථිර වූ ස්වර්ගයන්හී මොවුන්ද, හොඳ ගති පැවතුම් ඇති මොවුන්ගේ පියවරුන්ද, මොවුන්ගේ වල්ලභයන්ද, මොවුන්ගේ පරම්පරාවේ දරුවන්ද ඇතුළුවනු ඇත.*

*සෑම දොරටුවකින්ම මලායිකාවරුන් මොවුන් වෙත පැමිණ-(13:23) (මොවුන්ට) "ඔබ (ඔබගේ ජීවිත කාලයෙහි අමාරුකම්) විඳදරාගත් හේතුවෙන් ඔබට ශාන්තිය හා සමාදානය අත් වේවා! (ඔබගේ මෙම) අවසන් නිවස ඉතාමත් හොඳ එකක් බවට පත් විය" යයි පවසනු ඇත. (13:24)*

**8). ධර්මය සහ නබිවරයන් සම්බන්ධව**

*මසීහ් (ඊසා) ද, ශ්‍රේෂ්ඨත්වයෙන් පිරි මලායිකාවරුන්ද අල්ලාහ්ට වහලුන් වශයෙන් සිටීම ගැන මදිපාඩුවක් වශයෙන් ගණන් ගනු ලබන්නේ නැත. කවුරුන් ගර්වීතව අල්ලාහ්ට වහලුන් වශයෙන් සිටීම මදිපාඩුවක් වශයෙන් දකින්නෝද, ඔවුන් සියල්ලන්වම (විනිශ්චය දිනදී) ඔහු තමන් වෙතම ගෙන ඒමට සලස්වන්නේය! (4:172)*

*තවද ('මොහු සත්‍යය දූතයෙකි' යයි සාක්ෂි දරන්නට) 'එක් මලායිකාවරයෙකු යැවිය යුතු නොවේද? යි ඔවුන් පැවසූහ. (ඔවුන් කැමති වන අන්දමට) අපි එක් මලායිකාවරයෙකු යවා තිබුනේ නම්, (ඔවුන්ගේ) කාරණාව අවසන් වී තිබෙන්නට ඉඩ තිබුණි! පසුව (එහි) ඔවුන්ට කිසිම කාල අවකාශයක්ද නොලැබෙන්නට ඉඩ තිබුණි. එවලේම විනාශ වී යන්නට ඉඩ තිබුණි). (6:8)*

*(පරලොවදී) අපව හමුවීම කවුරුන් විශ්වාස නොකළෝද), ඔවුන් "අප කෙරෙහි (නබිවරයෙකු ලෙස කෙලින්ම) මලායිකාවරයෙකු පහළ කල යුතු නොවේද? නැතහොත් (අපගේ ඇස් වලින්) අපි අපගේ දෙවියන්ව බැලිය යුතු නොවෙද? යි පවසන්නාහ. මොවුන් තමන්ව ඉතාමත් විශාලවත්ව අදහස් කර ගනිමින් සීමාව ඉක්මවා (යන්න) ගියහ. (25:21)*

*(නැතහොත් අපගේ) දූතයාව මලායිකාවරයෙකු වශයෙන්ම යැව්වා වුවද, (ඔවුන්ට ඔවුන්ව දකින්නට ශක්තියක් නොමැති බැවින්) ඔහුවත් එක් මිනිසෙකුගේ හැඩරුවෙන්ම යවන්නෙමු. (ඒ අවස්ථාවේදීද) දැන් ඇති සැකයම ඔවුන්ට අපි ඇති කළ අයෙකුම වන්නෙමු). (6:9)*

*(එයට 17.94) නබියේ! ඔබ මෙසේ පවසනු. "භූමියෙහි මලායිකාවරුන්ම වාසය කර, (එහි) ඔවුන් සමාදානයෙන් සැරිසරමින් සිටියේ නම්, අපිත් අහසින් එක් මලායිකාවරයෙක්ම (අපගේ දූතයා වශයෙන් ඔවුන් වෙත යවා ඇත්තෙමු. (එහෙත් ඔවුන් මිනිසුන් වශයෙන් සිටින බැවින් එක් මිනිසෙකුම ඔවුනට දූතයා වශයෙන් යැව්වෙමු)" (17:95)*

*ඔහු මලායිකාවරුන්ට වහී ලබා දී තම වහලුන්ගෙන් තමන් කැමති වන්නන් වෙත "නැමදුමට සුදුස්සා මා හැර වෙන කිසිවෙකුත් නැත, ඔබ මටම බිය වනු යයිම අනතුරු අඟවනු" යයි ඔවුන්ට නියෝග කර යැව්වේය. (16:32)*

*නියත වශයෙන්ම අල්ලාහ්ද, ඔහුගේ මලායිකාවරුන්ද, නබි කෙරෙහි සලවාත් පවසන්නාහ. (එබැවින්) විශ්වාසවන්තයිනී! ඔබත් ඔහු කෙරෙහි සලවාත් පවසා සලාම්ද පවසමින් සිටිනු. (33:56)*

*ඔහුගේ මලායිකාවරුන්ද ඔබ (විශ්වාසවන්ත යහපත් අය) වෙනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය; (33:43)*

*(මිනිසුන් කරන පාපයන්හී හේතුවෙන්) ඉහළ ඇති අහස පුපුරා ඇද වැටෙන්නටද ඉඩ ඇත. (නමුත්) මලායිකාවරුන් (බිය වී) තමන්ගේ දෙවියන්ව ප්‍රසංසා කර, සුවිශුද්ධ කර, භූමියෙහි සිටින්නන්ගේ (වැරදි වලට) සමාව දෙන මෙන් අයදිමින් සිටින්නාහ; (42:5)*

*අහස් හී කොපමනදෝ (විශාල වශයෙන්) මලායිකාවරුන් සිටින්නාහ; (53:26)*

*නියත වශයෙන්ම කවුරුන් පරලොව ගැන විශ්වාස නොකළෝද, ඔවුන් මලායිකාවරුන්ට ගැහැනුන්ගේ නම් තබන්නාහ. (53:27)*

**9). ජිබ්රීල් දේවදූතවරයා සහ අවසන් නබිතුමා සම්බන්ධව**

*(දිස්වී) සැඟවෙන තාරකාවන් මත සත්තකින්ම! (අපගේ දූතයා වන) ඔබ මිතුරා, මාර්ගය වැරද ගියේ නැත. ඔහු තම කැමැත්තට අනුව (කිසිවක්) පවසන්නේ නැත. මෙය ඔහුට වහී මගින් දැනුම් දෙනු ලැබූ දැයක් මිස වෙන කිසිවක් නොවේ; (53:1,2,3,4)*

*(ජිබ්රීල් නැමති) තේජවන්තයාම මෙය ඔහුට උගන්වා දෙන්නේය. ඔහු ඉතාමත් (ආත්ම) ශක්තියෙන් යුත්තෙකි. (තම ස්වභාවික හැඩරුවෙන් අපගේ නබි ඉදිරියේ දිස් වූවේය. ඔහු උස් වූ (අහසේ) ක්ෂිතිජයෙන් බැස- සමීප වී, පසුව අසළට පැමිණියේය. (නැවත) දුන්නේ දෙකෙළවර මෙන් හෝ ඊටත් වඩා සමීපයෙන් ඔහු ළං වූවේය. (53:5,6,7,8,9)*

*අල්ලාහ් ඔහුට දැනුම් දුන් සියල්ල ඔහු, ඔහුගේ (නබිවරයා වන) වහලාට වහී මගින් දැනුම් දුන්නේය. (නබිගේ) හෘදය, තමන් දුටු දැය ගැන බොරු කීවේ නැත. (53:10,11)*

*නියත වශයෙන්ම ඔහු තවත් වරක්ද (ජිබ්රීල් වන ඔහු මිහ්රාජ්) පහළ වනු දැක ඇත. සිද්රතුල් මුන්තහා නැමති ගසේ සීමාවෙහි- එහි සමීපයෙහිම (හොඳ වහලුන්) රැඳෙන ස්වර්ගය ඇත්තේය. එම ගස වටකර ගත යුතු දැය එය (සම්පූර්ණයෙන්ම) වට කර ගත්තේය. එයින් ඔහුගේ) බැල්ම ඈත් වූයේද නැත. පසු කළේද නැත. ඔහු තම දෙවියන්ගේ අති විශාල ප්‍රාතිහාර්යන් ඇත්තෙන්ම දුටුවේය. (53:12-18)*

## පෙර විසූ නබිවරු සහ අවසන් නබි මොහම්මද් (ﷺ)තුමා

නබිවරයෙක් හෙවත් අනාගතවක්තෘවරයෙකු යනු මනුෂ්‍ය වර්ගයාගේ ප්‍රතිසංස්කරණය සහ මග පෙන්වීම සඳහා අල්ලාහ් දෙවිඳුන් විසින් තෝරාගනු ලැබූ පුද්ගලයෙකි. ශුද්ධ වූ කුරාණය අනාගතවක්තෘවරයෙකු සඳහා රසූල් සහ නබි ලෙස අරාබි වචන දෙකක් භාවිතා කරයි

1. රසූල් (Messenger) යන පදයේ තේරුම 'පණිවිඩකරු' යන්නයි.
2. නබි (prophet) යන්නෙන් අදහස් කරන්නේ මිනිසුන් නොදන්නා සිදුවීම් පිළිබඳ පුවත් ලබා දෙන්නා යන්නයි.

සියලුම රසූල්වරුන් (Messengers) (පණිවිඩකරුවන්) අනාගතවක්තෘන්/ Prophets / නබිවරුන් වන අතර සියලුම අනාගතවක්තෘවරුන්/ Prophets/ නබිවරුන් රසූල්වරුන් Messengers/ පණිවිඩකරුවන් නොවේ.

උදාහරණ ලෙස. කුරානය තුල නබිවරු 25 ක් ගැන සඳහන් වේ. ඉන් 5 දෙනෙකු රසූල්වරුන් වේ.

මූසා නබි (අ.ස):- රසූල්වරයෙකි. (ඔහුට අල්ලාහ් දෙවිඳුන් විසින් වහී පහළ කර නව නීති රීති ලබා දී ඇත).

ඔහුගේ සහෝදර හාරූන් (අ.ස), නබි කෙනෙකි. ඔහුවත් අල්ලාහ් විසින් තෝරාගනු ලැබූවෙකි, නමුත් ඔහුට මූසා (අ.ස)ට මෙන් නව නීති රීති ලබා දී නැත. ඔහු මූසා (අ.ස) වෙත ලැබුණු දහමම, නීති රීතිම සමාජය වෙත ප්‍රචාරය කිරීම සිදු කළහ.

ඉස්ලාමය සෑම මුස්ලිම්වරයෙකුටම මුහම්මද් නබි (ﷺ) තුමාණන් වෙත පහළ වූ දහම පමණක් නොව, ඔහුට පෙර ලොව පහළ වූ අනෙකුත් සියලුම නබිවරුන් වෙත පහළ වූ සත්‍යය දහම්ද විශ්වාස කිරීම අනිවාර්ය කරයි.

අනාගතවක්තෘවරුන් දෙවියන් වහන්සේ විසින් උත්ථාන කරනු ලැබුවේ මනුෂ්‍ය වර්ගයා යහ මගට ගැනීමටය. ඔවුන්ගේ මූලික කාර්යය වන්නේ තම සමාජයේ මිනිසුන්ව දෙවියන් වහන්සේට සමීප කිරීමයි. එම කටයුත්තේදී ඔවුන් බොහෝ විරුද්ධවාදිකම්වලට මුහුණ දෙන නමුත් නොසැලී තම රාජකාරිය ඉටු කරන අතර අවසානයේ ඔවුන් ජය ගනී. සියලුම ජාතීන්ට දෙවියන් විසින් පණිවිඩකරුවන් (ලක්ෂයකට වඩා) යවා ඇති බව මුස්ලිම්වරු විශ්වාස කරති.

දෙවිඳුන් තම අවසන් නබිවරයාට මෙසේ පවසා ඇත.

*(අපගේ) දූතයාණෙනි! ඔබගේ දෙවියන්ගෙන් ඔබට පහළ කරන ලද දැය (කිසිම අඩුපාඩුවකින් තොරව ඔවුන්ට) දැනුම් දී හරිනු. ඔබ (එසේ) නොකලහොත් ඔවුන්ගේ දූත මෙහෙවර ඔබ ඉටු කල කෙනෙකු බවට පත්වන්නේ නැත. (මෙහිදී ඔබ කිසිවෙකුටවත් බිය නොවනු). මිනිසුන්ගේ (නපුරෙන්) අල්ලාහ් ඔබව (ආරක්ශා කර) බේරා ගනු ඇත.(5:67)*

මිනිසා විශ්වාස කළ යුතු කරුණු හයක් ඉස්ලාමය තුල පෙන්වා දෙයි. ඉන් හතරවැන්න නබිවරුන්ව විශ්වාස කිරීමයි.

**වත්මන් සමාජයට වලංගු දෙවිඳුන්ගේ අවසන් වක්තෘවරයා.**

දෙවියන්ගේ සියලුම නබිවරුන් කෙරෙහි විශ්වාසය මුස්ලිම් ඇදහිල්ලේ මූලික අංගයකි. පෙර වක්තෘවරුන් යම් ජාතියකට, ගෝත්‍රයකට හෝ ජන කොටසකට යවන ලද අතර, මුහම්මද් නබි (ﷺ) තුමාණන් සර්වබලධාරී දෙවියන් විසින් අවසන් කාලයේ වෙසෙන මුළු මිනිස් සංහතියටම එවන ලදී.

මුහම්මද් නබි (ﷺ) තුමාණන්ගේ ජීවිතය ඔහුගේ උසස් සදාචාරාත්මක ගුණාංග, අධ්‍යාත්මික බලය, අධිෂ්ඨානය, ඔහුගේ ඉගැන්වීම්වල විශිෂ්ටත්වය සහ පරිපූර්ණත්වය, ඔහුගේ පරිපූර්ණ ආදර්ශය, කෙටියෙන් කිවහොත් ඔහුගේ ජීවිතයේ සෑම අංශයකම, දීප්තිමත් සලකුණු ප්‍රදර්ශනය කළේය. ඔහු දිව්‍යමය පණිවිඩය ප්‍රකාශ කිරීමට කදිම නිදසුනක් වූ අතර පරිපූර්ණ මිනිසෙක් විය.

---

# නබිවරුන්ගේ පෙලපත.

විශ්වයේ සහ මිනිසාගේ මැවුම්කරු වන දෙවියන් වහන්සේ, පෘථිවියේ මිනිසුන්ට මඟ පෙන්වීම සඳහා ආසන්න වශයෙන් අනාගතවක්තෘවරුන් ලක්ෂයක් පමණ එවා ඇති බව හදීස් හෙවත් අවසාන නබි මොහම්මද් (ﷺ) තුමාගේ වචන වලින් දන්වා ඇත. අවසාන දිව්‍ය හෙළිදරව්ව වන ශුද්ධ වූ අල් කුරාණය තුල ඔවුන්ගෙන් විසිපස් දෙනෙකු ගැන සඳහන් වේ.

නබිවරුන්ගේ පෙලපත සකස් කිරීමේදී කුරානය සහ අවසන් නබිවරයාගේ දැනුම් දීම් පමනක් ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා පෙර පහළවූ ආගම් වලින්ද කරුනු උකහා ගැනීමට සිදුවිය.

නමුත්, කුරානයට පෙර පහළ වූ ආගම් වල, [උදාහරණයකට මෝසෙස් (අ.ස) සහ ජීසස් (ඊසා අ.ස) තුමන්ලා විසින් ජනතාවට ඉදිරිපත් කල තව්රාත් සහ

ඉන්ජීල් නම් ආගම්වල] අන්තර්ගතයන්ට පසුකාලීනව යම් යම් විකුර්තිතාවයන් ඇතිවී ඇති නිසා එවායින් සහ එම ඉතිහාස තොරතුරුවලින් ලැබෙන තොරතුරු 100% ක් නිවැරදි යැයි සහතික විය නොහැක. එනිසා නබිවරුන්ගේ පෙලපත සම්බන්ධව දළ වශයෙන් සකසා ඇති මෙම සටහනෙහිද සුළු හෝ අඩුපාඩු තිබිය හැක. නමුත් අධ්‍යයනයේ සහ වටහා ගැනීමේ පහසුවට මෙම සටහන ප්‍රයෝජනවත් විය හැක. මෙය සැකසීමට එම ඉතිහාසගත තොරතුරුද උපයොගී කරගන්නා ලදී.

මෙම සටහනෙහි කලු පැහැති බෝල මගින් පෙන්වා ඇති 25 දෙනා නබිවරුන්ය. ඔවුන්ගෙන් පස් දෙනෙකු පමණක් රසූල් වරුන් ය. එම රසූල්වරු නම්, නූහ්, ඉබ්රාහීම්, මූස, ඊසා සහ මොහම්මද් යන අයය. (සියළුම නබිවරුන්ට දෙවියන්ගේ සාමය හිමි වේවා!).

අනිකුත් අය ඔවුන්ගේ පරම්පරාවේ පෙර සහ පසු පැමිනි අයය.

මෙම සටහනින් පෙන්වා දෙන ප්‍රධාන කාරණා කිහිපයක්.

- පෘතුවියට පහළ වූ පළමු යුවලගේ මුල් පරම්පරාව.
- ඉතිහාසය තුලදී පෘතුවියෙන් ක්ෂය වී ගිය සමහර මිනිස් පරම්පරාවන්
- මහා ජල ගැල්මට පසු ඉතුරු වූ නූහ් නබිතුමාට පසු ඇතිවූ පරම්පරාව
- යුදෙව්, ක්‍රිස්තියානි සහ මුස්ලිම්වරුන්ගේ මී මුත්තෙකු වූ ඉබ්රාහීම් නබි තුමාගේ පරම්පරාව බෙදී වෙන් වූ ආකාරය.
- මෝසෙස් නබිතුමා ගෙන් පසු යුදෙව්වරුන් වෙන්වූ ආකාරය
- යේසුස් වහන්සේගේ අනුගාමිකයන් ඇති වූ ආකාරය.
- අවසාන නබිවරයා වන මොහම්මද් තුමාගේ පරම්පරාව පැමිනීම පෙන්නුම් කිරීම.

මීට අමතරව අප නොදැනගත් ප්‍රදේශවලටද දෙවියන්ගේ පණිවිඩය රැගෙන ගිය නබිවරුන් බොහෝ ගනනක් බිහි වන්නනට ඇත.



Allah(SWT) Knows Best
ආදම් (අ.ස) [පලමු මිනිසා]
හව්වා (අ.ස.) [පලමු කාන්තාව]
කුරාන් හි සදහන් නබිවරුන් (සහ කුරාන් හදීස් ඇතුලුව පැරණි දේව ග්‍රන්ථ සහිත ආගම් වල ඉතිහාස වලත් සදහන් ආකාරයට ඔවුන්ගේ පෙලපත් ඇති වූ ආකාරය පෙන්වන අධ්‍යයනයේ පහසුවට සැකසූ දල සටහනකි මෙය) . Genealogy of Prophets.
Direct Descendant
Skip Generations
Male
Female
Prophets
ආදම් ගේ සිට ඉබ්‍රාහිම් දක්වා පෙලපත් ඇතිවූ ආකාරය
Father of Arabs...
Father of Romans...
Father of Africans..
Arab Al Bakia
Still Remaining Arabs
Arab Al Bakiya
Lost Arab Nations
The Original Arabs
(Because they start speak Arabic)
Father of modern Arabs
Came from Babil city--
1st Generation we found in Arabian peninsula (Around 5000 years ago)
Khahthani Arabs
Adnaanii Arabs
ඉබ්‍රාහිම් (අ.ස)
From Iraq
From Egypt
Came from North Iraq(U'rr)
To Mecca
ඉස්මායිල් (අ.ස)
ඉස්හාක් (අ.ස)
Children
Jews start from here
Nabataea's
They were converted to Christianity
මූසා (අ.ස)
හාරූන් (අ.ස)
යූනුස් (අ.ස)
අයියූබ් (අ.ස)
ශුඅයිබ් (අ.ස)
සාලිහ් (අ.ස)
ඉල්යාස් (අ.ස)
අල්යසඅ (අ.ස)
සකරියා (අ.ස)
යහියා (අ.ස)
ඊසා(අ.ස)
Jesus(pbuh)
අද්නාන්
Direct from Adnaani Arabs
Arab Al Musthariba
They learnt Arabic and became as super Arabs
මොහම්මද් නබි (සල්) තුමාගේ මවගේ සහ පියාගේ පරම්පරා පැමිනි ආකාරය
Father
Mother
මොහම්මද් (සල්)

# මොහම්මද් නබිතුමා (ﷺ) යනු කවුරුන්ද? (ලිපි 1)

අපි එදිනෙදා විවිධ අවස්ථාවල විවිධ පුද්ගලයන්ව විශේෂත්වයකින් යුතුව සිහිපත් කරනවා. බෞද්ධයන් බුදුන් වහන්සේවද, කිතුනුවන් ජේසු (ඊසා අ.ස) තුමාවද, මුස්ලිම්වරුන් මොහම්මද් නබි (ﷺ) තුමාවද, සමහරු ක්‍රීඩකයන්වද, සමහරු නළු නිලියන්වද, දරුවන්වද, ප්‍රේමවන්තයින්වද, මිය ගිය අය ද ඒ අතර වෙයි.

වර්තමාන ලොවේ ජනගහනයෙන් අති මහත් ජනතාවක් මොහම්මද් නබි(ﷺ) තුමාව අන් කිසිම පුද්ගලයෙකු සිහි නොකරන විශේෂ ක්‍රමයකට සිහිපත් කරන බව ඔබ දැක තිබේද? එය මෙම පරිච්ඡේදයෙත් ලිපිය අවසානයටත් ලියා ඇත.

එතුමා තම වයස වසර 40ක් වෙනතුරු මක්කාවේ කාන්තාරයේ සාමාන්‍ය මිනිසකු වශයෙන් වෙල-හෙළදාම් කරගෙන සිටි කෙනෙකි. ලියන්නට කියවන්නටවත් බැරි අධ්‍යාපන මට්ටමක සිටි එතුමා එම කාලය තුල කිසිම දේශපාලන හෝ ධර්ම ප්‍රචාරයක හෝ නොයෙදුන කෙනෙකි. යුධමය වශයෙන් දස්කම් පෑමක් නොපෙන්නපු, යන්තර මන්තර හුනියම් වල හෝ නිපුනත්වයක් නොපෙන්නපු, කිසිම කලාත්මක හැකියාවක්වත් නොතිබුණු කෙනෙකි. කුඩා කාලෙම දෙමාපිය සෙනෙහසද අහිමිව සිටි එතුමා කිසිවකින් ප්‍රසිද්ධියක් නොලබා ඉතාම සාමකාමීව සරළව හිටපු කෙනෙකි. නමුත් ඔහුට "විශ්වාසවන්තයා" යන පටබැඳි නමින්ම යම් පිළිගැනීමක් තිබිනි. වයස 40 සිට 63 දී මිය යන තෙක් නම් එතුමා තුලින් සුවිශේෂත්වයක් පෙන්නුම් කළේය.

මෙතුමා ගැන සොයා බැලීම ඔහු ගැන නොදන්නා ඔබ සැමගේ යුතුකමක් සහ වගකීමක් යැයි මම ඔබට දැනුවත් කිරීමට කැමතියි.

මෙතුමා ගැන සොයා බැලීම ඉතාම වැදගත් බව පහතින් මම ඉදිරිපත් කර තියෙන කරුණු දිහා බැලුවම ඔබටද වැටහෙයි. එසේ වුවත්, මෙතුමා ගැන සත්‍ය කරුණු සොයා බැලීමට ඇති වටපිටාව අපේ සමාජයේ යම් කිසි කොටසක් විසින් තම තමන්ගේ පුද්ගලික වාසි තකා විවිධ උපක්‍රම භාවිතා කර සමාජයට සඟවා තබන්න උත්සහයක නිරත වී සිටින බවද දැකිය හැක.

බුදුන් වහන්සේට බොදුනුවන් කොතරම් ආදරය කරනවද, ජේසු තුමා (ඊසා අ.ස)ට කිතුනුවන් (මෙන්ම සත්‍ය නම් කිතුනුවන්ට වඩා මුස්ලිම්වරුන්) කොතරම් ආදරය කරනවද. එසේම, මොහම්මද් නබි(ﷺ) තුමාට සැබෑ මුස්ලිම්වරුන් තම පනටත් වඩා ආදරය කරනවා. ඔබ කුමන ආගමිකයෙකු වුවත් මොහු ගැන සොයා බැලීමෙන් ඔබට යහපතක් මිස අයහපතක් සිදු නොවනු ඇත.

වැලි කාන්තාරයේ මෙතුමා සමග සිටි හිතවතුන් එතුමා ගේ අවසන් වසර 23 තුල සිදුවූ සියල්ලද, එනම්, එතුමා කියපු කරපු දේවල්ද, එතුමා හොඳයි නරකයි කියා වෙන්කර පෙන්නපු දේවල්ද, අනුමත හා ප්‍රතික්ෂේප කල දේවල්ද ආදී වශයෙන් වූ සියල්ලම පුදුම පරිස්සමකින්ද පුදුම භක්තියකින්ද අනාගතය වෙනුවෙන් ලියා සටහන් කර සුරක්ෂිත කර අපටද බලාගන්න පුළුවන් විදිහට දායාද කර දී තිබේ. මෙතුමාගේ චරිතයෙන් තරම් තොරතුරු එක්රැස් කර පොත් වශයෙන් එළිදක්වපු වෙනත් කිසිදු චරිතයක් නැතුව ඇතැයි විශ්වාස කල හැකිය. (එම පොත් වලට අරාබි බසින් 'හදීස්' යැයි කියනු ලැබේ)

මොහු ගැන තමයි ඔබ නොදැන හිටියේ. ඔබ නොදැන සිටිය නොව, ඔබෙන් එම මාර්ග වසා දමා තියෙනවා කියලයි මගේ මතය. එය කව්ද කලේ, කව්ද කරන්නේ, කුමන හේතුවකටද කලේ, කුමන හේතුවකටද කරන්නේ යන්න පසුව ඔබටම වැටහෙයි. මොහු මෙතරම් විශිෂ්ඨ වෙන්න හේතුව සහ ඔහුගේ විශිෂ්ඨ ක්‍රියාවන් මොනව දැයි මම තවම සටහන් කලේ නැත. ඉදිරි පරිච්ඡේදය තුලින් එය පෙන්නුම් කරයි.

එතුමාගේ වයස අවුරුදු 40 න් පසු සුවිශේෂී විපර්යාසයක් එතුමා තුලින් දෘශ්‍යමාන වන්නට පටන් ගැනුනි. සිදුවුයේ කුමක්ද යන්න මම අවසානයට සඳහන් කරන්නම්. එතෙක්, මේ සාමාන්‍ය මනුස්සයා එකපාරටම වෙනස් වුණේ මොන පැතිවලින්ද කියලා බලමු.

1. ලියන්නට කියවන්නට බැරි ඔහු ලොව විශිෂ්ඨතම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේය.
2. එතුමා එම ග්‍රන්ථය තුලින් නුතන විද්‍යාඥයන් පවා මවිත කරවන විද්‍යාත්මක තතු හෙළි කළේය.
3. ලෝක ඉතිහාසය ගැන එතුමා තතු හෙළි කළේය. අනාගතය ගැන අනාවැකි ඉදිරිපත් කළේය.
4. නීතිය ගැන එතුමා කරුණු ප්‍රකාශ කර නීතියක් ස්ථාපිත කළේය.
5. ධර්මයක් ප්‍රකාශ කර ජනයා ඒ වෙත කැඳවන්නට විය.
6. හොඳ නරක පිළිබඳව උපදෙස් දෙන්නට ආරම්භ කෙරිණි.
7. දක්ෂ කථිකයෙකුගේ ලක්ෂණ පෙන්වන්නට පටන් ගැණිනි.
8. එකම ධජයක් යටතට ජනතාව පෙලගස්සන්නට විය.
9. එතුමා සමාජ සංශෝධකයෙක් ලෙස ක්‍රියාත්මක විය.
10. එතුමා අවිහින්සාවේ ආදර්ශය විය.
11. යුධ පිටියේදී එතුමා සෙන්පතියෙකු විය. රාජ්‍ය නායකත්වය, ජනාධිතිධූරය දැරිය (නමුත් එය සුවිශේෂී නායකත්වයකි).
12. එතුමා එවක සිටි ජනතාවට සමහර ප්‍රාතිහාර පෙන්වීය.

වැලි කාන්තාරයේ තිරිසනුන් ම්ලේච්චයන් මෙන් නූගත් කමේ ඉහලින්ම සිටි, ලොවත් සමග කිසිදු සම්බන්දතාවයක් නොපවත්වා හුදකලාවේ රජයමින් සිට වෙළදාමට තවලම් සදහා පමණක් (ඔටුවන්, බූරුවන් පිට නැග) සංචාර වල යෙදෙමින් සිටි තම අසල්වාසීන් සමග සිටි මෙතුමා තම ග්‍රන්ථය තුලින් කතා කල විෂයයන් මොනවද කියල ටිකක් හොයල බලමු.

**(01) ලියන්නට කියවන්නට බැරි ඔහු ලොව විශිෂ්ටතම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේය.**

(වසර 3000 ට පෙර) ඉතිහාසය දෙස බලන විට මෝසෙස් හෙවත් මූසා නබි (අ.ස)ගේ කාලය මැජික් හෙවත් සූනියම් කලාවට ප්‍රසිද්දියක් ඉසිලූ බව අපිට දැනගන්නට පුළුවන්. වසර 2000 ට පෙර එනම් ජේසු (ඊසාඅ,ස)ගේ කාලයේ රෝග සුව කිරීම වැනි වෛද්‍ය විද්‍යාව සම්බන්දව ප්‍රසිද්ධියක් ඉසිලුව. මිට වසර 1500 කට පෙර මොහම්මද් නබි (ﷺ)ගේ කාලයේ අරාබිකරය පුරාවට කාව්‍යකරණ කලාවට මහත් ප්‍රසිද්දියක් ඉසිලීය. අති දක්ෂ කවියන් සිටි පරිසරය තුල කිසිදිනක කවියක් හෝ ගෙතු බවටද සඳහනක් නැති, ලියන්නට කියවන්නටවත් බැරි මොහම්මද් (ﷺ) තුමා වසර 40 ට පසු අති දක්ෂ කවිකාරයෙකු ලෙස දිස් වන්නට විය. ඔහුගෙන් ප්‍රකාශ වූ කාව්‍යමය වදන් වලින් මුළු මහත් මානව සංහතියටම අභියෝගයන් රාශියක් ඉදිරිපත් කර තිබේ. පුලුවන්නම් එතුමා ගෙනා ග්‍රන්ථයට සමාන ග්‍රන්ථයක් (පරිච්චේද 114 ක්) නිර්මාණය කර පෙන්න්වන ලෙස. තව වරක, පුලුවන්නම් පරිච්චේද 10 ක්ද, නැත්නම් පුලුවන්නම් එක පරිච්චේදයක් නිර්මාණය කර පෙන්වන ලෙස අභියෝග ඉදිරිපත් කර තියෙනවා. එම අභියෝගය අදටත් එලෙසම පවතී.

- එතනින් නතර නොවූ එතුමා, ඔහුගේ ග්‍රන්ථයෙහි කිසිඳු සැකයක් නොමැති බව පවසයි. පුලුවන්නම් එකම එක වරදක්, නොගැලපීමක්, ව්‍යාකරණ දෝෂයක් හෝ සොයා පෙන්න්වන ලෙසටද අභියෝග කර තියෙනවා. එවක සිටි අති දක්ෂ කවිකාරයන්ට කල මේ අභියෝගය අද අප ඉදිරියේත් පවතී.
- නූතනයේ අරාබි සාහිත්‍යයේ විශිෂ්ඨම ග්‍රන්ථය ලෙස සලකනු ලබන්නේද එතුමා ගෙනා මෙම ග්‍රන්ථය බව සමහර විට ඔබ නොදන්නවා ඇති. නමුත් සත්‍යය එයයි.
- ඔහු තමාගේ ග්‍රන්ථයෙන් කියා සිටිනවා එම ග්‍රන්ථය ලොව අවසන් වෙනතුරු කිසිඳු අයුරකින් වෙනසකට හෝ විනාශයට ලක් නොවී ආරක්ෂා වන බව.
- වසර 1400 කට පෙර කිවූ එම කියමන සත්‍යය කරමින් අදටත් එම ග්‍රන්ථයේ එකම එක අකුරකුදු තිතකුදු වෙනසක් නොවී පැවතීම කෙතරම් භාග්‍යයක්ද.

- අදටත් ලොවේ සෑම මොහොතකම ලොවේ කොතැනක හෝ මෙම ග්‍රන්ථය මිනිසුන් විසින් පරායනය කරමින් පවතින බවද සත්‍යයකි.
- මෙතුමා ගෙනා මෙම ග්‍රන්ථය අද ලොවෙහි 1/4 ක් තරම් වූ ජනතාවකගේ මහත් භක්තියදරයටත් ගෞරවයටත් පාත්‍ර වී ඇත.
- එහි තිබෙන භාෂා විලාශයද, උච්චාරණ ශෛලයයද, කුඩා දරුවෙකුට පවා කියවා තේරුම් ගෙන මතක තබා ගැනීමේ පහසුකමද, කියවීමේදීත් ඇසීමේදීත් මහත් රුචියක් ගෙනදීමේ ස්වර රටාවද විශ්මය ජනකය.
- ඔහු ගෙනා ග්‍රන්ථය මෙලොව බිහිවූ විශිෂ්ටතම ප්‍රතිහර්යයයි. ඉදිරියේදී ඒ බව ඔබට ඔප්පු වෙයි කියා මම විශ්වාස කරනවා .

**(2) එතුමා එම ග්‍රන්ථය තුලින් නුතන විද්‍යාඥයන් පවා මවිත කරවන විද්‍යාත්මක තතු හෙළි කළේය.**

වසර 1400 කට පෙර කිසිදු මනුෂ්‍ය බුද්ධියකින් කිව නොහැකි (නුතන විද්‍යාවෙන් 100% ම සත්‍ය බවට තහවුරු වුනු) කරුණු රාශියත් ඇතත් ලිපිය දිග වැඩිවන නිසා ඒ පිළිබඳව සඳහන් කිරීම මෙතනින් නතර කරමි.

තම ජීවිතයේ කිසිම දවසක සාගර තරණයක නොයෙදුණු මෙතුමා සාගර විද්‍යාව ගැන කතා කළහ. මහා සාගරයේ ගැඹුරු පතුලේ තත්වය ගැන තොරතුරු කියන්නට විය. ලවණ සාන්ද්‍රනයන්ගේ සුවිශේෂී තත්වයන් ගැන කියන්නට විය.

වැලි කාන්තාරයේ ජල හිඟයෙන් උපරිම පිඩාවෙන් පසුවූ තුමා ජල විද්‍යාව ගැන ප්‍රකාශ කරන්නට විය. ජල චක්‍රය ගැන කියන්නට විය. වැසි ජලයේ වේගය ද ජල බිංදු වල ප්‍රමාණයන් ගැනද එහි නොපෙනෙන විද්‍යාත්මක තතුද මෙතුමා හෙළි කරන්නට විය.

නුතන විද්‍යාත්මක උපකරණ වන හර්බල්, ජේම්ස් වෙබ් ටෙලෙස්කොප් වැනි දුරේක්ෂ ආධාරයෙන් ද චන්ද්‍රිකා හා පරිගණක තාක්ෂණයේ ආධාරවලින් ද හෙළි කෙරුණු විශ්වය බිහිවීම ගැනද, විශ්වයේ ප්‍රසරණයද සෞරග්‍රහ මණ්ඩලයේ ගමන් මග පිළිබඳවද, සූර්ර්යයාගේ චලනද, සූර්ර්යයගේද වෙනත් තාරකාවලද චන්ද්‍රයාගේ භෞතික තත්වයන් ගැනද අහස් ස්ථර පිළිබඳවද, එනම් ආකාශ විද්‍යාවට/ තාරකා විද්‍යාවට අදාල තොරතුරු එතුමා තම ග්‍රන්ථයෙන් කියා තිබීම ද විශ්මයජනක නොවේද?

පෘථිවියෙහි හැඩය ගැනද, දිවා රාත්‍රී ඇතිවීමේ විද්‍යාත්මක ස්වභාවයද, පොලොව නොසෙල්වී පැවතීම සඳහා කඳු පොලොව තුලට කිඳා බැස ගත් කුඤ්ඤ ලෙස පවතින බවද, වැසි ජලය පොලොව තුලට උරා උල්පත් බිහිවන බවද (එනම් භූගත ජලය පිළිබඳව), පොළොවේ පහත්ම භූමියක සිදුවන (පසුව සිදු වුන)

අනාවැකි ගැනද වශයෙන් භූගෝල විද්‍යාවට අදාල කරුණු ගැනද එතුමා කියන්නට විය.

ලාමර්ක්, චාර්ල්ස් ඩාවින් වැනි මහා උගතුන් විසින් මිනිසාගේ ආරම්භය සහ පරිණාමය ගැන ඉදිරිපත්කර තිබූ පරිණාම වාදයන් අද නූතන විද්‍යාව හමුවේ බිඳී සුනු විසුනු වී යද්දී මොහම්මද් නබි (ﷺ) තුමා ඒ පිළිබඳව වසර 1400 කට පෙර කියා තිබුණු කරුණු දැන් සත්‍ය වෙමින් පවතින බවද ඔබ සමහර විට නොදන්නවා විය හැක.

පිහිය කතුර ඉදිකටුව වැනි ප්‍රාථමික විද්‍යා උපකරණ පමණක් තිබුණු එම යුගයේ, කිසිදු වෛද්‍යමය ශිල්පයක් නොහදාරා සිටි එතුමා කළල විද්‍යාවට අදාල කරුණුත් ජාන තාක්ෂණ විද්‍යාට අදාල කරුණුත් ප්‍රකාශ කරන්නට විය. එතුමා එදා කී ඒ කළල අවස්ථාවන්ද, ස්වභාවයන්ද, කළලයන්හි හැඩයන්ද අද නූතන විද්‍යාවෙන් සත්‍ය බවට තහවුරු වෙමින් පැවතීම පුදුම සහගත නොවන්නේද?

ඇඟිලි සලකුණු වල ඇති විශේෂත්වය ගැනද සංවේදී සමෙහි විද්‍යාත්මක තොරතුරුද, ජීවී සෛලයන්ගේ සංයුතිය ගැනද, කථා කරන ඔහු ජීව විද්‍යාවේ නිපුන වෛද්‍ය වරයෙක් නොවන බවද සිහිපත් කරගන්න.

පරමාණුවේ කුඩා අවස්ථාව ගැනද මතක් කරන ඔහු රසායන විද්‍යාවද අමතක කර නැත.

බීජ වල ස්වභාවයන් ගැනද ඒවායේ ස්ත්‍රී පුරුෂ භාවයන් ගැනද සිහිගන්වමින් උද්භිද විද්‍යා ක්ෂේත්‍රයෙන්ද ඉතාම සියුම් දේ ඉස්මතු කර පෙන්වයි.

මී පැණිවල ගුණය ගැනද මී මැස්සාගේ උදරය තුල සිදුවන ක්‍රියාව ගැනද, මී මැස්සාගේ ලිංගය නිර්ණය කිරීමද, වස්සාගෙන් ලැබෙන කිරි, එය ඉකුත් වෙන ස්ථානය ගැනද, ඌරු මාංශයේ නුසුදුසුකමද, ආදී වශයෙන් උදාහරණ ගෙන ඉදිරිපත්කල සත්ව විද්‍යාත්මක කරුණු ගැනද නූතන විද්වතුන් තමන්ගේ විශ්මය පළකරයි.

**3) ලෝක ඉතිහාසය ගැන එතුමා තතු හෙළි කළේය.**

ජේසු (ඊසා අ.ස) ගැනද, එතුමාගේ මව මරියම් (අ.ස) ගැනද, මොසෙස් (මූසා අ.ස) තුමා ගැනද, ඉබ්‍රාහිම්(අ.ස) ගැනද, එතනිනුත් එහාට ගොස් පළමු මිනිසා වන ආදම්(අ.ස) ගැනද ඒ අතර තුල විසූ බොහෝ සුවිශේෂී පුද්ගලයන්ගේ තොරතුරුද ඉදිරිපත් කරන්නට විය. කිතුනුවන් ළඟද යුදෙව්වන් ළඟද තියෙන ධර්ම පුස්තකවල සඳහන් රහසිගතව සඟවා තබා ගත් ඉතිහාසයේ තොරතුරුද කිසිම කෙනෙකු නොදත් ඉතිහාසයේ තොරතුරුද එතුමා හෙළිකරන්නට විය. කිසිවෙකු

නොදැන සිටි ඉතිහයසේ තොරතුරු ගැන මෙතුමා කී කතා නූතන විද්‍යාවෙන් තහවුරු කරගත් අවස්ථා කිහිපයක්ම ඇත. අද නූතන යුගයේ පර්යේෂකයන් කැනීම් වලින් සොයාගෙන තහවුරු කරගත් වසර දහස් ගණන් ඉපැරණි තොරතුරු එතුමා කෙසේ නම් කීවාද යන්න ඔබට ගැටළුවක් නොවේද? ඒ අතර මිසරයේ සැගව ගොස් තිබූ මමී ගැනද, වසර දහස් ගණනකට පෙර විනාශ වී ගොස් සැගව ගිය නගරයන් පිළිබදවද එම නගර වල විසූ මිනිසුන් මුහුණ පෑ විනාශයන් ගේ ස්වභාවයන් ගැනද, ලොව ප්‍රකට මහා ජල ගැල්ම ගැනද, මළ මුහුදේ ඉතිහාසය ගැනද මෙතුමා ප්‍රකාශ කල තොරතුරු කිසිවක් අඩුපාඩු සහිතද වරද සහිතද ඒවා නොවීම පුදුම සහගත නොවන්නේද? අමතක කරන්න එපා එතුමා වෙළදාමට ඔටුවන්, බූරුවන් පිට කෙටි සංචාරවල පමණක් යෙදී සිටිය කෙනෙකු බව.

බොහෝ පුද්ගලයන්ගේ ආගමික සහ චර්යාමය ඉතිහාසයන් ගැන එතුමා කෙසේ ප්‍රකාශ කලාද යන්න ඔබට ප්‍රශ්නයක් නොවේද? එවක තිබූ සන්නිවේදන සහ ප්‍රවාහන පහසුකම්වල තත්වය ගැන ඔබටද වටහා ගත හැකි යැයි සිතමි. එතුමාට අකුරු ලියන්නටද කියවන්නටද බැරි කමක් තිබුණු බව මම යලිත් සිහිපත් කරන්නේ පොත පතින් ලත් දැනුමෙන් එය කියන්නට ඇති කියන සැකය ඔබට එයි කියල සිතුන නිසයි. එතුමා කී කිසිවක් නූතන විද්‍යාවේ නිපුනයන්ටද බොරු කල නොහැකිව තියෙන බවද සත්‍යයකි.

**4) නීතිය ගැන එතුමා කරුණු ප්‍රකාශ කරන්නට පටන් ගත්ත වගේම. නීතියක් ස්ථාපිත කළේය.**

නීති විද්‍යාලයකට තියා ප්‍රාථමික පාසලකටවත් පය නොතියපු එතුමා ගෙනහැර පෑ නීතින්, එදා මෙන්ම අද සිටින මුස්ලිම් සමාජයමද කිසිඳු තර්කයකින්, තරාතිරමකින්, උස්-පහත් භේදයකින් තොරව 100%ක් ම පිළිගනිමින් සිටිනු ඔබටද දැකබලා ගත හැක. වසර 1000කට පෙර හෝ අද හෝ විය හැක; ඔහු රටක ජනාධිපති වරයෙකු හෝ මී හරක් බලාගන්න කෙනෙකු උවත් වෙනසක් නැතුව එම නීති එකහෙලා පිළිගනී. අප "ඉස්ලාම් නීතිය" යනුවෙන් අද හඳුන්වන්නේ එයයි.

**5) ධර්මයක් ප්‍රකාශ කරන්නට පටන් ගැනිණි. ජනයා ඒ වෙත කැඳවන්නට විය.**

වසර 40 ක් වෙනතෙක් කිසිඳු පිළිමයකටද කිසිඳු මනුෂ්‍යයෙකුටද වැද නොවැටුණු, හුදෙකලාවේ සත්‍යයේ ආලෝකය කුමක්දැයි සිතමින්ද අපේක්ෂා කරමින්ද හිටියා මිස කිසිඳු දහමක් ගැන වචනයක් හෝ නොදොඩා සිටි මෙතුමා හදිසියේ ජනයාට ධර්මයක් ප්‍රකාශ කරන්නටද ජනයාව ඒ වෙත කැඳවන්නටද පටන් ගැනුනි. අප අසා ඇති ආකාරයට බුදුදහමේ සදහන් සිදුහත් කුමරා කුඩා

කළ සිටම අදියරෙන් අදියර ගුරුවරුන් කිහිප දෙනෙකුගෙන්ම අධ්‍යාපනය හැදෑරීය. පසුව එතුමා ස්ව උත්සාහයෙන් අධ්‍යනයක යෙදිලා තමයි එතුමා දෙසූ ධර්මය සොයා ගත්තේ. නමුත් මොහම්මද් (ﷺ) තුමා ගේ තත්වය ඊට ඉදුරාම වෙනස්ය. එතුමා තුලින් ප්‍රකාශ වුනු කරුණු සම්බන්ධයෙන් එතුමා කිසිඳු අද්‍යනයක යෙදුනේ නැත.

## 6) හොඳ නරක පිළිබඳව උපදෙස් දෙන්නට ආරම්භ කෙරිණි.

පණපිටින් කුඩා ගැහැණු දරුවන්ව වළලන යුගයක, ගස් ගල් වලට රූප වලට පිළිම වලට වැඳ වැටෙන වටපිටාවක , මංකොල්ලය දූෂණය අපචාරය සොරකම අවිහිංසාවෙන් වහල් භාවයෙන් ජනතාව පීඩනයකට ලක්කරමින් සිටි වටපිටාවක ජීවත් වූ එතුමා, යහපත අයහපතින් වෙන්කර දක්වන මහා යුග පුරුෂයෙකුගේ ලක්ෂණ පෙන්නවන්නට පටන් ගැනිණි.

## 7) දක්ෂ කථිකයෙකුගේ ලක්ෂණ පෙන්වන්නට පටන් ගැනුනි

කිසිම දිනක මහජනයා අමතා කතාවක් නොකළ එතුමා පහත සඳහන් මාතෘකා යටතේ සුවිශේෂී කථනයන් පෙන්වන්නට විය ඒවා නම් ,

දෙවියන් ගැන, අපට නොපෙනෙන දේවල් ගැන (මලායිකාවරුන් හෙවත් දෙවියන්ගේ දූතවරුන් කොටසක් සහ ජින් හෙවත් යක්ෂයන් ගැන), මෙලොව හා පරලොව ගැන, ස්වර්ගය හා අපාය ගැන, මරණින් මතු ජීවිතය ගැන, දේව පණිවිඩ ගැන, සදාචාරය ගැන, නීතිය ගැන, දේශපාලනය ගැන, සමාජ විද්‍යාව ගැන, ආගම ධර්මය ගැන, ඉතිහාසය ගැන, අනාගතය ගැන, පෙරනිමිති, විද්‍යාත්මක තොරතුරු ගැන, ලෝක විනාශයක් ගැන හා තව බොහෝ මාතෘකා යටතේ සුවිශේෂී කථනයන් පෙන්වන්නට විය.

## 8) එකම ධජයක් යටතට ජනතාව පෙලගස්සන්නට විය

එතුමා ජීවත් වූ මක්කා නම් නගරයේ පිහිටා ඇති නැමදුම් මද්‍යස්ථානය (කාබතුල්ලාහ්ව) ඇතුලෙම විවිද පිළිම සහ එවැනි දේවල් 350ක් පමණ තිබුණු යුගයක, විකාර රූපී පිළිම වලට පවා නැමදමින් නොමගෙහි අනන්තයටම ගිය එසේම මහත් මුරන්ඩුද, අකීකරුද, මහන්ත්ත්වයෙන් පිඹිම්ලාද, අහංකාරකමින් අන්ද වෙලාද සිටි විවිධ ගෝත්‍රිකයන් විශාල ගණනක් එකම ධජයක් යටතට ගෙන ඒමට මෙතුමාට හැකියාව ලැබුණි. මේ සත්‍යය ඉතිහාසයන් මිස අතිශෝක්තිය නොවන බව සිහි තබා ගන්න. වර්ග සැතපුම් 12,000ක් පමණ වන කාන්තාර පරිසරයේ නොදියුණු සනිවේදන පහසුකම් තත්වයක් යටතේ වසර 23ක තරම් කාලයකදී මෙතුමා එය කෙසේ කලේදැයි ඔබට හිතා ගත හැකිද? එකිනෙකාට වෙනස් අදහස් දරන වෙනස් ආගම් සහිත වෙන වෙන දෙවිවරු යැයි කියන දේ

අදහන කණ්ඩායම් දෙකක් එකතු කරන එක පහසු වැඩක් ද? එතුමා එවැනි ගෝත්‍ර කිහියක් නම් එසේ එකතු කලාද කියා වැඩිදුර අධ්‍යනයක යෙදුනොත් ඔබටත් දැනගත හැක. අද ලොව පුරා ජනයා එක්රොක් වී සිටින්නේ එතුමා එදා ගොඩනැගූ 'ලා-ඉලාහ-ඉල්ලල්ලාහ්,-මෝහමදුර්-රසූලුල්ලාහ්' යන "කලිමාව" සහිත ධජය යටතෙහිය . එම ධජය යටතේ එකම නීතියක්, එකම ශිෂ්ටාචාරයක්, එකම ආගමක්, එකම සංස්කෘතියක්, එකම ආණ්ඩුක්‍රමයක් නිර්මාණය කලා පමණක් නොව, එය ලොව පුරා ව්‍යාප්ත කිරීමටද යුහුසුළු විය.

## 9) එතුමා සමාජ සංශෝධකයෙක් ලෙස ක්‍රියාත්මක විය.

අශිෂ්ටයන් ශිෂ්ටයන් බවටද, ම්ලේච්චයන් සභ්‍යයන් බවටද, අන්ද භක්තිකයන් ඍජු මාර්ගයටද, වැරදි කරන්නන්ද-දුසිරිත් පිළිපදින්නන්ද පවිත්‍ර ගුණ පෙන්න්වන්නන් බවටද යුක්තිය හා නිතිය නොදැන සිටි අයව යුක්ති ගරුකයන්, නීති ගරුකයන් බවටද පත් කිරීමට එතුමාට හැකි විය. අසාධාරණයට ලක් වූවන්ට සාධාරණය ළගා කර දුන්හ. එතුමා ජනාධිපති තනතුර දැරූ නමුත්, අද සිටින ජනාධිපතිවරුමෙන් නොව, එතුමා හැම අතින්ම අවංක ලෙස සිටීහ.

## 10) එතුමා අවිහින්සාවේ ආදර්ශය විය

එතුමා ඉහත සියල්ල කලේ හිංසාවෙන් නොව. අප සමාජය තුල පමණක් නොව ලොව මහා බලවතුන් අතරද එතුමා ගැන උවමනාවෙන්ම සත්‍ය තොරතුරු සගවනවා පමණක් නොව, වැරදි ප්‍රතිරූපයක් මවා මහජනයාව නොමග යවන පිරිසක් ඉන්න බවද මෙහිදී නොකියාම බැහැ. කටවචන වලින් නොව පොත් පත් වලින්ද එතුමා ගැන අමු අමුවේ බොරු ලියා තිබෙන බව අපට දැකිය හැක. (සමහරු ආගම තම ව්‍යාපාරය කරගෙන එය රැකගන්න නොකරන දෙයක් නැහැ).

හුදෙකලාවේ තමාගේ වැඩක් බලාගෙන හිටපු එතුමා වටා මෙතරම් ජනතාවක් රොක් උනේ එතුමා තුලින් ඉස්මතු වූ මහත්මා ගුණයන් නිසාය. එතුමාගේ චරිතය සම්බන්ධ කරගෙන ලියවී ඇති සත්‍ය කරුණු ඇතුලත් පොත් (හදිස් ලෙස හඳුන්වන පොත්) ඔබත් කියවා බැලුවොත් ඔබත් එතුමාට බොහෝ සේ ආදරය කරනු නොඅනුමානය. මෙතරම් විප්ලවයක් කරන විට එතුමා ජනයා අතරම සාමාන්‍ය කෙනෙකු සේම හැසුරුණු අතර කිසි දිනක එතුමා කිසිවෙක්ව තම ජීවිත ආරක්ෂකින් ලෙස යොදාගත්තේද නැත.

## 11) යුධ පිටියේදී එතුමා සෙන්පතියෙකු විය. රාජ්‍ය නායකත්වය, ජනාධිතිධූරය දැරිය (නමුත් එය සුවිසේශී නායකත්වයකි).

එතුමාගේ නව නීති රීති සහ යහපත් ක්‍රියා කලාපය නිසා තම වාසී අහිමි කිරීමට පැමිණි මාරයෙකු ලෙස එතුමාව දුටු අසාධාරණයේ, අයුක්තියේ රජයමින් සිටි පිරිසක් එම සමාජයේත් සිටියේය. එතුමා ප්‍රකාශයට පත්කරන දහම වෙතට මහජනයාව කැඳවන විට එවක සිටි අනිකුත් ආගමික නායකයන්ට මහත් ගැටළුවක් විය. මෙතුමාගේ මෙම ක්‍රියාකලාපය නතර කිරීමට ඔවුන් නොගත් උත්සහයක් නැත. (මේ ආකාර තත්ත්ව අදත් ලොව තුල ක්‍රියාත්මක වෙමින් පවතී). එතුමාට නොයෙක් හිංසා පීඩා සිදු කලේය. තම උපන් ගමෙන්ද පිටවීමට එතුමාටත් එතුමා අනුගමනය කළ අයටත් සිදු විය. යුධමය වශයෙන්ද එතුමාව විනාශ කිරීමට ඔවුන් පැමිණිහ. ඔහු කඩුව අතට ගත්තේ එනිසයි. කිසිම යුධ පුහුණුවක් හෝ දැනුමක් නොමැති එතුමා තම සතුරන්ට එරෙහිව මහා සෙන්පතියෙකුගේ ලක්ෂණ පෙන්වන්නට විය. අවසානයේ යුධමය වශයෙන්ද එතුමාව පරාජය කිරීමට කිසිවෙකුට පුළුවන් කමක් නොවිය.

එතුමා නැවත තම උපන් ගමට පැමිණ අරාබිකරයේ රාජ්‍ය නායකත්වය ඉසිලිය. එහෙත් එතුමාගේ මුළු රජමාලිගාවම ඔබේ කුඩා නිදන කාමරයකට වඩා ලොකු කරගන්නට හෝ, බුමුතුරුණු වලින් සරසා ගන්නට හෝ එතුමා මැලි විය. ජනයා අතරට ගියවිට පිටස්තරයෙකුට ඔහුව හඳුනාගත හැක්කේ කාගෙන් හරි ඇසීමෙන් මිස වෙන ක්‍රමයකින් නොව. හේතුව නම් එතුමා උස පුටුද, විශේෂ ඇඳුම්ද ප්‍රතික්ෂේප කළහ. එතුමා සභාවකට එනවිට කිසිවෙකු නැගිට ආචාර කරනවාට පවා එතුමා විරුද්ධ විය.

එතුමා තම ධනය අවසන් වනතුරු වියදම් කලේ මහජනයා වෙනුවෙනි. රාජ්‍ය නායකයා ලෙසින්ම එතුමා මියයන විට එතුමාගේ යුධ කබාය පවා උකසට තබා තිබුණි. රාජ්‍ය භාණ්ඩාගාරයේ කිසිවක් ලබාගැනීම එතුමා තම පවුලේ උදව්යට තහනම් කෙරින. (සමහර රාජ්‍ය නායකයන් මියයන විට ඔවුන් තමන්ගේ දරුමුණුපුරන්ට වෙන රටවල ඉඩම් ගෙවල් දොරවල් අරන් තම රට උකස් කරලයි යන්නේ. පහුගිය කාලේ අපේ රටට උනෙත් එයම නොවෙද?)

## 12) එතුමා එවක සිටි ජනතාවට සමහර ප්‍රාතිහාර පෙන්වීම

මෙම කරුණු ඔබ එකවරම විශ්වාස නොකරන්නට පුළුවන්, නමුත් පසුව ඔබට වැටහෙයි. එතුමාගේ විශිෂ්ඨතම සහ ඔබටද දැකබලාගත හැකි ප්‍රාතිහාර්ය නම් එතුමා ප්‍රකාශ කල ග්‍රන්ථය හෙවත් "ශුද්ධ වූ අල් කුරානය"යි. එම ප්‍රාතිහාර්යය ඔබ කියවා තේරුම් ගත්තොත් පහත සඳහන් ප්‍රාතිහාර්යයන්ද ඔබ පිළිගනු නොඅනුමනයි.

- අසල සිටි මිනිසුන්ගේ අභියෝගයක් වෙනුවෙන් චන්ද්‍රයා දෙපලු කර පෙන්වීම. එන්ම ප්‍රාතිහාර්ය පෙන්වීම.

- සාමාන්‍ය ජනයාට නොපෙනෙන ද නොඇසෙන දේවල්ද එතුමා ග්‍රහණය කර ගැනීම.
- එක රැයක් තුල එතුමා දේව දූතයෙකු (ජිබ්රීල් නම් මලායිකා වරයා) සමග අහසෙහි (ස්වර්ගයෙහි) චාරිකාවක යෙදීන.
- ආහාර බඳුන් වල අභිවෘධිය ඇති කිරීම.
- වෙනත් අයගේ රහස් දැනගැනීම, අනාවැකි පළකිරීම.
- බෙහෙත් වලින් තොරව ඇතැම් රෝගීන්ව සුවකිරීම.
- [ලිපිය දිග වැඩි වෙන නිසා කෙටි කරන්න අදහස් කරමි].

එතුමා විවිධ පැතිකඩවලින් ශ්‍රේෂ්ටත්වයන් පෙන්නවන්නට විය. වෙනත් ඕනෑම පුද්ගලයෙකු ගෙන බලන්න. ඔහු මෙතුමා තරම් හැම අංශයකින්ම විස්කම් පෙන්නුම් කර තිබේද කියල.

එතුමා අපි මෙන්ම පොළොවේ පයගහල, කාලා බීලා කතා කරල, ඇවිදලා, විවාහ වෙලා, දරුමල්ලෝ හදල, වයසට යමින් අපි මෙන්ම අසනීප වලටද මුහුණදී, අවසානයේ හුස්ම ටික ශරීරයෙන් පිටවෙලා මිය ගිය මනුෂ්‍යයෙකි.

නමුත්, ඉහත සඳහන් බෝහෝ කරුණු වලින් ඔප්පු වෙනවා එතුමා සාමාන්‍ය මනුෂ්‍ය බුද්ධියට එහා ගොස් එම කරුණු පැවසු බව. එනම් මනුෂ්‍යයෙකුට කිසිම විටක කිව නොහැකිද, කළ නොහැකිද දේවල් එතුමා කියල, කරලා තියෙනවා.

ඉහත සඳහන් බෝහෝ කරුණු වලින් ඔප්පු වෙනවා එතුමාට කව්රු හෝ මග පෙන්වීමක් කර දී තිබෙනවා යන්න. මොකද මේ සියල්ල වසර 23කදී සිදු වූ දේවල්ය.

කිසිම මනුෂ්‍යයෙක් නොදන්නා දේවල් එතුමා පවසා තියෙන නිසා එතුමාට මනුෂ්‍යයෙක් ගෙන් උපදෙස් ලැබුණා වෙන්නට බැහැ.

විශ්වයේත් එතුල පවතින දේවල් වලත් නිර්මාණාත්මක අදියරයන්වල සහ ඒවායේ ක්‍රියාත්මක තත්වයන්ගේ ඇති විශ්මිත කරුණු පවසා ඇති නිසා එතුමාට ඒ පිළිබඳව කරුණු ලැබෙන්නත් ඕනි විශ්වයේත් එහි සියල්ලේත් නිර්මාතෘගෙන්ම විය යුතුය.

යම් අවස්ථාවල පමණක් එතුමා විවිධ ප්‍රාතිහාර්ය පෙන්වා ඇති නිසා එම බලයද එම අවස්ථාවලට පමණක් එතුමා වෙත ලැබී තිබිය යුතුය. එනම් එය එතුමාගේ පුද්ගලික හැකියාවන් නොවන බව පැහැදිලිය.

මේ සුවිශේෂී කාරණාවලට අනුව ඇත්තටම මෙතුමා කව්ද? මෙතුමා මනුෂ්‍යයයෙක්ද, දෙවි කෙනෙක්ද, භූතයෙක්ද, හූනියන් කාරයෙක්ද, බුදු කෙනෙක්ද, මැජික් කාරයෙක්ද, අමනුෂ්‍යයෙක්ද, දෙවියන්ගේ පුතෙක්ද?

එතුමාගේ ග්‍රන්ථයෙහි අබමල් රේණුවක වරදක් අදටත් සොයාගන්නට නොහැකි නිසාත්, සෑම විෂයක් ගැනම ඉතා ගැඹුරු විශ්මිත කාරණා පෙන්වාදී තිබෙන නිසාත් එතුමාට උපදෙස් ලැබී තිබිය යුත්තේ සියල්ල දත් කෙනෙකුගෙන් විය යුතුය. ඔහුගේම වචන වලින් මෙයට පිළිතුර ඔහු අපවෙත දී තිබෙනවා.

**"මුළු මහත් විශ්වයම මවා, පාලනය කරමින්ද පෝෂණය කරමින්ද සිටින විශ්වයේ මහා අධිපති වන එකම දෙවියන් හෙවත් 'අල්ලාහ්' විසින් 'ජිබ්රීල්' (අලෙය්) නමැති දේව දූතවරයා හරහා සහ වෙනත් මාර්ගයන්ගෙන්ද තමාවෙත ලැබුණු දේව පණිවිඩ හෙවත් 'වහී' වලට අනුව තමා සියල්ල කළ බවත් කී බවත්, සහ තමාගේ සිතැඟියාවට අනුව කිසිවක් තමා නොකිරීමට වගබලාගත් බවත්, තමාට පෙරත් විවිධ ජන කොටස් වලට මිනිසුන් අතරින්ම තෝරාගෙන නබිත්වය හෙවත් දේව දූතත්වය ලැබුණු පුද්ගලයන් ලොවට පැමිණ ඇති බවත් තමාට පසු ලොව අවසන් වනාතුරාවටම වලංගු වනසේ අවසන් නබිවරයා වශයෙන් තමාව තෝරාගෙන සිටි බවත්, තමාට ලැබුණු දේව පණිවිඩ ඒ අයුරින්ම ප්‍රකාශ කිරීම සහ ක්‍රියාවට නැංවීම පමණක් තමා වෙත පැවරුණු රාජකාරිය බවත් එතුමා නිහතමානිව කියා ඇත".**

අනුන් කරපු වැඩවල ලකුණුත් තමාට දාගන්න තත්වයක් අපි ලොවෙහි නිතර දකිද්දී මෙතුමා කළ කිසිවක් එතුමාගේ දස්කම් නොවන බව එතුමාම පවසනවා නම් ඔහු දේව දූතවරයෙක් බවට පිළිගැනීමට තව කුමන සාක්ෂිද අප සෙවිය යුත්තේ?

මෙයින් පැහැදිලි වන්නේ ඔහු දෙවියන්ගේ දූත වරයෙක් බව නොවේද? ලොව පළමු මිනිසාගේ සිට අද දක්වාම සිටි සෑම මනුෂ්‍ය සමූහයකටම දෙවියන් තම පණිවිඩය දූතවරුන් හරහා පහළ කර තිබේ. ජේසු (ඊසා අලෙය්) තුමා මීට පෙර ආ දූත වරයයි. යහියා, සකරියා, යූනුස් ,අල්යසස, ඉල්යාස්, සුලේය්මන්, දාවුද්, සුල්කිෆ්ලි, හාරූන්, මූසා, අයුබ්, යූසුෆ්, යාකූබ්, ලූත්, ඉසමෙල්, ඉෂාක්, ඉබ්‍රාහිම්, සාලිහ්. හුද්, නූහ්. මේ සියල්ල නබිවරුන්ය.(මෙතුමන්ලා සියල්ලටම දෙවියන්ගෙන් සාමය හා ශාන්තිය ලැබේවා!) මෙලෙස මෙලොවට පහළ වූ නබි/දූතවරුන් ගැන අවසන් දූතවරයාගේ ග්‍රන්ථයෙන් කරුණු සිහිපත් කරයි. මීට පෙර සිටි සහ ඔවුන් ඉදිරිපත් කළ ග්‍රන්ථවලින් අවසන් නබිවරයා ගැන කියා ඇත. ඔහුගේ නමද ලක්ෂණද, පැමිණෙන ප්‍රදේශ ගැනද කියා ඇත.

**මොහම්මද් යන වචනයේ සිංහල අර්ථය.**

අරාබි බසින් 'හම්ද්' යනු 'මෛත්‍රී' කිරීම/කරනවා යන්නයි (එය ක්‍රියා පදයකි).

මු + හම්ද් = මොහම්මද් (වී ඇත).

අරාබි ව්‍යාකරණය නීතියට අනුව ක්‍රියාවක් ඉදිරියට "මු" යෙදූ විට, එම ක්‍රියාව > "ක්‍රියාව කරන්නා" බවට පත් වෙයි.

(කරන්නා+මෛත්‍රී) = (මෛත්‍රී කරන්නා) = (මුහම්මද්/ මොහම්මද්)=( මු +හම්ද් )

කිතුණුවන්, මතුවට පැමිණීමට නියමිත මෛත්‍රී කරන්නා (බයිබලයේ සොලමන් ගීතිකාවේ 5:16 හිබ්රු භාෂාවෙන් හඳුන්වා දුන් "මොහමදීම්"ව අනුගමනය කරන ලෙස උපදෙස් දී ගිය ශාස්තෘ වරයාණන් හෙවත් ජේසු (ඊසා අ.ස) තුමාවම පමණක් විස්වාස කරමින් තවමත් එතනම රැඳී සිටිනවා. එය නොමග යාමකි.

බොදුනුවන් මතු ඉපදෙන්නට ඉන්නවා කියන"මෛත්‍රී බුදුන්"එනතෙක් බලා සිටිනවා.

මුස්ලිම්වරුන් වසර 1400 කට පෙරම පැමිණ ලොවෙන් සමුගත් අවසන් ශාස්තෘවරයා ගේ නම මොහම්මද් ලෙස ඇසුනා හෝ කිය උනා නම් එවලෙම "සල්ලල්ලාහුඅලෛහිවසල්ලම්" (ﷺ) කියා එතුමාට දෙවියන්ගේ ආශීර්වාදය හා ශාන්තිය ප්‍රර්ථනා කරනවා.

මුස්ලිම්වරුන් එතුමා කල මෙහෙය අගේ කරමින් එතුමාව සිහි වුන හෝ නම ඇසුණු වහාම ඔහු වෙනුවෙන් ප්‍රර්තනා කිරීමට මොහොතක්ද ප්‍රමාද නොවීමට හේතුව කුමක්ද කියා දැන් ඔබට වැටහෙනු ඇතයි සිතමි.

ඉස්ලාම් දහමට අදාල අමතර කරුණු කිහිපයක්.

මහජනයාට දෙවියන්ගේ පණිවිඩය ලබා දීමට තව නම් නොකී විශාල නබිවරු සංඛ්‍යාවක් ඒවා ඇති බවද සඳහන් වේ. දෙවියන් පළමු මිනිසාගේ සිට ලොව අවසන් මිනිසා දක්වා ඉපදෙන සෑම ජනකොටසක්ම අත නොහැර "නැමදීමට සුදුස්සා අල්ලාහ් පමණක්ම බවත් ඔහු හැර වෙන කිසිඳු දෙවියෙක් නැති බවත්' මතක්කරදී ඇත. ඔබත් "මහා දෙවියෙක්" ඉන්න බව පිළිගන්නවට කිසිඳු සැකයක් නැහැ. ඔහු අල්ලාහ් බව, මොහම්මද් (ﷺ) තුමා මෙම සමාජයේ දූතවරයා වශයෙන් පැමිණ ප්‍රකාශකර තියෙනවා. අල්ලාහ් ශ්‍රේෂ්ඨ බවත් නැමදීමට සුදුස්සා අල්ලාහ් පමණක්ම බවත් ඔහු හැර වෙන කිසිඳු දෙවියෙක් නැති බවත් ඔබ දන්නේ නැහැ කියන්න බැහැ.

ඔබ මියගිය පසුව අල්ලාහ් නැවත ඔබවත් මාවත් උපන් සියලු දෙනාවත් මතු ඉපදී මියයන සියල්ලවත් යම් දිනක නැවත කැඳවා ඔබ මම අපි සියල්ල තනි තනි

වශයෙන් මෙලොව ජීවත්වූ ආකාරය පිළිබඳව ප්‍රශ්න කරනු ලබයි. එයට විනිශ්චය දිනය යැයි කියනු ලැබේ.

දෙවියන්ගේ පණිවිඩය ඔබට ලැබුනේ නැහැ කියන්න බැහැ. "ශුද්ධ වූ කුරාන් " ලෙස මොහම්මද් (ﷺ) තුමා කියා පැවේ එම පණිවිඩයයි. එහි පරිවර්තන අද ඕනිම කෙනෙකුට පහසුවෙන්න්ම සොයාගත හැක. මෙලොව ජීවිතයේදී එය කියවන්න වෙලාවක් තිබුනේ නැහැ කියන්න බැහැ. මොහම්මද් (ﷺ) තුමා ගැන හොයා බලන්නත් ඒ සඳහා වෙලාවක් සහ පහසුකම් තිබුනේ නැහැ කියන්න බැහැ. තමාගේත් මේ විශ්වයේත් නිර්මාතෘ අල්ලාහ් බව තෙරුන් ගන්න තරම් කරුණු තිබුනේ නැහැ කියන්නත් බැහැ.

කුරානය තුලින් අපට කතා කරන්නේ "අල්ලාහ්" හෙවත් "දෙවියන්" ම බව එය කියවූ කෙනෙකුට ප්‍රත්‍යක්ෂ වෙනු නොඅනුමානයි.

අල්ලාහ්ව දන්නා කෙනෙකු මරා දැමුවත්, ඔවුන් වෙනත් මිනිසුන්, වෙනත් මනඃකල්පිත දෙවිවරුන් අනුගමනය නොකරනු ඇත. වෙනත් ගුරුවරුන් අනුගමනය කිරීමෙන් සහ අල්ලාහ්ව අතහැර යහපත් ජීවිතයක් ගත කර අපට එය සාධාරණීකරණය කිරීමට අවස්ථාවක් නොලැබෙනු ඇත.

ඔබ කොතරම් හොඳ වැඩ කලත් වැඩක් නැහැ ඔබේ නිර්මාතෘව ප්‍රතික්ෂේප කරනවානම්. පැහැදිලි කිරීමක් කරනවානම්, කොතරම් හොඳට ඉගන ගත්තත්, කොතරම් හොඳ චරිතයක් තිබුනත්, කොතරම් වස්තුව තිබුනත්, කොතරම් හොඳ දරු මල්ලන් හිටියත් වැඩක් නෑ කවලා පෝෂණය කරලා උගන්නල ආරක්ෂා කරලා ලොකු මහත් කළ ඔබේ පුතා හෝ දුව දැන දැනම ඔබව මව හෝ පියා ලෙස පිළිගන්න එක ප්‍රතික්ෂේප කරලා වෙන වෙන අයට අම්ම තාත්තා කියනවනම්.

මෙලොවට අපි ආවේ අල්ලාහ් වෙතිනුයි, ඔහු වෙතින් ආ අපි නැවත ඔහු වෙතම යා යුතුවද ඇත. අපේ මෙලොව ජීවිතය පිළිබඳව ප්‍රශ්න කරන දවස ඉතාම දැඩි දවසක් බව අල්ලාහ්ම කුරානය තුලින් මොහම්මද් නබි (ﷺ) තුමා හරහා අපට පැහැදිලි සාක්ෂි සහිතව කියා ඇත. අපව මිහිමත උසස්ම ජීවී කොටස බවට පත් කර අහස වියනක් ලෙසද පොලොව යහනාවක් ලෙසද පත්කර, සියලු ආහාරද, වස්තුවද දරුවන්ද දී හොඳ නරක වෙන්කර දක්වන පුස්තකද, එය අනුගමනය කර ප්‍රායෝගිකව පෙන්වා දීමටත් පැහැදිලිකර දීමටත් නබිවරුන්වද පහළකර දී තියෙද්දිත්, ඔහුව විශ්වාස නොකර ඔහුගේ පුස්තක විශ්වාස නොකර, ඔහුගේ දූතවරයන් විශ්වාස නොකර, මරණින් මතු ජීවිතයක් ගැන විශ්වාස නොකර, දෙවියන් හමුවට යන දවසක් විශ්වාස නොකර, ඔහුට කෘතගුණ නොකර, ඔහුව නමදින්නේ නැතිව අහංකාරව හිද, වෙන වෙන දේවල් වලට හිස පහත් කර,

වෙන වෙන අයවද දේවල්ද ඔහුට සමාන කරමින් මෙලෝ ජීවිතය තුල අන්ධයන් ලෙස සිටි ජනතාවට දෙවියන්ගේ කෝපයේ ප්‍රතිපලත්, දෙවියන්ගේ තෘප්තිය දිනාගෙන ජීවත් වූ අයට සෞභාග්‍යය ත් හිමිවන බව පැවසීමට මුළු මහත් ලෝක වාසී ජනතාවටම පැමිණි අවසන් නබිවරයා මොහම්මද් (ﷺ) තුමයි.

නැවත නබිවරයෙක් එන්නේ නැත. එන්න අවශ්‍යද නැත. හේතුව නම් ඔහුගේ පණිවිඩය ලොව අවසන් වනතුරු සුරක්ෂිතයි. ලොව අවසන් වනතුරු එය බොරු කිරීමට කිසිවෙකුට නොහැකි බව දෙවියන්ම පවසා ඇත.

*(අපගේ) දූතයාණෙනි! ඔබගේ දෙවියන්ගෙන් ඔබට පහළ කරන ලද දැය (කිසිම අඩුපාඩුවකින් තොරව ඔවුන්ට) දැනුම් දී හරිනු. ඔබ (එසේ) නොකලහොත් ඔවුන්ගේ දූත මෙහෙවර ඔබ ඉටු කල කෙනෙකු බවට පත්වන්නේ නැත. (මෙහිදී ඔබ කිසිවෙකුටවත් බිය නොවනු). මිනිසුන්ගේ (නපුරෙන්) අල්ලාහ් ඔබව (ආරක්ශා කර) බේරා ගනු ඇත.(5:67)*

දෙවිඳුන් විසින් මොහම්මද් නබි (ﷺ) තුමානන්ට දුන් මෙම අණ එතුමා නිසි අයුරින්ම ඉටු කර ඇති බවට අපට පැහැදිලිවම සාධක ඇත.

එතුමානන්ට දෙවියන්ගේ සාමය, සමාදනය සහ ආශිර්වාදය හිමිවේවා!

---

# මුහම්මද් (ﷺ) තුමා කව්ද? (ලිපි 2)

ජේසු තුමාගේ පැමිණීමෙන් පසු මෙලොවට එවන ලද දෙවියන්ගේ අවසාන පණිවිඩ කරු මුහම්මද් (ﷺ) නබිතුමාණෝ වෙති. එතුමාගෙන් පසු නබිවරුන්ගේ පැමිණීම සහ දේව පණිවිඩය කෙළවර වන්නේය. ඒ අනුව මුහම්මද් (ﷺ) තුමාට පහළ වූ අල් කුරානය ලොව පහළ වූ අවසාන සහ සම්පූර්ණ කරන ලද දහම් පුස්තකය වේ. තවද, මුහම්මද් (ﷺ) තුමා එක් ජනකොට්ටාසයකට පමණක් සීමා වූ නබිවරයෙක් නොවන අතර මුළු ලෝකවාසී සියලු ජනතාවටම නබිවරයෙකි. එම හේතුවෙන් මුහම්මද් (ﷺ) තුමා ගැන දැනගැනීම ලෝකවාසී සියලුදෙනාගේම වගකීමකි.

මුහම්මද් (ﷺ) තුමා අනෙක් නබිවරුන් මෙන්ම මිනිසුන් අතරින් තෝරාගනු ලැබූ කෙනෙකි. එතුමාට නබිවරුන්ට ලබෙන දේව පණිවිඩ ලැබෙන්නේය. ඒවා මිනිසුන් අතරට ගෙන යාම ඔහුට පැවරුණු විශේෂ රාජකාරිය විය. එතුමා නබිවරයෙකු බව මිනිසුන්ට ඒත්තු ගැන්වීම සඳහා බොහෝ ප්‍රතිහාරයන් සිදු කොට තිබේ. ඒවා අතරින් අප අතර ඉතිරිව තිබෙන්නේ අල් කුරානය පමණි.

මුහම්මද් (ﷺ) තුමා ඉබ්‍රාහිම් නබිතුමාගේ පුත් ඉස්මායිල්ගේ පරම්පරාවෙන් ද ජේසු තුමා ඉබ්‍රාහිම් තුමාගේ පුත් ඉස්හාක්ගේ පරම්පරාවෙන්ද පැවතෙන්නෝය. ඒ අනුව ජේසු තුමා සහ මුහම්මද් (ﷺ) තුමා යන දෙදෙනා ඥාති සහෝදරයින් වෙති.

මුහම්මද් (ﷺ) තුමා ක්‍රි.ව. 571 දී අබ්දුල්ලා සහ අමිනා යන දෙදෙනාට දාව උපත ලැබුවේය. එහෙත් එතුමා උපදින විට තම පියා ජීවතුන් අතර සිටියේ නැත. එසේම ඔහුගේ වයස හයේදී මවද කළුරිය කළාය. නබිතුමා කුඩා කල සිටම අරාබියේ චාරිත්‍රයට අනුව හාලිමා නම් ග්‍රාමීය කාන්තාවක් සමඟ හැදී වැඩුණි. මවගේ අභාවයෙන් පසු සිය පියාගේ පියා වන අබ්දුල් මුත්ත්ලිබ් ද ඔහුගේ අභාවයෙන් පසු නබිතුමාගේ පියාගේ සහෝදරයෙක් වන අබූ තාලිබ් තුමා ළඟද එතුමා හැදී වැඩුනේය.

මුහම්මද් (ﷺ) තුමා අනාථ දරුවෙකු ලෙස උපත ලැබුවත් දෙවියන්ගේ සැලසුම අනුව ඉතා කෙටි කාලයකදී ලෝකයේ ඉතා විශාල වෙනසක් ඇති කළේය. ඒ අනුව ගෝත්‍ර වශයෙන් බෙදී සිටි අරාබියාව එක්සේසත් කළේය. ඔවුන් අතර විශාල අධ්‍යාත්මික පෙරළියක් ඇති කළේය. ඉතා කෙටි කාලයක් තුළදී ලෝකයේ ඉතා ශ්‍රේෂ්ඨ ජාතියක් බවට අරාබිවරුන් පත් විය. ඊට ප්‍රධාන හේතුවක් වූයේ අල් කුරානය සහ නබිතුමාගේ ජීවිතාදර්ශය යි.

මුහම්මද් (ﷺ) තුමාගේ ශ්‍රේෂ්ටත්වය මුස්ලිම් විද්වතුන්ට වඩා මුස්ලිම් නොවන විද්වතුන්ගේ ප්‍රකාශන වලින්ම දැනගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. මයිකල් එච් හාට් විසින් ලියන ලද "100 most influential people in the world" යන කෘතියේ මුලටම මුහම්මද් (ﷺ) තුමාගේ නම සඳහන් කොට ඇත. එම ග්‍රන්ථයේ ජේසු තුමා මෙන්ම තවත් බොහෝ විද්‍යාඥයින්ගේ නම් සඳහන් වන්නේ ඉන් පසුවය. එමගින් එතුමාගේ ශ්‍රේෂ්ටත්වය කියා පාන්නේය.

අල් කුරානය මුහම්මද් (ﷺ) තුමාගේ නිර්මාණයක් නොවන බව බොහෝ විද්‍යාඥයින් විසින් ප්‍රකාශ කොට තිබේ. ඒ අතර මහාචාර්ය කීත් එල් මුවර් ද ප්‍රධාන තැනක් ගන්නේය. මේ බව මහාචාර්ය මොරිස් බුකෙල් ඔහුගේ "The Qur'an, the Bible and Modern Science" යන කෘතියේ ද සඳහන් කොට ඇත. ඔහු සඳහන් කරන්නේ මුහම්මද් (ﷺ) තුමා ජීවත්වූ කාලය දෙස බලන කල කිසිසේත්ම අල් කුරානය ඔහුගේ කෘතියක් විය නොහැකි බවයි.

නබිතුමා කුඩා කාලයේදී අකුරු ඉගෙන ගෙන තිබුනේ නැත. ඒ අනුව එතුමාට කියවීමට හෝ ලිවීමට හැකියාව තිබුනේ නැත. එවන් පසුබිමක් තුල ලෝකයේ විශිෂ්ටතම කෘතිය ලෙස සැලකෙන අල් කුරානය ඔහු විසින් ලියන ලද්දක් යැයි පැවසීමට කිසිම සාක්ෂියක් නොමැත.

මුහම්මද් (ﷺ) තුමා ඔහුගේ 25 වන වියේදී ඔහුට වඩා වයසින් වැඩි දෙවරක් වැන්දඹු භාවයට පත්ව සිටි කදිජා තුමිය සමග විවාහ වී ඇත. එම විවාහය ඉතා සාර්ථක එකක් වූ අතර කදිජා තුමිය ජීවතුන් අතර සිටිනතාක් කල් නබිතුමා වෙනත් කිසිම විවාහයක් සිදු කර ගත්තේ නැත. එම විවාහයෙන් නබිතුමාට පිරිමි දරුවන් දෙදෙනෙකු සහ ගැහැණු දරුවන් සිව් දෙනෙක් ලැබී ඇත. පිරිමි දරුවන් දෙදෙනා කුඩා කාලයේදීම කළුරිය කළෝය. ෆාතිමා හැර අන් සියලුම ගැහැණු දරුවන් නබිතුමා ජීවතුන් අතර සිටියදීම කලුරිය කළෝය. නබිතුමාගේ 53 වන වියේදී කදිජා තුමියද කලුරිය කළාය. කදිජා තුමියගේ වියෝවෙන් පසු නබිතුමා විවිධ සමාජයීය හේතූන් මත විවාහයන් 11 ක් සිදු කොට තිබේ. මෙම විවාහයන් අතරින් අයිෂා තුමිය හැර අන් සියලුම දෙනා වැන්දඹු කාන්තාවෝ වෙති.

නබිතුමාගේ ජීවිත කාලය තුලදී සිදුවුණු සුවිශේෂී කරුණක් වන්නේ මිහ්රාජ් ගමනයි. එවැනි ගමනක් වෙනත් කිසිම නබිවරයෙකුට ලැබී නැත. එම ගමනේදී නබිතුමා අහස් හතක් පසුකරගෙන ගොස් අල්ලාහ්ව හමු වී ඇත. ඔහු නැවත හැරී එන විට පංච කාල සලාතය පිලිබඳ නියෝගය රැගෙන ආවේය. තවද නබිතුමා එම ගමනේදී ස්වර්ගය සහ නිරය දැක බලාගෙන තිබේ. මෙම ගමන නබිතුමා විසින් සිදු කල ප්‍රතිහාරයක් බැවින් එය අපගේ බුද්ධියෙන් තේරුම් ගැනීමට හෝ එය විස්තර කිරීමට නොහැකිය. කෙසේ වෙතාත් එකල සිටි මුස්ලිම් නොවන කුරෙෂ්වරුන් විසින් නබිතුමාගෙන් අසන ලද ප්‍රශ්න වලට නබිතුමා ලබා දුන් පිළිතුරු නිසා ඔවුන් නිරුත්තර වී තිබේ.

නබිතුමාගේ මැදි වියේදී හුදකලා ජීවතයක් ගත කොට ඇත. ඊට ප්‍රධාන හේතුව එකල පැවති සමාජයේ පිරිහීමයි. මේ හේතුවෙන් නබිතුමා වැඩිම කාලයක් ගත කොට ඇත්තේ මක්කාවේ පිහිටි හිරා නම් ගුහාව තුලය. නබිතුමාට මුල්ම කුර්ආන් පණිවිඩය පහළ වුයේද ඔහු හිරා නම් ගල් ගුහාව තුල සිටින කාලය තුලදීය. ඉන් පසු ක්‍රමක් ක්‍රමයෙන් වසර 23 ක් පුරාවට සම්පූර්ණ කුරානයම පහළ විය. ඒ අනුව නබිතුමාගේ ජීවිත කාලය තුලදී ඉස්ලාම් දහම සම්පූර්ණ කෙරුණේය. එම නිසා ලෝකය අවසානය දක්වා එහි කිසිම වෙනසක් කිරීමට අවසර නොමැත.

මේ වන විට ලෝක ජනගහණයෙන් 1/3 ක් පමණ එතුමාගේ අනුගාමිකයෝ වෙති. එපමණක් නොව ලෝකයේ වේගයෙන්ම ව්‍යාප්තවන දහම ඉස්ලාම් බවට පත්වී ඇත. (FA)

# මුහම්මද් (ﷺ) තුමාණන්ගේ මිහ්රාජ් ගමන.

සෑම නබිවරයෙකුම අල්ලාහ්ගේ උදව්වෙන් ප්‍රතිහාරයන් සිදුකොට තිබේ. නබිවරුන් විසින් සිදු කරන ලද ප්‍රාතිහාරයන් සාමාන්‍ය මිනිසුන්ට කළ නොහැකි ය. එහෙත් නබිවරුන් ඒවා අල්ලාහ්ගේ උදව්වෙන් සිදු කරන්නේය. ප්‍රතිහාරයන් වලදී සාමාන්‍ය භෞතික නීති ක්‍රියාත්මක වන්නේ නැත. එම නිසා ඒවා සාමාන්‍ය කෙනෙකුට තේරුම් ගත නොහැකිය. උදාහරණයක් ලෙස ඉබ්‍රාහිම් නබිතුමාව ගින්නට විසි කල අවස්ථාවේදී ගින්නෙන් ඔහුට කිසිම හානියක් සිදු වුයේ නැත. තවද මූසා නබිතුමා අල්ලාහ්ගේ උදව්වෙන් ඔහුගේ හැරමිටිය නාගයෙකු බවට පත් කර ඇත. තවද එම හැරමිටිය භාවිතා කොට මුහුද දෙබෑ කොට ඔහුගේ අනුගාමිකයින්ව මුහුදෙන් එතෙර කොට ඇත. මේවා සියල්ලම සත්‍ය සිදුවීම් මිස මන්ත්‍ර බලයෙන් කරන දේවල් නොවේ. නබිතුමාගේ මිහ්රාජ් ගමනත් මෙවැනිම ප්‍රාතිහාරයකි. ඒ අනුව නබිතුමා මක්කාවේ සිට ජෙරුසලමටත් ජෙරුසලමේ පිහිටි බයිතුල් මුකද්දිස් සිට අල්ලාහ් වෙතටත් එක් රැයකින් ගොස් පෙරලා පැමිණීම බලගතු ප්‍රතිහාරයකි. මෙම සිදුවීම අල් කුරානයේ පහත සඳහන් පරිදි විස්තර කොට ඇත.

*"ශුද්ධවන්තයා වන ඔහු තම ගැත්තාව මස්ජිදුල් හරාම්හි සිට අවට පරිසරය භාග්‍යවත් කල මස්ජිදුල් අක්සා තෙක් ආශිර්වාද ලත් එම රාත්‍රියෙහි කැඳවාගෙන ගියේ අපගේ සාක්ෂින් පෙන්වීම සඳහාය" (කුරානය 17:1).*

මස්ජිදුල් අක්සාහිදී නබිතුමා සෑම නබිවරයෙකුටම නායකත්වය දෙමින් සලාතය ඉටු කර තිබේ. ඉන් පසු ජිබ්‍රිල් දේවදූතයා ස්වර්ගයෙන් රැගෙන පැමිණි බුරාක් නමැති සත්වයාගේ පිටේ නැග අල්ලාහ්ව බැහැ දැකීම සඳහා පිටත්ව ගොස් ඇත. මුහම්මද් (ﷺ) තුමා එම සත්වයාගේ වේගය විස්තර කොට ඇත්තේ ඇසට පෙනෙන දුරට ඌ පිම්ම තබන බවයි.

එම ගමන යන අතර තුර එක් එක් අහසේ නැවතී මීට පෙර මෙලොවට පැමිණි නබිවරුන් වන ආදම්, යහියා, ඊසා නොහොත් ජේසු තුමා, යුසුෆ්, ඉදිරිස්, හාරූන්, මූසා (ඔවුන් සියලු දෙනා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය අත්වේවා) යන සියලු දෙනා දැක බලාගෙන ඔවුන්ට සලාම් පවසා ඔවුන් සමග කතා බහ කොට ඇත. අවසානයේදී අල්ලාහ් වෙත ගොස් තිබේ. එම ගමනේදී නබිතුමාට බයිතුල් මාමූර් දේවස්ථානය, ස්වර්ගය සහ නිරය දැක ගැනීමට ලැබී තිබේ. නබිතුමා ආපසු පැමිණෙන විට පංච කල සලාතය සහ සූරා බකරාහි අවසාන වක්‍යාය ද රැගෙනවිත් ඇත.

මිහ්රාජ් ගමන සිදුවූ දිනය සම්බන්දයෙන් ඉස්ලාමීය විද්වතුන් අතර විවිධ මත පලවී ඇත. අත් තබරි තුමා පවසන්නේ එය නබිත්වය සිදු වූ වසරේම සිදුවූ බවයි.

නවවි සහ අල් කුර්තුබි යන දෙදෙනා පවසන්නේ එය නබිත්වයෙන් වසර 5 කට පසුව සිදුවූ බවයි. ඊට අමතරව තවත් බොහෝ මතයන් ප්‍රකාශ වී තිබේ.

මිහ්රාජ් ගමන ගොස් පැමිණි නබිතුමා පසුවදා අවදි වුයේ විශාල කනස්සල්ලකිනි. ඊට හේතුව මක්කා වාසින් එය විශ්වාස කරයිදෝ නොකරයිදෝ යන බිය නිසාය. එසේ තිබියදී ඔහුගේ එදිරිවාදියෙක් වූ අබූ ජහිල් නබිතුමා අසලින් යමින් සිටියදී නබිතුමාව දැක "අළුත් යමක් නැද්දැයි" අපහාසාත්මකව විමසා ඇත. එවිට නබිතුමා අළුත් සිදුවීමක් ඇතැයි පවසමින් මිහ්රාජ් ගමන ගැන සැලකොට තිබේ. අබූ ජහිල් මෙය විශ්වාස නොකළත් එම පුවතට ඉතා ඕනෑකමින් සවන් දී තිබේ. ඉන් පසු නබිතුමා ඔහුට පවසා සිටි දේවල් අනෙක් අය ඉදිරියේත් මේ අකාරයටම පැවසිය හැකි දැයි නබිතුමාගෙන් විමසා ඇත. ඊට නබිතුමා 'ඔව්' යැයි පිළිතුරු දුන් විට අබූ ජහිල් ඔහුගේ සගයන් එම ස්ථානයට කැඳවාගෙන ඇවිත් තිබේ. අනතුරුව නබිතුමා ඔවුන්ටත් එම මිහ්රාජ් ගමන පිළිබඳව සියලු විස්තර පවසා ඇත. ඊට සවන්දුන් අබුජහිල්ගේ සගයින් මහා හඬින් සිනාසී නබිතුමාට අපහාස කොට ඇත. පසුව නබිතුමා පවසන දේ සත්‍යදැයි පරික්ෂා කිරීම සඳහා ඔහුගෙන් ජෙරුසලමේ පිහිටි දේවස්ථානය ගැන විස්තර අසා තිබේ. ඔවුන් අසන සෑම ප්‍රශ්නයකටම නබිතුමා ඉතා නිවැරදිව පිළිතුරු දීම නිසා ඔවුන්ට කිසිවක් කර කියා ගත නොහැකිව එම ස්ථානයෙන් පිටත්ව ගොස් තිබේ. කෙසේ වෙතත් ඉන් නොනැවතුනු අබුජහිල් නබිතුමාව බොරු කාරයෙක් කිරීම සඳහා නබිතුමාගේ හිත මිත්‍ර අබූ බක්කර් රලි තුමා වෙත ගොස් මිහ්රාජ් ගමන ගැන සැලකොට ඇත. එවිට අබුබක්කර් රලි තුමා අබුජහිල් ඇතුළු පිරිසගෙන් මෙම කරුණු මුහම්මද් (ﷺ) තුමා පැවසුවාදයි ප්‍රශ්න කොට තිබේ. ඊට "ඔව්" යැයි ඔවුන් පිළිතුරු දුන් විට අබුබක්කර් රලි තුමා කිසිම ප්‍රශ්න කිරීමකින් තොරව නබිතුමා පවසන දේ සත්‍යයක් බව පිළිගෙන තිබේ. එතැන් පටන් අබූ බක්කර් රලි තුමාට සිද්දීක් යන නම පට බැඳුනේය.

කිසිම නබිවරයෙකුට නබිතුමාට ලැබුණු මෙවැනි අකාරයේ ප්‍රාතිහාරයක් ලැබ නොමැත. තවද නබිතුමාට පහළ වූ අල් කුරානයද සුවිශේෂී ප්‍රතිහාරයකි. එය අදටත් ප්‍රතිහාරයක් ලෙසම පවතී. කිසිම් දිනක නබිතුමා ජෙරුසලමට ගොස් නොමැතිව සිටියේදී ඔහුගේ සතුරන් අසන ලද ප්‍රශ්නවලට ඉතා නිවැරදිව පිළිතුරු දීම සුවිශේෂී කරුණකි. (FA).

---

## මුහම්මද් (ﷺ) තුමාණන් කල අවසාන දේශනය.

හිජ්රි 10 වන වසරේ දුල්හජ් මාසයේ නබිතුමා ඉටුකල එකම හා අවසානම හජ් වන්දනාවේ දී එහි පැමිණ සිටි බැතිමතුන්හට කල දේශනය එතුමාගේ වසර 23 ක මෙහෙවර සාරාංශ කොට කල අවසානම දේශනය විය.

මාගේ ජනතාවනි ඉතා සාවදානව මට කන් දෙන්න. මන්ද මෙම වසරෙන් පසු කිසිදා මම ඔබ අතර වෙම්දැයි මා නොදන්නා බැවිනි. එබැවින් මා කියන දෙයට ඉතා හොඳින් කන් යොමු කර, අද දින මෙහි පැමිණීමට නොහැකි වූවන් අතරට ද මාගේ මෙම පණිවුඩය ගෙන යන්න. "ජනතාවනි ඔබ මෙම (දුල්හජ්) මාසයත්, (අරෆා) දිනයත්, මෙම (මක්කාව) නගරයත් කොතරම් ශුද්ධත්වයෙන් සලකන්නේ ද එසේම සෑම මුස්ලිම්වරයෙකුගේම ජීවිතයත්, ධනයත්, ආත්මගරුත්වයත් ශුද්ධත්වයෙන් සලකන්න. ඔබේ භාරයේ කිසිවකුට අයත් යම් දෙයක් වේ නම් එය නියම අයිතිකරුටම නැවත භාරදෙන්න. එහි කිසිවිටෙකත් වංචනයන් සිදු නොකරන්න. එසේම කිසිවෙකු හට වේදනා නොකරන්න. එවිට කිසිවකු ඔබට වේදනා නොකරනු ඇත. සත්‍ය වශයෙන්ම ඔබගේ ස්වාමියාණන් (දෙවියන්) හමුවන බවත්, ඔහු සත්තකින්ම ඔබගේ ක්‍රියාවන් ගැන විමසන බවත්, තරයේ මතක තබා ගන්න. පොළී ලබා ගැනීම අල්ලාහුතආලා විසින් තහනම් කර ඇත. එබැවින් පොළීය හා සම්බන්ධ (එනම් පොළී ලබාගැනීම, ලබාදීම, උදව්කිරීම, සාක්ෂිකරුවකුවීම යන) සියළු බැඳීම් මින් මතු අත්හල යුතුයි. ඔබගේ ආගමේ හා ඔබගේ ආරක්ෂාව උදෙසා 'ෂෙයිතාන්' ගෙන් (සාතාන් ගේ නපුරෙන්) ප්‍රවේශම් වන්න. 'ලොකු දේවලින් ඔබ නොමග යැවිය හැකිය' යන විශ්වාසය ඔහු (සාතාන්) කෙරෙන් සම්පූර්ණයෙන්ම බිඳී ගොස් ඇත. එනමුත් ඔබලා සුළු යයි සිතන කාරණයන් තුලින් ඔහුව අනුගමනය කිරීමෙන් ප්‍රවේශම් වන්න.

ජනතාවනි ඔබගේ ස්ත්‍රීන් සම්බන්ධයෙන් ඔබට යම් යම් අයිතීන් ඇති බව සැබෑය. ඔබගේ අයිතීන් සම්බන්ධයෙන් ඔවුන් ඔබට කීකරුවෙත් නම් ඔබ විසින් ආදරයෙන් කවා, පොවා, වස්ත්‍ර සැපයීමේ අයිතිය ඔවුනට හිමිවේ. ඔබ ඔබේ ස්ත්‍රීන්ට හොඳින් සලකන්න. ඔවුනට කරුණාවන්ත වන්න. ඔවුන් ඔබගේ සහකාරියන් හා පක්ෂපාති උදව්කරුවන් වේ. ස්ත්‍රීන්ට ද තම ස්වාමියා සම්බන්ධයෙන් යම් යම් අයිතීන් ඇත. එනම් තම දරුවන් රැකබලා ගැනීමත්, තම

ස්වාමියා විසින් අනුමත නොකරන අය හා සමග ඔවුන් මිත්‍රත්වය ඇති කර නොගැනීමත්, එසේම ඔවුන් කිසිකලෙකත් පරපුරුෂ සෙවනයෙහි නොයෙදී පතිනි බව ආරකෂා කරගැනීමත් ඔවුන්ගේ අයිතීන් වේ.

ජනතාවනී ඉතා සාවදානව මට ඇහුම්කන් දෙන්න. අල්ලාහ් දෙවියන් පමණක් නමදින්න. දිනපතා පස්වේල සලාතය ඉටුකරන්න. රමළාන් මාසයේ උපවාසයෙහි යෙදෙන්න. ඔබගේ ධනයෙන් සZකාත් (මුස්ලිම්වරුන් විසින් දුප්පතුන්ට දෙන අනිවාර්‍ය බද්ධ) දෙන්න. වත්කම් ඇත්නම් හජ් වන්දනාවේ යෙදෙන්න. එක් මුස්ලිම්වරයෙකු තවත් මුස්ලිම්වරයෙකුගේ සහෝදරයෙකු යන්න නුඹලා දන්නෙහිය. ඔබ සියළු දෙනා (ජාතියෙන්, භාෂාවෙන් කිසිවෙක් කිසිවකුට උසස් නොවන) සමානයෝ වෙති, එනමුත් ඔබලාගේ භක්තිය හා සත්ක්‍රියාවන් හේතු කොටගෙන නුඹලාගෙන් එක් අයෙකු තවත් අයෙකුට වඩා උසස් වන්නේය.

මතකයේ රඳවාගන්න යම් දිනක ඔබගේ ස්වාමියා (අල්ලාහ්) ඉදිරියේ පෙනී සිට ඔබගේ (මෙලොව) ක්‍රියාවන් සම්බන්ධයෙන් පිළිතුරුදීමට සිදුවෙනු ඇත. ජනතාවනී මගෙන් පසු නබිවරයෙක් (වක්තෘවරයෙක්) නොපැමිණෙනු ඇත. එසේම අළුත් ධර්මයන් බිහි නොවනු ඇත. එබැවින් ප්‍රවේශම් වන්න මගේ වියෝවෙන් පසු කිසි කලෙකවත් සත්‍යයේ මාර්ගයෙන් ඈත් නොවන්න. ඒ සඳහා මා ඔබට පවසන වචන හොඳින් තේරුම් ගෙන බුද්ධිමත්ව සිතට ගන්න. මාගේ ජනතාවනී මා කරුණු දෙකක් නුඹලා හමුවේ තබායමි. ඒ අල්කුර්ආනය (දේව වාක්‍ය අඩංගු ශුද්ධ වූ ලියවිල්ල) හා සුන්නාහ්ව (මුහම්මද් ﷺ තුමා වචනයෙන්, ක්‍රියාවෙන් හා අනුමත කිරීම් තුලින් පෙන් වූ ආදර්ශනයන්) වේ. ඔබලා මේ දෙක පිළිපදිනතාක් කිසි විටෙකත් නොමග නොයනු ඇත.

මාගේ ජනතාවනී මාගේ මෙම වදන් සවන් දෙන ඔබ මෙයට සවන් නොදුන් අයට ද එම වදන් පවසන්න, එය සවන් දෙන අය තවත් අයහට මෙම වදන් පවසත්වා! මන්ද මෙම වදන් සෘජුවම සවන් දුන් අයට වඩා පසුව එන අය හොඳින් අවබෝධ කරගනු ඇත. "යා අල්ලාහ්! (මාගේ දෙවියනේ!) ඔබගේ පණිවුඩය මෙම ජනතාවට දැනුම් දුන් බවට ඔබම සාකෂිකරුවකු වන්න." ___________________

# නබිවරුන් සම්බන්ධ ප්‍රාතිහාර්යයන්.

අනාගතවක්තෘවරුන්ගේ ප්‍රාතිහාර්යයන් සහ විශේෂ සිදුවීම්.

ඔක්ස්ෆෝඩ් ශබ්දකෝෂයට අනුව ප්‍රාතිහාර්යයක් යනු; ස්වාභාවික හෝ විද්‍යාත්මක නීති මගින් පැහැදිලි කළ නොහැකි සහ එම නිසා දිව්‍ය ආයතනයකට ආරෝපණය කරන ලද අසාමාන්‍ය සහ පිළිගත හැකි සිදුවීමකි.

ප්‍රාතිහාර්යය යන්නට ආශ්චර්යය, පෙළහර, හාස්කම, මහා පුදුමය, අද්භූත දේ යන වචනද භාවිතා කෙරේ.

විශ්වයේ ආරම්භයද ප්‍රාතිහාර්යයකි. එය මනා සැලසුමකට අනුව ව්‍යාප්ත වීමද, එහි අන්තර්ගතය තුල ඇති සෑම දෙයක්ම ප්‍රාතිහාර්යයන් ලෙසම පවතී. නමුත්, මිනිසුන් විසින් ඒවා සාමාන්‍ය දේවල් බවට පත්කරගෙන විවිධ තර්ක ඉදිරිපත් කරමින් සිටී.

එවන් අවස්ථාවක දෙවිඳුන් විසින් නබිවරුන් හරහා මිනිසාට මාර්ගෝපදේශ ලෙස දිව්‍ය හෙළිදරව්වන් පහළ කල විට එම දිව්‍ය වදන් සහ එම නබිවරුන්ව නොසලකාහරින තරමට මිනිසුන් ඉක්මන් සහ අහංකාර වේ. එවිට එම නබිවරයා පැමිණියේ දෙවියන්ගේ හෙළිදරව්වන් රැගෙන බව තහවුරු කිරීමට සොභාවික පරිසරය තුල සාමාන්‍ය ආකාරයට සිදු නොවන යම් යම් සිදුවීම් හෙවත් ප්‍රාතිහාර්යයන් පෑමට දෙවිඳුන්ගේ අවසරින් එම නබිවරුන්ට අවස්ථාව ලබා දුනි. එවැනි ප්‍රාතිහාර්යයන් කිහිපයක් සහ නබිවරුන් සම්බන්ධ එවැනි තවත් විශේෂ තොරතුරු කිහිපයක් මෙම ලිපිය තුලින් ඉදිරිපත් කර ඇත.

ඉස්ලාම් දහම වෙතින් ප්‍රාතිහාර්යයන් සහ ඉතිහාසය ගැන තොරතුරු ඉදිරිපත් කරනුයේ ශුද්ධ වූ අල් කුරාණය සහ නබි මොහම්මද් ﷺ තුමාගේ දිව්‍යමය ආදර්ශය පදනම් කරගෙනය. එබැවින්, කුරාණය යනු කුමක්දැයි සහ නබි මොහම්මද් ﷺ තුමා ගැනත් කෙටියෙන් පැහැදිලි කිරීම පළමුව වටී. (කුරානයේ මග පෙන්වීම මත ඇතැම් ඉතිහාස කරුණු ගැන යම් තොරතුරු ප්‍රමාණයක් පෙර පහළ වූ ග්‍රංථ වන තව්රාත් සහ ඉංජීලයෙන්ද සොයා ගත හැක. නමුත් ඒවායේ

ඇති සමහර කරුණු මිනිසුන් විසින් වෙනස් කර ඇති නිසා ඒ ගැනත් සැලකිලිමත්වී සත්‍ය තොරතුරු පමණක් ලබාගැනීම කළ යුතුය).

ඇත්ත වශයෙන්ම අල් කුරාණය යනු අද යුගයේ සිටින ජනතාවට සිය දෑස්වලින්ම බලා ගැනීමට හැකි වන ලෙස සර්වබලධාරී අල්ලාහ් දෙවිඳුන් විසින් අවසන් නබි මොහම්මද් ﷺ තුමාට පහළ කල විශේෂ ප්‍රාතිහාර්යයකි. එය ලෝක අවසානය තෙක්ම ප්‍රාතිහාර්යයක් ලෙසම පවතී යන්නයි මුස්ලිම්වරුන්ගේ විශ්වාසය.

කුරාණය ප්‍රාතිහාර්යයක් වන්නේ එහි අන්තර්ගත වාක්‍ය වලින් සහ එහි ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති ස්ථාවර භාවයෙනි. කිසිඳු මිනිසෙකුට හෝ මුළු මහත් මිනිස් (සහ ජින්) සමූහයම එකතුවී උත්සහ ගත්තත් කුරාණය වැනි ග්‍රංථයක් නිර්මාණය කළ නොහැකි බවත්, මෙම කුරාණය තුලින් කිසිඳු වරදක්, නොගැලපීමක් සොයාගත නොහැකි බවත් එහි කතෘ වන දෙවියන්වහන්සේ සහතික වී සහ අභියෝග කර ඇත.

**කිසිඳු මිනිසෙකු දැන ගැනීමට පෙර විශ්වය සහ එහි ඇති දේ ගැන බොහෝ කරුණු දෙවිඳුන් කුරාණය තුල අංතර්ගත කර තබා තිබීමද එය දෙවියන්ගෙන් පැමිණි හෙළිදරව්වක් බවට සාධයයකි. මේ ගැන කුරානය යනු කුමක්ද? යන ලිපිය තුල වැඩි වශයෙන් කරුණු අන්තර්ගත කර ඇත.**

**එම කුරාණය තුල පෙන්වාදෙන ප්‍රාතිහාර්යයන් කෙරෙහි කිසිඳු සැකයකින් තොරව මුස්ලිම්වරුන් විශ්වාස කරනුයේ එම සෑම වචනයක්ම දෙවියන්ගේම වචන බවට ඇති අචල විශ්වාසය නිසාය. එසේම, අල්ලාහ්ගේ අවසන් දූතයා වන නබි මොහම්මද් ﷺ තුමා කෙරෙහිද ඇත්තේ එවැනිම විශ්වාසයකි. එම නිසා මුස්ලිම්වරුන් එතුමාගේ දිව්‍ය ආදර්ශය හෙවත් සුන්නාව ද විශ්වාස කරයි.** එම විශ්වාසයන් මත පිහිටුවමින් පහත සඳහන් ප්‍රාතිහාර්යයන් සහ විශේෂ සිදුවීම් ගැන තොරතුරු ඉදිරිපත් කර ඇත.

### 1). ආදම් (අ.ස) සම්බන්ධ ආශ්චර්යයන්

පළමු මිනිසා ආදම් (අ.ස) සහ ඔහුගෙන් නිර්මාණය කළ පළමු කාන්තාව වන හව්වා (අ.ස) යන දෙපල සම්බන්දව ප්‍රාතිහාර්යයන් සිදුවිය. නමුත් ඒවා ජනතාවට

පෙන්වීමට ජනතාව ඉදිරියේ සිදු වූ ඒවා නොවේ. සිදුවූ ප්‍රාතිහාර්යයන් නම්, ඔවුන් ව නිර්මාණය කළ ආකාරයත් ඔවුන් ස්වර්ග උයනේ සිට ඉතා දුරක් ගෙවමින් පෘතුවිය වෙත පැමිණීම සහ ඔවුන් පෘතුවියෙහි ස්ථාන දෙකකට පහළ වූ පසු පසුව මක්කා හිදී නැවත එකට මුනගැසීමත්ය.

ඔවුන් ස්වර්ග උයනේ සිට පෘතුවියට පැමිණි වේගය ආලෝකයේ වේගයට වඩා වැඩි විය යුතුයි. අවසන් නබි මොහම්මද් ﷺ තුමන්ද මෙලෙස විශ්මිත ගමනක යෙදී තිබේ. එය එතුමාට ලැබුනු ප්‍රාතිහාර්යයකි. ඒ ගැන මුහම්මද් ﷺ තුමාණන්ගේ මිහ්රාජ් ගමන ගැන ලියවුණු ලිපියෙහි සඳහන් වේ.

## 2). ඉද්රිස් (අ.ස) තුමා සම්බන්ධ විශේෂත්වයන්

ආදම් (අ.ස)ට පසු කුරානය තුල සඳහන් වන්නේ නබි ඉද්රීස් (අ.ස) තුමා ගැනය. දෙවිඳුන් පවසනවා ඔහු ඉතා අවංකභාවයෙන් යුත් 'විශ්වාසවන්ත' සහ 'ඉවසිලිවන්ත' කෙනෙකු බව. එසේම, ඔහුට බුද්ධිය, කුසලතාව, ජ්‍යොතිෂය වැනි දැණුමද, මිනිස් ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසිය හැකි ලිවීම, සංඛ්‍යා ශාස්ත්‍රය සහ මැහුම් කටයුතු වැනි දේවලින් නිර්මාණ කිරීමේ හැකියාව වැනි තත්වයන් ලබා දී ඇත.

## 3). නූහ් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යයක්

නූහ් නබි (අ.ස) තුමා වසර 950 කට ආසන්න කාලයක් එවකට සිටි ජනතාවට පිළිම වන්දනාව සහ අල්ලාහ්ට සමානයන් තැබීමෙන් වළකින ලෙස උපදෙස් දුනි. නමුත් ඔවුන් එම වදන් සැලකිල්ලට ගත්තේ නැත. අවසානයේ නූහ් නබි තුමා එම ගුණමකු සමාජය මෙලොවින් ඉවත් කරන ලෙස අල්ලාහ්ගෙන් ඉල්ලා සිටියේය. එවිට, අල්ලාහ්ගේ අවසරය සහ මගපෙන්වීම ඇතිව, නූහ් නබි (අ.ස) තුමා පළමු වරට විශාල නැවක් සෑදීය. අල්ලාහ්ව සහ නබිවරයාව ප්‍රතික්ෂේප කරන්නන්ව සහමුලින්ම විනාශ කර දැමීමට පහළ කල මහා වර්ෂාවෙන් සහ ගංවතුරින් බේරී යාමට එම නැව උපකාරී විය. නූහ් නබි තුමා සමග විශ්වාසවන්තයින් කිහිපදෙනෙකු සහ සතුන් යුගල කිහිපයක් එම නැව හරහා ආරක්ෂිත ස්ථානයක් කරා ගමන් කලේය. පසුව ඔවුන්ගෙන් නව මිනිස් පරම්පරාව ව්‍යාප්ත විය.

## 4). හූද් නබි (අ.ස) සම්බන්ධ විශේෂත්වයන්

ආද් ජනතාව ඉතා දක්ෂ හා විශිෂ්ඨ ගෘහ නිර්මාණ ශිල්පීන් විය. ඔවුන් මන්දිර අලංකාර ලෙස ඉදි කරන්නන්ය. ශක්තිවන්තයන්ය. ඔවුන් ඒකාධිපතියෙකුගේ නායකත්වය යටතේ සිටි අතර අල්ලාහ්ට මෙන්ම අනෙකුත් සත්වයන්ටද නමස්කාර කළහ. පිළිම වන්දනාවද අධික විය. හූද් නබි (අ.ස) ඔවුන්ට අල්ලාහ්ව පමණක් නමදින ලෙස නැවත නැවත කීවේය. අල්ලාහ්ගේ දඬුවම ගැන අවවාද කළේය. ඔවුන් එය ගනන් ගත්තේ නැත.

අවසානයේ අල්ලාහ් ඔවුන් වෙත දඬුවමක් පහළ කළේය. එය දින 8 ක් සහ රාත්‍රී 7 ක් පුරා පැවති සුළඟක් ලෙසින් පැමිණ එයින් සියලු ප්‍රතික්ෂේප කරන්නන් සහ ගේදොර මාලිගා ආදිය විනාශ වී ගියේය.

අල්ලාහ්ට පමණක් නමස්කාර කිරීම කල හූද් නබි (අ.ස) තුමා සහ ඔහුව විශ්වාස කළ ජනතාව නිරුපද්‍රිත වූහ.

## 5). සාලිහ් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යයක්

ආද් ජනතාව මෙන්ම මොවුන්ද දක්ෂ ගෘග නිර්මාණ ශිල්පියෝ වූහ. ඔවුන් ඉතා ශක්ති සම්පන්න ජනතාවක් විය. විශාල පර්වත හාරා නිවාස අලංකාරවත් ලෙස සැදීය. ඔවුන්ද අල්ලාහ්ට සමානයන් තබා පිළිම වන්දනාවේ නිරත විය. ඔවුන් වෙත සාලිහ් නබි (අ.ස) විසින් අල්ලාහ් ගැන පහදා දෙන්නට විය. ඔවුන් නබිවරයාව විහිළුවට ගත්තේය. ඔවුන් නබිවරයාගෙන් ප්‍රාතිහාර්යයක් පෙන්වන ලෙස ඉල්ලීය. එය නම් පර්වතයක් පලා එතුලින් ගැහැණු ඔටුදෙනක් ලබා දෙන ලෙසය. එය ඒ පරිදිම සිදු විය. ඉන් පසුවත් ඔවුන් පිළිසකර නොවීය. පසුව ඔවුන් ඔටු දෙනවද මරා දැමීය. එවිට මහා භූමිකම්පාවක් ඇතිවී ඔවුන් සියල්ල සහමුලින්ම විනාශ විය. සාලිහ් නබිවරයා සහ ඔහුව විශ්වාස කළ අය නිරුපද්‍රිත විය.

## 6). ඉබ්රාහීම් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යයක්

ඉබ්රාහීම් නබි (අ.ස) තුමා තම පියා ඇතුළු පිළිම වන්දනාකරුවන් සමග එයට විරුද්ධව නිතර වාද කළ කෙනෙකි. වරක් ඔහු කිසිවෙක් නොසිටි අවස්ථාවක

ඔවුන්ගේ පිළිම කඩා විනාශ කර එක් විශාල පිළිමයක් පමණක් ඉතුරු කළේය. පසුව ගම්වාසීන් පැමිණ මෙය දැක එයට ඉබ්රාහීම් (අ.ස)ව සැක කළහ. ඉබ්රාහීම් (අ.ස) පැවසුවේ පිළිම කඩපු කෙනා ගැන මේ ඉතුරු විශාල පිළිමයෙන් අසා දැන ගන්නා ලෙසය. එවිට ඔවුන් කෝප වී ඉබ්රාහීම් (අ.ස)ව ගින්නකට දැමීය. එවිට අල්ලාහ්ගේ අණින් එම ගින්න ඉබ්රාහීම් (අ.ස)ට රස්නයක් හෝ පිළිස්සීමක් ඇති නොකලේය.

## 7). ලූත් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යයක්

ලූත් නබි තුමා වාසය කල ප්‍රදේශයේ ජනතාව පිරිමි-පිරිමි ලිංගිකව එකතුවන අසික්කිත ක්‍රියාවේ නියැලෙන්නට විය. ඔවුන් පාපී ජනතාවක් විය. ඔවුන් ට ලූත් නබි (අ.ස) විසින් අල්ලාහ් ගැනත් ඔහුගේ දඬුවම් ගැනත් කියා දුනි. නමුත් ඔවුන් පිළිසකර වූයේ නැත. එවිට අල්ලාහ් ඔවුන් වෙත උනුසුම් කරණ ලද කිරිමැටි ගල් වර්ෂාවක් එවා ඔවුන්ගේ නගරය සහමුලින්ම විනාශ කර දැමීය. නගරය උඩු යටිකුරු කරාක් මෙන් විය. ලූත් නබි (අ.ස) සහ විශ්වාසවන්තයින්ට හානියක් නොවීය.

## 8). ඉස්මායිල් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යය

ඔහුගේ පියා (ඉබ්රාහීම් අ.ස), අල්ලාහ්ගේ අණ පරිදි ඔහුව (කුර්බාන් ලෙස) පූජා කිරීමට සූදානම් වූ විට ඔහුගේ ගෙල කැපීමට මොහොතකට පෙර අල්ලාහ් ඉස්මායිල් (අ.ස) කුඩා දරුවා වෙනුවට එතනට බැටළුවෙකු ආදේශ කළේය. ඉස්මායිල් (අ.ස)ව ඝාතනය නොවුනි. ඉබ්රාහීම් (අ.ස) ද තම විශ්වාසනීයභාවය පෙන්වමින් අල්ලාහ්ගේ පරීක්ෂනයෙන් සමත් උනි.

## 9). ඉස්හාක් නබි (අ.ස) සම්බන්ධ විශේෂත්වය

ඉස්හාක් (අ.ස) ඉබ්රාහීම් (අ.ස) ගේ එක් පුතෙකි. ඉස්හාක් (අ.ස) ගේ බිරිඳ (වන රෆ්කා බින්ට් බතුයිල්) වඳ කාන්තාවක් වූ අතර, ඔහුගේ යාච්ඤාවේ ප්‍රතිඵලයක් ලෙස අල්ලාහ් ඔවුන් දෙපලට නිවුන් දරුවන් ලබා දුනි. එම දරුවන්ගෙන් එක්කෙනෙක් රෝමවරුන්ගේ මුතුන් මිත්තෙකු වන 'ඉෂු' සහ  අනිත් දරුවා ඊශ්‍රායෙල් දරුවන්ගේ මුතුන් මිත්තෙකු වන යා'කුබ් (අ.ස)ය.

### 10). යාකුබ් නබි (අ.ස) සම්බන්ධ විශේෂත්වය

යාකුබ් (අ.ස) දරුවන් 12 දෙනෙකුගෙන් යුත් අනාගතවක්තෘවරයෙකු වූ අතර ඔහුට ඔහුගේ මරණයට පෙර තම පුතුන් සම්බන්ධව තිබූ කැමැත්ත ඉටු වීම ද පුදුමයකි. එය අල් කුරාණයේ සූරා අල්-බකරා හි 133 වන පදයේ අඩංගු වේ. එය මෙසේය.

"මගෙන් පසු ඔබලා කුමක් නම් නමදින්නෙහුද?"යි විමසූ විට, "ඔබගේ දෙවියන්ද, ඔබගේ මුතුන්මිත්තන් වන ඉබ්රාහීම්, ඉස්මායීල්, ඉස්හාක් ආදීන්ගේ දෙවියන්ද වන එකම දෙවියන්ව අපි නමදින්නෙමු! ඔහුට සම්පූර්ණයෙන්ම අවනත වූ මුස්ලිම්වරුන් වශයෙන්ම සිටින්නෙමු" යයිද පැවසූහ; (2:133)

### 11). යූසුෆ් නබි (අ.ස) සම්බන්ධ විශේෂත්වයන්

යූසුෆ් නබි (අ.ස)ට අල්ලාහ් විසින් ඉතාම කඩවසම් පෙනුමක් ලබා දී තිබූ අතර සිහින අර්ථ නිරූපණය කිරීමට හැකියාවද ලබා දී තිබුණි.

### 12). අයියූබ් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යය

අයියූබ් (අ.ස) රෝගාතුර විය. ඉන් විශාල ලෙස පීඩා වින්දේය. ඔහුගේ පවුලද, දේපලද විනාශ විය. අයියූබ් (අ.ස) තම පරීක්ෂාවන්ට මුහුණ දීමේදී ඔහු වඩාත්ම ඉවසිලිවන්ත ලෙස සිටියේය. ඔහු අධික ලෙස පීඩා විඳිමින් සිටින විට අල්ලාහ් ඔහුට ඔහුගේ පාදයෙන් පොළොවට ගසන ලෙස අණ කළේය. ඔහු එසේ කල විට එතනින් දිය උල්පතක් මතු විය. ඔහු එයින් පානය කර ස්නානය කල විට ඔහුගේ රෝගය සුව විය.

### 13). ශුඅයියූබ් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යය

ශුඅයියූබ් (අ.ස)ගේ ජනතාව අල්ලාහ්ට සමානයන් තබමින්ද නබිවරයාගේ ඔවදන් ප්‍රතික්ෂේප කරමින්ද, කිරුමෙහි ආසාධාරණකම් කරමින්ද, පාපිෂ්ඨයන් වශයෙන් සිටියේය. නබිවරයාව ගල් ගසා මරණ බවද පැවසීය. එවිට ශුඅයියූබ් (අ.ස) අල්ලාහ්ගේ දඬුවම් ගැන ඔවුන්ට මතක් කර දුනි. ඉන් පළක් නොවීය. පසුව

ආලෝක සහිත මහා හෙණ හඬවලින්ද, භූමිකම්පාවෙන්ද ඔවුන්ව විනාශකර දැමීය. ශුඅයියුබ් (අ.ස) සහ විශ්වාසවන්තයින් නිරුපද්‍රිත විය.

### 14). මූසා නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යයන්

අල්ලාහ් සුභානවතාලා මූසා නබි තුමා සමග කථා කල බව කුරාණය තුල සඳහන්. එසේම අල්ලාහ්ව දැකීමට අවස්ථාවක් දෙන ලෙස ඉල්ලා සිටි විට, මිනිසුන් කිසිවෙක්ට අල්ලාහ්ව ඍජුව බැලිමට ශක්තිය නැති බව පවසා එය තහවුරු කිරීමට අල්ලාහ් එක බැල්මක් හෙලූ කන්ද සුණු විසුණු වී ගිය ආකාරය මූසා (අ.ස) ට දැකීමට අවස්ථාව දුනි.

තවද අල්ලාහ් මූසා (අ.ස) ට දුන් ප්‍රාතිහාර්යයන් හේතුවෙන්, මූසා නබිතුමාගේ අත කමිස සාක්කුවට දමා පිටතට ගත් විට එයින් ආලෝකය පිට විය. ඔහුගේ දිවෙහි ගැටය නිසා ඔහු කෙරෙහි තිබූ වචන උච්චාරණ දෝෂය නිවැරදි කරන ලෙස අල්ලාග්හෙන් ඉල්ලීම් කල පසු එය නිසි පරිදි සැකසුණි. එසේම ඔහුගේ සැරයටිය නාගයෙක් බවට පත් කල හැකි වීම සහ එම සැරයටිය භාවිතා කරමින් ඔහුට රතු මුහුද දෙබෑ කිරීමට හැකි වූ අතර එමගින් ඔහු සහ ඔහුගේ අනුගාමිකයන් ෆිරඖන්ගේ ලුහුබැඳීමෙන් බේරා ගත හැකි විය.

ඊට අමතරව ඔහු හා සම්බන්ධව එම ජනතාවට ඉඩෝරය, අස්වැන්න අඩු කිරීම, උකුණන්, පළගැටියන්, මැඩියන්, වස්තූන් ගල් කිරීම වැනි තත්වයන්ද සිදුවී ඇත.

### 15). දාවූද් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යයන්

කඳු සහ පක්ෂීන් ඔහුට වසඟ කර දීම. එමගින් ඔහුට ඒවා සමග යම්කිසි සන්නිවේදන හැකියාවන් ඇතිවීම. ඉමිහිරි කටහඬක් ද, ශක්තිමත් දැතක්ද, ආරවුල් විසදීමේ ඥාණය සහ යකඩ වලින් ආරක්ෂිත යුද ඇඳුම් සැදීමේ නුවණ ඔහුට අල්ලාහ්ගෙන් වරප්‍රසාද ලෙස ලැබුණි.

### 16). සුලෙයිමාන් නබි (අ.ස) සම්බන්ධ ආශ්චර්යයන්

පක්ෂීන්ගේ භාෂාව කතා කිරීමට සහ තේරුම් ගැනීමටත්, කුහුඹුවන් වැනි සතුන්ගේ භාෂාවන් පවා වටහා ගැනීමේ හැකියාවත්, ජින් සහ සුළඟ ඔහුගේ

කැමැත්තට කීකරු වන පරිදි ඒවා යටත් කර ගැනීමට හැකියාව ඔහුට අල්ලාහ් විසින් ලබා දී තිබුණි.

## 17). යූනුස් නබි (අ.ස) සම්බන්ධ ආශ්වර්යයන්

යූනුස් නබි (අ.ස) වාසය කළ නගරයෙහි මිනිසුන් පිළිරූ වන්දනා කළේය. එය නවතා අල්ලාහ්ව නැමදුවේ නැතිනම් අහසින් දඬුවමක් පැමිණේවි යයි ඔහු තම ජනතාවට අනතුරු හැඟෙව්වේය. නමුත් අණතුර ප්‍රමාද වූ නිසා ඔහු ජනතාවට බියෙන් එම නගරෙන් පිට විය. එවිට ජනතාව අණතුර ගැන ඇත්තටම බියවී අල්ලාහ්ගෙන් සමාව ඉල්ලා සිටි පසු අල්ලාහ් විසින් අණතුර පහව හැරියේය.

නගරෙන් පිටත් වූ යූනුස් නබි (අ.ස) විශාල මාළුවෙකු ගිලගත් අවස්ථාවේ ඔහු මාළුවාගේ කුස තුල සිටින ගමන් තමන්ව එයින් මුදවන ලෙස අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කලේය. අල්ලාහ් එම ප්‍රාර්ථනාව පිළිගෙන ඔහුව එයින් මුදවන ලදී.

## 18). සකරීයා නබි (අ.ස) සම්බන්ධ ආශ්වර්යය

සකරීයා නබි (අ.ස) සහ ඔහුගේ බිරිඳ යන දෙදෙනාම ඉතාම මහළු වයසෙදී තමන්ගේ පරම්පරාව ගෙනයාමට දරුවකු ලබා දෙන ලෙස අල්ලාහ්ගෙන් ඉල්ලා ප්‍රාර්ථනා කලේය. ඒ වන විටත් ඔහුගේ බිරිඳ වඳභාවයෙන්ද සිටියේය. නමුත්, අල්ලාහ් ඔහුගේ ප්‍රාර්ථනාවට පිළිතුරු දී ඔවුන් දෙපලට යහියා (අ.ස) නම් පුතෙකු ලබාදුන්නේය.

දරුවා ලැබීම ගැන මුලින්ම සුභාරංචිය ලැබුණු අවස්ථාවේ සකරියා (අ.ස) ඒ ගැන සළකුනක් පෙන්වන ලෙස අල්ලාහ්ගෙන් ඉල්ලා සිටියේය. එවිට අල්ලාහ් ඔහුට දැනුම් දුන්නෙ "නුඹ දින තුනක් මිනිසුන් සමග කතා නොකරන ගොලුවෙකු ලෙස සිටින බවය". ඔහුට එසේ මිනිසුන් සමග කතා කළ නොහැකි විය, නමුත් ඔහු සලාත් කිරීමෙහි දී සහ අල්ලාහ්ව දික්ර් කිරීමේදී ඔහු ගොලු නොවීය.

## 19). ඊසා නබි (අ.ස) [යේසුස් වහන්සේ] සම්බන්ධ ආශ්වර්යයන්

ඊසා (අ.ස) ගේ උපතත් ප්‍රාතිහාර්යයකි. ඔහු පියෙකු රහිත කෙනෙකු ලෙස දේව අනින් උපත ලද්දේය. ඔහු උපන් අලුත මිනිසුන් සමග කථා කලේය. ඔහු වැඩිවිය

පැමිණි පසු උපතින් අන්ධ වූවන් සුව කිරීමටත්, මළවුන් නැවත නැඟිටුවීමටත් සමත් වූ අතර, යුදෙව්වන් ඔහුව කුරුසියේ ඇණ ගැසීමට උත්සාහ කළ විට අල්ලාහ් ඔහුගේ රුව වෙනත් කෙනෙකුට මාරු කර ඔහුව ස්වර්ගයට ඔසවා තබන ලදී. ඔහු ලෝක අවසානයට පෙර නැවත පැමිනීමටද නියමිතය.

## 20). මොහම්මද් නබි (ﷺ) සම්බන්ධ ආශ්චර්යයන්

මොහම්මද් නබි (ﷺ) තුමාණන්ගේ ශ්‍රේෂ්ඨතම ප්‍රාතිහාර්යය වන්නේ මනුෂ්‍ය වර්ගයාට මඟ පෙන්වීමක් ලෙස අල් කුරාණයයි. ඊට අමතරව,

අල්ලාහ් ඔහුට තවත් අසාමාන්‍ය අවස්ථාවක් ද ලබා දී ඇත, එය ඉස්රා සහ මිහ්රාජ් නම් ගමනයි. එය ආලෝකයේ වේගය පවා අභිභවා ගිය ගමනකි. මක්කාවේ සිට ජෙරුසෙලමේ බයියතුල් මුකද්දස් වෙත සහ අපගේ විශ්වය වන පහල අහසත් ඉන් ඉහල ඇති තවත් අහස් හයකුත් පසු කර අල්ලාහ්සුභානවතාලා සිටින මායිමට ගොස් නැවත පැමිණීමකි. එම සිදුවීම දිනකට අඩු කාලයක් තුළ සිදු විය.

අල්ලාහ්ගේ අවසරය ඇතිව මුහම්මද් ﷺ තුමාණන්ට චන්ද්‍රයා දෙකට බෙදිය හැකි විය. එහි සළකුනු අදත් චන්ද්‍රයා මත ඇත.

නබි ﷺ තුමා ගේ මිතුරෙකු කුඩා කණ්ඩායමක් සඳහා සූදානම් කර තිබූ ආහාර වේලකට ඔහුට ආරාධනා කළ විට, නබි ﷺ තුමා එම ආරාධනය පිළිගත් අතර, සත්කාරකයා පුදුමයට පත් කරමින්, නබි ﷺ තුමා තමාගේ තවත් අනුගාමිකයින් විශාල ප්‍රමාණයකට එම ආහාර මේසයට එක්වන ලෙස ආරාධනා කළේය. ආශ්චර්යයක් ලෙස එම කුඩා ආහාර ප්‍රමාණය එම විශාල සෙනගටම ඇතිවන ලෙස සැකසුනි.

නබි ﷺ තුමාගේ එක් සංචාරයකදී, එතුමාණන් සහ ඔහුගේ සගයන් ඔවුන්ගේ ජල සැපයුම අවසන් වූ විට තීරණාත්මක තත්වයකට මුහුණ දුන්හ. මෙම අවශ්‍යතාවය ඇති වූ මොහොතේ, නබි ﷺ තුමා සතුව කුඩා වතුර භාජනයක් තිබුණි. ඔහු එයට අත තැබූ විට, එයින් සියළුම දෙනාගේ වතුර අවශ්‍යතාවයන් සපිරෙන ලෙස එයින් වතුර නිකුත්වන්නට විය.

නබි ﷺ තුමාණන් බොහෝ විට සිකුරාදා දේශන පැවැත්වූයේ ගසක කඳක් මත සිටගෙනය. පසුව සහාබිවරයෙකු එතුමන්ට මිම්බරයක් පිළිගැන්වීය. එහි සිටිමින් ඔහුගේ පළමු දේශනාව දෙන අතරතුර, ඉහත සඳහන් ගසක කඳෙන් ගැඹුරු හා ශෝකජනක ශබ්දයක් මතු වූ අතර එය දරුවෙකුගේ කෑගැසීම් වලට සමාන විය. බොහෝ සහචරයින් මෙම අසාමාන්‍ය සිදුවීම දුටු අතර ශබ්දයෙන් සංවේගයට පත් විය. එවිට නබි ﷺ තුමාට එම ගස සමග සන්නිවෙදන හැකියාව ලැබුණි. නබි ﷺ තුමා තමා වෙතින් වෙන් වීම ගැන එය දුක් වී ඇත. පසුව නබි ﷺ තුමා එය ගෞරවාන්විත ලෙස වලලන ලෙස සහාබිවරුන්ට උපදෙස් දී ඇත.

නබි ﷺ තුමාණන් ආශ්චර්යමත් ක්‍රියා මගින් දිව්‍ය සුව කිරීමේ බලය පෙන්නුම් කළහ. එක් අවස්ථාවක අලි (රලි) තුමා අක්ෂි ආසාදනයකින් පීඩා විඳිමින් සිටීමයි. එවිට නබි ﷺ තුමා තම කෙල බිඳක් අලි (රලි)ගේ ඇස් මත මෘදු ලෙස ගා ඔහුගේ සුවය සඳහා ආශිර්වාද කළේය. ඔහු එයින්ම සුව විය.

---

## The Most Influential Man in History - Michael Hart

The following is from Michael Hart's book and lists Prophet Muhammad as the most influential man in History.

A Citadel Press Book, published by Carol Publishing Group

Ranking of the twenty from the list of 100:

1. Prophe t Muhammad
2. Isaac Newton
3. Jesus Christ
4. Buddha
5. Confucius
6. St. Paul
7. Ts'ai Lun
8. Johann Gutenberg
9. Christopher Columbus
10. Albert Einstein
11. Karl Marx
12. Louis Pasteur
13. Galileo Galilei
14. Aristotle
15. Lenin
16. Moses
17. Charles Darwin

| | |
|---|---|
| 18. Shih Huang Ti | 19. Augustus |
| | 20. Caesar |

MUHAMMAD, No. 1; The 100, a Ranking of the Most Influential Persons in History by Michael H.Hart

My choice of Muhammad to lead the list of the world's most influential persons may surprise some readers and may be questioned by others, but he was the only man in history who was supremely successful on both the religious and secular levels. Of humble origins, Muhammad founded and promulgated one of the world's great religions, and became an immensely effective political leader. Today, thirteen centuries after his death, his influence is still powerful and pervasive.

The majority of the persons in this book had the advantage of being born and raised in centers of civilization, highly cultured or politically pivotal nations. Muhammad, however, was born in the year 570, in the city of Mecca, in southern Arabia, at that time a backward area of the world, far from the centers of trade, art and learning.

Orphaned at age six, he was reared in modest surroundings. Islamic tradition tells us that he was illiterate. His economic position improved when, at age twenty-five, he married a wealthy widow. Nevertheless, as he approached forty, there was little outward indication that he was a remarkable person. Most Arabs at that time were pagans, who believed in many gods. There were however, in Mecca, a small number of Jews and Christians; it was from them no doubt that Muhammad first learned of a single, omnipotent God who ruled the entire universe.

When he was forty years old, Muhammad became convinced that this one true God (Allah) was speaking to him, and had chosen him to spread the true faith. For three years, Muhammad preached only to close friends and associates.

Then about 613, he began preaching in public. As he slowly gained converts, the Meccan authorities came to consider him a dangerous nuisance. In 622, fearing for his safety, Muhammad fled to Medina (a city some 200 miles north of Mecca), where he had been offered a position of considerable political power.

This flight, called the Hijrah, was the turning point of the Prophet's life. In Mecca, he had had few followers. In Medina, he had many more, and he soon acquired an influence that made him a virtual dictator. During the next few years, while Muhammad's following grew rapidly, a series of battles were fought between Medina and Mecca. This was ended in 630 with Muhammad's triumphant return to Mecca as conqueror. The remaining two and one-half years of his life witnessed the rapid conversion of the Arab tribes to the new religion.

When Muhammad died, in 632, he was the effective ruler of all of southern Arabia. The Bedouin tribesmen of Arabia had a reputation as fierce warriors. But their number was small; and plagued by disunity and internecine warfare, they had been no match for the larger armies of the kingdoms in the settled agricultural areas to the north. However, unified by Muhammad for the first time in history, and inspired by their fervent belief in the one true God, these small Arab armies now embarked upon one of the most astonishing series of conquests in human history.

To the north east of Arabia lay the large Neo-Persian Empire of the Sassanids; to the northwest lay the Byzantine, or Eastern Roman Empire, centered in Constantinople. Numerically, the Arabs were no match for their opponents. On the field of battle, though, the inspired Arabs rapidly conquered all of Mesopotamia, Syria,and Palestine. By 642, Egypt had been wrested from the Byzantine Empire, while the Persian armies had been crushed at the key battles of Qadisiya in 637, and Nehavend in 642.

But even these enormous conquests, which were made under the leadership of Muhammad's close friends and immediate successors, Ali, Abu Bakr and 'Umar ibn al-Khattab, did not mark the end of the Arab advance. By 711, the Arab armies had swept completely across North Africa to the Atlantic Ocean There they turned north and, crossing the Strait of Gibraltar, overwhelmed the Visigothic kingdom in Spain.

For a while, it must have seemed that the Moslems would overwhelm all of Christian Europe. However, in 732, at the famous Battle of Tours, a Moslem army, which had advanced into the center of France, was at last defeated by the Franks. Nevertheless, in a scant century of fighting, these Bedouin tribesmen, inspired by the word of the Prophet, had carved out an empire stretching from the borders of India to the Atlantic Ocean-the largest empire that the world had yet seen.

Everywhere that the armies conquered, large-scale conversion to the new faith eventually followed. Now, not all of these conquests proved permanent. The Persians,though they have remained

faithful to the religion of the Prophet, have since regained their independence from the Arabs.

In Spain, more than seven centuries of warfare, finally resulted in the Christians reconquering the entire peninsula. However, Mesopotamia and Egypt, the two cradles of ancient civilization, have remained Moslem, as has the entire coast of North Africa. The new religion, of course, continued to spread, in the intervening centuries, far beyond the borders of the original Moslem conquests. Currently it has tens of millions of adherents in Africa and Central Asia andeven more in Pakistan and northern India, and in Indonesia. In Indonesia, the new faith has been a unifying factor. In the Indian subcontinent, however, theconflict between Muslims and Hindus is still a major obstacle to unity.

How, then, is one to assess the overall impact of Muhammad on human history? Like all religions, Islam exerts an enormous influence upon the lives of its followers. It is for this reason that the founders of the world's great religions all figure prominently in this book. Since there are roughly twice as many Christians as Moslems in the world, it may initially seem strange that Muhammad has been ranked higher than Jesus. There are two principal reasons for that decision.

First, Muhammad played a far more important role in the development of Islam than Jesus did in the development of Christianity. Although Jesus was responsible for the main ethical and moral precepts of Christianity (insofar as these differed from Judaism), St. Paul was the main developer of Christian theology, its principal proselytizer, and the author of a large portion of the New

Testament. Muhammad, however, was responsible for both the theology of Islam and its main ethical and moral principles. In addition, he played the key role in proselytizing the new faith, and in establishing the religious practices of Islam.

The Quran therefore, closely represents Muhammad's ideas and teachings and to a considerable extent his exact words. No such detailed compilation of the teachings of Christ has survived. Since the Quran is at least as important to Muslims as the Bible is to Christians, the influence of Muhammad through the medium of the Quran has been enormous. It is probable that the relative influence of Muhammad on Islam has been larger than the combined influence of Jesus Christ and St.Paul on Christianity.

On the purely religious level, then, it seems likely that Muhammad has been as influential in human history as Jesus. Furthermore, Muhammad (unlike Jesus) was a secular as well as a religious leader. In fact, as the driving force behind the Arab conquests, he may well rank as the most influential political leader of all time. Of many important historical events, one might say that they were inevitable and would have occurred even without the particular political leader who guided them.

For example,the South American colonies would probably have won their independence from Spain even if Simon Bolivar had never lived. But this cannot be said of the Arab conquests. Nothing similar had occurred before Muhammad, and there is no reason to believe that the conquests would have been achieved without him. The only comparable conquests in human history are those of the

Mongols in the thirteenth century, which were primarily due to the influence of Genghis Khan.

These conquests, however, though more extensive than those of the Arabs, did not prove permanent, and today the only areas occupied by the Mongols are those that they held prior to the time of Genghis Khan. It is far different with the conquests of the Arabs. From Iraq to Morocco, there extends a whole chain of Moslem nations united not merely by their faith in Islam, but also by their Arabic language, history, and culture.

The centrality of the Quran in the Moslem religion and the fact that it is written in Arabic have probably prevented the Arab language from breaking up into mutually unintelligible dialects, which might otherwise have occurred in the intervening thirteen centuries.

Differences and divisions between these Arab states exist, of course, and they are considerable, but the partial disunity should not blind us to the important elements of unity that have continued to exist. For instance, neither Iran nor Indonesia, both oil-producing states and both Islamic in religion joined in the oil embargo of the winter of 1973-74.

It is no coincidence that all of the Arab states, and only the Arab states, participated in the embargo. We see, then, that the Arab conquests of the seventh century have continued to play an important role in human history, down to the present day. It is this unparalleled combination of secular and religious influence which I feel entitles Muhammad to be considered the most influential single figure in human history.

The following is from Michael Hart's book and lists Prophet Muhammad as the most influential man in History. A Citadel Press Book, published by Carol Publishing Group Ranking, list of 100 most influential persons in history:

Prophet Muhammad, Isaac Newton, Jesus Christ, Buddha, Confucius, St. Paul, Ts'ai Lun, Johann Gutenberg, Christopher Columbus, Albert Einstein, Karl Marx, Louis Pasteur, Galileo Galilei, Aristotle, Lenin, Moses, Charles Darwin, Shih Huang Ti, Augustus, Caesar, Mao, Tse-tung, Gengis Khan, Euclid, Martin Luther, Nicolaus Copernicus, James Watt, Constantine the Great, George Washington, Michael Faraday, James Clerk Maxwell, Orville Wright and Wilbur Wright, Antoine Laurent Lavoisier, Sigmund Freud, Alexander the Great, Napoleon Bonaparte, Adolf Hitler, William Shakespear, Adam Smith, Thomas Edison, Anthony van Leeuwenhoek, Plato, Guglielmo Marconi, Ludwig van Beethoven, Werner Heisenberb, Alexander Graham Bell, Alexander Fleming, Simon Bolivar, Oliver Cromwell, John Locke, Michelangelo, Pope Urban II, Umar ibn al-Khattab, Asoka, St. Augustine, Max Planck, John Calvin, William T.G. Morton, William Harvey, Antoine Henri Becquerel, Gregor Mendel, Joseph Lister, Nikolaus August Otto, Louis Daguerre, Joseph Stalin, Rene Descartes, Julius Caesar, Francisco Pizarro, Hernando Cortes, Queen Isabella I, William the Conqueror, Thomas Jefferson, Jean-Jacques Rousseau, Edward Jenner, Wilhelm Conrad Rontgen, Hohann Sebastian Bach, Lao Tzu, Enrico Fermi, Thomas Malthus, Francis Bacon Voltaire, John F. Kennedy, Gregory Pincus, Sui Wen Ti Mani, Vasco da Gama, Charlemagne Cyprus the Great, Leonhard Euler, Niccolo Machiavelli, Zoroaster Menes, Peter the

Great, Mencius, John Dalton, Homer, Queen Elizabeth, Justinian I, Johannes Kepler, Pablo, Picasso, Mahavira, Niels Bohr, Honorable Mentions and Interesting Misses: St. Thomas Aquinas, Archimedes, Charles Babbage, Cheops, Marie Curie, Benjamin Franklin, Gandhi, Abraham Lincoln, Ferdinand Magellan, Leonardo daVinci.

—-------------------------------------------------------------------------------------

# Views of non-Muslim scholars on Muhammad (PBUH)

The non-Muslim verdict on Muhammad (PBUH) If a man like Muhamed were to assume the dictatorship of the modern world, he would succeed in solving its problems that would bring it the much needed peace and happiness.

George Bernard Shaw

People like Pasteur and Salk are leaders in the first sense. People like Gandhi and Confucius, on one hand, and Alexander, Caesar and Hitler on the other, are leaders in the second and perhaps the third sense. Jesus and Buddha belong in the third category alone. Perhaps the greatest leader of all times was Mohammed, who combined all three functions. To a lesser degree, Moses did the same.

Professor Jules Masserman

Head of the State as well as the Church, he was Caesar and Pope in one; but, he was Pope without the Pope's pretensions, and

Caesar without the legions of Caesar,without a standing army, without a bodyguard, without a police force, without a fixed revenue.

If ever a man had the right to say that he ruled by a right divine, it was Muhummed, for he had all the powers without their supports. He cared not for the dressings of power. The simplicity of his private life was in keeping with his public life.

Rev. R.Bosworth-Smith

Muhammad was the soul of kindness, and his influence was felt and never forgotten by those around him.

Diwan Chand Sharma, The Prophets of the East, Calcutta 1935, p. l 22.

Four years after the death of Justinian, A.D. 569, was born at Mecca, in Arabia the man who, of all men exercised the greatest influence upon the human race Mohammed.

John William Draper, M.D., L.L.D., A History of the Intellectual Development of Europe,London 1875, Vol. 1, pp. 329-330

In little more than a year he was actually the spiritual, nominal and temporal rule of Medina,with his hands on the lever that was to shake the world.

John Austin,"Muhammad the Prophet of Allah," in T.P. 's and Cassel's Weekly for 24th September 1927.

Philosopher,Orator, Apostle, Legislator, Warrior, Conqueror of ideas Restorer of rational beliefs, of a cult without images; the

founder of twenty terrestrial empires and of one spiritual empire, that is Muhammed. As regards all standards by which human greatness may be measured, we may well ask, is there any man greater than he?

Lamartine,Historie de la Turquie, Paris 1854, Vol. 11 pp. 276-2727

It is impossible for anyone who studies the life and character of the great prophet of Arabia, who knows how he taught and how he lived, to feel anything but reverence for that mighty Prophet, one of the great messengers of the Supreme.And although in what I put to you I shall say many things which may be familiar to many, yet I myself feel whenever I re-read them, a new way of admiration, anew of reverence for that mighty Arabian teacher.

Annie Besant,The Life and Teachings of Muhammad, Madras 1932, p. 4

Muhummed is the most successful of all Prophets and religious personalities.

Encyclopedia Britannica

I have studied him - the wonderful man - and in my opinion far from being an anti-Christ he must be called the saviour of humanity.

George Bernard Shaw in "The Genuine Islam"

By a fortune absolutely unique in history, Mohammed is a threefold founder of a nation, of an empire, and of a religion.

Rev. R.Bosworth-Smith in "Mohammed and Mohammedanism 1946." Source: Michael Hart [External/non-QP]

## අනාගතවක්තෘවරයෙකු ගැන වූ සංසන්දනාත්මක අධ්‍යයනයක්.

1. බෞද්ධ ග්‍රන්ථ වල සඳහන් මෛත්‍රේය නම් වූ සාශ්තෘන්.
2. හින්දු ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු
3. යුදෙව් ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු
4. ක්‍රිස්තියානි ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු (New Testament)

## බෞද්ධ ග්‍රන්ථ වල සඳහන් මෛත්‍රේය නම් වූ සාශ්තෘන්.

ගෞතම බුදුන් වහන්සේ මෛත්‍රී නම් බුදු කෙනෙකුගේ පැමිණීම ගැන අනාවැකි පළ කළහ. ඒවා පහත ආකාරයට බෞද්ධ ග්‍රන්ථ වල සඳහන්ව ඇත.

ආනන්ද තෙරුන් භාග්‍යවතුන් වහන්සේ වෙතින් මෙසේ විමසීහ: 'ඔබ වහන්සේ නැති කල්හි අපට උගන්වන්නේ කවරෙක් දැ?

එවිට බුදුන්වහන්සේ මෙසේ වදාළ සේක. මා නැති කල්හී මාගේ ධර්මය ඔබට සාස්තෘන් වන සේක. එසේම "නායකත්වය සහ පිළිවෙළ රඳා පවත්වගෙන යන පලමු හා එකම බුදුවරයා මම නොවේ යැයි කියනු ලැබේ. මට පෙර බොහෝ බුදුවරුන් පැමින ඇත. මට පසුද එවැනි ගුණ ඇති මෛත්‍රිය නම තවත් බුදුවරයෙකු පැමිනෙනු ඇත"

එවිට ආනන්ද තෙරුන් මෙසේ විමසීය. එතුමන්ව හඳුනා ගන්නේ කෙසේද? එවිට බුදුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මෛත්‍රේය නම් වූ (කාරුණික වූ) ශාස්තෘ වූ, උත්තරීතර වූ, සිල්වත් වූ, හැසිරීම් ප්‍රඥායෙන් සමන්විත වූ, භාග්‍යවත් වූ, විශ්වය දන්නා වූ බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වන්නේ ය. ඔහු තමාගේ සුවිසේශී ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කළ දෙය මේ විශ්වයට ප්‍රකාශ කරන්නේය. ඔහු තම ආගම දේශනා කරන්නේය. එය මහිමාන්විත වන්නෙය, එය තේජාන්විත වන්නෙය, ආත්මයෙන් හා අකුරෙන්, ආගමක් ප්‍රකාශ කරයි. ජීවිතය, සම්පූර්ණයෙන්ම පරිපූර්ණ සහ සම්පූර්ණයෙන්ම පිරිසිදු, මම දැන් මගේ ආගම දේශනා කරන මෙන්, දැන් මම සිය ගණනක් වූ භික්ෂු සමාජයක් පවත්වාගෙන යනු මෙන්, ඔහු දහස් ගණනක භික්ෂු සමාජයක් පවත්වා ගෙන යනු ඇත".

පහතින් සඳහන් වන කරුණු බෞද්ධ අදහස් සමග සමහර විට නොගැලපෙන්නත් පුලුවන්. එහෙත්, යම් හෙයකින් විමර්ශනය කරන්නෙකුට යම් ප්‍රයෝජනයක් ද තිබිය හැක. නොගැලපෙනවා නම් එය නොසලකා හරින්න.

1. 'මෛත්‍රේය' යන සංස්කෘත වචනය

'මෛත්‍රේය' යන සංස්කෘත වචනය හෝ ඊට සමාන පාලි භාෂාවෙන් 'මෙත්තෙයා' යන්නෙහි තේරුම ආදරණීය, දයානුකම්පිත, දයාවන්ත සහ කරුණාවන්ත යන්නයි. එය කරුණාව සහ මිත්‍රත්වය, අනුකම්පාව යනාදිය ද අදහස් කරයි. මේ සියලු වචනවලට සමාන එක් අරාබි වචනයක් වන්නේ 'රහමත්' යන්නයි. අල් කුර්ආන් හී කිහිප තැනක අවසන් දේවදූතවරයා (නබිවරයා) සම්බන්ධයෙන් පහත ආකාරයේ වදන් දැකිය හැක.

*"අපි ඔබව එව්වේ, සියලු සත්වයන්ට කරුණාවක් ලෙසයි." [අල්-කුර්ආනය 21:107]*

මුහම්මද් (ﷺ) තුමාණන් දයානුකම්පිත ලෙස හැඳින්වූයේ 'මෛත්‍රී' යනුවෙනි.

මුහම්මද් යන වචනය 'මහමෙට්' හෝ 'මහොමෙට්' ලෙසද විවිධ භාෂාවලින් වෙනත් විවිධ ආකාරවලින්ද ලියා ඇත. පාලි සහ සංස්කෘත භාෂාවෙන් 'මහෝ' හෝ 'මහා' යන වචනයේ තේරුම ශ්‍රේෂ්ඨ සහ කීර්තිමත් වන අතර 'මෙත්තා' යන්නෙන් අදහස් කෙරේ. එබැවින් 'මහොමෙට්' යනු 'මහා දයාව' යන්නයි.

මනා ලෙස අධ්‍යනයක යෙදුනු පසු මෙම ලිපිය ලියන මටද, තව බොහෝ මුස්ලිම් වරුන්ටද වරෙක සිතෙනවා ගෞතම බුදුන්වහන්සේ එසේ වදාලේ මොහම්මද් නබි ﷺ තුමා ගැනවත් දෝ කියලා. එය මුස්ලිම් අපට ඇතිවන සාධාරණ සිතුවිල්ලකි.

2. බුදුරදුන්ගේ ධර්මය සැඟවීම හෝ එලිපිට කීම:

*"ආනන්‍දය, සත්‍යයන් සම්බන්ධයෙන් යමක් පස්සට තබන, ගුරුවරයෙකුගේ වැසූ හස්තය වැනි දෙයක් තථාගතයන් වහන්සේට නැත".*

සර්වබලධාරී දෙවියන්ගේ ආඥාව පරිදි අවසන් දේවදූතවරයානන් ද ගුප්ත දෙය හා එලිපිට දෙය අතර කිසිදු වෙනසක් නොකර පණිවිඩය සහ මූලධර්මය සියල්ල ලබා දුන්නේය. අල් කුර්ආනය නබි ﷺ තුමාගේ කාලයේ ප්‍රසිද්ධියේ පාරායනය කරන ලද අතර එය අද දක්වාම සිදු කෙරේ. නබිතුමා මුස්ලිම්වරුන්ට ධර්මය සැඟවීම දැඩි ලෙස තහනම් කර ඇත.

3. බුදුරදුන්ගේ සැදැහැවත් සේවකයෝ:

*"ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනුගාමිකයන් අමතා, 'යමෙක් අතීතයේ පටන් අරහත්-බුද්ධ වූවාහුද, ඒ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ආනන්ද තෙරුන් වහන්සේ මා කෙරෙහි සැදැහැවත් වූ සේම, යම්සේ සහෝදරයෝද ඒ දාසයෝ වූහ. අනාගතයේ අරහත්-බුදුවරු වෙති, ආනන්ද මට කළාක් මෙන් ඒ භාග්‍යවතුන් වහන්සේට සැදැහැවත් සේවකයෝද වෙති".*

බුදුන්වහන්සේගේ අග්‍ර උපස්ථායක ආනන්ද තෙරුන් ය. මුහම්මද් (ﷺ) තුමාට මලික්ගේ පුත්‍රයා වූ අනස් (රලි) නම් සේවකයෙක් ද සිටියේය. අනස් (රලි) නබිතුමාට ඔහුගේ දෙමාපියන් විසින් ඉදිරිපත් කරන ලදී. අනස් (රලි) විස්තර කරයි: "මගේ මව නබි (සල්) තුමානන්ට මෙසේ පැවසුවා, 'අනේ දෙවියන්ගේ දූතයාණෙනි, මෙන්න ඔබේ කුඩා සේවකයා'.

තව දුරටත් අනස් විස්තර කරයි, "මම ඔහුට වයස අවුරුදු 8 සිට ඔහුට සේවය කළ අතර නබි ﷺ තුමා මට ඔහුගේ පුතා සහ ඔහුගේ කුඩා ආදරණීයයා ලෙස

හැඳින්වීය". නබිතුමාණන්ගේ ජීවිතයේ අවසානය දක්වා සාමය ඇතිවිට හා යුද්ධයේදී, අනස් (රලි) ආරක්ෂිතව මෙන්ම අනතුරට ලක්වද සිටියේය.

අනස් (රලි) තුමාට වයස අවුරුදු 11ක් වන විට, නබිතුමාණන්ගේ ජීවිතය දැඩි අනතුරකට ලක්ව තිබූ උහුද් සටනේදී නබිතුමා අසල නැවතී සිටියේය.

හොනයින් සටනේදී පවා දුනුවායන් වූ නබි තුමාගේ සතුරන් විසින් වට කර ගත් විට, වයස අවුරුදු 16 ක් වූ අනස් (රලි), නබිතුමාගේ පැත්තේ සිටියේය.

ගෞතම බුදුන් වහන්සේ ළඟට මත් වූද සිහි විකල් වූද හස්තියා ළඟට එන විට ඔහු අසල සිටි ආනන්ද සමඟ අනස් (රලි) සැසඳිය හැකිය.

4. බුදුන් හඳුනාගැනීමේ නිර්ණායක හයක්:

"භාග්‍යවතුන් වහන්සේ වදාළා, 'තථාගතයන් වහන්සේගේ රුව නිරවුල් සහ අතිශයින් පැහැපත් වන අවස්ථා දෙකක් තිබෙනවා. ආනන්ද, රාත්‍රියේදී තථාගතයන් වහන්සේ උත්තරීතර වූ පරිපූර්ණ ඥානය ලබනවා. අවසානයේ දී උන්වහන්සේ පිරිනිවෙන රාත්‍රියේදී ඔහුගේ භූමික පැවැත්මේ කිසිවක් ඉතිරි නොවන සේ අතිශයින් ගමන් කිරීමකි".

ගෞතම බුදුන් වහන්සේට අනුව (මෛයිත්‍රී) බුදුන් වහන්සේ හඳුනාගැනීමේ නිර්ණායක හයක් පහත දැක්වේ.

1. බුදුරජාණන් වහන්සේ රාත්‍රියේදී උත්තරීතර හා පරිපූර්ණ තීක්ෂ්ණ බුද්ධිය ලබා ගනී.
2. ඔහුගේ සම්පූර්ණ බුද්ධත්වයේ අවස්ථාවෙහිදී ඔහු අතිශයින් දීප්තිමත් ලෙස පෙනේ
3. බුදුන් වහන්සේ ස්වභාවික මරණයක් සිදු කරයි.
4. ඔහු රාත්‍රී කාලයේ මිය යයි.
5. ඔහුගේ මරණයට පෙර ඔහු ඉතා දීප්තිමත් ලෙස පෙනේ.
6. උන්වහන්සේගේ ඇවෑමෙන් පසු බුදුන් වහන්සේ නමක් මිහිපිට නිරුද්ධ වේ.

1) මුහම්මද් (ﷺ) තුමාණෝ උත්තරීතර තීක්‍ෂණ බුද්ධිය සහ නබිත්වය ලබා ගත්තේ රාත්‍රියේදීය. සූරා දුඛාන් පවසන පරිදි:

"දෙයක් පැහැදිලි කරන ග්‍රන්ථ මගින් - අපි එය ආශීර්වාද ලත් රාත්‍රියක පහළ කළෙමු." [අල්-කුර්ආන් 44:2-3]:

"අපි මෙය (පණිවිඩය) ඇත්ත වශයෙන්ම භාග්‍යයයෙන් පිරි ලෛලතුල් කදර් නම් රාත්‍රියේ පහල කළෙමු." [අල්-කුර්ආනය 97:1]

2) මුහම්මද් (ﷺ) තුමාට තම අවබෝධය ආකාශ ආලෝකයෙන් ආලෝකමත් වූ බව ක්ෂණිකව දැනුනි.

3) මුහම්මද් (ﷺ) තුමා ස්වභාවික මරණයකින් මිය ගියේය.

4) අයේෂා (රලි) ට අනුව, මුහම්මද් (සල්) තුමාණෝ රාත්‍රියේ මිය ගියේය. ඔහු මිය යන විට පහනෙහි තෙල් නොතිබූ අතර ඔහුගේ බිරිඳ අයේෂා (රලි) පහන සඳහා තෙල් ණයට ගැනීමට සිදු විය.

5) අනස් (රලි) ට අනුව, මුහම්මද් (සල්) තුමාණෝ ඔහුගේ මරණය සිදු වූ රාත්‍රියේ අතිශයින් දීප්තිමත් ලෙස පෙනුණි.

6) මුහම්මද් නබි (ﷺ) තුමාණන්ගේ දේහය භූමදානය කිරීමෙන් පසු ඔහුව නැවත කිසි දිනෙක මේ මිහිතලය මත ඔහුගේ සිරුරෙන් දැකගත නොහැකි විය. (කිසිම රූපයක් හෝ පිළිමයක්ද නැත).

5. බුදුවරු දේශකයෝ පමණි.

අල් කුරානය සූරා ගාෂියා හි මෙසේ පවසයි.

"එබැවින්, නබිතුමනි, සියලු දෙනාටම මතක් කිරීම දිගටම කරගෙන යන්න, මක්නිසාද ඔබගේ යුතුකම වන්නේ මතක් කිරීම පමණි. ඔවුන්ව විශ්වාස කිරීමට බල කිරීමට ඔබ නැත. [88:21-22]

6. බුදුන් වහන්සේ විසින් මෛත්‍රී බුදුන් හඳුනා ගැනීම ගැන තොරතුරු

1) ලෝකයේම වඩාත් සාර්ථක කෙනෙකු ලෙස සිටී.

2) සදාචාර දේශකයෙකු ලෙස සිටී.

**පහත සඳහන් සමානතාවයන් දෙස සලකා බලන්න**

ගෞතම බුදුන්වහන්සේ ස්වර්ගය සහ අපාය ගැන දේශනා කර ඇත. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද ස්වර්ගය සහ අපාය ගැන දේශනා කර ඇත.**

ගෞතම බුදුන්වහන්සේ විශ්වය ගැන දේශනා කලහ. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද විශ්වය ගැන දේශනා කලහ.**

ගෞතම බුදුන්වහන්සේ විසින් විද්‍යාත්මක තොරතුරු බොහෝමයක් ගැන දේශනා කලහ. අකුරු ලියන්නට කියවන්නට බැරි කාන්තාරයේ ජීවත්වූ **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද විද්‍යාත්මක තොරතුරු බොහෝමයක් ගැන දේශනා කලහ.**

ගෞතම බුදුන්වහන්සේ විසින්, මනුෂ්‍යයන්, අමනුෂ්‍යයන් සහ සත්වයන් මරණින් මතු නැවත ඉපදෙන බව දේශනා කළේය. **අවසන් දේවදූත මොහම්මද් (ﷺ) තුමාද ඔවුන්ගේ නැවත ඉපදීමක් ගැන දේශනා කලහ.**

ගෞතම බුදුන්වහන්සේ විසින්, මනුෂ්‍යයන් වෙනත් ලොවක සිට මෙහි පැමිණි බව දේශනා කළේය. **අවසන් දේවදූත මොහම්මද් (ﷺ) තුමාද මනුෂ්‍යයන් වෙනත් ලොවක සිට මෙහි පැමිණි බව දේශනා කළේය.**

ගෞතම බුදුන්වහන්සේ විසින් නිර්වාණයක් හෙවත් සදාකල් සැනසීම ලැබීමක් ගැන දේශනා කලහ. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද සදාකල් සැනසීම ලැබීමක් ගැන දේශනා කලහ.**

ගෞතම බුදුන්වහන්සේ ප්‍රාතිහාර්යයන් පෑ බව සඳහන්, **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද ප්‍රාතිහාර්යයන් පෑ බව සඳහන්.**

ගෞතම බුදුන්වහන්සේ සක්‍ර නම් දෙව් රජාණන් කෙනෙකු ගැන දේශනා කලහ. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද (Allah නම්) දෙව් රජාණන් ගැන දේශනා කලහ.**

ගෞතම බුදුන්වහන්සේ සක්‍ර නම් දෙව් රජාණන් සමීපයට වැඩම කල බව සඳහන්, **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද Allah දෙව් රජාණන් සමීපයට (ජිබ්රීල් නම් දේවදූතයෙකු විසින්) රැගෙන ගිය බව කල සඳහන්.**

ගෞතම බුදුන්වහන්සේ විසින්, නිර්මාතෘ (සක්‍ර දෙව්) නොවන වෙනත් දෙවිවරුන් විශාල ගනනක් සිටින බව දේශනා කළේය. **අවසන් දේවදූත මොහම්මද් (ﷺ) තුමාද නිර්මාතෘ (Allah දෙව්) නොවන වෙනත් සුරදූතවරු විශාල ගනනක් සිටින බව දේශනා කළේය.** බුදුන්වහන්සේ ඔවුන්ගෙන් සමහරෙක්ව දුටු බව සඳහන්. **නබිතුමාද ඔවුන්ගෙන් සමහරෙක්ව දුටු බව සඳහන්.**

ගෞතම බුදුන්වහන්සේ දේශනා කර ඇති ආකාරයට මනුෂ්‍යයින්ගේ ආත්ම මෙලොවට පැමිණ ඇත්තේ විශ්වයේ ඈත වෙනත් දිශාවකිනි.(ආබස්සර බඹ ලොව ලෙස එය හැඳින්වේ) සඳහන්. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද දේශනා කළේ මනුෂ්‍යයන්ගේ ආත්ම මෙලොවට පැමිණියේ පිටතින් බවය.**

ගෞතම බුදුන්වහන්සේ වයස 36 දී සුවිශේෂී පුද්ගලයෙකු (බුදුවරයෙකු) බවට පත් වූ බව සඳහන්. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද වයස 40 දී සුවිශේෂී පුද්ගලයෙකු (නබිවරයෙකු) බවට පත් වූ බව සඳහන්.**

ගෞතම බුදුන්වහන්සේ තම ධර්මය රැගෙන ආවේ බහුදේව වාදී සහ අදේවවාදී ගෝත්‍ර විශාල සංඛ්‍යාවක් සිටි නොදියුණු සමාජයකටය. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද ධර්මය මුලින්ම රැගෙන ආවේ බහුදේව වාදී සහ අදේවවාදී ගෝත්‍ර විශාල සංඛ්‍යාවක් සිටි නොදියුණු සමාජයකටය.**

ගෞතම බුදුන්වහන්සේ තම ධර්මය නගරෙන් නගරෙට ගොස් දේශනා කලහ. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද තම ධර්මය නගරෙන් නගරෙට ගොස් දේශනා කලහ.**

ගෞතම බුදුන්වහන්සේ මාධ්‍යයම ප්‍රතිපදාව දේශනා දේශනා කලහ. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද දේශනා කලේ එලෙසමය.**

ගෞතම බුදුන්වහන්සේ ධර්මය දේශනා කලහ, කරුණු පහදා දුනි. ධර්මයෙහි බල කිරීමක් නැත. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද දේශනා කලේ එලෙසමය. සත්‍යය අසත්‍යය පෙන්වා දුනි. ඉස්ලාම් දහමෙහි බල කිරීමක් නැත.**

ගෞතම බුදුන්වහන්සේට හොඳ විශ්වාසවන්ත අනුගාමිකයන් පිරිසක් මෙන්ම එතුමන්ට අපහාස කල, එතුමන්ව මැරීමට පවා තැත් කල ජනතාවක්ද සිටියේය. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද හොඳ විශ්වාසවන්ත අනුගාමිකයන් පිරිසක් මෙන්ම එතුමන්ට අපහාස කල, එතුමන්ව මැරීමට පවා තැත් කල ජනතාවක්ද සිටියේය.**

ගෞතම බුදුන්වහන්සේ විසින්, තමා එකම බුදුවරයා නොවන බවත් තමාට පෙර තවත් බොහෝ බුදුවරු පැමිණි බවත් තමාට පසු මෛත්‍රී නමින් තවත් බුදුවරයෙකු පැමිණෙන බවත් දේශනා කල බව සඳහන්. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද තමා එකම නබිවරයා නොවන බවත් තමාට පෙර නබිවරු බොහෝමයක් පැමිණි බවත් තමා මුලු මහත් ලෝකයටම මෛත්‍රී කරන්නෙකු ලෙස පැමිණි අවසන් නබිවරයා බවත් දේශනා කල බව සඳහන්.**

ගෞතම බුදුන්වහන්සේ පිරිනිවන් පෑමට ආසන්නයේදී තම අනුගාමිකයින් ට පැවසුවේ දහම සම්බන්දව තව කුමක් හෝ දැනගැනීමට අවශ්‍යය නම් නොපමාව එය අසන ලෙසයි. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමා තම මරණයට පෙර පැවසුවේ මනුෂ්‍යයාගේ දහම තමා සම්පූර්ණ කල බවය.**

ගෞතම බුදුන්වහන්සේගේ ධර්මදේශනාවන් කටපාඩම් කල පිරිසක් සිටි අතර එතුමන්ගේ පිරිනිවන් පෑමෙන් වසර 300-400 කට පමන පසු ඒවා ග්‍රන්ථාරූඪ කෙරිණ. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාගේ ධර්මදේශනාවන් කටපාඩම් කල පිරිසක් සිටි අතර එතුමන්ගේ ජීවිතකාලය තුලදීම ඒවා ග්‍රන්ථාරූඪ කෙරිණ.**

බුදුන්වහන්සේ (සිදුහත් කුමරා ලෙස) සාමාන්‍ය දරුවෙකු ලෙස ඉපදී හැදී වැඩී විවාහ වී දරුවන් ලැබ සාමාන්‍ය මනුෂ්‍යයෙකු ලෙස සිටීහ. පසුව බුද්ධත්වය

ලැබීය. ඉන්පසු තම ජීවිතයම දහම වෙනුවෙන් කැප කළේය. ඒ අතර සතුරන්, මිතුරන්, අනුගාමිකයින් සිටීහ. අටලෝ දහමට මුහුන දුනි. අවසානයේ සාමාන්‍යා මනුශ්‍යයෙකු ලෙසින්ම (අසනීප වී) මරණයට මුහුණ දුනි. **අවසන් දේව දූත නබි මොහම්මද් (ﷺ) තුමන්ගේ ජීවිතයද එලෙසම ගෙවීය. එතුමන් නබිවරයෙකු ලෙස සිට තම දහම ප්‍රචාරය කළේය. අවසානයේ සාමාන්‍යා මනුෂ්‍යයෙකු ලෙසින්ම (අසනීප වී) මරණයට මුහුණ දුනි.**

ගෞතම බුදුන්වහන්සේ විසින් තම දහමෙහි කිසිඳු සැකයක් නොමැති බව දේශනා කළේය. එය නුවණින් විමසා පරීක්ෂා කර බලන ලෙසද පැවසීහ. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද තම දහමෙහි කිසිඳු සැකයක් නොමැති බව දේශනා කළේය. එය නුවණින් විමසා පරීක්ෂා කර බලන ලෙසද පැවසීහ.**

ගෞතම බුදුන්වහන්සේ දේශනා කල ධර්මය එතුමන්ගේ ඇවෑමෙන් වසර 300-400කට පසු ග්‍රන්ථාරූඪ කෙළේය. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමා පාරායනා කල "දේව වදන්' (අල් කුරාණය) එතුමන්ගේ ජීවිත කාලය තුලම ලේඛණ ගත කළේය.**

ගෞතම බුදුන්වහන්සේ පිරිනිවන් පාන විට හෞතික වශයෙන් ඔහු වෙනුවෙන් මෙලොව කිසිදෙයක් ඉතුරු කර ගියේ නැත. **අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමාද තම මරණයට පෙර හෞතික වශයෙන් ඔහු වෙනුවෙන් මෙලොව කිසිදෙයක් ඉතුරු කර ගියේ නැත.**

බුදුන්වහන්සේ විසින්, තමන්ට වන්දනා කරන ලෙසත් තමාට ප්‍රතිමා නිර්මාණය කර ඒවාට වන්දනා කරන ලෙසත් තම අනුගාමිකයින්ට කිසිවිටකත් පැවසුවේ නැත. **අවසන් දේව දූත නබි මොහම්මද් (ﷺ) තුමන්ද හැසිරුනේ එලෙසමය.**

ගෞතම බුදුන්වහන්සේ දේශනා කළේ මනුෂ්‍යායන්ට වඩාත්ම උසස් වන්නේ මෙලොව ජීවිතයට වඩා පරලොව තත්වය බවය. එනිසා ඉතා යුහුසුලුව පරලොව වෙනුවෙන් කටයුතු කරන ලෙසය. **අවසන් දේව දූත නබි මොහම්මද් (ﷺ) තුමන්ද දේශනා කළේ එලෙසමය.**

බෞද්ධ විශ්වාසයට අනුව බුදුන් වහන්සේ නිර්වාණ සම්පත්තිය හිමිකර ගත් බව පවසයි. **ඉස්ලාමයට අනුව (දේව වදන් වලටම අනුව) මොහම්මද් (ﷺ) නබි තුමාද අනිවාර්යයෙන්ම දෙවියන් කැමති තාක් කල් ස්වර්ගයෙහි ඉතාම උසස් වන්තයෙකු ලෙස (කිසිඳු ආකාරයක දුක් පීඩාවක් නොමැතිව) ඉතාම සුවසේ සිටින බව තහවුරුය.**

**ඉහත කරුණු දෙස සලකා බැලීමේදී නබිවරයෙකුගේ ලක්ෂන බුදුන්වහන්සේ තුලින්ද පෙන්නුම් කර ඇත. ඒ අනුව බුදුන් වහන්සේද නබිවරයෙකු විය හැකි යැයි අනුමාන කල හැකි නමුත්, සෑම නබිවරයෙකුගේම ප්‍රධානතම ධර්ම පණිවිඩය වන විශ්වයේ මැවුම්කරු වන එකම දෙවි (අල්ලාහ්)ව විශ්වාස කලයුතුය යන පණිවිඩය දැනට භාවිත වන බෞද්ධ ග්‍රන්ථ හෝ බෞද්ධ දේශනා වලින් දැකිය නොහැක. ඒවා ට අනුව බුදුන් වහන්සේ නබිකෙනෙකු ලෙස ඉස්ලාම් භක්තිකයන්ට පිළිගත නොහැක.**

උදාහරණයකින් පවසනවා නම්, මුස්ලිම් අය ජේසු තුමා නබිවරයෙක් ලෙස පිලිගනී. නමුත් ක්‍රිස්තියානි අය (ඔවුන් දැනට භාවිතා කරන බයිබලයට අනුව යමින්) ඔහු නබිවරයෙක් ලෙස පිළිගන්නේ නැහැ. ඔවුන් පිළිගන්නේ ජේසු තුමා දෙවියන් ලෙසටය. එනිසා ඔවුන් ජේසු තුමාට වන්දනාමාන කරයි.

**බුදු දහමෙහි සාරාංශය ලෙස හුවා දක්වන සබ්බපාපස්ස අකරණං ගාථාවේ සහ ඉස්ලාමයේ සාරාංශය ලෙස හුවා දක්වන අ ල් අසර් ගාථාවේ එකම වෙනස නම් බෞද්ධ ගාථාව තුල "නිර්මාතෘව සහ ඔහුගේ ධර්මය විශ්වාස කර" කියන වාක්‍යය නැතිකමය.**

- ධම්ම පදය – බුද්ධ වග්ගය, පස්වන ගාථාව

*"සබ්බ පාපස්ස අකරණං -කුසලස්ස උපසම්පදා. සචිත්ත පරියෝ දපනං -ඒතං බුද්ධාන ශාසනං"*

මෙම ගාථාවෙන් කියවෙන පරිදි සියලු බුදුවරුන් ගේ අනුශාසනය වන්නේ සියලු පව් නොකිරීමද, කුසල් දියුණු කර ගැනීමද, සිය සිත පිරිසිදු කිරීමද වේ.

❖ 103 සූරාව- අල් අසර් (කාලය). Al-'Aṣr. العصر

*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

*වල් අසර්, ඉන්නල් ඉන් සානලෆී කුhusර්. ඉල් ලල්ලදීන ආමනූව අමිලුස් සාලිහාති වතවා සව් බිල් හක්කි වතවාසව් බිස්සබර්*

අසීමිත දයාව හා අසමසම අනුකම්පාවෙන් යුතු අල්ලාහ් ගේ නාමයෙනි.

1. කාලය මත සත්තකින්ම 2. මිනිසා තම ආයුෂ කාලය නිකරුනේ වියදම් කර නියත වශයෙන්ම පරාජික මාර්ගයේ සිටින්නේය. 3. එහෙත් කවුරුන්, විශ්වාසය තබා දැහැමි කාරනාවන්ද කර සත්‍යය කෙනෙකුට කෙනෙකු ඔවදන් දී (පාපයන් අතැහැර දැමීමෙහිද පින් ඇති දැය කිරීමෙහිද, ඇති වන අමාරුකම විද දරා ගන්නා ලෙසටද, කෙනෙකුට කෙනෙක් ඔවදන් දෙමින් සිටින්නෝද) ඔවුන් හැර. (මොවුන් පරාජීත වූවේ නැත).

මෙහි විශ්වාසය තබා යන්න ගැන වැඩිවශයෙන් දැන ගැනීමට “මිනිසා විශ්වාස කල යුතු කරුණු හයක්“ යන ලිපිය කියවා බලන්න.

මනුෂ්‍යයාට නිර්මාතෘ කෙනෙකු සිටී නම්, නිර්මාතෘ විසින් ධර්මයක් (ජීවන සැලසුමක්) එවා තිබේ නම් බෞද්ධයන්ට තම නිර්මාතෘව සහ ඔහු තමන්ට ලබා දුන් ජීවන සැලැස්ම (The manual of the human) විශ්වාස කර අනුගමනය කිරීමට ඇති හාදාව කුමක්ද?

---

## 2) හින්දු ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු

- Atharvaveda - Book 20, Hymm 21 Verse 6 (= Al Quran Ch 33 V 22)
- Atharvaveda - Book 20, Hymm 21 Verse 7

- Atharvaveda - Book 20, Hymm 126 Verse 14 (Ahamed)
- Atharvaveda - Book 8, Hymm 5 Verse 14
- Rigveda - Book 1, Hymm 53 Verse 9
- Rigveda - Book 8, Hymm 6 Verse 10 (Ahamed)
- Samaveda - Uttarachika, Mantra 1500 (Ahamed)
- Samaweda -Indra Chapter 2, Mantra 152 (Ahamed)
- Yajurveda - Chapter 31, Verse 18 (Ahamed)

**Prophet Mohammed (pbuh) Mentioned as Narashansha (Praiseworthy man)**

- Rigveda - Book 1, Hymm 13 Verse 3
- Rigveda - Book 1, Hymm 18 Verse 9
- Rigveda - Book 1, Hymm 106 Verse 4
- Rigveda - Book 1, Hymm 142 Verse 3
- Rigveda - Book 2, Hymm 3 Verse 2
- Rigveda - Book 5, Hymm 5 Verse 2
- Rigveda - Book 7, Hymm 2 Verse 2
- Rigveda - Book 10, Hymm 64 Verse 3
- Rigveda - Book 10, Hymm 182 Verse 2
- Yajurveda - Chapter 1, Verse 21
- Yajurveda - Chapter 21, Verse 31
- Yajurveda - Chapter 21, Verse 55
- Yajurveda - Chapter 20, Verse 37
- Yajurveda - Chapter 20, Verse 57
- Yajurveda - Chapter 28, Verse 2
- Yajurveda - Chapter 28, Verse 19
- Yajurveda - Chapter 28, Verse 42
- Bhavishyapuran - Parv 3 khand 3 adhyay 3 Shloka 5-8

# 3) යුදෙව් ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු

Book of Deuteronomy Ch 18 V 18

18:18 is pointing us all ultimately to Jesus, to the coming of a perfect prophet who would speak the words of God perfectly. 18:18 අප සියල්ලන්ම අවසානයේ යේසුස් වෙත යොමු කරයි, දෙවියන් වහන්සේගේ වචන පරිපූර්ණ ලෙස කථා කරන පරිපූර්ණ අනාගතවක්තෘවරයෙකුගේ පැමිණීම. (මෙහි යේසුස් ලෙස සඳහන් කලත් එය මුහම්මද් ලෙස නිවැරදි විය යුතුය්)

The prophet like Moses will proclaim the total divine will emanating from the mouth of God,......මෝසෙස් වැනි අනාගතවක්තෘවරයා දෙවියන් වහන්සේගේ මුඛයෙන් පිටවන සම්පූර්ණ දිව්‍ය කැමැත්ත ප්‍රකාශ කරනු ඇති අතර,.....

මෝසෙස් වැනි අනාගතවක්තෘවරයෙක්: මෝසෙස් සහ මුහම්මද් තරම් සමාන වූ අනාගතවක්තෘවරුන් දෙදෙනෙක් සිටියේ නැති තරම්ය. දෙදෙනාටම විස්තීර්ණ නීතියක් සහ ජීවන නීති සංග්‍රහයක් ලබා දී ඇත. දෙදෙනාම තම සතුරන්ට මුහුණ දුන් අතර ආශ්චර්යමත් ආකාරවලින් ජයග්‍රහනය කළහ. ඔවුන් දෙදෙනාම අනාගතවක්තෘවරුන් සහ රාජ්‍ය නායකයන් ලෙස පිළිගත්හ. දෙදෙනාම සංක්‍රමණය වූයේ ඔවුන් ඝාතනය කිරීමේ කුමන්ත්‍රණවලට පසුවය. මෝසෙස් සහ යේසුස් අතර ඇති සමානකම් ඉහත සමානකම් පමණක් නොව අනෙකුත් තීරණාත්මක ඒවාද නොසලකා හරියි. මේවාට මෝසෙස්ගේ සහ මුහම්මද්ගේ ස්වාභාවික උපත, පවුල් ජීවිතය සහ මරණය ඇතුළත් නමුත් යේසුස්ගේ නොවේ. එපමනක් නොව, ඔහුගේ අනුගාමිකයින් විසින් යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස සලකනු ලැබූ අතර, මෝසෙස් සහ මුහම්මද් මෙන් සහ මුස්ලිම්වරුන් විශ්වාස කරන පරිදි දෙවියන් වහන්සේගේ අනාගතවක්තෘවරයෙකු ලෙස පමණක් නොවේ. ඉතින් මේ අනාවැකිය කියන්නේ මුහම්මද් නබිතුමාට

මිසක් ජේසුට නෙවෙයි, මොකද මුහම්මද් කියන්නේ ජේසුට වඩා මෝසෙස් වගේ නිසා.

Book of Deuteronomy Ch 18 V 19

"If anyone does not listen to my words that the prophet speaks in my name, I myself will call him to account." "යමෙක් මාගේ නාමයෙන් අනාගතවක්තෘවරයා පවසන මාගේ වචනවලට සවන් නොදෙන්නේ නම්, මම ඔහුට ගණන් දෙන්නෙමි."

මෙයින් අදහස් කරන්නේ බයිබලය විශ්වාස කරන ඕනෑම අයෙකු මෙම අනාගතවක්තෘවරයා පවසන දේ විශ්වාස කළ යුතු බවත්, මෙම අනාගතවක්තෘවරයා නබි මුහම්මද් (සල්) තුමා බවත්ය.

Book of Isaiah chapter 29 verse 12

And the book is delivered to him that is not learned, saying, Read this, I pray thee: and he saith, I am not learned. තවද, උගත්කමක් නැති තැනැත්තාට පොත භාර දී: මෙය කියවන්න, මම ඔබෙන් ඉල්ලා සිටිමි; (මෙය නබි මුහම්මද් (සල්) තුමාණන් සම්බන්ධයෙනි).

---

# 4). ක්‍රිස්තියානි ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු (New Testament)

මෙම පොත හැඳින්වීම සටහනෙහි 5 වන සහ 6 වන පිටුවල මා සඳහන් කළ කාරණාවක් නැවත මෙහි ඉදිරිපත් කරමි. එය මවිසින්ද පිළිගන්නා බයිබල් වැකියකි.

**"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත. (බයිබලය-යොහන් 14:6).**

ඇත්ත වශයෙන්ම යේසුස් වහන්සේ මෙය පැවසුවේ එතුමාගේ සමාජයටය. එතුමාගේ සමාජය යනු එතුමා සමග එවක සිටි ජනතාව සා එතුමාට පසු තව නව නබිවරයෙකු හෝ රසූල්වරයෙකු (හෙවත් දෙවියන්ගේ පණිවිඩකරුවකු) පැමිණෙන තෙක් ගතවන කාළය දක්වා සිටින ජන සමූහයටය.

ලොවෙහි කුමණ කාලයක කුමණ ප්‍රදේශයක වාසය කළ මනුෂ්‍යයෙකුට හෝ හෝ ජන සමාජයකට දෙවියන් විසින් පත් කළ නබිවරයෙකු හෝ රසූල්වරයෙකු පැමිණුනා නම් එම නබිවරයාට හෝ රසූල්වරයාටත් ඉහත යේසුස් වහන්සේ පැවසූ වදනම පැවසිය හැක. තව නබිවරයෙකු හෝ රසූල්වරයෙකු පැමිණෙන තෙක් එම සමාජයට එම වැකිය වලංගු වන්නේය.

යේසුස් වහන්සේ තමාට අදාල කරගෙන පැවසූ එම වදන වලංගු වූයේ එතුමාට පසු මොහම්මද් නබි ﷺ තුමා පැමිණෙන තෙක් පමණි. මොහම්මද් නබි ﷺ තුමා පැමිණි පසු එම වදන ඒ ආකාරයෙන්ම මොහම්මද් නබි ﷺ තුමාටත් පැවසිය හැක. [යේසුස් වහන්සේට පියෙකු නැති නිසා ගෞරවයක් වශයෙන් දෙවියන් වහන්සේට පියානන් වහන්සේ ලෙස අමතා ඇතත් අනිකුත් (පියවරුන් සිටි) නබිවරු දෙවියන්ට දෙවියන් වහන්සේ ලෙසම අමතා ඇත].

මොහම්මද් නබි ﷺ තුමා ගේ පැමිණීම ගැන යේසුස් වහන්සේ පැවසූ වදන් පහතින් ඉදිරිපත් කර ඇත.

- *[Gospel of Jhon Ch 14 V 16] තවද මම පියාණන් වහන්සේට යාච්ඤා කරන්නෙමි, එවිට ඔහු ඔබ සමඟ සදහටම සිටින පිණිස තවත් සැනසිලිදායකයෙකු ඔබට දෙනු ඇත.*
- *[Gospel of Jhon Ch 15 V 26] මම පියාණන් වහන්සේ වෙතින් ඔබ වෙත එවන උපදේශකයා - පියාගෙන් නික්ම යන සත්‍යයේ ආත්මය - ඔහු මා ගැන සාක්ෂි දරනු ඇත.*

- *[Gospel of Jhon Ch 16 V 7] එසේ වුවද, මම ඔබට ඇත්ත කියමි; මක්නිසාද මා ඉවත්ව යාම ඔබට සුදුසුය. නමුත් මම ගියොත් මම ඔහුව ඔබ වෙත එවන්නෙමි.*
- *[Gospel of Jhon Ch 16 V 12-14] මට තවමත් ඔබට කීමට බොහෝ දේ ඇත, නමුත් ඔබට දැන් ඒවා දරාගත නොහැක. කෙසේ වෙතත්, උන් වහන්සේ, සත්‍යයේ ආත්මය පැමිණි විට, උන් වහන්සේ ඔබට සියලු සත්‍යයට මඟ පෙන්වන සේක. මක්නිසාද ඔහු තමාගේම අධිකාරියෙන් කථා නොකරනු ඇත, නමුත් ඔහු අසන ඕනෑම දෙයක් කතා කරයි. ඔහු ඔබට ඉදිරි දේවල් පවසනු ඇත.*

යුදෙව්වරුන් (මෝසෙස්) මූසා නබිගේ වදන් වලට අනුව කටයුතු කළා නම් (මෝසෙස්) මූසා ට පසුව පැමිණි යේසුස් වහන්සේව අනුගමනය කරන්න තිබුනා. නමුත් ඔවුන් යේසුස් වහන්සේව මරන්න පියවර ගත්තා.

ක්‍රිස්තියානි වරුන් යේසුස් වහන්සේව සහ ඉහත සඳහන් බයිබල් වැකි අනුගමනය කලා නම් යේසු තුමාට පසු පැමිණි මොහම්මද් නබි ﷺ තුමාව සහ කුරාණය අනුගමනය කරන්න තිබුනා. නමුත් ඔවුන් එය ප්‍රතික්ෂේප කරමින් සිටී.

මුස්ලිම්වරුන් අතීතයේ පැමිණි සියළුම නබිවරුන්ව සහ ඔවුන් ගෙනා දෙවියන්ගේ දහම් සත්‍ය ලෙසට පිළිගනිමින් තමන් වෙත පැමිණ ඇති අවසන් දහම සහ අවසන් නබිවරයාව අනුගමනය කරමින් සිටී. එනිසා මමද යේසුස් වහන්සේ පැවසූ ඉහතින් සඳහන් වැකිය පිළිගන්නා මුස්ලිම්වරයෙකි.

---

# නවක මුස්ලිම්වරු (පළමු කොටස)

සැ:යු:- නවක මුස්ලිම්වරු (New Muslims) හඳුන්වා දීමට වඩාත්ම සුදුසු වන්නේ "නැවත හැරුනු මුස්ලිම්වරු" (Reverted Muslims) යන්නයි.

නැවත හැරීම යනු කුමක්ද?

නැවත හැරීම යනු කුමක්ද කියා පැහැදිලි කිරීමක් කරනවානම්, මෙය මගේ ඉරණම සම්බන්දයෙන් සිදුවූ සුවිශේෂම අවස්ථාවයි. මෙය ඔබටද පොදු විය හැක. එනිසා මෙ පිළිබඳව ඔබවත් දැනුවත් කිරීමට අදහස් කලෙමි.

මෙයට 'ආපසු හැරීම' ලෙසින්ද කිව හැක. 'ආපසු හැරීමක්' නිසා සම්පූර්ණයෙන්ම සිදුවූ හැරීමක් බවත් 'නැවත හැරීමක්' නිසා 'පෙර සිටි' තත්වයකට 'නැවත පැමිණීමක්' බවත් අදහස් වෙනවා. කුමක්ද මේ පෙර සිටි තත්වය?

මම ඔබෙන් ප්‍රශ්නයක් අහන්නම්. ඔබ මවගේ කුසෙන් බිහිවන විට ඔබ බොහෝ දේ රැගෙන ආවා නේද? පෙනීම, ඇසීම, ඔබට හිමි ජාන ආදී බොහෝ දේ. ඒ සමග ඔබ රැගෙන ආ ආගම කුමක්ද? ඔබ ආගමක් රහිත කෙනෙක් වශයෙන්ද ඉපදුනේ?

මදක් නිශ්ශබ්දව සිතා බලන්න.

කිසිවක් නොදන්නෙකු ලෙස උපත ලද අතදරු ඔබව ඔබේ මව නිවසට ගෙනවිත් කල් යද්දී ඇයට සුපුරුදු දහම ඔබට කියා දුන්නා. ඔබ ඒ ගැන අද සතුටු වෙනවා ඇති.

"ඔබ හිතනවද කෙනෙකුට නිවැරදි ආගම ලැබෙන්නේ ඒ ආකාරයට කියල?

ඔබ දන්නෙත් නැතුව කුඩා කාලෙම වෙනත් ආගමක කෙනෙක් ඔබව සොරකම් කරගෙන ගොස් තිබුණා නම් අද ඔබේ ආගම කුමක්ද? ඔබ අද ප්‍රතික්ෂේප කරන වෙන දහමක කෙනෙක් වෙලා නේද? එවිට ඔබ එම ආගම සත්‍යයයි කියමින් හඬ නගාවි නේද?

මේ දෙකටම වඩා වෙනස් පහත අවස්ථාව බලන්න.

- ඔබට කිසිම දහමක් නොවැටහෙන වයසේදී ඔබව කැලෑවක අතරමන් උනා නම්, අද ඔබේ ආගම කුමක්ද? එවිට ඔබ අදහන්නේ ඔබ ඉපදෙනවිට රැගෙන ආ ඔබටම හිමි ඔබේම ස්වාධින ආගම නොවේද?

ඔබ ඔබේ පපුවට තට්ටු කරලා අහන්න, ඔබ කුමන ආගමක් ඇදහුවත්, කුමන රූපයකට දණගහල වැන්දත්, ඔබට මහත් ව්‍යසනයක් අනතුරක් අසරණකමක් ඇතිවූ විට ඔබේ ඇතුලාන්තයෙන්ම කතා කරන්නේ කාටද?

ඔබ පිහිට ඉල්ලන්නේ කාගෙන්ද කියල ඔබ ඔබෙන්ම ප්‍රශ්න කර බලන්න. ඔබ 'දෙවියන්ව' අමතනවා කියා මම කිව්වොත් ඔබද එයට එකඟ වනු ඇත.

පහතින් සඳහන් වන්නේ විදෙස් රටක වූ සත්‍ය සිදුවීමකි.

යම් කිසි ආයතනයක් විසින් විශේෂ වැඩමුළුවක් සඳහා උපාධිධාරී සිසුන් කිහිපදෙනෙකුව කැඳවා තිබුණා. ඔවුන් පිරවූ අයදුම් පත්‍ර වල ආගම සඳහන් ස්ථානයේ සුළුතරයක් හැර වැඩි දෙනෙක් සඳහන් කර තිබුනේ 'තමන්ට කිසිම ආගමක් නැහැ' කියලයි. ආගමක් නැහැ කියූ අයට පහතින් ගමන් කරන කුඩා ගුවන්යානයකින් යන සංචාරයකට අවස්ථාවක් ලබා දුන්නා.

එහි ගුවන් නියමුවාට මෙහෙම උපදෙස් දුන්නා; 'ඔබ ටික දුරක් ගොස් ගුවන් යානය තමාට පාලනය කළ නොහැකි බව පවසා බය හිතෙන විදිහට එහෙට මෙහෙට හරවා හරවා පදවන්න. තව ටික දුරක් ගොස් තමාට නැවත එය පාලනය කල හැකි බව පවසන්න. ඉන් පසු නැවත සියල්ල කැඳවාගෙන එන්න.'

ඔහුට ලැබුණු එම උපදෙස් පරිදිම ඒ දේ ඒ විදිහටම සිදුවුනි. පසුව ඒ සියල්ල තේ පැන් සංග්‍රහයකට කැඳවා තිබුණි. ඔවුන්ට වීඩියෝ පටයක් පෙන්වන්නටද විය.

පුදුමයකි! ඉහත දී තමන් මුහුණ දුන් මාරාන්තික අවස්ථාවේ වීඩියෝ පටයක් දැන් ඔවුන්ට නැරඹීමට අවස්ථාවක් ලැබී ඇත.

ඔවුන් එම අවස්ථාවේ කෙසේ හැසිරුනේදැයි ඔබට හිතා ගත හැකිද? ඔබ එහි හිටියානම් ඔබේ තත්වය කුමක්ද? සිදුවූ දේ ඔබට පැහැදිලි යැයි සිතමි.

අහසෙදී ඔවුන් සියල්ල මෙසේ මරහඬ දෙන්නට විය.

- අනේ දෙවියනේ මට උදව් කරන්න..../// O' God - help me..///
- අනේ දෙවියනේ අපට උදව් කරන්න..../// O’ God - please help us..///

සියල්ලගෙන්ම ඉවරයක් නැතුව මෙයම ඇසෙන්නට විය. ඉන් පසු "ගුවන් යානාව පාලනය කල හැකි" බව ඇසූ සැනින් ඔවුන් දෙවියන්ට ස්තුති කරන්නටද විය. "Thanks God...///"

දැන් සංවිධායක මඩුල්ල ඔවුන් ගෙන් ප්‍රශ්න කරනවා මේ සම්බන්ධයෙන්.

**"ඔබලාට ආගමක් නැහැ කියලා නොවේද ඔබ සියල්ල ඔබලාගේ අයදුම් පත්‍ර වල සදහන් කලේ? කාටද ඔබ කතා කලේ, කාගෙන්ද උදව් ඉල්ලුවේ?" ..**

**එවිට ඔවුන් සියල්ලගේම පිළිතුර උනේ.. 'අපි දන්නේ නැහැ, අපි නොදැනුවත්වම එය අපි තුලින්න්ම එලියට ආපු දෙයක්, අපේ ඇතුලාංතයෙන්මයි අපි දෙවියන්ව ඇමතුවේ'.**

මුලින් "ආගමක් නැහැ" කියූ අයගෙ ශරීරය ඇතුලෙ, හදවත ඇතුලෙ, ආත්මය ඇතුලෙ තිබූ තමන්ගෙම ආගම එලියට ආපු විදිහ ඔබ දුටුවා ද? ඔබේ ඇත්ත තත්වෙත් එයම තමයි.

මගේ ආදරණීය පාඨකයිණී..

අද මම 'නැවත හැරී' සිටින්නේ එම දෙවියන්ගේම මාර්ගයටයි. මම අද අනුගමනය කරන්නේ ඔහුගේ දහමයි. ඔහු 'අල්ලාහ්' ම බව (එනම් තමාගේම නිර්මාතෘ බව) 'ශුද්ධ වූ කුරානය' කියවුවොත් ඔබටද වැටහෙනු නොඅනුමානයි.

අල්ලාහ් අපට පවසනවා, අප ඉපදෙන්නට පෙරම ඔහු තමාගේ දෙවියන් අල්ලාහ් බවට පිලි ගන්නව කියලා අපෙන් තනි තනිව පොරොන්දුවක් ගත් බවත්, පසුව ඒ පිලිගැනීම අපේ මනස තුලට ද කාවද්දල දෙවියන් නැමදීමේ ස්වභාවය සෑම මනුෂ්‍යයෙකු තුලම ස්ථාපනය කරලා ඉන් පසුවයි අපව මේ ලෝකෙට එවල තියෙන්නෙ කියලා.

ඒ ස්වභාවය නිසා තමයි මිනිසා නැමදීමේ කටයුත්තේ නිරත වන්නේ. භාහිර පරිසරයෙන් ඔහුගේ මනස විකෘති නොවුනානම්, ඔහු අනිවාර්යයෙන්ම නමදින්නේ තම නිර්මාතෘ (අල්ලාහ්)ට මය. අල්ලාහ් (හෙවත් තමාගේ නිර්මාතෘ) දෙවියන්ට නොනැමද වෙනත් වෙනත් පුද්ගලයන්ට හෝ වස්තූන්ට නමදින්නට

මිනිසා පෙලඹෙන්නේ ඔහුට ඔහුගේ වටපිටාවෙන් ලැබුණු ආදර්ශය හා උපදෙස් නිසයි. එයට පළමුව වගකිව යුත්තේ හරියට හොයන්නේ බලන්නේ නැතුව අපට ගුරු හරුකම් දුන් අයයි. දෙවනුව, වැඩිවිය පැමිණි පසු තමාගේ මනස උපයෝගී කර ගන්නේ නැතුව අන්ධයන් මෙන් අනුන් කියන සැම දේම සත්‍යයයි කියා පිළිගත්ත තමාමය.

මිනිසා, නැමදීම හෙවත් උපරිම ගරුත්වය පිදිය යුත්තේ තම නිර්මාතෘ (දෙවියන්)ට පමණක්ම බව දෙවියන්ම පවසයි. ඔහු මානවයාව එතරම්ම උසස් කොට සළකා ඇත. දෙවියන්ට සමාන වෙන කිසිවක් හෝ ඇත්නම් එයට හිස නැමීමට හෙවත් උපරිම ගරුත්වය පිදීමට මිනිසාට අවසර ඇත. දෙවියන්ට සමාන නොවන මොනම බලගතු කෙනෙකුට හෝ දෙයකට හෝ වේවා මිනිසා නොනැමදිය යුතුයි. එයයි මිනිසාගේ නිර්මාතෘගේ නියමය. එසේ අණ කලත් එම දෙවියන්ම පවසනවා 'මිනිසා ඔහුව නැමදීමෙන් ප්‍රයෝජනය ඇත්තේ මිනිසාටම බවත්'.

අල්ලාහ් ශුද්ධ වූ කුරානයෙන් අපට පවසනවා ඔහු ගැන. ඔහු කෙබඳු කෙනෙක්ද යන්න පිළිබඳව. (දෙවියන් ගැන බොහෝ තොරතුරු මෙම වෙබ් අඩවියෙහිම ඇතුලත් කර ඇත).

ඔබට පුරුදු ඔබ නමදින දෙවියෝ කියන කිසිවෙක් අල්ලාහ් මෙන් ඔබව කුමන ආකාරයකට හෝ අමතා තිබේද? ඔවුන්ගේ ස්වරූපයන් දෙවිකෙනෙකුට සමකල හැකිද?

සොබාදහම තුල අප දකින බොහෝ දෙවල් එකිනෙකට වෙන්සය. හැන්ද පුටුවට සමාන නැත. පුටුව කුකුළාටද සමාන නැත. කුකුළා කපුටට සමාන නැත, කපුට මිනිහටද සමාන නැත. මෙය අපට විමතියට කරුනක් නොවේ. එසේම, මේ කිසිවක් දෙවියන්ටද සමාන නැත. ඔබ පන්සල් පල්ලි කෝවිල් ආදිය තුලින් දෙවිවරු ලෙස දකින එක රූපයක්වත් දෙවියන්ගෙ යැයි පිළිගත නොහැක. එම රූප තනිකරම මිනිසා මනඃකල්පිත කරගත් ඒවාය. මහා බ්‍රහ්මයාගේ යැයි කියමින් සමාජයට රූප හෝ පිළිම වලින් පෙන්වා දී ඇති ස්වරූපය දෙස බලන්න. ඒ රූපය විශ්වයේ නිර්මාතෘ ගේ ස්වරූපය යැයි පිළිගත හැකිද? අල්ලාහ්

පවසනවා 'ඔහුට සමාන කිසිවක් නැහැ' කියලා. මිනිසාගේ සම්පූර්ණ තොරතුරු අන්තර්ගත, පසුව මිනිසෙක් දක්වා වර්ධනය කරවන ඉතා කුඩා ශුක්‍රාණු ඒක සෛලයේ නිර්මාපකයාද, මහා විශ්වයේ නිර්මාපකයාද වන අල්ලාහ්ගේ දෑත (මිනිසා මනංකල්පිත කර ඇඳ ඇති) මහා බ්‍රහ්මයාගේ රූපයේ තියෙන දෑත වගේ විය හැකිද?

අල්ලාහ් වෙනුවෙන් රූපයක්, පිළිමයක් නිර්මාණය කල හැකි කෙනෙක් මේ මිනිස් සමාජයේ ඉදිවිද? දෙවියන්ගේ හැඩරුව ගැන මිනිසාගේ කුඩා මොලයට ගෝචර වෙයි කියා ඔබ හිතනවාද? ඔහුගේ නිර්මාණ දෙස බලා ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය වටහාගෙන ඔහුව නිසි අයුරින් පැසසුම් කරන්න. මනඃක්කල්පිත කර ඇති බොරු වලට රැවටෙන්න එපා.

අල්ලාහ් පවසනවා තමා ස්වාධින බව. කිසිඳු අවශ්‍යතාවයක් නොමැති, ඔහුට හුස්ම ගැනීමට වාතයද, ආහාරද අවශ්‍ය නැති බව ඔහු පවසනවා. මේ විශ්වය පාලනය කිරීමේදීත්, නඩත්තු කිරීමේදීත් ඔහුට වෙහෙසක් ඇති නොවන බවත් ඒ සඳහා කිසිවෙකුගේ සහාය අවශ්‍ය නොවන බවත් ඔහු පවසනවා. ඔහු ඔහුට සිතූ දේ කිරීමට තරම් බලසම්පන්න බවත් පවසනවා. ඔහුට මවෙක් පියෙක් හෝ දරුවන්ද නොමැති බවත් එවැනි දෙයින් ඔහු පාරිශුද්ධ බවත් ඔහු පවසනවා. මේ විශ්වයේ දෙවි වරු දෙදෙනෙක් වත් නොමැති බවත් දෙදෙනෙකු හිටියානම් මෙම විශ්වය අවුල් වියවුල් වන්නටද ඉඩ ඇති බවත් ඔහු එක්කෙනෙක්ම පමණක් බවත් යලි යලිත් කුරානය තුලින් ඔහු අපට මතක්කර දෙනවා.

ඔහු සියල්ල අසන බවත්, ඔහු සියල්ල දකින බවත්, ඔහු සියල්ල කෙරෙහි දැනුවත්ව සිටින බවත් අපට සිහි ගන්වනවා. ඔහුට නොදැනුවත්ව ගසක කොලයක් හෝ බිමට නොවැටෙන බවත් ඔහු ආහාර සැපයීමේ වගකීම භාර නොගත් කිසිඳු ජීවියෙකු මිහිමත නොමැති බවත් ඔහු පවසනවා. මුළු විශ්වයම ඔහුගේ අණට යටත් බවත් ඔහු පවසනවා. ඔහු අපට මහත් භාග්‍යමත් ජීවිතයක් දුන් බවත් ඔහු අපට මහා කරුනාවන්තයෙක් වශයෙන් සිටින බවත් පවසනවා. ඔහු සියලු ලෝකවලට අධිපති බවත්, විනිශ්චය දිනයේ රජු බවත් එහිදී කිසිවෙකුට අණුවක තරම් හෝ අසාධාරණයක් නොකරන බවත් පවසනවා. ඔහු දයාලු වන්තයා වශයෙන්ද සමාව දෙන්නා වශයෙන්ද සිටින බවත් පවසනවා.

යහපත් විශ්වාසවන්තයන්ට ස්වර්ගය පිරිනමන බවත් ඔහුව ප්‍රතික්ෂේප කරන්නන්ව නිරයට දමන බවත් ඔහු පවසනවා.

ඔහු පැහැදිලි සාක්ෂි සහිත පුස්තකයක් (Al Quran) මගින්ද පැහැදිලි සාක්ෂි සහිතව පැමිණි අවසන් නබි වරයා (Mohammad ﷺ) හරහාද මිහිමත තම දහම සම්පූර්ණ කල බවත් ඔහුගේ දහමට පිටින් යන කුමන දහමක් වත් ඔහු පිළිනොගන්න බවත් පවසනවා. පුලුවන්න්නම් ඔහුගේ නබි වරයාවත් පුස්තකයත් බොරු කර පෙන්වන්නැයි කියා 'වෙනත් ආගම හරිය කියන අයට' අභියෝගද කර තිබෙනවා. එම අභියෝගය ඔබ ඉදිරියේද තිබෙනවා.

මම නැවත - (ආපසු) හැරුනේ මගේ එම දහම වෙතයි. කිසිම පුද්ගලයෙකුට අයිවාසිකමක් කිව හැකි ආගමක් නොවෙයි එම දහම. එය කිසිම පුද්ගලයෙක් දෙසූ දහමක් නොවෙයි. එය මේ විශ්වයටම පොදු දහමයි.

විශ්වයේ මැවුම් කරු ඉතා පැහැදිලි සාක්ෂි සහිතව ශුද්ධ වූ අල් කුරාණය මගින් අපට පවසා තිබෙනවා ඔහු අපගේ මැවුම් කරු බවත් ඔහු අපට අනුමත කල දහම මෙම විශ්ව දහම පමණක්ම බවත්.

අපිට යමක ඉතාම පැහැදිලි සාක්ෂි තිබෙනවානම් එය පිළිගන්නට අපි සූදානම්. ඉතින් කුරානය තුලින් පැහැදිලි සාක්ෂි තියෙද්දිත් එය පිළිනොගෙන ඉන්නේ ඇයි කියන ප්‍රශ්නය මතු නොවන්නේද? ඔබට පුලුවන්ද ඔබ හරියි කියන ආගම පිළිගන්නට තියෙන පැහැදිලි සාක්ෂි කිහිපයක් පෙන්වා දෙන්නට? සාක්ෂි නැතුව 'පාර භෞතික' කරුණු විතරක් කෙරෙහි විස්වාසය තියන්නද ඔබ අදහස් කරන්නේ? ශුද්ධ වූ කුරාණය ගැන ඔබ නොදන්නවානම් ඔබට මගේ තීරණය ගැන පැහැදිලි අවබෝධයක් ගන්න බැහැ. නමුත් ඔබට එක කරුණක් පැහැදිළි වෙයි. ඔබ නිවැරදියි කියන (විශ්වයේ නිර්මාතෘ ගේ නොවන) දහම සත්‍යයි කීමට තියෙන පැහැදිලි සාක්ෂි මොනවද කියල සොයා බැලීම තමාගේම ඥුවනට හුරු කරුණක් බව. ඔබට තනියම හිතා ගන්න බැරිනම් 'ආගම විශ්වාස කිරීමට පැහැදිලි සාක්ෂි කිහිපයක් ධර්ම පුස්තක වලින් උපුටා පෙන්වන ලෙස' ආගමික විද්වතුන්ගෙන් ඉල්ලා සිටින්න.

මදක් සිතා බලන්න කියා මම ඔබට යෝජනා කරනවා.

# ආගම් ප්‍රචාරණය

- *මහණෙනි! මිනිසුන්ගේ හා දෙවියන්ගේ හිත සුව පිණිස චාරිකාවෙහි යෙදෙන්න, ධර්මය දේශනා කරන්න, . බුදුරජාණන් වහන්සේ*
- *නුඹලා ගොස් සියලු ජාතීන්ට සුභාරංචිය දේශනා කරන්න. මක්නිසාද දේවරාජ්‍යය අත ළඟය. යේසුස් වහන්සේ*
- *නුඹලා අතරෙන් සමාජයෙහි නපුර වලක්වා යහපත කරා මිනිසුන් කැඳවන්නා වූ පිරිසක් සිටිය යුතුය. ශුද්ධ වූ අල්කුර්ආන්*

ඔබ විශ්වාස කරන ආගම කුමක් වුව ද ඒ පිළිබඳව මනා අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම ඔබගේ වගකීමක් බව ඔබ දන්නවාද? ලොව බිහි වූ හෝ පහළ වූ ආගම් තුළ ඒකායන දැක්ම වුයේ මිනිසුන් අතර ආගමානුකූල ප්‍රතිපත්තීන් ගොඩනැගීම හා ඒ අනුව සදාචාරාත්මක සමාජ සංස්ථාවත් මිහි මත ගොඩනැගීමය. අප කුමන භාෂාවක් කතා කරත් කුමන ආගමකට අයිති වුවත් අප එකිනෙකාට ආගමානුකූලව පැවරී තිබෙන වගකීම් නිසියාකාරව තේරුම් ගෙන ක්‍රියා කිරීම ඉතා වැදගත්ය.

ඇත්ත වශයෙන්ම ආගමිකයන් ලෙස අප කුමන හෝ ආගමකට අයත්ව ජීවත් වන්නේය. බෞද්ධ වේවා, ක්‍රිස්තියානි වේවා, ඉස්ලාම් වේවා මේ ආගම්වලින් කුමන ආගමකට අයත් වුවත් ආගම තම තමන්ගේ වගකීමක් කොට සිතා ක්‍රියා කරන්නා වූ සියල්ලෝම වගකීම් පිළිබඳව ද තේරුම් ගත යුතුය

ශ්‍රී ලංකාව සාගරයෙන් වට වූ කුඩා දිවයිනක් වන අතර එහි කෝටි දෙකකට ආසන්න ජනතාවක් ජීවත් වන්නේය. ඔවුන් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, ඉස්ලාම්, හා වෙනත් ආගම් අදහන විවිධ ජන සමාජයක් ලෙස ජීවත් වන්නේය. මෙම සියලු ආගම් පිළිබඳව අධ්‍යයනය කර බලන විට ඒ පිළිබඳව තමන් ජීවත්වන අවට සමාජය දැනුවත් කිරීම කාගේ කාගේත් වගකීමකි. තම තමන් විසින් අධ්‍යයනය කොට පිළිගත්තා වූ සත්‍ය දර්ශනයන් පිළිබඳව කතා කිරීමත් එය අන් අයට පහදා දීමත් ඉතා වැදගත්ය. විවිධ ආගම් අතර සහයෝගීතාවය ගොඩනැගීමේ අරමුණ ඇතිව එකිනෙකාට ගරු කරමින් මෙම ක්‍රියාවලිය ඉටුකල යුතුය.

**බුදුදහමින්...**

ක්‍රිස්තු පූර්ව හයවන සියවසෙහි භාරත සමාජය බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළින් ඒකාධිකාරී තත්ත්වයක් ගොඩ නගාගෙන තිබුණි. එය සමාජයට යථාර්ථය දැන ගැනීම පිණිස සකස් වූවක් නොවීය. එය අවබෝධ කරගත් ක්ෂත්‍රිය වංශයෙහි උපන් සිද්ධාර්ථ කුමරුන් එය සමාජයට හිතකර ධර්මයක් නොවන බව අවබෝධ කර ගත්තේය. ඒ අනුව එතුමා, චතුරාර්ය සත්‍යය (දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, මාර්ග සත්‍යය, නිරෝධ සත්‍යය) පෙරදැරි කරගෙන ධර්මය දේශනා කළ සේක. එය මිනිසුන්ගේ හිත සුව පිණිස හේතු විය. ඉන්දියාවේ බ්‍රාහ්මණ ආධිපත්‍යය මේ හේතුවෙන් ක්‍රමක්‍රමයෙන් බිඳ වැටිණි. බොහෝ දෙනෙක් බුදුදහම සිය ආගම වශයෙන් පිළිගැනීමට හේතු වූයේ එහි ඇති සාමකාමී හා අවිහිංසාවාදී ප්‍රතිපත්තිය නිසාය. බුදුරජාණන් වහන්සේ සිය අනුගාමික භික්ෂූන් වහන්සේලාට දේශනා කරනු ලැබුවේ මහණෙනි නිරන්තරයෙන්ම මිනිසුන්ගේ හිත සුව පිණිස ධර්මය දේශනා කරන්න යනුවෙනි.

**කිතු දහමින්...**

බුදුරජාණන් වහන්සේගෙන් පසුව පහල වූ ආගමක් වන ක්‍රිස්තියානි ආගමද මෙයට අවුරුදු දෙදාහකට පමණ පෙර ලොව පහළ වන්නේ මිනිසා අතර සාමය ගොඩනැගීමේ අරමුණ පෙරදැරි කරගෙනය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පලස්තීනයෙහි බෙත්ලෙහෙමේ උපත ලබන්නේය. එතුමා සමාජයෙහි මධ්‍යම පන්තියෙහි උපත ලබන්නේය. එවකට එම සමාජයෙහි බලය දරා සිටින්නේ සදිසි වරු සහ පරිසිවරුන්ය. ඔවුන්ගේ ඉගැන්වීම් සමාජයට මහත් පීඩා සහිත එකකි. එවිට දෙවියන්වහන්සේගේ මග පෙන්වීමෙන් යේසුස් වහන්සේ දේශනා කළේ "සාමය සමාජය තුළ ස්ථාපිත කිරීම සඳහා දේශනා කරන්නෝ, සමාදාන කරන්නෝ භාග්‍යවන්තයෝය, මක්නිසාද ඔවුන් දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය යි කියන්නේය" (මතෙව් ශුභාරංචියෙහි පස් වන පරිච්ඡේදයෙහි මේ බව සඳහන්ය). ඇත්ත වශයෙන්ම ක්‍රිස්තියානි ධර්මය තුළ උගන්වනු ලබන්නේ මිනිසුන් අතර සාමය ගොඩනැගීම හා මිනිසා පාපය කරණකොටගෙන දෙවියන් වහන්සේ ගෙන් ඈත්ව සිටීම ඉවත් කොට දෙවියන්වහන්සේ සමග සම්බන්ධතාවයට මගපෙන්වීමයි. මක්නිසාද, සියල්ලෝම පව් කොට දෙවියන්

වහන්සේගේ මහිමයෙන් හීන ව සිටිති යනුවෙන් ශුද්ධ වූ බයිබලයෙහි සඳහන් වේ. නැවත දෙවියන්වහන්සේ සමග සම්බන්ධ වීමට පාපයෙන් ගැලවීමට කිතුනුවන් මිනිසා අතර ක්‍රියා කරනු ලැබේ.

**ඉස්ලාම් දහමින්.....**

මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් බිහිවන්නේ මක්කම ප්‍රදේශයෙනි. එතුමා එවක සමාජයේ දක්නට ලැබුණු සමාජය තුළ පිරිහීම මනාව අවබෝධ කරගනිමින් යහපත කරා මිනිසුන් කැඳවීමේ අධිෂ්ඨානයෙන් යුතුව විශ්වාසවන්තයකු ලෙස ජීවත් වන්නේය. ශුද්ධවූ දෙවිඳාණන් විසින් පහළ කරනු ලැබූ වචනයට අනුව (අල් කුර්ආණයට අනුව) ක්‍රියාත්මක වන එතුමා සමාජ හිතකාමී දේව කැමැත්ත පිළිබඳව සමාජය තුළ දේශනා කරනු ලැබූහ. එය සමාජයට අර්ථවත් එකක් විය. සාපරාධී ලෙස ක්‍රියාකළ සමාජයත් සාමකාමී සමාජයක් වන්නේ මේ අනුවය.

**ඉස්ලාම් ධර්මය පිළිබඳව ඉතාම කෙටියෙන් හඳුන්වන්නේ නම් එය දන්නා අයත් නොදන්නා අයත් අතර සාමය ගොඩනැඟීමය.**

මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් අවසාන වක්තෘවරයෙක් ලෙස පහල වූ නමුදු එතුමා අනුගාමික සමාජයට ප්‍රකාශ කරනු ලැබුවේ යහපත කරා මිනිසුන් කැඳවන ලෙසය. එය මුස්ලිම්වරයෙකුගේ වගකීමක්ද වේ.

වර්තමාන සමාජ සංස්ථාව අධ්‍යයනය කර බලන විට ඇත්ත වශයෙන්ම කිසිදු ආගමික සමාජයකට මෙම වගකීම පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබේ දැයි සැක සහිතය. ආගමික දැනුමකින් තොර සමාජයකට සත්‍යතාවයන් යුතුව ආගම් පිළිබඳව විග්‍රහ කළ නොහැක. මිනිසා කරනුයේ බාහිරව දක්නට ලැබෙන යම් යම් ක්‍රියාවන් හා ආගමික ප්‍රතිපත්තීන් දෙස බලා කරුණු ඉදිරිපත් කිරීමයි. මේ අනුව ආගමික සත්‍යතාවයෙන් තොර වූ ගැටුම් නිර්මාණය වේ. අප ජීවත්වන රටෙහි සාමය සහජීවනය අන්‍යෝන්‍ය මිත්‍රශීලී ඒ බව ගොඩනැගීමට නම් විවිධ ආගම් ඒ හා සම්බන්ධ සංස්කෘතිමය ලක්ෂණ හා භාෂාවන් පිළිබඳව දැනුම ලබාගත යුතුය. ආගමික දැනුමෙන් තොරව ඉදිරිපත් කරන අදහස් උදහස් යෝජනා චෝදනා මේ

සියල්ල තුළින් නිර්මාණය වන්නේ ගැටුම්ය. ඒ නිසාම සමාජය තුළ සාමය සමගිය සහජීවනය බිඳ වැටේ.

මේ පිළිබඳව වගකිය යුතු පාර්ශවයන් හෙවත් පූජක පක්ෂය ඉතා වගකීමකින් කටයුතු කළ යුතුය. සෑම ආගමකින්ම උගන්වනු ලබන්නේ සියලුම ආගම් වලට ගරු කරමින් ක්‍රියා කරන ලෙසය. කිසිදු ආගමක ආගම වැළඳ ගැනීමට බල කිරීමක් නොමැත. එකිනෙකා සත්‍ය වටහා ගැනීම තුළින් සුදුසු මාර්ගය තෝරා ගැනීමේ අයිතිය මිනිසා සතුව ඇත. එමනිසා එකී මාර්ගය තෝරා ගැනීමට උදව් කිරීම සියලු ආගමික වගකියයුතු පුද්ගලයන්ගේ වගකීමකි.

---

## ඉස්ලාම් ධර්මය ගැන පැහැදිලි කරන්න යන ඔබට උපදෙසක්.

මෙය ඉස්ලාම් ධර්මය ගැන පැහැදිලි කරන්න යන අයෙකුට මෙන්ම ඉස්ලාම් ධර්මය ගැන දැනගන්න යන කෙනෙකුටත් ප්‍රයෝජනවත් ලිපියකි.

[මුස්ලිම් නොවන අය අසන පොදු ප්‍රශ්න 100ක් මෙම ලිපිය අවසානයට සඳහන් කර ඇත. ඒවාට පිළිතුරු Online හරහා www.srmicenter.com / https://srmi-center.webnode.page/ වෙතින්ද ලබා ගත හැක].

දෙවිඳුන් මෙසේ පවසා ඇත.

*(නබියේ!) ඔබ (මිනිසුන්ට) ප්‍රඥාවෙන්ද, අලංකාරවත් හොඳ ඔවදන් මගින්ද ඔබගේ දෙවියන්ගේ මාර්ගය දෙසට ආරාධනා කරණු මැනව! තවද ඔවුන් සමග (තර්ක කිරීමට සිදු වුවහොත්) ඔබ (ගෞරවණීය හා) අලංකාරවත් අන්දමින් තර්ක කරනු මැනව!; (16:125)*

*නියත වශයෙන්ම කවුරුන් තමන් වෙත හොඳ ඔවදන් පැමිණෙන විට, ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන් විනිශ්වය දිනදී තමන්ගේ තත්වය වටහා ගනු ඇත. මන්දයත් නියත වශයෙන්ම මෙය ඉමහත් ගෞරවණීය ධර්මයක් වන්නේය.(41:41) මීට*

*කළින් හෝ මීට පසුව හෝ (පරිශ්ද්ධ වූ කුරානය වන) මෙයට බොරු (කිසි සේත්) ළඟා වීමට නොහැකිය. ඉතාමත් ප්‍රශංසාවට අයත් කෙනා හා ඥානවන්තයා විසින් (මෙය) පහළ කරන ලදී. (41:42)*

මිනිසාගේ නිර්මාතෘ මිනිසාට සුදුසු ලෙස මාර්ගෝපදේශ සහිත දහමක් ඉදිරිපත් කර එය නබිවරු හරහා සමාජගත කර ඇත. එම දහම ලැබුණු අය විසින් එය මෙතෙක් නොලැබුණු අයට පැවසීම අනිවාර්‍ය යුතුකමකි.

නමුත් මිනිසාගේ ස්වභාවය මතම මෙය තරමක් අර්බුධකාරී කටයුත්තකි. එය ප්‍රකාශ කිරීමේදී ප්‍රකාශ කරන්නාට නොයෙකුත් අපහසුතා, සිත්තැවුල් ආදී තත්ව වලටද මුහුණ දීමට සිදු විය හැක. එය ඉතිහාසයේ සිටම සිදුවී ඇත.

කොතරම්ම දුර්මාර්ගයේ සිටින කෙනෙකු උවත් තම දෙමාපියන්, මුතුන් මිත්තන් ආදීන් ගිය මාර්ගයේම යන්නමයි වැඩි කැමැත්තක් දක්වන්නෙ. දෙමාපියන්ගෙ පාරෙම යමින් නයින්ට, හරකුන්ට, මීයන්ට, ගින්දරට, ගස් ගල් වලට නමදින මිනිසුන් පවා බිහිඋනේ එනිසයි. ඔවුන්ට පහදා දීම ඉතා අසීරුයි.

මිනිස් සිත්  අධිකව හිතුවක්කාරයි මුරන්ඩුයි යන්න පෙන්වා දීමට මෙම ආගම දහම නම් මාතෘකාවට වඩා වෙන කාරණාවක් ලොව නැති තරම්ය. දෙවියන්ගේ පණිවිඩය කියන අයට කිසිම ලෞකික වාසියක් අත් නොවන නමුත්, එය ලබන්නාට තම ජීවිත කලය තුල ලැබිය හැකි වටිනාම දෙය ලෙස මෙය තිබියදීත් මෙවැනි වාතාවරණ ඇතිවීම නම් පුදුම සහගතය.

**"ඔබ ඔබගේ නිර්මාතෘව හඳුනාගන්න" යන ලොව ඇති ලස්සනම පණිවිඩය සමහරුන්ට කිව්වාම ඔවුන් පණත් එපා කියල දුවන තත්වයක් තමයි බොහෝ විට දකින්න තියෙන්නෙ. සමහරුන්ට එම පණිවිඩය ඇසීමත් කේන්තියට කරුණකි. සමහරුන්ට එය විහිළුවකි.**

නමුත් කෙනෙකුව දුර් මාර්ගයේ සිට ඍජු මාර්ගයට පැමිණවීම වෙනුවෙන් කටයුතු කිරීම ගැන තමාට ඇතිවන සතුට මේ සියල්ලට වඩා ඉතා ඉහළ බව සෑම මුස්ලිම් කෙනෙකුම හොඳින් දන්නා කරුණකි. එම පණිවිඩය අන් අයට ලබා දීම යනු තම යුතුකමට අමතරව තමා ඔහුට හෝ ඇයට දක්වන ආදරයේ, කරුණාවේ,

දයාවේ උපරිම අවස්ථාවකි. නමුත් අවාසනාවකට බොහෝ දෙනෙක් මෙය වටහා ගන්නේ නැත.

දෙවියන්වහන්සේ විසින් මිනිසාට බොහෝමයක් වරප්‍රසාදයන් ලබා දී ඇත. අනාගතටත් ඔවුන් වෙනුවෙන් ස්වර්ගය වැනි අනර්ඝ දේ පිළියෙල කර ඇති බව පවසා ඇත. නමුත් බොහෝ දෙනෙක් දෙවියන්ගේ පණිවිඩය නොසලකා හරිමින් ඔහුවවත් ගනන් නොගෙන සිටී. දෙවියන් මේ ගැනත් කුරාණය තුලින් මෙසේ පවසා ඇත.

*මිනිසුන්ගෙන් බොහෝමයක් ඉතාමත් ගුණමකු අය වශයෙන් සිටින්නාහ.; (25:50)*

දෙවියන් මිනිසාට දී ඇති නිදහස් ජීවන තත්වයෙන් අයුතු ප්‍රයෝජන ගෙන තමන්ගේම නිර්මාතෘවත් ඔහුගේ මාර්ගෝපදේශයත් නොසලකා හරින අයට මෙසේ අනතුරු හඟවා ඇත.

*(නබියේ!) ඔබ මෙසේ පවසනු; "(සම්පූර්ණයෙන්ම) සත්‍යය වූ (මෙම ධර්මය) ඔබගේ දෙවියන් විසින් පහළ කරන ලදී" කැමැත්තන්ට මෙය විශ්වාස කළ හැකිය, අකැමැත්තන්ට (මෙය) ප්‍රතික්ෂේප කර දැමිය හැකිය". (නමුත් මෙම ප්‍රතික්ෂේප කරන) අපරාධකාරුවන්ට නියත වශයෙන්ම අපි නිරයම පිළියෙල කර ඇත්තෙමු; (18:29)*

දෙවියන්ව විශ්වාස කරන අයට මෙසේ උපදෙස් දී ඇත.

*විශ්වාසවන්තයිනි! ඔබ, ඔබවද, ඔබගේ පවුලේ උදවියද, මිනිසුන්ද ගල්ද ඉන්දන බවට පත් කළ හැකි නිරා ගින්නෙන් ආරක්ෂා කර ගනු. ; (66:6)*

ඉතින්, ඔබ ඔබට හමුවූ සත්‍යය දහම වන දෙවියන්ගේ මාර්ගෝපදේශය ඔබ ඉදිරියේ සිටින්නෙකුට පවසන්නේ මේ නිසාමය. මෙම වැකි සත්‍යය වැකි බව මුස්ලිම්වරු විශ්වාස කරති. එම නිසා තමනුත් නිරයෙන් ආරක්ෂා වී තමන්ගේ වටපිටාවේ සිටින අයවත් නිරයෙන් ආරක්ෂා කරගෙන මරණින් මතු ජීවිත ජය ගැනීම උදෙසායි දහම ගැන අන් අයට දෙන්නෙ. නමුත් බහුතරයකට මෙය තේරෙන්නෙ නෑ.

ඇත්තවශයෙන්ම අල්ලාහ්වත් ඔහුගේ මාර්ගෝපදේශයත් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව ඇති කුරාන් වැකි දෙස බැලූ විට, (එහි ඇති භයන්කර බව දකින විට) මෙම පණිවිඩ සමාජගත වන තරම හොඳටම මදි. මුස්ලිම්වරුන් මීට වඩා මේ ගැන සැළකිළිමත් විය යුතුය.

දෙවියන්ගේ පණිවිඩය අන් අයට කීමට ඔබට විවිධ පහසු ක්‍රම උපයෝගී කර ගත හැක. හැමෝටම එකම විදිහට දහම ගැන කියා දීමට නොහැක. අසන්නාගේ ස්වභාවය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්ය. ඔබට පහසුවක් වීම සඳහා එක ක්‍රමයක් ගැන මම පහතින් සඳහන් කර ඇත්තෙමි. එහි ඇති කරුණුද ඔබට ගැලපෙන අයුරින් භාවිතා කර දෙවියන්ගේ පණිවිඩය ඔවුන් වෙත ලබා දෙන්න.

**[පියවර 1]**. තනිව හෝ දෙතුන් දෙනෙකුව විනාඩි 30 කට පමණ තමාට සවන්දීමට කැමති කරවා ගන්න. එයින් පළමු විනාඩි 30 ඔබ පමනක් කතා කරන බව පවසන්න. එම කාළය තුල ප්‍රශ්න කිසිවක් අහන්න එපා කියන්න.

එම කාළය තුල

- විශ්වයේත්, ඉස්ලාමයේත්, මිනිසාගේ ජීවන ගමනේත් මුල මැද අග ආදී සියල්ල පිළිබඳවත්,
- මේවායේ නිර්මාතෘ වන දෙවියන් වහන්සේ ගැනත්,
- ඔහු එවා ඇති පණිවිඩ සහ නබිවරු ගැනත් යන සියල්ල කෙටියෙන් විස්තර කළ යුතුයි.

එනම් මෙම දහම තුලින් මුල මැද සහ අග යන තුන් කාලය ගැනම කතා කළ හැකි බව ඒත්තු ගන්වන්න ඕනි. දෙවියන්ගේ මෙම දහමින් හැර, ලොව ඇති වෙන කිසිම දහමකින් මේ සියල්ල ගැනම පැහැදිළිව විස්තර කළ නොහැක. එනිසා එම සම්පූර්ණ කෙටි පහදා දීම ඉදිරි සාකච්චා සඳහා හොඳ අඩිතාලමක් වෙයි. [විනාඩි 30 ට පසු ඔවුන්ට ඇති ප්‍රශ්ණ සාකච්චා කරමින් අමතර තොරතුරු ඉදිරිපත් කළ හැකිය].

ඔබගේ විනාඩි 30 කතාවට පහත කරුණු උපයෝගී කර ගන්න.

1). දෙවියන් සිටින බවට සාදක කිහිපයක් පෙන්වා දෙන්න. මෙය තමයි වටිනාම කාරණාව. (ඊලගට වටින කාරණාව තමයි කුරානය තුල තිබෙන්නේ ඔහුගේම වදන් බව තහවුරු කිරීම. මේ ගැන ඔබ සිහියේ තබාගෙන කටයුතු කරන්න).

පහත සඳහන් කරුණු කෙටියෙන් විස්තර කරන්න. (වැඩි විස්තර www.srmicenter.com වෙබ් අඩවියෙහි ඇත).

- ✓ හේතු-ඵල දහම :- ඕනෑම දෙයක ආරම්භයට හේතුවක් තිබිය යුතුයි. සියල්ලෙහි ආරම්භයට හේතුව දෙවියන්ය. ඒ ගැන හිතන්න කියන්න.
- ✓ දිව්‍යමය හෙළිදරව් :- ඉස්ලාම් තමයි ලොව පැරනිතම ආගම. ඉතිහාසයේ සිට දෙවියන්ගේ මාර්ගෝපදේශ නබිවරු හරහා එවා ඇති බව පවසන්න.
- ✓ නිර්මාණවල සැලසුම් සහගත බව :- දෙවියන්ගේ සුවිශේෂී නිර්මාණශීලී හැකියාව ඔබේ ශරීරය තුලින්ම සහ සොභාදහම , විශ්වය ආදිය තුලින් දකින්න කියන්න. මේවා කිසිවක් ඉබේ විය නොහැකි බව පවසන්න.
- ✓ ප්‍රාතිහාර්යයන් :- නබිවරු ගෙනා පණිවිඩය දෙවියන්ගෙන් පැමිණි ඇති බව තහවුරු කිරීමට විවිධ ප්‍රාතිහාර්යයන් පෙන්වා ඇති බවත්, එසේ අවසානයට පැමිණි එක් ප්‍රාතිහාර්යයක් බැලීමට කැමතිනම් කුරානය (එහි පරිවර්ථනයක්) අරන් කියවා බලන ලෙසත් පවසන්න. එහි අන්තර්ගතයම ප්‍රාතිහාර්යයකි.
- ✓ ස්වභාවික අත්දැකීම් :- හැමෝගෙම හදවත් තුල දෙවියන් සිටින බව තමන්ම සිතා බලන්න කියන්න. අපි සත්‍යය ලෙස කෙනෙකුගෙන්, දිය හැකි කෙනෙකුගෙන් ප්‍රාර්ථනා කළ යුතු බව පවසන්න. තමන්ගෙම අයිතිකරුගෙන් ප්‍රාර්ථනා කරන්න කියන්න.

2). දෙවියන් විසින් විශ්වය සහ එය නිර්මාණය කිරීම ගැන කුරාන් ආයත් ගොඩක් ඇති බව පවසන්න.

3). පලමු මිනිසා ආදම් (අ.ස)ව නිර්මානණය කිරීම, ඔහු සහ ඔහුගේ බිරිඳ පෘතුවියට පැමිණීම, ඔවුන්ගෙන් පරම්පරාව බෝ වීම, කල් යද්දි මිනිසුන් දෙවියන්ගේ මාර්ගයෙන් ඈත් වීම, ඉන් පසු කලින් කලට නබිවරු පැමිණීම, මූසා (අ.ස), ජේසු (ඊසා අ.ස) සහ මොහම්මද් ﷺ යන නබිවරු ගැන මතක් කරන්න.

4). නබිවරුන් විසින් අල්ලාහ්වම පමණක් නමදින ලෙසත්, ඔහුගේ දහම පමණක් අනුගමනය කරන ලෙසත්, වෙනත් මනඃක්කල්පිත රූප, පිළිම, ගස් ගල් ආදිය නොනමදින ලෙසත්, මිනිසුන්ගේ උපදෙස් තම ධර්මය ලෙස පිළි නොගන්නා ලෙසත්, ඔවුන්ව නොනමදින ලෙසත් උපදෙස් දුන් බව පවසන්න.

5). අන් සියල්ලන්ටම වඩා අල්ලාහ් බලසම්පන්න බවත්, සියල්ල දකින බවත්, සියල්ල අසන බවත් ඔහුම සියළුම දේ තම බලයෙන් නිර්මාණය කර ඇති බවත් පවසන්න. ඔහුට වඩා වෙන කිසිවෙකු උසස්වන්ත ලෙස සැලකීම මහත් පාපයක් බවත් අල්ලාහ්ම පවසා ඇති බව දැනුවත් කරන්න.

6). අප පැමිණියේ අල්ලාහ්ගෙන්ම බවත් අප නැවත යා යුත්තේද ඔහු වෙතම බවත් ඒ අතර තුර මෙලොවදී අපි අල්ලාහ් හමුවීමට යාමට පෙර සූදානම් විය යුතු බවත් පෙන්වා දෙන්න. අල්ලාහ්වත් ඔහුගේ ධර්මයත් ප්‍රතික්ෂේප කළ අය අවසානයේ අල්ලාහ් හමුවට ගොස් ඔහුට මුහුණ දෙන්නේ කෙසේදැයි අහන්න.

7). අල්ලාහ්ව ප්‍රශංසා කිරීමත්, යපහත් ලෙස ජීවත් වීමත්, පාපයන්ගෙන් ඈත්වී සිටීමට උත්සහ කිරීමත් යන මූලිකම කාරණා අපගේ මෙලොව ජීවිතයේ අරමුණු බව පහදා දෙන්න.

8). මිනිසාට වටහා ගත නොහැකිව අතරමං වී සිටින බොහෝ කාරණා අල්ලාහ් තම අවසන් පණිවිඩය වන අල් කුරාණය හරහා පැහැදිලි කර ඇති බව පවසන්න. මිනිසාගේ අත්පොත මිනිසාගේ නිර්මාතෘ දුන් කුරාණය බව දැණුවත් කරන්න.

විශ්වයේ ආරම්භය, මිනිසාගේ ආරම්භය, මරණින් මතු ජීවිතය, විනිශ්චය දවස, මලායිකාවරු, ජින්වරු, ස්වර්ගය, අපාය වැනි බොහෝ කරුණු ගැන හරියටම දැනගෙන මෙලොවත්, පරලොවත් ජයග්‍රහනය කිරීම සඳහා සත්‍යය දහම ලෙස පවසන මෙම ඉස්ලාම් හෙවත් විශ්ව දහම කෙරෙහි උනන්දුවන ලෙස පවසන්න.

9). අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළ අයව අල්ලාහ් නිරයට දමන බව අල්ලාහ්ම පවසා ඇති බව පෙන්වා දෙන්න. අල්ලාහ්ගේ වදන් විහිළුවට ගත්තොත් තමන්ටමයි පාඩු බව පවසන්න.

10). මෙය තමන්ගේ ඉරණම සම්බන්ධ කාරණාවක් නිසා තමන්ගේ (මෙලොව සීමිත කාලයට වඩා) මරණින් මතු (සදාකල් පවතින) ජීවිතයේ යහපත වෙනුවෙන් අනිවාර්යයෙන්ම පියවර ගත යුතුව ඇති බව පවසන්න. ආගම වෙනස්කිරීම් වැනි කාරණා සමාජය ඉදිරියේ ගැටළුවක් යැයි සිතන්නේ නම් ඒ සදහා විකල්ප මාර්ග භාවිතා කරමින් හෝ අවශ්‍ය කාරණාව තුල ජීවත් වන්න යැයි පවසන්න. එසේම මරණින් පසු සමාජය තමන්ගේ උදව්වට නොපැමිණෙන බවද මතක් කර දෙන්න.

**[පියවර 2]. ඉන් පසු ප්‍රශ්න ඇත්නම් අහන්න කියන්න.**

ප්‍රශ්න අහන විට ධර්මය සම්බන්ධ ප්‍රශ්න පමණක් අසන ලෙසත් ධර්මයට සම්බන්ධ නොවන ප්‍රශ්න නොඅසන ලෙසත් ඉල්ලා සිටින්න. ඉස්ලාම් ධර්මය ශුද්ධ වූ අල් කුරාණයටත්, දෙවිඳුන් තම නබිවරයා හරහා අපට පෙන්වා දුන් ආදර්ශය හෙවත් හදීස් වලටත් යන කරුණු දෙක මත පමණක් පදණම්ව ඇත.

අවසාන දේව පණිවිඩය මොහම්මද් නබි (ﷺ) තුමාට අරාබි භාෂාවෙන් පහළ වී ඇති බවත් එම භාෂාවෙන්ම ඒවා එම කාලයේම ලේඛන ගත කර ඇති බවත් ඒවා ඉන් පසු කිසිඳු වෙනසකට ලක් නොවී අද වෙනකම්ම ආරක්ෂා වී සහ පහසුවෙන් භාවිතා කළ හැකි අයුරින් ඇති බවත් පවසන්න.

දෙවියන් විසින් දහම සම්පූර්ණ කර ඇති බවත්, වටහා ගැනීමේ පහසුවට අර්ථ විවරණ සහ පරිවර්තන ඇති බව පවසන්න.

ඔවුන් අසන සමහර ප්‍රශ්ණ පිලිතුරු දීමට අවශ්‍යය නැති ඒවාය. මේ එවන් ප්‍රශ්නයකට උදාහරණයකි.

සෞදි අරාබියේ සිටින රජතුමා මුස්ලිම් කෙනෙක්ද? මෙම ප්‍රශ්නය ඉස්ලාම් දහමට අදාල ප්‍රශ්නයක් නොවෙයි. එය එම රජතුමා සම්බන්ධ පුද්ගලික කාරණාවකි. ඔහු ගේ නියම තත්වය අල්ලාහ් තමයි දන්නෙ. නමුත් සියළුම නබිවරු මුස්ලිම්වරුන්ය. අල්ලාහ් ඒ බව අපට දැනුවත් කර ඇත. ජේසු තුමා මුස්ලිම්වරයෙක් දැයි ඇසුවොත් එය සාධාරණ ප්‍රශ්නයකි.

එමනිසා මුස්ලිම් සමාජයේ මිනිසුන්ගේ යම් යම් පුද්ගලික කාරණා අපට අදාල නොවන බව පවසන්න. එය තවත් පැහැදිළි කරනවානම්, අහවල් මුස්ලිම් මිනිසුන් හරි නරකයි. ඔවුන් අපිරිසිදුයි, ඔවුන් සලා කරන්නෙ නෑ, ඔවුන් බොරුකාරයින්....මේවා සියල්ල මිනිසුන්ගේ පුද්ගලික දේවල්ය.

සමහර ප්‍රශ්න අහනව වචනවල තේරුම හරි හැටි නොදැන. අන්තවාදීන්, මූලධර්මවාදීන්, ත්‍රස්තවාදීන් වැනි වචන. මේවායේ නියම අර්ථ පහදා දිය හැක. එනිසා එවැනි ප්‍රශ්න කිහිපයකුත් සමග දහම සම්බන්ධව අසන පොදු ප්‍රශ්න කිහිපයක් පහතින් දක්වා ඇත.

අපට ඇතිවන ප්‍රශ්න වලදී අප ප්‍රධාන වශයෙන් පිළිතුරු සෙවිය යුතු වන්නේ දහමට අදාල ප්‍රශ්න වලටය. එයට හේතුව නම්, අපගේ ඉරණමට බලපාන්නේ එයයි. අනිකුත් ලෞකික ප්‍රශ්න මෙලොවට සීමාවන තාවකාලික ඒවාය. ඒවාට උපදෙස් දීමට උපදේශකවරුන් බොහෝ ඇත.

අපට වඩාත් වැදගත්වන්නේ දෙවියන් අපට පවසා ඇත්තේ මොනවද යන්නයි. ඒවා සියල්ල ඉතා මැනවින් පහදා දිය හැක. නමුත් දෙවියන් ගේ උපදෙස් ගැන නොදන්නා රාජ්‍යයක් දෙවියන්ගේ නියමයන්ට පවා පිටින් යමින් තීරන ගෙන යම් නීති පද්ධතියක් ස්ථාපනය කර පවත්වාගෙන යන්නේ නම් අප එම රටේ පුරවැසියන් විදිහට අප් මනසින් කාරණාව දෙවියන්ට භාර දී එම පවතින නීතියට අනුව කටයුතු කිරීමට අප නිහතමානී විය යුතුය. හැකි විටෙක එම අපහසුතාවයෙන් මිදීමට උත්සහ ගැනීම සුභ වාදී තත්වයකි.

නමුත් මේ සියල්ලටම වඩා වැදගත්ම ප්‍රශ්නය විය යුත්තේ 'සර්වබලධාරී අල්ලාහ් තමන්ගේ නිර්මාතෘද?' යන ප්‍රශ්නයයි. එයට පිළිතුර "ඔව්" ලෙස යමෙකුට පිළිගන්න පුළුවන් උනානම් අනිත් ප්‍රශ්න සියල්ල්ටම බොහෝමයක් පිළිතුරු එතුලම ඇති බව වැටහෙයි.

මුස්ලිම් නොවන අය අසන පොදු ප්‍රශ්න 100ක් ලිපිය අවසානයට සඳහන් කර ඇත.

පිළිතුරු දීමේදී ධර්ම මූලශ්‍ර උපයෝගී කරගෙන පිළිතුරු දීමට වග බලා ගත යුතුය. අපේ සිතට නැගෙන පුද්ගලික පිළිතුරු වලින් පිළිතුරු ලබා නොදිය යුතුය.

ප්‍රශ්ණ අසන්නේ පිළිතුරක් බලාපොරොත්තුවෙන් නම් දෙන ලද පිළිතුර හොඳින් කියවා බලා වටහා ගන්න තමන් උත්සහ කළ යුතු බව පවසන්න.

එම පිළිතුර ප්‍රමාණවත් නොවන්නේ නම් එය පැහැදිළි වන තෙක් එයට පමණක් පිළිතුරු දෙන්න. එවෙලෙහිම පිළිතුරු දිය නොහැකි නම් එය සටහන් කර එයට පසුව පිළිතුරු දෙන්න පොරොන්දු වී වෙන ප්‍රශ්ණයකට යන්න.

පිළිතුරු දීමට අවස්ථාව නොදී ප්‍රශ්ණ පමණක් අසමින් සිටීමට ඉඩ නොදෙන්න.

ඔබට (හෝ ඔවුන්ට) මෙම ප්‍රශ්ණ වලට පහතින් දී ඇති යොමුව තුලින් අදාල ප්‍රශ්න වලට පිළිතුරු ලබා ගැනීමටද අවස්ථාව ඇත. අදාල අංකය හෝ මීට වඩා වෙනත් ප්‍රශ්න ඇත්නම් පහතින් ලියා අප වෙත දැන්විය හැක.

[පියවර 3]. ඔබගේ කතාව සහ ප්‍රශ්ණ වලට පිළිතුරු දීම අවසන් වූ පසු ඔවුන්ට පුද්ගලිකවත් මේ ගැන අධ්‍යයනය කිරීම සඳහා අපගේ මෙම වෙබ් අඩවියම ඔවුනට ලබා දෙන්න. (www.srmicenter.com)

මෙම කාරණාව සුළු කොට සැලකීම හෝ නොසළකා හැරීම තමන් තමන්ටම කරගන්නා විශාල හානියක් බව ඔවුන්ට නැවත කියන්න. ඔවුන්ට එසේ හිතෙනවා නම් නොවරදවාම ප්‍රතික්ෂේප කිරීම හෙවත් ලොකුම පාපය සහ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව ඇති කුරාන් ආයත් සහිත පිටු දෙකවත් කියවා බලන්න කියන්න.

[පියවර 4]. ඉන් පසු ඉඳ හිට ඉස්ලාමය සම්බන්ධ වටිනා තොරතුරු සහිත පණිවිඩ (WhatsApp මැසේජ් ලෙස) එවා මේ ගැන ඔබට නැවත මතක් කිරීම සිදු කළාට කමක් නැද්දැයි අසා එයට අවසර ලබා ගන්න.

මේ සියල්ල ඔහුගේම යහපත වෙනුවෙන් ඔබ කරන දේවල් බව ඔබම දනී. ඔවුන්ගේ ප්‍රතිචාර කුමක් උවත් ඔබ ඉවසීමෙන් සිටින්න. ඒ බව දෙවියන් මෙසේ පවසා ඇත.

*(නබියේ!) නියත වශයෙන්ම අපි මිනිසුන්ගේ යහපත සඳහාම සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් පිරි මෙම ධර්මය ඔබ වෙත පහළ කළෙමු. එබැවින් කවුරුන් (මෙය) අනුගමනය කර කටයුතු කරන්නේද, ඔහුටම එය හොඳකි. කවුරුන් එයින් මාර්ගය වැරද යන්නේද, එය ඔහුටම නපුරක් වශයෙන් අවසන් වනු ඇත. (නබියේ!) ඔබ ඔවුන්ව (ඍජු මාර්ගයෙහි යන ලෙස මෙන් බල කර), බේරා ගන්නෙකු නොව. (39:41)*

ඉහත වැකියෙන් පවසන්නේ නබිවරයෙකුටවත් ඍජු මාර්ගය ලබා දිය නොහැකි බවය. නබිවරුන්ට පවා කළ හැක්කේ දහම කියාදීම පමණි. එය ලබාගැනීම අසන්නා සතු වගකීමකි. ඔහු ඔහුටම අවංක වී මෙය ලබා ගැනීමට ඉදිරිපත් විය යුතුයි. එවිට අල්ලාහ් එයට ඉඩ සලසනු ලබයි.

*කාලය මත සත්තකින්ම, මිනිසා තම ආයුෂ කාලය නිකරුණේ වියදම් කර නියත වශයෙන්ම පරාජික මාර්ගයේ සිටින්නේය. එහෙත් කවුරුන්, විශ්වාසය තබා දැහැමි කාරනාවන්ද කර සත්‍යය කෙනෙකුට කෙනෙකු ඔවදන් දී (පාපයන් අතැහැර දැමීමෙහිද පින් ඇති දැය කිරීමෙහිද, ඇති වන අමාරුකම විද දරා ගන්නා ලෙසටද, කෙනෙකුට කෙනෙක් ඔවදන් දෙමින් සිටින්නෝද) ඔවුන් හැර. (මොවුන් පරාජිත වූවේ නැත) (103:1-3)*

අපි දහම අන් අයට හඳුන්වා දෙමින්, එය පහදා දෙමින් අපේ යුතුකම අපි කරමු. එපමණයි. දහම තුල කිසි බල කිරීමක් නැත. අවසානයට ඔබ ඔබේ ඉරණම සමග සිටී, ඔහු ඔහුගේ ඉරණම සමග සිටී.

---

## මුස්ලිම් නොවන අය අසන පොදු ප්‍රශ්න 100ක්.

ඒවා සියල්ල ඉතා මැනවින් පහදා දිය හැක.

වරකට එක ප්‍රශ්නය බැගින් කැමති තරම් ප්‍රශ්න අපගේ වෙබ් අඩවිය හරහා අප වෙත යොමු කළ හැක. ඒවාට කෙටි පිළිතුරු ලෙස හෝ විස්තර සහිතව හෝ www.srmicenter.com / https://srmi-center.webnode.page/ සබැඳි (link) සමග

හෝ පිළිතුරු ලැබිය හැක. ඒවා කියවා තේරුම් ගැනීමට උත්සහ කළ යුතුය. නොතේරුනොත් ඒ බව පවසා නැවත යොමු කරන්න.

1. දෙවියන් (අල්ලාහ්) සිටින්නේ කොහෙද, ඔහු සෑම තැනම සිටිනවාද?
2. දෙවියන් (අල්ලාහ්)ගේ ස්වභාවය, හැඩරුව මොන වගේද?
3. සියල්ල නිර්මාණය කළේ දෙවියන් නම් දෙවියන්ව නිර්මාණය කළේ කව්ද?
4. 'අල්ලාහ් සර්වබලධාරී එකම දෙවියන්ය' සහ 'අල්ලාහුඅක්බර්' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
5. ඉස්ලාමය ආරම්භ වූයේ කවදාද?
6. ඉස්ලාම්, මුස්ලිම් යන වචන වල තේරුම් මොනවාද?
7. ඉස්ලාම් දහම සත්‍යය දහම බව පැවසීමට හේතු මොනවාද?
8. ඉස්ලාමය තුල සත්ව ඝාතණය අනුමත කරනවාද?
9. ඉස්ලාමයට අනුව මාංශ අනුභවය පාපයක් නොවෙයිද?
10. ඉස්ලාමීය සතුන් (ගෙල කපා) මැරීමේ ක්‍රමය නිර්දය ලෙස පෙනේ. එය අනුමත කළ හැකිද?
11. විනිශ්චය දිනයක් ඇති බව කීමට තිබෙන සාධක මොනවාද?
12. ඉස්ලාමය තුල බහු විවාහයට අවසර දෙන්නේ ඇයි?
13. මුස්ලිම් අයට ඌරුමස් අනුභවය තහනම් ඇයි?
14. මුස්ලිම් අයට මධ්‍යසාර තහනම් ඇයි?
15. මිනිසුන් විසින් අල්ලාහ් දෙවියන්ව නැමදිය යුතුයි යැයි පවසන්නේ ඇයි?
16. අල්ලාහ් විසින් විශ්වය නිර්මාණය කළ බව දහම තුලින් පෙන්වා දෙන්න.
17. අල්ලාහ් විසින් මිනිසාව නිර්මාණය කළ බව ඔප්පු කරන්නේ කෙසේද?
18. සිත සහ ආත්මය ගැන ඉස්ලාමය පවසන්නේ මොනවාද?
19. මුස්ලිම් අය පරිණාමවාදය පිළිගන්නවාද?
20. ඉස්ලාමය තුල විද්‍යාව සම්බන්ධව පෙන්වා දී ඇති කරුණු මොනවද?
21. ඉස්ලාම් අන් ආගම් වලට වඩා හොඳ බව පෙන්වා දෙන්නේ කෙසේද?
22. මුස්ලිම් නොවන අයගේ මරණින් මතු තත්වය කෙබඳුද?
23. ඉස්ලාමයට අනුව සතුන්ගේ මරණින් මතු තත්වය කෙබඳුද?
24. ජේසු තුමා සහ ඉස්ලාමය අතර ඇති සම්බන්ධය කුමක්ද?

25. ඉස්ලාමයට අනුව තෙරේසා මව්තුමිය, මහත්මා ගාන්ධි, ඕශෝ, පාප් වහන්සේ හෝ බුදුන් වහන්සේ වැනි අයගේ තත්වය කෙබඳුද?
26. ඉස්ලාම් ගැන අසා නැති අයට (මරණින් මතු) කුමක් සිදුවේද?
27. ඉස්ලාමයට අනුව පුනුරුප්පත්තිය යනු කුමක්ද?
28. යක්ෂයින්, ප්‍රේතයින්, හොල්මන්, ආදිය ගැන ඉස්ලාමය තුළ සඳහන් වෙනවාද?
29. ජේන බැලීම සහ සාස්තර කීම ගැන ඉස්ලාමීය දැක්ම කුමක්ද?
30. මුස්ලිම් ජනගහනයට වඩා ක්‍රිස්තියානි ජනගහනය වැඩි ඇයි?
31. ඊශ්‍රායෙල් වරුන් හෝ යහූදීන් යනු කවුරුන්ද?
32. මොහම්මද් නබි තුමා යුද්ධ කළේ දහම ප්‍රචාරය කිරීම සඳහාද?
33. ඉස්ලාමය කඩුවෙන් ව්‍යාප්ත කල දහමක් ලෙස සමහරු පවසන්නේ ඇයි?
34. ජිහාද් (ලෙස හඳුන්වන සටන් කිරීම) යනු කුමක්ද?
35. සමහර මුස්ලිම් අයව මූලධර්මවාදීන් ලෙසින් (සමහරු) හඳුන්වන්නේ ඇයි?
36. සමහර මුස්ලිම් අයව අන්තවාදීන් ලෙසින් (සමහරු) හඳුන්වන්නේ ඇයි?
37. සමහර මුස්ලිම් අයව ත්‍රස්තවාදීන් ලෙසින් (සමහරු) හඳුන්වන්නේ ඇයි?
38. ප්‍රාතිහාර්යයන් යනු මොනවාද?
39. කුරානය තුළ මිනිසුන්ගේ වදන් අංතර්ගතයද?
40. හදීස් යනු මොනවාද?
41. මොහම්මද් නබි තුමා යනු කවුරුන්ද?
42. ඉස්ලාමයේ පුද පූජා තිබෙනවාද?
43. මුස්ලිම් පිරිමි විතරද දේවස්ථාන වෙත යන්නේ?
44. ඉස්ලාමයේ පූජක පක්ෂයක් සිටිනවාද?
45. ඉස්ලාමීය විවාහය සඳහා කාන්තාවකගේ අවම වයස කීයද?
46. ඉස්ලාමය සොභාවික දහමක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
47. ඉස්ලාම් දහමේ මුළ මැද අග පැහැදිළිද?
48. ඉස්ලාම් දහමට අනුව මිනිසාගේ මුළ මැද අග පැහැදිළිද?
49. ඉස්ලාමයට අනුව සතුන් ශාක සහ අජීවී දේවල් යනු මොනවාද?
50. පල්ලි වල අදාන් ශබ්දය කරදරකාරී දෙයක් නේද?

51. ඉස්ලාමයට අනුව වඩා උසස් වන්නෙ කාන්තාවද පිරිමිද?
52. දාවා යනු යනු කුමක්ද?
53. මිනිසුන් හජ් කරන්න මක්කා යන්නේ ඇයි?
54. ඉස්ලාම් හී මූලික ග්‍රංථ අරාබි භාශාවෙන් තිබෙන්නේ ඇයි?
55. අල්ලාහ් කියන්නේ මුස්ලිම්වරුන්ගේ දෙවියන්ද?
56. කුරානය මුස්ලිම්වරුන්ගේ පොතක්ද?
57. නබිවරුන් දහම් දෙසුවේ මුස්ලිම්වරුන්ට පමණක් ද?
58. ඉස්ලාමයේ බලකිරීම් තිබෙනවාද?
59. ඉස්ලාමයේ කාන්තා අයිතිවාසිකම් මොනවාද?
60. ඉස්ලාමයට පිවිසෙන්නේ කෙසේද?
61. ඉස්ලාමය හැර ගොස් වෙන ආගමක් ඇදහීමට අවසර තියෙනවාද?
62. ඉස්ලාම් සහ බුද්ධාගම යන අගම් දෙකම එකවර අදහන්න හෝ අනුගමණය කරන්න පුළුවන්ද?
63. අල්ලාහ් දෙවියන්ට සමාන වෙන දෙවිවරු ඉන්නවද?
64. නබිතුමා තමන්ගේ පුද්ගලික අදහස් දහම ලෙස ඉගැන්නුවාද?
65. කුරානය විනාශ කරන්න හෝ වෙනස් කරන්න පුලුවන්ද?
66. ඉදිරියේදී තව නබිවරු එන්න ඉන්නවාද?
67. බුදුන් වහන්සේ නබිවරයෙක්ද?
68. හලාල් හරාම් යනු කුමක්ද?
69. මුස්ලිම්වරුන්ට පොළී ගනුදෙනු තහනම් ඇයි?
70. ඇයි මුස්ලිම්වරුන්ට මුස්ලිම් නොවන අයව විවාහ කර ගැනීමට අවසර නොදෙන්නේ?
71. මුස්ලිම්වරුන් වැඩිපුර දරුවන් හදන්නේ ඇයි?
72. ඉස්ලාමය තුල අත් කැපීම, බෙල සිඳීම, කස පහර. ගල් ගැසීම වැනි දඬුවම් අනුමත කරන්නේ ඇයි?
73. සමහර මුස්ලිම් කාන්තාවන් මුහුණු පවා වසාගෙන ඇදුම් අඳින්නේ එය බලකිරීමක් නිසාද?
74. මුස්ලිම් පිරිමි බහුතරයක් රැව්ල වවන්නේ, තොප්පි දාන්නේ ඇයි?
75. චර්මඡේදනයේ වාසි අවාසි මොනවාද?

76. මුස්ලිම්වරුන් පරිනාමවාදය ගැන පවසන්නේ කුමක්ද?
77. සුන්නි සහ ශියා මුස්ලිම්වරු යනු කවුරුන්ද?
78. ලෝක අවසානය ගැන ඉස්ලාමයේ මොනවද පවසන්නේ?
79. ෂරියා නිතිය යනු කුමක්ද?
80. වැරදි කරල දෙවියන්ගෙන් පව් සමා කළාම දෙවියො සමාව දෙනවාද?
81. ඉස්ලාමයට අනුව කුසල් අකුසල් මනින්නේ කෙසේද?
82. මක්කා සහ මදීනා යන ස්ථාන මුස්ලිම්වරුන්ට පමණක් සීමා කර ඇත්තේ අයි?
83. වඩාත් ශ්‍රේෂ්ඨ අල්ලාහ්ද, ජේසු තුමාද, ශිව දෙවියොද, ශක්‍රයාද, බුදුන් වහන්සේද?
84. අල්ලාහ් දෙවියන්ගේ පිළිම හෝ රූප කිසිවක් දකින්නට නැත්තේ ඇයි?
85. මොහම්මද් නබි ﷺ තුමාගේ (ඇඳපු) රූපයක් හෝ පෙන්නන්න පුළුවන්ද?
86. ඉස්ලාමයට අනුව ලොකුම පාපය කුමක්ද? මව මැරීම, පියා මැරීම වගේ දෙයක්ද?
87. හැම දෙයක්ම සිදුවෙන්නේ අල්ලාහ් දෙවියන්ට ඕනි විදිහටද?
88. අල්ලාහ් මිනිසුන්ව මැව්වා නම් ආබාධිත අයව මැව්වේ ඇයි?
89. දුප්පත් අය පව්කාරයින්ද? පෝසත් අය පිං කර ඇති අයද?
90. දෙවියන්ට 'පිං දීම' ගැන ඉස්ලාමයේ දැක්ම කුමක්ද?
91. අල්ලාහ් සහ දෙවියන් (GOD) යන නම් සමානද?
92. අල්ලාහ් ඔහුගේ නිර්මාණ වලට අදාල සෑම කටයුත්තක්ම කරමින් ඉන්නවාද?
93. අල්ලාහ් (දෙවියන්) මිනිස් ස්වරූපයෙන් පැමිණෙනවාද?
94. ඇයි කුරානය තුලින් අල්ලාහ්ව ඔහු ලෙස හා සමහර තැන්වල අපි ලෙස සඳහන් කර ඇත්තේ?
95. මුස්ලිම් අය මක්කාවේ තිබෙන කාබාව (කළු බිල්ඩිම)ට නමදිනවාද?
96. මුස්ලිම්වරු දවසට පස් වතාවක් නමදින්නේ ඇයි? එය වැඩි නැද්ද? අපහසු නැද්ද?
97. යමෙක් ඉස්ලාම් දහම වැළඳ ගත් පසු නම වෙනස් කළ යුතුද?

98. සියළු ආගම් යහපත උගන්නනවා නම් ඇයි ඉස්ලාම් තමයි එකම සත්‍යය මාර්ගය ලෙස හඳුන්වන්නේ?

99. කුරානය පහළවූ රට වන සෞදි අරාබියේ වෙනත් ආගම් වලට අවසර නොදෙන්නේ ඇයි?

100. ඉස්ලාම් ආගම වඩා හොඳ නම් ඇයි මුස්ලිම් සමාජයේ හොඳ ලොව තුල ප්‍රසිද්ධ නැත්තෙ?

---

# දාවා පිළිබඳ හැඳින්වීම සහ එය ඉටු කරන ආකාරය.

da'wah දාවා (දා'වහ්) دعوة අරාබි වචනයෙහි පරිවර්ථනය "කැඳවීමක් නිකුත් කිරීම", "ආරාධනය" හෝ "ඇමතුම" යන්නයි. daʿwāt دَعْوات (දා'වාත්) දාවාත් එහි බහු වචනයයි.

ඉස්ලාමීය සන්දර්භය තුළ, මෙම වචනය භාවිතා කරන්නේ ඉස්ලාමයේ පණිවිඩය දෙසට, දෙවියන් වහන්සේ දෙසට, නිර්මාතෘ දෙසට, සත්‍යය දෙසට, සියලු මනුෂ්‍ය වර්ගයා සඳහා සර්වබලධාරි දෙවියන් වහන්සේ විසින් නියම කරන ලද නිවැරදි මාර්ගය දෙසට මිනිසුන්ව කැඳවීමේ, ආරාධනා කිරීමේ සහ ඔවුන්ට ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියටයි.

දාවාත් කටයුත්තේ නියැලෙන පුද්ගලයාව da'i داعي දායී කෙනෙකු ලෙස හඳුන්වයි.

දෙවිඳුන් මිනිසුන්ව නිර්මාණය කළේ ඔවුන් පරීක්ෂන අවස්ථාවකට මුහුණ දෙන්නක් ලෙසටය. එහිදී එම මිනිසුන් ආකාර දෙකක් ලෙස නිර්මාණය කර ඔවුන්ව පරීක්ෂා කරයි.

**1. දෙවියන්ගේ මාර්ගෝපදේශය ලද ජනතාව.**

දෙවියන්ගේ පණිවිඩය ලද ජනතාව [එනම්, නබිවරුන් සහ ඔවුන් වෙතින් පණිවිඩය ලද මුස්ලිම් ජනතාව] විසින් එය නොලද ජනතාවට පැවසිය යුතුය.

## 2. දෙවියන්ගේ මාර්ගෝපදේශය නොලද ජනතාව.

දෙවියන්ගේ පණිවිඩය නොලද ජනතාව එය පවසන නබිවරයාගෙන් හෝ (එය ලද සහ) එය ඉදිරිපත් කරණ අනිකුත් (මුස්ලිම්) ජනතාව ගෙන් එය ලබා ගත යුතුයි.

එයට අනුව මේ දෙගොල්ලන්ටම (50%-50%) වගකීම් ඇත යැයි අපේක්ෂා කල හැක. (මුස්ලිම් අය මෙය අන් අයට කීමට උත්සහ ගත යුතුයි, මුස්ලිම් නොවන අය මෙය සොයා ගැනීමට උත්සහ ගත යුතුයි). මේ ගැන වැඩි විස්තර මුස්ලිම්වරුන්ට දෙවියන්ගේ පරීක්ෂණය පහසුද? ලිපියෙහි සඳහන්ව ඇත.

### ❖ දාවා ආරම්භ වන්නේ නබිවරුන්ගෙනි.

දෙවියන් වහන්සේ වහී හෙවත් දිව්‍ය හෙළිදරව් මගින් තම පණිවිඩය සහ මාර්ගෝපදේශය නබිවරුන්ට ලබා දෙයි. නබිවරුන් එය ජනතාවට දැනුම් දෙයි. ඉන් පසු, එය පිළිගත් ජනතාව එය එතෙක් නොලැබූ ජනතාවට දැනුම් දෙයි. එසේ නොවුන හොත් නබිවරුන් සහ එය ලැබුණු සහ පිළිගත් අයද දෙවියන් ඉදිරියේ වරදකරුවන් බවට පත් වේ.

*ශුභාරංචි දෙන්නෙක් වශයෙන්ද, බිය ගන්වා අනතුරු අඟවන්නෙක් වශයෙන්ද අපි අපගේ දූතයින්ව යැව්වෙමු; (18:56)*

*(නබියේ!) නියත වශයෙන්ම අපි මිනිසුන්ගේ යහපත සඳහාම සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් පිරි මෙම ධර්මය ඔබ වෙත පහළ කළෙමු; (39:41)*

*(නබියේ!) මීට මෙර අපි දූතයින් බොහෝමයක් දෙනාව යැවූ) මේ අන්දමටම ඔබවද අපි (අපගේ දූතයා වශයෙන්) එක් සමූහයක් වෙත යැව්වෙමු. මොවුන්ගෙන් පෙරද (මොවුන්ගෙන්) විවිධ සමූහයන් ඉකුත්ව ගොස් ඇත්තාහ. (දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන් වෙත දූතයෙකු නොපැමිණියේය). එබැවින් අපි ඔබට වහී මගින් දැනුම් දෙන දැය මොවුන්ට ඔබ සමුදීරණය කර පෙන්වා දෙනු; (13:30)*

*නබියේ, ඔබගේ දෙවියන් ආදම්ගේ පරම්පරාවේ දරුවන් වන ඔවුන්ගේ පිටකොන්දෙන් ඔවුන්ගේ පරම්පරා දරුවන්ව ඉකුත් කර, ඔවුන් තමන්වම ඔවුන්ට සාක්ශියක් වශයෙන්ද තබා (ඔවුන්ට) "මා ඔබගේ දෙවියන් නොවේද"? යි විමසූ විට, "ඇත්තෙන්ම (ඒ ආකාරයටම) අපි සාක්ශි දරන්නෙමු" යැයි ඔවුන්ගේ පැවසීම (ඔබ ඔවුන්ට) මතක් කර දෙනු. (මන්දයත් මෙය කිසිවෙකුත් මතක් කර නොදුන් බැවින්) නියත වශයෙන්ම අපි මෙය අමතක කර දමා නොසැලිකිලිමත්ව සිටියෙමු" යැයි පරලොව දිනදී ඔවුන් නොකියා සිටීම සඳහාද..,(7:172)*

*සෑම වාර්ගිකයන් වෙතම (අපි යැවූ අපගේ දූතයාව ඔවුන්ට) සාක්ෂි වශයෙන් අපි කැඳවන (දිනය ගැන නබියේ! ඔබ ඔවුන්ට මතක් කර දෙනු); (16:84)*

මුහම්මද් නබි (ﷺ) තුමා මනුෂ්‍ය වර්ගයා වෙත එවන ලද අවසාන අනාගතවක්තෘවරයා සහ දෙවියන් වහන්සේගේ අවසාන දූතයා වේ. එතුමා නබිත්වය වසර 23ක් පුරා ඉටු කළේය. එතුමා (ﷺ) මිය යාමට පෙර දහම සම්පූර්ණ කළේය. එය එතුමාගේ සිට මුළු ලෝක වාසීන්ටම ලෝක අවසානය තෙක් වලංගු වේ. එසේම එය ප්‍රචාරය කිරීමට හොඳ අනුගාමිකයින් පිරිසක්ද බිහි කළේය. එම දහම පිරිසිදුව සහ සම්පූර්ණවම අද දක්ක්වාත් පැමිණ ඇත.

මුහම්මද් නබි (ﷺ) තුමාගේ අවසාන සමුගැනීමේ දේශනාවේදී, ඔහු මෙම බලගතු පණිවිඩය අවසන් කළේ, ***'පැමිණ සිටින අය නොපැමිණෙන අයට ප්‍රකාශ කරත්වා!'*** යන වචන සමඟිනි. එසේම එතුමා මෙසේද ප්‍රකාශ කළේය.***'(මගේ ඉගැන්වීම්) තනි වාක්‍යයක් වුවද ජනතාවට ප්‍රකාශ කරන්න'.***

එබැවින්, අල්ලාහ්ගේ මාර්ගයට මිනිසුන් කැඳවීමේ ක්‍රියාව විද්වතුන් සඳහා පමණක් අදහස් නොකෙරේ, ඒ වෙනුවට එහි මූලික මට්ටමින් හෝ පණිවිඩය ප්‍රචාරය කිරීම එය ලද සැමට පොදු ආඥාවකි, වගකීමකි.

විනිශ්චය දිනයේදී, මුස්ලිම් නොවන අයද අවසාන විනිශ්චයකරු වන අල්ලාහ්ට මුහුණ දෙන අතර ඔවුන්ගෙන් ඇදහිල්ල පිළිබඳව එහිදී ප්‍රශ්න කරනු ලැබේ. ඔබේ මුස්ලිම් නොවන මිතුරන්, සගයන්, සහ අසල්වැසියන් එවිට, ඔබ ඔවුන් වෙත මෙම පණිවිඩය ලබා දීමට අපොහොසත් වූ පුද්ගලයා ලෙස චෝදනා කළ හැකිය.

මේ නිසා ඔබ ඉස්ලාමයේ පණිවිඩය ප්‍රකාශ කළ යුතු අතර, එය ඔබේ දෛනික ජීවිතයේදී කතාවෙන් සහ ක්‍රියාවෙන්ද පෙන්නුම් කළ යුතුයි. දෙවියන් වහන්සේ කුරානයේ සඳහන් කරන්නේ ඔහු මුස්ලිම්වරුන්ව මධ්‍යම ජාතියක් බවට පත් කර ඇති බවත්, එබැවින් ඔවුන්ට සියලු මිනිසුන්ට සාක්ෂි දිය හැකි බවත්ය. අද ලොව ජනගහනයෙන් 25%ක් මුස්ලිම්වරුන්ය. ඉතිරි 75%ට මෙම පණිවිඩය ලබා දීම ඔවුන්ගේ වගකීමකි. දෙවියන් වහන්සේ මුස්ලිම්වරුන්ව තෝරාගෙන ඇත්තේ මනුෂ්‍යාත්වයට සේවය කිරීමට මෙන්ම දෙවියන්ගෙන් ඈත්වී සිටින මිනිසුන්ව නැවත දෙවියන් වහන්සේ (ගේ මාර්ගෝපදේශය) වෙත යොමු කිරීමටය.

මුස්ලිම් පවුල්වල උපන් ඔබ සහ පසුව ඉස්ලාම් දහම වැළඳගත් නවක මුස්ලිම්වරුන්ද, ඔබේ දෛනික ජීවිතය තුලින්ද ඉස්ලාමයේ පණිවිඩය රැගෙන යා යුතුය. එය ඔබේ වචන වලින්, ඔබේ චරිතයෙන්, අන් අය සමඟ කරන ඔබේ ගනුදෙනුවලින්, ඔබේ ව්‍යාපාර ගනුදෙනුවලින් සහ ඔබේ එදිනෙදා කාර්යයන් තුළින් පෙන්නුම් කළ යුතුයි. එසේ නොවුවහොත්, අපගේ අනාගතවක්තෘවරයා විනිශ්චය දිනයේදී ඔබට විරුද්ධව සාක්ෂිකරුවෙකු ලෙස ඉදිරිපත් විය හැකි අතර, මෙම වැදගත් කාර්යය නොසලකා හැරීම සම්බන්ධයෙන් ඔබට දෙවියන්වහන්සේගෙන් දඬුවම් ලැබිය හැකිය.

ඉස්ලාමීය පණිවිඩය අන් අයට පැවසීම, දෙවියන්ගේ මාර්ගය වෙත ආරාධනා කිරීම හෙවත් දාවා කටයුත්ත කිරීම කෙසේ කළ යුතු දැයි දෙවියන්ම මුස්ලිම්වරුන්ට පෙන්වා දී ඇත.

*(නබියේ!) ඔබ (මිනිසුන්ට) ප්‍රඥාවෙන්ද, අලංකාරවත් හොඳ ඔවදන් මගින්ද ඔබගේ දෙවියන්ගේ මාර්ගය දෙසට ආරාධනා කරණු මැනව! තවද ඔවුන් සමග (තර්ක කිරීමට සිදු වුවහොත්) ඔබ (ගෞරවණීය හා) අලංකාරවත් අන්දමින් තර්ක කරනු මැනව!; (16:125)*

පොත් පත් සහ Social media වැනි සම්ප්‍රේෂණ සාහිත්‍යය හරහා පමණක් සිදු නොවේ.

ඇත්ත වශයෙන්ම, ඉස්ලාමය නිරූපණය කිරීමට සහ ඉගැන්වීමට වඩාත්ම ඵලදායී හා වැදගත් ක්‍රමය වන්නේ මුස්ලිමෙය වටහා ගත් සමහර මුස්ලිම්වරුන්

(විවිධ සමජීය හේතු මත සෘජුවම ඉස්ලාමීය පණිවිඩය තම අසල්වාසීන්ට නොදුන්නත්, ඔවුන් වෙනත් ආකාරවලින්) එය ඔවුන් වෙත ලබා දීමට කටයුතු කරමින් සිටී. උදාහරණ කිහිපයක් පහතින් දැක්වේ.

❖ **වචන වලින් ඔබ්බට: චරිතය සහ ක්‍රියාව හරහා දාවාත් කිරීම.**

ඉස්ලාම් වචනය ප්‍රචාරය කිරීමේ ක්‍රියාව විවිධ ආකාරවලින් සිදුවිය හැකි අතර එය කථනය, දේශනා කිරීම හෝ්මවරයා හොඳ චරිතයක්, ශක්තිමත් පෞරුෂයක්, කරුණාවන්ත හැසිරීමක් සහිත මෘදු, අවංක, සත්‍යවාදී, හොඳ ජීවමාන ආදර්ශයක් වීමයි. (විශේෂයෙන්ම, ඉස්ලාමයේ කැඳවුම්කරුට පණිවිඩය ඵලදායී ලෙස ප්‍රකාශ කිරීම සඳහා මෙම ලක්ෂණ තිබිය යුතුය).

එවිට ඔවුන්ගේ පණිවිඩය ශක්තිමත්ව තබා ගැනීමට සහ අන් අය විසින්ද එය බැරෑරුම් ලෙස සැලකිය හැකිය. මෙම ගුණාංග නොමැතිව, කෙනෙකු ඉදිරිපත් කරන පණිවිඩය ශක්තිමත් නොවේ. අන් අය විසින් එය බැරෑරුම් ලෙස නොසලකනු ඇත. කෙනෙකුගේ චරිතය හෝ ක්‍රියාවන් අපකීර්තියට පත් වුවහොත් සහ ඔවුන්ගේ දේශනා සමඟ සමපාත නොවන්නේ නම්, ඔහුගේ පණිවිඩය බැරෑරුම් ලෙස නොසලකනු ඇත. සවන්දෙන්නන් ඔවුන්ගේ වචන විශ්වාස නොකරනු ඇත, විශේෂයෙන් ඔවුන් සොරකම් කරන්නේ නම්, බොරු කියන්නේ නම් හෝ වංචා කරන්නේ නම් ඔහුගේ දාවාත් සඳහා වන උත්සහය නිශ්ඵල විය හැක. අපගේ මුහම්මද් නබි (ﷺ) තුමා ඉස්ලාම් දේශනා කිරීමට දශක ගණනාවකට පෙර ඔහුගේ ප්‍රජාව අතර 'සත්‍යවාදීයා, විශ්වාසවන්තයා' ලෙස ප්‍රසිද්ධ විය.

දාවා යන්නට යහපත අණ කිරීමෙන් සහ නපුර තහනම් කිරීමෙන් තම ආගමේ ඇතැම් දුර්වල මුස්ලිම්වරුන්ට උපකාර කිරීම සහ මතක් කිරීම ද ඇතුළත් වේ.

❖ **ප්‍රජා සේවය සහ සමාජ බලපෑම හරහා දාවාත්**

සෑම කෙනෙකුම විද්වතෙකු හෝ දේශකයෙකු වීමට අදහස් නොකරන බවත් දාවාත් විවිධ ආකාරවලින් පැමිණෙන බවත් සැලකිල්ලට ගත යුතුය. මිනිසුන්ට

සහ සමාජයට ප්‍රතිලාභ සැලසීම සඳහා මිනිසුන්ට බොහෝ ආකාරවලින් දාවාත්හි නිරත විය හැකිය.

තම පවුල, තම ප්‍රජාව සහ පොදු සමාජය තම හැකියාවෙන් උපරිම ලෙස දියුණු කිරීම සෑම මුස්ලිම්වරයෙකුගේම යුතුකමකි. ජාතිවාදය, අයුක්තිය, දරිද්‍රතාවය, ආක්‍රමණ ආදියට එරෙහි සටන් සහ අරගලවල පෙරමුණ ගැනීමට මුස්ලිම්වරයෙකු සම්බන්ධ වී කැපවිය යුතුය.

මුස්ලිම්වරයෙකු යනු තම ප්‍රජාවට සහ පොදු සමාජයට යහපත සලසන අයෙකි. මුස්ලිම්වරයෙකු යනු අන් අයට වටිනා, සේවයක් කරන, අන් අයට ධනාත්මක වෙනසක් සහ බලපෑමක් ඇති කරන අයෙකි. එය ස්වේච්ඡා සේවය, සමාජ වැඩ, ප්‍රාදේශීය අනාථ නිවාසවලට උදව් කිරීම, දුප්පතුන්ට උපකාර කිරීම, උපදේශනය, දේශපාලන ක්‍රියාකාරිත්වය, පාසල් ගොඩනැගීම හෝ තම සම වයසේ මිතුරන්ට හෝ ප්‍රජා තරුණයින්ට උපදෙස් දීම වැනි ආකාරවලින් ද විය හැක.

නිදසුනක් වශයෙන්, මුස්ලිම් වෛද්‍යවරයෙකු සතියකට හෝ මාසයකට එක් දිනක් තම ප්‍රජාවට යම් සහනයක් ලබා දීම සඳහා කැප කළ හැකි අතර, සෞඛ්‍ය සේවා නොමැති අයට නොමිලේ සායනයක ස්වේච්ඡා සේවයක් ලබා දිය හැකිය.

මුස්ලිම්වරුන් තමාගේම කුසලතා, ශක්තීන්, අධ්‍යාපනය, පසුබිම සහ පෞරුෂය ගැන මෙනෙහි කළ යුතු අතර, දෙවියන් වහන්සේ තමන්ට ලබා දී ඇති විශේෂිත ගුණාංග සහ වරප්‍රසාද වෙනුවෙන් ස්තුති කර ඒවා අන් අයට ප්‍රයෝජනවත් වන පරිදි භාවිතා කළ යුතුය.

එම ගුණාංගයන් අන් අයට ඉගැන්වීම, නිර්මාණශීලිත්වය, නායකත්වය, දැනුම, මුදල්, රැකවරණ යන ආකාර වලින් පැමිණිය හැකිය. නබි (ﷺ) තුමාගේ උම්මතය හෙවත් වත්මන් ඉස්ලාමීය ප්‍රජාව සියළු කෝණවලින් උපකාර සහ සේවාවන් කරන අය විය යුතුය. දෙවියන් වහන්සේගේ අවසාන අනාගතවක්තෘවරයා මෙසේ පැවසීය: 'අල්ලාහ්ට වඩාත්ම ආදරණීයයා ජනතාවට වඩාත්ම ප්‍රයෝජනවත් වේ.'

මුස්ලිම්වරයෙකු මෙම සමාජ සේවා සහ සත්කාරක ක්‍රියාවන් අල්ලාහ්ට මිස අන් අයට පෙන්වීමේ අරමුණින් සිදු නොකල යුතු නමුත්, ඒවා ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීම හරහා මුස්ලිම් නොවන අයට හෝ ඒ කාරණය සඳහා දුර්වල හෝ ප්‍රායෝගික නොවන මුස්ලිම්වරුන්ට පවා හොඳ ආදර්ශයක් විය හැකි යයි සිතන්නේ නම් එසේ කිරීම වරදක් නොවේ.

සායනයක ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී නොමිලේ සේවාවන් ලබා දෙන ඉස්ලාමය නියෝජනය කරන හිජාබ් පැළඳ සිටින මුස්ලිම් වෛද්‍යාවරියක් හෝ හෙදියක් දුටු විට කෙනෙකුට ඉස්ලාමය කෙරෙහි ආශ්වාදයක් සහ කුතුහලයක් ඇති විය හැකිය. මේවාදා දාවාත් හී කොටස් වේ.

❖ **දාවාහි ඉවසීම සහ නිහතමානීකම:**

දාවා කාර්යයේ නියැලෙන තැනැත්තා ඉවසිලිවන්ත විය යුතු අතර යටත් නොවිය යුතුය හෝ බලාපොරොත්තුව නැති කර නොගත යුතුය. තමාගේ කුමන වචනය ශ්‍රාවකයාගේ හදවතේ රෝපණය වී ඔහුගේ ජීවිතයට ආලෝකය ලැබී කුමණ මොහොතේ වෙනස් වෙයිද යන්න අල්ලාහ් හැර කිසිවෙකු නොදනී.

දාවා කාර්යයේ නියැලෙන තැනැත්තාට අවබෝධ විය යුත්තේ තමාට කිසිවෙකුගේ හදවත හෝ මනස පරිවර්තනය කිරීමේ හැකියාවක් නොමැති බවයි. ඒ වෙනුවට, මඟ පෙන්වීම පැමිණිය හැක්කේ සර්වබලධාරී දෙවියන් වහන්සේගෙන් පමණි. තම මඟ පෙන්වීමට සුදුසුකම් ලත් අය කවුරුන්ද යන්න අල්ලාහ් දනී. දෙවියන් වහන්සේ ශුද්ධ වූ කුරාණයේ තම දූතයාට මෙසේ පවසයි:

*(නබියේ!) ඔබ කැමති අයව ඍජු මාර්ගයෙහි ඇතුළු කිරීමට නියත වශයෙන්ම ඔබට නොහැකිය. එහෙත් අල්ලාහ් තමන් කැමති අයවම ඍජු මාර්ගයෙහි ඇතුළු කරන්නේය. ඍජු මාර්ගයෙහි යා හැකි අය කවුරුන්දැයි ඔහුම හොඳින් දන්නේය. (28:56)*

දෙවියන් වහන්සේගේ දූතයින්ගේ මෙන්ම ඔවුන්ව අනුගමනය කරන මුස්ලිම්වරුන්ගේ කාර්යය සහ යුතුකම වන්නේ පැහැදිලි වචනවලින් සහ හැකි

තරම් කරුණාවන්තව අන් අයට පණිවිඩය මතක් කිරීමයි. ඉතිරිය දෙවියන් වහන්සේට භාරයි.

*"ඔබගේ යුතුකම පණිවිඩය ගෙන ඒම පමණි; තවද ගණන් බැලීම අප සතුය" (කුරානය 13:40)*

❖ **දාවාහ් දැනුම සහ අන්තර් ආගමික සංවාදය:**

දෙවියන් වහන්සේගේ පණිවිඩය ප්‍රකාශ කිරීමේ නිරත වන තැනැත්තාට අල් කුරාණයේ සහ සුන්නාවේ විස්තර කර ඇති පරිදි ඉස්ලාමීය කතිකාව පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වන අතර ඔහු ආමන්ත්‍රණය කරන කරුණු පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

යමෙකු වෙනත් ආගම්වල පුද්ගලයින් සමඟ සාකච්ඡා කරන්නේ නම් හෝ විවාද කරන්නේ නම්, ඔහුට හෝ ඇයට මෙම විශ්වාසයන් පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. පොදු පදනමක් ගොඩනඟා ගැනීමට සහ ඔවුන්ගේ ආගම තුළ ඔවුන් නොසලකා හරින තව්හීද් (ඒක දේවවාදය හෙවත් දෙවියන් වහන්සේගේ ඒකීයභාවය) ගැන ඔවුන් සමඟ කතා කිරීම වටින්නේය.

විවිධ විශ්වාසයන් අතර සමානකම් අවධාරණය කිරීමෙන් සහ පොදු පදනමක් ස්ථාපිත කිරීමෙන් ග්‍රන්ථයේ මිනිසුන්ට (එනම්, ක්‍රිස්තියානි සහ යුදෙව්වන්ට) දාවා ලබා දෙන ලෙස කුරානය මුස්ලිම්වරුන්ට උපදෙස් දෙයි. "ඔබ සහ අපි අල්ලාහ්ව (එනම් එකම මැවුම්කරු) හැර අන් කිසිවෙකුට නමස්කාර නොකළ යුතුය, එසේම ඔහු සමඟ කිසිදු සහකරුවෙකු සම්බන්ධ නොකළ යුතුය" යන්න ඔවුන්ට මතක් කර දිය යුතුය.

*"ශුද්ධ ලියවිල්ල ලත් ජනයිනි, අප හා ඔබ අතර පොදු කොන්දේසි වලට පැමිණෙන්න - අපි අල්ලාහ් හැර අන් කිසිවෙකුට නමස්කාර නොකරමු, ඔහු සමඟ කිසිවක් සම්බන්ධ නොකරමු, අල්ලාහ් වෙනුවට එකිනෙකා ස්වාමිවරුන් ලෙස නොගන්නෙමු." නමුත් ඔවුන් ප්‍රතික්ෂේප කළහොත්, "අපි ඔහුට යටත් වන මුස්ලිම්වරුන් බවට සාක්ෂි දරන්න" යැයි පවසන්න.(3:64)*

ග්‍රන්ථයේ ජනයා සමඟ සංවාදයක යෙදෙන විට, අපගේ ප්‍රධාන ඉලක්කය වන්නේ අපගේ පැහැදිලි සහ සත්‍ය ආගම ඉදිරිපත් කර ඔවුන්ට එක්වන ලෙස ආරාධනා කිරීමයි. ඔවුන්ගේ ඇදහිල්ල හෝ ග්‍රන්ථ වැරදි බව ඔප්පු කිරීමට සුසුදු කාලයක් සහ ස්ථානයක් සකසා ගන්නා තෙක් එය පහත් කොට සැලකීම නොකළ යුතුය. අපගේ ඉලක්කය වන්නේ අප පිරිනමන දෙය දෙවියන් වහන්සේගේ සැබෑ වචනය බවත් අපගේ ආගම දෙවියන් වහන්සේට පිළිගත හැකි එකම ඇදහිල්ල බවත් ඔප්පු කිරීමයි.

දෙවියන්වහන්සේ ගැන අවබෝධයක් හෝ දැණුමක් නොමැතිව වෙනත් දෑ නමදිමින් සිටින අයට තමන්ගේ නිර්මාතෘ මෙන්ම සියල්ලෙහි හිමිකරු වන සර්වබලධාරී දෙවියන්වහන්සේ ගැන සහ ඔහුගේ නිර්මාණ, ඔහුගේ මාර්ගෝපදේශ ගැන අවබෝධ කරවීමම ප්‍රමාණවත් විය හැක. ඔවුන්ගේ දහමෙහි අඩුපාඩු පෙන්වා දීමක් අප විසින් කළ යුතු නැත. එය ඔවුන්ම වටහා ගනීවි.

❖ **දාවාහි ආචාර ධර්ම: මෘදුකම සහ ගෞරවය**

දාවාහි සංවාදයේ යෙදෙන තැනැත්තාට ඉලක්කයක් ඇත. එය 'තර්කය ජය ගැනීම නොව, පුද්ගලයාට සත්‍ය පහදා දී පුද්ගලයාව දිනා ගැනීමය'. සමහර විට උණුසුම් තර්ක මගින් පුද්ගලයෙකු ඉස්ලාමයෙන් ඈත් කිරීම සිදු විය හැක.

දාවා දීමේදී, අනෙකාට වටිනාකමක් නැති බවක් දැනෙන්නට සැලැස්වීම හෝ ඔහුව හෙළා දැකීම නොකළ යුතුය. ආරාධනා කරන පුද්ගලයාගේ ආකල්පය මෘදු, කරුණාවන්ත සහ ලස්සන විය යුතුය. රළු ආකල්පයක් මගින් අධෛර්යමත් කර සත්‍යයෙන් මිනිසුන්ව ඈත් කළ හැකි බැවින්, මෘදු ලෙස පණිවිඩය ප්‍රකාශ කිරීම අත්‍යවශ්‍ය වේ.

ඇත්ත වශයෙන්ම, දෙවියන් වහන්සේ කුරානයේ නබි මුහම්මද් (ﷺ) තුමාට පවසන්නේ, ඔහු සමග මෙතෙක් ජීවත් වූ හොඳම මිනිසුන් ලෙස ප්‍රසිද්ධ තම සහචරයින්ට පණිවිඩය ප්‍රකාශ කිරීමේදී රළු සහ දැඩි නම්, ඔවුන් ඔහුගෙන් විසිරී යන බවයි.

*"[නබියේ!], අල්ලාහ්ගේ කරුණාවෙන් ඔබ ඔවුන් කෙරෙහි මෘදු විය. ඔබ දැඩි හා රළු (කතාවෙන් සහ හදවතින්) සිටියේ නම්, ඔවුන් ඔබෙන් විසිරී යනු ඇත; (3:159)*

විශේෂයෙන් නවක මුස්ලිම්වරුන් තම පවුලේ සහ සමීපතමයින්ට දවාත් ලබා දීමේදී මෙය වඩාත් සැලකිල්ලට ගත යුතුය. එසේ නොවුවහොත්, ඔබට ඔබේ ආදරණීයයන් බොහෝ සෙයින් ඔබෙන් දුරස් වීමට ඉඩ ඇත.

තමන් දෙවියෙකු ලෙස ප්‍රකාශ කර, ළදරුවන් සහ අහිංසක මිනිසුන් මරා දැමූ, මෙතෙක් ජීවත් වූ නරකම මිනිසා ලෙස සලකන සහ තමාව හදාවඩා ගත් පාරාවෝට ඉස්ලාමයේ පණිවිඩය මෘදු ලෙස දැනුම් දෙන ලෙස දෙවියන් වහන්සේ අනාගතවක්තෘ මූසා (අ.ස)ට සහ ඔහුගේ සහෝදරයා වන නබි හාරොන් (අ.ස)ට උපදෙස් දුන්නේය.

*"ඔබ දෙදෙනාම පාරාවෝ වෙත යන්න. ඇත්ත වශයෙන්ම, ඔහු අපරාධ කර ඇත. ඔහුට මතක් කර දීමට හෝ [අල්ලාහ්ට] බිය වීමට හැකි වන පරිදි මෘදු වචනයෙන් ඔහුට කතා කරන්න" (අල් කුරානය 20:43-44)*

❖ **දාවාහි සාර්ථකත්වය මැනීම: සංඛ්‍යාවට වඩා අභිප්‍රාය**

දාවාහි සාර්ථකත්වය මනිනු ලබන්නේ කෙනෙකුගේ අභිප්‍රාය සහ උත්සාහය අනුව මිස ඔවුන් ගෙන් ආගමට හැරෙන පුද්ගලයින් සංඛ්‍යාව අනුව නොවේ. කෙනෙකුට වසර ගණනාවක් දාවාහ් ලබා දිය හැකි අතර එක ආත්මයක්වත් ආගමට හැරවිය නොහැකි විය හැක.

ඇත්ත වශයෙන්ම, නූහ් නබිතුමා වසර 950 ක් පමණ ඉස්ලාමයේ පණිවිඩය දේශනා කළ අතර ඉතා සුළු පරිවර්තන කිහිපයක් පමණක් දුටුවේය. දෙවියන් වහන්සේ වෙනුවෙන් වන තමන්ගේ කාර්යයේ අභිප්‍රාය නිරන්තරයෙන් මතක තබා ගැනීම වැදගත් වේ.

❖ **දාවාහි විපාක: දිව්‍ය පිළිගැනීම සහ ආශිර්වාදය:**

ඉස්ලාමයේ වචනය පතුරුවා හැරීමට තමන්ට කාලය නොමැති බව හැඟෙන අය, දැනට දාවාහි වචනය පතුරුවන අය කාර්යබහුල පුද්ගලයින් බවත්, ඔවුන් තම කාර්යබහුල කාලසටහන් තුළ දාවා සඳහා කාලය වෙන් කරන බවත් වටහා ගත යුතුය. ඔවුන් එය වගකීමක් ලෙස සලකන ක්‍රියාකාරකමකි. ඔවුන් එසේ කරන්නේ නම් එසේ නොකරන ඔබේ තත්වය අල්ලාහ් ඉදිරියේ කෙසේ විය හැකිදැයි සිතන්න.

මේ ලෝකයේ කෙනෙකුට ප්‍රකාශ කළ හැකි හොඳම කතා විලාසය දෙවියන් වහන්සේගේ මාර්ගෝපදේශය වෙතට මිනිසුන්ව ආකර්ෂණය කරන ආරාධනා වචන බවත්, ඔවුන්ගේ මැවීමේ අරමුණ ග්‍රහණය කර ගැනීමට සහ අවබෝධ කර ගැනීමට අන් අයට ආරාධනා කිරීම බවත් දෙවියන් වහන්සේ පවසයි.

*"තවද, අල්ලාහ් වෙත ආරාධනා කර දැහැමිකම් කර, "නියත වශයෙන්ම, මම මුස්ලිම්වරුන්ගෙන් කෙනෙක්" යැයි පවසන කෙනෙකුට වඩා වචනයෙන් දක්ෂ කවුද (41:33)*

අපගේ නබි (ﷺ) තුමා මෙසේ පැවසීය: *'යමෙකු යහපත කිරීමට යොමු කරන්නේ නම්, යහපත කරන්නාට සමාන විපාක ලැබෙනු ඇත.'*

යමෙකු ඔබෙන් ඉස්ලාමය පිළිගන්නේ නම් හෝ පිළිනොගන්නේ නම් ද, එම උත්සාහය සඳහා ඔබට දෙවියන් වහන්සේගෙන් මහත් විපාක ලැබෙනු ඇත.

*කාලය මත සත්තකින්ම, මිනිසා තම ආයුෂ කාලය නිකරුනේ වියදම් කර නියත වශයෙන්ම පරාජිත මාර්ගයේ සිටින්නේය. එහෙත් කවුරුන්, විශ්වාසය තබා දැහැමි කාරනාවන්ද කර සත්‍යය කෙනෙකුට කෙනෙකු ඔවදන් දී (පාපයන් අතැහැර දැමීමෙහිද පින් ඇති දැය කිරීමෙහිද, ඇති වන අමාරුකම විද දරා ගන්නා ලෙසටද, කෙනෙකුට කෙනෙක් ඔවදන් දෙමින් සිටින්නෝද) ඔවුන් හැර. (මොවුන් පරාජිත වූවේ නැත) (103:1-3)*

# ඉස්ලාමය පිළිගන්නේ කෙසේද?

ඉස්ලාම් යනු ස්වභාවධර්මයට හිමි ආගමයි. ඉස්ලාම් පිළිගැනීම යනු තම හදවතින් (කැමැත්තෙන්) එයට ඇතුළු වීමයි. ස්වභාවධර්මය දෙවියන් විසින් නිර්මාණය කරන ලද නිර්මාණයකි. දෙවියන්වහන්සේ එම මැවිල්ලේ සෑම අංගයකටම ගැලපෙන ආකාරයෙන් තම ආඥා හෙළි කර ඇත. අපි කතා කරන්නේ දෙවියන්වහන්සේ මිනිසා මැවීමෙන් පසු ඔහුට හෙළි කළ ආඥා සහ මාර්ගෝපදේශ ගැන ය. එය පිළිගන්නා තැනැත්තා දෙවියන්වහන්සේගේ ආගම පිළිගත් පුද්ගලයෙකි. එය නිවැරදිව පිළිගැනීමෙන් ඔහු මුස්ලිම්වරයෙකු බවට පත්වේ.

ඉස්ලාමය පිළිගැනීමට පෙර ඔබ විසින් කළ යුතු කාරණා කිහිපයක්ද, ඉස්ලාමය තුලට පිවිසෙන ආකාරයද ඉස්ලාමය වෙත ඇතුළු වූ පසු ඔබ කළ යුතු කාරණා කිහිපයක්ද මෙම ලිපිය තුලින් පෙන්වා දී තිබේ.

ඉස්ලාම් ගැන නිවැරදි තොරතුරු දැනගැනීම සඳහා ඉස්ලාමීය විද්වතෙකු සමග කතා කරන්න. ඔහු ඔබට සර්වබලධාරී දෙවියන්වහන්සේ ගැන, ඔහුගේ නිර්මාණ ගැන, ඔහු තමාව නිර්මානය කර ඇති ආකාරය ගැන, තමා සහ දෙවියන්වහන්සේ අතර පවතින සම්බන්ධතාවය ගැන, ඒ හරහා ඇතිවන ඇඳහිල්ල සහ එය ක්‍රියාත්මක වන ආකාරය ගැන, දෙවියන් මිනිසාට දුන් මාර්ගෝපදේශය ගැන, අපගේ පෙර තත්වය, වර්ථමාන ජීවිතයේ අරමුණු, මරනින් මතු ත්ත්වය ආදී වශයෙන් ඔබට අවශ්‍ය මූලික කරුණු පහදා දෙයි. එම තොරතුරු ඔබේ හදවත සමගත් උරගා බලා ඔබේ විශ්වාසය පරීක්ෂා කරගන්න. එහිදී ඔබට අපැහැදිලි හෝ අමාරු ප්‍රශ්න ඇති වුව හොත් ඒවා ගැන අසන්නට බිය නොවන්න. ඒවා ගැන ප්‍රශ්න කිරීමෙන් ඔබ මෙම දහම ගැන හොඳින් ඉගෙන ගනු ඇත.

ඔබ මුස්ලිම්වරයෙකු වීමට සූදානම්ද නැතහොත් ඉස්ලාමය ගැන තව දුරටත් ඉගෙන ගැනීමට අවශ්‍යදැයි යන්න ඔබම තීරණය කරන්න. කිසිවෙකුත් ඔබට ඉස්ලාමය වෙත ඇතුළුවීමට බල කරන්නේ නැත. ඉස්ලාමීය ශුද්ධ ලියවිලි පිළිබඳව ඔබට දැනුවත් වීමට, පල්ලි නැරඹීමට සහ මුස්ලිම් ජනතාව සමඟ කතා කිරීමට ඔබට අවස්ථාව ඇත. ඔබ ඒවායින් ප්‍රයෝජනය ගන්න. ඔබ සිදු කළ

අධ්‍යනයන්, පර්යේෂණ සහ සංවාද මගින් මුස්ලිම් වීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඔබ තේරුම් ගෙන ඇති බවට විශ්වාසයක් ඇති වී තිබේ නම්, ඔබට ඇදහිල්ලේ සාක්ෂිය හෙවත් ෂහදාව පාරායනය කර එයට නිල වශයෙන් එක් වීමට සූදානම් විය හැකිය.

කෙසේ වෙතත්, ඔබ මුලින්ම අල්ලාහ්ව සහ කුර්ආනයේ ඇති වචන විශ්වාස කරන බවට සහතික විය යුතුය. ඔබට ස්ථිරභාවය පිළිබඳ දැඩි හැඟීමක් ඇති වන තුරු ප්‍රශ්නය සමඟ කාලය ගත කරන්න. ඉස්ලාමය ගැන නොදන්නා අයගෙන් උපදෙස් ගැනීමෙන් වැලකී සිටින්න.

අවසානයේ ඔබ ඔබෙන්ම මෙසේ අසන්න. සර්වබලධාරී එකම දෙවියන් වන අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බව මම විශ්වාස කරනවාද? මම දේවදූතයන් විශ්වාස කරනවාද? මම ශුද්ධ ග්‍රන්ථ විශ්වාස කරනවාද? මම අනාගතවක්තෘවරුන් විශ්වාස කරනවාද? විනිශ්චය දිනය, ස්වර්ගයේ සහ නිරයේ යථාර්ථය මම විශ්වාස කරනවාද? දෙවියන්ගේ ආඥාව මම විශ්වාස කරනවාද?

මේ සියල්ල එකකට එකක් සම්බන්ධ කාරනාවන් නිසා ඒ සියල්ල මතින් තමයි මෙම දහමේ සම්පූර්ණත්වය ඔබට දැකිය හැකි වන්නේ. ඉන් කුමණ හෝ කාරණාවක් කෙරෙහි සැක සහිත නම් නැවත ඒ ගැන ප්‍රශ්න කර පැහැදිලිතාවය ලබා ගන්න.

තවද ඔබ ඔබෙන්ම මෙසේ අසන්න, මම අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම යටහත් වීමට, ඔහුගේ නීති (ෂරියා) වලට කීකරු වීමට සහ ඊළඟ ජීවිතයට සූදානම් වීම සඳහා මගේ ජීවිතය ඔහුගේ නමස්කාරයට කැප කිරීමට සූදානම්ද? දෙවිඳුන් තහනම් කර ඇති දේවල් (එකවර හෝ ටික ටික හෝ අමාරුවෙන් හෝ) අත්හැරීමට මම සූදානම්ද? ඔබ දහම තුල ජීවත් වන විට මේ සියල්ල ඔබට පහසු වනු ඇත. දිනකට පස් වේලක් සලාතය කිරීම බැලූ බැල්මට අපහසු යැයි හැඟුනද, පසුව ඔබ එයට ප්‍රිය කරනු ඇත. ඔබ එහි ආශ්වාදය විඳිනු ඇත. මස්ජිදවල මුස්ලිම්වරුන් එම නැමදීම් වල නිරත වන්නේ ඔවුන්ගේම කැමැත්තෙනි.

ඉස්ලාමය පිළිගැනීම මෙලොව ජීවිතයේ සැප පහසුව තහවුරු කරන්නක් නොව. මුස්ලිම් සහ මුස්ලිම් නොවන සෑම මිනිසෙකුම මරණය තෙක් විවිධාකාර

පරීක්ෂන වලට මුහුන දිය යුතුය. ඉස්ලාම් පිළිගැනීමෙන් සහ එය භාවිතයෙන් ඔබට මානසික සුවය නම් ලැබෙන බව ස්ථිරය. ඔබට ඔබගේ ජීවන ගමන ගැන පැහැදිලිතාවය දැනෙනු ඇත. නමුත් සමහර විට ලෞකික ජීවිතයේ ප්‍රශ්න වලින් ඔබ සමහර විට පෙරටත් වඩා පීඩා විදීමටද ඉඩ ඇත.

ඔබට සැකයන් ඉතිරි වුවහොත්, වැඩිදුර පර්යේෂණ කරන්න, සහ සෑම ආකාරයකින්ම අධ්‍යාත්මිකත්වය සඳහා වෙනත් ප්‍රවේශයන් ගවේෂණය කරන්න. නමුත් ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන හෝ අල්ලාහ්ට අකීකරු වන අයට කුරානයේ පෙන්වා දී ඇති අනතුරු ඇඟවීම්වලට අවනත වන්න. මරණය කුමණ මොහොතේ අපව හසු කර ගනීදැයි කිසිවෙකුටත් කිව නොහැකිය.

ඔබට ඉතිරිව ඇති ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දෙන ලෙසත් ඔබට ඇති විය හැකි ඕනෑම සැකයක් ඉවත් කරන ලෙසත් ඔබේම වචන වලින් අල්ලාහ්ගෙන් ඉල්ලා යාච්ඤා කරන්න.

ඉස්ලාමයේ ප්‍රධාන විශ්වාසයන් හය කෙරෙහි ඔබ විශ්වාස කරන බව ඔබට විශ්වාස නම්, ඔබ තවත් ප්‍රමාද විය යුතු නැහැ. හැකි ඉක්මනින් ඔබේ ඇදහිල්ල පිළිබඳ සාක්ෂි දෙන්න. මෙය ෂහාදා පැවසීම ලෙස හඳුන්වයි. ඔබ ප්‍රමාද වී ඔබට ඛේදජනක දෙයක් සිදුවුවහොත්, සියලු නොඇදහිලිවන්තයන්ට අත්වන ඉරණමට ඔබ මුහුණ දෙනු ඇත.

දිගු ගමනක් ගොස් ඔබ ගැනීමට යන මෙම නව තීරණය ගැන මෙනෙහි කරන්න. ඉස්ලාම් පිළිගැනීම යනු ආපසු හැරීමක් නොමැති දැවැන්ත කැපවීමකි. ඉස්ලාමයෙන් තවත් හැරීමට තැනක් නැති බවත් ඔබට වැටහේවි.

ඔබ ෂහදා හෙවත් ඇදහිල්ලේ සාක්ෂිය පැවසීමට එකඟ නම්, එනම් මුස්ලිම්වරයෙකු වීමට නම්, ඔබ ඇදහිල්ලේ සාක්ෂිය නබි ﷺ තුමානන් පෙන්වා දී ඇති ආකාරයටම කළ යුතුය. ෂහදාව පැවසීමෙන් පසු ඔබ ජීවිත කාලය පුරාම ඉස්ලාමයට කැපවී සිටී.

ඔබට ෂහදාව තනිවම පැවසිය හැකිය. මන්ද එය සියල්ල දකින අල්ලාහ්ට සාක්ෂියකි. කෙසේ වෙතත්, අනෙකුත් මුස්ලිම්වරුන් විසින් හඳුනා ගැනීමට නම්,

සාක්ෂිකරුවන් ඉදිරියේ එය පැවසීම ඥානවන්තය. වඩාත් සුදුසු වන්නේ ඔබට සමීප පල්ලියේ ඉමාම්වරයෙකු සම්බන්ද කරගෙනම කිරීමය.

ෂහාදාවේ වචන සහ එහි තේරුම;

أَشْهَدُ أَنْ لَا إِلَٰهَ إِلَّا اللَّهُ، وَأَشْهَدُ أَنَّ مُحَمَّدًا رَسُولُ اللَّهِ

*"අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්, ව' අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්"*

***"මම සාක්ෂි දරනවා අල්ලාහ් හැර වෙන දෙවියෙකු නැති බවටත්, මම සාක්ෂි දරනවා මුහම්මද් අල්ලාහ්ගේ අනාගතවක්තෘවරයා බවටත්."***

ඔබත් ඔබගේ නිර්මාතෘ වන දෙවියන්වහන්සේත් අතර බැඳීමක් ඇති කර ගැනීම සඳහා ෂහදාව සම්පූර්ණයෙන්ම තේරුම් ගෙන එය අවංකව ප්‍රකාශ කළ යුතුය.

ෂහදාව ගැනීම ඔබේම නිදහස් තේරීමක් විය යුතුය. කිසිදු බලපෑමකින්, රැවටීමකින් හෝ බලහත්කාරයෙන් සිදු නොකළ යුතුය.

වචන නිවැරදිව උච්චාරණය කරන්න. ඔබට එය වෙනත් මුස්ලිම්වරයෙකු පවසා පෙන්වූ පසුව එයම ඔබට කිව කැක. ඔබ තනිව ශහදා පවසන්නේ නම් පටිගත කල හඬක් අනුගමනය කිරීමද ගැටලුවක් නොවේ.

ඉන් පසු ඔබව පිරිසිදු කරගන්න. එය සම්පූර්ණ නැමකි. එය ගුස්ල් යනුවෙන් හඳුන්වනු ලබයි. ගුස්ල් මුස්ලිම්වරුන් සිදු කරන චාරිත්‍රානුකූල පවිත්‍ර කිරීමකි. ෂහදා පැවසීමෙන් පසු ඔබ මෙසේ සම්පූර්ණ ස්නානය කල විට ඔබ දෙවියන් ඉදිරියේ නැවත උපන් (අලුත්) කෙනෙකු හා සමානය. ඔබ පිරිසිදුය. දෙවියන් පිළිගැනීමට පෙර ඔබ කළ සියළු පාප වලට ඔහු ඔබට සමාව දෙන බව පවසා ඇත. දැන් ඔබ හමුවේ කිසිවක් නොලියවූ සුපිරිසිදු ජීවන පොතක් ඇත. ඔබ ඉදිරියේදී කරන හොඳ සහ නරක එහි ලියවීමට පටන් ගනී. කුසල් වැඩි වශයෙන් ලියවා ගැනීමටත්, අකුසල් ලිවීම මග හරවා ගැනීමටත් ඔබ උත්සහ ගත යුතුයි. එය ඔබගේ වගකීමකි.

දැන් ඔබ මුස්ලිම්වරයෙකු විය. එම 'මුස්ලිම්වරයෙකු යන තත්වය' ආරාක්ෂා කර ගැනීමට ඔබ උත්සහ ගත යුතුය. ඒ වෙනුවෙන් ඔබට කළ යුතු කටයුතු කිහිපයක් පහතින් දක්වා ඇත.

- ඔබ දෛනික සලාතයන් 5 ඉටු කිරීම කළ යුතුය.
- ඉස්ලාමය තුල සකාත් නම් දුගී බද්දක් ගෙවීම පෙන්වා දී ඇත. ඔබගේ වත්කම් අනුව ඔබත් එය ගෙවීමට සුදුසුකම් ලබන්නේ නම් සෑම වසරකදීම ගනන් බලා ඔබ එය ගෙවිය යුතුය.
- රමදාන් මාසයේ අනිවාර්යයෙන්ම උපවාසයේ නිරත විය යුතුය.
- ඔබට හැකි නම් ජීවිතයේ එක වතාවක් හෝ හජ් වන්දනාව කිරීමට ඉදිරිපත් විය යුතුය.
- ඔබ කැමති නම් ඔබට සුදුසු ලෙස අලුත් නමක් භාවිතා කළ හැක. එය අනිවාර්ය නැත.
- ඔබ පුරුෂයෙකු නම් චර්මඡේදනය කිරීම ඔබට වඩා හොඳය. එය සෑම මුස්ලිම්වරයෙකුම කර ගනී.
- ඔබට හැකි නම් හජ් හජ් අනිවාර්යයි. උම්රා කිරීම සතුටුදායකයි, එහෙත් එය අනිවාර්ය නැත.

  ඊට අමතරව ඉස්ලාම් දහම පිළිබඳව අධ්‍යාපනය ලැබීම, දානය (සදකා) දීම, යහපත් ගුණ ගරුක චරිතයක් ගොඩ නගා ගැනීම, අන් අයට දහම පැවසීම, කුරානය පාඩම් කිරීම, නබි තුමාගේ සුන්නාව පිළිපැදීම, දෙවියන්ව වැඩි වශයෙන් සිහි කිරීම, තමන් වෙනුවෙන් සහ අන් අය වෙනුවෙන් ඇති යුතුකම් ඉටු කිරීම වැනි දේ හරහා ඔබටම යහපත් වන කුසල් රැස්කර ගත හැකි මාර්ග බොහෝමයක් ඉස්ලාමය තුල පෙන්වා දී ඇත. ඒවා අධ්‍යනය කර ක්‍රියාවට නගන්න උත්සහ ගන්න. ඉස්ලාමය තුල තහනම් කර ඇති ක්‍රියාවන්ගෙන් ඈත් වන්න උත්සහ ගන්න. කාන්තාවන්ට විශේෂ වූ කාරණා පෙන්වා දී ඇත.

දැනුම සහිත යහපත් මුස්ලිම්වරුන්ව සමීපව ඇසුරු කිරීම මගින් ඔබට ඔබගේ නව ජීවන ගමන තවත් පහසු වනු ඇත.

තම සුපුරුදු ඇදහිල්ලෙන් ඉවත්ව ඉස්ලාම් වෙත පිවිසි පසු ඔබට ප්‍රායෝගිකව මුහුන දීමට සිදුවන ගැටලු කිහිපයක්ද ඇත. නමුත් ඒවා මෙලොව වශයෙන් බලපාන තාවකාලික කාරණාය. ඉන් සමහර ඒවාට විසඳුම් තිබේ, තවත් සමහර ඒවාට ඔබට සම්පූර්ණ විසඳුම් හමු නොවීමටද ඉඩ ඇත. අපගේ අවසන් හුස්ම දක්වා අප සිටින්නේ දෙවියන් අප වෙත ලබා දී ඇති පරීක්ෂනය තුලය. විශ්වාසයෙන් සහ ඉවසීමෙන් එයට මුහුණ දීමට කටයුතු කරන්න.

අප සියල්ල දෙවියන් වෙතින් පැමිණි අය වන අතර අප සියල්ල නැවත යා යුත්තේද දෙවියන් වෙතමය. දෙවියන් වෙත යාමට පෙර අප ඊට සූදානම් විය යුතුය. එයයි අපගේ මෙලොව ජීවිතයේ අරමුණ සහ ඉලක්කය. දෙවියන්ගේ තෘප්තිය දිනාගත් කෙනෙකු ලෙස ඔබ ඔහුව හමු උනොත් ඔබ ජයග්‍රාහකයෙකි. එසේ නොවුන හොත් එවැනි අය අභාග්‍යවන්තයින්ය. එය මෙම විශ්වයම නිර්මාණය කළ සර්වබලධාරී දෙවියන්ගේ නියමයය.

අපත් ඔබ සැමත් දෙවියන්ගේ තෘප්තිය ලද්දවුන් බවට පත් වේවායි ප්‍රාර්ථනා කරමු.

---

## මුස්ලිම් නොවන අයට පණිවිඩයක්.

මෙම ලිපිය ලියන මම කලකට පෙර ඔබ වැනිම මුස්ලිම් නොවන කෙනෙකු ලෙසම සිටි නිසා ඉස්ලාම් ගැන මුස්ලිම් නොවන ශ්‍රී ලාංකික බහුතරයකගේ සිත් තුල මුල්බැස ගෙන ඇති ආකල්පය හොඳ වැටහීමක් ඇති කෙනෙකි. එය සරළවම කියනවා නම් (එවකට මට සහ) වර්ථමානයේ ඔවුන්ට, ඉස්ලාම් දහම සම්බන්ධව නම්, "එය ගැන වැඩි යමක් දැනගැනීමට හෝ අවශ්‍යයතාවයක් නැති එකකි". අද ඔවුන්ට මෙන්ම සත්‍යය ඉස්ලාමය ගැන කිසිවක් නොදැන සිටි මටද එවකට තිබුනේ එවැනිම සිතුවිල්ලකි.

මාව (සහ අප සැමව) නිර්මාණය කල දෙවි කෙනෙක් සිටින බව කලකට පෙර මා දැන සිටියේ නැත. එම දෙවියන්වහන්සේ විසින් නබිවරයෙකු හරහා මා වෙත (සහ අප සැම වෙත) මෙම ජීවිතයේ අරමුණ සහ අප නොදැන සිටි බොහෝ

කාරණා සහිතව මාර්ගෝපදේශයක් එවා ඇති බවත් දැන සිටියේ නැත. අද මුස්ලිම් නොවන බොහෝ අය මෙන්ම මෙන්ම එවකට මාද ඉස්ලාමය දුටුවේ එහි ප්‍රධාන ධර්ම ග්‍රංථ තුලින් නොව. සමහර මාධ්‍ය හරහා ලැබුණු පුවත් වලිනි, එසේත් නැතිනම් ඉස්ලාම් සමාජය නියෝජනය කරන මිනිසුන්ගේ එක් එක් වැඩ කටයුතු වලිනි, ඔවුන්ගේ ඇඳුම් වලිනි, ඔවුන්ගේ හැසිරීම් වලිනි. එම වරද මා අතින් සිදු උනා වගේම අද ඔවුන් අතින් සිදුවෙමිනුත් පවතී.

අප දහමක් හඳුනා ගත යුත්තේ එහි ඇති නිරවද්‍යය ප්‍රධාන ධර්ම මූලාශ්‍ර වලිනි. ඉස්ලාමයේ ධර්ම මූලාශ්‍ර අධ්‍යයන කල මම අද එම දැණුම උපයෝගී කරගෙන නවක මුස්ලිම්වරුන්ට සහ ඉස්ලාම් නොවන සිංහල භාශාව භාවිතා කරන ඔබලාටද ඉතාම ප්‍රයෝජනවත් වන පරිදි  ඉස්ලාමය ගැන සත්‍යය තොරතුරු උපයෝගී කරගනිමින් මෙම පොත සහ www.srmicenter.com https://srmi-center.webnode.page/ වෙබ් අඩවිය නිර්මාණය කලෙමි.

පාඨකයයන්ට අවශ්‍ය කරන තොරතුරු සහ ඔවුන්ට ඇතිවන සෑම ප්‍රශ්නයකටම පිළිතුරුද සහිතව මෙම වෙබ් අඩවිය සමන්විත බව මම විශ්වාස කරමි.

දැන්, මෙයත් සමග ඉස්ලාම් දහම ගැන මුස්ලිම් නොවන ඔබලාට අවශ්‍ය තරමටම තොරතුරු ඔබලාට තේරෙන භාෂාවෙන්ම ලැබී ඇත. තව දුරටත් යමක් දැන ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහාද විවිධ අයුරින් සහාය විය හැක.

ඉස්ලාමයේ පණිවිඩය ලැබුණු අය එය අන් අයටත් ලබා දීම (සෑම මුස්ලිම්වරයෙකුගේම) වගකීමකි.

පහත සඳහන් දෙවියන් වහන්සේගේ (එනම්, ඔබගේත් මගේත් නිර්මාතෘගේ) උපදේශනය දෙස බලන්න.

*(නබියේ!) ඔබ (මිනිසුන්ට) ප්‍රඥාවෙන්ද, අලංකාරවත් හොඳ ඔවදන් මගින්ද ඔබගේ දෙවියන්ගේ මාර්ගය දෙසට ආරාධනා කරනු මැනව! තවද ඔවුන් සමග (තර්ක කිරීමට සිදුවුව හොත්) ඔබ (ගෞරවණීය හා) අලංකාරවත් අන්දමින් තර්ක කරනු මැනව! ඔහුගේ මාර්ගයෙන් වැරද ගිය අය කවුරුන්ද යන්න නියත වශයෙන්ම ඔබගේ දෙවියන් හොඳින් දන්නේය. ඍජු මාර්ගයෙහි සිටින්නන්*

*කවුරුන් යන්නද ඔහුම හොඳින් දන්නේය. (16:125)* දෙවියන් වහන්සේ අප සමාජයට එවා ඇති අවසන් දේව දූතයානන් වන මොහම්මද් නබි (ﷺ) තුමාණෝ මෙසේ පැවසූහ:

*"එය තනි වාක්‍යයක් වුවද (මගේ ඉගැන්වීම්) මිනිසුන්ට ප්‍රකාශ කරන්න" (Sahih al-Bukhari 3461 In-book reference : Book 60, Hadith 128)*

පහත කාරණා වෙත ඔබේ විශේෂ අවධානය යොමු කරන්න.

මිනිසා අයිති මිනිසාගේ නිර්මාතෘටය.

මිනිසා මෙලොවට පැමිණියේද ඔහු වෙතින්මය.

මිනිසාට අවශ්‍යය පහසුකම් සපයන්නේද මිනිසාගේ නිර්මාතෘමය.

මිනිසා ගැන හොඳින්ම දන්නේත් මිනිසාගේ නිර්මාතෘම මිස වෙන කිසිවෙකුත් නොවේය.

මිනිසාට ගැලපෙනම දහම (හෙවත් මාර්ගෝපදේශය) විය යුත්තේද මිනිසාගේ නිර්මාතෘ විසින්ම මිනිසාට ලබා දුන් දහමමය.

මිනිසා මරණින් පසු ආපසු යන්නේද ඔහු වෙතමය.

තමන් මෙලොවදී කළ හොඳ නරක වලට නිසි ප්‍රතිඵල ලබා දෙන්නේද මිනිසාගේ නිර්මාතෘමය.

මිනිසාගේ නිර්මාතෘ විසින් ඔබට ඔහුගේ මාර්ගෝපදේශය වන ශුද්ධ වූ අල් කුරාණය අවසන් දේවදූත නබි මොහම්මද් (ﷺ) තුමා හරහා දැනටමත් එවා ඇත. එය සුරක්ෂිතව මුස්ලිම්වරුන් සතුව ඇත. එයයි මුස්ලිම්වරුන් මුස්ලිම් නොවන සෑම කෙනෙකුටම ලබා දිය යුතු වටිනාම පණිවිඩය. ඔබ මුස්ලිම් නොවන්නෙක් නම් මෙතෙක් ඉහත කාරණා ගැන නොදැන සිට හෝ නොදැනුවත්කමට එය ප්‍රතික්ෂේප කරමින් සිටි ඔබට, තව දුරටත් එය ප්‍රතික්ෂේප කළ හැකි දැයි දැන් ඔබ ඔබගේම හෘද සාක්ෂියෙන් විමසා බලන්න. මේ වන තෙක් ඔබ ඔබේම නිර්මාතෘ හඳුනාගෙන නැත. මෙය ඔබේ මව ප්‍රතික්ෂේප කිරීමට වඩා බරපතල පාපයක් බව

ඔබට දැන් සිතාගත හැකි යැයි මම විශ්වාස කරමි. ඔබ ආනන්තරීය පාපකර්මය ගැන අසා ඇත. එසේනම් එය මෙය හා සසඳා බලන්න. මෙම කාරණාව තහවුරු කරගැනීමට අවශ්‍යය සියළුම තොරතුරු මෙම වෙබ් අඩවියෙහි අංතර්ගත බව මම නැවත සඳහන් කරමි. ඔබ සියළු දෙනාටම මරණයට පෙර සත්‍යය අවබෝධ වී ඒ මත ක්‍රියාත්මක වීමට අවස්ථාව ලැබේවායි මම ප්‍රාර්ථනා කරමි. මෙම වෙබ් අඩවිය සැකසීමට භාවිතා කළ තොරතුරු මීට පෙර මා වෙත ලැබෙන ලෙස සකස් කර තිබූ සියළු දෙනාටත් දෙවියන්වහන්සේ ආශිර්වාද කරත්වා!

---

## බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි අයගෙන් කෙරෙන ඉල්ලීමක්!

මිනිසුන් අතරින් අවංකවම ආගමට දහමට ලැදිව කටයුතු කරන්නන් පිළිබඳව අප කාතුලත් ඇත්තේ යහපත් සිතුවිල්ලකි. සෑම දහමකින්ම මිනිසාව යහමග යැවීමට උපදෙස් ලබා දී ඇත. එම උපදෙස් බොහෝ විට සෑම ආගමකම බොහෝ දුරට සමානතාවයකින් යුක්තය. යම් යම් කාරණා කිහිපයකදී ආගම් අතර වෙනස්කම් දැකිය හැක.

කුමණ හෝ ආගමක් දහමක් ගැන සොයන්නා, ඇහුම්කන් දෙන්නා සහ දෙසන්නා මේ ලොව තුල සිටි ශ්‍රේෂ්ඨතම පුද්ගලයින්ව අනුගමණය කරන්නෙකි. බුදුන් වහන්සේත්, යේසුස් වහන්සේත්, මොහම්මද් නබි (ﷺ) තුමත් හින්දු දහමේ සිටි පණ්ඩිත්වරුත් ශ්‍රේෂ්ඨත්වයට පත් උනේ සත්‍යය සෙවීමෙනි, ඇහුම්කන් දීමෙනි, එසේම තමා පිළිගත් සත්‍යය ලොවට දේශනා කිරීමෙනි.

කුමණ හෝ ආගම දහමකට දර්ශනයකට ලැදි නැති, ඒ පිළිබඳව උවමනාවක් උනන්දුවක් නැති සහ, තමා සත්‍යය යැයි විශ්වාස කරන ආගම දහම සම්බන්ධ තොරතුරු අන් අය සමගත් බෙදා නොගනිමින් ආත්මාර්ථකාමීව සිටින අයගේ මනුෂ්‍යත්වයේ ඇති ඵලය කුමක්ද? මිනිසුන්ට එකිනෙකා සමඟ කතා කිරීමට මීට වඩා හොඳ මාතෘකාවක් තවත් තිබේද? බුදුරදුන් හා නබිවරුන්ට අනුව මෙය උසස්ම කාර්යයකි.

ඔබ කුමන දහමක් ඇදහුවත් එහි ඔබ වඩාත් සිත් ගත් වැකි කිහිපයක් අකුරින් සටහන් කරමින් හෝ ධර්ම මූලාශ්‍රයේ ඡායාරූප භාවිතා කරමින් මා වෙතත් එවන්න. මූලාශ්‍රයේ නම, පරිච්ඡේදයේ නම, වැකි අංක ආදිය සමගම එවන්නට වගබලාගන්න. (Our email:- srmicenter@gmail.com)

ඉස්ලාම් දහමට අදාලව ශුද්ධ වූ කුරානය තුලින් මා සිත් දිනාගත් වැකි කිහිපයකුත් ලිපිය අවසානයේ සඳහන් කර ඇත.

ඇත්තටම අද ලොව තුල සිදුවිය යුත්තේ මෙය නොවේද? සත්‍ය සොයා යන්නන්ට මීට වඩා හොඳ ක්‍රමයක් තවත් ඇත්ද?

**ශුද්ධ වූ කුරානය තුලින් මා සිත් ගත් වැකි කිහිපයක් මෙහි සඳහන් කර ඇත.**

*ශුද්ධ වූ කුරානය වන මෙය ධර්ම පුස්තකයයි. මෙහි කිසිම සැකයක් නැත. භය භක්තිකයින්ට (මෙය) ඍජු මාර්ගය පෙන්වන්නේය.(2:2). මෙය අනාවරණය උනේ විශ්වයේ අධිපති වූ අල්ලාහ් (දෙවියන්) ගෙනි:"(32:2). "අපි තමයි මෙම ග්‍රන්ථය පහල කලේ. අපිම එය ආරක්ෂා කරන්නෙමු"(15:9). 'ඔවුන් මෙම කුරානය ගැඹුරින් අවධානය කල යුතු නොවේද? මෙය දෙවියන්ගෙන් හැර වෙනත් කෙනෙකුගෙන් පහල වූ පුස්තකයක් නම් මෙහි අනන්තවත් වැරදි හා භේදයන් ද ඔවුන් විසින් දකින්නට තිබුණි'(4:82). මිනිසුන්ට හොඳ වැටහීමක් ලබා ගැනීම පිනිසම මෙම කුරානය නියත වශයෙන්ම අපි ඉතාමත් පහසු කර ඇත්තෙමු. එබැවින් (මෙමඟින්) හොඳ වැටහීමක් ලබන්නන් කවුරුන් හෝ ඇත්ද?(54:17). "නබිතුමා විසින් මෙය ගොතනු ලැබුවක් යැයි සමහරු කියනවා නම් ඔවුන්ට කියන්න, පුලුවන්නම් මෙහි සඳහන් ආකාරයේ පරිච්ඡේද එකක් නිර්මාණය කර පෙන්වන්න කියා.(2:23-25). (අපගේ) දූතයාණෙනී! ඔබගේ දෙවියන්ගෙන් ඔබට පහළ කරන ලද දෑය (කිසිම අඩුපාඩුවකින් තොරව ඔවුන්ට) දැනුම් දී හරිනු. ඔබ (එසේ) නොකලහොත් ඔවුන්ගේ දූත මෙහෙවර ඔබ ඉටු කල කෙනෙකු බවට පත්වන්නේ නැත. (මෙහිදී ඔබ කිසිවෙකුටවත් බිය නොවනු). මිනිසුන්ගේ (නපුරෙන්) අල්ලාහ් ඔබව (ආරක්ශා කර) බේරා ගනු ඇත.(5:67). මීට පෙරද මිනිසුන්ට ඍජු මාර්ගෝපදේශයන් වශයෙන් තිබුණු (පව්, පින්) වෙන් කර දැනුම්දිය හැකි (අනිත්) දැයද පහළ කර ඇත්තේය. (3:4).*

සටහන:- ඉහත වැකි කිහිපය හරහා එම ධර්මය පිළිබඳව මනා විශ්වාසනීය භාවයක් ඇති කරන නිසා ඒවා මා සිත් ඇඳබැඳ ගත්තේය. හරි පුදුමයි! විශ්වයේ අධිපති විසින් මිනිසාට මාර්ගෝපදේශයක් එවා, එහි කිසිදු අඩුපාඩුවක්ද නැති බවත් පවසා එය ආරාක්ෂාවට ලක් වූ දහමක් බවත්, එහි මිසිසාට ඍජු මාර්ගය ඇති බවත් පවසා එවැනි දහමක් වෙන කිසිවෙකුටත් ඉදිරිපත් කල නොහැකි බවට අභියෝගත් ඉදිරිපත් කල ඇත. මීට පෙර සිටි ජනතවටද මෙලෙස දෙවියන්ගේ මාර්ගෝපදේශ ලබා දී ඇති බවත් මෙම කාලයට වලංගු නබිවරයාට අල් කුරානය පහළ කර එය ජනතාවට දැනුම් දෙන ලෙසටද දෙවියන් උපදෙස් දී ඇත.

*නියත වශයෙන්ම අපි මිනිසාව ඉතාම ලක්ෂණ ස්වරූපයෙන් උත්පාදනය කර ඇත්තෙමු.(95:4). ඔබගෙන් කවුරුන් ක්‍රියාවන්ගෙන් ඉතාමත් අලංකාරවත් කෙනෙකුද යන්නෙහි ඔබව පිරික්සනු පිනිසම ඔහු ජීවිතයද මරණයද උත්පාදනය කර ඇත්තේය.(67:2). ඔහුම (තම) නියෝජිතයින් වශයෙන් භූමියෙහි ඔබව පත් කර ඇත්තේය. තවද ඔබගෙන් සමහරෙකුව අනිත් අයට වඩා පදවි වලින් උසස් කර ඇත්තේය. (මෙමගින්) ඔබට ලබා දී ඇති දැයෙන් (ඔබ කෙසේ නම් කටයුතු කරන්නේදැයි) ඔබව පරීක්ෂා කරන්නේය;(6:165). (මනුෂ්‍යයිනි!) ප්‍රාණයක් නොමැතිව තිබූ ඔබට ඔහුම පණ දී තිබියදී, ඔබ අල්ලාහ්ව කෙසේ නම් ප්‍රතික්ශේප කරන්නෙහුද? ඉන් පසුවද ඔහුම ඔබව මරණයට පත් කරන්නේය, පසුවද ඔහුම ඔබට පණ දෙන්නේය. (ඉන්) පසුවද ඔබ (ඔබගේ කළකම් සඳහා ඵලවිපාක අත්කර ගැනීම සඳහා) ඔහු වෙතම (විනිශ්චය සඳහා) ගෙන එනු ලබන්නෙහුය.(2:28).*

සටහන:- අපගේ ජීවිතය ආරම්භ වීම ගැන සහ එයට අරමුණක් ඇති බවත්, මරණයට පසු අප නැවත දෙවියන් වෙතම යා යුතු බවත් පවසා ඇත. එනම් අප පිළිබඳවත් මුල මැද සහ අග පිළිබඳව තොරතුරු දන්වා ඇත.

*'ඔබගේ හිමි මී මැස්සන්ට වැටහීම දෙන්නේය. කඳු, ගස් හා උස වූ ගොඩනැගිලිවල නුඹලා මී වද බඳිනු, තවද නුඹලා සෑම පලතුරු (වර්ගවල ඇති මල්) වලින් රොන් උරා බී ඔබ හිමිගේ පහසු මාර්ගයෙහි (නුඹලා ගේ නිවෙස් තුලට) ඇතුළු වනු. මෙයින් උගේ උදරයන්හි වර්ණ කිහිපයකින් යුත් පැණියක් (මී*

*පැණි) වැහෙන්නේය. එයින් මිනිසුන්ට සුවය ඇත. අත්තෙන්න්ම මෙහිද සිතා වටහා ගන්න ජනතාවට සාක්ෂියක් ඇත'. (16:68/69).*

සටහන:- මෙම වැකිය මා සිත් ඇඳබැඳ ගැනීමට හේතුව නම්, මේ හරහා අපට ලැබෙන පණිවිඩය ඉතා විශාලය. සතුන්වත් නිර්මාණය කල දෙවිදුන් ඔවුනට සුවිශේෂී හැකියාවන් ලබා දී ඇති බවත්, සොභාදහම දෙවියන් විසින් මනා සැලසුමකින් නිර්මාණය කර ඇති බවත්, එහි පාලන කටයුතුද දෙවියන් විසින්ම සිදු කරන බවත් මේ හරහා අපට වටහා ගත හැක. දෙවියන් මී මැස්සාට දැණුම දුන්නා නම් අප ද ලබා ගන්නා දැණුමෙහි හිමිකරු දෙවියන්ම විය යුතුය.

උදාහරනයකින් පවසනවා නම්, අපි GPS තාක්ෂණය සොයාගෙන මාර්ග වල ගමන්මග දැන ගැනීමට සමත්ව ඇත. දෙවියන් මී මැස්සන්ට, වවුලන්ට, කැස්බෑවන්ට තම ගමන් මග සොයා ගැනීමට වැටහීම ලබා දී ඇත්නම් අප GPS තාක්ෂණය සොයා ගත්තේ අපේ හැකියාවෙන්දැයි නැවත කල්පනාකර බැලිය යුතු නොවෙදැයි මම අදහස් කරමි. එනම් අපගේ මෙලොව ජීවිතයේ පරීක්ෂනය වෙනුවෙන් අවශ්‍යය සියළුම වටපිටාව දෙවියන් විසින්ම සපයමින් සිටී.

*කාලය මත සත්තකින්ම. මිනිසා තම ආයුෂ කාලය නිකරුනේ වියදම් කර නියත වශයෙන්ම පරාජික මාර්ගයේ සිටින්නේය. එහෙත් කවුරුන්, විශ්වාසය තබා දැහැමි කාරනාවන්ද කර සත්‍යය කෙනෙකුට කෙනෙකු ඔවදන් දී (පාපයන් අතැහැර දැමීමෙහිද පින් ඇති දැය කිරීමෙහිද, ඇති වන අමාරුකම විද දරා ගන්නා ලෙසටද, කෙනෙකුට කෙනෙක් ඔවදන් දෙමින් සිටින්නෝද) ඔවුන් හැර. (මොවුන් පරාජිත වූවේ නැත).(103:1-3)*

සටහන: කුරානයෙහි 103 වන මෙම පරිච්ඡේදය ජීවිතය ජය ගැනීමට අප විසින් කල යුතු දේ පිළිබඳව අපගේ නිර්මාතෘ සාරාංශ කර පවසා ඇත.

මෙහි විශ්වාසය තබා යන්න ඉතා වැදගත් ය. මිනිසුන් වන අප විශ්වය හා සසඳා බැලීමේදී ඉතාම නොගැනිය හැකි තරම් (වැලි කැටයක් වැනි)ය. අපි සියල්ල දන්නෝ නොවෙති. අප සියල්ල් දැකීමට හෝ සියල්ල සොයාගැනීමට හැකියාව ඇත්තෝද නොවෙති. අපට දෙවියන්ව දැකීමටද හැකියාව නැත. නමුත් දෙවියන් අප වෙත පහළ කර ඇති මාර්ගෝපදේශය දෙස බලා ඒ තුලින් අපට දෙවියන්

කෙරෙහි විශ්වාසය තැබිය හැක. අපගේ ආත්මය ගැන, මරනින් මතු තත්වය ගැන අපට වටහා ගැනීමට ඇති හොඳම මාර්ගය ලෙස මා වටහා ගත්තේ එය අපගේ නිර්මාතෘ ගෙන්ම දැනගැනීමය. ඔහු අපට විශ්වාස කල යුතු කරුනු පෙන්වා දී ඇත. එම විශ්වාසය සමග යහපත් ක්‍රියාවල නියැලෙන අයට ජයග්‍රහනය කල හැකි බව දෙවියන් පෙන්වා දී ඇත. ස්වර්ගය සහ අපාය ගැන අපට යම් ආදහසක් ඇත. ඒවායේ නිර්මාතෘ ද ඒවායේ පාලන කටයුතු කරන දේවදූතවරුන්ද දෙවියන්ගේම නිර්මාණ බව දැන ගත් පසු ඒ ගැනද හොඳ පැහැදිළි තාවයක් ඇති විය.

# මොහම්මද් නබි (ﷺ) තුමාගේ මිතුරන් (සහාබිවරුන්).

මුහම්මද් නබිතුමාගේ මිතුරන් වන සහබාවරු ඉස්ලාමයේ අතිමහත් වැදගත්කමක් දරති. ඔවුන් අනාගතවක්තෘවරයා සමඟ සෘජුව සම්බන්ධ විය. කුර්ආනය සහ සුන්නාහ් සම්ප්‍රේෂණය කිරීම, ඔවුන්ගේ ආදර්ශමත් චරිතය සහ දහම වෙනුවෙන් දැක්වූ දැඩි කැපවීම, ඔවුන් ඉටුකළ කායීභාරය ආදිය මුල් මුස්ලිම් ප්‍රජාවට සහ ලොව අවසන් වන තෙක් වන අනාගතයට මහඟු පිටිවහලකි. ඔවුන්ගේ නම් කිහිපයක් මෙහි ඉදිරිපත් කර ඇත. ඒ නම් හරහා යමින් ඔවුන් ගැන වැඩි තොරතුරු දැනගත හැක.

- මොවුන්ගෙන් බහුතරයක් නවක මුස්ලිම්වරුන්ය. එනම් ඔවුන් නබි තුමානන් ගේ දහම් පණිවිඩය අසා ඉස්ලාමය අලුතින් වැළඳ ගත් අයයි. එසේත් නැතිනම් එවැන්නන්ගේ දරු මුණුපුරන්ය.

| | | |
|---|---|---|
| 1. Abdullah ibn Abi Quhafa | 2. Ali ibn Abi Talib | 3. Aqeel ibn Abi Talib |
| 4. Abdullah ibn Ja'far | 5. Abdur-Rahman ibn Abu Bakr | 6. Abdur-Rahman ibn Sakran |
| 7. Abd al-Rahman ibn Awf | 8. Abdullah ibn Abbas | 9. Abd-Allah ibn Abd-Allah ibn Ubayy |
| 10. 'Abd Allah ibn 'Amr ibn al-'As | 11. Abdallah ibn Amir | 12. Abdullah ibn al-Zubayr |
| 13. Abdullah ibn Hudhafah as-Sahmi | 14. Abdullah ibn Jahsh | 15. Abdullah ibn Masud |
| 16. Abdullah ibn Suhayl | 17. Abd Allah ibn Hanzala | 18. Abd Allah ibn Mas'ada al-Fazari |
| 19. 'Abd Allah ibn Rawahah | 20. Abdullah ibn Salam | 21. Abdullah ibn Unais |
| 22. Abdullah ibn Amr ibn Haram | 23. Al-Harith ibn Awf | 24. Abdullah ibn Umar |

| | | |
|---|---|---|
| 25. Abd-Allah ibn Umm-Maktum | 26. Abdullah ibn Atik | 27. Abbad ibn Bishr |
| 28. Abu Basir | 29. Abu Rafi' al-Qibti | 30. Abu Bakra al-Siddeek |
| 31. Abu Darda | 32. Abū Āmir b. Wāthila al-Kinānī | 33. Abid ibn Hamal |
| 34. Abid ibn Hunay | 35. Abjr al-Muzni [ar] | 36. Abu al-Aas ibn al-Rabiah |
| 37. Abu Ayyub al-Ansari | 38. 'Abbas ibn 'Abd al-Muttalib | 39. Abû Dhar al-Ghifârî |
| 40. Abu Dujana | 41. Abu Fukayha | 42. Amir ibn Fuhayra |
| 43. Abu Hudhaifah ibn Mughirah | 44. Abu-Hudhayfah ibn Utbah | 45. Abu Hurairah |
| 46. Abu Jandal ibn Suhail | 47. Abu Lubaba ibn Abd al-Mundhir | 48. Abu Musa al-Ashari |
| 49. Abu Qatada al-Ansari | 50. Abu Quhafa | 51. Abu Sa`id al-Khudri |
| 52. Abd Allah ibn `Abd al-Asad | 53. Abu Sufyan ibn al-Harith | 54. Abu Sufyan ibn Harb |
| 55. Abu Ubaidah ibn al-Jarrah | 56. Abu Talhah al Ansari | 57. Abu Zama' al-Balaui |
| 58. Abzâ al-Khuzâ`î [ar] | 59. Adhayna ibn al-Hârith [ar] | 60. Adî ibn Hâtim at-Tâî |
| 61. Aflah ibn Abî Qays [ar] | 62. Ahmad ibn Hafs [ar] | 63. Ahmar Abu `Usayb [ar] |
| 64. Ahmar ibn Jazi [ar] | 65. Ahmar ibn Mazan ibn Aws [ar] | 66. Ahmar ibn Mu`awiya ibn Salim [ar] |
| 67. Ahmar ibn Qatan al-Hamdani [ar] | 68. Ahmar ibn Salim [ar] | 69. Ahmar ibn Suwa'i ibn `Adi [ar] |
| 70. Ahmar Mawla Umm Salama [ar] | 71. Ahyah ibn Umayya ibn Khalaf [ar] | 72. Ahzâb bin Usaid (pronounced with an alif) |
| 73. `Âisha bint Abî Bakr | 74. Al-'Ala' Al-Hadrami | 75. Al-Bara' ibn Mâlik al-Ansârî |
| 76. Al-Bara' ibn Azib | 77. Al-Hakam ibn Abi al-As | 78. Al-Mughira |
| 79. Abdullah ibn Abi Bakr | 80. Al-Qa'qa'a ibn Amr at-Tamimi | 81. Ammar bin Yasir |
| 82. Amr bin Al`âs | 83. Amr ibn al-Jamuh | 84. Amru bin Ma'adi Yakrib |
| 85. Anas ibn Nadhar | 86. Anas ibn Mâlik | 87. An-Nu`aymân ibn `Amr |
| 88. An-Nu`mân ibn Muqarrin | 89. Arbad ibn Humayrah | 90. Āqil ibn al-Bukayr |
| 91. As'ad ibn Zurarah | 92. Al-Arqam ibn-abil-Arqam | 93. Asmâ' bint Abî Bakr |
| 94. Asmâ' bint Umays | 95. Asim ibn Thabit | 96. Asim ibn Amr al-Tamimi |
| 97. Atika bint Abdul Muttalib | 98. Atiqa bint Zayd | 99. Attab ibn Asid |
| 100. At-Tufayl ibn Amr ad-Dawsi | 101. Ayman ibn Ubayd | 102. Ayyash ibn Abi Rabiah |
| 103. Abu Mihjan as Tsaqafi | 104. Amir bin al-Akwa | 105. Bashir ibn Sa'ad |
| 106. Bilal ibn Malik al-Mazni [ar] | 107. Bilal ibn Rabah al-Habashi | 108. Bilal ibn al-Harith |
| 109. Bilal ibn Yahya [ar] | 110. Busr ibn Abi Artat | 111. Dihyah ibn Khalifa al-Kalbi |
| 112. Dhiraar bin Al-Azwar Al-Asadi | 113. Dhiraar ibn al-Khattab | 114. Dhimad Al-Azdi |
| 115. Fadl ibn Abbas | 116. Fatima az-Zahra bint Muhammad | 117. Fatima bint Al-Aswad |
| 118. Fatima bint Asad | 119. Fayruz ad-Daylami | 120. Fatimah bint al-Khattab |
| 121. Fatima bint abi salama | 122. Habiba bint Jahsh | 123. Hammanah bint Jahsh |
| 124. Hasan ibn Ali | 125. Husayn ibn Ali | 126. Ḥamza ibn ʿAbd al-Muṭṭalib |

| | | |
|---|---|---|
| 127. Hanzala Ibn Abi Amir | 128. Hudhayfah ibn al-Yaman | 129. Ibrahim ibn Muhammad |
| 130. Ikrima ibn Abi Jahl | 131. Imran ibn Husain | 132. Iyad ibn Ghanm |
| 133. Jaban al-Kurdi | 134. Jabr | 135. Jabir ibn Abdullah al-Ansari |
| 136. Jafar ibn Abi Talib | 137. Jahsh ibn Riyab | 138. Jamila bint Thabit |
| 139. Jubayr ibn Mut'im | 140. Julaybib | 141. Jumanah bint Abi Talib |
| 142. Juwayriya bint al-Harith | 143. Ka'ab ibn malik | 144. Ka'b ibn Zuhayr |
| 145. Khadijah bint Khuwaylid | 146. Khalid ibn Sa`id | 147. Kharija bin Huzafa |
| 148. Khawlah bint Hakim | 149. Khawlah bint al-Azwar | 150. Khawlah bint Tha'labah |
| 151. Khubayb ibn Adiy | 152. Khunais ibn Hudhafa | 153. Khuzayma ibn Thabit |
| 154. Khabbab ibn al-Aratt | 155. Al-Khansa | 156. Khalid ibn al Walid |
| 157. Labid ibn Rabi'a | 158. Layla bint al-Minhal | 159. Lubaba bint al-Harith |
| 160. Lubaynah | 161. Malik al-Dar | 162. Malik bin Huwairith |
| 163. Maria al-Qibtiyya | 164. Marwan ibn al-Hakam | 165. Maymuna bint al-Harith |
| 166. Malik ibn an-Nadr | 167. Miqdad ibn al-Aswad | 168. Mu`adh ibn `Amr |
| 169. Mu`adh ibn Jabal | 170. Mu'awiya ibn Abi Sufyan | 171. Mughira ibn Shu'ba |
| 172. Mu`awwaz ibn `Amr | 173. Muhammad ibn Ja'far | 174. Muhammad ibn Maslamah |
| 175. Munabbih ibn Kamil | 176. Mus`ab ibn `Umair | 177. Maslama ibn Mukhallad al-Ansari |
| 178. Muhammad ibn Abi Bakr | 179. Muhsin ibn Ali | 180. Na'ila bint al-Farafisa |
| 181. Nasr ibn Hajjaaj | 182. Nadia | 183. Nauman Nābigha al-Jaʿdī |
| 184. Najiyah bint al-Walid | 185. Nuaym ibn Masud | 186. Nu'man ibn Bashir al-Ansari |
| 187. Nafi ibn al-Harith | 188. Nufay ibn al-Harith | 189. Nusaybah bint Ka'ab |
| 190. An-Nawwas ibn Sam'an | 191. Nu'aiman ibn Amr | 192. niyaz ibn waqqas |
| 193. imthiyaz ibn fazal | 194. Nuaym Ibn Abdullah | 195. Al-Qa'qa' ibn Amr al-Tamimi |
| 196. Qatada ibn al-Nu'man | 197. Qudamah ibn Maz'un | 198. Qutaylah bint Abd al-Uzza |
| 199. Qutayla ukht al-Nadr | 200. Qasim Ibn Muhammad | 201. Rab'ah ibn Umayah |
| 202. Rabiah ibn Kab | 203. Rabi'ah ibn al-Harith | 204. Ramlah bint Abu Sufyan |
| 205. Rayhanah bint Amr | 206. Rebi'i bin Aamer Al-Tamimi | 207. Rufaida Al-Aslamia |
| 208. Ruqayyah bint Muhammad | 209. Rumaysa bint Milhan | 210. Sa`sa`a ibn Suhan |
| 211. Sa`d ibn Abî Waqâs | 212. Sa`d ibn ar-Rabi` | 213. Sa`d ibn Malik |
| 214. Sa'd ibn Mua'dh | 215. Sa'd ibn Ubadah | 216. Sabra ibn Ma`bad |
| 217. Sa`îd ibn Âmir al-Jumahi | 218. Sa`îd ibn Zayd | 219. Safiyyah bint 'Abd al-Muttalib |
| 220. Safiyyah bint Huyayy | 221. Safwan ibn al-Mu'attal | 222. Safwan ibn Umayya |
| 223. Salama Abu Hashim | 224. Salama ibn al-Aqwa | 225. Salim Mawla Abi Hudhayfah |
| 226. Salma bint Umays | 227. Salma bint Sakhri ibn `Amir | 228. Salman al-Fârisî |

| | | |
|---|---|---|
| 229. Sahl ibn Sa'd | 230. Sahl ibn Hunaif | 231. Sahla bint Suhayl |
| 232. Salit bin 'Amr 'Ala bin Hadrami | 233. Samra ibn Jundab | 234. Sariyya ibn Zanim |
| 235. Sawdah bint Zam`a | 236. As-Sakran ibn Amr | 237. Shams ibn Uthman |
| 238. Shadad ibn Aus | 239. Shurahbil ibn Hasana | 240. Al-Shifa bint Abdullah |
| 241. Sirin bint Sham'un | 242. Suhayb ar-Rumi | 243. Suhayl ibn Amr |
| 244. Sumayyah bint Khayyat | 245. Sufyan ibn Awf | 246. Suraqa bin Malik |
| 247. Shuja' ibn Wahab al-Asad | 248. Sinan Bin Salamah bin Mohbik | 249. Salman al-Farsi (Rōzbeh ibn Marzban) |
| 250. Talhah ibn Ubaydullah | 251. Tamim Abu Ruqayya | 252. Tamim al-Ansari |
| 253. Tamim al-Dari | 254. Thabit ibn Qays | 255. Thumamah ibn Uthal |
| 256. Thuwaybah | 257. Tufail Ibn Amr Ad-Dawsi | 258. Umar Ibn al-Khattab |
| 259. Uthman Ibn Affan | 260. Ubadah ibn al-Samit | 261. Ubaydah ibn al-Harith |
| 262. Ubayy ibn Ka'b ibn Qays | 263. Al-Akhnas ibn Shurayq | 264. Umar ibn Harith |
| 265. Umayr ibn Sa'd al-Ansari | 266. Umayr ibn Wahb | 267. Umamah bint Zaynab |
| 268. Umm Ayman (Baraka bint Tha'laba) | 269. Umm Hakim | 270. Umm Hani |
| 271. Umm Haram | 272. Umm Kulthum bint Abi Bakr | 273. Umm Kulthum bint Asim |
| 274. Umm Kulthum bint Muhammad | 275. Umm Kulthum bint Uqba | 276. Umm Ma'bad |
| 277. Umm Ruman bint `Amir | 278. Umm Salamah | 279. Umm Sharik |
| 280. Umm Ubays | 281. Umm ul-Banin | 282. Ukasha Bin al-Mihsan |
| 283. Uqbah ibn Amir | 284. Urwah ibn Mas'ud | 285. Usama ibn Zayd |
| 286. Utbah ibn Ghazwan | 287. Utban ibn Malik | 288. Uthman ibn Abi al-As |
| 289. Uthman ibn Hunayf | 290. Uthman ibn Madh'un | 291. Uthman ibn Talha |
| 292. Wahb ibn Sa'd | 293. Wahb ibn Umayr | 294. Wahshi ibn Harb |
| 295. Wabisa ibn Ma'bad al-Asadi | 296. Walid ibn Uqba | 297. Walid ibn al Walid |
| 298. Yasir ibn Amir | 299. Yazid Ibn Abi Sufyaan | 300. Zayd al-Khayr |
| 301. Zayd ibn al-Khattab | 302. Zayd ibn Arqam | 303. Zayd ibn Harithah |
| 304. Zayd ibn Thabit | 305. Zaynab bint Ali | 306. Zaynab bint Jahsh |
| 307. Zaynab bint Khuzayma | 308. Zaynab bint Muhammad | 309. Zish Shamalain |
| 310. Zubair ibn al-Awam | 311. Zunairah al-Rumiy | |

# <u>ඉස්ලාම් දහම සම්බන්ධව විවිධ මාතෘකා කිහිපයක්.</u>

## ඉස්ලාමය සත්‍යය බව තහවුරු කර ගැනීමට සාධක.

අපි යමක් සත්‍යයම දැයි දැන ගැනීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන්නෙමු. අපට හිමි අපගේ නිවසේ සැබෑ අයිතිය තහවුරු කරගන්නේ එහි ඔප්පුව ආදිය නිසි පරිදි පරීක්ෂා කර බැලීමෙනි. එසේම අප අදහන ආගම සත්‍යයමදැයි දැන ගැනීමටත් අප උත්සහ ගත යුතුයි. නිවසකට ඇත්තේ එක් සත්‍යය ඔප්පුවක් පමණක් මෙන්ම මෙලොව ජීවත් වෙන මිනිසාට තිබිය යුත්තේද එක් සත්‍යය ධර්මතාවයක් විය යුතු යැයිද මම විශ්වාස කරමි.

අපි එකිනෙකා එක් එක් ආගම් වලට ගරු කල යුතුයි. එහෙත්, ඔබ ඔබේ ආගම තුල ඉන්න, මම මගේ ආගම තුල ඉන්නම් ලෙස පවසමින් අප මෙලොව ජීවිතය ගැන පමනක් සිතිය යුතු නැත. අප මෙලොව කුමණ ආගමක සිටියත් සියල්ලම මරණින් මතු ලෝක ධර්මතාව නම් එකම සත්‍යතාවයකට මුහුණ දිය යුතුය. එවිට මොලොව වශයෙන් අසත්‍යයේ සිටි අයට මුහුණ දෙන්න වෙන්නේ අවාසනාවන්ත ඉරණමකට නම් අප ඒ ගැන දැන් තියා සොයා බැලිය යුතුයි.

ඇත්තටම නම් අපගේ ආගම තමයි අපගේ ඉරණම. අපගේ ඉරණම වෙනුවෙන් අප තෝරාගෙන ඇති ආගම කෙතරම් දුරට සත්‍යය දැයි යම් මට්ටමකින් හෝ තහවුරු කරගැනීමට අප සැම උනන්දු විය යුතුයි. එසේ නොවුනහොත් අප නොදැනුවත්වම අප අදහන ආගම නිසාම අප අභාග්‍යයවන්ත වීමට ඉඩ ඇත. ඉස්ලාම් දහම සත්‍යයදැයි වටහා ගැනීමට ගත් උස්සහයකි මේ.

පහත සඳහන් කාරනා ගැන වැඩිපුර අධ්‍යයනය කිරීමෙන් එය තහවුරුකර ගැනීමට පහසු වේවි.

1. ඉස්ලාම් දහම යනු සියළුම නබිවරුන් සියළුම ලෝකවාසීන්ට ගෙන ආ එකම පණිවිඩයයි.

2. දෙවියන් පහල කල දහම් අතරින් මිනිසා විසින් කිසිදා වෙනස් නොකළ මට්ටමින් පවතින එකම දහම (ග්‍රන්ථය) ලෙස ශුද්ධ වූ කුරානය අදටත් ජීවමානව තිබීම.
3. ඉස්ලාම් දහමෙහි මුල මැද අග පැහැදිලිය, දැණුමින් පෝෂිතය, බුද්ධි ගෝචරය, තර්කයට ඉඩදී ඇත.
4. ඉස්ලාම් දහමේ පණිවිඩය විද්‍යාත්මක සහ තවත් විවිධ ආශ්වර්යයන්ගෙන් සමන්විතය. එනම් මෙය මනුෂ්‍යය බුද්ධියට එහා ගිය දැණුමක් සහිත ඇති දෙයක් ලෙස දකින්නට තිබීම.
5. අවසන් නබිවරයාගේ පැමිණීම ගැන පෙර ඉකුත් වූ ධර්ම පුස්තක වල සදහන්ව තිබීම.
6. මොහම්මද් (ﷺ) තුමාගේ නබිත්වය පිළිබඳ පිළිගතහැකි සාක්ෂි තිබීම.
7. දහමෙහි නිර්මාතෘ වන දෙවියන් සිටින බවට පැහැදිළි තර්ක ඉදිරිපත් කල හැකි වීම.
8. සොබාදහමත් සමග සෘජු සම්බන්ධතාවයක් ඇති දහම වීම.
9. සොබා දහමේ ආරම්භය, මැද සහ අවසානය පැහැදිළිවම ඉදිරිපත් කර ඇති දහමද ඉස්ලාම් දහම වීම.
10. මිනිසාගේද ජීවන ගමනේ ආරම්භය, මැද සහ අවසානය පැහැදිළිවම ඉදිරිපත් කර ඇති දහමද ඉස්ලාම් දහම වීම.

**1- ඉස්ලාම් දහම යනු සියලුම නබිවරුන් ගෙන ආ එකම පණිවිඩයයි.**

පළමු මනුෂයයා වන ආදම් (අ.ස) ගේ සිට අවසන් නබිවරයා වන මොහම්මද් නබිතුමා දක්වා වූ සියලුම නබිවරුන් මහලොවේ සිටි සියලුම මනුෂ්‍යයන්ට එකම දෙවියන්ගේ එකම පණිවිඩය රැගෙන ආ දේව දූතවරයන්ය. එනම් ඉස්ලාම් දහම සියලුම මනුෂ්‍යයන්ට පොදු දහමකි. එනිසා එය සත්‍යය බවට තර්ක කල හැක.

දෙවියන් වහන්සේ විසින් සෑම අනාගතවක්තෘවරයෙකුම මනුෂ්‍ය වර්ගයා වෙත එවන ලද්දේ සරල පණිවිඩයක් ලබා දීම සඳහාය. එනම්, දෙවියන් වහන්සේ එක්කෙනෙකි යන්නය. ඒ සමග ඒ ඒ කාලවල පැමිණි නබිවරුන් එම සමාජවලට දෙවියන් ලබා දුන් එම ප්‍රධාන පණිවිඩය සමඟ දෙවියන්ගේ මාර්ගෝපදේශයන්ද

ඉදිරිපත් කලහ. ඒවායේ නීති-රීති එම සමාජයන්ට සරිලන සේ ලබා දී ඇත. එනිසා මෙය වඩාත් ප්‍රායෝගික දහමක් බව ඉස්මතු වේ.

වත්මන් මුස්ලිම්වරුන් සියලු නබිවරුන්ව විශ්වාස කර තම කාලසීමාවට පහළ වූ අවසන් නබිවරයාව අනුගමනය කරයි.

*නබියේ! සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් පිරි මෙම ධර්මය ඔබ කෙරෙහි ඔහුම පහළ කර තැබුවේය. (මෙය) මෙයට පෙර තිබූ (ධර්මයන්) සියල්ලම ස්ථිර කරන්නේය. තව්රාතයද, ඉන්ජීලයද ඔහුම පහළ කලේය. (3:3)*

*මීට පෙරද මිනිසුන්ට ඍජු මාර්ගෝපදේශයන් වශයෙන් තිබුණු (පව්, පින්) වෙන් කර දැනුම්දිය හැකි (අනිත්) දැයද පහළ කර ඇත්තේය. (3:4)*

පහත සඳහන් ලිපි කියවා බලන්න

- නබිවරුන්ගේ පෙළපත

**2- දෙවියන් පහල කල දහම් අතරින් මිනිසා විසින් කිසිදා වෙනස් නොකළ මට්ටමින් පවතින එකම දහම (ග්‍රන්ථය) ලෙස ශුද්ධ වූ කුරානය අදටත් ජීවමානව තිබීම.**

(එහි දිව්‍ය හෙළිදරව්වන් පහළ වූ ආකාරයටම සුරක්ශිතව ම තිබීම සහ ඒ තුල ඉස්ලාම් දහම සත්‍ය බවට ප්‍රකාශ කළ වැකි බොහෝ සෙයින් අන්තර්ගතව තිබීම).

අල්ලාහ් කුරානයේ අපට මෙසේ පොරොන්දු වෙයි.

*නියත වශයෙන්ම අපි අල් කුර්ආනය පහළ කළෙමු, නියත වශයෙන්ම අපිම එහි භාරකරු වන්නෙමු (අපිම එය ආරක්ශා කරන්නෙමු). (කුරානය 15:9)*

කුරානය නබි ﷺ තුමාගේ ජීවිත කාලය තුල වසර 23ක් පුරාවට වරින් වර පහළ වූවකි. නබි තුමා සහ ඔහුගේ අනුගාමිකයින් එම පහල වූ අවස්ථාවේ සිටම ඒවා කටපාඩම් කර ගත්හ. සමහර වැකි හම් ආදියෙහි ලියා ගත්හ. එසේම කටපාඩම් කල දෑ තම මිතුරන් අතරේද ප්‍රචාරය කර ඔවුන්ටද කටපාඩම් කරවීය. නබි

තුමාගේ අභාවයට පෙර සියල්ල මනා පිලිවෙලකට නබිතුමා විසින් පාරයනා කර පෙන්වීය. නබි තුමාගේ අභාවයෙන් වසර දෙකකට පසු අබුබකර් රලි තුමාගේ උපදෙස් මත zසෙයිද් ඉබ්න් තාබිත් සහාබිවරයාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කර වසර දහයක් වැනි කෙටි කලකදී කටපාඩම් කල අය සහ ලියාගත් දෑ එකට සසඳා පොතක් ලෙස සැකසීය. එම පොත ඒ ආකාරයටම පිටපත් කර බෙදා හැරීම සිදු කලේය. එම මුල් පොතෙහි ඇති වාක්‍යය වල අකුරක්ද තිතක්ද අඩු තරමින් අකුරුවල පරතරයක්ද වෙනස් නොකර අද දක්වාම එහි පිටපත් නිකුත් කරයි. කටපාඩම් කල දෙයද එයට සමානව කිසිදු වෙනසක් නොකර අද දක්වා පැමිණ ඇත. මෙය කටපාඩම් කල අය ලක්ෂගණනින් අදත් ලොව තුල සිටී. අල් කුර්ආනයේ සෑම වචනයක්ම, අකුරක්ම සහ සෑම විරාමයක්ම පවා සම්මත වී ඇති අතර එය හෙළිදරව් වී වසර 1400 කට පසු අද දක්වාම නොවෙනස්ව පවතන බවට සහතික විය හැක. එම කුරානය මගින් දෙවියන් පිළිගන්නා එකම සත්‍යය දහම ඉස්ලාමය බව පෙන්වා දී ඇත යන කරුණ මත එය පිළිගැණීම.

පහත සඳහන් ලිපි කියවා බලන්න

- කුරානය ගැන සඳහන් කුරාන් වැකි. (P 129)
- කුරානය යනු කුමක්ද? (P 123)

**3- ඉස්ලාම් දහමෙහි මුල මැද අග පැහැදිළිය, එය දැණුමින් පෝෂිතය, එය බුද්ධි ගෝචරය, තර්කයට ඉඩදී ඇත.**

*ශුද්ධ වූ කුරානය වන මෙය ධර්ම පුස්තකයයි. මෙහි කිසිම සැකයක් නැත. භය භක්තිකයින්ට (මෙය) ඍජු මාර්ගය පෙන්වන්නේය. (2:2)*

*මිනිසුනේ! ඔබගේ දෙවියන් වෙතින් (ප්‍රමානවත්) සාධකයන් නියත වශයෙන්ම ඔබ වෙත පැමිණ ඇත. පැහැදිළි ඉමහත් වූ ආලෝකයම (ශුද්ධ වූ කුරානය) අපි ඔබට පහල කර ඇත්තෙමු ( 4:174)*

*මෙම කුරානය ඔවුන් ගැඹුරින් අවධානය කළ යුතු නොවෙද? මෙය අල්ලාහ් නොවන කෙනෙකුගෙන් පැමිණ තිබුණේ නම්, මෙහි අනන්තවත් (වැරදිද), භේදයන්ද ඔවුන් දකිනු ඇත. (4:82)*

දෙවියන්, තමා විසින් පහත සඳහන් දෑ සිදුකල බව සාදක සහිතව කුරානය තුලින් පෙන්වා දී තිබෙනවා.

- ➢ විශ්වය නිර්මාණය කල ආකාරය
- ➢ විශ්වය තුල සිදුවන ඇතැම් ක්‍රියාකාරකම්
- ➢ මිනිසාව නිර්මාණය කල ආකාරය
- ➢ සොබාදහම නිර්මාණය කල ආකාරය
- ➢ සොබාදහම පාලනක කරන ආකාරය
- ➢ අපට නොපෙනෙන දේවල් නිර්මාණය කල ආකාරය

මෙසේ මිනිසාට ඇදහිය නොහැකි ආකාරයට තමන් කල ක්‍රියාවන් විස්තර කර තිබේ. බුද්ධිමත් ජනතාවට ඒවා පරීක්ෂාකර බලන මෙන් දැනුවත් කර තිබේ.

ලබා දී ඇති කාරණා වලින් මිනිසාට පරීක්ශාකර බැලිය හැකි වූ බොහෝ කාරණා සත්‍යය බව තහවුරු කරගෙන තිබේ.

මීට අමතරව, දෙවියන්ගේ ස්වභාවය ගැනද සඳහන් කර තිබේ. එසේම මිනිසාගේ මරනින් මතු ලොව ගැන, මිනිසගේ ගමනාන්තය ගැන සඳහන් කර තිබේ.

තහවුරු කරගත් කරුනු මතින් යමින් (එම කරුණු වල ඇති විශ්වාසනීය භාවය පදනම් කර ගෙන) අනාගතය ගැනද, අපේ ඇසට නොපෙනෙන දේ සහ දෙවියන් ගැනද සඳහන් කර ඇති කරුනු කෙරෙහි සාධාරණ පිලිගැනීමක් ඇති කර ගැනීමට ඉස්ලාමය තුලින් අවස්ථාව ලබා දී තිබීම ඉතා හොද ලක්ෂණයකි. එනිසා ඉස්ලාමීය විශ්වාසය අන්ධ භක්තිය මත පදනම් වූවක් නොවන බව සනාථ කල හැකිය.

*(නබියේ) ඔවුන් මෙහි ආයාවන් අවධානය කර පරිශීලනය කිරීම සඳහාද (එමගින්) බුද්ධිමතුන් හොද වැටහීමක් ලබා ගැනීම සඳහාද ඉතාමත් භාග්‍යය ලත් මෙම ධර්මය අපිම ඔබ කෙරෙහි පහළ කළෙමු (38;29)*

මෙම සංඥා බොහොමයක් විද්‍යාත්මක ආශ්චර්යයන් ආකාරයෙන් පැමිණ තිබීමත් දැකිය හැක.

පහත සඳහන් ලිපි කියවා බලන්න

- ඉස්ලාමයට අනුව මිනිසාගේ ජීවන ගමනේ ආරම්භය, මැද සහ අවසානය (P 231)
- කුරානය යනු කුමක්ද? (P 123)

**4.ඉස්ලාම් දහමේ පණිවිඩය විද්‍යාත්මක ආශ්චර්යයන්ගෙන් සමන්විතව තිබීම**

නූතන විද්‍යාවෙන් සොයාගෙන තහවුරු කරගත් විද්‍යාත්මක කරුණු රාශියන් සාමාන්‍ය මිනිසා කිසිවිටකත් නොදැන සිටි අවස්ථාවල දෙවියන්ගේ දූතවරයන් විසින් ප්‍රකාශයට පත් කර තිබේ, අවසන් දූත්වරයා වන මොහම්මද් ﷺ නබි තුමා වෙතින් ඉදිරිපත් කල කුරානය හරහාද එවැනි විද්‍යාත්මක ආශ්චර්යයන් බොහොමයක් පෙන්වා දී ඇත. දහම තුල එවැනි තොරතුරු අන්තර්ගතව තිබීම විශ්වාසය තහවුරු කර ගැනීමට හොද අඩිතාලමකි. එය ඉස්ලාම් දහම තුල මැනවින් තිබේ.

පහත සඳහන් ලිපි කියවා බලන්න

- කුරානයේ විද්‍යාත්මක හෙලිදරව්වන්.. (P 135)
- අල්-කුර්ආනයේ ගණිතමය ආශ්චර්යයන් (P 141)

**5. අවසන් නබිවරයාගේ පැමිණීම ගැන පෙර ඉකුත් වූ ධර්ම පුස්තක වල සඳහන්ව තිබීම.**

ඉස්ලාමය තුලින් පෙන්වා දෙන ආකාරයට ලොව තුල සෑම යුගයකම සිටි සෑම ජනතා සමූහයකටම දෙවියන් ගේ පණිවිඩය සහ නීති රීති ඇතුලත් මාර්ගෝපදේශ නබිවරුන් හරහා ලබා දී ඇත. එම පණිවිඩ වලින් සමහර ඒවා මේ වනවිට විනාශ වී ගොසිනි. සමහර පනොවිඩ අතරින් පතර දකින්නට ඇත. නමුත් ඒවා යම් යම් වෙනස්කම් වලට භාජනය වී ඇති බවක් පෙනෙන්නට තිබේ. කෙසේ නමුත්, අද විවිධ ආගමික ජන සමූහයන් භාවිතා කරන තම ආගමික ග්‍රන්ථ තුලත් අවසන් නබිවරයා ගැන සඳහන්ව තිබෙනු දැකිය හැක. ඒ කරුණු ඔස්සේ තොරතුරු සොයා යන විටද ඉස්ලාම් සත්‍යය දහමක් බව සනාථ කර ගැනීමට අවස්ථා ඇත.

පහත සඳහන් ලිපි කියවා බලන්න

- බෞද්ධ ග්‍රන්ථවල මෛත්‍රේය නම් වූ ශාස්තෘ තුමෙකු ගැන සඳහන් කරුණු (P 537)
- හින්දු ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු (P 547)
- යුදෙව් ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු (P 549)
- ක්‍රිස්තියානි ග්‍රන්ථවල අවසන් දේව දූත මුහම්මද් (ﷺ) තුමාණන් ගැන සඳහන් කරුණු (P 550)

## 6. මොහම්මද් තුමාගේ නබිත්වය පිළිබඳ සාක්ෂි දැරීම

මොහම්මද් නබි තුමා තම ආයු කාලයෙන් පලමු වසර 40 ම පෙන්නුම් කලේ සාමාන්‍යය මනුෂ්‍යයයෙකුට පොදු ජීවන තත්වයක්ය. නමුත් එතුමාට නබිත්වය ලැබී මියයන තෙක් වසර 23 ක කාලයක් එතුමා තුලින් සුවිශේෂත්වයක් පෙන්නුම් කළේය. ඒ පෙන්වපු ලක්ෂණ දිහා බැලුවම එතුමා සත්‍යය නබිවරයෙක් බව පිළිබිඹු වෙයි.

එම විශේෂ ලක්ෂණ කිහිපයක් මෙලෙස දිස් විය;

- ✓ ලියන්නට කියවන්නට බැරි ඔහු ලොව විශිෂ්ඨතම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේය.
- ✓ එතුමා එම ග්‍රන්ථය තුලින් නූතන විද්‍යාඥයන් පවා මවිත කරවන විද්‍යාත්මක තතු හෙළි කළේය.
- ✓ ලෝක ඉතිහාසය ගැන එතුමා තතු හෙළි කළේය.
- ✓ නීතිය ගැන එතුමා කරුණු ප්‍රකාශ කරන්නට පටන් ගත්ත වගේම. නීතියක් ස්ථාපිත කළේය.
- ✓ ධර්මයක් ප්‍රකාශ කරන්නට පටන් ගැනිණි. ජනයා ඒ වෙත කැඳවන්නටද විය.
- ✓ හොඳ නරක පිළිබඳව උපදෙස් දෙන්නට ආරම්භ කෙරිණි.
- ✓ දක්ෂ කථිකයෙකුගේ ලක්ෂණ පෙන්වන්නට පටන් ගැනුනි.

- ✓ එකම ධජයක් යටතට ජනතාව පෙලගස්සන්නට විය.
- ✓ එතුමා සමාජ සංශෝධකයෙක් ලෙස ක්‍රියාත්මක විය.
- ✓ එතුමා අවිහින්සාවේ ආදර්ශය විය.
- ✓ යුධ පිටියේදී එතුමා සෙන්පතියෙකු විය. රාජ්‍ය නායකත්වය, ජනාධිතිධූරය දැරිය (නමුත් එය සුවිශේෂී නායකත්වයකි).
- ✓ එතුමා එවක සිටි ජනතාවට සමහර ප්‍රාතිහාර පෙන්වීය.

අල්ලාහ් ඒ බව කුරානය තුලින් මෙසේ ස්ථිර කරයි.

*(නබියේ!) මේවා අල්ලාහ්ගේ ආයාවන් වන්නේය, අපි ඒවා ඔබ කෙරෙහි සත්‍යය මගින්ම සමුදීරණය කරමු. තවද, නියත වශයෙන්ම ඔබද (අප විසින්) එවන ලද දූතයන්ගෙන් කෙනෙකි. (2:22)*

*(අපගේ) දූතයාණෙනි! ඔබගේ දෙවියන්ගෙන් ඔබට පහළ කරන ලද දැය (කිසිම අඩුපාඩුවකින් තොරව ඔවුන්ට) දැනුම් දී හරිනු. ඔබ (එසේ) නොකලහොත් ඔවුන්ගේ දූත මෙහෙවර ඔබ ඉටු කල කෙනෙකු බවට පත්වන්නේ නැත. (මෙහිදී ඔබ කිසිවෙකුටවත් බිය නොවනු). මිනිසුන්ගේ (නපුරෙන්) අල්ලාහ් ඔබව (ආරක්ශා කර) බේරා ගනු ඇත. (5:67)*

*ඉස්ලාමය හැර (වෙන කිසිම) ධර්මයක් කවුරුන් හෝ කැමති වුවහොත් නියත වශයෙන්ම ඔහුගෙන් (එය) භාරගනු ලබන්නේ නැත. පරලොවදී ඔහු පරාජිතයන්ගෙන් කෙනෙකු වශයෙන් සිටිනු ඇත" (3:85)*

### 7. දෙවියන් සිටින බවට පැහැදිලි තර්ක ඉදිරිපත් කල හැකි වීම

ඉස්ලාම් දෙවියන් හෙවත් සියල්ලෙහි නිර්මාතෘ මුල්කරගෙන පවතින දහමකි. එනිසා දෙවියන් සිටිනවාද යන්න තහවුරුකරගැනීම අතයාවශය කාරණාවකි. දෙවියන් අපට හිතාගැනීමට බැරි තරම් ශ්‍රේෂ්ඨය, අපිට හිතාගන්න බැරි තරම් විශාලය. අපගේ පංචේන්ද්‍රයන්ට ගෝචර නොවන ස්වභාවයකින් යුක්තය. එනිසා අපේ ඇසින් දෙවියන්ව බලා තහවුරු කරගැනීමට අපට මෙලොවදී හැකියාවක් නැත. එනිසා අපට දෙවියන්ගේ සලකුණු, දෙවියන්ගේ නිර්මාණ, දෙවියන්ගේ

දිව්‍ය වැකි, දේව දූතවරුන්ගේ ප්‍රකාශ සහ අපගේ බුද්ධිය භාවිතා කර දෙවියන් සිටින බව තහවුරු කරගැනීමට සිදු වෙයි.

- ✓ දිව්‍යයමය හෙළිදරව් (නබිවරුන් හරහා ලැබී ඇති දෙවියන්ගේ පණිවුඩ අද්‍යනය කිරීමෙන්)
- ✓ හේතු-ඵල තර්කය (විශ්වය ආරම්භ වූ දෙයකි. එම අරම්භයට හේතුව දෙවියන් ලෙස තර්ක කල හැක)
- ✓ සැලසුම් සහගත බවේ තර්කය (විශ්වය සහ එහි ඇති සියල්ලේ ඇති සැලසුම් සහගත බව)
- ✓ ප්‍රාතිහාර්යයන් පිලිබඳ තර්කය (ප්‍රාතිහාර්යන් සිදුකල හැක්කේ සර්වබලධාරී දෙවියන්ට පමණි)
- ✓ ස්වභාවික අත්දැකීම් සහිත තර්කය

මෙම කාරණා පිළිබඳව වැඩි විස්තර සඳහා පහතින් ඇති "දෙවියන් සිටින බවට සාක්ෂි" යන ලිපියත් බලන්න. ((P 48)

**8). සොබාදහමත් සමග සෘජු සම්බන්ධතාවයක් ඇති දහම වීම.**

සොබාදහමේ නිර්මාතෘ විසින් සොබාදහමට ලබා දී ඇති දහමද ඉස්ලාම් දහමම වේ. සොභාදහමේම කොටසක් වන මිනිසාගේ (රූහ්) ආත්මයෙහිද, ශරීරයෙහිද, (නෆ්ස් නැමති) සිතෙහි ව්‍යුහමය තත්වයේද දහමත් ඉස්ලාම් දහමම වේ. එනිසා එය ප්‍රතික්ශේපකළ නොහැකි වීම ඉස්ලාමය සත්‍ය දහම ලෙසට පෙන්වීමට සාදකයකි.

**9), 10). සොබා දහමේ මෙන්ම මිනිසාගේද ජීවන ගමනේ ආරම්භය, මැද සහ අවසානය පැහැදිළිවම ඉදිරිපත් කර ඇති දහමද ඉස්ලාම් දහම වීම.**

විද්‍යාඥයන් සහ ඇතැම් ආගම් හෝ දර්ශන අසරණ වූ මාර්තෘකාවකි මෙය. ඔවුන් ට මේ ගැන නිසි පිළිතුරු හමුවී නැතත්, ඉස්ලාමය තුලින් එය මනාව පැහැදිළි කර තිබීම අපට දැකිය හැක.

ඉස්ලාම් දහම මිනිසෙකුගේ නිර්මාණයක් හෝ මිනිසෙකුගේ දේශනාවක් නොව. එය සියල්ලෙහි නිර්මාතෘ ගේ දහමය. එනිසා සියල්ලෙහි නිර්මාතෘ මිනිසාගේ

මුල මැද සහ අග පිළිබඳව අපව දැනුවත් කර ඇත. වැඩි විස්තර පහත ලිපි මගින් ලබා ගන්න.

- ඉස්ලාමයට අනුව මිනිසාගේ ජීවන ගමනේ ආරම්භය, මැද සහ අවසානය
- සොබාදහමේ දහම සහ මිනිසාගේ දහම නිවැරදිව හඳුනා ගනිමු. (ඉස්ලාමයට අනුව මේ දෙකම එකකි). (P 17)

---

## විශ්ව දහම සරළව වටහා ගනිමු.

විශ්ව දහම සහ එය මිනිසාට වෙත ක්‍රියාත්මක වන ආකාරය සරළව වටහා ගනිමු.

**ලිපියෙහි සාරාංශය:** ඉස්ලාම් දහම උපයෝගී කරගෙන විශ්ව දහම පහදා දී ඇත. ඉස්ලාම් දහම වටහා ගැනීමට පහසු දහමකි. එය මිනිසාට පමණක් නොව මුළු විශ්වයටම එකම විදිහට බලපාන පොදු දහමකි. එය මිනිසෙකු විසින් නිර්මාණය කළ දහමක්ද නොව. එය සියල්ල දන්නෙකු සහ සියල්ලෙහි මැවුම්කරු වන සර්වබලධාරී දෙවියන්වහන්සේ විසින් ඇති කළ දහමකි.

මිනිසාගේ නිර්මාතෘ මිනිසාට අදාල මාර්ගෝපදේශ නබිවරුන් හරහා මිනිසා වෙත දැනුම් දී තිබේ. මෙම දහම මිනිසාට ප්‍රායෝගික ජීවන සැලැස්මකි. මිනිසා දැනගත යුතු බොහෝ කරුණු දහම තුළින් ඉදිරිපත් කරයි. ඒවා සියල්ල මිනිසාගේ මැවුම්කරුගේ උපදෙස්ය. දෙවියන් විසින් විශ්වය නිර්මාණය කළ ආකාරයත්, මිනිසාව නිර්මාණය කල ආකාරයත්, මිනිසාගේ ආරම්භය, වර්ථමානය සහ මරණින් පසු ජීවිතය, මිනිසාගේ බුද්ධියට ග්‍රහණය නොවන කරුණු, මිනිසාගේ පියවි ඇසට හෝ උපකරණ වලට නොපෙනෙන කරුණු, දෙවියන්වහන්සේ ගැන ආදිය පහදා දී ඇත.

**ඉස්ලාම් යන්නෙහි තේරුම සාමය යන්නයි**. එනම් දෙවියන්වහන්සේ තම නිර්මාණවලට සාමයෙන් පැවතීම සඳහා නිකුත් කළ දිව්‍ය ආඥාවට භාවිතා කරන අරාබි භාශාවේ වචනය ඉස්ලාම් යන්නයි. දෙවියන්ගේ සියළුම නිර්මාණ (හෙවත් සොබාදහම) එම දිව්‍ය ආඥාවට අවනතව යටහත්ව සහ කීකරුව පවතී.

එවැනි දැයට අරාබි භාෂාවෙන් මුස්ලිම් යන වචනය භාවිතා කරයි. එයට අනුව දෙවියන් තම සෑම නිර්මාණයකටම නිකුත් කළ දහම ඉස්ලාම් වන අතර දෙවියන්ගේ සෑම නිර්මාණයක්ම එය අනුගමනය කරන හෙයින් ඒවා සියල්ල මුස්ලිම් ලෙස හැඳින්විය හැක. උදාහරණ ලෙස සූර්යයා, පෘතුවිය, පස, ජලය, සෑම මූලද්‍රව්‍යයක්ම, සෑම ජීවී ශරීරයක්ම, සෑම සතෙක්ම සහ සෑම ශාකයක්ම තම දහම ලෙස දෙවියන් විසින් ඒවාට ගැලපෙන අයුරින් ඉදිරිපත් කර ඇති සොබාදහමේ දහම වන ඉස්ලාමය පිළිපදී. එම නිසා ඒවා සියල්ල මුස්ලිම් ලෙස හැඳින්විය හැක. එම සාමයට යොමු වීමට කැමැත්ත ඇති පුද්ගලයාටද මුස්ලිම් යන නම භාවිතා කරයි. තම මනසින් දෙවියන්ව සහ ඔහුගේ ආඥාව ප්‍රතික්ෂේප කරන්නන් මුස්ලිම් නොවන මිනිසුන් ලෙස හඳුන්වයි. එහෙත් ඔවුන්ගේත් ශරීර ක්‍රියා කරන්නේ දේව ආඥාවට අනුව නිසා ඔවුන්ගේත් ශරීර මුස්ලිම්ය.

දෙවියන් වෙතින් පැමිණි මිනිසා නැවත දෙවියන් වෙතම යා යුතුව ඇත. දෙවියන්ගේ උපදෙස් මත මෙලොවදී යහපත් ලෙස ජීවත් වීම තම ඉරණම ජයග්‍රහණය කර ගැනීමට ඇති එකම මාර්ගය බව මෙම දහම තුලින් පෙන්වා දෙයි. තම ජීවිත කාලය තුල දෙවියන්ගේ නිර්මාණ සම්බන්ධයෙන් මනා අධ්‍යනයක යෙදීම තුලින් මිනිසාට දෙවියන් ගැනත් ඔහුගේ නිර්මාණ ගැනත් ඉතා හොඳ වැටහීමක් ලබා ගත හැක. එම වැටහීම හරහා මිනිසාට මෙලොව ජීවිතයේ අරමුණත් ඉතා මැනවින් වටහා ගත හැකිවනු ඇත. දෙවියන් ගැන වටහා නොගත් කිසිවෙකුට සොබාදහම හෝ විශ්වය හෝ විශ්ව දහම යන්න වටහා ගැනීම අපහසුය. බුදුදහම වැනි දහම් සංකීර්ණ ලෙස දකින්නට තිබෙන්නේ එනිසයි. ඔවුන්ට මිනිසාගේ හෝ විශ්වයන්හී මුල මැද අග පිළිබඳව පැහැදිළිතාවයක් නැත.

අපගේ 'අත' දෙස බලන්න;

නැවීම, දිගහැරීම, කැරකීම ආදී ලෙස එය හසුරුවා ගැනීම අපට කොතරම් පහසුද. සාමාන්‍යයෙන් පෘථිවියේ ජීවත් වන කුමන කාලයක, කුමන තරාතිරමක, කුමන ප්‍රදේශයක කෙනෙකුට වුවත් එය එක සමානය.

අත ගැන පමණක් නොව, අපගේ දෛනික වැඩ කටයුතු සියල්ල අපහසුවකින් තොරව තේරුම් ගෙන කර ගත හැක.

මෙවැනි පොදු තත්වයක් ලොව තුල පවතිනවා නම්, මෙම පෘථිවිය තුල කුමන කාලයක, කුමන තරාතිරමක, කුමන ප්‍රදේශයක ජීවත්වන කෙනෙකුට උනත් වෙනසක් නැතුව තමන්ට අදාල ආගම දහම තේරුම් ගැනීමටත්, එය ක්‍රියාවට නැංවීමටත්, එය තව කෙනෙකුට කියා දීමටත් අපහසු නොවිය යුතුයි. එයටද පොදු තත්වයක් තිබිය යුතුයි.

තමන් අදහන ආගම හෝ දහම ගැන දැනගන්න මහා පුස්තකාලයක් තුල ජීවිත කාලයක් ගත කරන්න වෙනවා නම්, එය එතරම්ම සංකීර්ණයි නම්, ගමේ සිටින අඩු අධ්‍යාපනික දැනුමක් ඇති අයට තමන්ගේ ආගම ගැන සොයා බැලීමේ කටයුත්ත ප්‍රයෝගික නොවෙනවා නම්, එය පොදු දහමක් හෙවත් විශ්ව දහමක් වෙන්න බෑ. "දහම සංකීර්ණ වුවත් එය බුද්ධිමතුන්ට පමණක් නොවිය යුතුයි". (සෝපාක නම් පහත් කුලයේ සිටි දුප්පත් දරුවාත් ඔහුගේ මවත් බුදුන්වහන්සේගෙන් බණ අසා ඉතා සුලු වෙලාවකින්ම සෝවාන් වූ බව බෞද්ධ ඉතිහාසයේ සඳහන්. මෙය 'පෙර පිං' නිසා සිදුවූවක් ලෙස නොව, ඔවුන් දහම තේරුම්ගත් නිසා සිදුවූවක් ලෙසයි අපි වටහා ගත යුත්තේ).

ආගම දහම සංකීර්ණ වෙන්න පුළුවන්, ඒත් ඒ සංකීර්ණතාවය අපේ හිසට ලොකු බරක් වෙන්න විදිහක් නෑ. අපේ අතත් කොච්චර සංකීර්ණද. ඒත් ඒ සංකීර්ණතාවය අපට ගැටළුවක් වෙලා නැහැ නේද?

බුදු දහම වැනි සමහර උගැන්වීම් මිනිසුන් විසින්ම සංකීර්ණ කරලා කියලයි මට හිතෙන්නේ. එනිසා එය වටහා ගැනීමට බෞද්ධයින් ඉතා වෙහෙසක් ගන්නා බව දකින්නට පුළුවන.

මම ඉස්ලාම් දහම සරළව හඳුන්වා දෙන්න උත්සහ ගන්නම්. මෙය සොබාදහමේ දහම හෝ විශ්ව දහම වන ආකාරය බලන්න.

**මුලින්ම විශ්වය පිළිබඳව දල අදහසක් ගමු.**

මිනිසාට ග්‍රහණය වන විශාලතම දේ කුමක්ද? විශ්වය

විශ්වයට ආරම්භයක් තිබේද? ඔව්. (නූතන විද්‍යාවේ පිළිගැන්ම [බිග් බැන්ග් තියරිය]ට අනුව වසර බිලියන 13.7ට පමණ පෙර).

එසේ නම් මෙම විශ්වය තුල පවතින ආගම හෝ දහමක උපරිම ඉතිහාසය කොපමණද? නූතන විද්‍යාවට අනුව වසර බිලියන 13,7ක් විය යුතුයි.

ඉන් එහාට දිවයන ආගමක් පිළිබඳව විශ්වාස කල හැකිද? නූතන විද්‍යාවට අනුව පිළිගන්න බැහැ. (එහෙත්, බෞද්ධාගම වැනි ධර්ම ඉතිහාස වල අපි අහල තියෙන සාරා සංඛ්‍යෙය කල්ප ලක්ෂ ගණන් එපිටට ගිය අතීතය සහ එකල මනුෂ්‍යයන්ගේ පැවැත්ම, මෙය ඇතිවන නැතිවන චක්‍ර ලෙස සිදුවන බව ආදිය සැලකිල්ලට ගත්තත් එහි ආරම්භයක් ගැන සඳහනක් නෑ. ඉස්ලාම් දහම තුල ඉහල අහස් හතක නිර්මාණයක් සහ එහි විනාශය ගැනද කතා කරයි. කෙතරම් විශාල විශ්වයන් ඇතිවී නැති වී නැවත නැවත චක්‍ර ලෙස සිදු උනත්, දෙවියන් අහස් හතක් සහිත විශ්ව නිර්මාණය කල බව සඳහන් කලත් අප වටහා ගත යුතු ප්‍රධානතම කාරනාව වන්නේ ඒවා සියල්ල ආරම්භයක් සහිත 'නිර්මාණ' ලෙසට දැකිය හැකි බවය).

විශ්වයේ ආරම්භය පිළිබඳව මිනිසා දරන අදහස කුමක්ද? (මේ සඳහා මතවාද දෙකක් ඇත)

1. ඉබේම, හේතු කාරකයක් නොමැතිව හටගැනීම. - මෙය පිළිගැනීමට නම් හේතුඵල දහම ප්‍රතික්ෂේප කළ යුතුයි. (ආරම්භ වන සෑම දෙයකටම හේතුවක් තිබිය යුතුය).
2. මහා මැවුම් කරුවකුගේ මැවීමක්

**ඉස්ලාම් දහමේ ඉතිහාසය පිළිබඳව අදහසක්.**

මෙම විශ්වය තුල "ඉස්ලාම් දහම" පටන් ගත්තේ කවදාද? විශ්වය ආරම්භ වූ මොහොතේ සිටම එයට අදාල දෙවියන්ගේ නීතිය, දහම හෝ දිව්‍ය ආඥාවට කියන නම ඉස්ලාම්ය.

පළමු මිනිසා වඳුරන්ගෙන් ඇති උනාද? නූතන විද්‍යාවට අනුව අද එය පිළිගනු ලබන්නේ නැත. ඊට අමතරව, ලොව සිටින යුදෙව්වන්, ක්‍රිස්තියානුවන් සහ

මුස්ලිම් යන සියල්ලම පිළිගන්නේත් මනුෂ්‍යයන් ආදම් [අ.ස] නැමති පළමු මිනිසාගෙන් මනුෂ්‍ය දරුවන් ලෙස පෘතුවිය පුරා ව්‍යාප්ත වූ බවයි. පරිණාමවාදය ලොව තුළ ප්‍රචලිතව තිබුනත් ඉහත කී අය එය පිළිගන්නේ නැත.

පළමු මිනිසාට උපතක් තිබේද? ඉහත කී ජන සමාජ සියල්ල ඔහු සර්වබලධාරී දෙවියන්වහන්සේගෙ මැවීමක් ලෙස පිළි ගනු ලබයි.

ඉස්ලාම් දහමට අනුව මනුෂ්‍යයා ආරම්භ වුයේ කවදාද? දෙවියන්වහන්සේ විසින් පළමු මිනිසාව නිර්මාණය කල දවසෙ සිට. මේ ගැන මෙහි ඇති සබැඳි ලිපි වලින් කියවා බලන්න.

ඉස්ලාම් දහමට අනුව පෘථිවියට මනුෂ්‍යයා බිහි වුයේ කවදාද? දෙවියන් පළමු පිරිමි මිනිසාව සහ පළමු කාන්තාව ස්වර්ගයේදී නිර්මාණය කර පසුව පෘතුවිය වෙත එවන ලදි.

**පෘථිවිය මත ජනගහණ වර්ධනය පිළිබඳව අදහසක්.**

මුලින්ම පළමු මිනිසා සහ ඔහුගේ බිරිඳගෙන් දරුවන් බිහිවී ඔවුන් ටිකෙන් ටික ජනගහණය ලෙස වැඩිවී ලොව පුරා ව්‍යාප්ත වී අද වන විට මිය ගිය අයට අමතරව බිලියන 8ක් පමණ ජීවතුන් අතර සිටී.

පෘථිවියෙහි පළමු මිනිසාගේ දහම ඔහුට ලැබුනේ කාගෙන්ද? දෙවියන් පළමු යුවල නිර්මාණය කර ඔවුන්ට දෙවියන්ගේ දහම ලබා දී එය ඔවුන්ට නියම කෙරිණ. පසුව ඔවුන් පෘතුවියට පැමිණි පසු ඔවුන්ගේ දරුවන්ටත් එම දහමම අනුගමණය කරවන ලෙස උපදෙස් දුනි. ආදම් අ.ස සහ ඔහුගේ සමීප දරු මුණුපුරන් මිය ගිය පසු කලින් කලට නබිවරුන් හරහා ඔහුගේ ඉදිරි දරු පරම්පරා වලට එම දහමම යාවත්කාලීණ කරමින් පහළ කරන්නට විය.

**පළමු මිනිසාට ඔහුගේ නිර්මතෘ (දෙවිඳුන්) ඔහුට දුන් දහම කුමක්ද?**

දෙවිඳුන්ගේ නියමයන්ට අනුව ජීවත්වන ජීවන සැලැස්ම (එය ඉස්ලාම් ලෙස හඳුන්වයි).

පළමු මිනිසා (ආදම් අ.ස)ට වෙනත් ශාස්තෘවරුන් හිටියද? නැත. ඔහුගේ ශාස්තෘන් වහන්සේ ඔහුගේ නිර්මාණකරුය.

ඔහු නැමදුවේ කාවද ? ඔහු ස්වර්ගයේ සිටියදීත්, පෘතුවියට පැමිණි පසුත් ඔහු නැමදුවේ ඔහුගේත් සියල්ලෙහිත් නිර්මතෘ වන එකම දෙවියන්වහන්සේටය.

පෘථිවියෙහි වසන සියල්ල පළමු මිනිසාගේ දරුවන් නම්, අද ඔහුගේ දරුවන් වන අප නමදින්නේ, අප පිළිපදින්නේ, අපගේ මුල්ම පියාට ඔහුගේ නිර්මාතෘගෙන් උරුම වූ, මුල්ම පියා අනුගමනය කල දහම වන ඉස්ලාම්ද? නැත්නම්, ආදම් (හෙවත් මුල්ම පියා)ට පසු කාළීනව බිහිවූ වෙනත් ශාස්තෘවරුන්ගේ දහමක් ද?

පළිතුරු 3 කි.

1. මිනිසුන්ගෙන් සමහරු පිළිපදින්නේ අපගේ මුල්ම පියා ඇදහු, විශ්වයේත් තමාගේත් නිර්මාතෘ හෙවත් අල්ලාහ් දෙවියන්ගේ දහම වන ඉස්ලාම්ය. (මගේ පිළිතුරත් මෙයයි)
2. මිනිසුන්ගෙන් තව ජන කොටසක් පිළිපදින්නේ අපගේ මුල්ම පියා ගෙන් පසු බිහිවූ වෙනත් ශාස්තෘවරුන් දෙසූ දහමකි. බුදුවරුන්, සායි බාබා, ඕෂෝ හෝ වෙන ඕනෑම මිනිසෙකු හඳුන්වා දුන් දහමක් විය හැක. එය භෞතික වස්තු නැමදීමක් පවා විය හැක).
3. තව ජන කොටසක් කිසිම දහමක් පිළිපදින්නේ නැත.

**ඉස්ලාම් ස්වභාවික දහමකි**

සෑම මනුෂ්‍යයෙකුටම ඉස්ලාම් දහම ගැන දැන ගැනීමට ශාස්තෘවරුන් උවමනා ද? නැත.

එසේ නම් ඔහු තම දහම, තමා නමදින්නේ කාටද යන්න පිළිබඳව දැනගන්නේ කෙසේද? එය ස්වභාවික වූ දහමයි. එය තමා තුලමත් ඇත.

උදාහරණ මගින් පෙන්විය හැකිද? ඔව්. බාහිර ලෝකයට කිසිම අයුරකින් නොගැටුණ පුද්ගලයා අදහන දහම කුමක්ද? එයයි පිළිතුර. එයද "ඉස්ලාම් දහමම" වේ. කුඩා කල සිටම කැලෑවක තනියම ජීවත් වූ (ටාසන් වැනි)

මිනිසෙකුට වුව තම ස්වභාවික දහම අනුගමනය කරමින් සිටිය හැක. (නිසි පරිදි දෙවියන්ව හඳුනා ගැනීමේ ස්වභාවය මිනිසා තුලම ඇත).

නමුත් තම සමාජය වෙත (තම නිර්මාතෘ විසින් පැහැදිලි සාක්ෂි සහිතව) දූතවරයෙක් ඒවා තිබේ නම් එම සමාජය ඔහුව අනුගමනය කිරීම අනිවාර්යය වේ.

අද සමාජය තුල තියෙන්නෙත් ඔය කියන ඉස්ලාම් දහමමද? ඔව්

එහෙනම් ඉස්ලාම් දහමේ ශාස්තෘවරුන් පැමිණ තිබෙන්නේ ඇයි? තමා තුල ඇති තම ස්වභාවික දහම අමතක කල අයට මතක්කර දීමට, එම දහම අනුගමනය කල හැකි බව ආදර්ශයක් මගින් පෙන්වා දීමට, නව සමාජයන්ට දෙවියන් විසින් නියම කර ඇති නව නීති රීති යාවත්කාලීන කිරීමට, සුභාසිංශන ලබා දීමට, අණතුරු හැඟවීමටට, දෙවියන්ගේ පණිවිඩය මහජනයා අතර ව්‍යාප්ත කිරීමට එසේ නබිවරුන්ව එවා ඇත.

ඔය කියන ස්වභාවික දහම යන්න ටිකක් පැහැදිලි කරනවද? සියල්ලෙහි නිර්මාතෘ තමා නිර්මාණය කළ සියල්ලට ලබා දුන් දහම ඉස්ලාමයයි. පණ ඇති හෝ පණ නැති සියල්ල එම දේව නීතියට අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. එය සොභදහමේ නීතිය ලෙසයි බොහෝ අය හඳුන්වන්නේ.

මුල අමතක කල ජනයා නොමග ගියේ කෙසේද? පසුකාලීනව උපන් ජනයා ඔහුගේ පළමු පියා නොකළ දේ කළේය. එනම්, තම නිර්මාතෘ ගේ උපදෙස්වලට පිටින් ගියහ. ඔහුට නිසි ගෞරවය ලබා දීම හෙවත් නැමදීම පවා මග හැරීය. එසේම ඔවුන් වෙනත් දේවලට, වෙනත් මිනිසුන්ට, ගස්, ගල්, රූප, පිළිම සහ තමන් සෘෂිවරුන් ලෙස හැඳින්වූ අයට වැඳ වැටුණහ. මිනිසුන් තම දෙවියන්ගේ උපදෙස් අනුගමනය කරනවා වෙනුවට වෙනත් උපදෙස් අනුගමනය කළේය. සමහරු තමන්ගේ නිර්මාතෘව වැරදියට තේරුම් අරන් ක්‍රියා කරනවා. සමහරු කිසිම සාක්ෂියක් නැතුව දෙවිවරුන් ලෙස තමන්ගේම සිතින් මවාගත් රූප සාදා ගත්හ. මේ ආකාර වලින් මිනිසුන්ගෙන් සමහරෙක් නොමග ගියේය.

ස්වභාවික දහම හැම කෙනෙක් තුලම තියෙනවා කියල කොහොමද පිළිගන්නේ? ඔබ ඔබේම හදවතින් අහන්න. ඔබ කුමන ආගම ඇදහුවත් ඔබ කුමන හෝ මොහොතක ඔබ ඔබේ දෙවියන්ව අමතන ස්වභාවය ඔබ තුලින් මතුවෙනවා.

මුස්ලිම් නොවන අයත් දන්න දෙවිගොල්ලෝ ගොඩක් ඉන්නවා (තිස් තුන් කෝටියක් විතර). ඉස්ලාම් දහමේ කියන රූපයක්වත් නැති එකම දෙවියෝ හඳුනාගන්න පුලුවන්ද? ඔවුන් විශ්වාස කරන දෙවිගොල්ලෝ කිසිවෙකු පිළිබඳව කිසිම සාක්ෂියක් නැහැ. නමුත් ඉස්ලාම් දහම තුල පෙන්වා දෙන මෙම විශ්වය මවා, පෝෂණය කරමින්, පාලනය කරමින් සිටින එකම සර්වබලධාරී දෙවියන් සිටින බවට බුද්ධිය තියෙන කෙනෙකුට නම් සාක්ෂි සහිතව පෙන්වන්නට පුළුවන්.

දෙවියන්ගේ උපදෙස් අපට දැකබලා ගන්න පුලුවන්න්ද? ඔව්, කිසිදු සැකයක් නැතිව ඕනෑම වෙලාවක දැකබලා ගන්න පුලුවන්.

ඉස්ලාම් දහම ට අදාලව පූජක පක්ෂයක් සිටිනවාද? ඔවුන් සරණ යා හැකිද? කොහෙත්ම නෑ. ඉස්ලාම් දහමට පූජක පක්ෂයක් නැත. නමුත් ඔබේ පහසුව සඳහා ඉස්ලාම් සම්බන්ධව නිවැරදි දැනුම ඇති අයෙකුගෙන් සහය ලබා ගැනීම වඩා හොඳය. හඳුණා ගැනීමේ පහසුවට දැණුම ඇති අය එක් එක් නම් වලින් හඳුන්වනවා.

ඉස්ලාම් ගැන දැන ගැනීමට මා සූදානම් විය යුත්තේ කෙසේද? හොදම දේ නම් සවන්දීමයි. එහිදී පක්ෂග්‍රාහී නොවී, හැඟීම් වලට වහල් නොවී, මධ්‍යස්ත මනසකින්, බුද්ධිමත්ව සවන්දෙන්න. මූළික පොත් පත් කියවන්න. ඉතාම ඉක්මනින් විශ්ව දහම කුමක්ද යන්න ඔබට තේරුම් ගත හැක. ඔබ මහාචාර්ය කෙනෙක් හෝ අධ්‍යයාපනික් දැනුම අඩු කෙනෙකු හෝ වෙන්න පුලුවන්. ඉස්ලාම් දහම හඳුනා ගැනීමටත් එය භාවිතා කිරීමටත්, එයින් උපරිම ඵල නෙලා ගැනීමටත් ඔබේ එවන් තත්ව බලපාන්නේ නැත. ඉස්ලාම් දහම බුද්ධිමතුන්ට පමණක් වැටහෙන දහමක් නොවේ. එය ඕනෑම කෙනෙකුට ගැලපෙන දහමකි.

**"ඉස්ලාම්" යන්නෙහි සිංහල අරුත දැනගනිමු.**

'ඉස්ලාම්' කියන්නේ ආගමට දීල තියෙන නමද? නැත, එය අරාබි වචනයකි. කෙටිම සිංහල අරුත "සාමය"යන්නයි. (යටහත් වීම, අවනත වීම, හා කීකරු වීම යන්න ඒ තුල ගැබ්ව ඇත)

මොන විදිහේ සාමයක්ද? මේ විශ්වයේ මන්දාකිණිවල සිට, සෞරග්‍රහ මණ්ඩලවල සිට, ග්‍රහ ලෝක, ඉර හද, අහස පොලොව සුළඟ ගින්දර කඳු මුහුදු ගහ කොළ සතා සිව්පාවා මනුෂ්‍යායද ඇතුළුව අපේ පන්චේන්ද්‍රයන්ට ගෝචර වන, ගෝචර නොවන සියල්ලගේම පවතින සාමය "ඉස්ලාම්" යන වචනය තුල ඇත.

සාමය (සලාම්) ඇති විට අපිට කුමක් බලාපොරොත්තු විය හැකිද? ප්‍රචණ්ඩත්වය නොමැතිකම, පීඩනය නොමැතිකම, විප්ලවයක් නොමැතිකම, ක්‍රියා පිලිවතෙහි අවුලක් නොමැතිකම, නීතිය අකුරටම ක්‍රියාත්මක වීම, මනා පාලනයකින් යුක්ත වීම, යහපත් වටපිටාවක් ගොඩනැගීම වැනි යහපත් ප්‍රතිඵල ඇතිවේ. මෙය විශ්වයේ ක්ෂිරපත වල හෝ වේවා සෞරග්‍රහ මණ්ඩලවල හෝ වේවා, පෘථිවියෙහි අහස, පොලව හෝ මුහුද තුල හෝ වේවා, මහා කැලයක හෝ කුහුඹි ගුලක හෝ දෙබර කුඩුවක හෝ පවුලක හෝ තමා තුළ හෝ විය හැකි.

ඉහත සදහන් ආකාරයට ග්‍රහලෝක වල, ගින්දර වල, ගහ කොළ, සතා සර්පයා ආදිය තුල හා මිනිසා තුල 'සලාම්' හෙවත් 'සාමය' තියෙන්නේ කෙසේද? ග්‍රහ ලෝක කෙසේ ක්‍රියා කරන්නේ දැයි බලන්න. තම නිර්මාතෘගේ අණට, නිතියට එකගව, එනම්, යටහත්වද, අවනතවද, කිකරුවද තම කක්ෂයන් තුල නියමිත වේගයන්ගෙන් නියමිත චලන පමණක් දක්වයි. දේව නීතියට පිට නොයනු ඇත. එනම් ග්‍රහලෝක තුල සාමය හෙවත් 'ඉස්ලාමය' ඇත.

උදාහරණයක් බලන්න. සූර්යයා තම ක්ෂීරපථය තුල පැයකට කි.මී. 720,000ක වේගයෙන් තම කක්ෂය තුල පිහිටුවමින් නිශ්චිත දිසාවකට දෙසට ගමන් කරන බව නූතන විද්වතුන් පවසයි. සූර්යයා සමග පෘථිවියත් එම ගමනේ යයි. තම තමන්ගේ දුර පරතරයන් නිසියාකාරව තබා ගනී. මෙය නිකම්ම වෙනවද? ඉරයි පෘතිවියයි සාකච්චා කරගෙන මේ ගමන යනවද? නැත්නම් මෙය මෙහෙයවන, නිතිය ක්‍රියාත්මක කරවන, අණදෙන කව්රුහරි ඉන්න ඕනිද?

ඉරද, මුහුදද, ගහකොලද, කුහුබියගේ ශරීරයද දේව නීතියටම අනුව ක්‍රියා කරයි. එනිසා ඒවා තුල සාමය (ඉස්ලාම්) ඇත.

මිනිසාගේ ශරීර අවයවයන්ද මුළු සිරුරමද දේව නීතියට අනුව ක්‍රියා කරයි. එනිසා මිනිසාගේ සිරුර තුල සාමය (ඉස්ලාම්) ඇත. කොටින්ම සෑම අංශුවක්ම දේව නීතියට අනුවම මිස වෙන ක්‍රමයකට ක්‍රියාත්මක වන්නේ නෑ.

**දැන් මිනිසාගේ සිත ක්‍රියා කරන්නේ කෙසේ දැයි බලමු.**

මිනිසාගේ පුද්ගලික ස්වභාවය අනුව සිත් ආකාර දෙකකට ක්‍රියා කරයි .

a. දෙවියන් විශ්වාස කරන (දේව නීතියට එකඟව පවතින) සිත [එතුල සාමය හෙවත් 'සලාම්' ඇත].
b. දෙවියන් විශ්වාස නොකර දේව නිතියට පිටුපා පවතින සිත (එතුල සාමය හෙවත් 'සලාම්' නැත). මොහු තුලද දේව විස්වාසය ඇත. නමුත්, තමාගේ හෝ වෙන යම් බලපෑමක හේතුවෙන් එය තමා තුලම සඟවා/ යටපත් කර ඇත). තමාගේ සිත දෙවියන්ව ප්‍රතික්ෂේප කළත් ඔහු නොදැනුවත්වම ඔහුගේ ශරීරය දේව නීතියට අනුවම කටයුතු කරමින් සාමය පවත්වාගෙන සිටී. එනම් ඔහුගේ ශරීරය තුල ඉස්ලාමිය පවතී. හිත තුල ඉස්ලාමය යටපත් වී ඇත.

**"මුස්ලිම් "යන්නෙහි සිංහල අරුත දැනගනිමු.**

'මුස්ලිම්' කියන්නේ අරාබිකරයෙන් බිහි වූ මනුෂ්‍ය ජාතියක්ද? නැත

'මුස්ලිම්' කියන්නේ කුමන හෝ මනුෂ්‍ය ජාතියක් හඳුන්වන වචනයක්ද? නැත

'මුස්ලිම්' යන වචනය මනුෂ්‍ය නොවන, පන ඇති හෝ පන නැති දෙයකටද භාවිතා කල හැකි නම්, 'මුස්ලිම් යන අරාබි වචනයෙහි සිංහල අරුත කුමක්ද? විශ්වය සහ එහි ඇති ඝන, ද්‍රව, වායු සියල්ල එහි නිර්මාතෘ ගේ නිර්මාණය. නිර්මාතෘට සහ ඔහුගේ නියමයන්ට යටහත්ව, කීකරුව සහ අවනතව ජීවත් වෙන

කෙනා හෝ පවතින දෙය (එනම් එම නිර්මාණය අරාබි බසින් "මුස්ලිම්" දෙයක් ලෙස හඳුන්වන්න පුලුවන්).

ව්‍යාකරණ රටාව බලන්න

සලාම් = දේව නීතියට යටත්ව, කීකරුව, අවනතව "සාමයෙන් පැවතීමේ" ක්‍රියාව.

මු = අරාබි ව්‍යාකරණ වලට අනුව ක්‍රියාව මුලට යොදන අකුරකි (මෙය දැමූ පසු ක්‍රියාව->, "ක්‍රියාව කරන්නා" බවට පත් වේ).

මු + සලාම් = මුස්ලිම් [සලාම්/සාමය කියන දේව නීතිය ක්‍රියාවට නගන්නා]

උදා: මු + දරස් = මුදරිස් (උගන්වන්නා) [දරස්/ උගැන්වීම ක්‍රියාවට නගන්නා]

ඉර මුස්ලිම් ද? ඉරද එකම නිර්මාතෘ ගේ නිර්මාණයකි. ඉර වෙත එහි නිර්මාතෘ විසින් පනවන ලද නියමයන්ට යටහත්වද, කීකරුව සහ අවනතවද පවතින නිසා ඉර මුස්ලිම් ය. ඔබගේ හදවතද එහි නිර්මාතෘ විසින් පනවන ලද නියමයන්ට යටහත්වද, කීකරුව සහ අවනතවද පවතින නිසා එයද මුස්ලිම් ය. මේ අනුව මුළු සොබා දහමම මුස්ලිම් ය.

මනුෂ්‍යයාගේ හදවත ක්‍රියාත්මක වන්නේ කාගේ නියමයන්න්ට අනුවද? තමා එය ක්‍රියා කරවීමට ඉදිරිපත් වී නැත්නම්ද, තමාගේ මව හෝ පියා හෝ එය කර දෙන්නේද නැත්නම් සහ එය "නිකම්ම වෙනවා" කියල කියන්න තරම් අපේ බුද්ධිය අපට ඉඩ දෙන්නෙත් නැත්නම්, එය අපේ ශරීරයේ හිමිකරු විසින් කරනවා හෝ කරවනවා විය යුතුය් නේද? හේතුව නම්, මේ විශ්වය වගේම ඔබෙත් මගෙත් ශරීරයේ හිමිකරු ඔහු (එනම් එකම සර්වබලධාරී දෙවියන්-අල්ලාහ්) නිසා.

විශ්වයම දෙවියන්ගේ අණට යටත්ව අවනතව කීකරුව සිටින නිසා මුළු විශ්වයම "මුස්ලිම් "ද? ඔව්. පැහැදිලිවම.

එසේ නම් සමාජය තුල 'මුස්ලිම් නොවන ජන කොටසක්' ලෙස අපි හඳුන්වන්නේ කාවද? වැදගත්ම ප්‍රශ්නය මෙයයි .පිළිතුර ටිකක් විස්තර ඇතුව ලියන්නම්.

මිනිසා මෙම පෘතුවිය තුල සුවිශේෂී නිර්මාණයකි. මුළු පෘතුවියමද, අහසද පොළවද ඉර හඳ තරු ගහ කොල සතා සිව්පාවා ගංගා මුහුදු වැලි පස් සුලඟ ආදී සෑම දෙයක්ම මිනිසාට සේවය කරයි. දෙවියන් ඒවා මිනිසා ට අවනත කර දී ඇත. (ඒවා මිනිසාට නතුව පවතී, ඒවාගෙන් මිනිසාට වැඩ කර ගත හැකියි)

මිනිසා මෙම පෘථිවියෙහි නියෝජිතයා වේ. ඔහුට අනිකුත් නිර්මාණ වලට වගේ නොව, සියුම්ව හැසිරිය හැකි සිරුරට අමතරව සුවිශේෂී බුද්ධියක්ද, සිතීමේ නිදහසද, හොඳ නරක තෝරා බේරා ගැනීමේ නුවණද, යමක් දෙස විචාර බුද්ධිය මෙහෙයවල භෞතික මෙන්ම පාර භෞතික දේද සිහිනුවනින් දැකීමේ හැකියාවද උරුම කරදී, ඉරද හඳද ඇතුළුව පෘථිවියමද තමාට නතුකර දී (එනම් පෘථිවියෙහි නියෝජිත තනතුර දී) මේ පෘතුවිය තුලට කිසියම් කාලසීමාවකට මිනිසාව එවා ඇත.

මිනිසාට අවශ්‍ය සියලු පහසුකම්ද, ඇස් කන් ආදියද, කතා කිරීමේ ලිවීමේ උපකරණ හැදීමේ හැකියාවද දී ඇත. ජීවත් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව තමා තුලම දැනුමද, හෘද සාක්ෂියද ස්ථාපිත කර දෙවියන් නැමදීමේ චින්තනයද මනසතුලට කවා, ඒ අතර තුර නොමග යමින් තම ස්වාමියා/ තම නිර්මාතෘ/ තම දෙවියා අමතක කල අයට මතක් කරදීමටද ජීවත් වන්නේ කෙසේද යන්න පිලිබදව ආදර්ශයෙන් උපදෙස් දී යහමග කියාදීමට සහ තම දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීමෙන් ඇතිවන භයානක ඉරණම ගැන බිය ගැන්වීමටද තම දෙවියන්ට කිකරු වන්නන්ට සුභාශින්සනද රැගෙන වරින්වර දෙවියන්ගේ දූතයන්ද ඒවා ඇත. තව්රාත්, සුබූර්, ඉන්ජීල්, කුරාන් වැනි ධර්ම පුස්තකද (දිව්‍යයා හෙලිදරව්වන්) එවා ඇත.

තත්වය මෙසේ තිබියදී 'තමන්ට නිර්මාතෘ කෙනෙක් නැත'ය කියමින් 'විශ්වය නිකම්ම බිහි උනා' කියමින්, 'විශ්වයේ පාලනය නිකම්ම වෙනවයි කියමින්, පැහැදිලි සාක්ෂි සහිත පැමිණ ඇති දෙවියන්ගේ වදන්, දිව්‍යයා හෙලිදරව්වන් දේවදූතයන් ප්‍රතික්ෂේප කරමින් වෙන වෙන මාර්ගවල යන උදවිය, වෙන වෙන ශාස්තෘවරුන් අනුගමනය කරන උදවිය "මුස්ලිම් නොවන" ජන කොටසයි. ඒ

අයගෙත් හිත පමණක් මුස්ලිම් නොවේ. නමුත් තම සිරුර දෙවියන්ට අවනතයි. එනිසා සිරුර මුස්ලිම් වේ .

තම නියෝජිතයා(මිනිසා) තම ජීවිත කාලය තුල තමන්ට ලැබුණු ශරීරයද ලැබුණු වස්තුවද දරුවන්ද අසල්වැසියන්ද සතා සිව්පාව සමගද ගහ කොල සමගද තම පරිසරය සමගද කෙසේ ජීවත් වන්නේ දැයි තමා නිරීක්ෂණය කරමින්ද සටහන් කරමින්ද සිටින බව දෙවියන්ම පවසයි.

හොඳ නරක තෝරාගෙන, පරිසරයට ලෙන්ගතුව හෝ හානිකරවද, පින් වැඩ හෝ පව් වැඩ කරගෙන, සාමයෙන් සමගියෙන් හෝ ප්‍රචණ්ඩත්වයෙන් ද, ආත්මාර්ථකාමී හෝ පරාර්ථකාමී ලෙසද, යහපත් හෝ අයහපත් පරිසරයක් තෝරාගෙන, යහපත් හෝ අයහපත් ජීවනොපයක් කරගෙන, මනුෂ්‍යයෙක් ලෙස හෝ තිරිසනෙක් ලෙස තම බුද්ධිය යොදවමින් තම ජීවිතය කරගෙන යාමේ නිදහස මිනිසාට දී ඇත. (මෙය දෙවියන්ගේ සුවිසේෂී පරීක්ෂණයකි).

අන්ධයෙක්ව නිර්මාණය කර ඔහුට වෙනම පරීක්ෂණයක්ද, ඇස් අන්ධ කෙනා දිහා බලාගෙන ඇස් තියෙන කෙනා හැසිරෙන ආකාරය, එය වෙනම පරීක්ෂණයක් ලෙසද ඉදිරිපත් කර ඇත.

සෑම මනුෂ්‍යයෙකුටම ස්වාදීන වූ පරීක්ෂණයකි. පරීක්ෂණයේ ප්‍රතිපල තම තමන් තම නිර්මාතෘ ගෙන් මරණින් පසු විනිශ්චය දිනදී බලාපොරොත්තු වන්න. (ඒ ගැන පසුව කියවන්න). එක මිනිසෙකුට අවස්ථා දෙකක් ලබා දී නැත. මේ වන විටත් මෙලොව හැර ගොස් ඇති සියලුම දෙනාගෙම ජීවිත කතාවන් දෙවියන් ලඟය.

මරනින් පසු අප සියල්ලට "බර්සාහ්" නමින් හඳුන්වන මරනින් මතු ජීවිතකාලයක් ඇත. අප මිය ගිය පසු නැවත අපට මේ ලෝකයට මනුෂ්‍යයෙක් ලෙස හෝ සතෙකු ලෙස පැමිණිය නොහැකිය. නැවත දෙවියන් අපව කැඳවන දවසේ ඔහු වෙත යා යුතුව ඇත. ඉන් පසු අප මෙලොව කල කී දේ සම්බන්දයෙන් විනිශ්චය ලබා දෙනු ඇත. විනිශ්චය අනුව අපගේ ගමනාන්තය ස්වර්ගයෙන් හෝ අපායෙන් කෙලවර වනු ඇත. ඒ නවාතැනෙහි නිමක් නැති කාලයක් ඉන්නට සිදුවනු ඇත. එනිසා අපගේ මරනින් මතු ජීවිතය සැපවත් කර

ගැනීමට අපගේ නිර්මාතෘ ගේ උපදෙස් වලට අනුව ජීවිතය සකසා ගැනීම අප සැමගේ අරමුණ විය යුතුය.

මෙම විශ්වය තුල (අපට ඉහලින් ඇති අහස් තුල) අප වැනි තව කොපමනදෝ නිර්මාණ කර ඇති බවද දෙවියන් කුරානය තුලින් අපට දන්වා ඇත (අල් කුර්ආන් 23:17). ඒවා සියල්ල හේතුවක් සඳහාම නිර්මාණය කල බවත් පවසා ඇත. දෙවියන්ගේ කැමැත්ත පරිදි යම් දිනක මෙම විශ්වයම විනාශකර දමනු ඇත. ඉන් පසු නැවත අලුත් තත්ව හට ගැනීමක් පවා විය හැක. එය සදාකල් පවතින සර්වබලධාරී දෙවියන්ගේ කැමැත්තය. ස්වර්ගවාසීන් සහ නිරාවාසීන් දෙවියන් කැමති තාක් කල් ස්වර්ගයන්හී සහ නිරයන්හී සිටිනු ඇත. ඒවා නිශ්චිත වශයෙන්ම ඇති බව දෙවියන්ම අපට දන්වා ඇත.

---

## මුස්ලිම්වරුන්ට විශේෂ වූ ස්ථාන.

මුස්ලිම්වරුන් සර්වබලධාරී අල්ලාහ් දෙවියන්ට පමණක්ම නැමදීම් කරයි. එය සිදුකරන්නේද නබි ﷺ තුමන් පෙන්වාදුන් ආකාරයට පමණි.

මුස්ලිම්වරුන්ගේ මගපෙන්නන් වන්නේ නබිවරුන්ය. ඔවුන් මිනිසුන් අතරින් උසස්තම අය ලෙස සලකණු ලබයි. ඔවුන් කෙරෙහි මුස්ලිම්වරුන් තුල සුවිශේෂී ගෞරවයක් ඇත. නමුත් ඔවුන්ට නමදින්නේ නැත, ඔවුන්ගේ පිළිම නිර්මාණය කර ඒවාට පූජා පවත්වන්නේ නැත, ඔවුන් හරහා දෙවියන්ගෙන් ප්‍රාර්ථනා කරන්නේද නැත. ඔවුන් සිටි ස්ථාන, භාවිත කල දේවල් හෝ ඔවුන්ගේ සොහොන් වලට පවා නමදින්නේ නැත.

කෙසේ වෙතත්, ඉස්ලාමීය ඇදහිල්ල හා ඉතිහාසය සම්බන්ධව, ඒවාට ආවේණික වූ ලක්ෂණ ඇති ස්ථාන කිහිපයක් තිබේ. මෙම ලිපි පෙළ හරහා ඒවා පිළිබඳ තොරතුරු කිහිපයක් ඉදිරිපත් කරයි.

මුස්ලිම්වරුන්ට පූජනීය ස්ථාන (Sacred places) ලෙස පෙන්වා දී ඇත්තේ පහතින් දක්වා ඇති මස්ජිද් තුන පමණි. හැකි අයට තම ජීවිත කාලය තුල එම ස්ථාන 3 වෙත යන ලෙස උපදෙස් දී ඇත.

1. මක්කාවේ පිහිටා ඇති මස්ජිදුල් හරාම් (කාබතුල්ලාහ්ව).
2. මදීනාවේ ඇති නබි තුමාගේ මස්ජිදය හෙවත් මස්ජිදුල් නබවි.
3. ජෙරුසෙලමෙහි පිහිටා එති මස්ජිදුල් අක්සා.

මෙම ස්ථාන තුන හැර වෙනත් කිසිම ස්ථානයකට වන්දනාවේ හෝ නැරඹීම සඳහා හෝ යන ලෙස මුස්ලිම්වරුන්ව උනන්දු කර නැත. නමුත් අධ්‍යයනය කටයුතු හෝ පුද්ගලික කැමැත්ත මත ඒවා නැරඹීමට යාම තහනම් කර ද නැත. ඒවා අතර යම් යම් කාරණා පදනම් කරගෙන විශේෂත්වයන් පෙන්වන ස්ථාන කිහිපයක් පහතින් දැක්වේ. ඒවා පිළිබඳව ඔබට දැනුවත් වීම සඳහා වැදගත් තොරතුරු මෙහි ඉදිරිපත් කර ඇත.

---

## මස්ජිද් (නැමදුම් ස්ථාන)

මස්ජිද් (مسجد) යනු මුස්ලිම්වරුන්ගේ නැමදුම් ස්ථානයක් හඳුන්වන අරාබි වචනයකි. ලොව පුරාම සිටින මුස්ලිම් මිනිසුන් මස්ජිද් යන නම හඳුනන නිසා එම නම භාවිතා කිරීම මුස්ලිම් සමාජයේ සුලභ දෙයකි. එය තවත් නම් වලින් මෙලෙස හඳුන්වයි; මුස්ලිම් පල්ලිය, මුස්ලිම් දේවස්ථානය, මොස්ක්-Mosque.

මස්ජිද් කුඩා හෝ විශාල වීම මත එය තම දෙවියන් නැමදීමේ උච්චත්වය අඩු හෝ වැඩි වීමට හේතුවක් නොවේ. ලොව පුරා නිසි අයුරින් නැමදීම් සිදුකරන සියළුම මස්ජිද අල්ලාහ් ඉදිරියේ එක සමානය. මුස්ලිම්වරුන්ද ඒ සියළුම මස්ජිද් අල්ලාහ්ගේ නිවෙස් ලෙස ගෞරවයෙන් සලකති.

**කුඩා නැමදුම් ස්ථාන**

සිටින සෑම ප්‍රදේශයකම මෙවැනි කුඩා මස්ජිද් එකක් හෝ කිහිපයක් තිබිය හැක. මුස්ලිම් පිරිමින්ට දිනපතා පස් වතාවක්ම පල්ලියේ සාමූහිකව යාඥා කිරීමට

දිරිගන්වා ඇත. එම නිසා අදාන් (හෙවත් නැමදීමට ආරාධනා කරන හඬ) ඇසෙන මානයක ජීවත් වීමට ඔවුන් ප්‍රිය කරයි. එම නිසා එයට සරිලන ආකාරයට තම නිවෙස් ආසන්නයේ කුඩාවට හෝ මස්ජිදයක් සාදා ගැනීමට ඔවුන් උත්සහ ගනී. මෙම මස්ජිද් වල දිනකට පස් වේලක් මුඅද්දීන් වරයෙක් (හෙවත් සලාතයට කැදවන්නෙක්) විසින් තම අසල්වාසීන්ට සලාතය වේලාව සිහි කර, නැමදීමට ආරාධනා කරනු ලබයි. මෙම මුස්ලිම් මස්ජිද් බොහෝ විට ගමේම ජනතාව විසින්ම නඩත්තු කරනු ලැබේ, එබැවින් ඔබට හැකි ඕනෑම ආකාරයකින් ඒවාට දායක වීම මහත් ආශිර්වාදයකි.

මුස්ලිම් බහුතරයක් වෙසෙන ප්‍රදේශවල මෙවැනි කුඩා නැමදුම් ස්ථාන කිහිපයක් තිබීම එම ජනතාව අතර යහපත් සමාජයක් පිළිබඳ බලාපොරොත්තුවට ප්‍රධාන සාධකයකි. හේතුව, එම පහසුකම නිසා, සෑම වැඩිහිටි මුස්ලිම් පුරුෂයෙකුටම තම දෛනික යාච්ඤාවන් සාමූහිකව ඉටු කිරීමට දිරිමත් කරනු ලැබේ. මස්ජිදය ඉතා දුරින් පිහිටා ඇති විට, එය ප්‍රායෝගිකව ඔවුන්ට අපහසු වේ, එබැවින් ඔවුන් තම යාච්ඤාව නිවසේදී ඉටු කිරීමට නැඹුරු වෙති. නිවසේදී ඉටු කිරීමට වඩා පල්ලියක යාච්ඤාව ඉටු කිරීම වඩාත් ප්‍රයෝජනවත් වේ.

මෙම මස්ජිද් වල සිකුරාදා දිනට නියමිත ජුම්මා සලාතය සිදු කරන්නේ නැත.

**ජුම්මා මස්ජිද්**

ජුම්මා මස්ජිද් ලෙස හඳුන්වන්නේ විශාල පිරිසකට සහභාගී විය හැකි, මිම්බරයක් (හෙවත් සිකුරාදා දින ඉමාම් වරයෙක් විසින් දෙනු ලබන දේශනය දීමට ඔහුට සිටගත හැකි උස් වේදිකාවක්) සහිත මස්ජිදයන්ය.

එම මස්ජිද් වලද අනිකුත් කුඩා මස්ජිද්වල මෙන් දෛනික පස්වේල සලාතයන් ද සිදු කරනු ලබයි. ඊට අමතරව සිකුරාදා දින විශාල ප්‍රදේශයක සිටින ජනතාවක් එය වෙත පැමිණ කුද්බා (නමින් හඳුන්වන විශේෂ) දේශනයක් සහිත නැමදීමකට සහභාගී වේ.

විශාල හෝ කුඩා ඕනෑම පල්ලියක ඇත්තේ ඉතාම සීමිත දේවල් කිහිපයක් පමණි. ඒවා අතර ඇතැම් පල්ලිවල, කුරාන් පොත් කිහිපයක්, සලාතයන්හි

වෙලාව දක්වන පුවරුක්, බිම වාඩිවීමට අපහසු අයට වාඩි වීමට පුටු කිහිපයක්. යාච්ඤාවෙන් පසු උසුරීමට ගැනෙන වැකි සඳහන්ව ඇති පුවරුවක්, යාච්ඤාවට කැඳවීම සඳහා සහ යාච්ඤාව අතරතුර ඉමාම්ගේ හඬ වැඩි කිරීම සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර, වැසිකිළි පහසුකම්, දෝවනය හෙවත් වුළු කිරීමට අවශ්‍ය ජලය සහ ජුම්මා පල්ලියක නම් දේශනය සඳහා වේදිකාවක්. එපමණයි. පිළිම හෝ රූප කිසිවක් නැත.

සෑම මස්ජිදයක්ම මක්කාව දිසාවට මුහුණලා සිටින සේ නිර්මාණය කරයි. මස්ජිද් සෑදීමේදී වියදම් කිරීමට ඇති හැකියාව මත සමහර මස්ජිද් අලංකාරවත්ව නිර්මාණය කරයි. සමහර මස්ජිද් ඉතාමත් දුප්පත් මට්ටමින්ද ඇත. නමුත් අල්ලාහ් බලන්නේ මිනිසුන්ගේ හදවත් දෙසය. එනිසා කුමණ මට්ටමක මස්ජිදයක උනත් තම සලාතය අල්ලාහ් කෙරෙහි ඉතාමත්ම බිය බැතිව සිදු කරන්නේ නම් එයයි ඉහළම නමස්කාරය.

කාන්තාවන්ට විවිධ හේතු නිසා තම සලාතයන් නිවස තුලදීම ඉටු කිරීම වඩාත් යහපත් බව දහම තුලින් පෙන්වා දෙයි. එසේ වුවත්, ඔවුන්ට පල්ලි තුල සලාතය ඉටු කිරීමට තහනමක් නැත. සමහර පල්ලි වල කාන්තාවන් සඳහා වෙනම කොටසක් වෙන්කර ඇත. නබි තුමාගේ කාලයේ පිරිමින්ට ඉදිරි පෙළවල සලාතය කිරීමටත් කාන්තාවන් සඳහා තම සිටගැනීම පල්ලියේ පිටුපසම සිට ආරම්භ කිරීමටත් අවස්ථාව ලබා දී ඇත. කෙසේ වෙතත්, කිසිම පල්ලියක පිරිමින් සහ කාන්තාවන් එකට ළඟින් සිටගෙන සලාතය ඉටු නොකරති.

## මක්කාව සහ ඒ අවට ඇති විශේෂ ස්ථාන.

නබි (ﷺ) තුමාණෝ මෙසේ පැවසූහ, *"අල්ලාහ්ගේ නාමයෙන් දිවුරමි, මක්කාව අල්ලාහ්ගේ දේශයන්ගෙන් හොඳම වන අතර මක්කාව අල්ලාහ්ට වඩාත්ම ආදරණීය දේශයයි."*

පහත සඳහන් ස්ථාන එහි ඇති විශේෂ ස්ථානයි.

- කාබතුල්ලාහ්, සෆා මර්වා කඳු (මස්ජිදුල් හරාම්)
- ජබල් අල් නූර්

- ජබල් අල් තූර්
- කුරාන් කෞතුගාගාරය
- මීනා, මුස්දලිෆා, ජමරාත්, ජබල් අරෆාත්

නබි (ﷺ) තුමාගේ ඉහත වැකියත් සමග මක්කාවෙහි ඇති විශේෂත්වය ගැන සළකා බලමු.

පළමු මිනිසා සහ ඔහුගේ බිරිඳ වන ආදම් සහ හව්වා යන දෙපල (ඔවුන්ට අල්ලාහ්ගේ ශාන්තිය හිමි වේවා) ස්වර්ගයේ සිට පෘතුවියෙහි ස්ථාන දෙකකට පහළ වූ පසු මක්කාවේදී ඔවුන් එකෙනෙකා මුන ගැසී එහි ජීවත් වූ බව සඳහන්. ආදම් අලෙහිස්සලාම් විසින් තම නැමදීම් මදාස්ථානය ලෙස වර්ථමානයේ කාබතුල්ලාහ්ව ඇති ස්ථානයේ ඉදිකිරීමක් කර ඇත. පසුව යම් කාලයක් ඔහුගේ පරම්පරාවේ අයද එහිම තම නැමදීම් ඉටු කර ඇත.

ඉන් පසු කල් යත්ම එහි අල්ලාහ් නොවන දැය ද නැමදීම් කර පසුව එය විනාශ වන්නට විය, එසේ බොහෝ කලක් ගත වූ පසු මීට වසර 6000 කට පමණ පෙර අල්ලාහ් විසින් ඉබ්රහිම් අලෙහිස්සලාම්ට එතන අල්ලාහ් වෙනුවෙන් පළුම්අනක් නැමදීම් කරන නැමදුම් මධ්‍යස්ථානය ලෙස එය නැවත ගොඩනගන්නට උපදෙස් දී ඇත. ඉබ්රාහීම් අලෙහිස්සලාම් සහ ඔහුගේ පුත් ඉශ්මායීල් අලෙහිස්සලාම් යන දෙදෙනා එක්ව කාබාව ගොඩ නැගීය. කාබා යනු ඉස්ලාමයේ භෞතික මධ්‍යස්ථානයයි. එම නැමදුම්පොලට මස්ජිද් අල් හරාම් ලෙසින්ද, අල්ලාහ්ගේ නිවස ලෙසින්ද හදුන්වන් ලබයි.

**මස්ජිද් අල්-හරාම්**

මස්ජිද් අල් හරාම් යනු මුස්ලිම්වරුන්ට දීර්ග ඉතිහාසයක් ඇති නැමදුම් පොලකි. බොහෝ නබිවරුන් පවා නැමදුම් කල දෙවියන් මිනිසුන්ට නැමදුම් ස්ථානයක් ලෙස ඇති කල පළමු නැමදුම්පොලයි.

*(නබියේ!) ඉබ්රාහීම් වෙනුවෙන් ශුද්ධ වූ ස්ථානය අපි නැමදුම් මධ්‍යස්ථානයක් බවට පත් කර දී, (ඔහුට) "ඔබ මා හට කිසිවෙකුත් සමාන නොකරනු. මගේ (මෙම) නිවස (ස්ථානය) වටා ගමන්*

*කරන්නන්ටද, එහි හිස බිම තබා සුජූද් කර නමදින්නන්ටද එය පරිශුද්ධ කර තබනු" යයි අපි පැවසූ අවස්ථාවේදී (22:26) "හජ් සඳහා පැමිණෙන මෙන් මිනිසුන්ට නිවේදනයක් නිකුත් කරනු;(22:27)*



මස්ජිදුල් හරාම් හි එක් යාච්ඤාවක් වෙනත් ඕනෑම පල්ලියක යාච්ඤා 100,000 කට වඩා වටින බව නබි (ﷺ) තුමාණෝ පැවසූහ.

## මදීනා සහ ඒ අවට ඇති විශේෂ ස්ථාන.

මදීනාව යනු නගරයකට වඩා වැඩි වටිනාකමක් ඇති තැනකි. එය මක්කාවෙන් පසු ඉස්ලාමයේ දෙවන වඩාත්ම පූජනීය නගරයයි. මදීනාව යනු නබි මුහම්මද් (ﷺ) තුමාගේ මජිද්ය පිහිටා ඇති සහ, එතුමාව භූමදාන කරන ලද නගරයයි.. මක්කාවෙන් සංක්‍රමණය වීමෙන් පසු මොහම්මද් නබි (ﷺ ) තුමාගේ ගමනාන්තය මදීනාව විය. ඉන් ටික කලකට පසු, එතුමාගේ නායකත්වය යටතේ මදීනාව හරහා ලොව පුරා ඉස්ලාමය ප්‍රචාරය කිරීමේ මහඟු කාර්යය පටන් ගැනුණි.

සෑම මුස්ලිම්වරයෙකුටම මදීනාව සම්බන්ධව දැනගත යුතු බොහෝමයක් කාරණාවන් ඇත. ගනණය කිරීම් වලට අනුව 2016 දුල් හජ් මාසයේ දිනකට

බැතිමතුන් ලක්ෂ තුනක් පමන මදීනාවට පැමිණ ඇත. සෑම මුස්ලිම්වරයෙකුම ගමන්කිරීමට ඉතාම කැමතිම නගරයකි මෙය. ඉතිහාසයේ එය යත්රිබ් යන නමින්ද වර්තමානයේ මදීනා අල් මුනව්වරා යන නමින්ද හඳුන්වනු ලබයි.

*"විශ්වාසවන්තයෙකුට මදීනාව හොඳම ස්ථානයයි"* යනුවෙන් නබි මුහම්මද් (ﷺ) තුමා පැවසූ බව අනස් (රලි) වාර්තා කරයි.

**මස්ජිද් අල් නබවි**




මස්ජිද් අන්-නබවි යනු මොහම්මද් (සල්) තුමා මක්කම සිට මදීනාවට සංක්‍රමණය වීමෙන් පසු එතුමා විසින් ඉදිකරන ලද මස්ජිදයයි. එය කොතරම් ආශිර්වාද ලත් මස්ජිදයක්ද යත්, එහි සිදුකරන එක් යාඥාවක් යාඥා දහසක් ඉටු කිරීමේ විපාකයට සමාන බව නබි තුමානන් පවසා ඇත.

- අර් රව්දා. (නබිතුමා සලාත් කල පෙදෙස (රියාස් උල් ජන්නා/ Green carpet), නබි තුමාගේ නිවස සහ නබි තුමාගේ සොහොන ඇති පෙදෙස.
- රියාස් උල් ජන්නා. (මෙම කොටස Green carpet ලෙසද හඳුන්වයි).
- නබි තුමාගේ සොහොන ඇති පෙදෙස.
- නබි තුමාගේ නිවසෙහි ආකෘතියක්.

මෙම කාපට් එකේ කොළ පැහැය පාරාදීසය නියෝජනය කරන අතර මල් එහි උද්‍යාන සංකේතවත් කරන බව විශ්වාස කෙරේ. මෙම ස්ථානය මස්ජිදුල් නබවි හි වඩාත්ම ශුභදායක ස්ථානය ලෙස සැලකේ.




එය නබි (සල්) තුමා විසින් පාරාදීසයේ උයන ලෙස හඳුන්වනු ලබන අතර, නබි (සල්) තුමාගේ මෙම ප්‍රකාශය සියලුම මුස්ලිම්වරුන්ට මස්ජිදයේ මෙම ප්‍රදේශයේ වැදගත්කම පැහැදිලිව පෙන්නුම් කරයි. එම ස්ථානයේ අයැදීමක් කළහොත් එය දෙවියන් වහන්සේ විසින් කිසි විටෙකත් ප්‍රතික්ෂේප නොකරන බව විශ්වාස කෙරේ. මෙම ප්‍රදේශයේ සැබෑ ප්‍රමාණය දිග මීටර් 22 ක් සහ පළල මීටර් 15 කි.

*"මගේ නිවස සහ මගේ මින්බර් අතර ප්‍රදේශය පාරාදීසයේ උද්‍යානවලින් එකකි" යැයි තුමාණෝ පැවසූහ. අල්-බුහාරි, 1196; මුස්ලිම්, 1391*

මෙයින් අදහස්වන ආකාරයට ලෝක අවසානයේදී මෙම කොටස ඉහලට ඔසවාගන්නා බවක් පෙන්නුම් කෙරේ.

නබි මොහම්මද් (ﷺ ) තුමා ගේ මදීනා හි පිහිටි නිවස ඉතාම කුඩා එකකි. එය දිගින් සහ පළලින් අඩි පමණ විය, වහලයද උස අඩු එකකි. එතුමා (ﷺ ) සහ අයේෂා රළි තුමිය එහි වාසය කලහ. නබි තුමාගේ අභාවයෙන් පසු ඔහුගේ දේහය එම කුඩා කාමරයේම කොනක තැන්පත් කරණ ලදී. ඉන් පසුවද අයේෂා රළි තුමිය එහිම වසය කළහ. ඉන් පසු ඇගේ පියා වන අබු බකර් රළි තුමා ගේ අභාවයෙන් පසු ඔහුගේ දේහයද නබි තුමාගේ දේහය අසළින්ම තැන්පත් කළහ.

ඉන් පසුවද ඇය එම කාමරයේම වාසය කළහ. ඉන් පසු ඔබර් රළි තුමා ගේ අභාවයෙන් පසු ඔහුගේ දේහයද එම කාමරයේම අබූ බකර් රළි තුමා අසළින් තැන්පත් කළහ, ඔමර් රළි තුමා අයේෂා රළි තුමියගේ නැදැයෙකු නොවන නිසා (මහර්ම් නැති නිසා) ඉන් පසු එම සොහොන් පෙදෙස සහ අයේෂා රළි තුමියගේ සයනය සහිත කාමර කොටස අතර බිත්තියකින් වෙන් කෙරිණ. ඉන් ප්සු ඇය ඉතිරි කාලය පුරාම එම කුඩා නිවෙසෙහි තනිව ජීවත් විය.




## 2. උහද් කන්ද

ඉස්ලාමීය අනාගතවක්තෘ මුහම්මද් තුමා සහ ඔහුගේ කුරෙයිෂ් ගෝත්‍රයේ බහුදේවවාදීන් අතර දෙවන සටන සිදු වූ ස්ථානය මෙය විය. උහුද් සටන ක්‍රි.ව. 625 මාර්තු 19 වන දින මදීනාවේ කුඩා මුස්ලිම් හමුදාවක් සහ මක්කාවින් පැමිණි හමුදාවක් අතර සිදු විය.

අවසානයේදී උහුද් සටන අබූ සුෆියාන් යටතේ සිටි මක්කානුවන් විසින් ජයග්‍රහණය කරන ලද අතර, ඔහු මොහම්මද් (සල්) සහ ඔහුගේ කුඩා මුස්ලිම් හමුදාව පරාජය කළ අතර, අනාගතවක්තෘවරයාට පවා තුවාල සිදු කළේය. කෙසේ වෙතත්, එය සම්පූර්ණ ජයග්‍රහණයක් නොවීය, මන්ද මක්කානුවන් මදීනාව අල්ලා නොගත් අතර, මුස්ලිම්වරු තවත් දිනක් සටන් කර අවසානයේ යුද්ධයේ ජයග්‍රහණය ලබා ගත්හ.

සටන අවසන් වූයේ මුසාබ් බින් උමයිර් සහ හස්රත් හම්සා බින් අබ්දුල් මුත්තලිබ් ඇතුළු මුස්ලිම්වරුන් 70 දෙනෙකු පමණ දිවි පිදීමෙනි. ඇත්ත වශයෙන්ම උහුද් සටන එදා සහ අද මුස්ලිම්වරුන්ට පාඩමක් විය. අල්ලාහ්ට සහ ඔහුගේ දූතයාට කීකරු වීමට අප මතක තබා ගත යුතුය, එවිට අපට නිසැකවම සාර්ථකත්වය ලැබෙනු ඇත.

**3. කිබ්ලාතෙයින් මස්ජිද් (مسجد القبلتين)**

"කිබ්ලා දෙකේ පල්ලිය" එහි සිංහල පරිවර්තනයයි.




හිජ්රි වසර දෙකේ රජබ් මස කුර්ආන් ආයත් 2:142-144 පහළ වීමත් සමග එතෙක් ජෙරුසලමේ මස්ජිද් අල්-අක්සා දිසාවට හැරී සලාතයන් කිරීම වෙනුවට එතැන් සිට මක්කාවේ කාබතුල්ලාහ්ව ඇති දිසාවට හැරී සලා කිරීම ආරම්භ කෙරින. එසේ කිබ්ලාවේ දිශාව වෙනස් කළ මොහොතේ නැමදුම් දිශාවන් දෙකක් හෙවත් කිබ්ලා දිසාවන් දෙකක් තිබුන නිසා එයට එම නම පටබැඳුනි . මස්ජිද් අල්-කිබ්ලාතෙයින් මුස්ලිම්වරුන්ට ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ එය වෙනස් වීමෙන් පසු පළමු සහා සලාහ් හෙවත් ජුම්මාහ් සලාත්යේ යාච්ඤාව කළ ස්ථානය වන බැවිනි.

**4). මස්ජිද් අල් කුබා**

මක්කාවේ සිට මදීනාව දක්වා මොහම්මද් (සල්) තුමාණන්ගේ විශේෂ ගමන මතකද? එය හිජ්රා ලෙස හඳුන්වන අතර එය ඉස්ලාමීය ඉතිහාසයේ අතිශයින්

වැදගත් වේ. මෙම ගමන ඉස්ලාමීය දින දර්ශනයේ ආරම්භය සනිටුහන් කරයි! නබිතුමානන් විසින් මස්ජිද් කුබා ගොඩනගන්නේ මෙම ගමන අතර මගදීය.

මෙම ගමනේදී නබිතුමා කුබා මස්ජිදය ඉදි කළේය. එය මදීනාවට කිලෝමීටර් 3.5 ක් පමණ පෙර පිහිටා ඇත. එය මුහම්මද් නබිතුමාගේ ආගමික මෙහෙවර අතරතුර ඉදිකරන ලද පළමු මස්ජිදය වීම ද විශේෂත්වයකි.

මෙහි ඉටු කරන එක් සලාතයකට ලැබෙන විපාකය එක් උම්රා එකකට ලැබෙන විපාකයට සමාන බව නබිතුමාණන් පැවසූහ.

**5). සබා මස්ජිද් :**

මෙය මස්ජිද් අල් නබවියට නුදුරින් පිහිටි ස්ථානයකි. එහි කුඩා මස්ජිද් හතක් එක ළඟින් පිහිටා තිබී ඇත. දැනට එහි මස්ජිද් හයක් දක්නට තිබේ.

**6). මදීනා කෞතුකාගාරය.**

## ස්ජිද් අල් අක්සා.

ඉබ්‍රාහිම් (අ.ස), දාවුද් (අ.ස) සහ ඔහුගේ පුත් සුලෙයිමාන් (අ.ස), ඊසා (අ.ස) සහ අවසානයේ මුහම්මද් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ඇතුළු තවත් අනාගතවක්තෘවරුන් මස්ජිදුල් අක්සා හි යාච්ඤා කර ඇති අතර, එහි යාච්ඤා කිරීමෙන් මුස්ලිම්වරුන් ඔවුන්ගේ අඩිපාරේ යමින් සිටින බවට සාක්ෂි දරයි.

මෙය පලස්තීනයේ පිහිටා ඇත. මෙයට නුදුරින් යේසුස් වහන්සේ (ඊසා අ.ස.) උපන් බෙත්ලෙහෙම් නගරය පිහිටා ඇත.



---

## ඉස්ලාමීය අධ්‍යාපනික හා සාමාජයීය මධ්‍යස්ථාන..

මුස්ලිම්වරුන්ගේ එදිනෙදා ජීවිතයේ වැදගත් ස්ථාන කිහිපයක් පහත දැක්වේ. නවක මුස්ලිම්වරුන් මේවා පිළිබඳව දැනුවත් වී ඒවා සමඟ සම්බන්ධ වීම ඉතා ප්‍රයෝජනවත් වේ.

**ඉස්ලාමීය දහම් පාසැල් (මදර්සා).**

මදර්සා යනු අරාබි භාශාවෙන් "පාසල" යන්නය. සෞදි අරාබියාව වැනි රටවල සෑම ළමයෙක්ම එක වසර සිට උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබන්නේ මදරසා වලය. නමුත් ශ්‍රී ලංකාවේ මදර්සා පාසල් ලෙස හඳුන්වන්නේ ඉස්ලාමීය දහම් පාසල් වලටය.

එවැනි මධ්‍යස්ථාන ඔවුන්ගේ හැකියාවන් මත පදනම්ව විෂයයන් තෝරා ගනිමින් ඉස්ලාම් ඉගැන්වීමේ නිරත වේ. ඔවුන්ගේ ක්‍රියාකාරකම් බොහෝ විට අධ්‍යාපනය ලබා දීමට පමණක් සීමා වේ. කුඩා කුරාන් පංතියක සිට රජයේ ලියාපදිංචි කර, මනා කළමනාකාරීත්වයන්ගෙන් යුක්තව නේවාසික පහසුකම් පවා ලබා දී පූර්ණ කාලීන පාඨමාලා පවත්වා මවුලවිවරු, ඉස්ලාමීය ආගමික විද්වතුන් සහ දේශකයින් බිහිකිරීමේ තත්ව දක්වා ඇති පරාස වල, "මද්රසා" යන නමින්ද, සමහර ඒවා "අරාබි පාසල්" යන නමින්ද, තවත් ඒවා "කුරාන් පංති" ලෙසින්ද මෙම ඉස්ලාමීය දහම් පාසල් ඇත.

මෙම පාසල්වල අරාබි භාෂාව උගන්වනු ලැබේ. දෙවියන් වහන්සේගේ අවසාන එළිදරව්ව අරාබි භාෂාවෙන් හෙළිදරව් කරන ලද නිසාත්, අවසාන දේවදූතයන්ගේ ඉගැන්වීම් ද අරාබි භාෂාවෙන් ලියා ඇති නිසාත්, අරාබි භාෂාව ඉගෙනීම ඒවා නිවැරදිව තේරුම් ගැනීමට සහ ඒවා සමාජයට නිවැරදිව ගෙන ඒමට බලවත් මෙවලමකි.

මෙම දහම් පාසල්වල ඉගෙනුම ලබන සිසුන් අතර සිංහල කතා කරන්නන් සිටීම සිංහල ජනතාවට ආශිර්වාදයකි. හේතුව ඔවුන් හරහා සිංහල ජනතාවට දෙවියන් වහන්සේගේ ධර්මය ඉතා පැහැදිලිව අවබෝධ කර ගැනීමට අවස්ථාව ලැබෙන බැවිනි.

**ඉස්ලාමීය විශ්වවිද්‍යාල (ජාමියා).**

ඉස්ලාම් යනු ඉගනගෙන අවසන් කල හැකි විෂයක් නොවේය. අල්ලාහ් දෙවිඳුන් එය පහළ කර ඇත්තේ ඒ ආකාරයටය. ඉගනගන්නා කෙනෙකුට එය මහා සාගරයක් වැනිය. මෙනිසා ඉතිහාසයේ සිටම ඉස්ලාමීය විද්වතුන් බොහෝමයක් බිහි විය. වර්ථමානයේ එය වඩාත් ඵලදායි ලෙස සිදු කිරීමට ඉස්ලාමීය විශ්ව විද්‍යාල බිහි කර ඇත. තමන් විසින් හෝ තම දරුවන් හරහා ඒවායින් ප්‍රයෝජන ගැනීමට නවක මුස්ලිම් වරුන්ද සළකා බැලිය යුතුයි.

**දාවා (ඉස්ලාමය ප්‍රචාරය කරන) මධ්‍යස්ථාන.**

ශ්‍රී ලංකාව තුල හෝ පිටරටක සිටින නවක මුස්ලිම්වරුන්, විශේෂයෙන් තම අධයාපනික කටයුතු, හජ් උම්රා වැනි වන්දනා කටයුතු, ෂහදා සහතික ලබා ගැනීම් වැනි කටයුතු ඉටුකරදීම වෙනුවෙන් ඉදිරිපත් වී සිටින මෙවැනි සංවිධාන හඳුනාගෙන ඔවුන් සමග සම්බන්ධ වී කටයුතු කිරීමට යොමු විය යුතුයි. මුස්ලිම් නොවන අයටත් මෙම (පිලිගත්) මද්‍යාස්ථාන හරහා ඉස්ලාමීය දැනුම ලබා ගත හැක.

**සුභසාධන මධ්‍යස්ථාන.**

මුස්ලිම්වරුන්ට අල්ලාහ්ගේ තෘප්තිය දිනාගැනීම වෙනුවෙන් හැකි තරම් සදකා හෙවත් සුභසාදන කටයුතුවල නිරත වන ලෙස දිරිගන්වා ඇත. රමධාන් සහ ඊද්

අවුරුදු සමයන්හී මොවුන් වැඩි වශයෙන් දාන මාන කරති. ඒ වගේම සමහරුන් සදකතුල් ජාරියාත් වෙනුවෙන් ද උනන්දුව දක්වයි. මෙම සදකා එකතු කර බෙදා හරින මධ්‍යාස්ථාන සමග නවක මුස්ලිම්වරුන් සම්බන්ධවී කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

පාරම්පරික මුස්ලිම්වරුන්ට මෙන්ම මුස්ලිම් නොවන අයටත් මෙම මදාාස්ථාන හරහා ඇතැම් සේවාවන් ලබා ගත හැක.

**සකාත් එකතු කරන සහ බෙදාහරින මධ්‍යස්ථාන.**

'සකාත් ගෙවන්නන් සහ සකාත් ලබන්නන්' යන ලිපියෙහි වැඩි විස්තර සඳහන් කර ඇත.

නවක මුස්ලිම්වරු සකාත්හි ප්‍රතිලාභීන් වෙති. එය දැරිය හැකි අයට සකාත් ලබා දිය හැකි අතර එය අවශ්‍ය අයට සකාත් ලබා ගත හැකිය. එබැවින්, සකාත් එකතු කර බෙදා හරින අය සමඟ සම්බන්ධ වීමට උත්සාහ කළ යුතුය.

නවක මුස්ලිම්වරුන් සහ සකාත් එකතු කර බෙදා හරින මධ්‍යස්ථාන අතර සම්බන්ධතා ඇති කර ගැනීමට උත්සාහ කළ යුතුය.

**ඉස්ලාමීය විද්වතුන්ගේ කමිටුව.**

සමස්ත ලංකා ජම්ඉයිතුල් උලමා සභාව (ACJU) ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය සමාජය කරමින් නියෝජනය කරමින් විවිධ කටයුතු වල නියැලෙයි.

නවක මුස්ලිම්වරු වෙනුවෙන් ඔවුන් ගන්නා උත්සාහයන් සහ ඔවුන්ගේ දායකත්වය ගැනද දැනුවත් විය යුතුයි. එය නවක මුස්ලිම්වරුන්ගේ ඉදිරි ගමනට ශක්තිමත් පදනමක් විය හැකියි.

**කාති (ක්වාසි) උසාවිය.**

කාති (ක්වාසි) උසාවි ක්‍රමය මුස්ලිම්වරුන්ට අදාලවන ලෙස විශේෂයෙන්ම මුස්ලිම් විවාහය හා අදාලවන කටයුතු කරණ ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුල මීට වසර 70 කට පමණ පෙර ව්‍යවස්ථාගත කර ඇති නීතියකි. එය අර්ධ

අධිකරණ වැනි තත්වයක් ඇත්තකි. මේවා තුල යම් යම් අර්බුධකාරී සිදුවීම් ඇතිවන බවද ඇතැම් විට අපට අසන්නට ලැබේ.

**රජය හා සම්බන්ධ ආයතන. (මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව)**

---

# අදාන් සහ නැමදුම.

ඉස්ලාමීය පිළිවෙතක් වන "අදාන්" යනු යාච්ඥාවක් සඳහා කාලය ආරම්භ වී ඇති බවත් නැමදුම සිදුකරන ස්ථානය වෙත පැමිණෙන ලෙසත් නිශ්චිත වචනවලින් අන්යයන්ට කරන ආරාධනාවකි. මස්ජිදයක සිට (හෝ වෙනත් කුමණ ස්ථානයක සිට හෝ) නිශ්චිත වෙලාව පැමිණි විට මුස්ලිම්වරුන් ගෙන් කෙනෙකු විසින් තම නිර්මාතෘ වන දෙවියන්වහන්සේව නැමදීමට මෙම කැඳවීම කරනුයේ එය ඇසෙන මායිමේ සිටින සියළුම මිනිසුන්ටය. [කාන්තාවන්ට නම් නිවසේදීම දෙවියන් නැමදීමට උනන්දු කර ඇත].

එම කැඳවීම මුළු ලොව පුරාම එකම ආකාරයට සිදු කරනු ලැබේ. එනිසා එය නබි (ﷺ) තුමා භාවිතා කල අරාබි භාශාවෙන්ම සිදු කරනු ලැබේ. මුස්ලිම් නොවන බොහෝ දෙනෙකුට එම පණිවිඩයේ අරුත නොතේරෙන නමුත් එය මුස්ලිම් ජනතාවගේ නමස්කාරය සිහිපත් කරන පණිවිඩයක් ලෙස ඔවුන් දනී. එනිසා ඒ ගැන ඔවුනට එය එතරම් වැදගත් දෙයක් ලෙස නොහැඟෙන අතර සමහර විට එම ශබ්දය කරදරයක් ලෙසටද හැඟෙන්නට ඉඩ ඇත.

මුස්ලිම්වරුන්ගේ නැමදුම් ස්ථාන වලින් මෙම කැඳවීම දිනකට පස් වතාවක් බැගින් වසර පුරාම නොනවත්වා සිදු කරනු ලබයි. කුමක්ද මේ ශබ්දය? කුමක්ද මේ කැඳවීම? මෙම ලිපිය මගින් ඒ ගැන ඔබට හොඳ වැටහීමක් ලැබෙනු ඇත. එය සෑම මිනිසෙකුම දැන ගත යුතු දෙයකි. හේතුව, එම ආරාධනය මුස්ලිම්වරුන්ට පමණක් කරන ආරාධනයක් නොවේ.

සියල්ල නිර්මාණය කල දෙවියන්වහන්සේ මිනිසාව නිර්මාණය කලේ සුවිශේෂී කාරණාවකටය. එනිසා ඔහුව නිර්මාණය කර ඇත්තේද සුවිශේෂී ආකාරයකටය.

විශ්වයේ පවතින විවිධාකාරයෙන් වූ වස්තූන් සියල්ල අංගසම්පූර්ණ ලෙස දෙවියන්වහන්සේ විසින් (මැවීමකින්) නිර්මාණයකර ඇති දේවල්ය. ඒවා කිසිවකටත් අහඹු ඇතිවීමකින් බිහි වූ ඒවා නොවේය. බෞද්ධ පොතපත වල පවා සඳහන් ආකාරයට පඨවි ආපෝ තේජෝ වායෝ යන සතරමහා භූත වලින් සෑදී ඇති සෑම දෙයක්ම, එනම් ඒවා ඉර, හඳ, අහස, පොලොව, අපට පෙනෙන ජීවීන්ගේ ශරීර, නොපෙනෙන ජීවීන්ගේ ලෙස තිබිය හැක. ආවර්තිතා වගුව තුල අප දකින සියලුම මූලද්‍රව්‍ය මේ යටතට ගැනේ. ඔබේ ශරීරයේ ඇති ප්‍රෝටෝන ඉලෙක්ට්‍රෝන පවා. ඒවා සියල්ල තුල සුවිශේෂී නිර්මාණාත්මක සැලසුම් සහගත ව්‍යුහ ඇත. එසේම ඒවා සියල්ල තමන්ගේ සීමාවන් තුල නිශ්චිතවම සිටී. ඇත්තටම සොබා දහම ලෙස අප හඳුන්වන්නේ මෙයයි. සොබා දහම තම නිර්මාතෘට අවනතව යටහත්ව කීකරුව පවතී. උදාහරන වලින් පවසනවා නම්, ඉර නිශ්චිත ප්‍රමාණයන්ගෙන් ආලෝකය විහිදුවමින් තමන්ගේ නිශ්චිත මාර්ගයේ නිවැරදිවම ගමන් කරයි. ජල අනුවක් කිසි විටකත් එයට නියමිත සීමාවෙන් එපිට කටයුතු නොකරයි. එක් එක් සතුන්ගේ ඇති රුධිර සෛල ඒවාට නියමිත රාජකාරී වල යෙදෙයි. දෙවියන් පවසන ආකාරයට මේවා සියල්ල ඔවුන්ට නියමකර ඇති ආකාර වලින් තම නිර්මාතෘව නමදිමින් සිටී.

ඉහත සඳහන් මූලද්‍රව්‍ය උපයෝගීකරගෙන දෙවියන් නිර්මාණය කර ඇති ජීවී කාන්ඩ ඔවුන්ගේ ජීවන පැවැත්ම, සිතන පතන ආකාරය, බුද්ධිය, විචාරශීලීත්වය වැනි කරුණු මත ඔවුන්ව එකිනෙකාගෙන් වෙනස් වේ.

ආලෝකය මගින් නිර්මාණය කර ඇති මලායිකාවරු (හෙවත් දේව දූතවරුන්) සෑම විටම දෙවියන්ට කීකරුව, ඔවුන්ට නියමිත කාරණාවන් ඉටුකරමින්, දෙවියන්ව නිසි පරිදි නමදිමින් සිටී.

ශාක සහ සතුන් ඔවුන්ව සීමා සහිත රාමුවක් තුල ආකෘති ගත (format) කර ඇති ආකාරයට ජීවත් වේ. දෙවියන් පවසන ආකාරයට ශාක සහ සතුන් පවා ඔවුන්ට

නියම කර ඇති ආකාර වලට දෙවියන්ව නමදිමින් සිටී. එය ඔවුන්ගේ ස්වභාවික ලක්ෂණයකි. නමුත් මිනිසාව මීට වඩා වෙනස් ආකාරයකට නිර්මාණය කර ඇත.

දෙවියන් මිනිසාව නිර්මාණය කර ඇත්තේ ඔහුට තම කැමැත්තෙන් ආධ්‍යාත්මික වශයෙන් වෙනස් විය හැකි අයෙකු ලෙසය. මිනිසා - ශාක, සතුන් සහ දේව දූතයන්ගෙන් වෙනස් වන්නේ මෙමගින්ය.

ඒ අනුව මිනිසා එක්තරා විදිහක දුර්වල කෙනෙකි. එනම් මිනිසා ශාක, සතුන්, මලායිකාවරුන් මෙන් පූර්ව ආකෘති ගත කල (හෙවත් pre format කල) ජීවියෙකු නොවේය. ඔහුගේ හදවත තුල හොද-නරක තමන් කැමති තරම් පරාසයක් තුල ක්‍රියාත්මක කරවීමට අවස්ථාව ඇති කර ඇත. ඔහුගේ විචාර බුද්ධිය ඔහු කැමති පරිදි අඩුවෙන් හෝ වැඩියෙන් භාවිතා කිරීමට අවස්ථාව සලසා දී ඇත. තමන් තුල හෘද සාක්ෂියක් ඇතත් එය අවංකභාවයෙන් භාවිතා කරනවාද, නැත්නම් එය හීන කරගෙන හෘද සාක්ෂියක් නැත්තෙක් ලෙස හෙවත් තිරිසනෙක් ලෙස හෝ ඊටත් වඩා පහලට වැටුනු කෙනෙක් ලෙස ජීවත් වෙන්නට තරම් අවකාශය ඇත්තෙකු ලෙස මිනිසාව නිර්මාණය කර ඇත. මෙය මිනිසාට ඇති ඉතා අවධානම් තත්වයකි. එය මිනිසාට ඇති අභියෝගයකි. වරදට පෙළඹී තමා තමාටම මහා හානියක් කර ගැනීමට ඉඩ ඇත. තමන්ට තමන්ගේ නිර්මාතෘව පවා අමතක වී, ජීවිතයේ සැබෑ අරමුනෙන් බැහැර වී මරනින් මතු මහත් අවාසනාවන්තයෙකු වීමට ඉඩ ඇත.

මිනිසාව නිර්මාණය කල දෙවියන් මිනිසාගේ මෙම තත්වය ඉතාම හොඳින් දනී. එනිසා ඒ සියලුම අවධානම් වලින් මිදී ඉතාම හොද කෙනෙකු ලෙස මේ ලෝකය තුල ජීවත් වී අවසානයේ මහා භාග්‍යයවන්තයෙකු වන තත්වයක් දක්වා මේ ජීවිත කාලය ගත කිරීමට නම් දෙවියන් හදුන්වා දී ඇති හොඳම මාර්ගය ලෙස මෙම සලාතය හෙවත් දෙවියන් නැමදීම පළමු පියවර ලෙස පෙන්වා දී ඇත.

මිනිසා ගේ සිත වේගයෙන් වෙනස් වන සුළුය. තමාගේ සිතුම් පැතුම් වලට අමතරව අපට නොපෙනී අපව මුලාවට යොමු කිරීමට නරක දැය මුමුනමින් අප සමග සිටින ශේතාන් වරුන්ගේද බලපෑම නිසා මිනිසාට තමා තුලින්ම වෙහෙසක් දරා තමාව පාලනය කර ගැනීමක් කර ගත යුතුව ඇත. එයට හොඳම

පියවර ලෙස උදෑසන, දහවල, අපරභාගය, සැන්දෑව සහ නින්දට පෙර ලෙස දවසේ කාලය පහට බෙදා එම කාලවල දෙවියන්ව නැමදීමට යොමු වීම තුලින් තමාව දවස තුල කිහිප වතාවක්ම නැවුම් (re-fresh) කර ගත හැක. මෙමඟින් යහපත් ගති ඇති මනුෂ්ශයෙකු වීමට පුළුවන. තම නිර්මාතෘගේ තෘප්තිය දිනාගත් කෙනෙකු විය හැක. තමාගේ නිර්මාතෘව ප්‍රසංශා කිරීමටත්, ඔහු සමග සම්බන්ධතාවය තබා ගැනිමටත්, තමාගේත්, පවුලේ අයගේත්, අසල්වාසීන්ගේත්, මුළු ලෝකවාසී සෑම ජීවියෙකුගේම යහපත වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීමටත් මෙම කාලය භාවිතා කල හැක.

මෙය භාවනාවකි. මෙය තනිව උනත් කල හැකියි. නමුත් අපි ජීවත් වන්නේ තනිවම නොවෙයි. අසල්වාසීන් හෝ ගමනකදී නම් මගදි හමුවන අය සමගය. සමාජය තුල ජීවත් වන විට සමාජයේ එකිනෙකා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයකින් යුතුව ජීවත් වීමට සිදු වේ. මෙයට හොඳම පාඩමක් ලෙස සලාතය සමුහයක් ලෙස එක්ව කිරීමේ ක්‍රමවේදයක් දෙවියන් විසින් අපට පෙන්වා දී ඇත. මේ සඳහා තමයි අදාන් හරහා ඔබට ආරාධනා කරනුයේ. මේ තමයි මිනිසාට මෙලොවත් පරලොවත් යන දෙකම සාර්ථක කරගැනීමට තම නිර්මාතෘ විසින් ඉදිරිපත් කර ඇති මූලිකම වත් පිලිවෙත.

මෙම මනුෂ්‍ය නමස්කාරයෙන් දෙවියන්ට කිසිම ප්‍රයෝජනයක් නැත. මිනිසා විශ්වාස කළත් නැතත්, නමස්කාර කළත් නැතත් දෙවියන් ශ්‍රේෂ්ඨයි. මෙම නමස්කාරය මිනිසාට තම ජීවිතය යහමගට ගැනීමට උපකාර වනු ඇත. එහි විශාල පාඩමක් ඇත. එය මෙම අදාන් සහ සලාත් හරහා නැවත නැවත මතක් කර දී මිනිසාව නොමගට තල්ලු වීමෙන් ආරක්ෂා කරයි. එය නිසි පරිදි අවබෝද කරගෙන නිසි පරිදි ක්‍රියාවට නගන්නා ජයග්‍රාහයෙකු වන බවට දෙවියන් වහන්සේ පෙන්වා දී ඇත.

අදාන් හෙවත් මෙම ආරාධනාව කරන කෙනාව මුඅද්දීන් ලෙස හඳුන්වයි. ඔහු ප්‍රකාශ කරන වචන වල පහත අදහස අන්තර්ගත වේ. එහි වරහන් තුල ලියා ඇති දෙය අර්ථය වඩා පැහැදිළි කර දීමට එකතු කළ වදන්ය.

- (අපවත් මෙම විශ්වයත් නිර්මාණය කර ඇති) දෙවියන් වහන්සේ ඉතාම ශ්‍රේෂ්ඨ කෙනෙකි////.
- ඔහු හැර (ඔහුට වඩා උසස්) වෙනත් නැමදීමට සුදුස්සෙක් හෝ දෙවියෙක් නැත. මම ඔහු ගැන සාක්ෂි දරන්නෙක්මි//.
- (එසේම ඔහු විසින් අප වෙත එවා ඇති) අවසන් දේව දූතවරයානන් වන නබි මොහම්මද් (ﷺ) තුමා ගැනද මම සාක්ෂි දරන්නෙක්මි//.
- දෙවියන්ව නැමදීමට පැමිනෙන්න//.
- සාර්ථකත්වය උදාකර ගැනීමට (ඉක්මනින්) පැමිනෙන්න//.
- (ඔබ පැමිනියත් නැතත්, ඔබ දෙවියන්ව නැමදුවත් නැතත්) එම දෙවියන් ඉතාමත් ශ්‍රේෂ්ඨ කෙනෙකි//.
- ඔහු හැර (ඔහුට වඩා උසස්) වෙනත් නැමදීමට සුදුස්සෙක් හෝ දෙවියෙක් නැත/.

පාන්දර නැමදුමට ආරාධනා කිරීමේදී මීට අමතරව

- "නින්දට වඩා මෙම නැමදීම උතුම්//" යැයි ද පවසනු ලැබේ.

ටික වෙලාවකට පසු සලාතය හෙවත් නැමදුම ආරම්භ කරන අවස්ථාවේදී මෙයම මෙලෙස පවසයි. එම කැදවීම "ඉකාමත්" ලෙස හැඳින්වේ.

- දෙවියන් වහන්සේ ඉතාම ශ්‍රේෂ්ඨ කෙනෙකි//.
- ඔහු හැර නැමදීමට වෙන දෙවියෙක් නැතැයි මම සාක්ෂි දරමි/.
- තවද මොහම්මද් දෙවියන්ගේ දූතවරයා බවටද මම සාක්ෂි දරමි/.
- නැමදුමට එන්න/.
- සාර්ථකත්වය සඳහා (ඉක්මනින්) එන්න/.
- නැමදුම ආරම්භ කලා//.
- දෙවියන් වහන්සේ ඉතාම ශ්‍රේෂ්ඨ කෙනෙකි//.
- ඔහු හැර නැමදීමට වෙන දෙවියෙක් නැතැ/.

- ALLAHU AKBAR ////- Allah is the greatest (to be repeated 4 times).
- ASH-HADU ANLA ILAHA ILLALLAAH //- I testify that there is no god but Allah. (to be repeated 2 times).
- ASH-HADU ANNA MUHAMMADAN RASULULLAH //- I testify that Muhammad is Allah's messenger. (to be repeated 2 times).
- HAYYAA LAS SALAAT //- Come fast to prayer. (to be repeated 2 times).
- HAYYAA LAL FALAAH //- Come fast to success. (to be repeated 2 times).
- ALLAHU AKBAR //-Allah is the greatest. (to be repeated 2 times).
- LAA ILAHA ILLALLAAH /- There is no god but Allah. (to be recited once).

Note: In the Adhaan, for the Fajr (Dawn) prayer, the following words are recited twice after Hayya'alal Falaah:

- ASSALATU KHEIRUM MINA NAWM //-. The prayer is better than sleep (to be repeated 2 times).

දෙවියන් නැමදීම සිදු කරනුයේ දෙවියන් විසින්ම මිනිසාට දී ඇති උපදෙස් අනුවමය. එය සිදුකරන ආකාරය අවසන් දේව දූත මොහම්මද් (ﷺ) තුමා ආදර්ශයෙන් පෙන්වා දී ඇත. නිවැරදි මාර්ගයේ සිටින මුස්ලිම්වරුන් ලොව කොතනකදී උවත් එකම ආකාරයට මෙම නැමදුම සිදු කරනු ලබයි.

නැමදුමේදී සෑම මුස්ලිම්වරයෙකුම එක් ඉමාම් වරයෙක්ව අනුගමනය කරයි. නමුත් ප්‍රාර්ථනා කිරීමේදී කිසිම අතරමැදියෙකු සම්බන්ධ කර නොගෙන තමා සහ තම නිර්මාතෘ අතර ඍජු සම්බන්ධතාවයක් තබා ගනී. සෑම නැමදුමක්ම

ආරම්භ කරන්නේ නිශ්චිත ප්‍රාර්ථනාවකිනි. එය අල් කුරාන් හී පළමු පරිච්ඡේදයයි. එහි සිංහල පරිවර්ථනය මෙසේය.

1. අසීමිත දයාව හා අසම සම අනුකම්පාවෙන් යුත් අල්ලාහ් ගේ නාමයෙන්.
2. සියලු ප්‍රසංශා අල්ලාහ් ටය. (ඔහු) සකල ලෝකයම නිර්මාණය කර, සංවර්ධනය කර, සංරක්ෂණය කර, පෝෂණය කරන්නා වූද,
3. අපරිමිත අනුකම්පා වද, අසම සම දයාවද,
4. විනිශ්චය දින අධිපති (ද වන්නේ ය).
5. (අනුකම්පාව හා දයාවද පිරි අප දෙවියනේ), ඔබවම අප නමදින්නෙමු. ඔබගෙන්ම අප පිහිට පතන්නෙමු.
6. ඔබ අපට ඍජු මාර්ගය පෙන්වා දෙනු මැනව.
7. ඔබගේ අනුකම්පාව හා දයාව කාහට පහළ කලේද, ඔවුන්ගේ මාර්ගයේ යාමට සලස්වනු මැනව, එය ඔබගේ කෝපයට පත් වූවන් ගිය මාර්ගයෙහිද නොව, අයහමගෙහි වූවන්ගේ මාර්ගයෙහීද නොව.

මේ ලෝකයේ සිටින මිනිසුන් යන මාර්ග තුනක් ඇති බව දෙවියන් පෙන්වා දෙයි.ඒවා නම්,

1. දෙවියන් පෙන්වාදුන් ඍජු මාර්ගයේ යන අය.
2. දෙවියන් ගේ සම්බන්ධයක් නැති වෙනත් මාර්ග වල යන අය.
3. දෙවියන් පෙන්වා දුන් මාර්ගය විකෘති කරගෙන වැරදි මාර්ග වල යන අය.

මේවායින් පළමු මාර්ගයේ යාමට තමයි අදාන් හරහා ආරාධනා කරමින් එම නැමදුම සිදුකරනුයේ.

අපගේ නිර්මාතෘ (අල්ලාහ්) දෙවියන් මෙසේ පවසයි.

*ඔබ ඔබගේ දෙවියන්ව නමදිනු. ඔහුට කිසිවක් සමානයන් වශයෙන් නොතබනු. දෙමාපියන්ට කෘතඥ වනු. (එසේම) ඥාතීන්ටද, අනාථයින්ටද, දුප්පතුන්ටද, අසල්වැසි ඥාතීන්ටද, අසල්වැසි අන්‍යයන්ටද, (සැමවිටම) ඔබ සමග සිටින මිතුරන්ටද, මගියන්ටද, ඔබ යටතේ සිටින්නන්ටද (ආදරයෙන් යුතුව) කෘතඥ*

*වනු. කව්රුන් ගෞරිතව ආඩම්බරයෙන් යුතුව හැසිරෙන්නේද, ඔහුව නියත වශයෙන්ම අල්ලාහ් ප්‍රිය කරන්නේ නැත. (Al Quran 4:36)*

**සලාත් වර්ග**

- දෛනික පස්වේල අනිවායී සලාත් (ෆජර්,දොහර්,අසර්,මගරිබ්,ඉෂා)
- ප්‍රධාන සලාතයන්ට පෙර සහ පසු සුන්නත් සලා
- සිකුරාදා ජුම්මා සලාතය
- ඊද් අවුරුදු සලාත් (රමදාන් සහ ඊද් අල් අද්හා)
- ලුහා සලාතය (ඉර උදාවේ සිට දහවලට පෙර)
- ග්‍රහණ සලාතය
- රාත්‍රිය මැද කරන සලාතය (කියාමුල් ලෛයිල්) [තරාවි සලාතය (රමධාන් මස රාත්‍රී සලාතය)]
- රාත්‍රියේ අවසාන (තහජ්ජුත්) සලාතය (ෆජර් අදාන් කීමට පෙර)
- ජනාසා සලාතය (කෙනෙකු මිය ගිය පසු)

---

## ඉස්ලාමයේ වැදගත් ලක්ෂණ.

ඉස්ලාම් දහම සර්වබලධාරී දෙවියන්ගෙන් පහළ වූ දහමකි. එහි විශේෂත්වය වන්නේ එම දහම තුල ඒක දේව විශ්වාසය ඉතා ප්‍රභල ලෙස ආරක්ෂාකොට තිබීමයි. ඉස්ලාම් දහම තුල පිළිම වන්දනයක් නැත. එම නිසා ඉස්ලාමීය දේවස්ථාන තුල අල්ලාහ්ගේ හෝ නබිවරුන්ගේ හෝ පිළිම නොමැත.

ඉස්ලාම් දහමේ ප්‍රධාන මූලාශ්‍රයන් අල්-කුරානය සහ අල්-හදිස් වේ. අල් කුරානය ලියැවී තිබෙන්නේ අල්ලාහ්ගේම වදන් වලිනි. මේ නිසා කුරානයට අනුවාද දෙක තුනක් නොමැත. අල් කුරානයේ විවරණය ලෙස සලකනු ලබන්නේ නබිතුමාගේ හදිස් ය. ඒවා ඉතා සුපරික්ෂාකාරීව ග්‍රන්ථාරුඪ කොට ඇත. මේ හේතුවෙන් ඉස්ලාම් දහමේ නිවැරදිතාවය ආරක්ෂා වී තිබේ.

අල් කුරානය නබිතුමා ජීවතුන් අතර සිටියදීම සම්පූර්ණ කරන ලද්දේය. එහෙත් නබිතුමා ජීවත්ව සිටියදී විවිධ ද්‍රව්‍ය මත ලියා තබා තිබුණු කුරානයේ කොටස් එක් ග්‍රන්ථයක් ලෙස සකස් කරනු ලැබුවේ ඉස්ලාමයේ පළමු කලීෆා වන අබුබකර් රලි තුමාගේ කාලයේදීය. ඉස්ලාමයේ තුන්වන කලීෆා තුමාගේ කාලයේදී එය නැවත පිටපත් කොට ඉස්ලාම් රාජ්‍යයේ නොයෙකුත් රටවල් වලට බෙදා හැර ඇත. මේ නිසා අල්-කුරානය අද වන තුරුත් කිසිම වෙනසකට ලක් නොවී ආරක්ෂා වී තිබේ.

වෙනත් ආගම්වල මෙන් නොව අල්-කුරානය දෙවියන්ගෙන් පහළ වූ පණිවිඩයක් බව සනාථ කිරීම සඳහා අවශ්‍යකරන කරුණු කාරණා කුරානය තුලම ඇත. එම නිසා එය දේව පණිවිඩයක් බව නිසැකවම දැනගෙන පිළිපැදිය හැකිය. කුරානයේ ඇති විශේෂත්වයක් වන්නේ එය සම්පූර්නයෙන්ම කටපාඩම් කල හැකි වීමයි.අල් කුරානය එක් ජන කොට්ටාසයක් වෙනුවෙන් පමණක් පහළ වී නැත. එබැවින් එය මුළු මහත් මිනිස් වර්ගයාටම අයත් වේ. එසේම මුහම්මද් නබිතුමා එක් ජන කොට්ටාසයක් වෙනුවෙන් තෝරා එවන ලද දූතයෙක් නොවේ. ඔහු මුළුමහත් මිනිස් වර්ගයා වෙනුවෙන් පහළ වූ නබිවරයෙකි. මෙම කුර්ආන් වැකියෙන් එය සනාථ වන්නේය. *"අපි ඔබව මිනිස්වර්ගයාට කරුණාව දැක්වීමට මිස යැව්වේ නැත" (කුරානය 17:107).*

ඉස්ලාම් දහමට සුවිශේෂී කරුණු කිහිපයක් පහත දැක්වේ.

- ඉස්ලාම් දහම වැළඳගත් සියළුදෙනාම සහෝදරයින් ලෙස සලකනු ලැබේ. ඒ අනුව එහි කුල බේද, වර්ණ බේද, ජාති බේද නොමැත.
- ඉස්ලාමයේ උගන්වා ඇති නැමදුම් ඕනෑම කෙනෙකුට පහසුවෙන්ම ඉටු කල හැකිය. ලෝකයේ කොතැනකදීත් පංච කල සලාතය ඉටු කරන්නේ එකම දිශාවකට එකම භාෂාවෙන් ය.
- ඇති-නැති පරතරය අවම කොට දුප්පතුන්ටත් ජීවත් වීමට අවස්තාවක් ලබා දීම සඳහා ඉස්ලාම් දහමින් සකාත් අනිවාර්ය කොට තිබේ. සකාත් යනු ධනවතුන් විසින් තම වත්කම් සඳහා වාර්ෂිකව දුප්පතුන් සඳහා දෙනු ලබන බද්දකි.

- හජ් වන්දනයේදී ලොව පුරා වෙසෙන මුස්ලිම් බැතිමතුන් එකම ඇඳුමෙන් සැරසී එකම ක්‍රමයක් අනුගමනය කරමින් එකම කාලයක් තුලදී එකම අල්ලාහ් වෙනුවෙන් ඉටු කිරීම.
- ඉස්ලාම් දහමින් මිනිස් ජීවිතයට ඉහලම වටිනාකම ලබා දී තිබීම. ඒ අනුව අහේතුකව එක් මිනිසෙක් ඝාතනය කිරීම ලෝවැසියන් සියලුම දෙනාම ඝාතනය කලාට සමානව සලකනු ලැබේ. එසේම එක මිනිස් ජීවිතයක් බේරාගැනීම මුළු මහත් මිනිස් සංහතියම බේරා ගැනීමට සමානව සලකනු ලැබේ.

කෙසේ වෙතත් ලොව ඇති ජන මාධ්‍යයන් හරහා ඉස්ලාම් දහම ගැන බොහෝ වැරදි තොරතුරු සමාජ ගත කොට ඇත. ඒ හැරුණු විට මුස්ලිම් නොවන ලේඛකයින් විසින් ඉස්ලාම් දහමේ ප්‍රතිරූපය වෙනස් කිරීමට විශාල තැතත් ගෙන තිබේ. ඒ සෑම උත්සාහයක්ම ගෙන තිබියදීත් ඉස්ලාම් දහම ලෝකයේ වේගයෙන්ම ව්‍යාප්ත වන දහම බවට පත්ව තිබීම විශේෂත්වයකි. (FA)

---

## මානව දයාවෙන් පරිපූර්ණ වූ ඉස්ලාම්.

ඉස්ලාම් ධර්මය තුළ මානව ප්‍රජාවගේ පැවැත්මට අවශ්‍යය කරන්නා වූ සියලුම උපදෙස් පූර්ණ වශයෙන්ම ඇතුළත් කර තිබෙන නිසා ආගම සහ ප්‍රායෝගික ජීවිතය ඒකාබද්ධව පවත්වා ගත හැකිය.

මිනිස් ජීවිතයේ පැවැත්මෙහි සෑම අංශයක්ම සර්ව බලධාරී දෙවියන් වහන්සේගේ ප්‍රසන්න තාවය උදෙසා පවත්වාගෙන යාම මුස්ලිම්වරයෙකුගේ වගකීමයි. බොහෝ විට මිනිසා ආගම් පිළිබඳව තේරුම් ගන්නේ පවත්නා ආගම්වලට අනුව ක්‍රියාත්මක වන්නාවූ වත් පිළිවෙත් සමුදායක් අනුවය. උදාහරණයක් ලෙස ආගමානුකූල ජීවිතයක් ගත කරන අයෙකු සෑම විටම තමන් විශ්වාස කරන ආගමට අනුව ජීවිතයේ පැවැත්ම සකසා ගෙන ක්‍රියාත්මක වනු දැකීම තුළින් ආගමික භක්තිය අපි හඳුනා ගන්නෙමු.

බෞද්ධයෙක් නම් නිතර විහාරස්ථානයට යාම, පොහොය දවසෙහි පෙහෙවස් සමාදන් වීම, දාන මානාදී කුසල ධර්මයන් තුල ක්‍රියාත්මක වීම, ත්‍රිවිධ රත්නය ඇසුරු කරගෙන ජීවිතය පවත්වාගෙන යාම, යනාදී කරුණු තුළින් අප බෞද්ධයෙක් හඳුනා ගන්නෙමු.

කිතුනු වෙත්නම් ඔහුව හඳුනා ගැනීමට ඇත්තා වූ ලක්ෂණය වන්නේ නිතර දේව වචනය පරිහරණය කිරීම, සබත් දින නොකඩවා දේවස්ථානයට සහභාගිවීම, කිතුනු සහෝදරත්වයේ ඇසුර නිරන්තරයෙන් පවත්වාගෙන යාම, යේසුස් වහන්සේගේ ප්‍රේමය සමාජය තුළ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම. ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීම යනාදී කරුණු තුළිනි.

මුස්ලිම්වරයකු අප හඳුනා ගන්නේ තොප්පියක් දමාගෙන සිටීම, අරාබි සංස්කෘතියේ ඇඳුමක් පරිහරණය කිරීම, රැව්ල වවා සිටීම, පස්වේල සලාතයට පල්ලියෙහි සහභාගිකම පවත්වාගෙන යාම, අල්ලාහ් ගේ වචනය අනුව හා මහම්මත්නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ ජීවන ක්‍රියාවලියෙහි ඇතුළත් කරුණු ක්‍රියාත්මක කිරීම යනාදී මූලික කරුණු මුල්කරගෙනය.

ඉහතින් දක්වන ලද කරුණු අනුව අප ආගම් හා ආගමිකයන් හඳුනාගෙන ඇත්තෙමු.

මේ සැම ආගමක් තුළම පවත්නා ප්‍රතිපත්තීන් එකිනෙකට වෙනස්ය. මෙම වෙනස්කම් ඔස්සේ ආගම් පිළිබඳව යම් යම් මතවාද හා විවේචන සමාජය තුළ ඉස්මතු ව පවතී. බොහෝ විට පිටතින් පෙනෙන ස්වභාවයන් තේරුම් ගැනීම කරණ කොට ගෙන එකී වෙනස් වන්නා වූ කාරණා පිළිබඳව ගැටලු සහගත ස්වභාවයන් සමාජය තුළ ඉස්මතු වී පෙනෙන්නට ඇත.

මානව සමාජයෙහි කුමන විශ්වාසයන් ක්‍රියාත්මක වුවද එම විවිධත්වයන් තුළ ඒකීයත්වයට පැමිණිය හැකි මනුෂ්‍යාත්වයේ නියමයන් ක්‍රියාත්මක වන්නේ නැත. සැම ආගමක්ම පොදුවේ ගත් කල එම ආගම් පහළ වී තිබෙන්නේ සමාජයේ තෝරාගත් පිරිසකට පමණක් නොවේ. එය සමස්ත මානව වර්ගයාම නියෝජනය වන පරිදි ක්‍රියාත්මක වන්නාවූ පදනමක් යටතේ ආගමික ඉගැන්වීම් ක්‍රියාත්මක වන්නේය.

සෑම ආගමකින්ම උගන්වන කරුණු ඉතා පැහැදිලිව අධ්‍යයනය කර බලන විට එම ආගම් තුල සර්ව සාධාරණ මානව නියමයන් ක්‍රියාත්මක වන්නේය.

මිනිසුන් ආගම තුළට ඇතුල් වීමට ප්‍රථම මනුස්සත්වය පිළිබඳව අවබෝධ කර ගැනීම ඉතා වැදගත්ය. මනුෂ්‍යත්වයෙන් තොර කිසිදු දහමක් මිහිපිට ඇත්තේ නැත.

බුද්ධියට ඉඩ නොදී භක්තිය පමණක් මුල් කොටගත් කිසිදු සමාජයක් ස්ථාවරව ගොඩනැගෙන්නේ නැත. අද සියලු ආගමිකයන් දෙස බලන විට ඉතා පැහැදිලිව පෙනෙන්නට ඇත්තේ බාහිරව පවත්වාගෙන යනු ලබන භක්තිය සහ වත් පිළිවෙත් සමුදායක් පමණි. මිනිස් අභ්‍යන්තරය තුළ ආගමික ඉගැන්වීම්වල හරයන් ක්‍රියාත්මක වන්නේ නැත. ආගම් පහළ වූයේ සමාජයක් ගොඩනැගීමට නොව තනි තනි පුද්ගලයා වශයෙන් ආධ්‍යාත්මිකව හා සදාචාරාත්මකව ගොඩනැගීම සඳහාය.

අද කණ්ඩායම් වශයෙන් ආගමික මූලධර්මයන් පදනම් කොට ගෙන සමාජය ගොඩ නගන්නට උත්සාහ කළද පුද්ගල අභ්‍යන්තරය තුළ ආගමික හරයන් ක්‍රියාත්මක කිරීමට මිනිසුන් උත්සාහ කරන්නේ නැත. ආගම් ආරක්ෂා කිරීමට, ආගමික සත්‍යතාවයන් පැහැදිලි කිරීමට, තමන්ගේ උගත්කමට අනුව සමාජය හැඩ ගැස්වීමට, තමන්ගේ ආගම සත්‍ය ආගමක් ලෙස උද්දීපනය කිරීමට අන්‍ය ආගම් සංසන්දනය කිරීම හා හරි වැරදි පෙන්වා දීමට බොහෝ දෙනෙක් ඉදිරිපත් වී සිටිති... එහෙත් කිසිවකු ආගමානුකූලව ජීවිතය හැඩගස්වා ගනිමින් එම ප්‍රතිපත්තීන්ට අනුකූලව ජීවිතය පවත්වාගෙන යාමට, පවුල් සංස්ථාව ගොඩනැගීමට, උත්සාහ කරන්නේ නැත. එම නිසා ආගම් යනු මිනිසාට තේරුම් ගැනීමට අපහසු ඉතා ගැඹුරු සත්‍යතාවයන් බවට පත්වී තිබේ. බොහෝ දෙනෙකු ආගමේ නාමයෙන් තම තමන්ගේ බලය හා තම තමන්ගේ ස්ථාවරත්වය ගොඩ නගා ගන්නා ආකාරය ඉතා පැහැදිලිව පෙනෙන්නට ඇත.

සෑම ආගමික නායකයකු විසින්ම තමන්ගේ ආගම උද්දීපනය කරන ආකාරයෙන් අන්‍ය ආගම් හෙළා නොදකින ලෙස අවවාද කර තිබෙන බව ආගම් පිළිබඳ ව අධ්‍යයනය කරන්නෙකුට ඉතා පැහැදිලිව දැක ගැනීමට හැකියාව ඇත.

ඉස්ලාම් ධර්මය තුළ මොහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් අවවාද කරනුයේ තමන්ගේ ආගමට මෙන් අන්‍ය ආගම්වලටද ගරුත්වය දෙන ලෙසයි. මෙයින් අදහස් වන්නේ සමාජයේ පැවැත්ම සහ සහෝදරත්වය ආරක්ෂා කරගැනීමට නම් ආගමට පළමුවෙන් මිනිසා මනුෂ්‍යත්වයට ගරු කිරීමට මුල්තැන දිය යුතු බවයි. මනුෂ්‍යත්වයෙන් තොර කිසිදු ආගමක් ක්‍රියාත්මක වන්නේ නැත.

ඉස්ලාම් ධර්මය සමස්ත මානව ප්‍රජාවටම හිතකාමී ධර්මයක් ලෙස ගොඩ නැගී තිබෙන්නේ ආගම තුළ උගන්වන්නා වූ විශ්වාසය ප්‍රජාතන්ත්‍රවාදී සමාජ රාමුවක් තුළ ඉගැන්වීම නිසා ය. එහි සෑම කෙනෙකුටම හිමිවන්නේ එකම ස්ථානයකි. ලොකු කුඩා උගත්-නූගත්, දුප්පත්-පොහොසත් අලුත් පරණ භේදයක් ඉස්ලාමය තුළ නොමැත.

ඉස්ලාමය ඉතා වැදගත්කොට සලකන්නේ කලිමාවට යටත්ව ඊමානය ආරක්ෂා කරගැනීම පමණි.

විශ්වාසය සැබැවින්ම ආරක්ෂා කර ගන්නා අයෙකු කිසිවිටෙක තවත් අයෙකු විවේචනය කරන්නේ නැත, හිංසා පීඩා කරන්නේ නැත, අයුතුකම් ක්‍රියාත්මක කරන්නේ නැත. සැමවිටම සමාජය තුළ සාමය සහජීවනය ගොඩනැගෙන ලෙස ක්‍රියාත්මක වන්නේය. එයට පමණක් මුල්තැන දෙන්නේය. එයයි ඉස්ලාමයේ මූලික පදනම. අප පදනම හැර වෙනත් කිසිවක් ඉස්ලාමය අනුමත කරන්නේ නැත. එම නිසා ඉස්ලාම් ධර්මය මානව හිතවාදී ධර්මයක් ලෙස සමාජ සංස්ථාව තුළ ක්‍රියාත්මක වන්නේ ය. එහි සැබෑ යථාර්ථය ශුද්ධවූ අල්කුර්ආනය ක් මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ ජීවන ක්‍රියාවලියත් පදනම් කොටගෙන පමණක් ක්‍රියාත්මක වන්නේය.

ඕනෑම සමාජයකට, ඕනෑම කාලයකට, ඕනෑම ප්‍රතිපත්තියකට එකහව ඉස්ලාම් ධර්මය ක්‍රියාත්මක වන්නේය. එහි වැදගත්කම කුමක්ද යන්න සොයා බැලීම හා තේරුම් ගැනීම මානව සමාජයෙහි වගකීමකි.

වර්තමානයෙහි බොහෝ වියතුන්, ආගමික නායකයන්, සමාජය දැනුවත් කරන්නාවූ වගකිවයුතු පුද්ගලයන් විවිධාකාර ලෙස ආගමික හරයන් සංසන්දනය කිරීම හා අඩුපාඩු පෙන්වා දීම පක්ෂග්‍රාහීව සිදුකිරීම නිසා ආගමක් තුලින්

උගන්වන්නා වූ සත්‍යතාවයන් සමාජයට තේරුම් ගැනීමට හැකියාවක් නොමැත. එම නිසා ආගම් පිළිබඳව වැරදි මත සමග ද්වේශසහගත සම්බන්ධතාවයන් ගොඩ නැගෙනු ඇත.

ශ්‍රී ලංකාව වැනි කුඩා දිවයිනක විවිධ ආගම් සහ විශ්වාසයන් තුළ ජීවත්වන මානව සංස්ථාව තුළ සාමය ස්ථාපිත කිරීමට නම් ප්‍රධාන වශයෙන් ආගමික විශ්වාසයන් පිළිබඳව අවබෝධය සෑම කෙනෙක්ම ලබාගත යුතුය. එමෙන් ම ශ්‍රී ලාංකිකයන් වශයෙන් අප රටට ආවේණික වූ සංස්කෘතිමය ලක්ෂණවලට ගරු කළ යුතුය. එකිනෙකා විවිධත්වයෙන් යුතු නමුත් විවිධත්වය තුළ ඒකත්වය ඉස්ලාමය තුළ උගන්වන පදනමය. එය තේරුම් ගැනීමට ආරාධනා කිරීම අපගේ වගකීමකි. (IBS)

---

## ඉස්ලාමයේ අන්තවාදය තිබේද?

ඉස්ලාම් සැමවිටම මැද මාවතක් අනුගමනය කරන දහමකි. එබැවින් එහි අන්තවාදයට ඉඩක් නැත. එසේ තිබියදී යම්කිසිකෙනෙකුගේ ක්‍රියාකලාපය බලා ඉස්ලාම් දහම ගැන නිගමනය කළ නොහැකිය. ඉස්ලාම් දහම ගැන නිගමනයකට පැමිණිය යුත්තේ එම දහම නිවැරදිව හැදෑරීම තුලින්ම පමණි. ඒ අනුව ඉස්ලාම් දහම තුල අන්තවාදය තිබේද නැද්ද යන්න ප්‍රකාශ කිරීමට පෙර එම දහම ගැන මනා දැනුමක් තිබීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත් ඇතැම් අය ඔවුන්ගේ පටු පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා ඉස්ලාම් දහමට නොයෙකුත් අභූත චෝදනා නගති. එහෙත් ඒවායේ කිසිම සත්‍යතාවයක් නොමැත.

ඉස්ලාම් දහමින් මිනිසා දෙවියන්ට කළ යුතු යුතුකම් වලට අමතරව මිනිසාගෙන් සෙසු අයට සිදු විය යුතු යුතුකම් කොටස පැහැදිලි කොට තිබේ. ඒවා නිසියාකාරව ඉටු කරන තැනැත්තා නිවැරදි මාර්ගයේ ගමන් කරන මුස්ලිම්වරයෙකු වන්නේය. එහෙත් සීමාව ඉක්මවා දහම තුල සිටීමත් දහමින් තහනම් කොට ඇති වෙනත් කටයුතුවල නියලීමත් ඉස්ලාම් අනුමත කරන්නේ නැත. මේ පිළිබඳව සහාබිවරයෙක් නබිතුමාගෙන් අසන ලද ප්‍රශ්නයකට එතුමා

ඉතා අලංකාරව පිළිතුරු ලබා දී ඇත. එම පැහැදිලි කිරීම අනුව පමණ ඉක්මවා දෙවියන්ට නැමදීම පවා කල හැකි වන්නේ නැත. ඒ අනුව මුස්ලිම්වරුන්ගේ සෑම ක්‍රියාවක්ම දහමින් පෙන්වා ඇති සීමාව තුල තිබිය යුතුය. ඒ අනුව මුස්ලිම්වරයෙක් දහමින් පෙන්වා දී ඇති පරිදි ජීවත්වීම අන්තවාදය ලෙස අර්ථ දැක්විය නොහැකිය. එසේ තිබියදී මුස්ලිම් නොවන අය මුස්ලිම්වරුන්ගේ සෑම ක්‍රියාවක්ම විවේචනය කිරීම බලවත් වරදකි.

සහිහ් මුස්ලිම් ග්‍රන්ථයේ මෙසේ සඳහන් වන්නේය. "අන්තවාදියා විනාශයට පත් වන්නේය" නබිතුමා එය තුන් වතාවක්ම පවසා ඇත. මින් පැහැදිලි වන්නේ අන්තවාදයට ඉස්ලාම් දහම තුල ඉඩක් නොමැති බවයි. ශ්‍රේෂ්ට විද්වතෙකු වන ඉමාම් නවවි තුමා ඉහත කී හදිසය විස්තර කරමින් පවසා ඇත්තේ අන්තවාදියා යනු 'අධික ලෙස උනන්දුවන අන්ද භක්තිකයා' යනුවෙන් ය. එවැනි අය ක්‍රියාවෙන් සහ වචනයෙන් සෑම සීමාවක්ම ඉක්මවා කටයුතු කරන්නෝ වෙති. මේ නිසා එවැනි අය කොපමණ පින් දහම් කලත් දෙවියන්ගෙන් ඈත් වීමට හේතුවක් වන්නේය. පහත දැක්වෙන කථා පුවතින් එය පැහැදිලි වන්නේය.

එක් කාන්තාවක් අධික ලෙස පින් දහම් කරමින් සිට ඇත. එහෙත් ඇය බළලෙකුට ඇවිදගෙන ගොස් කෑම සොයාගැනීමට තිබෙන ඉඩ අහුරා හිරකොට තැබීමෙන් ඌ මරණයට පත් වී ඇත. ඇය කල මෙම වරද නිසා ඇය කොපමණ පින් දහම් කලත් නරකාදියට යන බව නබිතුමා පවසා ඇත. තවත් අවස්ථාවකදී වෛශ්‍යාවක් තිපාසයේ සිටි සුනකයෙකුගේ තිපාසය සංසිඳුවීම සඳහා වතුර ලබා දීම නිසා ඇය ස්වර්ගයට යන බව නබිතුමා පවසා ඇත.

ඇතැම් අය මුස්ලිම් කාන්තාවන් ෆර්දාව ඇඳීම සහ මුස්ලිම් පිරිමින් රැවුල වැවීම දකින්නේ අන්තවාදය ලෙසය. ඔවුන් එසේ කරන්නේ ඉස්ලාම් දහම ගැන දැනුමක් නොමැති කම නිසා විය හැකිය. ඇත්ත වශයෙන්ම ඒවා ඉස්ලාම් දහමේ මූලික අවශ්‍යතාවයන් ය. එබැවින් ඒවා ඉටු නොකරන තැනැත්තා දහම නිවැරදිව පිළි පදින්නෙකු නොවන බව ඔවුන් තේරුම් ගත යුතුව තිබේ. කෙසේ වෙතත් සෑම සමාජයකම අන්තවාදීන් සිටින්නේය. ඒ අනුව මුස්ලිම් සමාජයේද අන්තවාදීන් සිටිය හැකිය. කෙසේ වෙතත් ඔවුන් කරන දේවල් ඉස්ලාම් දහම නොවේ. එම නිසා සමාජයේ වගකීම වන්නේ ඔවුන්ව නිවැරදි මගට ගැනීම් ය.

මෙම වගකීම පැහැර හරිමින් සමත්ත මුස්ලිම් ජාතියටම දොස් කීම මුග්ධ කමකි. (FA)

---

## ඉස්ලාම් භීතිකාව.

නවීන ලෝකයේ ඉස්ලාම් භීතිකාවක් පැන නැගී ඇති බැවින් ඉස්ලාම් දහම ගැන සොයා බැලීම වැදගත් විය හැකිය. ඉස්ලාම් යනු මිනිසාට නිවැරදි මාර්ගය පෙන්වා දීම සඳහා අල්ලාහ්ගෙන් පහළ කරන ලද දහමකි. එය ලොව පහළ වූ මුල්ම සහ අවසාන දහම් පණිවිඩය වේ. අල් කුරානය මගින් ඉස්ලාම් දහම සම්පූර්ණ විය. අල් කුරානය පහළ වීමෙන් පසු ඉස්ලාම් දහම අනෙක් ආගම්වලට වඩා වේගයෙන් ලොව පුරා පැතිර ගියේය. එම දහම එදා පැවති අනෙක් ආගම් මෙන් විද්‍යාත්මක ගවේෂණයන්ට විරුද්ධ වුයේ නැත. එහි ප්‍රතිපලයක් ලෙස අඳුරේ ගිලී තිබුණු යුරෝපය විද්‍යාත්මක සොයා ගැනීම් අතින් විශාල පිබිදීමක් ලැබුවේය. එම පිබිදීමට මුස්ලිම්වරුන්ගෙන් විශාල දායකත්වයක් ලැබුනේය. ඒ හැරුණු විට ඉස්ලාම් දහම නිසා දේපල අයිතියට හිමිකම් නොතිබුණු කාන්තාවන්ට එම අයිතිය ලබා දෙන ලදී. තවද විවාහ වීමේදී කාන්තාවන්ට ගෙවීමට සිදුවුණු දැවැද්ද වෙනුවට කාන්තාවන් වෙනුවෙන් ගෙවීමක් කිරීමට පිරිමින්ට නියම කරන ලදී. මේ හැරුණු විට ඉස්ලාම් දහම පැමිණීමෙන් පසු ලොව පුරා විශාල සංස්කෘතික වෙනසක් ඇති විය. එසේ තිබියදී මෑත යුගයේ ඉස්ලාම් භීතිකාවක් හිස ඔසවා තිබේ. එය උවමනාවෙන්ම නිර්මාණය කරන ලද්දක් වන්නේය.

කව්රු කෙසේ කීවත් ඉස්ලාම් දහමින් පෙන්වා දෙන්නේ ජාතින් අතර සහයෝගයෙන් ජීවත් වීමට සුදුසු ක්‍රමයකි. එම නිසා අසල්වැසියා කුමන ජාතිකයෙක් වුවත් ඔවුන් සමග හොඳින් ජීවත් විය යුතු බව ඉස්ලාම් දහම උගන්වන්නේය. අසල් වැසියාට පිඩා කරන තැනැත්තා මුස්ලිම්වරයෙකු නොවන බව නබිතුමා පවසා ඇත. එසේ තිබියදී ඉස්ලාම් භීතිකාවක් හිස ඔසවන්නේ කෙසේද?

ඉස්ලාමීය මූලාශ්‍රවල ඉස්ලාම් භීතිකාවට හේතුවන කිසිම දෙයක් සොයා ගැනීමට නොහැකිය. එසේ තිබියදී ඇතැම් අය ඉස්ලාමයේ ව්‍යාප්තිය, ඉස්ලාම් භීතිකාවට හේතුවක් ලෙස පෙන්වා දීමට උත්සාහ කරන්නේය. ඇත්ත වශයෙන්ම එය ඉතා කනගාටු දායක තත්වයකි. ඉස්ලාමයේ බල කිරීමක් නොමැත. කැමති කෙනෙකුට පමණක් ඉස්ලාමය වැළඳ ගත හැකිය. අනෙක් අයට තමන් කැමති දහමක් පිළිපැදිය හැකිය. එසේ තිබියදී ඇතැම් උගතුන් යැයි කියාගන්නා අය පවා ඉස්ලාම් දහම කඩුවෙන් ව්‍යාප්ත වූ බව කියමින් ඉස්ලාම් භීතිකාවක් මැවීමට උත්සාහ කරන්නේය. එමගින් ඔවුන් පෙන්වන්නේ ඉස්ලාම් දහම පිලිබඳ ඔවින්ගේ බංකලොත් භාවයයි. එදා මෙන්ම අදත් වේගයෙන්ම ව්‍යාප්ත වන දහම ඉස්ලාම් ය. එයින්ම ඔවුන් පවසන කඩුවෙන් ඉස්ලාම් දහම ව්‍යාප්ත වුවා කියන චෝදනාව බොරුවක් බවට පත් වන්නේය.

ඕනෑම සමාජයක වැරදි කරන අය සිටිති. එසේම මුස්ලිම් සමාජයේ ද වැරදි කරන අය සිටිති. තවද සෑම සමාජයකම ත්‍රස්තවාදීන් සිටිති. එසේම මුස්ලිම් සමාජයේද ත්‍රස්තවාදීන් සිටිති. එහෙත් ඔවුන් කරන දේවල් ඉස්ලාම් නොවේ. එම නිසා ඔවුන්ගේ ක්‍රියාවන් ඉස්ලාම්භීතිකාවට හේතුවක් කර ගත යුතු නැත.

ඇතැම් අය මුස්ලිම්වරුන්ගේ ඇඳුම් සහ වෙනත් ආගමික දේවල් දෙස බලා ඉස්ලාම් භීතිකාවක් ඇති කිරීමට උත්සාහ කරන්නේය. මෙය ඉතාමත් කනගාටු දායක තත්වයකි. ඇත්ත වශයෙන්ම ඉස්ලාම් අංග සම්පූර්ණ දහමක් බැවින් එමගින් මුස්ලිම්වරයෙකුගේ සෑම ක්‍රියාවක්ම ආවරණය කරන්නේය.ඒවා නොකරන අය දහමින් බැහැර වන්නේය. එසේ තිබියදී කෙනෙකුගේ ඇඳුම පැළඳුම් නිසා හෝ කෑම බීම නිසා හෝ භීතියක් මවා පෑම කිසිසේත්ම අනුමත කල නොහැකිය.

ඉස්ලාම් භීතිකාව තුරන් කිරීම සඳහා ජන මාධ්‍යවලට විශාල කාර්‍ය භාරයක් කල හැකි වුවත් ඒවා හැසිරෙන්නේ ඉතා ලජ්ජා සහගත ආකාරයට ය. ඒවායින් බොහෝ විට සිදු කරන්නේ සුළු සිද්ධීන් පවා ජාතීන් අතර සැකය සහ වෛරය ඇතිවන ආකාරයට ය. එය ජාතික සමගියට මෙන්ම රටේ දියුණුවට විශාල බාදාවකි.

## ඉස්ලාමය ව්‍යාප්ත වූයේ කඩුවෙන්ද?

ඉස්ලාම්, විශ්වාසය මත පදනම් වන්නාවූ දහමක් බැවින් කඩුවෙන් බිය වැද්දීම හරහා කෙනෙකුගේ විශ්වාසය වෙනස් කල නොහැකිය. එවැනි බිය වැද්දීමක් නිසා කෙනෙක් අල්ලාහ්ව විශ්වාස කලත් ඔහු මුස්ලිම් වරයෙකු වන්නේ නැත. මුස්ලිම්වරයෙකු වීමට තිබිය යුතු මූලික අවශ්‍යතාවයක් වන්නේ ස්වෙච්ඡාවෙන් අල්ලාහ්ව විශ්වාස කිරීම යි. එබැවින් ඉස්ලාම් දහම කඩුවෙන් ව්‍යාප්ත වූ බවට කරන චෝදනාවේ කිසිම පදනමක් නැත. එම නිසා මෙවැනි පදනම් විරහිත චෝදනාවක් කල හැක්කේ ඉස්ලාම් දහම ගැන කිසිම දැනුමක් නොමැති කෙනෙකුට පමණි.

*"මෙම ධර්මය (වැළඳ ගැනීම සඳහා) කිසිදු බල කිරීමක් නැත" (කුරානය 2:256).*

ඉහත දැක්වෙන කුර්ආන් වැකිය අනුව ඉස්ලාම් දහම කඩුවෙන් ව්‍යාප්ත කළා යයි කිව හැක්කේ ද්වේශ සහගතව ඉස්ලාම් දහමට අපකීර්තියක් ඇති කරන පරමාර්ථය ඇති කෙනෙකුට පමණි. එසේම පහත දැක්වෙන කුර්ආන් වැකිය අනුවද පෙනී යන්නේ කෙනෙකුට ඉස්ලාම් දහම වැළඳ ගැනීම සඳහා ස්වාදීන නිදහසක් තිබෙන බවයි.

*"පවසනු! සත්‍යය ඔබගේ පරමාධිපතිගෙන් ලැබෙන දෙයකි. එහෙත් කැමති කෙනෙකුට එය විශ්වාස කල හැකිය. කැමති කෙනෙකුට එය ප්‍රතික්ෂේප කළ හැකිය" (කුරානය 18:29).*

අල්ලාහ්ට අවශ්‍යතාව තිබුනේ නම් සියලුම දෙනා මුස්ලිම්වරුන් වශයෙන් මැවීමට හැකිය. එහෙත් ඔහු එසේ කලේ නැත.

*"ඔබගේ දෙවිඳුන් සිතා සිටියේ නම් පොළොවෙහි සිටින සියල්ලෝම විශ්වාස කර තිබෙන්නොය. (එසේ තිබියදී) මිනිසුන් විශ්වාසවන්තයින් ලෙස වෙනස් විය යුතු යැයි ඔබ ඔවුන්ට බල කරන්නෙහි ද?" (කුරානය 10:99).*

අල්ලාහ්ගේ පරමාර්ථය මිනිසාවට නිදහස ලබා දී ඔවුන්ව පරික්ෂා කිරීමයි. ඒ අනුව ඔවුන්ට ස්වෙච්ජාවෙන් ඉස්ලාම් දහම වැළඳ ගැනීමට හෝ වැළඳ නොගැනීමට නිදහස ලබා දී තිබේ. කඩුවෙන් මෙය කල නොහැකිය.

*"(නබියේ) පවසනු! මිනිසුනි! නුඹලාගේ පරමාධිපතිගෙන් සත්‍යය නුඹලා හමුවට පැමිණ ඇත. (එමගින්) කවරෙක් යහමග ලබයිද ඔහු තමාටම යහපතක් කරගනියි. කවරෙක් මංමුලාවෙහි ගමන්කරයිද ඔහු තමාටම එරෙහිව නොමගෙහි යන්නෙකි. මා නුඹලාට භාරකාරයෙක් නොවෙමි" (කුරානය 10:108).*

ස්වෙච්ඡාවෙන් ඉස්ලාම් දහම පිළිගන්නේ නම් පමණක් කෙනෙකුගේ හදවත තුලට විශ්වාසය ඇතුලත් කරනු ලැබේ. එසේ නොමැතිව විශ්වාසය ඇතුලත් කල නොහැකිය. මෙය හොඳින් තහරුවූ වන්නේ නබිතුමාගේ සුළු පියා වන අබූ තාලිබ් ඉස්ලාම් දහම වැළඳ නොගැනීම නිසාය. එහෙත් ඔහු නබිතුමාව තමන්ගේම පුතුන්ට වඩා ආදරයෙන් හදා වඩා ගත්තේය. නබිතුමාද, ඔහුගේ අවසාන මොහොත දක්වාම ඉස්ලාම් දහම වෙත ඇරයුම් කළේය. එහෙත් කිසිම දිනක ඔහුට ඉස්ලාම් දහම වැළඳ ගන්නා ලෙස බල කර සිටියේ නැත.

නබිතුමා මක්කාව අත්පත් කල පසු ඔහුට අවශ්‍යතාවය තිබුනේ නම් එහි සිටි ජනතාව ඉස්ලාම් දහම වෙත බලයෙන් හරවා ගැනීමට හැකියාව තිබුනේය. එහෙත් එතුමා එවැනි දෙයක් සිදු කළේ නැත. ඒ වෙනුවට නබිතුමා සියලුම දෙනාට පොදු සමාව පිරි නැමුවේය. එහි ප්‍රතිපලයක් ලෙස ඔවුන් සියලුදෙනාම ඉස්ලාම් දහම සිය කැමැත්තෙන්ම වැළඳ ගත්තෝය. එම දිනයේදී මුස්ලිම් වරුන්ට විරුද්ධව යුද මෙහෙයවන ලද අබූ සුෆියාන් ද ඔහුගේ භාර්යාව වන හින්දා ද ඉස්ලාමයට විරුද්ධ කම් කල තවත් බොහෝ අයද ඉස්ලාම් දහම වැළඳ ගත්තෝය.

*"කවරෙක් අල්ලාහ්ව විශ්වාස කරත්ද, (අල්ලාහ්) ඔහුගේ හදවත නිවැරදි මගෙහි යවන්නේය" (කුරානය 64:11)*

කෙසේ වෙතත් ඉස්ලාම් දහම ප්‍රචාරය කිරීම මුස්ලිම්වරුන්ගේ ප්‍රධාන වගකීමකි. ඒ වෙනුවෙන් බුද්ධිමය විවාද පැවැත්වීම ද දේශනා පැවැත්වීම ද කල හැකිය. මෙවැනි දේවල් ඉස්ලාම් දහමේ පමණක් නොව අනෙක් ආගම්වලත් සිදු

කරන්නේය. එසේ තිබියදී ඉන්දුනීසියාව වැනි රටවල්වල ඉස්ලාම් දහම ව්‍යාප්ත වුයේ මුස්ලිම්වරුන්ගේ ගති පැවතුම් නිසාය. මේ නිසා ඉස්ලාම් දහම කඩුවෙන් ව්‍යාප්ත කලේ යැයි කියන චෝදනාවේ කිසිම පදනමක් නොමැත.

---

## ෂරියා නීතිය යනු කුමක්ද?

ඉස්ලාම් යනු අල්ලාහ්ගේ කැමැත්තට සම්පූර්ණයෙන්ම යටත් වීම යි. ඒ අනුව මුස්ලිම්වරයෙකුගේ සෑම දෙයක්ම අල්ලාහ්ගේ කැමැත්තට යටත් විය යුතුය. තමන්ගේ කැමැත්ත අනුව ජිවත් වීම ඉහත සඳහන් කල අර්ථ දැක්වීම අනුව ඉස්ලාම් නොවේ.

ෂරියාව සකස්වන්නේ අල්-කුරානය සහ මුහම්මද් නබිතුමාගේ ඉගැන්වීම් ඇසුරෙනි. මුස්ලිම්වරයෙකුගේ සම්පූර්ණ ජිවිතයම එමගින් ආවරණය කර ඇත. ඒ අනුව මුස්ලිම්වරයෙකුට ශරියාවෙන් තොර ජිවිතයක් නොමැත. එහෙත් මෙවැනි තත්වයක් වෙන කිසිම දහමක දැකිය නොහැකිය. මේ හේතුවෙන් බොහෝ අය ෂරියා ක්‍රමයේ ඇති වැදගත්කම නිවැරදිව තේරුම් ගෙන නැත.

ෂරියා නීති කොටස් දෙකකට බෙදිය හැකිය.

1. මිනිසා විසින් අල්ලාහ් වෙනුවෙන් කල යුතු දේවල් (Hukuk Allah)
2. මිනිසා විසින් මිනිසාට කල යුතු දේවල් (Hukuk al Insan)

පළමු කාණ්ඩයට උදාහරණ වන්නේ සලාතය, උපවාසය, සකාත් සහ හජ් ය. අනෙක් සමාජ සත්කාරයන් සියල්ලම මිනිසා මිනිසාට කල යුතු දේවල් ය. ෂරියා නීතියෙන් දඬුවම් නියම කොට ඇත්තේ මිනිසා මිනිසාට කරන වැරදි සම්බන්දයෙන් පමණි. මිනිසා අල්ලාහ්ට කල යුතු දේවල් සඳහා නිශ්චිත දඬුවම් මෙලොවදී නියම කොට නැත. ඒ අනුව ඒවා මිනිසාගේ මරණයෙන් පසුව ඇති විනිශ්චය දිනයේදී ප්‍රශ්න කිරීමට නියමිතය.

ෂරියාව ගැන නිවැරදිව අවබෝද කර නොගත් අය සිතන්නේ එය මුස්ලිම් නොවන සමාජයට තර්ජනයක් බවයි. එය සම්පූර්ණයෙන්ම වැරදි මතයකි.

ඉස්ලාම් දහමින් ඉස්ලාම් නොවන කිසිවෙකුට බලපෑම් කරන්නේ නැත. කුරානයේ ඇති බොහෝ වැකිවලින් එම අදහස පැහැදිලි කොට ඇත.

ඉස්ලාම් දහමේ මූලික පරමාර්ථය මිනිස් වර්ගයාට නිවැරදි දහම් මාර්ගය පෙන්වා දීම ය. එහෙත් ඒවා පිළිපැදීම සඳහා කිසිවෙකුට බලපෑම කරන්නේ නැත. උදාහරණයක් වශයෙන් මුස්ලිම්වරුන් හලාල් අහාර පමණක් අනුභව කරන්නේ ඒවා ශරීරයට හිතකර නිසාය. හරාම් අහාර අනුභව නොකරන්නේ ඒවා ශරීරයට හානිකර නිසාය. එසේම මුස්ලිම් කාන්තාවන් පිටස්තර පිරිමින් ඉදිරියේදී තම ශරීරය ආවරණය කරන්නේ ඔවුන්ගේ ආරක්ෂව සහ පිටස්තර අයගේ රාගය නො ඇවිස්සීම සඳහාය. මෙය මුස්ලිම්වරුන් ස්වෙච්ඡාවෙන් කරන දෙයක් මිස කිසිවෙකුගේ බලපෑමකට කරන දෙයක් නොවේ.

ඉස්ලාමීය දණ්ඩ නීතිය සකස් වී ඇත්තේ මිනිසුන්ගෙන් සිදු විය හැකි වැරදි අවම කිරීම සඳහාය. ඒවා ක්‍රියාත්මක වන රටවල් වල වැරදි කරන අයගේ විශාල අඩුවක් දැකිය හැකිය. කෙසේ වෙතත් එම නීති ක්‍රියාත්මක කල හැක්කේ ඉස්ලාමීය රාජ්‍යයක් තුල දී පමණි. ඒ අනුව සෞදි රජය තුල සම්පූර්ණ ෂරියා නීති ක්‍රියාත්මක වේ. ඉස්ලාම් නොවන රටවල් වල ක්‍රියාත්මක වන්නේ එදිනෙදා ජිවිතය තුල පිළිපැදිය යුතු දේවල් පමණි.

මුස්ලිම් නොවන අයගේ දැනගැනීම සඳහා ෂරියා නීතියේ සහ ෂරියා නොවන නීතිවල ඇති ඇතැම් ප්‍රධාන වෙනස්කම් කිහිපයක් මෙහි පහත විස්තර කොට ඇත.

**මිනිස් ඝාතන සඳහා ෂරියා නිතිය:**

ඉස්ලාම් නොවන නීතිය අනුව මිනිස් ඝාතකයෙකුට එල්ලුම් ගස හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම නියම කෙරේන්නේය. ඒ අනුව එම නීතියට අනුව සමාවට ඇති ඉඩ බෙහෙවින් සිමා වන්නේය. එහෙත් ෂරියා නිතිය අනුව මිනිස් ඝාතකයෙකුට අවස්ථාවන් තුනක් හිමි වේ. ඒ අනුව වරද සිදු කල අයගෙන් සමාව ඉල්ලා සිටිය හැකිය. ඒ අනුව ඔහුට සමාව ලැබුනේ නම් නිදහස් විය හැකිය. එම පියවර අසාර්ථක වුයේ නම් වන්දියක් ගෙවා නිදහස පැතිය හැකිය. මෙම

අවස්ථාවන් දෙකම අසාර්ථක වුයේ නම් පමණක් ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු වන්නේය.

**විවාහය:**

ඉස්ලාම් නොවන නිතිය අනුව ඕනෑම කෙනෙකු සමග විවාහ විය හැකි මුත් ෂරියා නිතිය අනුව අල්-කුරණයෙන් තහනම් නොකළ අය සමග පමණක් විවාහ විය හැකිය. මිට හේතු රාශියක්ම ඇත. විශේෂයෙන්ම මෙම නිතිය පැනවීමෙන් පවුලේ දිගු කාලින සමගිය සහ ලැබීමට නියමිත දරුවන්ගේ දහම ගැන පැන නැගිය හැකි ගැටළු අවම කල හැකිය. අනෙක් කරුණ වන්නේ ඉස්ලාම් නොවන විවාහ ක්‍රම අනුව මනාලිය විසින් මනාලයාට දැවැද්ද දිය යුතුය. එහෙත් ඉස්ලාම් නිතිය අනුව මනාලයා විසින් මනාලියට අනිවාර්යෙන්ම දැවැද්ද හෙවත් මහර් දීමනාව ගෙවිය යුතුය. තවද ඉස්ලාම් නිතිය අනුව විවාහය සඳහා භාරකරුගේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වෙතත් කාන්තාවකගේ අනුමැතිය නොමැතිව විවාහය සිදු කල නොහැකිය. ඉස්ලාමිය විවාහයක් අවම වශයෙන් සාක්ෂි කරුවන් දෙදෙනෙකු ඉදිරි පිට සිදු විය යුතුය. ඒ අනුව කාන්තාවකගේ ආරක්ෂාව හොඳින් තහවුරු වන්නේය.

**බහු විවාහය:**

ෂරියා නීතියෙන් කොන්දේසි සහිතව පිරිමින්ට විවාහ හතරක් සිදු කිරීමට අවසර ලබා දී තිබේ. එහෙත් එම කොන්දේසි ඉටු කිරීමට නොහැකි අයට මෙම අවස්ථාව හිමිවන්නේ නැත. තවද, නොයෙකුත් හේතුන් නිසා ලෝකයේ වැඩිවීගෙන යන කාන්තා ප්‍රතිශතය සඳහා ලබා දිය හැකි හොඳම විසඳුම බහු විවාහයයි.

**කාමය වරදවා හැසිරීම:**

ෂරියා නීතියට අනුව කාමය වරදවා හැසිරීම උසාවියකදී තහවුරු කළහොත් මරණ දඬුවම ක්‍රියාත්මක කරනු ලැබේ. එහෙත් කුරානයට අනුව මේ සඳහා ඇසින් දුටු ශාක්ෂි සතරක් අවශ්‍යය. මෙම අවශ්‍යතාව ප්‍රයෝගික වශයෙන් ඉටු

කිරීම පහසු නොවන නිසා එම දඬුවම ක්‍රියාත්මක කළ හැක්කේ කාමය වරදවා හැසිරුණු පුද්ගලයින් විසින් ස්වෙච්ඡාවෙන් එම වරද පිළිගන්නේ නම් පමණි.

**ඇඳුම:**

මිනිසාගේ යහපත උදෙසා ෂරියා නීතියෙන් මුස්ලිම්වරුන්ට ඇඳුමේ සීමාවන් නියම කොට තිබේ. ඒ අනුව ඉස්ලාම් නිතිය පවතින සමාජවල කාන්තා හිංසනයන්වල විශාල අඩුවක් දැකිය හැකිය. එහෙත් වෙනත් බොහෝ ආගම්වල පැහැදිලි ඇඳුම් ක්‍රමයක් නොමැති නිසා ඇතැම කාන්තවන් බිකිනිය සමග දැකිය හැකිය. එය සමාජයේ යහ පැවැත්මට විශාල තර්ජනයක් බව අමුතුවෙන් කිව යුතු නැත.

**සොරකම:**

ඉස්ලාම් දහම අනුව සෑම සොරෙකුගේම අත කපන්නේ නැත. ඒ අනුව දහමින් සිමා කොට ඇති වටිනාකම ඉක්මවූ භාණ්ඩයන් සඳහා පමණක් අත කැපීමට ශරියාවෙන් නියම කොට ඇත. එහෙත් ඉස්ලාම් නොවන සමාජවල සුළු දේවල් වලට පවා මිනි මැරුම් සිදු වන අවස්ථා දැකිය හැකිය. ඒ අනුව බලන කල සොරකම් කල පාර්ශවයන්ට ශරියාවෙන් නියම කොට ඇත්තේ සාදාරන දඬුවමකි.

**යුද්ධය:**

ෂරියා නීතිය අනුව සතුරා යුද්ධය ආරම්භ කළහොත් පමණක් ඊට ප්‍රති ප්‍රහාරය එල්ල කිරීමට අවසර ලබා දී තිබේ. එවැනි අවසරයක් නොතිබුනේ නම් සතුරු ආක්‍රමණයකදී කල යුත්තේ කුමක්ද?

**ආගමික නිදහස:**

ඉස්ලාම් දහම තුල බල කිරීමක් නොමැත. ඒ අනුව ඕනෑම කෙනෙකුට තමන් කැමති දහමක් පිළිපැදීමට අවසර තිබේ. කෙසේ වෙතත් ඉස්ලාම් දහමින් මිනිසාට සත්‍යය පැහැදිලි කොට දී තිබේ. එය පිළිගැනිම හෝ පිලි නොගෙන සිටීම මිනිසාට ලැබී ඇති ආගමික නිදහස වේ. (FA)______________________

# සකාත් ගෙවන්නන් සහ සකාත් ලබන්නන්.

සකාත් යනු ඉස්ලාමයේ එකම පුණ්‍ය ක්‍රමය නොවන නමුත් එය තුන්වන කුළුණ බවට පත් කිරීම කොතරම් වැදගත්ද යත්, සකාත් තුළින් සමෘද්ධිමත් අයට දුප්පතුන් නඟාසිටුවීමටත්, කරදරයට පත් වූවන්ට උපකාර කිරීමටත්, දුෂ්කරතා ඇති අය සනසාලීමටත් හැකි වේ.

සකාත් නීතිය මගින් දුප්පතුන්ට උපකාර කිරීමට උපදෙස් සහ අණ නිකුත් කර ඇතිවා මෙන්ම සුදුස්සන්ට එය ලබා ගැනීමට ඇති අයිතියද තහවුරු කර ඇත.

සකාත් මගින් ලෝකය වෙනස් කිරීමේ බලය ඇත. නමුත් එය ආරම්භ වන්නේ ඔබ එය ගෙවීමෙනි.

**සකාත් ගෙවන්නන්**

ඉස්ලාම් දහම තුල නිසාබ් ලෙස හඳුන්වන අවම වත්කම් ප්‍රමාණය ඉක්මවා ධනය ඇති සිහිබුද්ධියෙන් සිටින සෑම වැඩිහිටි මුස්ලිම්වරයෙකුටම සකාත් නම් ගෙවීම අනිවාර්ය කර ඇත. නිසාබ් යනු සකාත් කිරීමට පෙර මුස්ලිම්වරයෙකු සතුව තිබිය යුතු අවම ධනයයි. නබි මුහම්මද් (ﷺ) තුමාණන් විසින් නිසාබ් සකසන ලද්දේ රන් ග්‍රෑම් 87.48 හෝ රිදී ග්‍රෑම් 612.36 ට සමාන අනුපාතයකිනි. සකාත් ගෙවිය යුතු මුළු මුදල ඔවුන්ගේ මුළු ඉතුරුම් සහ ධනයෙන් 2.5% හෝ 1/40 කි. පුද්ගලයාට ආදායමක් ලැබෙන සෑම විටම එය ගනනයට එකතුවනු ඇත. සෑම වසරක් අවසන් වීමට පෙර එය ගනන් බලා ගෙවා අවසන් කල යුතුය.

**සකාත් ලබන පුද්ගලයින් වර්ග අට**

ඔබ ඔබේ සකාත් ගෙවීමට සූදානම් වන්නේද! නමුත් මොහොතක් ඉන්න. ඔබගේ සකාත් ලබාගත හැක්කේ කාටද, සහ එය ඔවුන්ට ලබා දිය යුතු යැයි එම තීරණය දුන්නේ කවුදැයි ඔබ දන්නේද?

ශුද්ධ වූ කුරාණයේ (9:60 වැකියට අනුව) දෙවියන් විසින් නම් කරන ලද සකාත් ලබාදිය යුතු පුද්ගලයින් වර්ග අටෙන් එකකට හෝ කිහිපයකට වැටෙන සුදුස්සන්ට හෝ කණ්ඩායම්වලට සකාත් බෙදා හැරිය හැකිය.

කුරාණය තුල සකාත් බෙදා හරින ආකාරය නිශ්චිතව දක්වා ඇත, නමුත් එය ගෙවීමේදී මුස්ලිම්වරුන්ට නම්‍යශීලී බවක් ලබා දෙයි. සකාත් ලැබිය යුතු කාණ්ඩ එකකට හෝ වැඩි ගණනකට අයත් අයට බෙදාහරින විශ්වාසදායක ආයතන වෙත ඔවුන්ගේ සකාත් ගෙවීමටද ඉඩ සලසයි.

සකාත් ගෙවන්නන් සහ පරිපාලකයන් සඳහා සකාත් ලබා දීම සඳහා කාණ්ඩ අටක් දෙවියන් විසින්ම හඳුන්වා දී තිබීම විශේෂත්වයකි. මෙම තේරීම රජයට, විද්වතුන්ට හෝ නබිතුමාට පවා අයත් නොවේ. වරක් මිනිසෙක් නබිතුමා වෙත පැමිණ සකාත් ඉල්ලා සිටි බව වාර්තා වේ.

*නබි ﷺ තුමානන් පැවසුවේ: සකාත් [වටිනාකම] විනිශ්චය කිරීමට අල්ලාහ් නබිවරයෙකුටවත් අවසර දුන්නේ නැත. ඒ වෙනුවට, ඔහුම එය පාලනය කළ අතර අවස්ථා අටකදී එයට අවසර දුන්නේය. එමනිසා, ඔබ මෙයින් එකකට අයිති නම්, මම නිසැකවම ඔබට ඔබේ අයිතිය ලබා දෙන්නෙමි. (Abu Dawood)*

ඉතින්, ඔබේ සකාත් ලැබිය හැකි අයව මෙසේ පෙන්වා දෙන ලදී,

1. දුප්පත් (අල්-ෆුකාරා'), එහි තේරුම අඩු ආදායම් ලබන අය හෝ දුප්පත් අය.
2. අවශ්‍යතා ඇති (අල්-මසාකින්), එයින් අදහස් කරන්නේ දුෂ්කරතාවයෙන් පෙළෙන තැනැත්තා යන්නයි.
3. සකාත් පරිපාලකයින්.
4. වහලුන් නිදහස් කිරීම (රිකාබ්).
5. ණය බරින් මිරිකී සිටින තැනැත්තන්. (අල්-ගාරිමීන්)
6. නවක මුස්ලිම්වරුන්. (මු'අල්ලාෆහ් කුලූබුහුම්)
7. අල්ලාහ්ගේ මාර්ගයේ විශේෂ කැප කිරීම් කරන අය. [අල්ලාහ්ගේ හේතුව සඳහා] (ෆී සබීලිල්ලාහ්)
8. මග යන්නන්, එහි තේරුම අතරමං වූ හෝ සම්පත් ස්වල්පයක් සමඟ ගමන් කරන අය යන්නයි. (ඉබ්න් අල්-සබීල්)

**සකාත් නිසි පරිදි ගෙවන අයට අල්ලාහ් සුභානවතාලා සුභාරංචි ලබා දෙයි.**

ශු: කුරාණය 2:261, 7:156, 3,133-143

**සකාත් නිසි පරිදි ගෙවීම පැහැර හරින්නන්ට අල්ලාහ් දැඩිව අවවාද කරයි.**

ශු: කුරාණය 3:180, 9:34, 9:35, 41:7, 70,24, 41:7

අල්ලාහ් සකාතය සම්බන්දව ඔබව දැනුවත් කර ඇති තවත් කුරාන් ආයත් කිහිපයක් පහතින් දැක්වේ.

ශු: කුරාණය 2:43, 2:83, 2:110, 2:177, 2:277, 4:77, 4:162, 5:12, 5:55, 7:156, 9:5, 9:11, 9:18, 9:71, 19:31, 19:55, 21:73, 22:41, 22:78, 24:37, 24:56, 27:3, 31:4, 33:33, 58:13, 73:20, 98:5, 6:141, 17:26, 51:19, 70:24.

මුස්ලිම්වරයෙකු ලෙස ඔබ ඌරුමස් අනුභව නොකිරීමට ප්‍රධානවම බලපාන කරුණ කුමක්ද? ඔබේ ප්‍රහලම පිලිතුර වන්නේ එය අල්ලාහ්ගේ නියමයකි, උපදේශයකි ලෙසය.

ඔබ හරි, අල්ලාහ් ශුද්ධ වූ කුරාණය තුලින් අවස්ථා 04 දී පමන මෙය අවධාරණය කර සිටී. එනිසා ඔබ එම අණ, එම උපදේශය පිළිපදියි.

එසේ නම් 40 වතාවක් පමණ කුරාණය තුලින් අල්ලාහ් සුභානවතාලා ඔබට අණ කර තිබෙන, උපදෙස් දී තිබෙන, මතක්කර දී තිබෙන සකාත් ගෙවීම පිළිබඳව ඔබ හැසිරෙන්නේ කොහොමද? එම පැනය ඔබ ඔබෙන්ම විමසා සිටින්න.

---

## සුන්නි සහ ෂියා අතර වෙනස.

ෂියා වරුන්ගේ ආරම්භය සිදු වන්නේ නබිතුමාගේ අභාවයෙන් දසක කිහිපයක් ගත වූ පසුව ය. මිට ප්‍රධාන හේතුව අලිරලි තුමා සහ මු'ආවියා රලි තුමා අතර ඇතිවුණු යුද්දයකි. ආරම්භයේදී ෂියා දේශපාලන මුහුණුවරක් ගත් අතර පසුව ආගමික නිකායක් බවට පත් විය. ශියාවරුන් විශ්වාස කරන්නේ මුහම්මද් නබිතුමාගෙන් පසු බලය හිමි විය යුත්තේ එතුමාගේ අනුප්‍රාප්තිකයන් වන අලි

රලි තුමාට සහ ඔහුගෙන් පැවත එන ඉමාම්වරුන්ට බවයි. ශියාවරුන් අද වන විට තවත් බොහෝ නිකායන්වලට බෙදී ඇත. බෝරාවරුන් ද එම නිකායට අයත් වෙති. ෂියාවරුන් පිළිපදින ඉස්ලාම් දහම නබිතුමා පෙන්වාදෙන ලද දහමම නොවේ. එම නිකායේ ඉස්ලාම් දහමට පටහැනි බොහෝ දේවල් එකතුකොට තිබේ. මේ නිසා ශියාවරුන් ඉස්ලාම් දහමින් වෙන්වූ කොටසක් ලෙස සැලකේ. ඒ අනුව ඔවුන් අදහන දහම සහ ඉස්ලාම් දහම අතර අහසට පොලව මෙන් වෙනස්කම් දැකිය හැකිය. මේවා ගැන නිසි දැනුමක් නොමැති මුස්ලිම්වරුන් තම දරුවන්ව ෂියා මද්රසා පාසැල්වලට ඇතුලත් කිරීම ඉතා භයානකය. ඇයිද යත් ඔවුන්ගේ ඉගැන්වීම් ඉස්ලාම් දහමේ ඉගැන්වීම්වලට සහමුලින්ම වෙනස් වන නිසාය. අද ලංකාව තුලද ඔවුන්ගේ මතවාදය පතුරුවමින් අළුතින් පාසැල් ඇතිකරමින් තිබෙන නිසා මුස්ලිම්වරුන් අවදියෙන් සිටිය යුතුය.

**ෂියාවරුන් ගේ විශ්වාසයන්ගෙන් සමහරක් පහත දැක්වේ.**

දෙවියන්ට බදා (Badaa) ලක්ෂණය ඇත. එනම් සඟවා හෙළිදරව් කිරීම හෙවත් දේව කැමැත්ත වෙනස් කිරීම (මූලාශ්‍රය Usul -e- Kafi). එහෙත් ඉස්ලාම් දහම අනුව එවැනි දෙයක් නැත.

දෙවියන් අමතක කරන්නේය (මූලාශ්‍රය Ibid). මෙය ඉස්ලාම් දහම අනුව වැරදිය.

දෙවියන් වැරදි කරන්නේය (මූලාශ්‍රය Ibid). ඉස්ලාම් දහම අනුව දෙවියන් වැරදි කරන්නේ නැත.

දෙවියන් සැලසුම් කලත් එය සිදු වන්නේ නැත (මූලාශ්‍රය Ibid). ඉස්ලාමීය විශ්වාසය අනුව දෙවියන්ගේ සැලසුම් වරදින්නේ නැත.

දෙවියන් නබිතුමාගෙන් පසු පාලකයා වශයෙන් පත් කළ යුත්තේ කව්රුන්දැයි දන්නේ නැත (මූලාශ්‍රය Ibid). ඉස්ලාම් දහම අනුව පාලකයෙක් පත් කිරීම මිනිසාට පවරා ඇත.

"ෂියාවරුන් වන අප යzසිද්, මුඅ'වියා, උzස්මාන් වැනි අයට පාලනය ලබා දුන් දෙවියන්ට නමදින්නේ නැත" (මූලාශ්‍රය Ibid). ඉස්ලාම් දහම අනුව උzස්මාන් රලි තුමා ස්වර්ග වාසියෙකි.

ඔවුන් පවසන්නේ "අලි පවසන පරිදි....මමයි ආරම්භකයා. මම විද්‍යාමාන සහ සැඟවුණු කෙනා වෙමි. පෘථිවියට උරුමක්කාරයා මම වෙමි"(මූලාශ්‍රය Islaamic Goverment P35/ 133). මෙය ඉස්ලාමීය ඉගැන්වීම් වලට සපුරා වැරදිය.

තවද ෂියාවරුන් පවසන්නේ ඉමාම්වරුන් යනු දෙවියන්ගේ මුහුණ බවයි (මූලාශ්‍රය Ibid). මෙය ඉස්ලාමීය ඉගැන්වීම්වලට සපුරා පටහැනි වේ.

ෂියාවරුන්ගේ මතය අනුව නබිතුමාගේ අභාවයෙන් පසු තිදෙනෙක් හැර අන් සියළුම දෙනා ඉස්ලාම් දහම අතහැර තිබේ (මූලාශ්‍රය Anwaar - No'maan Niyyah - P245. Vol 2. Nimatullah Jafaari./ Furu Kafi, Kitaabul Raudah :15 - Mullah Muhammad bin Yaqoob Kulaini Vol 3 P115/ Usul -e-Kafi Vol 2, P 246 Rijaal Kashsi P504). තවද ශියාවරුන් පවසන්නේ අබූබක්කර්, උමර් සහ උZස්මාන් රලි තුමන්ලා අලිරලි තුමාට හිමිවිය යුතු කලීෆා පදවිය උදුරා ගත් බවයි (මූලාශ්‍රය Al- Ihtijaaj - Tibrasi 83, 84./Haqqul Yaqeen, P 157). එසේම ශියාවරුන්ට අනුව උමර් රලි තුමා ඉස්ලාම් දහම හැර ගිය කාෆිර් කෙනෙකු වේ (මූලාශ්‍රය Haqqul Yaqeen , 551/Kashful Asraar P119). සුන්නිවරුන් මේවා සියල්ල තරයේ ප්‍රතික්ෂේප කරන්නේය.

ෂියාවරුන්ට ඔවුන්ගේම කුරානයක් ඇත (මූලාශ්‍රය Usul-e-Kafi). තවද ඔවුන්ට පමණක් අයත් නබිවදන් අඩංගු හදීස් ග්‍රන්ථ ඇත. එබැවින් ඔවුන් සහීහ් බුහාරි හෝ වෙනත් හදීස් ග්‍රන්ථ පිලි පදින්නේ නැත. එසේම ඔවුන්ට වෙනම ම ෆික් නීති පොත් සම්පාදනය කොට ඇත. ඒ අනුව ෂියා වරුන් දිනකට තුන් වේලක් පමණක් නැමදීම සිදු කරති. එහෙත් නබිතුමා පෙන්වා දී තිබෙන්නේ දිනකට පස් වෙලාවක් සලාතය ඉටු කිරීමට ය.

ෂියාවරුන් විශ්වාස කරන්නේ ඔවුන් පිළිපදින ඉමාම්වරුන්ට දේව පණිවිඩ ලැබෙන බවයි. තවද ඔවුන් සිදු කරනු ලබන සලාතය, අZසාන් සහ හජ් සුන්නි මුස්ලිම්වරුගෙන් වෙනස් වේ (මූලාශ්‍රය Usul-e-Kafi Vol2 P278/ Tafseer - al-Waeelah Vol 1 P280). එහෙත් සුන්නිවරුන් විශ්වාස කරන්නේ නබිතුමාගෙන් පසු දේව පණිවිඩ හෙවත් වහි පහළ වීම අවසාන වූ බවයි.

ෂියාවරුන් පවසන කලිමාව සුන්නිවරුන් පවසන කලිමාවට වඩා වෙනස් වේ. ඒ අනුව ඔවුන්ගේ කලිමාව වන්නේ "ලා ඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර්රසුලුල්ලාහ් - අලි වලියුල්ලා, කුමෙනි හුජ්ජතුල්ලාහ්" යනුවෙනි (මුලාශ්‍රය Wahdat Islaami - June 84 P1- monthly Iranian Goverment. Periodical). එහෙත් නබිතුමා පවසා ඇත්තේ "ලා ඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර්රසුලුල්ලාහ්" යන කලිමාව පමණි.

මිට අමතරව ෂියාවරුන් වාර්ෂිකව කර්බලා දිනය සිහි කරමින් තමාගේ ශරීරයට වද හිංසා පමුණුවා ගනිති. එහෙත් එවැනි දේවල් ඉස්ලාම් දහම අනුමත කරන්නේ නැත. මේවා දැකීමෙන් ඉස්ලාම් දහම ගැන නොදන්නා අය සිතන්නේ ඒවා ඉස්ලාමීය ඉගැන්වීම් ලෙසය. එසේම ශියාවරුන්ගේ කොටසක් වන බෝරාවරුන් සිදු කරන බොහෝ දේවල් ඉස්ලාම් නොවේ. (FA)

---

# රමදාන්.

ඉස්ලාමීය දින දර්ශනයට අනුව 9 වන මාසය රාමදාන් (رمضان) මාසයයි. මෙය මුස්ලිම්වරයෙකුට විශේෂ මාසයකි. ආහාර ගැනීම සීමා කිරීම පමණක් නොව, පහත සඳහන් කරුණු රාශියක් මතද පදනම් වූ සමෘද්ධිමත් සමයකි.

උපවාස මාසය/ සාමයේ මාසය/ සන්සුන් මාසය/ ආත්මය සුව කිරීමේ මාසය/ සමාව දීමේ මාසය/ යහපත්කමේ මාසය/ දෙවියන්ගේ දයාවේ මාසය/ පහසුවෙන් පාරාදීසය ලබන මාසය/ කුරානයේ මාසය/ දිව්‍ය හෙළිදරව්වේ මාසය/ මාස දහසක් වටිනා ලෙයිලතුල් කදර් සහිත මාසය/ මුස්ලිම්වරයෙකු වීම සැමරීමේ මාසය/ ජීවිතය ජය ගන්න පුහුණු වන මාසය/ ෂෙයිතාන් විලංගු දමන මාසය/ දානයේ මාසය..

මෙම මාසය තුල විශේෂයෙන්ම,

- ✓ දුආ ප්‍රාර්ථනා අධික වශයෙන් සිදු කරන්න. අල්ලාහ්ව අධිකව සිහි කරන්න

- ✓ කුරානය අධිකව පාරායනා කරන්න, එය අධිකව සවන්දෙන්න
- ✓ අමතර සලාතයන් වැඩිවශයෙන් ඉටු කරන්න
- ✓ හැකි තරම් දානමය කටයුතු වල නියැලෙන්න. සකාත් ගෙවන්න

රමධාන් සමය සාර්තකව ගත කිරීමට අපගේ www.srmicenter.com වෙබ් අඩවියෙහි ඇති පහත මාතෘකා යටතේ ඇති ලිපි  කියවා බලන්න.

- උත්සව සමය සහ නවක මුස්ලිම්වරු...
- සකාතුල් ෆිත්ර් – රමලාන් උපවාස දානය!
- "ලයිලතුල් කද්ර්" කීර්තිමත් රාත්‍රිය!
- උපවාස මාසයේදී විශේෂ අවධානය යොමු විය යුතු කරුණු
- රමළාන් සමය අපේක්ෂාවෙන් කැපවීම
- රමළාන් සමය සඳහා වැදගත් ඔවදන් කිහිපයක්!
- උපවාසයෙන් පසුවන කෙනෙකු සුවඳ විළවුන් ආලේප කළ හැකිද?
- නෝන්බි අවුරුදු දිනයෙහි පිළිපැදිය යුතු උසස් සාරධර්ම!
- රමළාන් මාසයේ අඹු සැමි සම්බන්ධතා පිළබඳ ඉස්ලාමයේ පවතින නීතිරීතීන් මොනවාද?

---

## <u>දුආ ප්‍රාර්ථනා.</u>

## දුආ ප්‍රාර්ථනා යනු කුමක්ද?

දුආ ප්‍රාර්ථනා යනු ආයාචනා සහ ප්‍රාර්ථනාවන්ය. මුස්ලිම්වරයන්ට මෙය භාවනාවකි, නැමදුමකි, කිසිඳු අතරමැදියෙකුනෙන් තොරව තම නිර්මාතෘව ඍජුවම සම්බන්ධකර ගැනීමකි.

තම සිතෙහි ඇති දේ ප්‍රකාශ කිරීම, පාපොච්චාරණය (තව්බා) කිරීම, පිහිට පැතීම, දෙවියන්ව සිහිපත් (දික්ර්) කිරීම, දෙවියන්ව ප්‍රසංශා (ශුක්ර්) කිරීම ආදියත් මේ යටතට ඇතුලත්ය.

නබි (ﷺ) තුමානන් පවසා තිබෙනවා තම නිර්මාතෘව සිහිපත් කරන්නා සහ නොකරන්නා පණ ඇති කෙනා සහ පණ නැති කෙනා වගේ කියලා. දෙවියන්ව සිහිකිරීම හදවතට සැනසීමකි, එය හරියට මාළුවන්ට වතුර මෙනි. අල්ලාහ්ව සිහිකිරීමෙන් විශ්වාස කරන්නන්ගේ හදවත් වලට සැනසීම ලැබෙන බවට දෙවිඳුන් සහතික කර ඇත.

*(නබියේ!) ඔබගෙන් මගේ දාසයන් මා ගැන විමසුවහොත් (එයට ඔබ මෙසේ කියනු); "නියත වශයෙන්ම මා සමීපයෙහිම සිටින්නෙමි. (කවුරුන් හෝ) මාව ආරාධනා කළහොත් එම ආරාධනා කරන්නාගේ ආරාධනාවට මා පිළිතුරු දෙන්නෙමි". එබැවින් මා වෙතම ප්‍රාර්ථනා කළ යුතුය. මාව විශ්වාස කළ යුතුය. (එමගින්) ඔවුන් ඍජු මාර්ගය අත් කර ගන්නාහ" (Al Quran 2:186)*

මිනිසාගේ නිර්මාතෘ ලොව වසන අවසන් ජන සමූහය වන අපට ඍජු මාර්ගෝපදේශය ලෙස ශුද්ධ වූ අල් කුරාණය පකළ කර මිනිසාගේ දහම සම්පූර්ණ කර ඇති බවත් පවසා තිබේ. ශුද්ධ වූ අල් කුරාණය ආරම්භ කරනුයේ ඉතාමත් ප්‍රභල ප්‍රාර්ථනාවක් සමගිනි. දෙවියන් වහන්සේම එය මිනිසාට උගන්වා දී තිබේ. එනම්, මේ ලෝකය තුල මිනිසාට තම ජීවන ගමනේ මාර්ග දෙකක් හමුවේ. එකක් ඍජු මාර්ගය, අනික්වා වරද ගිය මාර්ග.

අපි මේ ලොව තුල මොන ජයග්‍රහනය ලැබුවත් වැඩක් නෑ මේ ජීවිත කාලය තුල තමන්ට ඍජු මාර්ගයදී මගහැරුනොත් . එම නිසාම දෙවියන් ඔහුගේ මාර්ගෝපදේශය හරනා මිනිසාට පවසන්නේ ඍජු මාර්ගය පෙන්වා දෙන ලෙස දෙවියන්ගෙන් ප්‍රාර්ථනා කරන ලෙසය.

*ඔබවම අප නමදින්නෙමු. ඔබගෙන්ම අප පිහිට පතන්නෙමු. ඔබ අපට ඍජු මාර්ගය පෙන්වා දෙනු මැනව . ඔබගේ අනුකම්පාව හා දයාව කාහට පහළ කලේද, ඔවුන්ගේ මාර්ගයේ යාමට සලස්වනු මැනව. එය ඔබගේ කෝපයට පත් වූවන් ගිය මාර්ගයෙහිද නොව, අයහමගෙහි වූවන්ගේ මාර්ගයෙහීද නොව. (Quran 1:5-7)*

මෙහි දෙවියන්ගේ කෝපයට පත් වූ මාර්ගය යනු, දෙවියන්ගේ මාර්ගෝපදේශ විකෘති කරමින්, එය වෙනස් කරමින් අනුගමනය කරන අය යන මාර්ගයයි. (යුදෙව්වරුන් සහ ක්‍රිස්තියානි වරුන් වැනි අය).

අයහමගෙහි යන අයගේ මාර්ගය යනු දෙවියන් ලෙස පිළිම තනාගෙන සිටින අය, ගස් ගල් හිරු මිනිසුන් ආදිය අදහන අය සහ දෙවියන්ව ප්‍රතික්ශේප කරමින් සිටින (බෞද්ධ වැනි අය) යන මාර්ග. ඍජු මාර්ගය යනු තම නිර්මාතෘ වන දෙවියන් විසින් පෙන්වා දුන් මාර්ගයයි. එම මාර්ගය පෙන්වා දෙන ලෙස ප්‍රාර්ථනා කරන ලෙස දන්වා තිබේ.

*ඇත්තෙන්ම විශ්වාසය තබා සිටින්නන් (ඍජු මාර්ගයේ යන) ඔවුන්ය, (ඔවුන් ඉදිරියේ) අල්ලාහ්ගේ ශුද්ධ වූ නාමය මතක් කරනු ලැබුවහොත් ඔවුන්ගේ හදවත් සෑහීමට පත් වන්නේය. (මන්දයත්) අල්ලාහ්ගේ ශුද්ධ වූ නාමය මතක් කිරීම මගින් (සත්‍යය විශ්වාසවන්තයින්ගේ) හෘදයන් නියත වශයෙන්ම තෘප්තියට පත්වනු ඇත යන්න (නබියේ!) ඔබ දැන ගනු මැනව.( 13:28)*

දෙවිඳුන් අපව නිර්මාණය කළ මුල්ම අවස්ථාවේ ඔහු අපේ දෙවියන් බවට අප සාක්ෂි දරා ඇත. ඒ බව අදටත් අපේ හෘද සාක්ෂිය තුල ඇත. ලොව සිටින ඕනෑම පුද්ගලයෙක් ඔහු කුමන ආගමක් දහමක් ඇදහුවත්, ඔහු මුවින් දෙවියන් යැයි කෙනෙක් හෝ තමන්ට නිර්මාතෘ කෙනෙක් නැතැයි ප්‍රකාශ කලත් ඔහුගේ අභ්‍යන්තරය තුල දෙවියන් කියන සංකල්ප ඇත. ඔහු ඉතාම අමාරුකමකට මුහුණ දුන්නොත්, මරණය හැර වෙන විකල්පයක් නෑ කියන භයානක අවස්ථාවකට පත් උනොත් ඔහුගේ උඩු සිත නොදැනුවත්ව යටි හිතින් හරි දෙවියන්ව අමතන්න පටන් ගනී. "අනේ දෙවියනේ මාව බේර ගන්න!!!".....ආදී ලෙස.

මේ තමයි මනුෂ්‍යය ස්වභාවය. ඔහු ඉපදුනෙත් මේ දෙවියන් සමග ඇති සම්බන්ධතාවයත් එක්කමය. නමුත් වැඩිවිය පත් වෙද්දි සමහර මිනිසුන් එක එක කාරණා හේතුවෙන් තම නිර්මාතෘ සමග තබා ගත යුතු සම්බන්ධතාවය වෙනුවට වෙනත් දැය තම දෙවියන් කර ගන්නවා. සමහරු මැටි පිළිම තම දෙවියන් කර ගන්නවා, සමහරු එක් එක් සාශ්තෘන්වරුන්ව තමන්ගෙ දෙවියන් (ගැලවුම්කරු)

කරගන්නවා, සමහරු මුදල් තම දෙවියන් කරගන්නවා. සමහරු තමන් ආපු දිහාව දන්නෙත් නැතිව, යන දිහාව දන්නෙත් නැතිව තමන් තමන්වම දෙවියන් (ගැලවුම්කරු) කරගන්නවා. නමුත් තම අභ්‍යන්තරය තුල තම සැබෑ දෙවියන් ගැන මතකය මියැදෙන්නේ නෑ.

මොනතරම් ප්‍රශ්න, පීඩා ඇති උනත් දෙවියන්ව විශ්වාස කරන අය ජීවිතයෙන් පලා යන්නේ නෑ, සියදිවි නසා ගන්නේ නෑ. ඔහු විශ්වාස කරනවා එය තම ජීවිත පරීක්ෂනයේ තවත් අදියරයක් පමණයි කියලා. ඔහුව මේ ලෝකෙ කවුරු අතැහැරියත් තම නිර්මාතෘ තමා සමග සිටින බව ඔහු විශ්වාස කරනවා.

තම විචාර බුද්ධිය නිසි පරිදි භාවිතා නොකරන සහ, හෘද සාක්ෂිය අවභාවිතා කිරීම හෝ, කලක සිට භාවිතා නොකර මලකඩ කා ඇති හෝ ගල් වී ඇති නිසා දෙවියන් ගැන තැකීමක් නැති අයට ඒ බව සිහි කැඳවීමට, (සුභාරංචි සහ අණතුරු ඇඟවීම් සහිතව) දෙවිඳුන් නබිවරුන් හරහා මාර්ගෝපදේශ එවා ඇත. අප වෙත එවා ඇති මාර්ගෝපදේශය අල් කුරානයයි. එය මොහම්මද් නබි (ﷺ) තුමා හරහා එවා ඇත. එය ලබා ගැනීම සෑම මනුශ්‍යයෙක්ටම ඇති පෞද්ගලික වගකීමකි. එය නොසලකා හැරීම තමන් තමන්ටම කරගන්නා හානියකි.

අද ඔබ ඔබේ දෙමව්පියන්ගෙන් වෙන් වෙලා නම් ඉන්නෙ (ඔවුන් තාමත් ජීවතුන් අතර ඉන්නවානම්) ඔබ අවසන් වරට ඔවුන්ට දුරකතන ඇමතුමක් ගත්තේ කවදාද? ඔබට හැකි සෑම විටම ඔවුන් සමග සම්බන්ධතාවය තබා ගන්නේ ඔබ කොතරම් ගුණ යහපත් කෙනෙක්ද.

ඔබ ඔබේත්, ඔබේ දෙමව්පියන්ගේත් සැබෑ නිර්මාතෘ වන තම දෙවියන් වහන්සේ සමග අවසන් වරට සම්බන්ධ උනේ කවදාද?

*ඔබගේ දෙවියන් මෙසේ පවසන්නේය; ඔබ (ඔබට අවශ්‍ය දෑය සියල්ල ඉල්ලා සිටීමට) මාවම ආරාධනා කරනු. මා ඔබට (ඔබේ ප්‍රාර්ථනාවන්ට) පිළිතුරු දෙන්නෙමි; (40:60)*

අප ප්‍රාර්ථනා කලත් නැතත් දෙවියන් අපගේ සියළුම දේ කල්තියාම දන්නේය. නමුත් අප ඔහු සමග තබා ගන්නා සම්බන්ධතාවය කෙසේද යන්න ඇගයුමට ලක්

කර ඇත. ඇති බව අප වටහාගෙන කටයුතු කල යුතුය. අල්ලාහ් මෙසේ පවසා ඇත.

*නියත වශයෙන්ම අල්ලාහ් (ඔබගේ හෘදන්හී ඇති දැය හොඳින් දන්නෙකු වශයෙන් සිටින්නේය; (5:7)*

අප දකින විශ්වය සහ එහි ඇති දේවල් පුදුමාකාරය. අපට සිතා ගත නොහැකි තරම් විශ්මිතය. ඒ සියල්ලෙහි නිර්මාතෘ ගේ තත්වය අපට සිතා ගැනීමටද නොහැකිය. අප ප්‍රාර්ථනාවක් කලොත් දෙවියන් වහන්සේ එයට ප්‍රතිචාර දක්වන විදිහද අපගේ සිතුම් පැතුම් පරාසයෙන් එපිට දෙයකි. අපගේ සෑම ප්‍රාර්ථනාවකටම පිළිතුරු දෙන බවත් දෙවිඳුන් පවසා ඇත. ඔබ දෙවියන්ගෙන් මුදල් ලැබෙන මාර්ගයක් විවෘත කර දෙන ලෙස ඉල්ලා ප්‍රාර්ථනා කරනවා වෙන්න පුළුවන්, නමුත් ඔබ ගැන සියල්ල දන්නා දෙවිඳුන් ඔබට වඩාත්ම හොඳ දේ ලෙස වෙන දෙයක් ලබා දෙනවා වෙන්න පුළුවන්. එනිසා ඔහු පවසන්නේ ඔබ ඔහුගෙන් ඉල්ලමින් ප්‍රාර්ථනා කරන ලෙසය. ඔබට දෙවියන්වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය මෙහි ප්‍රභල ගුණාංගයකි. ඔහු තම ගැත්තන් කෙරෙහි ඉතාම දයාබරවන්තයෙකු ලෙස සිටින බව පවසා ඇත.

ඔබ කුමන කුමන ස්ථානයක, කුමන තත්ත්වයක සිටියත් අල්ලාහ්ව එක් වරක් සිහිපත් කර ඔහුට ප්‍රශංසා කළහොත් ඔහු ඔබට ස්වර්ගයෙහි ගසක් මවා දෙන බවට දෙවියන් වහන්සේ පොරොන්දු වූ බව හදීසයක සඳහන් වේ. එයට අනුව ඔබ හුස්ම ගන්න සෑම තත්පරයකටම දෙවිඳුන් වටිනාකමක් දී ඇත. නින්දට යන විට කරන ප්‍රාර්ථනා මගින් ඔබ නිදන කාලයටත් වටිනාකමක් උදා කර ගත හැක.

ඔබ මරණින් පසු නැවත ඔහු හමුවට යා යුතුය.

ඔබ මෙතෙක් ජීවත් වූ කාලය තුලදී කොතරම් දුරට ඔහුව සිහිපත් කලාද? ඔහු සමග හිතින් සන්නිවේදනය කලාද? ඔහුගෙන් යම් පිහිටක් ඉල්ලුවාද? ඔහු ඔබට ලබා දුන් ජීවිතය සහ වරප්‍රසාද වෙනුවෙන් ඔබ ඔහුට ස්තුති කලාද?

මුස්ලිම් අයගෙන්ට අහනවාට වඩා මේ ප්‍රශ්නය අහන්න වෙන්නෙ දෙවියන්ව මෙතෙක් විශ්වාස නොකරන අයගෙනුයි. ඔබ රසවත් පළතුරක් කන විට, ඔබ

විශ්මිත සතෙක්ව දකින විට, ඔබ ඔබේම ශරීයයේ විශ්මිත බව දකින විට, නව තාක්ෂණය හරහා විශ්වය පිළිබඳව තොරතුරු දකින විට ඔබට හිතෙන්නේ නැතිද "අනේ දෙවියනේ, ඔබේ නිර්මාණ නම් අති විශිෂ්ටයි" කියලා?

මේවා නිකම්ම ඉබේ හැදුනා කියලද ඔබ තවත් විශ්වාස කරන්නෙ?

මේ තියෙන්නෙ පිලිවෙලින් මීමැස්සෙකුගේ ඇසක්, බිත්තරයක අඩංගු දේ සහිත රූපසටහනක් සහ බත්කූරෙකුගේ හිසක් පෙන්වන රූප තුනකි.









මේවා දැක්කම මුස්ලිම් අය "wow, මාරයි, ලස්සනයි" කියලා කියනවාට වඩා මුලින්ම කරන්නේ මේවායේ නිර්මාතෘව සිහිපත් කර ඔහුගේ විශිෂ්ඨ නිර්මාණශීලීත්වය Mashaallaah කියමින් ඇගයීමයි, Alhamdulillaah කියමින් ඔහුව ප්‍රසන්සා කිරීමයි.

දෙවියන් පවසා ඇත්තෙත් මේවා තුලින් පවා දෙවියන්ව හඳුනා ගෙන තව තවත් ඔහුට ලං වෙන ලෙසයි. දෙවියන්ව (නිර්මාතෘව) විශ්වාස නොකරන තාක් කල් ඔබට සොභාදහමේ නියම ආශ්වාදය විඳිය නොහැකිය. ජීවිතයේ සැබෑ ආශ්වාදය අත් විඳිය නොහැකිය. එය ස්ථිරය.

තම නිර්මාතෘ සමග ශක්තිමත් සම්බන්ධතාවයක් ඇතිකර ගන්න තරමටම ඔබට තම ජීවිතය ගැනත් තෘප්තිමත් භාවය වැඩිකර ගත හැකිය. එහිදී ඔබ කොතරම් ධනවත්ද, ඔබ කොතරම් සෞඛ්‍ය සම්පන්නද, ඔබට කොතරම් මිතුරන් සිටිනවාද

යන්න ආදිය අදාල නොවන බවද ඔබට පසක් වනු ඇත. එනිසා හැකි තරම් දෙවියන්ව හඳුනාගන්න බලන්න. හැකි තරම් උපරිමව ඔහුව සිහිකරමින්, ඔහුව ප්‍රසන්සා කරමින් ඔහුගේ මාර්ගෝපදේශය මත ඉන්න බලන්න. එවිට ඔබට මෙලොව ගැනත් පරලොව ගැනත් සිතමින් තමා ගැනම සතුටු විය හැකියි.

මිනිසුන් අතරින් යම් පිරිසක් මෙසේ පවසන බව දෙවිඳුන් අපට මතක් කර දී ඇත.

(බුද්ධිමත්) මෙවැන්නන් (තමන්ගේ) නැගී සිටීමේද, වාඩි වීමේද, තමන්ගේ නින්දෙහිද, අල්ලාහ්වම සිතා අහස් හා භූමියෙහි උත්පාදනය ගැනද සිතා "අපගේ දෙවියනේ! ඔබ මේවා නිකරුණේ උත්පාදනය කර හැරියේ නැත. ඔබ ඉතාමත් පාරිශුද්ධය. නිරා ගින්නේ දඬුවමෙන් අපව බේරා ගනු මැනව! (Al Quran 3:191)

ඔබගේ දුආ ප්‍රාර්ථනා පිළිගැනීමට, යම් යම් කොන්දේසි සපුරාලිය යුතුය. ඒවා ගැන ඔබ සැලකිළිමත් වන්න.

**1. අල්ලාහ් හැර වෙන කිසිවකුට ආරාධනා නොකරන්න.**

*නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ: "ඔබ ඉල්ලන්නේ නම්, අල්ලාහ්ගෙන් (පමණක්) ඉල්ලන්න, ඔබ උදව් සොයන්නේ නම්, අල්ලාහ්ගේ උපකාරය පතන්න." (තිර්මිදි 2516)*

*නියත වශයෙන්ම මස්ජිදයන් සියල්ල අල්ලාහ්ගේ (නැමදුම) වෙනුවෙන්ම ඇත්තේය. එබැවින් (ඒවායේ) අල්ලාහ් සමග වෙනත් කිසිවෙකු (නැමදීමට නාමය පවසා) ආරාධනා නොකරනු. (72:18)*

*අපි ඔබව පමණක් නමදින්නෙමු. ඔබෙන් පමණක් පිහිට පතන්නෙමු (අල් ෆාතිහා 1:5)*

**2. ෂරියාහි හෙවත් ඉස්ලාමීය උගැන්වීම හරහා නියම කර ඇති ආකාරයන්ගෙන් අල්ලාහ්ට සමීප වීමට උත්සාහ කරන්න.** (පළතුරු ආදිය පූජා කර දෙවියන්ගෙන් පිහිට පැතීම වැනි දෑ ඉස්ලාමය තුල උගන්වා නැත).

**3. ඉක්මන් ප්‍රතිචාරයක් සෙවීමෙන් වළකින්න.** මක් නිසාද යත්, දෙවිඳුන් ගේ ප්‍රතිචාරය ඔබ සිතනවාට වඩා (ඔබට වඩාත් යහපත්) වෙනත් ආකාරයකට ලැබෙනවා වෙන්නත් පුළුවන. ඔබ ඔබගේ ඉල්ලීම හැකි තරම් දිගටම කරගෙන යන්න. එය ඔබටම යහපතකි.

**4. ඔබේ දුආ ප්‍රාර්ථනා පාපය හෝ ඥාති සබදතා බිඳ දැමීම සම්බන්ධව නොවිය යුතුය.** ඔබටත් අන් අයටත් යහපත වෙනුවෙන් පමණක් දුආ ප්‍රාර්ථනා කරන්න. ඔබට සතුරු කෙනෙකු සම්බන්ධව නම් ඔහුගේ සතුරු කමින් ආරක්ෂාව ලබා දෙන ලෙසත් ඔහුටත් අල්ලාහ්ගේ තෘප්තිය දිනාගත් අයෙකු බවට පත්වෙන්න අවස්ථාව උදාකර දෙන ලෙසත් ප්‍රාර්ථනා කරන්න.

**5. අල්ලාහ් ගැන ධනාත්මකව සිතන්න.** ඔබ ඔබේ දෙවියන් ගැන හොඳින් සිතන්නේ නම් සහ ඔහුගෙන් හොඳම දේ බලාපොරොත්තු වේ නම් අල්ලාහ් ඔබට ඔහුගේ අනුග්‍රහය ලබා දෙනු ඇත.

**6. ඔබ දුආ ප්‍රාර්ථනා ඉල්ලන අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය ගැන අවධානයෙන් හා සිහියෙන් සිටින්න.** නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ: "අල්ලාහ්ගෙන් අවධානය වෙනතකට යොමු වූ හදවතකින් කරන දුආ ප්‍රාර්ථනා වෙත අල්ලාහ් පිළිතුරු නොදෙන බව දැන ගන්න." (අත්-තිර්මිදි 3479)

**7. ඔබේ ආහාර පාන සහ ඇඳුම් පැළඳුම් ආදීය නීත්‍යානුකූල ප්‍රභවයන්ගෙන් ලැබෙන බවට සහතික වන්න.** වරදක් වී ඇත්නම් පසු තැවී තව්බා කරන්න.

*"සැබැවින්ම අල්ලාහ් පිළිගන්නේ භක්තිවන්තයන්ගෙන් පමණි" (5:27)*

තහනම් කරන ලද මූලාශ්‍රවලින් තම ආහාර, පාන සහ ඇඳුම් පැළඳුම් ආදීය ලබා ගන්නා අයෙකුට ප්‍රතිචාරයක් නොලැබෙන බව නබි තුමාණෝ ප්‍රකාශ කළහ.

**7. දුආ හි ආක්‍රමණශීලීත්වයෙන් වළකින්න,** මක්නිසාද අල්ලාහ් දුආහි ආක්‍රමණශීලීත්වයට කැමති නැත. අල්ලාහ් මෙසේ පවසයි.

*(එබැවින් විශ්වාසවන්තයිනි!) ඔබ ඉතාමත් යටහත් පහත්වද, ගුප්ත වශයෙන්ද, ඔබගේ අල්ලාහ් වෙතම (ඔබට අවශ්‍ය දැය ඉල්ලා) ප්‍රාර්ථනා කරනු. නියත වශයෙන්ම ඔහු සීමාව ඉක්මවූවන්ව ප්‍රිය කරන්නේ නැත. (7:55)*

**8. යම් කිසි අනිවාර්ය රාජකාරියකින් ඔබව වෙනතකට යොමු කිරීමට ඉඩ සලසමින් ප්‍රාර්ථනාවෙහි නොයෙදෙන්න.** උදාහරනයකින් පවසනවා නම් ඔබේ ඔබ දුආ පදනම මත ඔබේ දෙමාපියන්ගේ අයිතිවාසිකම් නොසලකා හැරිය යුතු නොවේ. තම මව කතා කළහොත් ඇයට පිළිතුරු දීමට ඔබ ඉදිරිපත් විය යුතුය. ඔබට අල්ලාහ් ගෙන් ඕනෑම වෙලාවක, ඕනෑම තත්වයක සිටිමින් වුව දුආ ප්‍රාර්ථනා කල හැකියි. දුආ ප්‍රාර්ථනා කිරීම වෙනුවෙන් කල් තියා ඔබට සූදානම් වෙන්න හැකිනම් එය මනා පිළිවෙලකට කරන්න. වඩාත්ම සුදුසු වෙලාවාක් තෝරා ගන්න.

ශුද්ධවූ අල් කුරාණය මක්කාවේ ජීවත් වූ අවසන් නබි මොහම්මද් (ﷺ) තුමාට අරාබි භාෂාවෙන් පහළ කල දිව්‍ය වදන්ය. නබිතුමා සම්බන්ධ හදීස් ඇත්තේද අරාබි බසිනි. එම දිව්‍ය උගැන්වීම කිසිඳු වෙනසකට ලක් නොකර පහල වූ භාෂාවෙන්ම අපටත් භාවිත කිරීමට ලැබීම අප ලද ඉමහත් භාගයකි. එම නිසා කුරනය තුලින් හෝ නබි තුමා විසින් පෙන්වා දී ඇති සමහර දුආ ප්‍රාර්ථනා අර්ථය වටහා ගෙන එම අරාබි වදන්ම භාවිතා කරමින් දුආ ප්‍රාර්ථනා කිරීමට උත්සහ ගත යුතුයි. තේරුම් ඇතිව එම අරාබි වදන්ම භාවිතා කිරීමට හුරු නැතිනම් තමන් තමන්ට හුරු භාශාවෙන්ම දුආ ප්‍රාර්ථනා කිරීම වරදක් නොවේ. අල්ලාහ් සුභානවතාලා අප සියල්ලගේ හදවත් තුල ඇති දේ පවා දන්නා කෙනෙකි. එනිසා හිත පතුලෙන්ම අවංකව මෙම දුආ ප්‍රාර්ථනා කිරීමට නැඹුරුවීම උසස් ගුණාංගයකි.

---

# දුආ, දික්ර්, ශුක්ර්, තව්බා

- **දික්ර් -** යනු දෙවියන්වහන්සේව සිහිපත් කිරීමකි. එය නමස්කාරයකි. එය තම හදවත තුළ අභ්‍යන්තරව සහ තම දිවෙන් මුනුනමින් ඔහුව මහිමයට පත් කිරීමයි. එය කෘතඥතාවයේ සහ ස්තුතියේ පදනම වේ.
- **ශුක්ර් -** යනු ඉස්ලාම් දහමෙහි ඉතා උසස් ගෞරවාදරයට පාත්‍ර වූ යහපත් ගුණාංගයක් වන මිනිසුන් විසින් තම නිර්මාතෘ වන දෙවියන්වහන්සේට ස්තුතිවන්ත වීම, කෘතඥතාව දැක්වීම හෝ උන්වහන්සේගෙන් යමක් පිළිගැනීම හඟවන අරාබි පදයකි.
- **දුආ -** ඇමතීම සහ කන්නලව් කිරීමේ ක්‍රියාවකි, එනම් යමක් උනන්දුවෙන් හෝ නිහතමානීව දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටීම හෝ අයැදීමයි.
- **තව්බා -** එය කිසියම් පාපයක් සහ වැරදි ක්‍රියාවක් සිදු කිරීම හේතුවෙන් දෙවියන්වහන්සේ වෙත පසුතැවිලි වීමේ ඉස්ලාමීය සංකල්පයයි. (එනම් එම වරද නැවත නොකරන්නම අල්ලාහ් ඉදිරියේ අධිෂ්ඨාන කර ගැනීමකි). එය තමා සහ දෙවියන් වහන්සේ අතර සෘජු කාරණයක් වන අතර එයට වෙනත් මැදිහත් කරුවෙක් සම්බන්ධ නොවේ.
- **ඉස්තිග්ෆාර් -** මෙය වරදට සමාව ගැනීමක් වැනි දෙයකි. (එයට ඔහු "අස්තහ්පිරුල්ලාහ්!" යනුවෙන් පවසයි).

මුස්ලිම්වරුන් විසින් නිතර භාවිත කරන දුආ ප්‍රාර්ථනා කිහිපයක් පහතින් දැක්වේ. ඒවායේ තේරුම පහතින් සඳහන් කර ඇත.

බිස්මිල්ලාහ්, සුභානල්ලාහ්, අල් හම්දුලිල්ලාහ්, අල්ලාහ්හුඅක්බර්, ලා ඉලාහ ඉල්ලල්ලාහ්, හස්බිඅල්ලාහ්, අස්තහ්පිරුල්ලාහ්, අඋදුබිල්ලාහ්, ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්, ඉන්නා ලිල්ලාහි ව ඉන්නා ඉලායිහී රාජි ඕන්, රදීතු බිල්ලාහි රබ්බන් වබිල් ඉස්ලාම් දීනන් වබි මොහම්මදින් නබීයන්, ලා ඉලාහ ඉල්ලාලාහ් අන්ත සුභානක ඉන්නී කුන්ත් මින්නස් දාලිමීන්, අල්ලාහුම්ම ඉන්නක අෆූවුන් තුහිබ්බුල් අෆු අෆ අෆුඅන්නී, ලා ඉලාහ ඉල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂයි ඉන් කදීර්,

අල්ලහුම්ම අ'ඉන්නී අලා දික්රික ව ශුක්රික ව හුස්නි ඉබාදතික, අල්ලාහුම් අජ් අල්නී මිනත් තව්වාබීන වජ් අල්නී මිනල් මුත්තහ්හරීන්. සුභාන රබ්බියල් අZතීම්, සුබ්හාන රබ්බියල් ආ'ලා, හස්බියල්ලාහු ලා ඉලාහ ඉල්ලල්ලාහු අලෙයිහිතවක්කල් වහුව රබ්බුල් අර්ෂිල් අතීම්, රබ්බනා ආතිනාෆී ද්දුනියා හසනතන් වෆිල් ආකිරත් හසනතන් වකිනා අදාබ් අන් නාර්, මා ෂා අල්ලාහ්, අස්තහ්ෆිරුල්ලාහ්,

අල්ලාහ්ගේ නාමයන් භාවිතා කරමින් එම ඕනෑම නමකින් ඔහුව සිහිපත් කළ හැකියි. ඔහුව ප්‍රසංශා කළ හැකියි.

**අල්ලාහ්ගේ නම් 99ක්**

අර්-රහ්මාන්, අර්-රහීම්, අල්-මලික්, අල්-කුද්දූස්, අස්-සලාම්, අල්-මු'මින්, අල්-මුහයිමින්, අල්-අසීස්, අල්-ජබ්බාර්, අල්-මුතකබ්බීර්, අල් ක්හාලික්, අල්-බාරි, අල්-මුසව්විර්, අල්-ගෆ්ෆාර්, අල්-කහ්හාර්, අල්-වහ්හාබ්, අර්-රස්සාක්, අල්-ෆත්තාහ්, අල්-අලීම්, අල්-කාබිඩ්, අල්-බාසිත්, අල්-ඛාෆිද්, අර්-රාෆි, අල්-මුයිස්, අල්-මුසිල්, අල්-සමී', අල්-බසීර්, අල්-හකම්, අල්-ආදල්, අල්-ලතීෆ්, අල්-ක්හාබීර්, අල්-හලීම්, අල්-අතීම්, අල්-ගෆූර්, අල්-ශකූර්, අල්-'අලී', අල්-කබීර්, අල්-හෆීඩ්, අල්-මුකීත්, අල්-හසීබ්, අල් ජලීල්, අල්-කරීම්, අර්-රාකීබ්, අල්-මුජීබ්, අල් වාසී, අල් හකීම්, අල්-වදූද්, අල්-මජීඩ්, අල් බා'යිත්, අල් ශහීද්, අල් හක්, අල්-වකීල්, අල් කව්ව්, අල් මතීන්, අල් වලී, අල් හමීඩ්, අල් මුහ්ද්, අල් මුබ්දි, අල් මු'ඉද්, අල් මුහී, අල් මුමීත්, අල් හෛයි, අල් කෛයූම්, අල් වාජිද්, අල් මජීඩ්, අල් වාහිද්, ඇහැද්, අස් සමද, අල්-කදීර්, අල්-මුක්තදීර්, අල් මුකද්දිම්, අල්-මුආක්කීර්, අල් අව්වල්, අල් ආක්හිර්, අද්-දාක්හිර්, අල් බාතින්, අල් වාලී, අල් මුතා'අලී, අල් බාර්, අත්- තව්වාබ්, අල් මුන්තකීම්, අල් අෆුව්ව්, අර් රවූෆ්, දූල්-ජාලාලි වල්-ඉක්රාම්, අල් මු'ශිත්, අල් ජාමි, අල් ඝනී, අල් මුග්නි, අල් මානී, අල් ධාර්, අල් නාෆී, අන් නූර්, අල් හාදි, අල් බාදි, අල් බාකි, අල් වාරිත්, අල් රාශීඩ්, අල් සබූර්.

වචන වල අර්ථ

**බිස්මිල්ලාහ්** :- "අල්ලාහ්ගේ නාමයෙනි". මුස්ලිම්වරුන් ඕනෑම දෙයක් ආරම්භකිරීමේදී දෙවියන්වහන්සේගේ නාමය පවසා ආරම්භ කිරීමට උනන්දු

වෙති. සියල්ල ආරම්භයට හේතුවද අල්ලාහ්ය. ඔහුගෙන් තොර කිසිවක් නොමැත. සියල්ලෙහි හිමිකරුද ඔහුය. සියල්ල කෙරෙහි බලය ඇත්තේද ඔහුටය. එනිසා ඔහුගේ නාමයෙන් ආරම්භ කිරීම තුල ඔහුව සිහිකිරීමක්, ඔහුට කෘතඥ වීමක්, ඔහුගෙන් අවසර ගැනීමක් වැනි බොහෝ ගුණාංග එය තුල ගැබ්ව පවතී.

**සුභානල්ලාහ්:-** "දෙවියන්ට මහිමය වේවා"! එය බොහෝ විට අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය සඳහා ප්‍රශංසා කිරීමේ සහ අගය කිරීමේ ආකාරයක් ලෙස භාවිතා වේ. එය ප්‍රීතිය, පුදුමය හෝ විස්මිත අවස්ථා වලදීද භාවිතා කළ හැක. අල්ලාහ්ගේ මැවීමේ බලය සහ අලංකාරය පිළිබඳව සුභානල්ලාහ් මගින් අපගේ ප්‍රශංසාව ප්‍රකාශ කරයි.

**අල් හම්දුලිල්ලාහ්** :- "සියලු ප්‍රශංසාව අල්ලාහ්ට හිමි වේ." එය බොහෝ විට අල්ලාහ් ආශීර්වාද සහ සෞඛ්‍යය, ආරක්ෂාව සහ ප්‍රතිපාදන වැනි අනුග්‍රහය දැක්වීමට කෘතඥතාව පළ කිරීමට කියනු ලැබේ. බොහෝ විට මුස්ලිම් කෙනෙකුගෙන් අසන විට, "ඔබට කොහොමද?" ලෙස, ඔවුන් ප්‍රතිචාර දක්වන්නේ "අල්හම්දුලිල්ලාහ්" යනුවෙනි. එම අවස්ථාවේ ඔහු මොන තරම් අපහසුව සිටියත්, මොන තරම් පහසුවක සිටියත් දෙවියන් කෙරෙහි ඇති විශ්වාසය නිසා එය ඔවුන්ට ශක්තියකි, එනිසා ඔවුන් පවසන්නේ "සියලු ප්‍රශංසාව අල්ලාහ්ට හිමි වේ" ලෙසිනි

**අල්ලාහ්හුඅක්බර්** :- මින් අදහස් වන්නේ " අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයි" යන්නය. තස්බීහ් ලෙසද මෙය හඳුන්වයි. මෙම වදන තුල විශාල අදහසක් ඇත. අදාන් තුලද, සලාතය තුලද මෙය නිතර භාවිතා වේ. පුදුම වන දෙයක් දුටුවිට පවා මෙය මුස්ලිම් අයගේ මුවින් නිතැතින්ම කියැවෙයි. යුද්ධයකදි පවා මේ වචනය භාවිතා කිරීම ජයග්‍රහනය ලැබීමට හේතුවක් බව අල්ලාහ් කුරානය තුලින්ම පවසා ඇත. මේ සියල්ල තුලින් ගම්‍ය වන්නේ දෙවියන්ගේ බල පරාක්‍රමයයි. හැම අතින්ම ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු වෙයි. සලාතයේදී ඉරියව් වෙනස් කිරීමේදී මෙය පවසමින් සලකුණු කරනුයේ ඇත්තටම අපට සෙලවීමට පවා අල්ලාහ්ගේ බලය නොමැතිව කල නොහැකි බවයි. විශාල පිපිරීමකදී මුස්ලිම් අය තිගැස්සීමෙන් යුතුව මෙය පවසන්නේ ඒ පිපිරුමට බලය පවා උත්පාදකයෙකු නොමැතිව සිදු විය නොහැකි බවත් විශ්වය ඇතුළු සියල්ලෙහි නිර්මාතෘ අල්ලාහ්ම වන බවත්

විශ්වාස කරන නිසාවෙනි. හැම අංශයකින්ම ඔහු තමයි ශ්‍රේෂ්ඨ. ඔහුගේ නම් 99 ක් කුරානය තුල සදහන් ඒ හැම නමකටම ශ්‍රේෂ්ඨත්වයේ තිබෙන්නේත් ඔහුටමය. සියල්ල දකින්නා ඔහුය, සියල්ල අසන්නා ඔහුය.... ඔබ දන්නවද මිනිස් සිරුරේ සෛල කීයක් විතර තියෙනවද කියලා? එය ට්‍රිලියන 30ක් පමන වේ. ඔබ දන්නවද නිරීක්ෂන අහසේ මන්දාකිනි කීයක් විතර තියෙනවද කියලා? එය ට්‍රිලියන 3 ක් පමන වේ. මේ සියල්ලෙහි නිර්මාතෘ අල්ලාහ්මය. අල්ලාහ්හුඅක්බර්.

**ලා ඉලාහ ඉල්ලල්ලාහ්** :- අල් ඉලාහ් යනු දෙවියන් යන්නයි. නැමදීමට සුදුස්සා යන අර්ථයද එහි ඇත. ඉල්ලල්ලාහ් යනු අල්ලාහ් හැර යන්නයි. එයට අනුව මෙයින් කියැවෙන්නේ නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර වෙන කිසිවෙක් නොමැති බවයි. (එය එකවරම ප්‍රතික්ෂේප කිරීම සහ සහතික කිරීමකි. "ලා ඉලාහා" යනු අල්ලාහ් හැර අනෙකුත් සියලුම නමස්කාර ප්‍රතික්ෂේප කිරීමකි. "ඉල්ලා අල්ලාහ්" යනු හවුල්කරුවන් නොමැතිව සියලු නමස්කාරයන් අල්ලාහ්ට පමණක් බව තහවුරු කිරීමකි). දෙවියන්ගේ ඒකීයත්වය මෙයින් පිලිඹිබු වේ. එනම් එකම එක දෙවියෙකු පමණයි සිටින්නේ. එවන් වෙන කිසිවෙකුත් නැත. එනම් ඔහු හැර නැමදීම් ලබන්න සුදුසු වෙන කිසිවෙක් නැත. මිනිසාද ඔහුට හැර වෙන කිසිවෙකුට නැමදිය යුතු නැත. සමහර මිනිසුන් නමදින වෙනත් කිසිවක් නැමදුම නම් උත්තරීතර ගෞරවය ලබන්න තරම් සුදුසුකම් නොලබන බවත් එයින් ගම්‍ය වේ.

**අඋදූබිල්ලාහ්** :- මම අල්ලාහ්ගේ රැකවරණය පතමි

**න'ඖදූබිල්ලාහ්** :- යනු 'අපි අල්ලාහ්ගේ රැකවරණය පතමු'

**හස්බිඅල්ලාහ්** :- අල්ලාහ් මට ප්‍රමාණවත්ය

**ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්** :- අල්ලාහ් සමඟ මිස කිසිම බලයක් හා ශක්තියක් නැත. මෙයින් ආදහස් වන්නේ අල්ලාහ්ගේ උපකාරය සහ සහයෝගය නොමැතිව තමාට (හෝ වෙන කිසිවෙකුට) කිසිවක් කළ නොහැකි බව පුද්ගලයෙකුගේ පිළිගැනීමයි.

**ඉන්නා ලිල්ලාහි ව ඉන්නා ඉලායිහී රාජි ඕන් :-** නියත වශයෙන්ම අපි අල්ලාහ්ට අයත් වන අතර අපි සියල්ලෝම ආපසු ඔහු වෙතම යන්නෙමු." යමෙකු මිය ගිය පසු හෝ අවාසනාවන්ත හෝ ව්‍යසනකාරී දෙයක් අත්විඳීමෙන් පසු මුස්ලිම්වරුන් සාමාන්‍යයෙන් මෙය පවසයි. නමුත් මෙය ඕනෑම වෙලාවක සිහිපත් කල හැකියි. සතුටු අවස්ථාවකදී උනත්. තමාගේ ජීවන ගමනේ මුල සහ අග මතක්කර ගැනීමකි. අල්ලාහ් හමුවට යාම සිහි කැදවීම තුළින් තමාව ඒ සඳහා සූදානම් කර ගැනීමකටද මෙම සිහිකිරීම වටින්නේය.

**රදීතු බිල්ලාහි රබ්බන් වබිල් ඉස්ලාමි දීනන් වබි මොහම්මදින් නබීයන්:-** අල්ලාහ් මගේ ස්වාමියා ලෙසත්, ඉස්ලාමය මගේ ආගම ලෙසත්, මුහම්මද් තුමාණන් මගේ අනාගතවක්තෘවරයා ලෙසත් මම සෑහීමකට පත් වෙමි". මෙය නිතර සිහිපත් කිරීම අපට ඉතා ප්‍රයෝජනවත් වන්නකි. ඇත්තටම මෙය අපේ පොරොන්දුවකි. අල්ලාහ් තමාගේ දෙවියන් බවත් ඔහුට අවනත වන බවටත් අපි මෙලොවට පැමිණීමටත් පෙරම ආල්ලාහ් ඉදිරියේ පොරොන්දු වී ඇත. අපි මිය ගිය පසු මිණීවල තුල මලායිකාවරුන් මුලින්ම අපෙන් අහන්නේද මේ ප්‍රශ්න තුනය. ඔබගේ දෙවියන් කවුද? ඔබගේ දහම් මාර්ගය කුමක්ද? ඔබ ගේ නබිවරයා කව්ද? ඒවාට නිසි පිළිතුරු දු අයට මිණීවල (කබ්ර්) තුල (බර්සාක් නම්) ජීවිත කාලයට යම් සැනසීමක් ලැබෙනු ඇත.

**ලා ඉලාහ ඉල්ලාලාහ් අන්ත සුභානක ඉන්නී කුන්ත් මින්නස් zදාලිමීන්:-** "ඔබ හැර වෙන දෙවියෙක් නැත, ඔබට මහිමය වේවා! නියත වශයෙන්ම මම වැරදි කරන්නන් අතර සිටිමි!". යූනුස් (අ.ස) නබිතුමා අල්ලාහ්ගේ උපදෙස් ලැබීමට පෙර තමන් ගත් තීරණයක් නිසා තමාට වරදක් සිදුවූ බව වටහා ගත්තේය. ඔහුව විශාල මාළුවෙක් ගිල ගත්තේය. ඔහු මාළුවාගේ උදර කුහරය තුලදී අල්ලාහ් වෙත තම බැගෑපත් භාවය පෙන්වීමට කල ප්‍රාර්ථනාවකි මෙය. අල්ලාහ් එයට සවන් දී ඔහුට දයාව දක්වා නිරුපද්‍රිතව මාලුවාගෙන් බේරා ගොඩ බිමට සේන්දු කරවන ලදී. මෙම දුවා ප්‍රාර්ථනාව ඉතා ප්‍රභල එකකි. නිතර මෙනෙහි කරමින් පැවසීමට රෙකමදාරු කළ එකකි.

**අල්ලාහුම්ම ඉන්නක අෆූවුන් තුහිබ්බුල් අෆු අෆ අෆුඅන්නී:-** අනේ දෙවියනේ! ඔබ ඉතාමත්ම සමාව දෙන්නාය, ඔබ සමාව දීමට කැමැත්ත ඇත්තාය, එබැවින් අපට සමාව දෙනු මැනව!

**ලා ඉලාහ ඉල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂයි ඉන් කදීර් :-** අල්ලාහ් හැර නැමදීමට සුදුසු වෙන කිසිවෙකුත් නැත, හවුල්කරුවන් කිසිවෙක් නොමැති එකම අල්ලාහ්ට සියලුම ආධිපත්‍යය හිමි වන අතර සියලු ප්‍රශංසා ඔහුටම හිමි වේ, ඔහු සියල්ල කෙරෙහි බලය ඇත්තාය.

**අල්ලහුම්ම අ'ඉන්නි අලා දික්රික ව ශුක්රික ව හුස්නි ඉබාදතික:-** අනේ දෙවියනේ! ඔබ ගැන මතක තබා ගැනීමටත්, ඔබට කෘතඥ වීමටත්, ඔබට විශිෂ්ට ලෙස නමස්කාර කිරීමටත් මට උපකාර කරන්න. සෑම සලාතයකට පසු මෙම අයැදීම ඉටු කරන ලෙස නබි ﷺ තුමානන් උපදෙස් දී ඇත.

අල්ලාහුම් අජ් අල්නී මිනත් තව්වාබීන වජ් අල්නී මිනල් මුත්තහ්හරීන්:- අනේ දෙවියනි!, පසුතැවිලි වී ඔබ වෙත හැරෙන අය අතරට මා පත් කරනු මැනව. තවද පවිත්‍ර වූවන් අතරට මා පත් කරනු මැනව. සෑම සලාතයකට පසු මෙම අයැදීම ඉටු කරන ලෙස නබි ﷺ තුමානන් උපදෙස් දී ඇත.

**සුබ්හාන රබ්බියල් අzතීම් :-** යන්නෙන් අදහස් වන්නේ, 'මගේ ස්වාමියා වන අල්ලාහ්ට ශ්‍රේෂ්ඨතම මහිමය හිමිය. අල්ලාහ් තආලා අපගේ පරිකල්පනයෙන් ඔබ්බට සිටින කෙනෙකි, ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයටද සීමාවක් නැත. සමස්ත නිර්මාණය කෙරෙහි ඒවායේ සියලු තාක්ෂණය සහ දැණුමද ඔහු ගේය. මෙය සෑමසලාතයකම රුකූ අවස්ථාවේ මුනුනමින් ඉතා සෙමින් කියනු ලැබේ. එසේම ඕනෑම අසස්ථාවකදී උච කීමට සුදුසුය.

**සුබ්හාන රබ්බියල් ආ'ලා :-** යන්නෙහි තේරුම මහෝත්තමයාණන් වන මාගේ ස්වාමි වූ අල්ලාහ්ට මහිමය වේවා යන්නයි. මෙය සලාතයේදී සුජූද් අවස්ථාවේදී කියනු ලබයි. මෙහිදී නැවතත්, ඔබ අල්ලාහ් තආලා ඉදිරියෙහි සිටින බව සිහි තබා ගන්න. මෙහිදී ඔබ ඔහුට සම්පූර්ණයෙන්ම යටහත් වී ඇති බවක් සහ උපරිම ගෞරවයක් පෙන්නුම් කරයි.

**හස්බියල්ලාහු ලා ඉලාහ ඉල්ලල්ලාහු අලෙයිහිතවක්කල් වහුව රබ්බුල් අර්ෂිල් අතීම් :-** අල්ලාහ් මට ප්‍රමාණවත්ය. ඔහු හැර නමස්කාරයට සුදුස්සෙක් නැත. මම ඔහු කෙරෙහි විශ්වාසය තැබුවෙමි, ඔහු මහිමාන්විත (අර්ෂ්) සිංහාසනයේ ස්වාමියාය.

**රබ්බනා ආතිනාෆී ද්දුනියා හසනතන් වෆිල් ආකිරත් හසනතන් වකිනා අදාබ් අන් නාර් :-** "අපගේ ස්වාමීනි, මෙලොවදී යහපත් දේත්, පරලොව යහපත් දේත් අපට ලබා දී අපව නිරා ගින්නේ දඬුවමෙන් ආරක්ෂා කළ මැනව." [-2:201]

**මා ෂා අල්ලාහ් :-** යන්නෙහි වාචික අර්ථය වන්නේ "දෙවියන් වහන්සේ එය (සිදුවීමට) අදහස් කර ඇත", "දෙවියන් වහන්සේ කැමති දේ සිදුවී ඇත" හෝ "දෙවියන් වහන්සේ කැමති දෙයයි" යන්නයි. උදාහරණයකින් පවසනවා නම්, ඔබ ලස්සන මලක් දැක්කා කියලා හිතමු. එවිට ඔබ මාශාඅල්ලාහ් කියා පවසයි. එනම් එම මල ඒ විදිහට පැවැතීමට දෙවියන් අදහස් කර තිබෙනවා, ඔහු එය නිර්මාණය කර තිබෙනවා, එය ඔබට දකින්න අවස්ථාව ඇති කර තිබෙනවා. එනිසා එම මලෙහි සුන්දරත්වය විඳින ඔබ එහි නිර්මාතෘ ගෙ දායකත්වය අගය කරනවා. ඔබේ අල්ලපු ගෙදර අය අලුතින් වාහනයක් ගෙනත් කියලා හිතමු. එවිට ඔබ මා ෂා අල්ලාහ් යැයි පවසනවා. එනම්, ඒ ගැන ඔබට ඉරිසියාවක් නෑ. ඔබ සතුටුයි. හේතුව නම්, එය දෙවියන්වහන්සේගේ කැමැත්තයි. ඔහු එය වෙන්න ඉඩ හැර තිබෙනවා. දැන් ඒ දේ සිදුවී තිබෙනවා.

**අස්තහ්ෆිරුල්ලාහ් :-** මෙය වරදට සමාව ගැනීමක් වැනි දෙයකි. මෙයට වඩා තව්බා කිරීම වඩා උසස් ය.

**අල්ලාහුම්ම අන්ත රබ්බි, ලා ඉලාහ ඉල්ලා අන්ත. හලක්තනී වඅන අබ්දුක වඅන අලා අහ්දික වවඃදික මස්තතඃතු. අඌදුබික මින් ශර්රි මා සනඃතු. අබූඋ ලක බිනිඃමතික අලයිය ව අබූඋ බිසන්බි ෆග්ෆිර්ලී ෆඉන්නහු ලා යග්ෆිරුස්සුනූබ ඉල්ලා අන්ත.**

අර්ථය : ඕ අල්ලහ්! ඔබ මාගෙ රබ්ය. නැමදීමට සුදුසු ඔබ හැර අන් කිසිවෙකු නොමැත. මා මැවුවෙ ඔබමය. මම ඔබගේ ගැත්තා වෙමි. මම මාගේ හැකියාව

අනුව ඔබගේ පොරොන්දුව හා ගිවිසුම අනුව ක්‍රියාකරමි. මා කල ක්‍රියාවන් හි උවදුරු වලින් ඔබෙන් රැකවරණය පතමි. ඔබ මට පිරිනමා ඇති භාග්‍යයන් සියල්ලම පිළිගනිමි. මා කළ පාපයන් ද පිළිගනිමි. එහෙයින්, මගේ පාපයන් කමා කරනු මැනවි. පාපයන් කමා කරන්නා ඔබ හැර අන් කිසිවෙක් නැත. (ග්‍රන්ථ: බුහාරි, 150)

---

## දෙවියන් සිහිකිරීම සම්බන්ධව ඇති කුරාන් ආයත්

පැහැදිළි කාරනාවක් මතම දෙවියන්වහන්සේ විසින් මිනිසාව නිර්මාණය කර ඇත. තම නිර්මාතෘව තම ඇසට නොපෙනෙන අවස්ථාවේ නිර්මාතෘ අපට දී ඇති සලකුණු මත යමින් ඔහුව හඳුනාගෙන ඔහුව සිහිපත් කිරීම, ඔහුව ප්‍රශංසා කිරීම, ඔහුගෙන් ප්‍රාර්ථනා කිරීම, තම වැරදි වලට පසුතැවී සමාව අයැදීම වැනි කාරණාවන් මතද ඔහු අපව පිරික්සන්නෙහිය. මිනිසාට කිසිඳු වියදමකින් තොරවම, තම සිතින් සහ මනසින්ද, දිවෙන් මුමුණමින්ද මෙම මහත්ඵල මහානිසංස ලැබෙන කටයුත්තේ නියැලීමට පුළුවන. අල්ලාහ්ව සිහිපත් කිරීම ගැන ඔහු කුරානය තුලින් මිනිසාව අමතා ඇති ආකාරය පහත සඳහන් ආයත් හරහා අපට බලා ගත හැක.

*ඔබ මාව (සිතමින්) භාවනා කරනු. මම ඔබව සිතා (දයාව පහළ කරමින්) සිටින්නෙමි. ඔබ මා හට කෘතඥ වෙමින් සිටිනු. (මා හට ස්තූති නොකරන) ප්‍රතික්ෂේප කරන්නන් බවට පත් නොවනු. (2:132)*

*(නබියේ!) ඔබ මනසෙහි ඉතාමත් පහත්වද, බියෙන්ද, (සුමුදුවද), දැඩි කටහඬක් නොමැතිවද, උදේ සවස ඔබ දෙවියන්ගේ ශුද්ධ වූ නාමය සුවිශුද්ධ කරමින් සිටිනු මැනව! (ඔහුව) අමතක කර දමා සිටින්නන්ගෙන් ඔබත් නොසිටිනු (මැනව!). (7:205)*

*(නබියේ!) කවුරුන් තමන්ගේ සොම්නස බලාපොරොත්තුවෙන් ඔහුවම උදේද, සවසද (ප්‍රාර්ථනා කර) ආරාධනා කරමින් සිටින්නෝද, ඔවුන් සමග ඔබත් (ඔබගේ දුක් ගැහැට විඳ දරාගෙන) ඉවසීමෙන් සිටිනු මැනව! මෙලොව*

*ජීවිතයෙහි අලංකාරය ඔබ ආශා කර, එවැනි (හොඳ) අයව අත්හැර ඔබගේ ඇස් හරවා නොගනු මැනව! තවද කවුරුන් තම (ශරීර) සුවය අනුගමනය කිරීමේ හේතුවෙන් ඔහුගේ හෘදය අපව සිහිකර, යාඥා කිරීමෙන් අපි හරවා දැමුවේද, ඔහුව ඔබ අනුගමනය නොකරනු. ඔහුගේ කාරණාව සීමාව ඉක්මවූ එකක් වන්නේය. (18:28)*

*"නියත වශයෙන්ම මා අල්ලාහ්ය. මා හැර වෙන දෙවියෙකු නැත. මාවම ඔබ නමදිනු. මාව සිහිපත් කරමින් සිටිනු පිණිස සලාතය නොකඩවා ඉටු කරනු". (20:14)*

*ඔහුම නැගෙනහිර දිසාවටද, බටහිර දිසාවටද දෙවියන්ය. ඔහු හැර, වෙන කිසිම හිමියෙකු නැත. එබැවින් ඔහුවම ඔබ, (ඔබගේ) ආරක්ෂකයා වශයෙන් (පත්) කරගනු, (73:9)*

*කවුරුන් මගේ හොඳ ඔවදන් ප්‍රතික්ෂේප කරන්නේද, ඔහුගේ ජීවිතය නියත වශයෙන්ම ඉතාමත් දුක් ගැහැට වලින් පිරි එකක් වශයෙන්ම තිබෙණු ඇත. විනිශ්චය දිනදී නම්, අපි ඔහුව අන්ධයෙකු වශයෙන්ම නැගිට්ටවන්නෙමු" යැයි පැවසුවේය: (20:124)*

*කවුරුන් රහ්මාන්ගේ හොඳ ඔවදනින් ඈත්ව ඇස් පියාගෙන සිටින්නේද, ඔහුට අපි එක් ෂෙයිතාන්වරයෙකුව (මිතුරෙකු වශයෙන්) පත් කර හරින්නෙමු. ඔහු, ඔහුට කිසිදාක ඈත් නොවන මිතුරෙකු බවට පත්වන්නේය. නියත වශයෙන්ම (ෂෙයිතාන් වන) ඒවාම ඔවුන්ව ඍජු මාර්ගයෙන් වළක්වා හරින්නාහ. එහෙත් ඔවුන් නම්, තමන් ඍජු මාර්ගයෙහිම සිටින්නෝ යයිම අදහස් කර ගන්නාහ. (43:36-37)*

*තවද ඔවුන් යම්කිසි අවමන් ගෙන දෙන ක්‍රියාවක් කළද, නැතහොත් (පාපයක් කර) තමන්ට තමන්ම හානියක් කර ගත්තද, එවෙලේම අල්ලාහ්ව සිතා, (ඔහු වෙතින්ම) තමන්ගේ පාපයන්ට සමාව අයැද සිටින්නාහ. (අල්ලාහ්ද ඔවුන්ට සමාව දෙනු ඇත). අල්ලාහ් මිස, (මෙවැන්නන්ගේ) වැරදි වලට සමාව දෙන්නේ කවරෙක්ද? ඔවුන් කළ (වැරදි) ක්‍රියාව (වැරද්දක් යයි) ඔවුන් දැනගත හොත් (එහි) ගැලී නොසිටින්නාහ. (එවෙලේම එයින් ඈත් වන්නාහ). (3:135)*

*මත්පැන් මගින්ද, සූදු කෙළිය මගින්ද, ඔබ අතරේ වෛරයද, ක්‍රෝධයද ඇති කිරිරීමටද, අල්ලාහ්ගේ මතකයෙන්ද, සලාතයෙන්ද, ඔබව වළක්වා හැරීමට නියත වශයෙන්ම ෂෙයිතාන් කැමැති වන්නේය. (එබැවින් ඒවායෙන්) ඔබ ඈත් වන්නෙහුය. (5:91)*

*(නබියේ!) වහී මගින් ඔබට දැනුම් දෙන ලද (මෙම) ධර්මය ඔබ සමුදීරණය කර, සලාතය නොකඩවා ඉටු කරමින් සිටිනු. මන්ද යත් නියත වශයෙන්ම සලාතය අවමන් ගෙන දෙන කාරණාවන්ගෙන්ද, පාපයන්ගෙන්ද, (මිනිසාව) ඈත් කරන්නේය. අල්ලාහ්ව (අමතක නොකර) මතකයේ තබා (ඔහුට දික්ර් කර) සිටීම. නියත වශයෙන්ම ඉමහත්ය, තවද ඔබ කරන දෑය අල්ලාහ් හොඳින් දන්නේය. (29:45)*

*(නබියේ!) උදේ සවස ඔබ දෙවියන්ගේ සුවිශුද්ධ වූ නාමය (පවසා) සුවිශුද්ධ කරමින් සිටිනු. රාත්‍රියෙහිද ඔහුට හිස නමා සුජූද් කර, රාත්‍රී කාලයෙහි දීර්ඝ කාලයක් ඔහුව සුවිශුද්ධ කරමින් සිටිනු මැනව! (76:25-26)*

*විශ්වාසවන්තයිනි! (සිකුරාදා දින වන) ජුමා දිනදී සලාතය සඳහා (අදාන් පවසා ඔබව) ආරාධනා කරනු ලැබුව හොත් වෙළදාම (ආදිය) අත්හැර දමා අල්ලාහ්ව දික්ර් කිරීමට ඔබ ඉක්මන් කර යනු. ඔබ බුද්ධිමත් අය වශයෙන් සිටියහොත් මෙයම ඔබට ඉතාමත් අගනේය. (මෙය ඔබ දැන ගනු විශ්වාසවන්තයිනි! ඔබගේ වස්තූන්ද, ඔබගේ දරුවන්ද, අල්ලාහ්ගේ මතකයෙන් ඔබව ඈතට හරවා දැමීම නොකළ යුතුය. කවුරුන් හෝ මෙසේ කළහොත් එවැන්නන් නියත වශයෙන්ම පරාජිතයින්ය. (63:9)මැනව!). (62:9)*

*(විශ්වාසවන්තයිනි!) ඔබ (සලාත් කර), සලාතය අවසන් කර ගතහොත් ඔබ සිටගෙන සිටියදීද, වාඩිවී සිටියදීද, හාන්සිවී සිටියදීද, අල්ලාහ්ව දික්ර් (සිහි) කරමින් සිටිනු; (4:103)*

*(නබියේ!) බලසම්පන්නකමද, අභ්‍යන්තර මනසෙන් වූ දූරදර්ශී භාවයෙන්ද යුක්තව සිටි අපගේ වහලුන් වන ඉබ්රාහීම්, ඉශාක්, යාකූබ්වද සිතා බලනු! අපි ඔවුන්ට විෂේශ (වූ එක් කාරණාවක්) මෙනෙහි කිරීම සඳහාද, (පරලොව) නිවස (සැම විටම) මෙනෙහි කිරීම සඳහාද තෝරා ගත්තෙමු. (38:45-46)*

(විපතක පැටලී) දඟලමින් සිටින අය (ආරක්ෂාව පතා) ආරාධනා කළහොත් (ඔවුන්ට) පිළිතුරු දී, ඔවුන්ගේ අමාරුකම් පහ කරන්නේ කවරෙක්ද? භූමියෙහි ඔබව නියෝජිතයින් වශයෙන් පත් කළේ කවරෙක්ද? මෙවැනි අල්ලාහ් සමග නැමදුමට යුතු (වෙන කෙනෙකු) සිටින්නෙහිද? (ඇත්තෙන්ම නැත) ඔබ (මේ ගැන) සිතන්නේ ඉතා අල්පයකි. (27:62)

විශ්වාසවන්තයිනි! ඔබ (යුද්ධයේදී සතුරන්ගේ) සමූහය හමු වුවහොත් (බිය නොවී) ස්ථීර වශයෙන් (විරුද්ධව) සිටිමින් "(අල්ලාහු අක්බර් යයි)" අල්ලාහ්ගේ ශුද්ධ වූ නාමය ඔබ අධික වශයෙන් (ශබ්ධ නගා) පවසනු. (එයින්) ඔබ ජයග්‍රහණය අත් කර ගනු ඇත. (8:45)

නියත වශයෙන්ම මගේ වහලුන්ගෙන් එක් කොටසක් සිටියහ. ඔවුන් (මා හට) "අපගේ දෙවියනේ! අපි (ඔබව) විශ්වාස කරන්නෙමු. ඔබ අපගේ වැරදි වලට සමාව දී අප කෙරෙහි දයාව පහළ කරනු මැනව! දයාව පහළ කරන්නන්ගෙන් ඔබ ඉතාමත් උසස් වන්තයෙකි" යැයි ප්‍රාර්ථනා කරමින් සිටියහ. (23:109). නමුත් "ඔබ නම්, මාව සිහි කිරීම සම්පූර්ණයෙන්ම අමතක කර දමා ඔවුන්ව අපහාසයට ලක් කරමින් ඔවුන් ගැන සිනහ සෙමින් සිටියෙහුය. (23:110) (ඔබගේ අපහාසය) ඔවුන් විඳ දරාගෙන සිටීමේ හේතුවෙන් අද දින නියත වශයෙන්ම මා ඔවුන්ට (හොඳ) ඵලවිපාක දුන්නෙමි. ඇත්තෙන්ම ඔවුන්ම ජයග්‍රහණය අත් කර ගත් අයයි" (යයිද දෙවියන් පවසනු ඇත). (33:111)

විශ්වාසය තැබූවන්ගේ හෘදය අල්ලාහ්වද, ඔහු පහළ කරන ලද සත්‍ය (ආයාවන්)ද සිතා බිය වී වෙව්ලන කාලය (තවමත්) පැමිණියේ නැද්ද? මොවුන්ට පෙර ධර්මය ලබා දෙනු ලැබූ අය මෙන් මොවුන්ද පත් නොවිය යුතුය. (මෙසේම) ඔවුන් කෙරෙහි එක් කාලයක් ගිය පසු ඔවුන්ගේ හෘදයන් ගල් බවට පත් විය. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු පාපතරයන් බවට පත් වූහ. (57:16)

(නබියේ!) මෙම මක්කාවාසීන් (ධර්ම) මාර්ගයෙහි ස්ථීරව සිටියහොත් බාධාවකින් තොරව ඔවුන්ට වර්ෂාව වසින්නට සලස්වමින් සිටින්නෙමු. (මෙහිදී) ඔවුන්ව අපි පිරික්සන්නෙමු. එබැවින් කවුරුන් තම දෙවියන්ව මතක් කිරීමම

*ප්‍රතික්ෂේප කරන්නේද, ඔහුව දරුණු දඬුවමෙහි ඔහු ඇතුළු කර දමන්නේය. (72:16-17)*

*(නබියේ!) කවුරුන් අපගේ මතක් කිරීම ප්‍රතික්ශේප කර, මෙලොව ජීවිතය හැර, (පරලොව) කැමති නොවී සිටින්නේද. ඔහුව ඔබ ප්‍රතික්ෂේප කර දමනු. (මොවුන්ගේ අධ්‍යාපන ඥානය මෙපමන දුර පමනක් යන්නේය! (මීට එහාට යන්නේ නැත). නියත වශයෙන්ම ඔබගේ දෙවියන් තමන්ගේ මාර්ගයෙන් වැරද ගිය අය කවුරුන්ද යන්නද හොඳින් දන්නේය. ඍජු මාර්ගයෙහි යන්නා කවුරුන් ද යන්නද ඔහු හොඳින් දන්නේය. (53:29-30)*

*(නබියේ! මොවුන්න්ට) "රාත්‍රියේ හෝ දහවලෙහි හෝ පැමිණිය හැකි රහ්මාන්ගේ දඬුවමෙන් ඔබව බේරා ගන්නේ කවරෙක්ද?" යි ඔබ විමසනු. එහෙත් මොවුන් නම්, තමන්ගේ දෙවියන්ව සිහි කිරීම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර දැමූහ. (21:42)*

*ප්‍රතික්ශේප කරන්නන්ට එදිනදී නිරයම අපි (නියත වශයෙන්ම) ඔවුන් ඉදිරියට තබන්නෙමු. ඔවුන් කෙබන්දයන්ද යත් (මෙම අල් කුරානය/ මගේ කැඳවීම) වෙතින් ඇස් වහගෙන සිටි සහ (එය) ඇසීම දරාගත නොහැකිව සිටි අය වෙති. (18:100-101)*

*පාපතරයින් වෙනුවෙන් නිරය ගෙන එනු ලබන එදිනදී මිනිසාට හොඳ බුද්ධිය උදා වනු ඇත. එහෙත් ඒ අවස්ථාවේදී උදාවන බුද්ධියෙන් ඔහුට කුමණ ප්‍රයෝජනයක්ද? "මගේ පරලොව ජීවිතය වෙනුවෙන් මා පින් ඇති දැය කර යවා තිබිය යුතු නොවෙද!" යයි ප්‍රලාප දොඩවනු ඇත. (89:23-24)*

*ෂෙයිතාන් මොවුන්ව ජයග්‍රහනය කර,අල්ලාහ් ගැන වූ අදහසම මොවුන්ට අමතක කර දැමුවේය. මොවුන්ම ෂෙයිතාන්ගේ සමූහයයි. ෂෙයිතාන්ගේ සමූහය නියත වශයෙන්ම පරාජිතයින් යන්න (නබියේ! ඔබ) දැනගනු, (58:19)*

*අල්ලාහ්ගේ වරප්‍රසාද ගැන සිහි කිරීම. (ඉතිහාස කතා)*

*ආරක්ෂාව :- (විශ්වාසවන්තයිනි!) ඔවුන් (මක්කාවාසී ප්‍රතික්ෂේප කරන්නන්) වෙනස්කම් කළහොත් නියත වශයෙන්ම අල්ලාහ් ඔබගේ ආරක්ෂකයා යන්න*

*ඔබ ස්ථිර වශයෙන් දැන ගනු. (ඔහු) ආරක්ෂා කිරීමෙහිද ඉතාම ශ්‍රේෂ්ඨය. උදව් කිරීමෙහිද ඉතා ශ්‍රේෂ්ඨය. [8:40]*

*පෝෂණය:- තවද ඔහු නොදන්නා අන්දමට ඔහුට ජීවනෝපයක් ඔහු (අල්ලාහ්) ලබා දෙන්නේය. කවුරුන් අල්ලාව (සම්පූර්ණයෙන්ම) විශ්වාස කරන්නේද ඔහුට, ඔහුම (සම්පූර්ණයෙන්ම) ප්‍රමාණවත් කෙනෙකි; [65:3]*

*අසනීප:- අයියූබ්වද, (අපි අපගේ දූතයා වශයෙන් යැව්වෙමු). ඔහු තම දෙවියන්ට "නියත වශයෙන්ම අසනීපයක් මාව පීඩා කරමින් ඇත්තේය. (එය පහ කර හරිනු මැනව!). ඔබ නම්, දයාබරවන්තයන්ගෙන් ඉමහත් දයාබරවන්තයෙකි" යැයි ප්‍රාර්ථනා කළ අවස්ථාවේදී; අපි ඔහුගේ ප්‍රාර්ථනාව භාර ගෙන, පීඩා කරමින් තිබූ අසනීපයද පහ කර, ඔහුගේ පවුලද අපි ඔහුට ලබා දී අපගේ දයාවෙන් නැවත්ත් ඒ වගේම සංඛ්‍යාවක් (ඔහුට පවුලක් වශයෙන්) ලබා දුන්නෙමු. මෙය (අපව) නමදින්නන්ටද (අප වෙත ප්‍රාර්ථනා කරන්නන්ටද) හොඳ වැටහීමක් බවට ඇත්තේය. [21:83,84]*

*උසස් අධ්‍යාත්මික තත්වයක්සඳහා:- මගේ දෙවියනේ! ඔබ මට ඥානය පහළ කර, හොඳ අය සමග මාව එක්කාසු කර හරිනු මැනව!". "පසු කාලයේදී (යුග අවසාන දින දක්වා සියල්ල) මා හට (අලෙහිස්සලාම් යයි පවසන) හොඳ නාමයද (කීර්තියද) ලබා දෙනු මැනව!" [26:83,84] මෙලෙස ඉබ්රාහිම් නබි තුම කළ ප්‍රාර්ථනාව අල්ලාහ් පිලිගත් බව සඳහන් කර ඇත.*

*ළමුන් සඳහා:- "මගේ දෙවියනේ! හොඳ අයගෙන් (කෙනෙකුව) ඔබ මා හට (දරුවෙකු වශයෙන්) ලබා දෙනු මැනව! යයි කීවේය. එමගින් ඉතාමත් ඉවසිලිවන්ත (ඉස්මායීල් නැමති) පුතෙකු මගින් ඔහුට සුභාරංචි දුන්නෙමු. [37:99,100]. මෙය ඉබ්රාහීම් නබි තුම කළ ප්‍රාර්ථනාවකි.ඒ අනුව ඔහුට එම පුතා ලැබුණි.*

*සලාතය සඳහා:- "මගේ දෙවියනේ! මාවද, මගේ පරම්පරාවේ දරුවන්දවද, (ඔබව) සලාත් කර සිටින්නන් වශයෙන් පත් කරනු මැනව! අපගේ දෙවියනේ! මගේ ප්‍රාර්ථනාව භාර ගනු මැනව! [14:40] මෙය ඉබ්රාහීම් නබි තුමා කළ ප්‍රාර්ථනාවකි.*

*දුක සහ වේදනාව ඉවත් කිරීම සඳහා:- නූහුවද (නබිවරයෙකු වශයෙන් අපි යැව්වෙමු). ඔහු ඊට පෙර කරමින් සිටි ප්‍රාර්ථනාව ඔහු වෙනුවෙන් අපි භාර ගෙන, ඔහුවද ඔහුගේ පවුලේ උදවියද ඉමහත් අමාරුකමෙන් බේරා ගත්තෙමු. [21:76] [12:86]*

*ඉවසීම සඳහා පීඩකයන්ගෙන් ගලවා ගැනීම සඳහා:- එයට ඔහු "මගේ ශෝකයද, දුකද අල්ලාහ් වෙතම මා පැමිණිලි කරන්නෙමි. ඔබ නොදන්නා දැයද අල්ලාහ්ගේ (දයාවෙන්) මා දැන සිටින්නෙමි" [12:86] මෙය යාකූබ් (අ.ස) නබි තුමා කල ප්‍රකාශයක් බව අල්ලාහ් පවසයි*

*ප්‍රශ්නවලින් මිදීම සඳහා:- (යූනුස් නබි වන) දුන්නූන්වද (අපගේ දූතයෙකු බවට පත් කළෙමු. තම ජනතාවගෙන් ඈත් වී) ඔහු කෝපයෙන් යුතුව පිටමං වූ අවස්ථාවේදී, (අපි ඔහුව අල්ලා ගැනීමට) ඔහු කෙරෙහි ශක්තියක් නැතැයි සිතා ගත්තේය. (එබැවින් ඔහුව මාළුවෙකු ගිල ගැනීමට සැලැස්සුවෙමු. මාලුවාගේ කුසේ) අන්ධකාරයේ සිටි ඔහු (අපට) "ඔබ හැර නැමදුමට යුතු හිමියෙකු වෙන කිසිවෙකුත් නැත, ඔබ ඉතාමත් පාරිශුද්ධවන්තයෙකි. නියත වශයෙන්ම මා නම්, අපරාධකරුවන්ගෙන් කෙනෙකු බවට පත් වුනෙමි. (මා හට සමාව දී දයාව පහළ කරනු මැනව!)" යයි ප්‍රාර්ථනා කළේය. [21:87] අපි ඔහුගේ ප්‍රාර්ථනාව භාර ගෙන, ඔහුගේ ඉතාමත් දුක් මුසු) දුක් ගැහැට වලින්ද අපි ඔහුව බේරා ගත්තෙමු. මෙසේම (අමාරුකමෙහි පැටලී අප වෙත ප්‍රාර්ථනා කරන) විශ්වාසවන්තයින්වද අපි බේරා ගන්නෙමු. [21: 88]*

*මූසා නබිතුමා සහ එම ජනතාවට දුන් වරප්‍රසාද ගැන සිතා බලනු [ ]*

*නූහ් නබි තුමාගෙන් පසු පැමිනි ජනතාවට දුන් වරප්‍රසාද ගැන සිතා බලනු [7:69]*

*ආද් නැමැති ජනතාවට පසු පැමිනි ජනතාවට දුන් වරප්‍රසාද ගැන සිතා බලනු [7:74]*

# <u>ප්‍රධාන ආගම් පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක්</u>

ආගම-දහම මානව සංහතියේ පැවැත්මේ අනිවාර්ය අංගයකි. එය සෑම මනුෂ්‍යයයෙකු තුලම පවතින සහජ ගුණාංගයකි. එම ගුණාංගය සෑම මනුෂ්‍යයෙක් තුලින්ම එකම අරමුණකට යොමුව සිදුකල යුතු යැයි අදහසක් ඉදිරිපත් කල හැකි නමුත් සමාජය තුල එය එලෙස දකින්නට නොමැත.

මනුෂ්‍යයන් විසින් තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් බෙදී "මනුෂ්‍යයාගේ ආගම" විවිධ ආකාරවලට ඇදහීම සහ භාවිතා කිරීම දකින්නට ඇත.

මුස්ලිම්වරු තමන්ගේ විශ්වාසයන්ට විශ්වාසවන්තව සිටින අතරම අන් අයගේ විශ්වාසයන්ට ගරු කරති. බහු සංස්කෘතික සැකසුම් තුළ, විවිධ ආගමිකයින් සමග ආගමික නොවන කටයුතුවලදී එක්ව කටයුතු කරයි. ආගමික කටයුතු වලදීද ඉස්ලාමීය සීමාව තුල සිටිමින් ඔවුන් සමගද ඒවාට සහභාගී වෙයි.

ලෝකයේ ප්‍රධාන ආගම් දෙවියන්ගේ ඒකීයභාවය පෙන්වා දෙයි. සමහර ආගම් අනාගතවක්තෘවරුන් හරහා ව්‍යාප්ත වූ අතර අනෙක් ඒවා එසේ නොවීය.

සමහර මිනිසුන් කිසිම ආගමක් අනුගමනය නොකළත්, ඔවුන් ඔවුන්ට යමෙකු විසින් උගන්වන ඉගැන්වීම් සහ සදාචාරයන් අනුගමනය කරයි.

ආගම මිනිස් ජීවිත කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. සියලුම මිනිසුන් පැවැත්ම සඳහා උසස් සුවිශේෂී කෙනෙකු (One God) හෝ සුවිශේෂී බලයක් (A Supreme Power) කෙරෙහි විශ්වාස කළ යුතුය. එවන් විශ්වාසයක් නැති අයට මෙහි ආරම්භයක් අවසානයක් ගැන වටහාගත නොහැක. එසේ වුවත්, හදිසි හෝ කරදරකාරී තත්ව වලදී දෙවියන් අදහන, දෙවියන්ට කන්නලව් කරන, ස්වභාවයන් ඔවුන් තුලින්ද ඉස්මතුවනු දැකිය හැක.

ලෝකයේ ඇති ප්‍රධාන ආගම් ගෙන බැලුවත් ඒවායේ බහුතරයක් අනුගාමිකයින් ඒවායේ සැබෑ ස්වරූපයෙන් අනුගමනය නොකරයි. ඔවුන් තම ආගම ගැන හරිහැටි නොදැන සිටිති. මේ අනුව ආගම් විශ්ලේෂණය කිරීමට ඒවා අනුගමනය කරන්නන් දෙස නොව, අප ඒවායේ ශුද්ධ ලියවිලි දෙස බැලිය යුතුය.

අපි එක් එක් ආගම් ගැන ගැඹුරින් සොයා බැලුවහොත්, ඒවායේ බොහෝ සමානකම් ඇති බව අපට පෙනී යන අතර, ඒකදේවවාදය පිළිබඳ සංකල්පය බොහෝ ආගම් තුලින් ඉස්මතු වෙයි. ඒ ගැන සංසන්දනාත්මක තොරතුරු කිහිපයක් මෙහි ඉදිරිපත් කර ඇත.

සෑම ආගමක් තුලම ශාස්තෘවරුන් ලෙස හඳුන්වන අයද සිටිනු දැකිය හැක. ඔවුන් විවිධ නම් වලින් හඳුන්වයි. ලොවට පැමිණි අවසාන වක්තෘවරයෙකු ගැනද බොහෝ ආගම් වල සඳහන්ව තිබේ. ගෞතම බුදුන් වහන්සේද තමාට පෙර බුදුවරු පහළ වූ බවත් තමාට පසුවත් බුදුවරු පහළ වන බව දේශනා කර ඇත. ඒ ගැනද සංසන්දනාත්මක තොරතුරු කිහිපයක් මෙහි ඉදිරිපත් කර ඇත.

---

## ආගම් වර්ගීකරණය.

ආගම් විවිධ ආකාරවලින් වර්ගීකරණය කර ඇත, ඒවා අතර දෙවියන් වහන්සේ කෙරෙහි ඇති ඔවුන්ගේ විශ්වාසය මත හෝ වෙනත් විශ්වාස මත පදනම් වී ඇත. ඒවා පහත පරිදි වර්ගීකරණය කළ හැක.

- ඒක දේවවාදී ආගම්: -තනි, සර්වබලධාරී දෙවියෙකු විශ්වාස කරන්න (උදා: යුදෙව් ආගම, ක්රිස්තියානි ආගම, ඉස්ලාම්).
- බහු දේවවාදී ආගම්: - බහු දෙවිවරුන් සහ දේවතාවියන් විශ්වාස කරන්න (උදා: පුරාණ ග්‍රීක සහ රෝම ආගම්).
- දේවවාදී නොවන ආගම්: - දිව්‍යමය ජීවියෙකු පිළිබඳ විශ්වාසයට වඩා ආචාර ධර්ම පද්ධති සහ සදාචාරාත්මක වටිනාකම් කෙරෙහි අවධානය යොමු කරන්න (උදා: බුද්ධාගමේ සහ ජෛන ආගමේ සමහර ආකාර).
- සම්භවය, භූගෝලීය, සහ සංස්කෘතික මූලයන් මතත් මේවා බෙදී යයි.
- මැද පෙරදිග ආගම්: යුදෙව් ආගම, ක්‍රිස්තියානි ආගම, ඉස්ලාම්, සොරොස්ට්‍රියානු ආගම සහ පුරාණ නිකායන්.
- නැගෙනහිර ආසියානු ආගම්: කොන්ෆියුෂියානුවාදය, ඩාඕවාදය, මහායාන බුද්ධාගම සහ ෂින්ටෝවාදය.

- ඉන්දියානු ආගම්: හින්දු ආගම, මුල් බුද්ධාගම, ජෛන ආගම සහ සික් ආගම.
- අප්‍රිකානු, ඇමරිකානු සහ හුදෙකලා වූ සහ ආදිවාසී ජනතාවන්ගේ ආගම් ආදිය.

මීටත් අමතරව තවල් සුළු කාරනා මත පදනම් වූ ආගම්ද දැකිය හැක.




---

# දෙවියන් පවසන "මිනිසාගේ නොමග යෑම".

දෙවියන් වහන්සේ සිටින බවට මිනිසාට පැහැදිලි සාක්ෂි ලබා දී ඇත.

මිනිසා ඇතුළු විශ්වය නිර්මාණය කළේ එකම දෙවියන් බව සනාථ කිරීමට දෙවියන් වහන්සේ සාධක ද එවන ලදී.

එම මිනිසා ජීවත් විය යුතු ආකාරය සහ ඔහුගේ මෙලොව ජීවිතයේ අරමුණ කුමක්ද යන්න පිළිබඳ දැනුවත් කළ මාර්ගෝපදේශ ද (නබිවරුන් හරහා) හෙළිදරව් කර ඇත.

පෙර විසූ ජනතාවට මෙන්ම වර්ථමාන සමාජයටද එවන් නබිවරයෙකු හරහා දෙවියන්ගේ අවසන් මාර්ගෝපදේශය (වන ශුද්ධ වූ කුරානය) පහළ කර ඇත.

මෙසේ තිබියදී, තම නිර්මාතෘට සහ ඔහුගේ මාර්ගෝපදේශයන්ට පිටින් යන මාර්ග සියල්ල "මිනිසා නොමග යන මාර්ග" ලෙස දෙවියන් විසින් පෙන්වා දී ඇත. ඒ පිළිබඳව අණතුරුද අඟවා ඇත. පහත සඳහන් දිව්‍ය වාක්‍යයන් දෙස අවධානය යොමුකර බලන්න.

*(පින් පව් දෙක පැහැදිලිව) වෙන්කර දැනුම් දෙන මෙම ධර්මය තම වහලා (වන මොහම්මද් ﷺ) කෙරෙහි පහළ කළ තැනැත්තා ඉතාමත් භාග්‍යයවන්තයෙකි. මෙය ලෝකවාසී සියල්ලන්වම බිය ගන්වා අනතුරු අඟවන්නක් බවට ඇත්තේය. (25:1)*

*මෙම ධර්මය පහළ කළ තැනැත්තා කෙබඳු අයද යත්, අහස් හා භූමියෙහි පාලනය ඔහුටම අයත්ය. ඔහු කිසිවෙකුවත් (තමන්ගේ) දරුවන් වශයෙන් ඇර ගත්තේද නැත. ඔහුගේ පාලනයෙහි ඔහුට කිසි සහායයෙකුද නැත. ඔහුම සියල්ල උත්පාදනය කර, ඒවාට අයත් ස්වභාවයද සැලැස්වූ අයයි. (25:2)*

*මිනිසුන් සියල්ලන්ම (ආරම්භයේදී එකම ධර්මයක් අනුගමනය කරන) එකම සමූහයක් වශයෙන් සිටියහ. නමුත් තමන් තුල ඇතිවූ ඊර්ෂ්‍යාවන් හේතුවෙන් විවිධ සමූහයන් වශයෙන් බෙදී ගියහ; (19:19)*

*(මෙසේ තිබියදී සමානයන් තබා නමදින්නන්) ඔහු නොවන දැය දෙවිවරුන් වශයෙන් ඇර ගන්නාහ. ඒවා කිසිවක් උත්පාදනය කළේ නැත. (එහෙත්) ඒවාද කිසිම හොඳක් හෝ නරකක් කර ගැනීමට ශක්තියක් නැති දැයයි. තවද පණ දීමට හෝ මරණයට පත් කිරීමට හෝ පණ දී නැගිට්ටවීමට හෝ ශක්තියක් නැති දැය වශයෙන්ම ඇත්තේය. (25:3) [මෙයින් පවසන්නේ පිළිම වඳින්නන්, වෙනත් භෞතික දෑ නමදින්නන් ගැනය]*

*ධර්මය හිමි අයවළුනි! ඔබ වෙත ඇත්තෙන්ම අපගේ එක් දූතයෙකු පැමිණ ඇත්තේය. ධර්මයෙහි ඔබ සඟවා ගත් බොහෝමයක් කාරණා ඔහු ඔබට පැහැදිලිව ගෙන හැර දක්වන්නේය. තවත් (ධර්මයන් ගැන ඔබ ගෙන ඇති වැරදි අදහස්) බොහෝමයක් පහ කර හරින්නේය. නියත වශයෙන්ම අල්ලාහ් ගේ සන්නිධානයෙන් ඉමහත් වූ ආලෝකයද පැහැදිලිතාවයද ඇති එක් ධර්මයක් දැන් ඔබ වෙත පැමිණ ඇත්තේය. (5:15)* [මෙය පවසන්නේ යුදෙව්වරුන්ට සහ ක්‍රිස්තියානිවරුන්ටය]

*(පෙර විසූ නබිවරුන් වන) ඔවුන්ගේ පා සටහන් වලම මරියම්ගේ පුත් ඊසාවද අපි යැව්වෙමු. ඔහු තමාට පෙර තිබූ තව්රාතය සත්‍යය කර තබන්නෙකු වශයෙන් සිටියේය. තවද ඔහුට ඉන්ජීල් නමැති ධර්මයද අපි පහළ කළෙමු. එහිද ඍජු මාර්ගයද, දීප්තිමත් ආලෝකයද ඇත්තේය. එය තම පෙර තිබූ තව්රාතය සත්‍යය කර තබන්නේය. භය භක්තිකයන්ට එය ඍජු මාර්ගය (පෙන්වන්න)ක් වශයෙන්ද හොඳ ඔවදනක් වශයෙන්ද ඇත්තේය. (5:46)* [මේ පවසන්නේ ජේසු තුමා නබිවරයෙක් බවය]

*කවුරුන් ධර්මයෙහි අල්ලාහ් පහළ කළ දැය සඟවාගෙන ඒ වෙනුවෙන් සුළු මුදලක් ලබා ගන්නෝද, ඔවුන් නියත වශයෙන්ම තම කුසෙහි ගින්දර මිස, වෙන කිසිවක් පුරවා ගන්නේ නැත. තවද විනිශ්චය දිනදී අල්ලාහ් ඔවුන් සමග කතා කරන්නේද නැත. ඔවුන්ට (සමාව දී) පරිශුද්ධ කර හරින්නේද නැත. ඔවුන්ට (ඉතාමත්) වේදනා ගෙන දෙන දඬුවම්ද ඇත. (2:174)*

*අල්ලාහ් පහළ කල (මෙම ධර්මය) අනුගමනය කරනු" යැයි ඔවුන්ට කියනු ලැබුවහොත් එයට ඔවුන්, "නොඑසේය! අපගේ මුතුන් මිත්තන් කුමක් කෙරෙහි සිටියෝ දැයි අපි දුටුවෙමුද, එයම අනුගමනය කරන්නෙමු" යැයි (මෙය ප්‍රතික්ෂේප කරන්නන්) පවසන්නාහ; (31:21)*

*ප්‍රතික්ශේප කරන්නන් අපව අත්හැර දමා අපගේ වහලුන්ව (තමන්ට) ආරක්‍ෂකයින් වශයෙන් ගතහැකි අය යැයි අදහස් කරමින් සිටින්නෙහුද? නියත වශයෙන්ම මෙම ප්‍රතික්ශේප කරන්නන්ට ආගන්තුක සත්කාර කිරීම සඳහා නිරයම අපි පිළියෙල කර ඇත්තෙමු. (පාපතර) ක්‍රියාවන්හි මොවුන්ට වඩා*

*පරාජිත වූවන්වද අපි ඔබට දැනුම් දෙන්නද? යි (නබියේ!) ඔබ විමසනු. ඔවුන් කවුරුන්ද යත්, මෙලොව ජීවිතයෙහි වැරදි මාර්ගයෙහිම උත්සාහ කරමින් තමන් ඇත්තෙන්ම හොඳ ක්‍රියාවන්ම කරන බවට සිතා ගන්නාහ. මෙවැන්නන්ම තමන්ගේ දෙවියන්ගේ ආයාවන්ද, ඔහුව හමු වන්නෙමු යන්නද ප්‍රතික්ෂේප කළ අයයි. ඔවුන්ගේ හොඳ ක්‍රියාවන් සියල්ල විනාශ වී ගියේය. (පින් පව් කිරා බැලීමට) ඔවුන් වෙනුවෙන් විනිශ්චය දිනදී තරාදිය අපි නොසිටුවන්නෙමු. (18:102-105) [මෙය පවසන්නේ මිනිසුන්ව සහ ජින්වරුන්ව තම ආරක්ෂකයින් ලෙස පත්කර ගත් අයටය]*

*සෑම ආත්මයක්ම මරණය අනිවාර්යයෙන්ම විඳින්නාහ. එහෙත් ඔබගේ (ක්‍රියාවන්ට සරිලන) ඵලවිපාක ඔබ පූර්ණ වශයෙන් අත් කර ගන්නේ විනිශ්චය දින දීය. එබැවින් (එදින) කවුරුන් (නිරා) ගින්නෙන් ඈත් කර, ස්වර්ගයන් හී ඇතුළු කරනු ලබන්නේද, ඔහු නියත වශයෙන්ම (ඉමහත්) භාග්‍යය අත් කර ගත්තේය. මෙලොව ජීවිතය වශී කල හැකි (අල්ප) සුවයම මිස වෙන කිසිවක් නැත. (3:185)*

*විශ්වාසවන්තයිනි! ඔබ අල්ලාහ්වද, ඔහුගේ දූතයාවද, ඔහු තමන්ගේ මෙම දූතයා වෙත පහළ කළ ධර්මයද, මෙයට පෙර තිබූ ධර්මයන්ද විශ්වාස කරනු. කවුරුන් අල්ලාහ්වද, ඔහුගේ මලායිකාවරුන්වද, ඔහුගේ ධර්මයන්ද, ඔහුගේ දූතයන්වද, අවසාන දිනයද ප්‍රතික්ශේප කරන්නේද, ඔහු නියත වශයෙන්ම ඉතාමත් ඈත් වූ දුර්මාර්ගයෙහිම ගමන් කරන්නේය (4:136)*

පහතින් දැක්වෙන සූරාව ඉස්ලාමයේ සාරාංශය ලෙස පෙන්වා දිය හැක.

*කාලය මත සත්තකින්ම, මිනිසා තම ආයුෂ කාලය නිකරුනේ වියදම් කර නියත වශයෙන්ම පරාජික මාර්ගයේ සිටින්නේය. එහෙත් කවුරුන්, විශ්වාසය තබා දැහැමි කාරනාවන්ද කර සත්‍යය කෙනෙකුට කෙනෙකු ඔවදන් දී (පාපයන් අතැහැර දැමීමෙහිද පින් ඇති දැය කිරීමෙහිද ඇති වන අමාරුකම විද දරා ගන්නා ලෙසටද, කෙනෙකුට කෙනෙක් ඔවදන් දෙමින් සිටින්නෝද) ඔවුන් හැර. (මොවුන් පරාජිත වූවේ නැත). (103:1-3)*

---

# යුදෙව්- ක්‍රිස්තියානි- ඉස්ලාම් යනු එකම ආගමේ අදියර තුනකි.

මෙම ආගම් තුනේම සිටින්නන්ගේ එකම විශ්වාසය සහිත ඉතිහාස කතාව මෙයයි.

එනම්, සර්වබලධාරී දෙවියන්වහන්සේ විශ්වය මවා පෘථිවිය තුල මිනිසාට ජීවත් විය හැකි වටපිටාව ඇති කල පසු එහි මනුෂ්‍ය සංහතිය ව්‍යාප්ත කිරීමට, පළමුවෙන්ම මුල්ම මිනිසා වන ආදම් (අස)ව සහ ඔහුගෙන් ඔහුට බිරිඳක් ලෙස හව්වා (අස)ව ස්වර්ග උයනකදී නිර්මාණය කර යම් කලකට පසු ඔවුන් දෙදෙනාව පෘතුවියට එවන ලදී. ඉන් පසු ඔවුන් දෙදෙනාගෙන් දරුවන් ලෙස මනුෂ්‍ය සංහතිය ටිකෙන් ටික ව්‍යාප්ත වන්නට විය. (මේ අනුව මෙම ආගම් වල කිසිවෙක් මිනිසා වඳුරන්ගෙන් පැවත එන්නන් ලෙස ප්‍රචලිතව ඇති කථාව පිලිගන්නේ නැත).

එනම් ඔවුන් සියල්ලගේම විශ්වාසය තමයි පළමු මිනිසාගෙ සිට අද සිටින මිනිසා දක්වා සිටි සියල්ල මිනිසුන් ලෙසම සිටි බව. නමුත් ඔවුන්ගේ ශරීර ප්‍රමාණය, පරමායුෂ කාලය, දෙවියන් විසින් ඔවුන්ට ලබා දුන් පහසුකම්, නීති රීති ආදිය කලින් කලට වෙනස් වූ බව ඔවුන් පිලිගනී.

දෙවියන්වහන්සේ විශ්වය තුල නිර්මාණය කල සෑම අංශුවක්ම එය කුමන ස්වරූපවලින් සිටියා හෝ පැවතුනා වුවද ඒවා දෙවියන්ගේ අණට අවනතව යටහත්ව සහ කීකරුව සිටිමින් දෙවියන්ව ප්‍රසංශා කරමින් (නමදිමින්) සිටින බව දෙවියන් විසින් මිනිසාට දැනුවත් කර තිබේ.

දෙවියන් මිනිසාව විශේෂිත බවකින් යුතුව නිර්මාණය කල බවත් ඔහුත් අන් වස්තූන් මෙන්ම දෙවියන්ව ප්‍රසංශා කරමින්, නැමදීම කරමින් සිටිය යුතු බවත්, එය එසේ කරන්නේ කෙසේද යන්නත් "මිනිසාට නියම කල දහම" ලෙස ඉස්ලාම් හෙවත් සොහා දහමේ දහම හඳුන්වා දී තිබේ. පළමු මිනිසාගේ සිට අවසන් මිනිසා දක්වා දෙවියන් මිනිසාට ඉදිරිපත් කළේද එම එකම දහම බව අපට දිව්‍ය හෙළිදරව් තුලින් දැනගත හැක.

දිව්‍ය හෙළිදරව්වන් හෙවත් දෙවියන් ගේ පණිවිඩ, දෙවියන් ඔහුගේ ශ්‍රේෂ්ඨ මලායිකාවරයෙක් වන ජිබ්රීල් (අ.ස) හරහා නබිවරුන් ලෙස හඳුන්වනු ලබන (මිනිසුන් අතරින්ම තෝරාගත්) යහපත් මිනිසුන් වෙත ලබා දී ඔවුන් හරහා ඔවුන්ගේ සමාජ වල සිටි අනිකුත් මිනිසුන්ට දැනගන්නට සැලැස්වීය.

අදට සාපේක්ෂව අතීතයේ ලොව තුල තිබුනේ දුර්වල සන්නිවේදන ක්‍රමෝපායන්ය. එම නිසා ඒ ඒ කාලවල සිටි සෑම ජන සමාජයකටම ඔවුන්ට ගැලපෙන අයුරින් වෙන් වෙන් වශයෙන් නබිවරු විශාල සංඛයාවක් එවූ බව දේව පණිවිඩ තුලින්ම අපට දැනගන්නට තිබේ. සමහර ප්‍රදේශ වලට ළඟින් ළඟින් එක්කෙනෙකුට පසු තව කෙනෙක් ලෙස නබිවරු පැමිණ ඇත. සමහර කාල වල සමහර පලාත්වලට පලමු නබිවරයාට පසු දෙවනි නබිවරයා පැමිනීමට ගතවූ කාලය අධික විය. සමහර පලාත්වලට එකවර නබිවරු දෙදෙනා බැගින් එවා ඇත. එය දෙවියන්ගේ කැමත්ත පරිදි සිදුවන්නට ඇත. මනුෂ්‍ය සමාජ වෙත නබිවරු ලක්ශයකට වඩා එවා ඇති බව අවසන් නබිවරයාගේ වදන් වලින් අපට දැනගන්නට ලැබී ඇත.

කෙසේ නමුත්, ඉතිහාසය තුල නබිවරුන් කිහිපදෙනෙකුගේ පැමිණීම් සම්බන්ධව නබිවරුන්ගේ පෙලපතක තොරතුරු අපට හමුවී ඇත.

දැන් අපි බලමු ඉහත ආගම් තුනම එකම ආගමේ අවස්ථාවන් තුනක් වන්නෙ කෙසේද යන්න.

දිව්‍ය හෙළිදරව්වන් තුල සඳහන්ව තිබෙනවා සෑම ජන සමාජයකටම නබිවරයන් එවූ බව.

එක් ප්‍රදේශයකට අලුතින් නබිවරයෙක් එනතුරු එම ප්‍රදේශයේ ජනතාව අනුගමනය කල යුත්තේ ඊට පෙර පැමිණි නබිවරයා ගෙනා නීති-රීතිය.

යම් ප්‍රදේශයකට නබිවරයෙක් පැමිණුනා නම් එම ප්‍රදේශයේ ජනතාව අනුගමනය කල යුත්තේ එම නව නබිවරයා ගෙනා නීති-රීතිය. එම ප්‍රදේශයට එම නබිවරයා ගෙනා නීති රීති වලංගු වන්නේ තවත් නව නබිවරයෙකු

පැමිණෙන තෙක් පමණිය. ජනතාව පැරණි නබිවරයා අනුගමනය කිරීම නවතා නව නබිවරයාව අනුගමනය කිරීම ආරම්භ කල යුතුය.

මෙම කාරනාව යුදෙව්වරුන්, ක්‍රිස්තියානිවරුන් සහ මුස්ලිම්වරුන් යන සියල්ල පිලිගන්නා දෙයකි. පිලිගත් නමුත්, යුදෙව්වන් සහ ක්‍රිස්තියානිවරුන් එය අනුගමනය කරන්නේ නැත. මුස්ලිම්වරුන් එය අනුගමනය කරයි.

එකම දෙවියන්ව විශ්වාස කරන සහ තම කාලය තුල තම ප්‍රදේශයට බලපවත්නා නබිවරයාව අනුගමනය කරන සියලුම දෙනා මුස්ලිම්ය. මුස්ලිම් යන්නෙහි අර්ථය දෙවියන්ට අවනතව සිටින්නාය. දෙවියන්ට අවනත නම් ඔවුන් දෙවියන් විසින් එවන ලද උපදෙස් සහ නබිවරුන්ව නිසි පරිදි අනුගමනය කල යුතුය.

යුදෙව්වන් හෙවත් යහූදීවරුන් යනු යාකූබ් (අ.ස) නබිවරයාගේ කාලයේ සිට පැවත එන මුස්ලිම් ගෝත්‍රයකට කියන ලද නමකි. මෝසෙස් හෙවත් මූසා (අ.ස) නබිතුමාගේ කාලයේත් යුදෙව්වන් සිටියේය. වර්තමානයේ යුදෙව්වන් ලෙස හඳුන්වන්නේ මෝසෙස් (මූසා) නබිතුමාට ලැබුනු දිව්‍ය පණිවිඩය සම්බන්ධ කරගෙන ඉන් පසු පැමිනි නබිවරුන්ව පිලි නොගන්නා ජන කොටසටය.

ජේසු තුමාගේ කාලයේ ජනතාව ජේසු තුමා (නබි ඊසා අ.ස.)ව නිසි පරිදි අනුගමනය කලා නම් ඔවුනුත් ක්‍රිස්තියානි ලෙස හඳුන්වන මුස්ලිම් ගෝත්‍රයක් යැයි කීමෙහි ගැටලුවක් නැහැ. නමුත් ක්‍රිස්තියානි කියන නම පවා යේසුස් වහන්සේට පසු කාලයක මිනිසුන් විසින් සාදාගත් නමකි. යේසුස් වහන්සේ ක්‍රිස්තියානිවරයෙකු ලෙස සිටියේ වත් එම නම දැනගෙන සිටියේවත් නැත.

අද යහූදිවරුන් වෙනම ආගමික කොටසක් ලෙසත් ක්‍රිස්තියානිවරුන් තවත් වෙනත් ආගමික කොටසක් ලෙසත් දකින්න තිබෙන්නේ ඇයි දැයි කියා බලමු.

දෙවියන් මිනිසාව අනිකුත් නිර්මාණ වලට වඩා සුවිශේෂත්වයක් ඇතිව නිර්මාණය කල බව මීට පෙර සඳහන් කලා. එනම්, ස්වයං තීරන ගෙන කටයුතු කිරීමේ හැකියාව මිනිසාට ලබා දී ඇත. එය අපි සතුන් තුලින් දකින ඔවුන් දක්වන සුළු සුළු ක්‍රියාවන් මෙන් නොව, මිනිසා තම විචාර බුද්ධියද භාවිතා කරමින් සතුන්ට වසා උසස් අන්දමින් ස්වයං තීරන ගැනීමය. උදාහරනයකින් කියනවා

නම්, සතුන්ට මෙය හොඳයි මෙය හොඳ නෑ ලෙසින් හිතමින් තම ඇතැම් කරුණු ගැන තීරන ගැනීමේ හැකියාවක් නැත. සතුන් යම් කිසි රාමුවක කොටු කර ඇත. නමුත් මිනිසා එසේ කොටු කර නැත. ඔහුට විශාල පරාසයක් තුල සිතමින් ස්වයං තීරන ගෙන කටයුතු කල හැක.

කොටින්ම, දෙවියන් මිනිසාට පෙන්වා දුන් ජීවන මාර්ගෝපදේශ සම්බන්ධවද, ඇතැම් නීති-රීති සම්බන්ධවද තම සිතැඟියාවන් මත ස්වයං තීරන ගෙන කටයුතු කල හැක. එනම් මිනිසාට දෙවියන්ගේ උපදෙස්වලට අනුව යමින් හොඳ විදිහට තම ජීවිතය ගෙවනවාද, නැත්නම් තමන්ට හිතෙන විදිහට හොඳ හෝ නරක කරමින් ජීවිතය ගෙවනවාද යන්න තීරනය කිරීමට මිනිසාට අවසර දී ඇත. මිනිසාට දෙවියන්ව විශ්වාස කරමින් හෝ විශ්වාස නොකරමින් සිටීමට පවා නිදහස ලැබී ඇත.

මේ නිදහස භාවිතා කරමින් සමහර මිනිසුන් දෙවියන්ගේ උපදෙස් වලින් බැහරව තම කටයුතු කරයි. එහිදී තම ආගම-දහමත් තමන්ට හරිය කියල හිතෙන විදිහට හෝ තමන්ට වාසි සහගතය ලෙසට කටයුතු කිරීමට සමහරු පෙළඹෙයි.

මේ නිසා සමහරු දෙවියන්ගේ මාර්ගෝපදේශයන් තම වාසියට ගැලපෙන ලෙස විකෘති කරයි . තම අදහස් දේව වාක්‍යය අතරට එක් කරයි. සමහර දේව වාක්‍යය සඟවයි. සමහර දේව වාක්‍යය ඇද-කුද කරයි. එසේ කරගෙන තමන්ට ගැලපෙන නීති රාමුවක්, බල ප්‍රදේශයක්, රාජධානියක් ගොඩ නගා ගනී. ඇදහිල්ල තමන්ට රිසි පරිදි සකසා ගනී. ජනතාවවත් ඒ දෙසට තල්ලු කරයි.

එවිට දෙවියන්ගේ නිවැරදි සහ නව මාර්ගෝපදේශයක් රැගෙන නබිවරයෙක් පැමිනි විට ඔහුට විරුද්ධව කැරලි ගසයි . ඔහුව පිටුවහල් කිරීමට වෙර දරයි. එසේත් නැතිනම් ඔහුව ඝාතනය කරයි. මෙවන් සිදුවීම් ඉතිහාසය පුරාම සිදුවී ඇත.

යුදෙව් ගෝත්‍රයේ සිටි මුස්ලිම්වරුන් ගෙන් යම් පිරිසක් දෙවියන්ගේ මාර්ගයට පිටින් යමින් ඔවුන් ඔවුන්ට රිසි පරිදි ඇදහිල්ල සහ නීති-රීති සකසා ගත්හ. ඔවුන්ව දිගටම අනුගමනය කරන පිරිසක් අදත් ලොව තුල සිටී. ඔවුන් දැන් තම ආගම "යුදෙව් ආගම/ Judaism) ලෙස නම් කරගෙන සිටී.

යුදෙව් ගෝත්‍රයේ සිටි තවත් මුස්ලිම් ජනතාවක් කාලයත් සමග ඉදිරියට ඇවිත් යේසුස් වහන්සේ (ඊසා අ.ස) තම කාලයේ නබිවරයා ලෙස පිළිගෙන සිටියේය. ඔවුන් නිවැරදි ක්‍රිස්තියානුවන් ලෙස හෝ මුස්ලිම්වරුන් ලෙසටම හඳුන්වා දිය හැක.

නමුත් යේසුස් වහන්සේ (ඊසා අ.ස) නබිවරයෙක් ලෙස පැමිණි අවස්ථාවේ දෙවියන්ගේ නියම මාර්ගයෙන් පිටව ගොස් සිටි අය එතුමාව නබිවරයෙක් ලෙස පිළිගත්තේ නැත. ඔහුට වද දී කුරුසිපත් කිරීමටද ඔවුන් පියවර ගැනීය.

යේසුස් වහන්සේ (ඊසා අ.ස)ද යුදෙව් පරම්පරාවෙන් බිහිවූ මුස්ලිම් නබිවරයෙකි.

යේසුස් වහන්සේ ගෙන් පසු ඊලග නබිවරයා පැමිනෙන තෙක් එතුමාව නබිවරයෙකු ලෙස අනුගමනය කල අය ද මුස්ලිම්වරුන් ලෙසම හඳුන්වා දිය හැක.

නමුත් යේසුස් වහන්සේ (ඊසා අ.ස) නබිවරයෙක් නොව, ඔහු දෙවියන් හෝ දෙවියන්ගේ පුතා ලෙස පිළිගනිමින් අදහන අය නියම දහමෙන් පිටව ගිය අය ලෙස සැලකිය හැක. අදත් ඔවුන් මුස්ලිම් නොවන ක්‍රිස්තියානුවන් ලෙසම සලකන්නට හේතුව ඔවුන් යේසුස් වහන්සේ (ඊසා අ.ස)ට පසු පැමිනි අවසන් නබිවරයාව සහ ඔහු ඉදිරිපත් කල දිව්‍ය හෙළිදරව්ව වන ශුද්ධ වූ අල් කුරාණය පිළිනොගන්නා නිසාය.

අවසන් නබිවරයා පැමිණියේ අරාබිකරයෙනි. නමුත් ඔහු පැමිණියේ අරාබිකරයට පමනක් නොව, මුළු ලොවටමය. ඔහු ගෙනා පණිවිඩය අද ලොව පුරා ඇති සෑම smart ජංගම දුරකතනයකින්ම පවා බාගත කරගෙන හෝ Online තුලින් බලා ගත හැක. ඔහු අවසන් නබිවරයාය.

දෙවියන්ගේ නියමයට අනුව තම කාලය තුල නබිවරයෙක් පැමිණියා නම් මීට පෙර අනුගමනය කල නබිවරයා වෙනුවට නව නබිවරයාව අනුගමනය කල යුතුව ඇත. එනම්, අද මුලු ලෝක වාසීන්ටම පැමිණි නව නබිවරයා මොහම්මද් (ﷺ) තුමාය.

මේ සරල කාරණාව තේරුම් නොගෙන හෝ තේරුනත් තේරුනේ නෑ වගේ සිටින්නේ තම බල තන්හාව, ඊර්ෂ්‍යාව, මාන්නය සහ තමාට තමා අවංක නොවීමය. මෙතුමා පැමිණියේ නබි මූසා (අ.ස) සහ ජේසු තුමා (ඊසා අ.ස) පැමිණි යුදෙව් පරම්පරාවෙන් නොවීමද ආගම් බෙදීමට ප්‍රභල හේතුවක් ද විය.

කෙසේ නමුත්, අද ලොව තුල බහුතර ජනතාවක් ජේසු තුමා (යේසුස් වහන්සේ) ප්‍රමුඛ කරගෙන තමන්ට ගැලපෙන අයුරින් දිව්‍ය වාක්‍යයන් වෙනස් කර ගොඩ නගාගෙන සිටින ක්‍රිස්තියානි සංස්කෘතිය ඉවතලන්න සිදුවෙයි කියන බය නිසා ඔවුන් සත්‍යය භාර නොගෙන සිටිනු දැකිය හැක. එපමනක්ද නොව, සත්‍යය විනාශම කිරීමට ද ඔවුන් වෙර දරනු දැකිය හැක. නමුත් දෙවියන් මෙය නිරීක්ෂණය කරමින් ඔවුන්ට නිසි දඬුවම් ද දෙමින් සිටී. දෙවියන්ගේ දඬුවම් අපි නොසිතන අයුරින් එමින් ඇත. එම දඬුවම් නොමග ගියවුන්ව නිසි මගට තල්ලු කිරීමට එවන සළකුණු වෙන්න බැරි නැත. පහතින් සඳහන් සොභාවික විපත් පිටුපස ඇති රහස යන මැයෙන් ලියා ඇති ලිපිය එය මනාව සහතික කරයි.

මුස්ලිම්වරුන් දෙවියන්වහන්සේ වෙතින් පහළ කළ අවසන් හෙළිදරව්ව වන ශුද්ධ වූ අල් කුරාණය අතැතිව යුදෙව්වන්ට සහ ක්‍රිස්තියානිවරුන්ට ආරාධනා කරන්නේ තම එකම දෙවියන්වහන්සේව නිසි අයුරින් හඳුනාගෙන, එම සර්වබලධාරි දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය නිසි අයුරින්ම පිළිගෙන, ඔහුට නොගැලපෙන තත්ව ආදේශ නොකර, දෙවියන්ගේම උපදෙස් වලට අනුව එක්ව ඔහුට නැමදීමටය.

පුස්තක හිමි (යුදෙව්වරුන්, ක්‍රිස්තියානිවරුන්, මුස්ලිම්වරුන්) අප සියල්ලගේම ශ්‍රේෂ්ඨ මුතුන් මිත්තෙකු වූ ඉබ්රාහීම් (අ.ස)ද එකම දෙවියන් නැමදූ මුස්ලිම්වරයෙකු බව ඔබද දන්නෙහිය. එසේ නම් ඔහුගේ මුණුපුරන් වන ඔබලා අද අලුතින් (යුදෙව්, ක්‍රිස්තියානි) ආගම් ඇතිකරගෙන වෙනත් ඈද කුද මාර්ගවල යන්නේ ඇයි දැයි මුස්ලිම්වරුන් ඔබෙන් ප්‍රශ්න කරයි.

# ඉබ්රාහිම් නබි තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව.

*"මම නුඹ මහත් ජාතියක් කරන්නෙමි; නුඹට ආශීර්වාද කොට නුඹේ නාමය කීර්තිමත් කරන්නෙමි; නුඹද ආශිර්වාදයක් වෙයන්න; තවද නුඹට ආශිර්වාද කරන්නන්ට මම ආශිර්වාද කරන්නෙමි; නුඹට සාප කරන්නාට මම ශාප කරන්නෙමි; පොළවේ සියලු පවුල් නුඹ කරණ කොටගෙන ආශිර්වාද ලබන්නෝ යයි කී සේක". (උත්පත්ති 12:2-3).*

ඉහතින් දක්වන ලද්දේ බයිබලයෙහි සඳහන් ආබ්‍රහම්(ඉබ්‍රාහිම්) නබි තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුය. ආබ්‍රහම් තුමාගේ පියා තේරාය. තේරා ජීවත්වනු ලැබුවේ ඌර් හි(වර්තමානයේ ඉරාකයේ) තෙරාප්‍රාත් ගංගාවෙන් එතෙර හාරාන් නම් ප්‍රදේශයෙය්ය. තේරාගේ රැකියාව වූයේ පිළිම නෙළීමය. ආබ්‍රහම් හාරාන්හි ජීවත් වන විට සර්වබලධාරී දෙවිදාණන් ආබ්‍රහම්ට කතා කොට දෙවියන් වහන්සේ විසින් පෙන්වන ලද දේශයට යන ලෙස අණ කරන ලදී. උත්පත්ති දොළොස් වන පරිච්ඡේදයෙහි පළමුවන පදයෙහි සඳහන් වන්නේ "ස්වාමීන් වහන්සේ ආබ්‍රහම්ට කතා කොට නුඹේ දේශයෙන්ද; නුඹේ නෑයන් කෙරෙන්ද නුඹේ පියාගේ ගෙදරින්ද පිටත්ව මා විසින් පෙන්වන දේශයට පලා යන්න" යනුවෙනි. සර්වබලධාරි දෙවිදාණන් ගේ අණට කීකරු වූ ආබ්‍රහම් සිය ජීවත්වන ප්‍රදේශයේ වූ හාරාන් ප්‍රදේශයෙන් පිටත්ව කානාන් දේශය (Land of Canaan / වර්තමානයේ පලස්තීනය)ටපැමිණියෝය. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට කථාකොට මේ දේශය නුබට උරුමයක් කොට දෙන්නෙමි" ;"යයි වදාළසේක .

සර්වබලධාරි දෙවිදාණන් ගේ අණට කීකරු වූ ආබ්‍රහම් (නබි සල්ලල්ලාහු) තුමාණන් ට දෙවියන් වහන්සේගේ පොරොන්දු ඉටු වන ආකාරය විශ්මය ජනකය. හාරාන්හි දී ආබ්‍රහම් සමග ජීවත්වූ ආබ්‍රහම්ගේ භාර්යාව වූ සාරාත් දමා ගිය සහෝදරයාගේ පුත්‍රවූ ලොත්(ලූත් අලෙෙ) හා තමන්ගේ සේවකයන් තමන්ගේ සම්පත් මේ සියල්ල රැගෙන කානාන් දේශයට පැමිණියේය. ආබ්‍රහම් (සල්) තුමාණන් එහි වාසය කරන විට සර්වබලධාරි දෙවිදාණන් ඔහුට දරුවෙක්

දීමට පොරොන්දු විය. එවිට ආබ්‍රහම්ගේ වයස අවුරුදු 99 ක් විය. සරාගේ වයස අවුරුදු 90 කි. කෙසේ වෙතත් ආබ්‍රහම්ට දාව සරා තුලින් දරුවෙකු දෙන බවට දෙවියන් වහන්සේ පොරොන්දු විය. ඒ අනුව සරා තුලින් ඉශ්හාක් (අලෛහිතුමා) උපත ලබන්නේය.

මෙයට ප්‍රථම සරාගේ දාසිය වූ හාජරා (හාගර්) කරණ කොටගෙන ආබ්‍රහම් හට ඉස්මායිල් බිහිවිය. සරාට ඊසාක් ලැබුණු පසු සරා අතරත් හාජරා අතරත් යම් යම් ගැටුම් ඇතිවිය. ගැටුම් නිසා ආබ්‍රහම් සිත් වේදනාවට පත් විය. එවිට හාගර් සහ ඉස්මායිල් සරාගෙන් වෙන් කරන ලෙස දෙවියන් වහන්සේ අණ කරන ලදී. ඒ අනුව ඉබ්‍රහම් විසින් හාගර්(හාජරා) සහ ඉස්මායිල් දෙදෙනාම වෙන් කරන ලදී.

හාගර් සහ ඉස්මායීල් යන දෙදෙනා කානාන් දේශයෙන් වෙන්ව ෂූර් යන ප්‍රදේශයෙහි වාසය කළේය. (වර්තමානයෙහි කාබතුල්ලාහ් පිහිටා තිබෙන මක්කා නම් ස්ථානය).

ආබ්‍රහම් නිසා උපන් දරුවන් දෙදෙනාටම දෙවියන් වහන්සේ ආශීර්වාද කළ සේක. ඔවුන්ගෙන් රාජකීය පරම්පරාවක් බිහිවිය. ගෝත්‍ර-ගෝත්‍ර වශයෙන් දෙදෙනාගේම පරම්පරාවන් වර්ධනය විය. ආබ්‍රහම්ට දුන්නා වූ පොරොන්දුව අනුව විශාල ජනතාවත් ආබ්‍රහම් තුළින් බිහිවිය.

ශුද්ධවූ බයිබලයටත් ශුද්ධ වූ අල්කුරාණයටත් ආබ්‍රහම් නබිතුමාගේ සම්බන්ධතාවයක් ගොඩනැගෙන්නේ දරුවන් දෙදෙනා නිසාය. ඉශ්හාක් අලෛහිතුමා මූලික කරගෙන යුදෙව් හා කිතුනු සමාජ වර්ධනය වන අතර ඉස්මායිල් නබිතුමා කරණ කොටගෙන මුස්ලිම් සමාජය වර්ධනය විය. මුල් කාලීනව දෙපාර්ශවය අතරම සාමය සහජීවනය පැවති අතර වර්තමානයෙහි දෙපාර්ශ්වය අතර යම් යම් මතභේද පැන නැගී තිබේ. මෙයට හේතුව සාරා තුමිය නැකම් කියන්නේ යුදෙව් පරම්පරාවට වීමත් හාජරාතුමිය නැකම් කියන්නේ අරාබි ජාතික පරම්පරාවන්ට වීමත්ය. ආබ්‍රහම් හේබ්‍රෙව් ජාතිකයෙකි.

විශ්වය මවා පාලනය කරන සර්ව බලධාරී දෙව්දාණන් විසින් ආශිර්වාද කරනු ලැබූ දරුවන් දෙදෙනා අතර කිසිවිටෙක ඉතිහාසය පුරා ගැටුමක් ඇතිවී නොමැත. ආබ්‍රහම් මියගිය අවස්ථාවේ අවසාන කටයුතු කරන්නේද ඉෂ්මායෙල් සහ

ඉශ්හාක් යන දෙදෙනාම එක්ව ය. මුල් කාලීනව දෙපාර්ශවය අතරම දෙවියන් වහන්සේගේ කරුණාව සහ අනුග්‍රහය සමසේ භුක්ති විඳිමින් සාමය සහ සමාදානය ගොඩනැගී තිබිණි.

යුදෙව්වන් අතරත් මුස්ලිම්වරුන් අතරත් ආබ්‍රහම්ගේ නාමය කියාමත් දවස දක්වාම ප්‍රකාශ වන්නේම ය. මුස්ලිම්වරුන්, යුදෙව්වරුන් සහ කිතුණුවන් එකම පියෙකුගෙන් පැවත එන දරුවන්ය.

සර්ව බලධාරි දෙවිඳාණන් ආබ්‍රහම් නබිතුමාට දුන්නා වූ ආශිර්වාද දරුවන් දෙදෙනාටම අයිතිය. යුදෙව්වන් සිය බුද්ධිය මෙහෙයවමින් ලෝකය පුරා මුස්ලිම් ප්‍රජාවට එම අයිතිවාසිකම් අහිමි කර තනි අයිතියක් බවට පත්කර ගැනීමට නොයෙකුත් උපක්‍රම යොදා තිබේ. ඇත්ත වශයෙන්ම බුද්ධිමත්ව ආගමික දැනුමක් ඇතුව කල්පනාකර බලනවිට කිතුනු සහ මුස්ලිම් වරුන්ගේ බෙදීම ආරම්භ වන්නේ දේව ප්‍රතිපත්තිය මෙන්ම භෞතික කාරණා කෙරෙහි ඇත්තා වූ බල තන්හාව නිසාය. කිසිවෙක් ආගමානුකූලව සමාජ විකාශනය දෙස බලන බවක් පෙනෙන්නට නැත.

සැබවින්ම මුස්ලිම්වරුන් ලෙස කළ යුතු වන්නේ සත්‍ය තේරුම්ගෙන බුද්ධියට ඉඩ දීමයි. අප විසින් වර්ධනය කරගත යුතු වන්නේ බුද්ධිමය පැත්තයි. ආගමක පැවැත්ම තහවුරු වන්නේ බුද්ධිය අනුව වැඩ කටයුතු කිරීම තුළිනි. මක්නිසාද පොළවේ පසුකාලීන සියලු මනුෂ්‍යයන් ආශිර්වාද ලබන්නේ ආබ්‍රහම් නබිතුමාණන් කරණ කොට ගෙනය. එය කිසිම ආගමික සමාජයක තනි අයිතියක් නොවේ. සමස්ත මානව වර්ගයාටම ලැබෙන්නාවූ අයිතියකි.

වර්තමානයෙහි මුස්ලිම්වරුන් ලෙස අප ඇත්තා වූ දැනුම බොහෝවිට රැඳී පවතින්නේ ආගමානුකූල දැනුමක් මත පමණි. අප විසින් මතක තබා ගත යුතු වන්නේ ලොව පවත්නා සියලු විෂයයන් ඒකරාශී වෙමින් අවසාන ආගම වන ඉස්ලාම් ධර්මය ලොවට පහළ වී ඇති බවයි. අප විසින් සොයා ගත යුතු වන්නේ එම විෂයයන් කෙරෙහි දැනුම යි. බොහෝවිට ආගම යනු භක්තියට පමණක් මුල් තැන දෙන්නක් ලෙස සියලු ආගමික ඉගැන්වීමයි. නමුත් ආගමක් යනු හැමවිටම බුද්ධියට මුල්තැන දී කටයුතු කළයුතු මග පෙන්වීමක් බව තේරුම් ගත යුතුය.

බුද්ධියෙන් තොර භක්තිය පමණක් මුල් කොටගත් ආගමකින් කිසිදු මිනිසෙකුට ප්‍රයෝජනයක් නැත. නූතන ආගමික සමාජයන් තුළ අපට දක්නට ලැබෙන්නේ එම ස්වභාවයයි. එමනිසා බුද්ධියට ඉඩ දෙන්න ඒ තුළින් භක්තිය ගොඩනගාගන්න. එවිට අල්ලාගේ ශාන්තිය සමාදානය විශ්වය තුළ පැතිරෙනු ඇත. (IBS)

---

# පිළිම වන්දනාව අනුමතද?

දෙවියන්වහන්සේගේ රුවට සමාන රූපයක් ඇඳීම හෝ පිළිමයක් නෙළීම කිසිවෙකුටත් සිදු කල නොහැක. එසේ තිබියදී දෙවියන්වහන්සේට සමාන නොවන වෙනත් රූප ඔහු වෙනුවෙන් නිර්මාණය කර ඒවාට නැමදීම කිසි විටෙකත් සදාචාරාත්මක නොවේ. දෙවියන් මිනිසුන්ව සහ ජින් වරුන්ව නිර්මාණය කළේ ඔහුට පමණක් නැමදීමට බව කුරානය තුලින් පවසයි. ඔහුට පමණක් නැමදීමට පවා ඔහුට සම නොවන රූප හෝ පිළිම සැකසීම අනුමත කර නැත. එවන් තත්වයක් යටතේ ඔහු නොවන අයට හෝ ඔහු නොවන දේවලට වැඳීම කෙසේ නම් පිළිගත හැකිද?

දෙවියන්ගේ පමණක් නොව, නබිවරුන්ගේ, බුදුවරුන්ගේ, දෙමාපියන්ගේ හෝ සතුන්ගේ හෝ කිසිම රූපයක් හෝ පිළිමයක් මගින් ඒවායේ සැබෑ ස්වභාවය ඇති කල නොහැක. එම නිර්මාණ පණ නැති ඒවා ලෙසම පවතින දේවල්ය.

මැටි වලින් සාදන පිළිම වලට අප කියනා දේ ඇසෙන්නේ නැත. ඒවාට අපව පෙනෙන්නේ නැත. කොටින්ම ඒවා මැටිය. එසේත් නැත්නම් ගල්, වැලි දැව, යකඩ හෝ සිමෙන්තිය. ඒවා ජීවමාන නැත. දෙවියන්ගේද, නබිවරුන්ගේද, බුදුවරුන්ගේද ගෞරවය ආරක්ෂා කිරීමට ඔවුන්ගේ පිළිම නිර්මාණය නොකල යුතුය. කලාකරුවන් විසින් නිර්මාණ කරන විටද අතිශෝක්තිය එකතු වීමද තවත් ගැටළුවකි. කලාව සහ සත්‍ය අතර මිනිසා පැටලීම එහි ඇති අවාසනාවන්ත තත්වයයි.

කලාකරුවන්ගේ රූප සහ පිළිම ඉදිරිපත් කිරීම නිසා ඔබ දෙවියන් යැයි සිතා වඳින්නේ සැබෑ දෙවියන්ට නොව. බුදුන් වහන්සේ යැයි සිතා නමදින්නේ සැබෑ බුදුන්වහන්සේට හෝ අඩු තරමින් සැබෑ බුදුන්වහන්සේට සමාන රූපයකටද නොව. ඔබ කිසි දිනක දැක නැති සහ මෙතෙක් කිසිවෙකුත් විසින් හඳුනා නොගෙන සිටින, එහෙත් කලාකරුවෙකු විසින් චිත්‍රණය කරන ලද හෝ මැටි වලින් අඹන ලද අවිනිශ්චිත රූපයක් ඔබේ සැබෑ මවගේ රූපය ලෙස ගැනීමට ඔබ කැමතිද? අප රූප හෝ පිළිම ලෙස දකින බුදුන්වහන්සේගේ හෝ, යේසුස් වහන්සේගේ හෝ මරියා තුමියගේ හෝ රූප ඔවුන්ගේ සැබෑ රූප නොවෙයි නේද?

ඉස්ලාම් දහමට අනුව දෙවිඳුන් විසින්ම තමා වෙනුවෙන් පිළිම නොසාදන ලෙස දන්වා ඇත. නබිවරුන්ද තමන් වෙනුවෙන් සහ දෙවියන් වෙනුවෙන් පිළිම නොසාදන ලෙස දන්වා ඇත.

මුස්ලිම්වරුන් තම දෙවියන්ට සහ නබිවරුන්ට තම පනටත් වඩා ආදරයද ගෞරවයද පුද කරමින් දහම තුල සිටී. ඔවුන් පිළිම හරහා ඔවුන්ට ළං වෙනවාට වඩා උසස් අන්දමින් තම මනසින් ඔවුන්ට ළං වේ. ඔවුන්ගේ දෙවියන්ගේ සහ නබිවරුන්ගේ යැයි මනඃක්කල්පිත කර සැදූ පිළිමයක් හෝ රූපයක් දුටුවොත් ඔවුන් ඒ ගැන කණගාටු වෙයි. ඔවුන් කැමති නැහැ තමන්ගේ දෙවියන්ට හෝ නබිවරුන්ට රූප හෝ පිළිම හරහා අපහාස සිදුවෙනවාට. එනිසා ඔවුන් රූප සහ පිළිම සම්පූර්නයෙන්ම ප්‍රතික්ෂේප කරයි.

ක්‍රිස්තියානි ආගම තුල ඇති බයිබලයේද තම දෙවියන් වෙනුවෙන් රූප සහ පිළිම සෑදීම තහනම් කර ඇත. නමුත් එම දහම අදහන වැඩි දෙනෙක් තම ධර්ම මූලාශ්‍රය තුල ඇති දෙයම නොසලකා රූප සහ පිළිම සාදා ඒවාට නැමදුම් කරති. බයිබලයේ මේ ගැන සඳහන් වැකි ‘‘අවධානය යොමු කළ යුතු බයිබල් වැකි‘‘ යන ලිපියෙහි සඳහන් කර ඇත.

යුදෙව් ආගම තුලද ඕනෑම ආකාරයක රූප හෝ පිළිම වන්දනා කිරීම තහනම් කරයි. මොසෙස් නබි තුමාගේ කාලයේ රන් වස්සෙකුව නැමදීමෙන් ඔවුන්

කරගත් පාපයට පසු ඔවුන් කිසිඳු ආකාරයකින් රූප සහ පිළිම සාදමින් ඒවාට නැමදීම අනුමත කරන්නේ නැත.

හින්දු ආගමේ මූලික ධර්ම මූලාශ්‍ර වල සඳහන් වන්නේ දෙවියන් වෙනුවෙන් රූප සහ පිළිම නිර්මාණය නොකළ යුතු බවය. නමුත් ඔවුන් තම ධර්ම මූලාශ්‍ර වලට පිටින් යමින් විවිධාකාරයේ මනඃක්කල්පිත රූප සාදාගෙන ඒවාට නැමදීම් සිදු කරමින් සිටී. ඔවුන් සදාගෙන ඇති බොහෝමයක් පිළිම වලින් පෙන්නුම් කරන්නේ අංග විකළ ලෙස සැකසූ මිනිස් රූපය.

ජෛන ආගමේ සහ බෞද්ධාගමේ බැතිමතුන් පිළිවෙලින් මහාවීරගේ සහ බුදුන්වහන්සේගේ පිළිම සාදාගෙන ඒවාට නමදින් සිටී. බොහෝමයක් බෞද්ධයින් හින්දු ආභාශයෙන් ලද දේව රූපවලටද නැමදීම සිදුකරයි.

ඇතැම් ආගම් වලට අනුව දිව්‍ය ලෝක වල සිටිනවා යැයි කියන බ්‍රහ්ම සහ ප්‍රාදේශීය දෙවිවරුනුත් ස්ත්‍රී හෝ පුරුෂ ලෙස අප වැනිම රූප සහිත, අප වැනිම මසා නිමකල ඇඳුම් අඳින දෙවිවරු ලෙස සිටී.

බුදුන්වහන්සේ ජීවමානව සිටියදී එතුමන් විසින් පිළිම වන්දනාව අනුමත කර තිබී නැත. අද වන විට විවිධ බෞද්ධ ජන කොටස් විසින් වෙනස් වෙනස් රූප ආකාර වලින් ගෞතම බුදුන්වහන්සේගේද, මනඃකල්පිත කරගත් මිනිස් රූපාකාර වලින් රහතන් වහන්සේලාගේද, පෙර පහළ වූ බුදුවරුන්ගේද පිළිම සාදාගෙන ඒවාට නැමදුම් කරමින් සිටී. අඩු තරමින් කිසිවෙකු ළඟවත් එතුමන්ලාගේ සත්‍යය රූපද නැත.

මීට අමතරව තව බොහෝ ආකාර වලින් රූප සහ පිළිම සාදාගෙන නැමදීම් කරන ජන කොටස ඉතිහාසයේ සිට අද දක්වාම ලොව පුරා සිටිනු දැකිය හැක. ඒවා අතර මිනිස රූපද, සත්ව හා භෞතික හැඩතල සහිත රූපද පවතී.

අපේ රටේ බහුතරයක් මිනිසුන් පිළිපදින ථේරවාදී බුදුදහම ගැන හොඳ අවබෝධයක් ඇති බෞද්ධ ගිහියන්ගෙන් සහ පැවිදි භික්ෂූන් වහන්සේලාගෙන් මෙම පිළිම සම්ප්‍රදාය ගැන ඇසුවොත් ඔවුහු පිළිම හෝ රූප වන්දනාව

ප්‍රතික්ෂේප කරනු දැකිය හැක. එයිනුත් පැහැදිලි වන්නේ ඔවුන් නොවන, එහෙත් බෞද්ධයින් බහුතරය රූප සහ පිළිම වන්දනා කරමින් නොමගෙහි සිටින බවය.

සැබෑ දෙවියන්, සැබෑ ධර්මය, සැබෑ නබිවරුන්, හෝ සැබෑ බුදුවරුන් තම හදවත් තුලින් දැකිය නොහැකි ජනතාවට ඒවාට ළං වීමට, ඒවා හඳුනා ගැනීමට, ඒවා අවබෝද කර ගැනීමට පහසු කරවීම සඳහා රූප සහ පිළිම භාවිතා කරන බව සමහරු පවසයි. එනම්, දහම නිවැරදිව වටහා ගත්තවුන්ට පිළිම අවශ්‍ය නොවන අතර, සත්‍යට කිට්ටු අයට කුඩා පිළිමත් සත්‍යට ගොඩාක් දුර අයට විශාලත්වයෙන් වැඩි පිළිමත් භාවිත කිරීමට සිදුව ඇති බව පෙනෙයි. මිනිසුන්ගේ භක්තිය වැඩි කිරීම සඳහා අති විශාල පිළිම ඉදිරිපත් කිරීමේ තත්වයක් ලෙසද එය දැකිය හැක.

මුස්ලිම්වරුන් සහ යුදෙව්වන් සියල්ලට රූප සහ පිළිම රහිතව තම ඇදහිල්ල තුල සිටිය හැකි නම්, අවබෝදය සහිත ක්‍රිස්තියන් සුළු පිරිසකටත්, බෞද්ධයින් සුළු පිරිසකටත් එය එසේ කල හැකි නම් අනිකුත් අයට පිළිම රහිතව තම ඇදහිල්ලේ සිටීමට නොහැක්කේ මන්ද? එය වෙන කිසිම හේතුවක් නිසා නොව, තම වැඩිහිටියන්ව ඒ ආකාරයටම අනුගමනය කිරීමෙහි ආදීනවයක් ලෙස සිදුවන බව සිතිය හැක. එනම්, ඔවුන් පිළිම වලට ඇබ්බැහි වීමක් වී හෝ පිළිම කෙරෙහි ආසාවක් ඇති කරගෙන සිටී.

ධර්මය අවබෝධ කරවීමේ පහසු මගක් ලෙස මුල් කාලවල ධර්මචක්‍රය වැනි දෑ භාවිත කළත්, පසු කාලීනව පිළිම භාවිතයද ඒ සඳහා යොදගෙන ඇත. එයින් ඇතිවූ අනිසි බලපෑමක් ලෙස ධර්මයට වඩා මිනිසුන්ගේ සිත් පිළිම කෙරෙහි නැඹුරු විය. පිළිම රහිතව බෞද්ධයෙක් විය නොහැකි වන තරමට එය වැඩි දියුණු විය. එම නිසා සෑම පන්සලකම, සෑම බෞද්ධ නිවසකම පිළිමයක් තිබීම අනිවාර්ය අංගයක් බවටත් පිළිම ඉදිරියේ සිටිමින් බුදුන් නැමදීමටත්, ගෞරව කිරීමටත්, පිහිට පැතීමටත්, පුද පූජා පැවැත්වීමටත් යොමුවී තිබේ.

දෙවියන්ගේ අවසන් නබි වන මොහම්මද් නබි (ﷺ) තුමා තමන්ගේ අනුගාමිකයින්ට පැවසුවේ කිසිවිටෙකත් තමාගේ රුව සිතුවම් හෝ පිළිරූ ගත නොකරන ලෙසයි. කොටින්ම තමන්ගේ හෝ කිසිවෙකුගේ මිනී වලට ඉහලින්

ස්මාරක පවා නොසාදන ලෙස උපදෙස් දෙන ලදී. තව දුරටත් ඔහු පෙන්වා දුන්නේ මීට පෙර පැමිනි ජේසු (ඊසා අ.ස) තුමාගේ පිළිම සාදාගෙන ඇතැමුන් අවසානයේ ඔහුව දෙවියන්ව කරගෙන නොමග ගිය ආකාරයට කිසිවෙකුවවත් පත් නොකළ යුතු බවය.

වරෙක ආනන්ද තෙරුන් බුදුන්වහන්සේගේ රුව සිතුවම් ගත කිරීමට අවසර ඉල්ලූ විට බුදුන්වහන්සේද එය ප්‍රතික්ෂේප කර තිබේ.

බුදුන්වහන්සේ සර්වඥයන් වහන්සේ ලෙස හඳුන්වාදීමෙන් හා වර්ණනා කිරීමෙන්ද බුදුන් වහන්සේගේ අනුගාමිකයන්ව නොමඟ යැවීම කණගාටුවට කරුණකි. සියල්ල දන්නා ලෙස අපට හඳුනාගත හැක්කේ සියල්ලෙහි නිර්මාතෘ ලෙස සිටිනා සර්වබලධාරී දෙවියන් වහන්සේය. එතුමන් විසින් ඇතැමුන්ට සුවිසේශී දැනුම ලබා දී තිබීමද අපට දැකිය හැක. බුදුන්වහන්සේ තුලද නබිවරුන් තුලද එවන් තත්ව අපි දකින්නෙමු.

පිළිම තුලින් දකිනා බුදු රුව සැබෑම බුදුන්වහන්සේගේ රුව නොවේ. කෙසේ නමුත් බුදු පිළිම තුලින් බුදු ගුණ සිහිපත් කිරීම පහසු බව ඇතැමුන් පවසයි. පිළිම විශාල කරන්න විශාල කරන්න සහ ඒවා ලස්සන කරන්න ලස්සන කරන්න උත්සහ ගන්නා විට ඒවා කෙරෙහි ඇතුළු කරන ගුණාංගද එන්න එන්න වැඩි කරයි. එවිට එහි ප්‍රතිඵලයද සත්‍යය අභිභවා යයි. එවිට මුලාවට පත් වේ. බුදු ගුණ අනන්ත යැයි සමහරු පවසති. අනන්ත ගුණ තිබිය හැක්කේ සර්වබලධාරී එකම දෙවියෙකුට පමණි. අනන්ත ගුණ සහිත දෙදෙනෙකුට පැවතිය නොහැකිය. දෙවියන්වහන්සේගේ ගුණ අනන්ත නිසයි ඔහු සදාකල් පවතින්නේ. බුදුන්වහන්සේ සදාකල් පවතින කෙනෙකු ලෙස පෙන්වා දෙන්නේ නැති නිසා එතුමන්ගේ ගුණ අනන්ත ලෙස පවතිනවා යැයි කීමට නොහැකිය.

බුදු ගුණ හරහා බුදුන් වහන්සේව සර්වබලධාරී දෙවියන්ට සමාන කිරීමක් හෝ ඊටත් වඩා උසස් කර සැලකීමක් කරන්නේ නම් එයද එක්තරා විදිහක ව්‍යාජ දෙවිවරුන් සාදාගෙන වන්දනා කරන පිළිම වන්දනාවටම සම වන්නේය.

බුදුන්වහන්සේ සියල්ල දන්නවා (සර්වඥ) නම් විශ්වයන්ගේ ඇතිවීම නැතිවීම හා ඒවා තුල සිදුවන සියල්ල ගැන දැන සිටියාට අමතරව ඊටත් එහා ගිය, එනම් ඒවා

සියල්ලෙහි නිර්මාතෘ වන සර්වබලධාරී දෙවියන්ගේ පෞද්ගලික තොරතුරුද ඔහුගේ සදාකල් පැවැත්මේ ස්වභාවයද දැනගෙන සිටිය යුතුය. එය කෙසේවත් සිදුවිය නොහැකිය. ඒ සියල්ලත් බුදුන්වහන්සේ දන්නවා නම් දෙවියන් සර්වබලධාරී නොවන තත්වයට පත්වනු ඇත.

ඉතිපිසෝ භගවා අරහං වැනි ගාථා මගින් පෙන්වාදෙන බුදු ගුණ සර්වබලධාරී දෙවියන්ගේ ගුණාංග වලට සමානකම් ඇතිකරයි. මෙය සර්වබලධාරී දෙවියන් ගැන නොදන්නාකම නිසා සිදුවූ වරදක් ලෙස පෙන්වාදිය හැකියි. සියළු ලෝක ගැන වඩා හොඳින්ම දන්නේ ඒවා සියල්ලෙහි නිර්මාතෘ ය. ඒවා සියල්ල පාලනය කළ හැක්කේද ඒවා සියල්ල නිර්මාණය කල සර්වබලධාරී දෙවියන්ටමය. සියල්ලටම වඩා සත්‍ය දන්නේද ඔහුමය. දෙවියන් වහන්සේ තමාගේ ගුණාංග සහ ඊට අදාල නම් 99ක් තම අවසන් දිව්‍ය හෙළිදරව්ව තුලින් මිනිසාට දැනුම් දී ඇත.

අල් කුරානයෙහි සඳහන් පහත වැකි දෙස විශේෂ අවධානය යොමු කර බලන්න.

*(මනුෂ්‍යයිනි!) ප්‍රාණයක් නොමැතිව තිබූ ඔබට ඔහුම පණ දී තිබියදී, ඔබ අල්ලාහ්ව කෙසේ නම් ප්‍රතික්ෂේප කරන්නෙහුද? ඉන් පසුවද ඔහුම ඔබව මරණයට පත් කරන්නේය, පසුවද ඔහුම ඔබට පණ දෙන්නේය. (ඉන්) පසුවද ඔබ (ඔබගේ කළකම් සඳහා ඵලවිපාක අත්කර ගැනීම සඳහා) ඔහු වෙතම (විනිශ්චය සඳහා) ගෙන එනු ලබන්නෙහුය. (2:28)*

*ඔහු නම් සෑම ආත්මයක්ම කරන සෑම දැයක්ම හොඳින් දන්නෙකි; (13:33)*

*සියල්ලන්ම උත්පාදනය කළ අය, (හෘදයන් හී ඇති දැය) දැන නොගන්නෙහිද?;(67:14)*

එනිසා සර්වබලධාරී දෙවියන්වහන්සේට වඩා බුදුන්වහන්සේව උසස් කොට සැළකීම නිවැරදි විය නොහැක. එනිසයි නැමදීමට වඩාත්ම සුදුස්සා ලෙස දෙවියන්ව හඳුන්වා දෙන්නේ. ඉස්ලාමය තුලින් පෙන්වා දෙන්නේ නැමදීමට අල්ලාහ් හෙවත් සර්වබලධාරී දෙවියන්වහන්සේට වඩා වෙන කිසිවෙකුත් නැති බවයි.

තව දුරටත්, බුදුන්වහන්සේගේ අරහත් ගුනය සහ අල් කුරානයෙකි සදහන් පහත වැකි දෙස විශේෂ අවධානය යොමු කර බලන්න.

*ඔහු ගුප්ත දැය සියල්ල දන්නෙකි. ඔහු නොදැනුවත්ව අහස් හි හෝ භූමියෙහි හෝ ඇති දැයෙන් එක් අණුවක ප්‍රමාණයක් තරම් හෝ බේරී යන්නේ නැත. ඊටත් වඩා කුඩා හෝ ලොකු හෝ (සෑම දෙයක්ම) ලව්හුල් මහ්ෆූල් නැමැති පැහැදිලි සටහන් පුස්තකයෙහි සටහන් නොවී නැත; (අල් කුරාණය 34:3).*

*භූමියෙහි ඇතුළු වී යාමද, එයින් පිටවී යාමද, අහසින් බැසීමද, ඒ දෙසට (භූමියේ සිට) නැගීමද, ඔහු හොඳින් දන්නේය. ඔබ කොහේ සිටියා වුවද, ඔහු ඔබ සමග සිටින්නේය. අල්ලාහ් අවධානයෙන් යුතුව බලන්නෙකු වශයෙන්ම සිටින්නේය. (57:4)*

*(අනිත් වතාවේදී කවදා) සූර් (නැමති හොරණෑව) පිඹිනු ලබන්නේද, එවෙලේම ඔවුන් සොහොන් වලින් ඉකුත් වී තමන්ගේ දෙවියන් වෙත (ඉතාමත්) වේගයෙන් දිව එන්නාහ. (36:51)*

දෙවියන් පවසන ආකාරයට ඔහු ජීවය දුන් සෑම ආත්මයක්ම නැවත දෙවියන් හමුවට යා යුතුය.

දෙවියන් යනු කෙබඳු කෙනෙක්ද, දෙවියන්ගේ දැනුම සහ ඔහුගේ නිර්මාණශීලී හැකියාව, දෙවියන්ගේ රාජධානිය යන ලිපි කියවා බැලුවොත් ඔබ කිසි විටකත් වෙන කිසිවෙක්ව දෙවියන්ට සමාන නොකරනු ඇත.

දෙවියන්වහන්සේ මිනිසාව නිර්මාණය කළේ ඇයි, දෙවියන් වහන්සේ මිනිසාට දුන් වරප්‍රසාද, දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීමේ පාපයේ බරපතලකම ආදිය ගැන නොදැන සිටීම මිනිසා අතින් සිදුවනුයේ විශාල අත්වැරද්දකි. පිළිම සාදා ඒවා මත කොටු වීමමයි මෙයට හේතුව. පිළිම නිසා මිනිසාගේ විචරබුද්ධිය පවා සීමා සහිත වනු ඇත.

පිළිම නිසා ක්‍රිස්තියන් අය ජේසු තුමා තුලින් දෙවියන්ව දකින්න උත්සහ ගන්නවා. පිළිම නිසා හින්දු අය ඔවුන්ගේ විකෘති රූප හරහා දෙවියන් ගැන වටහා ගන්න උත්සහ ගන්නවා. බුදු පිළිම හරහා බුදුන්වහන්සේට වඩා උසස් කෙනෙක්

නැතැයි කියා බෞද්ධයින් සිතනවා. මේ නිසා තමයි දෙවියන්ම පවසා තිබෙන්නේ පිළිම වන්දනාව මිනිසාට නුසුදුසු බව.

ඉස්ලාම්, ක්‍රිස්තියානි සහ යුදෙව් ආගම් වලට අනුව පළමු මිනිසා ආදම් (අ.ස)ය. මිනිසාට හිමිවිය යුතු දහම ඔහුට උගන්වා දුන්නේ මිනිසාගේ නිර්මාතෘ වන දෙවියන්වහන්සේ විසිනි. පෘතුවියට පැමිණි පසු ආදම් (අ.ස) තම නිර්මාතෘ වෙනුවෙන් පිළිම නිර්මාණය කලේ නැත. ඔහුගේ පසු පරම්පරාවල දරු මුණුපුරන් ගේ කාලයක යහපත් මිනිසුන් කිහිප දෙනෙක් ජීවත්ව සිට ඇත. ඔවුන් මිය ගිය පසු ඔවුන්ව සිහිවීම පිනිස ඔවුන් වෙනුවෙන් ස්මාරක ඉදි කර ඇත. පසුව ඒවාට වැඩි ගෞරව දක්වන්නට පටන්ගෙන ඇත. තවත් කල් යාමේදී ඒවාට නැමදීම් කරන්නට පටන්ගෙන ඇත. පිළිම වන්දනාව මෙසේ ආරම්භ වී එම වැරදි ආදර්ශය අද දක්වාම පැමින ඇත. එය නොකළ යුතු බව දැනුම් දීමට දෙවියන්වහන්සේ විසින් විටින් විට නබිවරු එවා ඇත. සෑම නබිවරයෙකුම ගෙනා පණිවිඩය වන්නේ නැමදීමට එකම සුදුස්සා සර්වබලධාරී දෙවියන් බවත් ඔහු හැර වෙන කිසිවෙකුට මිනිසා නැමදීම නොකළ යුතු බවත්ය. මුස්ලිම් මිනිසුන් තම නිර්මාතෘට හැර වෙන කිසිවෙකුට නමදින්නේ නැත්තේ මෙනිසයි. දෙවියන් වෙනුවෙන් රූප සහ පිළිම නෙලීමට දැණුම සහ හැකියාව ඇති කිසිවෙකුත් නොමැත. එනිසා දෙවියන්ගේ ශ්‍රේෂ්ඨත්වයට කිසිඳු හානියක් නොකර ඔහු වෙනුවෙන් රූප සහ පිළිම නෙලීම් නොකර තම දහම තුල සිටීමට මුස්ලිම්වරු වගබලා ගනී. ඔවුන් දෙවියන්ගේ නිර්මාන තුලින් දෙවියන්ගේ මහිමය හඳුනා ගනිමින් සිටී. දෙවියන් යනු කෙතරම් ශ්‍රේෂ්ඨ කෙනෙකුද යන්න ඔහුගේ නම්, ලක්ෂන සහ ඔහුගේ නිර්මාණ වලින් හඳුනා ගෙන ඔහුට නිසි ගරුත්වය ලබා දීමට අප සියලුදෙනාම ඉක්මන් විය යුතුය.

මිනිසාගේම යහපත වෙනුවෙන් ඔහු විසින් තම නිර්මාතෘට නැමදීමෙන් නිසි ගරුත්වය දක්වන ලෙසත්, දෙවිඳුන් ට හැර වෙන කිසිවකට නොනමදින තරමට මිනිසාව උසස් කර ඇති බව දෙවිඳුන්ම අපට දන්වා ඇති තත්වයක සහ අවසන් නබි මොහම්මද් තුමන්ද, ඊට පෙර පැමිණි ජේසු තුමා (ඊසා අ.ස) ඇතුළුව සියළුම නබිවරුන්ද, ගෞතම බුදුන්වහන්සේද, ධර්මය ගැන දැනුම් තේරුම් ඇති පෘතඃජන

උගතුන්ද පිළිම නැමදීම අනුමත නොකරන තත්වයක් උඩ ඔබ තව දුරටත් පිළිම වන්දනා කරනවා නම් ඒ ගැන නැවත සළකා බැළිය යුතු නොවේද?

ඉස්ලාම් දහමට අනුව නම් පිළිම වන්දනා කිරීම ඉතාමත් බරපතලම පාපයකි. දෙවියන් විසින් සමාව නොදෙන පළමු පෙලේ පාපයකි. දෙවියන් විසින් සෑම මිනිසෙකු වෙතම එවන ලද අවසන් පණිවිඩයේ සඳහන් එම කරුණ ලැබුණු අප විසින් එය ඔබටත් දැනුවත් කිරීම අපගේ අනිවාර්යය යුතුකමකි.

පිළිම වන්දනාව සම්බන්ධව ආගමික මූලාශ්‍ර වල සඳහන් කරුණු කිහිපයක්

*(තවද)"අල්ලාහ්ව මිස, ඔබ නමදින පිළිරූ සියල්ල ඔබ බොරුවට මනඃක්කල්පිත කර ගත් දැයයි. මන්දයත් නියත වශයෙන්ම අල්ලාහ් හැර, ඔබ නමදින මේවා ඔබට ආහාර ලබා දීමට පොඩියක් හෝ ශක්තිය නැති දැයයි. එබැවින් (ඔබට අවශ්‍ය) ආහාර අල්ලාහ්ගෙන්ම ඉල්ලා, ඔහු (එක්කෙනෙකු)වම නැමද ඔහුට කෘතඥ වී සිටිනු. ඔහු වෙතම ඔබව ගෙන එනු ලබන්නෙහුය. (Al Quran 29:17)*

*නියත වශයෙන්ම අල්ලාහ් තමන්ට සමානයන් තැබීමට සමාව දෙන්නේම නැත. මෙය හැර, (අන් කිසිවක් වුවත්, තමන් අදහස් කරන්නන්ට සමාව දෙන්නේය. කවුරුන් අල්ලාහ්ට සමානයන් තබන්නෝද, ඔවුන් නියත වශයෙන්ම අති විශාල පාපයම මනඃක්කල්පිත කරන්නාහ (Al Quran 4:48)*

Bible ගීතාවලිය 115:4-8 ඔවුන්ගේ පිළිම රිදී සහ රන් ය, මිනිසුන්ගේ අත් වැඩ. ඒවාට මුඛය ඇත, නමුත් ඒවා කතා නොකරයි; ඇස් ඇත, නමුත් ඒවා නොපෙනේ; ඒවාට කන් ඇත, නමුත් ඒවා ඇසෙන්නේ නැත; නාස් ඇත, නමුත් ඒවා ගඳ නොගසයි; ඒවාට අත් ඇත, නමුත් ඒවා අල්ලන්නේ නැත; පාද ඇත, නමුත් ඒවා ඇවිදින්නේ නැත; ඔවුන් තම උගුරෙන් කතා කරන්නේ නැත. ඒවා සාදන අය ඒවාට සමාන වනු ඇත; ඔව්, ඒවා කෙරෙහි විශ්වාසය තබන සෑම කෙනෙක්ම.

Bible යෙසායා 45:16 ඔවුන් සියල්ලෝම ලජ්ජාවට පැමිණෙති, එසේය, වියවුල්වන්නෝය; පිළිම සාදන්නෝ එක්ව වියවුලට පත්වන්නෝය.

Hindu:- Yajurveda – the Yajurveda says on Ch. No. 32, V. No. 3… 'Natasya Pratima Asti'... 'Of that God, no image can be made'

Hindu:-Yajurveda, Ch. No. 40, V. No. 8 says… 'God is image less, and body less – He has got no form, He has got no body'

Hindu:- Yajurveda, Ch. No. 40, V. No. 9 says… 'All those who worship the Asumbhuti, the natural things like air, water, fire… All those who worshipping the Asumbhuti, are in darkness'. And the verse continues… 'They are entering into more darkness. who are worshipping the Sambhuti – Sambhuti means… the created things.

Hindu:-Yajurveda Ch. No. 40, V. No. 9… 'If you worship the Sambhuti, the created things… the table, chair, etc., you are entering more into darkness. The Hindu Scriptures says… "Ekam Brahm, dvitiya naste neh na naste kinchan" (Sanskrit) – (Translation) 'There is only one God, not a second, not at all, not at all, not in the least bit'.

Hindu:- The Rigveda says in Vol. No. 8, Ch. No. 1, V. No. 1 . 'All praises are due to Him alone' – Alhamdullilah Hi Rabbul Alamin. Same as the Holy Qur'an, Surah Fathiha, Ch. No. 1, V. No. 1 to 2… Alhamdullilah hi Rabbul Alamin. The same Regveda, Vol. 6, Ch. No. 45, V. No. 16 says…'There is only one God… Worship Him alone'.

## මිනිසෙකු විසින් තවත් මිනිසෙකුට නැමදීම ගැන.

දෙමව්පියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරුන් ආදියට නැමදීම ශ්‍රී ලංකාව වැනි රටවල සුලබව දැකිය හැකි ගුණාංගයකි. එය බැලූ බැල්මට මහත් ප්‍රශංසනාත්මක යහපත් ගුණාංගයක් ලෙස ඔවුන් හඳුනාගෙන ඇත.

නැමදීම යනු “දක්වන උපරිම ගරුත්වයයි“. ඉස්ලාමීය කෝණයෙන් බැලූ විට එය පළමුව සහ උපරිමව ලබා දිය යුත්තේ නැමදීමට සුදුස්සා ලෙස ඉහලින්ම

සිටින සියල්ලගේම මැවුම්කරු, සියල්ලගෙම හිමිකරු, සියල්ලගේම පෝෂකයා, සියල්ලට බලසම්පන්නයා ආදී ලෙස සිටින සර්වබලධාරී දෙවියන්ටය. එම නැමදීම දෙවියන්ට නොදී හෝ දෙවියන්ට වාඩා උසස් කොට වෙනත් කුමණ හෝ කෙනෙකුට හෝ දෙයකට කරන නැමදීම "දැනුවත්ව හෝ නොදැනුවත්ව දෙවියන්ට කරන ගුණමකු කමකි". එනිසා පළමුව තමන්ගේ දෙවියන්ට තම උපරිම නැමදීම ලබා දී ඔබ කැමති වෙනත් අයට ඔවුන්ට ගැලපෙන අයුරින් ගෞරවය දක්වන්න. මිනිසා මේ වෙනස හඳුනා ගත යුතුය. එනිසා වඩාත් උසස්වන්තයාව හඳුනාගෙන මුලින්ම ඔහුට ඔබේ නැමදීම් කරන්න.

---

## මුස්ලිම්වරුන්ට දෙවියන්ගේ පරීක්ෂණය පහසුද?

මෙය මවිසින් අසන පුද්ගලික ප්‍රශ්නයකි. එනිසා ඇතැම් විට මෙය මුස්ලිම්වරුන් අතර පවා සංවාදාත්මක මාතෘකාවක් විය හැකියි.

දෙවියන්වහන්සේ අපගේ අවසන් නබි ﷺ තුමානන්ට මෙසේ පවසා ඇත.

*(අපගේ) දූතයාණෙනී! ඔබගේ දෙවියන්ගෙන් ඔබට පහළ කරන ලද දෑය (කිසිම අඩුපාඩුවකින් තොරව ඔවුන්ට) දැනුම් දී හරිනු. ඔබ (එසේ) නොකලහොත් ඔවුන්ගේ දූත මෙහෙවර ඔබ ඉටු කල කෙනෙකු බවට පත්වන්නේ නැත. (මෙහිදී ඔබ කිසිවෙකුටවත් බිය නොවනු). මිනිසුන්ගේ (නපුරෙන්) අල්ලාහ් ඔබව (ආරක්ෂා කර) බේරා ගනු ඇත.(5:67)*

නබි මුහම්මද් (ﷺ) තුමා තමාගේ අවසාන සමුගැනීමේ දේශනාවේදී, මෙසේ පැවසීය,

*'පැමිණ සිටින අය නොපැමිණෙන අයට ප්‍රකාශ කරත්වා!'. එසේම එතුමා මෙසේද ප්‍රකාශ කළේය.'(මගේ ඉගැන්වීම්) තනි වාක්‍යයක් වුවද ජනතාවට ප්‍රකාශ කරන්න'.*

එයද පදනම් කරගෙන මෙම ලිපිය සංසන්දනාත්මකව ලිවීමට අදහස් කලෙමි.

මෙම ලිපිය සංසන්දනාත්මකව ලිවීමට අදහස් කලෙමි.

මුස්ලිම්වරුන්ට, මුස්ලිම් නොවන්නන්ට සහ නවක මුස්ලිම්වරුන්ට අල්ලාහ් සුභානවතාලාගේ පරීක්ෂණය බලපාන්නේ කෙසේද යන්න මෙහිදී සළකා බැලේ.

අල්ලාහ් සියලු මිනිසුන්ට මේ ජීවිතය ලබා දෙන්නේ පරීක්ෂණයකට මුහුණ දීම සඳහා ය. එසේම, දෙවියන්වහන්සේගේ පොරොන්දුව පරිදි මිනිසුන්ට මරනින් මතු තම අවසන් වාසස්ථානය ලෙස ස්වර්ගය හෝ නිරය පිළියෙල කර ඇත. අල්ලාහ්ගේ අවසන් විනිශ්චයට පසු ඔවුන් ඒවායේ සදාකල් හෝ අල්ලාහ් කැමති තාක් කල් නොමැරී ජීවත් වේ. එය එලෙස පහසුවෙන් සඳහන් කළාට එය සුළුපටු කාරණාවක් නොවේ. එනිසා ඒ ගැන සළකා බැලිය යුතුය.

අල්ලාහ් සර්වසාධාරණය. කිසිවෙකුට හෝ අණුවක තරම්වත් අසාධාරණයක් නොකරන බව පවසයි. එසේනම් සමහරුන්ට පහසුවෙන් ස්වර්ගයට ඇතුළු වීමට අවස්ථාව දී තවත් සමහරුන්ට එය ඉතාම අමාරු අවස්ථාවක් කරාවි යැයි සිතිය නොහැක.

කව්රුන්ද මේ පහසුවෙන් ස්වර්ගයට ඇතුළු විය හැකි යැයි අදහස් කරන අය?

ලොවපුරා සිටින බහුතරයක් මුස්ලිම්වරුන්ගේ තත්වය උදාහරණයට ගනිමින් මෙම සටහන ලියමි.

සමහරවිට මුස්ලිම් පවුලකට අලුතින් දරුවෙකු ඉපදුනු විට වැඩිහිටියන් ඔහුගේ දකුණු සහ වම් කනට පිළිවෙළින් අදාන් සහ ඉකාමත් පවසයි. (මෙය ඉස්ලාමයේ උගැන්වීමක් ලෙස කීමට පිළිගත් සාධක නැතත්, එම දරුවා තම ජීවිතය පටන් ගන්නේ කෙතරම්ම ඉස්ලාමයට සමීපවද යන්න ඉන් පැහැදිළිව ඉස්මතුව පෙනෙයි).

එනම්, ඔහු ඉපදුන මොහොතේ සිට ඉස්ලාමය ඔහු වෙත ලබා දෙයි. ඔහු ටිකක් ලොකු වන විට ඔහු දකින්නේ ඉස්ලාමයට සමීප පරිසරයකි. කුරාන් පාරායනා කරන හඬ ඔහුට ඇසෙයි. නබි ﷺ තුමාගේ නම ඔහුට ඇසෙයි. වැඩිහිටියන් සලාතය කරන ආකාරය ඔහු දකී. අල්ලාහ් ගැන ඔහුට අසන්නට ලැබේ. ඉන් පසු

ඔහු යන පාසලේ ඉස්ලාම් උගන්වන පංතිකාමරයේ ඔහු ඉස්ලාම් ගැන තවත් ඉගෙන ගනී. වැඩිහිටියන් සමග ඔහුත් පල්ලි වලට යයි. රමධාන් සහ හජ් වැනි උත්සව සමය ඔහුත් ඉස්ලාමීය පිළිවෙත අනුව ගත කරයි. සලාත් කිරීමට, උපවාසය කිරීමට, පල්ලියට යාමට වැඩිහිටියන් ඔහුව හුරු කරයි. ඔහුත් තම පුරුද්දට එම කටයුතු අඩු වැඩි වශයෙන් කරගෙන තම වයස ගත කරයි.

ඔහු වටේ මුස්ලිම් නොවන අය සිටින බවත් ඔහු දකී. ඔහුට එය විශේෂ කාරණාවක් ලෙස නොවැටහෙයි. සකාත් ගෙවීම, සදකා කිරීම, ඌරුමස් අනුභව නොකිරීම, පිළිම නොනැමදීම, වැනි ඉස්ලාමීය පොදු තත්වයන් සහ වත්පිළිවෙත් සමග සිට මුස්ලිම්වරයෙක් ලෙසින් මිය ගිය විට ඉස්ලාමීය චාරිත්‍රානුකූලව ඔහුගේ අවසන් කටයුතුද ඉටු කරයි. [මෙය හරියට, පහළට ගලා බසින ජලාශයක පහළටම පිහිනා යනවා වැනිය].

මෙහි ඔහු සම්බන්ධව අල්ලාහ්ගේ පරීක්ෂණයේ බැරෑරුම් කමක් දකින්නට තිබුනාද?

මුස්ලිම්වරුන්ගේ මතයට අනුව (ඉන්ශාඅල්ලාහ්) ඔහුට ස්වර්ගය හිමිවී ඔහු එහි සදාකල් සුවසේ සිටීවි. කාට උනත් එසේ වේවායි අපිත් ප්‍රාර්ථනා කරමු.

ඔහු මධ්‍යස්ථ මුස්ලිම්වරයෙක් ලෙස සිටියා යැයි උපකල්පණය කරමු. ඔහුගේ හොඳ නරක කටයුතු වෙනුවෙන් අල්ලාහ්ගේ තීන්දුව ඔහුට ලැබේ. ඔහුට එවන් ඉස්ලාමීය පරිසරයක පහසුවෙන් සිටීමට හැකි ජීවිත අවස්ථාවක් ලබා දීම අල්ලාහ්ගේ කැමැත්තය. එයට නියම හේතුව දන්නේ අල්ලාහ් පමණි. (සමහර අවස්ථාවල තර්ක මත නොයිදින්ම විශ්වාස කිරීම ඉස්ලාමයේ එක් ගුණාංගයකි).

නමුත් මෙහිදී අප සංසන්දනාත්මකව උරගා බැලීමට යන ඊලඟ අවස්ථා දෙක ගැන සලකා බැලීමේදී අල්ලාහ් ඔවුන්ව ඉස්ලාමීය නොවන පරිසර වල ඉපදෙන්න සලස්වා සහ අවසානයේ ඔවුන්ට ඉතාම අපහසුවෙන් ස්වර්ගයට යාමට හෝ පහසුවෙන් අපායට යා හැකි ආකාරවලට ඔවුන්ගේ පරීක්ෂණය බැරෑරුම් කර ඔවුන්ට ලබා දී තිබීම ගැන අප නැවත සළකා බැලිය යුතුය. අල්ලාහ්සුභානවතාලා සර්වසාධාරණය. එනිසා ඒ ගැන අපි සැක ඇති කර

නොගෙන මෙහිදී අප එකිනෙකාගේ සැබෑ පරීක්ෂණ අපි නිවැරදිව වටහා ගැනීමට උත්සහ කරමු.

අල්ලාහ් මෙසේ පවසා ඇත.

*පසුව අපගේ වහලුන්ගෙන් අපි තෝරාගත් අයව එම ධර්මයන්ට හිමි අය බවට පත් කළෙමු. එහෙත් ඔවුන්ගෙන් සමහරෙක් (එයට වෙනස්කම් කර), තමන්ට තමන්ම හානිකර ගත්හ. ඔවුන්ගෙන් (වෙනත්) සමහරෙක් මධ්‍යස්ථ මාර්ගයෙහි ගමන් ගත්හ. ඔවුන්ගෙන් (තවත්) සමහරෙක් නම්, අල්ලාහ්ගේ නියෝගයන්ට අනුව දැහැමි කාරනාවන්හී ඉදිරියෙන්ම සිටින්නාහ. එයම අති විශාල භාග්‍යයක් වන්නේන. (35:32) ඔවුන් ස්ථිර වූ ස්වර්ගයන්ට යන්නාහ. මුතු ඔබ්බන ලද රත්‍රන් වළලු, එහිදී ඔවුන්ට (පරිත්‍යාඅග වශයෙන්) පළඳවනු ලබන්නාහ. එහි ඔවුන්ගේ ඇඳුම් මෘදු සේදයෙන්ම වන්නේය (35:33)*

සමූහයක් අතරින් කිසියම් පිරිසක් තෝරාගෙන ඔවුන්ට යමක් භාර දුන්නා නම් ඔවුන් ඒ සම්බන්ධයෙන් වගකීම් සහිත අය බවට පත්වන බව අපි කවුරුත් දන්නා කාරණාවකි. අල්ලාහ් තම ධර්මය දීමට තෝරගත් අයගෙන් ස්වර්ගයට ඇතුළු කරන අය ගැන ඉහත වැකියෙන් පෙන්වා දී ඇත. මෙය අවධානයට ලක් කළ යුතු නොවේද?

දැන් බලමු බහුතර බෞද්ධයන් ජීවත් වන අපේ රටේ ඔවුන්ගේ තත්ත්වය කොහොමද කියලා. (බහුතරයක් හින්දූන් සහ බහුතරයක් ක්‍රිස්තියානිවරු සිටින පරිසරවල තත්වයත් මෙලෙසමයි).

මාව උදාහරණයට ගනිමින් බෞද්ධයින්ගේ වටපිටාව ගැන ලියමි.

මෙය ලියන මම වයස අවුරුදු 34ක් වෙනතෙක් බෞද්ධයෙක් ලෙස බදුල්ල, නුවර සහ කොළඹට ආසන්න පෙදෙස්වල ජීවත් උනෙමි. මම ශ්‍රී ලංකාවේ 75% ක් පමණ නගර ආවරණය වන ලෙස ගමන් කරමින් සියළුම ආගමිකයින් සමග විවිධ රැකියාවන් කළ අයෙකි.

මා ඉපදුනේ බෞද්ධ පරිසරයකය. පාසැලේදී ඉගන ගත්තේ බුදු දහම ගැනය. ආගමික කටයුතු පන්සල් සමග එක්ව කටයුතු කළෙමි. මුස්ලිම් යහළුවන්

බොහෝමයක් සමගත් කාලය ගත කළ අතර මුස්ලිම් හිමිකරුවන්ගේ ආයතන වලත් වැඩ කළෙමි. අල්ලාහ් ගැන හෝ නබිතුමා ගැන හෝ අදාන් ගැන හෝ කිසිම අවබෝධයක් නොමැතිව වසර 34 ක්ම කාලය ගෙවින.

මම ඉස්ලාමය ගැන දැනගත්තේ රැකියාවක් සඳහා විදෙස්ගත වූ පසුවය. ඉස්ලාමය ගැන දැනගත් පසු මම ඉස්ලාමය වැළඳ ගත්තෙමි. ඒ, මෙය ලියන මොහොතට වසර 15 කට පෙරය.

ඉස්ලාමයට අනුව මම වයස 34 දී හෝ ඊට පෙර මිය ගියා නම් මම අනිවාර්යයෙන්ම සදාකල් නිරාවාසියෙකි. ඉස්ලාමයට අනුව තම නිර්මාතෘව ප්‍රතික්ෂේප කර සිටිමින් මිය යන්නන්ගේ තත්වය එයය. [මෙවන් මුස්ලිම් නොවන පරිසරවල උපදින අයගේ තත්වය සහ ඉපදුන ගමන් කණට අදාන් හඬ ඇසෙන ළමයාගේ තත්වය හා සසඳා බලන්න].

අපගේ රජයේ O/L විභාගයට එන ප්‍රශ්න පත්‍ර දෙස බලන්න. එයට අනුව ශ්‍රී ලංකාවේ සෑම පෙසෙදකම ඇති සෑම පාසැලකටම එකම ප්‍රශ්න පත්‍ර ලබා දෙයි. ඉතාම දුෂ්කර පාසැල් වල ළමයිනුත් ඉතාම ඉහල පහසුකම් සහිත පාසැල් වල ළමයිනුත් එක සමාන කර තිබීම තුල අපි එහි යම් අසාධාරණයක් දකින්නෙමු. නමුත් අල්ලාහ්ගෙ පරීක්ෂනයේ එවන් අසාධාරනකම් තිබිය නොහැක. සියල්ලටම වෙනස් ආකාරවලින් පරීක්ෂණ ලබා දී තිබුනත් (අපට නොතේරුනත්) කිසිවෙකුටත් වාසි සහගත තත්වයක්ද තවත් නෙකුට අවාසි සහගත තත්වයක්ද ලබා දී ඇතැයි සිතිය නොහැක.

හින්දු භක්තිකයන් පමණක් සිටින නුවරඑලියේ වතුකර පෙදෙස බලන්න. ඔවුන් හින්දු පරිසරය තුලම ඉපදී එහිම වැඩිවිය පැමිණ හින්දු භක්තිකයින් ලෙසම ජීවත් වී ඉස්ලාමය ගැන කිසිවක් නොදැන එහිම මිය පරලොව යයි. මොවුන්ට මුස්ලිම් අය විසින් ඉස්ලාමය ගැන කීවේ නැත්නම් එයාලා කොහොමද එය දැනගන්නෙ? (රට පුරා ඇවිදපු මටම දීන් අල් ෆිත්රා ගැන හෝ හදවත තුලින්ම අල්ලාහ් ගැන අදහස වසර 34ක් යන තෙක්ම අවදි උනේ නැත). එනිසා එවන් අයට පවා දෙවියන්ගේ පණිවිඩය ගෙනයාමේ වගකීම මුස්ලිම් අය වෙත පැවරී නැද්ද? එවැනි තත්ව සළකා බලද්දි අල්ලාහ් මුස්ලිම් පවුල්වල උපන් අයට පමණක්

ස්වර්ගයට යන ගමන පහසු කරාවිද? අල්ලාහ් මිනිසුන්ව පෘතුවියෙහි නියෝජිතයන් වශයෙන් පත් කර ඇත. මුස්ලිම් අයට අල්ලාහ්ගේ පණිවිඩය ලැබී ඇති නිසා ඔවුන්ට ඒ සම්බන්ධව තම වගකීම්භාවය වැඩිපුර දැරීමට සිදු නොවන්නේද?

මම දැන් ඉස්ලාමය ගැන තරමක් හෝ දුරට ඉගෙනගෙන ඇති නිසා දීන් අල් පිත්රා ගැනත් අල්ලාහ් ගැන අප හදවත් තුල ඇති සොභාවික තත්වය ගැනත් දනිමි. ඊට පෙර එය ඉස්මතුකර ගැනීමටවත් වටපිටාවක් මා හට නොවීය. එසේනම්, අල්ලාහ් කෙතරම් අසීරු පරීක්ෂණයකට මාව සහ මා වැනි අයව පත් කර ඇත්ද?

එම පරීක්ෂණය කෙතරම් බරපතලද යන්න පහත වැකියෙන් ඉස්මතු වේ.

*බැලිය හැකි ඇස් දෙකක්ම අපි ඔහුට ලබා දුන්නේ නැද්ද? එසේ තිබියදී සත්‍යය ඔහු දුටුවේ නැත; (90:8,9) තවද, මිනිසා නොදන්නා සියල්ල ඔහුට උගන්වා දෙන්නේය. (96:4,5)*

ඉහතින් සඳහන් කල මගේ උදාහරණයම නැවත බලන්න. අල්ලාහ් පවසන මෙම කාරනාව වටහා ගැනීමට මටම කොතරම් කාලයක් ගත උනාද? මිනිස් සිරුර ගැනම, විශ්වය ගැනම, සොභාදහම ගැනම පරීක්ෂන පවත්වමින් ඉන්නා පිරිසක්ද ලොව තුල ඇත. ඔවුන්ටද මෙය වටහා ගැනීම බොහෝ විට අසීරුය. අල්ලාහ් තම පරීක්ෂනය එතරම්ම සංකීර්ණ කර ඇත. එය වටහා ගැනීම සහ එය වෙත ඇතුළු වීම මෙතරම් අමාරු තත්වයක් සහිත පරීක්ෂණ අවස්ථාවක මුස්ලිම් නොවන (අල්ලාහ්ගේ දහම නොලැබුණු) යම් ජනකොටසක් ඉන්නා විට නොමිලේම අල්ලාහ්ගේ මාර්ගයෙන් දහම ලැබුණු තවත් ජනකොටසක් ඉතාම පහසුවෙන් එම (ඉස්ලාමීය) මාර්ගයේ යමින් සදාකල් ස්වර්ගයේ සැනසීම ලබා ගත හැකිවන ලෙස අල්ලාහ් ඔවුන්ට විශේෂ සහනයක් ලබා දෙයි කියා සිතිය හැකිද? ඒ සඳහා ඔවුන් ඉපදීමටත් පෙර යම් කුසලක් කර තිබුනාද? ඉස්ලාමයට අනුව එවැන්නක් නැහැ නේද?

ඉස්ලාමය ගැන දැන් දැන් ටික ටික සමාජය දැනුවත් වෙමින් පවතින්නේ කිහිපදෙනෙකු සමාජමාධ්‍ය තුල ක්‍රියාකාරීන් ලෙස කටයුතු කරන නිසාය. නමුත්

බහුතරයක්ට ඉස්ලාමය අන් අයට දැනුවත් කිරීමේ අවශ්‍යතාවයක්ද නැත. එසේනම් ඔවුන්ගේ සැබෑ පරීක්ෂනය පහසු ලෙස අවසන් වේ යැයි සිතිය හැකිද? ඉස්ලාමය සම්බන්ධ සියල්ල ඔවුන්ට ලබා දී තිබියදී, ඉස්ලාමය සම්බන්ධ කිසිවක් ලබා නොදුන් ජනකොටසකුත් තමා අවට සිටින බව ඔවුන් කල්පනා කළ යුතුයි. එය ඔවුන්ගේ පරීක්ෂණයේ කොටසක් විය නොහැකිද?

අන්ධයෙක් පාර මාරුවීමට උත්සහ ගනිමින් සිටින විට එය ඇස් පෙනෙන අයගේ පරීක්ෂනයේ කොටසක් ලෙස දකින ඉස්ලාමය තුල, අසල්වැසියා කුසගින්නේ ඉන්නා විට එයත් තමන්ගේ පරීක්ෂණයේ කොටසක් ලෙස පෙන්වා දෙන ඉස්ලාමය තුල, ඉස්ලාම් ගැන නොදන්නා අය බහුතරයක් සිටින විට එය ඉස්ලාම් ගැන දන්නා අයගේ පරීක්ෂනයේ කොටසක් නොවේදැයි සමහරුන්ට නොසිතෙන්නේ මන්ද?

ඊලඟට අපි බලමු මා වැනි (පසු කාලීනව) ඉස්ලාම් ආගම වෙත පැමිණි නවක මුස්ලිම්වරුන්ගේ පරීක්ෂණයේ තීව්‍රතාවය කෙසේද යන්න.

ඔවුන්ට තම උත්සහයෙන් ඉස්ලාමය ගැන සොයා බලා ඒ වෙත පැමිණීමට සිදු විය. ශ්‍රී ලංකාව වැනි රටක ඉස්ලාමය අලුතින් වැළඳ ගැනීමේ ප්‍රතිශතය නොගැනිය හැකි තරම් ඉතාම කුඩා අගයකි. එයින්ම පැහැදිළි වෙනවා එය සරළ හෝ සාමාන්‍ය දෙයක් නොවන බව. ඇත්තටම එය මුස්ලිම් නොවන්නන්ට අල්ලාහ්ගේ පරීක්ෂණයේ බරපතල අවස්ථාවකි.

ඔවුන්ගේ පරීක්ෂණය තවත් බරපතල වන්නේ ඔවුන් ඉස්ලාමයට පැමිණි පසුය. ඔවුන්ගේ පවුල්වලින් ඇතිවන විරෝධය, හිතමිතුරන්ගෙන්, ගම්වාසීන්ගෙන්, රැකියා කරණ ස්ථානවලින් සහ ඇතැම් විට තම එදිනෙදා කටයුතු කරගැනීමට යන එන තැන් වල සිටින අයගෙන්ද ඔවුන්ට ඇතිවන්නේ ඍජු හෝ වක්‍ර අකැමැත්තකි. ඉස්ලාමය වැළඳ ගැනීමත් සමග ඔවුන්ගේ පවුල්වල අළුතින් ආගමික, පුද්ගලික මෙන්ම නීතිමය ප්‍රශ්නද ඇති වේ. ඒ සියල්ලට වඩා තම පවුලේ අය සහ හිතවත් අය ඉස්ලාමය වැළඳ නොගෙන සිටින විට ඔවුන්ගේ මරණින් මතු ලොව ගැන සිහිවී ඔවුන් පත්වන්නේ සියල්ලට වඩා බරපතල

අසරණභාවයකටය. මේ සියල්ල සමග ඔවුන්ගේ පරීක්ෂණය මුස්ලිම් සහ මුස්ලිම් නොවන යන දෙගොල්ලටම වඩා සංකීර්ණය, අමාරුය.

නවක මුස්ලිම්වරුන්ගේ නව ඉස්ලාමීය ගමනට ඉස්ලාමය තුලින්ම අත්වැලක් නොලැබේනම් එය වෙන කාගෙන් හෝ ලැබිය හැකියැයි අපේක්ෂා කළ හැකිද?

අල්ලාහ් සුභානවතාලා ඔවුන් ගැන පෙන්වා දෙමින්, ඔවුන් වෙනුවෙන් සකාත් කොටසක්ද වෙන්කල යුතු බව දන්වා තිබියදී, මුස්ලිම් සමාජයේ කීයෙන් කීදෙනාද අඩුතරමින් අල්ලහ්ගේ එම අණට හෝ කීකරුව කටයුතු කරන්නේ? ඔවුන් සකාත් නම් අනිවාර්‍යය බද්ද නිසි පරිදි ගෙවනවාද? එයින් නවක මුස්ලිම්වරුන්ගේ අවශ්‍යතාවයන්ට ඒවා නිසි පරිදි යොදනවා දැයි සොයා බලනවාද?

ඉස්ලාමීය පවුල්වල උපත ලබා පහසුවෙන් ස්වර්ගයට යාමට අවස්ථාව ඇති අයට මෙම නවක මුස්ලිම්වරුන්ගේ කාරණාවත් තමන්ගේ පරීක්ෂණයේ කොටසක් ලෙස නොදැනේද?

ඔවුන් හිතනවාද තමන් ගැන විතරක් බලාගෙන ආගම තුල සිටියම ස්වර්ගයට පිවිසීම ඉතාම පහසු කාරණාවක් විය හැකි බව? අල්ලාහ්ගේ සාධාරණත්වය හමුවේ නබිවරුන් පවා අධික පරීක්ෂණවලට ලක් කර ඇත. එසේනම් සාමාන්‍ය මුස්ලිම්වරුන්ගේ තත්වය කෙසේ විය හැකිද?

අවසානයට, සාරාංශය ලෙස ගත හොත්,

1). මුස්ලිම් නොවන අයට තමා තුලින්ම හෝ සමාජය තුලින් ඉස්ලාමය ගැන දැනගෙන එය අවබෝධකරගෙන තම සුපුරුදු සමාජයේ ප්‍රතිචාර පසෙක තබා විශාල කැප කිරීමක් කර ඉස්ලාමය වෙත පැමිණීමේ භාරධූර පරීක්ෂනයක් ඔවුන් හමුවේ ඇත. ඇත්තටම එය උඩුගම් බලා පිහිණනවා වැනිය.

2). එසේ පැමිණ ඉස්ලාමය වැළඳ ගත් නවක මුස්ලිම්වරුන්ට ඉස්ලාමය ගැන තව දුරටත් ඉගනගෙන, තම නව ජීවනරටාව තුල ඇතිවන නොයෙකුත් අපහසුතා ඉවසාගෙන, තම පවුලේ සහ අන් අයටත් ඉස්ලාමය ගැන පවසමින් ජීවිතය ගත

කළ යුතු වන ආකාරයේ භාරධූර වගකීමක් සහ භාරධූර පරීක්ෂණ අවස්ථාවක් ඇත.

3). මුස්ලිම් පවුල්වල උපන් අයට තමාට උපන් ගෙයින්ම ලැබුණු ඉස්ලාමීය පරිසරය තුල යහපත් අන්දමින් ජීවත් වී, එය මුස්ලිම් නොවන අයට පවසමින්, කුමණ හෝ ආකාරවලින් ඉස්ලාමය ලොව පුරා ප්‍රචාරය කිරීමේ කටයුත්තට දායක වීම සහ මේ වන විටත් ඉස්ලාමයට පැමිණ ඇති නවක මුස්ලිම්වරුන්ව ආරක්ෂා කරගැනීමත් යන කාරණා හරහා ඔවුන්ටත් භාරධූර පරීක්ෂණයක් ඇත.

සියළු දෙනාටම තුන් ආකාරයකින් කැපවීමෙන් වැඩ කළ යුතුව ඇත. එවිට අල්ලාග්ගේ දයාවෙන් ස්වර්ගය හිමිකර ගත හැකිවනු ඇතැයි විශ්වාස කළ හැක. එසේ නොවුනහොත් විනිශ්චය දිනදී අල්ලාහ් ඒ ගැන ප්‍රශ්ණ නොකරම ස්වර්ගය හෝ අපාය තීන්දු නොකරාවි යන්නයි මගේ අදහස.

මේ ගැන ඔබගේ අදහස් මා සමගත් බෙදා ගන්න අමතක නොකරන්න.

---

# මිත්‍යා දෘෂ්ඨිය හඳුනා ගනිමු.

මිත්‍යා දෘෂ්ඨිය යනු යථාර්ථය සම්බන්ධව වැරදි දැක්ම, වැරදි කල්පනාව සහ වැරදි අදහස් ඇතිකර ගැනීමයි.

යථාර්ථය නම් එකම විශ්වීය සත්‍යයයි. ඒ පිළිබඳ අවබෝධයක් නොමැතිකම නිසා, විවිධ ආගම්වල අය තමන්ගේම විශ්වාසයන් මත පදනම්ව තම අදහස් ඉදිරිපත් කරති. එනිසා මිත්‍යාවත් සාපේක්ෂ දෙයක් වී ඇත. එය බෙදජනක තත්වයකි. එකම ස්වභාවයක් ඇති මිනිසුන්ට විවිධ ආගම් සහ විවිධ විශ්වාසයන් ඇති වී තිබෙන්නේ එනිසයි.

**ලිපියෙහි අනුමාතෘකා**

- හේතු-ඵල දහම නිවැරදිව වටහා ගැනීම.
- කර්ම-ඵල යාන්ත්‍රණය නිවැරදිව වටහා ගැනීම.
- නබිවරුන්ව සහ ඔවුන් ගෙනා දිව්‍ය පණිවිඩ.

- මිත්‍යා දෘෂ්ඨිය සම්බන්ධව දෙවියන් පවසන දේ.

මෙය විවේචනයට නොව, බුද්ධිමත් විමසීමටය

මහායාන බෞද්ධයන්ට අනුව ථේරවාදී බෞද්ධයන් සිටින්නේ මිත්‍යා දෘෂ්ඨියේ ලෙසත්, කිතුනුවන්ට අනුව මුස්ලිම්වරුන්ද, මුස්ලිම්වරුන්ට අනුව බෞද්ධයන්ද මිත්‍යා දෘෂ්ඨි මත සිටී. තව ආගම් හෝ විශ්වාස කිහිපයක් සැලකුවත් ඔවුන් අතරත් තත්වය එයමය.

කුමක්ද මේ පටලැවිල්ල?

මෙසේ සිදුවන්නෙ හේතු-ඵල දහම සහ කර්ම-ඵල යාන්ත්‍රණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැතිකමයි.

මෙම පටලැවිල්ල ලෙහා දැමීමට මේ සම්බන්ධව ප්‍රධාන ආගම් වල ඇති උගැන්වීම් කිහිපයක් මෙහි ඉදිරිපත් කරමි.

බෞද්ධ ත්‍රිපිටකයේ මෙසේ සඳහන් වේ.

"මහණෙනි, මේ මිථ්‍යා දෘෂ්ඨිය යම් ආකාරයක් වෙත් ද එසේ මහා සාවද්‍ය වූ අන් එකදු ධර්මයකුදු මගේ සර්වඥතා ඥාණයෙන් නො දකිමි. මහණෙනි, මිථ්‍යා දෘෂ්ඨිය වරදවල් අතරින් සියල්ලට ම මහත් වරද වේ" යනුවෙන් බුදුන් වහන්සේ වදාළ සේක.

බෞද්ධ කෝණයෙන් එය පැහැදිලි කිරීමක් මෙලෙස බෞද්ධ ලිපියකින්ම උපුටා දක්වමි.

මෙය දේශනා කර තිබෙන්නෙ කර්ම, කර්ම ඵල ප්‍රතික්ෂේප කරන නාස්තික, අහේතුක, අක්‍රිය යන දෘෂ්ඨි වලට ය. එම දෘෂ්ඨි අතුරින් කුමන දෘෂ්ටියියක් ගත් අයෙකු වුවත් එය අත් නො හැරියේ නම් මරණින් පසුව සුගතියකට යැමක් සිදු නොවේ. නිවන් අවබෝධ කිරීමක් සිදු නො වේ. ඒ දෘෂ්ඨි සත්වයාගේ ස්වර්ග මෝක්ෂ දෙක ආවරණය කර තිබේ. ඒ දෘෂ්ඨි ගත්තවුන් මරණය දක්වා ම එය අත් නො හැරියේ නම් ඒකාන්තයෙන් ම ඉපදීම සිදුවන්නේ නරකයෙ. එම නිසා මෙය නියත මිථ්‍යා දෘෂ්ටියිය ලෙස හඳුන්වනු ලබනවා. මිථ්‍යා දෘෂ්ඨිකයෙකු එම දෘෂ්ඨිය

නිසා නොයෙක් අකුසල් කිරීමට යොමු වේ. ඒවා ද එකතු වී මිථ්‍යා දෘෂ්ටියීය විපාක දීමේ දී ආනන්තරීය කර්ම වලටත් වඩා බලවත් ලෙස විපාක විඳීමට සිදු වේ. ආනන්තරීය කර්ම කළවුන් කල්ප අවසානයේ දී නරකයෙන් මිදෙන නමුදු නියත මිත්‍යා දෘෂ්ඨිය ගත්තවුන් ලෝකය විනාශය සිදුවන අවස්ථාවේදී වෙනත් ලෝකයක නරකයක ඉපිද දුක් විපාක විඳීමට සිදු වේ. එමෙන්ම එසේ සිදුවන විපාකවල අවසානය පිළිබඳ නිශ්චිතව කිව නො හැකි ය.

බොහෝ අය මිථ්‍යා දෘෂ්ටියීක වීමට හේතුව එවැනි අය ඇසුරු කිරීමයි. එසේ මිසදිටු අය තමන්ගේ දෘෂ්ටිය අත්‍යන්ට රසවත් කොට පෙන්වා දී මෝඩ අයව ඒ දෘෂ්ඨියට යොමු කරවා ගන්නවා. සම්‍යක් දෘෂ්ඨිය ඇති අයෙකු මිථ්‍යා දෘෂ්ටිකයකු කිරීම තරම් විශාල අකුසල් සිදුවන ක්‍රියාවක් තවත් නැත. ධර්මයෙන් ඈත්ව වාසය කරන පුද්ගලයින් මෙවැනි අය ගේ උගුල්වලට පහසුවෙන් අසු වේ. එයට හේතුව ධර්මය නො දැනීම ම යි. කැරුණු කාරණා ධර්මානුකූලව නොබැලීම, මිසදිටු අයගේ දේශන වලට සවන් දීමෙන් ඔවුන්ගේ පොත්පත්, විද්‍යුත් සටහන් කියවීමෙන් නුවණ මඳ කෙනා මුලාවට පත්වෙලා මිථ්‍යා දෘෂ්ඨිකයෙක් වී අකුසල් සිද්ධ කර ගන්නවා. (උපුටා ගැනීම අවසන්).

**සටහනක්: "මහණෙනි, මිථ්‍යා දෘෂ්ඨිය වරදවල් අතරින් සියල්ලට ම මහත් වරද වේ" යන වැකිය ඉස්ලාම් දහමටත් 100% ක්ම ගැලපේ.** කර්ම ඵලදීම විශ්වාස කිරීම ඉස්ලාම් දහමේත් පෙන්වා දෙයි. නමුත් එය බුදුදහමින් පෙන්වාදෙන ආකාරයට සිදු නොවේ. එය හේතුඵල දහම නිවැරදිව අවබෝධ කරගැනීමෙන් සහ සොබා දහම යනු කුමක්දැයි හඳුනා ගැනීමෙන් නිවැරදි අවබෝධය ලබා ගත හැක.

බුදුන් වහන්සේගේ සමයේ මිත්‍යා දෘෂ්ඨි අදහස් 62ක් ගැන කරුණු ඉදිරිපත් කර ඇත. ඉන් ප්‍රධාන 10ක් පහත පරිදි වේ.

1. දුන්දේ විපාක නැත. 2. මහා දානවල විපාක නැත. 3. සකසා පිළිගන්වන දානයේ විපාක නැත. 4. කුසලාකුසල කර්මයන්ගේ විපාක නැත. 5. මෙලොවක් නැත. 6. පරලොවක් නැත. 7. හිත දියුණු කළ, ලෝකය අවබෝධ කළ ශ්‍රමණ

බ්‍රාහ්මණ වරු නැත. 8. මවක් නැත. 9. පියෙක් නැත. 10. ඕපපාතිකව උපදින සත්වයෝ නැත.

ඉහත අංක 8 සහ 9 මවක් නැත, පියෙක් නැත ලෙස සිතීම මිත්‍යා දෘෂ්ඨික තත්වයන්ය. (එනම්, ඉපදීමට මවෙක් පියෙක් [හෝ වෙනත් කුමන හෝ හේතුවක්] නැත යැයි විශ්වාස කිරීම මිත්‍යා දෘෂ්ඨික අදහසකි).

10. ඕපපාතිකව උපදින සත්වයෝ නැත ලෙස සිතීම මිත්‍යා දෘෂ්ඨික අදහසකි. (එනම්, [මවෙක් පියෙක් හෝ වෙනත් කුමන හෝ] හේතුවක් නැතිවත් ජීවීන් උපදී යැයි විශ්වාස නොකිරීමත් මිත්‍යා දෘෂ්ඨික තත්වයකි).

මෙහි (8, 9) සහ 10 එකිනෙකට විරුද්ධ [පරස්පර, නොගැලපෙන] අදහස් දෙකකි.

දේවධර්මයට අනුව දෙවියන් ඔහු කැමති ආකාරයට තම නිර්මාණ කරයි. දෙවියන්වහන්සේ ආකාර 4 කින් මිනිසුන්ගේ ශරීර නිර්මාණය කර ඇති බව අවසන් දිව්‍ය වදන් සහිත අල් කුරාණය තුලින් අපට දකින්නට පුළුවන.

1. කිසිම පුරුෂයෙකුගේ හෝ කිසිම ස්ත්‍රියකගේ සම්බන්ධයක් නොමැතිව. උදා:- ආදම් (අ.ස)
2. පුරුෂයෙකු පමණක් සම්බන්ධ කරගෙන. උදා:- හව්වා (අ.ස)/ ආදම්ගේ බිරිඳ
3. කාන්තාවක් පමණක් සම්බන්ධ කරගෙන. උදා:- යේසුස් වහන්සේ (ඊසා අ.ස)
4. පුරුෂයෙකු සහ ස්ත්‍රියකු යන දෙදෙනෙකු සම්බන්ධ කරගෙන. උදා:- ඔබ, මම වැනි අය.

එයට අනුව එහි මවෙක් නැත, පියෙක් නැත යන තත්ව පවා දැකිය හැක. එහෙත් කිසිවක් නැතිව ඕපපාතිකව බිහි වෙන බව එහි සඳහන් නොවේ. ඒවායේ බිහිවීමට හේතුව දෙවියන්ගේ බලයයි. ඕපපාතිකව ජීවීන් බිහිවීමට බලපාන පසුබිම කුමක්ද? හේතු-ඵල දහමට අනුව එවැන්නක් විය නොහැක.

කිතුනුවන්ට අනුව දෙවියන් වහන්සේ සම්බන්ධ "ත්‍රිත්වය" එනම්, යේසුස් වහන්සේ දෙවියන්මය (පියාය), ඔහු දෙවියන්ගේ පුත්‍රයාය, සහ දිව්‍ය ආත්මයය යන්න පිළි නොගෙන සිටීම ස්වර්ගය අහිමිකර ගැනීමට හේතු වේ. මෙය පැහැදිළි කළ නොහැකි මිත්‍යා දෘෂ්ඨිය තත්වයකි ව්‍යාකූල තත්වයකි. [කුරානය තුලින් දෙවියන්ම මෙම කියමන ප්‍රතික්ෂේප කර ඇත].

මුස්ලිම්වරුන්ට අනුව සියල්ලෙහි නිර්මාතෘ එකම දෙවියෙකි. ඔහුට සහායකයන්, දරුවන්, මව්පියන්, අවශ්‍යතාවයන්, දුර්වලතාවයන්, සමානකරුවන් ආදී කිසිවක් නැත. සියල්ල පැමිනියේ ඔහු වෙතින් වන අතර සියල්ල නැවත ඔහු වෙතම යා යුතුය. ඉන් පසු ඔහුගේ අවසන් විනිශ්චයට පසු මිනිසුන් ස්වර්ගය හෝ අපාය වෙත යොමු කරනු ඇත.

හින්දුවරුන්ට අනුව දෙවියන්ට තව තවත් සහායක දෙවිවරුන් හෝ දිව්‍ය අවතාර බොහෝමයක් ඇත.

ආගම් අදහන්නේ නැති අයට මෙලොව-පරලොව, කුසල්-අකුසල්, ස්වර්ගය-අපාය ආදිය ගැන පැහැදිළි අදහස් නැත.

**මෙයට අනුව මිනිසුන් පිටතින් එකම සත්ව විශේෂයක් ලෙස පෙනුනත් ඇතුලතින් ඔවුනොවුන් අතර නොගැලපීම් බහුලය.**

මෙය කාගේ වරද නිසා සිදු වූවක්ද? මෙය ඉහතින් බුදුදහම ආශ්‍රයෙන් උපුටා ගත් කරුණක් මෙහි නැවත පල කරමි. එය නම්, “බොහෝ අය මිථ්‍යා දෘෂ්ඨික වීමට හේතුව එවැනි අය ඇසුරු කිරීමයි. එසේ මිසදිටු අය තමන්ගේ දෘෂ්ටියීය අන්‍යාන්ට රසවත් කොට පෙන්වා දී මෝඩ අයව ඒ දෘෂ්ඨියට යොමු කරවා ගන්නවා”. එය නම් 100% ම සත්‍යයකි.

මිත්‍යා දෘශ්ඨියෙන් බැහර වන්නේ කෙසේද? හේතු-ඵල දහම සහ කර්ම-ඵල යාන්ත්‍රණය මගින් හැර මෙමට විසදුමක් සොයා ගත නොහැක.

කුසල් අකුසල් ඇත, විපාක ඇත, අපායක් ඇත, ස්වර්ගය ඇත, මෙලොව ඇත, පරලොව ඇත, විශ්වය ඇත, සොබාදහම ඇත, මට සිතීමට හැකියාවක් ඇත, මට ආත්මයක් ඇත, මට ශරීරයක් ඇත, මවක් ඇත, පියෙක් ඇත, නොපෙනෙන

ජීවීන් ඇත, නොපෙනෙන ලෝක ඇත, බුදුන් වහන්සේ සිටි බවට ජේසු තුමා සිටි බවට විශ්වාසයන් ඇත. මේ ආකාරයට අප මිනිසුන් වශයෙන් මේ සියල්ල විශ්වාස කරන්නන් නම්, මේවා හේතු-ඵල දහම සහ කර්ම-ඵල යාන්ත්‍රණය සමග ගලපා මිත්‍යා දෘෂ්ටිය පිළිබඳව එකඟතාවයකට පත් වන්න උත්සහ ගනිමු.

**1) හේතු-ඵල දහම නිවැරදිව වටහා ගැනීම.**

යමක් හට ගැනීමට නම් එයට හේතුවක් තිබිය යුතුමයි.

- බුදු දහමට අනුව; ඇත ඉතිහාසයේ කොහේ හෝ තිබුනාය කියන කුමන බඹ ලොවක් හෝ දෙව් ලොවක් හෝ කුමන ආකාරයක ජීවියෙක් හෝ ආරම්භ වී නොමැතිව තිබූ අවස්ථාවක, ඒවා ආරම්භ වීමට බලපෑ හේතු හෝ හේතුව ලෙස පෙන්වීමට ඇත්තේ කුමක්ද?
- මෙයට සාධාරණ පිළිතුරක් දිය නොහැකි නම් බෞද්ධ ඔබට මිත්‍යා දෘෂ්ඨී බේදවාචකයෙන් ගැලවීමට නොහැක. ඔබම ඒ තුල ගිලී ඇත. මෙයට පිළිතුරක් නොමැතිව ඔබට මිත්‍යා දෘෂ්ඨී සම්බන්ධව අර්ථකතන ඉදිරිපත් කළ නොහැක.
- අපායක් නැතැයි විශ්වාස කරන්නා මිත්‍යා දෘෂ්ඨිකයෙක් යැයි ඔබ පවසන්නේ කෙසේද අපාය නිර්මාණය උනේ කෙසේ දැයි සහ එහි පාලනය කෙසේ සිදු වන්නේදැයි ඔබ දන්නේ නැතිව?
- දන් දීමෙහි විපාක ගැන පවසන්නේ කෙසේද එම කුසල් අකුසල් සහ කර්ම ඵලදීමේ යාන්ත්‍රණය කෙසේ සිදුවන්නේදැයි ඔබ දන්නේ නැතිව?
- මෙලොව සහ පරලොව ගැන ඔබ අදහස් දක්වන්නේ කෙසේද මෙලොව සහ පරලොව හටගත් ආකාරය සහ ඒවායේ කළමණාකරන ස්වභාවය දන්නෙ නැතිව?
- ඕපපාතික ජීවීන් ඇතැයි යන්න විශ්වාස නොකරන්නා මිත්‍යා දෘෂ්ඨිකයෙක් යැයි ඔබ පවසන්නේ කෙසේද ඔවුන්ගේ ආත්ම සහ ශරීර නිර්මාණය වන ආකාර දන්නෙ නැතිව? ඕපපාතික ජීවීන් ඇත්නම් ඔවුන්ට හේතු-ඵල දහමකුත් නෑ, කර්ම-ඵල යාන්ත්‍රණයකුත් නෑ. එසේ නම් ඔවුන්ට බලපාන ධර්මතාවය කුමක්ද?

- අපගේ විශ්වය (හෙවත් අපගේ සොබාදහම) තුල විශ්ව ධර්මතාවයට පිටින් කිසිවක් සිදු නොවේ. විශ්ව ධර්මතාවය යනු හිස් වචන දෙකක් නොව. එය මනා සංවිධානාත්මක වැඩ සටහනකි. එම වැඩ පිළිවෙල ගැන නොදැන ඔබ සොභාදහම යනු කුමක්දැයි හඳුනා ගන්නේ කෙසේද?

එනිසයි මුළින්ම සඳහන් කළේ කිසිවක් නොමැති අවස්ථාවේ මේවා ආරම්භ වීමට බලපෑ හේතුව කුමක්දැයි හඳුනා ගැනීම කළ යුතු බව.

අප කතා කරන විශ්වයන්ට අදාල සියල්ලෙහි පදනම හෙවත් අත්තිවාරම එයයි. මිනිසා සාදාගත් සියළු දහම් පවතින්නේ එම අත්තිවාරම උඩයි. කුසල්-අකුසල් සහ කර්ම-ඵල යාන්ත්‍රණය පවතින අත්තිවාරමත් එයයි. එයයි හේතු-ඵල දහමේ හේතුව.

අප කතාකරන විශ්වයන්, ආත්මයන්, ජීවීන් සියල්ල හේතු සහිත ඵලයන්ය. ඒ සියල්ලෙහිත් පදනම හෙවත් අත්තිවාරම එයයි. එනම් 'ආරම්භයට හේතු රහිතව සදාකල් පවතින සර්වබලධාරී තත්වයයි'.

මේවා ඇති වීමට බලපෑ හේතු රහිත (සදාකල් පවතින සර්වබලධාරී) තත්වය ගැන පහත සටහනෙන් දක්වා ඇත.

මෙම හේතු රහිත තත්වයට අපි සර්වබලධාරී දෙවියන්වහන්සේ යැයි කියන්නෙමු. එවන් තත්වයකින් තොරව අවිද්‍යාවක් හෝ විද්‍යාවක්, සිතක්, ඒක සෛලික ජීවියෙක්, කුඩා හෝ ලොකු එක ආත්මයක්, එක පරමාණුවක් හෝ ඉලෙක්ට්‍රෝන වලාවක්, එක මූලද්‍රව්‍යයක් හෝ වෙන කුමක් හෝ ඉබේ හෝ වෙන ක්‍රමයකට හෝ හට ගැනීමට අවස්ථාවක් ඇත්නම් ඒ ගැන අපවත් දැනුවත් කරන්න.

**2) කර්ම-ඵල යාන්ත්‍රණය නිවැරදිව වටහා ගැනීම.**

මිත්‍යා දෘෂ්ඨියේ අතරමං වීමට බලපාන තවත් කාරණාවකි කුසල්-අකුසල් සහ කර්ම-ඵල යාන්ත්‍රණය ගැන පැහැදිලි අවබෝධයක් නොමැති කම. ජීවත්ව සිටියදී මෙය ගැනවත් දැණුමක් නැතිව අප මිය ගිය පසු අපේ ආත්මය ඉතා විශාල

(පුදුමාකාර) සංචාරයක නිරත වෙමින් අනන්තවාරයක් මැරි මැරී උපදින බවට අදහස් ඉදිරිපත් කරයි.

අපි සිතින් හෝ ගතින් කරන කුසලක් හෝ අකුසලක් නැවත එය (කර්මය ලෙස) අපටම පටිසන් දෙන තෙක් එය ගමන් කරන මාර්ගය හෙවත් කුසල් අකුසල් සහ කර්ම-ඵල යාන්ත්‍රණය කුමක්ද? මෙය නොදැන සිටින මිනිසා ගේ ආත්මය කොහොමද ඔහු මිය ගිය පසු සංසාරය ලෙසින් භවෙන් භවේ මේ ලෝකෙ හෝ බඹ ලෝකවල හෝ සැරි සරන්නෙ? එනම්, ශරීරයක් ඇති මිනිසාට වඩා ශරීරයක් නැති ආත්මය දක්ෂද?

මේවා සිදුවන ආකාර දෙවිඳුන් අපට පෙන්වා දී ඇත. ඒ සඳහා දේවදූතවරු (මලායිකාවරු) මැදිහත්ව කටයුතු කරයි. වැඩි විස්තර පහත සබැඳි දෙකෙහි ඇත.

කුසල් යාන්ත්‍රණය ගැන දැනගැනීම සහ පහසුවෙන් කුසල් රැස් කිරීම

කුසල්-අකුසල්/ කර්ම-ඵල ආදියෙහි යාන්ත්‍රණය ගැන වෙනත් ක්‍රමවේදයක් ඇත්නම් අපට දන්වන්න

### 3). අනාගතවක්තෘ හෙවත් නබිවරුන්ව සහ ඔවුන් ගෙනා දිව්‍ය පණිවිඩ විශ්වාස කිරීම

ඔබට ජීවිතේ පළමු වතාවට Smart දුරකථනයක් සහ Internet සම්බන්ධතාවය ලබා දුන්නා යැයි සිතමු. Google, Facebook, WhatsApp ආදිය ගැන ඔබ කිසිවක් දන්නෙත් නැහැ කියලා හිතමු. මේවා පරිහරණය කිරීමට නම් ඔබට ඒවායේ Manual කියවීමට සිදුවේ. එසේත් නැත් නම් ඒවා ගැන මීට කලින් දැගෙන සිටින කෙනෙකුගෙන් සහය ලබා ගැනීමට සිදුවේ. එසේ නොකර ඔබ විසින්ම (Manual පවා නැතිව) ස්ව-උත්සහයෙන් මේවා ක්‍රියාත්මක කරන්න පටන් ගත්තොත් එය කොතරම් අපහසු වේවිද? අපහසුවෙන් හෝ ඔබ ටිකක් දැන ගත්තත් ඔබට බොහෝ දේවල් මග හැරීමටද ඉඩ ඇත. සමහර විට දුරකථනය විනාශ වීමටද ඉඩ ඇත.

මිනිසා සම්බන්ධවද මෙවැන්නක් ඇත. බුදුන් වහන්සේ කල්ප ගනනක් තිස්සේ පෙරුම් පුරා අවසන් ජීවිතයෙත් ඉතා වෙහෙස වී සත්‍ය අවබෝධ කරගත් බව

පොත පතේ සඳහන් වේ. නමුත්, මිනිසා සම්බන්ධව සහ විශ්වය ඇතුළු නොපෙනෙන ලෝක ගැන දැන ගෙන සිටි නබිවරු මේ ලෝකෙ කොතරම්දෝ ඉඳලා තියෙනවා. දෙවිඳුන් සෑම සමාජයකටම නබිවරුන් එවා තිබෙන බව පවසා ඇත. නබිවරු සම්බන්ධව තොරතුරු මෙම පොතෙහිම ඇත. [සමහර විට බුදුන් වහන්සේද එවැනි උත්තමයෙක් විය හැක. නමුත් අදවන විට අප සතුව ඇති තොරතුරුවලට අනුව එසේ යැයි පිළිගැනීමට සාධක ප්‍රමාණවත් නැත].

නබිවරුන් සතුව (විශ්වය ගැන, මිනිසා ගැන, දෙවිඳුන් ගැන, නොපෙනෙන ලෝක ගැන) ඒවා වලට අදාල තොරතුරු සහ Manual (හෙවත් ඒවායේ නිර්මාතෘ විසින් පහළ කළ දිව්‍ය හෙළිදරව්වන්) සතුවී තියෙනවා. Manual භාවිතා කිරීම කොතරම් පහසුද සහ කොතරම් නිරවද්‍යද? මිනිසා වෙත දෙවිඳුන් පහළ කළ අවසන් දිව්‍ය හෙළිදරව්ව හෙවත් මිනිසාගේ Manual එක (මාර්ගෝපදේශය) ශුද්ධ වූ අල් කුරාණයයි. එය පහත සබැඳියෙත් ඇත. එය ඇස් මායිමේ තියෙද්දි සත්‍ය සොයන්න 'වෙනත් අවිනිශ්චිත හෝ දුරස්ථ මාර්ගවල යන්නේ ඇයි?' ඔබට දෙවියන්ව සහ ඔහුගේ උපදෙස් 'Sure නැද්ද'? එහෙම ප්‍රශ්නයක් තිබේ නම් එය පුද්ගලික ප්‍රශ්නයකි. එනිසා ඔබේම යහපත වෙනුවෙන් දෙවියන්ගේ මාර්ගයෙන් මේ ආකාරයට හෝ ලැබී ඇති තොරතුරු ඔස්සේ යමින් ඔබ දෙවියන් ගැන නොදන්නා දේ ඉගෙන ගන්න.

ආදම්ගේ දරුවනේ! (මගේ) දූතයින් ඔබගෙන්ම නියම වී, ඔබ වෙත පැමිණ, මගේ ආයාවන් ඇත්තෙන්ම ඔබට සමුදීරණය කර පෙන්වන විට, (ඒවාට සවන් දීමට ඔබගෙන්) කවුරුන් (අල්ලාහ්ට බිය වී පාපයන්ගෙන්) ඇත් වී පිළිසකර කර ගන්නෝද, ඔවුන්ට කිසිම බියක්ද නැත, ඔවුන් දුක් වන්නේද නැත. (7:35)

**4). මිත්‍යා දෘෂ්ඨිය සම්බන්ධව දෙවියන් පවසන දේ සහ උපදෙස්.**

දෙවියන්වහන්සේ මිනිසාගෙන් මෙසේ අසයි

*අහස් හිද භූමියෙහිද, ඔවුන්ට ඉදිරියෙන්ද පසුපසින්ද, ඇති දැය ඔවුන් අවධානය කර බැලුවේ නැද්ද?; (34:9) ඒවා කිසිවක් නොමැතිව තමන් විසින්ම ඇති කළෙහුද? නැතහොත් මොවුන්, තමන්ට තමන්ම නිර්මාණය කර ගත්තෙහුද? නැතහොත් අහස්ද භූමියද ඔවුන් නිර්මාණය කළෙහුද?; (52:35,36)*

පසුව දෙවියන්ම එයට දෙන පිළිතුර;

*නැත. මේ සියල්ල නිර්මාණය කළ අය දෙවියන්ය; (52:35,36)*

*(කිවෙකුගේ උදව්වක් නොමැතිව) අපගේ ශක්තිය මගින් අහස (විශ්වය) නිර්මාණය කළෙමු. නියත වශයෙන්ම අපි (එය ඔවුන්ගේ බුද්ධියට හසු නොවන සේ) අති විශාලවත් අන්දමට තබා ඇත්තෙමු. (ඇත්ත වශයෙන්ම, අපි එය පුළුල් කරන්නෙමු." (51:47)*

ආත්මය ගැන දෙවියන් පවසන දේ;

*(නබියේ!) "රූහ් (ආත්මය)" ගැන (යුදෙව්වන් වන) ඔවුන් ඔබගෙන් විමසන්නාහ. එයට ඔබ "එය අපගේ දෙවියන්ගේ නියෝගයෙන් ඇති වන්නකි. (ඒ ගැන) ඉතාමත් අල්ප ඥානයක් මිස, ඔබට දෙනු ලැබුවේ නැත. (එබැවින් එහි ගැඹුරු අදහස ඔබට දැන ගැනීමට නොහැකිය)" යැයි පවසනු මැනව! (17:85)*

[එයට අනුව ආත්මය ගැන මිනිසාට සියළු තොරතුරු දැනගැනීමට හැකියාවක් ද නැත].

දැනුම රහිතව මිනිසුන් දෙවියන් ගැන තර්ක කරන බව

*(මිනිසුණේ!) "අහස්හිද, භූමියෙහිද, ඇති දෑය නියත වශයෙන්ම දෙවියන් ඔබට වසඟ කර දී ඇත්තේය" යන්නද, ඔහු තම වරප්‍රසාදයන් ගුප්තවද, ප්‍රසිද්ධියේද, ඔබ කෙරෙහි පහළ කර ඇත්තේය යන්නද, ඔබ දුටුවේ නැද්ද? මේ සියල්ල මෙසේ තිබියදී මිනිසුන්ගෙන් සමහරෙක් අධ්‍යාපන දැනුම හෝ තර්කානුකූල ඍජු මාර්ගය හෝ ආලෝකමත් ධර්ම ග්‍රන්ථයෙහි (කුරාන්හී) සාධකයන් හෝ නොමැතිව අල්ලාහ් (දෙවියන්) ගැන (නිකරුණේ) තර්ක කරන්නාහ. (31:20)*

දැනුම සම්බන්ධව මිනිසුන් කුමක් කළ යුතුද යන්න;

*විශ්වාසවන්තයිනි! ඔබ අල්ලාහ්වද, ඔහුගේ දූතයාවද, ඔහු තමන්ගේ මෙම දූතයා වෙත පහළ කළ ධර්මයද, මෙයට පෙර තිබූ ධර්මයන්ද විශ්වාස කරනු. කවුරුන් අල්ලාහ්වද, ඔහුගේ මලායිකාවරුන්වද, ඔහුගේ ධර්මයන්ද, ඔහුගේ දූතයන්වද,*

*අවසාන දිනයද ප්‍රතික්ශේප කරන්නේද, ඔහු නියත වශයෙන්ම ඉතාමත් ඈත් වූ දුර්මාර්ගයෙහිම ගමන් කරන්නේය (4:136)*

මිනිසාට අවශ්‍ය තරමට සම්පූර්ණ ලෙස දැනුම හා උපදෙස් ලබා දී ඇති බව;

*මිනිසුන්ට හොඳ වැටහීමක් ලබා ගැනීම පිනිසම මෙම කුරානය නියත වශයෙන්ම අපි ඉතාමත් පහසු කර ඇත්තෙමු. එබැවින් (මෙමඟින්) හොඳ වැටහීමක් ලබන්නන් කවුරුන් හෝ ඇත් ද? (54:17)*

*(පින් පව්) මාර්ගයන් දෙකම අපි ඔහුට වෙන්කර දැණුම් දුන්නෙමු (90:10) නියත වශයෙන්ම ඍජු මාර්ගය පෙන්වීම අපගේ යුතුකම වන්නේය, (නියත වශයෙන්ම මෙලොවද පරලොවද අපගේමය. (92:12.13)*

*නබියේ!) නියත වශයෙන්ම අපි මිනිසුන්ගේ යහපත සඳහාම සම්පූර්ණයෙන්ම සත්‍යයයෙන් පිරි මෙම ධර්මය ඔබ වෙත පහළ කළෙමු. එබැවින් කවුරුන් (මෙය) අනුගමනය කර කටයුතු කරන්නේද, ඔහුටම එය හොඳකි. කවුරුන් එයින් මාර්ගය වැරද යන්නේද, එය ඔහුටම නපුරක් වශයෙන් අවසන් වනු ඇත. (නබියේ!) ඔබ ඔවුන්ව (ඍජු මාර්ගයෙහි යන ලෙස මෙන් බල කර), බේරා ගන්නෙකු නොව. (39:41)*

*(නබියේ!) ඔබ මෙසේ පවසනු; "(සම්පූර්ණයෙන්ම) සත්‍යය වූ (මෙම ධර්මය) ඔබගේ දෙවියන් විසින් පහළ කරන ලදී" කැමැත්තන්ට මෙය විශ්වාස කළ හැකිය, අකැමැත්තන්ට (මෙය) ප්‍රතික්ෂේප කර දැමිය හැකිය". (නමුත් මෙම ප්‍රතික්ෂේප කරන) අපරාධකාරුවන්ට නියත වශයෙන්ම අපි නිරයම පිළියෙල කර ඇත්තෙමු; (18:29)*

*(නබියේ!) "කවුරුන් (මෙම ධර්මය) විශ්වාස කර, (මෙහි සඳහන්ව ඇති අන්දමට) දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ට නියත වශයෙන්ම (ස්වර්ගයන්හී) දිය දහරා සදාකල් ගලමින් ඇති උයන් වතු ඇත" යැයි ඔබ සුභාරංචි දෙනු මැනව (2:25)*

---

# ඉස්ලාමය සහ වෙනත් ආගම්

ඉස්ලාම්, විශ්වයේ මැවුම්කරු කේන්ද්‍රකරගත් ඒක දේවවාදී දහමකි. එහෙත් ඉස්ලාම් නොවන ආගම්වල මෙම තත්වය දැකිය නොහැකිය. තවද ඉස්ලාමයේ ඇති තවත් විශේෂත්වයක් වන්නේ එය දෙවියන්ගෙන් පහළ වූ ආකාරයටම ආරක්ෂා කොට තිබීමයි. එම හේතුවෙන් එහි මිනිසාගේ ඇඟිලි ගැසීම් දැකිය නොහැකිය.

ඉස්ලාම් ආගම ආදම් නබි තුමාට පහළ වූ අනපනත් වලින් ආරම්භ වී මුහම්මද් නබිතුමාට පහළ වූ අල් කුරානය මගින් අවසාන වන්නේය. ඒ අනුව අල් කුරානයට පෙර පහළ වූ සෑම ආගමකම මුහම්මද් නබි තුමාගේ පැමිණීම ගැන සඳහන් වී ඇත. තවද අල් කුරානය පහළ වීමත් සමග ඉස්ලාම් දහම පූර්ණත්වයට පැමිණ තිබේ. එම නිසා අල් කුරානයෙන් පසු තවත් ආගම පුස්තක මෙලොවට පහළ වන්නේ නැත.

ලොව ඇති සෑම ප්‍රධාන ආගමක්ම අල්ලාහ්ගෙන් පහළ වූ ඒවාය. එහෙත් අල් කුරානය හැර අනෙක් දහම් පුස්තක මිනිසා විසින් වෙනස් කොට තිබේ. සමහර ආගම්වල කොටස් අතුරුදහන් වී ඇත. මේ නිසා ඒවායේ සම්පූර්න පණිවිඩය දැක ගැනීමට නොහැකි වී ඇත. තවද ඒවායින් බොහොමයක්ම ඇත්තේ වෙනත් භාෂාවෙන්ට සිදුකල පරිවර්තනයන්ය. මේ නිසා ඒවායේ පරිවර්තන දෝෂයන් ඇතුලත් වීම වැළැක්විය නොහැකි කරුනකි.

අල් කුරානය දේව පණිවිඩයක් බව සනාථ කිරීම සඳහා අවශ්‍යකරන හේතු සාදක එය තුලම අන්තර්ගත කොට තිබීම එහි ඇති විශේෂත්වයකි. බොහෝ ආගම්වල එවැනි ක්‍රමයක් දැකිය නොහැකිය. මේ නිසා ඕනෑම කෙනෙකුට අල් කුරානය ගවේෂණය කිරීමෙන් එහි සත්‍යතාවය පිරික්සිය හැකිය. අල් කුරානය ගවේෂණය කිරීම සඳහා පහත සඳහන් වැකියෙන් ආරාධනා කොට තිබේ.

*"ඔවුන් මෙම කුර්ආනය පර්යේෂණය කර බැලිය යුතු නොවේද? නැතහොත් (ඔවුන්ගේ) හෘදයන් කෙරෙහි අගුලු දමා ඇත්තේද? ඇත්තෙන්ම කවුරුන් හට ඍජු මාර්ගය මෙය යැයි පැහැදිලි වූවායින් පසුව ඔවුන් ආපස්සට හැරී ගියෝද*

*ඔවුන්ගේ වැරදි අදහස් සාතාන් විසින් පුළුල් කොට ඔවුන් හට ඒවා අලංකාරවත් කළේය. මන්ද යත් ඇත්තෙන්ම ඔවුන් අල්ලාහ් පහළ කල (මෙම පුස්තකය) පිළිකුල් කර "අපි සමහර කාරනාවන්හි ඔබවම අනුගමනය කරමු"යි පවසන නිසාය. ඔවුන්ගේ එම රහස් අල්ලාහ් හොඳින් දන්නේය" (47: 24-26).*

ඉහත සඳහන් කුර්ආන් වැකිය නිසා ඕනෑම කෙනෙකුට ඉස්ලාම් දහම වැළඳ ගැනීමට පෙර ඒ ගැන ගවේෂණයේ යෙදීමට පූර්ණ අයිතිය ලැබෙන්නේය. ඉන් ප්‍රයෝජන ගැනීම මිනිසාගේ වගකීමකි. තවද අල් කුරානය පහළ වී ඇත්තේ එක් ජන කොට්ටාසයකට නොවීම එහි ඇති තවත් විශේෂත්වයකි.

ඉස්ලාම් දහමින් මිනිස් වර්ගයාට නිවැරදි මාර්ගය පෙන්වා දෙන්නේය. එහෙත් එම දහමේ බල කිරීමක් නොමැත. එම නිසා ඕනෑම කෙනෙකුට තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස තිබේ. එහෙත් ඔහු ගන්නා තීරණය ගැන ඔහු වගකීම දැරිය යුතුය.

පදනම් විරහිතව ඉස්ලාම් දහම විවේචනය කරන අයගේ හෘදයන්හි අල්ලාහ් මුද්‍රා තබන බව පහත දැක්වෙන කුර්ආන් පාඨයේ සඳහන් වේ.

*"තමන් වෙත පැවරුණු බලයක් නොමැතිව අල්ලාහ්ගේ කිසිම ආයාවක් ගැන තර්ක කිරීම; අල්ලාහ් වෙතද විස්වාස කල අය වෙතද ඉතාමත් පිළිකුල් සහගතය. එබැවින් ආඩම්බරය හා උඩඟුකම ඇති සෑම කෙනෙකුගේම හෘදයන්හි අල්ලාහ් මුද්‍රා තබන්නේය" (කුරානය 40:35).*

මෙවැනි අයට කුරානයේ මග පෙන්වීම වැළකී යන්නේය. එය ඔවුන් ලබන විශාල පාඩුවකි. ඔවුන් එය තේරුම් ගන්නේ මරණයෙන් පසුව නම් තවත් පාඩුවකි.

---

# මැවුම්වාදය පිළිගනන්වාද? භෞතිකවාදය පිළිගන්නවාද?

විශ්වය දෙවියන්ගේ මැවීමක් බව මැවුම්වාදීහු කියති. විශ්වය ඉබේ ඇතිවූ බව භෞතිකවාදීහු කියති. මේ දෙකෙන් කුමක් හරිදැයි අපි විමසා බලමු.

විද්‍යාඥයින් දැනට සොයාගෙන ඇති පරිදි විශ්වයට ආරම්භයක් ඇත. එසේ නම් එය ආරම්භ වීමට ක්‍රමයක්ද තිබිය යුතුය. මේ සඳහා මැවුම්වාදීහු පවසන්නේ දෙවියන් එය මැවූ බවයි. භෞතිකවාදීන් පවසන්නේ එය ඉබේ ඇතිවූ බවයි. කෙසේ වෙතත් විශ්වය ගැන හැදෑරීමේදී පෙනී යන්නේ එය යම්කිසි ඥානාන්විත දෙවිකෙනෙකුගේ මැවීමක් බවයි.

මැවුම් වාදීන් ඉදිරිපත් කරන වාදය සත්‍යය එකක් බව පෙන්වීම සඳහා නබිවරුන් විසින් ප්‍රාතිහාරයන් පා ඇත. එවැනි ප්‍රාතිහාරයන් නබිවරුන්ටම මිස වෙන කිසිවෙකුට කළ නොහැකි වීමෙන් පෙන්නුම් කරන්නේ ඔවුන් පවසන දේ සත්‍යය බවයි. එම ප්‍රාතිහාරයන් පිටුපස දෙවියන්ගේ හස්තය ක්‍රියාත්මක වන්නේයැයි ඔවුන් පවසති. මේ අනුව ජේසු තුමාගේ ඉපදීමම ප්‍රාතිහාරයකි. ඔහු තොටිල්ලෙදි කතාකොට ඇත. මළවුන් නැගිටුවා ඇත. උපතින්ම අන්ද වූ අයට පෙනුම ලබා දී ඇත. එසේම ජේසු තුමාට පෙර පැමිණි නබිවරුන්ද ප්‍රාතිහාරයන් පා තිබේ. ජේසු තුමාට පසුව පැමිණි මුහම්මද් නබිතුමාද ප්‍රාතිහාරයන් පා ඇත. මුහම්මද් නබිතුමාට ලැබී ඇති අල් කුරානය අදටත් ප්‍රාතිහාරයකි. එහි ඇති අභියෝගයන් කිසිවක් මෙතෙක් කිසිවෙකු විසින් ජය ගෙන නොමැත.

අනෙක් අතට භෞතිකවාදීන් විශ්වයේ බිහිවීම සම්බන්දයෙන් මත පමණක් ඉදිරිපත් කරති. කාලයෙන් කාලයට ඒවා වෙනස් කරති. මහා පිපිරුමකින් විශ්වය බිහිවූ බව එක්තරා කලකදී ඔවුන් විසින් පැවසුහ. දැන් පවසන්නේ විශ්වය ඉබේ බිහිවූ බවයි. අනාගතයේ දී වෙනත් මතයක් ඉදිරිපත් කිරීමට ඉඩ තිබේ. කෙසේ වෙතත් මෙම කිසිම මතයක් ඔප්පු කිරීමට හැකි ඒවා නොවේ.

සුප්‍රසිද්ධ ඇමරිකානු විද්‍යාඥයෙකු වූ ස්ටෙෆාන් හෝකින් මහතා විශ්වය දෙවියන්ගේ මැවීමක් බව ඔහුගේ එක් කෘතියකින් ප්‍රකාශ කොට තිබුනේය. එම

විද්‍යාඥයා දැන් පවසන්නේ විශ්වය ඉබේ ඇතිවූ එකක් බවයි!!! එහෙත් මෙම මතය බොහෝ විද්‍යාඥයින් විසින් පිළිගන්නේ නැත.

ඉහත කරුණු අනුව විශ්වයෙන් ඔබ්බට සිටින දෙවිකෙනෙකු ගැන මිනිසාට සිතිය යුතු වන්නේය. ඔහු විශ්වය සහ එහි ඇති සියළුම දේවල් මවා තිබිය යුතුය. ඔහු විශ්වය තුල නොමැති බැවින් ඔහු ගැන දැනගැනීමට ඇති එකම ක්‍රමය ඔහු විසින් එවන ලද පණිවිඩයක් හැදෑරීම ය. එහෙත් භෞතිකවාදීන් පවසන්නේ ඔවුන්ගේ අදහස් පමණි.

මැවුම්වාදය පිළිගැනීමෙන් මිනිසාට ජීවිතය ජය ගත හැකි ය. එහෙත් භෞතිකවාදීන්ට මරණයෙන් පසු ජීවිතය ගැන පැවසීමට නොහැකිය. මැවුම්වාදීන් පවසන දේ පිළිගැනීමෙන් මෙලොව ජීවිතය පමණක් නොව මරණයෙන් පසු ජීවිතයත් ජය ගැනීමට හැකිය. එහෙත් භෞතික වාදීන් පවසන දේ පිළිගැනීමෙන් මරණයෙන් පසු ජීවිතයේදී විශාල පාඩුවක්ම සිදු විය හැකිය.

---

## මියගිය හදවත් වල අධ්‍යාත්මික බංකොලොත්භාවය.

මිනිස් හදවත භෞතික මෙන්ම චිත්තවේගීය ඉන්ද්‍රියක් ලෙස සැලකිය හැකිය. එය මිනිස් සෙනෙහසේ ආසනය ද වේ. එමගින් මිනිසාගේ මනස, ශරීරය හා ආත්මය සම්බන්ධ කරන්නේය. අල් කුරානයට අනුව මිනිස් හදවත ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරන්නේය. ඇතැම් ඉස්ලාමීය විද්වතුන් එය ආත්මය ලෙසද නම් කොට ඇත. ඒ අනුව හදවත අන්ද වීම මිනිසාගේ අධ්‍යාත්මික ජීවිතය විනාශයට පත් වීමට හේතුවකි. මිනිසාගේ ඇස් දෙකම අන්ද වුවත් හදවත අල්ලාහ් කෙරෙහි විශ්වාසය තුලින් ජීවමාන වේ නම් ජීවිතය ජය ගැනීමට හැකි වන්නේය. ඇයිද යත් අධ්‍යාත්මික හදවත අන්ද වූ කෙනෙකුට කොපමණ උපදෙස් දෙනු ලැබුවත් ඉන් ප්‍රයෝජනයක් අත් නොවන නිසාය. හදවත අන්ද වීමට ප්‍රධාන වශයෙන් බල පාන්නේ මිනිසා කරන අකුසල් ක්‍රියාවන් වේ.

මිනිස් ආත්මය අශ්වාරෝහකයෙකුට උපමා කළ හැකිය. ඒ අනුව අශ්වාරෝහකයා ශක්තිමත් වන තරම අනුව අශ්වාරෝහකයාට අශ්වයා හැසිරවිය

හැකි වන්නේය. ඒ අකාරයටම ආත්මය ශක්තිමත් වන තරම අනුව මිනිසාට නිවැරදි මාර්ගයේ ගමන් කිරීමට හැකි වන්නේය. එසේ තිබියදී අද බොහෝ අය කාය වර්ධනය සඳහා නොයෙකුත් ව්‍යායාම වල යෙදුනත් ආත්මීය වර්ධනය සඳහා කිසිවක් කරන්නේ නැත. එහි ප්‍රතිපලය වන්නේ හදවත මිය යාමයි. කෙසේ වෙතත් සෑම කෙනෙකුටම මරණය නියතය. මරණයෙන් පසු හදවත මිය යාමේ භයානක ප්‍රතිපල දැක ගැනීමට හැකි වනු ඇත. එහෙත් එම අවස්ථාවේදී එය ප්‍රමාද වැඩිය.

*"කව්රුන්ගේ සිත්හි රෝග ඇත්තේද ඔවුන්ටද, සිත් දැඩිවූවන්ටද, සාතාන් දැමූ දෙය පරීක්ෂාවක් කරන්නේය. නියත වශයෙන්ම අපරාධකරුවෝ සත්‍යයේ සිට ඉතා දුරස්ව සිටින්නෝය. නියතවශයෙන්ම දැනුම දෙනු ලැබූවන් මෙය (කුරානය) නුඹගේ 'රබ්' ගෙන් ලැබුණු සත්‍යය බව දැන, එය ඔවුන් විශ්වාස කර ඔවුන්ගේ සිත් ඔහුට අවනත කර ගනු ඇත. නියතවශයෙන්ම අල්ලාහ් විශ්වාස කළවුන්ව ඍජු මාර්ගයේ යැවීමට ප්‍රමාණවත් ය" (කුරානය 22:53-54).*

මේ නිසා ප්‍රතික්ෂේප කරන්නන් මරණය දක්වාම සත්‍යය දැනගැනීමට උත්සහ කරන්නේ නැත.

කෙනෙකුට ලෞකික දැනුම තිබීමෙන්ම පමණක් අධ්‍යාත්මික සත්‍යය දැනගත හැකි වන්නේ නැත. එබැවින් ලෞකික දැනුම ඇති බොහෝ අය මිරිඟුවක් පසු පස හඹා යන අකාරයටම ලෞකික දේවල් පසුපස පමණක් හඹා යන්නෝය. අවසානයේදී ඔවුන් නතර වන්නේ කිසිවෙකුගේ පිහිටක් නොමැති අවාසනාවන්ත තැනකය. එවිට තමන්ව මුලා කල කිසිවෙකු උදව්වට පමිනේන්නේද නැත. ලෞකික ජීවිතයේදී මුලාවට පත් වූවන්ට සහ මුලාවට පත් කලවුන්ට අත්වන්නේ සදාකාලික නිරය වේ. ඇයිද යත් ඔවුන්ට දෙනු ලැබූ උපදෙස් වලට ඔවුන් කන් දුන්නේ නැත. ඔවුන් ගැන අල් කුරානයේ මෙසේ පවසා ඇත.

*"(නබියේ!) ඇත්තෙන්ම කව්රුන් හෝ (මෙම ග්‍රන්ථය) අවිස්වාස කරන්නෝද ඔබ බිය ගන්වා අවවාද කලේද අවවාද නොකළේද ඔවුන්ට එය එක සමානය. ඔවුන් කිසිසේත් විස්වාස කරන්නේම නැත. (එබැවින්) ඔවුන්ගේ සිත් තුලද*

*ඔවුන්ගේ කන් තුලද අල්ලාහ් මුද්‍රා තබා ඇත්තේය. ඔවුන්ගේ දෘෂ්ඨියෙහිද තිරයක් ඇති කළේය. තවද ඔවුන්ට දැඩි දඬුවම්ද ඇත" (කුරානය 2:6,7).*

මිනිසා තමන් සිටින මතයේම නොසිට සත්‍යය සොයා දැනගැනීමට උත්සාහ කල යුතුය. ඇයිද යත් මිනිසාට ලැබී ඇත්තේ එක් ජීවිත කාලයක් පමණක් වන නිසාය. එය නිවැරදිව තේරුම් ගෙන ක්‍රියා කරන්නේ නම් මරණයෙන් පසු නිමක් නොමැති ජීවිතය ජය ගැනීමට හැකි වනු ඇත. එසේ නොකළේ නම් නිමක් නොමැති නිරයට පාත්‍ර වනු ඇත. එය ඉතා අවාසනාවන්ත තත්වයක් නොවේද?

---

## ආගමක් නිවැරදි වන්නේ කෙසේද?

ආගමක් යන්නෙන් අදහස් කරන්නේ සර්වබලධාරී දෙවියන් විසින් පහළ කරන ලද මාර්ගෝපදේශයකි. ලෝකයේ මෙවැනි ආගම් බොහෝ ඇත. කෙසේ වෙතත් නබිවරුන්ගේ අභාවයෙන් පසු ජනතාව විසින් නබිවරුන් ගෙනෙන ලද ආගම් වෙනස් කොට ඇත. එම නිසා නිවැරදි දහම කුමක්දැයි සොයා දැනගැනීම මිනිසාට පැවරෙන ප්‍රධාන වගකීමකි.

විශ්වය ගැන හැදෑරීමේදී පෙනී යන්නේ එය එක් දෙවිකෙනෙකුගේ මැවීමක් බවයි. ඒ අනුව නිවැරදි දහමකින් එක් දෙවිකෙනෙකු ගැන පමණක් ප්‍රකාශ විය යුතුය. බහු දේව වාදී ආගමක් විශ්වය මවන ලද සර්වබලධාරී දෙවියන්ගෙන් පහළ විය නොහැකිය. තවද නිවැරදි ආගමක් පහත දැක්වෙන කරුණු සපුරා තිබිය යුතුය.

- එම දහම දෙවියන්ගෙන් පහළ වූ බවට සාක්ෂි තිබිය යුතුය
- දහම පහළ වූ මල් භාෂාවෙන්ම තිබිය යුතුය. එසේ නොවුවහොත් එහි මිනිස් අදහස් ඇතුලත් විය හැකිය
- එම දහම කිසිම වෙනසකට භාජනය නොවූ බවට සහතික කල හැකි විය යුතුය
- මිනිසුන්ගේ උවමනාවන් පරිදි කාලෙන් කාලෙට වෙනස් නොවී තිබිය යුතුය

- ➢ දහම තුල කිසිම පරස්පරතාවයන් නොතිබිය යුතුය
- ➢ එම දහමේ ඇති නීති යල් පැනගිය ඒවා නොවිය යුතුය
- ➢ දහම පහළ වූ යුගයේ පැවති අවිද්‍යාත්මක කරුණු දහම ලෙස ඉදිරිපත් නොවිය යුතුය
- ➢ දෙවියන් පිලිබඳ නිවැරදි අර්ථදැක්වීම දහම මගින් ඉදිරිපත් විය යුතුය. එසේ නැතහොත් දහමකින් බලාපොරොත්තු වන දේ ඉටු වන්නේ නැත.
- ➢ දහමින් තම ඉලක්කය ලඟා කර ගන්නා මාර්ගය ඉතා නිවැරදිව ඉදිරිපත් කොට තිබිය යුතුය.

මෙම කරුණු යම්කිසි දහමක ඇතුලත් වන්නේ නම් එය නිවැරදි දහමක් වන්නේය. එබැවින් එවැනි දහමක් පිලිපැදීමෙන් මිනිසාට විමුක්තිය ලඟා කර ගත හැකි වනු ඇත.

මිනිස් ජීවිතයේ අභිමතාර්ථය දැනගත හැක්කේ නිවැරදි දහමක් තුලින්ය. එබැවින් නිවැරදි දහමක අවශ්‍යතාවය සෑම මිනිසෙකුටම බල පවත්නේය. මිනිසා ඉබේ ඇතිවූ බව ඔප්පු කල හැකි නම් පමණක් එවැනි කෙනෙකුට දහමක් අවශ්‍ය වන්නේ නැත. එහෙත් කිසිම කෙනෙක් එවැනි දෙයක් ඔප්පු කොට නොමැත. එසේ නම් මිනිසා තම මැවුම්කරුවා ගැන දැනගත යුතු නොවේද? ඔහුගේ අණ පිළිපැදිය යුතු නොවේද? මිනිසාගේ මුරණ්ඩු කම නිසා දෙවියන්ට අවනත නොවුයේ නම් ඔහුට මරණයෙන් පසු කුමක් සිදු වේද? එබැවින් මේවට මුහුණ දීමට සුදානම වීම මිනිසාගේ පරම වගකීමකි.

---

# ආගම්වල බෙදීම්

1. ක්‍රිස්තියානි දහමේ බෙදීම්
2. බුදු දහමේ බෙදීම්
3. ඉස්ලාම් දහමේ බෙදීම්
4. යුදෙව් දහමේ බෙදීම්
5. හින්දු දහමේ බෙදීම්

# ක්‍රිස්තියානි දහමේ බෙදීම්

කිතුනුවන් යනු විවිධ නිකායන් ඇතුළුව, යේසුස් ක්‍රිස්තුස් වහන්සේව විශ්වාස කරන සියලුම පුද්ගලයින් සහ කණ්ඩායම් ඇතුළත් වේ.

''කිතුනුවා'' යන යෙදුම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සහ ඔහුගේ ඉගැන්වීම්වල අනුගාමිකයෙකුට යොමු දක්වයි. කිතුනුවන් දෙවියන් වහන්සේගේ පුත්‍රයා සහ මනුෂ්‍යාත්වයේ ගැලවුම්කරුවා ලෙස යේසුස් වහන්සේගේ දේවත්වය විශ්වාස කරයි. ඔවුන් බයිබලයේ දක්වා ඇති මූලික මූලධර්මවලට අනුගත වන අතර, නව ගිවිසුම කෙරෙහි අවධානය යොමු කරන අතර, එය යේසුස් වහන්සේගේ ජීවිතය, ඉගැන්වීම්, මරණය සහ නැවත නැඟිටීම විස්තර කරයි. කිතුනු ඇදහිල්ලේ කේන්ද්‍රීය වන්නේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල තුළින් ගැලවීම පිළිබඳ විශ්වාසය සහ ප්‍රේමය, අනුකම්පාව සහ සමාව දීම පිළිබඳ ඔහුගේ ඉගැන්වීම්වලට අනුකූලව ජීවිතයක් ගත කිරීමේ වැදගත්කමයි.

කෙසේ නමුත් කාලයත් සමග විවිධ හේතූන් මත ඔවුන් විවිධ කන්ඩායම් ලෙස බෙදී තම ආගමික ඇදහිල්ල තුල සිටී. එම බෙදීම් පහත ආකාරවලින් දැකිය හැක.

- කතෝලික - (මුළු ක්‍රිස්තියානි ජනගහනයෙන් 50.1%)
- ප්‍රොතෙස්තන්ත/ රෙපරමාදු- (මුළු ක්‍රි; ජනගහනයෙන් 50.1%)
- නැගෙනහිර ඕතඩොක්ස් - (මුළු ක්‍රිස්තියානි ජනගහනයෙන් 50.1%)
- පෙරදිග ඕතඩොක්ස් - (මුළු ක්‍රිස්තියානි ජනගහනයෙන් 50.1%)
- වෙනත් - (මුළු ක්‍රිස්තියානි ජනගහනයෙන් 50.1%)

**කතෝලික**

කතෝලික යන්නෙන් විශේෂයෙන් රෝමානු කතෝලික පල්ලිය විසින් පාලනය කරනු ලබන විශ්වාසයන් සහ පිළිවෙත් පිළිපදින අය ගැන සඳහන් වේ.

"කතෝලික" යන වචනය ව්‍යුත්පන්න වී ඇත්තේ "විශ්වීය" යන අර්ථය ඇති "කතොලිකොස්" යන ග්‍රීක වචනයෙන් වන අතර එහි අර්ථය ඇඳහිල්ලේ ගෝලීය ස්වභාවය අවධාරණය කිරීමයි.. කතෝලික ධර්මය ක්‍රිස්තියානි ධර්මයේ විශාලතම ශාඛාව වන අතර, එහි මූලාරම්භය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය හා ඉගැන්වීම් දක්වා දිවෙන අතර පාප්තුමාගේ නායකත්වයෙන් යුත් අතර එහි මධ්‍යම මූලස්ථානය වතිකානු නගරයේ පිහිටා ඇත. බව්තීස්මය සහ දිව්‍ය සත්ප්‍රසාදය වැනි සක්‍රමේන්තු, සාන්තුවරයන්ගේ (විශේෂයෙන් මරියා, සාන්ත පීතර්) මැදිහත්වීම සහ පූජනීය ශුද්ධ ලියවිල්ලෙන් මඟ පෙන්වීම, පූජනීය සම්ප්‍රදාය සහ පල්ලියේ මැජිස්ටීරියම් (ඉගැන්වීමේ අධිකාරිය) වැනි ප්‍රධාන අංග අතර වේ. කතෝලික ධර්මය කේන්ද්‍රගත වී ඇත්තේ ශාන්ත පීතරගේ අනුප්‍රාප්තිකයා සහ පල්ලියේ අධ්‍යාත්මික නායකයා ලෙස සැලකෙන පාප් වහන්සේගේ අධිකාරිය පිළිබඳ විශ්වාසය මත ය. කතෝලිකයන් බයිබලයේ ඉගැන්වීම් මෙන්ම පල්ලිය විසින් ස්ථාපිත කරන ලද සම්ප්‍රදායන් සහ මූලධර්ම, සක්‍රමේන්තු, පූජනීය නමස්කාරය සහ සාන්තුවරයන්ගේ ගෞරවය ඇතුළුව පිළිපදිති. දෙවියන් වහන්සේගේ කරුණාව අත්විඳීමේ මාධ්‍යයක් ලෙස සම්ප්‍රදායේ වැදගත්කම, පූජක පක්ෂයේ කාර්යභාරය සහ සක්‍රමේන්තු කෙරෙහි කතෝලික පල්ලිය දැඩි අවධානයක් යොමු කරයි. පොහොසත් ඉතිහාසයක් සහ එකමුතුකම සහ අඛණ්ඩතාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, කතෝලික ධර්මය සියවස් ගණනාවක් පුරා ක්‍රිස්තියානි දේවධර්මය, ආචාර ධර්ම සහ අධ්‍යාත්මිකත්වයේ වර්ධනය හැඩගැස්වීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇත. සියලුම කතෝලිකයන් ක්‍රිස්තියානීන් බව මතක තබා ගන්න, නමුත් සියලුම කිතුනුවන් කතෝලිකයන් නොවන බව මතක තබා ගන්න. පාප් වහන්සේ රෝමයේ රදගුරුවරයා වන අතර ලොව පුරා කතෝලික පල්ලි කෙරෙහිද ප්‍රධානියා වේ.

**ප්‍රොතෙස්තන්ත/ රෙපරමාදු**

16 වන සියවසේ ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයේදී කතෝලික පල්ලිය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ ක්‍රිස්තියානි ධර්මයේ ප්‍රධාන ශාඛාවක් වන්නේ රෙපරමාදු ආගමයි. ආගමික සත්‍යය සඳහා අවසාන අධිකාරිය

බයිබලය බවත්, ගැලවීම ලැබෙන්නේ ඇදහිල්ල තුළින් පමණක් දෙවියන් වහන්සේගේ කරුණාවෙන් බවත්, සියලුම ඇදහිලිවන්තයන්ට දෙවියන් වහන්සේ සමඟ සෘජු සම්බන්ධතාවයක් ඇති බවත් විශ්වාස කිරීම මගින් එය සංලක්ෂිත වේ. රෙපරමාදු භක්තිකයන් පාප් වහන්සේගේ අධිකාරිය සහ රෝමානු කතෝලික පල්ලියේ සම්ප්‍රදායන් ප්‍රතික්ෂේප කරන අතර, ශුද්ධ ලියවිල්ලේ තනි අර්ථ නිරූපණය සහ "සියලු ඇදහිලිවන්තයන්ගේ පූජකත්වය" අවධාරණය කරයි. රෙපරමාදු ආගම ආරම්භ කළේ කවුද? රෙපරමාදු ප්‍රතිසංස්කරණය :මාටින් ලූතර් ජර්මානු ගුරුවරයෙකු සහ භික්ෂුවක් වූ මාටින් ලූතර්, 1517 සිට කතෝලික පල්ලියේ ඉගැන්වීම්වලට අභියෝග කළ විට, රෙපරමාදු ප්‍රතිසංස්කරණය ගෙන ආවේය. රෙපරමාදු ප්‍රතිසංස්කරණය යනු 1500 ගණන්වල යුරෝපය පුරා පැතිර ගිය ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයකි. රෙපරමාදු ආගම, ලුතරන්, ඇන්ග්ලිකන්, මෙතෝදිස්ත, බැප්ටිස්ට් සහ ප්‍රෙස්බිටේරියන් වැනි ප්‍රධාන නිකායික පවුල් මෙන්ම පෙන්තකොස්තවාදය, ඇනබැප්තිස්මය සහ නිකායික නොවන පල්ලි වැනි ව්‍යාපාර ඇතුළු විවිධ කණ්ඩායම් රාශියක් ආවරණය කරයි. මෙම කණ්ඩායම් විවිධ කාල පරිච්ඡේදවලින් සහ දේවධර්මීය අවධාරණයන්ගෙන් ආරම්භ වූ අතර, ගැලවීම, නමස්කාරය සහ පල්ලි ව්‍යුහය සඳහා ඔවුන්ගේ ප්‍රවේශයන්හි වෙනස්කම් ඇති අතර, අද නිරීක්ෂණය කරන ලද විවිධාකාර විශ්වාසයන් සහ පිළිවෙත් වලට මග පාදයි. රෙපරමාදු භක්තිකයන් අත්‍යවශ්‍ය විශ්වාසයන් තුනක් විශ්වාස කරයි. 1) බයිබලය අවසාන ආගමික සත්‍යය සහ අධිකාරියයි. 2) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි සහ දෙවියන් වහන්සේගේ කරුණාව කෙරෙහි විශ්වාසය තැබීම තුළින් මිනිසුන්ට ගැලවීම සොයාගත හැකිය. 3) සියලුම කිතුනුවන් පූජකයන් ලෙස සලකනු ලබන අතර දෙවියන් වහන්සේ සමඟ කෙලින්ම සන්නිවේදනය කළ හැකිය.

**නැගෙනහිර ඕතඩොක්ස්**

මුල් පල්ලිය සමඟ සම්ප්‍රදාය සහ අඛණ්ඩතාව අවධාරණය කරයි, එහි මූලාරම්භය අපෝස්තලික යුගය දක්වා දිව යන අතර නැගෙනහිර රෝම අධිරාජ්‍යය කේන්ද්‍ර කර ගනී. එය ත්‍රිත්වය වැනි මූලික ක්‍රිස්තියානි විශ්වාසයන් බෙදා ගනී, නමුත් රෝමානු කතෝලික හා රෙපරමාදු ආගම සමඟ සැලකිය යුතු දේවධර්මීය

වෙනස්කම් ඇත, විශේෂයෙන් එහි තියොස් (දිව්‍යකරණය), දෙවියන් වහන්සේ තුළ සාරය-ශක්ති වෙනස සහ අයිකන වන්දනා කිරීම කෙරෙහි අවධාරණය කරයි. පල්ලිය ග්‍රීක ඕතඩොක්ස් සහ රුසියානු ඕතඩොක්ස් පල්ලි වැනි ස්වාධීන, ස්වයං-පාලන පල්ලි වලින් සමන්විත වන අතර ඒවා පොදු දේවධර්මය සහ පූජනීය පිළිවෙත් බෙදා ගන්නා අතර ගෝලීය වශයෙන් අනුගාමිකයන් මිලියන 260 ක් පමණ සිටිති.

**පෙරදිග ඕතඩොක්ස් :-** නයිසීන් ක්‍රිස්තියානි සම්ප්‍රදායට අනුගත වේ. පෙරදිග ඕතඩොක්ස් යනු ක්රිස්තියානි ධර්මයේ පැරණිතම ශාඛාවකි.

| | අසමානතා | |
|---|---|---|
| | Catholicism: | Protestantism: |
| | කතෝලික | කතෝලික |
| 1 | ප්‍රොතෙස්තන්ත/ රෙපරමාදු | ප්‍රොතෙස්තන්ත/ රෙපරමාදු |
| 2 | මුළු ක්‍රිස්තියානි ජනගහනයෙන් 50.1% | මුළු ක්‍රිස්තියානි ජනගහනයෙන් 50.1% |
| 3 | මුළු ක්‍රිස්තියානි ජනගහනයෙන් 36.7% | මුළු ක්‍රිස්තියානි ජනගහනයෙන් 36.7% |
| 4 | 2012 සංගණනයට අනුව, ශ්‍රී ලංකාවේ ආසන්න වශයෙන් කතෝලිකයන් මිලියන 1.55 ක් (ජනගහනයෙන් 7%) | 2012 සංගණනයට අනුව, ශ්‍රී ලංකාවේ ආසන්න වශයෙන් කතෝලිකයන් මිලියන 1.55 ක් (ජනගහනයෙන් 7%) |
| 5 | 2012 සංගණනයට අනුව, ශ්‍රී ලංකාවේ ආසන්න වශයෙන් රෙපරමාදු භක්තිකයන් 291,000 ක් (1.43%) | 2012 සංගණනයට අනුව, ශ්‍රී ලංකාවේ ආසන්න වශයෙන් රෙපරමාදු භක්තිකයන් 291,000 ක් (1.43%) |

| | | |
|---|---|---|
| 6 | කතෝලිකයන් විශ්වාස කරන්නේ පාප් වහන්සේ සහ බිෂොප්වරුන් විසින් මෙහෙයවනු ලබන ශුද්ධ ලියවිල්ල සහ පල්ලියේ සම්ප්‍රදාය අධිකාරියේ මූලාශ්‍ර බවයි. | කතෝලිකයන් විශ්වාස කරන්නේ පාප් වහන්සේ සහ බිෂොප්වරුන් විසින් මෙහෙයවනු ලබන ශුද්ධ ලියවිල්ල සහ පල්ලියේ සම්ප්‍රදාය අධිකාරියේ මූලාශ්‍ර බවයි. |
| 7 | රෙපරමාදු භක්තිකයන් බයිබලය අවසාන අධිකාරිය බවත් පල්ලියේ සම්ප්‍රදායෙන් අර්ථ නිරූපණයට යටත් නොවන බවත් විශ්වාස කරති. | රෙපරමාදු භක්තිකයන් බයිබලය අවසාන අධිකාරිය බවත් පල්ලියේ සම්ප්‍රදායෙන් අර්ථ නිරූපණයට යටත් නොවන බවත් විශ්වාස කරති. |
| 8 | කතෝලිකයන් විශ්වාස කරන්නේ ගැලවීම ලබා ගත හැක්කේ ඇදහිල්ල සහ යහපත් ක්‍රියාවල එකතුවකින් බවත්, එය ඇදහිලිවන්තයා සහ දෙවියන් වහන්සේ අතර සහයෝගීතාවයේ ක්‍රියාවලියක් ලෙස සලකන බවත්ය. | කතෝලිකයන් විශ්වාස කරන්නේ ගැලවීම ලබා ගත හැක්කේ ඇදහිල්ල සහ යහපත් ක්‍රියාවල එකතුවකින් බවත්, එය ඇදහිලිවන්තයා සහ දෙවියන් වහන්සේ අතර සහයෝගීතාවයේ ක්‍රියාවලියක් ලෙස සලකන බවත්ය. |
| 9 | රෙපරමාදු භක්තිකයන් විශ්වාස කරන්නේ ගැලවීම ලැබෙන්නේ ඇදහිල්ලෙන් පමණක් බවත්, එය ක්ෂණික සිදුවීමක් බවත්ය. | රෙපරමාදු භක්තිකයන් විශ්වාස කරන්නේ ගැලවීම ලැබෙන්නේ ඇදහිල්ලෙන් පමණක් බවත්, එය ක්ෂණික සිදුවීමක් බවත්ය. |
| 10 | කතෝලිකයන් සක්‍රමේන්තු හතක් හඳුනා ගනී (බව්තීස්මය, තහවුරු කිරීම, දිව්‍ය සත්ප්‍රසාදය, පසුතැවීම, අසනීප ආලේප කිරීම, ශුද්ධ නියෝග සහ විවාහය) | කතෝලිකයන් සක්‍රමේන්තු හතක් හඳුනා ගනී (බව්තීස්මය, තහවුරු කිරීම, දිව්‍ය සත්ප්‍රසාදය, පසුතැවීම, අසනීප ආලේප කිරීම, ශුද්ධ නියෝග සහ විවාහය) |
| 11 | රෙපරමාදු භක්තිකයන් සාමාන්‍යයෙන් හඳුනා ගන්නේ | රෙපරමාදු භක්තිකයන් සාමාන්‍යයෙන් හඳුනා ගන්නේ |

| | | |
|---|---|---|
| | දෙකක් පමණි: බව්තීස්මය සහ දිව්‍ය සත්ප්‍රසාදය. | දෙකක් පමණි: බව්තීස්මය සහ දිව්‍ය සත්ප්‍රසාදය. |
| 12 | කතෝලිකයන් මරියා සහ සාන්තුවරයන්ට ගරු කරන්නේ ඇදහිලිවන්තයන් වෙනුවෙන් යාච්ඤා කළ හැකි මැදිහත්කරුවන් ලෙසය. | කතෝලිකයන් මරියා සහ සාන්තුවරයන්ට ගරු කරන්නේ ඇදහිලිවන්තයන් වෙනුවෙන් යාච්ඤා කළ හැකි මැදිහත්කරුවන් ලෙසය. |
| 13 | දෙවියන් වහන්සේ සහ මිනිසා අතර ඇති එකම මැදිහත්කරු යේසුස් ක්‍රිස්තුස් බව රෙපරමාදු භක්තිකයන් විශ්වාස කරන අතර මරියාට හෝ සාන්තුවරයන්ට යාච්ඤා නොකරති. | දෙවියන් වහන්සේ සහ මිනිසා අතර ඇති එකම මැදිහත්කරු යේසුස් ක්‍රිස්තුස් බව රෙපරමාදු භක්තිකයන් විශ්වාස කරන අතර මරියාට හෝ සාන්තුවරයන්ට යාච්ඤා නොකරති. |
| 14 | කතෝලික භක්තිකයන් රූප වන්දනාවේ නිරත වෙති | කතෝලික භක්තිකයන් රූප වන්දනාවේ නිරත වෙති |
| 15 | රෙපරමාදු භක්තිකයන් රූප වන්දනාවේ නිරත නොවෙති | රෙපරමාදු භක්තිකයන් රූප වන්දනාවේ නිරත නොවෙති |
| 16 | කතෝලිකයන් කුරුස භාවිතා කරයි, විශේෂයෙන් එය මත ජේසුස් වහන්සේගේ රූපය සහිත කුරුසයකි. | කතෝලිකයන් කුරුස භාවිතා කරයි, විශේෂයෙන් එය මත ජේසුස් වහන්සේගේ රූපය සහිත කුරුසයකි. |

**නැගෙනහිර ඕතඩොක්ස් සහ පෙරදිග ඕතඩොක්ස් අතර වෙනස්කම්**

ඔවුන්ගේ ප්‍රධාන වෙනස වන්නේ ක්‍රිස්තු විද්‍යාවයි: නැගෙනහිර ඕතඩොක්ස්වාදය ක්‍රිස්තුස් වහන්සේට එක් පුද්ගලයෙකු තුළ වෙනස් ස්වභාවයන් දෙකක් (දිව්‍යමය සහ මනුෂ්‍ය) ඇති බවට චැල්සිඩෝනියානු අර්ථ දැක්වීම අනුගමනය කරන අතර, පෙරදිග ඕතඩොක්ස්වාදය මියාෆිසයිට් ස්ථාවරය අනුගමනය කරමින් ක්‍රිස්තුස් වහන්සේගේ එක් එක්සත් දිව්‍ය-මිනිස් ස්වභාවය තහවුරු කරයි. මෙම මූලික එකඟ නොවීම ක්‍රි.ව. 451 දී චැල්සිඩෝන් කවුන්සිලයෙන් පැන නගින අතර,

එමඟින් නැගෙනහිර ඕතඩොක්ස් සභාව ඇතුළු අනෙකුත් පල්ලිය සමඟ ඇති සම්බන්ධතාවය බිඳ දැමීමට හේතු විය.

පෙරදිග ඕතඩොක්ස්වාදය: ක්‍රිස්තුස් වහන්සේගේ ස්වභාවය පිළිබඳ චැල්සිඩන් කවුන්සිලයේ සොයාගැනීම් ප්‍රතික්ෂේප කිරීමෙන් පසු ක්‍රි.ව. 451 දී ප්‍රධාන පල්ලියෙන් වෙන් විය.

**චල්සිඩන් කවුන්සිලය :-**

- නැගෙනහිර ඕතඩොක්ස්වාදය: චැල්සිඩන් කවුන්සිලයේ (ක්‍රි.ව. 451) ඉගැන්වීම් බැඳීමක් ලෙස පිළිගනී.
- පෙරදිග ඕතඩොක්ස්වාදය: චැල්සිඩන් කවුන්සිලය ප්‍රතික්ෂේප කළේ, එහි නිර්වචනය නෙස්ටෝරියානුවාදයට (ක්‍රිස්තුස් වහන්සේ වෙනම පුද්ගලයන් දෙදෙනෙකු බව) බොහෝ සෙයින් සමාන බව විශ්වාස කරමිනි.

**පල්ලියේ ව්‍යුහාව :-**

- නැගෙනහිර ඕතඩොක්ස්වාදය: ස්වයංක්‍රීය නමුත් සාමාන්‍යයෙන් කොන්ස්ටන්ටිනෝපල්හි කිතුනු කුලදෙටුවන්ගේ පළමු-සමාන භූමිකාව පිළිගන්නා පල්ලිවල හවුලකි.
- පෙරදිග ඕතඩොක්ස්වාදය: ස්වයං පාලන පල්ලි කිහිපයක හවුලකි, ඒ සෑම එකක්ම තමන්ගේම කුලදෙටුවන් හෝ ප්‍රධාන බිෂොප්වරයා සමඟ.

**පූජනීය හා සංස්කෘතික සම්ප්‍රදාය :-**

- නැගෙනහිර ඕතඩොක්ස්වාදය: ප්‍රධාන වශයෙන් බයිසැන්තියානු (ග්‍රීක) සම්ප්‍රදාය අනුගමනය කරයි.
- පෙරදිග ඕතඩොක්ස්: සම්ප්‍රදායන්හි විශාල විවිධත්වයක් ඇති අතර, හවුලෙහි සෑම පල්ලියකටම තමන්ගේම පූජනීයත්වයක් සහ සුවිශේෂී සංස්කෘතික සම්ප්‍රදායන් ඇත.

සාරාංශයක් ලෙස, ශාඛා දෙකම අපෝස්තලික යුගයට ඔවුන්ගේ මූලයන් සොයාගෙන නෙස්ටෝරියානුවාදය සහ යුටිචියානුවාදය වැනි මිථ්‍යාදෘෂ්ටීන් හෙළා දකින අතර, ක්‍රිස්තුස් වහන්සේගේ තනි ස්වභාවයන් එදිරිව දෙක පිළිබඳ ඔවුන්ගේ වෙනස් අදහස් හවුල සහ දේවධර්මය තුළ කල් පවතින බෙදීමක් ඇති කරයි.




Major denominational groups and heresies within Christianity
Judaism
(extant)
Mandaeism (extant)
Mani (242)
John the Baptist (1st Century)
Simon Magus (1st Century)
Gnosticism
Manichaeism
Novatian (250)
Novatianism
First Council of Nicaea (325)
Arianism
Council of Ephesus (431)
(Nestorianism)
Council of Chalcedon (451)
(Miaphysites)
Third Council of Constantinople (680)
Second Council of Nicaea (787)
Iconoclasm
Great Schism (1054)
Great Moscow Synod/Raskol (1666)
Schism of 1552
Jan Hus (1415)
Martin Luther (1517)
Reformation (16th Century)
Henry VIII (1534)
John Smyth (1609)
John Calvin (1536)
(Calvinism)
Michael Servetus (1553)
Joseph Rutherford (1931)
William Miller (1833)
Puritans
George Fox (1652)
Joseph Smith (1830)
Seekers
John Wesley(1738)
Ignaz von Döllinger (1879)
Hussitism
Assyrian Church of the Ea
Eastern Catholic Church
Oriental Orthodox
Old Believers
Eastern Orthodox
Roman Catholic
Old Catholic
Anglican/Episcopal
Methodist
Pentecostalism
Churches of Christ
Mormons
Quakers
Baptists
Adventists
Lutheran
Reformed/Presbyterian
Restorationism
Jehovah's Witnesses
Congregational
Unitarianism
Anabaptists
Moravians
500 BCE
0 CE
500 CE
1000 CE
1500 CE
2000 CE

# බුදුදහම ගැන කෙටි හැඳින්වීමක්

බුද්ධාගම යනු "බුදුන්" හෝ "පිබිදුණු, බුද්ධිමත්, ඥානවන්ත තැනැත්තා" ලෙස හැඳින්වෙන සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ ගේ ඉගැන්වීම් සමඟ පුරාණ ඉන්දියානු ප්‍රදේශයෙන් ආරම්භ වූ දාර්ශනික සම්ප්‍රදායකි. ජීවිතය දුක් වේදනා වලින් පිරී ඇති බවත්, දුක් වේදනා අවසන් කර නිර්වාණය ලෙස හඳුන්වන බුද්ධත්වය හෝ අරහත් තත්වයක් අත්කර ගැනීමේ මාර්ගය ලෙස යහපත් ගුනධර්ම ප්‍රගුණ කිරීම, සදාචාරය, භාවනාව සහ ප්‍රඥාව පුහුණු කිරීම හරහා බව එය උගන්වයි, ඒවා චතුරාර්ය සත්‍යයන් සහ අෂ්ටාංගික මාර්ගයෙහි දක්වා ඇත.

**මූලික විශ්වාසයන් සහ දර්ශනය :-**

බුද්ධාගම කේන්ද්‍රගත වී ඇත්තේ උත්තරීතර දෙවියෙකු මත යැපීමට වඩා දුක් වේදනා අවසන් කිරීම සඳහා ප්‍රායෝගික ප්‍රවේශයක් මත ය.

**චතුරාර්ය සත්‍යයන්:-**

මෙම සත්‍යයන් බෞද්ධ චින්තනයේ පදනම වන අතර දුක් විඳීමේ ස්වභාවය පැහැදිලි කරයි.

- දුක්ඛ (දුක්ඛ): ජීවිතය සියලු දේවල අනිත්‍ය ස්වභාවය නිසා ඇතිවන දුක්ඛ සහ අතෘප්තියෙන් සංලක්ෂිත වේ.
- සමුදය (දුක්ඛයේ ආරම්භය): මෙම දුක්ඛයට හේතුව තණ්හාව සහ නොදැනුවත්කම (අවිජ්ජ) වන අතර එය බැඳීමකට හේතු වේ.
- නිරෝධ (දුක්ඛ නැවැත්වීම): මෙම තණ්හාව අත්හැරීමෙන් දුක්ඛය අවසන් කළ හැකිය.
- මග්ග (දුක්ඛ නැවැත්වීමේ මාර්ගය): දුක්ඛය අවසන් කිරීමේ මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමයි.

**ආර්ය අෂ්ටාංගික මාර්ගය:**

දුක්ඛිතභාවය අවසන් කිරීමට සහ නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට මඟ පාදන සදාචාරාත්මක හා අධ්‍යාත්මික ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රායෝගික මාර්ගෝපදේශය මෙයයි. මෙය ආචාර ධර්ම හැසිරීම, මානසික විනය සහ ප්‍රඥාව සඳහා ප්‍රායෝගික රාමුවයි. එයට නිවැරදි කතාව, නිවැරදි ක්‍රියාව, නිවැරදි උත්සාහය සහ නිවැරදි සිහිකල්පනාව වැනි මූලධර්ම ඇතුළත් වේ.

**කර්මය සහ නැවත ඉපදීම:**

කර්මය, හෝ "ක්‍රියාව" යනු චේතනාන්විත ක්‍රියා අනාගත ප්‍රතිවිපාකවලට තුඩු දෙන අධ්‍යාත්මික මූලධර්මයකි. මෙය මරණයේ සහ නැවත ඉපදීමේ චක්‍රය (සංසාරය)ට ඉන්ධන සපයයි. යහපත් ක්‍රියාවන් උසස් නැවත ඉපදීමකට මඟ පෑදිය හැකි අතර, සෘණාත්මක ක්‍රියාවන් පහත් එකකට මඟ පෑදිය හැකිය, නමුත් අවසාන ඉලක්කය වන්නේ මෙම චක්‍රයෙන් සම්පූර්ණයෙන්ම ගැලවීමයි.

පුද්ගලයෙකු යනු නිරන්තරයෙන් වෙනස් වන "සමස්තයන්" පහක සංයුක්තයකි: ශාරීරිකත්වය, හැඟීම්, අදහස්, මානසික සැකැස්ම සහ විඥානය.

**ප්‍රධාන පිළිවෙත්:-**

බෞද්ධ පිළිවෙත් පුහුණුවේ ප්‍රධාන අංශ තුනක් ඇතුළත් වේ: ආචාර ධර්ම හැසිරීම, භාවනාව සහ ප්‍රඥාව.

- සීල (ආචාර ධර්ම): මෙයට ගිහියන් සඳහා වන ශික්ෂා පද පහ ඇතුළත් වන අතර, ඒවාට ඝාතනය, සොරකම් කිරීම, ලිංගික වරදවා හැසිරීම, බොරු කීම සහ මත් වීමෙන් වැළකී සිටීම ඇතුළත් වේ.
- සමාධි (භාවනාව): සමාධිය සහ භාවනාව තුළින් මානසික වර්ධනය ප්රඥාව කරා යන මාර්ගයයි. මෙම පිළිවෙත මනස සන්සුන් කිරීමට සහ අවධානය යොමු කිරීමට උපකාරී වේ.
- ප්‍රඥා (ප්‍රඥාව): භාවනාව සහ ධර්මය අධ්‍යයනය කිරීම තුළින් බෞද්ධයන් බුද්ධත්වය ලබා ගැනීමට අවශ්‍ය තීක්ෂ්ණ බුද්ධිය සහ අවබෝධය ලබා ගනී.

අවසාන ඉලක්කය

බුද්ධාගමේ කේන්ද්‍රීය අරමුණ වන්නේ බුද්ධත්වය හෙවත් බෝධි සාක්ෂාත් කර ගැනීම සහ නිර්වාණය ලෙස හඳුන්වන දුක් වේදනා වලින් නිදහස් තත්ත්වයකට ළඟා වීමයි.

**නිර්වාණය:**

තණ්හාව, වෛරය සහ නොදැනුවත්කම තුරන් කිරීම හරහා ලබා ගත හැකි නිර්වාණය යන නැවත ඉපදීමේ චක්‍රයේ අවසානයයි.

**බෝධිසත්ව පරමාදර්ශය:**

මහායානය වැනි සමහර පාසල්වල, ඉලක්කය වන්නේ බෝධිසත්වවරයෙකු වීමයි - සියලු සංවේදී ජීවීන්ට ඔවුන්ගේ දුක් වේදනා අවසන් කිරීමට උපකාර කිරීම සඳහා තමන්ගේම අවසාන නිර්වාණය ප්‍රමාද කරන බුද්ධිමත් ජීවියෙකි.

**දේවවාදී නොවන ස්වභාවය:**

බුද්ධාගම සාමාන්‍යයෙන් දේවවාදී නොවන සම්ප්‍රදායක් ලෙස සැලකේ, එනම් එය මැවුම්කරු දෙවියෙකුට හෝ දෙවියෙකුට නමස්කාර කිරීම මත කේන්ද්‍රගත නොවේ.

**සම්භවය සහ ව්‍යාප්තිය**

ක්‍රි.පූ. 6 හෝ 5 වන සියවසේදී පමණ ඉන්දියානු උප මහද්වීපයේ බුද්ධාගම ආරම්භ වූයේ ශ්‍රමණ සම්ප්‍රදායේ ව්‍යාපාරයක් ලෙසය.

ඉගැන්වීම් ආසියාව පුරා ව්‍යාප්ත වූ අතර මහාද්වීපයේ සංස්කෘතික හා අධ්‍යාත්මික ජීවිතය තුළ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය.

**ගෝලීය ප්‍රවේශය:**

බුද්ධාගම අවසානයේ 20 වන සියවසේදී බටහිරට ව්‍යාප්ත වූ අතර මිලියන ගණනක් අනුගාමිකයින් සමඟ ගෝලීය ආගමක් බවට පත්ව ඇත.

# බුදු දහමේ බෙදීම්

- හීනයාන (එහි අනුගාමිකයින් විසින් ථෙරවාදය ලෙසද හැඳින්වේ)
- මහායාන
  - **මහායාන යේ ශාඛා**
    - වජ්‍රයාන
    - සෙන් (හෝ චැන්)
    - පිවිතුරු දේශය
    - නිචිරෙන්

"වැඩිහිටියන්ගේ ධර්මය" යන අර්ථය ඇති ථේරවාද බුද්ධාගම, මුල් පාලි ත්‍රිපිටක ග්‍රන්ථ කෙරෙහි අවධාරණය කිරීම සහ ස්වයං උත්සාහයෙන් විමුක්තිය අත්කර ගන්නා අරහත් (සම්පූර්ණයෙන්ම අවදි වූ ජීවියෙකු) පිළිබඳ පරමාදර්ශය මගින් සංලක්ෂිත වේ. ප්‍රධාන ලක්ෂණ අතරට උතුම් අෂ්ටාංගික මාර්ගය හරහා ස්වයං විමුක්තිය, නිවන (දුක් විඳීම නැවැත්වීම) ලුහුබැඳීම, ශක්තිමත් පැවිදි සම්ප්‍රදායක් සහ භාවනාව, සිහිය සහ සදාචාරාත්මක හැසිරීම (සීලය) කෙරෙහි අවධානය යොමු කිරීම ඇතුළත් වේ. අනෙකුත් පාසල් මෙන් නොව, එය බොහෝ බෝධිසත්වයන්ට ගරු නොකරන අතර ඓතිහාසික ශාක්‍යමුණි බුදුන් වහන්සේ පරිපූර්ණ ගුරුවරයෙකු ලෙස ගෞරවයට පාත්‍ර කරයි.

මූලික ලක්ෂණ

පාලි ත්‍රිපිටකය පිළිපැදීම:

ථෙරවාද බුද්ධාගම පවසන්නේ ටිපිටකයේ (ශුද්ධ ලියවිල්ලේ "කූඩ තුන") වාර්තා කර ඇති පරිදි, බුදුන්ගේ පැරණිතම සහ වඩාත්ම අව්‍යාජ ඉගැන්වීම් ආරක්ෂා කරන බවයි.

පරමාදර්ශය ලෙස අරහත්:

ආධ්‍යාත්මික ඉලක්කය වන්නේ රහත් බවට පත්වීමයි, එනම් නැවත ඉපදීමේ චක්‍රය අවසන් කරමින් තමන්ගේම ප්‍රඥාව සහ උත්සාහය තුළින් නිවන (විමුක්තිය) ලබා ගත් පුද්ගලයෙකු වීමයි.

ස්වයං විමුක්තිය:

දුක් වේදනා අවසන් කර බුද්ධත්වය ලබා ගැනීම සඳහා දිව්‍යමය ජීවියෙකු හෝ උසස් බලයක් මත නොව, තමන්ගේම උත්සාහයන් මත විශ්වාසය තබන්න.

ආර්ය අෂ්ටාංගික මාර්ගය:

මෙය දුක් වේදනා අවසන් කිරීම සඳහා ප්‍රායෝගික මාර්ගෝපදේශයයි, සදාචාරාත්මක හැසිරීම, මානසික විනය (භාවනාව ඇතුළුව) සහ ප්‍රඥාව ඇතුළත් වේ.

භාවනාව පිළිබඳ අවධාරණය:

භාවනාව, විශේෂයෙන් ඣාණ (භාවනා අවශෝෂණයන්), මනස පිරිසිදු කිරීම සහ සමාධිය සහ තීක්ෂ්ණ බුද්ධිය වර්ධනය කිරීම සඳහා කේන්ද්‍රීය වේ. පැවිදි සහ ගිහි ජීවිතය

සංඝයාගේ කාර්යභාරය: සංඝයා (භික්ෂූන් වහන්සේලාගේ සහ භික්ෂුණීන්ගේ ප්‍රජාව) ඉගැන්වීම් ආරක්ෂා කිරීම සහ සම්ප්‍රේෂණය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. භික්ෂූන් වහන්සේලා නීති 227 කින් සමන්විත දැඩි පැවිදි විනය සංග්‍රහයක් වන විනය පිටකය පිළිපදිති.

සුවිශේෂී භූමිකාවන්: පැවිදි සහ ගිහි අනුගාමිකයින්ගේ භූමිකාවන් අතර පැහැදිලි වෙනසක් ඇත. මේ ජීවිතයේ දී පූර්ණ බුද්ධත්වය ලබා ගත හැක්කේ පැවිද්දන්ට පමණක් වුවද, ගිහියන් සංඝයාට සහාය වන අතර වඩා හොඳ නැවත ඉපදීමක් සඳහා කුසල් ලබා ගැනීම සඳහා යහපත් ක්‍රියා කරති.

මූලික ග්‍රන්ථ

පාලි කැනනය (ත්‍රිපිටක): බුදුන්ගේ ඉගැන්වීම්වල පැරණිතම ඉතිරිව ඇති වාර්තාව අඩංගු මධ්‍යම හා වඩාත්ම බලයලත් ග්‍රන්ථය. එය පාලි භාෂාවෙන් ලියා ඇති අතර "කූඩ" හෝ අංශ තුනකින් සමන්විත වේ:

විනය පිටක: පැවිදි නීති.

සූත්‍ර පිටක: බුදුන්ගේ දේශන.

අභිධම්ම පිටක: ඉගැන්වීම් පිළිබඳ ක්‍රමානුකූල දාර්ශනික විශ්ලේෂණයක්.

පැවිදි බව:- ඉගැන්වීම් ආරක්ෂා කිරීම සහ ගිහි අනුගාමිකයින් සඳහා අධ්‍යාත්මික මග පෙන්වීම ලබා දීම සඳහා ශක්තිමත් පැවිදි පිළිවෙලක් (සංඝ) ඉතා වැදගත් වේ.

මැවුම්කරු දෙවියෙකු ප්‍රතික්ෂේප කිරීම:- ථෙරවාද බුද්ධාගම මැවුම්කරු දෙවියෙකු විශ්වාස නොකරන අතර බුදුන් වහන්සේ දෙවියෙකු ලෙස නොව මඟ පෙන්වන්නෙකු ලෙස සලකයි.

පැවැත්මේ ලක්ෂණ තුනක්:- අනුගාමිකයින් සියලු සංසිද්ධිවල අනිත්‍ය (අනිච්ච), අසතුටුදායක (දුක්ඛ) සහ ස්වයං නොවන (අනත්ත) ස්වභාවය තේරුම් ගනී.

මහායානය

මහායානයේ පොදු ලක්ෂණ

1. බෝධිසත්වයන්

අන් අය වෙනුවෙන් බුද්ධත්වය පතන්න. ගිහියන් සහ පැවිද්දන් යන දෙදෙනාම බෝධිසත්වයන් වීමට දිවුරුම් දෙති.

ජීවීන් අනන්ත සංඛ්‍යාවක්, මම ඔවුන් සියල්ලන්ම බේරා ගැනීමට දිවුරුම් දෙමි

බාධාකාරී ආශාවන් අනන්ත සංඛ්‍යාවක්; මම ඔවුන් සියල්ලන්ම අවසන් කිරීමට දිවුරුම් දෙමි

අන් අයව බේරා ගැනීම සඳහා ඉගැන්වීම් අසංඛ්‍යාතයි, මම ඒවා සියල්ලම ඉගෙන ගැනීමට දිවුරුම් දෙමි

බුද්ධත්වය උත්තරීතර ජයග්‍රහණයයි: මම එය ලබා ගැනීමට දිවුරුම් දෙමි

දුක් විඳින අයගේ ආයාචනා අසන ස්වර්ගීය බෝධිසත්වයන් වෙමි.

2. බුදුන්ගේ ශරීර තුන:- බුදුන් වහන්සේ යනු අංශ තුනක් හෝ ශරීර සහිත සදාකාලික පැවැත්මකි

පිරිසිදු විශ්වීය විඥානය

ප්‍රීතිමත් ශරීරය "බෝධිසත්වයන්ට ධර්මය සන්නිවේදනය කළ බුද්ධත්වයේ දීප්තිමත් ආකාශ අංගය

පරිවර්තන ශරීරය - සිද්ධාර්ථ ගෞතම

3). හිස්බව (සුන්‍යත):- සියලු භූමික දේවලට සදාකාලික යථාර්ථයක්/ස්වාධීන සම්භවයක් නොමැත. මේ අනුව සංසාර ලෝකය ආවේණික පැවැත්මෙන් හිස් ය. පුද්ගලයෙකුගේ සමස්ථ පහක් නිරපේක්ෂ ස්වයං-ස්වභාවයෙන් හිස් ය; පවතින්නේ අනෙකට සාපේක්ෂව පමණි.

| | | මහායාන යේ ශාඛා | | | |
|---|---|---|---|---|---|
| හීනයාන (එහි අනුගාමිකයින් විසින් ථෙරවාදය ලෙසද හැඳින්වේ) | මහායාන | වජ්‍රයාන | සෙන් (හෝ චැන්) | පිවිතුරු දේශය: | නිචිරෙන්: |
| මුළු බෞද්ධ ජනගහනයෙන් 36% | මුළු බෞද්ධ ජනගහනයෙන් 56.% | මුළු බෞද්ධ ජනගහනයෙන් 2-4% | | | |
| "කුඩා වාහනය" යන අර්ථය ඇත | "මහා වාහනය" යන අර්ථය ඇත | | | | |

| | | මහායාන යේ ශාඛා | | | |
|---|---|---|---|---|---|
| **හීනයාන (එහි අනුගාමිකයින් විසින් ථේරවාදය ලෙසද හැඳින්වේ)** | **මහායාන** | **වජ්රයාන** | **සෙන් (හෝ චැන්)** | **පිවිතුරු දේශය:** | **නිචිරෙන්:** |
| මුළු බෞද්ධ ජනගහනයෙන් 36% | මුළු බෞද්ධ ජනගහනයෙන් 56.% | මුළු බෞද්ධ ජනගහනයෙන් 2-4% | | | |
| ථෙරවාද බුද්ධාගම ශ්‍රී ලංකාව, මියන්මාරය, කාම්බෝජය, තායිලන්තය සහ ලාඕසය යන රටවල ප්‍රමුඛ සම්ප්‍රදායයි. හීනයාන බුද්ධාගමේ ප්‍රධාන සංකල්පය වන්නේ පුද්ගල උත්සාහයෙන් ස්වයං විමුක්තිය ලබා ගැනීම, පුද්ගලික නිර්වාණය ලබා ගැනීම සහ පුද්ගල දුක් වේදනා වලින් මිදීම සඳහා බුදුන්ගේ මුල් ඉගැන්වීම් වලට අනුගත වීමයි. එය බොහෝ විට සියලු ජීවීන් සඳහා බුද්ධත්වය අපේක්ෂා කරන මහායානයේ පුළුල්, පරාර්ථකාමී ප්‍රවේශයට වඩා වෙනස් වේ. බුදුන් වහන්සේ ඓතිහාසික මිනිසෙකු ලෙස සලකයි. පෙර පාලි ත්‍රිපිටකය අනුගමනය කරයි | පුරාණ ඉන්දියාවේ මතු වූ බුද්ධාගමේ ප්‍රධාන ශාඛාවකි, එය දැන් චීනය, ජපානය, කොරියාව සහ ටිබෙටය ඇතුළු උතුරු සහ නැගෙනහිර ආසියාවේ ප්‍රමුඛ වේ. එය තනි පුද්ගල විමුක්තිය කෙරෙහි පමණක් අවධානය යොමු කරනවාට වඩා, සියලු සංවේදී ජීවීන්ට බුද්ධත්වය ලබා ගැනීමට උපකාර කිරීමට කැප වූ ප්‍රබුද්ධ ජීවියෙකු වන බෝධිසත්ත්වවරයෙකුගේ මාර්ගය අවධාරණය කරයි. (විශ්වීය අනුකම්පාව සහ ප්‍රඥාව තුළින් සියලු සංවේදී. (විශ්වීය අනුකම්පාව සහ ප්‍රඥාව තුළින් | භූතානය, මොන්ගෝලියාව, ටිබෙටය, නේපාලය සහ රුසියාවේ සමහර ප්‍රදේශවල වඩාත් සංකේන්ද්‍රණය වී ඇත. භූතානය ප්‍රධාන වශයෙන් වජ්‍රයාන රටක්. වජ්‍රයාන බුද්ධාගමේ ප්‍රධාන සංකල්පය වන්නේ සාම්ප්‍රදායික මාර්ගවලට වඩා ඉක්මනින් බුද්ධත්වය ලබා ගැනීම සඳහා විස්තීර්ණ චාරිත්‍ර වාරිත්‍ර, භාවනා, මන්ත්‍ර සහ මණ්ඩල වැනි අධ්‍යාත්මික පිළිවෙත් භාවිතා කිරීමයි. එය කෙනෙකුගේ සහජ "බුද්ධ-ස්වභාවය" දැකීම අවධාරණය කරන අතර සුදුසුකම් ලත් අධ්‍යාත්මික ගුරුවරයෙකුගේ (ලාමා හෝ ගුරු) තීරණාත්මක භූමිකාව මගින් මෙහෙයවනු ලබන පරිවර්තනය සඳහා ඉන්ධන ලෙස අත්දැකීම්වල සියලු අංග භාවිතා කරයි. | චීනය, ජපානය, කොරියාව සහ වියට්නාමය යන රටවල බෞද්ධයන් සෙන් බුද්ධාගමෙන් උපුටා ගත් බෞද්ධ පාසල් අනුගමනය කරති. සෙන් වඩාත් ප්‍රසිද්ධ ලෙස ජපානය සමඟ සම්බන්ධ වුවද, එහි මූලයන් චීන චැන් බුද්ධාගමේ වන අතර, එය කොරියාවේ සියොන් සහ වියට්නාමයේ තියන් ලෙසද වර්ධනය විය. සෙන් බුද්ධාගමේ ප්‍රධාන සංකල්පය වන්නේ සෘජු, පෞද්ගලික අත්දැකීම් හරහා, ප්‍රධාන වශයෙන් භාවනාව (සාසෙන්) | එය චීනයේ ආරම්භ වූ සම්ප්රදායක් වන අතර එය විශේෂයෙන් නැගෙනහිර ආසියානු රටවල ජනප්රියයි.. චීනය, ජපානය, තායිවානය සහ වියට්නාමය යන රටවල මොවුන් සිටී. පිවිතුරු භූමි බුද්ධාගමේ ප්රධාන සංකල්පය වන්නේ "පිවිතුරු දේශයක | විශේෂයෙන් ජපානය සහ අනෙකුත් නැගෙනහිර ආසියානු රටවල. නෙළුම් සූත්‍රය හරහා ගැලවීම.නිචිරෙන් බුද්ධාගමේ ප්‍රධාන සංකල්පය නම්, සියලු මිනිසුන්ට ආවේණික බුද්ධ ස්වභාවයක් ඇති බවත්, නෙළුම් සූත්‍රයේ හෙළිදරව් කර ඇති අද්භූත නීතිය වන නම්-මියෝහෝ-රෙන්ගේ-ක්යෝ |

| | | මහායාන යේ ශාඛා | | | |
|---|---|---|---|---|---|
| **හීනයාන (එහි අනුගාමිකයින් විසින් ථෙරවාදය ලෙසද හැඳින්වේ)** | **මහායාන** | **වජ්රයාන** | **සෙන් (හෝ චැන්)** | **පිවිතුරු දේශය:** | **නිර්වාණය:** |
| මුළු බෞද්ධ ජනගහනයෙන් 36% | මුළු බෞද්ධ ජනගහනයෙන් 56.% | මුළු බෞද්ධ ජනගහනයෙන් 2-4% | | | |
| | සියලු සංවේදී ජීවීන්ට බුද්ධත්වය ලබා ගැනීමට උපකාර කිරීමට කැප වූ ප්‍රබුද්ධ ජීවියෙකු වන බෝධිසත්ත්වවරයෙකුගේ මාර්ගය අවධාරණය කරයි. (විශ්වීය අනුකම්පාව සහ ප්‍රඥාව තුළින් සියලු සංවේදී ජීවීන්ගේ බුද්ධත්වය සඳහා උත්සාහ කරන බෝධිසත්ත්ව මාර්ගයක් අවධාරණය කරයි). බුදුන් වහන්සේ දිව්‍යමය, සර්වඥ ජීවියෙකු ලෙස දකියි සංස්කෘත ග්‍රන්ථ රාශියක් භාවිතා කරයි | දැනුවත්භාවය ඍජුවම පරිවර්තනය කිරීම සඳහා මෙම ගුප්ත ක්‍රම හඳුන්වා දීමෙන් වජ්‍රයානය මහායාන ඉගැන්වීම් මත ගොඩනැගේ. | හරහා, බුද්ධිමය අධ්‍යයනයෙන් හෝ චාරිත්‍ර චාරිත්‍රවලින් නොව, කෙනෙකුගේ ආවේණික "බුද්ධ-ස්වභාවය" හෝ සැබෑ ආත්මය අවබෝධ කර ගැනීමයි. සෙන් අවධාරණය කරන්නේ සිහිකල්පනාව, වර්තමාන මොහොතේ ජීවත් වීම සහ යථාර්ථයේ සරල, ගැඹුරු සාරය අවබෝධ කර ගැනීම සඳහා බැඳීම් සහ ද්විත්ව චින්තනය අත්හැරීමයි. | ", විශේෂයෙන් අමිතාභ බුදුන්ගේ සුඛාවතියෙහි, දුක් වේදනා වලින් තොර සාමකාමී, දූෂිත නොවූ රාජධානියක නැවත ඉපදීමයි. මෙම නැවත ඉපදීම භූදෙක් භෞතික ස්ථානයක් නොව අධ්‍යාත්මික රැකවරණයක් සහ බුද්ධත්වය ළුහුබැඳීම සඳහා | කෙරෙහි ඇදහිල්ල සහ සජ්ඣායනා කිරීම තුළින් නිරපේක්ෂ සතුටේ තත්වයක් ලබා ගත හැකි බවත්ය. මෙම පිළිවෙත පුද්ගලයන්ට තම ජීවිත පරිවර්තනය කර ගැනීමට, දුක් වේදනා ජය ගැනීමට සහ වඩාත් සාමකාමී ලෝකයකට දායක වීමට අභ්‍යන්තර ශක්තිය සහ අනුකම්පාව වර්ධනය |

| | | මහායාන යේ ශාඛා | | | |
|---|---|---|---|---|---|
| **හීනයාන (එහි අනුගාමිකයින් විසින් ථෙරවාදය ලෙසද හැඳින්වේ)** | **මහායාන** | **වජ්රයාන** | **සෙන් (හෝ චැන්)** | **පිවිතුරු දේශය:** | **නිචිරෙන්:** |
| මුළු බෞද්ධ ජනගහනයෙන් 36% | මුළු බෞද්ධ ජනගහනයෙන් 56.% | මුළු බෞද්ධ ජනගහනයෙන් 2-4% | | | |
| | | | | කදිම පරිසරයක් වන අතර, එය සාමාන්ය ජනතාවට ඇදහිල්ලෙන් සහ බුදුන් වහන්සේගේ නාමයේ බුද්ධ පාරායනය (නියාන්ෆෝ/නෙන්බුට්සු) මගින් කළ හැකි වේ. | කර ගැනීමට ඉඩ සලසයි.. |

# ඉස්ලාම් දහමේ බෙදීම්

ලෝකය පුරාම සිටින මුස්ලිම්වරුන් බැලූ බැල්මට එකම ජන කොටසක් ලෙස දිස් වුවද ඔවුන් විවිධ කාරණා පදනම් කරගෙන බෙදී තිබේ.

අව්ෆ් බින් මාලික් තුමාගෙන් වාර්තා වන පරිදි අල්ලාහ්ගේ දූතයාණෝ (ﷺ) මෙසේ පැවසූහ:

“යුදෙව්වන් කණ්ඩායම් හැත්තෑ එකකට බෙදී ගිය අතර, ඉන් එකක් පාරාදීසයේ සහ හැත්තෑව නිරයේ සිටිනු ඇත. කිතුනුවන් කණ්ඩායම් හැත්තෑ දෙකකට බෙදී ගිය අතර, ඉන් හැත්තෑ එකක් නිරයේ සහ එකක් පාරාදීසයේ සිටිනු ඇත. මුහම්මද් තුමාගේ ආත්මය අත ඇති තැනැත්තා මත දිවුරමි, මගේ ජාතිය කණ්ඩායම් හැත්තෑ තුනකට බෙදී යනු ඇත, ඉන් එකක් පාරාදීසයේ සහ හැත්තෑ දෙකක් නිරයේ සිටිනු ඇත.” Reference : Sunan Ibn Majah 3992 In-book reference : Book 36, Hadith 67 අත එය



ඉස්ලාම් දහමෙහි අනුගාමිකයන්ගේ ප්‍රාථමික බෙදීම් සුන්නි සහ ෂියා වන අතර, එය මුහම්මද් නබිතුමාගේ අනුප්‍රාප්තිය පිළිබඳ මතභේදයකින් පැන නගී. මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක් වන සුන්නිවරු, නායකයෙකු (කලීෆ්) ප්‍රජාව විසින් තෝරා ගත යුතු බව විශ්වාස කරන අතර, ෂියාවරු නායකයා (ඉමාම්) මුහම්මද් තුමාගේ දිව්‍යමය ලෙස පත් කරන ලද පරම්පරාවක් විය යුතු බව විශ්වාස කරති. අනෙකුත් ශාඛා සහ ව්‍යාපාර අතරට සූෆිවාදය, අහමදියා සහ ඉබාදිස් ඇතුළත් වන අතර, ප්‍රධාන වශයෙන් සුන්නි ශාඛාව තුළ ඇති වහබිවාදය සහ සලාෆිවාදය වැනි නිශ්චිත චින්තන පාසල් ද ඇතුළත් වේ. මෙම පොත සකසන මා සුන්නි මූස්ලිම්වරයෙකු වන අතර එහි බෙදී ඇති අනු ශාඛා වලටද සම්බන්ධයක් නැත.  සුන්නි සහ ෂියා අතර වෙනස වෙනම ලිපියකින් දක්වා ඇත.

“ශ්‍රී ලංකාවේ මුස්ලිම් සන්විධාන” යන නමින් ධර්ම ගවේශක ශාන් සිරාජ් විසින් ලියා ඇති ග්‍රන්ථය කියවා බලන්න. එහි 26 වන පිටුවේ ඇති සටහන පහතින් දක්වා ඇත. එම ග්‍රන්ථයෙහි පිටපතක් අපගේ වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක.



# යුදෙව් දහමේ බෙදීම්

යුදෙව් ආගමේ කණ්ඩායම් නිකායන් සහ දාර්ශනික වෙනස්කම් මත පදනම්ව වන අතර ප්‍රධාන ව්‍යාපාර හතරක් ඇත

ප්‍රධාන ආගමික ව්‍යාපාර:

ඕතඩොක්ස් යුදෙව් ආගම: ඓතිහාසිකව අර්ථකථනය කර ඇති පරිදි හලාකා (යුදෙව් නීතිය, ෂබාත් සහ කෂ්රුත් (ආහාර නීති) දැඩි ලෙස පිළිපැදීම ඇතුළුව) දැඩි ලෙස පිළිපැදීම අවධාරණය කරන වඩාත් සාම්ප්‍රදායික ව්‍යාපාරය.

කොන්සර්වේටිව් යුදෙව් ආගම: යුදෙව් සම්ප්‍රදාය සංරක්ෂණය කිරීමට උත්සාහ කරන අතරම නූතන ජීවිතයට සහ යුදෙව් නීතියේ අර්ථකථනවලට අනුගත වේ.

ප්‍රතිසංස්කරණ යුදෙව් ආගම: යුදෙව් ආගම පරිණාමය වන ශිෂ්ටාචාරයක් ලෙස සලකන සහ සදාචාරාත්මක ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරන වඩාත් ලිබරල් ව්‍යාපාරයක්, බොහෝ විට ආගමික භාවිතයේ වඩාත් නම්‍යශීලී බවක් ඇත.

ප්‍රතිසංස්කරණවාදී යුදෙව් ආගම: යුදෙව් ආගම පරිණාමය වන ශිෂ්ටාචාරයක් සහ යුදෙව් ජනතාවගේ සංස්කෘතියක් ලෙස සලකන අතර, සාම්ප්‍රදායික දිව්‍ය හෙළිදරව් කිරීම් කෙරෙහි අඩු අවධානයක් යොමු කරමින් සහ ප්‍රජාව සහ මානවවාදී වටිනාකම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.

මේවාට අමතරව,

හසිඩික් යුදෙව්වන්: ගුප්තවාදය, යාච්ඤාවේදී අධ්‍යාත්මික ප්‍රීතිය සහ නිශ්චිත රෙබ්බෙ (ආධ්‍යාත්මික නායකයෙකු) සහ ඔවුන්ගේ රාජවංශයට අනුගත වීම කෙරෙහි අවධානය යොමු කිරීම මගින් සංලක්ෂිත ඕතඩොක්ස් යුදෙව් ආගමේ කොටසක්.

ලෞකික යුදෙව්වන්: යුදෙව් සංස්කෘතිය හා උරුමය සමඟ හඳුනා ගන්නා නමුත් අනිවාර්යයෙන්ම ආගමික පිළිවෙත් හෝ විශ්වාසයන්ට අනුගත නොවන පුද්ගලයින්.

අනුබද්ධ නොවන යුදෙව්වන්: විශේෂයෙන් උතුරු ඇමරිකාවේ, කිසිදු විශේෂිත ආගමික ශාඛාවක් සමඟ හඳුනා නොගන්නා යුදෙව් ප්‍රජාවේ සැලකිය යුතු කොටසක්.

මෙම ප්‍රධාන ශාඛාවලින් ඔබ්බට, මුතුන් මිත්තන්ගේ සම්භවය සහ භූගෝලීය සම්භවය මත පදනම් වූ ජනවාර්ගික කණ්ඩායම් ද ඇත:

අෂ්කෙනසි යුදෙව්වන්: මධ්‍යම හා නැගෙනහිර යුරෝපයේ ජීවත් වූ මුතුන් මිත්තන් සිටි යුදෙව්වන්.

සෙෆාර්ඩි යුදෙව්වන්: අයිබීරියානු අර්ධද්වීපයෙන් (ස්පාඤ්ඤය සහ පෘතුගාලය) පැමිණි මුතුන් මිත්තන් සිටි යුදෙව්වන්.

මිස්රාහි යුදෙව්වන්: මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාවෙන් පැමිණි මුතුන් මිත්තන් සිටි යුදෙව්වන්.

"නූතන ඊශ්‍රායෙල්වරුන්" යන්නෙන් මූලික වශයෙන් අදහස් කරන්නේ නූතන ඊශ්‍රායෙල් රාජ්‍යයෙන් (මතුවූ යුදෙව්වන්) නොව, අනාගතවක්තෘ යා'කූබ් (ජාකොබ්) ගෙන් ආරම්භ වූ පරම්පරාවක් වන බානූ ඊශ්‍රායෙල් හෙවත් ඊශ්‍රායෙල් දරුවන් ය. බනු ඊශ්‍රායෙල් යන පදය කුරානයේ සැලකිය යුතු ආගමික සංකල්පයක් වන අතර එය බොහෝ විට පුරාණ ඊශ්‍රායෙල් ජනතාව ගැන සඳහන් කරයි, එය නූතන ඊශ්‍රායෙල් රාජ්‍යයේ ජීවත් වන ජනතාවගෙන් වෙනස් සංකල්පයකි. මුස්ලිම්වරු සමකාලීන යුදෙව් ජනතාව බානූ ඊශ්‍රායෙල් උරුමයේ ප්‍රාථමික උරුමක්කාරයන් ලෙස සලකන අතර සාමාන්‍යයෙන් ඉස්ලාමයේ ඔවුන්ව යුදෙව්වන් හෝ ග්‍රන්ථයේ ජනතාව ලෙස හඳුන්වනු ලැබේ.

"බානි ඊශ්‍රායලය" යන පදය ඉස්ලාමීය දෘෂ්ටිකෝණයකින් ආගමික නාමයක් වන අතර එය යුදෙව්වන් ස්වයං-හඳුනා ගැනීමට භාවිතා කරන අෂ්කෙනසි, සෙෆාර්ඩි

හෝ මිස්රාහි යුදෙව්වන් වැනි ජනවාර්ගික හා සංස්කෘතික කාණ්ඩ වලින් වෙනස් වේ.




## හින්දු දහමේ බෙදීම්

හින්දු ආගම යනු පුරාණ ඉන්දියාවේ ආරම්භ වූ අන්තර් සම්බන්ධිත ආගමික, දාර්ශනික සහ සංස්කෘතික සම්ප්‍රදායන්ගේ විවිධ එකතුවකි, එය බිලියනයකට අධික අනුගාමිකයින් සිටින පැරණි ආගමකි. එයට තනි නිර්මාතෘවරයෙකු නොමැත, දෙවිවරුන්, ශුද්ධ ග්‍රන්ථ සහ පුනරුත්පත්තිය සහ කර්මය වැනි පිළිවෙත් රාශියක් වැළඳ ගන්නා අතර, ඒ සියල්ල තුළ දේවත්වය සෙවීමේ සහ අවසාන අධ්‍යාත්මික යථාර්ථය වන බ්‍රහ්මයා සමඟ ඒකීයභාවය සාක්ෂාත් කර ගැනීමේ සංකල්පයෙන් ඒකාබද්ධ වේ.

මූලික විශ්වාසයන් සහ සංකල්ප;

දෙවියන් වහන්සේ සමඟ ඒකත්වය:- මධ්‍යම විශ්වාසයක් නම් සියලු යථාර්ථය අවසානයේ එකක් බවත්, ඒකවාදය ලෙස හඳුන්වන සංකල්පයක් බවත්, සෑම පුද්ගලයෙකු තුළම දේවත්වය පවතින බවත්ය.

බ්‍රහ්ම:- හින්දු භක්තිකයන් බ්‍රහ්මයා සමඟ මෙම ඒකත්වය, අවසාන යථාර්ථය හෝ ආත්මය අවබෝධ කර ගැනීමට උත්සාහ කරයි.

හෙනොදේවවාදය:- නූතන හින්දු ආගම බොහෝ විට හෙනොදේවවාදය, එක් උත්තරීතර දෙවියෙකුට නමස්කාර කිරීම, දෙවිවරුන් සහ දේවතාවියන් රාශියක විවිධ ප්‍රකාශනයන් (අවතාර) හඳුනා ගැනීම ප්‍රගුණ කරයි.

පුනරුත්පත්තිය සහ කර්මය:- පුනරුත්පත්තිය (ආත්මයේ නැවත ඉපදීම) සහ කර්මය (හේතුව සහ බලපෑම පිළිබඳ නීතිය) පිළිබඳ බෙදාගත් විශ්වාසයන් මූලික වේ.

ප්‍රධාන අංග;

දෙවිවරුන් සහ සංකේත:- ප්‍රධාන දෙවිවරුන්ට විෂ්ණු, ශිව, ගනේෂ සහ දුර්ගා ඇතුළත් වේ. ඕම් හි පූජනීය සංකේතය ද කැපී පෙනේ.

හින්දු ආගමේ කණ්ඩායම් වලට භක්ති කේන්ද්‍රය මත පදනම් වූ ප්‍රධාන නිකායන් විෂ්ණු, ශිව හෝ ශක්ති වැනි ප්‍රාථමික දෙවියෙකු මත කේන්ද්‍රගත වේ. මේවා හින්දු ආගම තුළ ඇති ප්‍රධාන උප කණ්ඩායම් වන අතර, ඒවායේ ප්‍රධාන නමස්කාර වස්තුව අනුව වෙනස් වේ.

- වෛෂ්ණවාදය: බැතිමතුන් ප්‍රධාන වශයෙන් විෂ්ණු දෙවියන් සහ ක්‍රිෂ්ණා සහ රාම වැනි ඔහුගේ අවතාර උත්තරීතර දෙවියා ලෙස වන්දනාමාන කරති.
- ශෛවවාදය: බැතිමතුන් තම භක්තිය උත්තරීතර දෙවියන් ලෙස ශිව දෙවියන් කෙරෙහි යොමු කරයි.
- ශක්තිවාදය: මෙම සම්ප්‍රදාය කේන්ද්‍රගත වන්නේ උත්තරීතර බලය සහ දේවත්වය ලෙස ශක්ති දේවතාවිය වන්දනා කිරීම මත ය.

➢ ස්මාර්තවාදය: ස්මාර්ත සම්ප්‍රදාය බහු දෙවිවරුන්ට නමස්කාර කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර, අනුගාමිකයින්ට ඔවුන්ගේ පුද්ගලික තෝරාගත් දෙවියා (ඉෂ්ඨ දේවතා) ලෙස ශිව, විෂ්ණු, ශක්ති සහ සූර්ය (සූර්ය දෙවියන්) ඇතුළු විවිධ දෙවිවරුන්ගෙන් තෝරා ගත හැකිය.

කුල ක්‍රමය (වර්ණ ක්‍රමය) :- මෙය සාම්ප්‍රදායික සමාජ ධූරාවලියක් වන අතර එය සමාජයේ ඔවුන්ගේ උපකල්පිත භූමිකාව මත පදනම්ව ප්‍රධාන පන්ති හතරකට මිනිසුන් වර්ගීකරණය කරයි.

- බ්‍රාහ්මණ: පූජක සහ උගත් පන්තිය.
- ක්ෂත්‍රිය: පාලකයන්, පරිපාලකයින් සහ රණශූරයන්.
- වෛශ්‍ය: වෙළඳුන්, ගොවීන් සහ වෙළඳුන්.
- ශුද්‍ර: කම්කරු සහ සේවක පන්ති.

දලිත් (ස්පර්ශ නොකළ අය): සාම්ප්‍රදායිකව ප්‍රධාන පන්ති හතරෙන් පිටත සිටින බව සලකනු ලබන සහ බොහෝ විට වෙනස්කම්වලට මුහුණ දෙන කණ්ඩායමකි.

---

## මහාවීර යනු කවුරුන්ද?

වර්ධමාන ලෙසද හැඳින්වෙන මහාවීර, වර්තමාන යුගයේ ජෛන ආගමේ විසිහතරවන සහ අවසාන තීර්තංකර (උත්තරීතර දේශකයා සහ "ෆෝර්ඩ්-නිර්මාතෘ") විය. ජෛන ආගමේ වර්තමාන ස්වරූපය ස්ථාපිත කිරීම සඳහා වගකිව යුතු කේන්ද්‍රීය චරිතය ලෙස ඔහු සැලකේ.

ජීවිතය

උපත සහ පසුබිම: මහාවීර ක්‍රි.පූ. 599 දී පමණ (සාම්ප්‍රදායික ආලය) ඉන්දියාවේ නූතන බිහාර් හි වෛශාලි අසල කුණ්ඩග්‍රාමයේ රාජකීය, පාලක පවුලක උපත ලැබීය. ඔහුගේ දෙමාපියන් වන සිද්ධාර්ථ රජු සහ ත්‍රිෂාලා රැජින, 23 වන තීර්තංකර, පාර්ශ්වනාථගේ ගිහි අනුගාමිකයන් වූහ.

අත්හැරීම සහ තපස්වීම: ඔහුගේ දෙමව්පියන්ගේ මරණයෙන් පසු (සමහර සම්ප්‍රදායන්ට අනුව), වයස අවුරුදු 30 දී, ඔහු තම රාජකීය ජීවිතය අත්හැර, අධ්‍යාත්මික පිබිදීමක් සඳහා ඉබාගාතේ යන තාපසයෙකු බවට පත්විය. ඔහු වසර දොළහහමාරක් තිස්සේ දැඩි භාවනාව සහ දැඩි තපස් පුහුණුවීම් කළ අතර, එම කාලය තුළ ඔහු තම ඇඳුම් ඉවත දමා සමබරතාවයෙන් ශාරීරික දුෂ්කරතා විඳදරා ගත්තේය.

සර්ව විද්‍යාව සහ ඉගැන්වීම: වයස අවුරුදු 42 දී, ඔහු සල් ගසක් යට කේවල ඥානය (සර්ව විද්‍යාව හෝ අනන්ත දැනුම) ලබා ගත්තේය.

ඉන්පසු ඔහු ඊළඟ වසර 30 තුළ තම දර්ශනය දේශනා කරමින් සහ ඔහුගේ අනුගාමිකයින් ජෛන සංගමය ලෙස හැඳින්වෙන සිව් වැදෑරුම් ප්‍රජාවකට (භික්ෂූන්, කන්‍යා සොහොයුරියන්, ගිහියන් සහ ගිහි කාන්තාවන්) සංවිධානය කරමින් ගත කළේය.

මරණය/මෝක්ෂය: ඔහු වයස අවුරුදු 72 දී බිහාර්හි පවාපුරි නගරයේ දී මෝක්ෂය (නැවත ඉපදීමේ චක්‍රයෙන් මිදීම) ලබා ගත්තේය. ජෛන ජාතිකයන් ඔහුගේ නිර්වාණ රාත්‍රිය දීපවාලි ලෙස සමරයි.

ඉගැන්වීම් සහ මූලධර්ම

මහාවීරගේ ඉගැන්වීම්, පවතින වෛදික සම්ප්‍රදායන්හි සමහර අංග, විශේෂයෙන් බ්‍රාහ්මණයන්ගේ අධිකාරිය සහ සත්ව පූජාවන්ට ප්‍රතිචාරයක් සහ ප්‍රතික්ෂේප කිරීමක් විය. ඔහු උපත් සහ මරණ චක්‍රයෙන් විමුක්තිය ලබා ගැනීමට ස්වයං උත්සාහය අවධාරණය කළේය.

ප්‍රධාන මූලධර්මවලට "ත්‍රිවිධ රත්න" සහ "පංච පොරොන්දම්" ඇතුළත් වේ:

ත්‍රිවිධ රත්න: අධ්‍යාත්මික විමුක්තිය කරා යන මාර්ගය නිවැරදි ඇදහිල්ල (සම්යක්-දර්ශන), නිවැරදි දැනුම (සම්යක්-ඥාන) සහ නිවැරදි හැසිරීම (සම්යක්-චරිත්‍ර) හරහා සාක්ෂාත් කරගනු ලැබේ.

ප්‍රතිඥා පහක් (මහාව්‍රත්ත): මහාවීර තම පූර්වගාමියා වූ පාර්ශ්වනාථගේ භාර හතර පුළුල් කළේ, තපස් සඳහා දැඩි අවශ්‍යතාවයක් ලෙස බ්‍රහ්මචර්යාව එකතු කිරීමෙනි. මෙම භාරයන් නම්:

1. අහිංසා (අවිහිංසාව): සියලු ජීවීන්ට ගරු කිරීම අවධාරණය කරන සහ ක්‍රියාවෙන්, කථනයෙන් සහ චින්තනයෙන් හානිය අවම කරන උත්තරීතර සදාචාරාත්මක ගුණය.
2. සත්‍ය (සත්‍යවාදී බව): හානිකර සත්‍යය පමණක් කථා කිරීම.
3. අස්තේය (සොරකම් නොකිරීම): නොදුන් කිසිවක් නොගැනීම.
4. බ්‍රහ්මචර්යාව (පවිත්‍රකම): ලිංගික සැප සම්පත් වලින් වැළකී සිටීම (භික්ෂූන් වහන්සේලා/කන්‍යා සොහොයුරියන් සඳහා).
5. අපරිග්‍රහ (ඇලීම/අත්පත් කර නොගැනීම): මිනිසුන්, ස්ථාන සහ ද්‍රව්‍යමය දේවලින් සම්පූර්ණයෙන්ම වෙන්වීම.

විශ්වයට මැවුම්කරුවෙකු, ආරක්ෂකයෙකු හෝ විනාශ කරන්නෙකු නොමැති බවත්, පැවැත්ම සදාකාලික බවත් මහාවීර ඉගැන්වීය. කර්මයෙන් ආත්මය පිරිසිදු කිරීම (ආත්මය නැවත ඉපදීමේ චක්‍රයට බැඳ තබන අදෘශ්‍යමාන ද්‍රව්‍යමය ද්‍රව්‍යයක් ලෙස සලකනු ලැබේ) සහ ස්ථිර සතුට අත්කර ගැනීම සඳහා ඔහු අතිශයින්ම අල්ප මාත්‍ර ජීවිතයක් වෙනුවෙන් පෙනී සිටියේය.

---

## මහාවීර සහ ගෞතම බුදුන් අතර සමානකම් හා වෙනස්කම්

ගෞතම බුදුන් වහන්සේ සහ මහාවීර යන දෙදෙනාම සමකාලීනයන් වූ අතර ඔවුන් පුරාණ ඉන්දියානු ශ්‍රමණ සම්ප්‍රදායෙන් බොහෝ මූලික සංකල්ප බෙදා ගන්නා නමුත් ඒවායේ මූලික දාර්ශනික මූලධර්ම සහ නියම කරන ලද පිළිවෙත් වලින් සැලකිය යුතු ලෙස වෙනස් වන වෙනස් ආගම් (පිළිවෙලින් බුද්ධාගම සහ ජෛන ආගම) ආරම්භ කළහ.

**සමානකම්**

රූප දෙකම සහ ඔවුන්ගේ ඉගැන්වීම් පොදු පසුබිමක් සහ ප්‍රධාන මූලධර්ම කිහිපයක් බෙදා ගනී:

සම්භවය සහ පසුබිම: දෙදෙනාම ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ ක්ෂත්‍රිය කුමාරවරුන් ලෙස උපත ලැබූ අතර අධ්‍යාත්මික සත්‍යය සහ නැවත ඉපදීමේ චක්‍රයෙන් (සංසාරය) විමුක්තිය සොයමින් ඔවුන්ගේ ධනවත් ජීවිත අත්හැරියහ.

වෛදික අධිකාරිය ප්‍රතික්ෂේප කිරීම: මහාවීර සහ බුදුන් යන දෙදෙනාම සමාජ සමානාත්මතාවය සහ විශ්වීය සහෝදරත්වය වෙනුවෙන් පෙනී සිටිමින් වේදවල අධිකාරිය, බ්‍රාහ්මණයන්ගේ ආධිපත්‍යය සහ ප්‍රචලිත කුල ක්‍රමය ප්‍රතික්ෂේප කළහ.

මූලික සංකල්ප: ඔවුන් දෙදෙනාම කර්මය (අනාගත ප්‍රතිවිපාක තීරණය කරන ක්‍රියාවන්) සහ නැවත ඉපදීම යන මූලධර්ම පිළිගත්තා.

විමුක්තිය කරා යන මාර්ගය: දෙදෙනාම චාරිත්‍ර වාරිත්‍ර, පූජා හෝ මැවුම්කාර දෙවියෙකුට වඩා සදාචාරාත්මක හැසිරීම, ස්වයං විනය සහ භාවනාව විමුක්තියට (මෝක්ෂය/නිර්වාණය) මාර්ගය ලෙස අවධාරණය කළහ.

අහිංසා (අවිහිංසාව): දෙදෙනාම සියලු ජීවීන් කෙරෙහි අවිහිංසාවාදයේ මූලධර්මය දේශනා කළ නමුත් එහි යෙදුමේ ප්‍රමාණය සැලකිය යුතු ලෙස වෙනස් විය.

බුදුන්වහන්සේ මගධි භාශාව භාවිතා කල අතර මහවීර භාවිතා කල භාශාවද අර්ධ මගධි භාශාව ලෙස ද, මෙම භාශා දෙකටම පොදුවේ ප්‍රාකිෂ්ට් භාශාව ලෙසද මධ්‍යම ඉන්දු-ආර්ය භාෂාව ලෙසද හදුන්වයි.

**වෙනස්කම්**

ප්‍රධාන වෙනස්කම් පවතින්නේ ඔවුන්ගේ දර්ශනයේ විශේෂතා සහ විමුක්ති මාර්ගයේ දැඩි බව තුළ ය:

| අංශය | ගෞතම බුදුන් (බුද්ධාගම) | මහාවීර (ජෛන ආගම) |
|---|---|---|
| ආරම්භය | 528 BCE | 557 BCE or 468 BCE |
| ප්‍රතිමාවන් අතර වෙනස (බැලූ බැල්මට දෙදෙනාම ස්වරූපයෙන් සහ ඉරියව්වලින්ද සමානය. එහෙත් සුළු වෙනස් කම් පෙන්වයි). | බුද්ධ ප්‍රතිමාවල බුදුන් වහන්සේ රෙද්දක් (සිවුරක්) ඔතාගෙන සිටී. (සාමාන්‍යයෙන් තුන්වන ඇස සංකේතවත් කරන සර්පිලාකාර තිලකයක් ඇත. හිසකෙස් පෙන්නුම් කරයි.   | මහාවීර ඔහුගේ ලෞකික සියල්ල අත්හැරීම නියෝජනය කරමින් රෙද්දකින් හෝ ශරීරය වසා නැත. මහාවීරගේ සරල ජීවිතය පෙන්නුම් කරමින් ඇතැම් විට ඔහුගේ හිසේ හිසකෙස් හෝ තිලකයක් පෙන්නුම් නොකරයි   |
| ආත්මය පිළිබඳ සංකල්පය | අනත්ත (ස්වයං-නිදහස්/අස්ථිර නොවන ආත්මය) ඉගැන්වූ අතර, ස්ථිර ආත්මයක් පිළිබඳ විශ්වාසය අහිතකර මානසික තත්වයක් ලෙස සලකන ලදී. | කර්මයෙන් සිරවී නිදහස් විය හැකි සදාකාලික, සාරභූත ජීවයක (ආත්මයක) පැවැත්ම ඉගැන්වීය. |
| විමුක්තියේ මාවත | ස්වයං තෘප්තිය සහ අන්ත තපස්කම අතර සමබර ප්‍රවේශයක් වන “මැද මාවත“ (මධ්‍යම ප්‍රතිපදාව) වෙනුවෙන් පෙනී සිටියේය. | සියලු කර්මය පුළුස්සා දැමීම සඳහා භික්ෂූන් වහන්සේලාට උපවාසය සහ නිරුවත ඇතුළුව දැඩි අල්පේච්ඡ හා දැඩි ස්වයං විනයකින් යුත් ජීවිතයක් වෙනුවෙන් පෙනී සිටියේය. |

| | | |
|---|---|---|
| අහිංසා පුහුණුව | අවිහිංසාව දේශනා කළ නමුත් භික්ෂූන් වහන්සේලාට මස් කෑමට අවසර දුන්නේ එය දානයක් ලෙස පූජා කළහොත් මිස ඔවුන් වෙනුවෙන් විශේෂයෙන් මරා නොදැමුවහොත් ය. | ඉතා දැඩි අහිංසා ක්‍රමයක් බලහත්කාරයෙන් ක්‍රියාත්මක කළ අතර, දැඩි නිර්මාංශිකත්වයක් සහ ක්ෂුද්‍ර ජීවීන්ට පවා හානි නොකිරීම සඳහා බිම අතුගා දැමීම හෝ මුඛ ආවරණ පැළඳීම වැනි පිළිවෙත් අනුගමනය කරන ලදී. |
| කර්මය | චේතනාව (චේතනාව) අත්‍යවශ්‍ය කර්ම සාධකය බව විශ්වාස කළා. | කර්මයට හේතුව භෞතික ක්‍රියාවම බව විශ්වාස කළා. |
| ඉලක්කය | චතුරාර්ය සත්‍යය සහ අෂ්ටාංගික මාර්ගය තුළින් ආශාව සහ අවිද්‍යාව දුරු කිරීමෙන් නිර්වාණය සාක්ෂාත් කර ගැනීම. | දැඩි විනය සහ ක්‍රියා නොකිරීම තුළින් සියලු කර්ම සමුච්චනයන්ගෙන් ආත්මය පවිත්‍ර කිරීමෙන් කෛවල්‍යය (සර්ව විද්‍යාව/විමුක්තිය) සාක්ෂාත් කර ගැනීම. |

---

# ප්‍රධාන ආගම්වල ධර්ම මූලාශ්‍ර

- හින්දු ග්‍රන්ථ
- බෞද්ධ ග්‍රන්ථ
- යුදෙව් ග්‍රන්ථ
- ක්‍රිස්තියානි ග්‍රන්ථ
- ඉස්ලාමීය ග්‍රන්ථ

# හින්දු ග්‍රන්ථ

හින්දු ග්‍රන්ථ යනු පූජනීය ග්‍රන්ථ වන අතර ඒවා පුළුල් ලෙස කාණ්ඩ දෙකකට බෙදා ඇත: ශ්‍රැති ("ඇසෙන දේ") සහ ස්මෘති ("මතක තබා ගන්නා දේ"). ශ්‍රැති දිව්‍යමය, සදාකාලික සත්‍යයන් ලෙස සලකනු ලබන අතර, වේද සහ උපනිෂද් වඩාත් කැපී පෙනෙන උදාහරණ වේ. භගවත් ගීතාව, පුරාණ සහ රාමායණය වැනි

ස්මෘති ග්‍රන්ථ මිනිසුන් විසින් රචිත ඒවා ලෙස සලකනු ලබන අතර වෙනස්වන තත්වයන්ට අනුව ශ්‍රුතිගේ ඉගැන්වීම් අර්ථ නිරූපණය කිරීමට සහ පැහැදිලි කිරීමට අදහස් කෙරේ.

- ශ්‍රුති [දෙවියන් වහන්සේගේ වචනය - එළිදරව්] (ඇසූ, මතක තබා ගත්)
- ස්මෘති [මිනිසා විසින් ලියන ලද]

වේදයන්

- ඍග්වේදය
- යජුර්වේදය.
- සාමවේදය.
- අථර්වවේදය.

මෙම සෑම වේදයකටම උපනිෂද්, සංහිතා, බ්‍රාහ්මණ සහ ආරණ්‍යක ඇතුළත් වේ.

| Upanishads | Samhitas | Brahmanas | Aranyakas |
|---|---|---|---|
| Aitareya | Manthras (Prayers) | Aitareya | Aitreya Aranyakas. |
| Chandogya | | Gopatha | Sankhayan Aranyak. |
| Kena | | Jaiminiya Upanishad Brahmana | Taittiriya Aranyak. |
| Katha | | Kaushitaki | Maitriyani Aranyak. |
| Taittiriya | | Panchavimsha Brahmana | Madhyandini Vrihadaranyak. |
| Svetasvatara | | Sadvimsha Brahmana | Talvakar Aranyak. |
| Maitrayani | | Shatapatha Brahmana | Jaimini. |
| Isha | | Taittirīya Brāhmaṇa | |
| Brihadaranyaka | | Vamsa Brahmana | |
| Mandukya | | | |
| Mundaka | | | |

| Smritis: | Vedangas (Sutras): | Upvedas: | 18 Puranas: | Upa-Puranas: |
|---|---|---|---|---|
| Atri. | Shiksha (Phonetics) | Ayurveda (Medical Science) | Vishnu Purana | Sanat-Kumara |
| Vishnu. | Kalpa (Ritual) | Dhanurveda (Military Science) | Shivpurana | Narasimha |
| Harita. | Vyakarana (Grammar) | Gandharvaveda (Musica Knowledge) | Skandhapurana | Brihan-Naradiya |
| Ausanasi. | Nirukta (Etymology) | Shilpveda (Science o Architecture) | Varahpurana | Siva-Rahasya |
| Angirasa. | Chhandas (Metrics) | | Agni Purana | Durvasa |
| Yama. | Jyotisha (Astronomy) | | Bhagvatpurana | Kapila |
| Āpastamba | | | Bhavishyapuran | Vamana |
| Samvartta | | | Brahmapuran | Bhargava |
| Kātyāyana | | | Brahmandapuran | Varuna |
| Brihaspati | | | Brahmavaivartapuran | Kalika |
| Parāśara | | | Kurmapuran | Samba |
| Vyāsa | | | Lingpuran | Nandi |
| Śaṅkha | | | Markandeyapuran | Surya |
| Likhita | | | Matsyapuran | Parasara |
| Dakṣa. | | | Naradapuran | Vasishtha |
| Gautama. | | | Padmapuran | Devi-Bhagavata |
| Śātātapa. | | | Vamanapuran | Ganesha |
| Vaśiṣṭha. | | **Other Books** | Vayupuran | Mudgala |
| Manusmriti. | | **Ramayana** | | Hansa |
| Narada Smriti. | | **Mahabharata** | | |
| Yajnavalkya Smriti. | | **Bhagvadgita** | | |

# බෞද්ධ ග්‍රන්ථ.

ගෞතම බුදුන් වහන්සේගේ සමුගැනීමෙන් පසු සියවස් ගණනාවක් පුරා ධර්ම කරුණු ප්‍රධාන වශයෙන් වාචිකව සම්ප්‍රේෂණය වූ අතර, පැරණිතම ලිඛිත ග්‍රන්ථ වන ගාන්ධාර බෞද්ධ ග්‍රන්ථ ක්‍රි.පූ. 1 වන සියවසේ සිට ක්‍රි.ව. 3 වන සියවස දක්වා කාලය තුළ දර්ශනය විය. පැරණිතම සම්පූර්ණ බෞද්ධ ග්‍රන්ථය සහ ථෙරවාද බුද්ධාගමේ හරය වන පාලි ග්‍රන්ථය, ක්‍රි.පූ. 1 වන සියවසේ මැද භාගයේදී පමණ ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය කර ඇති බව පෙනේ, නමුත් මෙම කාලය තුළ අනෙකුත් බෞද්ධ ප්‍රජාවන් ද ඔවුන්ගේ ග්‍රන්ථ ලියා තැබීමට පටන් ගත්හ.

වාචික සම්ප්‍රදාය ලිඛිත ග්‍රන්ථ වෙත

වාචික සම්ප්‍රේෂණය: වසර සිය ගණනක් තිස්සේ, බුදුන්ගේ ඉගැන්වීම් භික්ෂූන් වහන්සේලා සහ ඔවුන්ගේ සිසුන් විසින් කටපාඩම් කර කියවා ඇත.

පළමු ලිඛිත ග්‍රන්ථ: ගන්ධාර බෞද්ධ ග්‍රන්ථ ලෙස හැඳින්වෙන පැරණිතම බෞද්ධ අත්පිටපත් නූතන පකිස්ථානයේ සහ ඇෆ්ගනිස්ථානයෙන් හමු වූ අතර ඒවා ක්‍රි.පූ. 1 වන සියවසේ සිට ක්‍රි.ව. 3 වන සියවස දක්වා දිව යයි.

ථෙරවාද බුද්ධාගම සඳහා කේන්ද්‍රීය ග්‍රන්ථයක් වන පාලි ග්‍රන්ථ සම්පාදනය: ක්‍රි.පූ. 3 වන සියවසේදී සම්පාදනය කරන ලද අතර ක්‍රි.පූ. 1 වන සියවසේදී පමණ ශ්‍රී ලංකාවේදී ප්‍රථම වරට ලියා ඇත.

අරමුණ: භික්ෂූන් වහන්සේලා මිය යන විට වාචික සම්ප්‍රදාය අහිමි වීමට ඉඩ ඇති බැවින්, ඉගැන්වීම් අහිමි වීමේ බිය නිසා මෙය සැලකිය යුතු ක්‍රියාවක් විය.

සම්ප්‍රදාය අනුව විවිධ ග්‍රන්ථ ග්‍රන්ථ එකතුවක් දැකිය හැක. ථෙරවාද බුද්ධාගම සඳහා මූලික ග්‍රන්ථය ත්‍රිපිටකය වේ. එයට විනය පිටකය (ආරාම නීති), සූත්‍ර පිටකය (බුද්ධ දේශනා) සහ අභිධම්ම පිටකය (දාර්ශනික ඉගැන්වීම්) ඇතුළත් වේ.

(මහායාන බුද්ධාගම වැනි අනෙකුත් සම්ප්‍රදායන් අතර සංස්කෘත හා චීන ග්‍රන්ථවල සටහන් කර ඇති දියමන්ති සූත්‍රය, හෘද සූත්‍රය සහ නෙළුම් සූත්‍රය වැනි අමතර ග්‍රන්ථ ඇතුළත් වේ).

- **විනය පිටකය :-** පාරාජිකපාළිය/ පාචිත්තියපාළිය/ මහාවග්ගපාළිය/ චුල්ලවග්ගපාළිය/ පරිවාරපාළි 1/ පරිවාරපාළි 2 ලෙස කොටස් වලට වෙන් කර තිබේ. මේ සෑම එකක් තුලම සූත්‍ර විශාල ගනනක් අන්තර්ගත වේ.
- **සූත්‍ර පිටකය:-** දීඝ නිකාය/ මජ්ඣිම නිකාය/ සංයුත්ත නිකාය/ අඞ්ගුත්තර නිකාය/ ඛුද්දක නිකාය ලෙස කොටස් වලට වෙන් කර තිබේ. මේ සෑම එකක් තුලම සූත්‍ර විශාල ගනනක් අන්තර්ගත වේ.
- **අභිධර්ම පිටකය:-** ධම්මසඞ්ගණීප්‍රකරණය/ විභඞ්ගප්‍රකරණය 1 සහ 2/ කථාවස්තුප්‍රකරණය 1, 2 සහ 3/ ධාතුකථා ප්‍රකරණය/ පුද්ගල ප්‍රඥප්ති ප්‍රකරණය/ යමකප්‍රකරණය/ පට්ඨානප්‍රකරණය 1 , 2 සහ 3 ලෙස කොටස් වලට වෙන් කර තිබේ. මේ සෑම එකක් තුලම සූත්‍ර විශාල ගනනක් අන්තර්ගත වේ.

මේ සම්බන්ධව උපුටා ගන්නා දල සටහනක් පහතින් දැක් වේ.



# යුදෙව් ග්‍රන්ථ

දෙවියන් මූසා (Moses) නබි තුමාට දුන් දිව්‍ය හෙළිදරව්වන් හී මුල් පිටපත් අද වන විට සොයාගෙන නැත.

දෙවියන් මූසා නබි තුමාට දුන් ධර්මය

- ➢ ලිඛිත තව්රාතය
- ➢ වාචික තව්රාතය (මෙය ඇතැම් යුදෙව්වන්ගේ විශ්වාසයකි) මෙය "මිස්නා" ලෙසද හඳුන්වයි. මිස්නා ග්‍රන්ථාරූඩ වූයේ ක්‍රි පූ 2 වන සියවසේය.

පසු කාලීනව ඇති කල මිස්නා හි අර්ථ විවරනය ''ගෙමාරා'' ලෙස එළිදැක්වුනු අතර, මිස්නා සහ ගෙමාරා දෙකෙහි එකතුවට ''**තල්මූදය**'' ලෙස හඳුන්වයි. තල්මූදය යුදෙව්වන්ගේ ප්‍රධාන ග්‍රන්ථයකි . තල්මූදය තුල දෙවියන්ගේ මෙන්ම මිනිසුන්ගේ වදන් ද ඇත.

- ★ *ඉහත යෙසායා පොත පමනක් පූර්ණ වශයෙන් ඇත. අනික්වා අසම්පූර්ණය.
- ★ ඉහත පොත්වල විවරණ ෂෙපර් ලියවිලි ලෙස හඳුන්වයි.
- ★ *මීට අමතරව යුධ ලියවිලි සහ දේවස්ථාන ලියවිලි ලෙස තවත් අමතර ලියවිලිද මේ අතර ඇත.

යුදෙව් දහමේ ආරම්භයේ සිට වත්මන් කාලය දක්වා යුදෙව් ග්රන්ථ වල විකාශය.

| ක්‍රි.පූ 2 සියවස | ක්‍රි.ව 4 සියවස | ක්‍රි.ව 1005-1008 -1( සියවස | ක්‍රි.ව 1200 12 සියවස |
|---|---|---|---|
| **මළ මුහුදු ලියැවැල්** | **සයිනටික්ස් අත් පිටපත්** | **ලෙනින්ග්‍රැඩ් අත් පිටපත පොත (හීබෲ පොතකි)** | **සමාරිඅ පං පුස්ථකය** |
| උප්පත්තිය | උප්පත්තිය | උප්පත්තිය | උප්පත්තිය |
| නික්මයාම | | නික්මයාම | නික්මයාම |
| ලෙවී ව්‍යවස්තාව | ලෙවී ව්‍යවස්තාව | ලෙවී ව්‍යවස්තාව | ලෙවී ව්‍යවස්තාව |
| ගණන් කතාව | ගණන් කතාව | ගණන් කතාව | ගණන් කතාව |

| ද්විතීයික නීති සංග්‍රහය | ද්විතීයික නීති සංග්‍රහය | ද්විතීයික නීති සංග්‍රහය | ද්විතීයික නී සංග්‍රහය |
|---|---|---|---|
| ජොෂුවා | ජොෂුවා | ජොෂුවා | |
| වීරාවලිය | | වීරාවලිය | |
| රූත්ගේ කතාව | | රූත්ගේ කතාව | |
| 1 සහ 2 සාමුවෙල් | | 1 සහ 2 සාමුවෙල් | |
| 1 සහ 2 රාජාවලිය | | 1 සහ 2 රාජාවලිය | |
| ජෝබ් | | ජෝබ් | |
| ගීතාවලිය | ගීතාවලිය | ගීතාවලිය | |
| දිවැසිවරුන් දොලොස්දෙනා. | දිවැසිවරුන් දොලොස්දෙනා. | දිවැසිවරුන් දොලොස්දෙනා. | |
| තෝබීත් | තෝබීත් | | |
| සිරාක් | | | |
| බාරුක් | | | |
| ගීතාවලිය 151 | | | |
| ජුබිලි පොත | | | |
| 1 ඊනෝච් | | | |
| යෙසායා | යෙසායා | යෙසායා | |
| | | | |
| *ඉහත යෙසායා පොත පමනක් පූර්ණ වශයෙ ඇත. අනික්වා අසම්පූර්ණය. | 1 වංශාවලිය | 1 හා 2 වංශාවලි | |
| | එස්රා | එස්රා | |
| | එස්තර් | එස්තර් | |
| | ජූදිත් | | |
| ඉහත පොත්වල විවරණ ෂෙපර් ලියවිලි ලෙ හදුන්වයි. | 1 හා 4 මකබීවරුන් | | |
| | ජෙරමියා | ජෙරමියා | |
| | විලාප ගී | විලාප ගී | |
| මීට අමතරව යුධ ලියවිලි සහ දේවස්ථාන ලියවි ලෙස තවත් අමතර ලියවිලිද මේ අතර ඇත | හිතෝපදේශ | හිතෝපදේශ | |
| | ධර්මදේශකයා | ධර්මදේශකයා | |
| | ප්‍රේම ගී | ප්‍රේම ගී | |
| | සලමොන්ගේ ප්‍රඥාව | | |
| | | | |
| | සිරාක්, ජෝබ් යන පොත්ව ග්‍රීක පරිවර්ථන | | |
| | මතෙව් | | |
| | මාක් | | |
| | ලූක් | | |

| | | | |
|---|---|---|---|
| | ජොහාන් | | |
| | රෝමවරු | | |
| | 1 හා 2 තෙසලෝනිකවරු | | |
| | හේබ්‍රෙව්වරුන් | | |
| | 1 හා 2 තිමෝතියස් | | |
| | තීතස් | | |
| | පිලොමෝන් | | |
| | ක්‍රියා | | |
| | ජාකෝබ් | | |
| | 1 හා 2 පේදුරු | | |
| | 1,2 හා 3 ජොහාන් | | |
| | ජුද් | | |
| | එළිදරව්ව | | |
| | බාර්ණබස් | එසකියෙල් | |
| | හර්මස්ගේ එඬේරා | නෙහෙමියා | |

- *ඉහත යෙසායා පොත පමනක් පූර්ණ වශයෙන් ඇත. අනික්වා අසම්පූර්ණය.
- ඉහත පොත්වල විවරණ ෂෙපර් ලියවිලි ලෙස හඳුන්වයි.
- *මීට අමතරව යුධ ලියවිලි සහ දේවස්ථාන ලියවිලි ලෙස තවත් අමතර ලියවිලිද මේ අතර ඇත.

**යුදෙව් දහමේ ආරම්භයේ සිට වත්මන් කාලය දක්වා යුදෙව් ග්‍රන්ථ වල විකාශය.**

| අදින් වසර | | | | | |
|---|---|---|---|---|---|
| 3600 | ක්‍රි.පූ | 1400 | 14 | සියවස | මූසා නබි තුමා ජීවත් වූ කාලය |
| 3500 | ක්‍රි.පූ | 1300 | 13 | සියවස | මූසා නබි තුමා ජීවත් වූ කාලය |
| 3400 | ක්‍රි.පූ | 1200 | 12 | සියවස | |
| 3300 | ක්‍රි.පූ | 1100 | 11 | සියවස | |
| 3200 | ක්‍රි.පූ | 1000 | 10 | සියවස | |
| 3100 | ක්‍රි.පූ | 900 | 9 | සියවස | |
| 3000 | ක්‍රි.පූ | 800 | 8 | සියවස | |
| 2900 | ක්‍රි.පූ | 700 | 7 | සියවස | |
| 2800 | ක්‍රි.පූ | 600 | 6 | සියවස | මේ කාලයේ හීබෘ (හෙබ්‍රෙව්) බසින් ලියැවුණු ලියවුනු රිදී ලියවැල් දෙකක් හමුවී ඇත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2700 | ක්‍රි.පූ | 500 | 5 | සියවස | |
| 2600 | ක්‍රි.පූ | 400 | 4 | සියවස | බුදුන්වහන්සේ සිටි කාලය |
| 2500 | ක්‍රි.පූ | 300 | 3 | සියවස | මේ කාලයේ යුදෙව්වන් හීබෲ ලියැවිලි ග්‍රීක භාශාවට පරිවර්තනය කර ඇත. (LXX සෙප්ටුඅජින්ට්) |
| 2400 | ක්‍රි.පූ | 200 | 2 | සියවස | මේ කාලයේ හීබෲ බසින් ලියැවුණු නාශ් පැප්රි ලේඛණය (එක් පිටුවක්) හමුවී ඇත. (හෙබ්‍රෙව් මැසොරටික් ලියවිලි) |
| | | | 2 | සියවස | මේ කාලයේ කුම්රාන් ප්‍රදේශයේ සිටි යුදෙව්වන් හීබෲ බසින් ලියූ "මළ මුහුදු ලියැවැල් හමුවී ඇත. ඒවායේ යුදෙව්වන්ගේ ඉතිහාසය ගැන සඳහන්ව ඇත |
| 2300 | ක්‍රි.පූ | 100 | 1 | සියවස | ෆුආද් පැප්රි ලේඛණය :-මෙය හීබෲ භාශාවෙන් තිබූ "පොත් පහ" ග්‍රීක භාශාවට පරිවර්ථනය කර ඇත |
| 2200 | ක්‍රි.ව | 0 | 0 | සියවස | යේසුස්වහන්සේ සිටි කාලය |
| 2100 | ක්‍රි.ව | 100 | 1 | සියවස | |
| 2000 | ක්‍රි.ව | 200 | 2 | සියවස | |
| 1900 | ක්‍රි.ව | 300 | 3 | සියවස | |
| 1800 | ක්‍රි.ව | 400 | 4 | සියවස | සයිනටිකස් අත් පිටපත් පොත |
| 1700 | ක්‍රි.ව | 500 | 5 | සියවස | |
| 1600 | ක්‍රි.ව | 600 | 6 | සියවස | [කුරානය පහළ වූ කාලය] |
| 1500 | ක්‍රි.ව | 700 | 7 | සියවස | |
| 1400 | ක්‍රි.ව | 800 | 8 | සියවස | |
| 1300 | ක්‍රි.ව | 900 | 9 | සියවස | |
| 1200 | ක්‍රි.ව | 1000 | 10 | සියවස | ලෙනින්ග්‍රෑඩ් අත් පිටපත් පොත (1005-1008) (හෙබ්‍රෙව් මැසොරටික් ලියවිලි) |
| 1100 | ක්‍රි.ව | 1100 | 11 | සියවස | |
| 1000 | ක්‍රි.ව | 1200 | 12 | සියවස | සමාරිඅ පංච පුස්ථකය (මුහුදු ලියැවැල් වල අඩංගු දැහි පිටපත් හමු වී ඇත) (සමාරිඅ තව්රාතය) |
| 900 | ක්‍රි.ව | 1300 | 13 | සියවස | |
| 800 | ක්‍රි.ව | 1400 | 14 | සියවස | |
| 700 | ක්‍රි.ව | 1500 | 15 | සියවස | |
| 600 | ක්‍රි.ව | 1600 | 16 | සියවස | |
| 500 | ක්‍රි.ව | 1700 | 17 | සියවස | |
| 400 | ක්‍රි.ව | 1800 | 18 | සියවස | |
| 300 | ක්‍රි.ව | 1900 | 19 | සියවස | |
| 200 | ක්‍රි.ව | 2000 | 20 | සියවස | |
| 100 | ක්‍රි.ව | 2100 | 21 | සියවස | |
| | ක්‍රි.ව | 2200 | 22 | සියවස | |

---------------------------------------------------------------------------------------

# ක්‍රිස්තියානි ග්‍රන්ථ

ක්‍රිස්තියානි ශුද්ධ ලියවිලි යනු කිතුනුවන් විසින් බලයලත් සහ පූජනීය ලෙස පිළිගත් ශුද්ධ ලියවිලි එකතුවක් වන අතර, ප්‍රධාන වශයෙන් පැරණි ගිවිසුම සහ නව ගිවිසුම ඇතුළත් වන අතර ඒවා එක්ව බයිබලය සකසා ඇත. "ලිවීම" යන අර්ථය ඇති ලතින් වචනයක් වන ස්ස්රිප්ûර වෙතින් උපුටා ගන්නා ලද මෙම පාඨ දෙවියන් වහන්සේගේ චරිතය සහ සැලැස්ම හෙළි කරන අතර, දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව ජීවත් වීම සඳහා දිව්‍ය මඟ පෙන්වීමක් ඒවායින් ලබා දෙයි. කිතුනුවන් බයිබලය දෙවියන් වහන්සේගේ ආනුභාවයෙන් ලියන ලද, දෝෂයකින් තොරව සහ ඇදහිල්ලේ සහ ජීවිතයේ සියලු කාරණා සම්බන්ධයෙන් අවසාන අධිකාරිය ලෙස සලකයි. (නමුත් එහි බොහෝමයක් දෝශ දැකිය හැක).

**ක්‍රිස්තියානි ශුද්ධ ලියවිලිවල ප්‍රධාන අංග**

**බයිබලය:** ක්‍රිස්තියානි ශුද්ධ ලියවිලි සාමාන්‍යයෙන් බයිබලය ලෙස හඳුන්වනු ලබන අතර එය පැරණි සහ නව ගිවිසුම් වලින් සමන්විත වේ. "බයිබලය" යන වචනය යේසුස් වහන්සේට පසු කාලීනව භාවිතා කළ නමකි. එය "පොත්" යන අර්ථය ඇති ග්‍රීක "බිබ්ලියා" වලින් සෑදුනු නමකි. කිතුනුවන්ට, බයිබලයේ කේන්ද්‍රීය අර්ථය වන්නේ දෙවියන් වහන්සේ මනුෂ්‍යත්වයට හෙළි කිරීම සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින් ගැලවීම සඳහා මාර්ගයක් සැපයීමයි.

**දිව්‍ය එළිදරව්ව:** ක්‍රිස්තියානීන් විශ්වාස කරන්නේ ශුද්ධ ලියවිලි දෙවියන් වහන්සේ මනුෂ්‍ය වර්ගයාට කළ ලිඛිත එළිදරව්වක් බවත්, ඔහුගේ චරිතය සහ ගැලවීමේ සැලැස්ම ප්‍රකාශ කරන බවත්ය.

**මාර්ගෝපදේශය සහ අධිකාරිය:** ක්‍රිස්තියානි ජීවිතය සඳහා බයිබලය මඟ පෙන්වීම සපයන අතර විශ්වාසයන් සහ ක්‍රියාවන් සඳහා අවසාන, විශ්වාසදායක අධිකාරිය ලෙස සේවය කරයි.

**ඓතිහාසික සන්දර්භය:** අළුත් ගිවිසුම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය, මරණය සහ නැවත නැඟිටීම කෙරෙහි අවධානය යොමු කරන අතර, පැරණි ගිවිසුම දෙවියන් වහන්සේගේ සෙනඟ වන ඊශ්‍රායෙලයේ ඉතිහාසය වාර්තා කරයි.

**කැනනය:** ක්‍රිස්තියානි ප්‍රජාවන් තුළ සියවස් ගණනාවක් පුරා විවාද සහ එකඟතාවයන් හරහා ස්ථාපිත කරන ලද බලයලත් පාඨ එකතුව බයිබලානුකූල කැනනය ලෙස හැඳින්වේ.

**දෙවියන් වහන්සේගේ වචනය:** ක්‍රිස්තියානීන් බොහෝ විට ශුද්ධ ලියවිලි "දෙවියන් වහන්සේගේ වචනය" හෝ "වචනය" ලෙස හඳුන්වන අතර, එහි දිව්‍යමය ආරම්භය සහ උත්තරීතර වැදගත්කම පෙන්නුම් කරයි.

නව ගිවිසුම් වල මුල් පිටපත් අප සතුව නැත. අද වන විට භාවිතයේ ඇත්තේ අත් පිටපත් වල අත් පිටපත් වලින් හමුවූ කොටස් එකතු කර සාදාගත් නව අත් පිටපතකි

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2400 | ක්‍රි.පූ | 200 | 2 | සියවස | | |
| 2300 | ක්‍රි.පූ | 100 | 1 | සියවස | | |
| 2200 | ක්‍රි.ව | 0 | 0 | සියවස | යෙසුස් වහන්සේගේ උපත | යේසුස් (ඊසා) නබි තුමාට දෙවියන් තව්රාතයත් අනාවරනය කල අතර අළුතිප ඉන්ජීලය අනාවරණය කරන ලදී. නමුත් ඉන්ජීලයේ මුල් පිටපතද අද වන විට සොය ගත නොහැක. ඒ වෙනුවට ග්‍රීක බසින් සියැවුනු ලේඛන 27 කින් සමන්විත න ගිවිසුම ඇත. එහි තව්රාතයේ අඩංගු දේද, ඉන්ජීලයේ අඩංගු දේද, ජේසු තුමාගෙ ජීවිතය ගැන තොරතුරුද මිනිසුන්ගේ වදන්ද ආදීය කලවම් වී අන්තර්ගතය |
| 2100 | ක්‍රි.ව | 100 | 1 | සියවස | | |
| 2000 | ක්‍රි.ව | 200 | 2 | සියවස | | |
| 1900 | ක්‍රි.ව | 300 | 3 | සියවස | | |
| 1800 | ක්‍රි.ව | 400 | 4 | සියවස | | නව ගිවිසුමෙහි පහත සඳහන් දෑ දැකිය හැක. යේසුස් තුමාගේ ජීවිත කතාව විස්ත කරනසුබ අස්න 4 ක් |
| 1700 | ක්‍රි.ව | 500 | 5 | සියවස | | 1. මතෙව් සුබ අස්න<br>2. මාර්ක් සුබ අස්න<br>3. ලූක් සුබ අස්න<br>4. ජොහාන් සුබ අස්න |
| 1600 | ක්‍රි.ව | 600 | 6 | සියවස | | |
| 1500 | ක්‍රි.ව | 700 | 7 | සියවස | | |
| 1400 | ක්‍රි.ව | 800 | 8 | සියවස | | |
| 1300 | ක්‍රි.ව | 900 | 9 | සියවස | | |
| 1200 | ක්‍රි.ව | 1000 | 10 | සියවස | | |
| 1100 | ක්‍රි.ව | 1100 | 11 | සියවස | | |
| 1000 | ක්‍රි.ව | 1200 | 12 | සියවස | | ක්‍රියා පොත (ප්‍රේරිතවරුන්ගේ (යෙසුස් තුමාගේ ගෝලයන්ගේ) ඉතිහාසයන් සහ ඔවුන්ගේ ක්‍රියාවන් ඇතුලත් පොත) |
| 900 | ක්‍රි.ව | 1300 | 13 | සියවස | පාවුල් පේදුරු | මෙතුමන්ලා ලියූ හසුන් 21 ක් ඇතුලත්. රෝමවරු. 1 කොරින්ති, 2 කොරින්ති ගලාති, එපීස, සොලොස්සි, 1 තිමෝති, 2 තිමෝති, තීතස්, පිලෙමෝන්, පිලිප්පිවරු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | ජොහාන්<br>ජේම්ස්<br>(ජාකොබ්)<br>ජූද් | හේබ්‍රෙව්වරු (මෙහි කතෘ නිස්චිත නැත)<br>1 පේදුරු හසුන, 2 පේදුරු හසුන<br>හසුන් 3 ක්, සහ ජොහාන් තුමා දැකපු සිහිනය - එළිදරව්ව<br>ජාකොබ් හසුන<br>ජූද් හසුන |
| 800 | ක්‍රි.ව | 1400 | 14 | සියවස | | |
| 700 | ක්‍රි.ව | 1500 | 15 | සියවස | 1535 | Tyndale Bible |
| 600 | ක්‍රි.ව | 1600 | 16 | සියවස | 1610 | Douay-Rheims Bible |
| 500 | ක්‍රි.ව | 1700 | 17 | සියවස | 1611 | King James Version – KJV |
| 400 | ක්‍රි.ව | 1800 | 18 | සියවස | | |
| 300 | ක්‍රි.ව | 1900 | 19 | සියවස | 1952 | Revised Standard Version – RSV |
| 200 | ක්‍රි.ව | 2000 | 20 | සියවස | 1961 | New World Translation of Holy Scriptures – NWT |
| 100 | ක්‍රි.ව | 2100 | 21 | සියවස | 1970 | The New American Bible - NAB& |
| | ක්‍රි.ව | 2200 | 22 | සියවස | 1978 | New International Version - NIV& |

නව ගිවිසුම් වල මුල් පිටපත් අප සතුව නැත. අද වන විට භාවිතයේ ඇත්තේ අත් පිටපත් වල අත් පිටපත් වලින් හමුවූ කොටස් එකතු කර සාදාගත් නව අත් පිටපතකි.

---

## ඉස්ලාමීය ග්‍රන්ථ

ඉස්ලාම් දහමෙහි ප්‍රධාන ආගමික මූලාශ්‍ර 2කි.

1. ශුද්ධ වූ අල් කුර්ආන්
2. පිළිගත් හදීස්

### 1) කුරානය

කුරානය යනු සර්වබලධාරී අල්ලාහ් දෙවියන් විසින් ජිබ්රීල් නම් මලායිකාවරයා හරහා මීට වසර 1450 කට පමණ පෙර මක්කාවේ විසූ මොහම්මද් “ﷺ” නැමති නබිවරයා වෙත පහළ කල දිව්‍ය හෙළිදරව්වයි. එය පහළ වූ ආකාරයටම (එකම

වචනයක හෝ) කිසිඳු වෙනසකට ලක් නොවී අද දක්වාම සුරක්ෂිතව ඇත.

- බිස්මිල්ලාහ් ඇතුළුව අල් කුර්ආනයේ මුළු වාක්‍ය සංඛ්‍යාව 6,348 කි.
- බිස්මිල්ලාහ් හැරුණු විට අල් කුර්ආනයේ මුළු වාක්‍ය සංඛ්‍යාව 6,236
- අල් කුර්ආනයේ ඇති පරිච්ඡේද ගණන 114 කි.
- අල් කුර්ආනයේ ඇති වචන ගණන 157935 කි.
- අල් කුර්ආනයේ ඇති අකුරු ගණන 668684 කි.

දැනට පෘතුවිය තුල කිසිඳු වෙනසකට ලක් නොවී පවතින එකම ආගමික ග්‍රන්ථය ලෙස මෙම කුරානය හඳුන්වා දිය හැක.

**2) හදීස්**

හදීස් යනු සර්වබලධාරී අල්ලාහ් දෙවියන් වහන්සේ අවසන් දේව දූත මොහම්මද් නබි තුමාට කුරානයට අමතරව (වෙනත් ආකාර වලින්) දැණුම් දුන් ධර්මයට සම්බන්ධ කරුණුය. ඒවා මොහම්මද් නබි තුමා එතුමාගේ වදන් වලින් හෝ ක්‍රියාවෙන් ඉදිරිපත් කල කරුණුය. ඒ සියල්ල ධර්මයට සම්බන්ධ කරුණුය. එතුමා නබි වරයෙකු ලෙස සිටි කාලය තුල ඒවා ඔහුගෙ අනුගාමිකයන්ට උපදෙස් ලෙස හෝ අදහස් ලෙස හෝ දේශනා කල දේවල්ය. එසේත් නැත්නම් එතුමා ක්‍රියාවෙන් කර පෙන්වූ ඒවා සහ වෙනත් අය කල හෝ කී දේ අනුමත කිරීම් ආකාරයෙන්ද වූ ඒවා ය. එතුමාගේ එම හැසිරීම තුල සිදුවූ සිදුවීම් අදාල කොට ඒවා පොත්වල ලියැවුනි. මේ සඳහා එතුමාව සෘජුවම ඇසුරු කල අයගෙන්ද, ඔවුන්ව සමීපයෙන් ඇසුරු කල අයගෙන්ද ආදී වශයෙන් තොරතුරු එකතුකර මෙම "හදීස් ග්‍රන්ථ" සකස් කෙරිණ. එම තොරතුරු සැපයූ අය ලෙස නබිතුමාගේ පවුලේ අය, මිතුරන් (සහාබිවරුන්), ඔවුන්ගේ පහල පරම්පරාවේ අය (තාබීත් වරුන්) සහ ඔවුන්ගේත් පහල පරම්පරාවේ අය (තබි තාබීත් වරුන්) ලෙස නබි තුමාට සමීප කාල වල සිටි අයයි. මෙම තොරතුරු විද්වතුන් කිහිප දෙනෙකු විසින් එකතු කර ග්‍රන්ථාරූඩ කරන ලදී. මේවායින් ද වඩාත් විශ්වාසදායි දැය පමනක් අනුගමනය කිරීමට මුස්ලිම් විද්වතුන් පියවර ගෙන ඇත.

පිළිගත් හදීස් පොත් කිහිපයක් සම්බන්ධව තොරතුරු පහතින් දැක් වේ



මෙම සටහනෙහි ඇති හදීස් වලින් හදීස් කිහිපයක් තෝරාගෙන සැකසූ පොතක් ද ඇත. එය ‘‘රියාලුස් සාලිහීන්‘‘ ලෙස හැදින්වේ. සාමාන්‍යය ජීවිතයේදී පහත රූපයේ පරිදි ඇති විශාල පොත් ප්‍රමාණයක් පරිහරණය කිරීම අපහසු උනත් මෙම රියාලුස් සාලිහීන් පොත අත් පොතක් ලෙස භාවිතා කිරීමට පුලුවන. එය සිංහල භාෂාවෙන් ‘‘සුදනන්ගේ මල් උයන‘‘ යන නමින් පරිවර්තනයකට ලක් කර ඇත. ඒ අනුව මුස්ලිම්වරුන්ගේ අත් පොත් ලෙස ශුද්ධවූ කුරාණයත් රියාලුස් සාලිහීන් පොතත් හදුන්වා දිය හැක .



## <u>ප්‍රධාන හදීස් ග්‍රන්ථ සහ එහි කතුවරයන්</u>

| | හදීස් ග්‍රන්ථයෙහි නම සහ එහි කතුවරයාගේ නම | කතුවරයා ගේ | | කතුවරයාව හඳුන්වන කෙටි නම |
|---|---|---|---|---|
| | | උපත (හිජිරි වසර) | විපත (හිජිරි වසර) | |
| 1 | අල්-මුඅත්තා | 93 | 179 | Abu Abdillah |
| | මාලික් ඉබ්නු අනස් ඉබ්නු මාලික් ඉබ්නු අබු ආමීර් අල් අස්බහි | | | |
| 2 | අහ්මද් (මුස්නද් අහ්මද්) | 164 | 241 | Abu Abdillah |
| | ඉබ්නු හම්බල් අෂ්-ෂෙයිබානි | | | |
| 3 | දාරමී (සුනන් දාරමී) | 181 | 255 | Abu Mohammad |
| | අබ්දුල්ලාහ් ඉබ්නු අබ්දුර් රහ්මාන් ඉබ්නු ෆල්ල් ඉබ්නු බහ්රාම් තමීම් දාරමී | | | |
| 4 | බුහාරි (සහීහුල් බුහාරි) | 194 | 256 | Abu Abdillah |
| | මුහම්මද් ඉබ්නු ඉස්මාඊල් ඉබ්නු ඉබ්රාහිම් මුගීරා ඉබ්නු බර්තිස්බීහ් | | | |
| 5 | අබු දාවුද් (සුනන් අබී දාවූද්) | 202 | 256 | Abu Dhawudh |
| | සුලෙයිමාන් ඉබ්නු අෂ්- ෂ'දී ඉබ්නු ඉස් හාක් අල්-අස්දි අස්-සජස්තානි | | | |
| 6 | මුස්ලිම් (සහීහුල් මුස්ලිම්) | 204 | 261 | Imam Muslim |
| | මුස්ලිම් ඉබ්නු හජ්ජාජ් අල්-කුසෙයිරි අන් නයිසාබූරි | | | |
| 7 | උබ්නු මාජා (සුනන් ඉබ්නු මාජා) | 207 | 273 or 275 | Ibnu Maja |
| | මුහම්මද් ඉබ්නු සඊද් ඉබ්නු මාජා අල්-කස්වීන් | | | |
| 8 | තිර්මිදි (ජාමිඋත් තිර්මිදි) | 209 | 279 | Abu Isa |
| | මුහම්මද් ඉබ්නු ඊසා | | | |
| 9 | නසා'ඉ (සුනන් නසාඉ) | 215 | 303 | Abu Abdur Rahman |
| | ඉබ්නු සූඑයිබ් | | | |
| 10 | හාකිම් (මුස්තදරක් හාකිම්) | 321 | 405 | Abu Abdillah |
| | මුහම්මද් ඉබ්නු අබ්දිල්ලාහ් නයිසාරබූරි | | | |
| 11 | බයිහකී | 374 | 458 | Abu Bakkar |
| | අහ්මද් ඉබ්නු හුසෙයින් | | | |
| 12 | ඉබ්නු හිබ්බාන් | | 80 years old | Abu Haatham |
| | මුහම්මද් ඉබ්නු හිබ්බාන් ඉබ්නු අහ්මද් ඉබ්නු හිබ්බාන් බස්ති | | | |

## ක්‍රිස්තියානි ආගම සම්බන්ධව

මුලින්ම ජේසු තුමාගේ නම හරියට හඳුනාගෙන සිටිමු. කිතුනුවන්ගෙන් බහුතරයක් සහ ලෝක ජනගහනයෙන් බහුතරයක් එතුමාගේ නාමය පවා නිවැරදිව භාවිතා නොකරන බව දැකිය හැකිය.

අරාබිකරයේ, පලස්තීනයේ ජෙරුසෙලම් නගරයට නුදුරින් බෙත්ලහම් නම් ගමෙහි දී මර්යම් තුමියට ප්‍රාතිහාර්යයක් ලෙසින් ඉපදුනු දරුවාට ඇය විසින් හෙබ්‍රෙව් (හීබ්රු) භාෂාවෙන් "ගලවා ගැනීමට", "බේදා හැරීමට" යන අරුත ඇතිව යෙහෙෂුවා (හෝ යෙෂුවා) යන නම ලබා දී ඇත. එය භාවිතයේ පහසුවට ඔහුගේ මව සහ එතුමාගේ ගම්වාසීන් (වන යුදෙව්වරුන්) එතුමාට "යේෂු" "ඊෂෝ" "ඊසා" "මෙෂියාආ" ලෙසින්ද භාවිතා කර ඇත. දෙවියන්වහන්සේ එතුමා ගැන අල් කුරාණය තුලින් කතා කරන විට "ඊසා" සහ "මසීහ්" යන නම් භාවිතා කර ඇත. (මරියම්ගේ පුත් ඊසා/ Isa ibn Maryam).

එතුමාගේ නම වන යෙහ්ශුවා යන්නට පසුව අභිෂේකලත් තැනැත්තා (Anointed One) යන වචනයේ හේබ්‍රෙව් වචනය වන Messiah යන්න භාවිත කර ඇත. එම නම් දෙකම එකවර Yeshua HaMashiach ලෙස භාවිතා කර ඇත. එතුමාට පසුකාලීනව එය පරිවර්ථනය සහ කෙටිකර Jesus Christ ලෙස භාවිතා කිරීමට පටන්ගෙන ඇත. ජේසුතුමා ඇරමෙයික් සහ හෙබ්‍රෙව් භාශාව කතා කල බව සඳහන්.

එනිසා එතුමාට එතුමාගේ මව පවා භාවිතා නොකල ජේසු, ජීසස්, ජීසස් ක්‍රයිස්ට් ලෙස ඇමතීම යුක්ති සහගත නැත. අද එතුමා මෙලොවට නැවත පැමිණිය හොත් එතුමා එම නම් දන්නෙ නැති බවත් එම නම් වලින් සිටි අයෙක්ව හඳුනන්නේ නැති බව පවසාවි.

එසේම, කෙනෙකුගේ නමක් පරිවර්ථනය කර භාවිතා කිරීමද වැරදිය. උදා:- කෙනෙකුගේ නම බැට් (Bat) නම් ඔහුට හැමෝම බැට් (Bat) ලෙසම කතා කළ යුතුය. එය පරිවර්ථනය කර "වව්ලා" ලෙස හෝ "ක්‍රිකට් පිත්ත" ලෙස භාවිතා කිරීම වැරදිය.

මුස්ලිම්වරුන් එතුමාගේ නම ඊසා ලෙස භාවිත කරන අතර එතුමාට කරන ගෞරවයක් වශයෙන් කිසිවිටකත් ඊසා ලෙස නම විතරක් භාවිතා නොකර "ඊසා අලෛහිස්සලාම් (එතුමාට ශාන්තිය හිමිවේවා!)" ලෙසම භාවිතා කරයි. එසේම එතුමා දෙවියන් නොව, ත්‍රිත්වයද නොව, නමුත් මුස්ලිම්වරුන් එතුමා දෙවියන්ගේ ශ්‍රේෂ්ඨ දේව දූතයෙක්, නබිවරයෙක් ලෙස පිලිගනී.

එතුමා සම්බන්ධව තවත් මතවාදී කාරුණු කිහිපයක් ඇත. ඒවාට කුරාණය තුලින් නිවැරදි තොරතුරු ලබා දී ඇත.

එතුමාගේ උපත (දෙසැම්බර් 25 වැනි) සීත කාලයක සිදුවූ බවටද සාක්ෂි නැත. කුරානය තුලින් පෙන්වා දෙන කරුනු සලකා බැලූ විට එම උපත රට ඉඳි ඉදෙන (එනම් රස්නෙ කාලෙක) සිදුවී ඇති බව හැඟවෙයි.

එසේම යුදෙව්වන් විසින් එතුමාට වධ දී කුරුසිපත් කළ බව ක්‍රිස්තියන් වරුන් පිළිගත්තත් කුරානය තුලින් දෙවියන් පවසන්නේ එතුමාට එවන් අපරාධයක් සිදු නොවූ බවයි.

*තවද "අල්ලාහ්ගේ දූතයා, මර්යම්ගේ පුත් ඊසා මසීහ්ව නියත වශයෙන්ම අපි (කුරුසියෙහි තබා ඇණ ගසා) ඝාතනය කර දැමුවෙමු" යැයි ඔවුන් පැවසීමේ හේතුවෙන්ද (ඔවුන්ට ශාප කළෙමු). ඔහුව, ඔවුන් කපා දැමුවේ නැත. ඔවුන් කුරුසියෙහි තබා ඇණ ගැසුවේද නැත. (ඔහු සිටි කාමරය තුලට ඔහුව සොයා ගිය කෙනාව ඔහුගේ හැඩරුව මෙන් බවට පත් කර හැරියේය. සොයා ගිය අනිත් අය, ඔහුවම කුරුසියෙහි තබා ඇණ ගැසූහ. මෙබැවින්) ඔවුන්ව සැකයෙහි ඇතුළු කරණු ලැබූහ. එබැවින් කවුරුන් මෙයට විරුද්ධව අදහස් දරන්නෝද, ඔවුන් අනවශ්‍ය සැකයෙහිම ගැලී ගියහ. අනවශ්‍ය සැකයෙහි අනුගමනය කරනවා මිස, එහි ඔවුන්ට සත්‍ය ඥානය (සාධකයන්) ඇත්තේ නැත. නියත වශයෙන්ම ඔවුන් ඔහුව කපා දැමුවේම නැත. (කුරානය 4:157)*

දෙවියන් වහන්සේ විසින් යේසුස් (ඊසා අලෛහිස්සලාම්)ට දිව්‍ය හෙලිදරව් ලෙස එතුමාට පෙර සිටි මෝසෙස් (මූසා අලෛහිස්සලාම්) නබිවරයාට පහළ කල තව්රාත් නැමති ධර්මය හෙවත් දිව්‍ය මගපෙන්වීමත්, අලුතින් ඉන්ජීල් නැමති ධර්මයත් පහළ කර ඇත. නමුත් මිනිසුන් විසින් මෙම දිව්‍ය පහළ කිරීම් දෙකම

වෙනස් කිරීම් වලට ලක් කර ඇත. දිව්‍ය මගපෙන්වීම අවුල් වියවුල් සහ විකෘති කර ඇති නිසා ඒවායේ අඩුපාඩුත් පෙන්වාදෙමින් අවසන් නබිවරයා වන මොහම්මද් (ﷺ) තුමාට නව සහ සම්පූර්ණ කළ දහම ලෙස අල් කුරාණය පහළ කර ඇත.

කුරානය තුල 78 වතාවක් ඊසා (අ.ස) නමින් හෝ ඔහුගේ තත්වයෙන් යෙසුස් වහන්සේව සඳහන් වේ. මර්යම් අලෙහිස්සලාම් 34 වතාවක් සඳහන් කර ඇත. එතුමියගේ නමින්ම එහි පරිච්ඡේදයකුත් ඇත (සූරා මරියම් - පරිච්ඡේදය 19.) එසේම ඇය ලෝක වාසී සියලුම කාන්තාවන්ගෙන් ශ්‍රේෂ්ඨම කාන්තාවන් (දෙදෙනෙකුගෙන්) එක්කෙනෙක් ලෙසද දෙවිඳුන් සඳහන් කර ඇත. සියළු මුස්ලිම්වරුන් ඇයට එම ගරුත්වය ලබා දේ. ශ්‍රේෂ්ඨතම අනෙක් කාන්තාව ලෙස පිරවුන් ගේ බිරිඳ "ආසියා' ව සඳහන් කර ඇත.

---

## යේසුස් වහන්සේ ගැන සඳහන් (කිසිම වෙනසකට ලක් නොවූ) දිව්‍ය වදන් වල සිංහල පරිවර්තනය වාක්‍යයන් කිහිපයකි.

අල් කුරානය පරිච්ඡේදය 3- අල් මායිදා (44 සිට 62 දක්වා මෙසේ සඳහන් වේ.)

*(නබියේ!) මේ (සියල්ල ඔබ නොදන්නා) ගුප්ත පුවත් වන්නේය. මේවා අපි ඔබට වහී මගින් දැනුම් දෙන්නෙමු. තවද මරියම්ව (හදාවඩා ගැනීමට) ඔවුන්ගෙන් කවුරුන් භාරකාරත්වය බාර ගන්නේද යන්න (නිවිත්තක් මගින් දැන ගැනීමට) ඔවුන් තමන්ගේ පෑන් (ගඟට) විසි කළ අවස්ථාවේදීද ඔබ ඔවුන් සමග සිටියේ නැත. (මේ ගැන) ඔවුන් තර්ක කරමින් සිටින විටද ඔබ ඔවුන් සමග සිටියේ නැත. (3:44)*

*(තවද මර්යම්ට) මලායිකාවරුන් "ඕ මර්යම්! නියත වශයෙන්ම අල්ලාහ් තමන්ගේ (වනු! යන) එක් වචනයක් මගින් ඔබට (පුතෙකු ලබා දීමට) සුභාරංචි පවසන්නේය. එයගේ නම "මර්යම්ගේ පුත් ඊසා මසීහ්" යනුවෙනි. ඔහු මෙලොවද පරලොවද ඉතාමත් ගාම්භීර කෙනෙකු වශයෙන්ද, (දෙවියන්ට) ඉතාමත් සමීප අයගෙන් කෙනෙකු වශයෙන්ද සිටිනු ඇත" යයි පැවසූහ. (3:45)*

*තවද, "ඔහු තොටිල්ලේ (ළදරුවෙකු වශයෙන්) සිටියදීද, (තම මවගේ පරිශුද්ධභාවය ගැනද, තම නබිත්වය ගැනද) තරුණ වියේදීද, මිනිසුන් සමග කතා කරනු ඇත. තවද හොඳ ගති පැවතුම් ඇත්තන්ගෙන් කෙනෙකු වශයෙන්ද සිටිනු ඇත" (යයිද පැවසූහ). (3:46)*

*(එයට මරියම් තම් දෙවියන්ට) "මගේ දෙවියනේ! කිසිම මිනිසෙකු මා හට ළං නොවී සිටියදී මට කෙසේ නම් දරුවෙකු ඇති විය හැකිද?" යි පැවසුවාය. (එයට) මෙසේම අල්ලාහ් තමන් අදහස් කළ දෑය උත්පාදනය කරන්නේය. ඔහු වස්තුවක් (උත්පාදනය කිරීමට) අදහස් කළහොත් එය "වනු" යයි පැවසීමම (ඇති ප්‍රමාදයයි!) යයි පැවසුවේය. (3:47)*

*තවද "ඔහුට ධර්මයද, ඥානයද, තව්රාතයද, ඉන්ජීලයද උගන්වනු ඇත. (3:48)*

*ඉස්රායීල පරම්පරාවේ දරුවන්ට (ඔහුව) එක් නබිවරයෙකු වශයෙන්ද පත් කරනු ඇත" (යයි දෙවියන් පැවසුවේය. පසුව ඊසා ඉපදී තම තරුණ වියට පත් වී ඉස්රායීල් පරම්පරා දරුවන් වෙත ගිය අවස්ථාවේදී ඔවුනට මෙසේ පැවසුවේය); "නියත වශයෙන්ම මා ඔබගේ දෙවියන් වෙතින් (යවනු ලැබූ එක් නබිවරයෙකු යන්නට) එක් ප්‍රාතිහාර්යයක් සමග පැමිණ ඇත්තෙමි. ඔබ වෙනුවෙන් මැටි වලින් පක්ෂියෙකුගේ හැඩරුව අඹා මා එයට පිඹින්නෙමි. අල්ලාහ්ගේ අනුමැතියට අනුව එය (පණ ඇති) පක්ෂියෙකු බවට පත් වනු ඇත. අල්ලාහ්ගේ අනුමැතියට අනුව උප්පත්තියෙන්ම අන්ධයින්වද, කුෂ්ඨ (ලාදුරු) රෝගීන්වද මා සුව කරන්නෙමි. මරණයට පත් වූවන්ට මා පණ දෙන්නෙමි. ඔබ අනුභව කළ දෑයද, ඔබ නිවෙස් හී එක්කාසු කර ඇති දෑයද, මා ඔබට දැනුම් දෙන්නෙමි. ඇත්තෙන්ම ඔබ විශ්වාසය තැබූවන් වශයෙන් සිටින්නෙහු නම් මෙයින් ඔබට (තෘප්තියක් ලැබිය හැකි) සාධකයක් ඇත්තේය". (3:49)*

*මා ඉදිරියේ ඇති තව්රාතය(ද මා) සත්‍යය කර තබා, (පෙර) ඔබට තහනම් කර තිබූ දෑයෙන් සමහර දෑය ඔබට අනුමත කර තැබීම සඳහාද ඔබගේ දෙවියන්ගෙන් (මෙවැනි) සාදකයන් සමග ඔබ වෙත මා පැමිණ ඇත්තෙමි. එබැවින් ඔබ අල්ලාහ්ට බිය වී මාව අනුගමනය කරනු. (3:50)*

*නියත වශයෙන්ම අල්ලාහ්ම මගේ දෙවියන්ද ඔබගේ දෙවියන්ද වන්නේය. එබැවින් ඔහුවම ඔබ නමදිනු. මෙයයි ඍජු මාර්ගය (යයිද පැවසුවේය) (3:51)*

*ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු තමන්ව ප්‍රතික්ෂේප කරනු ඊසාට හැඟුනු විට, (ඔවුන්ට) "අල්ලාහ් වෙනුවෙන් මා හට උදව් කරන්නේ කවරෙක්ද?" යි විමසුවේය. (එයට ඔහුගේ) අනුගාමිකයින් "අපි අල්ලාහ් වෙනුවෙන් (ඔබට) උදව්කරුවන් වශයෙන් සිටින්නෙමු. ඇත්තෙන්ම අල්ලාහ්ව අල්ලාහ්ව විශ්වාස කරන්නෙමු. එබැවින් නියත වශයෙන්ම අපි (සම්පූර්ණයෙන්ම ඔහුට අවනත වූ) මුස්ලිම්වරුන් බවට සාක්ෂි දරනු මැනව! යයි පැවසූහ. (3:52)*

*(තවද) "අපගේ දෙවියනේ! ඔබ (මොහුට) පහළ කරන ලද (ධර්මය) අපි විශ්වාස කරන්නෙමු. (ඔබගේ) මෙම රසූල්වද අපි අනුගමනය කරන්නෙමු. එබැවින් (ඔහුව) සත්‍යය කරන්නන් සමග අපවද සටහන් කර ගනු මැනව! යයිද එම අනුගාමිකයින් ප්‍රාර්ථනා කළහ). (3:53)*

*(ඊසාව ප්‍රතික්ෂේප කළ) ඔවුන්, (ඔහුව ඝාතනය කිරීමට) කුමන්ත්‍රණය කළහ. (එහෙත් අල්ලාහ් ඔහුව බේරාගෙන තමන්ගේ කෙනෙකුව ඔවුන් කරන මෙන්) අල්ලාහ් (ඔවුන්ට) කුමන්ත්‍රණ කර හැරියේය. අල්ලාහ් කුමන්ත්‍රණ කරන්නන්ගෙන් බලසම්පන්නය. (3:54)*

*(ඊසාට) අල්ලාහ් පැවසූ දැය (ඔවුන්ට) මතක් කර දෙනු. "ඕ ඊසා! නියත වශයෙන්ම මා ඔබව (ඔබගේ ආයුෂ) පූරණය කරන්නෙමි. ඔබව මගේ සන්නිධානයට ඔසවා ගන්නෙමි. ප්‍රතික්ෂේප කරන්නන්ගේ (අපවාදයෙන්) ඔබව පරිශුද්ධ කර හරින්නෙමි. ඔබව අනුගමනය කරන්නන්ව, ප්‍රතික්ෂේප කරන්නන් කෙරෙහි විනිශ්චය දින දක්වා උසස් කර තබන්නෙමි" (යයි පැවසීමෙන් අනතුරුව, ඕ ඊසා! එම ප්‍රතික්ෂේප කරන්නන්ට මා පැවසුවේ යයි ඔබ මෙසේ පවසනු (මැනව!). "(අල්ලාහ් වන) මා වෙතම ඔබ පසුවද පැමිනෙන්නාහුය. ඔබ තර්ක කරමින් සිටින දැය ගැන (ඒ අවස්ථාවේදී) මා ඔබ අතරේ විනිශ්චය දෙන්නෙමි" (යයිද පැවසුවේය). (3:55)*

*එබැවින් (ඔවුන්ගෙන්) කවුරුන් (ඔබව) ප්‍රතික්ෂේප කරන්නෝද, මා මෙලොවෙහිද, පරලොවෙහිද දැඩි ලෙස දඬුවම් කරමි. ඔවුන්ට උදව් කරන්නන් කිසිවෙකුත් නොසිටිනු ඇත. (3:56)*

*කවුරුන් (ඔබව) විශ්වාස කර දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ගේ (හොඳ) ඵලවිපාක ඔවුන්ට පූර්ණ වශයෙන් ලබා දෙනු ඇත. අල්ලාහ් අපරාධකරුවන් ප්‍රිය කරන්නේ නැත. (3:57)*

*(නබියේ!) අපි ඔබ කෙරෙහි සමුදීරණය කළ මේවා (දෙවියන්ගේ) ආයාවන් වශයෙන්ද, ඥානයෙන් (පිරි) ඔවදන් වශයෙන්ද ඇත්තේය.(3:58)*

*නියත වශයෙන්ම අල්ලාහ්ගේ සන්නිධානයෙන් ඊසාගේ උපමාව, ආදම්ගේ උපමාව මෙන් වන්නේය! ඔහු, ඔහුව මැටියෙන් උත්පාදනය කර, "(මිනිසා බවට) වනු" යයි පැවසුවේය. එවෙලේම (එසේ) සිදු විය. (3:59)*

*(නබියේ! ඊසා ගැන) ඔබගේ දෙවියන්ගෙන් ලැබුණු සත්‍යය වූ (පුවත) මෙයයි. එබැවින් (මේගැන) සැක සිතන්නන්ගෙන් ඔබත් (කෙනෙකු බවට) පත් නොවනු. (3:60)*

*(නබියේ!) ඔබට සත්‍යය වූ පුවත ලැබුණු පසුවද, මේ ගැන ඔබ වෙත කවුරුන් හෝ තර්ක කළ හොත්, (ඔවුන්ට) ඔබ මෙසේ කියනු; "එනු, අපි අපගේ දරුවන්වද, ඔබගේ දරුවන්වද, අපගේ භාර්යාවන්ද, ඔබගේ භාර්යාවන්ද, අපවද, ඔබවද කැඳවා (ඒකරාශී කර) තබාගෙන, සැමදෙනාම (තම තමන්ගේ කියමන සත්‍යය යයි) දිව්රා, '(මෙයට වෙනස් ආකාරයට පවසන) බොරුකාරයින් කෙරෙහි අල්ලාහ්ගේ ශාපය අත් වේවා!' යයි ප්‍රාර්ථනා කරමු." (යයි පවසන මෙන් නියෝග කළේය. මෙසේ නබි තුමානන් ඔවුන්ව ආරාදනා කළ අවස්ථාවේදී කිසිවෙකුත් මෙසේ දිව්රීමට ඉදිරිපත් වූයේ නැත).(3:61)*

*නියත වශයෙන්ම මෙයයි සත්‍යය වූ ඉතිහාසය. අල්ලාහ් හැර, වෙන කිසිම දෙවියෙක් නැත. නියත වශයෙන්ම අල්ලාහ්; ඔහු (සියල්ලන්ට වඩා) බලසම්පන්නයෙකු හා ඥානවන්තයෙකු වශයෙන් සිටින්නේය. (3:62)*

# අල් කුරානයට අනුව ජේසුතුමා කව්ද? (ලිපි 2)

ඉස්ලාම් දහම අනුව ජේසු තුමා ශ්‍රේෂ්ඨ නබිවරයෙකි. අල් කුරානයේ එතුමාගේ මව වන මරියම් තුමියගේ නමින් පරිච්ඡේදයක් පහල කොට ඇත. තවද ජේසු තුමාගේ නම මුහම්මද් නබිතුමාගේ නමට වඩා වැඩි වාරගනනක් කුරානයේ සඳහන් වේ. එසේම ජේසු තුමා විසින් සිදුකළ බොහෝ ප්‍රාතිහාරයන් කුරානයේ සහ නබි වදන්වල සඳහන් වේ. එහෙත් ජේසු තුමාගේ දේවත්වයක් ගැන කිසිම සඳහනක් කුරානයේ හෝ නබි වදන් වල දැකිය නොහැකිය. තවද ජේසු තුමා යුදෙව්වන් අතින් ඝාතනය නොවූ බවත් එම කරුණ මිනිසුන්ගෙන් වසම් කල බවත් කුරානය පෙන්වා දෙන්නේය. ජේසු තුමා ලෝක අවසානයට පෙර නැවතත් පැමිණීමට නියමිත බව ඉස්ලාමීය ඉගැන්වීම වේ. එසේ පැමිණෙන ඔහු අල් කුරානයට අනුව ජනතාව පාලනය කිරීමට නියමිතය.

මරියම් තුමිය ජේසු තුමාව පිළිසිඳ ගත්තේ පියෙකු නොමැතිව බව කුරානයේ ඉතා පැහැදිලිව සඳහන් කොට ඇත. එපමණක් නොව එතුමා විසින් බොහෝ ප්‍රාතිහාරයන් සිදු කොට තිබේ. ඒ අනුව ඔහු තොටිල්ලේදීම කතා කොට ඇත. උපතින්ම අන්ද වූ අයට පෙනුම ලබා දී තිබේ. ලාදුරු රෝගීන් සුවපත් කොට ඇත. ඒවා සියල්ලම එතුමා කලේ දෙවියන්ගේ උදව්වෙනි. එම නිසා ඔහු කිසිම අවස්ථාවකදී දෙවියන් බව හෝ දෙවියන්ගේ පුත්‍රයෙකු බව හෝ පවසා නැත. බයිබලයට අනුවද දෙවියන් එක්කෙනෙකි. ඒ බව පහත දැක්වෙන බයිබල් වැකි වලින් පැහැදිලි වන්නේය.

*"ඉෂ්රායිල්වරුනි, අපගේ දෙවිඳුන් එක්කෙනෙකි" (ද්විතීය කථාව 6:4).*

තවද බයිබලයේ තවත් තැනක මෙසේ සඳහන් වේ.

*"ඉෂ්රායිල්වරුනි, අපේ දෙවි ස්වාමීන් වහන්සේට සවන් දෙන්න, ස්වාමීන් එක් කෙනෙක්ය" (මාක් 12:29).*

බයිබලයේ මෙවැනි තවත් බොහෝ වැකි තිබේ. ඒවා සියල්ලෙන්ම පවසන්නේ දෙවියන් එක්කෙනෙක් බවයි.

දෙවියන් පිලිබඳ අල් කුරානයේ එන අර්ථදැක්වීම අනුව

*ඔහු එක්කෙනෙකි. ඔහුට සමාන වෙන කිසිවෙකු නැත. ඔහු කිසිවෙකුගේ අවශ්‍යතාවන් නොමැත්තා ය. ඔහු කිසිවෙකුව ප්‍රසූත කලේ නැත. එසේම කිසිවෙකුගේ කුසින් ඔහු ප්‍රසූත වුයේද නැත. තවද ඔහුට සමාන කිසිවෙකුත් නැත (කුරානය 112:1-4).*

මෙම අර්ථ දැක්වීම අනුව ජේසු තුමා දෙවිකෙනෙක් විය නොහැකිය. ඇයිද යත් ජේසු තුමා මරියම් තුමියගේ කුසින් උපත ලබා ඇත. තවද අනෙක් මිනිසුන් මෙන් කෑම අනුභව කොට ඇත. සතුරන්ගේ තාඩන පීඩනවලට ගොදුරු වී තිබේ. මේවා කිසිවක් සර්වබලධාරී දෙවියන්ට ඔබින්නේ නැත. එපමණක් නොව ජේසු තුමාව කුරුසයේ ගසන විට

*"මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මාව අත්හැරියේ මන්දැයි" පැවසූ බව බයිබලයේ සඳහන් වේ (Matthew 27:46).*

කුරානයට අනුව මේ වැකිය ගැන යම් සැකයක් ඇත. එනම්, කුරානය තුලින් පවසන්නේ යේසුස් වහන්සේව කුරුසිපත් කිරීමට පෙර වෙන කෙනෙකුට එතුමාගේ රූපය මාරු කල බවය. එයට අනුව කුරුසිය සමග වද වින්දේ සහ කුරුසිපත් උනේ යේසුස් වහන්සේ නොවන බවයි. ඊටත් අමතරව කිතුනුවන්ගේ විශ්වාසයට අනුව ගත් කල යේසුස් වහන්සේ මෙසේ පැවසුවා නම් ඔහු දෙවියන් නොවන බව එයින්ම පැහැදිළි වනු ඇත.

ජේසුතුමා විෂයෙහි අල්-කුරානයේ පහත සඳහන් පරිදි සඳහන් වේ."නියතව අල්ලාහ්, මරියම්ගේ පුත් මසීහ්යැයි පවසන්නෝ ප්‍රතික්ෂේප කළවුන් වන්නෝය. එහෙත් මසීහ් පැවසුවේ

*'ඉස්රායිල්ගේ දරුවනි! මාගේ සමිඳුන්ද ඔබගේ සමිඳුන්ද වූ අල්ලාහ්වම නමදින්න' යනුවෙනි. නියතව කවරෙක් අල්ලාහ්ට (යමක්) සමකරයිද අල්ලාහ්, ඔහුට ස්වර්ගය තහනම් කරන්නේය. ඔහුගේ නවාතැන නිරය වන්නේය! අපරාධකරුවන්ට උදව්කරුවන් නැත" (කුරානය 5:72),*

*"නියතව ප්‍රතික්ෂේප කරන්නන් 'අල්ලාහ් තුන්දෙනාගෙන් කෙනෙකි'යි පවසන්නෝය. එහෙත් නැමදීමට සුදුසු සමිඳුන් අල්ලාහ් හැර වෙන කිසිවෙකුත් නැත. තමන් පවසන දෙයින් ඔවුන් ඉවත්ව නොසිටින්නේ නම්, ඔවුන්ගෙන් ප්‍රතික්ෂේප කරන්නන්ට හිංසාව ඇතිකරන වේදනාව නියතය" (කුරානය 5:73).*

*" 'මරියම්ගේ පුත් මසීහ්' දූතයෙකු මිස අන් කිසිවෙකු නොවේ. ඔහුට පෙරද බොහෝ දූතයින් පැමිණ ඇත. ඔහුගේ මව සත්‍යවන්තියකි. ඔවුන් දෙදෙනාම ආහාර අනුභව කරන්නන් ම වූහ" (කුරානය 5:75)*

ජේසු තුමාගේ උපත ගැන කුරානයේ එන විස්තරය මෙසේය. ජේසු තුමා මරියම් තුමියගේ කුසින් උපත ලබා ඇත. මරියම් තුමිය ඉම්රාන් තුමාගේ දූ කුමරියයි. එසේ තිබියදී ඉමාන්ගේ බිරිඳ පිළිසිඳගෙන සිටින දරුවා, ජෙරුසලමේ පිහිටි ශුද්ධ දේවස්ථානයට දෙන බවට භාරයක් කොට ඇත. එහෙත් ඇය ප්‍රසූත කළේ ගැහැණු දරුවෙකි. කෙසේ වෙතත් එම දරුවාට මරියම් යන නම තබා දේවස්ථානයට භාර කොට ඇත. දේවස්ථානයේ භාරකරු වූයේ මරියම් තුමියගේ ඥාතියෙකු වන Zසැකරියා (අ.ස) තුමාය. එතුමා ඇය වෙනුවෙන් දේවස්ථානයේ 'මිහ්රාබ්' නමැති කුටියක් සාදා නතර වීමට ඉඩ හැර ඇත. ඉම්රාන් තුමා ඇයව බැලීමට ගිය සෑම අවස්ථාවකදීම ඇය පලතුරු අතැතිව සිට ඇත. ඒවා දැක පුදුමයට පත් එතුමා "මේවා ඔබට ලැබෙන්නේ කොහින්දැයි" විමසා ඇත. ඊට පිළිතුරු වශයෙන් ඇය පවසා ඇත්තේ අල්ලාහ් තමන් කැමති අයට ප්‍රමාණය ඉක්මවා ආහාර ලබා දෙන බවයි.

කාලය ගෙවී ගියේය. මරියම් තුමියද වැඩි වියට පත් වූවාය. දිනක් ඇය තම කුටියේ යාක්ඥාවේ යෙදී සිටින අවස්ථාවේදී මිනිස් වෙස් ගත් දේවදූතයෙක් ඇය වෙත පැමිණ තිබේ. එම දේව දූතයාව දැකීමෙන් භීතියට පත්වූ ඇය, 'සැබැවින්ම ඔබගෙන් මාව ආරක්ෂාකරන මෙන් අල්ලාහ්ගෙන් මා ප්‍රාර්ථනා කරමි, ඔබ හොඳ ගති පැවතුම් ඇත්තෙකු නම් (මෙතනින් ඉවත්ව යනු)'යි පවසා ඇත. එවිට එම දේවදූතයා 'පාරිශුද්ධ වූ පුතෙකු ඔබට ලබා (දීම ගැන දැනුම්) දීම සඳහා මාව ඔබගේ දෙවියන් විසින් ඔබ වෙත එවන ලද දූතයෙක් (ජිබ්රීල් අ.ස) වෙමි'යි පවසා ඇත. එවිට ඇය 'මට කෙසේ නම් දරුවෙක් ලැබේවිද? කිසිම මිනිසෙකු මා ස්පර්ශ කර නැත! මම අපචාරයේ හැසිරෙන්නෙකු ද නොවෙමි!'යි පවසා ඇත. එවිට එම

දේව දූතයා 'එසේ (සිදුවනු ඇත). එය මට ඉතා ලෙහෙසි දෙයකි. ඇය මිනිසුන් අතරේ එක් සලකුණක් වශයෙන්ද අපගේ වරප්‍රසාදයක් වශයෙන්ද පත් කරන්නෙමු. මෙය අවසාන වශයෙන් මනඃකල්පිත කරන ලද කාරනාවකි. ඔබගේ දෙවියන් කියන්නේහි යි' පවසා තිබේ.

ඉන් පසු කාලය ගෙවී යත්ම මරියම් තුමිය ගැබ් ගත්තාය. එහෙත් පියෙකු නොමැතිව ගැබ් ගැනීම නිසා ඇය මහත් සේ සිත් තැවුලට පත්වූවාය. මේ හේතුවෙන් ඇය තමන් රැඳී සිටි දේවස්ථානයේ කුටියෙන් බැහැරවී ඇයගේ උපන් ගම වන නසරිත් (Nazareth) වෙත යාම සඳහා පිය නගා තිබේ. කල් යත්ම දරු ප්‍රසූතියේ දිනය ද ළඟා විය. එබැවින් ඇය එම ස්ථානයෙන්ද පිටව ගියත් වැඩි දුරක් යාමට මත්තෙන් ඇයගේ කුසේ සිටි දරුවා මෙලොවට බිහි කළාය. එම අවස්ථාවේදී ජිබ්රීල් (අ.ස) දෙවදූතයා පැමිණ "දුක් නොවනු, ඔබගේ දෙවියන් මෙතන දිය පාරක් ගලා යාමට සලස්වා ඇත, මෙම රට ඉඳි ගස සොලවනු, ඔබට ඉන් ඉදුණු රට ඉඳි වැටීමට සලස්වන්නෙමු"යි පවසා තිබේ. මැරී ගොස් තිබුණු එම රට ඉඳි ගස නැවත ජීවය ලැබීම දුටු ඇයගේ සිතට දේවියන් කෙරෙහි විශ්වාසය වඩාත් ස්ථිර විය. මෙම සිදුවීමෙන් පසු ඇය එම බිළිඳා ද රැගෙන තම ගමට යාම සඳහා පිටත් වූවාය. එහි වැසියන් ඇය රැගෙන ගිය ළදරුවා ගැන විමසන්නට පටන් ගෙන ඇත. එහෙත් එම ජනතාව විමතියට පත් කරමින් එම ළදරුවා ඔවුන් අසන ප්‍රශ්න වලට පිළිතුරු දී ඇත.

කාලය ගෙවීයත්ම ජේසු තුමාට දෙවියන්ගෙන් දහම් පණිවිඩය පහළ විය. එහෙත් එකල සිටි ජනතාව ඔහුට බොහෝ හිරිහැර සිදුකොට ඇත. ඔහුගේ දේව පණිවිඩය පිළිගැනීමට අකමැති විය. අවසානයේදී ජේසු තුමාව කුරුසයේ තබා ඝාතනය කිරීමට ඔවුන් සැලසුම් කොට තිබේ. එහෙත් අල්ලාහ්ගේ සැලසුම අනුව ජේසු තුමාව කුරුසයේ ගැසීමට නොහැකි වූ අතර වෙනත් කෙනෙක් ඒ වෙනුවෙන් කුරුසයේ ගැසීමට සලස්වා ඇත. පහත දැක්වෙන කුර්ආන් වැකියෙන් ඒ බව පැහැදිලි වේ.

*"තවද "අල්ලාහ්ගේ රසූල් වන මරියම්ගේ පුත් ඊසා (හෙවත් මසීහු) නියත වශයෙන්ම අපි (කුරුසයෙහි තබා ඇණ ගසා) මරා දමුවෙමු"යි ඔවුන් කී බැවින්ද (ඔවුන්ට ශාප කළෙමු). (නමුත්) ඔහුව ඔවුන් කපා දැමුවේද නැත. ඔහුව ඔවුන්*

*කුරුසයෙහි තබා ඇණ ගැසුවේද නැත. ( ඔහු සිටි කාමරයට ඔහුව සොයා ගිය කෙනෙකුව ඊසාගේ හැඩරුව ඇතිව වෙනස් කරන ලදී. ඊසා සොයා ගිය අනිත් අය ඔහුව කුරුසයේ තබා ඇණ ගැසුවෝය) මේ නිසා ඔවුන්ව සැකයෙහි ඇතුල් කරන ලදී. එබැවින් මෙයට විරුද්ධව කව්රුන් අදහස් දරන්නෝ ද ඔවුන් අනවශ්‍ය සැකයෙහි ගිලී යන්නෝය. අනුමානය අනුගමනය කිරීම මිස එහි ඔවුන්ට සත්‍ය වූ ඥානයක් නැත්තේය. ඇත්තෙන්ම ඔවුන් ඔහුව ඝාතනය කලේම නැත" (කුරානය 4:157).*

ඉහත දැක්වෙන කරුණු අනුව ජේසු තුමා මිනිසෙකු මිස සර්වබලධාරී දෙවියෙකු නොවේ. කුරානයට අනුව ඔහු දෙවියන් සමීපයේ සිටින අතර ලෝකය අවසාන වීමට පෙර නැවතත් මෙම ලෝකයට පැමිණීමට නියමිතය. (FA)

## අවධානය යොමු කළ යුතු බයිබල් වැකි

බයිබලයෙන් උපුටා ගන්නා ලද පහත සඳහන් වැකි වලින් පෙන්නුම් කරන්නේ යේසුස් වහන්සේ දෙවියන් නොවන බවය. එතුමා මනුෂ්‍යයයෙකි, දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ නබිවරයෙකි.

පහත කරුණු සම්බන්ධව බයිබල් වැකි ඉදිරිපත් කර ඇත.


1. යේසුස් වහන්සේ තමා දෙවියන් නොවන බව ප්‍රකාශ කිරීම. 798
2. යේසුස් වහන්සේ තම පියා (දෙවියන් වහන්සේ) තමන්ට වඩා උසස් බව පැවසීම. 799
3. යේසුස් වහන්සේ මනුෂ්‍යයෙක් බව. 799
4. යේසුස් වහන්සේ අනාගතවක්තෘවරයෙක් (නබිවරයෙක්) බව. 800
5. යේසුස් වහන්සේ දෙවියන්ගේ සේවකයා බව. 801
6. යේසුස් වහන්සේ දෙවියන්ට යාච්ඤා කිරීම. 802
7. රූප සහ පිළිම වන්දනාව තහනම් බව. 803
8. යේසුස් වහන්සේ පියෙකු රහිතව උපත ලැබීය. 806
9. ප්‍රතික්ෂේප කරන්නන් සම්බන්ධව යේසුස් වහන්සේගේ දැඩි .ප්‍රතිචාර. 806
10. ඌරුමස් අනුභවය තහනම් බව. 806
11. රමදාන් (9 වන මස) උපවාසය. 807

12. යේසුස් වහන්සේ බෞතීස්ම කළේ ඇයි? ඔහුගේ පව් සමා කරවීමටද? 807
13. යේසුස් වහන්සේ අපගේ පාප උදෙසා මිය ගියේය. 807
14. කිසිම මිනිසෙකු අන් අයගේ පාප කරගහන්නේ නැත. 808
15. චර්මච්ඡේදනය පිළිබඳ බයිබල් පද. 809
16. ශුද්ධ වූ දිව්‍ය ග්‍රන්ථයක නොතිබිය යුතු වැකි (අසැබි ක්‍රියා). 810
17. වෙනත්. 812

**1). යේසුස් වහන්සේ තමා දෙවියන් නොවන බව ප්‍රකාශ කිරීම**

*[යොහන් 5:30] මට තනිවම කිසිවක් කළ නොහැක; මා අසන පරිදි මම විනිශ්චය කරමි; මාගේ විනිශ්චය ධර්මිෂ්ඨය; මක්නිසාද මම මාගේම කැමැත්ත නොව මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත සොයන්නෙමි.*

*[මතෙව් 20:28] එසේම මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්ටත් බොහෝ දෙනෙකු උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටත් ආයේය.*

*[මතෙව් 7:21] ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට: ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නෝය. [මතෙව් 7:22] ඒ දවසේදී බොහෝ දෙනෙක් මට කියනු ඇත: ස්වාමීනි, ස්වාමීනි, අපි ඔබගේ නාමයෙන් අනාවැකි නොකීවෙමුද? ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු නොකළෙමුද? ඔබගේ නාමයෙන් බොහෝ බලවත් ක්‍රියා නොකළෙමුද? [මතෙව් 7:23] එවිට මම ඔවුන්ට මෙසේ කියන්නෙමි: මම කිසි කලෙකත් නුඹලා නොහැඳින්නෙමි. අයුතුකම් කරන්නෙනි, මා කෙරෙන් ඉවත්ව යන්න.*

*[මාර්ක් 10:18] යේසුස් වහන්සේ ඔහුට කතා කර, ''ඔබ මට යහපත් යැයි කියන්නේ මන්ද? එක් කෙනෙක් හැර අන් කිසිවෙක් යහපත් නැත, එනම් දෙවියන් වහන්සේ ය''යි වදාළ හ.*

*Maththew 23:27, 26:39 = Quran 29:19 Exodus 20:1-3*

**2). යේසුස් වහන්සේ තම පියා (දෙවියන් වහන්සේ) තමන්ට වඩා උසස් බව පැවසීම**

*[යොහන් 14:28] මම ගොස් නුඹලා වෙතට එමියි මා නුඹලාට කී බව නුඹලා ඇසුවහුය. නුඹලා මට ප්‍රේම කළාහු නම්, මා පියාණන් වෙතට යන බැවින් නුඹලා ප්‍රීතිවන්නාහුය. මක්නිසාද පියාණන් වහන්සේ මට වඩා උතුම්ය.*

*[මාර්ක් 12:29] ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "පළමුවැන්න නම්, 'එම්බා ඉශ්‍රායෙල්, අසන්න; අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ එකසේය.*

*[යොහන් 17:3] සදාකාල ජීවනය නම් මේය: එකම සැබෑ දෙවියන්වහන්සේ වන ඔබ එවූ තැනැත්තා, Isiah 45:57 දෙවියන්ට සියළු බලය ඇත. යේසුස් වහන්සේට සියළු බලය නැත.*

*[මාර්ක් 12:30] නුඹේ මුළු හෘදයෙන්ද, නුඹේ මුළු ආත්මයෙන්ද, නුඹේ මුළු බුද්ධියෙන්ද, නුඹේ මුළු ශක්තියෙන්ද නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේම කරන්න.*

*Genesis 22:11, Exodus 3:4, John 9:9 දෙවියන් එක්කෙනෙකි. ඔහු තරම් වෙන කිසිවෙකුත් නැත. Jhon 1;29, Matthew 6:6 God is unseen, Jesus has seen*

**3). යේසුස් වහන්සේ මනුෂ්‍යයෙක් බව**

*[යොහන් 8:40] නුමුත් දෙවියන්වහන්සේගෙන් ඇසූ සත්‍යය නුඹලාට කී මනුෂ්‍යයෙකු වන මා මරන්ට දැන් නුඹලා සොයන්නාහුය; ආබ්‍රහම් එසේ කළේ නැත. / Numbers 23;19 දෙවියන් මිනිසෙකු නොවේ, Matthew 11:19 දෙවියන්ට ලිංග භේදයක් නැත.*

*[මතෙව් 20:28] එසේම මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්ටත් බොහෝ දෙනෙකු උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටත් ආයේය.*

*[ගණන් කථාව 23:19] දෙවියන් වහන්සේ බොරු කීමට මනුෂ්‍යයෙක් නොවේ, පසුතැවිලි වීමට මනුෂ්‍ය පුත්‍රයාද නොවේ:,*

*Psalm 121:2,4 දෙවියන් කිසි විටක නිදා ගන්නේ නැත, Matthew 8:24 යේසුස් වහන්සේ නිදා ගත් සේක*

*[මතෙව් 11:19] මනුෂ්‍ය පුත්‍රයා කමින් බොමින් ආ සේක. ඔව්හු: බලව, කෑදර මනුෂ්‍යයෙක්ද මුද්‍රිකපානය බොන්නෙක්ද සුංගම් අයකරන්නන්ගේත් පව්කාරයන්ගේත් මිත්‍රයෙක්ද කියා කියති. ප්‍රඥාව ඇගේ ක්‍රියාවලින් යුක්තිසහගත බව ඔප්පුවේ.*

*[ක්‍රියා 2:22] ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි, මේ වචන අසන්න: ඔබ දන්නා පරිදි, දෙවියන් වහන්සේ ඔබ මධ්‍යයේ උන්වහන්සේ ලවා කළ බලවත් ක්‍රියාවලින්ද පුදුමවලින්ද ලකුණුවලින්ද, නාසරෙත්හි යේසුස්වහන්සේ ඔබට දෙවියන් වහන්සේ විසින් අනුමත කරන ලද මනුෂ්‍යයෙක්ය.*

**4). යේසුස් වහන්සේ අනාගතවක්තෘවරයෙක් (නබිවරයෙක්) බව**

*[මතෙව් 15:24] නුමුත් උන්වහන්සේ උත්තරදෙමින්: ඉශ්‍රායෙල් වංශයේ නැතිවූ බැටළුවන් වෙතට මිස මා එවනලද්දේ නැතැයි කී සේක.*

*[මතෙව් 10:5-6] ජේසුස් වහන්සේ මේ දොළොස් දෙනා යවමින් ඔවුන්ට අණ කරමින්, "අන්‍යජාතීන්ගේ කිසි මාර්ගයකට නොයන්න, සමාරියයන්ගේ කිසි නුවරකට ඇතුළු නොවන්න; ඉශ්‍රායෙල් වංශයේ නැති වූ බැටළුවන් වෙතට යන්නැ"යි වදාළ සේක.*

*[ක්‍රියා 3:22] මෝසෙස් සැබවින්ම මෙසේ කීවේය: ස්වාමි වූ දෙවියන් වහන්සේ මා වැනි අනාගතවක්තෘවරයෙකු ඔබේ සහෝදරයන් අතරින් ඔබ වෙනුවෙන් නැඟිටුවනු ඇත; ඔහු ඔබට පවසන සියල්ලේදී ඔබ ඔහුට සවන් දිය යුතුය.*

*[මතෙව් 21:11] සමූහයෝද: මුන්වහන්සේ ගලීලයේ නාසරෙත්හි අනාගතවක්තෘවූ යේසුස්වහන්සේයයි කීවෝය.*

*[මතෙව් 13:57] ඔව්හු උන්වහන්සේ ගැන අමනාප වූහ. නුමුත් යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක්: අනාගතවක්තෘවරයෙකුට ගෞරව නැත්තේ තමාගේම රටෙහිත් තමාගේම ගෙදරදීත් මිස වෙන කිසිවක් නොවේ.*

*[මතෙව් 15:9] නමුත් ඔවුන් මට නමස්කාර කරන්නේ නිෂ්ඵල ලෙසයි. මිනිසුන්ගේ ආඥා ඔවුන්ගේ මූලධර්ම ලෙස උගන්වති.*

*[ලූක් 24:19] ඔහු ඔවුන්ට කතා කොට, "කවර දේවල් දැ"යි ඇසූ විට ඔව්හු ඔහුට කතා කොට, "දෙවියන් වහන්සේ ඉදිරියෙහි ද මුළු සෙනඟ ඉදිරියෙහි ද ක්‍රියාවෙන් ද වචනයෙන් ද බලගතු දිවැසිවරයෙකු වූ නාසරෙත්හි ජේසුස් වහන්සේ පිළිබඳ කාරණා මෙසේ ය:"*

*[මතෙව් 1:22] මේ සියල්ල සිදුවී ඇත්තේ, ස්වාමීන්වහන්සේ විසින් අනාගතවක්තෘ ලවා කියන ලද දේ ඉටු වන පිණිසය.*

*[(යොහන් 14:6].මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි. මා තුළින් මිස කිසිවෙක් පියාණන් වෙතට පැමිණෙන්නේ නැත". (ඔහුවටා සිටි ඊශ්‍රායෙල්වරුන්ට කීවකි)*

*[යොහන් 6:31-34] අපගේ පියවරුන් කාන්තාරයේදී මන්නා කෑවෝය; එය ලියා ඇති පරිදි: උන්වහන්සේ ඔවුන්ට ස්වර්ගයෙන් රොටි දුන් සේක. එබැවින් යේසුස්වහන්සේ ඔවුන්ට මෙසේ කීසේක: සැබවින්ම, සැබවින්ම මම ඔබට කියමි, ඔබට ස්වර්ගයෙන් රොටි දුන්නේ මෝසෙස් නොවේ; නමුත් මාගේ පියාණන් වහන්සේ ඔබට ස්වර්ගයෙන් සැබෑ රොටි දෙන සේක. මක්නිසාද දෙවියන් වහන්සේගේ රොටි නම් ස්වර්ගයෙන් බැස ලෝකයට ජීවනය දෙන දෙයයි. එබැවින් ඔව්හු උන්වහන්සේට කථාකොට: ස්වාමීනි, මේ රොටි අපට සැමවිටම දුන මැනවයි කීවෝය.*

**5). යේසුස් වහන්සේ දෙවියන්ගේ සේවකයා බව**

*[ක්‍රියා 3:13] ආබ්‍රහම්ගේද ඊසාක්ගේද යාකොබ්ගේද දෙවියන්වහන්සේ වන අපගේ පියවරුන්ගේ දෙවියන්වහන්සේ තමන් සේවකයාවූ යේසුස්වහන්සේව මහිමයට පත්කළසේක; නුඹලා උන්වහන්සේව පාවා දුන්නහුය, පිලාත්*

*උන්වහන්සේ නිදහස්කරන්ට තීරණයකර සිටියදී ඔහු ඉදිරියෙහි උන්වහන්සේ ප්‍රතික්ෂේප කළහුය.*

*[ක්‍රියා 3:22] මෝසෙස් සැබවින්ම මෙසේ කීවේය: ස්වාමී වූ දෙවියන් වහන්සේ මා වැනි අනාගතවක්තෘවරයෙකු ඔබේ සහෝදරයන් අතරින් ඔබ වෙනුවෙන් නැඟිටුවනු ඇත; ඔහු ඔබට පවසන සියල්ලේදී ඔබ ඔහුට සවන් දිය යුතුය.*

*[ක්‍රියා 3:23] තවද, ඒ අනාගතවක්තෘවරයාට සවන් නොදෙන සෑම ආත්මයක්ම සෙනඟ අතරින් සහමුලින්ම විනාශ කරනු ලබන්නේය.*

*[ක්‍රියා 3:26] දෙවියන් වහන්සේ තමන් සේවකයා නැඟිටුවා, ඔබ සෑම එකිනෙකා ඔබේ අයුතුකම්වලින් හරවා, ඔබට ආශීර්වාද කරන පිණිස, පළමුකොට ඔබ වෙතට උන්වහන්සේ එවූ සේක.*

*[ක්‍රියා 4:27] මක්නිසාද ඔබ ආලේප කළ ඔබගේ ශුද්ධ සේවකයා වන ජේසුස් වහන්සේට විරුද්ධව මේ නුවරදී සැබවින්ම හෙරොද් සහ පොන්තියුස් පිලාත් යන දෙදෙනාම අන්‍යජාතීන් හා ඉශ්‍රායෙල් ජනයා සමඟ රැස්ව සිටියහ.*

*[මතෙව් 12:17-18] මෙසේ වූයේ, යෙසායා අනාගතවක්තෘ මාර්ගයෙන් කියන ලද දේ ඉටු වන පිණිසය. එනම්, "බලන්න, මා තෝරාගත් මාගේ සේවකයා,*

*මාගේ ආත්මය ප්‍රසන්න වූ මාගේ ප්‍රේමවන්තයා :මම මාගේ ආත්මය ඔහු කෙරෙහි තබන්නෙමි, ඔහු අන්‍යජාතීන්ට විනිශ්චය ප්‍රකාශ කරන්නේය.*

*[ක්‍රියා 4:30] සුව කිරීමට ඔබගේ අත දිගු කරන විට, ඔබගේ ශුද්ධ සේවකයා වන ජේසුස් වහන්සේගේ නාමයෙන් ලකුණු සහ අරුමපුදුම දේ සිදු වන විට.*

**6). යේසුස් වහන්සේ දෙවියන්ට යාක්ඥා කිරීම**

*[මතෙව් 27:46] නවවෙනි පැය පමණේදී යේසුස්වහන්සේ: ඒලී, ඒලී, ලාමා සබක්තානි? එනම්: මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මක්නිසාද කියා මහත් හඬින් මොරගැසුසේක.* *[(ජෝන් 19:4) හයවන පැයේදී/ (ජෝන් 19:16) ඔහුව කුරුසිපත් කළේය.( මාර්ක් 12:25) තුන්වන පැයේදී / ඔහුව එල්ලුවේය]

*[මතෙව් 15:9] නමුත් ඔවුන් මට නමස්කාර කරන්නේ නිෂ්ඵල ලෙසයි.*

*[මතෙව් 14:23] උන්වහන්සේ සමූහයන් යැවූ පසු, යාච්ඤා කරන පිණිස වෙන්ව කන්දට ගියසේක. සවස් වූ විට උන්වහන්සේ එහි තනිව සිටිසේක.*

*[ලූක් 5:16] එහෙත් උන්වහන්සේ වනාන්තර ස්ථානවලට ගොස් යාච්ඤා කළ සේක.*

*[උත්පත්ති 17:3] එවිට ආබ්‍රම් මුහුණින් වැටුනේය. දෙවියන්වහන්සේ ඔහු සමඟ කථා කොට:*

*[exodus 34:8] එවිට මෝසෙස් ඉක්මනින් බිම දෙසට හිස නමා නමස්කාර කලේය.*

*[මතෙව් 26:39] (Jesus) උන්වහන්සේ මදක් ඉදිරියට ගොස් මුහුණින් වැටී: මාගේ පියාණෙනි, හැකි නම් මේ කුසලාන මා කෙරෙන් පහකළ මැනව. එහෙත්, මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවා යි යාච්ඤා කළ සේක.*

*Jhon 20:17 = Quran 5:72*

*Matthew 11;25 = Quran 6:39, 12;40*

**7). රූප සහ පිළිම වන්දනාව තහනම් බව**

*1 යොහන් 5:21  දේවතා රූපවලින් පරෙස්සම් වන්න.*

*ගීතාවලිය 115:4-8 ඔවුන්ගේ පිළිම රිදී සහ රන් ය, මිනිසුන්ගේ අත් වැඩ. ඒවාට මුඛය ඇත, නමුත් ඒවා කතා නොකරයි; ඇස් ඇත, නමුත් ඒවා නොපෙනේ; ඒවාට කන් ඇත, නමුත් ඒවා ඇසෙන්නේ නැත; නාස් ඇත, නමුත් ඒවා ගඳ නොගසයි; ඒවාට අත් ඇත, නමුත් ඒවා අල්ලන්නේ නැත; පාද ඇත, නමුත් ඒවා ඇවිදින්නේ නැත; ඔවුන් තම උගුරෙන් කතා කරන්නේ නැත. ඒවා සාදන අය ඒවාට සමාන වනු ඇත; ඔව්, ඒවා කෙරෙහි විශ්වාසය තබන සෑම කෙනෙක්ම. [ගීතාවලිය 135:15-18 ඉහත වැකියම මෙහිත් සඳහන්]*

*රෝම 1:21-23 මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේ දැන, උන්වහන්සේ දෙවියන්වහන්සේ මෙන් මහිමයට පත් නොකළෝය, ස්තුති නොකළෝය; නමුත් ඔවුන්ගේ තර්කවලින් නිෂ්ඵල වූවෝය, ඔවුන්ගේ අඥාන සිත අඳුරු විය. තමන් ප්‍රඥාවන්තයන් යැයි කියා ගනිමින්, ඔව්හු මෝඩයෝ වී, නොදිරන දෙවියන්වහන්සේගේ මහිමය දිරාපත් වන මනුෂ්‍යයාගේද, පක්ෂීන්ගේද, සිව්පා සතුන්ගේද, බඩගා යන සතුන්ගේද රූපයකට සමාන කරගත්තෝය.*

*[2 කොරින්ති 6:15-17] බෙලියල් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ ඇති එකඟතාවය කුමක්ද? නැතහොත් ඇදහිලිවන්තයෙකුට නොඇදහිලිවන්තයෙකු සමඟ ඇති කොටස කුමක්ද? දෙවියන් වහන්සේගේ මාලිගාවකට පිළිම සමඟ ඇති එකඟතාවය කුමක්ද? මක්නිසාද අපි ජීවමාන දෙවියන් වහන්සේගේ මාලිගාවකි; දෙවියන් වහන්සේ පැවසූ පරිදි, මම ඔවුන් තුළ වාසය කරන්නෙමි, ඔවුන් තුළ ගමන් කරන්නෙමි;*

*මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි, ඔව්හු මාගේ සෙනඟ වන්නෝය. එබැවින් ඔබ ඔවුන් අතරින් පිටතට පැමිණ වෙන්ව සිටින්න. ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක. කිසිම අපවිත්‍ර දෙයකට අත නොතබන්න. මම ඔබව පිළිගන්නෙමි,*

*[යෙසායා 45:16] ඔවුන් සියල්ලෝම ලජ්ජාවට පැමිණෙති, එසේය, වියවුල්වන්නෝය; පිළිම සාදන්නෝ එක්ව වියවුලට පත්වන්නෝය.*

*නික්මයාම 20:1-6 දෙවියන් වහන්සේ මේ සියලු වචන කතා කරමින්, "මම නුඹව ඊජිප්තු දේශයෙන්, වහල්කමේ නිවසින් පිටතට ගෙනා ඔබේ දෙවි වන යෙහෝවා වෙමි. මා හැර වෙනත් දෙවිවරුන් නුඹට නොසිටිය යුතුය. නුඹට කැටයම් කළ රූපයක් හෝ ඉහළ අහසෙහි හෝ පහළ පොළොවෙහි හෝ පොළොව යට ජලයෙහි ඇති කිසිම දෙයකට සමාන දෙයක් සාදා නොගන්න. නුඹ ඒවාට නමස්කාර නොකළ යුතු අතර ඒවාට සේවය නොකළ යුතුය. මක්නිසාද නුඹේ දෙවි වන යෙහෝවා වන මම ඊර්ෂ්‍යා කරන දෙවියෙක් වෙමි, පියවරුන්ගේ අයුතුකම දරුවන් කෙරෙහි, මට වෛර කරන අයගේ තුන්වන සහ හතරවන*

*පරම්පරාවට දඬුවම් කරමි, මට ප්‍රේම කරන සහ මාගේ ආඥා පිළිපදින දහස් ගණනකට ප්‍රේමනීය කරුණාව පෙන්වමි.*

*යෝනා 2:8-9 බොරු නිෂ්ඵල දේ සලකන්නෝ*

*තමන්ගේම කරුණාව අත්හරිති. නමුත් මම ස්තුති හඬින් ඔබට පූජා කරන්නෙමි; මා පොරොන්දු වූ දේ මම ගෙවන්නෙමි. ගැලවීම යෙහෝවාගෙන්ය. (යූනුස් නබි මෙසේ පැවසීය)*

*හබක්කුක් 2:18 කැටයම් කළ රූපය සාදන්නා විසින් එය කැටයම් කළ නිසාත්, වාත්තු කළ රූපය, බොරු උගන්වන්නා විසින්, ගොළු රූප සෑදීමට එහි ස්වරූපය විශ්වාස කරන නිසාත්, එයින් ඇති ප්‍රයෝජනය කුමක්ද?*

*ගලාති 4:8-8 එහෙත් ඒ කාලයේදී ඔබ දෙවියන් වහන්සේ නොදැන, ස්වභාවයෙන්ම දෙවිවරුන් නොවන අයට වහල්ව සිටියහුය. නමුත් දැන් ඔබ දෙවියන් වහන්සේව දැන හඳුනා ගෙන ඇති නිසා, නැතහොත් දෙවියන් වහන්සේ විසින් දැන හඳුනා ගෙන ඇති නිසා, ඔබ නැවතත් වහල්භාවයේ සිටීමට කැමති දුර්වල හා දුප්පත් මූලික දේවලට නැවත හැරෙන්නේ කෙසේද?*

*යෙසායා 44:9-10 කැපූ රූපයක් සාදන්නෝ සියල්ලෝම නිෂ්ඵලය; ඔවුන් ප්‍රිය කරන දේවල් ප්‍රයෝජන නොලබති; ඔවුන්ගේම සාක්ෂිකාරයෝ නොදකිති, නොදනිති; ඔවුන් ලජ්ජාවට පත් වන පිණිස. දෙවියෙකු සෑදුවේ කවුද, නැතහොත් කිසිවකට ප්‍රයෝජනයක් නැති රූපයක් වාත්තු කළේ කවුද? බලන්න, ඔහුගේ සියලු සගයෝ ලැජ්ජාවට පත් වෙති; වැඩ කරන්නෝ ද මනුෂ්‍යයෝ ය: ඔවුන් සියල්ලෝම එක්රැස් වෙත්වා, ඔවුන් නැඟිටිත්වා; ඔවුන් බිය වනු ඇත, ඔවුන් එක්ව ලැජ්ජාවට පත් වනු ඇත.*

### 8). යේසුස් වහන්සේ පියෙකු රහිතව උපත ලැබීය

*[මතෙව් 1:18] යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත මෙසේ විය: උන්වහන්සේගේ මවවූ මරියා යෝසෙප්ට විවාහ ගිවිසගෙන සිටියදී, ඔවුන් එක්වෙන්ට පළමුවෙන් ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ඈ ගැබ්ගෙන සිටින බව දැන ගන්නා ලදී.*

**9). ප්‍රතික්ෂේප කරන්නන් සම්බන්ධව යේසුස් වහන්සේගේ දැඩි ප්‍රතිචාර**

*[ලූක් 19:27] නුමුත් මා ඔවුන් කෙරෙහි රජකම් කරනවාට අකමැතිවූ මේ මාගේ සතුරෝ මෙහි ගෙනැවිත් මා ඉදිරියෙහි මරන්නැයි කීවෝය.*

*[නික්මයාම 22:20] ස්වාමීන්වහන්සේට හැර අන් දෙවිවරුන්ට පූජා කරන කවරෙක් නුමුත් සහමුලින්ම විනාශ කරනු ලබන්නේය.*

*[මැතිව් 10:34] මම ආවේ සාමයට නෙවෙයි, කඩුවක් ගන්න.*

*[1 ඉස්මායිල් 15:3] "දැන් ගිහින් අමලෙක්වරුන්ට පහර දී ඔවුන් සතු සියල්ල මුළුමනින්ම විනාශ කරන්න. ඔවුන්ට අනුකම්පා නොකරන්න. පුරුෂයන් සහ ස්ත්‍රීන්, දරුවන් සහ කිරි දරුවන්, ගවයන් සහ බැටළුවන්, ඔටුවන් සහ කොටළුවන් මරා දමන්න."*

**10). ඌරුමස් අනුභවය තහනම් බව**

*[ද්විතීය කථාව 14:8] ඌරා, කුර බෙදී ඇති නමුත් වමාරා නොකන බැවින්, ඌ ඔබට අපවිත්‍ර ය. උන්ගේ මස් ඔබ නොකෑ යුතු ය, උන්ගේ මළකුණු ස්පර්ශ නොකළ යුතු ය.*

*[11:7] ඌරු මස්, එහි කුර බෙදී ඇති අතර, පාද බෙදී ඇති නමුත්, වමාරා කන නිසා, එය ඔබට අපවිත්‍ර ලෙස සැලකිය යුතුය.*

*[යෙසායා 65:3-4] ඒ සෙනඟ මාගේ මුහුණ ඉදිරියෙහි නිතරම මා කෝප කරවමින්, උයන්වල පූජා ඔප්පු කරමින්, ගඩොල් මත සුවඳ දුම් ඔප්පු කරමින්; සොහොන් අතරේ හිඳ, රහස් ස්ථානවල නවාතැන් ගනිමින්; ඌරු මස් අනුභව කරමින්, පිළිකුල් සහගත දේවල සුප් හොද්ද ඔවුන්ගේ භාජනවල තිබේ; ඔවුන් කියන්නේ: ඔබම සිටින්න, මා ළඟට නොඑන්න, මක්නිසාද මම ඔබට වඩා ශුද්ධය. මොවුන් මාගේ නාසයේ දුමකි, දවස පුරා දැවෙන ගින්නකි.*

*[යෙසායා 65:12] මම නුඹලා කඩුවට නියමකරන්නෙමි, නුඹලා සියල්ලෝම ඝාතනයට නැමෙන්නහුය; මක්නිසාද මා අඬගැසූ කල නුඹලා උත්තර*

*නුදුන්නෝය; මා කථාකළ කල නුඹලා නොඇසුවෝය; එහෙත් නුඹලා මාගේ ඇස් හමුවෙහි නපුරුව තිබුණු දේ කොට, මා කැමති නැති දේ තෝරාගත්තෝය.*

**11). රමදාන් (9 වන මස) උපවාසය**

*[යෙරෙමියා 36:9] යොෂියාගේ පුත්‍රවූ යූදාහි රජවූ යෙහෝයාකීම්ගේ පස්වෙනි අවුරුද්දේ නවවෙනි මාසයේදී යෙරුසලමේ සියලු සෙනඟද යූදාහි නුවරවලින් යෙරුසලමට ආ සියලු සෙනඟද ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි උපවාසයක් ප්‍රකාශකළෝය.*

**12). යේසුස් වහන්සේ බෞතීස්ම කළේ ඇයි? ඔහුගේ පව් සමා කරවීමටද?**

*[මතෙව් 3:13] එකල යේසුස්වහන්සේ යොහන්ගෙන් බව්තීස්ම-ස්නාපනය ලබන පිණිස ගලීලයේ සිට යොර්දාන ළඟට එනසේක.*

*[ගලාති 3:13] ගසක එල්ලෙන සියල්ලෝ ශාප ලද්දෝයයි ලියා තිබෙන බැවින්, ක්‍රිස්තුස් වහන්සේ අපට ශාපයක් වී, ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදාගත් සේක.*

*[ද්විතීය කථාව 21:23] ඔහුගේ මළ සිරුර මුළු රාත්‍රියේම ගසේ නොතිබිය යුතුය; නුමුත් ඔබ ඒ දවසේම එය භූමදාන කළ යුතුය; මක්නිසාද එල්ලා මරන ලද තැනැත්තා දෙවියන් වහන්සේගෙන් ශාප ලද්දෙක්ය; එවිට ඔබේ දෙවිවූ ස්වාමීන්වහන්සේ ඔබට උරුමයක් ලෙස දෙන ඔබේ දේශය ඔබ විසින් අපවිත්‍ර නොකළ යුතුය.*

**13). යේසුස් වහන්සේ අපගේ පාප උදෙසා මිය ගියේය**

*[රෝම 4:25] අපගේ වැරදි නිසා පාවා දෙනු ලැබ, අප ධර්මිෂ්ඨ කිරීම සඳහා උත්ථාන කරනු ලැබූ සේක.*

*[1 පේතෘස් 3:18] මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේද අප දෙවියන්වහන්සේ වෙතට පමුණුවන පිණිස අධර්මිෂ්ඨයන් උදෙසා ධර්මිෂ්ඨව පව් නිසා වරක් වධ වින්දසේක; මාංසයෙන් මරණයට පත් කරනු ලැබ, ආත්මයෙන් ජීවත් කරනු ලැබ;*

*[1 කොරින්ති 15:3] මක්නිසාද සියල්ලට පළමුවෙන් මා ඔබට භාර දුන්නේ මට ලැබුණු දෙයයි. එනම්, ශුද්ධ ලියවිල්ලට අනුව අපගේ පාප උදෙසා ක්‍රිස්තුස් වහන්සේ මිය ගිය බවය. (15:5) God Will newer Die*

*[1 යොහන් 2:2] උන්වහන්සේ අපේ පාපවලට ශාන්තිකර්මය වන සේක; අපේ පාපවලට පමණක් නොව මුළු ලෝකයටත්ය.*

**14). කිසිම මිනිසෙකු අන් අයගේ පාප කරගහන්නේ නැත**

*[එසකියෙල් 18:30] එබැවින්, එම්බා ඉශ්‍රායෙල් වංශය, මම නුඹලා එකිනෙකා තම තමාගේ මාර්ග ලෙස විනිශ්චය කරන්නෙමියි ස්වාමිවූ ස්වාමීන්වහන්සේ කියනසේක. නුඹලා හැරී නුඹලාගේ සියලු වරදවලින් හැරෙන්න; එවිට අයුතුකම නුඹලාගේ විනාශය නොවන්නේය.*

*[1 කොරින්ති 15:3] මක්නිසාද සියල්ලට පළමුවෙන් මා ඔබට භාර දුන්නේ මට ලැබුණු දෙයයි. එනම්, ශුද්ධ ලියවිල්ලට අනුව අපගේ පාප උදෙසා ක්‍රිස්තුස් වහන්සේ මිය ගිය බවය.*

*[1 යොහන් 2:2] උන්වහන්සේ අපේ පාපවලට වරක් වධ වින්දසේක; මාංසයෙන් මරණයට පත් කරනු ලැබ, ආත්මයෙන් ජීවත් කරනු ලැබ;*

*[ද්විතීය කථාව 24:16] දරුවන් වෙනුවට පියවරුන්වත්, පියවරුන් වෙනුවට දරුවන්වත් මරණයට පත් නොකළ යුතුය. සෑම මිනිසෙකුම තම තමාගේ පාපයට මරණයට පත් කළ යුතුය.*

*[ගීතාවලිය 49:7] ඔවුන්ගෙන් කිසිවෙකුට තම සහෝදරයාව කිසිසේත් මුදවා ගත නොහැක. ඔහු වෙනුවෙන් දෙවියන් වහන්සේට මිදීමේ මිලයක් ද දිය නොහැක.*

*[එසකියෙල් 18:30] එබැවින්, එම්බා ඉශ්‍රායෙල් වංශය, මම නුඹලා එකිනෙකා තම තමාගේ මාර්ග ලෙස විනිශ්චය කරන්නෙමියි ස්වාමිවූ ස්වාමීන්වහන්සේ කියනසේක. නුඹලා හැරී නුඹලාගේ සියලු වරදවලින් හැරෙන්න; එවිට අයුතුකම නුඹලාගේ විනාශය නොවන්නේය.*

*[ද්විතීය කථාව 24:16] දරුවන් වෙනුවට පියවරුන්වත්, පියවරුන් වෙනුවට දරුවන්වත් මරණයට පත් නොකළ යුතුය. සෑම මිනිසෙකුම තම තමාගේ පාපයට මරණයට පත් කළ යුතුය.*

*[ගීතාවලිය 49:7] ඔවුන්ගෙන් කිසිවෙකුට තම සහෝදරයාව කිසිසේත් මුදවා ගත නොහැක. ඔහු වෙනුවෙන් දෙවියන් වහන්සේට මිදීමේ මිලයක් ද දිය නොහැක.*

*[යෙරෙමියා 31:30] නුමුත් එකිනෙකා තම තමාගේ අයුතුකම නිසා නසින්නේය. ඇඹුල් මිදි ගෙඩි කන සෑම මනුෂ්‍යයෙකුගේම දත් හිරිවැටෙන්නේය.*

**15. චර්මච්ඡේදනය පිළිබඳ බයිබල් පද 6**

[1. Genesis 17:10–14 2. Deuteronomy 10:14–16 3. Acts 15:1–20 4. Romans 2:25–29 5. Galatians 5:1–6 6. Colossians 2:11–12]

*[උත්පත්ති 17:10-12] මා සහ ඔබ අතරත්, ඔබෙන් පසු ඔබේ වංශය අතරත්, ඔබ විසින් රක්ෂා කළ යුතු මාගේ ගිවිසුම මෙයයි: ඔබ අතර සිටින සෑම පිරිමියෙකුම චර්මච්ඡේදනය කරනු ලැබේ. ඔබත් ඔබේ චර්මඡේදනයේ මාංසය චර්මච්ඡේදනය කරනු ලැබේ; එය මා සහ ඔබ අතර ගිවිසුමක ලකුණක් වනු ඇත. ඔබ අතර දින අටක් වයසැති තැනැත්තා, ඔබේ පරම්පරාවල සෑම පිරිමියෙකුම, නිවසේ උපන් තැනැත්තා හෝ ඔබේ වංශයේ නොවන විදේශිකයෙකුගෙන් මුදලට මිල දී ගත් තැනැත්තා, චර්මච්ඡේදනය කරනු ලැබේ. [උත්පත්ති 17:13-14] ඔබේ නිවසේ උපන් තැනැත්තාද, ඔබේ මුදලින් මිල දී ගත් තැනැත්තාද චර්මච්ඡේදනය කළ යුතුය. මාගේ ගිවිසුම ඔබේ මාංසයෙහි සදාකාලික ගිවිසුමක් වනු ඇත. චර්මච්ඡේදනය නොකළ පුරුෂයා තම චර්මඡේදනයේ මාංසයෙන් නම්, එම ආත්මය ඔහුගේ සෙනඟගෙන් නෙරපා හරිනු ලැබේ; ඔහු මාගේ ගිවිසුම කඩ කර ඇත.*

*[ක්‍රියා 15:1] තවද යුදයෙන් සමහර මනුෂ්‍යයෝ ඇවිත්: මෝසෙස්ගේ සිරිත ලෙස චර්මඡේදනය කරනු නොලැබුවහොත් ඔබට ගැළවීම ලැබිය නොහැකි බව සහෝදරයන්ට ඉගැන්වූහ.*

*[රෝම 2:25-26] මක්නිසාද නුඹ ව්‍යවස්ථාව පවත්වන්නෙක් නම් චර්මච්ඡේදනය සැබවින්ම ප්‍රයෝජනදායකය. නුමුත් නුඹ ව්‍යවස්ථාව කඩකරන්නෙක් නම් නුබේ චර්මච්ඡේදනය අචර්මච්ඡේදනයක් වී තිබේ. එබැවින් අචර්මච්ඡේදිතයා ව්‍යවස්ථාවේ නියෝග පවත්වන්නේ නම්, ඔහුගේ අචර්මච්ඡේදනය චර්මච්ඡේදනයක් ලෙස ගණන් ගනු නොලබන්නේද? [රෝම 2:27-29] ස්වභාවයෙන්ම චර්මච්ඡේදනය නොවූ තැනැත්තා නීතිය ඉටු කරන්නේ නම්, අකුරෙන් හා චර්මච්ඡේදනය කිරීමෙන් නීතිය කඩ කරන්නෙකු වන ඔබව විනිශ්චය නොකරන්නේද? මක්නිසාද බාහිරව යුදෙව්වෙකු වන තැනැත්තා යුදෙව්වෙකු නොවේ; මාංසයෙන් බාහිරව චර්මච්ඡේදනය වන තැනැත්තාද නොවේ; නමුත් ඇතුළතින් යුදෙව්වෙකු වන ඔහුය; චර්මච්ඡේදනය යනු හදවතේ, අකුරෙන් නොව ආත්මයෙන් ය; ඔහුට ප්‍රශංසාව ලැබෙන්නේ මිනිසුන්ගෙන් නොව දෙවියන් වහන්සේගෙනි.*

*[ගලාති 5:2-4] බලන්න, පාවුල් වන මම ඔබට කියමි, ඔබ චර්මච්ඡේදනය ලැබුවහොත් ක්‍රිස්තුස් වහන්සේ ඔබට කිසි ප්‍රයෝජනයක් නැති බව. එසේය, චර්මච්ඡේදනය ලබන සෑම මිනිසෙකුටම මම නැවතත් සාක්ෂි දෙමි, ඔහු මුළු ව්‍යවස්ථාව පැවැත්වීමට ණයගැතියෙකි. නීතියෙන් ධර්මිෂ්ඨ කරනු ලැබීමට කැමති ඔබ ක්‍රිස්තුස් වහන්සේගෙන් වෙන් කරනු ලැබ ඇත; ඔබ කරුණාවෙන් වැටී ඇත.*

*[ගලාති 5:5-6] මක්නිසාද අපි ආත්මයාණන් කරණකෙ ාටගෙන ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨකමේ බලාපොරොත්තුව බලාපොරොත්තුවෙන් සිටිමු. මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ චර්මච්ඡේදනයවත් කිසිවක් ප්‍රයෝජනයක් නැත; නමුත් ප්‍රේමය කරණකොටගෙන ක්‍රියාකරන ඇදහිල්ලය.*

*[කොලොස්සි 2:11-12] උන්වහන්සේ තුළ නුඹලා චර්මඡේදනය කරනු ලැබුවේ ක්‍රිස්තුස්වහන්සේගේ චර්මඡේදනය තුළ, මාංසයේ ශරීරය ඉවත් කිරීමෙන්, අතින් නොකළ චර්මඡේදනයෙනි; බව්තීස්මයෙන් උන්වහන්සේ සමඟ තැන්පත් කරනු*

*ලැබ, උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ දෙවියන්වහන්සේගේ ක්‍රියාව කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන උන්වහන්සේ සමඟ නැගිටුවනු ලැබූවහුය.*

**16). ශුද්ධ වූ දිව්‍ය ග්‍රන්ථයක නොතිබිය යුතු වැකි.**

*[උත්පත්ති 35:22] තවද ඉශ්‍රායෙල් ඒ දේශයේ වාසය කරන කල, රූබන් ගොස් තම පියාගේ උපභාර්යාව වූ බිල්හා සමඟ සයනය කළේය. ඉශ්‍රායෙල්ට ඒ ගැන ආරංචි විය. යාකොබ්ගේ පුත්‍රයෝ දොළොස් දෙනෙක්ය.*

*[උත්පත්ති 19:34-36] පසුවදා වැඩිමහල් දරුවා බාලයාට කතා කොට, “බලන්න, ඊයේ රෑ මම මගේ පියා සමඟ සයනය කළෙමි. අද රෑත් අපි ඔහුට වයින් පොවමු; ඔබ ඇතුළට ගොස් අපේ පියාගෙන් පැවත එන්නන් ආරක්ෂා කර ගැනීමට ඔහු සමඟ සයනය කරන්නෙමු”යි කීවාය. ඔව්හු ඒ රාත්‍රියේත් තම පියාට වයින් පොවති. බාලයා නැඟිට ඔහු සමඟ සයනය කළහ. ඇය නිදාගත්තේ කවදාද, ඇය නැඟිට්ටේ කවදාද කියා ඔහු දැන සිටියේ නැත. මෙසේ ලොත්ගේ දූවරු දෙදෙනාම තම පියාගෙන් ගැබ්ගෙන සිටියහ.*

*[2 සාමුවෙල් 13:11-13] ඇය ඒවා කෑමට ඔහු ළඟට ගෙනා විට, ඔහු ඇයව අල්ලාගෙන, “මගේ සහෝදරිය, එන්න, මා සමඟ සයනය කරන්න” කියා ඇයට කීවේය. ඇය ඔහුට පිළිතුරු දෙමින්, “මාගේ සහෝදරයා, මට බල නොකරන්න; මක්නිසාද ඊශ්‍රායෙල්හි එවැනි දෙයක් නොකළ යුතුයි: මේ මෝඩකම නොකරන්න. මම, මගේ ලැජ්ජාව කොහේට ගෙනියන්නද? ඔබ සම්බන්ධයෙන්, ඔබ ඊශ්‍රායෙල්හි මෝඩයන්ගෙන් කෙනෙකු මෙන් වනු ඇත. එබැවින් දැන්, මම ඔබෙන් රජුට කතා කරන්න; මක්නිසාද ඔහු මා ඔබෙන් වළක්වා නොගන්නේ ය. නමුත් ඔහු ඇගේ හඬට සවන් දුන්නේ නැත; නමුත් ඇයට වඩා ශක්තිමත් වූ නිසා, ඔහු ඇයව බලහත්කාරයෙන් ඇය සමඟ සයනය කළේය.*

*[උත්පත්ති 38:8-16-18] යූදා ඕනාන්ට කථාකොට: නුඹේ සහෝදරයාගේ භාර්යාව වෙතට ගොස්, පුරුෂයෙකුගේ සහෝදරයෙකුට තිබිය යුතු යුතුකම ඇයට ඉටුකර, නුඹේ සහෝදරයාට දරුවන් උපදවන්නැයි කීවේය.*

*ඔහු මඟදී ඇය දෙසට හැරී, "කරුණාකර එන්න, මට නුඹ වෙතට එන්නට ඉඩ දෙන්න. මක්නිසාද ඇ තමාගේ ලේලි බව ඔහු දැන සිටියේ නැත. ඇ: මා වෙතට එන්නට නුඹ මට කුමක් දෙන්නෙහිදැයි ඇසුවාය.*

*ඔහු: මම නුඹට කුමන ඇපයක් දෙන්නද? ඇ: නුඹේ මුද්‍රාවද නුඹේ ලණුවද නුඹේ අතේ තිබෙන නුඹේ සැරයටියද කීවාය. ඔහු ඒවා ඇයට දී, ඇ වෙතට පැමිණියාය, ඇ ඔහු කරණකොටගෙන ගැබ්ගත්තාය.*

*[1 කොරින්ති 7:36-37] නමුත් යමෙක් තම කන්‍යා දියණිය කෙරෙහි තමා අශෝබන ලෙස හැසිරෙන බව සිතන්නේ නම්, ඇයගේ වයසේ මල් පිපී ඇත්නම්, සහ අවශ්‍යතාවයක් තිබේ නම්, ඔහු තමා කැමති දේ කළ යුතුය; ඔහු පව් නොකරයි; ඔවුන් විවාහ වේවා. නමුත් අවශ්‍යතාවයක් නොමැතිව, තමාගේම කැමැත්තට බලපෑම් කිරීමට බලය ඇති, තමාගේම කන්‍යා දියණිය තබා ගැනීමට තමාගේම සිතින් මෙය තීරණය කර ඇති, තම සිතේ ස්ථිරව සිටින තැනැත්තා යහපත කරනු ඇත.*

*[1 කොරින්ති 7:38] එබැවින් තමාගේ කන්‍යා දියණියව විවාහ කර දෙන්නා යහපත කරයි; විවාහ කර නොදෙන තැනැත්තා ඊට වඩා යහපත කරයි.*

**15. මුස්ලිම්වරුන් පවසන වදන් යේසුස් වහන්සේත් පැවසූ බවට බයිබලයෙන් පෙන්වන සාධක.**

- සහාදා:- ජෝන් 17:3
- අල්ලාහ්:- මාර් ක් 15:34, මැතිව් 27:46
- අස්සලාමුඅලෙයිකුම් :- ලූක් 24:36, ජෝන් 20:19
- ලා ඉලාහ ඉල්ලල්ලාහ් :- මාර්ක් 12:29,
- බිස්මිල්ලාහ් : (30 වතාවක් පමණ. උදා ජෝන් 12:30
- අල් හම්දුලිල්ලාහ් : 100 වතාවක් පමණ. උදා මැතිව් 11:25

**16. වෙනත්**

*[1 තිමොති 2:14] තවද ආදම් රැවටුනේ නැත, නමුත් රැවටී සිටි ස්ත්‍රිය වරදට වැටුණාය.*

# විවිධ ආගම් හී දෙවියන් පිලිබඳ සංකල්ප

## හින්දු ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය.

හින්දු ආගමේ දේව සංකල්පය වේදයේ ද දැකිය හැකිය.

**1). යජුර්වේදය :-**

- *"ඔහුගේ රූපයක් නැත." යජුර්වේද 32:3*
- *"ඔහු නිර්මල හා ශුද්ධවන්තය." යජුර්වේද 40:8*

**2). අථර්ව වේදය**

- *"දෙවියන් වහන්සේ ඇත්තෙන්ම ශ්‍රේෂ්ඨයි." අථර්වවේද 20:58:3*

*[කුරානයේ එවැනිම පණිවිඩයක් වන්නේ, "ඔහු ශ්‍රේෂ්ඨය, මහෝත්තමයාණන්ය." අල් කුර්ආනය 13:9]*

**3). ඍග්වේදය** :- එය සියලුම වේදයන් අතරින් පැරණිතම වන අතර එය අති පූජනීය ලෙස සැලකේ.

*ඍෂිවරු (උගත් පූජකවරු) එක දෙවියෙකුට විවිධ නම්වලින් කියති. ඍග්වේදය 1:164:46*

*"මිත්‍රවරුනි, දිව්‍යමය වූ උන්වහන්සේට හැර වෙන කිසිවකුට නමස්කාර නොකරන්න." ඍග්වේදය 8:1:1*

ඍග්වේදයේ සඳහන් වන ගුණාංගයක් වන්නේ බ්‍රහ්ම සහ විෂ්ණු ය. දෙවියන්ට රූපයක් නොමැති නමුත් ඔවුන්ට දෘශ්‍ය නිරූපණයක් ඇති නිසා මුස්ලිම්වරුන්ට කිසි විටෙකත් එවැනි නම් වලින් තම දෙවියන්ව හැඳින්විය නොහැක.

**4). හින්දු වේදාන්තයේ බ්‍රහ්ම සූත්‍රයේ ද දැකිය හැකිය**

*"දෙවැන්නා නොව එක් දෙවි කෙනෙක් පමණයි. කොහෙත්ම නැහැ, කොහෙත්ම නැහැ, අඩුම තරමින් නැහැ."*

මේ අනුව හින්දු ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය දැන ගැනීමට හින්දු ග්‍රන්ථ අධ්‍යයනය වැදගත් වේ. හින්දු ආගමේ සහ ඉස්ලාමයේ දේව සංකල්පය බොහෝ සමානකම් ඇත.

---

## ක්‍රිස්තියානි ආගමේ දෙවියන්ගේ සංකල්පය

ක්‍රිස්තියානි ධර්මයේ දෙවියන් පිළිබඳ සංකල්පය ඒකදේවවාදය මත පදනම් වේ. මෙම පාඩමේදී අපි ක්‍රිස්තියානි ධර්මය ගැන සාකච්ඡා කර පසුව ඉස්ලාමයේ සහ ක්‍රිස්තියානි ධර්මයේ ඇති දේව සංකල්පය සංසන්දනය කරමු.

**ක්‍රිස්තියානි ආගම යනු කුමක්ද?**

ක්‍රිස්තියානි ආගම සෙමිටික් ආගමකි. එය ලෝකයේ වැඩිම අනුගාමිකයින් ඇති ආගමයි. ඔවුන් යේසුස් ක්‍රිස්තුස් ඔවුන්ගේ දෙවියන් ලෙස සලකයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ඉස්ලාම් ආගමේ ද ඉතා ඉහළින් සලකනු ලැබේ.

ඉස්ලාමයේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගැන අපි දැන ගනිමු,

- සියලුම මුස්ලිම්වරු යේසුස් ක්‍රිස්තුස් වහන්සේව විශ්වාස කරති.
- ඔවුන් ඔහුව සලකන්නේ බලවත්ම අනාගතවක්තෘවරයකු ලෙසයි.
- ඔහු පියෙකු නොමැතිව උපත ලැබීය.
- ඔහු මළවුන්ට ජීවනය දුන් අතර අන්ධයන් සහ ලාදුරු රෝගීන් සුව කළේය.
- යේසුස් (ඊසා අලෛහිස්සලාම්) තුමාණන් කිසිවිටෙක දේවත්වය ප්‍රකාශ කළේ නැත.

ක්‍රිස්තියානි ආගම සහ ඉස්ලාම් ආගම අතර වෙනස නම් ඔවුන් යේසුස් වහන්සේට දේවත්වය පැටවීමයි. ක්‍රිස්තියානි ධර්මයේ ඉගැන්වීම් දෙස බැලුවද, ක්‍රිස්තියානි

ධර්මයේ දේව සංකල්පය ද පදනම් වී ඇත්තේ යේසුස් වහන්සේ ආගමේ දේශකයා වීම මත ය. බයිබලය පවා පවසන්නේ ඔහු දිව්‍යමය නොවන බවයි.

"මගේ පියා මට වඩා උතුම්" බයිබලය - යොහන් 14:28

"... මම දෙවියන් වහන්සේගේ ආත්මයෙන් යක්ෂයන් දුරු කරමි...." බයිබලය - මතෙව් 12:28

**යේසුස් ක්‍රිස්තුන් වහන්සේ (ඊසා අලෙහිස්සලාම්) තුමාගේ මෙහෙවර -**

ඔහු පැමිණියේ නීතිය ඉටු කිරීමටය.

යේසුස් වහන්සේ පැමිණියේ දේවත්වය ප්‍රකාශ කිරීමට නොව, යුදෙව් නීති ඉගැන්වීම සඳහා දෙවියන් වහන්සේගේ මෙහෙවර මත ය. ඒ බව පහත ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

*"මා පැමිණියේ නීතිය හෝ අනාගතවක්තෘවරුන් විනාශ කිරීමට යැයි නොසිතන්න. මා පැමිණියේ විනාශ කිරීමට නොව ඉටු කිරීමට ය. මක්නිසාද ඇත්තෙන්ම මම ඔබට කියමි, අහසත් පොළොවත් පහව යන තුරු, සියල්ල සම්පූර්ණ වන තුරු, නීතියෙන් එක තිතක්වත්, එක අකුරක්වත් කිසිසේත් පහව නොයන්නේය." Bibal Matthew 5:17-18*

දෙවියන් වහන්සේ යේසුස් වහන්සේව එව්ව බව බයිබලයේ පහත සඳහන් පදයෙන් ප්‍රකාශ කරයි.

*".. ඔබ අසන වචනය මාගේ නොව මා එවූ පියාණන්ගේය." බයිබලය - යොහන් 14:24*

යේසුස් වහන්සේ දිව්‍යමය නොවන බවත්, උන් වහන්සේගේ ඉගැන්වීම් දේශනා කිරීමට දෙවියන් වහන්සේ විසින් එවන ලද බවත් මෙයින් පැහැදිලි වේ.

යේසුස් වහන්සේ දේවත්වය පිළිබඳ දුරස්ථ යෝජනාවක් පවා ප්‍රතික්ෂේප කළේය. යේසුස් වහන්සේ දිව්‍යමය බව ප්‍රතික්ෂේප කරන සිද්ධියක් බයිබලයේ සඳහන් වේ. දෙවියන් වහන්සේගේ ආඥා පිළිපදින ලෙස ඔහු මිනිසුන්ගෙන් ඉල්ලා සිටියි.

නාසරෙත්හි යේසුස් තුමාණන් - දෙවියන් වහන්සේ විසින් අනුමත කරන ලද මිනිසෙකි.

පහත වැකිය ඔහු අනාගතවක්තෘ බව සනාථ කරයි.

*"ඉශ්‍රායෙල් දරුවනී, මේ වචන අසන්න: නාසරෙත්හි ජේසුස් වහන්සේ, ඔබ අතරේ දෙවියන් වහන්සේ විසින් කරන ලද ප්‍රාතිහාර්යයන් හා අරුමපුදුම දේවලින් හා ලකුණුවලින් ඔබ අතරේ දෙවියන් වහන්සේ අනුමත කළ මනුෂ්‍යයෙකි, ඔබ ද දන්නා පරිදි." බයිබලය - ක්‍රියා 2:22*

මේ අනුව ක්‍රිස්තියානි ධර්මයේ දෙවියන් යන සංකල්පය පදනම් වී ඇත්තේ යේසුස් වහන්සේ දෙවියන් වහන්සේ වීම මත නොව උසස් ජීවියෙකුගේ පැවැත්ම සහ ආඥා ඉගැන්වීමට යේසුස් වහන්සේ සිටීම මත ය. මේ දෙස බලන විට කිතු දහමේ සහ ඉස්ලාම් ආගමේ දේව සංකල්පය එතරම් වෙනස් නොවේ.

පළමු ආඥාව නම් දෙවියන් වහන්සේ එක්කෙනෙකි යන්නයි.

පළමු ආඥාව ගැන යේසුස් වහන්සේගෙන් ඇසූ විට, ඔහු මෝසෙස්ගේ උපුටා දැක්වීමකින් පිළිතුරු දුන්නේය

*"ඊශ්‍රායෙල්, අසන්න: අපේ දෙවි සමිඳාණන් වහන්සේ එකම සමිඳාණන් වහන්සේ ය." බයිබලය - මාර්ක් 12:*

මෙයින් පැහැදිලි වන්නේ ඔහු දේව සංකල්පය ඉගැන්වීමට පැමිණි බවයි.

---

# යුදෙව් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය

යුදෙව් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය හැඳින්වීම

එය ද ඒකදේවවාදී ආගමකි. මෙහිදී යුදෙව් ආගමේ, ඉස්ලාම් ආගමේ සහ ක්‍රිස්තියානි ධර්මයේ දෙවියන් පිළිබඳ සංකල්පය සමාලෝචනය කරමු.

**යුදෙව් ආගම යනු කුමක්ද?**

ඔවුන් යුදෙව්වන් ලෙස හැඳින්වේ. ඔවුන් මෝසෙස් නබිතුමාගේ ඉගැන්වීම් විශ්වාස කරනවා. එය ප්‍රධාන සෙමිටික් ආගමකි. එහි මූලයන් මැද පෙරදිග කලාපයේ ඇත.

යුදෙව් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය පැහැදිලි කිරීම සඳහා, අපි ශුද්ධ ලියවිලි පද කිහිපයක් හරහා ගොස් බලමු.

ද්විතීය කථාව පොත

එය මෝසෙස්ගේ ඉගැන්වීම් අඩංගු පොතකි. පහතින් දැක්වෙන්නේ හෙබ්‍රෙව් පදයේ පරිවර්ථනයයි :

*"ඉශ්‍රායෙල් මිනිසුනේ, අසන්න: සමිඳාණන් වහන්සේ, අපගේ දෙවියන් වහන්සේ එකම සමිඳාණන් වහන්සේ කෙනෙකිය." [බයිබලය - ද්විතීය කථාව 6:4]*

මෙයින් පැහැදිලිව පෙනෙන්නේ යුදෙව් ආගමේ තනි දෙවියන් පිළිබඳ සංකල්පයක් පවතින බවයි.

යෙසායාගේ පොත

ඉසියා පොතේ පහත සඳහන් පද සලකා බලන්න. මෙයින් ඇඟවෙන්නේ යුදෙව් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය ඒකදේවවාදය මත පමණක් පදනම් වූවක් බවයි.

*"මම, මම පවා, සමිඳාණන් වහන්සේ ය, මා හැර වෙනත් ගැළවුම්කාරයෙක් නැත." [බයිබලය - යෙසායා 43:11]*

*"මම සමිඳාණන් වහන්සේ ය, වෙන කිසිවෙක් නැත. මා හැර වෙනත් දෙවියෙක් නැත. බයිබලය - [යෙසායා 45:5]*

*"මම දෙවිය, වෙන කිසිවෙක් නැත. මම දෙවියන් ය, මට සමාන කිසිවෙක් නැත. බයිබලය - [යෙසායා 46:9]*

යුදෙව් ආගම පිළිම නමස්කාරය හෙළා දකී. යුදෙව් ආගම පහත සඳහන් පදවලට අනුව පිළිම නමස්කාරය හෙළා දකී.

*"මා හැර වෙනත් දෙවිවරුන් ඔබට නැත. උඩ අහසේ හෝ පොළොවේ හෝ පොළොව යට ජලයේ ඇති කිසිම දෙයක කැටයම් රූපයක් හෝ සමානකමක් හෝ සාදා නොගන්න. ඔබ ඔවුන්ට වැඳ වැටෙන්නේවත් ඔවුන්ව දකින්නේවත් නැත. මක්නිසාද ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ වන මම සැක සහිත දෙවි වෙමි...."[බයිබලය -නික්මයාම 20:3-5]*

ඉහත වාක්‍යයට අනුව යුදෙව් ආගමේ දේව සංකල්පය පහත සඳහන් කරුණු මත පදනම් වේ

- දෙවියන් එක්කෙනෙකි.
- දෙවියන් වෙනුවෙන් රූපයක් සාදා නොගත යුතුය.
- ඔහුට සමාන කිසිවෙක් නැත.
- ඔවුන් අන් කිසිවෙකුට නමස්කාර නොකළ යුතුය.

අපි කරුණු දෙස සමීපව බැලුවහොත්, යුදෙව්, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගම්වල දෙවියන් පිළිබඳ සංකල්පය බොහෝ දුරට සමාන බව පෙන්නුම් කරයි.

ශුද්ධ ලියවිලි හෝ පොත්පත් අපට ආගම ගැන සැබෑ අර්ථයෙන් කියයි. ඔවුන් විශ්වාස කරන්නේ සර්වබලධාරී සහ උත්තරීතර වූ එකම දෙවි කෙනෙකුව ය. දෙවියන්ට පමණක් නමස්කාර කළ යුතු බව හඟවමින් පිළිම වන්දනා කිරීම ද ආගම හෙළා දකී.

ද්විතීය කථාව පොතේ සමාන පණිවිඩය.

මෙම පණිවිඩයේ වැදගත්කම පෙන්නුම් කරමින්, දෙවියන් වහන්සේගේ සංකල්පය සහ ඔහුගේ ඒකීයභාවය පිළිබඳ සමාන පණිවිඩයක් ද්විතීය කථාව පොතෙහි පුනරාවර්තනය වේ. ශුද්ධ ලියවිලි පද සහ වාක්‍ය දෙස බැලීමෙන් අපට යුදෙව් ආගම පිළිබඳ සැබෑ දැනුම ලබා ගත හැකිය.

**ඔහුට සමාන කිසිවෙක් නැත**

**ඔවුන් අන් කිසිවෙකුට නමස්කාර නොකළ යුතුය.**

අපි කරුණු දෙස සමීපව බැලුවහොත්, යුදෙව්, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගම්වල දෙවියන් පිළිබඳ සංකල්පය බොහෝ දුරට සමාන බව පෙන්නුම් කරයි. ශුද්ධ ලියවිලි හෝ පොත්පත් අපට ආගම ගැන සැබෑ අර්ථයෙන් කියයි. ඔවුන් විශ්වාස කරන්නේ සර්වබලධාරී සහ උත්තරීතර වූ එකම දෙවි කෙනෙකුව ය. දෙවියන්ට පමණක් නමස්කාර කළ යුතු බව හඟවමින් පිළිම වන්දනා කිරීම ද ආගම හෙළා දකී.

---

# Zoroastrianism (පාර්සිවාදය) හි දෙවියන් පිළිබඳ සංකල්පය

*"මිනිසුනි! මෙන්න උපමාවක්! එයට සවන් දෙන්න! අල්ලාහ් හැර, ඔබ කැඳවන අයට, ඔවුන් සියල්ලන්ම එකම අරමුණක් සඳහා එකට මුණගැසුණේ නම්, මැස්සෙකු පවා නිර්මාණය කළ නොහැක! තවද මැස්සා ඔවුන්ගෙන් යමක් උදුරා ගන්නේ නම්, එය මැස්සාගෙන් මුදා හැරීමට ඔවුන්ට බලයක් නැත. අයැදුම් කරන අය දුර්වලයි! අල් කුර්ආනය 22:73*

*ඉශ්‍රායෙල් මිනිසුනි, අසන්න: අපේ දෙවි සමිඳාණන් වහන්සේ එක සමිඳාණන් වහන්සේ ය. බයිබලය - මාර්ක් 12:29*

මෙම පාඩමේදී අපි Zoroastrianism හි දෙවියන් පිළිබඳ සංකල්පය අධ්‍යයනය කරමු. ලෝකයේ බොහෝ ආගම් මෙන්, සොරොස්ට්‍රියානුවාදය ඒකදේවවාදය විශ්වාස කරයි. අපි Zoroastrianism හි ඉගැන්වීම් හරහා ගොස් ඒවා ඉස්ලාමය සමඟ සංසන්දනය කරන්නෙමු.

Zoroastrianism ආගම යනු කුමක්ද?

Zoroastrianism යනු ආර්ය ආගමකි. එය ලෝකයේ පැරණිතම ආගමක් වුවද එයට බොහෝ අනුගාමිකයින් නොමැත. එබැවින් එය සුළු ආගමක් ලෙස

සැලකේ. ඉරාන අනාගතවක්තෘ Zoroaster මෙම ආගමේ නිර්මාතෘවරයා විය. එය 'පාර්සිවාදය' ලෙසද හැඳින්වේ.

## Zoroastrianism හි දෙවියන් සංකල්පය

Zoroastrianism හි දෙවියන් පිළිබඳ සංකල්පය ඒකදේවවාදය මත පදනම් වේ. ඔවුන් ඔවුන්ගේ දෙවියන්ව හඳුන්වන්නේ අහුරා මැස්ඩා, එනම් ප්‍රඥාවන්ත ස්වාමීන් ලෙසයි. 'Ahura Mazda' සර්වබලධාරී (සියලු බලැති) සහ සර්වඥ (සියල්ල දන්නා) ලෙස හැඳින්වේ. ඔහු සාධාරණ, ත්‍යාගශීලී සහ කාරුණික ලෙස සැලකේ.

## Zoroastrianism හි මූලික ඉගැන්වීම්

Zoroastrianism අනුගමනය කරන මිනිසුන් මනුෂ්‍ය වර්ගයාගේ යහපත්කම විශ්වාස කරන අතර, ඔවුන් විශ්වයේ ඇති සියල්ල දිව්‍යමය ලෙස සලකති. ඔවුන් තම අනාගතවක්තෘවරයා විශ්වාස කරයි. ඔවුන් සඳහා, මූලද්‍රව්‍ය දෙවියන් විසින් නිර්මාණය කර ඇති අතර, මෙම මූලද්‍රව්‍යයන් යහපත කිරීම සහ අයහපත් දේවලින් ඈත්ව සිටීමෙන් පිරිසිදුව තබා ගත යුතුය. ඔවුන් විශ්වාස කරන්නේ සෑම මනුෂ්‍යයෙක්ම යහපත කළ යුතු අතර අන් අයට උපකාර කළ යුතු බවයි.

## Zoroastrianism හි ශුද්ධ ලියවිලි

Zoroastrianism හි පූජනීය ග්‍රන්ථ දෙකක් ඇත, දසතීර් සහ ඇවෙස්ටා. 'දසතීර්' යන්න තවදුරටත් 'බුර්දා දසතීර්' හෝ 'කලන් දසතීර්' ලෙස බෙදිය හැකිය. 'ඇවෙස්ටා' තවදුරටත් 'බුර්දා ඇවෙස්ටා' හෝ 'කලන් ඇවෙස්ටා' ලෙස බෙදිය හැකිය... මහා ඇවෙස්ටා හෝ 'සෙන්ඩ් ඇවෙස්ටා'.

දසතීර්ට අනුව දෙවියන්ගේ ගුණාංග

- ඔහු එක් කෙනෙක්
- කිසිවක් ඔහුට සමාන නොවේ
- ඔහු සම්භවයක් හෝ අවසානයක් නැති කෙනෙක්
- ඔහුට පියා හෝ මව, බිරිඳ හෝ පුතා නැත

- ශරීරයක් හෝ ස්වරූපයක් නොමැතිව
- ඇසට ඔහුව දැකිය නොහැක, සිතීමේ ශක්තියට ඔහුව පිළිසිඳ ගත නොහැක

අපි මෙම ගුණාංග දෙස සමීපව බැලුවහොත්, Zoroastrianism හි දෙවියන් පිළිබඳ සංකල්පය ඉස්ලාමයට සමාන වේ. ඉස්ලාමය තුළ ද දෙවියන් වහන්සේ එක් අයෙකු ලෙස සලකනු ලබන අතර සම්භවයක් හෝ අවසානයක් නොමැත.

ඇවෙස්ටාට අනුව දෙවියන්ගේ ගුණාංග:

ඇවෙස්ටා, විවිධ කරුණු මත දෙවියන් වහන්සේට විවිධ ගුණාංග ලබා දී ඇත.

- මැවුම්කරු (යස්නා 31:7 සහ 11) (යස්නා 44:7) (යස්නා 50:11) (යස්නා 51:7)
- වඩාත්ම බලගතු - ශ්‍රේෂ්ඨ (යස්නා 33:11) (යස්නා 48:3)
- ප්‍රතිලාභී - 'හුදායි' (යස්නා 33:11) (යස්නා 48:3)

Bountiful – 'Spenta' (Yasna 43:4,5,7,9,11,13,15) (Yasna 44:2) (Yasna 45:5) (Yasna 46:9) (Yasna 48:3)

මේ අනුව Zoroastrianism හි දෙවියන් පිළිබඳ සංකල්පය එහි සැබෑ අර්ථයෙන් දැනගත හැක්කේ අප ශුද්ධ ලියවිලි පාඨ කියවා ඒවා හරහා ගොස් ඒවායේ අර්ථයන් තේරුම් ගැනීමට උත්සාහ කළහොත් පමණි.

---

# සීක් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය

මෙම පාඩමේදී අපි සීක් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය සමාලෝචනය කරමු. අපි ආගමේ අංග හරහා ගොස් එය ඉස්ලාම් ආගමට සංසන්දනය කරමු.

එය ලෝකයේ ප්‍රධාන ආගමක් නොව ගුරු නානක් විසින් පිහිටුවන ලද හින්දු ආගමේ ශාඛාවකි. සීක් ආගම ආරම්භ වූයේ පකිස්ථානයේය.

සීක් සහ සීක් ආගමේ අර්ථ දැක්වීම

සීක් යන්න ව්‍යුත්පන්න වී ඇත්තේ අනුගාමිකයා යන අරුත ඇති 'සිසියා' යන වචනයෙනි. සීක්වරු ගුරුවරුන් දස දෙනෙකුගේ ඉගැන්වීම් අනුගමනය කරති, පළමුවැන්නා ගුරු නානක් ය. ශ්‍රී ගුරු ග්‍රන්ත නමින් ඔවුන් අනුගමනය කරන පොතක් ද ඔවුන් සතුව ඇත.

K පහ (The 5 K's)

සෑම සීක් ජාතිකයෙකුටම K 5 තබා ගත යුතුය

K’s යන්නෙන් අදහස් කරන්නේ සීක් ජාතිකයන් ඔවුන්ගේ කොණ්ඩය කපා නොගන්නා නිසා නොකපු හිසකෙස් යන්නයි.

1. කන්ග, එනම් පනාව, තමන් ළඟ තබා ගත යුතු ය.
2. කඩ, ලෝහ බංගල්, මෙය ආගමට ඔවුන්ගේ සම්බන්ධය පෙන්නුම් කරන අතර ශක්තිය සඳහා යොදා ගනී.
3. කිර්පාන් - ඔවුන් ආත්මාරක්ෂාව සඳහා තබා ගත යුතු කිනිස්ස
4. කච්චා - කඩිසරකම සඳහා පැළඳ සිටින යට දණහිස දක්වා දිග.
5. මූල් මන්ත්‍රය: සීක් ආගමේ මූලික ඇදහීම

සීක් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය වඩාත් හොඳින් අවබෝධ කර ගත හැක්කේ මූල් මන්ත්‍රය උපුටා දැක්වීමෙනි.

*"පවතින්නේ එකම දෙවි කෙනෙක් පමණි, ඔහු සත්‍ය, නිර්මාතෘ, බියෙන් හා වෛරයෙන් තොර, අමරණීය, ස්වයං-පවත්නා, ශ්‍රේෂ්ඨ සහ දයානුකම්පිත ලෙස හැඳින්වේ." ශ්‍රී ගුරු ග්‍රන්ත සාහිබ් - වෙළුම 1 ජපුජි, පදය 1*

මෙයින් ඇඟවෙන්නේ සීක් දහම දැඩි ලෙස ඒකදේවවාදය අනුගමනය කරන අතර සීක් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය තනි දෙවියෙකු සහ ගුරුවරුන්ගේ ඉගැන්වීම් වටා පරිණාමය වන බවයි. සීක් වරුන්ට දෙවියන් සඳහා 'එක් ඕම්කාරා' වැනි බොහෝ නම් ඇත.

සීක් ජාතිකයන් ඔවුන්ගේ උත්තරීතර ස්වාමීන් වහන්සේට දෙන තවත් බොහෝ නම් වේ

- සාහිබ් - ස්වාමීන්
- Kartar - නිර්මාතෘ
- සත්තනාම - ශුද්ධ නාමය

**ඔවුන් ඔහුව වහේ ගුරු - එකම සැබෑ දෙවියන් ලෙසද හඳුන්වයි.**

සීක් ආගමේ දෙවියන් පිළිබඳ සංකල්පය ඒකදේවවාදය මත පදනම් වේ. ඔවුන් ද අවතාරවාදය - පුනරුත්පත්තිය පිළිබඳ මූලධර්මය විශ්වාස නොකරයි. Avataravada පදනම් වී ඇත්තේ දෙවියන් වහන්සේ අවතාර ලෙස පුනරුත්පත්තිය සහ මිනිසුන්ට උපකාර කිරීම යන සංකල්පය මත ය. සීක්වරු අවතාර විශ්වාස කළත්, ඔවුන් ඔහුව දෙවියන්ගේ පුනරුත්පත්තියක් ලෙස සලකන්නේ නැහැ. පිළිම වන්දනාවටත් විරුද්ධයි.

කබීර්ගේ බලපෑමෙන් ගුරුන්නාන්සේ.

සාන්තුවරයා වන කබීර්ගේ කියමන ගුරු නානක්ට කෙතරම් තදින් බලපෑවාද යත් ඔහු ගුරුන්නාන්සේ සාහිබ් හි ඔහුගේ කියමන එකතු කළේය.

ප්‍රසිද්ධ යුගලවලින් එකක් නම්,

"සෑම කෙනෙක්ම කරදරයේදී දෙවියන්ව සිහිපත් කරයි, නමුත් සාමය සහ සතුට අතරතුර කිසිවෙකු ඔහුව සිහිපත් නොකරයි. සමාදානයෙන් හා සතුටෙන් සිටින විට දෙවියන් සිහි කරන්නාට කරදර ඇති වන්නේ කුමකට ද?"

අපි එය කුර්ආන් වැකිය සමඟ සංසන්දනය කළහොත්,

*"මිනිසාට යම් කරදරයක් ඇති වූ විට, ඔහු පසුතැවිලි වී ඔහු වෙත හැරී තම ස්වාමියා වෙත මොරගසයි. නමුත් පසුව ඔහු ඔහුට ඔහුගෙන්ම අනුග්‍රහය ලබා දෙයි, ඔහු කලින් කෑගැසූ දේ ඔහුට අමතක වී, ඔහු අල්ලාහ්ට ප්‍රතිවාදීන් පිහිටුවයි. [අල් කුර්ආනය 39:8]*

මේ අනුව අපට ආගම් දෙකෙහිම සමානකම් දැකිය හැකි අතර ශුද්ධ ලියවිල්ල හෝ කියමන් ආගම වඩාත් හොඳින් විස්තර කරන බව අපට පෙනේ. සික් ආගමේ දෙවියන් යන සංකල්පය පදනම් වී ඇත්තේ ඉස්ලාම් ආගමේ එකම ඒකත්වය මතය.

---

# බුද්ධාගමෙහි දෙවියන් පිළිබඳව සංකල්පය.

බෞද්ධයන් දෙවියන් අදහනවාද? දෙවියන් පිළිබඳ අදහස ගැන බුදුදහම උගන්වන්නේ කුමක්ද? බෞද්ධයන් දේවවාදීන්ද, අදේවවාදීන්ද, නැතිනම් එය දැනගැනීම පවා බෞද්ධයන්ට වැදගත්ද?

සමහර බෞද්ධ සම්ප්‍රදායන් දෙවිවරුන් හෝ දේවතාවන් පිළිගන්නා අතර, මොවුන් අනෙකුත් ජීවීන් මෙන් දුක් වේදනා සහ නැවත ඉපදීමේ චක්‍රයට යටත් වන ජීවීන් ලෙස සැලකේ, නිර්මාණකරුවන් හෝ ගැලවීමේ අවසාන මූලාශ්‍ර ලෙස නොවේ.

බොහෝ බෞද්ධ සූත්‍ර වලින් සහ බොහෝ විද්වතුන්ගේ අදහස් මගින් පෙන්නුම් කරන්නේ බුදුන් වහන්සේ දෙවිවරුන් යැයි කොටසක් සිටින බව දේශනා කර ඇති බවත්, ඔවුන්ද එකම සංසාර චක්‍රයේ සිරවී සිටින තවත් සමූහයක් බවත් මනුශ්‍යයාට තම ගැළවීම සඳහා ඔවුන් ගැන දැනගැනීම එතරම් ප්‍රයෝජනවත් වන දෙයක් නොවන බවත්, දෙවිවරුන් සැපසේ සිටින පිරිසක් උවත් ඔවුන්ටත් වඩා උතුම් තත්වයක මිනිසත්භවය පවතින බවත්ය.

බුදුන් වහන්සේ මැවුම්කරුවෙකු ලෙස සැලකිය හැකි (බ්‍රාහ්ම නම්) දෙවි කෙනෙකු ගැනද දේශනාකර ඇති බව ත්‍රිපිටකයේ දක්නට ඇත. එහෙත් ඔහුද එක්කෙනෙක් ලෙස නොපෙන්වයි

*බ්‍රහ්මජාල සූත්‍රය 45 : මහණෙනි, දික් කලක් ඇවෑමෙන් කිසි සමයෙක මේ ලොව නස්නේ ද, එබඳු වූ කාලයෙක් වේ ම ය. එසේ ලොව නැසෙන කල්හී සත්හු බෙහෙවින් ආභස්සර බඹලොවැ උපදින්නෝ වෙති. ඔහු එහි ධ්‍යානචිත්ත*

බලයෙන් උපන්නෝ වෙති, ප්‍රීතිය ම ආහාර කොට ඇත්තෝ වෙති, තුමූ ම බැබළෙන්නෝ වෙති, අහසෙහි හැසිරෙන්නෝ වෙති, සිත්කළු වස්ත්‍රාභරණ හැඳ පැළඳ සිටින්නෝ වෙති. එහි ඔහු ඉතා බොහෝ කලක් සිටිත්.

මහණෙනි, දික් කලක් ඉක්මීමෙන් යම් කිසි සමයෙක මෙලොව නැවත හටගන්නේ නම් එසේ වූ කාලයෙක් වෙයි. එසේ ලොව හට ගන්නා කල්හී හිස් බඹවිමනෙක් පහළ වෙයි. ඒ කල්හී එක්තරා සත්ත්වයෙක් ආයු ගෙවී යැමෙන් හෝ පින් ගෙවී යැමෙන් ආභස්සර බඹ ලොවින් සැව ඒ හිස් බඹවිමනෙහි උපදී. හෙ තෙමේ එහි ධ්‍යාන සිතින් උපන්නේ ප්‍රීතියම ආහාර කොට ඇත්තේ වෙයි. සිය සිරුරු එළියෙන් ම බබළන්නේ වෙයි, ආකාශචාරී වෙයි, සිත්කළු වස්ත්‍රාභරණ ඇති වැ සිටින්නේ වෙයි. හේ එහි ඉතා බොහෝ කලක් සිටියි. එහි ඔහු හුදකලා වැ බොහෝ කලක් වුසූ හෙයින් 'අන් සත්හු ද මේ අත්බවට එන්නාහු නම් යෙහෙකැ' යි ප්‍රාර්ථනාවෙක් තෘෂ්ණාවෙක් ඔහුට පහළ වෙයි. ඉක්බිති එක්තරා සත්ත්ව කෙනෙක් ද, ආයු ගෙවීමෙන් හෝ පින් ගෙවීමෙන් හෝ ආභස්සර ලොවින් සැව ඒ බඹවිමනට, ඔහුගේ සහභාවයට පැමිණෙත්. ඔහු ද එහි ධ්‍යානමනසින් උපන්නෝ ප්‍රීතිය ම ආහාර කොට ඇත්තෝ වෙත්, ස්වයම්ප්‍රභ වෙත්, ආකාශචාරී වෙත්, සිත්කළු උයන් විමන් ආදියෙහි සිටින්නෝ (නොහොත් සිත්කළු වස්ත්‍රාභරණ හැඳ පැලැඳ සිටින්නෝ) වෙත්. ඔහු එහි ඉතා දික් කලක් සිටිත්.

මහණෙනි, එහි යම් සත්ත්වයෙක් පළමු වැ උපන්නේ ද, ඔහුට මෙසේ සිතෙක් වෙයි. "මම බ්‍රහ්ම වෙමි, මහා බ්‍රහ්ම වෙමි, අන් හැම මැඩ පවත්වා සිටින්නෙමි වෙමි, අනුන් විසින් නොමඩනා ලදුයෙමි වෙමි, ඒකාන්තයෙන් සියල්ල දක්නෙමි වෙමි, සියල්ලන් වශයෙහි පවත්වන්නෙමි වෙමි, ඊශ්වර වෙමි, කර්තෘ වෙමි, මවන්නා වෙමි, ලොවට උත්තම වෙමි, ලොව සකස් කරන්නා වෙමි, පුරුදු කළ වශිතා ඇත්තෙමි, උපන්නවුන්ගේ ද, උපදින්නවුන්ගේ ද පියා වෙමි. මා විසින් මේ සත්ත්වයෝ මවන ලදහ. ඒ (එසේ සිතනුයේ ) කවර හෙයින? යත්: 'අන් සත්ත්ව කෙනෙකුත් මෙහි මේ අත්බවට එන්නාහු නම් යෙහෙකැ'යි පූර්වයෙහි මට මේ සිත පහළ විය. මෙසේ මාගේ ප්‍රාර්ථනාව ද විය. මේ සත්ත්වයෝත් මගේ ඒ ප්‍රාර්ථනාව අනු ව මේ අත්බවට ආහ" යනු යි.

*යම් සත්ත්ව කෙනෙක් පසුව උපන්නෝ ද ඔවුනට මේ සිත වෙයි. 'මේ භවත් තෙමේ බ්‍රහ්ම ය, මහා බ්‍රහ්ම ය, අනුන් මැඩ පවත්වා සිටින්නා ය, අනුන් විසින් නො මැඩුණේ ය, ඒකාන්තයෙන් සියල්ල දක්නේ ය, ලොව තමා වශයෙහි පවත්වන්නේ ය, ඊශ්වර ය, කර්තෘ ය, නිර්මාතෘය, උත්තමයා ය, ලොව සකස් කරන්නා ය, පුරුදු කළ වශිතා ඇත්තා ය, උපන් උපදනා සියල්ලන්ගේ පියා ය. මේ භවත් බඹහු විසින් අප මවන ලද්දමෝ වමු. ඒ කවර හෙයින? යත්: මොහු වනාහී අපට පළමු ව මෙහි උපන්නහු අපි දුටුවමු. අපි වනාහී පසු වැ උපන්නම්හ" යනුයි.*

*යම් යම් අවස්ථාවල හිස් බඹ-විමන් හෝ බ්‍රහ්ම-ලෝක හෝ බ්‍රහ්මයා හෝ වෙනත් දේව ශරීර ඇත්තෝ හෝ වෙනත් ජීවී ආකාර හෝ වෙනත් ලෝක හෝ පහල වූ බව ත්‍රිපිටකයෙහි සඳහන් වන නමුත් පහල වූ ආකාරය ගැන දක්වන අදහස් සාධාරණ නොමැත. එනම්, එම විවිධ අදහස් වලින් පෙන්නුම් කරන්නේ ඒවා ඉබේම ඇතිවූ දේවල් ලෙසය. කාලයත්, අවකාශයත්, ඒ අතර ඇති කිසිවකුත් ඉබේ හටගැනීමකට කොහෙත්ම ඉඩක් නැත.*

ඕනෑම වස්තුවකට හෝ ජීවයකට පහලවීමකින් හෝ ආරම්භයක් ඇත්නම් ඒ කිසිවකට දෙවියන්ගේ ගුණාංගයක් වන "ආරම්භයක් නැති සහ අවසානයක් නැති" යන ගුණාංගයට සම විය නොහැකි නිසා ඒ කිසිවකට හෝ කිසි කෙනෙකුට දෙවියන් හෝ දෙවිවරු ලෙස ආමන්ත්‍රණය කල නොහැකිය. ඉහත ත්‍රිපිටක දේශනාවෙහි සඳහන් බ්‍රහ්ම කුමන හෝ බඹ ලොවක් තුල පහල වූ කෙනෙකු ලෙස නොව, ඔහු විසින් සියලු ලොව පහල කල බවක් ලෙස සඳහන් වූවා නම් "බ්‍රහ්ම" වෙනුවෙන් පෙන්වා දී ඇති ලක්ශන නිවැරදි ලෙස පිලිගැනීමට කිසිඳු ගැටලුවක් මතු වන්නේ නැත.

මාගේ වැටහීම අනුව බෞද්ධ ග්‍රන්ථ වලින් පිළිබිඹු කෙරෙන මෙම පද්ධතියේ ප්‍රමාණය ගැන මෙහි සඳහන් කරන්නම්.

කල්ප කාලාන්තර තිස්සේ ඇතිවෙමින් නැති වෙමින් සහ නැවත නැවත එවැනිම දේ වෙමින් පවතින මේ මහා පරිසරය මෙතරම් විශාල යැයි කිව නොහැකි තරමිය. ඍද්ධි බලය ඇති මුගලන් රහතන්වහන්සේටවත් එහි අග මුල කරා යා නොහැකි

තරම් විශාලය. බෞද්ධ පොත පතට අනුව ශක්‍රයා ලෙසින් හඳුන්වන උසස්ම දෙවිඳුන් හෝ එවැනි දෙවිවරුන් පහල වන්නේද එහිය. සියලු දෙවිවරුන්, සියලු බුදුවරුන් පහල වූයේද මෙතුලමය, ස්වර්ගයන් සහ අපායන් පිහිටන්නේද එතුලය. එසේම, බුදුන් වහන්සේ මේ සියල්ල දන්නේය.

මගෙ අවබෝදයට අනුව මින් එහා යමක් ගැන බෞද්ධ ග්‍රන්ථ වලින් දැකිය නොහැක.

කෙසේ වෙතත්, බුදුන් වහන්සේ දෙවියන්ව ප්‍රතික්ෂේප කළේ නැහැ. එබැවින් දේව සංකල්පය පිළිබඳ බුදුන් වහන්සේගේ අදහස වූයේ මැවුම්කරුවෙකු හෝ නිර්මාණයක් යන සංකල්පය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොවේ. තමන් මේ දේවල් විශ්වාස කළත් මේ ප්‍රශ්නවලට උත්තර බුද්ධත්වයට පත්වීමට හෝ නිර්වාණය ලැබීමට අවශ්‍ය නැහැ කියලා එතුමන් සළකන්නට ඇති.

මූලික බෞද්ධ විශ්වාසයක් නම්, සියලුම විශ්වීය පැවැත්මේ සංසිද්ධිවලට අත්‍යවශ්‍ය ලක්ෂණ තුනක් ඇති බවයි. ඒවා නම් දුක්ඛ, අනිච්ච (අනිත්‍යතාව) සහ අනත්ත (අත්‍යවශ්‍ය බව) ය.

දෙවියන්ගේ ගුණාංග මෙම විශ්වීය පැවැත්මේ සලකුණු සමඟ නොගැලපේ. මෙසේ දෙවියන් දුක්ඛයෙන් නිදහස් විය යුතුය, ඔහු සදාකාලික විය යුතුය (එබැවින් අනිච්චාවට යටත් නොවිය යුතුය), අවසාන වශයෙන්, ඔහුට වෙනස්, වෙනස් නොවන අනන්‍යතාවයක් තිබිය යුතුය. (එබැවින් අනත්තේ ලක්ෂණයක් නොමැත).

නිර්වාණය නිත්‍යය, ස්ථිරය, නොනැසී පවතී, අචලය, බය නැතිය, මරණ රහිතය, නූපන්ය, අනපේක්ෂිත යයි කියනු ලැබේ. එය සතුට, සැපත, සුරක්ෂිත, සරණ සහ අසීමිත ආරක්ෂිත  බව ඇති වාසස්ථානය බව, එය සැබෑ සත්‍යය සහ උත්තරීතර යථාර්ථය බව, එය යහපත්, උත්තරීතර ඉලක්කය සහ එකම සමාපත්තිය බව. එනම් අපේ ජීවිතයේ "සදාකාලික,  සැඟවුණු සහ තේරුම්ගත නොහැකි සාමයය.

නිවන් අවබෝධ කරගත් බුදුන් වහන්සේ මරණින් පසු ජීවතය ගැන විමසීම නුසුදුසු යැයි අදහස් කළේය.

'පවතින' යන වචනය අපට තේරුම් ගත හැකි කිසිදු තත්වයක් සමඟ සම්බන්ධ නොවේ. බුදුන් වහන්සේ පෙන්වන්නට උත්සාහ කළේ සංකල්ප සහ තර්කයෙන් ඔබ්බට ගිය යථාර්ථයක් සමඟ කටයුතු කිරීමට භාෂාව සන්නද්ධ නොවන බවයි. ආරම්භයක් සහ අවසානයක් නොමැතිව සදාකල් පවතින තත්වයක් ලෙසින් සියල්ලෙහි නිර්මාතෘ (දෙවියන්)ව හඳුන්වා දීමේදී සමහරුන්ට එය වටහා ගැනීමට යම් යම් අපහසුතා මතුවන්නේද මෙම භාෂා ගැටලුවමය.

මා ඉහතින් පෙන්වා දුන් බෞද්දයන්ගේ පරිසර රාමුවෙන් පිටතිනුයි දෙවියන් සිටිනුයේ. එනම් බෞද්ධ පරිසරය තුල කතා කල එම සියල්ල ඇති වන සහ නැතිවන, කිසියම් කාලයක් පවතින, තවත් දෙයක් මත පරාර්ථකාමී හෝ පරපෝශී වන, කිසියම් සැලසුමකට යටත්වන නිර්මානාත්මක දේවල් ලෙස පෙන්වා දිය හැක. එනම් නිර්මාණ කරුවෙක් ගැන හෝ නිර්මානය වූ ආකාරයක් ගැන සඳහන් වන්නේ නැත.

බුදු දහමෙහි සහ දේව වාදයෙහි (ඉස්ලාමයෙහි) අතර ඇති ප්‍රධානතම වෙනස අපට මෙතනදී හමුවේ.

එය සරලව පවසනවා නම්, ඔබ සුදු කොලයක් අරන් දෙකට වෙන් කර මැදින් ඉරක් අදින්න. ඉන් එක පැත්තක් යනු බෞද්දාගම තුල කතා කරන මහා පද්ධතියයි. ඉස්ලාමයට අනුව මුලු කොලයම ඔවුන්ගේ පධ්දතියය්. ඉස්ලාමයට අනුව එක් පැත්තක සිටිනුයේ අනිත් පැත්තට අදාල නොවන ස්වභාවයක් ඇති එම පැත්ත නිර්මානය කල සදාකල් පවතින මහා බලසම්පන්න එකම දෙවියන් ය. අප සියල්ලෙහි නිර්මාතෘ ඔහුය. ඔහු තමය් සියල්ල දන්නෙ.

එය කෙසේ වෙතත්, මිනිසාගේ අරමුණ මුල්කරගෙන සමහර විට බෞද්ධයන් සහ දේවවාදීන් එකම යථාර්ථය විවිධ වචන වලින් ආමන්ත්‍රණය කරනවා විය හැක. බෞද්ධයන් 'නිර්වාණය' ලෙස හඳුන්වන්නේ ද දේවවාදී ආගම් අනුගාමිකයින් මරනින් මතු ස්වර්ගයන්හි ගෙවන සදාකල් ජීවිතය ලෙසින් හඳුන්වන්නේ ද එකම විය හැකියි. මෙම මාර්ග ඔස්සේ සිතීම අනෙකුත් ඇදහිලි අනුගාමිකයින් සමඟ අන්තර් ආගමික සංවාදයක යෙදීමට විශිෂ්ට නව මාර්ගයක් ලබා දෙයි.

ලිපියේ ආරම්භයේ සඳහන් කළ පරිදි බුදුදහම තුළ දෙවියන් පිළිබඳ අදහස සියලු ආකාරයේ මත සඳහා ඉඩකඩ තිබේ. කෙනෙකුට අදේවවාදී බෞද්ධයෙකු, ක්‍රිස්තියානි බෞද්ධයෙකු, විද්‍යාත්මක බෞද්ධයෙකු හෝ වෙනත් ඕනෑම ආකාරයක බෞද්ධයෙකු විය හැකිය. කෙනෙකුට එකම අවස්ථාවේදීම වෙනත් ඇදහිල්ලක් සහ බුද්ධාගමේ අංගයන් අධ්‍යයනය කර අනුගමනය කළ හැකිය.

බුදුන්වහන්සේ ඔහුට නමදින ලෙස තම අනුගාමිකයන්ට දේශනා කලේ නැත. එසේම, සැනසීමේ (නිවන්) මාර්ගය පෙන්වාදීමට පැමිණි එකම සාස්තෘවරයා තමා නොවන බවත්, තමාට පෙර බොහෝ බුදුවරු පැමිණි බවත් තමාට පසු තවත් එවැනි කෙනෙකු පැමිනීමට නියමිත බවත් දේශනා කල සේක.

---

# ඉස්ලාම් ආගමේ දෙවියන් පිළිබඳව සංකල්පය

ඉස්ලාම් ආගම බොහෝ අනුගාමිකයන් සිටින ප්‍රධාන දේවවාදී ආගමකි. ඉස්ලාමයේ දේව සංකල්පය නම් ඔවුන් එක දෙවියෙකු සහ ඔහුගේ උපදෙස්, ඉගැන්වීම් විශ්වාස කිරීමයි. ඔවුන් අනාගතවක්තෘවරුන් විශ්වාස කරති, අවසන් නබිවරයාව අනුගමනය කරති, පරලොව ගැන, දේව දූත (මලායිකාවරු) ගැන සහ දෙවියන් (අල්ලාහ්) ගේ නියමයන් ගැන විශ්වාස කරයි.

දෙවියන් පිළිබඳ වඩාත් සංක්ෂිප්ත අර්ථ දැක්වීම:

දෙවියන් විසින් තමා ගැන, තමා කුමන ආකාරයේ කෙනෙක්ද යන්න ගැන තම දේවදූතවරයෙකු හරහා මිනිසුන්ට දැනගන්නට සැලස්වූ වදන් කිහිපයක් අපට හමුවේ.

*"කියන්න: ඔහු එකම දෙවියන්ය. ඔහු ස්වයංපෝෂීය. ඔහු කිසිවෙකුව ප්‍රසූත කලේ නැත, ඔහුව කිසිවෙකු විසින් ප්‍රසූත කරනු ලැබුවේද නැත. ඔහුට සමාන කිසිවෙක්ද නැත." [අල් කුර්ආනය 112:1-4] සූරා ඉක්ලාස්.*

සූරා ඉක්ලාස් මගින් දෙවියන් කුමන ආකාරයේ කෙනෙක්ද යන්න සංසන්දනාත්මකව අද්යනය කිරීමට පහසුකම ලබා දෙන්නකි. මුස්ලිම් නොවන

ඕනෑම කෙනෙකුට ඔබ අසා ඇති දෙවිවරුන්ව මෙය සමග සංසන්දනය කර බැලිය හැක. පරීක්ෂා කළ හැක.

දෙවියන් ලෙස පෙනී සිටින මිනිසුන් ගැන ඉස්ලාම් පවසන්නේ කුමක්ද?

බොහෝ සාන්තුවරයන් සහ අධ්‍යාත්මික ගුරුවරුන් සිටින බැවින් ඉන්දියාව දේව-මිනිසුන්ගේ දේශය ලෙස හැඳින්වේ. එවැනි එක් මාස්ටර් කෙනෙකි ඕෂෝ රාජ්නීෂ්.

**ඕෂෝ රාජ්නීෂ්:**

ඔහු ඉන්දියාවේ අධ්‍යාත්මික ගුරුවරයෙකු වූ අතර ඔහු ඔහුගේම ප්‍රජාවක් පිහිටුවා ගත්තේය. **ඔහුගේ අනුගාමිකයන් සිතුවේ ඔහු දෙවියන් බවයි.**

භගවාන් රාජනීෂ් - සූරා ඉක්ලාස් පරීක්ෂණයට ලක් කර බලමු:

පළමු නිර්ණායකය වන්නේ දෙවියන් එක් අයෙකු වීමයි, -නමුත් ඕෂෝ රාජ්නීෂ් වැනි ශරීර ඇත්තවුන් බොහෝ දෙනෙක් සිටිති.

දෙවනුව, දෙවියන් ස්වයංපෝෂී කෙනෙකු විය යුතුය. (කිසිවකගේ අවශ්‍යතාවය මත යැපෙන්නෙක් නොවිය යුතුය). නමුත් රජිනීශ්ට බොහෝ අවශ්‍යතාවන් පිටතින් සපුරා ගත යුතුය.

තෙවනුව, 'ඔහු (දෙවියන්) කිසිවෙකුව ප්‍රසූත කලේ නැත, ඔහු (දෙවියන්ව) කිසිවෙකු විසින් ප්‍රසූත කරනු ලැබුවේද නැත' - නමුත් රාජනීෂ්ට දෙමාපියන් සිටියහ.

හතරවනුව, 'ඔහුට (දෙවියන්ට) සමාන කිසිවෙක් නැත,' නමුත් රාජ්නීෂ් වැනි බොහෝ දෙනෙක් සිටිති.

මේ නිසා රජිනීශ් දෙවි කෙනෙකු ලෙස මුස්ලිම් අය පිලිගන්නේ නැත.

හින්දු කෝවිල් වල, සහ වෙනත් ස්ථානවල විවිධාකාර රූප වලින්, පිලිම වලින් පෙන්නුම් කරන ඒවා දෙවියන් ලෙස පිලිගත හැකිද?

සූරා ඉක්ලාස් වෙතින් දෙවියන් පෙන්වා දී ඇති කරුනු වලට අනුව දෙවිගොල්ලො ගොඩක් සිටිය නොහැක. එහෙම දෙවිගොල්ලො ගොඩක් සිටියොත් විවිධාකාර ගැටලු මතුවනු ඇත. නමුත් කෝවිල් වල දෙවිගොල්ලො තිස්තුන් කෝටියකට වඩා ඇති බව පවසයි. මදක් සිතා බලන්න, ඉරට අධිපති දෙවියන් ඉර හකුලා ගත්තොත් සඳුට අධිපති දෙවියන්ට සහ කතරගමට හෝ පෘථිවියටම අධිපති දෙවිවරුන්ට යන එන මං නැතිවනු ඇත. එනම් මේ සියලුම නිර්මාණයන්ට සහ සියල්ලෙහිම පාලනයට එකම දෙවියෙකු පමනයි සිටිය යුත්තේ.

දෙවියන් වහන්සේ මනුෂ්‍යයෙකු වන්නේ නැත.

බොහෝ අය තර්ක කරන්නේ දෙවියන් වහන්සේ සර්වබලධාරී නම්, ඔහුට මනුෂ්‍යයෙකු විය නොහැක්කේ මන්ද යන්නයි. ඒ මන්දැයි පහත කරුණු වලින් අපි ඔබට කියන්නෙමු,

දෙවියන් වහන්සේ අමරණීය ය; මිනිසුන් අමරණීය නොවේ. දෙවියන්ට ආරම්භයක් හෝ අවසානයක් නැත, නමුත් මිනිසුන්ට තිබේ. දෙවියන්ට ආහාර ගැනීමට හෝ නිදා ගැනීමට අවශ්‍ය නැත. මිනිසුන්ට අවශ්‍යයි. දෙවියන් මනුෂ්‍ය තත්වයකට පැමිනියා නම්, (දෙවියන් වහන්සේ මිනිසත් බවට පත්වුවහොත්) එවිට ඔහු දෙවියන්ගේ කිසිදු ගුණාංගයක් නොමැති තත්වයකට පත්වනු ඇත. එසේම දෙවිකෙනෙකුට (ඔහුට) නොගැලපෙන දේ තාවකාලිකව හෝ කිරීමට ඔහුට සිදුවනු ඇත. දෙවියන් වහන්සේ කිසිවිටකත් ඔහුට, ඔහුගේ මහිමයට නුසුදුසු දේ කරන්නේ නැත. ඉස්ලාමයේ දෙවියන් පිළිබඳ සංකල්පය ඔහුගේ උත්තරීතර බව තබමින් කතා කරයි .

ඔහුට කිසිදා අයුක්තිය හෝ බොරු කීම වැනි අභක්තික ක්‍රියා (Un-Godly act) සිදු කළ නොහැක. ඔහුට නලුවෙකු ලෙස හැසිරීමේ අවශ්‍යතාවයක් නැත. මිනිසුන්ට මෙන් දුහද ගහන, වයසට යන, දිරාපත් වන, අපිරිසිදු ද්‍රව්‍ය සහිතවන, ආහාර ආදිය මත යැපෙන, අපිරිසිදු ස්ථාන මත ඇවිද යන, විවිධ ගතිගුන ඇති අය සමග එකට වසන, සත්වයින් සමගද එකට ලගින මනුශ්‍ය ස්වරූපයක් ගැනීම ඔහුගේ උත්තරීත බවට කිසි සේත්ම ගැලපෙන්නේ නැත.

මැවුම්කරු තම මැවීම් වලට උපදෙස් ලබා දීමට දූත සංකල්පය භාවිතා කරයි.

කුරානයේ ස්වරූපයෙන් මෙම පෘථිවියෙහි අවසන් කාලය තුල වසන මිනිසුන්ට අවශ්‍ය උපදෙස් මිනිසුන් අතරින්ම තෝරාගත් අවසන් නබිවරයා හරහා ලබා දී ඇත. මෙලෙසටම මීට පෙර විසූ ජනයාටත් තම උපදෙස් එවා ඇත. මිනිසුන්ට ජීවත් වීමට අවශ්‍ය ගුරුහරුකම් සහ නීති රීති ලබා දීමට දෙවිඳුන්ට මෙම පොලොවට පැමිනීමට අවශ්‍යතාවය නැත. ඒ සඳහා දෙවිඳුන් දූත සංකල්පය භාවිතා කරයි.

අපි දෙවියන්ව හඳුන්වන්නේ කුමන නමින්ද?

'දෙවියන්- GOD' යන වචනය සමඟ වෙනස්කම් ඇති කළ හැකි නිසා ඉස්ලාමයේ දේව සංකල්පය පිරිසිදුව තබා ගැනීමට මුස්ලිම්වරුන් දෙවියන්ට "අල්ලාහ්" ලෙස හැඳින්වීමට කැමැත්තක් දක්වයි.

---

## <u>දැනුම සඳහා වෙනත් ලිපි</u>

## ★ ඉස්ලාමීය චාරිත්‍ර

# ඉස්ලාමීය විවාහය

ඉස්ලාම් දහම අංග සම්පූර්න ජීවන ක්‍රමයක් පෙන්වාදෙන්නේය. ඊට විවාහයත් ඇතුලත් වේ. නබිතුමා විවාහයන් කිහිපයක් සිදු කිරීමෙන් එය පෙන්වා දී ඇත. නබිතුමා සිදු කළ සෑම විවාහයක්ම ඉතා පහසුවෙන් අනුගමනය කල හැකි සරල ක්‍රමයක් අනුගමනය කර තිබේ. තවද විවාහය නබිතුමාගේ මඟ පෙන්වීමක් බැවින් එය ඔහුගේ අනුගාමිකයින්ට කුසල් ගෙන දෙන ක්‍රියාවක් බවට පත් වන්නේය. විවාහ වීමෙන් කෙනෙකුගේ ජීවිතය සම්පූර්ණ වන බව නබිතුමා පවසා ඇත.

නබිතුමාගේ හදිසයකට අනුව මුස්ලිම්වරයෙකු විවාහ විය යුත්තේ දහමට ප්‍රමුක ස්ථානය ලබා දීම හරහාය. ඒ අනුව කාන්තාවකගේ අලංකාරයට හෝ වත්කමට

වඩා ඇයගේ දහම ගැන වඩාත් සැලකිලිමත් විය යුතුය. පහත දැක්වෙන නබිවදනින් එය විස්තර කොට ඇත.

*"ස්ත්‍රියක් විවාහ කර ගනු ලබන්නේ කරුණු හතරක් නිසාය. එනම් ඇයගේ ධනය, පවුලේ තත්වය, අලංකාරය සහ දහම නිසාය. මේවා අතරින් දහමට ලැදි කාන්තාව විවාහ කර ගනු. එසේ නොකරන්නේ නම් ඔබ පරාජයට පත් වනු ඇත." (සහීහ් අල්-බුහාරි).*

ඉහත සඳහන් හදිසයට මුල්තැන ලබා දෙන්නේ නම් විවාහයන් සාර්ථක වනු නො අනුමානය. එහි ප්‍රතිපලයක් ලෙස ඔවුන්ට දාව ලැබෙන දරුවන්ට හොඳ අනාගතයක් හිමිවනු ඇත.

ඉස්ලාම් විවාහයක විශේෂත්වය වන්නේ දැවැද්ද වෙනුවට මනාලයා විසින් මනාලියට අනිවාර්ය ගෙවීමක් සිදු කිරීමයි. එය මහර් ලෙස නම් කොට ඇත. මෙය නිසි ලෙස ක්‍රියාත්මක කරන්නේ නම් කාන්තාවන්ගේ විවාහ ප්‍රශ්නයට හොඳ විසඳුමක් ලැබෙනු ඇත.

මුස්ලිම්වරුන්ට පහත දැක්වෙන කාන්තවන් සමග විවාහ වීම තහනම් වේ.

*"ඔබගේ මව්වරුන්ද, ඔබගේ දියනියන්ද, ඔබගේ සහෝදරියන්ද, ඔබගේ පියාගේ සහෝදරියන්ද, ඔබගේ මවගේ සහෝදරියන්ද, ඔබගේ සහෝදරයන්ගේ දියනියන්ද, ඔබගේ සහෝදරියන්ගේ දියනියන්ද, ඔබට කිරි දුන් කිරිමව්වරුන්ද, ඔබට කිරිදීමෙන් වූ සහෝදරියන්ද, ඔබගේ භාර්යාවන්ගේ මව්වරුන්ද ඔබට තහනම් කරනු ලැබ ඇත (කුරානය 4:23)."*

මීට අමතරව නබිතුමාද විවාහය සඳහා ඇතැම් තහංචි පනවා තිබේ. එබැවින් ඔවුන් සමගද විවාහ වීම ද තහනම් වේ. උදාහරණයක් වශයෙන් එකම අවස්ථාවේදී එක කුස උපන් සහෝදරියන් දෙදෙනෙකු සමග විවාහ වීම නබිතුමා තහනම් කොට ඇත.

ඉස්ලාමිය විවාහයකදී විවාහ වන කාන්තාවගේ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. එවැනි අවසරයකින් තොරව සිදු කරනු ලබන විවාහයක් නබිතුමා විසින් අවලංගු කොට ඇත. කෙසේ වෙතත් මුස්ලිම් කාන්තාවකට විවාහ විය හැක්කේ

ඇයගේ භාර කරුගේ අවසරයකින් පමණි. එහෙත් යම් අසාධාරණ හේතුවක් මත ඔහු අවසර ලබා නොදෙන්නේ නම් පමණක් නිත්‍යානු කූල කාසිවරයෙකුගේ අවසරය මත ඇයට විවාහ විය හැකිය. කාන්තාවකගේ භාරකරු විය යුත්තේ ඇයගේ පියා හෝ පිය පාර්ශවයේ වෙනත් කෙනෙකුය. නැතහොත් සහෝදරයෙකුට භාරකාරත්වය දැරිය හැකිය. මෙවැනි කෙනෙක් නොමැති අවස්ථාවකදී කාසිවරයාට එම විවාහය සිදු කිරීමේ බලය පැවරෙන්නේය.

ඉස්ලාම් විවාහයක විශේෂත්වය වන්නේ මනාලයා විසින් දෙනු ලබන සරල සාදයකින් (වලිමා) මනාලයා සහ මනාලිය එක්කර හැරීමයි. ඒ අනුව පෝරුවේ චාරිත්‍ර හෝ නැකත් බැලීමක් සිදු කරන්නේ නැත. වලිමා සාදය හැර වෙනත් කිසිම සාදයක් නබිතුමා පෙන්වා දී නොමැත. විවාහ වූ පසු පවුලේ නඩත්තු කටයුතු පැවරෙන්නේ මනාලයාටය. ඒ අනුව භාර්යාවට කොතරම් විශාල අදායමක් තිබුනත් ඇයගේ කැමැත්තෙන් මිස පවුලේ වියදම් දැරීමට ඇය බැඳී නැත.

නබිතුමා පෙන්වා ඇති ක්‍රමය අනුගමනය කරන්නේ නම් සමාජයේ ඇති කාන්තා ප්‍රශ්න බොහොමයක් නිරාකරණය කර ගත හැකි වන්නේය. එපමණක් නොව ඒවාට අල්ලාහ්ගේ ආශිර්වාදයද ලැබෙනු නො අනුමානය. එම නිසා විශාල සාදයන් පවත්වා දහමට පටහැනි දේවල් ද සිදු කිරීමෙන් වැලකී සිටීම මුස්ලිම්වරුන්ගේ ප්‍රධාන වගකීමකි.

---

## ඉස්ලාමීය අවමංගල චාරිත්‍ර

මිනිසාගේ උපතේ සිට මියයන තුරු සියළුම දේවල් ඉස්ලාම් දහමින් පෙන්වා දී තිබේ. ඒ අනුව මුස්ලිම්වරයෙකුගේ අවමංගල චාරිත්‍ර ද සිදු විය යුත්තේ ඉස්ලාම් දහම නියෝග කොට ඇති අකාරයට ය. ඒ අනුව මුස්ලිම්වරයෙකුගේ දේහය භූමදානය කරනු ලබන අතර ආදාහනය කරන්නේ නැත. ආදාහනය කිරීම ඉස්ලාම් දහමට පටහැනි ක්‍රියාවකි.

ජනාසාවක් භූමදානය කිරීමෙන් පසු එහි රැස්ව සිටින අය විසින් මෙහි දැක්වෙන කුරානයේ වැකිය පරායණය කරමින් පස් පිඩු තුනක් එම ජනාසව තිබෙන මිනි වල තුලට දැමීම නබිතුමාගේ සුන්නාවකි.

*"අපි නුඹලාව එයින්ම (පසෙන්) මැව්වෙමු. (නැවතත්) ඔබව ඒ වෙතම හරවා යවන්නෙමු. නැවතත් ඔබලාව ඉන් එලියට ගන්නෙමු" (කුරානය 20:55).*

මේ අනුව පසෙන් නිර්මාණය වූ මිනිසාව පස තුලම දිරා යාමට සැලැස්වීම ඉස්ලාමීය ක්‍රමය වේ.

ඉස්ලාම් දහමින් පෙන්වා දී ඇති භූමදාන ක්‍රමයට වැය වන්නේ ඉතා අඩු වියදමකි. තවද මුස්ලිම්වරයෙකු මිය ගිය විට ඉතා කෙටි කාලයක් තුලදී භූමදාන කටයුතු සිදු කරනු ලබන්නේය. ඒ අනුව මිනිය එම්බාම් කිරීමට අවශ්‍යවන්නේ නැත. ඒ අනුව එම ක්‍රමය ඇති නැති සියළු දෙනාටම පහසුවෙන් අනුගමනය කල හැකි ය. තවද ඉස්ලාමීය අවමංගල්‍ය ක්‍රමය දුගියාගේ පටන් ධනවතා දක්වා එකසේ අනුගමනය කිරීම විශේෂත්වයකි.

මුස්ලිම්වරයෙකු මිය ගිය විට එය ඥාතීන් වෙත ද හිතමිතුරන් වෙත ද දැන්විය යුතුය. තවද, ඔහුගේ දේහය භූමිදානය කිරීමේ වගකීම ඔහුගේ ලඟම ඥාතීන්ට පැවරෙන්නේය. ඥාතීන් සොයාගැනීමට නොහැකි වූ අවස්ථාවකදී ගමේ සිටින සියළු දෙනාටම එහි වගකීම පැවරෙන්නේය. කෙසේ වෙතත් ගමේ සිටින යම් පිරිසක් විසින් භූමිදාන කටයුතු සිදු කරනු ලැබුවේ නම් එමගින් ගමේ සිටින සියළු දෙනාම වගකීමෙන් නිදහස් වන්නේය.

මුස්ලිම්වරයෙකු මිය ගිය විට විශේෂ හේතුවක් නොමැති අවස්ථාවලදී භූමිදානයට පෙර ජලයෙන් නැවිය යුතුය. ඉන් පසුව පිරිමි දේහයක් නම් සුදු රෙදි කඩ තුනකින් ද කාන්තා දේහයක් නම් රෙදි කඩ පහකින් ද කෆන් කිරීම හෙවත් භූමිදානය සඳහා සුදානම් කරනු ලැබේ. අනතුරුව ඥාතීන් ඇතුළු අනෙක් සියළු දෙනාටම එම ජනාසාව බැලීමට ඉඩ සලසනු ලබේ. ඉන් පසු පිරිමි පාර්ශවය විසින් එම දේහය භූමිදානය සඳහා රැගෙන යනු ලැබේ. ජනාසාව රැගෙන සුසාන භූමියට යන අවස්ථාව සඳහා කාන්තාවන් සහභාගී වන්නේ නැත.

ජනාසාව භූමිදානය කිරීමට පෙර එම මරණය වෙනුවෙන් සාමූහික දේව මෙහෙයක් පවත්වනු ලබේ. එමගින් මියගිය තැනැත්තා වෙනුවෙන් පව් සමා කරන ලෙස අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නේය. ඉන් පසු එම දේහය භූමිදානය කරනු ලබේ. අනතුරුව එහි පැමිණ සිටින අය විසින් මිය ගිය තැනැත්තා වෙනුවෙන් තනි තනිවම ප්‍රාර්ථනා කිරීම නබිතුමාගේ මග පෙන්වීමකි.

ඉස්ලාමිය මල ගෙදරක සහ ඉස්ලාම් නොවන මල ගෙදරක ඇති ප්‍රධාන වෙනසක් වන්නේ මිය ගිය තැනැත්තා වෙනුවෙන් ශබ්ද නගා හඬා වැළපීම තහනම් කොට තිබීම, මරණය භූමිදානය සඳහා රැගෙන යන අවස්ථාවේදී බෙර වාදනය හෝ නලා වාදනය නොකිරීම, මල් වඩම් හෝ වෙනත් සංකේත රැගෙන නොයාම වේ.

මුස්ලිම්වරයෙකුගේ භූමදානය සඳහා මිල අධික මිනී පෙට්ටියක් භාවිතා කරනු ලබන්නේ නැත. ඒ වෙනුවට එකම වේවැල් කූඩයක් හෝ ලී කූඩයක් සෑම ජනාසාවක් වෙනුවෙන්ම නැවත නැවත භාවිතා කරනු ලැබේ. එසේම මුස්ලිම්වරයෙක් භූමිදානය කල ස්ථානයේ ස්ථිර ගොඩනැගිලි ඉදි කාන්නේ නැත. එය දහමින් තහනම් කොට ඇත. ඒ අනුව කෙනෙක් භූමිදානය කල ස්ථානයේ නැවත නැවත වෙනත් දේහයන් භූමිදානය කිරීමට ඉඩ සැලසෙන්නේය. මේ නිසා මුස්ලිම් සුසාන භූමිවල ඉඩ නැති ප්‍රශ්නයක් පැන නගින්නේ නැත.

**ඉස්ලාමිය අවමංගලයකදී සැලකිය යුතු කරුණු:**

මියගිය දේහය භූමිදානය කිරීමට පෙර ඔවුන් ණයවී සිට ඇත්තම් ඒවා පියවීමට කටයුතු කළ යුතුය. ඇයිද යත් කෙනෙකුගේ ණය ගෙවන තුරු ඔහුට හෝ ඇයට ස්වර්ගයට යා නොහැකි බව නබිතුමා පවසා ඇති බැවිනි. තවද නබිතුමා එවැනි අයගේ ජනාසා වන්දනය මෙහෙයවීම සඳහා ඉදිරිපත් වී නොමැත.

ජනාසාව භූමිදානය කිසිම සඳහා සූදානම් කල පසු නබිතුමා පෙන්වා නොදුන් "හලරා" වැනි දේවල් සිදු කිරීම අළුතින් දහමට එක්කල දේවල් වේ. දහමට අළුතින් එක් කළ දේවල් නිෂ්ප්‍රභා කරන ලෙස නබිතුමා පවසා ඇත.

මල ගෙදරට සහභාගිවන අය වෙනුවෙන් කෑම පිළියෙළ කිරීම එම නිවැසියන්ට පැවරීම වැරදි ක්‍රමයකි. නබිතුමාගේ උපදෙස් අනුව එය සිදු විය යුත්තේ ඥාතින්, හිත මිත්‍රාදීන්, අසල්වැසියන් විසිනි (සහිහ් බුහාරි 7:593, සහිහ් මුස්ලිම් 4:5491).

ඉස්ලාම් දහම අනුව ස්වාමියා වෙනුවෙන් භාර්යාවක් මාස හතරකුත් දින 10ක ශෝක කාලයක් ගත කල යුතුය. එහෙත් මිය ගිය අයගේ භාර්යාව හැර අනෙක් අයට මිය ගිය අය වෙනුවෙන් දින තුනකට වඩා ශෝකය පල කල නොහැකිය. ඒ අනුව එම කාලය තුලදී සුවඳ විලවුන් භාවිතා කිරීම හෝ අලංකාරවත්ව ඇඳුම් ඇඳීම හෝ නැවත විවාහ වීම හෝ කල හොහැකිය. කෙසේ වෙතත් අත්‍යවශ්‍ය හේතුවක් ඇතොත් බෙහෙත් ගැනීම සඳහා එම වැන්දඹු කාන්තාවට වෛද්‍යවරයෙකු හමු විය හැකිය. එසේම දහමින් අනුමත කල වෙනත් අත්‍යාවශ්‍ය කටයුත්තක් සඳහා ද වැන්දඹු කාන්තාවට සහභාගී විය හැකිය.

මිය ගිය අය වෙනුවෙන් දින නියමකරගනිමින් දාන දීම නබිතුමා පෙන්වා පෙන්වා දී නැතත් ඔවුන් වෙනුවෙන් නබිතුමා පෙන්වා දී ඇති ආකාරයට පින් අනුමෝදම් කල හැකිය. උදාහරණයක් වශයෙන් මිය ගිය තැනැත්තාට පින් පැමිණවීම පිණිස ළිඳක් කපා එහි ජලය මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කිරීම හෝ පුස්තකාලයකට පොත් පරිත්‍යාග කිරීම හෝ අරෝග්‍යශාලාවකට ඇඳන් ලබා දීම හෝ වෙනත් එවැනි ද්‍රව්‍යමය පින්කමක් කල හැකිය.

---

## නවක මුස්ලිම්වරයෙකුගේ අභාවයකදී ඇතිවන ප්‍රායෝගික ගැටලු.

අපි හැමෝම මරණය නම් සත්‍යයට මුහුන දිය යුතුමය. යමෙකුගේ ප්‍රාණය තම සිරුරින් ඉවත් වූ විට ඔහු තව දුරටත් කිසිවක් කරකියා ගැනීමට හැකියාවන් ඇත්තෙකු නොවන්නේය. තම අවසන් කටයුතු වෙනත් අය විසින්ම කරන තත්වයකට පත්වන්නේය. අපට මිය ගිය සමීපතයෙකුගේ අවසන් කටයුතු කිරීමක් සම්බන්ධව පැහැදිළි අවබෝධයක් ඇත. එක් එක් ජන සමාජ

ඔවුනොවුන්ට ආවේනික ආකාරවලින් එම කටයුතු කරනු ඇත. එය සමාජය තුල සාමාන්‍ය දෙයකි.

නමුත් නවක මුස්ලිම්වරයෙකුගේ අවසන් කටයුත්ත අප සිතන මට්ටමේ සාමාන්‍ය අවසන් කටයුත්තක් බවට පත්වන්නේ නැත. එයට හේතුව නම්, මෙහිදී ඔහු ඉස්ලාම් වැලඳ ගැනීමට පෙර තමා සමග සිටි පවුලේ සමීපතයන් විසින් ඔවුන්ට හුරු පුරුදු ආකාරයට මෙම අවසන් කටයුත්ත සිදුකිරීමට ඉදිරිපත් වීම සහ තම නව ඇදහිල්ල වූ ඉස්ලාමය තුලින් පෙන්වා දෙන අවසන් කටයුත්ත අතර යම් යම් නොගැලපීම් කිහිපයක් ඉස්මතු වීමය. මෙය මිය ගිය ඔහුට වඩා ජීවත්ව සිටින ඔහුගේ සමීපතයන් මුහුණ දෙන බරපතල තත්වයකි. එය සුළු පටු කාරණාවක් නොවන බව මම නැවත සඳහන් කරමි.

පහත සඳහන් කරුණු කිහිපය දෙස සලකා බලන්න. නවක මුස්ලිම්වරයෙකු මිය ගිය පසු ඔහුගේ මෘත දේහය,

- එම්බාම් කරනවාද නැද්ද?
- කුමණ නිවසේ තැම්පත් කර තබනවාද?
- දින කීයක් භූමදානය නොකර තබා ගන්නවාද?
- කුමණ ආගමික චාරිත්‍ර වලට අනුව අවසන් කටයුතු කරනවාද?
- කුමණ කනත්තක එය සිදු කරනවාද?
- භූමදානය කරනවාද, ආදාහනය කරනවාද?
- මේ කටයුතු කෙසේ කල යුතු යැයි ඔහු විසින් අවසන් කැමැති ප්‍රකාශනයක් ලබා දී තිබෙනවාද?
- එයට තම පෙර ඇදහිල්ල සමග සිටි පවුලේ අය කැමති වෙයිද එසේ කැමති උනොත් එය ඔවුන්ගේ පැවැත්මට තම සමාජයෙන් යම් යම් බලපෑම් මතු වෙයිද?
- ඇදහීම් දෙකක පූජක පක්ෂ දෙකක් මෙයට දායකත්වය දක්වන්නේ කෙසේද?
- ඔහු තම ප්‍රදේශයට අදාල නැමදුම් මධ්‍යස්ථානය තුල ලියාපදිංචි වී තිබේද?

- මෙවැනි තත්ව සහ අපහසුතාවයන් කල්තියා හඳුණාගෙන පෙර සූදානම් කර තැබීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.
- මුස්ලිම්වරයෙකුගේ අවසන් කටයුත්තකදී පහත සඳහන් ප්‍රධාන කාරණා කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ඇත. (මේ සමග තව සුළු කාරණා කිහිපයක්ද ඇත)
- මියගිය මුස්ලිම්වරයාගේ මෘත දේහය එම්බාම් නොකරයි.
- උපරිම වශයෙන් දිනක් ඇතුලත භූමදානය කිරීමට ඉක්මන් කරයි.
- අවසන් කටයුතු ඉතාම චාම් සහ සරළ ආකාරයට සිදු කරයි.
- මෘත දේහය නෑවීමකට ලක් කර සුදු රෙදි කැබැල්ලකින් එතීමක් කරයි.
- මිනී පෙට්ටි භාවිතා නොකරයි, නැමදුම් මධ්‍යස්ථානයේ ඇති පොදු ලී බක්කියක් මේ සඳහා යොදා ගනී. මිණිය වැලලූ පසු එම ලී බක්කිය නැවත නැමදුම් මධ්‍යාස්ථානයට භාර දෙයි.
- අවසන් කටයුත්ත බොහෝ විට නැමදුම් මධ්‍යස්ථානය තුල ජනාසා නම් සලාතයක් සමග සිදු කරයි.
- ඉන් පසු භූමදානය සඳහා ඉක්මනින් මුස්ලිම්වරුන්ව භූමදානය කරන කනත්තක් වෙත රැගෙන යයි.
- එම මග දෙපස සැරසිළි, බෙර ගැසීම හෝ රතිඤ්ඤා දැමීම, පොළොවට කාපට් හෝ රෙදි ආදිය දැමීම සිදු නොකරයි.
- තම සමීපතයා මිය ගිය පසු සහ ඉන් පසුවද අධික ලෙස විලාප නගමින් හැඬීම සිදු නොකර හැකි තරම් ඉවසීමෙන් සිටීමට පියවර ගනී.
- මෘත දේහය වළලන විට එම ස්ථානයට කාන්තාවන් නොයයි.
- මෘත දේහය කිසි විටකත් ආදාහනය නොකරයි.
- මුස්ලිම් මළ සිරුරක් භූමදානය කරණ විට එහි දකුණු කණ සහ සිරුරෙහි දකුණු පෙදෙස පොළොවට ගැටෙන ලෙසත්, මුහුණ මක්කාවේ කාබතුල්ලාහ්ව දෙසටත් සිටින සේ තබයි. මළ සිරුර වළෙහි එක් බිත්තියකට හේත්තු වන ලෙස තබයි. සමහර වළවල් සම්පූර්ණයෙන්ම පස් දමා වසයි. සමහර වළවල් වල මිණියට උඩින් පස් දමන්නේ නැත. මිණී වළ හිස් කාමරයක් ලෙස සිටින සේ තබා ඉහලින් කොන්ක්‍රීට් ස්ලැබ්

තබා එය උඩට පස් දමණු ලබයි. එම වළ වසර කිහිපයකට පසු නැවත වෙන මළ සිරුරක් වෙනුවෙන් භාවිතා කරයි. කලින් තිබූ සිරුරේ ඇට කටු එම වළෙහිම තව කුඩා වළක් හාරා එහි තැම්පත් කරයි. (ජනාකීර්ණ පෙදෙස්වල සිදු කරණුයේ මෙම දෙවැනි ක්‍රමයයි)

- මිනී වල උඩ ස්මාරක තැනීම හෝ සැරසිළි නොකරයි.

මෙවන් වටපිටාවක් හමුවේ මුස්ලිම් නොවන වෙනත් ඇදහිලි ඇති පවුල් වටපිටාවක් තුල නවක මුස්ලිම්වරයාගේ මෙම ඉස්ලාමීය චාරිත්‍රාණුකූල අවසන් කටයුත්ත කිරීම අභියෝගයක්ව පවතී.

මරණයකදී පමණක් නොව, ඉස්ලාමීය උත්සව සමයන්හිදීද, දෛනික නැමදුම් කටයුතු වලදීද, පොදු සමාජය තුල එක්ව කටයුතු කිරීමේදීද, තම පවුලේ අයගේ විශේෂ කටයුතුවලට සහභාගී වීම් වලදීද, තම විවාහය වැනි කටයුතුවලදීද, මුස්ලිම් නොවන තම ස්වාමිපුරුෂයා හෝ බිරිඳ සමග කටයුතු කීමේදීද මෙම නවක මුස්ලිම්වරයා සාමාන්‍ය හැසිරීමකට එහා ගිය යම් සුවිශේෂී අපහසුතා රාශියකට මුහුණ දෙනු ඇත.

අල්ලාහ් දෙවියන් වහන්සේගේ කරුණාව මෙම නවකමුස්ලිම්වරුන් වෙත පහළ වේවා! ඔවුන්ගේ කටයුතු පහසුකර දෙත්වා!

මෙම තත්වය ගැන  මුස්ලිම් සහ මුස්ලිම් නොවන පොදු සමාජය යහමින් අවබෝධකර ගනිත්වා!

ඔවුන්ගේ මෙම සෑම කටයුත්තකදීම ඔවුනට පහසුවක් වනු පිණිසම අල්ලාහ්සුභානවතාලාගේ නියමය පරිදි ඔවුන් වෙනුවෙන් වෙන්කල යුතුව ඇති සකාත් හි කොටස නිසි පරිදි කළමණාකරනය වෙත්වා!

---

## ඉස්ලාමීය ඇඳුම් පැළඳුම් කේතය

මුස්ලිම්වරුන්ගේ සෑම ක්‍රියාවක්ම අල් කුර්ආනය සහ නබිතුමාගේ සුන්නාවන් මගින් තීන්දු කරන්නේය. ඒ අනුව මුස්ලිම්වරුන් ඇඳුම් ඇඳිය යුත්තේ ද අල්

කුරානයට සහ නබිතුමාගේ මඟ පෙන්වීමට අනුවය. මෙය ඉස්ලාම් යන වචනයෙහි අර්ථයෙහි ද ගැබ්වී තිබේ. ඉස්ලාම් - අල්ලාහ්ගේ කැමැත්ත අනුව ජීවත් වීම.

අල් කුරානය පහළ වී ඇත්තේ මිනිසාට යහපත් ජීවිතයකට මඟ පෙන්වීම සඳහා ය. ඒ අනුව කුරානයෙන් පෙන්වා දෙන ඇඳුම් ක්‍රමයද මිනිසාගේ යහපත වෙනුවෙන් නියම කොට ඇත. එසේ තිබියදී කව්රුන් හෝ ඉස්ලාමීය ඇඳුම් පැළඳුම් ක්‍රමය විවේචනය කරන්නේ නම් එය ඔහුගේ යම් දුර්වලතාවයක් මිස ඉස්ලාම් දහමේ වැරැද්දක් නොවේ. ඉස්ලාම් දහම දර්පනයකට උපමා කලේ නම් දර්පනය ඉදිරියෙන් සිටින කෙනෙකුට පෙනෙන්නේ ඔහුගේ මුහුණ මිස වෙන දෙයක් නොවේ. එසේම තමන්ගේ හදවත තුල කුහක කම තබාගෙන ඉස්ලාම් දහම දෙස බලන විට ඔහුට පෙනෙන්නේ ඔහුගේම ප්‍රතිබිම්බය මිස වෙන කිසිවක් නොවේ. මේ නිසා කව්රුන් හෝ ඉස්ලාම් දහමින් පෙන්වා දී ඇති ඇඳුම් ක්‍රමය විවේචනය කරන්නේ නම් ඒවා පිළිගත යුත්තේ බුද්ධිමත්ව සිතාබැලීමෙන් පසුවය.

ඉස්ලාම් මිනිසාට පෙන්වා දෙන්නේ නිහතමානි ජීවන රටාවකි. ඒ අනුව ඉස්ලාමීය ඇඳුම් ක්‍රමය නිසා මුස්ලිම්වරුන්ට ගෞරවයක් ලැබෙන්නේය. තවද, ඉස්ලාමීය ඇඳුම අඳින සමාජයක අපචාරයන් දැකිය හැක්කේ ඉතාමත් අඩුවෙනි. එයම එම ඇඳුම් ක්‍රමයේ වැදගත්කම කියා පාන්නේය.

අල් කුරානය මගින් පිරිමින්ට මෙන්ම කාන්තාවන්ට ඇඳුම් ඇඳීම පිළිබඳව උපදෙස් ලබා දී ඇත. ඒ අනුව තම අලංකාරය පෙන්විය හැකි තැන් මෙන්ම එය සැඟවිය යුතු තැන් පිළිබඳව පහත දැක්වෙන කුර්ආන් වැකිවලින් පෙන්වා දී ඇත.

*(නබියේ!) විස්වාසකරන ගැහැනුන්ට ඔබ මෙසේ කියනු. ඔවුන්ද තම බැල්ම පහත හෙලා තමන්ගේ පතිවතද ආරක්‍ෂා කරනු. (තවද තමන්ගේ දේහය සාමාන්‍යයෙන්) පිටතට පෙනෙන තැන් මිස තමන්ගේ අලංකාරයද (ඇඳුම්, ආභරණ වැනි) අලංකාරයද පිටතට නොපෙන්වා සඟවා ගනු. තමන්ගේ හිස්-වැස්මෙන් ලපැත්තද වසා ගනු. ගැහැණු තමන්ගේ ස්වාමිපුරුෂයන්, තමන්ගේ පියවරු, තමන්ගේ ස්වාමිපුරුෂයන්ගේ පියවරුන්, තමන්ගේ පුතුන්, තමන්ගේ ස්වාමි පුරුෂයන්ගේ පුතුන්, තමන්ගේ සහෝදරයන්, තමන්ගේ සහෝදරයන්ගේ පුතුන්, තමන්ගේ*

*සහෝදරියන්ගේ පුතුන්, තමන්ගේ ගැහැනුන් හෝ තමන්ගේ වහලුන් හෝ තමන්ගේ වහලුන් කෙරෙහි ඇල්මක් නැති (ඔවුන්ට) සමීපව ජීවත්වන (මහලු) පිරිමින් හෝ ගැහැණුන්ගේ රහස් ස්ථාන ගැන අවබෝධ නොකරගත් කුඩා ළමුන් යනාදීන් හම්වෙහි හැර අනෙක් අය හමුවෙහි හෙළි නොකළ යුතුය. තවද තමන්ගේ අලංකාරයෙහි සඟවා ඇති දැය දැනුම් දීමට (බුමියෙහි) තමන්ගේ පාදයන් හප්පමින් ගමන් නොකරනු. විශ්වාසවන්තයිනි! (මෙයින් යම්කිසි වැරැද්දක් සිදුවුවහොත්) ඔබ සියලුදෙනාම ජයග්‍රහණය කිරීම පිණිස අල්ලාහ්ගෙන්ම සමාව ඉල්ලා (ඔබගේ සිත්) අල්ලාහ් දෙසට හරවනු (කුරානය 24:31).*

පිරිමින් සඳහා පහත දැක්වෙන නියෝගය ලබා දී ඇත.

*"ඔවුන් තමන්ගේ බැල්ම පහත හෙළිය යුතු යැයිද, තමන්ගේ පතිවත රැකගත යුතු යැයිද, (නබි) නුඹ විශ්වාසවන්ත වූ පිරිමින්ට පවසනු! මෙය ඔවුන්ට වඩාත් පිරිසිදු වේ. නියතව ඔවුන් කරන දේ ගැන අල්ලාහ් හොඳින් දන්නේය" (24:30).*

ඉහත දැක්වෙන කුර්ආන් වැකි සහ නබිතුමාගේ හදිස් අනුව පහත දැක්වෙන නිගමනවලට එළඹී ඇත.

කාන්තාවන් අන්‍යය පිරිමින් ඉදිරියේදී සම්පූර්ණ ශරීරයම ආවරණය කල යුතුය. එහෙත් මුහුණ ආවරණය කිරීම පිලිබඳව ඉස්ලාමීය විද්වතුන් අතර මත බේද තිබේ. කෙසේ වෙතත් කොරෝනා වෛරස් අසාදනයෙන් පසු එහි වටිනාකම අමුතුවෙන් පැහැදිලිකර දීමට අවශ්‍ය නැත. එවැනි මුහුණු ආවරණයක් ජීවිතයට සම්පූර්න ආරක්ෂාවක් සලසා දෙන බව දැන් බොහෝ දෙනෙක් තේරුම් ගෙන ඇත.

කාන්තාවන්ගේ පිටත ඇඳුම අන්‍යය පිරිමින්ගේ ආකර්ෂණය ඇද නොගන්නා පරිදි තිබිය යුතුය. මෙමගින් කාන්තාවන්ට අත්විඳීමට සිදුවන බාහිර බලපෑම් අවම කර ගත හැකි වන්නේය.

ඇඳුම ශරීරයට ඇලි නොසිටින පරිදි බුරුලට තිබිය යුතුය. එමගින් ඇතැම් කාමාතරයන්ගේ අනවශ්‍ය බැල්මෙන් ආරක්ෂා විය හැකිය.

පිරිමින්ගේ වස්ත්‍රය පාදයේ වළලු කරට වඩා ඉහලින් තිබිය යුතුය. මෙවැනි නියෝගයක් පැනවීමට ප්‍රධාන හේතුව ඇඳුම නිසා ඇතිවිය හැකි අනවශ්‍ය මමත්වයෙන් වැළකීමටය. උඩඟුකම අනු ප්‍රමාණයක් හෝ ඇති අය ස්වර්ගයට නොයන බව නබිතුමා පවසා ඇත.

ඉතත දක්වා ඇත්තේ මුස්ලිම්වරුන් අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙතයි. එම සීමාව තුල තමන් කැමති අකාරයකට ඇඳුම් සකසා ගත හැකිය. කෙසේ වෙතත් ඇඳුමකින් බලාපොරොත්තු වන්නේ ආරක්ෂාව සහ අලංකාරයි. ජේසු තුමාගේ මව ඈත අතීතයේ සිටම තම ශරීරය වැසෙන පරිදි ඇඳුම් ඇඳ තිබේ. බෞද්ධ උපාසිකාවන්ද ඉතා සංවර ඇඳුම් අඳින්නෝය. එසේ තිබියදී නවීන සමාජයේ බටහිර කාන්තවන් බිකිනිය සමග මහමග යාමට පුරුදු වී ඇත. එවැනි දෙයක් විදේශිකයින් කල පමණින් එය සංවර ඇඳුමක් වන්නේ නැත.

ඉස්ලාම් දහම පෙන්වා දී ඇති ඇඳුම නිසා කාන්තාවන්ගේ ආරක්ෂාව සැලසෙන්නේය. එසේ නොවන ඇඳුම් පැළඳගෙන පාරේ ගමන් කරන බොහෝ කාන්තාවන් නොයෙකුත් හිංසනයන්ට ගොදුරු වන්නෝය. දිනපතාම කාන්තා දූෂණයක් ගැන පුවත්පත්වල වාර්තා වීමට එක් හේතුවක් වන්නේ කාන්තාවන් පිටස්තර අයගේ ආකර්ෂණයට ලක්වීම බව නොරහසකි.

නවීන ලෝකයේ කාන්තා රුව වෙළඳ ප්‍රචාරයන් සඳහා භාණ්ඩයක් බවට පත්වී ඇත. එය කාන්තවන් සඳහා කරන නිගාවක් ලෙස සැලකිය හැකිය. ඉස්ලාම් දහම එවැනි දෙයක් කිසිසේත්ම අනුමත කරන්නේ නැත. ඉස්ලාම් දහම අනුව කාන්තාවන්ගේ අඩනිරුවත් රූප යොදා අනිමින් වෙළඳාම් කිරීම කාන්තාවට කරන බලවත් අවමානයකි.

බොහෝ දියුණු රටවල්වල ඉස්ලාමීය ඇඳුමට පිළිගැනීමක් ලැබී තිබේ. ඒ අනුව ඇතැම් බටහිර රටවල්වල මුස්ලිම් හමුදා නිලධාරිනියන්ට සේවය කරන අවස්ථාවේදී ෆර්දාව පැළඳීමට අවසර ලබා දී තිබේ. එසේ තිබියදී ඇතැමුන්ට ඉස්ලාමීය ඇඳුම් ක්‍රමය නුහුරු එකක් වී තිබීම කනගාටුවට කරුණකි.

ඇතැම් අය සිතන්නේ මුස්ලිම් කාන්තාවන්ගේ ෆර්දාව ආරක්ෂාවට තර්ජනයක් බවයි. එහෙත් කිසිසේත්ම එය පිළිගත නොහැකිය. ආරක්ෂාවට තර්ජනයක් වීමට නම් තනපටක් හෝ නිකරයක් වුවද ප්‍රමාණවත් විය හැකිය.

මුස්ලිම් නොවන ඇතැම් අය සිතන්නේ මුස්ලිම් කාන්තාවන් ෆර්දාව අඳින්නේ පිරිමින්ගේ බලපෑම නිසා බවයි. එහෙත් සත්‍යය එය නොවේ. ඔවුන් එසේ ඇඳුම් අඳින්නේ ස්ව කැමැත්තෙන් අල්ලාහ්ගේ නියෝග වලට යටත් විය යුතු නිසාය. ඇත්ත වශයෙන්ම එය ආගමික අවශ්‍යාත්වයකි. (FA)

---

# චර්මච්ඡේදනය

චර්මච්ඡේදනය යනු ශිෂ්නය කෙළවරේ ඇති සම ඉවත් කිරීම සඳහා සිදු කරනු ලබන සැත්කමකි. මෙය බොහෝ විට යුදෙව් සහ ඉස්ලාමීය ආගමික සිරිතක් ලෙස සලකනු ලැබුවත් මුස්ලිම් නොවන ජන සමාජවලද දක්නට ලැබේ. ඒ අනුව ක්‍රිස්තු පූර්ව හතරවන සියවස තරම් ඈත ඉතිහාසයේ සිටම මෙය අරාබියාවේ දක්නට ලැබෙන චාරිත්‍රයකි.

ඊජිප්තුවේ පැරණි සොහොන් කොත් ආශ්‍රිතව ලැබී ඇති සිතුවම්වලට අනුව චර්මජ්ජෙදනයට ක්‍රි.පූ. 2400-2300 තරම් පැරණි ඉතිහාසයක් තිබේ. එය මුස්ලිම්වරුන් පමණක් නොව යුදෙව්වන්ද සිදු කරති. ජේසුස් වහන්සේට චර්ම ජේදනය සිදුකර තිබුණු බව බයිබලයේ සඳහන් වේ. අප්‍රිකානු සංස්කෘතිය අනුව ඕස්ට්‍රේලියාවේ ඇබෝරිජින් වරුන් අතරද චර්මච්ඡේදනය දැකිය හැකිය.

ඉස්ලාම් දහම අනුව පිරිමින් සඳහා චර්මච්ඡේදනය විශේෂයෙන්ම නිර්දේශ කොට ඇත. එහෙත් කාන්තාවන් සඳහා චර්මජේදනය අවශ්‍යනම් පමණක් කල හැකිය. ඊට හේතුව නබිතුමාගේ සම්ප්‍රාප්තියට පෙර සිටම කාන්තාවන්ට චර්මච්ඡේදනය කිරීමේ සිරිත අරාබියාවේ තිබී ඇති බැවිනි. එම චාරිත්‍රය නබිතුමා තහනම් නොකළ අතර දිගටම පැවතීමට ඉඩ හැර තිබේ. එසේම කාන්තවන් සඳහා එය සිදු කරන මෙන් නබිතුමා නියෝග කළේද නැත.

මුස්ලිම්වරුන් ආගමික හේතුන් නිසා චර්මච්ඡේදනය සිදු කලත් එහි බොහෝ සෞඛ්‍යමය ප්‍රතිලාභ තිබෙන බව වෛද්‍යවරුන් පවසති. මේ නිසා චර්මජ්ජේදය මුස්ලිම් නොවන සමාජවල සංස්කෘතික හේතුන් ලෙසද ලෙඩ රෝග වැළැක්වීමේ ක්‍රමයක් ලෙස සිදු කරනු ලබන්නේය.

චර්මච්ඡේදනය ලිංගික චර්යාවන්ට බාදාවක් ඇති කරන්නේ නැත. අනෙක් අතට ඉන් වාසි රැසක්ම තිබේ. ඒ අනුව පිරිමින්ගේ පෙර සම ඉවත්කිරීමෙන් එහි එක්රැස් වන කුණු සහ විසබීජ පහසුවෙන්ම ඉවත්කර ගැනීමට හැකියාව ල්බෙන්නේය. තවද HIV වෛරසය පැතිරයාම බොහෝ දුරට පාලනය වන්නේය. එපමණක් නොව පිරිමින්ට චර්මච්ඡේදනය කිරීම නිසා කාන්තාවන්ගේ ගර්භාශ්‍රිත පිළිකා සැලකිය යුතු මට්ටමකින් අඩුවන බව සංඛ්‍යාලේකන වලින් පෙන්නුම් කර ලබේ.

HIV/AIDS (UNAIDS) පිලිබඳ ලෝක සෞඛ්‍යසංවිධානය එක්සත් ජාතීන්ගේ වැඩසටහන සමග එකතුවී නිකුත්කළ නිවේදනයෙන් පවසන්නේ HIV වැළැක්වීමට හොඳම ක්‍රමය පිරිමින්ට චර්මච්චේදනය කිරීම බවයි. තවද කුඩා කාලයේදී ඇතිවිය හැකි මුත්‍රාශය සම්බන්ද ආසාදනයන් බොහොමයක් චර්මච්ඡේදනය නිසා වලක්වා ගත හැකි බව වෛද්‍යවරුන් පවසා ඇත.

---

# හලාල් සහ හරාම්

හලාල් සහ හරාම් යනු ඉස්ලාම් දහමේ ඉතා වැදගත් සංකල්පයන් දෙකකි. හලාල් යන්නෙන් අදහස් කරනු ලබන්නේ දහමින් අනුමත කල දේවල් වන අතර හරාම් යන්නෙන් අදහස් කරනු ලබන්නේ දහමින් තහනම් කල දේවල්ය. මේවා අහාර පාන සඳහා පමණක් නොව ක්‍රියාවන් සම්බන්දයෙන්ද බලපැවැත්වෙන්නේය.

ඇතැම් දේවල් එහි ස්වභාවය නිසාම තහනම් වේ. උදාහරණයක් වශයෙන් මත්පැන්, ඌරු මස්, ඉබේ මැරුණු සතුන් ආදිය එහි ස්වභාවය නිසා තහනම් කොට ඇත. එසේම ඇතැම් ක්‍රියාවන් සම්බන්ද දේවල් ද තහනම් වේ. උදාහරණයක් වශයෙන් මුසාවාදය, සොරකම, රැවටීම, අනාචාරයේ හැසිරීම, පොළී ගනු දෙනු ආදිය ඊට අයත් වේ. මේ අතර හලාල් දේවල් පවා හරාම් වන

අවස්ථා තිබේ. උදාහරණයක් වශයෙන් පලතුරු වර්ග හලාල් වුවත් ඒවා අත්පත් කර ගත් ක්‍රමය වැරදි නම් ඒවා හරාම් වේ. ඒ අනුව සොරකම් කල සෑම දෙයක්ම හරාම් වන්නේය. මේ අතර ඇතැම් දේවල් හලාල් වුවත් ඒවා දහමට පටහැනි ක්‍රමයට ඝාතනය කිරීම නිසා හරාම් වන්නේය. උදාහරණයක් වශයෙන් කුකුලන් එළුවන් හලාල් වුවත් ඒවා ඝාතනය කිරීමේදී ඉස්ලාම් අනුමත කල ක්‍රම අනුගමනය නොකළේ නම් හරාම් වන්නේය.

ඉස්ලාම් දහමින් හරාම් ලෙස නම් කොට ඇති සෑම දෙයක්ම මිනිස් ජීවිතයට භෞතික වශයෙන් හෝ අධ්‍යාත්මික වශයෙන් අහිතකර බලපෑම් ඇති කරන්නේය. ඒ අනුව හරාම් අහාර අනුභව කිරීමෙන් එහි ප්‍රතිවිපාක කිසියම් අකාරයකට බලපාන්නේය. එසේම හරාම් ක්‍රියාවන් නිසා අධ්‍යාත්මික වශයෙන් බලපෑම් සිදු වන්නේය. ඒවා පින් සහ පව් වශයෙන් වෙන් කල හැකිය. කුරානයේ මේවා විස්තර කොට ඇත.

අල් කුරානය මගින් අහාරය පිණිස තහනම් කොට ඇති දේවල් මෙම කුර්ආන් වැකියෙන් පෙන්වා දී ඇත.

*"ඉබේම මළ දෑ, රුධිරය, සූකර මාංශ, අල්ලාහ් නොවන්නන් වෙනුවෙන් ඝාතනය කරනු ලැබූ සතුන් ආදිය නුඹලාට තහනම් කර ඇත. තවද බෙල්ල මිරිකනු ලැබීමෙන් මළ දෑ, පහර කෑමෙන් මළ දෑ, උස්තැනක සිට වැටීමෙන් මළ දෑ, අං වලින් අනිනු ලැබීමෙන් මළ දෑ, වනසතුන් සපා කෑමෙන් මළ දෑ යනාදියද (තහනම් කර ඇත)" (කුරානය 5:3).*

මේවා අනුගමනය කිරීමෙන් මිනිස් ජීවිතයට වටිනාකමක් එකතු වන්නේය. වෛද්‍ය විද්‍යාව අනුවද ඉබේ මල දෑ සහ රුධිරය අහාරය පිණිස ගැනීමෙන් මිනිස් ජීවිතයට අහිතර බලපෑම් ඇති වන්නේය. එසේම සූකර මාංස නිසා බොහෝ ලෙඩ රෝග සහ වෙනත් අතුරු අබාද ඇති වන්නේය. ඉහත සඳහන් ලේඛනයට අමතරව තවත් බොහෝ මාංශ වර්ග නබිතුමා විසින් තහනම් කොට තිබේ. උදාහරණයක් වශයෙන් මාංශ බක්ෂක සතුන්, රාජාලියන් ඊට අයත් වේ. බූරුවා මාංශ බක්ෂක නොවුනත් එය නබිතුමා විසින් තහනම් කොට තිබේ. මෙහි සඳහන් මාංශ අනුභව කිරීමෙන් මිනිස් ශරීරයට පමණක් නොව අධ්‍යාත්මික ජීවිතයටද

අභිතර බලපෑම් ඇති කල හැකි බව නවීන විද්‍යාව අනුව සොයාගන තිබේ. උදාහරනයක් වශයෙන් සූකර මාංශ අහාරයට ගැනීම නිසා ලජ්ජා ශීලී බව නැතිවන බව මානව විද්‍යාඥයින් විසින් සොයාගෙන ඇත. තවද රුධිරය ශුද්‍ර ජීවින් සඳහා ඉතා හොඳ තෝතැන්නකි. එබැවින් රුධිරය අනුභව කිරීමෙන් නොයෙකුත් අබාද ඇතිවිය හැකිය. මේ නිසා ඉස්ලාම් පෙන්වා දෙන ක්‍රමයට සත්වයින් ඝාතනය කිරීමේදී උපරිම වශයෙන් රුධිරය පිටතට වාහනය වීමට සලස්වන්නේය. මේ හේතුව නිසාම උස තැනකින් වැටී මිය ගිය සතුන් සහ පහර කෑමෙන් මිය ගිය සතුන්ගේ මාංශ අනුභව කිරීම මුස්ලිම්වරුන්ට තහනම් කොට ඇත. ඉස්ලාම් දහමින් තහනම් නොකළ අනෙක් සෑම දෙයක්ම හලාල් වේ.

අහාර පමණක් නොව නබිතුමා සහ කුරානයෙන් තහනම් කොට ඇති ක්‍රියාවන්වල නිරත වීමත් මුස්ලිම්වරුන්ට හරාම් වේ. උදාහරනයක් වශයෙන් අනාචාරයේ යෙදීම, මත්පැන් මෙන්ම මත්කුඩු භාවිතා කිරීම පොළිය සම්බන්ද සියළුම ගනු දෙනු මුස්ලිම්වරුන්ට තහනම් වේ. එපමණක් නොව මුසාව, වංචාව, සොරකම, මංකොල්ල කෑම ආදී සෑම දෙයක්ම ඉස්ලාම් දහමින් හරාම් වේ.

ඉහත කරුණු වලට අමතරව මුස්ලිම්වරුන් කරන රැකියාවන්ද හලාල් විය යුතුය. ඒ අනුව පොළී ගනු දෙනු කරන ආයතනවල, තැබෑරුම්වල, ගණිකා මඩම්වල මුස්ලිම්වරුන්ට රැකියා කිරීම හරාම් වේ. එසේම හලාල් රැකියාවක නිරත වුවත් පගාව ගැනීම හෝ එය දීම හරාම් වේ. නබිතුමා පවසා ඇති පරිදි පගාව ගත් තැනැත්තා සහ පගාව දුන් තැනැත්තා යන දෙදෙනාම නරකාදියට යන්නේය. මේ නිසා තමන් ගනු ලබන වේතනයට සරිලන අවංක සේවයක් ලබා දීම මුස්ලිම්වරයෙකුගේ යුතුකම වේ. ඊට පටහැනිව ක්‍රියා කිරීම හරාම් වන්නේය.

මෑත කාලයේදී හලාල් සහතිකයක් ගැන ඇසීමට ලැබෙන්නේය. එවැනි දෙයක් අවශ්‍ය වන්නේ වෙළඳ පොලේ ඇති භාණ්ඩ හඳුනා ගැනීම සඳහා ය. ඉන් වැඩි වාසිය අත් වන්නේ මුස්ලිම්වරුන්ට වඩා එම භාණ්ඩ විකුණන ව්‍යාපාරිකයින්ට ය. ඇයිද යත් එමගින් ඔවුන්ට ඉතා විශාල වෙළඳ පොළක් හිමිවන නිසාය.

---

## ★ කාලීන

# අන්තවාදය යනු කුමක්ද?

අන්තවාදය යන්නෙන් අදහස් කරනු ලබන්නේ "අන්තයේ ගුණාත්මකභාවය හෝ තත්වය" එසේත් නැතිනම් "ආන්තික පියවර හෝ අදහස් වෙනුවෙන් පෙනී සිටීම" වේ. අන්තවාදීන් ලෙස සැලකෙන දේශපාලන න්‍යායපත්‍රවලට බොහෝ විට අන්ත වාමාංශික දේශපාලනය හෝ අන්ත දක්ෂිනාංශික දේශපාලනය මෙන්ම රැඩිකල්වාදය, ප්‍රතිගාමීවාදය, මූලධර්මවාදය සහ අන්තවාදය ද ඇතුළත් වන්නේය. මෙවැනි ඇතැම් මතදාරින් නිසා ජනතාවට නොයෙකුත් බලපෑම් සිදු වන්නේය. ඔවුන් සිය මතය අනෙකා කෙරෙහි බලෙන් පැටවීම නිසා පොදු ජනතාව නොයෙකුත් හිංසනයන්ට ගොදුරු වන්නේය. මෙවැනි සිදු වීම චීනයේ ඇතැම් ප්‍රාන්තයන්හි දැකිය හැකිය. ඔවුන් සිය මතය මිනිසුන් කෙරෙහි පැටවීම සඳහා දෙමව්පියන්ගෙන් දරුවන්ව වෙන් කොට ළමා ගොවිපොළවල් ඇතිකර තිබේ. ඔවුන්ගේ දෙමව්පියන්ට ආගමක් ඇදහීමේ නිදහස සම්පූර්ණයෙන්ම වලක්වා ඇත. මේවා පිළිකුලෙන් හෙලා දැකිය යුතු අන්තවාදය වේ.

කිසිම ආගමක මිනිසාට අහිතකර අන්තවාදයක් උගන්වා නැත. එහෙත් ඇතැම් අයගේ ක්‍රියා කලාපයන් නිසා ඔවුන් නියෝජනය කරන දහමට කැළලක් ගෙන දෙන්නේය. එසේ තිබියදී ඇතැම් අය කිසිම හේතුවක් නොමැතිව ඇතැම් මුස්ලිම්වරුන්ට අන්තවාදීන් යැයි නම් කොට ඇත. ඇත්තෙන්ම එය ඔවුන්ගේ නොදැනුවත් කම මිස ඉස්ලාම් දහමේ වරදක් නොවේ.

ඉස්ලාම් දෙවියන්ගෙන් මිනිස් වර්ගයා වෙනුවෙන් පහළ වූ දහමකි. එහි කිසිම බල කිරීමක් නොමැත. එම නිසා කැමති කෙනෙකුට එය පිළිපැදිය හැකිය. කැමති නැති කෙනෙකුට ඉන් වැලකී සිටිය හැකිය. එහෙත් එය පිළිපදින අය අකුරටම එම දහම පිළිපැදීම අර්ථදැක්වීම අනුව අන්තවාදය ලෙස පෙන්වා දිය හැකි වුවත් ඉන් කිසිවෙකුට හානියක් සිදු වන්නේ නැත. ආගම පමණක් නොව විද්‍යාව, ගණිතය වැනි විෂයයන් වුවද නිවැරදිව තේරුම් ගැනමට නම් ඒවායේ මූලධර්ම නිවැරදිව වටහා ගෙන තිබිය යුතුය. ඒවා අන්තයටම දැන ගත් තරමට වඩා හොඳ

ප්‍රතිපල ලබා ගත හැකිය. එම නිසා එය ප්‍රතික්ෂේප කල යුතු අන්තවාදයක් නොවේ.

ඇතැම් අය ඉස්ලාම් අන්තවාදයක් ගැන කතා කලත් ඔවුන්ට ඉස්ලාම් දහම ගැන කිසිම දැනුමක් නොමැති වීම කනගාටුවට කරුණකි. එම නිසා ඔවුන් ඉස්ලාම් දහමේ ඇති ඇතැම් සංවිදානවල නම් පමණක් ඉදිරිපත් කරමින් ඉස්ලාම් දහමට මඩ ගැසීමට උත්සාහ කරති. මේ සඳහා ඔවුන් යොදා ගනු ලබන්නේ වහාබ් වාදයයි. එහෙත් එය දහම දෙසීම සඳහා මෑත කාලයේ බිහිවූ සන්විදනයක් බව ඔවුන් දැන ගත යුතුය. මේ අකාරයටම ඇතැම් අය ෂරියා නීතිය අනුව ජිවත් වීම අන්තවාදය ලෙස පෙන්වා දීමට උත්සාහ කරති. එහෙත් ෂරියාව යනු කුරානය සහ නබිතුමාගේ මග පෙන්වීම වේ. තවත් සමහරු තව්හිද් යනු අන්තවාදී සන්විදනයක් ලෙස වරදවා තේරුම් ගෙන ඇත. එහෙත් තව්හිද් යන්නෙන් අදහස් කරන්නේ අල්ලාහ්ගේ එකියභාවයයි. එම මුලික අවශ්‍යතාවය නොමැති විට ඉස්ලාම් දහමක් නොමැත.

මුස්ලිම්වරුන් රැවුල වැවීම සහ කාන්තාවන් ෆර්දාව ඇඳීම සමහරුන් දකින්නේ අන්තවාදය ලෙසය. එහෙත් එසේ සිතන අය දැනගත යුත්තේ එය දහමේ අවශ්‍යතාවයක් බවයි. එම නිසා සෑම මුස්ලිම්වරයෙකුම ඒවා පිළිපැදීමට බැඳී සිටින්නෝය. ඒ අකාරයටම දහමින් අනුමත කරන දේවල් (හලාල්) පරිබෝජනය කිරීමත් දහමින් තහනම් කොට ඇති (හරාම්) දේවල් වලින් වැලකී සිටීමත් දහමේ අවශ්‍යතාවයන් ය. එම නිසා මුස්ලිම්වරුන් ඒවා අනුගමනය කල යුතුව තිබේ. තවද අල් කුරානයේ සඳහන් වන පරිදි මුස්ලිම්වරුන් සම්පුර්ණයෙන්ම දහම තුලට පිවිසිය යුතුය. එය පහත දැක්වෙන කුර්ආන් වැකියෙන් පවසා ඇත.

*"විශ්වාසවන්තයිනි! නුඹලා මුළුමනින්ම ඉස්ලාමයෙහි පිවිසෙන්න. සාතන්ගේ මඟ නොපිළිපදින්න. නියතව ඔහු නුඹලාට ප්‍රකට සතුරා වේ" (කුරානය 2:208).*

මේ නිසා මුස්ලිම්වරයෙකු දහම තුල සම්පුර්ණයෙන්ම ජීවත්වීම අර්ථදැක්වීම අනුව අන්තවාදය වුවත් එමගින් කිසිවෙකුට හානියක් සිදු වන්නේ නැත. ඇත්ත වශයෙන්ම මුස්ලිම්වරයෙකු දහම අනුව ජිවත් වීම ඔහු ලබන භාග්‍යයක් ලෙස සැලකිය යුතුය.

# ඉස්ලාම් දහමින් අධ්‍යාපනයට හිමි තැන

අධ්‍යාපනය ලැබීම සෑම මුස්ලිම්වරයෙකුටම අනිවාර්යවේ. මෙම කරුණ නබි වදනකින් සනාථ වන්නේය. තවද ඉස්ලාම් දහම තුල ක්‍රියාවට පෙර අධ්‍යාපනයට මුඛ්‍ය ස්ථානයක් ලබා දී ඇත. එබැවින් මුස්ලිම්වරයෙකු යම් ක්‍රියාවක් කිරීමට පෙර ඒ සඳහා අවශ්‍ය දැනුම ලබාගෙන තිබිය යුතු වන්නේය. මිනිසාට දැනුම ලබාගැනීම සඳහා අවශ්‍යකරන ශරීර අවයවයන් උපතින්ම ලබා දුන් අල්ලාහ්ට මිනිසා සදා නයගැතිය.

*"නුඹලා කිසිවක් නොදන්නන්ව සිටි තත්වයෙහි නුඹලාගේ මෑණිවරුන්ගේ කුසවලින් අල්ලාහ්ම නුඹලාව පිට කළේය. තවද ඔහුම නුඹලා තුති කරනු පිණිස ශ්‍රවනයද, දෘෂ්ටින්ද, සිත්ද ඇති කළේය" (කුරානය 16:78).*

මිල කළ නොහැකි මිනිස් අවයවයන් ලබා දුන් අල්ලාහ්ට ස්තුති කල හැක්කේ ඔහුගේ නියෝගයන් හැකි පමණින් ක්‍රියාවට නැංවීම තුලිනි. ඒ අනුව අපගේ ඇස්වලින් දෙවියන් තහනම් කළ දේවල් බැලීම වරදකි. එසේම අපගේ කන්වලින් ඔහු තහනම් කළ දේවල් ඇසීම වරදකි. මේවා ගැන අපගෙන් ප්‍රශ්න කරනු ඇත.

*"නුඹට කුමක් ගැන දැනුම නැත්තේද නුඹ එය නොපිළිපැදිය යුතුය. නියතව ශ්‍රවණය, දෘෂ්ටිය, හදවත යනාදිය ගැන ප්‍රශ්න කරනු ඇත" (කුරානය 17:36).*

නබිතුමාට පහළ වූ මුල්ම කුර්ආන් වැකියෙන් පවසා ඇත්තේද කියවීම සම්බන්දවයි. එම වැකි ඛණ්ඩය පහත දැක්වේ.

*"නුඹගේ අධිපතියාගේ නාමයෙන් කියවනු!....."*

තවද කුරානයේ මෙසේ සඳහන් කොට ඇත.

"නියතව නැමදුම් ලැබීමට සුදුස්සා අල්ලාහ් හැර වෙන කිසිවෙකු නැතැයි නුඹ දැනගන්න!..." (කුරානය 47:19).

ඉහත සඳහන් කළ කරුණු අනුව පෙනී යන්නේ ක්‍රියාවට පෙර දැනුම ලබාගෙන තිබිය යුතු බවයි. ඉහත දැක්වෙන කුර්ආන් වැකියෙන් පෙනී යන්නේද දෙවියන් නැමදිය යුත්තේ ඔහු ගැන දැනගැනීමෙන් පසුව බවයි. මේ නිසා සෑම කෙනෙකුම තමන්ට හැකි පමණින් දැනුම ලබාගැනීමට ක්‍රියා කළ යුතුය.

*"අල්ලාහ්ගේ ගැත්තන්ගෙන් ඔහුට බිය වන්නේ උගතුන්මය" (කුරානය 35:28).*

ඉහත වැකිය අනුව පෙනී යන්නේ උගතුන් අල්ලාහ් ඉදිරියේ ගෞරවනීය ස්ථානයක් උසුලන බවයි. මෙය පහත දැක්වෙන කුර්ආන් වැකියෙන් තවත් හොඳින් පැහැදිලි වේ.

*"නුඹලාගෙන් කවරහු විශ්වාස කර, දැනුමද දෙනු ලැබ ඇත්තෝද ඔවුනට අල්ලාහ් තරාතිරම් උසස් කරන්නේය" (කුරානය 58:11).*

දැනුමෙහි ඇති වැදගත්කම නිසාම දැනුම වැඩිකර දෙන මෙන් ප්‍රාර්ථනා කිරීමට කුරානයේ උගන්වා ඇත.

*"මාගේ 'රබ්'! මට දැනුම අධික කරනු මැනව'යි පවසන්න" (කුරානය 20:114).*

තවත් අවස්ථාවකදී අල්ලාහ් මෙසේ පවසා ඇත.

"දන්නෝ සහ නොදන්නෝ සමාන වන්නේදැයි (නබි!) නුඹ අසන්න! බුද්ධිමත්හුම උපදෙස් ලබන්නෝය" (කුරානය 39:9).

මිනිසාට ප්‍රයෝජනවත් සෑම දැනුමක්ම ඉගෙන ගැනීම සඳහා ඉස්ලාම් දහමින් ඇරයුම් කරන්නේය. මේ නිසා ආගමික දැනුමට අමතරව වෛද්‍ය විද්‍යාව, භෞතික විද්‍යාව, අභ්‍යාවකාශ විද්‍යාව වැනි විෂයන් හැදෑරීම මුස්ලිම්වරුන්ට වැදගත් වන්නේය. පුරාණ මුස්ලිම්වරුන් විසින් මෙම ක්ෂේත්‍රවලට විශාල දායකත්වයක් සපයා ඇත. එහෙත් අද ඉස්ලාමීය දහම් පාසල්වලින් විද්‍යාව සම්පූර්ණයෙන්ම ඉවත්වී ඇත. මේ හේතුවෙන් කුරානය හදාරන බොහෝ අයට විද්‍යා විෂයන් හැදෑරීමේ අවස්ථාව ලැබෙන්නේ නැත. එසේම ලෞකික අධ්‍යාපනය හදාරන සිසුන්ට කුරානය හැදෑරීමට අවස්ථාවක් ලැබෙන්නේද නැත. එහෙත් කුරානය හොඳින් තේරුම් ගැනීමට නම් සෑම අංශයකින්ම දැනුම

ලබාගෙන තිබීම ඉතාමත්ම වැදගත්ය. ඇයිද යත් කුරානයේ ආගමික කරුණු වලට අමතරව විද්‍යාව සම්බන්ද වැකි විශාල සංඛ්‍යාවක් තිබෙන නිසාය.

---

## මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම

නොයෙකුත් වර්ගයේ මත් ද්‍රව්‍ය විවිධ නම් වලින් ලොව පුරා ව්‍යාප්තවෙමින් ඇත. දැන් දැන් ඒවා පාසල් සිසුන් අතරත් යමින් තිබේ. මේ නිසා අනාගතයේදී රට බාරගැනීමට සිටින තරුණ පිරිස මුහුණ දෙමින් සිටින්නේ විශාල අභියෝගයකටය. එය මැඩලීම සඳහා ගුරුවරුන්, දෙමව්පියන් සහ පූජකවරුන්ට විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට තිබේ. මෙහිදී දෙමව්පියන්ගේ වගකීම ඉතා විශාලය.

කුමන අකාරයේ උත්සාහයන් කලත් හොඳම ප්‍රතිපල ලබා ගත හැක්කේ ස්ව උත්සාහයෙන් ඊට ප්‍රතිරෝදය දැක්වීමෙන් පමණි. නීති පැනවීමෙන් කල හැක්කේ එය මර්ධනය කිරීම පමණි. මේ නිසා මතින් තොර සමාජයක් ගොඩ නැගීම සඳහා කෙනෙකුගේ ආගමික පසුබිම විශාල රුකුලක් වන්නේය. මෙය හොඳින් දැක ගත හැක්කේ අල් කුරානයේ බලපෑම නිසා මුස්ලිම්වරුන් අතර මතට ඇබ්බැහි වුවන් ඉතා අඩුවෙන් දැකගත හැකි වීම නිසාය. කෙසේ වෙතත් නරක මිතුරු ආශ්‍රය නිසා එය පැතිරී යා හැකිය. මේ නිසා කෙනෙක් ආශ්‍රය කල යුත්තේ මතට විරුද්ධ අයවල් පමණි.

සෑම වර්ගයකම මත්ද්‍රව්‍ය නිසා දිනපතා විශාල සංඛ්‍යාවක් මරණයට පත් වන්නෝය. තවත් විශාල පිරිසක් කායික සහ මානසික ලෙඩ රෝග වලට ගොදුරු වන්නෝය. තවද මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුවන්ගේ ජීවිත කාලය වසර දහයකින්, පහළොවකින් අඩු වන්නේය. එසේම මතට ඇබ්බැහි වුවන්ට වයසක පෙනුමක් ලැබෙන්නේය. මේ නිසා තමන්ගේම අනාගතය ගැන සිතා ඉන් වැළකී සිටීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

බොහෝ විට මත් ද්‍රව්‍ය ව්‍යාප්ත කරනු ලබන්නේ මුලදී ඒවා නොමිලයේ ලබා දීමෙන් ය. ඊට ගොදුරු වන්නේ අලුත් අත්දැකීම් වලට කැමති තරුණයින් වීම

කනගාටුවට කරුණකි. මෙම මත්ද්‍රව්‍ය කීප වරක් පාවිච්චි කල ඊට ඒවාට ඇබ්බැහි වීම ඉබේම සිදු වන්නේය. ඉන් පසු ඒවා මිලදී ගැනීමට යොමු වේ. එහි අවසාන ප්‍රතිපලය වන්නේ ඔවුන් සමාජයෙන් කොන් වීමත් අකල් මරණය වැළඳ ගැනීමත් ය.

ගෝලීය දුම්කොළ කර්මාන්තය 2013 වසරේ දී මෙට්රික් ටොන් මිලියන 7.44 ක් නිෂ්පාදනය කර ඇත. එහි ප්‍රධාන නිෂ්පාදකයා වන්නේ චීනයයි. එම වසරේදී දුම්කොළ මෙට්රික් ටොන් දශලක්ෂ 3.15 ක් පමණ නිෂ්පාදනය කොට තිබේ. අනෙකුත් ප්‍රධාන නිෂ්පාදකයින් වන්නේ බ්‍රසීයල සහ ඉන්දියාවයි. ලොව පුරා දුම්කොළ සමාගමක් වන ඉම්පීරියල් දුම්කොළ සමූහය 2016 දී ඩොලර් බිලියන 39.1 ක ආදායමක් උපයා ඇත (The Statistics Portal). ඔවුන්ගේ ඉලක්කය වන්නේ එම නිෂ්පාදන කෙසේ හෝ විකුණා කෝටිපතියන් වීමය.

දුම් පානය නිසා එක්සත් ජනපදයේ පමණක් පිරිමි සහ ගැහැණු ළමයින් අතර ඇති සමස්ත මරණ අනුපාතය දුම් පානය නොකරන පුද්ගලයින්ට වඩා තුන් ගුණයක් පමණ වැඩි බව වාර්තා වේ. එම මරණවලට ප්‍රධාන හේතුව පෙනහළු පිළිකාව සහ ස්වසන රෝග වේ. තවද දුම්කොළවල ඇති නිකොටින් නිසා හදවත නිසි ලෙස ස්පන්දනය නොවීමේ තත්වයක් උදාවන අතර එය හදිසි මරණවලට හේතුවක් වේ.

මත්ද්‍රවය වලට විරුද්ධව ක්‍රියා කිරීමට හොඳම ක්‍රමය තම තමන්ගේ දහම අනුව ජීවත් වීමයි. සෑම දහමකින්ම ඊට එරෙහි වන අතර ඉස්ලාම් දහම අනුව එය විශාල පාපයක් ලෙස නම් කොට ඇත. එපමණක් නොව ඉස්ලාම් දහමින් මත් ද්‍රව්‍ය නිෂ්පාදනය, ප්‍රවාහනය, බෙදාහැරීම සහ විකිණීම සපුරා තහනම් වේ. එපමණක් නොව මත්ද්‍රවය භාවිතා කල පුද්ගලයාගේ දේව විශ්වාසය එම කාලය තුලදී ඔහුගෙන් ඉවත් වන්නේය. එවැනි අවස්ථාවකදී ඔහු මිය ගියේ නම් ඔහුගේ ඉරණම කුමක් විය හැකිද? (FA)

---

## මුස්ලිම්වරුන් අතර සියදිවි නසා ගැනීම් අඩු ඇයි?

මුස්ලිම්වුන් නිතර අල්ලාහ්ව සිහිපත් කිරීමෙන්ද දෛනිකව පස්වතාවක් අල්ලාහ්ට නැමදීමෙන් ද ඔහු සමග ඉතා සමීප සම්බන්දතාවයක් පවත්වා ගන්නේය. මේ හේතුවෙන් මුස්ලිම්වරුන්ගේ සිත් අල්ලාහ් කෙරෙහි ඇති විශ්වාසයෙන් පිරි පවතින්නේය. එහෙත් අල්ලාහ්ව මෙනෙහිකිරීමෙන් ඈත්වන සිත්හි යම්කිසි අඩුවක් දැනෙන්නේය. එය පිරවිය හැක්කේ අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන්ම පමණි. ඒ හැර වෙන කිසිම ක්‍රමයකින් සිත් සැනසුම ලබන්නේ නැත. මේ නිසා කොපමන ලෞකික සැප සම්පත් තිබුනත් බොහෝ අයගේ සිත්වල කාන්සාවක් පවතින්නේය. මේ බව අල් කුරානයේ මෙසේ සඳහන් කොට ඇත.

*"අල්ලාහ්ව සිහිකිරීම තුලින් විශ්වාස කළවුන්ගේ සිත් සැනසුම ලබයි. දැනගන්න! අල්ලාහ්ව සිහිකිරීම තුලින් සිත් සැනසුම ලබයි" (කුරානය 13:28).*

මෙහි නැවත නැවතත් අවධාරණය කොට ඇත්තේ සිත්වල සැනසුම අල්ලාහ්ව සිහි කිරීම තුල රැඳී ඇති බවයි. එහෙත් දෙවියන්ගෙන් ඈත්වන මිනිසා සැනසීම සොයා නොයෙකුත් දේවල් අත්හදා බලන්නේය. ඒවා අසාර්ථක වූ විට ඔවුන් සිය දිවි නසාගැනීමට පෙළඹෙන්නේය.

සම්මානලාභී විලාසිතා නිර්මාණ ශිල්පී කැතරින් නොයෙල් බ්‍රොස්නහාන් නොහොත් කේට් ස්පේඩ් හට සියලු සැප සම්පත් තිබුනත් ඇය නිව්යෝර්ක් නගරයේ පිහිටි සිය නිවස තුලදී ජීවිතය නැතිකර ගෙන තිබේ. ඇය සියදිවි හානිකර ගන්නා විට ඇයගේ වයස අවුරුදු 55 ක් විය. එසේ නම් ධනවත් කාන්තාවක් වන ඇය සියදිවි හානි කරගත්තේ කුමක් නිසාද? මෙවැනි සිදුවීම් තවත් බොහෝ තිබේ. ඊට හේතුව කුමක්ද?

සිය දිවි හානිකර ගැනීම සම්බන්දයෙන් මනෝ විද්‍යාඥ, කැන්ඩිස් ලැම් ඔහුගේ අත්දැකීම් මෙසේ විස්තර කරන්නේය. "මගේ රෝගීන් සාමාන්‍ය මිනිසුන්ට වඩා වැඩි පීඩනයක් යටතේ මානසික ආබාධ රාශියකින් පීඩා විඳිති. ඒවා මෙලෙස වර්ගීකරණය කල හැකිය; භීතිකා ප්‍රහාර, නින්ද නොයාම, ප්‍රචණ්ඩකාරී පිපිරීම්, මත්ද්‍රව්‍ය අනිසි භාවිතය, ආහාර ගැනීමේ අක්‍රමිකතා, සියදිවි නසාගැනීමේ සිතුවිලි, ලිංගික ඇබ්බැහි වීම සහ කිංකි හෝ විකෘති ලිංගික හැසිරීම" මෙවයින් පෙන්නුම් කරන්නේ මිනිසුන්ට ධනය තිබුණු පමණින්ම මානසික සුවය නොලැබෙන බවයි.

සියදිවි හානිකරගැනීම් සම්බන්දයෙන් පර්යේෂන සිදු කරන අය පෙන්වා දෙන්නේ මුස්ලිම්වරුන් බහුතරයක් වෙසෙන මුස්ලිම් රටවල්වල සියදිවි නසාගැනීමේ ප්‍රතිශතය ඉතා අඩු බවයි. ඔවුන් පවසන අන්දමට මුස්ලිම්වරුන් අතර සියදිවි හානිකරගැනීම අඩු අගයක් ගන්නේ කුරානෙයේ බලපෑම සහ මුස්ලිම්වරුන් අතර නරකාදිය පිලිබඳව ඇති දැඩි විශ්වාසයයි. (Nova Science Publishers © Copyright 2004 - 2016).

සමස්ථයක් ලෙස වසරකට මිලියනකක් පමණ සියදිවිනසාගැනීම් වාර්තාවන්නේය. එනම් සෑම තත්පර 40 කටම ලෝකයේ කොතැනක හෝ සියදිවි නසාගැනීමක් වාර්තා වන්නේය. වසර 2050 වන විට එය වාර්ෂිකව මිලියන 1.5 ක් දක්වා ඉහල යා හැකි බව ලෝක සෞඛ්‍ය සංවිදායනය සඳහන් කරයි. මොවුන්ගෙන් 25% තරුණයින් සහ වයස විසිපහට අඩු අය බව පෙන්වා දී ඇත. ලංකාවේ වසරකට හාරදහසක් පමණ සිය දිවි හානිකර ගැනීම් වාර්තා වන බව අචාර්ය නීල්ප්‍රනාන්දු (Head of National Institute of Mental Health) මහතාගේ වාර්තාව පෙන්වා දෙන්නේය.ඉස්ලාම් දහම අනුව සියදිවි හානිකර ගැනීම බලවත් වරදකි. කුරානයේ මෙලෙස සඳහන් වේ.

*"....දුප්පත්කමට (බිය වී) නුඹලාගේ දරුවන්ව ඝාතනය නොකරන්න. අපිම නුම්බලාටද, ඔවුන්ටද ආහාර ලබා දෙමු. තවද නින්දාසහගත ක්‍රියාවන්හි ප්‍රසිද්ධ දේටද, රහසිගත දේටද සමීප නොවන්න. අල්ලාහ් වැළැක්වූ කුමන ජීවයක් වුවද අයිතියක් නොමැතිව ඝාතනය නොකරන්න..." (කුරානය 6:151).*

කුරානයේ තවත් තැනක මෙසේ සඳහන් වේ.

*"විශ්වාසකලවුනි! නුඹලා අතර තෘප්තිමත් භාවය මත කෙරෙන වෙළඳාම හැර, නුඹලාගේ වස්තු නුඹලා අතර වැරදි අන්දමින් අනුභව නොකරන්න. තවද, නුඹලාව නුඹලාම නොනසා ගන්න. නියතව අල්ලාහ් නුඹලා සමග අසම දයාවන්තයා ලෙස සිටියි. සීමාව ඉක්මවාද, අසාධාරණ ලෙසද කවරෙක් මෙය කරයිද ඔහුව අපි නිරයට ඇතුළු කරන්නෙමු. මෙය අල්ලාහ්ට ඉතා පහසු කාර්යයක් වේ" (කුරානය 4:29-30).*

නබිතුමා ජීවතුන් අතර සිටියදී යුද්ධයට ගිය සෙබළුන් පවා සිය දිවි හානිකරගෙන නැත. එම නිසා මරාගෙන මැරෙන බෝම්බ පුපුරවා ගැනීම ඉස්ලාම් දහම අනුමත කරන්නේ නැත.

පහත දැක්වෙන්නේ වසරක් තුළදී සියදිවි නසාගැනීම් සම්බන්දයෙන් ඇති සංඛ්‍යා ලේඛනයකින් උපුටාගත් කොටසකි.

වසරක් තුලදී මිනිසුන් 100,000 කට සිදුවන සියදිවි නසාගැනීම් (2012)

| රටේ නම | පිරිමින් සහ ගැහැණු එකතුව | ශ්‍රේණිය |
|---|---|---|
| ගුයනා | 44 | 1 |
| දකුණු කොරියාව | 29 | 2 |
| ශ්‍රී ලංකාව | 29 | 3 |
| ඉන්දියාව | 21 | 11 |
| රුසියාව | 20 | 14 |
| ජපානය | 19 | 17 |
| ඇමරිකාව | 12 | 50 |
| පකිස්තානය | 9 | 76 |
| ජර්මනිය | 9 | 77 |
| තුර්කිය | 8 | 93 |
| බංගලාදේශය | 8 | 94 |
| සිරියාව | 0.4 | 170 |
| සෞදි අරාබියාව | 0.4 | 171 |

(List by the World Health Organization - 2012)

මෙම සංඛ්‍යාලේඛනයට අනුව මුස්ලිම්වරුන් අතර සිය දිවි හානිකර ගැනීම් වාර්තා වී ඇත්තේ ඉතා අඩුවෙනි. ඊට ප්‍රධාන හේතුව ඔවුන් මරණයෙන් පසු ජීවිතයක් ගැන දැඩි ලෙස විශ්වාස කිරීමත් දෙවියන් කෙරෙහි ඇති විශ්වාසයත් ය.

---

## ඉස්ලාම් දහමින් දුම්පානය තහනම් කරන්නේ ඇයි?

මනුෂ්‍ය ජීවිතයට හානිකර සියලුම දේවල් ඉස්ලාම් දහමින් තහනම් කොට ඇත. එහෙත් දුම්වැටි සම්බන්දයෙන් අල් කුරානයේ සෘජුවම කිසිවක් ප්‍රකාශ කරන්නේ නැත. කෙසේ වෙතත් කුරානයේ ඇති වෙනත් වැකිවල ආධාරයෙන් ද නබිතුමාගේ උපදෙස් අනුව ද දුම්පානය තහනම් බව ඉස්ලාමීය විද්වතුන් විසින් ඒකමතිකව තීරණය කොට ඇත. තවද දුම්පානය ශරීර සෞඛ්‍යට අහිතකර බව වෛද්‍යවරු පවසා ඇත. අල් කුරානයේ ඇති මෙම වැකිය අනුවද ඉන් වැලකී සිටීම අනිවාර්ය වේ.

*"....අනුභව කරන්න, පානය කරන්න එහෙත් නාස්ති නොකරන්න. නියත වශයෙන්ම ඔහු නාස්ති කරන්නන්ව ප්‍රිය නොකරන්නේය" (කුරානය 7:31).*

මෙම වැකිය අනුව කිසිම ප්‍රතිලාබයක් ගෙන නොදෙන දෙයක් කිරීමෙන් වැළකී සිටිය යුතු වන්නේය.

දුම් පානය කිරීමෙන් ඇති වන මූලික ලක්ෂණ වන්නේ කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, හුස්ම හිරවීම සහ ඇදුම යනාදියයි. මෙම ලක්ෂණ එහි ආරම්භය පමණි. දුම් පානය දිගටම සිදු කිරීමෙන් නියුමෝනියාව, එම්පිසීමාව සහ පෙනහළු පිළිකා වැනි මාරාන්තික රෝග ඇති විය හැකි බව වෛද්‍යවරුන්ගේ මතය වේ. පෙනහළු පිළිකාවෙන් සිදුවන මරණ වලින් 84% ක් සිදුවන්නේ දුම්පානය නිසා ය. ඊට ප්‍රධාන හේතුව දුම්වැටිවල මිනිස් සිරුරට අහිතකර රසායන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අඩංගු වීමය. ඒවායින් බොහොමයක්ම පිළිකා කාරකයන් ය. ළය පිළිකාවලින් මිය යන පිරිමින්ගෙන් 87% ද කාන්තා මරණවලින් 70% ද දුම් පානය කිරීම නිසා සිදු වන බව ඇමරිකාවේ සිදුකල පර්යේෂණවලින් නිගමනය

කොට තිබේ. තවද දුම් පානය කිරීම නිසා ඇතිවන ළය පිළිකාව සුවකිරීම අපහසු බව වෛද්‍යවරුන්ගේ මතය වේ. දුම් බීමෙන් මධ්‍යම ස්නායු පද්ධතියට බොහෝ බලපෑම් ඇති කරන්නේය. ඊට ප්‍රධාන හේතුව දුම්කොළවල අඩංගු නිකටින් වේ. නිකටින් මානසික වෙනස්කම් ඇතිකරන ඖෂධයකි. එය ඉතා කෙටි කාලයකදී මොලය වෙත ළඟා වී එහි ක්‍රියාකාරීත්වය වැඩි කරන්නේය. ඉන් පසු එහි බලපෑම ක්‍රමක් ක්‍රමයෙන් හීන වීමේදී එය භාවිතා කළ පුද්ගලයා මහන්සියට පත් වන්නේය. මේ නිසා එම තැනැත්තා තව තවත් දුම් බීමට යොමු වන අතර එය පුරුද්දක් බවට පත් වන්නේය. එවිට එම පුද්ගලයාට දුම්පානය කිරීම අත්හැරීම දුෂ්කර කාර්යයක් බවට පත් විය හැකිය.

නිකොටින් වලට ඇබ්බැහි වීමෙන් පසු එය නතර කිරීමේදී කනස්සල්ලට, කෝපයට හා කලකිරීමට පත් වන බව විද්‍යාඥයින් සොයාගෙන ඇත. තවද එමගින් හිසරදය සහ නින්ද යාමේ ගැටළු ඇති වන්නේය. මේ නිසා හැකි පමණින් ඊට පුරුදු නොවී සිටීම වැදගත් ය.

දුම්පානය නිසා ලය පිළිකාව පමණක් නොව හෘදය පිළිබඳ රෝග, ස්වාස නාලිකා ප්‍රදාහය (bronchitis), ආඝාතය (stroke) වැනි අතුරු සෞඛ්‍ය ගැටළු ඇති වන්නේය. කාන්තාවන්ගේ ගැබ් ගැනීම් වලට සහ පිළිසිඳගත් ළමුන්ගේ සෞඛ්‍යයට දුම්පානය කිරීමෙන් බොහෝ බලපෑම් එල්ල විය හැකිය. බරින් අඩු ළමයින්ගේ බිහිවීමට එය ප්‍රධාන හේතුවක් වන්නේය. කාන්තාවක් දුම්පානය නොකලත් ස්වාමි පුරුෂයා දුම් පානය කරන්නේ නම් එයින් කාන්තාවන්ට යම් තරමක බලපෑමක් ඇති කරන බව සත්‍යයකි.

දුම් පානය කිරීම නිසා නියුමොනියාව සහ ඇදුම වැනි රෝග උග්‍ර විය හැකිය. මේ හැරුණු විට මුකයේ විදුරුමස පිළිබඳ ආසාදන, ඇසෙ සුද, අස්ථි තුනී වීම, උකුළු ඇටයේ බිඳීම, ඔඩු සහිත වනයන් ඇතිවිම වැනි දේ සිදු විය හැකිය. වසර 1990 දී Centers for Disease Control and Prevention (CDC) කල පරියෙශනයකට අනුව දුම් පානය කරන්නන්ගේ ආයු කාලය පිරිමින්ගේ වසර 13.2 කින් සහ කාන්තාවන්ගේ එය වසර 14.5 කින්ද අඩුවන බව සොයාගෙන තිබේ.

කරුණු එසේ තිබියදී සෑම මුස්ලිම්වරයෙකුම විනිශ්චය දිනයේදී දෙවියන් ඉදිරියේ තමන් ගත කල ජීවිතය ගැන වගකිව යුතු වන්නේය. ඒ අනුව කෙනෙක් හම්බ කල ආකාරය සහ එය වියදම් කල අකාරය ගැනත් පිළිතුරු දීමට සිදු වන්නේය. ඒ අනුව මිනිස් සිරුරට හානිකර දුම්වැටි සඳහා වියදම් කල මුදල් වෙනුවෙන් කුමක් පැවසීමට යන්නේදැයි දැන්ම සිතා බැලිය යුතුය. (FA)

---

## ඉස්ලාම් දහම තුල දරුවන් වෙනුවෙන් දෙමව්පියන්ගේ වගකීම්.

ඉස්ලාම් දහම දරුවන්ගේ වගකීම ඉතා බැරෑරුම් කරුණක් ලෙස පෙන්වා දෙන්නේය. මෙම කුර්ආන් වැකිය දෙස බැලීමේදී එය පැහැදිලි වේ.

*"විශ්වාස කලවුනි! නුඹලාවද නුඹලාගේ පවුලේ උදවියද නිරයෙන් බේරා ගනු" (කුරානය 66:6).*

ඉන් අදහස් කරන්නේ පවුලේ උදවියට ආගමානු කූල මග පෙන්වීමක් සිදු කල යුතු බවයි. එසේ තිබියදීත් බොහෝ දෙමව්පියගේ අරමුණ වී තිබෙන්නේ තම දූවා දරුවන්ට ලෞකික අධ්‍යාපනය වැඩියෙන් ලබා දීම ය. එහි ප්‍රතිපලය වන්නේ ඔවුන් දහමින් ඈත් වීමයි. එම නිසා ලෞකික අධාපනයට සමගාමීව ආගමික දැනුම ලබා දීමට සෑම මුස්ලිම් දෙමව්පියෙක්ම කටයුතු කල යුතුය. ආගමික අධ්‍යාපනය යනු කුරානය අරාබි බසින් කියවීම පමණක් නොවේ. ඒ අනුව අල්ලාහ් පිළිබඳව සහ දහමේ නීති රීති හරියාකාරව කියා දීමට කටයුතු කල යුතු වන්නේය. එය පාසලේදී සිදු නොවේ නම් සුදුසුකම් ඇති පෞද්ගලික ගුරුවරයෙකුගේ මාර්ගයෙන්වත් සිදු කිරීමට වග බලා ගත යුතය. ඊට අමතරව ඔවුන්ට තේරෙන භාෂාවෙන් ඇති දේශනා වලට සවන් දීම සඳහා ක්‍රමයක් සකස් කිරීම වඩාත් ප්‍රයෝජනවත් වන්නේය.

දරුවන් හදා වඩා ගැනීමේ දී ප්‍රධාන වගකීම දැරිය යුතු වන්නේ මවක් විසින්ය. එබැවින් ඒ ගැන නිසි අවධානය යොමු කල යුතු වන්නේ විවාහ වන අවස්ථාවේදී ය. මේ හේතුවෙන් දහමට ලැදි කාන්තාවක් විවාහ කර ගැනීමෙන් එම කටයුත්ත පහසු කර ගත හැකි වන්නේය. මේ සම්බන්දයෙන් නබිතුමාද උපදෙස් ලබා දී තිබේ.

ලුක්මාන් තුමා සිය පුතුන්ට දුන් උපදෙස කුරානයේ මෙලෙස සඳහන් කොට ඇත.

*"මාගේ දයාබර පුතුනි! අල්ලාහ්ට නැමදීමේදී කිසිවක් එකතු නොකරන්න! නියතවශයෙන්ම අල්ලාහ්ට නැමදීමේදී කිසිවක් එකතු කිරීම උග්‍ර පාපයක් වන්නේය" (කුරානය 31:13).*

එහෙත් අපගෙන් කී දෙනෙක් තම දරුවන්ට ශිර්ක් සම්බන්දයෙන් උපදෙස් ලබා දී තිබේද? කෙසේ වෙතත් එය කෙනෙකුව නිරයට ගෙන යා හැකි පවක් බව හොඳින් තේරුම් ගන්නේ නම් ළමුන්ට පාසල් අවදියේ පටන් ශිර්ක් සම්බන්දයෙන් දැනුම ලබා දීමට කටයුතු කරනු ඇත.

නූතන සමාජය තුල බොහෝ දෙමව්පියන්ගේ වැඩි අවධානය යොමුව තිබෙන්නේ දරුවන්ගේ ලෞකික අධ්‍යාපනය කෙරෙහි පමණි. මේ නිසා බොහෝ දරුවන්ට ආගම ගැන ඇත්තේ ඉතා අල්ප දැනුමකි. එහි ප්‍රතිපලයක් ලෙස බොහෝ දූවා දරුවන්ට ඉස්ලාම් පෙන්වා දෙන නිවැරදි මාර්ගය කුමක්දැයි දන්නේ නැත. මේ නිසා බොහෝ අය දහම ලෙස සලකන්නේ නබිතුමා පෙන්වා නොදුන් අලුතින් දහමට එකතු කරන ලද දේවල් ය. එහෙත් දහමට අලුතින් එකතුකරන ලද සියළුම දේවල් නිරයට මාර්ගය බව නබිතුමා පවසා ඇත. මේ නිසා දෙමව්පියන් වශයෙන් නිවැරදි දහම් දැනුම ළමුන්ට ලබා දීමට කටයුතු කිරීම ඉතා වැදගත් කරුණකි.

සෑම මුස්ලිම් නිවසක්ම දරුවන්ට ආදර්ශවත් කේන්ද්‍රස්ථානයක් විය යුතුය. ඒ අනුව දරුවන් ඉදිරියේ දෙමව්පියන්ගේ හැසිරීම ඉතා වැදගත් කොට සැලකිය යුතුය. උදාහරණයක් වශයෙන් මවකගේ ඇඳුම් විලාශය බොහෝ දුරට දියණියන්ට ආදර්ශයකි. එසේම පියාගේ ක්‍රියාකාරකම පිරිමි දරුවන්ට ආදර්ශයකි. එම නිසා ඔවුන් දහම අනුව ජීවත් වීම කෙරෙහි අවදානය යොමු කල යුතු වන්නේය. ඒ අනුව පියවරුන් තම පිරිමි දරුවන් ළඟ තබාගෙන දුම් පානය කිරීම

හෝ ඔවුන් ලවා දුම්වැටි ගෙන්වා ගැනීම කිසිසේත්ම නොකළ යුතු ය. මව්වරුන්ද තම ගැහැණු ළමයි ඉදිරියේ ඔවුන්ගේ ඇඳුම් විලාසය දහමේ සීමාවන් තුල තබා ගත යුතුය.

අනෙක් අතට දෙමව්පියන් දහමින් අනිවාර්ය කොට ඇති සලාතය සහ උපවාසය නිසි පරිදි ඉටු කිරීමෙන් තම දූවා දරුවන්ට ආදර්ශමත් විය යුතුය. එසේම සෑම විටම පියවරුන් විසින් තම පුතුන්ව මස්ජිදය වෙත රැගෙන ගොස් සලාතය ඉටු කිරීමට වග බලා ගත යුතුය. එසේ නොකළහොත් සිදු වන්නේ ඔවුන් තම යහළු මිත්‍රයන් සමග කාලය ගත කිරීමෙන් සලාතය මඟ හැරීමයි.

බොහෝ නිවෙස් වල දහමට නිසි තැන නොදී ම නිසා ඇතැම් දරුවන් මත්කුඩු වලට ඇබ්බැහි වී ඇත. දරුවෙක් එම අවස්ථාවට පත්වන තුරු බලා හිඳ දුක් වීමෙන් කිසිම පලක් නැත. ඉන් පසු ඔවුන්ව නිසි මගට යොමු කිරීම ඉතා අසීරු කාර්යක් වනවාට කිසිම සැකයක් නැත. මේ නිසා නිසි කලට වෙලාවට ළමුන් වෙනුවෙන් දහම් දැනුම ලබා දීම ඉතා වැදගත් කොට සැලකිය යුතුය. නීති රීති පැනවීමෙන් කල නොහැකි බොහෝ දේවල් දෙවියන් කෙරෙහි බිය බැතිකම ඇති කිරීමෙන් ඉටු කර ගත හැකි වන්නේය. (FA)

---

## සත්ව කරුණාව සහ ඉස්ලාමය.

ඉස්ලාම් දහම මිනිසාට පමණක් නොව සෑම සතා සිව්පාවෙකුටම කරුණාව දැක්වීමට උගන්වා ඇත. එහෙත් ස්වභාවික නීති වලට පිටුපාමින් අහාරය පිණිස සතුන් ඝාතනය කිරීම වලක්වා නොමැත. ලෝකයේ ඇති ආහාර දාමයන් ගැන සලකා බැලීමේදී ඒවා සැකසී ඇත්තේ ද එක් ජීවියෙක් තවත් ජීවියෙකුගේ ගොදුර කරගන්නා ආකාරයටය. මේ නිසා සත්ව ඝාතනයට එරෙහි වීමෙන් සිදු වන්නේ මාංශ භක්ෂක සතුන්ට නිරාහාරව සිට මිය යාමටය. කෙසේ වෙතත් සර්ව බක්ෂක සත්වයින්ට පමණක් විකල්පයක් තෝරාගත හැකිය. මේ හේතුවෙන් ලෝකයේ ඇති අහාර දාමයන්ට ඉස්ලාම් දහම එරෙහි වන්නේ නැත.

මිනිසාගේ අහාර ජීරණ පද්දතිය ගැන සලකා බැලීමේදී ඔහුගේ දත් සහ ජීරණ පද්දතිය සැකසී ඇත්තේ මාංශ සහ ශාක ජීර්ණය කල හැකි ආකාරයට ය. ඒ අනුව මිනිසාට අවශ්‍ය නම් පමණක් තමන් කැමති ආහාරයක් තෝරා ගැනීමට හැකිය. එහෙත් නීතියකින් මිනිසාට මාංශ අනුභව කිරීම තහනම් කිරීමෙන් සිදු වන්නේ ස්වභාවික නීතිවලට පිටු පෑමකි. තවද, නවීන විද්‍යාව අනුව ශාක වලට ජීවයක් ඇති බවත් ඒවාට වේදනාව දැනෙන බවත් සොයාගෙන තිබේ. ඒ අනුව මිනිසාට මාංශ තහනම් කොට ශාක ආහාරයට ගැනීමට බල කිරීමෙන්ද ප්‍රයෝජනයක් නොමැත. මේ නිසා මිනිසාගේ කැමැත්ත අනුව මාංශ හෝ ශාක අහාර ගැනීමේ නිදහස තිබිය යුතුය.

අල්කුරානයට අනුව ඇතැම් සතුන් මවා තිබෙන්නේ විශේෂ හේතූන් මතය. ඒ අනුව අශ්වයා, ඔටුවා, ගවයා වැනි සතුන් මිනිසාගේ ප්‍රවාහන කටයුතු සඳහා මවා තිබේ. ඒ අතරම ඔටුවා සහ ගවයා වැනි සතුන්ගෙන් මිනිසා කිරි ද ලබා ගන්නේය. එසේම උන් අහාරය පිණිස ද යොදා ගැනේ. කෙසේ වෙතත් නිකරුනේ සතුන්ට හිංසා කිරීම ඉස්ලාම් දහම කිසිසේත්ම අනුමත කරන්නේ නැත. මේ නිසා සත්වයින්ට ඉසිලිය හැකි බරට වඩා වැඩි බරක් උන්ගේ පිට මත පැටවීම නබිතුමා අනුමත කලේ නැත. එපමනක් නොව සත්වයින්ගේ පිටේ වාඩිවී වැඩි වෙලාවක් කතා කරමින් සිටි සහාබි වරයෙකුව දුටු නබිතුමා ඔහුට අවවාද කළේය.

එක් දිනක් නබිතුමා සිය අනුගාමිකයින් සමග ගමනක් යමින් සිටි අතර වාරයේදී වෙනත් කටයුත්තක් සඳහා පිටත්ව ගොස් ඇත. ඔහු එම කටයුත්ත අවසන් කොට නැවත පැමිණි විට දක්නට ලැබී ඇත්තේ සහාබාවරු එහි සිටි මව් කිරිල්ලියගෙන් උගේ පැටවුන් දෙදෙනෙකු උදුරාගෙන සිටීමය. එම අවස්ථාවේදී මව් කිරිල්ලී උගේ පැටවුන් දෙදෙනා නැතිවුණු ශෝකයෙන් අහසේ පියාසර කරමින් සිට ඇත. එම සිද්ධිය දුටු නබිතුමා,

*'මෙම කිරිල්ලීට වේදනාව ගෙන දෙන මේ ක්‍රියාව කලේ කව්දැ'යි විමසා බලා වහාම එම කුරුළු පැටවුන් නිදහස් කරන ලෙස නියෝගකොට තිබේ (සහීහ් මුස්ලිම්).*

තවත් අවස්ථාවකදී නබිතුමා ඔහුගේ අනුගාමිකයින් අමාතා,

*"යම්කිසිවෙකු සෙල්ලමට හෝ ගේ කුරුල්ලෙකු මරා දැමුවේ නම්, එම ගේ කුරුල්ලා විනිශ්චය දිනයේදී, 'දෙවියනි! මොහු නිකරුනේ මාව මරා දැමුවා! ඔහු කිසිම වැදගත් කමකට මාව මැරුවේ නෑ' යනුවෙන් පවසන බව දැනුම් දුන්නේය. (සුනන් අන් නිසායි*).

තවත් හදිසයක දැක්වෙන අන්දමට බනී ඉස්රායිල්වරුන්ට අයත් කාන්තාවක් බළලෙකුට නිදැල්ලේ යන සතුන් ආහාරයට ගැනීම වළක්වාලමින් ඌ සිරකොට තැබීම හේතුවෙන් එම බළලා කුසගින්නෙන් මිය ගොස් ඇත. මේ නිසා එම කාන්තාව කොතරම් පින් දහම් කර තිබුනත් නිරයට යන බව නබිතුමා පැවසුවේය. මේ සෑම දෙයකින්ම පැහැදිලි වන්නේ පින් දහම් කලත් සතුන්ට හිංසා කිරීමෙන් දෙවියන්ගේ කෝපයට පාත්‍ර වන බව යි.

ඉස්ලාම් දහම සත්ව ඝාතනයට ඉඩ හැර නොතිබුනේ නම් වෛද්‍ය විද්‍යාව මහත් දුෂ්කර තත්වයන්ට මුහුණ පෑමට ඉඩ තිබුනේය. විද්‍යාවේ දියුණුවත් සමග ලෙඩ රෝග වලට හේතුව ක්ෂුද්‍ර ජීවින් බව සොයාගෙන තිබේ. මේ නිසා කෙනෙකුට රෝගයක් සෑදුනු විට එම ක්ෂුද්‍ර ජීවින් සිය ලක්ෂයකට වඩා විනාශ කිරීමට සිදු වන්නේය. සතා කුඩා වුනත් ඌට ඇත්තේ ද ප්‍රානයකි. එසේ තිබියදී ඉස්ලාම් දහම සත්ව ඝාතනය තහනම් කොට තිබුනේ නම් තත්වය කුමක් විය හැකිද? එසේම ප්‍රාණ ඝාතනය පවක් නම් සතුරු ආක්‍රමණයකදී කුමන තීරණයක් ගැනීමට සිදු වන්නේද? (FA)

---

## සත්ව ඝාතනය -

## විද්‍යාත්මක සහ ආගමික කෝණ වලින්.

මිනිසා ගැන සහ ඔහු කෙසේ ක්‍රියා කළයුතු දැයි වඩා හොඳින්ම දන්නෙ මිනිසාගේ නිර්මාතෘ වන දෙවියන්වහන්සේය. විශ්වයට හිමිකම් කියන්නේද එහිත් නිර්මාතෘ වන දෙවියන්වහන්සේමය. එලෙස තමාටත්, විශ්වයටත් හිමිකාරීත්වයක් දරමින් සිටින සර්වබලධාරී දෙවියෙකු ගැන නොදන්නා කෙනෙක් වේ නම්, ඇත්ත

වශයෙන්ම සත්ව ඝාතනය හෝ මාන්ස අනුභවය හෝ කුසල් අකුසල් යනාදිය ගැන හෝ එසේත් නැත්නම් වෙන කුමන දෙයක් ගැන වේවා කරුණු සෙවීමට හෝ තර්ක කිරීමට වඩා වටින්නේ එම දෙවියන්වහන්සේ ගැන කරුණු සොයා බැලීමය. එම දෙවියන් අපට ලබා දී ඇති මාර්ගෝපදේශය ගැන සොයා බැලීමය. අප පැමිණ ඇත්තේද ඔහු වෙතින්ම වන අතර අප නැවත යා යුතුව ඇත්තේද ඔහු වෙතමය.

මිනිසාවත් සතුන්වත් නිර්මාණය කළ දෙවියන් වහන්සේ මිනිසාට සතුන් සම්බන්ධව කටයුතු කල යුතු ආකාරය ගැන උපදෙස් දී තිබේ නම් අපට ඊටත් වඩා වෙන කාගේ හෝ උපදෙස් වලට මූලිකත්වයක් දිය හැකිද? මෙය වටහා ගැනීමට හැකි සරළ කාරනාවක් උනත් පහත උදාහරණයත් සලකා බලන්න.

ඔබ ටොයෝටා වාහනයක් මිලදී ගෙන ඇත්නම් එම ටොයෝටා වාහනය ගැන ඔබට නිවැරදිම උපදෙස් ලබා ගත හැක්කේ ටොයෝටා වාහන නිෂ්පාදිත ආයතනයෙන්මය. ටොයෝටා ආයතනය තිබේ නම්, ඒ හරහා ඔබට උපදෙස් ලබා දේ නම්, එය පහසුවෙන් ලබා ගත හැකි නම්, ඔබ වෙන අයගෙ උපදෙස් කෙරෙහි වද වන්නේ කුමටද?

දෙවියන් වහන්සේ මනුෂ්‍ය වර්ගයාට ලබා දී ඇති බොහෝ මාර්ගෝපදේශ සහ වරප්‍රසාද ඔහුගේ අවසාන පණිවිඩය වන අල් කුරානය තුලින් තම අවසාන දූතයා වන මුහම්මද් නබි (ﷺ) තුමාණන් හරහා අප වෙත දැනුවත් කර ඇත. ඒවායින් සමහරක් පහත සඳහන් වේ.

*ඔහුම ඔබ වෙනුවෙන් භූමිය වාසස්ථානයක් බවටද, අහස වියණක් බවටද නිර්මාණය කර, වලාකුළෙන් වර්ෂාව වසින්නට සලස්වා, එමගින් ඔබට ආහාර වශයෙන් ගත හැකි පළතුරු වර්ගද ඔබට ඉකුත් කරන්නේය. එබැවින් (මේ සියල්ල) දැනගෙන අල්ලාහ්ට (කිසිම) සමානයක් ඇති නොකරනු. (2.22)*

*විහිදී තිබෙන වැල්ද, විහිදී නොයන පැළෑටීන්ද ඇති උයන් වතුද, ඉඳි ගස්ද, ආහාරයට ගත හැකි විවිධ ගස් වැල් පලා වර්ගද, ධාන්‍යය වර්ගද, (බැලූ බැල්මට) එක සමානවද, (රසයෙන්) විවිධ වූ ඔලිව් ද, දෙළුම් හා තව විවිධ වර්ගයේ පළතුරු ආදියද, ඔහුම උත්පාදනය කර ඇත්තේය, එබැවින් ඒවා ප්‍රයෝජනවත් වන්නේ*

*නම් (ඕනෑ තරම්) ආහාරයට ගනු. ඒවා අස්වැන්න නෙලා ගන්නා කාලයෙහි (දෙවියන්ට ස්තුති කිරීම පිණිස) එහි ඔහුගේ කොටසද දුප්පතුන්ට දෙනු; (6:141)*

*(මිනිසුනේ!) ගමේ සතුන්වද ඔහුම උත්පාදනය කර ඇත්තේය. ඒවායින් ඔබ වෙනුවෙන් (ශීතය වැලැක්වීමට) භාණ්ඩද, විවිධ ප්‍රයෝජනවත් දැයද ඇත්තේය. ඒවායෙන් සමහරක් අනුභව කරන්නෙහුය. (16:5)*

*(එළු, ගව, ඔටුවන් වැනි) සතුන්ගෙන්ද ඔබට පාඩමක් ඇත. ලේ වලටද, ගොම වලටද අතරේ උන්ගේ කුසෙන් කළවම් නොවුන කිරි (උත්පාදනය කර) අපි ඔබට පොවන්නෙමු. එය පානය කිරීමට ඉතා රසවත්ය. (16:66)*

ආහාරයට ගත හැකි සහ ආහාරයට නොගත යුතු සත්ව මාංශ වර්ග ගැනද අපගේ නිර්මාතෘ අපට පැහැදිලිව දන්වා ඇත.

(විශ්වාසවන්තයිනි!) ඉබේ මැරුණු, ලේ, ඌරු මස්, අල්ලාහ් නොවන දැයෙහි නම් පවසනු ලැබූ ආදියද, බෙල්ල මිරිකා මැරුණු දැයද, පහර වැදී මැරුණු, (ඉහල සිට) වැටී මිය ගිය දැයද, අං වලින් අනිනු ලැබ මැරුණු, (සිංහ දත්, වීර නියපොතු වලින් යුත් මස් බුදින සතුන් වන සිංහයන්, කොටියන්, දිවියන් වැනි) දඩයම් සතුන් විසින් සපා (මැරුණු) දැයද ඔබට තහනම් කරනු ලැබ ඇත්තේය. (එහෙත් මෙම සතුන් දඩයම් කරන ලද) ඒවායෙන් (පණ පිටින් සිටින විටදී) නියම අන්දමින් (බිස්මිල්ලාහ් කියා) ඔබ බෙල්ල කැපූ (කුර්බාන් කළ) දැය හැර. (එසේ බෙල්ල කැපූ දැය ආහාරයට ගත හැකිය). තවද පූජා කිරීම සඳහා සිටුවන ලද (කුළුණු, කොඩි, පිළිරූ වැනි) දැය සඳහා කැපූ දැයද, දුන්නෙන් විද (නිවිති බලා) පංගු බෙදා ගැනීමද (ඔබට තහනම් කරනු ලැබ ඇත්තේය). මේ සියල්ල පාපයන් වන්නේය....,

*...කවුරුන්හෝ පාපයන් කිරීමේ අදහසක් නොමැතිව බඩගින්නේ දරුණු කම නිසා, බලකරණු ලැබ, (ඉහත සඳහන් තහනම් කරනු ලැබූ දැය අනුභව කර) හැරියහොත් (එය වරදක් වන්නේ නැත). මන්දයත් අල්ලාහ් (බල කරනු ලැබූ ඔහුගේ වැරදිවලට) සමාව ලබා දී, අනුකම්පා කරන්නෙකු වශයෙන් සිටින්නේය; (5:3)*

*(නබියේ! ආහාරයට ගැනීමට) තමන්ට අනුමැතිය දෙනු ලැබූ දැය කුමක්දැයි ඔවුන් ඔබගෙන් විමසන්නාහ. (එයට ඔබ මෙසේ පවසනු) (පාරිශුද්ධ වූ) හොඳ දැයම ඔබට අනුමත කරනු ලැබ ඇත්තේය. තවද අල්ලාහ් ඔබට උගන්වා දී ඇති අන්දමට දඩයම් කරන (බල්ලා, දිවියා වනි) සතුන්ට හා (රාජාලියා වැනි පක්ෂීන්ටද) ඔබ දඩයම් කිරීමට උගන්වා, ඒවා (දඩයම් කර, තමන් අනුභව නොකර) ඔබ වෙනුවෙන් වළක්වා (තබා ගත්) දැයද -(ඒවා මිය ගියා උවද)-ඔබට ආහාරයට ගත හැකිය. (එහෙත් දඩයමට මුදා හරින විට, බිස්මිල්ලාහ් යයි) අල්ලාහ්ගේ නාමය පවසා අත්හැරිය යුතුය; (5:4)*

*(විශ්වාසවන්තයිනි!) ජලයෙහි දඩයම් කිරීමද, ඒවා ආහාර වශයෙන් ගැනීමද, ඔබට අනුමත කරනු ලැබ ඇත්තේය;(5:96)*

විශේෂයෙන්ම ආහාර සඳහා සත්වයින් ඝාතනය කරන ක්‍රම පිළිබඳව මිනිසුන් අතර විවිධ අදහස් ඇත. මේ ඒ ගැන පැහැදිළි කිරීමකි.

බෙල්ලේ ඉදිරිපස තියුණු කැපුමකින් සතුන් ඝාතනය කිරීමේ ඉස්ලාමීය (HALAL) පිළිවෙත සත්ව හිංසනයේ ආකාරයක් ලෙස ඇතැම් සත්ව හිමිකම් ක්‍රියාකාරීන්ගේ ප්‍රහාරයට නිතර ලක්ව ඇත. එය සතුන් මැරීමේ වේදනාකාරී අමානුෂික ක්‍රමයක් බව ඔවුන් ප්‍රකාශ කරයි.

මීට අමතරව සත්වයා මිය යාමට පෙර වේදනාව දැනීම වැළැක්වීම සඳහා සතුන්ගේ හිසට වෙඩි තැබීමකින් ඝාතනය කිරීම සමහර රටවල අනුමත කර ඇත.

එබැවින් ජර්මනියේ හැනෝවර් විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාලයේ මහාචාර්ය විල්හෙල්ම් ෂුල්ස් සහ ඔහුගේ සගයා වන වෛද්‍ය හසිම් විසින් කරන ලද අධ්‍යයනයක ප්‍රතිඵල දැනගැනීම හොඳ පණිවිඩයක් වේවි.

**අධ්‍යයනය:- 'සාම්ප්‍රදායික (කැප්ටිව් බෝල්ට් පිස්තෝලයක් මගින් මොළයට වෙඩි තැබීමෙන්) සහ ඉස්ලාමීය චාරිත්‍රානුකූල (හෙවත් හලාල්) ක්‍රමයට පිහියෙන් ගෙල නහර කපා බැටළුවන් හා ගවයන් ඝාතනය කිරීමේ ක්‍රමවල වේදනාව සහ සවිඥානකත්වය පරීක්ෂා කිරීම.**

[ඉස්ලාමීය (HALAL) ඝාතනය ඉතාමත් මානුෂීය ඝාතනයක් වන අතර වෙඩි තැබීම සත්වයාට දැඩි වේදනාවක් ඇති කරන බව අවසානයට තහවුරු වී ඇත. ඉස්ලාමීය ක්‍රමයට ලබා ගන්නා මස් වල ගුණාත්මක භාවය හා කල් තබා ගැනීමේ ගුණය, වෙඩි තබා ලබා ගන්නා සතුන්ගේ මස් වල ගුණාත්මග භාවය හා කල් තබා ගැනීමේ ගුණයට වඩා වැඩි බවද තහවුරු විය].

**1 - ඉස්ලාමීය ක්‍රමය**

ඉස්ලාමීය හලාල් ඝාතනය යනු ශරීරයෙන් හිස වෙන් නොකර ජුගුලර් නහර, කැරොටයිඩ් ධමනි, ස්වසනාලය සහ esophagus කපා දැමීමයි. මෙම ක්‍රමය මඟින් මොළයට රුධිරය හා ඔක්සිජන් සැපයීම නතර කරන අතර තත්පර කිහිපයකින් සත්වයාට සිහිය නැති වේ.

අධ්‍යයනයේ දී, මොළයේ මතුපිට ස්පර්ශ වන පරිදි සියලුම සතුන්ගේ හිස් කබලේ විවිධ ස්ථානවල ඉලෙක්ට්‍රෝඩ කිහිපයක් ශල්‍යකර්මයෙන් බද්ධ කරන ලදී. (ඉන්පසු සති කිහිපයක් සතුන්ට සුවය ලැබීම සඳහා ඉඩ ලබා දෙන ලදී).

පසුව, ඉන් සතුන් කිහිප දෙනෙකුගේ ගෙල මත තියුණු පිහියකින් වේගවත් ගැඹුරු කැපුමක් සිදු කර ජුගුලර් නහර සහ කැරොටයිඩ් ධමනි මෙන්ම ස්වසනාලය සහ esophagus (ඉස්ලාමීය ක්‍රමයට) කපා දමන ලදී.

අත්හදා බැලීමේදී, විද්‍යුත් එන්සෙෆලෝග්‍රැෆ් (EEG) සහ විද්‍යුත් හෘද රෝග සටහනන් (ECG) මගින් කැපුම් ඝාතන සහ වෙඩි තැබීම මගින් කල ඝාතන කාලය තුළ සියලුම සතුන්ගේ මොළයේ සහ හදවතේ තත්ත්වය සටහන් විය.

EEG හි සටහන් කර ඇති පරිදි ඉස්ලාමීය ඝාතනයේ සිට පළමු තත්පර තුන ඝාතනයට පෙර ප්‍රස්ථාරයෙන් කිසිදු වෙනසක් නොපෙන්වන අතර එමඟින් සත්වයාට කැපීමේදී හෝ වහාම වේදනාවක් දැනුණ බවක් නොපෙන්වීය. මෙම සිහිසුන් තත්ත්වය තුළ සත්වයාට වේදනාවක් දැනෙන්නේ නැත. මේ අතර, මොළයේ ඇති පිටියුටරි ග්‍රන්ථිය මගින් වකුගඩු වල ඇති අධිවෘක්ක ග්‍රන්ථි වෙත සංඥා යවමින් ඇඩ්‍රිනලින් නිකුත් කරයි.

ඊළඟ තත්පර 3 සඳහා, EEG ගැඹුරු නින්දේ තත්වයක් වාර්තා කළේය (සිහිසුන්ව). මෙයට හේතුව ශරීරයෙන් විශාල රුධිර ප්‍රමාණයක් පිටවීමයි.

ඉහත සඳහන් කළ තත්පර 6 කට පසුව, EEG ශුන්‍ය මට්ටම වාර්තා කළ අතර, කිසිදු වේදනාවක් දැනෙන බවක් නොපෙන්වයි.

මොළයේ පණිවිඩය (EEG) ශුන්‍ය මට්ටමට පහත වැටුණු විට, හදවත තවමත් ස්පන්දනය වෙමින් පවතින අතර ශරීරය දැඩි ලෙස කම්පනයට පත් වීම හේතුවෙන් (සුෂුම්නාවෙහි ප්‍රත්‍යාවර්ත ක්‍රියාවක් මත) ශරීරයෙන් ඉවතට උපරිම රුධිර ප්‍රමාණයක් ගෙන යන අතර එමඟින් පාරිභෝගිකයාට සෞඛ්‍ය සම්පන්න මස් ලැබේ.

**2). කැප්ටිව් බෝල්ට් පිස්තෝලයක් භාවිතයෙන් සතුන් ගේ හිසට වෙඩි තබන බටහිර ක්‍රමය:**

- a). වෙඩි වැදුනු වහාම සතුන් සිහිසුන් විය.
- b). වෙඩි වැදුනු වහාම EEG හරහා දැඩි වේදනාවක් පෙන්නුම් කළේය.
- c). ඉස්ලාමීය ක්‍රමයට අනුව ඝාතනය කරන ලද සතුන් හා සසඳන විට, වෙඩි වැදුනු සතුන්ගේ හදවත් ඉක්මනින් නතර විය. එනිසා වැඩිපුර රුධිර ප්රමාණයක් ශරීරයෙන් ඉවත් නොවී මස්වලම රඳවා ගැනීමට හේතු විය. එනිසා එම මස් වල බැක්ටීරියා ක්‍රියාකාරීත්වයද අධිකය. මෙය පාරිභෝගිකයාට සාපේක්ෂව නුසුදුසුය.

**ඉස්ලාමීය (HALAL) ඝාතනය සඳහා රෙගුලාසි**

මුහම්මද් නබි (ﷺ) තුමාණෝ මෙසේ පැවසූහ: ඔබ ඝාතනය කරන විට එම සත්වයාට දයාවන්ත වන්න: එහි වේදනාව සමනය කිරීම සඳහා ඔබේ තලය මුවහත් කරන්න."

තවද එතුමානන් උගන්වා ඇත්තේ සතෙකු ඉදිරියෙහි පිහි තලය මුවහත් කිරීම හෝ තමන්ගේම වර්ගයේ අන් සතුන් ඉදිරියේ සතෙකු මරා දැමීම නොකල යුතු බවයි.

සත්වයා ඝාතනය කිරීමට පෙර "බිස්මිල්ලාහ්" යනුවෙන් අල්ලාහ්ගේ නාමය පැවසිය යුතුය. [සත්වයාගේ සැබෑ නිර්මාතෘ සහ හිමිකරු දෙවියන්වහන්සේය].

සත්ව ඝාතනය සඳහා භාවිතා කරන පිහිය තියුණු විය යුතු මෙන්ම එය වේගයෙන් භාවිතා කළ යුතුය. ගෙල වේගයෙන් කපන විට වේදනාව සඳහා වගකිව යුතු මොළයේ ස්නායු වලට රුධිර ප්‍රවාහයද ඉක්මනින් විසන්ධි කරයි. එවිට සත්වයාට වේදනාවක් දැනෙන්නේ නැත. කැපීමෙන් පසු සතාගේ සිදුවන චලනයන් සහ මැලවීම සිදුවන්නේ වේදනාව නිසා නොව, රුධිරයේ ඌනතාවයෙන් යුත් මාංශ පේශි හැකිලීම සහ ලිහිල් කිරීම නිසාය.

කැපීම: සුසුම්නාලය (ශ්වාසනාලය), ගුලට් (එසොෆගුස්) සහ ජුගුලර් නහර දෙක සම්බන්ධ විය යුතුය. (සුෂුම්නාව නොකැපෙන ලෙස මෙය කළ යුතුයි). මෙම ක්‍රමය මඟින් සත්වයාගේ ශරීරයෙන් වැඩි ප්‍රමාණයක් රුධිරය වහනය වීම වේගවත් කරයි. සුෂුම්නාව කපා දැමුවහොත් හෘදයේ ස්නායු තන්තු වලට හානි වී හෘදයාබාධ ඇති විය හැකි අතර එමඟින් රුධිර නාලවල රුධිරය එකතැන පල්වීමට හේතු වේ. හිස ඉවත් කිරීමට පෙර රුධිරය සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතුය. ක්ෂුද්‍ර ජීවීන් සඳහා මාධ්‍යයක් ලෙස ක්‍රියා කරන රුධිරය ඉවත් කිරීමෙන් මස් පිරිසිදු කරයි; මස් ද වෙනත් ඝාතන ක්‍රමවලට සාපේක්ෂව නැවුම්ව පවතී.

එබැවින් සත්ව ඝාතනයේදී සිදුවන සත්ව හිංසන ගැන කතා කිරීමේදී මෙවැනි කරුණු කෙරෙහි දැනුවත්ව සිටීම ඉතා හොඳය.

## මාංශ භක්ශක, ශාක භක්ශක, සර්ව භක්ශක, පරිණාමවාදය සහ කුසල්-අකුසල් ආදිය ගැන සළකා බලමු.

හිපපොටේමස් යනු පෘථිවියේ සිටින තුන්වන විශාලතම ක්ෂීරපායින් වේ. ශාක භක්ෂක වේ, බහුලව තණකොලද  අමතරව පළතුරු අනුභව කරයි. ඔවුන් විශේෂ දෙකක් සිටී. ඔවුන්ට දිය යටින් වේගෙන් පිහිණිය හැක, මඩේත් ඔවුන් ජීවත් වේ. ගොඩබිමදී වේගයෙන් දිවීමට පුළුවන. සිංහයන් කිඹුලන් වැනි සතුන් සමග පවා සටන් කල හැක. ඔවුන්ට විශාල කටක් සහ විශාල බඩකුත් ඇත. අපි රඹුටන් ගෙඩියක් කටේ දාගන්නවා වගේ සටනකදී සිංහයෙකුගේ ඔලුවක් උනත් තම

කටෙන් අල්ලා ගත හැක. ඔවුන් එකමුතු කමින් සතුරන්ට පහර දෙති. ඔවුන්ට දහවලට වඩා රාත්‍රී කාලයේදී වඩාත් හොඳින් ක්‍රියාශීලී විය හැක. ඔවුන්ට ගොම හෝ අසූචි වල සුවඳ දැනීමෙන් එය සතුරෙකුගෙන්ද මිතුරෙකුගෙන්ද ආදී ලෙසද හඳුනාගත හැකිය.

හිපපොටේමස් වඳවීමේ අවදානමට ලක්ව ඇති සත්ව කාන්ඩයකි. පරිසරය අනුව සතුන්ගේ ස්වභාවය වෙනස් වී අදාල පරිසරයට සුදුසු ආකාරයට (ඩාවින් පරිණාම වාදයෙන් කියනා ලෙසට) ස්වභාවික වරණයක් වෙනවා නම් හිපෝ ලා තුන් වේලම මස්, මාලු, බිත්තර, තණකොල, මඩෙහි හැදෙන ඕලු මල් හා ඕලු අලත් ආහරයට ගෙන, වතුරෙත්, මඩෙත්, ගොඩබිමත් තම රාජධානිය කරගෙන ලෝකෙ බොහෝ ප්‍රදේශ වලටත් ව්‍යාප්ත වෙලා කිසිම වඳවීමේ තර්ජනයකට ලක් නොවී ඉන්න පුලුවන් වන විදිහට අනුවර්ථනය වෙන්න තිබුනා.

සිංහයින්ට තණකොල එහෙමත් කන්න හැඩගැහෙන්න තිබුනා. බූරුවන්ටත් පොඩි හරි සතෙක් අල්ලන් කන්න හැඩ ගැහෙන්න තිබුනා. නමුත් එහෙම වෙලා නෑ. එනම්, මේ ලෝකේ සිටින සත්තු ඒ ඒ තත්ව වලට නියම වී ඇති බව පැහැදිළියි.

මිනිසාගේ ශරීරයම සර්වභක්ෂක තත්වයකින් නිර්මාණය වී ඇත.

හිපපොටේමස් කොතරම් අනුවර්තීය ශක්තිමත් සහ දක්ෂ උනත් ශාක භක්ෂකයි.

සිංහයා කැලේ රජා උනත් මස් නැත්නම් බඩගින්නෙ මැරෙන්නයි වෙන්නෙ. එයා මාංෂභක්ෂකයි. පරිසරවලට අනුව ඔවුන් එහෙම අනුවර්තනය වෙලා නෑ. යම් නියමයකට අනුවයි ඔවුන් හැඩ ගැසී තිබෙන්නේ. (එය නිර්මාතෘ ගේ නියමයයි).

දෙවියන් පවසනවා ඔහු මිනිසාව මිනිසෙක් ලෙසම නිර්මාණය කල බව. මිනිසා වානරයෙකුගෙන් පැවත එන බවක් මිනිසාගේ නිර්මාතෘ පවසා නැහැ. එනිසා නොමග ගිය මත වල තවත් රැඳී සිටිය යුතු නැත.

මිනිසා ගැන, ඔහුගේ ආරම්භය - අවසානය ගැන, ඔහු පෘතුවිය තුල සිටින කාලය තුල කෙසේ ජීවත් විය යුතුද, මරනින් මතු ලෝකයේ තත්වය කෙසේද, විශ්වයේ

ආරම්භය අවසානය වැනි අප නොදන්න බොහෝ දේ ගැන අපට ඒවායේ නිර්මාතෘගෙන්ම නිවැරදි තොරතුරු ලැබී ඇත.

කුසල් අකුසල් යාන්ත්‍රණය ගැන නොදැන අප විසින් ඒවාට නීති රීති සම්පාදනය නොකළ යුතුය. මිනිසාට හානිකර සතෙකු ඝාතනය කිරීම සම්බන්ධව කුසල් අකුසල් රැස් වන්නේ කෙසේද, ආහාර, ඖෂධ හෝ වෙනත් කාරණාවක් වෙනුවෙන් ජීවී තත්ව වල ඇති බැක්ටීරියා, දිලීර, ලොකු හෝ කුඩා ශාක, ලොකු හෝ කුඩා සත්වයින් ආදිය භාවිතයට ගැනීම ගැන කුසල් අකුසල් නිර්ණය කිරීම ඒ සියල්ලෙහි අයිතිකරුට අනුව සිදු කල යුතු දේවල්ය. එනිසා මිනිසා කුසල් යාන්ත්‍රණය කෙසේ සිදුවන්නේ දැයි පැහැදිළි අවබෝදයකින් සිට කටයුතු කල යුතුය. නැතිනම් ඔහු "තමා නිවැරදියි" යැයි සිතමින් නොමගෙහි සිටිය හැක. එය අවාසනාවන්ත තත්වයකි.

අවසානයට අකුසල් ප්‍රමාණය වැඩිවෙලා අපායට සේන්දුවන අයට දඬුවම් දෙනු ලබන යමපල්ලන් ගැනවත් මිනිසා පොඩියෙන් හරි දැනගෙන සිටීම ඔහුගේ සිතට සැහැල්ලුවකි. ඇත්තටම යමපල්ලන් යනු කව්රුන්ද? දෙවියන්ගේ තවත් ණාත්මක ජීවී සමූහයක් වන මලායිකාවරුන් ගැන දැනුවත් වීමෙන් එම ගැටළුවද විසඳා ගත හැක.

ඉස්ලාමය ප්‍රායෝගික දහමකි. එහි ඇති උපදෙස්, නීති රීති කුමන කාලයක, කුමන ප්‍රදේශයක, කුමන තරාතිරමක සිටින කෙනෙකුටද උවද අනුගමණය කළ හැකි උගැන්වීමකි.

සතුන්ට වඩා මිනිසාට සුවිසේශී බුද්ධියක්, මනා විචාර බුද්ධියක්, ස්වයං තීරන ගැනීමේ උපරිම නිදහසක්, ලොව ඇති සම්පත් ප්‍රයෝජනයට ගැනීමට හොඳ හැකියාවක් මෙන්ම ඒවා භාවිතයට ගැනීමට යම් කිසි අයිතිවාසිකමක් වැනි වරප්‍රසද රාශියකට හිමිකම් ලැබී ඇත. එසේම ඔහු දෙවියන් ඉදිරියේ පරීක්ෂනයකට ලක්ව ඇත.

අපි දන්නවා සෑම සතෙක්ම ජීවත් වීමට ආශා කරන බව. ඔවුන් දක්වන භිය හැසිරීම් වලින් එය අපට වටහා ගත හැක. එසේම සතුන් සියදිවි නසා ගැනීමක්

කර ගන්නේ නැත. අධික ලෙස තුවාල වූ සතුන්ද ජීවත් වීමටම උත්සහ ගන්නා බව අප දැක ඇත.

තත්වය එසේ නම් ඔවුන්ට වඩා උසස් අපි ඔවුන්ව ඝාතනය කරන්නේ කෙසේද? බුදුදහම තුලින් නම් එය ගැඹුරින්ම අවධානය කර එය මහත් පාපයක්ම බව පවසයි.

නමුත් ප්‍රායෝගික ලෝකය තුල අපට ශාක හෝ සතුන්ගේ පණ නැසීමකින් තොරව ජීවත් වීමට නොහැකිය. පර පණ නැසීම අනිවාර්යයෙන්ම පාපකර්මයක් නම් එය නසන ජීවියා ලොකු හෝ පොඩි ලෙස වර්ග කළත් එය පාපකර්මයක්ම වන්නේය. උනක් හැදුනොත් එයට ප්‍රතිකර්මයක් ලෙස බෙහෙතක් බීමටද නොහැකිය. මදුරුවෙක් රෑ පුරාම වද දෙනවා නම් ඌ මැරීමටද නොහැකිය. වෙනත් විශාල විෂඝෝර සතෙක් උනත් මැරිය නොහැකිය. දරුණු මිනීමරුවෙකුට එල්ලුම් ගස ක්‍රියාත්මක කිරීමටද නොහැකිය. සමහර අත්‍යාවශ්‍ය ඖෂධ නිපදවීමටද නොහැකිය. වෙනත් විද්‍යාත්මක පරීක්ෂන කිරීමටද, අත්හදා බැලීම් කිරීමටද නොහැකිය. ලෝකය අද මෙන් දියුණු වන්නට පෙර අධික සීත රටවල, අධික උෂ්ණ රටවල එලවළු පළතුරු නොතිබෙන්නට ඇත. ඔවුන්ට මස් නැතිව පැවැත්මකුත් නැත. මාංශ භක්ශක සතුන් උනත් උන් ජීවිත කාලයම යැපෙන්නෙත් පර පණ නසාගෙනමය.

මේ කරුණු සලකා බැලීමේදී අප කැමති උනත් නැතත්, මේ ලෝකය සහ එහි ජීවීන් නිර්මාණය වී පවතින්නේ පර පණ නැසීමත් එක්කම සහ සම්බන්ධතාවයකින්මය. එනිසා අප එයට මුහුන දිය යුතුයි. සියල්ලෙහි නිර්මාතෘ ,ඒ ගැන දන්න නිසයි මිනිසාට උනත් මාංශමය ආහාර සඳහා හෝ වෙනත් අවශ්‍යතාවයන් සඳහා යම් ප්‍රමාණයකට සත්ව ඝාතනය අනුමත කර තිබෙන්නෙ. අවශ්‍යතාවය මත එය කුහුඹියෙක් හෝ මිනිසෙක් පවා විය හැක. දෙවිදුන්ගේ උපදෙස් මත එය කිරීම පවක් ලෙස නොසලකන අතර නිකරුණේ ගහක කොලයක් කැඩුවොත් එයද පාපයක් බවත් පවසා ඇත. එනිසා මිනිසා මෙහිදී බුද්ධිමත් විය යුතුය.

**මාංශ අනුභවය ගැන මගේ පුද්ගලික අදහස**

පෙර කාලවල අධික ශීත සහ අධික උෂ්ණ ප්‍රදේශ වල එලවලු පලතුරු, ධාන්‍යය ආදිය නොතිබෙන්නට ඇත. එනිසා ඔවුන් දිනපතා මාංශමය ආහාර අනුභව කිරීම වරදක් ලෙස සැලකිය නොහැකිය. දෙවියන් පවා මාංශමය ආහාර අනුභවයට අවසර දී ඇත.

නමුත් අද අධික උෂ්න සහ අධික ශීත ලෙස සලකන බොහෝ රටවල (වෙළඳසැල්වල) ශ්‍රී ලංකාවට වඩා නැවුම් එලවළු පළතුරු ඇත.

තම ශරීරයට අවශ්‍ය බොහෝමයක් පෝෂන පදාර්ථ මස් වලින් තොරවම ලබා ගත හැක. එලවළු පලතුරුවල මිළද මාංශමය ආහාර වලට වඩා අඩුය. එවන් තත්වයක් යටතේ දිනපතාම තම ආහාර වේල් සඳහා අහිංසක සතුන්ගේ මස්ම ලබාගන්න තත්වයක සිටිනවා නම් ඒ ගැන නැවත සළකා බැලිය යුතු වන්නේය. දෙවියන් අවසර දුන්න නිසාම සීමාව ඉක්මවා යාම තමන්ටම නරකක් විය හැක. මනුශ්‍යත්වය මතුකරගෙන මේ ලොව තුල සිටින සතුන් හා ශාක සමග අප ජීවත් වීමට වගබලා ගත යුතුය. එනිසා ඔබට හැකි නම් ඔබේ කෑම පිඟානට එන අහිංසක සහ හලාල් නොවන සතුන් ප්‍රමාණය අඩු කරන්න උත්සහ ගන්න.

---

## මිනිස් හදවත දැඩි වීම කෙරෙහි බලපාන සාධක

මිනිස් මනස පිළිබඳව සිදු කරනු ලබන්නාවූ පර්යේෂණ අනුව එය භෞතික දෙයක්ද නැතහොත් පාරභෞතික දෙයක්ද යන්න ස්ථිර ලෙස නිගමනය කොට නැත. කෙසේ වෙතත් අනාදිමත් කාලයක සිටම සිතීමේ ප්‍රධාන අවයවය හර්ධය බවට පිළිගැනීමක් තිබේ. මේ නිසා "ඔබේ හදවතට තට්ටු කොට බලන්න" නැතහොත් "හෘද ශාක්ෂියට එකහව කියන්න" යනාදී දේවල් ජනවහරේ දැකිය හැකිය. මේ අනුව ඇතැම් විට මිනිස් මොළය ක්‍රියා කරන්නේ හදවතින් ලැබෙන පණිවිඩ අනුවදැයි අනුමාන කල හැකිය.

අපගේ හැඟීම් නිසා මොළයෙන් හදවතට යවනු ලබන සංඥා වෙනස් කරන අතර හදවත සංකීර්ණ ආකාරයකින් ඒවාට ප්‍රතිචාර දක්වන බව පර්යේෂකයින් පෙන්වා දෙන්නේය. එපමණක් නොව, හදවත මොළයට යවන පණිවිඩ ද ක්‍රියාකාරීත්වයට

බලපාන බව ඔවුහු පෙන්වා දෙන්නේය. හදවත, මොළය හා ශරීරය සමඟ ආකාර හතරකින් සන්නිවේදනය කරන බව පැවසේ.

ඉස්ලාමිය ලෝකයේ ප්‍රසිද්ද විද්වතෙකු වන ඉමාම් ගzස්සාලි දක්වන අදහස් අනුව මිනිසාගේ වැදගත්ම හරය වන්නේ සිතයි (Qalb-Self). ඔහු දක්වන අදහස අනුව සිත අධ්‍යාත්මික (spiritual) වස්තුවක් වන අතර එය ශරීරය තුල පවතිමින් භෞතික සහ අධ්‍යාත්මික ක්‍රියාවන් මෙහෙය වන්නේය. සිතට (Qalb) භෞතික හදවත සමග සම්බන්දකමක් ඇති බැවින් එතුමාගේ අදහස අනුව එය හදවත ලෙසද හැඳින්වේ. මෙම ඉමාම් වරයාගේ මතය අනුව ආත්මය අරාබි බසින් සිව් අකාරයකට හඳුන්වනු ලබන්නේය, එනම් කල්බ් (සිත-heart), රූහ් (ආත්මය-soul), නෆ්ස් (desire-nature) සහ අක්ල් (intellect) වශයෙනි. මේ අනුව ආත්මය භෞතික දෙයක් වන්නේ නැත.

මිනිසාගේ ශරීරයට සමානව ඔහුගේ මනසත් රෝගී හෝ නිරෝගී වන්නේය. ඒ අනුව නිරෝගී මනසක් සතුටින් ගත කරන අතර රෝගී මනසක් දුකින් පසු වනු ඇත. කෙසේ වෙතත් සෑම පුද්ගලයෙකුගේම මානසික සුවය එකම ක්‍රමයකට මැනිය නොහැකිය. ඇයිද යත් අප අවට ඇති පරිසරය එක් එක් පුද්ගලයාට විවිධාකාරයෙන් බලපාන නිසාය.

කෙනෙකුගේ මානසික සුවය මැනිය හැකි එක් ක්‍රමයක් වන්නේ ඔහු කොතරම් හොඳින් ජීවත් වන්නේදැයි පිරික්සා බැලීමෙනි. එය කළ හැක්කේ කෙනෙක් කොතරම් සතුටින් ජීවත් වන්නේද, සාමන්‍ය මානසික ආතතියකට ඔරොත්තු දෙන්නේ කෙසේද, යහළු මිත්‍රයන් සමග හැසිරෙන්නේ කෙසේද, ස්වාදීන දිවියක් ගතකරන්නේ කෙසේද, ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ කෙසේදැයි පිරික්සා බැලීමෙනි. ඉස්ලාම් දහම අනුව ඇතැමුනට දෙන හොඳ ඔවදන් පිළිකුල් කරන්නේ ඔවුන්ගේ හදවත මිය ගොස් ඇති බැවිනි. නබි වදනකට අනුව ඔවුන් ඇවිදින මල කඳන් වැනිය.

එසේ තිබියදී ඉස්ලාම් දහම පෙන්වා දෙන අන්දමට කෙනෙක් අල්ලාහ්ව මෙනෙකි කිරීමෙන් ඉවත් වන්නේ නම් ඔහුගේ හදවත මිය යන්නේය. එවැනි අය ජීවත් වන්නේ අධ්‍යාත්මික හදවත මිය ගිය වුන් වශයෙනි. ඇතැම් අයගේ හදවත් වලට

ඔවුන් කරන වැරදි නිසා අගුලු දමා ඇත. මෙවැනි අයගේ හදවත් ගල් පර්වත මෙන් දැඩි වන්නේය. මිනිස් සිතට සාතන්ගෙන් බලපෑම් කල හැකිය. ඒ අනුව සාතන් මිනිසාගේ මනසට බාහිර අදහස් ඇතුළු කරන්නේය. එහෙත් එම අදහස් ප්‍රතික්ෂේප කිරීමේ හැකියාව මිනිසාට ලැබී ඇත. මේ සඳහා දෙවියන්ගේ පිහිට ද පැතිය යුතුය. කෙසේ වෙතත් සාතාන්ගේ අදහස්වලට ඉඩ දීමෙන් මිනිසාගේ මනස ව්‍යාකුල වන අතර දෙවියන් කෙරෙහි විශ්වාසය වැඩි වන තරමට මිනිසාගේ මනස ශක්තිමත් වන්නේය. මේ බව අල් කුරානයේද සඳහන් වේ. අල් කුරානයේ ඇතැම් සිත් පිළිබඳව මෙසේ සඳහන් කොට ඇත.

*"ඉන් පසුවද ඔබගේ හදවත් දැඩිවිය. එය ගල් පර්වත මෙන් හෝ නැතහොත් ඊටත් වඩා දැඩි විය. (මන්දයත්) සමහර පර්වතවලින් උල්පත් ඇති වී සැමදා ජලය වැහෙන්නේය. තවත් සමහර පර්වත පැලී දෙබෑ වී එයින් ජල දහරා වැහෙන්නේය. ඉන් සමහරක් අල්ලාහ්ට බියෙන් පහලට ඇද හැලෙන්නේය. අල්ලාහ් ඔබ කරන දැය නොදන්නේ නොවේ" (කුරානය 2:74).*

සිත් දැඩි වීමට බලපාන ප්‍රධන හේතුවක් වන්නේ අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් වැලකි සිටීමත් දහමට පටහැනිව ක්‍රියා කිරීමත් ය. එනම් සාතන්ගේ මාර්ගයේ ගමන් කිරීමය. ඒ අනුව අනවශ්‍ය ලෙස තර්ක කිරීමෙන් සිත් දැඩි වන්නේය. තවද පොරොන්දු කඩ කිරීම බොරු කීම හිත දැඩි විමට බලපාන බව ඉස්ලාමීය විද්වතුන්ගේ අදහස වේ. මෙය මිනිසා ලබන විශාල පාඩුවකි. අල්ලාහ් එය පිළිකුල් කරන්නේය. ඔවුන්ගේ හදවත් අල්ලාහ් මුද්‍රා තබන්නේය.

*"(අල්ලාහ්ගෙන්) තමන්ට පැමිණි කිසිම සාදකයක් නොමැතිව අල්ලාහ්ගේ ආයාවන් ගැන (නිකරුනේ) තර්ක කිරීම අල්ලාහ් වෙතද විස්වාස කළ අය වෙතද ඉතාමත් පිළිකුල් සහගතය. මෙසේම ආඩම්බරය හා උඩඟුකම ඇති සෑම කෙනෙකුගේම හෘදයන්හි අල්ලාහ් මුද්‍රා තබන්නේය. (එබැවින් ඔවුන්ට ස්වයංව ඍජු මාර්ගය අත්කර ගත නොහැකි වන්නේය)" (කුරානය 40:35).*

කෙනෙකුගේ හදවත මිය යාමෙන් වලක්වා ගැනීමට නම් ඔහු අධික ලෙස අල්ලාහ්ව මෙනෙහි කල යුතුය. අල් කුරානය එහි අර්ථය සමග කියවිය යුතුය. එවිට ජීවමාන හදවතක් අහි අය එහි අර්ථය වටහා ගැනීමෙන් කඳුළු සලනු ඇත.

බොහෝ අය සත්‍ය දැක දැකත් ඉන් බැහැර වන්නේ ඔවුන්ගේ සිත් දැඩි වීම හේතුවෙනි. එය ඔවුන් මෙලොවදී ලබන ලොකුම දඬුවම වන්නේය. එහි ප්‍රථිපලය වන්නේ මරණයෙන් පසු සදාකල් නිරයට පාත්‍ර වීමය. මේ නිසා මිනිසා කළ යුත්තේ තමන්ගේ උඩඟු කම පසෙක ලා සත්‍යය සොයා යාමය. සත්‍යය දුටු පසු එය පිළිගැනීමට සූදානම් විය යුතුය. ඒ වෙනුවට අනවශ්‍ය තර්කවල යෙදීමෙන් කිසිදිනක විමුක්තිය ලබා ගැනීමට හැකිවන්නේ නැත. (IBS)

---

## මුස්ලිම්වරයා සතු සමාජ වගකීම්.

විශ්වය මවා පාලනය කරන්නාවූ සර්වබලධාරි දෙවිඳාණන් විසින් ඉස්ලාම් නැමැති ධර්මය පහළ කරනු ලබන අතර එය විශ්වාස කර අනුගමනය කරන්නා වූ අය මුස්ලිම්වරුන් ලෙස හඳුන්වනු ලබයි.

මුස්ලිම්වරුන්ගේ ඊමානය ගොඩනැගෙන්නේ මැවුම්කාර වූ සර්ව බලධාරී එකම දෙවිඳාණන් විශ්වාස කිරීම හා ඉස්ලාම් නැමැති උතුම් ධර්මය ලොවට දායාද කළ මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වස් වල්ලම්තුමාණන් කළා වූ කුදු මහත් කාර්යයන් අධ්‍යයනය කොට ඒ අනුව ස්ලාම් මාර්ගයේ ක්‍රියා කිරීම මුස්ලිම්වරයාගේ මූලික වගකීමයි.

මුස්ලිම්වරයාට අල්ලාහ් වෙනුවෙන් ඉටු කරන්නාවූ නැමදුමට අමතරව තම සමාජය වෙනුවෙන් ඉටුකළ යුතු වගකීම් රැසක් ද පැවරෙනු ලබයි. එම වගකීම නිසියාකාරව ඉටු කිරීම මුස්ලිම්වරයාගේ නැමදුම තරම්ම ඉතා වැදගත්ය. එහෙත් මුස්ලිම්වරුන් ලෙස ජීවත් වන්නාවූ නූතන සමාජය මෙම වගකීම් පිලිබඳව එතරම් දුරට සැලකීමක් දක්වන බවක් පෙනෙන්නට නැත. පස්වේල සලාතයත්, ගොඩනැගිලි ඉදිකිරීමත්, නොයෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, කණ්ඩායම් වශයෙන් බෙදී තමතමන්ගේ කණ්ඩායමෙහි අරමුණු සාක්ෂාත් කිරීම පිණිස වැඩ කිරීම විනා සමාජය වෙනුවෙන් ඉටුවිය යුතු මෙහෙවර ඉටුවනවාද යන්න සැක සහිතය.

මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ජීවමාන අවධිය අධ්‍යයනය කර බලන්නෙකුට ඉස්ලාමයෙහි වර්ධනයට හේතු වූයේ ආරම්භයේදී ඉස්ලාම් දහම වැළඳගත් අයවලුන්ගේ ගති පැවතුම්ය. නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ ඉතා චිත්තාකර්ශනීය කතාව හා ගති පැවැතුම් හා විශ්වාසවන්ත භාවය හේතුකොටගෙන බොහෝ දෙනෙක් ඉස්ලාම් ධර්මය කෙරෙහි ආකර්ශණය වුහ.

මුස්ලිම්වරුන්ගේ ගති පැවතුම්, පවුල් ජීවිතයෙහි ඇත්තා වූ නිරවද්‍යතාවය, ව්‍යාපාර කටයුතුවලදී දැක්වූ අවංකභාවය, හා සමගිය සමාජය වෙනුවෙන් දරන්නා වූ කැපවීම යනාදී ගුණාංග දැකීමෙන් බොහෝ රටවලට ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත විය.

*"(විශ්වාසවන්තයෙනි!), නීතිගරුක වන ලෙසද, හොඳ ක්‍රියාවන් කරන ලෙස ද, ඥාතීන්ට (වස්තුව) දී උදව් කරන ලෙසද ඇත්තෙන්ම Allah ඔබට නියම කරන්නේ ය. අවමානයට ලක් වන ක්‍රියාවන්. පාපයන්, අපරාධ ආදී දෙයින් ඔබව ඔහු තහනම් කරන්නේ ය. මේ දේය ඔබ මතක තබා ගත යුතු යයි Allah ඔබට හොඳ අවවාද දෙන්නේ ය"(Quran 16:19)*

ඉස්ලාම් ධර්මය විශ්වාස කරන්නා වූ මුස්ලිම්වරයාට ඉස්ලාම් ෂරියාව ඔස්සේ අල්ලාහ් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව ජීවන සැලැස්මක් වෙන්වන්නේ සියයට පහක් දහයක් තරම් සුළු ප්‍රමාණයකි. අනෙක් 90% හෝ 95/ම ක්‍රියාත්මක කළ යුතු වන්නේ මුස්ලිම් වරයා විසින් සමාජයට කළ යුතු වගකීම් ලෙසය. සැමියාගෙන් භාර්යාවට, භාර්යාවගෙන් සැමියාට, දරුවන් විසින් දෙමවුපියන්ට, දෙමව්පියන් විසින් දරුවන්ට, තමන්ගේ අසල්වාසීන්ට, තමන් ජීවත්වන රටෙහි සමස්ත ජනතාවට ආදී වශයෙන් මුස්ලිම් වරයාට වගකීම් පැවරෙන්නේය. එම නිසා සමාජ වගකීම් පිළිබඳව මුස්ලිම්වරයා දැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත.

තමන් කොතරම් දුරට පින් දහම් කළත් අනුන් විවේචනය කරමින්, හිංසා පීඩා කරමින්, අනුන්ගෙ ඕපදූප සොයමින්, කුමන ආකාරයකින් හෝ පීඩනයට ලක් කරයි ද හෙතෙම අල්ලාහ්ගේ උදහස උරුම කරගන්නේය. මුහම්මද් නබි

සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ප්‍රකාශ කරන්නට යෙදුන වදනක සඳහන් වන්නේ එක් ස්ත්‍රියක් බළලෙකුට ආහාර නොදී හිරකර තබා මරණයට පත් කිරීම හේතුවෙන් ඇයට නිරයට ඇතුළුවීමට සිදුවන බවයි.

*"ඔබ එම බළලාට කෑමට හෝ බීමට කිසිවක් නො දුන් අතර නිදැල්ලේ යන සතුන් අල්ලා ගෙන කෑමට නොහැකි වන පරිදි හිරකළේ යයි" Allah පැවසූ බව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් දැනුම් දී ඇත (බුහාරි3:553)*

මේ අනුව මිනිසුන්ට පමණක් නොව අප අවට පරිසරයේ ජීවත් වන සතා සිවුපාවාට ද කරුණාව දයාව දැක්වීම හා ආහාර පාන සැපයීම මුස්ලිම්වරයාගේ වගකීමක් බව පැහැදිලි වේ.

*"තම හිංසනයෙන් තම අසල්වැසියා ආරක්ෂා නොවේ නම් ඔහු විශ්වාසවන්තයෙක් නොවේ."(තිර්මදි4994)*

තවදුරටත්,..

*"අල්ලාහ්ව සහ අවසාන දිනය විශ්වාස කරන්නන් තම අසල්වැසියා වෙනුවෙන් නිර්ලෝභී විය යුතුය."(අල්-මුඅත්තා49:22)*

තම අසල්වැසියන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමට මග පෙන්වන ඉස්ලාම් ධර්මය එම අසල්වැසියා තම තමන්ගේ ඥාතීන් වන්නේ නම් මීටත් වඩා යුතුකම් ඉටුකල යුතුය.

*ඥාතීන් සමග සමගියෙන් හා සහයෝගයෙන් යුතුව කටයුතු නොකරන කිසිදු මුස්ලිම් වරයෙක් ස්වර්ගයට ඇතුළු නොවන බව මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් දන්වා තිබේ. (මුස්ලිම් 6199)*

*එමෙන්ම ඥාතීන් හා අසල්වැසියන් සමග එකට ජීවත් වන මුස්ලිම් වරයා සමග සර්ව බලධාරී දෙවිදාණන් සිටින අතර, අසල් වැසියාගෙන් සහ ඥාතීන්ගෙන් ඈත් ව සිටින්නා ගෙන් අල්ලාහ් ද ඈත්වන බව තවදුරටත් සඳහන් වේ. (බුහාරි 8:18)*

ඉස්ලාම් ධර්මය ඉතා පැහැදිලිවම උගන්වනු ලබන්නේ මුස්ලිම් වරයාට නිරන්තරයෙන්ම පැවරෙන සමාජ වගකීම් නිසියාකාරව ඉටු කිරීම නැමදුම තරම්ම වැදගත් වන බවයි.

ඉස්ලාම් ධර්මය ගොඩනැගී පවතින්නේ යුතුකම් සමුදායක් මත ය. එය තේරුම් ගැනීම මුස්ලිම්වරයකුගේ වගකීමකි. නූතන මුස්ලිම් සමාජය මේ පිළිබඳව සැලකිල්ලක් දක්වන බව පෙනෙන්නට නැත. යම් දෙයක් කරන්නේ නම් බොහෝවිට එහි යටි අදහස එකිනෙකා සමාජයෙහි කැපී පෙනෙන්නට දරන උත්සාහයක් බව පැහැදිලිය.

සමාජයට ඉටුවිය යුතු යුතුකම් පැහැර හරිමින් සියලු දේ රැස් කරගනිමින් බොහෝ දෙනකු කරනු ලබන්නේ තමන්ගේ තත්වය ප්‍රදර්ශනය කිරීමකි. ඒ හැර වෙනත් යමක් නූතන සමාජය තළ දක්නට නොමැත. උදව් උපකාර කිරීම පසෙකලා සමහරවිට බොහෝ දෙනකුට වචනයකින් හෝ සැනසීම ගෙනදෙන පිණිස කතා කිරීමක් වත් නොමැත. මුස්ලිම් සමාජයේ ම ජීවත්වන්නාවූ බොහෝ දෙනෙක් අන්ත අසරණය. කුසගින්න, හිසට සෙවණක් නොමැති කම, නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමට හැකියාවක් නොමැති කම, රෝග පීඩා ව්‍යසනයන්ගෙන් දුක් විඳින අපගේම අසල්වාසීන් අපට නොපෙනේ. නමුත් ප්‍රදර්ශනයට ගොඩනැගූ කෝටිප්‍රකෝටි ගණනින් මුදල් වියදම් කොට ගොඩනැගූ ගොඩනැගිලි අපමණය.

මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ගොඩනගනු ලැබූ ඉස්ලාමීය දැක්ම පිළිබඳව මුස්ලිම්වරුන්ගේ අවධානය යොමු වන්නේ නැත. අප ජීවත්වන සමාජයේ සුවහසක් ප්‍රශ්න හමුවේ සැබෑ මුස්ලිම්වරයාට ඇත්ත වශයෙන්ම සැනසීමක් තිබේද?

බොහෝ දෙනෙකු ආගමික ඉගැන්වීම් පිළිබඳව පමණක් මහ උජාරුවට කතා කළ ද පැවැත්මෙහි ඇත්ත වශයෙන්ම පිළිවෙළක් නොමැත. තම තමන්ගේ අසල්වාසීන්, තමන් ජීවත්වන පරිසරය පිළිබඳව සැලකිල්ලක් නොදක්වන කිසිවෙකුත් මුස්ලිම්වරයෙකු වන්නේ නැත. ඉස්ලාම් ධර්මයෙහි උගන්වනු ලබන අති විශිෂ්ට ක්‍රමවේදයන් අනුගමනය කරන්නේ නම් සමස්ත ලෝකවාසීන්ටම

ඉස්ලාම් ධර්මය සුබ නම්‍ය දහම් අත්වනු ඇත. මේ පිළිබඳව කල්පනා කර බලා කටයුතු කිරීමට සුදුසු කාලය මෙයයි.

---

# නවක මුස්ලිම්වරු (දෙවන කොටස)

## උත්සව සමය සහ නවක මුස්ලිම්වරු

ඉස්ලාමීය පවුල්වල උපත ලැබූ මුස්ලිම්වරුන්ට ඉස්ලාමීය උත්සව සමය තුල නවක මුස්ලිම්වරයෙකු විසින් දෙන ලද පණිවිඩයකි.

ඉස්ලාමීය පවුල්වල උපත ලැබූ ආදරණීය මුස්ලිම්වරුනි,

ඉස්ලාමීය ප්‍රජාව තුළ සිටින නවක මුස්ලිම්වරුන් වෙනුවෙන් ඉදිරිපත් කරන මගේ කෙටි පණිවිඩය කියවීමට කරුණාකර මොහොතක් ගත කරන්න.

මුස්ලිම් පව්ලක උපත නොලැබ එහෙත් ස්ව-කැමැත්තෙන්ම ජීවන මාර්ගය ලෙස ඉස්ලාමය තෝරාගෙන සිටින අයෙකු ගැන ඔබ දන්නේ නම්, රාමදාන් සමයේ ඉෆ්තාර් රාත්‍රී භෝජන සංග්‍රහ සහ ඊද් අල් ෆිත්ර්, ඊද් අල් අද්හා වැනි උත්සව වලට ගෙන් එක් අයෙකුට හෝ ආරාධනා කරන්න.

රාමදාන් සහ හජ් අවුරුදු උත්සව ඔබලාට ඉතාමත් ප්‍රීතිමත් අවස්ථාවන් උනත්, බොහෝ නවක මුස්ලිම්වරුන් සඳහා එය තනිකම සහ වඩාත් මානසික අවපාත (depressing) සහිත කාලයකි. එයට ප්‍රධාන හේතුව නම් අපගේ නව ඇඳහිල්ල තේරුම් ගැනීමට, සහයෝගය දැක්වීමට, ධෛර්යමත් කිරීමට හෝ ප්‍රීතිමත් වීමට අපට පවුලක් සහ මිතුරන් නොමැති කමයි.

රමධාන් සමයේ හෝ වෙනද් දිනවල පවා උපවාසය ආරම්භ කිරීමට පෙර සහූර් සඳහා අපව අවදි කිරීමට අපට මුස්ලිම් පවුලක් නොමැත. එබැවින් අප තනිව

නැගිට තනිව සහූර් ආහාරය ලබාගෙන තනිවම අපගේ උපවාසය ආරම්භ කරන්නෙමු.

බොහෝ විට අප මස්ජිද වලට ඇතින් ජීවත්වන්නන් ලෙස සිටින අය නිසා ෆජර් සහ අනිකුත් සලාතයන්ද අප තනිවම කරගන්නෙමු. බොහෝ විට අපගෙන් සමහරුන්ට අදාන් හඬ පවා කලාතුරකින් ඇසෙන්නේ අවශ්‍යතාවයකට ඔවුන් මග තොට යන විටකදීය. සමහර විට කාගේ හෝ මුවින් අස්සලාමු අලෙයිකුම් යන්න පවා ඇසීමට ඔවුන්ට කාලයක් බලා සිටීමට සිදුවනු ඇත.

අල්ලාහ්ගේ තෘප්තිය ලබාගැනීමේ අරමුණින් නිරාහාරව සිටීමේ සහ උපවාසය අවසන් කිරීමේ ප්‍රීතිය ඔබලාට මෙන් සාමූහිකව බෙදා ගැනීමට අපට මුස්ලිම් පවුලක් නොමැත. එබැවින් අප තනිවම නිරාහාරව සිට එයද තනියම අත් හරින්නෙමු.

මස්ජිද කිට්ටුව සිටිනා අපගෙන් සමහරෙක් මස්ජිදය වෙත යාමට උත්සාහ කරන්නේ ඉෆ්තාර් සමයේදී කවුරුන්හෝ අප සමඟ පැමිණෙනු ඇතැයි යන බලාපොරොත්තුවෙනි. බොහෝ විට අප එම ගමනත් තනියම ම යන්නෙමු .

සමූහ ලෙස නැමදුමෙන් පසු බොහෝ විට අප නැවත තනි වන්නේ ඔබ අප ගැන අමතක කර ඔබගේ සාම්ප්‍රදායික ඉෆ්තාර් කෑම මේසයට ඔබ හා එක්වන ලෙස අපෙන් ඉල්ලා නොසිටින බැවිනි.

ඊද් සඳහාද අපට කිසිදු සැළසුමක් නොමැත. ඒ නිසා අපි සාමාන්‍යයෙන් ඊද් දවසද නිවසේ රැඳී සිටිමින් තනිවම කාලය ගත කරන්නෙමු.

බොහෝ විට ඊද් වැනි දිනවල ඔබලා ඔබලාගේ මව් භාශාවලින් එකිනෙකා අතර සුබ පැතුම් පළකර ගනිති. එය එසේ දකින විට අප ඔවුන්ට අයිති නැති හැඟීමක් අප තුල ඇති වෙනවා මෙන් දැනේ. මෙය ඔබ දැනුවත්ව සිදු නොවන්නක් බවද අප දන්නෙමු. නමුත් අපත් නොහිතන ක්ෂණයකින් අපට හැඟී යන්නේ අප ඔවුන්ට මුළුමනින්ම අයිති නැති බවකි.

කුඩා ළමුන් අලුත් ඇඳුමින් සැරසී බැලූන් රසකැවිලි සහ අතේ ඇති තෑගි මුදල් සමඟ සතුටින් පිනා යමින් එහෙ මෙහෙ දුවති. ඒ මොහොතේම අප තුලත් උත්සව

සමයන්හි ගෙවුණු අපගේ ළමා කාලය පිළිබඳ වටිනා මතකයකන් පෙළ ගැසෙයි. මොහොතකට අපි ඔබගේ දරුවන් හා මනසින් ඔවුන්ගේ ප්‍රීතිය බෙදාහදා ගන්නා අතර මෙතරම් අපූරු අත්දැකීමක් ලැබීමට මේ ළමුන් කොතරම් වාසනාවන්ත දැයි අපට සිතේ. ඒ අතරම අපගේ දරුවන්ට ඊද් උත්සවයන්හී ප්‍රීතිය කවදා හෝ විඳින්නට හැකිවේ දැයි අප තුල මහත් තිගැස්මක්ද ඇතිවී යයි.

තවත් සමහරු ඔවුන්ගේ පරණ මිතුරන් හා පවුලේ සාමාජිකයන් සමඟ ගැටෙන විට එකිනෙකා සමඟ නැවත සම්බන්ධවන බවට දිවුරුම් දී ගනී. බොහෝ විට, නවක මුස්ලිම්වරුන් මෙය දකින අතර අපගේ හදවත්වල ඇතිවන වේදනාව නැවැත්වීමට අපට නොහැකි වනු ඇත. ඒ ඊර්ෂ්‍යාවෙන් නොව, අපගේ ඇදහිල්ල පිළිගැනීමට නොහැකිවන විට අපගේ සුපුරුදු ප්‍රියයන් සමග ඇතිවන පරතරය ගැන සිහි වීම නිසා වෙනි. එනම්, අපගේ නව ඇදහිල්ල හේතුවෙන් පෙර අප අතර වූ ආදරය පවා බෙදා-හදා ගැනීමට නොහැකි වූ විට අප සහ අපගේ පවුල්වල සහ ජීවිත කාලය පුරාම සිටි අපගේ මිතුරන් හා අප අතර ඇති වන දුරස්ථභාවය ගැන සිහිපත් වීමෙනි.

අප අපට හුරුව තිබූ ඇදහීමෙන් හැරී ගියදා සිට අපේ පවුල් වල සමහර අය, අප හා ඔවුන් අතර තිබෙන සම්බන්දතාවයෙන් අපව සම්පූර්ණයෙන්ම කපා දමා ඇත. ඔවුන් අපව වෙන්කර දැමුවත් ඔවුන්ව පිළිගැනීමට හා අපගේ නව ඇදහීම තහවුරු කර ඔවුන්ටද එය දැනුවත් කිරීමට අපි ආශාවෙන් සිටිමු. පෙර ට වඩා නව හැඟීම්බර බවක් ඔවුන් වෙත ඇතිවී තිබියදී පෙර තරම් වත් සමීප වීමට අපහසු වීම අපට තවත් පීඩාවක් වී ඇත.

අපගේ ප්‍රීතියද දුක-සැපද බෙදාහදා ගැනීමට පවුලේ අය සහ මිතුරන් අපටද සිටිය යුතුය. කුමන තත්ත්ව යටතේ උවත් අවසානයට එයයි මිනිස් ස්වභාවය. තනිවූ අපට විශේෂයෙන් උත්සව සමයන් හී මේ බව වැඩි වශයෙන් දැනෙන්නට පටන්ගනී.

මෙවැනි සිතුවිලි නොනවත්වා ගලා එමින් තිබෙන විටෙක ඔබ මෙන්ම අනෙකුත් පවුල් ඔවුන්ගේ වාර්ෂික සම්ප්‍රදායන්ට හවුල් වීමට සූදානම්ව වේගයෙන් වේගයෙන් තම මෝටර් රථවලට ගොඩවී සිටිනු අපි බලා සිටිමු. පව්ලේ උදෑසන

ඊද් ආහාරය, තෑගි හුවමාරු කිරීම සහ සාදයෙන් සාදයට ගෙදරින් ගෙදරට යාම සිදුවෙයි. ඔවුන් එසේ කාර්යබහුල වන නමුත් දවසේ ඉතිරි කාලය සඳහා අප කුමක් කළ යුතුදැයි කල්පනා කරමින්, අපගේ මෝටර් රථයේ දොර වසා සුක්කානම මත අත තබා ගත් විට හෝ ඉස්ලාම් නොවන නිවැසියන් සිටින නිවසට පැමිණ කාමරයේ දොර වසා ගත් විට අප මානසික පීඩනයෙන් මිරිකී යන්නෙමු.

මෙය මගේ පෞද්ගලික කතාව නොවේ. ඉහත සඳහන් කළ දෙයට යම් මට්ටමකින් හෝ සම්බන්ධ විය හැකි ඔබ කවදා හෝ හමු වූ සෑම නවක මුස්ලිම්වරයෙකුගේම කතාව මෙයයි.

අවාසනාවකට මෙන්, රාමසාන් සහ ඊද් උත්සව වලදී බොහෝ නවක මුස්ලිම්වරුන්ගේ යථාර්ථය මෙයයි.

අපේ ප්‍රජාව තරම් විශාල ප්‍රජාවක් අපට සිටින විට, දාවාහ් සඳහා කැපවූ බොහෝ පිරිසක් සිටින විට, සුන්නාහ්ව දැඩි ලෙස අනුගමනය කරන බව කියා සිටින බොහෝ පිරිසක් සිටින විට, ඉස්ලාමීය සමාජ සේවා මධ්‍යස්ථාන බොහෝමයක් ඇති වටපිටාවක, ඉතාම ධනවත් මුස්ලිම්වරුන්ද බහුලව සිටින විටක, අපගේ ප්‍රජාවන් තුළ තනිකමක් දැනෙන එක නවක මුස්ලිම්වරයෙකුවත් නොසිටිය යුතුය. නමුත් යථාර්ථය නම්, බොහෝ ප්‍රජාවන් තුළ එවැනි පුද්ගලයින් සිටින බවයි.

මුස්ලිම් පවුල්වල ඉපදුනු මුස්ලිම්වරුනි, ඔබ කොපමණ නවක මුස්ලිම්වරුන් ගැන දන්නවාද? ඔබගේ පවුලේ අය සමඟ නිරාහාරව සිට එය අත්හැරීමට ඔබ කොපමණ වාරයක් ඔබගේ නිවසට නවක මුස්ලිම්වරුන්ට ආරාධනා කර තිබේද? ඔබගේ අසල්වාසී හෝ දුර බැහැරක හෝ සිටිනා නවක මුස්ලිම් මිතුරාට කිසියම් අවශ්‍යතාවයක් තිබේදැයි බැලීමට ඔබ කොපමණ වාරයක් දුරකථනය භාවිත කර තිබේද? ඔබගේ කුර්බානී ආහාර, සදකා හෝ සකාත් ගෙවන ඔබගේ කොටසින් නවක මුස්ල්ම්වරුන් වෙනුවෙන් වෙන් කරන ලෙස අල්ලාහ්සුභානවතාලා පෙන්වා දුන් උපදේශ ඔබට සිහිපත් වෙනවාද?

ආදරණීය මුස්ලිම් පවුල්වල ඉපදුණු මුස්ලිම්වරුනි,

අවම තරමින් මෙවන් විශේෂ අවස්ථාවලදී හෝ ඔබගේ නවක මුස්ලිම් මිතුරාට ඇමතුමක් දී හෝ වචන පෙළක් ලියා යවමින් හෝ ඔවුන්ට ඉස්ලාමීය සම්ප්‍රදායේ සුළු කාරනාවක් සඳහා හෝ ඔබ සමග එක්වන්නට ආරාධනා කරන්න. එයින් ඔබට කවරදාක හෝ දැනුනාට වඩා වැඩි යමක් නවක මුස්ලිම් අපට දැනේ.

මීට,

ඔබගේ ප්‍රජාව තුළ සිටින නවක මුස්ලිම්වරයෙක්.

**ශ්‍රී ලාංකික නැවත හැරුනු මුස්ලිම්වරුන්ගේ ස්වාධීන මධ්‍යස්ථානය.**




www.srmicenter.com https://srmi-center.webnode.page/ /

අසමසම දයාබර, අපරිමිත කරුනාන්විත අපගේ නිර්මාතෘ ﷲ දෙවිඳුන්ගේ නාමයෙනි!

සියලු ප්‍රශංසා සර්වබලධාරී දෙවිඳුන්ට හිමිය. තවද, දේව දූත මොහම්මද් තුමාට දෙවිඳුන්ගේ සාමය හා ආශිර්වාදය හිමි වේවා!

SRMI Center වෙත ඔබව සාදරයෙන් පිළිගන්නෙමු!

නවක මුස්ලිම්වරු (New Muslims) හඳුන්වා දීමට වඩාත්ම සුදුසු වන්නේ නැවත හැරුනු මුස්ලිම්වරු (Reverted Muslims) යන්නයි.

## නැවත හැරුනු මුස්ලිම්වරුන් යනු කව්රුන්ද?

ලෝකයේ සෑම දරුවෙකුම උපදින්නේ තම නිර්මාතෘට අවනත වීමේ ස්වභාවික තත්වයෙන්මය. මෙය ඉස්ලාම් ධර්මයට අනුව "ෆිත්රා" යනුවෙන් හැදින්වේ. පසුව ඔවුන්ගෙන් සමහරෙක් තම දෙමාපියන්ගේ සහ වටපිටාවෙන් ලබන ආභාශය නිසා එම ස්වභාවයෙන් මිදී විකල්ප මාර්ග වල යන්නට නැඹුරු වෙයි. එයිනුත් කොටසක් මුලු ජීවිත කාලයම තම නිර්මාතෘ වෙතින් තමන් වෙත එවන ලද මාර්ගෝපදේශයෙන් ඈත්වී හිදම මෙලොවින් සමුගනී. එම නිසා ඔවුන් තමන්ගේම නිර්මාතෘව මඟහැරුණු හෝ, නොසලකා හැර හෝ ප්‍රතික්ෂේපකර සිට මියගිය අය ලෙස සැලකිය හැක.

නමුත්, සමහරු තමාගේම නිර්මාතෘ ගැනවත් අවබෝදයකින් තොරව හිදිමින් සිටි අවස්ථාවක, තමන් නිවැරදි මාර්ගයෙහි නොයන බව වටහාගෙන, තමා ඉපදෙන විට රැගෙන ආ තම නිර්මාතෘට අවනතව ජීවත් වීමේ ස්වභාවය වෙතම නැවත (ආපසු) හැරෙමින් ඔවුන්ගෙන් තාවකාලිකව ඈත්වී තිබුනු එම ස්වභාවික තත්වයටම නැවත ඇතුල් වේ. ඔවුන් තමන්ගේත්, තම දෙමාපියන්ගේත්, ස්වභාවධර්මය ලෙසින් හඳුන්වන වටපිටාවේත්, මුලු මහත් විශ්වයේත් නිර්මාතෘද, හිමිකරුද වන දෙවියන්ගේ අනපනත් වලට අනුව ජීවත් වීමට උත්සහ දරමින්, තම නිර්මාතෘට නිසි අයුරින් ගරු බුහුමන් කරමින්, ඔහුව ප්‍රශංසා කරමින්, ඔහු විසින් එවන ලද නබිවරුන් හෙවත් දූතවරුන්ව විශ්වාස කරමින්, මලායිකාවරුන්, ධර්මය, අවසන් දිනය සහ දෙවියන්ගේ ආඥාව ආදියද විශ්වාස කරමින් තම අවසන් නබි වරයාව අනුගමනය කරමින් ජීවත් වීමට උත්සාහ ගනී. ඔවුන්ව සමාජය තුල බහුල වශයෙන් හඳුන්වන්නේ ඉස්ලාමය අලුතින් වැලඳ ගත් අය යනුවෙනි. නමුත් ඇත්තටම ඔවුන්ව හඳුන්වා දීමට වඩාත්ම සුදුසු වන්නේ නැවත හැරුනු මුස්ලිම්වරු (Reverted Muslims) යනුවෙනි.

මේ අනුව ඔවුන්ව, ඉස්ලාමයට ප්‍රවිශ්ඨ වූ අලුත් අය ලෙස හෝ නවක මුස්ලිම් අය (New Muslim) ලෙස හෝ ඉස්ලාමය දෙසට හැරුනු අය (Converted Muslims) ලෙස හඳුන්වා දිමට වඩා ඔවුන් නැවත හැරුනු මුස්ලිම්වරු (Reverted Muslims) ලෙස හඳුන්වා දීම වඩාත් උචිතය. (නමුත්, භාවිතයේ සහ පාඨකයන්ගේ පහසුව සඳහා අපද ඇතැම් විට නවක මුස්ලිම්වරු යන වචනය භාවිතා කර ඇත).

දෙවියන් වහන්සේ විසින් මිනිසුන් අතරින් පත්කරන ලද අවසාන නබිවරයා වන මොහම්මද් (ﷺ) තුමාණෝ මෙසේ පැවසූහ; "තම නිර්මාතෘ හෙවත් දෙවියන්ව නැමදීමේ ස්වභාවික තත්වයෙන් තොරව කිසිඳු දරුවෙකු උපදින්නේ නැත. නමුත් පසුව ඔහුව යුදෙව්වෙකු හෝ කිතුණුවෙක් හෝ බහුදේවවාදියෙකු බවට පත් කරන්නේ ඔහුගේ දෙමාපියන්ය".

## අප ගැන තොරතුරු බිඳක්

2016 දී ආරම්භ කරන ලද SRMI Center මධ්‍යස්ථානය, (වසර 10 කට පසුව මෙම පොත ප්‍රකාශයට පත් කරන තෙක්ම) දෙවියන් වහන්සේගේ කරුණාවෙන් සහ නවක මුස්ලිම්වරුන්ගේ ඉදිරිපත්වීමෙන් සහ දිරිගැන්වීමෙන් (පමණක් සහ වෙනත් කිසිදු ආයතනයක හෝ ස්වේච්ඡා පුද්ගලයින්ගේ සහයෝගයක් නොමැතිව), තම ආගමික, අධ්‍යාපනික සහ සමාජ සුභසාධනය සඳහා ස්වේච්ඡාවෙන් ඉස්ලාම් ආගමට හැරුණු ශ්‍රී ලාංකික නවක මුස්ලිම්වරුන් කිහිපදෙනෙකු විසින් ඔවුන් වෙනුවෙන්ම කටයුතු කරන ලාභ නොලබන ස්වේච්ඡා සමාජ සේවා වැඩසටහනකි.

SRMI center හි සාමාජික අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර ලබා දුන් අය වෙත මෙමගින් මෙහි සඳහන් (විශේෂ) සේවා පහසුකම් ලබාදීමට අප උත්සහ ගන්නෙමු.

අපගේ වර්ථමාන විශ්වාසයට අනුව, අප තම මැවුම්කරුට හෙවත් දෙවියන්ට අවනත වන ස්වභාවයෙන් උපත ලබා පසුව එම තත්වයෙන් මිදී වෙනත් ඇදහිලිවල නියැලී නැවත දෙවියන් වහන්සේට හෙවත් තම නිර්මාතෘටම කීකරු වීමේ තත්වයට පැමිණි අයයි.

මෙම නැවත හැරීමත් සමග අප මුහුන පෑ ඇතැම් ප්‍රායෝගික ගැටලු මෙන්ම සමාජයේ සුලභ වූ එවන් නොයෙකුත් දුෂ්කරතාවයන්ද හඳුනාගෙන ඒවාට පිළිතුරු සොයා යාමේදී, එවන් දුෂ්කරතාවන්ට මුහුන පාන්නට සිදුවන අපගේ අනිකුත් නවක මුස්ලිම් සහෝදර සහෝදරියන් හටද ඒවා මගහැර හෝ ඒවාට පහසුවෙන් මුහුන දිය හැකිවන ලෙසින්, ඉස්ලාම් ලෙසින් හඳුන්වන තම නිර්මාතෘ විසින් අප වෙත ලබා දී ඇති එම ජීවන සැලැස්ම තුල අවබෝධයෙන් යුතුව සහ අනවශ්‍ය අපහසුතා වලින් තොරව සැබෑ දේව භක්තිකයෙකු ලෙස ජීවත් වීමට මග පෙන්වාදෙන සහ, ශ්‍රී ලාංකික නැවත හැරුනු (නවක) මුස්ලිම්වරුන් වන අපට එකතු විය හැකි 'අපේම සංධිස්ථානයක්' ඇති කිරීමේ අරමුණ අප හට ඇතිවිය. එහි ප්‍රතිපලයක් ලෙස මෙම මධ්‍යස්ථානය ආරම්භ කළෙමු.

නවක මුස්ලිම්වරුන් සහ ඉස්ලාමය ගැන ඉගෙන ගැනීමට කැමති අය සඳහා අවශ්‍යය වන මූලික කරුණු සියල්ල මෙහි අඩංගු වේ.

වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම් වෙබ් අඩවිය හරහා අප හා සම්බන්ධ වන්න.

"දෙවියන්වහන්සේ ලෝකවාසීන් සියලු දෙනාටම හෙළි කළ පණිවිඩය අන් අය සමඟ බෙදා ගැනීම අපගේ යුතුකම හා වගකීමයි".

# නවක මුස්ලිම්වරුන් වෙනුවෙන් SRMI center වෙතින් ඉටු විය යුතු සේවාවන්...

- නවක මුස්ලිම්වරු සුහදව පිලිගැනීම
- ඉස්ලාමීය දැනුම, පොත් පත්..
- තොරතුරු සංචිතයක්
- ශක්තිමත් කණ්ඩායමක්
- අතරමැදියෙකු ලෙස
- සන්නිවේදන මධ්‍යස්ථානයක්
- නීතිමය කටයුතු වලදී සහාය
- සජීවී සාකච්චා
- අනිකුත් මධ්‍යස්ථාන සමග බැදීම්
- දාවා කටයුත්තට සහාය
- මංගල යෝජනා සහාය සහ  අභාවයකදී සහාය

වැඩි විස්තර සදහා www.srmicenter.com වෙබ් අවියෙහි අනු පිටු වලට පිවිසෙන්න

# නවකමුස්ලිම්වරුන් සම්බන්ධව මා දුටු පාරම්පරික මුස්ලිම්වරුන්ගේ දායකත්වය

නවකමුස්ලිම් 'දායී' (Da'i داعي) වරයෙකු ලෙස  මා ලද පෞද්ගලික අත්දැකීම් මතින් මේ ගැනත් යමක් සඳහන් කළ යුතු යැයි මා අදහස් කළෙමි.

මම ඉස්ලාමීය පණිවිඩය අන් අය වෙත ලබා දීම කෙරෙහි සහ නවකමුස්ලිම්වරුන් ගේ සුභසාධනය වෙනුවෙන් වසර 15ක් පුරා විවිධ ක්‍රියාකාරකම් කරමින් වෙහෙස මහන්සි වී කටයුතු කළ අයෙකි. එම කාලය තුල ඉස්ලමීය ගමන් මගෙහි මට හමුවූ මුස්ලිම්වරුන් සහ මා ලද අත්දැකීම් ස්වල්පයක් ගැන සඳහන් කරමින්ම මගේ පෞද්ගලික අදහස ඉදිරිපත් කිරීමට සිතුවෙමි.

සෞදි අරාබියාවෙහි ඉස්ලාම් සම්බන්ධ අමාත්‍යාංශයේ ඉහලම නිලධාරී වරයෙකුගේ සිට, එරටෙහි තිබෙන ඉස්ලාමීය දාවා මධ්‍යස්ථාන වලට අදාලව රියාද් හී ඇති ප්‍රධානතම මධ්‍යස්ථානයේ ඉහලම තණතුර දරන්නා ද ඇතුළුව තවත් මධ්‍යාස්ථාන කිහිපයක් සමගද, ශ්‍රී ලංකාවේ ඉස්ලාම් සම්බන්ධව සහ විශේෂයෙන් දාවා සම්බන්ධව පවත්වාගෙන යන ප්‍රධාන පෙලේ මධ්‍යස්ථානය කිහිපයකම ඉහලම නිලධාරීන් (දායි වරුන්) බොහෝ අය සමගද මට කටයුතු කිරීමට අවස්ථාව ලැබුණි. ඊට අමතරව ඉස්ලාමිය ගැන උන්න්දුව ඇති තවත් බොහෝ අය සමගද මම කටයුතු කර ඇත්තෙමි. එසේම, ඒ කාලය තුල මම ආශ්‍රය කළ විවිධ රටවල් නියෝජනය කළ නවක මුස්ලිම් වරුන් ගනන දහසකට ආසන්නව ඇතැයි මා විශ්වාස කරමි. එම දහසින් ශ්‍රී ලාංකික නවක මුස්ලිම්වරුන් හාරසියයක් පමණ මා හා සමීපව ආශ්‍රය කර ඇත. එසේම ජෙද්දාහි දාවා මධ්‍යස්ථානයක මම වැඩ කර ඇති අතර වෙනත් දාවා මධ්‍යාස්ථාන කිහිපයක් සම්බන්ධවද මා අවධානය යොමු කරමින් මගේ අත්දැකීම් මා එකතු කර ගත්තෙමි. එම කාලය තුල ශ්‍රී ලාංකික සහ ශ්‍රී ලාංකික නොවන මුස්ලිම් සමාජයේ දාවා හී නියැලෙන සහ එවැන්නක් නොකරන මෙන්ම නමට පමණක් මුස්ලිම් ලෙස පෙනෙන ආදී වූ විවිධ තරාතිරම්වල අය සමග ආශ්‍රය කිරීමට අවස්ථාව මට ලැබුණි.

එම කාලය තුල දෙවියන්වහන්සේගේ දයාවෙන් මට හජ් වන්දනා දෙකක් ඉටු කර ගැනීමට හැකි වූ අතර උම්රා වන්දනා 50 ඉක්මවූ බව මට විශ්වාසය. මදීනා හි පිහිටි මස්ජිදුල් නබවි වෙත දහ වතාවක් පමණ යාමටද හැකියාව ලැබුණි. ඒ වගේම මගේ නවක මුස්ලිම් දින චර්යාව තුල විවිධ ස්ථාන වල පිහිටි මස්ජිද දහසක පමණ දෛනික පස්වේල නැමදුම් කිරීමට මට අවස්ථාව ලැබුණු අතර මුස්ලිම් ජනාසා හෙවත් මුස්ලිම්වරුන්ගේ අභාවයකට පසු සිදු කරන අවසන් සමු ගැනීමේ අවස්ථා 50 කට පමණද සහභාගී වී ඇත්තෙමි. ගෙවුනු සෑම රමධාන් මසක් තුලම උපවාසශීලයේ ආශ්වාදය අත් වින්දෙමි. මේ අයුරින් මගේ ප්‍රියතම විෂය බවට ඉස්ලාමය පත් විය. මේ සියළු අත්දැකීම් සහිතව මම නවක මුස්ලිම්වරුන්ට කෙටි පණිවිඩයක් මෙහි සටහන් කිරීමට අදහස් කළෙමි.

ලොව කොතැනක සිටියත් නවක මුස්ලිම්වරයෙකුට සාමාන්‍ය මුස්ලිම්වරයෙකු ලෙස ජීවත් වීම අපහසුය. ශ්‍රී ලාංකිකයෙකු නම් ශ්‍රී ලංකාව තුල නවක මුස්ලිම්වරයෙකු ලෙස ජීවත් වීමත් ඉතාමත් අපහසුය. මෙම අපහසුතාවය ප්‍රායෝගිකව මෙන්ම ආධ්‍යාත්මිකවද තමන්ට බලපාන්නකි.

නවක මුස්ලිම් ඔබ අතහැරිය නොහැකි ඉතා උණුසුම් වතුර වීදුරුවක් අතින් අල්ලා ගෙන සිටින කෙනෙකු වැනිය. එහි රස්නය ඔබේ දෑත හරයා ශරීරය පුරා දිව යයි. විටෙක ඔබට කඳුළු එන තරමට එහි වේදනාව දැනෙයි.

පාරම්පරික මුස්ලිම් සමාජයේ සමහරුන් මේ බව දනී. විශේෂයෙන් දාවා කරන අය...., ඔවුන් කියාවි ඔවුන්ටත් මෙහි බරපතල කම ඔබට වගේම දැනෙන බව. සමහර විට ඔබට පෙනේවි ඔවුන් මේ වෙනුවෙන් යම් යම් ක්‍රියාමාර්ග ගන්න බව. නමුත් මගේ අත්දැකීම් වලට අනුව ඔවුන්ට (ඔවුන්ගෙන් අති මහත් බහුතරයකට) නිසි පරිදි තවම එය දැනී නැත. [හෝ එලෙස දැනුණු අය මට මෙතෙක් හමුවී නැත].

ඔවුන් හිතනවාට වඩා නවක මුස්ලිම්වරුන්ගේ තත්ත්වය බරපතලය. ඇතැම් විට දාවා හි නියැලෙන අය මේ වෙනුවෙන් දමන පැලැස්තර ප්‍රතිකාර මගින් ඔබට ස්ථිර සහනයක් නොලැබේ. මා ලද අත්දැකීම් වලට අනුව සහ මට හිතෙන

ආකාරයට දාවා කරන පාරම්පරික මුස්ලිම්වරුන් මෙම නවක මුස්ලිම්වරුන් සම්බන්ධ කාරණාව තව දුරටත් හැදැරිය යුතුය.

එනිසා නවක මුස්ලිම් ඔබ දෙවියන් කෙරෙහි ස්ථිර විශ්වාසයෙන් සිට කටයුතු කරන්න. මෙය මැනවින් තේරුම් ගත් සහාබිවරුන් හෙවත් නබි තුමානන්ගේ සමීප අනුගාමිකයන් සිටි බව විශ්වාස කරන්න. හැබැයි ඔවුනුත් නවක මුස්ලිම්වරුන්ය. එහෙයින්, පාරම්පරික මුස්ලිම් සමාජය දෙස නොව ඉස්ලාමීය ධර්ම මූලාශ්‍ර වන කුරානය සහ නබි ﷺ තුමාගේ සුන්නාව දෙස බලන්න. එයින් ඔබට සැනසීම ලැබේවි.

---

## ශ්‍රී ලංකාවේ ආගමික නිදහස

## Freedom of religion in Sri Lanka

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය II වන පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකාවේ ආගමික නිදහස සුරක්ෂිත අයිතියකි. බුද්ධාගමට රාජ්‍ය ආගම ලෙස මූලික ආරක්ෂාව ලබා දුන්නද මෙය සියලු ආගම්වලට අදාළ වේ. ශ්‍රී ලංකාව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලෞකික රටක් ලෙස සලකනු ලැබුවද, 1978 දී ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් බුද්ධාගමට ප්‍රමුඛස්ථානය හිමි විය.

කතෝලික ආගමට හැරීම පිළිබඳ සීමාවන් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2018 දී ගෙනහැර දක්වා ඇති අතර, කතෝලික සංවිධානයකට එරෙහි තීන්දුව ප්‍රකාශයට පත් කරමින්, අවදානමට ලක් වූ පුද්ගලයන්ට (ආගමක් ප්‍රචාරය කිරීමේ අරමුණින්) ආර්ථික හා මූල්‍යමය ආධාර සැපයීම, ඇදහිල්ලක් ප්‍රකාශයට පත් කිරීම, එම පුද්ගලයන්ගේ ආගමික නිදහස උල්ලංඝනය කිරීමක් බව ප්‍රකාශ කළේය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ මෙසේ සඳහන් වේ; "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දිය යුතු අතර ඒ අනුව බුද්ධ සසනා ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම රජයේ යුතුකම වන අතර සියලු ආගම්වලට 10 වන වගන්තියෙන් ලබා දී ඇති අයිතිවාසිකම් සහතික කරයි. 14 (1) (ඉ)."

10 සහ 14 (1) (ඉ) වගන්තිවල මෙසේ සඳහන් වේ;

"සෑම පුද්ගලයෙකුටම තම තේරීම පිළිබඳ ආගමක් හෝ විශ්වාසයක් තිබීමට හෝ පිළිගැනීමට ඇති නිදහස ඇතුළුව සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගමේ නිදහස සඳහා හිමිකම් ඇත." සහ "සෑම පුරවැසියෙකුටම තමා විසින්ම හෝ අන් අය සමඟ ඇසුරු කිරීමෙන් සහ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම හෝ නමස්කාරය, සැමරීම, පුහුණුවීම හෝ ඉගැන්වීම පිළිබඳ විශ්වාසය ප්‍රකාශ කිරීමට නිදහස තිබේ".

# ගීතයක්

*දැවෙනා හදවත් කතරට වැසි දිය - හලා සිසිල් කරනා*

*දෙව්දුනි ඔබමයි මා ලද සම්පත - හදවත සුවපත් කරනා*

*ජීවන ගමනේ දුක් සංකා මැද - යා යුතු යහමග පෙන්වා*

*කවුරුද ඉන්නේ කඳුලට සුසුමට - එරෙහිව අත්වැල් බන්දා*

*දෙව්දුනි ඔබමයි මා ලද සම්පත - හදවත සුවපත් කරනා*

*සිත කය සංවර කර ජය ගන්නට - මෙලොවෙහි මට ඇති හාදා*

*මෙනෙහි කරන්නෙමි අපරිමාණ වූ - ඔබෙ ගුණ කඳ නැත නිම්මා*

*දෙව්දුනි ඔබමයි මා ලද සම්පත - හදවත සුවපත් කරනා //*

අවසානයි.

## පොත ගැන පාඨක සටහන්

කතෘට ලියන්න:- srmicenter@gmail.com

## සොබාදහම සහ නිර්මාතෘ හඳුනා ගැනීමට...

මිනිසා සොබාදහමේ අපූරුම දෙයකි. බුදුදහමට අනුව, දිව්‍ය ලෝකවල ජීවත් වීමට වඩා ජීවියෙකුට මිනිස් පැවැත්මක් ලැබීම හොඳය. නමුත්, කුමන ලෝකයක ජීවත් උවත් ජීවියෙකුට නිර්වාණයට ළඟා වන තෙක් සංසාරයේ ඉතා දිගු ගමනක් තිබේ. දේවධර්මයට අනුව මිනිසුන් යනු දෙවියන් වහන්සේගේ විශේෂ නිර්මාණයක් වන අතර අනෙකුත් මැවීම්වලට වඩා බොහෝ වරප්‍රසාද හිමිකරගෙන තිබේ. කෙසේ වෙතත්, මිනිසාගේ ගමනාන්තය ස්වර්ගය හෝ නිරය වන අතර, ඔහුට අනන්ත කාලයක් එහි රැඳී සිටීමට සිදුවනු ඇත. මේ අනුව බලන කළ ලෝකය තුල කුමන විශ්වාසයන් සහ සම්මතයන් අනුව ජීවත් වුවද, මිනිසුන්ට සොබාදහම තුළ ඉතා දීර්ඝ ගමනක් ඇත.

ඉතා කෙටි වූ මෙලොව ජීවිතයේදී සොබාදහමෙහි සුළු කොටසක් අපි දකින්නෙමු. එහෙත් මෙලොවදී අපට නොපෙනෙන සොබාදහම සහ මරනින් මතු අප මුහුනදෙන සොබාදහමේ ස්වභාවය කෙසේ විය හැකිද? මෙම අද්විතීය මිනිස් ජීවිතය තුළදීම අපට මෙම විශ්මිත සොබාදහම යනු කුමක්දැයි දැන ගැනීමට හැකියාව ඇත. ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති උවහොත් එහි අපගේ මෙලොව වගකීම සහ පරලොව ස්වභාවය නිසි ලෙස හඳුනා ගැනීමට නොහැකිව අප පාඩු ලබන්නන් විය හැකිය.

තමන් ඇතුළුව සොබාදහම අහඹුවක් විය නොහැක. එය කාගේ හෝ සැලසුම් සහගත නිර්මාණයක් විය යුතුය. එසේනම් එහි නිර්මාතෘ කවුරුන්ද? ඔහුත් අපත් අතර ඇති සම්බන්ධතාවය කෙසේ විය යුතුද?

පාඨකයාට සොබාදහම සහ එහි නිර්මාතෘ හඳුනා ගැනීමටත්, එමඟින් තමන්ව සහ තමන්ගේ මෙලොව ජීවිතයේ අරමුණ හඳුනා ගැනීමටත් ඉතා පැහැදිලි මාර්ගෝපදේශයක් මෙහි අඩංගු වේ. මෙය ඕනෑම මට්ටමක සිටින කෙනෙකුට භාවිතා කළ හැකි දිව්‍ය වදන් සහිත වටිනා අත්පොතකි.

**සුදේෂ් ජයන්ත**